භදන්තාචරිය මහානාම ස්ථවිරපාදයන් විසින් විරචිත

## සද්ධම්මප්පකාසනී නම් වූ

# පටිසම්භිදාමග්ගට්ඨ කථා

## (සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

# පටිසම්භිදාමග්ගට්ඨ කථා සිංහල පරිවර්තනය

අට්ඨකථාචාර්ය්‍ය මහානාම මහාස්ථවිර පාදයන් විසින් රචිත පටිසම්භිදාමග්ග අට්ඨකථාව බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි සිංහලට පරිවර්තනය කළ දකුණු සිරිලක හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මිරිස්ස මිහිරිවැල්ලේ පදිංචි විජයතුංග ලියනපටබැඳිගේ ධර්මදාස මහතා 1962 දී විද්‍යෝදය පරිවෙණාධිපති ශ්‍රී සුමංගල ගුණානුස්මරණ සංගමය මගින් දෙහිවල ගොඩ [illegible]ධානසර විහාරයේදී පවත්වන ලද ත්‍රිපිටක ධර්ම පරීක්ෂණයෙන් සමත්ව ත්‍රිපිටකාචාර්ය උපාධිය ද විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ද ලබා ඇත.

[illegible] [illegible]කාර විද්‍යාලයේ ද, [illegible] [illegible] විද්‍යාතුංග පිරිවෙණෙහි අධ්‍යාපනය ලැබූ මොහු එම පිරිවෙණෙහිම ආචාර්ය වරයකු ලෙස කටයුතු කර ඇත. 1971 දී ගුරුපත්තියෙන් ඉවත් වූ රාජ්‍ය සේවාවතීර්ණව දිවයිනේ විවිධ පෙදෙස් හි සේවා නිරතව දනට විශ්‍රාමිකව වෙසේ.

පාලි, හින්දි, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාවන් පිළිබඳ හසළ දැනුමකින් හෙබි මොහු මිරිස්ස සිරි සුනන්දාරාමස්ථ ශ්‍රී ප්‍රඥාලෝක දහම් පාසැලේ ගුරුවරයෙකු ලෙස ද ක්‍රියාකර ඇත. විශ්‍රාම ගැනීමෙන් පසු මොහු කළ ප්‍රථම පරිවර්තන කෘතිය ලෙස පටිසම්භිදා මග්ග අට්ඨකථාව සඳහන් කළ හැකිය.

Vol XXI

භදන්තාචරිය මහානාම ස්ථවිරපාදයන් විසින් විරචිත

## සද්ධම්මප්පකාසනී නම් වූ

# පටිසම්භිදාමග්ගට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

*බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුග්‍රහයෙනි.*

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 25

භදන්තාචරිය මහානාම ස්ථවිරපාදයන් විසින් විරචිත

## සද්ධම්මප්පකාසනී නම් වූ

# පටිසම්භිදාමග්ගට්ඨ කථා

## (සිංහල පරිවර්තනය)

*සිංහල පරිවර්තනය*

**ත්‍රිපිටකචාර්ය, ශාස්ත්‍රවේදී**

**විජේතුංග ලියනපටබැඳිගේ ධර්මදාස**

*අධීක්ෂණය*

**දයා ගුණසේකර**

**ප්‍රාචීන පණ්ඩිත - බී.ඒ, පේරාදෙනිය**

*ප්‍රකාශනය*

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථනඃ 2734256 ෆැක්ස්ඃ 21736737

භදන්තාචරිය මහානාම ස්ථවිරපාදයන් විසින් විරචිත

## සද්ධම්මප්පකාසනී නම් වූ

# පටිසම්භිදාමග්ගට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

I S B N - 978-955-1604-44-8

*පරිගණක අකුරුකරණය*

උපමාලි කුලසේකර - කටුගස්තොට.

*පිටකවරය*

සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය

**අජිත් ප්‍රින්ටර්ස්**

85/4, පරණ කැස්බෑව පාර, ගංගොඩවිල, නුගේගොඩ.

දුරකථනය : 011-2517269

*ප්‍රකාශනය*

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථනඃ 2734256, 2728468, 2726234 ෆැක්ස්ඃ 2736737

විද්‍යුත් තැපැලඃ bcc456@sltnet.lk

www.buddhistcc.com

# ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනි ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෛගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සලකන වින්ටර්නීට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රණයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුණු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරළා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාද්වීපයේ තහවුරු විය.

හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්විය. මොග්ගලිපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදි. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

**මහා අට්ඨකථා**
**කුරුන්දි අට්ඨකථා**
**පච්චරිය අට්ඨකථා** නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දැරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

## බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධි මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ "කෝටනේම්ලී පුරිගුන්ඩ්ලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයුර සුත්ත පට්ඨන හෝ මයුර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්‍ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්‍ෂ එක්සැටදහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

## අටුවා විස්තරය

### විනය පිටකය

| | පෙළ | | අටුවාව | කර්තෘ | කාලය |
|---|---|---|---|---|---|
| උභය විභංග | 1 පාරාජිකා පාළි | 1 ආණා දෙසනා | සමන්තපාසාදිකා | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 2 පාචිත්තිය පාළි | 2 යථාපරාධ සාසන | විනය අට්ඨකථා | | |
| ඛන්ධක | 3 චුල්ල වග්ග පාළි | 3 සංවරාසංවර කථා | | | |
| | 4 මහාවග්ග පාළි | | | | |
| පරිවාර | 5 පරිවාර පාළි | | | | |
| | | භික්ඛුපාතිමොක්ඛ | කඞ්ඛා විතරණී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | | භික්ඛුණී පාතිමොක්ඛ | (මාතිකට්ඨ කථා) | | |

### අභිධර්ම පිටකය

| | | | | |
|---|---|---|---|---|
| 1 ධම්මසංගණිප්පකරණ | 1 පරමත්ථ දේසනා | අත්ථසාලිනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 2 විභංගප්පකරණ | 2 යථාධම්ම සාසන | සම්මොහ විනොදනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 3 නාමරූප පරිච්ඡේද කථා | | | |
| 3 කථාවත්ථුප්පකරණ | | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ | | | | |
| 5 ධාතුකථාප්පකරණ | | පරමත්ථදීපනී | | |
| 6 යමකප්පකරණ | | පඤ්චප්පකරණට්ඨකථා | | |
| 7 පට්ඨානප්පකරණ | | | | |

## සූත්‍ර පිටකය

| | | | |
|---|---|---|---|
| 1 දීඝනිකාය | 1 වොහාරා දේශනා | සුමංගල විලාසිනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 මජ්ඣිමනිකාය | 2 යථානුලෝමසාසන | පපඤ්ච සූදනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 සංයුක්තනිකාය | 3 දිට්ඨි විනිවෙඨන කථා | සාරත්ථප්පකාසිනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 4 අංගුත්තරනිකාය | | මනෝරථපූරණී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 5 ඛුද්දක නිකාය | | | |
| 1 ඛුද්දකපාඨ | පරමත්ථ ජෝතිකා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 ධම්මපද | ධම්මපදට්ඨ කථා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 උදාන | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 4 ඉතිවුත්ථක | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 5 සුත්තනිපාත | පරමත්ථ ජෝතිකා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 6 විමානවත්ථු | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 7 පේත වත්ථු | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 8 ථේර ගාථා | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 9 ථෙරී ගාථා | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 10 ජාතක | ජාතකට්ඨකථා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 11 නිද්දේස (චුල්ල-මහා) | සද්ධම්ම ජෝතිකා | | උපසේන ආචාර්ය 6වන ශ.ව. |
| 12 අපදාන (ථේර-ථෙරී) | විසුද්ධ ජන විලාසනී | | මහානාම ආචාර්ය 7වන ශ.ව. |
| 13 පටිසම්භිදා මග්ග | සද්ධම්මප්පකාසිනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 14 බුද්ධවංස | මධුරත්ථප්පකාසිනී | | බුද්ධදත්ත හිමි 5වන ශ.ව. |
| 15 චරියාපිටක | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| | විසුද්ධි මග්ග | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| නෙත්තිප්පකරණ | නෙත්තී අට්ඨකථා | | ධර්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| චතුභාණවාරපාළි | චතුභාණවාර අට්ඨකථා | | ආනන්ද වනරතන 8වන ශ.ව. |

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසින්ය.

## බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනී නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

### උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

### මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියන ලදී.

### ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - ප්‍රේතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියන ලදී.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථාචරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරිය වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුණු බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දූන දූනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින **ත්‍රිපිටක මුද්‍රණසභා** නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ පාම් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජුනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සවිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනි විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කරන ලදී. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනීනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරහේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාව හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපළම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතම්හ.

මෙයට,

ශාසනස්ථිතිකාමී,

**කිරම විමලජෝති ස්ථවිර,**
අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ
# අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ශ්‍රී සුමංගල නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල අනුනායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආදාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත තුඹුල්ලේ ධම්මානන්ද නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පැල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවතානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බමුරුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පත්තල සුමේධ හිමිපාණන් වහන්සේ

| | |
|---|---|
| රාජකීය පණ්ඩිත | කීර්ති නාරම්පනාව මහතා |
| ශාස්ත්‍රවේදී | ඇන්.එච්. පෙරේරා මහතා |
| පණ්ඩිත | ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා |
| පණ්ඩිත | ටී.ජී. ජයතිලක මහතා |
| පණ්ඩිත | ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා |
| පණ්ඩිත | බී.ඇම්.පී. බාලසූරිය මහතා |
| පණ්ඩිත | සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා |
| පණ්ඩිත | දයා ගුණසේකර මහතා |
| පණ්ඩිත | ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා |
| පණ්ඩිත | ජිනදාස ගොඩකන්ද මහතා |
| පණ්ඩිත | ලසිත් නලන්ත මහතා |
| පණ්ඩිත | පී.ඇල්.කේ. පෙරේරා මහතා |

**සම්බන්ධීකරණය:-** විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ
# අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
6. පණ්ඩිත දයා ගුණසේකර මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
7. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
8. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
9. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

# සංඥාපනය

පටිසම්භිදා යන වචනය විශ්ලේෂණාත්මක ඥාණය වශයෙන් අර්ථ දක්වා ඇත. අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන යන සිව්පිළිසිඹියාවන් ලැබීමට විශේෂ විභාග දැනීම අවශ්‍ය හෙයින් ඒ විශේෂ විභාග දැක්වීම පටිසම්භිදා මග්ගයෙන් විස්තර කෙරේ. රහත් ඵලය වඩාත් සම්භාවනීය වන්නේ සිව්පිළිසිඹියාවන් සහිත වීමෙනි.

මෙම ග්‍රන්ථයට පටිසම්භිදා මග්ග යන නම යෙදීමේ උචිත බව ග්‍රන්ථයේම විස්තර කරයි. සතර ප්‍රතිසම්භිදාවන්ගේ මාර්ගය පටිසම්භිදා මග්ග වශයෙන් ද, විවිධාකාර භේද භින්න ගැඹුරු අර්ථ තිබෙනුයි ප්‍රකරණ වන්නේ යයි ද එහි දැක්වේ. එය අර්ථ සම්පන්නය. ගැඹුරුය. ලොකෝත්තර භාවයන් ප්‍රකාශ කරන්නේය යනුවෙන් ද එහිම දැක්වේ.

පටිසම්භිදා මග්ග අට්ඨකථාවේ ආරම්භක ගාථාවල සඳහන් වන්නේ 'අවොක්කමනෙතා සමයා සකාච - අනාමසනෙතා සමයං පරඤ්ච' යනුවෙනි. අන්‍ය ආගම් වාද ස්ව සමය හා ස්පර්ශ නොකරමින් පටිසම්භිදා මග්ගට්ඨ කථාව කරන බව මෙයින් දැක්වේ. ස්ව සමය නම් බුදු සමයයි. වර්තමානයේ සමහර පිරිසක් දරණ 'සෑම ආගමකම දැල්වෙන්නේ එකම පහනය' යන මිථ්‍යාදෘෂ්ටියට මෙය හොඳ පිළිතුරකි. පරවාදයන්ගෙන් බුදුසමය වෙන්කර පිරිසිදුව පවත්වා ගැනීම එහි අදහසයි.

මෙහි මහා වග්ග, යුගනද්ධ වග්ග, පඤ්ඤා වග්ග යයි වර්ග තුනෙකි. මහා වර්ගයෙහි ඤාණ කථා, දිට්ඨි කථා, ආනාපාන, ඉන්ද්‍රිය, විමොක්ඛ, ගති, කම්ම, විපල්ලාසා, මග්ග, මණ්ඩපෙය්‍ය, කථා යයි කථා දහයක්ද, යුගනද්ධ වර්ගයෙහි යුගනද්ධ, සච්ච, බොජ්ඣංග, මෙත්තා විහාර, පටිසම්භිදා ධම්මචක්ක, ලෝකුත්තර, බලල, සුඤ්ඤතා, වශයෙන් කථා දහයක් ද, පඤ්ඤා වර්ගයෙහි මහා පඤ්ඤ, ඉද්ධි, අභිසමය විවේක, චරියා, පාටිකාරිය, සමසීස, සතිපට්ඨාන, විපස්සනා, මාතිකා කථා යනුවෙන් කථා දහයක ද වශයෙන් විස්තර කිරීම් තිහක් වෙති. ධම්මචක්කපපවත්තන සූත්‍රය පිළිබඳව මනා විස්තරයක් ප්‍රශ්න උත්තර වශයෙන් දැක්වේ.

අභිධර්මය සූත්‍ර පිටකය පාදක කරගනිමින් වර්ධනය වූයේය යන විද්වත් මතය ඉදිරිපත් කරන විද්වත්හු පටිසම්භිදා මගගය අභිධර්ම පෝෂණයට ඉවහල් වූ අයුරු දක්වයි. විභංගයේ විවිධ කොටස් පටිසම්භිදා මගගය මත අවලම්බිත වූ බව ආචාර්ය ලාහා පෙන්වා දෙයි. ථේරවාද පටිසම්භිදා මග්ගයේ හා සර්වාස්ති සම්ප්‍රදායේ ඥාන ප්‍රස්ථාන ශාස්ත්‍රයේ විෂය වස්තුව බොහෝසෙයින් සමානතා දක්වන බව ආචාර්ය වෙණිමාධව වාඩුවා විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇත. පටිසම්භිදා මග්ග අට්ඨ කථාවේ විශෙෂයෙන් සඳහන් කළ යුතු දේ වශයෙන්, විශුද්ධි මාර්ගයේ දක්වන අදහස් මෙහි එසේම නො පිළිගැනීම යයි අගගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියෝ පෙන්වා දෙති. උන්වහන්සේ ඒ සඳහා උදාහරණ කීපයක් පාලි සාහිත්‍යය නම් පොතේ දක්වති.

මිහිඳු මාහිමි ශිෂ්‍යයන් විසින් පටිසම්භිදා මග්ගයට කරන ලද හෙළටුවාව කුමාර ධාතුසේන රජුගේ රජෙඡාදයෙන් තුන්වැන්නෙහි මහානාම තෙර කෙනෙකුන් විසින් සද්ධම්මප්පකාසනී නමින් පාලියට පරිවර්තනය කර ඇත. ධාතුසේන රජතුමාගේ මයිළණුවන් වූ මහානාම තෙරුන් උන්වහන්සේ යයි ද සැලකෙති.

පටිසම්භිදා මග්ගය ඛුද්දක නිකායයේ දොළොස්වෙනි ග්‍රන්ථයයි.

---

# බැති පුද

පටිසම්භිදා මග්ග අට්ඨකථාවේ නවතම සිංහල පරිවර්තනය සමාප්තියෙහි ලා ප්‍රදානිත සදුපදේශයන් වෙනුවෙන් මිදිගම පුරාණ විහාරාධිපති රාජකීය පණ්ඩිත මුල්කිරිගල රතනසිරි නාහිමිපාණන් වහන්සේ කෘතවේදීව සමරමි.

**පරිවර්තක**

# පටුන

පිටු අංකය

## මහා වර්ගය


| | | |
|---|---|---|
| 01. | ඤාණ කථා මාතිකා උද්දෙස වාර වර්ණනාව | 01 |
| 02. | විසඳුම් අර්ථ වර්ණනාව | 60 |
| 03. | අභිඤ්ඤෙය්‍ය නිර්දේශ වර්ණනාව | 65 |
| 04. | පරිඤ්ඤෙය්‍ය නිර්දේශ වර්ණනාව | 109 |
| 05. | පහාතබ්බ නිර්දේශ වර්ණනාව | 109 |
| 06. | භාවිතබ්බ නිර්දේශ වර්ණනාව | 116 |
| 07. | සච්ඡිකාතබ්බ නිර්දේශ වර්ණනාව | 123 |
| 08. | හානභාගී චතුෂ්ක නිර්දේශ වර්ණනාව | 133 |
| 09. | ලක්ෂණත්‍රික නිර්දේශ වර්ණනාව | 138 |
| 10. | දුක්ඛ සත්‍යය නිර්දේශ වර්ණනාව | 139 |
| 11. | සමුදය සත්‍යය නිර්දේශ වර්ණනාව | 156 |
| 12. | නිරෝධ සත්‍යය නිර්දේශ වර්ණනාව | 158 |
| 13. | මාර්ග සත්‍යය නිර්දේශ වර්ණනාව | 160 |
| 14. | චතුරාර්ය සත්‍ය ප්‍රකීර්ණක වර්ණනාව | 195 |
| 15. | ශ්‍රැතමයෙ ඤාණ නිර්දේශ වර්ණනාව | 199 |
| 16. | සීලමය ඤාණ නිර්දේශ වර්ණනාව | 200 |
| 17. | සමාධි භාවනාමය ඤාණ නිර්දේශ වර්ණනාව | 229 |
| 18. | ධර්මස්ථිති ඤාණ නිර්දේශ වර්ණනාව | 237 |
| 19. | සම්මර්ශන ඤාණ නිර්දේශ වර්ණනාව | 244 |
| 20. | උදයව්‍යය ඤාණ නිර්දේශ වර්ණනාව | 251 |
| 21. | භංගානුපස්සනා ඤාණ නිර්දේශ වර්ණනාව | 255 |
| 22. | ආදීනව ඤාණ නිර්දේශ වර්ණනාව | 260 |
| 23. | සංස්කාරුපේක්ෂා ඥාන නිර්දේශ වර්ණනාව | 262 |
| 24. | ගෝත්‍රභූ ඤාණ නිර්දේශ වර්ණනාව | 271 |
| 25. | මාර්ග ඤාණ නිර්දේශ වර්ණනාව | 273 |

26. ඵල ඤාණ නිර්දේශ වර්ණනාව 278
27. විමුක්ති ඤාණ නිර්දේශ වර්ණනාව 278
28. ප්‍රත්‍යවේක්ෂා ඤාණ නිර්දේශ වර්ණනාව 279
29. වස්තු නානත්ව ඤාණ නිර්දේශ වර්ණනාව 281
30. ගෝචර නානත්ව ඤාණ නිර්දේශ වර්ණනාව 282
31. චර්යා නානත්ව ඤාණ නිර්දේශ වර්ණනාව 283
32. භූමි නානත්ව ඤාණ නිර්දේශ වර්ණනාව 287
33. ධර්ම නානත්ව ඤාණ නිර්දේශ වර්ණනාව 292
34. ඤාණ පඤ්චක නිර්දේශ වර්ණනාව 295
35. ප්‍රතිසම්භිදා ඤාණ නිර්දේශ වර්ණනාව 296
36. ඤාණත්‍රය නිර්දේශ වර්ණනාව 297
37. ආනන්තරික සමාධි ඤාණ නිර්දේශ වර්ණනාව 298
38. අරණ විහාර ඤාණ නිර්දේශ වර්ණනාව 301
39. නිරෝධ සමාපත්ති ඤාණ නිර්දේශ වර්ණනාව 302
40. පරිනිර්වාණ ඤාණ නිර්දේශ වර්ණනාව 310
41. සමසීසට්ඨ ඤාණ නිර්දේශ වර්ණනාව 310
42. සල්ලෙකට්ඨ ඤාණ නිර්දේශ වර්ණනාව 312
43. විරියාරම්භ ඤාණ නිර්දේශ වර්ණනාව 314
44. අර්ථ සන්දර්ශන ඤාණ නිර්දේශ වර්ණනාව 315
45. දර්ශන විසුද්ධි ඤාණ නිර්දේශ වර්ණනාව 315
46. ක්ෂාන්ති ඤාණ නිර්දේශ වර්ණනාව 318
47. ප්‍රදේශ විහාර ඤාණ නිර්දේශ වරණනාව 318
48. විවට්ට ඤාණ චක්‍ර නිර්දේශ වර්ණනාව 321
49. ඉද්ධිවිධ ඤාණ නිර්දේශ වර්ණනාව 324
50. ශ්‍රොතධාතු විශුද්ධි ඤාණ නිර්දේශ වර්ණනාව 333
51. චෙතොපරිය ඤාණ නිර්දේශ වර්ණනාව 335
52. පූර්වේනිවාසානුස්මෘති ඤාණ නිර්දේශ වර්ණනාව 336
53. දිව්‍ය චක්ෂු ඤාණ නිර්දේශ වර්ණනාව 357
54. පඤ්ච ඤාණ ප්‍රකීර්ණක නිර්දේශ වර්ණනාව 362
55. ආශ්‍රවක්ෂය ඤාණ නිර්දේශ වර්ණනාව 363
56. සත්‍ය ඤාණ චතුෂ්ක ද්වය නිර්දේශ වර්ණනාව 365
57. සුද්ධික ප්‍රතිසම්භිදා ඤාණ නිර්දේශ වර්ණනාව 368

| | | |
|---|---|---|
| 58. | ඉන්ද්‍රිය පරෝ පරියත්ත ඥාණ නිර්දේශ වර්ණනාව | 368 |
| 59. | ආසයානුසය ඥාණ නිර්දේශ වර්ණනාව | 372 |
| 60. | යමක ප්‍රාතිහාර්ය ඥාණ නිර්දේශ වර්ණනාව | 379 |
| 61. | මහා කරුණා ඥාණ නිර්දේශ වර්ණනාව | 382 |
| 62. | සර්වඥතා ඥාණ නිර්දේශ වර්ණනාව | 405 |
| 63. | ආශ්වාද දෘෂ්ටි වර්ණනාව | 411 |
| 64. | ආත්මානුදෘෂ්ටි වර්ණනාව | 420 |
| 65. | අන්තර්ග්‍රාහික දෘෂ්ටි වර්ණනාව | 427 |
| 66. | පූර්වාන්තාපරන්ත දෘෂ්ටි කථා වර්ණනාව | 430 |
| 67. | ආනාපාන සති කථා | 442 |
| | ගණන් වාර වර්ණනාව | 443 |
| | සොළොස් ඥාණ නිර්දේශ වර්ණනාව | 443 |
| | උපක්ලේශ ඥාණ නිර්දේශ වර්ණනාව | 444 |
| | ව්‍යවදාන ඥාණ නිර්දේශ වර්ණනාව | 448 |
| | සතොකාරි ඥාණ නිර්දේශ වර්ණනාව | 463 |
| | ආනාපාන සති මාතෘකා වර්ණනාව | 475 |
| | දීර්ඝ ආශ්වාස ප්‍රශ්වාස නිර්දේශ වර්ණනාව | 479 |
| | ඥාණ රාශි ෂට්ක නිර්දේශ වර්ණනාව | 500 |
| 68. | ඉන්ද්‍රිය කථා වර්ණනාව | 502 |
| 69. | විමෝක්ෂ කථා වර්ණනාව | 528 |
| 70. | ගති කථා වර්ණනාව | 552 |
| 71. | කර්ම කථා වර්ණනාව | 556 |
| 72. | විපර්යාස කථා වර්ණනාව | 559 |
| 73. | මාර්ග කථා වර්ණනාව | 563 |
| 74. | මණ්ඩපෙය්‍ය කථා වර්ණනාව | 563 |


මහාවර්ග වර්ණනාව නිමි.

## යුගනන්ධ වර්ගය


01. යුගනන්ධ කථා වර්ණනාව 566
02. සත්‍ය කථා වර්ණනාව 579
03. බොධ්‍යංග කථා වර්ණනාව 586
04. මෛත්‍රී කථා වර්ණනාව 590
05. විරාග කථා වර්ණනාව 595
06. ප්‍රතිසම්භිදා කථා වර්ණනාව 597
07. ධර්මචක්‍ර කථා වර්ණනාව 605
08. ලෝකෝත්තර කථා වර්ණනාව 607
09. බලකථා වර්ණනාව 612
10. සුඤ්ඤතා කථා වර්ණනාව 622


යුගනන්ධ වර්ග (මධ්‍යම) වර්ණනාව නිමි.

## ප්‍රඥා වර්ගය


01. ප්‍රඥා කථා වර්ණනාව 632
02. ඍද්ධි කථා වර්ණනාව 651
03. අභිසමය කථා වර්ණනාව 691
04. විවේක කථා වර්ණනාව 695
05. චර්යා කථා වර්ණනාව 698
06. ප්‍රාතිහාර්ය කථා වර්ණනාව 698
07. සමසීසී කථා වර්ණනාව 700
08. සතිපට්ඨාන කථා වර්ණනාව 701
09. විදර්ශනා කථා වර්ණනාව 703
10. මාතෘකා කථා වර්ණනාව 707


ප්‍රඥා වර්ග වර්ණනාව නිමි.

# සද්ධම්මප්පකාසනී නම් වූ
# පටිසම්භිදාමග්ගට්ඨ කථා
## (සිංහල පරිවර්තනය)

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට
නමස්කාරය වේවා !

යො සබ්බ ලොකාතිග සබ්බ සොභා
යුත්තෙහි සබ්බෙහි ගුණෙහි යුත්තො
දොසෙහි සබ්බෙහි සවාසනෙහි
මුත්තො විමුත්තිං පරමඤ්ච දාතා

යමෙක් සියලු ලෝකයන් ඉක්මවා යන සියලු බැබලීම්වලින් යුක්ත වූයේ සියලු ගුණයන්ගෙන් යුක්ත වූයේ, මාගාත සහිත සියලු දෝෂයන්ගෙන් මිදුණේ, උතුම් විමුක්තිය දෙනුයේ,

නිච්චං දයාචන්දන සීත චිත්තො
පඤ්ඤා රවිජ්ජොතිත සබ්බනෙය්‍යො
සබ්බෙසු භූතෙසු තමග්ග භූතං
භූතත්ථනාථං සිරසා නමිත්වා

නිතර දයාව නමැති සඳුන් සිසිලෙන් යුත් සිතැතියේ, ප්‍රඥාව නමැති සූර්යාලෝකයෙන් බැබලුණු, සියල්ල දතුයේ, සියලු සත්ත්වයින් අතර අග්‍ර වූ, සියලු සත්ත්වයින්ගේ යහපතට පිහිට වන්නා වූ ඒ බුදුරදුන් සිරසින් නැමද,

යො සබ්බ සත්තෙසු මුනීව අග්ගො
අනන්ත සබ්බෙසු ජිනත්‍රජෙසු
ආහු දයා ඤාණ ගුණෙහි සත්‍ථු
ලීලානුකාරි ජනතා හිතෙසු

යමෙක් සියලු සත්ත්වයින් කෙරෙහිද අනන්තාපරිමාණ බුද්ධ පුත්‍රයින් කෙරෙහිද, ශ්‍රේෂ්ඨ මුනිවරයෙකු බඳුව, ජනතා හිතසුව කාර්යයන්හි දයා ඤාණ ගුණයන්ගෙන් යුක්තව, බුදුරදුන්ගේ, ආකාරයන් අනුකරණය කෙරේයයි කීහුද,

තං සාරිපුත්තං මුනි රාජ පුත්තං
ථෙරං ථිරානෙක ගුණාභිරාමං
පඤ්ඤා පභාවුග්ගත චාරු කිත්තිං
සුසන්ත වුත්තිඤ්ච අථො නමිත්වා

ස්ථිර නොයෙක් සිත්කලු ගුණයන්ගෙන් යුත්, ප්‍රඥාලෝකයෙන් උද්ගත මනොඥ කීර්තියක් ඇති, සන්සුන් පැවැතුම් ඇති, මුනිරද පුත් ඒ සැරියුත් හිමියන් නැමද,

සද්ධම්ම චක්කානු පවත්තකෙන
සද්ධම්ම සෙනාපති සාවකෙන
සුත්තෙසු වුත්තෙසු තථාගතෙන
භූතත්‍ථ වෙදිත්ත මුපාගතෙන

තථාගතයාණන් වහන්සේ විසින් සූත්‍රයන්හි දේශිත සද්ධර්ම චක්‍රය නොකඩවා පවත්වාගෙන එන, සත්ත්වහිතාභිවෘද්ධිය දත් බවට සපැමිණි සද්ධර්ම සේනාපති ශ්‍රාවකයාණන් වහන්සේ විසින්,

යො භාසිතො භාසිත කොවිදෙන
ධම්මප්පදීපුජ්ජල නායකෙන
පාඨො විසිට්ඨො පටිසම්භිදානං
මග්ගොති තන්නාම විසෙසිතොව

කීමෙහි බිණීමෙහි දක්‍ෂ, ධර්ම ප්‍රදීපයෙන් බබලන ප්‍රධානියෙකු විසින්, ප්‍රතිසම්භිදාවන්ගේ මාර්ගයයි යම් පාඨයක් විශිෂ්ටත්වයෙන් කියන ලද්දේද? එම නාමය විශේෂයෙන් සලකා,

විචිත්ත නානත්ත නයොපගාළ්හා
ගම්භීර පඤ්ඤෙහි සදාවගාළ්හා
අත්තත්ථ ලොකත්ථ පරායණෙහි
සංසෙවනීයො සුජනෙහි නිච්චං

විසිතුරු නොයෙක් ක්‍රමයන්හි බැසගත්තේ, ගැඹුරු නැණැතියන් විසින් හැමකල් බැසගත්තේ, ආත්මාර්ථ ලෝකාර්ථ පිහිටකොට ඇති (අපේක්ෂිත) සත්පුරුෂයන් විසින් නිතර සේවනය කටයුතුය.

ඤාණප්පභෙදාවහනස්ස තස්ස
යොගීහි නෙකෙහි නිසෙවිතස්ස
අත්ථං අපුබ්බං අනුවණ්ණයන්තො
සුත්තඤ්ච යුත්තිඤ්ච අනුක්කමන්තො

නොයෙක් යෝගීන් විසින් සෙවුණා ලද ඤාණ ප්‍රභේද ගෙන එන එහි පෙර නොදක්වන ලද අර්ථ, සූත්‍රයද, යුක්තියද අනුක්‍රමයෙන් ගෙන, විශේෂයෙන් වර්ණනා කරනුයේ,

අවොක්කමන්තො සමයා සකාව
අනාමසන්තො සමයං පරඤ්ච
පුබ්බාපදෙසට්ඨකථා නයඤ්ච
යථානුරූපං උපසංහරන්තො

ස්වකීය සමය නොඉක්මවමින්, අන්‍ය ආගම් වාද ස්පර්ශ නොකරමින් පූර්වයෙහි පැවති අර්ථ කථා ක්‍රමයන්, සුදුසු පරිද්දෙන් ගෙනහැර දක්වනුයේ,

වක්ඛාමහං අට්ඨකථං ජනස්ස
හිතාය සද්ධම්ම චිරට්ඨිතත්ථං
සක්කච්ච සද්ධම්ම පකාසනිං තං
සුණාථ ධාරෙථ ච සාධු සන්තො

සද්ධර්මයාගේ චිරස්ථිතිය උදෙසාද, ජනහිත සුව සඳහාද, එම සද්ධර්ම ප්‍රකාසනිය මම කියමි. සත්පුරුෂ සාධූහු එය මනාසේ අසත්වා! දරත්වා!

**පටිසම්භිදානං මග්ගොති තන්නාම විසෙසිතොව** යනුවෙන් කියන ලද හෙයින් ප්‍රතිසම්භිදා මාර්ගයාගේ, ප්‍රතිසම්භිදා මාර්ගතාවය පළමුකොට කිවයුතුය.

ප්‍රතිසම්භිදා සතරක් වන්නේය. අර්ථ ප්‍රතිසම්භිදා, ධර්ම ප්‍රතිසම්භිදා, නිරුක්ති ප්‍රතිසම්භිදා, ප්‍රතිභාන ප්‍රතිසම්භිදා යනු ඒවා වෙති. ඒ ප්‍රතිසම්භිදාවන්ගේ මාර්ගය නවලොව්තුරු දහමයයි කියනු ලබන අධිගමයට උපාය මාර්ගය වේනුයි ප්‍රතිසම්භිදා මාර්ග නම් වේ. ප්‍රතිසම්භිදා ලැබීමට හේතුවේයයි කියන ලදී.

කෙසේ මෙය ඒවාට පැමිණීමේ මාර්ගය වේද යත්? විවිධාකාරයෙන් දේශනා කරන ලද දේශනාවන්ගෙන් ප්‍රතිසම්භිදා ඥානය ගෙන එන බැවිනි. නොයෙක් කොටස්වලට කැඩුණු ධර්මයන්ගේ නොයෙක් කොටස්වලට කැඩුණු දේශනා අසන ආර්ය පුද්ගලයන්ට ප්‍රතිසම්භිදා ඥාන ප්‍රභේද (කොටස්) හැඳින ගැනීමට හැකිවෙයි. පෘථග්ජනයින්ට මතු මත්තෙහි ප්‍රතිසම්භිදා ඥාන විශේෂ ලබාගැනීමට උපකාරී වේ.

කියන ලද්දේද වේ. ප්‍රභේද වශයෙන් වනාහි එකට සනව ඇති දෑ වෙන්කොට දක්වන දේශනාව ප්‍රතිසම්භිදා ඥාන ගෙන එන්නේ වෙයි. (උපදවයි). මෙයද නොයෙක් ආකාර බිඳුම්වලින් බිඳී ඇති දේශනාවකි. එහෙයින් මෙය ඒ ප්‍රතිසම්භිදාවන්ගේ මාර්ග සිද්ධියට අදාළ වර්ණනයකි.

එහි **චතසෙසා** යනු ගණන්කොට වෙන් කිරීමයි. **පටිසම්භිදා** යනු ප්‍රභේදයි. වෙන් කිරීමයි. එහි අර්ථයෙහි ඥාණය අර්ථ ප්‍රතිසම්භිදාවයි. ධර්මයෙහි ඥාණය ධර්ම ප්‍රතිසම්භිදාවයි. අර්ථ, ධර්ම, ව්‍යාකරණ කී මෙහි (දැනීමෙහි) ඥාණය නිරුක්ති ප්‍රතිසම්භිදාවයි. ඥාණයන්හි ඥාණය ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවයයි කියන ලද හෙයින් වෙන අන් කිසිවක ප්‍රභේදයක් නොව මේ ඥාණයෙහිම ප්‍රභේදයි. එහෙයින් සතර ප්‍රතිසම්භිදා යනු ඥාණයන්ගේ සතරාකාර ප්‍රභේදයෝය යනු තේරුමයි. අර්ථයෙහි ප්‍රභේද සිතා බැලීම විශේෂයෙන් සලකා බැලීම, වෙන්කොට තේරුම් ගැනීමට දක්ෂ වූ අර්ථයෙහි ප්‍රභේදගත ඥාණය **අත්ථ පටිසම්භිදා** යි. ධර්මයෙහි ප්‍රභේද සිතා බැලීම විශේෂයෙන් සලකා බැලීම වෙන්කොට තේරුම් ගැනීමට දක්ෂ වූ ධර්මයෙහි ප්‍රභේදගත ඥාණය **ධම්මපටිසම්භිදා** යි. නිරුක්ති ප්‍රභේදයන්හි ප්‍රභේද සිතා බැලීම, විශේෂයෙන් සලකා බැලීම

වෙන්කොට තේරුම් ගැනීමට දක්ෂ වූ නිරුක්තියෙහි ප්‍රභේදගත ඤාණය **නිරුත්ති පටිසම්භිදා** යි වැටහීම් ප්‍රභේදයන්හි ප්‍රභේද සිතා බැලීම, විශේෂයෙන් සලකා බැලීම වෙන්කොට තේරුම් ගැනීමට දක්ෂ වූ ඤාණය **පටිභාන පටිසම්භිදා** යි.

එහි **අත්ථො** යනු සංක්ෂේපයෙන් හේතුව හා ඵලයයි. යම් හේතුවක් අනුසාරයෙන් පත්වේද, අවබෝධ කෙරේද, පමුණුවනු ලැබේද එහෙයින් එයට අර්ථයයි කියනු ලැබේ. ප්‍රභේද වශයෙන් වනාහි හේතුවකින් හටගත් යමක් වේද එයද, නිර්වාණය ද දේශිත ධර්මය, විපාකය, ක්‍රියාව යන මේ පස (5) අර්ථයයි දතයුතුය. ඒ අර්ථය මෙනෙහි කරන්නාට ඒ අර්ථයෙහි ප්‍රභේදගත ඤාණය අර්ථ ප්‍රතිසම්භිදාවයි. **ධම්මො** යනු සංක්ෂේපයෙන් ප්‍රත්‍යයයි. එය වනාහි ඒ ඒ දෙය නියම කරයිද පවත්වයිද පමුණුවයිද එහෙයින් ධර්මයයි කියනු ලැබේ. ප්‍රභේද වශයෙන් වනාහි, ඵලය නිපදවන හේතුව ද, ආර්ය මාර්ගය ද, බුද්ධ දේශනාව ද කුසලය ද, අකුසලය ද යන මේ කරුණු පහ ධර්මයයි දතයුතුය. ඒ ධර්මය මෙනෙහි කරන්නහුට ඒ ධර්මයෙහි ප්‍රභේදගත ඤාණය ධර්ම ප්‍රතිසම්භිදා නම් වේ. අභිධර්මයෙහිද මෙම අර්ථයම වේ. දුකෙහි දැනුම අර්ථ ප්‍රතිසම්භිදාවයි. දුක හට ගැනුමෙහි ඤාණය (දැනුම) ධර්ම ප්‍රතිසම්භිදාවයි. දුක නිරුද්ධ කිරීමෙහි ඤාණය අර්ථ ප්‍රතිසම්භිදාවයි. දුක නිරුද්ධ කිරීමට පමුණුවන ප්‍රතිපදා ඤාණය ධර්ම ප්‍රතිසම්භිදාවයි.

හේතුවෙහි ඤාණය ධර්ම ප්‍රතිසම්භිදාවයි. හේතුවෙහි හා ඵලයෙහි ඤාණය අර්ථ ප්‍රතිසම්භිදාවයි. යම් ධර්ම කෙනෙක් උපන්නේද, ඇතිවීද, හටගත්තේද, උපන්නේද, විශේෂයෙන් උපන්නේද, පහළ වූයේද මේ ස්වභාවයන්හි ඤාණය අර්ථ ප්‍රතිසම්භිදා නම්. යම් ස්වභාවයකින් ඒ ස්වභාවයන් උපන්නේද, ඇතිවීද, හටගත්තේද, උපන්නේද, විශේෂයෙන් හටගත්තේද, පහළවූයේද, ඒ ස්වභාවයන්හි ඤාණය ධර්මප්‍රතිසම්භිදාවයි. ජරාමරණ පිළිබඳ දැනුම අර්ථ ප්‍රතිසම්භිදාවයි. ජරාමරණ නැති කිරීමෙහි ඤාණය අර්ථ ප්‍රතිසම්භිදාවයි. ජරාමරණ නිරුද්ධ කිරීමට පමුණුවන ප්‍රතිපදාවෙහි ඤාණය ධර්ම ප්‍රතිසම්භිදාවයි. උපතෙහි ඤාණය -පෙ- භවයෙහි ඤාණය -පෙ- දැඩිව ගැනීමෙහි ඤාණය -පෙ- ස්පර්ශයෙහි ඤාණය -පෙ- ආයතන සයෙහි ඤාණය -පෙ- නාමය හා රූපයෙහි ඤාණය -පෙ- විඤ්ඤාණයෙහි ඤාණය -පෙ- සංස්කාරයන්හි ඤාණය අර්ථ ප්‍රතිසම්භිදාවයි. සංස්කාර හටගැනීමෙහි ඤාණය ධර්ම

ප්‍රතිසම්භිදාවයි. සංස්කාර නිරෝධයෙහි ඥාණය අර්ථ ප්‍රතිසම්භිදාවයි. සංස්කාර නිරෝධයට පමුණුවන ප්‍රතිපදාවෙහි ඥාණය ධර්මප්‍රතිසම්භිදාවයි. මේ සස්නෙහි භික්ෂුව, සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වේදල්ල යන නවාංග ශාස්තෘ ශාසනයට අයත් ධර්මය දනීද? මෙය ධර්ම ප්‍රතිපදාවයැයි කියනු ලැබේ. (යුසේපි) හෙතෙම ඒ ඒ කියන ලද්දෙහි අර්ථය මේ මෙම කියන ලද්දෙහි අර්ථයය, මේ, මෙම කියන ලද්දෙහි අර්ථය යැයි අර්ථ දනීද මෙය අර්ථ ප්‍රතිසම්භිදාව යැයි කියනු ලැබේ. කුසල්දම් කවරහුද? යම් වෙලාවක සොම්නස් සහගත ඥාණ සම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිතක් උපන්නේ වේද, එය රූපයක් අරමුණුකොට හෝ වේද? -පෙ- ධර්මයක් අරමුණුකොට හෝ වේද? යම් යම් දැයක් අරමුණුකොට එසමයෙහි ස්පර්ශයෙක් වේද? -පෙ- අවික්ෂේපයක් වේද මෙම ධර්ම කුසල්යයි දනීද? මෙම ධර්මයන්හි ඥාණය ධර්ම ප්‍රතිසම්භිදාවයි. ඒවාහි විපාකයෙහි ඥාණය අර්ථ ප්‍රතිසම්භිදාවයි. ආදී ක්‍රමයෙන් විස්තර වශයෙන් බෙදා බෙදා දක්වන ලදී.

'අත්ථධම්මනිරුත්තාභිලාපෙඤාණං' යනු එම අර්ථයෙහිද, ධර්මයෙහිද යම් ස්වභාව නිරුක්තියක් අවිශේෂ ව්‍යවහාරයක් වේද, එහි අභිලාසයෙහි, භාෂණයෙහි, උදීරණයෙහි, එම ලපිතය, භාෂිතය, උදීරිතය ස්වභාව නිරුක්ති ශබ්දය අරමුණුකොට, ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට එම ස්වභාව නිරුක්ති අභිලාෂයෙහි නිරුක්තිය යයිද, මෙසේ එම ධර්ම නිරුක්ති සංඥීතාවයෙන්, ස්වභාව නිරුක්තියෙහි, සියලු සත්ත්වයින්ගේ මුල් භාෂාව වූ මාගධියෙහි ප්‍රභේදගත ඥාණය නිරුක්ති ප්‍රතිසම්භිදාවයි.

මෙසේ මේ නිරුක්ති ප්‍රතිසම්භිදාව ශබ්දයක් අරමුණු කොට හටගත්තේ වෙයි. ප්‍රඥප්තියක් අරමුණුකොට නොවේ. කුමක් හෙයින්ද යත්? ශබ්දයක් ශ්‍රවණය අසා මෙය ස්වභාව නිරුක්තියයිද, මෙය ස්වභාවික (උචිත) නිරුක්තිය නොවේයයි දැනගනීද, ප්‍රතිසම්භිදා ප්‍රාප්තවූවහු එසෙසා යන වචනය කී කල්හි මෙය ස්වභාව නිරුක්තිය යයි දැනගනීද එසස හෝ එසසනති යයි කී කල්හි මෙය ස්වභාවික නිරුක්තිය නොවේ යයි දැනගනීද වේදනාදී ශබ්දයන්හිද එසේමැයි. මෙහි විශේෂයක් නම් සමහරු නාම ආඛ්‍යාත උපසර්ග නිපාත ව්‍යංජනාක්ෂරාදි ශබ්ද දන්නාහු හෝ නොදන්නාහු වෙති. යම් වේලාවක සිට ශබ්දයක් අසා මෙය ස්වභාව නිරුක්තිය යයිද මෙය ස්වභාව නිරුක්තියක් නොවේයයි දැනගනීද, එතැන් සිට ඔහු එය තේරුම්ගෙන මෙය ප්‍රතිසම්භිදා කෘත්‍යයක් නොවේයයි

ප්‍රතික්ෂේප කොට භාෂාව සත්ත්වයෝ ඉගෙන ගනිත් යයි කියා පහත දැක්වෙන කරුණු ඉදිරිපත් කරයි. මව්පියවරු ළමයින් ළදරු වියෙහිදී ඇඳෙහි හෝ පුටුවෙහි හොවවා (හිටුවා) යම් යම් දේ කියන කල්හි ඒ ඒ කටයුතු කරති. දරුවෝ ඔවුන්ගේ ඒ කියමන් අසා මේ වචනයෙන් කියන ලද්දේ මෙයයි. මේ වචනයෙන් කියන ලද්දේ මෙයයි කරුණු තේරුම් ගනිති. කල් යත් යත්ම සියලුම භාෂාව දැනගනිති. මව දෙමළය, පියා ආන්ද්‍ර යයි ඔවුන්ට උපන් දරුවා ඉදින් ප්‍රථමයෙන් මවගේ කථා ශ්‍රවණය කරයිද එවිට දෙමළ බස කථා කරන්නේය. පියාගේ කථා කිරීම පළමුව ශ්‍රවණය කරයිද ආන්ද්‍ර භාෂාව කථා කරන්නේය. දෙදෙනාගේම කථා ශ්‍රවණය නොලදහොත් මාගධී භාෂාව කථා කරන්නේය. කථාකරන අන් කිසිවකු නොමැති ගමක් නුවූ මහා කැලයක යම් පුද්ගලයෙක් උපන්නේ වේද? ඔහුද ඔහුට උපතින් ලද ශක්තිය තුළින් වචන උපදවන්නේ මාගධී භාෂාවම කථා කරන්නේය. නිරයෙහි තිරිසන් යෝනියෙහි, ප්‍රේත ලෝකයෙහි, මිනිස්ලොව, දෙව්ලොව යන හැමතැනම මාගධී භාෂාවම උසස්ව පවතී. එහි අනෙක් අශිෂ්ටගොත්‍රික වැදි ආන්ද්‍රදෙශික, මුස්ලිම්, දෙමළ ආදී භාෂා කලින් කල වෙනස් වේ. බ්‍රහ්මයින් ආර්යයන් වැනි ශ්‍රේෂ්ට ගණයේ භාෂාව මාගධී භාෂාවයි. බුදුරජාණන් වහන්සේද ත්‍රිපිටක බුද්ධ වචනය පෙළට නගන්නේ මාගධී භාෂාවටම නැගූ සේක. කුමක් හෙයින්ද යත්? මෙසේ වූ විට තේරුම ගෙනහැර දැක්වීම පහසුයි. ප්‍රතිසම්භිදා පත් උතුමන්ට මාගධී භාෂාවෙන් පෙළට නැගූ ධර්මයෙහි අවබෝධ ප්‍රමාදය කණෙන්ද්‍රියට පැමිණීම පමණි. කණෙහි ගැටුණු සැණින් සියක් නයින් දහසක් නයින් (ක්‍රමයෙන්) අර්ථය වැටහෙයි. වෙනත් භාෂාවකින් පෙළට නැගූ බුදුදහම පෙළ පෙළා (අති දුෂ්කරව) ඉගෙනගත යුතු වෙයි. බොහෝකොට උගත් නමුදු පෘථග්ජනයින්ට ප්‍රතිසම්භිදා ප්‍රාප්තියක් නම් නැත. ප්‍රතිසම්භිදාවට නොපැමිණි ආර්ය ශ්‍රාවකයෙක් නම් නැත.

ඥාණෙසු ඥාණං යනු හැමතැන නුවණ අරමුණුකොට සිහි කරන්නහුට ඒ ඥාණයෙහි ප්‍රභේදගත ඥාණය කියන ලද ත්‍රිවිධ ඥාණයන්හි ගෝචර කෘත්‍ය ආදී වශයෙන් විස්තර කරන ලද ඥාණය ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවයි. මේ සතර ප්‍රතිසම්භිදා දෙතැනකදී ප්‍රභේදයකට (වෙන් කිරීමට) නයයි කරුණු පසකින් (5) ප්‍රකට වේ යයි දතයුතුය. කවර දෙතැනක ප්‍රභේදයට යයිද? ශෛක්‍ෂ්‍ය, අශෛක්‍ෂ්‍ය වශයෙනි. එහි, සැරියුත් මහමුගලන්, මහාකාශ්‍යප, මහා කච්චායන, මහාකොට්ඨිත ආදී අසූමහා

ශ්‍රාවකයන්ගේ ප්‍රතිසම්භිදා ප්‍රාප්තිය අශෛක්‍ෂ්‍ය භූමියෙහි වූයේ යයි වර්ග කළහැකිය. අනඳ තෙරුන්, චිත්‍ර ගෘහපති, ධම්මික උපාසක, උපාලි ගෘහපති, ඛුජ්ජුත්තරා උපාසිකාව යන මොවුන්ගේ ප්‍රතිසම්භිදා ප්‍රාප්තිය ශෛක්‍ෂ්‍ය භූමියේ වූයේ යයි වර්ග කළ හැකිය. මෙම භූමි දෙක අනුව කොටස් දෙකකට යයි. (ගණන් ගැනේ) කවර කරුණු පහකින් (5) ප්‍රකට වෙයිද? අවබෝධයෙන් පර්යාප්තියෙන්, ශ්‍රවණයෙන්, (විමසීමෙන්) විචාරීමෙන් කලින් යෙදීමෙන්.

එහි අධිගම නම් රහත් බවට පැමිණීමයි. රහත්භාවයට පැමිණියහුට ප්‍රතිසම්භිදා ප්‍රකට වේ. **පරියත්ති** නම්. බුදුවදන්ය. එය ඉගෙන ගන්නහුට ප්‍රතිසම්භිදා ප්‍රකට වේ. **ශ්‍රවණ** නම් සද්ධර්මශ්‍රවණයයි. සකස්ව සිත එකඟකොට ධර්මය අසන්නාට ප්‍රතිසම්භිදා ප්‍රකට වේ. **විචාරීම** නම් පාලි අටුවාවන්හි ගැටපද, පදාර්ථ විනිශ්චය කථා ඉගෙනගත් පාලි ආදී භාෂාවන්හි අර්ථය විමසන්නහුට ප්‍රතිසම්භිදා ප්‍රකට වේ. **පූර්වයෝග** යනු පෙර බුදුවරුන්ගේ ශාසනයන්හි, යෝගාවචරතාවයෙන්, ඉදිරියට යාම, ආපසු ඒම ආදී ස්වභාවයෙන් අනුලෝමය දක්වා ගෝත්‍රභූ සමීපයට පැමිණි විදර්ශනා භාවනාවන්හි යෙදීම පූර්වයෝගාවචරයන් හට ප්‍රතිසම්භිදා ප්‍රකට වේ. මේ කරුණු පහෙන් (5) ප්‍රකට වේ. මෙම කරුණු අතර, උගතයුතු ධර්මය, ශ්‍රවණය, විමසීම යන කරුණු තුන ප්‍රභේදය සඳහා බලවත්ය. පූර්වයෝගය අධිගමයට බලවත් හේතුවකි. ඉහත කරුණු තුනට (3) හේතුවේද නොවේද, හේතු වේ. පර්යාප්තිය (ධර්මය ඉගෙනීම) ශ්‍රවණය, විමසීම යන මේවා පෙර ආත්මයන්හි වූයේ හෝ නොවූයේ හෝ වේවා පූර්වයෝගයෙන්ද මේ ආත්මයෙහි සංස්කාරයන්ගේ උත්පාද භංග යීති මෙනෙහි කිරීමකින් තොරව ප්‍රතිසම්භිදාවක් නම් නොමැත. මෙම දෙකම එකට එකතුව උපකාර ලබා ප්‍රතිසම්භිදා ප්‍රකට කෙරේ. සමහරු මෙසේ කීහ.

පුබ්බයොගො බාහුසච්චං - දෙසභාසාච ආගමො
පරිපුච්ඡා අධිගමො - ගරු සන්නිසසයො තථා
මිත්ත සම්පත්ති චෙවාති - පටිසම්භිද පච්චයා

වුත්තං, වුත්තංහෙතං, වුත්තානි

කියන ලදී. එය කියන ලද්දේමය. කියන ලදහ. කෙටි යෙදුමඃ- යූ.සේයි.

පූර්වයෝගය, බහුශ්‍රැත බව, දේශභාෂාව, ආගම විචෑරීම, අධිගමය, ගුරුන් ඇසුරු කිරීම, මිත්‍ර සම්පත්තිය හා මේවා ප්‍රතිසම්භිදාවට හේතුවේ. එහි පූර්වයෝගය කියන ලද පරිදිය. බහුශ්‍රැත බව නම් ඒ ඒ ශාස්ත්‍රයන්හිද, ශිල්පයන්හිද දක්‍ෂතාවයයි. දේසභාසා නම් එක්සියයක් භාෂාවන් හැසිරවීමේ දක්‍ෂතාවයයි. විශේෂයෙන් මාගධී භාෂාවේ දක්‍ෂතාවයයි. ආගම නම් යටත් පිරිසෙයින් බුද්ධදේශනාවේ ඕපම්ම වර්ගය පමණක්වත් මනාව අධ්‍යයනය කිරීමය. පරිපුච්ඡා නම් එක් ගාථාවක හෝ අර්ථ විනිශ්චය විචාරීමය. අධිගම නම් සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතරමග සතරඵල වේ. ගරු සනනසසය නම් ඇසූපිරූ තැන් බහුල (උගත් ප්‍රඥාවත්) ගුරුවරුන්ගේ ළඟ වාසය කිරීමයි. මිත්‍ර සමපතති යනු එබඳුම වූ මිත්‍රයින්ගේ ලැබීමයි. එහි බුදුවරුද, පසේබුදුවරුද, පූර්වයෝගයත්, අධිගමයත් නිසා ප්‍රතිසම්භිදාවන්ට පැමිණෙත්. ශ්‍රාවකයෝ ඉහත සඳහන් සෑම කරුණුය. ප්‍රතිසම්භිදාවන්ට පැමිණීමෙහිලා වෙන වෙන කර්මස්ථාන භාවනාවන්හි යෙදීමක් නම් නැත. ශෛක්‍ෂ්‍යයන්ට ශෛක්‍ෂ්‍ය ඵල විමුක්ති අන්තයෙහිද, අශෛක්‍ෂ්‍යයන්ට අශෛක්‍ෂ්‍ය ඵල විමුක්ති අන්තයෙහිද ප්‍රතිසම්භිදා ප්‍රාප්තිය වේ. බුදුවරුන්ට දසබලයන් මෙන් ආර්යයන්ට ආර්ය ඵලයෙහිදීම ප්‍රතිසම්භිදා ප්‍රාප්තිය සිදුවේ. මේ සතර ප්‍රතිසම්භිදාවන්ගේ මාර්ග යනුයි = ප්‍රතිසම්භිදා මාර්ග නම් වේ. ප්‍රතිසම්භිදා මාර්ග ප්‍රකරණයම= පටිසමභිදා මගගපපකරණ නම් වේ. ක්‍රමානුකූලව කරනු ලැබේ. කියනු ලැබේ. මෙහි විවිධාකාර භේදභින්න ගැඹුරු අර්ථ තිබේනුයි ප්‍රකරණ නම් වේ. ඒ මේ ප්‍රතිසම්භිදා මාර්ග ප්‍රකරණය අර්ථසම්පන්නයි. අක්‍ෂර සම්පන්නයි. ගැඹුරුයි. ගැඹුරු අර්ථ ඇත්තේය. ලෝකෝත්තර තාවයන් ප්‍රකාශ කරයි. ශූන්‍යතාවය හා ඒකාබද්ධව ඇත. ප්‍රතිපදාවන්හි යෙදීමෙන් ලබන විපාකය නමැති විශේෂතා ගෙන එයි. විරුද්ධතා වළකාලයි. යෝගාවචරයන්ට උතුම් ඤාණය නමැති රුවනාකරයක් වේ. ධර්ම කථිකයින්ට ධර්මකථා විලාසය පවත්වාගෙන යාමට විශේෂයෙන් ආධාර වේ. සසර බිය ඇතියවුන්ට දුකින් නික්මීමේ මාර්ගයයි. ඒ උපායමාර්ග දැකීමෙන් සැනසිල්ල හටගැනීමටත්, ඊට විරුද්ධ දෑ නැසීමටත්, ගැඹුරු අර්ථයන්ට නොයෙක් සූත්‍ර හා අපදානයන් මගින් අර්ථ විවරණය කරමින් හුදී ජන හෘදයන්හි ප්‍රීතිය හටගැන්වීම සඳහාත් තථාගත අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් හැමතැන අප්‍රතිහත සර්වඥතාඥාන මහා පහන් ආලෝකයෙන් සියලු ජනතාව වෙත පැතිරුණු මහා කරුණාව නමැති තෙලෙන් සිතිඳු වූ හෘදයෙන්, දම්දෙසීමෙන් හික්මවිය හැකි ජනතාවගේ හෘදයගත ක්ලේශාන්ධකාරයන් විනාශ කිරීමටත්, දල්වන

ලද සද්ධර්මය නමැති මහ පහනට ඒ අදහස් පැතිරවීමට ඉසින සිනිදු තෙලක් බඳු වූ, පන්දහසක් වස් නොවෙනස්ව බබලනු කැමැත්තෙන් ලෝකානුකම්පී වූ, ධර්මරාජයාණන් වහන්සේගේ දම්සෙනෙවි ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ කියමන අසා, ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් ප්‍රථම මහා ධර්ම සංගායනා කාලයෙහි ඇසූ පරිද්දෙන්ම සංගායනාවට නගන ලදී. එය විනය පිටකය, සූත්‍ර පිටකය, අභිධර්ම පිටකයයි යන ත්‍රිපිටකයන් අතර සූත්‍ර පිටකයට අයත් දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය යන පස්මහ නිකායන් අතර ඛුද්දක නිකායට ඇතුළත්, සූත්‍ර ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක ජාතක අබ්භුතධම්ම, වේදල්ල යන නව ශාස්තෘ ශාසන අංගයන් අතර හටගත් පරිදි (ඇතුළත් කරුණු අනුව)

**ද්වාසීතිං බුද්ධතො ගණ්හිං ද්වෙ සහස්සානි භික්ඛුතො**
**චතුරාසීති සහස්සානි යෙ මෙ ධම්මා පවත්තිනොති**

කරුණු පහකදී එතදග්‍රස්ථානයෙහි තබන ලද ධර්ම භාණ්ඩාගාරික තෙරුන් විසින් ගෙනහැරදැක්වූ අසූහාර දහසක් ධර්මස්කන්ධයන් අතර භික්ෂූන්ගෙන් ගත් දෙදහසක් ධර්මස්කන්ධයන්හි නොයෙක් සියගණන් ධර්මස්කන්ධයන් ඇතුළත්ව ඇත.

එහි වර්ගත්‍රයකි. මහා වර්ගය, මධ්‍යම වර්ගය, චූල වර්ගය (කුඩා) යනුවෙනි. එක් එක් වර්ගයෙහි දහය දහය බැගින් වූ ඤාණ කථා මුල්කොට මාතිකා කථා අවසන්කොට කථා තිංසකි. මෙසේ විවිධාකාරයෙන් හඳුන්වා ඇති මේ ප්‍රතිසම්භිදා මාර්ග ප්‍රකරණයෙහි අනුපිළිවෙළින් පෙර නුවූ පදවල (තේරුම් නුදුන්) අර්ථ පමණක් වර්ණනා කරන්නෙමු. මෙම ප්‍රකරණය පාඨ වශයෙන්, අර්ථ වශයෙන් ඉගැන්වීමෙහිද, විස්තර කිරීමෙහිද මනාව ඉගැන්විය යුතුය. විස්තර කළයුතුද වේ. ඉගෙන ගන්නන් විසින්ද ඉගෙන ගතයුතුය. දැරිය යුතුද වේ. (සිත්හි ධාරණය) ඊට හේතු කවරේද? ගැඹුරු බැවිනි. ලෝවැසියන්ගේ හිතසුව පිණිස පවතින මෙම ප්‍රකරණය ලෝකයෙහි බොහෝ කලක් නිවැරදිව පැවතීම සඳහාය.

ඒ තිහක් වූ කථා අතර ඤාණකථා කුමක් හෙයින් පළමුව කියන ලද්දේද යත්? කෙලෙස්මල පිරිසිදු කිරීමෙහිදී ඤාණය මුල්වේ. ප්‍රතිපත්ති කිරීමෙහිදීද මුල්වන හෙයිනි. භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේය.

එහෙයින් භික්ෂුව ඔබ මුලදීම කුසල් දහම් අතර සීල පාරිශුද්ධියද, දෘෂ්ටියෙහි ඍජුබවද පිරිසිදු කරව. ඍජු දෘෂ්ටිය යනු සම්‍යග් දෘෂ්ටි සංඛ්‍යාත ඤාණය දක්වයි. එහෙයින්ද ඤාණ කථාව පළමුව කියන ලදී.

අනෙකක්ද කියන ලදී. මහණෙනි, එහි සම්‍යග්දෘෂ්ටිය පූර්වාංගම වේ. මහණෙනි, කෙසේ සම්‍යග් දෘෂ්ටිය පූර්වාංගම වේද? සම්‍යග් දෘෂ්ටිය සම්‍යග් දෘෂ්ටියයි දනීද? මිථ්‍යා දෘෂ්ටිය මිථ්‍යා දෘෂ්ටියයි දනීද? එයම සම්‍යග් දෘෂ්ටිය වේ. සම්‍යග් සංකල්ප - සම්‍යග් සංකල්ප යයි දැනගනීද, මිථ්‍යා සංකල්ප මිථ්‍යා සංකල්පයයි දැනගනීද, සම්‍යග් වචන සම්‍යග් වචනයයි දැනගනීද, මිථ්‍යා වචන මිථ්‍යා වචනයයි දැනගනීද, සම්‍යග් කර්මාන්ත සම්‍යග් කර්මාන්ත යයි දැනගනීද, මිථ්‍යා කර්මාන්ත මිථ්‍යා කර්මාන්ත යයි දැනගනීද? සම්‍යග් ජීවනය සම්‍යග් ජීවනයයි දැනගනීද, මිථ්‍යා ජීවනය මිථ්‍යා ජීවනයයි දැනගනීද, සම්‍යග් ව්‍යායාමය සම්‍යග් ව්‍යායාමයයි දැනගනීද, මිථ්‍යා ව්‍යායාමය මිථ්‍යා ව්‍යායාමයයි දැනගනීද, සම්‍යග් සතිය (සිහිය) සම්‍යග් සතිය යයි දැනගනීද, මිථ්‍යා සතිය මිථ්‍යා සතිය යයි දැනගනීද, සම්‍යග් සමාධිය සම්‍යග් සමාධිය යයි දැනගනීද, මිථ්‍යා සමාධිය මිථ්‍යා සමධිය යයි දැනගනීද එය සම්‍යග් දෘෂ්ටිය වන්නේය. පූර්වාංගම වූ සම්‍යග් දෘෂ්ටියෙන් සිදුවූ, මිථ්‍යා දෘෂ්ටීන්ගේ මිථ්‍යා දෘෂ්ටි භාවය දැනගන්නේය යන්න සලකා සම්‍යග් දෘෂ්ටි සංඛ්‍යාත ඤාණය පිරිසිඳු කිරීමට මුලදීම ඤාණකථාව කියන ලදී.

තවද, උදායි සසරෙහි පූර්වාන්තය තිබීයේවා. අපරාන්තයද තිබීයේවා. ඔබට ධර්මය දේශනා කරමි. මෙය ඇතිකල්හි මෙය වේ. මෙය හටගැන්මෙන් මෙය හටගනී. මෙය නැතිකල්හි මෙය නොවේ. මෙහි නිරෝධයෙන් මෙය නිරුද්ධ වේයයි පූර්වාපරාන්ත දෘෂ්ටීන් අත්හැර ඤාණයම පිළිබඳව කියන ලද හෙයින් ඤාණකථාව මුලදී කියන ලදී. "සුභද්‍ර කම් නැත. එය තිබීයේවා. ඒ සියල්ලෝ ස්ව ප්‍රතිඥාවෙන් මනාව අවබෝධ කරගත්තාහුද? සියල්ලෝම මනාව අවබෝධ නොකළාහුද? නොහොත් ඇතමෙක් මනාව අවබෝධ කළාහුද? ඇතමෙක් මනාව අවබෝධ නොකළාහුද? සුභද්‍ර ඔබට ධර්මය දේශනා කරන්නෙමි. එය අසව. මනාකොට මෙනෙහි කරව. වදාරන්නෙමියි බොහෝ මහණ බමුණන් විසින් ගෙනහැර දක්වන නිවන් මගින් බැහැර වූ කරුණු පිළිබඳ වාද විවාද (බැහැරකොට) අත්හැර ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අදාළ කරුණු දේශනා කළ හෙයින්, එම අෂ්ඨාංගික මාර්ගයෙහිද සම්‍යක් දෘෂ්ටියයි

කියනු ලබන ඤාණය ප්‍රධාන බැවින් මුලදීම ඤාණ කථාව කියන ලදී. මහණෙනි, ශ්‍රෝතයට (සෝවාන් මාර්ගයට) පැමිණීමේ හේතුකාරක කරුණු හතරකි. (4) කි. ඒවානම් සත්පුරුෂ ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම, ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යන මේවායි. ශ්‍රද්ධාව හටගත් තැනැත්තා භික්ෂූන් සමීපයට එළඹෙයි. එළඹී ආශ්‍රය කරයි. ආශ්‍රය කරන්නේ කන් යොමුකරයි, යොමුකරන ලද කන් ඇත්තේ ධර්මය අසයි. ධර්මය අසා සිත්හි දරාගනියි. සිත්හි දරා ගත් ධර්මයන්ගේ අර්ථය ප්‍රඥාවෙන් විශේෂ පරීක්ෂාවට ලක් කරයි. අර්ථ පරීක්ෂා කරන්නේ අවබෝධය ලබාගනියි. අවබෝධය ලබා මාර්ගඵල සඳහා උත්සාහ කරයි. උත්සාහකොට සමානකොට බලයි. (කිරාබලයි) කිරාබලා ප්‍රධන්වීර්යය කරයි. ප්‍රධන්වීර්ය කරන්නේ (භාවනා කරන්නේ) කයින්ද, ප්‍රඥාවෙන්ද පරමාර්ථ සත්‍යය අවබෝධ කර්නේය.

"මේ ලොව තථාගතයාණන් වහන්සේ උපදිති. -පෙ- එතුමා මුල යහපත් වූ ධර්මය දේශනා කරයි යනාදී නොයෙක් සූත්‍ර පදවල ක්‍රමානුකූලව ශ්‍රවණයෙහි ඤාණය මුල්කොට ක්‍රමානුකූලව ඤාණකථාව මුලදීම කියන ලදී.

ඒ ඤාණකථාව උද්දේස-නිද්දේස වශයෙන් දෙයාකාරයකි. උද්දේසයෙහි, කන් යොමුකිරීමේ ප්‍රඥාව සුතමය ඤාණයයි යනාදි ක්‍රමයෙන් දක්වන ලද හැත්තෑතුනක් වූ ඤාණයන්ද, මාතෘකා වශයෙන් දක්වන ලදී. නිර්දේශයෙහි (විස්තරයෙහි) කන් යොමුකිරීමේ නුවණ කෙසේ සුතමය ඤාණයක් වේද? මේ ධර්ම විශේෂයෙන් දතයුතුයයි කන් යොමුකොට දැනගැනීමේ ප්‍රඥාව සුතමය ඤාණයයි ආදි ක්‍රමයෙන් එම (73) හැත්තෑතුනක් වූ ඤාණයෝම විස්තර වශයෙන් නිර්දේශ කරන ලදහ. එහි, උද්දේශයෙහි පළමුව, **සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං** යන මෙහි සොත ශබ්දයෙහි විවිධාකාර අර්ථ බෙදීම් ඇත. ඒ මෙසේය.

**මංස විඤ්ඤාණ ඤාණෙසු - තණ්හාදිසුච දිස්සති**
**ධාරායං අරියමග්ගෙ - චිත්ත සන්තතියම්පිච**

"සොතායතන, සොතධාතු, සොතින්ද්‍රියං යනාදි තන්හි මෙම සොත ශබ්දය මාංශ ශ්‍රෝතසෙහි (කනෙහි) යෙදේ. **'සොතෙන සද්දං සුත්වා'**

යනාදි තැන්වල ශ්‍රෝත විඤ්ඤාණයෙහි යෙදේ. 'දිබ්බාය සොතධාතුයා' යනාදි තැන්වල ඤාණ ශ්‍රෝතස අදහස් කෙරේ. යම් ඒ ශ්‍රෝතස් කෙනෙක් මා විසින් වර්ණනා කරන ලද්දේද (විස්තර) දේශනා කරන ලද්දේද, පනවන ලද්දේද (දක්වන) පිහිටුවන ලද්දේද, පැහැදිලි කරන ලද්දේද, බෙදන ලද්දේද, ප්‍රකට කරන ලද්දේද, ප්‍රකාශ කරන ලද්දේද, එබඳු යම් ඒ ශ්‍රෝත්‍රස, දුශ්චරිත ශ්‍රෝතස අවිද්‍යා ශ්‍රෝතස ආදි තන්හි තෘෂ්ණා ආදි පංච ධර්මයන්හි යෙදේ. මහදරකඩක් ගංගා නදියේ සැඩ පහරට හසුව ගසාගෙන යනු බුදුරජාණන් වහන්සේ දුටු සේක. මෙහි සෝත යනු ජල දහරාවයි. ඇවැත්නි, යම් ඒ සෝතයයි නාමයක් වේද, එය ආර්ය අෂ්ඨාංගික මාර්ගයට යෙදෙන විශේෂ නාමයකි. මේ ආදි තැන්වල ආර්ය මාර්ගය අදහස් කරයි. මුල සිට පැවත එන මෙලොව පිහිටියා වූද පරලොව පිහිටියා වූද නොසිඳී පවත්නා විඤ්ඤාණ ශ්‍රෝතධාතුව පිළිවෙළින් දැනගනීද මෙහි චිත්ත සන්තතිය දැක්වේ. මෙහි වනාහි මාංශ ශ්‍රෝතසයයි සැලකිය යුතුය. (දැකිය යුතුය) එම ශ්‍රෝතස් හේතුවීමෙන් කරුණු වීමෙන් අවබෝධ කරගනී. වටහා ගනී. කන් යොමු කෙරේනුයි සොතාවධානයයි. ඒ කිමෙක්ද? ශ්‍රවණයයි. ඒ ශ්‍රවණය යනු කුමක්ද? ශ්‍රවණය නම් බොහෝ ඇසූ දේ ඇත්තේ, ඇසූ දේ දරාගන්නේ, ඇසූ දේ සිත්හි තැන්පත් කරන්නේ යනාදි තන්හි මෙන් ශ්‍රොතද්වාරානුසාරයෙන් දැනගත්, සැලකිල්ලට ගත්, ධර්ම කොටසක් වේද, එය මෙහි ශ්‍රෝතාවධානයයි කියන ලදී. එම ශ්‍රෝතාවධාන සංඛ්‍යාත ශ්‍රවණයෙහි පවත්නා ප්‍රඥාව

**සොතාවධානෙ පඤ්ඤා යි.**

පඤ්ඤා යනු ඒ ඒ අර්ථයාගේ ප්‍රකට කිරීම් සංඛ්‍යාත දැනගැනීම් අර්ථයෙන් ප්‍රඥා යයි කියනු ලැබේ. ඒ ඒ අනිත්‍යාදී ආකාරයෙන් ධර්මයන් දැනගනීනුයි ප්‍රඥා නම්.

**සුතමයෙ ඤාණං** යන මෙහි සුත ශබ්දය උපසර්ග සහිතවද, උපසර්ග රහිතවද යෙදේ.

**ගමනෙ විසසුතෙ තිනෙත'නුයොගො පචිතෙපිච**
**සදෙදච සොතදවාරානුසාර ඤාතෙච දිසසති**

ගමන් කිරීමෙහි, ප්‍රකට, රාගයෙන් තෙත් වූ, යෙදීමෙහි රැස් කිරීමෙහි, ශබ්දයෙහි, ශ්‍රෝතද්වාරයෙන් ලබාගත් දැනුම් දරන්නෙක් යන අර්ථයන්හි දිස්වේ.

එසේ වන්නේය.

**සෙනාය පසුතො** ආදී තන්හි ගමන් කරන්නේ යන අර්ථයි. **සුත ධම්මස්ස පස්සතො** ආදී තන්හි ප්‍රකට වූ ධර්මයෙහි යන අර්ථයි. **අපස්සුතා නවස්සුතස්ස පුරිස පුග්ගලස්ස** යනාදී තන්හි රාගයෙන් තෙත් නොවූ යන අර්ථයි.

යෙ **ඣාන පසුතා ධීරා** ආදී තන්හි යෙදෙන ලද්දාහු යන අර්ථයි. **තුමෙහහි පුඤ්ඤං පසුතං අනප්පකං** යන තන්හි රැස්කරන ලද්දේ යන අර්ථයි. **දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං** යන තන්හි ශබ්දය යන අර්ථයි. **බහුස්සුතොහොති සුතධරො සුත සන්නිචයො** යන තන්හි ශ්‍රෝත ද්වාර අනුසාරයෙන් උගත් දෑ ධාරණය කරන්නේ යන අර්ථයි. මෙහිද ශ්‍රෝතද්වාරානුසාරයෙන් දැනගත් දෑ සලකන ලද්දේ යන අර්ථයි. **සුතමයෙ ඤාණං** යනු යම් ආකාර ඇසූ, දැනගත්, අවධාරණය කළ ධර්මය අරභයා එය අරමුණුකොට සියල්ලට පළමුවද වරින්වරද හටගන්නා ප්‍රඥාවයි. එය සුතමය ඤාණයයි කියනු ලැබේ. සුතමය ඤාණය යන අර්ථයි. සුතමයෙ යනු ප්‍රථමා විභක්තියයි. **නහෙවං වත්තබ්බෙ, වනප්පගුම්බෙ, යථා ඵුස්සිතග්ගෙ, නත්‍ථි අත්තකාරෙ, නත්‍ථිපරකාරෙ, නත්‍ථි පුරිසකාරෙ** යනාදී තැන්වල ප්‍රථමා විභක්තිය යෙදේ. මෙහිද එසේ දතයුතුය. එහෙයින් කියන ලදී. සුතමය ඤාණය යන නම් වේ. ඒ ශ්‍රැතමය දහම් කොටසෙහි පැවති ඒ හා යෙදුණු ඤාණය ශ්‍රැතමය ඤාණයි.

ස්වභාව සමාන ලක්‍ෂණ වශයෙන් ධර්මයන් දනීනුයි ඤාණ නම් වේ. එම ධර්මයම වෙනත් වචනවලින් අදහස් ප්‍රකාශ කිරීම අතියමින් ප්‍රඥායයි කියා, පසුව ඤාණය අදහස් කරන ලද්දේ යයි නියමකොට කියන ලද්දේ යයි දතයුතුය. ඤාණයෙහි පහත සඳහන් ලක්‍ෂණ ඇත. ඇති තතු අවබෝධ කරගැනීම පැකිලීමකින් තොරව අවබෝධ කරගැනීම, දක්‍ෂ දුනු ශිල්පියෙකු විසින් විදින ලද ඊතලයක් බඳු වීම, පහනක් මෙන් අදාල විෂය බබලවන ස්වභාව ඇත්තේය. වනයට ගිය යහපත් මාර්ගෝපදේශකයකු මෙන් නුමුළාව නැගිටින ස්වභාව ඇත්තේය.

**සමාහිතො භික්ඛවෙ භික්ඛු යථාභූතං පජානාති** යන වචනයෙන් සමාධිය ආසන්න කරුණයි. ලක්‍ෂණාදීන් අතර ස්වභාවික තත්වය, සාමාන්‍ය තත්වය අවබෝධ කරගැනීම ලක්‍ෂණකොට ඇත. කෘත්‍යය හෝ සම්පත්තිය රසය වේ. වැටහෙන කාරණය හෝ ප්‍රතිඵලය එළඹ සිටි කරුණයි. ආසන්න කරුණ පදට්ඨාන යයි දතයුතුය.

**පාතිමොකඛා සතීචෙව ඤාණං ඛනති තථෙව ච**
**විරියඤච පඤචිමෙ ධමමා සංවරාති පකාසිතා**

මේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වූයේ, මනාව යුක්ත වූයේ එළඹියේ, මනාව එළඹියේ, හටගත්තේ, මනාව හටගත්තේ, යුක්ත වූයේ යයි දක්වන ලද්දේ ප්‍රාතිමෝක්ෂ සංවරයයි. ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් නොගනී. (අවයවයන් මනෝඥයයි නොසිතීම). අනුව්‍යංජන වශයෙන් (ස්ත්‍රී පුරුෂ වශයෙන්) නොගනී. යම් හේතුවක් නිසා චක්ෂුන්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට දැඩි ලෝභය, දොම්නස ආදී පාපි අකුසල සිතිවිලි ඔහු තදින් මැඩගෙන යන්නේද, එවැනි තත්වයන්ගෙන් තමන් වැළකී සංවරය සඳහා පිළිපදියි. (ක්‍රියා කරයි) චක්ෂුන්ද්‍රිය රකියි. චක්ෂුන්ද්‍රියයේ සංවරයට පැමිණේ යනාදි ක්‍රමයෙන් දැක්වූයේ සති සංවරයයි.
භාග්‍යවතුන් වහන්සේ අජිතයැයි අමතා,

**යානි සොතානි ලොකසමිං (අජිතානි භගවා)**
**සතිතෙසං නිවාරණං**
**සොතානං සංවරං බ්‍රෑමි**
**පඤඤායෙතෙ පිථීයරෙ**

ලෝකයෙහි යම්කිසි ශ්‍රෝතස් (ගලාබැසීම්) කෙනෙක් වෙත්ද, ඒවා සිහියෙන් වැළැක්විය යුතුය. ශ්‍රෝතසුන්ගේ සංවරය වදාරමි. ප්‍රඥාවෙන් ඒවා වසනු ලැබේ. මේ ඤාණ සංවරයයි.

මහණෙනි, කවර ආශ්‍රවයෝ සේවනයෙන් ප්‍රහාණ කළ යුතුද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව නුවණින් සලකා සිවුරු පරිභෝජනය කරයි ආදි ක්‍රමයෙන් දක්වා ඇත්තේ ප්‍රත්‍ය පරිභෝජන සංවරයයි. එයද ඤාණ සංවරයෙහිම සංග්‍රහ කරන ලදී. සීත, උෂ්ණ, සාගිනි, පිපාසා, මැසිමදුරු දෂ්ට, නොමනා අව්සුළං, සර්පදෂ්ට, නොමනාව කියන ලද වචන, නොමනාව පැමිණි වචන, දුක්වූ, දරුණුවූ, කර්කශ වූ කටුක වූ, අමිහිරි වූ, නොමනා වූ, ප්‍රාණය ඉවත්කර දැමීමට සමත්, උපන් ශාරීරික දුක් ඉවසන්නේ වේද, මේ ක්ෂාන්ති සංවරයයි.

උපන් කාම විතර්කය නොඉවසයි. අත්හරියි. දුරුකරයි. ඉවත්කරයි. නොමැති තත්වයට පත්කරයි යනුවෙන් දක්වන ලද්දේ වීර්ය සංවරයයි. මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම මිථ්‍යා ආජීවය හැර සම්‍යග් ආජීවයෙන්

ජීවිකාව ගෙන යයි දැක්වූයේ ආජීව පාරිශුද්ධි සංවරයයි. එය වීර්ය සංවරයෙහිම ඇතුළත්ය. ඒ සත් සංවරයන් අතර ප්‍රාතිමෝක්ෂ සංවරය, ඉන්ද්‍රිය සංවරය, ආජීව පාරිශුද්ධිය, ප්‍රත්‍යය ප්‍රතිසන්නිශ්‍රිත යන සතර සංවරය මෙහි අදහස් කරන ලදී. ඔවුන් අතරින්ද විශේෂයෙන් ප්‍රාතිමෝක්ෂ සංවර සීලය විශේෂයෙන් අදහස් කරන ලදී. මේ සියලුම සංවරයන් හැකි අයුරින් සංවරවිය යුතු කාය දුශ්චරිතාදීන් වළක්වන හෙයින් සංවරයයි කියනු ලැබේ. ශ්‍රැතමය ඤාණයෙහි කියන ලද ධර්මය අසා සංවර වන්නහුට සංවර කරන්නහුට, ඒ සංවරයෙහි පවතින, ඒ හා යෙදුණු ප්‍රඥාව 'සුත්වාන සංවරෙ පඤ්ඤායි' කියන ලදී, හෙවත් හේතු අත්ථෙ සුත්වා යන වචනයෙන් ප්‍රකාශ වන්නේ, ඇසීම් හේතුවෙන් ප්‍රඥාවෙන් සංවරවීමයි.

සීලමයෙ ඤාණං යන මෙහි සීල යනු හික්මීම යන අර්ථයෙන් සීල නම් වේ. මේ හික්මීම කුමක්ද? කාය කර්මාදීන්ගේ මනා පැවතුම නොවිසිරී එක්තැන් කිරීම යන අර්ථයි. කුසල් දහම් පිළිබඳ විශේෂයෙන් විමසා බැලීම හා පිහිටුවා ගැනීමට ආධාර වීම යන අර්ථයි. මෙම අර්ථ දෙකම ශබ්ද ලක්ෂණ දත් අය අනුමත කරති. තවත් සමහරු අධික සේවනාර්ථය, ආධාරාර්ථය, සංවරාර්ථය, සිරසාර්ථය, සීතලාර්ථය, ශාන්තාර්ථය සීලයයි වර්ණනා කරති.

සීලනං ලක්ඛණං තස්ස භින්නස්සාපි අනෙකධා
සනිදස්සනත්තං රූපස්ස යථා භින්නස්සනෙකධා

විවිධාකාරයෙන් බිඳී ගියේ වී නමුදු, සීලයෙහි සීලන ලක්ෂණය වෙනස් නොවේ. රූපය කැඩී බිඳී ගියේ වී නමුදු එහි මුල් ලක්ෂණ වෙනස් නොවන්නාක් මෙනි.

නිල් කහ ආදි වශයෙන් රූපය විවිධාකාරයට බෙදී ගියේ වී නමුත් එහි මුල් ප්‍රකෘති ලක්ෂණය වෙනස් නොවේ. මුල් ප්‍රකෘති ගතිය ඉක්මවා නොයන බැවින්, එසේම සීලය චේතනාදි භේදයෙන් විවිධාකාරයට බෙදී ගියේ වී නමුත් කාය කර්මාදීන් එක්තැන් කිරීම් වශයෙන්, කුසල් දහම්වල පිහිටීමට ආධාර වීම් වශයෙන් වන සීලනය වෙනස් නොවේ. චේතනාදි භේදයෙන් බිඳී ගියේද, එක්තැන් කිරීම් පිහිටුවීම් යන මුල් ලක්ෂණය වෙනස් නොවේ.

මෙබඳු ලක්ෂණ ඇති සීලය :-

**දුස්සීල්‍ය විද්ධංසනතා - අනවජ්ජ ගුණා තථා**
**කිච්ච සම්පත්ති අත්ථේන - රසො නාම පවුච්චති**

දුසිල් බව විනාශ කිරීමද, නිරවද්‍ය යහගුණ ඇති කිරීමද යන මෙම කෘත්‍ය හා සම්පත් යන අර්ථයෙන් රසයයි කියනු ලැබේ.

එහෙයින් මෙම සීලය කෘත්‍යාර්ථ රසයෙන් දුසිල් බව විනාශ කරන රසයයි. සම්පත් අර්ථ රසයෙන් නිරවද්‍ය රසයයි දතයුතුය.

**සොචෙය්‍ය පච්චුපට්ඨානං - තයිදං තස්ස විඤ්ඤූහි**
**ඔත්තප්පඤ්ච හිරීචෙව - පදට්ඨානන්ති වණ්ණිතං**

මෙම සීලයෙහි පිරිසිදු බව වැටහෙන කරුණ ලෙසින්ද, හිරි-ඔතප් දෙක ආසන්න කාරණය ලෙසින්ද නුවණැතියන් විසින් දක්වා ඇත.

මෙම සීලය කයෙහි පිරිසිදු බව, වචනයෙහි පිරිසිදු බව, මනසෙහි පිරිසිදු බව යන පිරිසිදු බව වැටහෙන කරුණය. පිරිසිදු භාවයෙන් වැටහෙයි. බහුලභාවයට යයි නුවණැත්තන් විසින් ලජ්ජා භය දෙක ආසන්න කාරණයයි වර්ණනා කරන ලදී. ලජ්ජා භය ඇතිකල්හි සීලය උපදින්නේද- පවතින්නේද වේ. නැතිකල්හි උපදින්නේද නැත. පවතින්නේද නොවේ. මේ ආකාර වූ සීලයෙන් යුක්ත ඒ හා යෙදුණු ඤාණය සීලමය ඤාණයයි. නොහොත් සීලයෙන්ම කරන ලද්දේ සීලමයයි. ඒ හා යෙදුණු එම සීලමය ඤාණය, අසංවරයෙහි ආදීනව (දොස්) සිහි කිරීම, සංවරයෙහි අනුසස් මෙනෙහි කීම, සංවරයෙහි පිරිසිදු බව මෙනෙහි කිරීම, සංවරය, කිලිටි වීම, පිරිසිදු වීම මෙනෙහි කිරීමද, සීලමය ඤාණයෙහිම ඇතුළත් කරන ලදී. කියන ලද සීල සංවරයෙන් සංවර වී, සංවරකොට, සීලයෙහි පිහිටා සිත තැන්පත් කරන්නහුට උපචාර අර්පණා වශයෙන් සිත එකඟ කරන්නහුට ඒ සිත එකඟ කිරීමෙහිදී ඒ හා සම්ප්‍රයුක්තව ප්‍රඥාව හටගනී.

සමථ, යහපත්ව ගැනීම, තැබීම, තැන්පත් කිරීම යන මේවා සමාධියටම පර්යාය නාමයෝය.

සමාධි භාවනාමයෙ ඤාණං යන මෙහි යහපත් අරමුණක සිත එකඟ කරගැනීම සමාධි නම් වේ. කවර අර්ථයකින් සමාධි නම් වේද?

තැන්පත් කිරීම් අර්ථයෙන් සමාධි නම් වේ. මේ එකඟ කිරීම නම් කුමක්ද? චිත්ත චෛතසිකයන් එක් අරමුණක සමව, මනාව, පිහිටුවීම, තැබීම යයි කියන ලදී. එහෙයින් යම් කරුණක් හේතුවෙන් චිත්ත චෛතසික ධර්මයන් සමව මනාව වික්‍ෂෙප නොවී, නොවිසිරී තිබෙත්ද? මෙය සමාධානයයි දතයුතුය. ඒ සමාධියගේ

**ලක්ඛණනතු අවික්ඛෙපො - වික්ඛෙපුද්ධංසනං රසො**
**අකම්පනමුපට්ඨානං - පදට්ඨානං සුඛං පන**

අවික්‍ෂෙපය (නොකැළඹීම) ලක්‍ෂණයයි. කැළඹිලි ගති විනාශ කිරීම රසයයි. කම්පා නොවීම වැටහෙන කරුණයි. සැපය ආසන්න කරුණයි.

දියුණු කෙරේනුයි, වඩානුයි භාවනා නම්. සමාධියම භාවනාව වූයේ සමාධි භාවනා නම්. සමාධියගේම වැඩීම, දියුණු කිරීම සමාධි භාවනා නම්. සමාධි භාවනා වචනයෙන් අන්‍ය භාවනා ප්‍රතික්‍ෂෙප කරයි. කලින් මෙන් උපචාර, අර්පණා වශයෙන් සමාධි භාවනාමය ඥාණයයි.

පච්චය පරිග්ගහෙ පඤ්ඤා යන මෙහි යමක් හේතුකොට ඵලයක් උපදීනුයි පච්චය නම්. පටිච්ච යනු එය අත්නොහැර යන අර්ථයි. **ඒති** යනු ඉපදීම හා පැවැත්ම යන අර්ථයි. තවද උපකාරකාර්ථයෙහිද, ප්‍රත්‍යයාර්ථයෙහිද වේ. එම ප්‍රත්‍යයන් විවිධාකාර බැවින්, ප්‍රත්‍යයන්ගේ ලබාගැනීම ප්‍රමාණය නිශ්චය කිරීමේ ප්‍රඥාව ප්‍රත්‍යය පරිග්‍රහ ප්‍රඥාවයි.

ධම්මට්ඨිති ඤාණං යන මෙහි, ධර්ම ශබ්දය, ස්වභාවය, ප්‍රඥාව, පින, පැණවීම, පැමිණීම, පර්යාප්තිය, ආත්මයකින් තොරබව, වෙනස, ගුණධර්ම, හේතුව, හේතුවකින් උපන් දෙය යන අර්ථයන්හි වැටේ. මෙහි කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා යනාදී තන්හි ස්වභාවයෙහි දැක්වේ.

**යස්සෙතෙ චතුරො ධම්මා - සද්ධස්ස ඝරමෙසිනො**
**සච්චං ධම්මො ධිතී චාගො - සවෙ පෙච්ච නසොචති'ති**

ගිහිගෙයි වාසය කරන යම් සැදැහැවත් අයකු තුළ සත්‍යය, ධර්මය, ධෛර්යය, ත්‍යාගය යන කරුණු සතර විද්‍යමාන වේද, ඔහු පරලොව සෝක නොවේ. මෙහි ප්‍රඥාවෙහි ද සඳහන්ය.

**නහි ධම්මො අධම්මොච - උභොසම විපාකිනො**
**අධම්මො නිරයං නෙති - ධම්මො පාපෙති සුගතිනති**

ධර්මය අධර්මය යන දෙක සමවිපාක දෙන්නේ නොවෙයි. අධර්මය නිරයට පමුණුවයි. ධර්මය සුගතියට පමුණුවයි ආදියෙහි (පින) පුණ්‍යයෙහිද වේ.

**පඤ්ඤත්ති ධම්මා - නිරුත්ති ධම්මා - අධිවචන ධම්මා** යන මෙහි ප්‍රඥප්තියෙහි (පැණවීමෙහි) යෙදේ. **'පාරාජිකා ධම්මා සංඝාදිසෙසා ධම්මා'** යන මෙහි ඇවැත්වල යෙදේ. **ඉධ භික්ඛු ධම්මං ජානාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං** යනාදියෙහි පර්යාප්තිය දැක්වේ. **තස්මිං ඛොපන සමයෙ ධම්මා හොන්ති ධම්මෙසු ධම්මානුපස්සී විහරති** යනාදියේ සත්ත්ව පුද්ගල ආදියෙන් තොරභාවය දැක්වේ. **ජාති ධම්මා ජරා ධම්මා** යන මෙහි ස්වභාවය වෙනස්වීමෙහි යෙදේ. **බුද්ධ ධම්මානං** යන තැන ගුණයෙහි දැක්වේ. **හෙතුම්හි ඤාණං ධම්මපටිසම්භිදා** යන තන්හි ප්‍රත්‍යයෙහි යෙදේ. **ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා** යනාදි තන්හි ප්‍රත්‍යයෙන් හටගත් යන තේරුම ගෙන එයි. මෙහිද ප්‍රත්‍යයෙන් හටගත්තේය යි දතයුතුය.

අර්ථ වශයෙන් වනාහි තමාගේ ස්වභාවය දරත්යයි හෝ ප්‍රත්‍යය ආධාරයෙන් දරනු ලබත්නුයි හෝ තමාගේ ඵලය දරත් යයි හෝ තමා සම්පූර්ණයෙන් අපායයන්හි නොවැටෙන්නා සේ දරත් යයි හෝ තමාගේ ස්වභාවය දරත් යයි හෝ සිතෙන් ආධාර කරනු ලබත් යයි යන අර්ථයන්හි ධම්ම යන වචනය සුදුසු පරිදි භාවිතා කරති. මෙහි වනාහි තමාගේ ප්‍රත්‍යයන්ගෙන් දරත්නුයි ධම්ම නම් වේ. ප්‍රත්‍යයෙන් හටගත් ධර්ම එය කරණකොට තිබෙත්. උපදිත් මෙන්ම පවතිත්නුයි ධම්මට්ඨිති නම් වේ. ප්‍රත්‍යය ධර්මයට මෙය සමාන වචනයකි. ඒ ධර්මස්ථිතියෙහි ඤාණය **ධම්මට්ඨිති ඤාණං** මෙය සමාධි භාවනාමය ඤාණයෙහි කියන ලද සමාධියෙන් සමාහිත වූ (එකඟ වූ) සිතෙන් යථාභූත ඤාණ දර්ශනය සඳහා භාවනා යෝග අරඹා නාමරූපයන් ව්‍යවස්ථාපනය කරන කල්හි ඒ නාමරූපයන්ගේ ප්‍රත්‍යය පරිග්‍රහණ අවස්ථාවෙහිදී ධම්මට්ඨිති ඤාණය උපදියි. නාමරූප ව්‍යවස්ථාපන ඥානයයි නොකියා කුමක් හෙයින් ධම්මට්ඨිති ඤාණයයි කියන ලද්දේ යත්? ප්‍රත්‍යය පරිග්‍රහණයෙන්ම ප්‍රත්‍යයෙන් හටගත් පරිග්‍රහණයේ සිද්ධිය වන හෙයින්, ප්‍රත්‍යය හටගත්

කල්හි පරිග්‍රහණය නොවූ, ප්‍රත්‍යය පරිග්‍රහණය කළ නොහැකිය. එහෙයින් ධම්මට්ඨිති ඤාණ ග්‍රහණයෙන්ම එයට හේතුභූත වූ කලින් සිද්ධ වූ නාමරූප ව්‍යවස්ථා ඥානය කියන ලද ආකාරයටම වේයයි දතයුතුය. කුමක් හෙයින් දෙවන තෙවන ඤාණ මෙන් සිත තැන්පත්කොට ප්‍රත්‍යය පරිග්‍රහණයෙහි ප්‍රඥාවයයි නොකියන ලද්දේද යත්? සමථ විදර්ශනා එකට බැඳී ඇති බැවිනි. සිත් තැන්පත්කොට යම් ආකාරයකට විදර්ශනා කරන තැනැත්තේ විදර්ශනා කෙරේද? එසේ වූ විට සමථයද විදර්ශනාවද, තැන්පත් වේ. සමානභාග වූ එකට බැඳීම එසේ වූයේ යයි කියනු ලැබේ. එහෙයින් සමාධිය අත්නොහැර සමාධියද ඤාණයද ඒකාබද්ධකොට ආර්ය මාර්ගය දක්වා උත්සාහ කළ යුතුයයි හැඟවීමට ප්‍රත්‍යය පරිග්‍රහණයෙහි ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණයයි කියාම කිය ලද්දේ යයි දතයුතුය.

**අතීතානාගත පච්චුප්පන්නානං ධම්මානං සංඛිපිත්වාන වවත්ථානෙ** පඤ්ඤා යනු තමාගේ ස්වභාවය උත්පාදාදි ක්ෂණයන්ට පත්ව ඉක්ම ගියේනුයි අතීත නම් වේ. ඒ දෙකටම නොආයේය. නොපැමිණියේනුයි අනාගත නම් වේ. ඒ ඒ කරුණ අරභයා උත්පාදාදි අවස්ථාවන්හි පවතීනුයි ප්‍රත්‍යුප්පන්න නම් වේ. නොකඩවා පැවැත්ම - ක්ෂණයක පැවැත්ම යන වර්තමාන කාල අතරින් නොකඩවා පැවැත්මේ වර්තමානය මෙහි අදහස් කරන ලදී. ඒ අතීත අනාගත වර්තමාන පඤ්චස්කන්ධ ධර්මයන්ගේ එක එක ලක්ෂණය වෙන වෙනම ගෙන හකුළුවා රූප කලාප වශයෙන් රාශිභූත කොට ව්‍යවස්ථාපනයෙහි, නිශ්චයෙහි, සනිටුහන් කිරීමේ ප්‍රඥාවයි.

**සම්මසනෙ ඤාණං** යනු මනාකොට ස්පර්ශ කිරීමේ, පිරිමැදීමේ බැලීමේ ඤාණයයි. කලාප සම්මසන ඤාණය යනු අර්ථයි. මෙය වනාහි නාමරූප ව්‍යවස්ථාපන ඥානයට අනතුරුව, නාමරූප ප්‍රත්‍යය පරිග්‍රහණ ධම්මට්ඨිති ඤාණයෙහි සිටියහුට 'යම්කිසි අතීත, අනාගත, වර්තමාන වූ හෝ ආධ්‍යාත්මික හෝ බාහිර හෝ සන හෝ සියුම් හෝ තත්ත්වයෙන් බාල හෝ උසස් වූ හෝ දුර වූ හෝ ළඟ වූ හෝ රූපයක් වේද? ඒ සියලුම රූප අනිත්‍ය වශයෙන් වෙන් කරයි. (තීරණය කරයි) මෙය එක් සම්මර්ශනයකි. දුක් වශයෙන් වෙන්කරයි. එක් සම්මර්ශනයකි. අනාත්ම වශයෙන් වෙන් කරයි. එක් සම්මර්ශනයකියි ආදී ක්‍රමයෙන් කියන ලද සම්මර්ශන වශයෙන් පෙර වෙන්කරන ලද එක් එක් ස්කන්ධයන්හි ත්‍රිලක්ෂණයට නංවා අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් විදර්ශනා කරන්නහුට කලාප සම්මසන ඤාණය උපදියි.

**පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා** යනු නොකඩවා පැවතීම් වශයෙන් වර්තමාන ආධ්‍යාත්මික පංචස්කන්ධ ධර්මයන්ගේ වෙනස්වීම බිඳීම දැකීමේ ප්‍රඥාවයි. මේ ධර්ම ඉපදී බිඳෙත්නුයි හටගැන්ම සිතින් ගෙනම භේදයෙහි සිත පිහිටුවයි. එහෙයින් හටගැන්ම නොකියන ලද්දේද කියන ලද්දේම යයි දතයුතුය. වර්තමාන ධර්මයන්ගේ දර්ශනයෙන්ම හටගැනීමේ දර්ශනය සිද්ධ වන හෙයින් හටගැන්ම කියන ලද්දේම වේ. හටගැන්මක් නොමැතිව ධර්මයන්ගේ ඉපදීමක් සිදුනොවේ. එහෙයින් වර්තමාන ධර්මයන්ගේ ඉපදීම, වෙනස්වීම අනුව බැලීමේ (විශේෂයෙන් බැලීමේ) ප්‍රඥාව යයි නොකියන ලද්දේ වී නමුත් කියන ලද්දේම වේයයි දතයුතුය.

**උදයබ්බයානුපස්සනෙ ඤාණං** යන මෙහි සඳහන් හටගැනීම් දර්ශනය සිද්ධවේමයයි නියමිත හෙයින් අනතුරුව කියන ලද, සම්මසන ඤාණයෙහි පරතෙරට ගොස් එය මෙනෙහි කිරීමෙහිදීම ප්‍රකට වූ උදයව්‍යයන් පරිග්‍රහණය කොට, සංස්කාරයන්ගේ පිරිසිඳීම කිරීම සඳහා හටගැනීම-විනාශය අනුව බැලීම අරඹන්නහුට උදයව්‍යය ඥානානුපස්සනා ඤාණය උපදී. එය හටගැනීම-විනාශය අනුව බලන හෙයින් උදයව්‍යයානු පස්සනාවයැයි කියයි.

**ආරම්මණං පටිසංඛා** යන මෙහි රූපස්කන්ධාදි අරමුණුවල විනාශය නුවණින් දැන දැක. **භංගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං** යනු ඒ අරමුණ විනාශවීම් වශයෙන් මෙනෙහිකොට උපන් ඤාණයාගේ විනාශය සිහිකිරීමෙහිලා යම් නුවණක් වේද? එය විදර්ශනා ඥානයයි කියන ලද්දේ වෙයි. විපස්සනා යනු විවිධාකාරයෙන් බැලීමයි. අරමුණ නුවණින් සලකා බලන්නේය යනුද පාඨයි. එහි අර්ථය අරමුණෙහි ස්වභාවය නුවණින් සලකා දැනගැනීම, දැකීමයයි කියන ලද ක්‍රමයෙන්ම අරමුණ නුවණින් සලකා භංගය අනුව බැලීමෙහි ප්‍රඥාව විදර්ශනා ඥානයයි කියන ලද්දේ වෙයි. යම්හෙයකින් වනාහි භංගානුපස්සනාවෙහිදීම විදර්ශනාව මස්තකප්‍රාප්ත වේද? (එසේ වීමටත් ඉඩ ඇත.) එහෙයින් විශේෂකොට මෙයම විදර්ශනාවෙහි ඤාණයයි කියන ලදී. යම්හෙයකින් උදව්‍යයානුපස්සනාවෙහි සිටියහුට මග්ගා මග්ග ඤාණ දර්ශනය උපදීද? එහෙයින් එය සිද්ධවීමෙන් අනෙක ඉටුවේයයි එසේ නොකියා, භංගානු පස්සනාවෙහිම විදර්ශනා ඤාණය කියන ලද්දේ යයි දතයුතුය. උදය ව්‍යයානුපස්සනාවෙහි, මනාව පිරිසිඳ දත් සංස්කාරයන්හි මනාව දුටු

උදයව්‍යයන් වහ වහා වැටහෙන කල්හි ඤාණය සියුම්ව උසුලන කල්හි උදය (හටගැන්ම) හැර භංගයෙහිම (විනාශයෙහිම) සිහිය මනාව පිහිටයි. ඔහුට මෙසේ මේ සංස්කාර ඉපිද බිඳෙත් යයි දකින කල්හි එතැන්හි භංගානුපස්සනා ඤාණය උපදී.

භයතුපට්ඨානෙ පඤ්ඤා යනු ඉපදීම-පැවතීම ආදී ආකාරයන්, කර්ම රැස්කිරීම්-ප්‍රතිසන්ධි ආදීන් බියවීමට හේතු වශයෙන් සලකා දැඩි පීඩාවට පත්ව භය වශයෙන් ගැනීමෙහි ප්‍රඥාවයයි යන අර්ථයි. භය වශයෙන් වැටහේනුයි භයතුපට්ඨානයි. ඒ භය වශයෙන් වැටහීමේ අරමුණයි. නොහොත් භය වශයෙන් වැටහේනුයි භයතුපට්ඨානයි. ඒ භය වශයෙන් සලකන ප්‍රඥාව යයි කියන ලද්දේ වෙයි.

ආදීනවෙ ඤාණං යනු සම්බන්ධ විභක්තියි. යම් භයතු පට්ඨානයෙහි ප්‍රඥාවක් වේද, යම් ආදීනව ඤාණයක් වේද? යම් නිබ්බිදා ඤාණයක් වේද, මේ සියල්ල එක් අර්ථයක්ම ඇත. අක්‍ෂරයන්ගේ වෙනස් බවක් පමණක් යයි කියන ලද හෙයින්, මෙහි එකක්ම කියන ලද්දේ නමුත් අවස්ථා භේදයෙන් මුඤ්චිතු කම්‍යතා ඤාණයෙහි මෙන් ත්‍රිවිධාකාරම වේ. එහෙයින් භයතුපට්ඨාන, ආදීනවානු පස්සනාදීහු සිදුවූ පසු නිබ්බිදානුපස්සනාව සිද්ධ වේයයි නොකියන ලද්දේද කියන ලද්දේම වේයයි දතයුතුය. සියලු සංස්කාරයන්ගේ විනාශය අරමුණුකොට භංගානුපස්සනාව සේවනය කරන්නහුට, වඩන්නහුට, බහුල වශයෙන් කරන්නහුට, භවත්‍රය-චතුර්යෝනි, පංචගති, සප්ත විඤ්ඤාණට්ඨිති, නව සත්තාවාස ආදීන්හි බිඳෙනසුලු සංස්කාරයන් දකිනවිට සුවයෙන් ජීවත්වෙනු කැමති බියගුලු පුරුෂයෙකුට සිංහ, ව්‍යාඝ්‍ර, දිවි, වලස්, කළුහිස් වලස්, යක්‍ෂ, රාක්‍ෂස, නපුරු ගොනුන්, නපුරු බල්ලන්, මදවැහෙන නපුරු ඇතුන්, භයානක සර්පයින්, හෙණ පිපිරුම්, සොහොන්, යුදබිම්, දැල්වෙන අඟුරු වලවල්, ආදීන් දැකීමෙන් බියට පත්වන්නාක් මෙන් බියජනකාරයෙන් වැටහෙයි. ඔහුගේ අතීත සංස්කාරයෝ නිරුද්ධයහ. වර්තමාන ඒවා නිරුද්ධ වෙති. අනාගත ඒවාදි එපරිද්දෙන්ම නිරුද්ධ වන්නාහු යයි දකින්නහුට එතැන භයතුපට්ඨාන ඤාණය උපදියි. ඔහුට ඒ භයතුපට්ඨාන ඤාණය සේවනය කරන කල්හි, වඩන කල්හි, බහුල වශයෙන් දියුණු කරන කල්හි, සියලු, භව, යෝනි, උපදින ස්ථාන, සිටින ස්ථාන ආදි නව සත්තාවාසයන්හි, ආරක්ෂාවක්, පිහිටක්, පිළිසරණක් නොපෙනේ. සියලු භව, යෝනි, උපදින ස්ථාන, වාසස්ථානගත සංස්කාරයන් අතර එකම

සංස්කාරයක් කෙරෙහි පවා ප්‍රාර්ථනාවක් හෝ ස්පර්ශ කිරීමක් හෝ නොවෙයි. ත්‍රිවිධ භවයන් පහවූ ගිනිදැල් ඇති පිරුණු ගිනි අඟුරු වලවල් මෙන්ද, සතරමහා භූතයෝ නපුරු විෂ ඇති සර්පයින් මෙන්ද, පංචස්කන්ධයන් එසවූ කඩු අතින් ගත් වධකයින් මෙන්ද ආධ්‍යාත්මික අංග සය හිස් ගමක් මෙන්ද, බාහිර ආයතන සය ගම් පහරණ සොරුන් මෙන්ද, සප්ත විඤ්ඤාණස්ථිතීන්ද නව සත්තාවාසයන්ද, එකොළොස් ගින්නකින් ඇවිලුණාහු මනාව ඇවිලුණාහු. ගිනිදැල්වලින් බැබලී ගියාක් මෙන්ද වැටහේ. සියලු සංස්කාරයෝ ගෙඩියක් වූවා මෙන්ද, රෝගයක් මෙන්ද හුලක් වූවා මෙන්ද, විපතක් වූවා මෙන්ද, ආබාධයක් වූවා මෙන්ද, ආශ්වාද රහිතය. නීරසය. ගොඩගැසුණු මහා දොස් රැසක් මෙන් වැටහෙති. සැපසේ ජීවත්වනු කැමති බියගුලු පුරුෂයෙකුට සිත්ගන්නාසුලු ස්වභාවයක පිහිටියත් රුදුරු වනසතුන් ගැවසෙන කැලයක් මෙන්ද, දිවියන් සහිත ගුහාවක් මෙන්ද, කිඹුල් ආදී නපුරු සතුන් හා රකුසන් සහිත ජලයක් මෙන්ද, ඔසවන ලද කඩුවක් සහිත සතුරකු මෙන්ද, විෂ සහිත බොජුනක් මෙන්ද, සොරුන් සහිත මාර්ගයක් මෙන්ද, ගිනිගත් ගෙයක් මෙන්ද, යුද්ධයට අවතීර්ණ සේනා සහිත යුදබිමක් මෙන්ද, යම්සේ ඒ පුරුෂයා ඒ රුදුරු වනසතුන් ගහණ ස්ථානයන්ට පැමිණ, භයවූයේ, සංවේගයට පත්වූයේ ලොමුඩැහැ ගැණුනේ හාත්පස දෝෂයන්ම දකියි. එපරිද්දෙන්ම ඒ යෝගාවචරයා භංගානුපස්සනා වශයෙන් සියලු සංස්කාරයන් භය වශයෙන් එළඹ සිටි කල්හි හාත්පස නීරස ලෙසද ආස්වාද රහිත ලෙසද දොස් ආදියම දකියි. ඔහුට මෙසේ බලනකල්හි ආදීනවානුපස්සනා ඥාණය උපදියි. හෙතෙම මෙසේ සියලු සංස්කාරයන් ආදීනව වශයෙන් මනාව බලන්නේ සියලු භව, ජාති, උපදින ස්ථාන, විඤ්ඤාණයක් පිහිටන සත්ත්වයින් වාසය කරන ස්ථානයන්හි, විවිධාකාර භේදයන් සහිත සංස්කාරයන්ට ඇතුළත් වූ සියලු දෑ කෙරෙහි කලකිරෙයි. නොඇලේ. සතුටට පත් නොවෙයි. විසිතුරු කඳුපාමුලක සිත් අලවා වාසය කරන ස්වර්ණ හංසරාජයෙක් සැඩොල් ගම්දොර අසූචි වලෙහි නොඇලේද? සප්තමහා විල්හිම සිත් අලවන්නේ වේද? එපරිද්දෙන්ම මේ යෝගී රාජහංසයා මනාකොට පිරිසිඳ දක්නාලද ආදීනව සහිත භේදසහිත සංස්කාරයන් කෙරෙහි, නොඇලේ. භාවනාවෙහි ඇලුණේ, විශේෂයෙන් ඇලුණේ, සප්ත අනුපස්සනාවන්හිම සිත් අලවයි. රන් කූඩුවක දමන ලද්දේ වී නමුත් මෘගරාජ සිංහයා එහි සිත් නොඅලවයිද? තුන්දහසක් යොදුන් පැතුරුණු හිමවතෙහිම සිත් අලවයි. එපරිද්දෙන්ම මේ යෝගී සිංහයාද ත්‍රිවිධ සුගති භවයන්හිද සිත් නොඅලවයි. ත්‍රිවිධ

අනුපස්සනාවන්හිම සිත් අලවයි. යම්සේ සම්පූර්ණයෙන් සුදු සත්තැන මනාව පිහිටි (පෘථුවියෙහි පිහිටි) ෂද්දිමත්, අහසින් ගමන් කරන සද්දන්ත නාරජු නගර මධ්‍යයෙහි සිත් නොඅලවයි. සද්දන්ත විලෙහිම සිත් අලවයි. එසේම මේ ශ්‍රේෂ්ඨ යෝගී ඇත්රජ සංස්කාරගත සියල්ලෙහිම නොඇලේ. නොඉපදීම ආරක්‍ෂා සහිතය, ආදි ක්‍රමයෙන් දක්වන ලද සාන්ති පදයෙහිම සිත් අලවයි. ඒ අතට නැමුණු ඒ අතට ප්‍රවණතාවය ඇතිව, ඒ අතට නම්‍රතාවයෙන් යුත් මනසක් ඇත්තේ වෙයි. මෙතෙකින් ඔහුට නිබ්බිදානු පස්සනා ඤාණය උපන්නේ වෙයි.

මුඤ්චිතුකම්‍යතා පටිසංඛා සන්තිට්ඨනා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං යාන මෙහි මුදන්ට, අත්හරින්ට, ආශා කරයි. කැමති වෙයිනුයි මුඤ්චිතු කාම නම් වේ. මිදෙනු කැමැත්තෙහි ස්වභාවය මුඤ්චිතු කම්‍යතාවයයි. සලකා බලයි. විශේෂයෙන් පරීක්‍ෂා කෙරේනුයි පටිසංඛා නම් වේ. නුවණින් සලකා බැලීමේ ස්වභාවය පටිසංඛා නම්. පිහිටා සිටියි මධ්‍යස්ථ වේනුයි සන්තිට්ඨානා නම් වේ. පිහිටා සිටීම සන්තිට්ඨනා නම් වේ. ඒ මිදෙනු කැමති නුවණින් සැලකීමද, පිහිටා සිටීමද යන මේ සියල්ල එකට කැටිකර ගත්කල්හි මුඤ්චිතු කම්‍යතා පටිසංඛා සන්තිට්ඨනා නම් වේ. මෙසේ පූර්වභාගයෙහි නිබ්බිදා ඤාණයෙන් කලකිරුණහුට ඉපදීම් ආදිය අත්හැරීමේ කැමැත්ත මුඤ්චිතු කම්‍යතා නම් වේ. මිදීමට ක්‍රම ඇතිකිරීම පිණිස මධ්‍යයෙහි නුවණින් සලකා බැලීම, නුවණින් සලකා බැලීමෙන් මිදී අවසානයෙහි මධ්‍යස්ථව සිටියි. මෙසේ ව්‍යවස්ථාපන ත්‍රිවිධාකාර වූ ප්‍රඥාව සංස්කාරයන්ගේ අජ්ඣුපෙක්ඛණ ප්‍රඥාව නම් වේ. මිදෙනු කැමැත්ත, නුවණින් සැලකීම්, පිහිටා සිටීම් සංඛ්‍යාත වූ අවස්ථා භේදයෙන් ප්‍රඥා තුනටම සංස්කාරයන්ගේ මධ්‍යස්ථතාවය කැමති වන්නේනුයි ප්‍රඥාවද එයමනුයි සංඛාරුපෙක්ඛාසු යයි බහුවචනයෙන් දක්වන ලදී. අවස්ථා භේදයෙන් බිඳුනේ වී නමුත් ඥානයේ ස්වභාවය ඒකාකාර බැවින් ඒකවචනයෙන්ද දක්වන ලද්දේයයි දතයුතුය කියන ලද්දේම වේ. යම් ඒ මුඤ්චිතු කම්‍යතාවක් වේද යම් ඒ පටිසංඛානු පස්සනාවක් වේද, යම් ඒ සංඛාරුපේක්‍ෂාවක් වේද මේ ධර්මයෝ ඒකාර්ථයහ. අකුරු පමණක් වෙනස්ය.

සමහරු වනාහි සංඛාරුපෙක්ඛාසුයයි බහු වචනය යොදති. සමථ විදර්ශනා වශයෙන් සංඛාරුපෙක්ඛාවන්ගේ සංඛ්‍යාව බහුලයයි කියති. සංඛාරුපෙක්ඛාසු යන මෙහි ක්‍රියාව අපෙක්‍ෂා කෙරේයයි දතයුතුය. අවස්ථා

භේදයෙන් වනාහි ඒ නිබ්බිදා ඤාණයෙන් කලකිරුණහුට, උක්කණ්ඨිතයාට සියලු භව යෝනි ගති විඤ්ඤාණට්ඨිති සත්තාවාසගත භේද සහිත සංස්කාරයන්හි සිත නොබැඳේ. නොඇලේ. නොබැඳේ. සංස්කාරගත සියලු දැයින් මිදීමේ අත්හැරදැමීමේ කැමැත්ත ඇතිවේ. නොහොත් දැලක් ඇතුළට ගිය මත්ස්‍යයෙක්, සර්පයෙකුගේ මුවට ගිය මැඩියෙක්, කූඩුවකට දමන ලද කැලෑ කුකුලෙක්, දැඩි උගුලකට හසුවූ මුවෙක්, අහිගුණ්ඨිකයෙකු අතපත් සර්පයෙක්, මහා මඩගොහොරුවකට වැටුණු ඇත් රජෙක්, ගුරුළාගේ මුවටගිය නාගරාජයෙක් යන මේ ආදී අය ඒ ඒ ස්ථානවලින් මිදෙනු කැමැත්තාහු නික්මයනු කැමැත්තාහුම වෙති. මෙසේ ඒ යෝගියාගේ සිත සියලු සංස්කාරගත දැයින් මිදෙනු කැමැත්තාහු නික්ම යනු කැමැත්තාහු වෙති. මෙසේ කියනකල්හි මිදෙනු කැමැත්තහුගේ ස්වභාවය මුඤ්චිතු කම්‍යතායි පාඨය යෙදේ. මෙසේත් ඇතිකල්හි, උප්පාද මුඤ්චිතු කම්‍යතා ආදීන්හි උපතින් මිදෙනු කැමැත්ත යයි කිවයුතු වේ. එහෙයින් පළමු අර්ථයම වඩා යහපත්ය. ඉක්බිති ඔහුට සියලු සංස්කාරයන්හි පහවූ ඇල්ම ඇත්තේ, සංස්කාරගත සියලු දැයින් මිදෙනු කැමැත්තහුට මුඤ්චිතු කම්‍යතා ඥානය උපදී. හෙතෙම මෙසේ සියලු භවයෝනි ගති විඤ්ඤාණට්ඨිති සත්තාවාසගත භේද සහිත සංස්කාරයන්ගෙන් මිදෙනු කැමැත්තේ මිදීමට උපාය සම්පාදනය සඳහා නැවත එම සංස්කාරයන්ම පටිසංඛානුපස්සනා ඤාණයෙන් ත්‍රිලක්ෂණයට නංවා විදර්ශනා කරයි. මෙසේ විදර්ශනා කරන්නහුට අනිත්‍ය වශයෙන් වූ නිමිති සහිත පටිසංඛා ඤාණය උපදී. දුක්ඛ වශයෙන් පැවති පටිසංඛා ඤාණය උපදී. අනාත්ම වශයෙන් හේතුවද, පැවැත්මද ඇතුළත් පටිසංඛා ඤාණය උපදී. හෙතෙම පටිසංඛානුපස්සනා ඤාණයෙන් සියලු සංස්කාරයෝ ශූන්‍යයයි දැක ත්‍රිලක්ෂණයට නංවා සංස්කාරයන් පරීක්ෂා කරන්නේ, භයද තෘෂ්ණාවද අත්හැර, භාර්යාවගේ දොස් දැක අත්හරින ලද භාර්යාවක ඇති පුරුෂයෙක් ඒ භාර්යාව කෙරෙහි පවතින්නේ යම්සේද, එසේ මේ යෝගියාද, සංස්කාරයන්හි උදාසීන වෙයි. මධ්‍යස්ථ වේ. මමය මාගේ යයි නොගනියි. මෙසේ දන්නා වූ, මෙසේ බලන්නා වූ ඔහුට ත්‍රිවිධ භවයන් පිළිබඳව සිත ඉවත්වයේ. පෙරළේ, ආපසු හැරෙයි. දිග නොහැරෙයි. යම්සේ නෙලුම් පතක් මදක් නැමී ජලය ස්පර්ශ කරන්නේ ඉන් ඉවත් වේද, පෙරළේද, ආපසු හැරේද, දිග නොහැරේද යම්සේ වනාහි කුකුල් පියාපතක් හෝ නහර වැදැල්ලක් ගින්නෙහි බහාලන ලද්දේ ඉවත්ව යේද, පෙරළේද ආපසු හැරේද දිග නොහැරේද, එසේම ඔහුට ත්‍රිවිධ භවයන් කෙරෙහි සිත ඉවත්ව යයි. පෙරළේ. ආපසු හැරේ. දිග නොහැරේ. උපේක්ෂාවෙහි

පිහිටයි. මෙසේ මොහුට සංඛාරුපේක්ෂා ඥාණය උපන්නේ වෙයි. මේ සංඛාරුපෙකඛා ඥාණය සමග මත්තෙහි ගොත්‍රභූ ඥාණයට ආධාර වූ අනුලෝම ඥාණය පූර්වාපර ඥාණයන්හි කියන ලද දේද, නොකියන ලද දේද, කියන ලද්දේම වේයයි දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේය.

"මහණෙනි, ඒකාන්තයෙන් ඒ භික්ෂුව කිසියම් සංස්කාරයක් නිත්‍ය වශයෙන් මනාව විමසා බලන්නේ අනුලෝම ක්ෂාන්තියෙන් යුක්ත වූයේය යන මෙම කරුණ කිසිවිටෙකත් විද්‍යමාන නොවන්නේය. (එවැන්නක් නොවන්නේය) අනුලෝම ක්ෂාන්තියෙන් යුක්ත නොවූයේ නිවැරදි ක්‍රමයට බසින්නේය යන මෙම කරුණද සිද්ධ නොවන්නේය. නිවැරදි ක්‍රමයට නොබසින්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත්වය සාක්‍ෂාත් කරන්නේය යන මෙම කරුණද විද්‍යමාන නොවන්නේය. ධර්මසේනාපති විසින් කියන ලද්දේය. කොපමණ ආකාරයන්ගෙන් අනුලෝම ක්‍ෂාන්තිය ලබයිද? කවර ආකාරයන්ගෙන් නිවැරදි ක්‍රමයට බසීද? සතළිස් ආකාරයකින් අනුලෝම ක්‍ෂාන්තිය ලබයි. සතළිස් ආකාරයකින් නිවැරදි ක්‍රමයට බසියි.

පට්ඨානයෙහිද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. අනුලෝමය ගෝත්‍රභූ ඥානයට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. අනුලෝමය වෝදානයට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ, ආදිය. ඔහුට ඒ සංඛාරුපේක්ෂා ඥානය, සේවනය කරන කල්හි, වඩන කල්හි, බහුලව වඩන කල්හි ස්ථිර ශ්‍රද්ධාව බලවත් වේ. වීර්යය මනාව ඔසවා ඇත. සිහිය මනාව පිහිටුවා ඇත. සිත මනාව සන්සිඳී ඇත. සංඛාරුපේක්ෂා ඥානය ඉතා බලවත්ව (තියුණුව) පවතී. දැන් දැන් ඔහුට සංඛාරුපේක්ෂා මාර්ගය උපදින්නේ යයි පෙනෙන තත්වයට පැමිණ, සංස්කාරයන් අනිත්‍යයයි දුක් යයි, අනාත්මයයි මෙනෙහිකොට භවංගයට වැටේ. භවංගයට අනතුරුව සංස්ඛාරුපේක්ෂාවෙහි කළ ආකාරයෙන්ම සංස්කාරයන්, අනිත්‍යයයි හෝ දුක්යයි හෝ අනාත්මයයි හෝ අරමුණු කරන්නේ මනෝද්වාරාවර්ජනය උපදී, ඉන් අනතුරුව එම සංස්කාරයන්ම අරමුණු කොට දෙකක් තුනක් හෝ හතරක් ජවන් සිත් උපදියි. ඒ හා යෙදුණු ඥානය අනුලෝම ඥානයයි. එය පළමු විදර්ශනා ඥානයන්ට කෘත්‍යතාවයෙන් අනුලොම් වේ. මත්තෙහි කිවයුතු සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ට අනුලොම් වේ. යම්සේ වනාහි විනිශ්චය ස්ථානයෙහි සිටි

දැහැමි රජෙක් විනිශ්චයකාර මහඇමති අටදෙනාගේ විනිශ්චය අසා අගතියට යාම හැර මධ්‍යස්ථ වී එසේ වේවායි අනුව සතුටු වන්නේ ඔවුන්ගේ විනිශ්චයට විරුද්ධ නොවන්නේය. පෞරාණික රාජධර්මයටද විරුද්ධ නොවන්නේය. එහි අනුලෝම ඥානය රජු මෙනි. අටවැදෑරුම් විදර්ශනා ඥාන, විනිශ්චයකාර ඇමතිවරුන් අටදෙන මෙනි. සත්තිස් බෝධිපාක්ෂික ධර්ම පෞරාණික රාජධර්ම මෙනි. යම්සේ රජ එසේ වේවායි අනුව සතුටු වන්නේ විනිශ්චයකාර මහ ඇමතින්ගේ විනිශ්චයටද රාජධර්මයටද අනුලොම් වෙයිද එසේම මෙහි අනිත්‍යාදී වශයෙන් සංස්කාරයන් අරබයා උපදිනු ලබන අටවැදෑරුම් විදර්ශනා ඥානයන්ටද මත්තෙහි කිවයුතු සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ටද ක්‍රියාකාරීත්වයෙන් අනුලොම් වේ. එහෙයින් අනුලෝම ඥානයයි කියනු ලැබේ.

බහිද්ධා වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභූ ඤාණං යන මෙහි බහිද්ධා යනු සංස්කාර නිමිත්තය. එය ආධ්‍යාත්මික චිත්ත සන්තානයෙහි අකුසල ස්කන්ධයන් පිළිබඳව සලකා බහිද්ධා යයි යූ සේයි. එම බාහිර සංස්කාර නිමිත්තෙන් නැගී සිටියි. පහව නැගී සිටීනුයි වුට්ඨාන නමැ පෙරළේ. පරාවර්තනය වේ. පරාම්මුඛ වේනුයි විවට්ටනංයි. නැගිටීමද පරම්මුඛ වීමද එයමනුයි වුට්ඨාන විවට්ටනංයි එහෙයින් කීහ. ගොත්‍රභූ ඤාණය සමුදයෙහි මුලිනුපුටා නොදමන හෙයින් පැවැත්මෙන් නොනැගිටියි. නිර්වාණාරම්මණ හෙයින් නිමිත්තෙන් නැගිටීනුයි එක්ව නැගිටීම වේ. පෘථග්ජන ගෝත්‍රය මැඩපවත්වන හෙයින්ද, ආර්ය ගෝත්‍රය වඩන හෙයින්ද ගෝත්‍රභූයි. මෙය වනාහි අනුලෝම ඤාණයන්ගෙන් නෙලුම්පතෙහි දිය මෙන් සියලු සංස්කාරයන්ගෙන් බැහැර කරනු ලබනුයේ සිතෙහි අනුලෝම ඤාණයෙහි ආසේවන කෙළවර අනිමිත්ත නිර්වාණය අරමුණු කරනුයේ පෘථග්ජන ගෝත්‍රය, පෘථග්ජන ව්‍යවහාරය, පෘථග්ජන භූමිය ඉක්මවනුයේ, ආර්ය ගෝත්‍රයට ආර්ය ව්‍යවහාරයට, ආර්ය භූමියට බැසගනුයේ නිර්වාණාරම්මණයෙහි ප්‍රථම බැසගැන්ම, ප්‍රථම සිතාබැලීම ප්‍රථම එක් අරමුණක සිත පිහිටුවීම් සංඛ්‍යාත මාර්ගයාගේ අනන්තර, සමනන්තර, ආසේවන, උපනිස්සය, නත්ථි විගත ආදී වශයෙන් සය ආකාරයකින් ප්‍රත්‍ය භාවය සිදුකරන්නේ මස්තකප්‍රාප්ත විදර්ශනාව මුදුන් වූයේ පුනරාවර්තන නොවනසේ උපදියි.

දුභතො වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං යන මෙහි දුභතො යනු දෙආකාරයකින් දෙකකින් යයි කියන ලද්දේ වෙයි.

කෙලෙසුන්ගේ මුල්සිඳින හෙයින් ක්ලේශයන්ගෙන්ද ඒ අනුව පවතින ස්කන්ධයන්හිද, නිවන් අරමුණු කරන හෙයින් පිටත සියලු සංස්කාර නිමිතීන්ගෙන්ද නැගිටියි. පෙරළෙයි. මේ දෙආකාරයෙන් වුට්ඨාන විවට්ටනෙ ප්‍රඥාව දක්වයි. එහෙයින් කියන ලදී. සතර මාර්ග ඥානයෝ නිමිති රහිත අරමුණු ඇති බැවින් නිමිත්තෙන් නැගිටිත්. හටගැනීමෙහි මුල් සිඳින හෙයින් පැවැත්මෙන් නැගිටිත් යයි දෙයාකාරයකින් නැගිටීම් වෙත්.

මග්ගෙ ඤාණං යනු නිර්වාණය සොයයි බලයි. නිර්වාණය පිළිබඳ අවශ්‍යතාව ඇත්තවුන් විසින් සොයනු ලැබේ. අන්වේෂණය කරයි. කෙලෙසුන් නසමින් යයි. පවතීනුයි මග්ග නම්. ඒ මාර්ගයෙහි ඤාණයයි එය ගොත්‍රභූ ඤාණයට අනතුරුව නිර්වාණය අරමුණු කරමින් තමන් නැසූ කෙලෙසුන් ඉතිරි නොවන සේ සිඳ දමන්නේ, අනවරාග්‍ර සංසාර වෘත්තයෙහි දුක් නමැති සමුද්‍රය වියලවන්නේ සියලු අපා දොරවල් වසන්නේ සප්ත ආර්ය ධනයාගේ සම්මුඛභාවය කරන්නේ අෂ්ඨාංගික වැරදි මාර්ගය අත්හරින්නේ සියලු විරුද්ධතා භය සන්සිඳුවන්නේ සම්‍යක් සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේගේ (ජාතක) ඖරස පුත්‍රභාවයට එළඹෙන්නේ වෙනත් නොයෙක් සියගණන් අනුසස් ලබමින් මාර්ග ඥාන උපදවා ගනියි.

ඨාතුං ඉච්ඡං පුරිසො - ලංඝිත්වා මාතිකාය පරතීරෙ
වෙගෙනාගම්ම යථා - ගණ්හිත්වා ඔරිම තීර තරුබද්ධං

රජ්ජුංවා දණ්ඩංවා - උල්ලංඝිත්වාන පාරනින්නතනු
පාරාසනෙනා පන තං - මුඤ්චිය වෙධං පතිට්ඨහති පාරෙ

එවං යොගාවචරො - සක්කායමයම්හි ඔරිමෙ තීරෙ
දිට්ඨභයො අභයෙ පන - ඨාතුං ඉච්ඡං අමතපාරෙ

උදයබ්බයානුපස්සන - පභුතික වෙගෙන ආගතො රජ්ජුං
රූපාවහං දණ්ඩංවා - තදිතර ඛන්ධාවහයං සම්මා

ගණ්හිත්වා ආවජ්ජන - චිත්තෙන හි පුබ්බ වුත්ත නයතොව
අනුලොමෙ හුල්ලංසිය - නිබ්බුති නිනෙනා තදාසන්නගතො

තං මුඤ්චිය ගොත්‍රභුනා - අලද්ධ ආසෙවනෙනත්‍ථ පවෙධං
පතිතො සංඛත පාරෙ - තතො පතිට්ඨාති මග්ගඤාණෙන

පස්සිතුකාමො චන්දො - ඝනතමහි අබ්භපටලෙහි
ථූලක සුඛුම සුඛුමෙසු - අබ්භෙසු පාටෙසු වායුනා කමතො

චන්දං පස්සෙය්‍ය නරො - යථා තථෙවානුලොම ඤාණෙහිකමා
සච්චච්ඡාදක මොහෙ - විනාසිතෙ පෙක්ඛතෙහි ගොත්‍රභූ අමතං

වාතාවිය තෙ චන්දං - අමතං නහි පෙක්ඛරෙනුලොමානි
පුරිසො අබ්භානිවච - ගොත්‍රභූ න තමං විනොදෙති

හමිතම්හි චක්කයන්තෙ - ධීතො නරො අඤ්ඤඤ්ඤදින්න සඤ්ඤාය
උසුපාතෙ ඵලකසතං - අපෙක්ඛමානො යථා විජ්ඣෙ

එවමිධ මග්ගඤාණං - ගොත්‍රභුනා දින්න සඤ්ඤා මවිභාය
නිබ්බානෙ වත්තන්තං - ලොභක්ඛන්ධාදිකෙ පදාළෙති

සංසාර දුක්ඛ ජලධි - සොසයති පිදහති දුග්ගති ද්වාරං
කුරුතෙච අරියධනිනං - මිච්ඡා මග්ගඤ්ච පජහති

වෙරභයානි සමයතෙ - කරොති නාථස්ස ඔරස පුත්තත්තං
අඤ්ඤෙඤ්ච අනෙක සතෙ - සදානිසංසෙ දදාති ඤාණ මිදන්ති

ඇල මාර්ගයක් හරහා පරතෙරට ගොස් සිටීමට කැමති පුද්ගලයෙකු වේගයෙන් දුව අවුත් මෙතෙර ඇති එතෙරට නැමුණු තුනී වැලක් හෝ ලීයක් අල්ලාගෙන ඇල උඩින් පැන පරතෙරට පැමිණියේ අල්වාගත් ආධාරකය මුදාහරියි. (අත්හරියි) එසේම යෝගාවචර තෙමේ මෙතෙර යයි කියනු ලබන තමාගේ ශරීරයෙහි දුටු භය ඇත්තේ නිර්භය වූ නිර්වාණ නමැති පරතෙරෙහි පිහිටනු කැමැත්තේ

උදයව්‍යයානු පස්සනා ප්‍රමුඛ කොට ඇති වේගයන් කරණකොට පැමිණියේ රූපස්කන්ධය හා අනෙකුත් ස්කන්ධ නමැති වැලක් හෝ ලීයක් පෙර කියන ලද අයුරු ආවර්ජනා සිතෙන් ගෙන, අනුලෝමයෙන් පැන නිවණට නැමුණේ ඒ ආසන්නයට ගියේ

එය අත්හැර ගොත්‍රභූ ඥානයෙන් නොලද, සේවනයෙන් කම්පා වූයේ, සංඛත පරතෙරෙහි වැටුණේ ඉන්පසු මාර්ග ඥානයෙන් පිහිටයි.

චන්ද්‍රයා දකිනු කැමති තැනැත්තේ චන්ද්‍රයා වලාකුළු පටලයන්ගෙන් වැසුණු කල්හි, මහත් හා සියුම් සියුම් වලාපටල ක්‍රමයෙන් සුළඟින් ඉවත්වූ කල්හි

මිනිසා සඳ බලන්නාක් මෙන් සත්‍යය වසන මෝහාන්ධකාරය විනාශ වූ කල්හි ක්‍රමයෙන් අනුලෝම ඤාණයන්ගෙන් පෘථග්ජන ගෝත්‍රය නසන අමා නිවණ බලන කල්හි, වලාකුළු සහිත සුළං චන්ද්‍රයා වසන්නාක් මෙන්, අනුලෝම ඤාණයන්ට නිවණ නොපෙනේ. පුරුෂයා වලාකුළු සහිත අහස දකින්නාක් මෙන් ගොත්‍රභූ ඤාණය අඳුර දුරු නොකරයි. අමෘතයද අනුලෝම ඤාණ නොදකියි.

වෙනත් අයෙකු දුන් සංඥාව අනුව චක්‍රයන්ත්‍රයෙහි සිටි මිනිසා අපේක්ෂිත පුවරු සියයක වැදීම සඳහා ඊය විද්දේද යම්සේ විදින්නේද,

එසේම මෙහි මාර්ග ඥාන ගෝත්‍රභූ ඥානයෙන් දුන් සංඥාව නොහැර නිවණෙහි පවතින්නේ (නිවන් අවබෝධ කරන්නේ) ලෝභ ආදි ස්කන්ධයන් පලයි.

සසර දුක් නමැති සාගරය වියලවයි. දුගති දොර වසයි. ආර්ය ධනය රැස් කරන්නේද වේ. වැරදි මාර්ගයද අත්හරියි.

සතුරු භය සමනය කෙරේ. බුදුරදුන්ගේ ඖරස පුත්‍රභාවයට පත්වේ. අනෙකුත් නොයෙක් සියගණින් ආනිසංස මෙම ඤාණය ගෙන දේ.

පයොග පටිප්පස්සද්ධි පඤ්ඤා ඵලෙ ඤාණං යන මෙහි පයොගො යන්නෙහි බොහෝ යෙදුම් ඇත. ඵල සාක්ෂාත් කිරීම සඳහා වන මාර්ග භාවනාවගේ දෙයාකාරයකින් නැගිටීම වේ. ඒ ප්‍රයෝගයාගේ සංසිඳීම නිෂ්ඨාවඃ- පයොග පටිප්පස්සද්ධියයි. ඒ කුමක්ද? සිවුමග ක්‍රියා අවසානයයි. ඒ ප්‍රයෝග පටිප්පස්සද්ධියට හේතු වූ පවත්නා ඵලයෙහි ප්‍රඥාව පයොග පටිප්පස්සද්ධි ප්‍රඥාවයි. ඵල ගනී, පැසේනුයි ඵලනම්. ඒ ඵලයෙහි ඒ හා යෙදුණු ඤාණයයි එක් එක් මාර්ග ඥානයාගේ අනතුරුව ඒ ඒ ඥානයන්ට විපාක වූ නිවණ අරමුණුකොට තුනක් හෝ දෙකක් හෝ එකක් හෝ ඵල සිත් උපදියි. අනතුරුවම විපාක දෙන හෙයින් ලෝකෝත්තර කුසලයන්ට, සමාධි මානන්තරිකඤ්ඤමාහු යන්නද දන්ධං ආනනතරිකං පාපුණාති ආසවානං ඛයා යන ආදියද කියන ලදී. යමෙකුට අනුලෝම ඥාන දෙකක් වේද, ඔහුට තුන්වැන්න ගෝත්‍රභූ වේ. සතරවැන්න මාර්ග සිතයි.

ඵල සිත් තුනක්ද වෙයි. යමෙකුට අනුලෝම ඤාණ තුනක් වේද, ඔහුට හතරවැන්න ගොත්‍රභූ වේ. පස්වැන්න මාර්ග සිතයි. ඵල සිත් දෙකක් වෙයි. යමෙකුට අනුලෝම ඤාණ හතරක් වේද, ඔහුට පස්වැන්න ගෝත්‍රභූ වේ. සයවැන්න මාර්ග සිතයි. එක් ඵල සිතක් වේ. මේ මාර්ග වීථි ඵලයයි. සමාපත්ති වශයෙන් උපදින්නා වූද, නිරෝධ සමාපත්තියෙන් නැගිටින්නහුටද කාලාන්තරයක් ගතවීමෙන් පසු උපදින ඵල චිත්තයද මෙයින්ම සංග්‍රහ කරන ලදී.

ඡිනන වටට මනු පසසනෙ පඤ්ඤා යනු ඒ ඒ ආර්යමාර්ගයන්ගෙන් මුල්සිඳින ලද ඒ ඒ කෙලෙස් පසුව බැලීමෙහි ප්‍රඥාවයි. විමුතති ඤාණං යනු විමුක්තියගේ (මිදීමෙහි) ඤාණයයි. විමුත්ති යනු කෙලෙසුන්ගෙන් මිදුණා වූ පිරිසිදු සිතයි. මිදුණු ස්වභාවයයි. ඒ විමුක්තිය පිළිබඳව දන්නා ඤාණය විමුක්ති ඤාණයයි. කෙලෙසුන්ගෙන් මිදුණා වූ චිත්ත සන්තතීන්ද, කෙලෙසුන්ගෙන් මිදුණු ස්වභාවය සිහිකරන්නේ කෙලෙසුන්ගෙන් තොරව ප්‍රත්‍යවේක්‍ෂා නොකරන්නේය යන මෙයින්, ප්‍රහීණ වූ කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂාව කියන ලද්දේ වෙයි. විමුතතසම්ං විමුතතමිති ඤාණං හොති යන්න මේ සඳහා කියන ලදී. ඉතිරි කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂාව (සිහිකිරීම) වනාහි නොකියන ලද්දේද මේ අයුරින්ම කියන ලද්දේ වේයයි ගතයුතුය. කියන ලද්දේද වේ.

වුතතමහි එක ධමෙම - යෙ ධමමා එක ලකඛණා තෙන
වුතතා භවනති සබෙබ - ඉති වුතෙතා ලකඛණො හාරො'ති

එක ආකාර ලක්‍ෂණ ඇති එක ධර්මයක් කියන ලද කල්හි ඒ ආකාර සියල්ලම කියන ලද්දේ වෙයි. මෙය එක ආකාර ලක්‍ෂණ පැවරීම යයි කියන ලදී.

නොහොත් රහතුන්ට ශේෂ වූ කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂාවක් නොවන හෙයින් සතර ආර්යයන්ට ලැබෙන්නා වූ ප්‍රහීණ කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂාවම කියන ලද්දේ යයි දතයුතුය.

තදාසමුදාගතෙ ධමෙම පසසනෙ පඤ්ඤා යි එකල්හි මාර්ග ක්‍ෂණයෙහි හෝ ඵලක්‍ෂණයෙහි ප්‍රතිලාභ වශයෙන්ද ප්‍රතිවේධ වශයෙන්ද හටගත්, එක්තැන් වූ, සම්ප්‍රාප්ත වූ යුක්ත වූ මාර්ගඵල ධර්මයන්ද, චතුරාර්ය

සත්‍ය ධර්මයන්ද බැලීම හා දැකීමේ ප්‍රඥාව **පච්චවෙක්ඛණෙ ඤාණං** ප්‍රත්‍යවේක්ෂා ඤාණයයි දක්වා, බොහෝ බැලීමේ දැනීමේ ඤාණය, මේ ඤාණයාගේ වශයෙන්ද, මේ ඤාණයාගේ වශයෙන්දැයි ඤාණ ද්වයයෙන් ප්‍රත්‍යවේක්ෂා ඤාණ යූසේයි. සෝවාන් වූවහුට මාර්ග වීථියෙහි සෝවාන් ඵල කෙළවරෙහි සිත භවංගයට බසී. ඉක්බිති භවංගය සිඳ මාර්ග ප්‍රත්‍යවේක්ෂා සඳහා මනෝද්වරාවර්ජනය උපදී. එය නිරුද්ධ වූ කල්හි පිළිවෙළින් සත් මාර්ග ප්‍රත්‍යවේක්ෂා ජවන් වෙයි. නැවත භවංගයට බැස ඒ ක්‍රමයෙන්ම ඵල ආදීන් ප්‍රත්‍යවේක්ෂණය සඳහා ආවර්ජනාදීහු උපදිති. යම් මාර්ග ඵලාදීන්ගේ හටගැනීමෙන් පසු, මේ තෙමේ මාර්ගය ප්‍රත්‍යවේක්ෂා කරයි. ඵලය ප්‍රත්‍යවේක්ෂා කරයි. ප්‍රහීණ වූ කෙලෙසුන් ප්‍රත්‍යවේක්ෂා කරයි. ඉතිරි කෙලෙසුන් ප්‍රත්‍යවේක්ෂා කරයි. නිර්වාණය ප්‍රත්‍යවේක්ෂා කරයි. හෙතෙම ඒකාන්තයෙන් මම මේ මාර්ගයෙන් පැමිණියේ වෙමියි මාර්ගය ප්‍රත්‍යවේක්ෂා කරයි. ඉක්බිති මම මේ අනුසස් ලද්දෙමියි ඵලය ප්‍රත්‍යවේක්ෂා කරයි. ඉක්බිති මගේ මෙනම් ක්ලේෂයෝ ප්‍රහීණ වූහයි ප්‍රහීණ කෙලෙස් ප්‍රත්‍යවේක්ෂා කරයි. ඉක්බිති මගේ මෙනම් කෙලෙස් ඉතිරිවූයේ යයි මතු මාර්ගයෙහිදී නැසිය යුතු කෙලෙස් ප්‍රත්‍යවේක්ෂා කරයි. අවසානයෙහි මා විසින් මේ ධර්ම අරමුණු වශයෙන් ලද්දෙමියි නිර්වාණය ප්‍රත්‍යවේක්ෂා කරයි. මෙසේ සෝවාන් ආර්යශ්‍රාවකයාට ප්‍රත්‍යවේක්ෂා පහක් වෙයි. සෝවාන් වූවහුට යම්සේද සකෘදාගාමී, අනාගාමි ආදීන්ටද එසේය. රහතුන්ට වනාහි ඉතිරි කෙලෙස් ප්‍රත්‍යවේක්ෂණයක් නම් නැත. ප්‍රත්‍යවේක්ෂණ සංඛ්‍යාව සතරකි. මෙසේ සියලුම ප්‍රත්‍යවේක්ෂා ඤාණ සංඛ්‍යාව එකුන් විස්සකි. ප්‍රහීණ, ඉතිරි කෙලෙස් ප්‍රත්‍යවේක්ෂණය ශෛක්ෂයින්ට සමහරවිට උසස් අන්දමින් සිදුවන්නටත් නොවන්නටත් පුළුවන. එවැනි ප්‍රහීණ නොවීමක් හේතුවෙන් මහානාම ශාක්‍ය තෙමේ බුදුරදුන්ගෙන් මෙසේ විචාළේය. කවරනම් කෙලෙස් ධර්ම කෙනෙක් මාගේ ආධ්‍යාත්මයෙන් ප්‍රහීණ නොවූයේද? යම් යම් අවස්ථාවලදී සමහරවිට ලෝභ ස්වභාවයද මාගේ හිත හාත්පසින් අල්වාගෙන සිටියි. ඒ ඇයි?

මෙහි ධම්මට්ඨිති ඤාණාදි එකොළොස් ඤාණයන්ගේ විස්තර කිරීම සඳහා මේ උපමාව දතයුතුය. පුරුෂයෙක් මසුන් අල්ලාගන්නෙමියි සිතා මසුන් අල්ලාගනු ලබන කෙමින ගෙන ඊට සුදුසු ජලයක බස්වා මඳ වේලාවක් සිට කෙමිනෙහි මුවින් අත බස්වා දිය ඇතුළත සිටි කළු සර්පයෙක් මත්ස්‍යයෙක්ය යන සංඥාවෙන් බෙල්ලෙන් දැඩිකොට ගෙන

මා විසින් විශාල මත්ස්‍යයෙක් ලදමියි සතුටින් ඔසවා බලන්නේ නයි පෙනයේ ස්වස්තික අකුර දැකීමෙන් සර්පයෙක් යයි හැඳින භයවූයේ ආදීනව දැක අල්ලාගැනීම පිළිබඳව කළකිරුණේ මිදෙනු කැමතිවී මිදීමට උපාය කරන්නේ නගුට අග සිට අත ලිහිල්කොට, අත ඔසවා හිස මුදුනෙහි දෙතුන් වරක් කරකවා සර්පයා දුර්වලකොට, යව එම්බල දුෂ්ට සර්පය යයි අත්හැර ජලයෙන් ගොඩ නැග සිටියේ, පින්වත, මහා සර්පයෙකුගෙන් මිදුනෙමියි සතුටුවූයේ පැමිණි මාර්ගය බලන්නේද? ඒ පුරුෂයාට මත්ස්‍යයෙක්ය යන සංඥාවෙන් කළු සර්පයෙකු දැඩිව ගෙන සතුටුවීම මෙන් මේ යෝගියාට මුල පටන් අඥාන පෘථජ්ජනයාට අනිත්‍යාදි වශයෙන් භයානක වූ ස්කන්ධ පංචකය නිත්‍යාදි සංඥාවෙන් මම, මගේ යන තෘෂ්ණා දෘෂ්ටිවලින් දැඩිව ගෙන සතුටුවීම මෙනි. ඔහුට කෙමින මුඛයෙන් සර්පයා ගෙනහැර නයිපෙනයේ ස්වස්තික අකුර දැක සර්පයෙක් යයි හැඳිනීම මෙන් ප්‍රත්‍යය සහිත නාමරූප පරිග්‍රහණයෙන් එකට එකතු වූ කොටස් වෙන්කොට කලාප වශයෙන් මෙනෙහි කිරීම් ආදී ඤාණයන්ගෙන් ස්කන්ධ පංචකයාගේ අනිත්‍යාදි ලක්ෂණත්‍රය දැක, අනිත්‍යය, දුක්ඛය, අනාත්මයයි තීරණය කිරීමයි. ඔහුගේ භයවීම මෙන් මොහුගේ භයතුපට්ඨාන ඤාණයයි. සර්පයාගේ ආදීනව දැකීම මෙන් ආදීනවානුපස්සනා ඤාණයයි. සර්පයා අල්ලා ගැනීමෙහිදී ඇතිවන කලකිරීම මෙන් නිබ්බින්දනානුපස්සනා ඤාණයයි සර්පයා අත්හැර දමනු කැමැත්ත මෙන් මුඤ්චිතු කම්‍යතා ඤාණයයි. පටිසංඛානුපසසනා ඤාණය සර්පයාගෙන් මිදීමේ උපාය කල්පනා කිරීම මෙනි. සර්පයා කරකවා දුර්වලකොට දෂ්ට කරන්නට අසමත් බවට පත්කිරීම මෙන්, සංඛාරුපෙක්ඛා අනුලෝම ඤාණයන්ගෙන් ත්‍රිලක්ෂණයට නංවා සංස්කාරයන් කරකවා දුර්වලකොට නැවත නිත්‍ය සුඛ ආත්ම ආකාරයෙන් වැටහෙන්ට අසමර්ථතාවයට පත්කිරීම දතයුතුය. සර්පයා අත්හැරීම ගොත්‍රභූ ඤාණය මෙනි. සර්පයා අත්හැර ගොඩට වී සිටීම නිර්වාණ නමැති ගොඩට නැග සිටි මාර්ගඵල ඥාන දැක්විය හැකිය. සතුටට පත්වූවහුගේ පැමිණි මාර්ගය බලන්නාක් මෙන් මාර්ගාදිය ප්‍රත්‍යවේක්ෂා කරන ඤාණයන් දතයුතුය. මේ ශ්‍රැතමය ඤාණාදී තුදුසක් ඤාණයන්ගේ උපදින ආකාරයන්ගෙන්ද උපදවාගැනීමේ ප්‍රතිපත්ති ක්‍රමයෙන්ද, දේශනා ක්‍රමය කළ හෙයින් ප්‍රත්‍යවේක්ෂණයෙහිදී, පළමුව කෙලෙස් ප්‍රත්‍යවේක්ෂණය වෙයි. (දක්වයි) ඉන්පසු මාර්ගඵල නිර්වාණ ප්‍රත්‍යවේක්ෂණයන් යයි දතයුතුය.

සසරින් නිදහස දෙන, නිවනට යන මිථ්‍යාදෘෂ්ටීන්ගේ ප්‍රහාණය

සඳහා කාමරාග ව්‍යාපාදාදීන්ගේ තුනීභාවය කරනු සඳහා කාමරාග ව්‍යාපාදාදීන්ගේ සේස නොමැති ප්‍රහාණය සඳහා, රූපරාග මාන උද්ධච්ච අවිජ්ජාදීන්ගේ සේස නොමැති ප්‍රහාණය සඳහා ලෝකෝත්තර ධ්‍යානය වඩයි යන මෙහි කෙලෙස් ප්‍රහාණයම අධිකකොට මාර්ග ප්‍රතිපත්තියෙහි කියන ලද බැවින් ප්‍රතිපත්තියට අනුරූප අයුරින්ම කෙලෙස් ප්‍රත්‍යවේක්ෂණයෙහි මුල්භාවය යෙදේ. අර්ථකථාවෙහි කියන ලද ක්‍රමයම දක්වන ලද්දේමය. ඒ ක්‍රමය වනාහි, උත්පත්ති ක්‍රමය, ප්‍රහාණ ක්‍රමය, ප්‍රතිපත්ති ක්‍රමය, භූමික්‍රමය, දේශනා ක්‍රමයයි පංචවිධ වේ.

**පඨමං කලලං හොති - කලලා හොති අබ්බුදං**
**අබ්බුදා ජායතෙ පෙසී - පෙසී නිබ්බත්තී ඝනො'ති**

පළමුව කළලය වෙයි. කළලයෙන් අර්බුද අවස්ථාව වේ. අර්බුදයෙන් පේසි අවස්ථාවටත්, ඉන් පසු පේසියෙන් ඝනය හටගනියි.

මේ ආදිය උත්පත්ති ක්‍රමයයි. 'දස්සනෙන **පහාතබ්බා ධම්මා** භාවනාය පහාතබ්බා ධම්මා' යන මේ ආදිය ප්‍රහාණ ක්‍රමයයි. '**සීල විසුද්ධි,** චිත්ත විසුද්ධි, දිට්ඨි විසුද්ධි, **කංඛාවිතරණ විසුද්ධි, මග්ගාමග්ග ඤාණ** දස්සන විසුද්ධි, **පටිපදා** ඤාණ දස්සන **විසුද්ධි,** ඤාණ දස්සන **විසුද්ධි'** යන මේ ආදිය ප්‍රතිපත්ති ක්‍රමයයි. '**කාමාවචර ධම්මා, රූපාවචර ධම්මා,** අරූපාවචර ධම්මා' යන මේ ආදිය භූමික්‍රමයයි. '**චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්චබලානි, සත්ත බොජ්ඣංගා, අරියො අට්ඨංගිකො මග්ගො'** යනුද, '**ආනුපුබ්බිං කථං කථෙසි, සෙය්‍යථීදං, දානකථං සීලකථං, සග්ගකථං, කාමානං ආදීනවං ඔකාරං, සංකිලෙසං නෙක්ඛම්මෙච ආනිසංසං පකාසෙසි'** යන මේ ආදිය දේශනා ක්‍රමයයි. මෙහි වනාහි තුදුසක් ඤාණයන්ගේ උත්පත්ති ක්‍රමය, ප්‍රතිපත්ති ක්‍රමය යන දෙයාකාරයෙන් පිළිවෙළින් දක්වා ඇතිහෙයින් ඒවාද ඇතුළුව දේශනා ක්‍රමයද ගෙන ක්‍රම තුනක් දතයුතුය. දැන් යට ස්වභාව තත්වයෙන් නාමරූප ව්‍යවස්ථා ඤාණය නොකියන ලදී. එහෙයින් පස් ආකාරයකින් නාමරූප ප්‍රභේද දැක්වීමට, අජ්ඣත්ත වවත්ථානෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං ආදි ඤාණ පංචකයක් දක්වන ලද්දාහු වෙති. සියලු නාමරූපයන් කී කල්හි යමක් අල්ලාගන්ට පුලුවන් වේද, යමක් අල්ලා ගතයුතුද එය අල්ලා ගන්නේය. ලෝකෝත්තර නාමයන් වනාහි පරිග්‍රහණය කරන්ට නොහැකිය අවබෝධ නොකළ හෙයින් පරිග්‍රහණය නොකළ යුතුය. විදර්ශනාවට නොපැමිණි හෙයිනි.

**එහි අජඣත්ත වවත්ථානෙ** යනු, මෙසේ පවතිනු ලබන අපි ආත්මයයි ග්‍රහණයට යන්නෙමුයි, මෙවැනි අදහසකින් තමා යන දෘෂ්ටියක් ඇතිකොට පවතීනුයි අධ්‍යාත්ම නම්. අජඣත්ත ශබ්දය වනාහි ගෝචර අජඣත්ත, නියකජ්ඣත්ත, අජඣත්තජ්ඣ, විසයජ්ඣත්ත යන අර්ථ සතරක පෙනේ.

**තෙන ආනන්ද භික්ඛුනා තස්මිං යෙව පුරිමස්මිං සමාධි නිමිත්තෙ අජඣත්තමෙව චිත්තං සණ්ඨපෙතබ්බං, අජඣත්ත රතො සමාහිතො** යන ආදීන්හි ගොචරජ්ඣත්ත (අරමුණ) යෙහි පෙනේ. 'අජඣත්තං' සම්පසාදනං, අජඣත්තංච ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආදීන්හි නියකජ්ඣත්ත (ස්වකීය, තමා අයත්) යෙහි පෙනේ. 'ඡ අජඣත්තිකානි ආයතනානි අජඣත්තිකා ධම්මා ආදීන්හි අජඣත්තජ්ඣයෙහි (තමා පිළිබඳ) පෙනේ. **'අයං ඛො පනානන්ද විහාරො තථාගතෙන අභිසම්බුද්ධො, යදිදං සබ්බ නිමිත්තානං අමනසිකාරා අජඣත්තං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරති'** ආදීන්හි විසයජ්ඣත්ත (ආධාර වන දේ) ඉස්සරියට්ඨාන (ආධිපත්‍යය) යන අර්ථයි. ඵල සමාපත්තීන්හි බුදුවරයන්ට ආධිපත්‍යය ස්ථානය නම් වේ. මෙහි වනාහි අජඣත්තජ්ඣයෙහි (තමා පිළිබඳ) යයි දතයුතුය. ඒ අධ්‍යාත්මයන්ගේ ව්‍යවස්ථානයෙහි (නියම කිරීමෙහි) ආධ්‍යාත්ම ව්‍යවස්ථානයෙහි

**වත්ථු නානත්තෙ** යනු වස්තූන්ගේ විවිධාකාර භාවයෙහි, නොයෙක් වස්තූන්හි යන අර්ථයි. මෙහි ජවන මනො විඤ්ඤාණයට උපකාරී වූ භවංග මනසද, ඇස ආදී පංචකය මෙන් උත්පත්ති ස්ථානය බැවින් වස්තුයයි කියන ලද්දේය. ආවර්ජනයද එය ඇසුරුකොටම කළ යුතුය. **බහිද්ධා** යනු අජඣත්තජකඛත්ත සයෙන් පිටත පිහිටි ඔවුන්ට විෂය වූ ස්ථානයන්හි. **ගොචර නානත්තෙ** යනු ගොදුරුවන අරමුණුවල විවිධත්වයයි. **චරියා වවත්ථානෙ** යනු, සිතීමේ චර්යාව, නොදැනීමේ චර්යාව, ප්‍රඥා චර්යාව වශයෙන් චර්යාවන්ගේ පිරිසිඳ දැනීමයි. චරිය වවත්ථානෙ යනුවෙන් කෙටියෙන්ද කියවති. **චතුධම්ම වවත්ථානෙ** යනු කාමාවචර භූමි ආදීන්ගේ දැකීම චතුෂ්ක වශයෙන් ගෙන, ධර්ම සතරක් බැගින් ව්‍යවස්ථානයයි. **භූමි** යනු චතුභූමි ගතංච වෙහාසට්ඨංච ආදී තන්හි පෘථුවිය යන අර්ථයෙහි වැටේ. භූමිකාවාසෙ වසී යන තන්හි ප්‍රදේශය යන අර්ථයෙහි වැටේ. **සුඛභූමියං කාමාවචරෙ** ආදී තන්හි උපදින ස්ථානයේ වැටෙයි. මෙහි වනාහි කොටස යන අර්ථයෙහි වැටේ. වෙන්කිරීමෙහි යයිද කියති.

නවධම්ම වවත්ථානෙ යනු කාමාවචර කුසලාදි වශයෙන්, ප්‍රමෝදය මූලික වශයෙන් නුවණින් මෙනෙහි කිරීම මූලික වශයෙන් ධර්මයන් නවයක් නවයක් බැගින් වෙන්කිරීමයි. මෙහිද ඤාණ පහක් අතර, පළමුව අධ්‍යාත්මික ධර්ම වෙන්කළ යුතුයයි වස්තු නානත්වයෙහි ඤාණය පළමුව කියන ලදී. ඉනික්බිති ඔවුන්ගේ විෂය ව්‍යවසථාපනය සඳහා ඉන් අනතුරුව ගෝචර නානත්වයෙහි ඤාණය කියන ලදී. ඉන්පසුව ත්‍රිවිධ ඤාණයෝ තුන හතර වශයෙන් අනුලෝම ගණනින් කියන ලද්දේය.

දැන් නාමරූපයන්ගේ ප්‍රභේද වශයෙන් ව්‍යවස්ථාපන ඤාණය ඤාත පරිඤ්ඤා-තීරණ පරිඤ්ඤා පහාන පරිඤ්ඤා වශයෙන් ත්‍රිවිධාකාර වූ විශේෂ දැනුම් ඒ හා සම්බන්ධ සිත් දියුණු කිරීමෙන් සාක්ෂාත් වෙති. එහෙයින් ධම්ම නානත්ත ඤාණයට අනතුරුව, ඤාතට්ඨ ඤාණාදී පංච ඤාණයෝ දක්වන ලදහ. ඤාත පරිඤ්ඤා තුනකි. එහි 'රුප්පන ලක්ඛණං රූපං, වෙදයිත ලක්ඛණං වෙදනාති' මෙසේ ඒ ඒ ධර්මයන්ගේ වෙන් වෙන්ව පවතින ස්වභාවයන් සැලකීම් වශයෙන් පවතින ප්‍රඥාව ඤාත පරිඤ්ඤා නම් වේ. 'රූප අනිච්චං දුක්ඛං අනත්තා, වෙදනා අනිච්චා දුක්ඛා අනත්තා' ආදී ක්‍රමයෙන් ඒ ඒ ධර්මයන්ගේ පවතින ස්වභාව ලක්ෂණයන් කෙරෙහි සිත යොමුකොට පැවතුණු විදර්ශනාව තීරණ පරිඤ්ඤා නම් වේ. ඒ ධර්මයන්හිම නිත්‍ය සංඥාදිය අත්හැරීම් වශයෙන් පැවතුණු ලක්ෂණාරම්මණික විදර්ශනා ප්‍රඥාව පහාන පරිඤ්ඤා නම් වේ. එහි සංස්කාරයන් පිරිසිඳීමෙහි පටන් ප්‍රත්‍යය පරිග්‍රහණය දක්වා ඤාත පරිඤ්ඤාවගේ භූමියයි. ඒ අතරෙහි ධර්මයන්ගේ වෙන් වශයෙන් පවතින ස්වභාව අවබෝධයෙහිම ස්වාමිත්වය වේ. කලාප මෙනෙහි කිරීමේ පටන්, උදයව්‍යයානුපස්සනාව දක්වා තීරණ පරිඤ්ඤාවගේ භූමියයි. ඒ අතරතුර සමාන ලක්ෂණ අවබෝධයෙහිම ප්‍රධානත්වය වේ. භංගානුපස්සනාව මුල්කොට මතුමත්තෙහි සියල්ල ප්‍රහාණ පරිඤ්ඤාවගේ භූමියයි. එතැන් පටන් අනිත්‍ය වශයෙන් නුවණින් බලන්නේ නිත්‍ය සංඥාව දුරලයි. දුක් වශයෙන් නුවණින් බලන්නේ සුව සංඥාව අත්හරියි. අනාත්ම වශයෙන් නුවණින් බලන්නේ ආත්ම සංඥාව අත්හරියි. කලකිරෙන්නේ තෘෂ්ණාව අත්හරියි. නොඇලෙන්නේ ඇල්ම දුරුකරයි. නිරුද්ධ කරන්නේ හටගැනීම නැතිකරයි. අත්හරින්නේ දැඩිව ගැනීම අත්හරියි. මෙසේ නිත්‍ය සංඥා ආදීන්ගේ ප්‍රහාණය සිදුකරන සප්ත අනුපස්සනාවන්ගේ ප්‍රධානත්වය වේ.

එහි **අභිඤ්ඤා පඤ්ඤා** යනු ධර්මයන්ගේ (ස්වභාවයන්ගේ) වෙනස්වීම් ආදි ස්වභාවයෙන් දැනගන්නා ඤාණයයි. එය වනාහි සෝභනාර්ථයෙන් ඒ ඒ ධර්මයන්ගේ ස්වභාවය දැනීම යහපත් සේ දනිත් යයි අභි ශබ්දය එකතුකොට අභිඤ්ඤා යයි කියනු ලැබේ. **ඤාතට්ඨෙ ඤාණං** යනු දැනගන්නා ස්වභාවයේ ඤාණයයි. **පරිඤ්ඤා පඤ්ඤා** යනු දැනගැනීමේ ප්‍රඥාවයි. එය පැතිරීම් වශයෙන් අනිත්‍යාදි පොදු ලක්ෂණ වශයෙන්ද, තමාගේ කෘත්‍යයන් නිමාකිරීම් වශයෙන්ද ව්‍යාප්තව දනීනුයි පරිශබ්දයත් එකතුව පරිඤ්ඤායයි කියනු ලැබේ. **තීරණට්ඨෙ ඤාණං** යනු විමසා බැලීමේ ඤාණයයි. **පහානෙ පඤ්ඤා** යනු නිත්‍ය සංඥාදීන්ගේ දුරුකිරීමේ ප්‍රඥාවයි. දුරුකෙරෙත්නුයි, හෝ එයින් දුරුකෙරෙත්නුයි පජහනං නම් වේ. **පරිච්චාගට්ඨෙ ඤාණං** යනු පරිත්‍යාග කිරීමේ ස්වභාව ඤාණයයි. **භාවනා පඤ්ඤා** යනු වඩන ප්‍රඥාවයි. **එකරසට්ඨෙ ඤාණං** යනු තනි කෘත්‍ය ස්වභාවයේ ඤාණයයි. විමුක්ති (මිදීම) රසයෙන් හෝ එක් රස ස්වභාවයේ ඤාණයයි. **සච්ඡිකිරියා පඤ්ඤා** යනු ප්‍රතිවේධ වශයෙන් හෝ ප්‍රතිලාභ වශයෙන් හෝ ප්‍රත්‍යක්ෂ කිරීමෙහි ප්‍රඥාවයි. **ඵුසනට්ඨෙ ඤාණං** යනු ඒ දෙයාකාරයෙන්ම විඳීමේ ස්වභාව ඤාණයයි.

දැන් යම්හෙයකින් ප්‍රහාණය, වැඩීම, සාක්ෂාත් කිරීමේ ඤාණ ආර්ය මාර්ග හා එකට යෙදුණාහුම වෙති. එහෙයින් ඊට අනතුරුව ආර්ය පුද්ගලයන්ටම ලැබිය යුතු සතර ප්‍රතිසම්භිදා ඤාණයන් දක්වන ලද්දේය. එහිද හේතුවකින් උපන්නේය යන අර්ථයෙන් දුක්ඛ සත්‍යය මෙන් මනාව දතහැක්කේ, ප්‍රකට වූයේනුයි පළමුවෙන් අර්ථ ප්‍රතිසම්භිදාව දක්වන ලද්දේය. අර්ථයාගේ හේතුධර්මයන්ට විෂයවන බැවින් ඉන් අනතුරුව ධම්ම පටිසම්භිදා ඤාණය දක්වයි. ඒ දෙකට නිරුක්ති විෂය වන බැවින් ඉන් අනතුරුව නිරුක්ති ප්‍රතිසම්භිදා ඤාණය දක්වයි. ඒ ඒ ඤාණයන්හි පවත්වන හෙයින් ඉන් අනතුරුව ප්‍රතිභාණ ප්‍රතිසම්භිදා ඤාණයයි 'පකාරය දීර්ඝ කොටද පාඩම් කරති. මින් මත්තෙහි විහාරාර්ථයෙහි ඤාණාදී ත්‍රිවිධ ඤාණයෝ ආර්යයන්ටම ලැබෙන හෙයින් ප්‍රතිසම්භිදා ප්‍රභේද වශයෙන්ද ප්‍රතිසම්භිදා ඤාණයට අනතුරුව දක්වන ලදී. **විහාරට්ඨෙ ඤාණං** යනු ධර්ම ප්‍රතිසම්භිදාව වෙයි. සමාපත්ති අර්ථයෙහි ඤාණය අර්ථ ප්‍රතිසම්භිදාවයි. ධර්ම ස්වභාවයෙහි ඤාණයද ප්‍රතිසම්භිදා කථාවෙහි ධර්ම ප්‍රතිසම්භිදායයි කියන ලදී. නිර්වාණයෙහි ඤාණය වනාහි අර්ථ ප්‍රතිසම්භිදාවයි. එහි **විහාර නානත්තෙ** යනු අනිත්‍යානුපස්සනා වශයෙන් නොයෙක් විදර්ශනා විහරණයන්ය. **විහාරට්ඨෙ** යනු විදර්ශනාවෙන් යුක්තව

වාසය කරන ස්වභාවයෙහි විහාරො යනු එකට යෙදුණු විදර්ශනාවමය. **සමාපත්ති නානත්ත** යනු අනිමිත්තාදි වශයෙන් වූ විවිධ ඵල සමාපත්තියෙහි, සමාපත්ති යනු ලෝකෝත්තර වූ චිත්ත චෛතසික ධර්මයෝය. **විහාර සමාපත්ති නානත්ත** යනු දෙකක් වශයෙන් කියන ලදී. එයින් විහාර සමාපත්ති ඤාණය සිදුකරන්නා වූ, දෙඅයුරකින් නැගිටින පෙරළෙන ප්‍රඥාවයයි පෙර කියන ලද, මාර්ග ඤාණයාගේ, ආස්‍රවයන් මුල්සිඳ දැමීමට ඇති හැකියාවද අනතුරු ඵලදායකත්වයද යන කරුණු විශේෂයෙන් දක්වා වෙනත් අයුරකින් කියනු කැමැත්තේ එයම ආනන්තරික සමාධියෙහි ඤාණයයි දක්වන ලදී.

එහි **අවික්ඛෙප පරිසුද්ධත්තා** යනු එයින් සිත (විසුරුවයි) අවුල් කරයිනුයි වික්ෂෙප නම්. මෙය නොසන්සුන්කමට නමකි. නොවිසිරේනුයි අවික්ෂේප නම් වේ. නොසන්සුන්කමට විරුද්ධ සමාධියට මෙය නමකි. පාරිශුද්ධියෙහි ස්වභාවය පාරිශුද්ධත්වයයි. අවික්ෂෙපයාගේ පාරිශුද්ධත්වය අවික්ෂෙප පාරිශුද්ධියයි. එහෙයින් අවික්ෂෙපයෙන් පිරිසිදු බැවින් සමාධියගේම පරිශුද්ධභාවයෙන් යයි අර්ථයි. මෙය ආශ්‍රව මුල් සිඳින්නා වූ අනතුරු ඵලදායකත්වයටම හේතුවන කරුණයි. **ආසව සමුච්ඡෙදෙ** යනු මෙහි පැසේනුයි (වැගිරේනුයි) ආසව නම් වේ. ඇසින්ද -පෙ- මනසින්ද ගලත්. පවතිත් යයි කියන ලද්දේ වෙයි. චිත්ත චෛතසික ධර්මයන්ගේ වශයෙන් ගෝත්‍රභූ තෙක්ද, අවකාශ වශයෙන් භවාග්‍රය තෙක්ද ගලත්නුයි ආශ්‍රව නම් වේ. එකක් එකකට ඇතුල්වන්ට ඉඩදී පවතිත්නුයි අර්ථයි. ඇතුල්කිරීම මේ ආකාර වේ. බොහෝකලක් පැසවීම් අර්ථයෙන් ධාන්‍ය වර්ගවලින් පෙරූ මත්පැන් නමැති ආසව වැනිනුයි ආසව නම් වේ. ලෝකයෙහි බොහෝකලක් පැසවූ ධාන්‍ය වර්ගවලින් පෙරූ මත්පැන් ආසවයයි කියති. බොහෝකලක් පැසවූ හෙයින් ඒවා ආසවයන් වීමට සුදුසුය. වදාරන ලද්දේය. මහණෙනි, මින් පෙර අවිද්‍යාව නොවූයේය. ඉන්පසු හටගත්තේ යයි අවිද්‍යාවගේ පූර්ව කෙළවර පැහැදිලි නොවේ. දීර්ඝ වූ සසර දුක් ගලත් උපදවත්නුයි ආසව නම් වේ. මේ කරණකොට විනාශ වේනුයි සමුච්ඡෙද නම්. **ආසව සමුච්ඡෙදෙ පඤ්ඤා** යනු කාමාසවාදි සිව් ආසවයන්ගේ විනාශ කිරීමෙහි ප්‍රඥාවයි. **ආනන්තරික සමාධිම්හි ඤාණං** යනු තමාගේ පැවැත්මට අනතුරුව නියම වශයෙන්ම ඵල ප්‍රදානය කරන හෙයින් ආනන්තරිකයයි ලබන ලද නාමය ඇති මාර්ග සමාධියයි. මාර්ග සමාධිය උපන් කල්හි එහි ඵල උත්පත්තිය වළකාලන කිසිදු අනතුරක් නැත. කියන ලද්දේද වේ. මේ පුද්ගලයා සෝවාන්ඵල සාක්ෂාත්

කිරීම සඳහා පිළිපන්නේ වේද? එවිටම කල්ප විනාශය ආරම්භවන අවස්ථාවක් වන්නේද? මේ පුද්ගලයා සෝවාන් ඵලය සාක්ෂාත් කරන තෙක් කල්ප විනාශය නොවන්නේය. එහෙයින් මේ පුද්ගලයා කල්ප විනාශය නවත්වන, ඨිතකපපී නම් වේ. සියලුම සෝවාන් ආදී මාර්ගාංගයන් ගෙන් යුක්ත පුද්ගලයෝ ඨිත කප්පීහු නම් වෙති. මේ ඒ ආනන්තරික සමාධිය හා එක්ව යෙදුණු ඤාණයයි. මේ මාර්ග ඤාණයෙන් ඵලප්‍රාප්ත ආර්යන්ටම හටගන්නා හෙයින් මේ ඤාණයට අනතුරුව අරණ විහාර ඤාණාදි ඤාණ හතර දක්වන ලදී. එහිද රහතුන්ටම නිතර හටගන්නා බැවින් අරණ විහාර ඤාණය පළමුව දක්වන ලදී.

ඉන් අනතුරුව නිරෝධ සමවතෙහිලා අනාගාමි හා රහතුන්ට නිරෝධය හටගැන්මෙහිලා බොහෝ ප්‍රවණතා ඇති හෙයින්ද විශේෂයෙන් නිරෝධය ඉහාත්ම නිර්වාණයයි පිළිගත් හෙයින්ද නිරෝධ සමාපත්ති ඤාණය උදෙසන ලදී. ඉන් අනතුරුව පරිනිර්වාණ කාලාන්තරයෙහිලා පරිනිර්වාණ කාලය ගටා සිටි හෙයින් දීර්සකාලික යැයි පරිනිර්වාණ ඤාණය උදෙසන ලදී. ඉන් අනතුරු සමසීසට්ඨයාගේ සියලු කෙලෙස් ක්‍ෂය කිරීමෙන් අනතුරුව වන පිරිනිවන් කාලය ගටා සිටි හෙයින් හ්‍රස්ව කාලිකයැයි සමසීසට්ඨ ඤාණය උදෙසන ලදී. එහි, සනෙතාවාති චකාරය දසසනාධිපතෙය්‍ය, විහාරාධිගම, පණිතධි මුතනතා යන පදත්‍රය සමගම සම්බන්ධ කරගත යුතුය. **දසසනං** යනු විදර්ශනා ඤාණයයි. අධිපතිභාවයම ආධිපතෙය්‍ය නම්. අධිපතිත්වයෙන් (ස්වාමිත්වය) පැමිණි හෙයින් ආධිපතෙය්‍ය නම්. දර්ශනයද ආධිපතිත්වයද එකට සම්බන්ධ වූයේනුයි **දසසනාධිපතෙය්‍ය** නම්. විහරණය = විහාර නම්. එය කරණකොට වාසය කෙරෙත්නුයි විහාර නම් වේ. අවබෝධ කරයි පැමිණෙයිනුයි අධිගම නම්. අවබෝධකොට වාසය කිරීම **විහාරාධිගමො** යි එයද කෙලෙස් දාහයන්ගෙන් විරහිත බැවින් නිවුණේනුයි සාන්තයි **සනෙතා**. ඒ අර්හත්ඵල සමාපත්තියද, උතුම් අර්ථයෙන්ද, නොතැවෙන අර්ථයෙන්ද ප්‍රණීත නම් වේ. ප්‍රධානභාවයට ගෙන ගියේනුයි ප්‍රණීතයි. ප්‍රණීත, ඇලුණු, සැක නැති සිතැත්තේ එහිම යෙදුණේ ප්‍රණීතාධිමුත්තයි. එහි ස්වභාවය **ප්‍රණීතාධිමුතතතායි**. ඒ ඵල සමාපතතාධිමුතතතාවය පූර්වභාග ප්‍රඥාවමය. **අරණ විහාරෙ** යනු නිකෙලෙස් විහරණයයි. රාගාදීහු සත්ත්වයින් කුඩුකරත් තලත් මඩිත්නුයි රණනම් වේ. සත්ත්වයෝ මෙයින් පීඩාවට පත්වෙති. හඬති. වැළපෙති නුයි = රණයි. කියන ලද ත්‍රිවිධ විහරණයන් ඔහුට කෙලෙස් නැත්තේනුයි අරණයි. නොයෙක් විරුද්ධ ස්වභාවයන් එයින් ඉවත්

කෙරේනුයි විහාරයි. ඒ අරණ විහාරයන්හි නිර්දේශ වාරයෙහි කියන ලද, ප්‍රථමධ්‍යානාදීන් ප්‍රණීතාධි මුත්තතාවෙහිම සංග්‍රහ කරන ලදී. ඵලසමාපත්තියට සමවදිනු කැමැත්තහු විසින් ප්‍රථමධ්‍යානාදීන්ට සමවැදී නැගිට ධ්‍යාන හා එක්වූ ධර්මයන් නුවණින් බලයි. අරණ විභංග සූත්‍රාන්තයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද යම් අරණ ප්‍රතිපදාවක් වේද, එයද සංග්‍රහ කරන ලද්දේයයි දතයුතුය.

භාග්‍යවතුන් වහන්සේ විසින් එහි දේශනා කරන ලද්දේය. මහණෙනි, ඔබලාට අරණ විභංගය දේශනා කරන්නෙමි. හීන වූ, ග්‍රාම්‍ය වූ, පෘථජ්ජනික වූ, අනාර්ය වූ, අනර්ථය පිණිස හේතු වූ කම්සැපයෙහි නොයෙදෙන්නේය. (නොයෙදිය යුතුය.) දුක්වූ අනාර්ය වූ අනර්ථය පිණිස හේතුවූ ශරීරය වෙහෙසට පත්කිරීමේ යෙදීම්වල නොයෙදෙන්නේය. මහණෙනි, මේ අන්ත දෙකටම නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් මනාසේ වටහාගත් නැණැස ඇතිකරන, ප්‍රඥාව ඇතිකරන මධ්‍යම ප්‍රතිපදාව සන්සිඳීම පිණිස, විශිෂ්ට දැනුම සඳහා මනා අවබෝධය සඳහා පවතියි. ප්‍රශංසාවද දැනගන්නේය. දෝෂාරෝපණයද දැනගන්නේය. ප්‍රශංසාවද දැන දෝෂාරෝපණයද දැන ප්‍රශංසා නොකරන්නේය. දෝෂාරෝපණද නොකරන්නේය. සුව විනිශ්වය දැනගන්නේය. සුව විනිශ්වය දැන අධ්‍යාත්ම සුවයෙහි යෙදෙන්නේය. රහස්කීම් නොකියන්නේය. හමුවෙහි ක්‍ෂයවූවක් නොකියන්නේය. ඉක්මන් නොවෙමින් කථා කරන්නේය. ඉක්මන්වෙමින් කථා නොකරන්නේය. ප්‍රදේශ භාෂා ව්‍යවහාරය නොඉක්මවන්නේය. සමානත්වය අතිධාවනය නොකරන්නේය. මේ අරණ විභංගයේ උද්දේසයයි. -පෙ- මහණෙනි, එහි යමෙක් කාම ලෝක ප්‍රතිසන්ධියෙන් සුවපත්වූයේ -පෙ- සතුටුදායක යෙදුම්වල නොයෙදන්නේය. හීනවූ -පෙ- අනර්ථ සහිත වූ, ඒ සම්‍යක් ප්‍රතිපදාව දුකෙන් තොරය. විපතක් නොවන්නේය බලවත් සිත්තැවුලක් නොවන්නේය. වැලපීමක් නොවන්නේය. එහෙයින් ඒ ධර්මය අරණය. -පෙ- මහණෙනි, යම් ඒ අනාර්ය වූ අනර්ථ සහිත වූ දුක්වූ ආත්මය වෙහෙසට පත්කරන ක්‍රියාවක් වේද, එහි නොයෙදෙන්නේ වේද ඒ ස්වභාවය දුක්නොවේ. -පෙ- එහෙයින් ඒ ධර්මය අරණයි. මහණෙනි, යම් ඒ තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කළ මධ්‍යම ප්‍රතිපදාවක් වේද, ඒ ස්වභාවය දුක් නොවේ. -පෙ- එහෙයින් ඒ ධර්මය අරණයි. මහණෙනි, යම් ඒ ප්‍රශංසා කිරීමක් නොවන්නේද, දෝෂාරෝපණ කිරීමක් නොවන්නේද, ධර්මදේශනාවක් නිසි අයුරින් වේද, එය දුක් නොවේ. -පෙ- එහෙයින් ඒ ධර්මය අරණයි.

මහණෙනි, යම් ඒ නෛෂ්ක්‍රම්‍ය සුවයක් වේද, විවේක සුවයක් වේද, සන්සිඳීම් සුවයක් වේද, මනා අවබෝධ කරගැනීමේ සුවයක් වේද, එය දුක් නොවේ. එහෙයින් ඒ ධර්මය අරණයි. මහණෙනි, යම් ඒ සිදුවූ, සත්‍ය අර්ථ සහිත රසාස්වාදයක් වේද, එම ස්වභාවය දුක් නොවේ. -පෙ- එහෙයින් ඒ ධර්මය අරණයි. මහණෙනි, යම් ඒ සිදුවූ, සත්‍ය වූ, අර්ථ සහිත ඉදිරිපිට ක්ෂීණවාදයක් වේද, ඒ ධර්මය අරණයි. මහණෙනි, යම් ඒ කථාවක් ප්‍රදේශ ව්‍යවහාරය ඉක්මවා නොයන ව්‍යවහාරය නොඉක්මවන්නේද එය දුක් නොවේ. -පෙ- එහෙයින් ඒ ධර්මය අරණයි. එහෙයින් මහණෙනි, කෙලෙස් සහිත ධර්මය දැනගන්නෙමු. කෙලෙස් නැති ධර්මයද දැනගන්නෙමු. කෙලෙස් සහිත ධර්මයද දැන කෙලෙස් රහිත ධර්මයද දැන කෙලෙස් රහිත ප්‍රතිපදාවෙහි පිළිපදින්නෙමුයි මහණෙනි, නුඹලා එසේ හික්මිය යුතුය. මහණෙනි, සුභූති කුලපුත්‍ර කෙලෙස් රහිත ප්‍රතිපදාවෙහි පිළිපන්නේ වෙයි. එහි මධ්‍යම ප්‍රතිපදාව දර්ශනාධිපත්‍ය වශයෙන්ද සාන්ත විහාරාධිගම වශයෙන්ද සංග්‍රහ කරන ලදී. කම්සුවය, ශරීරය වෙහෙසට පත්කරන ක්‍රියාවල නොයෙදෙන්නේ එය මධ්‍යම ප්‍රතිපදාවයි. රහතුන්ට වනාහි විදර්ශනා පූර්වභාග මධ්‍යම ප්‍රතිපදාව වේ. අර්හත් ඵල සමවත අෂ්ඨාංගික මාර්ග වශයෙන් වන මධ්‍යම ප්‍රතිපදාවයි. සෙස්ස ප්‍රණීත සංකල්පනයන් තුළින් ලබාගනී යයි සංග්‍රහ කරන ලද්දේයයි දතයුතුය. සියලු රහත්හු, අරණ විහාරීය. අනෙක් රහත්හු ධර්මය දේශනා කරන්නාහු යහපත් මාර්ගයට පිළිපන් අය යහපත් මාර්ගයට පිළිපන්නේ යයිද, වැරදි මාර්ගයට පිළිපන් අය වැරදි මාර්ගයට පිළිපන්නේ යයිද පුද්ගල වශයෙන්ද ප්‍රශංසා දෝෂාරෝපණාදිය කොට ධර්මය දේශනා කරත්. සුභූති තෙර මේ වැරදි ප්‍රතිපදාවය, මේ යහපත් ප්‍රතිපදාවයයි ධර්මය දේශනා කළේය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඔහුම අරණ ප්‍රතිපදාවෙහි පිළිපන්නේ යයි වර්ණනා කළහ. 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර යම් ඒ සුභූති නමැති භික්ෂුවක් වේද, අරණ විහාරි භික්ෂූන් අතර ඔහු අග්‍රයයි අරණ විහාරීන් අතර අග්‍රස්ථානයෙහි තැබුවේය.

**ද්වීහි ඵලෙහි** යනු සමථඵල, විදර්ශනා ඵලයන්ගෙන්, සමන්නාගතතා යනු යෙදුණු බැවින් සම්පූර්ණත්වයට පත්හෙයින්, **තයොචාති** විභක්ති විපර්යාසයකි. **තිණණං** යනුවෙන් යොදාගත යුතුය. **සංඛාරානං** යනු වචීසංඛාර, කාය සංඛාර, චිත්ත සංඛාරයන්ගේ - **පටිප්පසසද්ධියා** යනු සන්සිඳීම සඳහා නිරෝධය සඳහා නොපැවැත්ම සඳහා, **සොළසහි** යනු අනිත්‍යානුපස්සනාදි අටමාර්ගයන්ද ඵල අටද

යන දහසයෙනි. **ඤාණ චරියාහි** යනු නුවණ හැසිරවීම රූපාවචර අරූපාවචර සමාධි හා එහි උපචාර සමාධිය යන නවයෙන් **වසීභාවතා පඤ්ඤා** යනු සැහැල්ලුවෙන් සුවසේ පැවැත්මයි. වසීභාවයෙහි ආධිපත්‍යයට පැමිණ එය ඔහුට ඇත්තේනුයි වසී නම්. වසියගේ ස්වභාවය වසීභාවයයි. වසීභාවයම වසී භාවනාවයි. යම්සේ පිළිකුල් වූයේම පටික්කූලයයි කියාද, එසේම මේ ආකාර වූ ප්‍රඥාව වසීභාවනා පඤ්ඤායයි කියනු ලැබේ. සි කාරය දීර්ඝකොටම කියවති. යුක්ත වූ බැවින්ද සංසිඳවීමෙන්ද ඥාන චර්යාවන්ගෙන්ද සමාධි චර්යාවන්ගෙන්ද යනුවෙන් 'ච' කාරය සම්බන්ධ කරගත යුතුය.

**නිරොධ සමාපත්තියා ඤාණං** යනු අනාගාමී හා රහතුන්ගේ නිරෝධ සමාපත්ති නිමිතිකොට ඇතිවන ඤාණයයි. අඳුන්දිවියා නසන කල්හි දිවියාද නසන්නාක් මෙනි. නිරෝධ සමාපත්තිය නෙවසඤ්ඤානාසඤ්ඤා යතනයාගේ අභාව මාත්‍රයයි. ප්‍රඥප්ති මාත්‍රවූ කිසියම් ධර්මයක් අභාවමාත්‍ර බැවින් කිසිවක් නොවළක්වයි. සමවදින්නා විසින් සමවදිනුයි සමාපත්තියයි කියනු ලැබේ. **සමපජානසස** යනු යහපත් ආකාරයෙන් දනීනුයි සම්පජාන නම්. ඒ සම්පජානයට. **පවතත පරියාදානෙ** පැවැත්ම සිඳුවීමයි. නිතර පැවතීමයි යන අර්ථයි. කෙලෙස් පැවැත්ම, ස්කන්ධ පැවැත්ම, ඒ පැවැත්මේ ඉතිරිකොට නොගැන්ම, ක්‍ෂයකිරීම, නොපැවැත්ම පවතත පරියාදානයි. ඒ පවතත පරියාදානයෙහි, **පරිනිබ්බානෙ ඤාණං** යනු රහත්හුගේ කාමච්ඡන්දාදීන් විනාශකිරීමෙන් සම්පූර්ණ සැනසීමට පත්වීම නොපැවැත්ම, අනුපාදිසේස නිර්වාණයද, ප්‍රත්‍යවේක්‍ෂා කරන්නහුට ඒ කෙලෙස් පරිනිර්වාණයෙහිද, ස්කන්ධ පරිනිර්වාණයෙහිද පැවති ඤාණය.

**සබ්බ ධම්මානං** යනු සියලු ත්‍රෛභූමික ධර්මයන්ගේ **සම්මා සමුච්ඡෙදෙති** යනු නොකඩවා පැවැත්ම මුලිනුපුටා දැමීම් වශයෙන් මනාව නිරුද්ධ කිරීම, **නිරොධෙච අනුපට්ඨානතා** යනු නිරුද්ධ කළ කල්හි නැවත නොවැටහෙන බැවින්, නැවත නූපදී යන අර්ථයි. **සමසීසට්ඨෙ ඤාණං** යනු නෛෂ්ක්‍රම්‍යාදී සත්තිස් සමයයන්ද, තෘෂ්ණා ආදී තෙළෙස් ශීර්ෂයෝද වෙති. විරුද්ධ ස්වභාවයන් සමනය කරන බැවින් සම නම් වේ. සුදුසු පරිදි ප්‍රධන් වීර්යකොට කෙළවර වූයේ සීසයි. එක් ඉරියව්වක හෝ එක් රෝගයක හෝ එක් ජීවිතේන්ද්‍රියයක සමාන පැවතුම් වශයෙන් නෛෂ්ක්‍රම්‍ය ශ්‍රද්ධාදී ශීර්ෂ ඔහුට ඇත්තේනුයි සම සීසීයි. සමසීසිහුගේ අර්ථය සමසීසට්ඨයි. එම සමසීසට්ඨයෙහි, සමසීසි භාවයෙහියි යන අර්ථයි.

එක් ඉරියව්වක, රෝගයක, ජීවිතයක සම පැවතුම් වශයෙන් විදර්ශනා අරඹා, ඒ ඉරියව්වෙහි, රෝගයෙහි, ජීවිතයෙහි සමනාන්තරව, සතර මාර්ග ඵලයන්ට පැමිණ, එහිම පිරිනිවුමට පත්වන රහතුන්ටම සමසීසි භාවය වේ. එම සමසීසි භාවයෙහි ප්‍රඥාවයි. පුද්ගල පඤ්ඤත්තියෙහිද, අටඨකතාවෙහිද දැක්වේ. කවර පුද්ගලයෙක් සමසීසිද? යම් පුද්ගලයෙකුගේ ආශ්‍රව විනාශයද, ජීවිත විනාශයද, පෙර පසු නොවී සිදුවේද මේ පුද්ගලයා සමසීසියයි කියනු ලැබේ. සමසීසි නිර්දේශයෙහි, අපුබ්බං අචරිමං යනු පෙර පසුනොවී නොඩවා පවතින වර්තමානය වශයෙන් එක් වරෙකම, එක් කලෙකදීමය යන අර්ථයි. පරියාදානං යනු ක්‍ෂයවීමයි. අයං යනු මේ පුද්ගලයා සමසීසි නම් වේයයි කියයි. ඔහු වනාහි තෙවැදෑරුම් වේ. ඉරියව් සමසීසි, රෝග සමසීසි ජීවිත සමසීසි යනුවෙනි. එහි යමෙක් සක්මන් කරන්නේම විදර්ශනාව ආරම්භකොට, අර්හත්වයට පත්ව, සක්මන් කරන්නේම පිරිනිවන්පායි. යමෙක් සිටගෙනම විදර්ශනාව ආරම්භකොට අර්හත්වයට පත්ව, සිටගෙනම පිරිනිවන්පායි. යමෙක් හිඳගෙනම විදර්ශනාව ආරම්භකොට අර්හත්වයට පත්ව හිඳගෙනම පිරිනිවන්පායි. යමෙක් වැදහෝන්නේම විදර්ශනා ආරම්භ කොට අර්හත්වයට පත්ව වැදහෝන්නේම පිරිනිවන්පායි. මේ ඉරියව් සමසීසි නම් වේ.

යමෙක් එක් රෝගයකට පත්ව, රෝගය පවත්නා කාලය තුළදීම විදර්ශනාව ආරම්භකොට අර්හත්වයට පත්ව ඒ රෝගයෙන්ම පිරිනිවෙයි. මේ රෝග සමසීසි නම් වේ. ජීවිත සමසීසි නම් කවරෙක්ද? එහි ශීර්ෂ දහතුනකි. එහි කෙලෙස් ශීර්ෂයද, අවිද්‍යාවද අර්හත් මාර්ගය මඩිනු ලැබේ. ප්‍රවෘත්ත ශීර්ෂයද ජීවිතේන්ද්‍රියද චුති සිත මඩිනු ලැබේ. අවිද්‍යාවෙන් මැඩුණු සිතට ජීවිතේන්ද්‍රිය මැඩපැවැත්විය නොහැකිය. ජීවිතේන්ද්‍රිය හාත්පසින් අල්ලාගත් කල්හි අවිද්‍යාව මැඩිය නොහැකිය. අවිද්‍යාවෙන් මැඩුණු සිත එකකි. ජීවිතේන්ද්‍රියයෙන් මැඩුණු සිත එකකි. යමෙකුට මේ ශීර්ෂද්වයයම සමව මැඩපැවැත්විය හැකිද? ඔහු ජීවිත සමසීසි නම් වේ. මෙය කෙසේ සම වේද? ද්වාර සමතාවය නිසයි. යම් ද්වාරයෙක්හි මාර්ගයෙන් නැගිටීමක් වේද? සෝවාන් මාර්ගයෙහි ප්‍රත්‍යවේක්‍ෂණ පහකි. සකෘදාගාමි මාර්ගයෙහි හතරක්ද යන එකුන්විසි ප්‍රත්‍යවේක්‍ෂා ඤාණයන්හි පිහිටා භවංගයට බැස පිරිනිවෙයිද? මේ ද්වාර සමතාවයෙන්ම ශීර්ෂද්වය සම්පූර්ණයෙන් මැඩගැනීමද සම වෙයි. එහෙයින් මේ පුද්ගලයා ජීවිත සමසීසි යයි කියනු ලැබේ. ඔහුම මෙහි අදහස් කරන ලදී.

ශ්‍රැතමය, සීලමය, භාවනාමය ඥාණයෝ වෘත්තපාදකය. (සසර ගමනට) කෙලෙස් තුනී කරන්නේ නොවේ. ලෝකෝත්තර පාදක වූ මේවාද අනෙකුත් ඥාණ සල්ලේඛයයි කියති. විරුද්ධ කෙලෙස් තුනීකරන ආකාරයෙන් පවත්නා ඥාණයන් දැක්වීමට සමසීසට්ඨ ඥාණයන්ට අනතුරුව කෙලෙස් ලියවනාර්ථයෙහි ඥාණ දක්වන ලදී. එහි **පුථුනානත්ත තෙජපරියාදානෙ පඤ්ඤායි** ලෝකෝත්තර ධර්මයන් සමග මිශ්‍ර නොවීම් අර්ථයෙන් බොහෝ ඇලීම්වලටද නොයෙක් ආකාර, නොයෙක් ස්වභාව ඇති කාමාසවාදීන්ද තවන අර්ථයෙන් තේජ යයි ලද, නාමයෙන් යුත්, දුසිල් බව ආදීන් ඉතිරි නොකොට විනාශ කරන ක්‍ෂය කිරීමෙහි ප්‍රඥාව සත්තිස් ප්‍රභේද ඇති නෛෂ්ක්‍රම්‍යාදි ධර්මයන්හි ප්‍රඥායි කියන ලදී. වෙන්වූ, නොයෙක් ආකාර වූ බලයමය. ඒ වෙන්වූ නොයෙක් ආකාර වූ දුස්සීල ආදී පස්වැදෑරුම් ගිනි ඉතිරි නොකොට ක්‍ෂය කිරීමේ ප්‍රඥාවයි. තේජයෙන්ම බොහෝ විවිධාකාර සංග්‍රහය නිර්දේශ වාරයෙහි ප්‍රකාශ කරන්නෙමු. **සලෙලකට්ඨෙ ඤාණ** යනු විරුද්ධ ධර්මයන් තුනී කරයි. මුලිනුපුටා දමයිනුයි සලෙලඛ නම්. ඒ සත්තිස් ප්‍රභේද නෛෂ්ක්‍රම්‍යාදි කෙලෙස් තුනීකරන ස්වභාවයෙහි ඥාණයයි. අන්‍යයෝ විහිංසක වෙති. අපි මෙහිදී අවිහිංසක වන්නෙමුයි, කෙලෙස් තුනී කළයුතුයයි ආදී ක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් සලෙලඛ සූත්‍රයෙහි දේශිත සිව්සාළිස් ප්‍රභේද ඇති සල්ලේඛ මෙයින් සංග්‍රහ කරයි.

මේ කෙලෙස් තුනී කිරීමෙහි යෙදී සිටියහු විසින් කළයුතු සම්‍යක් ප්‍රධාන වීර්යයන් දැක්වීමට ඉන් අනතුර වීර්යාරම්භයෙහි ඥාණය දක්වන ලදී. එහි **අසල්ලීනත්ත පහිතත්ත පග්ගහට්ඨෙ** යනු කුසීතකමින්, පසුබට නොවූ නොහැකිලුණු සිතක් වන්නේනුයි අසල්ලීනත්ත නම්. **අත්ත** යනු සිතයි. දෙසූ පරිදි,

> **උදකංහි නයන්ති නෙත්තිකා - උසුකාරා නමයන්ති තෙජනං**
> **දාරුං නමයන්ති තච්ඡකා - අත්තානං දමයන්ති පණ්ඩිතා**

ජලය ගෙනයන්නෝ ජලය ගෙන යති. හීවඩුවෝ (දුනු) හී ගින්නෙන් නමති. වඩුවෝ ලී නමති. නුවණැත්තෝ තමන් දමනය කරති.

ශරීරයෙහිද ජීවිතයෙහිද අපේක්‍ෂා රහිතව, යවන ලද, යැවූ අත්හරින ලද ආත්මය එය කරණකොටගෙන නුයි **පහිතත්ත** නම් වේ. **අත්තා** යනු

ආත්මභාවයයි කියන ලදී. යම් භික්ෂුණියක් තමාට හිංසාකොට අඩන්නීය ආදියයි. නොහැකිලුණේ අත්හරින ලද ජීවිතාපේක්ෂා ඇත්තේනුයි අසලලීන පහිතත්තයි එකට උපන් ධර්මයන් දැඩිව ගනියි. රැකුල් දේනුයි පගගහ නම්. දැඩිව ගැනීමම - පගගහටඨද, දැඩිව ගැනීමේ ස්වභාවය යන අර්ථ දේ. නොහැකිලුණු අත්හරින ලද, ජීවිතාපේක්ෂා ඇතිව දැඩිව ගැනීම අසලලීන පහිතතත පගගහටඨ නම් වේ. ඒ අසලලීන පහිතතත පගගහටඨයෙහි, මහණෙනි එහෙයින් නුඹලා මේ සාසනයෙහි නොපසුබසින වීර්යයෙන් යුක්තව බලවත්ව උත්සාහ කරවු. ඒකාන්තයෙන් මාගේ ශරීරයෙහි ලේ මස් වියලේවා. සම, නහර, ඇට ඉතිරි වේවා. යම් ඒ පුරුෂ ශක්තියෙන් පුරුෂ වීර්යයෙන්, පුරුෂ පරාක්‍රමයෙන්, උත්සාහ කරවු. අපේක්ෂිත ඉලක්කයට නොපැමිණ වීර්යයාගේ නැවැත්මක් නොවන්නේය යනුවෙන්. කියන ලද හෙයින් අසලලීන පහිතතත වචනයෙන් ප්‍රධන් වීර්යයෙහි පසුනොබසින බව නොනවතින බව කියන ලදී. පගගහටඨ වචනයෙන් කුසීතබව, නොසන්සුන් බව ආදියෙන් මුක්ත වූ සමව පැවති වීර්යය කියන ලදී.

**විරියාරමෙභ ඤාණං** යනු වීරභාවය - විරියයි. වීරයන්ගේ ක්‍රමයෙන් ආකාරයෙන් උපායෙන් කටයුතු පැවැත්විය යුත්තේනුයි විරිය නම් වේ. එය උත්සාහයේ ලක්ෂණයයි. එක්ව හටගත් ධර්මයන්ට උපකාරවීම රසයයි. පසුබට නොවීම වැටහෙන කරුණයි. සංවිගෙගා යොනිසො පදහති යන වචනයෙන් සංවේගය ආසන්න කරුණයි. වීර්යාරම්භයද ආසන්න කරුණකි. යහපත් ලෙස අරඹන ලද්ද සියලු සම්පත්වලට මුල්වේයයි දතයුතුය. වීර්ය සංඛ්‍යාත ආරම්භය විරියාරම්භයයි. මෙයින් සෙසු ආරම්භයන් ප්‍රතික්ෂෙප කරයි. මේ ආරම්භ ශබ්දය කර්මයෙහි පැමිණීමෙහි, ක්‍රියාවෙහි, වීර්යයෙහි, හිංසාවෙහි කඩා කපා දැමීම යන නොයෙක් අර්ථයන්හි යෙදේ.

> **යංකිඤචි දුකඛං සමෙභාති - සබබං ආරමභ පචචයා**
> **ආරමභානං නිරොධෙන - නතථි දුකඛසස සමභවො'ති**

යම්කිසි දුකක් හටගනීද, ඒ සියල්ල ආරම්භය හේතුවෙනි. ආරම්භයන්ගේ නිරෝධයෙන් දුක් හටගැනීමක් නොවේ.

මෙහි කර්මය ආරම්භයි. අරඹයි විපිළිසර වේ. මෙහි පැමිණීමයි. මහා යාගයක් විශාලව ඇරඹීය. ඒවා මහත්ඵල නොවේ. මෙහි යාගය

ඔසවා දැක්වීමේ ක්‍රියාවෙහි යෙදේ. අරඹවු, නික්මෙවු, බුදුසසුනෙහි යෙදෙවු. මෙහි වීර්යයයි. ශ්‍රමණ භවත් ගෞතමයන් උදෙසා සතුන් මරති. මෙහි හිංසාවයි. පැළවෙන ගස්, වෘක්ෂලතා විනාශයෙන් වැලකුණේ වෙයි. මෙහි සිඳීම්-බිඳීම් ආදී කඩා කපා දැමීමයි. මෙහි වීර්යයම අදහස් කරන ලදී. එහෙයින් කියන ලදී. වීර්ය සංඛ්‍යාත ආරම්භය වීර්යාරම්භයයි.

වීර්යය ඇරඹීම් වශයෙන් ආරම්භයයි කියනු ලැබේ. ඒ වීර්යාරම්භයෙහි ඤාණය. අසල්ලීනත්තා පහිතත්තාති යනුවෙන්ද කියවති. මැලිනොවන ස්වභාවයෙන් අත්හළ භාවයෙනැයි අර්ථයි. පළමු පාඨයම යහපත්ය. සමහරු සති, ධම්මවිචය, විරිය, පීති සම්බොජ්ඣංගයන්ගේ සමතාවය නොහැකිලුණු (මැලි නොවුන) ස්වභාවයයිද, සති, සමාධි, පස්සද්ධි උපෙක්ඛා සම්බොජ්ඣංගයන්ගේ සමතාවය පහිතත්ත (හළ ආත්මාපේක්ෂාව) යයිද, කියති. සප්ත සම්බොජ්ඣංගයන්ගේ සමතාව අල්ලා ගැනීමයයි වර්ණනා කරති.

දැන් සම්‍යක් ව්‍යායාමයෙන් සිද්ධ වූ, මාර්ගඵලයන්ට පත්වූවහු විසින් ලෝකයාගේ හිතසුව පිණිස ධර්මදේශනා කළයුතුයයි දක්වන්ට ඉන් අනතුරුව අර්ථ සංදර්ශනයෙහි ඤාණය දක්වන ලදී. එහි නානා ධම්ම පකාසනා යනු සියලු සංඛත, අසංඛත වශයෙන් නොයෙක් ධර්මයන්ගේ ප්‍රකාශකිරීම, දැක්වීම, දේශනා කිරීමයි. දේශනා කිරීම යනු ප්‍රකාශ කිරීමය. අත්ථ සන්දස්සනෙ යනු නොයෙක් අර්ථයන් අනුන්ට දැක්වීමෙහි ධර්මද අර්ථද ඒවාමය.

දැන් අන්‍යයන්ට දැහැමි කථා මනාව විස්තර කරන ඒ ආර්ය පුද්ගලයාට යථා ස්වභාවයෙන් ධර්මදේශනාවට ආධාරවන දර්ශන විශුද්ධිය දක්වන්ට ඉන් අනතුරුව දස්සන විසුද්ධි ඤාණය දක්වන ලදී. එහි සබ්බ ධම්මානං එක සංගහතා නානත්තෙකත්ත පටිවෙධෙ යනු සියලු සංඛත අසංඛත ධර්මයන්ගේ ඒක සංග්‍රහතාවයද, කාමච්ඡන්දාදීන්ගේ නානත්‍වයද, නෛෂ්ක්‍රම්‍යාදීන්ගේ ඒකත්‍වයද ප්‍රතිවේධය, අවබෝධයයි අර්ථයි. ඒ මාර්ග ප්‍රඥාව හා ඵල ප්‍රඥාවද, මාර්ග ප්‍රඥාව සත්‍යාවබෝධ ක්ෂණයෙහි සත්‍යය අවබෝධ වීම් වශයෙන් අවබෝධ කෙරේනුයි පටිවේධයි. ඵල ප්‍රඥාව ප්‍රතිවේධ කළ හෙයින් පටිවෙධයි එක සංගහතා යන මෙහි ජාති සංග්‍රහය, සඤ්ජාති සංග්‍රහය, ක්‍රියා සංග්‍රහය, ගණන සංග්‍රහයයි සංග්‍රහය චතුර්විධයි. සියලු ක්ෂත්‍රියයෝ එත්වා. සියලු බ්‍රාහ්මණයෝ, සියලු වෛශ්‍යයෝ, සියලු

ක්‍ෂුද්‍රයෝ එත්වා. ඇවැත්නි, විශාඛය, යම් ඒ සම්‍යග් වචනයක්, යම් සම්‍යක් කර්මාන්තයක්, යම් සම්‍යග් ආජීවයක් වේද, මේ ධර්මයන් සීලස්කන්ධයෙහි සංග්‍රහ කරන ලදී. මේ ජාති සංග්‍රහයයි. එක් ජාතියකට අයත්වූවෝ එත්වායි, කියන ලද ස්ථානයෙහි මෙන් මෙහි සියල්ල ජාතියෙන් එකක් සේ සංග්‍රහ කරන ලදී. සියලු කෝසල ජානපදිකයෝ එත්වා. සියලු මාගධිකයෝ එත්වා. සියලු භාරුකච්ඡකයෝ එත්වායි කියන ලද තන්හි මෙන් මෙහි සියල්ලෝ හටගත් ස්ථාන වශයෙන්, වාසය කළ ස්ථාන වශයෙන්ද, එකට සංග්‍රහ කරන ලදී. සියලු හස්ථාරෝහකයෝ එත්වා, සියලු අශ්වාරෝහකයෝ එත්වා, සියලු රථාචාර්යයෝ එත්වා. ඇවැත්නි, විශාඛ, යම් ඒ සම්‍යග් දෘෂ්ටියක් වේද, යම් සම්‍යක් සංකල්පයක් වේද, මේ ධර්මයන් ප්‍රඥා ස්කන්ධයෙහි සංග්‍රහ කරන ලදී. මේ ක්‍රියා සංග්‍රහය නම් වේ. ඒ සියල්ලම තමාගේ ක්‍රියාකරන හෙයින් එකට සංග්‍රහ කරන ලදී. චක්ඛායතනය කවර ස්කන්ධ ගණනට යයිද? චක්ඛායතනය රූපස්කන්ධ ගණනට යයි. චක්ඛායතනය රූපස්කන්ධයෙහි සංග්‍රහ කරන ලද්දේ යයි නොකිව යුතුය. මේ ගණන සංග්‍රහයයි. එය මෙහි අදහස් කරන ලදී. තථට්ඨාදී ද්වාදසාකාරයන්හි වෙන් වෙන්ව එකිනෙක ගණන් පිරිසිඳීමේ සංග්‍රහය මොවුහු වෙත්නුයි ඒකසංග්‍රහ නම් වේ. එකට සංග්‍රහ කිරීමේ ස්වභාවය ඒකසංග්‍රහතාවයයි.

**දස්සන විසුද්ධි ඤාණං** යනු මාර්ගඵල ඤාණයයි. දර්ශනයම විශුද්ධිය වූයේ දර්ශන විශුද්ධියයි. දර්ශන විශුද්ධියම ඥානයනුයි දර්ශන විශුද්ධි ඥානයයි. මාර්ග ඥානය පිරිසිඳු කෙරේනුයි දර්ශන විශුද්ධියයි. ඵල ඥානය පිරිසිඳු බැවින් දර්ශන විශුද්ධියි.

දැන් දර්ශන විසුද්ධි සාධක විදර්ශනා ඤාණ දෙපරිද්දෙකින් දක්වන්ට ඉන් අනතුරු ඛන්ති ඤාණ, පරියොගාහන ඤාණ දක්වන ලදී. එහි **විදිතත්තා පඤ්ඤා** යනු රූප ස්කන්ධාදිය අනිත්‍යාදි වශයෙන් දැනගැන්මෙහි පැවැති ප්‍රඥාවයි. **ඛන්ති ඤාණං** යනු දැනගත් දෑම ඉවසානුයි ක්‍ෂාන්ති නම් වේ. ක්‍ෂාන්තියම ඤාණය ක්‍ෂාන්ති ඥානයි. මෙයින් ඉවසන ක්‍ෂාන්තිය ප්‍රතික්‍ෂෙප කරයි. එය කලාප මෙනෙහි කිරීම් වශයෙන් පැවති තරුණ විදර්ශනා ඥානයයි. **ඵුට්ඨත්තා පඤ්ඤා** යනු රූප ස්කන්ධාදීන්ගේ අනිත්‍යාදි වශයෙන් ඤාණ ස්පර්ශයෙන් ස්පර්ශ කිරීමෙහිදී පවත්නා ප්‍රඥාවයි.

**පරියොගාහණෙ ඤාණං** යනු ස්පර්ශ කළ සැණින් අවබෝධ

කරයි. පිවිසේනුයි පරියොගාහණ ඤාණයයි. එය භංගානුපස්සනාදී වශයෙන් පැවති තියුණු විදර්ශනා ඤාණයයි. සමහරු විදර්ශනා ඥානයම ඔහුගේ ක්‍ෂාන්ති ඥානයයි ප්‍රඥාව හෝ ශ්‍රද්ධාව පරියොගාහණ ඤාණයයි කියති. මෙසේ ඇතිකල්හි මේ ඥානද්වය එක් අයෙකුට හට නොගනී. එසේ නොවනකල්හි එක් ශ්‍රාවකයෙකුට සත්සැටක් ශ්‍රාවක සාධාරණ ඤාණ හට නොගනිත්. එහෙයින් එය නොයෙදේ.

දැන් පෘථජ්ජනයෝද, ශෛක්‍ෂ්‍යයෝද, විදර්ශනානුයායි සියලු ස්කන්ධාදි ධර්ම මෙනෙහි කරත්. ඉන් කොටසක් පමණක් නොවේ. එහෙයින් ඔවුන්ට ප්‍රදේශ විහාරය නොලැබේ. රහතුන්ටම කැමති පරිද්දෙන් ප්‍රදේශ විහාර ලැබේයයි දර්ශන විශුද්ධි සාධක ඤණයන් සඳහන් කොට ඉන් අනතුරුව රහතුන්ගේ දර්ශන විශුද්ධිය සිදුකරන ප්‍රදේශ විහාර ඤාණය දක්වන ලදී. එහි සමොදහනෙ පඤ්ඤා යනු ස්කන්ධාදීන්ගේ එක් කොටසක වේදනා ස්වභාවයන්ගේ එක්තැන් කරන ප්‍රඥාවයි. එකතුකිරීමේ ප්‍රඥාවයි. රැස්කිරීමේ ප්‍රඥාවයි. එකට ගැළපීමේ ප්‍රඥාවයයිද පාඨයකි. එයම අර්ථයයි. පදෙස විහාරෙ ඤාණං යනු ස්කන්ධාදී කොටස්වලින් එක් කොටසක අවයවයකින් වාසය ප්‍රදේශ විහාරයි. ඒ ප්‍රදේශ විහාරයෙහි ඤාණය එහි ප්‍රදේශ නම් ස්කන්ධ ප්‍රදේශ, ධාතු, සත්‍යය, ඉන්ද්‍රිය ප්‍රතීත්‍ය සමුත්පාදය, සතිපට්ඨාන, ධ්‍යාන, නාමරූප ධර්ම යනාදි වශයෙන් විවිධාකාරයි. වේදනාවද විවිධාකාරයි. කෙසේද? පංචස්කන්ධයන්ගේ වේදනාස්කන්ධ වශයෙන් ස්කන්ධයන්ගේ එක් කොටසකි. දොළොස් ආයතනයන්ගේ වේදනා වශයෙන් ධර්මායතනයෙහි එක් කොටසකි. අටළොස් ධාතුන්ගේ වේදනා වශයෙන් ධර්ම ධාතුන්ගේ එක් කොටසකි. චතුරාර්ය සත්‍යයන්ගේ වේදනා වශයෙන් දුක්ඛ සත්‍යයෙහි එක් කොටසකි. දෙවිසි ඉන්ද්‍රියයන්ගේ පස් වේදනා ඉන්ද්‍රිය වශයෙන් ඉන්ද්‍රියයන්හි එක් කොටසකි. දොළොස් ප්‍රතීත්‍ය සමුත්පාදාංගයන්ගේ ස්පර්ශය හේතුවෙන් විඳීම් වශයෙන් ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි එක් කොටසකි. සතර සතිපට්ඨානයන්ගේ වේදනානුපස්සනා වශයෙන් සතිපට්ඨානයෙහි එක් කොටසකි. නාමරූපයන්ගේ වේදනා වශයෙන් නාමරූපයන්හි එක් කොටසකි. කුසල් ආදී සියලු ධර්මයන්ගේ වේදනා වශයෙන් ධර්මයෙහි එක් කොටසකි. මෙසේ වේදනාවම ස්කන්ධාදීන්ගේ කොටසකි. ඒ වේදනාවම ප්‍රත්‍යවේක්‍ෂා කිරීම ප්‍රදේශ විහාරයයි.

දැන් සමාධි භාවනාමය ඤාණයන් වඩන්නා වූ පෘථජ්ජනයින්ද,

ශෛක්‍ෂයින්ද ඒ ඒ වැඩිය යුතු භාවනා ධර්මයන් ප්‍රධානත්වයෙහි ජ්‍යෙෂ්ඨත්වයෙහි තබා ඒ ඒ භාවනාවෙන් ප්‍රහාණය කළයුතු ඊට විරුද්ධ නොයෙක් ආකාර ඇති නොයෙක් ආදීනව ඇති ධර්මයන් ආදීනව වශයෙන් ප්‍රත්‍යවේක්‍ෂා කොට ඒ ඒ භාවනා ධර්මයට ගැළපෙන අයුරින් සිත පිහිටුවා ඒ ඒ විරුද්ධ ධර්මයන් දුරුකරති. දුරුකරන්නේද, විදර්ශනා කාලයෙහි සියලු සංස්කාරයන් ශූන්‍ය වශයෙන් දැක පසුව මුලිනුපුටා දැමීමෙන් දුරුකරති. කියන ලද ආකාරයෙන් සියලු ආර්යයෝ සුදුසු පරිදි පිළිපදිත්. එහෙයින් පදේස විහාර ඤාණයට අනතුරුව සඤ්ඤාවිවට්ට ඤාණාදි සය ඤාණයන් ක්‍රමානුකූලව දක්වන ලදී. එහි අධිපතිත්තා පඤ්ඤා යනු නෛෂ්ක්‍රම්‍යාදීන්ගේ අධිපතිභාවයෙන්, නෛෂ්ක්‍රම්‍යාදීන් උසස්කොට සලකා ඒ හා බැඳුණු ස්වභාවයෙන් පැවති ප්‍රඥාවයි. සඤ්ඤා විවට්ට යනු සංඥාවගේ පෙරළීම, අන් අතට පෙරළීම, පරම්මුඛභාවය සංඥා විවට්ටයයි යම් සංඥාවකින් ඒ ඒ භාවනා ධර්ම අධිපති කෙරේද, ඒ සංඥාවට හේතුකරුණු වූ ඒ කාමච්ඡන්දාදීන්ගෙන් පෙරළීමේ ඤාණයයි. එහෙන් මෙහෙන් පෙරළේ යයි නොකීවේ මුත්, යම් තැනකින් පෙරළේද, එතැනින්ම පෙරළුණේ යයි ගනියි. විවට්ටානුපස්සනාවෙහි මෙනි. ඒ ප්‍රඥාව හැඳිනීම ලක්‍ෂණකොට ඇත්තේය. එය මෙයම යයි නැවත හැඳිනීමට ප්‍රත්‍යය වූ හැඳිනීමේ ලකුණ රසයයි. දැව ආදියෙහි වඩුවන් සලකුණු තබන්නාක් මෙනි. ගති නිමිත්ත අනුව සිත පිහිටුවීම වැටහෙන කරුණයි. ඇතුන් පෙන්වන අන්ධයින් මෙනි. අරමුණෙහි තදින් අල්වා නොගත් හෙයින් ටික කලක් පැවතීම වැටහෙන කරුණයි. විදුලිය මෙනි. එළඹ සිටි සිහිය ආසන්න කරුණයි. මුවපොව්වන් පඹයින් දැක මිනිසුන් යයි උපන් හැඟීම මෙනි.

**නානත්ත පඤ්ඤා** යනු නොයෙක් ආකාරයෙන් වැඩියයුතු හෙයින් අන්‍ය ස්වභාවයන් වූ කාමච්ඡන්දාදීන්හි ආදීනව දැකීමෙහි ප්‍රඥාව නොයෙක් ආකාර ප්‍රහාණය නානත්තයි. නොයෙක් දේ ප්‍රහාණ නිමිත්තයි. නොයෙක් දේ ප්‍රහාණ හේතුයි. නෛෂ්ක්‍රම්‍යාදීන්හි හටගන්නා ප්‍රඥාවයි.

**චෙතො විවට්ට ඤාණං** යනු චෛතසිකයන්ගෙන් කාමච්ඡන්දාදීන් පෙරළී යාමේදී (ඉවත්වීම) නෛෂ්ක්‍රම්‍යාදීන්හි ඇතිවන ඤාණයයි. චෙතො යන්නෙන් චේතනාව අදහස් කරයි. එය සිතීම ස්වභාව කොට ඇත්තේය. ගැළපීම ලක්‍ෂණකොට ඇත්තේය. රැස්කිරීම රසයයි. පිළියෙල කිරීම වැටහෙන කරුණයි. තමාගේ හා අන්‍යයන්ගේ සියලු කටයුතු ඉටුකරන

ප්‍රධාන ශිෂ්‍යයා මහවඩුවා ආදීන් මෙනි. මෙය අත්‍යවශ්‍ය ක්‍රියා සිහි කිරීම් ආදීන්හිදී ඒ හා යෙදුණු චෛතසිකයන් එසවීම් ස්වභාවයෙන් ප්‍රකට වෙයි.

අධිට්ඨානෙ පඤ්ඤා යනු නෛෂ්ක්‍රම්‍යාදි වශයෙන් සිත පිහිටුවීමේ ප්‍රඥාවයි. චිත්ත විවට්ටෙ ඤාණං යනු කාමච්ඡන්දාදීන් ප්‍රහාණ වශයෙන් සිතෙහි පෙරළීමේ ඤාණයයි. මෙහි සිත දැනගැනීමේ ලක්ෂණ ඇත්තේය. පෙරටුව යාම රසයයි. ගැළපීම වැටහෙන කරුණයි. නාමරූප ආසන්න කරුණයි.

සුඤ්ඤතෙ පඤ්ඤා යනු ආත්ම ආත්මනීය හා අනාත්ම අනාත්මනීය භාවයේ පැවති ශූන්‍යතා අනත්තානු පස්සනා ප්‍රඥාවයි. ඤාණ විවට්ටෙ ඤාණං ඤාණයම තදින් ඇලීමෙන් පෙරළේනුයි විවට්ට නම්. ඒ ඤාණ පෙරළී යාමේ ඤාණය. වොස්සග්ගෙ ඤාණං යනු අත්හරීනුයි වොස්සග්ග නම්. කාමච්ඡන්දාදීන් අත්හැරීම නෛෂ්ක්‍රම්‍යාදීන්හි ප්‍රඥාවය. විමොක්ඛ විවට්ටෙ ඤාණං යනු කාමච්ඡන්දාදීන්ගෙන් මිදේනුයි විමොක්ඛ නම්. එයම ඤාණයයි.

තථට්ඨෙ පඤ්ඤා යනු එක් එක් සත්‍යයෙහි සතරාකාර බැගින් වෙනස් නුවූ, කෘත්‍ය වශයෙන් නුමුලා ස්වභාවයෙන් පැවති ප්‍රඥාවයි. සච්ච විවට්ටෙ ඤාණං යනු චතුරාර්ය සත්‍යයන්හි නැගිටීම් වශයෙන් දෙයාකාරයකින් පෙරළේනුයි සච්ච විවට්ට නම්. එයම ඤාණයයි. එකම ඤාණයක් අධිපතිකොට ධර්ම වශයෙන් සඤ්ඤා විවට්ටයයිද ප්‍රහාණය කළයුතු ධර්ම වශයෙන් චෙතො විවට්ටයයිද, සිත පිහිටුවීම් වශයෙන් චිත්ත විවට්ටයයිද, විරුද්ධ ධර්මයන් දුරුකිරීම් වශයෙන් විමොක්ඛ විවට්ට යයිද සතරාකාරය අනත්තානුපස්සනාවම ශූන්‍යතාකාර වශයෙන් ඤාණ විවට්ට ඤාණයයි කියන ලදී. මාර්ග ඥානයම යට මාර්ගයෙහි ඤාණයයිද, ආනන්තරික (අතරක් නැති) සමාධියෙහි ඤාණයයිද දෙයාකාරයකින් කියන ලද්දේ වී නමුදු පෙරළීමේ ආකාර වශයෙන් සත්‍ය විවට්ට ඤාණයයි කියන ලදී.

දැන් ඒ සච්චවිවට්ට ඤාණ වශයෙන් පැවති ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමේ ඤාණය වශයෙන් පැවති, ෂට් අභිඤ්ඤා ඤාණ දක්වන ලදී. එහිද ලෝකයෙහි ප්‍රකට තේජස් ඇති බැවින්ද, විස්මය එළවන බැවින්ද පළමුව ඉද්ධිවිධ ඤාණය දක්වන ලදී. චෙතොපරිය ඤාණයට විෂය වන හෙයින්

දිව්‍යශ්‍රොත ඤාණය සරල විෂයයක් බැවින් දෙවනුව දිව්‍යශ්‍රෝත ඤාණය දක්වන ලදී. සියුම් විෂයයක් බැවින් තෙවනුව චෙතොපරිය ඤාණය දක්වන ලදී. ත්‍රිවිද්‍යාවන්හි පෙර වාසය කළ ස්ථාන පිළිබඳ වැසුණු අඳුර දුරුකරන හෙයින් පළමුව පූර්වේනිවාසානුස්මෘති ඥානය දක්වන ලදී. වර්තමාන අනාගත අඳුර දුරුකරන හෙයින් දෙවනුව දිව්‍ය චක්‍ෂුර් ඥානය දක්වන ලදී. සියලු අඳුර මුළුමනින් විනාශ කරන හෙයින් තෙවනුව ආශ්‍රවක්‍ෂය ඥානය දක්වන ලදී. එහි **කායමපි** රූපකායයෙහි, **චිත්තමපි** යනු ඥාන පාදක ධ්‍යාන සිතද, **එකවවත්ථානතා** යනු පරිකර්ම සිතෙන් එක්ව තැබීම සඳහාය. පෙනෙන ශරීරයෙන් හෝ නොපෙනෙන ශරීරයෙන් යනු කැමති කාලයෙහි සුදුසු පරිදි ශරීරයෙහිද සිතෙහි මිශ්‍ර කරණයයි යුසේයි. කායො යනු මෙහි ශරීරයයි. ශරීරය වනාහි අපවිත්‍ර දෑ රැස්කරන හෙයින්ද පිළිකුල් කේසාදීන්ගේද, ඇස් රෝගාදී රෝගයන්ගේද හටගන්නා ස්ථානය බැවින්ද කායයයි කියති. **සුඛසඤ්ඤංච ලහු සඤ්ඤංච** යනු මෙහි චතුර්ථධ්‍යාන සම්ප්‍රයුක්ත එකම සංඥාව ස්වභාවය විවිධ බැවින් දෙකක් කොට එක්කිරීම් වශයෙන් 'ච' ශබ්දය යොදන ලදී. චතුර්ථධ්‍යානයෙහි උපේක්‍ෂාව ශාන්ත බැවින් සැපයයි යූසේයි. ඒ හා යෙදුණු සංඥාව සුව සංඥාවයි. එයම නීවරණයන්ගෙන්ද, විතර්කාදී විරුද්ධතාවන්ගෙන්ද මිදුණු හෙයින් ලහු සඤ්ඤායි යූසේයි. **අධිට්ඨාන වසෙන** යනු අධිකකොට සිටීම් වශයෙන් පිවිසීම් වශයෙන් යයි අදහසයි. අධිට්ඨාන වසෙන චාති යනුවෙන් ච ශබ්දය සම්බන්ධ කළයුතුය. මෙතෙකින් සර්වප්‍රකාරයෙන් ඍද්ධිවිධවල විස්තර කරුණු සුදුසු පරිදි යූසේයි.

**ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා** යනු ඉටුවන ස්වභාවයෙහි ප්‍රඥාවයි. **ඉද්ධිවිධෙ ඤාණං** යනු සිදුවීම් අර්ථයෙන් ඍද්ධියි. සමෘද්ධවීම් අර්ථයෙන් ලැබීම් අර්ථයෙන් යයි යූසේයි. යමක් හටගනීද, ලැබේද, එය සිද්ධ වූයේයයි කියති. කියන ලදී. කාමයන් කැමති වන්නහුට එය සමෘද්ධ වේ. එසේම නෛෂ්ක්‍රම්‍යය ඉටුවේනුයි ඍද්ධියි. විස්මය එළවානුයි ප්‍රාතිහාර්ය නම් වේ. අර්හත් මාර්ගය ඉටුවේනුයි ඍද්ධි නම් වේ. විස්මය එළවානුයි ප්‍රාතිහාර්ය නම් වේ. තවත් ක්‍රමයක් ඉටුවීම් අර්ථයෙන් ඍද්ධියි. ක්‍රම සම්පාදනයට මෙය විශේෂ නාමයකි. අදහස් කරන ලද ප්‍රතිඵලය උපදවන හෙයින් උපාය සම්පත ක්‍රියාත්මකයි. මේ චිත්ත ගෘහපතියා සිල්වත්ය, යහපත් ගතිගුණවලින් යුක්තය. ඉදින් ප්‍රාර්ථනා කරන්නේ නම් අනාගතයෙහි සක්විති රජෙකු වන්නේය. සිතෙහි ප්‍රාර්ථනා පිරිසිදු බැවින් සිල්වතාට ඉටුවන්නේය. අනෙක් ක්‍රමයක්, මෙයින් සත්ත්වයන් සමෘද්ධ වෙතියි

ඍද්ධි නම්. ඉටුවේනුයි, සිදුවූ වෘද්ධ වූ, උසස්බවට ගියාහු වෙතියි යුසේයි. ඍද්ධියෙහිම ආකාරය ඍද්ධිවිධයි. ඍද්ධි කොටස, ඍද්ධි විකල්පයයි අර්ථයි. එය ඍද්ධිවිධ ඥානයයි යූසේයි. **විතක්ක විප්ඵාර වසෙන** යනු දිව්‍යශ්‍රෝත ධාතුව උපදවාගැනීම පිණිස සූදානම් වන අවස්ථාවෙහි ශබ්දාරම්මණයන්හි තමාගේ කල්පනාව පැතිරවීම් වශයෙන්, කල්පනාවේග වශයෙන් යනු අර්ථයි. විතක්කො යන මෙහි විතක්කෙති යනු කල්පනාව කල්පනා කිරීම හෝ විතර්කයයි. කල්පනා කිරීමයයි යූසේයි.

එය අරමුණෙහි සිත නංවන ලක්ෂණයි. හැප්පවීම විශේෂයෙන් හැප්පවීම රසයයි. එසේම ඒ යෝගාවචරයා විසින් අරමුණ කල්පනාවට හැප්පවූ, විශේෂයෙන් හැප්පවූ තත්වයක් ඇතිකරයි. අරමුණ සිතට ගෙන ඒම වැටහෙන කරුණයි. ඉන්‍ද්‍රියයන්ගෙන් එක් අරමුණක සිත පිහිටුවීමෙන් ආවරණය කළ විෂයයෙහි අනතුරුවම ඉදිරියට හමුවන විෂයය ආසන්න කාරණයයි. **නානත්ත කත්ත සද්දනිමිත්තානං** යනු නොයෙක් ආකාර වූද, ඒකාකාරී වූද ශබ්ද නිමිති ශබ්දම මෙහි කල්පනා ඉපදීමට හේතු බැවින්ද, හටගත් ලකුණු බැවින්ද නිමිති වේ. බෙර ශබ්දාදී වශයෙන් එකට මිශ්‍ර වූ (ඝන වූ) නොයෙක් ශබ්ද, නොයෙක් දිසාවන්හි ශබ්ද, නොයෙක් සත්ත්වයින්ගේ ශබ්ද, නානත්ත සද්දයි. එක් දිසාවක හෝ එක් සත්ත්වයෙකු හෝ ශබ්ද, බෙර ශබ්දාදි වශයෙන් එක් එක් ශබ්ද එකත්ත සද්දයි. මෙහි සදෙදා යනු ශ්‍රවණය වේනුයි ශබ්දයි. කථා කෙරෙයි යන අර්ථයි. **පරියොගාහණෙ පඤ්ඤා** යනු පිවිසීමේ ප්‍රඥාවයි. දැනගන්නා ප්‍රඥාවයි. අර්ථයි. **සොතධාතු විසුද්ධි ඤාණං** යනු ශ්‍රවණාර්ථයෙන්ද, අජීවාර්ථයෙන්ද ශ්‍රොත ධාතුයි. ශ්‍රෝතධාතු කෘත්‍ය කරණ වශයෙන් ශ්‍රෝත ධාතු වැනියයි ශ්‍රෝතධාතුයි. පිරිසිදු හෙයින්ද කෙලෙසුන්ගෙන් තොර බැවින්ද විසුද්ධියි. ශ්‍රෝත ධාතුවම පිරිසිදු වූයේ ශ්‍රෝතධාතු විශුද්ධියි. එයම ඤාණය වූයේ ශ්‍රෝතධාතු විසුද්ධි ඤාණයයි.

**තිණ්ණං චිත්තානං** යනු, සතුටින් යුක්ත, දොම්නසින් යුක්ත, මධ්‍යස්ථතාවයෙන් යුක්ත ආදී වශයෙන් සිත් තුනට, **විප්ඵාරත්තා** යනු පැතිරීම් ස්වභාවයෙන් වේගයෙන් යයි අර්ථයි. චේතෝපරිය ඤාණය උපදවාගැනීම සඳහා සූදානම්වන කාලයෙහි අනෙක් සිත් තුනෙහි පැතිරීම් හේතුවෙන්.

**ඉන්‍ද්‍රියානං පසාද වසෙන** යනු චක්ෂුරාදි ෂඩින්ද්‍රියයන්ගේ පිරිසිදු

බව වශයෙන් ඉන්ද්‍රියයන් පිහිටි ස්ථානයෙහි අවට පෙදෙසද ඉන්ද්‍රියයන් සේ සලකයි. 'ඇවැත්නි, ඔබගේ ඉන්ද්‍රියය ඉතා ප්‍රසන්නය. සමෙහි වර්ණය පිරිසිදුය. ඉතා පිරිසිදුය. මෙහිදී ඉන්ද්‍රියයන් පිහිටි ස්ථාන අතර හෘදය වස්තුවම මෙහි අදහස් කරන ලදී. ප්‍රසාද වශයෙන් යනු නොකැළඹුණු ස්වභාවයෙන් ප්‍රසාද අප්‍රසාද වශයෙන් යයි කිවයුතු වුවත්, අප්‍රසාද ශබ්දය ලොප්කරන ලදී. මෙය අප්‍රසන්න යයි ගැනීමෙහිදී ප්‍රසාදය අපේක්ෂාකොටම හටගත් හෙයින් ප්‍රසාද වශයෙන් යයි වචනයෙන්ම අප්‍රසාදයද කියන ලද්දේම වේයයි දතයුතුය.

**නානත්තෙකත්ත විඤ්ඤාණචරියා පරියොගාහණෙ පඤ්ඤා** යනු පිළිවෙළින් නොයෙක් ස්වභාව හා එක් ස්වභාවයක් ඇති එකුන් අනූවක් විඤ්ඤාණයන්හි පැවැත්ම දන්නා ප්‍රඥාව මෙහි සමාධිගත නොවූවහුගේ සිත්හි චර්යා විවිධාකාරය. සමාධිගත වූවහුගේ සිත්හි චර්යා ඒකාකාරය. සරාගී සිත විවිධාකාරය. වීතරාගී සිත ඒකාකාරය. **චෙතො පරියඤාණං** යනු හාත්පස යේනුයි පරියයි. පිරිසිඳීනුයි අර්ථයි. සිතෙහි පිරිසිඳීම චේතො පරියයි. චේතෝ පරියද ඤාණයද එකම වූයේනුයි චේතොපරිය ඤාණයයි. පැතිරීම යනුද අර්ථයි.

**පච්චය පවත්තානං ධම්මානං** යනු ප්‍රතීත්‍ය සමුත්පාද වශයෙන් ප්‍රත්‍යය වශයෙන් පවත්නා ප්‍රත්‍යයෙන් හටගත් ධර්මයන්ගේ **නානත්තෙකත්ත කම්මවිපඵාර වසෙන** යනු මෙහි අකුසල කර්මය විවිධාකාරය. කුසලකර්මය ඒකාකාරය. කාමාවචර කර්මය විවිධාකාරය. රූපාවචර-අරූපාවචර කර්මය ඒකාකාරය. විවිධාකාර, ඒකාකාර කර්ම පැතිරීම් වශයෙන් හේතුවකින් හටගෙන පවත්නා ධර්මයන්ගේ හාත්පසින් අවබෝධ කරගැනීමේ ප්‍රඥාවයයි සම්බන්ධයි. **පුබ්බෙ නිවාසානුස්සති ඤාණං** යනු පෙර අතීත ජාතීන්හි විසූ ස්කන්ධයන් පූර්වේනිවාසයයි. නිවුත්ථ යනු විසූ, විඳින ලද, තම සන්තානයෙහි ඉපිද නිරුද්ධ වූ යන අර්ථයි. පෙර අතීත ජාතීන්හි විසූ ස්වභාවයන් පූර්වේනිවාසයයි, නිවුත්ථා තමාගේ විඤ්ඤාණයෙන් පිරිසිඳ දැනගත් හෝ අන්‍ය විඤ්ඤාණයකින් දන්වන ලද හෝ පෙර ගෝචර නිවාසයෙන් වාසයකොට පුරුදු තැනයි. ඒ ඒ මාර්ගයෙන් සිඳිනලද ඉතා සියුම්වූද, කෙලෙස් වට සිහිකිරීම් ආදියෙහි, ඒවා බුදුවරුන්ට පමණක් ලැබේ.

**පුබ්බෙ නිවාසානුස්සති** යනු යම් සිහියකින් පෙර විසුම් සිහිකෙරේද,

එය පූර්වේනිවාසානුස්සති ඥාන නම් වන්නේය. **ඤාණං** යනු ඒ සිහිය හා යෙදුණු ඤාණයයි.

**ඔභාසවසෙන** යනු ඇසින් රූප දර්ශනය සඳහා දිගුකළ ගිනි කසිණය, සුදුකසිණය, ආලෝක කසිණය යන මේවායින් එකකට සිව්වන ධ්‍යානාරම්මණ වූ කසිණාලෝකයාගේ වශයෙන්, **නානත්තෙකත්ත රූප නිමිත්තානං** යනු නොයෙක් සත්ත්වයින්ගේ රූප - නොයෙක් ශරීරයන්ගෙන් උපන් සත්ත්වයින්ගේ රූප නොයෙක් දිසාවන්හි වූ හෝ රූප මිශ්‍ර නොවූ හෝ රූප නානත්ත රූපයි. එක් සත්ත්වයෙකුගේ රූප, එක් කයක උපන්නාවුන්ගේ රූප, එක් දිසාවක රූප, නොයෙක් දිසාවන්හි සම්මිශ්‍රණය වූ රූප එකත්තරූපයි. රූපය යනු මෙහි ඇස්, කන් ආදී ඉන්ද්‍රියය ඤාණය ඇසට පෙනේනුයි රූප නම්. වෙනස්වීම්වලට භාජන වනුයේ හෘදයංගත භාවය ප්‍රකාශ කරයි යනු අර්ථයි. රූපයම රූප නිමිත්තයි. ඔවුන්ගේ විවිධත්වයෙහි හා ඒකත්වයෙහි වූ රූප අරමුණුවල. **දස්සනට්ඨෙ පඤ්ඤා** යනු දැකීම් ස්වභාවයෙහි ප්‍රඥාව. **දිබ්බචක්ඛු ඤාණං** යනු දෙවියන්ට සමාන බැවින් දිව්‍ය නම් වේ. දෙවියන්ට වනාහි සුචරිත කර්මයෙන් උපන් බැවින් පිත් සෙම් ලේ ආදියෙන් බාධා රහිත වූයේ කෙලෙසුන්ගෙන් මිදුණු බැවින් දුර වුවද අරමුණු පිළිගැනීමට සමත් දිව්‍ය ප්‍රසාද ඇසක් වේ. මෙයද වීර්ය භාවනා බලයෙන් උපන් නැණසද එවැනිම වූයේනුයි දෙවියන් හා සමාන බැවින් දිව්‍ය නම් වේ. දිව්‍ය විහරණ වශයෙන් ලද හෙයින්ද, තමන්ද දිව්‍ය විහරණ ආශ්‍රිත හෙයින්ද දිව්‍යයයි. ආලෝකය ලබාගැනීමෙන් මහා බැබලීමක් ඇතිහෙයින්ද දිව්‍යයි. බිත්ති හරහා ඇති රූප දැකීමෙහි උසස් ස්වභාවයක් ඇති හෙයින්ද දිව්‍යයි. ඒ සියල්ල ශබ්ද ශාස්ත්‍රානුසාරයෙන් දතයුතුය. දර්ශනාර්ථයෙන් චක්ඛුයි. ඇසේ කෘත්‍යය කරන අර්ථයෙන්ද ඇස වැනියයිද චක්ඛුයි. දිව්‍ය වූයේද ඇස වූයේද එයනුයි දිව්‍ය චක්ෂුයි. දිව්‍ය ඇසද ඤාණයද එයම වූයේ නුයි දිව්‍ය චක්ෂු ඥානයයි.

**චතුසට්ඨියා ආකාරෙහීති** යනු අටවැදෑරුම් මාර්ගඵලයන්හි අට අට ඉන්ද්‍රියයන්ගේ වසයෙන් සිවුසැට ආකාරයන්ගෙන්. **තිණ්ණන්නං ඉන්ද්‍රියානං** යනු අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රිය යන මේ ත්‍රිවිධ ඉන්ද්‍රියයන්ගේ **වසීභාවෙසු පඤ්ඤා** යනු වසීභාවයෙන් පවත්නා ප්‍රඥාවයි. අර්හත් ඵලයෙහි අටවැදෑරුම් ඉන්ද්‍රියයන්ගේ වශයෙන් අට ආකාරයකින් අඤ්ඤාතාවින්ද්‍රියයාගේ

වසීභාවයෙන් අර්හත් මාර්ගක්‍ෂණයෙහි නැතිකල්හිද, හේතු සිද්ධි වශයෙන් එය සිද්ධවන බැවින් යුසේයි. **ආසවානං ඛයෙ ඤාණං** යනු තමා විසින් නැසිය යුතු ආශ්‍රවයන්ගේ විනාශය ඇතිකරන අර්හත් මාර්ග ඥානයයි ආශ්‍රවක්‍ෂය ඥාන සංඛ්‍යාත වූ අර්හත් මාර්ග සම්බන්ධ වූ සිවුමග ඤාණයන්ගේ එක් එක් මාර්ග ඤාණයාගේ ඒකීය අවබෝධය දක්වන්ට **'පරිඤ්ඤෙය්‍යෙ පඤ්ඤා'** ආදි සිවු ඤාණයන් දක්වන ලදී. එහිද, ලිහිල් බැවින්ද සියලු සත්ත්වයින්ට සාධාරණ බැවින්ද, පහසුවෙන් අවබෝධ කළ හැකි හෙයින්ද දුක්ඛ සත්‍යය පළමුව යුසේයි. එහිම හේතු දැක්වීමට ඉන් අනතුරුව සමුදය සත්‍යයද, හේතු නිරෝධයෙන් ඵලනිරෝධය වේයයි ඇඟවීමට ඉන් අනතුරුව නිරෝධ සත්‍යයද, එහි අවබෝධ උපාය මාර්ග දැක්වීමට ඉන් අනතුරුව මාර්ග සත්‍යයද දක්වයි. භව සැප ආස්වාදයෙහි නිමග්න වී සිටින සත්ත්වයින්ට සංවේග ඉපදවීම සඳහා පළමුව දුක්ඛ සත්‍යය දෙසූ සේක. එය ස්වයං ක්‍රියව නොඑයි. ඊශ්වර නිර්මාණාදියකින් නොවේ. මේ හේතුයෙන් යයි දැක්වීමට ඉන් අනතුරුව සමුදය සත්‍යය දක්වයි. ඉක්බිති හේතු සහිත දුකින් මැඩුණු සංවේගප්‍රාප්ත මානසිකත්වයක් ඇති දුකින් නිදහස්වීම ගවේෂණය කරන්නන්ට නිදහස දැක්වීමෙන් සැනසිල්ල හටගැන්වීමට දුක්ඛ නිරෝධය දක්වයි. ඉක්බිති නිරොධාධිගමය සඳහා නිරෝධයට පමුණුවන මගයයි දැන් ඊට විෂය වූ, ඤාණ ඒ ක්‍රමයෙන්ම දක්වන ලදී. එහි **පරිඤ්ඤෙය්‍යෙ** යනු දුක්ඛයාගේ පීඩනයට පත්කරන ආදී සිව් ආකාරයන් විශේෂයෙන් දැනගත යුතු ස්වභාවයන්ය. **පහාතබ්බෙ** යනු සමුදයෙහි රැස්කිරීම් ආදී සතරාකාර දුරුකළ යුතු ස්වභාවයන්ය. **සච්ඡිකිරියෙය්‍යෙ** යනු නිරෝධයාගේ නිදහස්වීම ආදී සතරාකාර ප්‍රත්‍යක්‍ෂ කළයුතු ස්වභාවයන්ය. **භාවනෙය්‍යෙ** යනු මාර්ගයාගේ ගෙනයනු ලබන ආදී සිවු ආකාර වැඩියයුතු ස්වභාවයන්ය.

දැන් වඩන ලද මාර්ග ඇති තැනැත්තාට ප්‍රත්‍යවේක්‍ෂා වශයෙන්ද නොවඩන මාර්ග ඇති තැනැත්තාට පරම්පරා කථා වශයෙන් වෙන් වෙන්ව සත්‍ය ඤාණයන් දැක්වීමට දුක්ඛ සත්‍ය ඤාණාදි සිව් ඤාණයන් දක්වන ලදී. එහි **දුක්ඛෙ** යනු 'දු' යන මේ ශබ්දය පිළිකුලෙහි පෙනේ. පිළිකුල් පුතා දුපුත්ත යයි කියති. 'ඛං' ශබ්දය හිස් යන අර්ථයෙහි යෙදේ. හිස් අහස ඛං යයි කියයි. මේ ප්‍රථම සත්‍යය පිළිකුල්ය. නොයෙක් උපද්‍රවයන් නිශ්වය කරන හෙයින් හිස්ය. අඥාන ජන කල්පිතයන් තුළ, ස්ථිර, ශුභ සුව ආත්මභාවයන්ගෙන් තොර බැවිනි. එහෙයින් පිළිකුල් බැවින්ද, හිස් බැවින්ද දුක්ඛ යයි කියයි. දුක්ඛ සමුදයෙ යන මෙහි 'සං' යන මේ ශබ්දය

එක්වීම, යුක්තවූ ආදීන්හි මෙන් සංයෝගය දක්වයි. 'උ' යන මේ ශබ්දය උපන්නේය. උදාවූයේ යයි ආදීන්හි මෙන් උත්පත්තියෙහි යෙදේ. අය ශබ්දය වනාහි කාරණය දක්වයි. මේ දෙවන සත්‍යයද ඉතිරි හේතූන් එක්වූ කල්හි දුකෙහි උත්පත්ති කරුණයි. දුකෙහි සංයෝගය හටගැනීමට හේතුවන බැවින් දුක්ඛ සමුදයයි කියයි.

දුක්ඛ නිරොධෙ යන මෙහි 'නි' ශබ්දය අභාවය හඟවයි. රෝධ ශබ්දය හැසිරවීම දක්වයි. එහෙයින් සියලු උත්පත්ති ශූන්‍යවන බැවින් සසර හැසිරවීම් සංඛ්‍යාත දුක්ඛ නිරෝධයෙහි අභාවය මෙහි දැක්වේ. එය අවබෝධ කළ කල්හි සසර හසුරුවන දුක් රෝධයාගේ අභාවය වේ. ඒ දුක්වලට විරුද්ධ බැවින්ද දුක්ඛ නිරෝධයයි කියයි. **දුක්ඛ නිරොධ ගාමිනියා** පටිපදායාති අරමුණු කිරීම් වශයෙන් ඊට අභිමුඛ වූ හෙයින්ද දුක් නිරෝධ ප්‍රාප්තියෙහි ප්‍රතිපදාවක්ද වේ. යමක් නිසා දුක් නිරෝධයට යේද, එහෙයින් ඊට දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව යයි කියයි. සතර මාර්ග ඥාණයන්ම යට නැගිටීම් ආකාරයක් දැක්වීම් වශයෙන් මාර්ගයෙහි ඥාණයයි කියන ලද්දේය. අනතුරුවම ප්‍රතිඵල දායකත්වය දැක්වීම් වශයෙන් ආනන්තරික සමාධියෙහි ඥාණයයි කියන ලදී. පෙරළෙන ආකාරය දැක්වීම් වශයෙන් සච්ච විවට්ටනෙ ඥාණයයි කියන ලදී. මාර්ග පිළිවෙළ ක්‍රමයෙන්ම අර්හත් මාර්ග ඥානය උපන්නහුගේ ඥාණයෙහි අභිඥාභාවය දක්වන්ට අර්හත් මාර්ග ඥානයම ආස්‍රවක්‍ෂය කර ඥානයයි යූසේයි. නැවත සතර මාර්ග ඥාණයන්ටම එක් අවබෝධතාවයක් බව දැක්වීමට, පරිඤ්ඤෙය්‍ය පඤ්ඤා දුක්ඛෙ ඥාණං ආදී සිවු ඥාණයන් යූසේයි. නැවත එක් එක් සත්‍යයන් වෙන් වෙන්ව උත්පත්ති දැක්වීම් වශයෙන් දුක්ඛෙ ඥාණං ආදි සතර ඥාණයන් දක්වන ලද්දේයයි මෙසේ පූර්වාපර විශේෂ දතයුතුය.

දැන් සියලු ආර්ය පුද්ගලයන්ට ආර්ය මාර්ගානුභාවයෙන්ම පටිසම්භිදා ඥාණයන් සිදුවූයේ යයි දැක්වීමට **අත්ථපටිසම්භිදෙ ඥාණන්ති** ආදී සතර පටිසම්භිදා ඥාණයන් නැවත දක්වන ලදී. මේ ප්‍රතිසම්භිදා ප්‍රභේද නොමැතිවූයේද, සියලු ආර්ය පුද්ගලයින්ට සාධාරණ අමිශ්‍ර පටිසම්භිදා ඥාණයි. යට දක්වන ලද ඒවා වනාහි බිඳුණු පටිසම්භිදාවන්ගේ ප්‍රභේදයට පත් ප්‍රතිසම්භිදා ඥාණයන් යයි දතයුතුය. මෙය එම ඥාණයන්ගේ බහුවචනයෙහි විශේෂයයි. අනතුරුව දක්වන ලද, දුක අරමුණු වූද, නිරෝධය අරමුණු වූද ඥාණය අර්ථ ප්‍රතිසම්භිදාව වේ. සමුදය අරමුණු වූද මාර්ගය අරමුණු වූද ඥාණය ධර්ම ප්‍රතිසම්භිදාව වේ.

එය කීමෙහි ඤාණය නිරුක්ති ප්‍රතිසම්භිදාවයි. ඒ ඤාණයන්හි ඤාණය ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවයි. එහෙයින් එම අර්ථ විශේෂය දැක්වීමට අමිශ්‍ර ප්‍රතිසම්භිදා ඤාණ දක්වන ලද්දේය, ඒවාම යට නානත්ත ශබ්දයෙන් විශේෂකොට කියන ලදී. මෙහි එසේ විශේෂයක් නොකොට කියන ලදී.

මෙසේ පිළිවෙළින් සූසැටක් ශ්‍රාවක සාධාරණ ඤාණ උගන්වා, දැන් ශ්‍රාවකයින්ට අසාධාරණ බුදුවරුන්ටම විශේෂයෙන් අයත්වූ ඤාණ දැක්වීමට ඉන්ද්‍රිය පරොපරියත්ත ඤාණාදී වූ ෂට් අසාධාරණ ඤාණ දක්වා ඇත. බුදුවරු ධර්මදේශනා සඳහා බඳුන් කළයුතු, නොකළයුතු වශයෙන් සත්ත්වයින්ගේ තත්ත්වය විමසා බලන්නේ බුදුඇසින් බලති. බුදු ඇසනම් ඉන්ද්‍රිය පරොපරියත්ත හා ආසයානුසය ඤාණ ද්වයමය. භාග්‍යවතුන් වහන්සේ බුදු ඇසින් ලොව බලන සේක් අල්ප රජස්ක වූද, මහා රජස්ක වූද, තීක්‍ෂණ ඉන්ද්‍රියන් ඇත්තා වූද මෘදු ඉන්ද්‍රියයන් ඇත්තා වූද සත්ත්වයින් දුටු සේක. සත්ත්ව සන්තානයන් බලනසේක් පළමුව බලවත් ශ්‍රද්ධා ප්‍රඥාදියෙහි මේරූ නොමේරූ තත්ත්වයන් බලති. ඉන්ද්‍රිය පරිපාකය දැන සිතේ පවත්නා ආකාරයට සුදුසු අයුරින් ධර්මදේශනා සඳහා ඉක්බිති සිත්හි පවත්නා ආකාරයන් අනුව අප්‍රකට කෙලෙස් සහිත චරිතයන් බලත්. එහෙයින් පළමුව ඉන්ද්‍රිය පරොපරියත්ත ඤාණය දක්වයි. ඉන් අනතුරුව ආසයානුසය ඤාණයයි. ධර්මය දේශනා කරන්නේ ප්‍රාතිහාර්යයෙන් හික්මවිය යුතු අයට ප්‍රාතිහාර්යය කරති. එහෙයින් ආසයානුසය ඤාණයට අනතුරුව යමක ප්‍රාතිහාර්ය ඤාණය දක්වයි. මේ ත්‍රිවිධ ඤාණයන්ගේ හේතු දැක්වීමට ඉන් අනතුරුව මහා කරුණා ඤාණය දක්වයි. මහා කරුණා ඤාණයෙහි පිරිසිදු බව දැක්වීමට ඉන් අනතුරුව සර්වඥතා ඥානය දක්වයි. බුදුරදුන්ගේද සියලු ධර්මයන්ගේ මෙනෙහි කිරීම් හා සම්බන්ධ බව දැක්වීමට සර්වඥතාඥානය වැසීමකින් තොර බව දැක්වීමට ඉන් අනතුරුව අනාවරණ ඤාණය දක්වයි.

**ඉන්ද්‍රිය පරොපරියත්තෙ ඤාණං** යන මෙහි සත්ත්වයින් මත්තෙහි යන පදය මෙහිදීම ගෙනවුත් සත්තානං ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං යනුවෙන් යෙදිය යුතුය. පරානිච අපරානිච පරාපරානියි කිවයුතු වුවත්, රොකාරයකොට පරොපරානියි කියයි. පරොපරයන්ගේ භාවය පරොපරියයි. පරොපරියම පරොපරියත්තයි. හික්මවිය හැකි සත්ත්වයින්ගේ ශ්‍රද්ධාදී පංච ඉන්ද්‍රියයන්ගේ අඩුවැඩි බව දැනීම ඉන්ද්‍රිය පරොපරියත්තයයි. ඉන්ද්‍රිය පරොපරියත්තයෙහි ඤාණය ඉන්ද්‍රිය පරොපරියත්ත ඤාණයයි.

ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ උසස් පහත් බව දැනීමේ ඤාණයයි යන අර්ථයි. ඉන්ද්‍රිය වරෝ වරියත්ත ඤාණං යනුවෙන්ද පාඨයකි. වරානිච අවරානිච වරොවරියානි වරෝ වරියන්ගේ භාවය උතුම් හා උතුම් නොවූවන්ගේ ස්වභාවය වරොවරියත්තයි. අවරියානි යනු උතුම් නොවූ යන අර්ථයි. පරානිච ඔපරානිච පරොපරානි, ඔවුන්ගේ ස්වභාවය පරොපරියත්තයි. ඔපරානිද ඔරානි යනුවෙන්ද කියයි. ලාමක පහත් යන අර්ථයි. පරොපරායසස සමෙචච ධම්මා ආදීන්හි මෙන් ඉන්ද්‍රිය පරෝ පරියත්තෙ ඤාණං ආධාරාර්ථයෙහි පාඨයයි.

සත්තානං ආසයානුසයෙ ඤාණං යන මෙහි රූපාදී ස්කන්ධයන්හි කැමැත්ත හා ආශාවෙන්, ඇලුණේ පැටලුණේනුයි සත්ත්ව නම් වේ. බුදුරදුන් දෙසන ලද්දේමය 'රාධය රූපයෙහි යම් කැමැත්තක්, යම් ඇල්මක්, යම් සතුටක්, යම් තෘෂ්ණාවක් වේද, එහි ඇලුණේ, එහි පැටලුණේ වේද, එහෙයින් සත්ත්වයායි කියයි. වේදනා, සඤ්ඤා, සංස්කාර විඤ්ඤාණයන්හිද යම් කැමැත්තක්, යම් ඇල්මක්, යම් සතුටක්, යම් තෘෂ්ණාවක් වේද, එහි ඇලුණේ එහි පැටළුණේ වේද එහෙයින් සත්ත්වයා යයි කියනු ලැබේ. අක්ෂර චින්තකයෝ අර්ථ විමසීමක් නොකොට, නාමමාත්‍රයම කැමති වෙති. යමෙක් අර්ථය විමසත්ද? ඔව්හු ඇලීම් යෝගයෙන් සත්ත්වයා යයි කැමති වෙත්. ඒ සත්ත්වයින්ගේ වාසස්ථානය ආශ්‍රය කරන ස්ථානය මෙයනුයි ආසය නම්. මිථ්‍යාදෘෂ්ටියෙන් හෝ සම්‍යග් දෘෂ්ටියෙන්, කාමාදීන්ගෙන් හෝ නෛෂ්ක්‍රම්‍යාදීන්ගෙන් වඩන ලද සන්තානයට මෙය විශේෂ නමකි. සත්ත්ව සන්තානයන්හි අත්නොහැර පවතිත්. අනුව පවතිත්නුයි අනුසයයි. බලවත් වූ කාමරාගාදීන්ට මෙය විශේෂ නමකි. ආසයද අනුසයද, ආසයානුසයයි. ජාති ග්‍රහණයෙන් ද්වන්ද සමාස වශයෙන් ඒකවචනයයි දතයුතුය.

චරිත ස්වභාවයන් ආසයානුසයෙහි සංග්‍රහ කරන ලදී. එහෙයින් කෙටි විස්තරයෙහි චරිතාධිමුත්තීන්හි ඤාණ ආසයානුසය ඤාණයෙහිම ඇතුළත්කොට ආසයානුසයෙ ඤාණයයි කියන ලදී. යම් අදහසකින් කෙටි විස්තරය කරන ලද්දේද ඒ අදහසින්ම දීර්ඝ විස්තරයද කළේය.

යමක පාටිහීරෙ ඤාණං යන මෙහි ගිනිකඳක් හා ජලදහරාවක් පෙර පසු නොවී එක්වරකදීම පවත්වන ලද්දේ යමකයි. අශ්‍රද්ධාදී විරුද්ධ ධර්මයන්ගේ ඉවත් කිරීම සිදුකරන හෙයින් පාටිහීර නම්. යමක වූතයද ප්‍රාතිහාර්යයද එයම වූයේ නුයි යමක පාටිහීර නම්.

**මහා කරුණා සමාපත්තියා ඤාණං** යන මෙහි, අනෙකාගේ දුකක් ඇති කල්හි සත්පුරුෂයින්ගේ හෘදය කම්පා කෙරේනුයි කරුණායි. අන් දුක ක්‍ෂය කෙරේනුයි විනාශ කෙරේනුයි කරුණායි. දුකට පත්වූවන් කෙරෙහි ක්‍රියා කෙරේනුයි පැතිරීම් වශයෙන් දිගුකරනු ලැබේනුයි කරුණායි.

පැතිරීම් කර්ම වශයෙන්ද, කර්මගුණ වශයෙන්ද මහත් වූ කරුණාව මහා කරුණාවයි. මේ මහා කරුණාවට සමවදිතියි=සමාපත්ති නම්. මහා කරුණාවද, සමාපත්තියද එකම වූයේ නුයි මහා කරුණා සමාපත්ති නම්. ඒ මහා කරුණා සමාපත්තියෙහි, ඒ හා යෙදුණු ඤාණයයි.

**සබ්බඤ්ඤුත ඤාණං අනාවරණ ඤාණං** යන මෙහි පස්වැදෑරුම් දතයුතු මාර්ග ප්‍රභේදයන් සියල්ල දැනගත්තේනුයි සබ්බඤ්ඤූයි. සියල්ල දත් බව සබ්බඤ්ඤුතාවයි. එයම ඤාණය වූයේ සබ්බඤ්ඤුතා ඤාණයයි කිවයුතු වුවත් සබ්බඤ්ඤුත ඤාණයයි කියන ලදී. හේතුවකින් හටගත් හටනොගත් සියලු ධර්මයෝ සංස්කාර විකාර, ස්වභාව, නිර්වාණ, නියම යන පස්වැදෑරුම් දතයුතු මාර්ගයන්ට අයත් වෙති. සබ්බඤ්ඤූ යන මෙහි, ක්‍රම සබ්බඤ්ඤූ එක්වරක් සබ්බඤ්ඤූ, නිතර සබ්බඤ්ඤූ ශක්ති සබ්බඤ්ඤූ, දැනගත් සබ්බඤ්ඤූ යයි පස්වැදෑරුම් සර්වඥවරු වන්නාහුය. ක්‍රමයෙන් සියල්ල දැනගන්නා කාල නොයෙදෙන හෙයින් ක්‍රම සර්වඥවරු නොවෙති. එක්වර සියලු අරමුණු ගැනීමක් නොයෙදෙන හෙයින් එක්වර සර්වඥවරු නොවෙති. චක්‍ෂු විඤ්ඤාණාදීන්ට සුදුසු අරමුණු වශයෙන් සිත් හටගන්නා බැවින්ද, භවංග සිත් විරෝධ බැවින්ද, යුක්තියක් නොමැති හෙයින්ද, නිතර පවත්නා සර්වඥවරු නොවෙත්. ශේෂයක් නොමැතිව සියල්ල දැනගැනීමේ හැකියාවක් ඇති බැවින් ශක්ති සර්වඥවරු වන්නෝය. සියලු ධර්මයන් දත් හෙයින් ඤාත සර්වඥවරුද වන්නෝය. ශක්ති සර්වඥවරුනට සියලු දතයුතු දෙයක් නැතයයි යන්නද නොයෙදේ.

**න තස්ස අදිට්ඨමිධත්ථි කිඤ්චි - අථො අවිඤ්ඤාත මජානිතබ්බං**
**සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙය්‍යං - තථාගතො තෙන සමන්ත චක්ඛු'ති**

ඔහුට මෙහි නුදුටු හෝ තවද දැන නොගත් හෝ දැනගත යුතු කිසිවක් නැත. යම්කිසි දැනගතයුතු දෙයක් තිබේද? ඒ සියල්ල දැනගත්තේය. එහෙයින් තථාගතයන් වහන්සේ සමන්ත චක්ඛු නම් වේ යයි කියන ලද හෙයින් ඤාත සර්වඥතාවයම යෙදේ. මෙසේ ඇති කල්හි, කෘත්‍ය වශයෙන්,

නුමුලා බැවින්, කාරණ සිද්ධි වශයෙන් මෙනෙහි කිරීම් හා සම්බන්ධව පවත්නා බැවින් සර්වඥත්වයම වේ. මෙනෙහි කිරීම් පිළිබඳව මොහුට ආවරණයක් (වැස්මක්) නැත්තේනුයි අනාවරණයි. එයම අනාවරණ ඤාණයයි කියයි.

**ඉමානි තෙසත්තති ඤාණානි** යනු මේ තෙසැත්තෑ (73) ඤාණයන් ශ්‍රාවකයන් කෙරෙහි සාධාරණ අසාධාරණ වශයෙන් දක්වන ලදී. **ඉමෙසං තෙ සත්තතියා ඤාණානං** යන මෙහි මුල පටන් කියන ලද තෙසැත්තෑ ඤාණයන්ගේ. දැරීම් අර්ථයෙහි ෂෂ්ඨී විභක්තියි. තෙසත්තති යනුවෙන්ද පාඨයි. තෙසත්තතියායි කිවයුතු කල්හි එකවචනාර්ථයෙහි බහුවචනයි. **සත්තසට්ඨි ඤාණානි** මුල පටන් සත්සැටක් ඤාණ. **සාවක සාධාරණානි** යනු ශ්‍රවනාන්තයෙහි ආර්ය ජාතියෙහි උපන් බැවින් සාවක නම්. මේවා සමව දරානුයි සාධාරණයි. තථාගත ශ්‍රාවකයින් හා සාධාරණ බැවින් ශ්‍රාවක සාධාරණයි. **ඡඤාණානීති** යනු කෙළවර දක්වන ලද ෂට් ඤාණයන්. **අසාධාරණානි සාවකෙහීති** යනු ශ්‍රාවකයින්ට අසාධාරණ වූ බුදුවරුන්ගේම ඤාණයෝය.

සද්ධර්මප්‍රකාශනී නම් වූ ප්‍රතිසම්භිදා මාර්ග අර්ථකථාවෙහි
ඤාණ කථා මාතිකා කෙටි විස්තර වාර වර්ණනාව
නිමි.

දැන් තබන ලද කෙටි විස්තරයෙන් ඇතුළත් කරන ලද ධර්මයන් ප්‍රභේද වශයෙන් දක්වන්ට, **කථං සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං** ආදි විස්තර වාරය අරඹන ලදී. එහි සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං වශයෙන් යමක් කියන ලද්දේද, එය කෙසේ වේද? මෙය කියනු කැමති විමසීමයි. ප්‍රශ්න කිරීම් පස්වැදෑරුම්ය. නුදුටු දේ ප්‍රකට කිරීම, දුටු දේ සංසන්දනය කිරීම, සැක දුරුකිරීම (සිඳීම) අනුමත කිරීම, විස්තර වශයෙන් කියනු කැමැත්ත යන පස් ආකාරයෙන් ප්‍රශ්න විචාරයි. මේ එහි නානාප්‍රකාරයයි. එහි නුදුටු දේ ප්‍රකට කිරීමෙහි ප්‍රශ්න විචාරීම කවරේද? මුල් ස්වභාවය නොදක්නා ලද්දේ, සමාන නොකළේ, තීරණය නොකළේ, ප්‍රකට නොවූයේ, පැහැදිලි නොවූයේ නොදත්තේ වේද, එය නුවණින් දැකීම පිණිස, ප්‍රකට කිරීම පිණිස පැහැදිලි කිරීම පිණිස ප්‍රශ්න විචාරයිද,

මෙය නුදුටු මුල් ස්වභාවය ප්‍රකට කිරීමෙහි ප්‍රශ්න විචරයයි. දුටු දේ සංසන්දනය කිරීමේ ප්‍රශ්න විචාරීම කවරේද? මුල් ස්වභාවය දක්නා ලද්දේ සමාන කළේ, තීරණය කළේ, ප්‍රකට වූයේ, පැහැදිලි වූයේ, දැනගත්තේ වේද, එය අනෙක් පණ්ඩිතයින් සමග සැසඳීම සඳහා ප්‍රශ්න විචාරීමයි. මෙය දුටු දේ සංසන්දනය කිරීමේ ප්‍රශ්න විචාරීමයි. සැක සිඳලීමෙහි ප්‍රශ්න විචාරය කවරේද? ප්‍රකෘතියෙන් සැකයට නැඹුරුවූයේ, විමතියට නැඹුරුවූයේ මෙසේමද? නොවේද? කුමක්නම් වේද? කෙසේනම් වේදැයි සැකයෙන් යුක්ත වේද? හෙතෙම සැක සිඳලීම පිණිස ප්‍රශ්න විචාරයි. මේ සැක සිඳලීම සඳහා කරන ප්‍රශ්න විචාරීමයි. අනුමත ප්‍රශ්න විචාරය කවරේද? බුදුරදුන් භික්ෂූන්ගේ අනුමතියෙන් (එකඟතාවයෙන්) ප්‍රශ්න විචරයි. මහණෙනි, නුඹලා එය කුමක්යයි හඟීද? රූපය නිත්‍ය හෝ අනිත්‍යද? අනිත්‍යයි ස්වාමීනි. යමක් අනිත්‍යයද? එය දුකද? නැතහොත් සැපද? දුකයි ස්වාමීනි. යමක් වනාහි අනිත්‍යද? දුකද? වෙනස්වනසුලුද? එය මගේය. ඒ මම වෙමි. ඒ මගේ ආත්මයයි මනාසේ බලන්ට සුදුසුද? ස්වාමීනි, එසේ නොබැලිය යුතුය. මේ එකඟතාවයෙන් ප්‍රශ්න විචාරීමයි. කියනු කැමැත්තෙන් ප්‍රශ්න විචාරීම කවරේද? භාග්‍යවතුන් වහන්සේ කියනු කැමැත්තෙන් භික්ෂූන්ට ප්‍රශ්න යොමුකරත්. මහණෙනි, මේ සතිපට්ඨාන සතරකි. කවර සතරෙක්ද? මේ කියනු කැමැත්තෙන් ප්‍රශ්න විචාරීමයි. ඒවා අතර මේ තෙරුන්ගේ ඓතුකම්‍යතා ප්‍රශ්න විචාරීමයයි යුසේයි.

මාතෘකා කෙටි විස්තරයෙහි, කියනු කැමති ප්‍රශ්න කිරීමෙන් මේ ධර්ම විශේෂයෙන් දතයුතුයයි කන් යොමුකිරීම එය දැනගැනීමෙහි ප්‍රඥාව සුතමයෙ ඤාණයයි ආදී සොළොස් විසඳන උද්දේසයයි. එහි **ඉමෙධම්මා අභිඤ්ඤෙය්‍යා** යන මෙහි දේශනා කරන්නහුගේ යනු පාඨශේෂයි. මේ ධර්ම විශේෂයෙන් දතයුතුයයි ශාස්තෘන් වහන්සේගේ හෝ වෙනත් ගරුකටයුතු සබ්‍රම්සර තෙර කෙනෙකුන් හෝ ධර්මය දෙසන කල්හි පෙර කියන ලද පරිදි, කන් යොමුකොට ඇසීම සෝතාවධානයයි. එය අවබෝධ කිරීමේ ප්‍රඥාව, ඒ ශ්‍රවණයෙහි පිළිවෙළ දැනීම, පිරිසිඳ දැනීමේ ප්‍රඥාව සුතමයෙ ඤාණයයි අර්ථයි. **තස්ස පජානනා තං පජානනා** වශයෙන් ෂට්ඨී විභක්ති සමාසයයි. තං පජානනාති යන මෙහි විභක්ති විපර්යාස වශයෙන් සම්බන්ධ කිරීමේ අර්ථයෙහි යොදා ඇත. **අභිඤ්ඤෙය්‍යා** යනු ස්වභාව ලක්ෂණ අවබෝධ කිරීම් වශයෙන් යහපත් ආකාරයෙන් යයි දැනගත යුතුය. **පරිඤ්ඤෙය්‍යා** යනු සමාන ලක්ෂණ අවබෝධ කිරීම්

වශයෙන්ද, කෘත්‍ය නිමාකිරීම් වශයෙන්ද, තීරණයකොට දතයුතුය. **භාවෙතබ්බා** යනු වැඩිය යුතුය යන අර්ථයි. **සච්ඡිකාතබ්බා** යනු ප්‍රත්‍යක්ෂ කළයුතුය. ලැබීමේ අවබෝධය, අරමුණු කිරීමේ අවබෝධ යයි ප්‍රත්‍යක්ෂය දෙයාකාරය. විරුද්ධ ධර්මයන් තමා තුළ හැසිරීම් වශයෙන් පිරිහීම් සංඛ්‍යාත හානිය භජනය කෙරේනුයි **හානභාගියි** ඊට අනුකූලවන අයුරින් සිහිය පිහිටුවීම් වශයෙන් සිටීම භජනය කෙරේනුයි **ඨිති භාගිය** නම් වේ. මත්තෙහි විශේෂයන් අවබෝධ කිරීම් වශයෙන් විශේෂතාවයක් භජනය කෙරේනුයි **විසේසභාගි** යි.

නොකැඩුණු, නොපැළුණු, ලෝභස්කන්ධය, ද්වේෂ ස්කන්ධය, මෝහ ස්කන්ධය කඩාදමයි. පළා දමයිනුයි ආර්ය මාර්ගය **නිබ්බෙධයි**. සංවේගී සංඥා මනසිකාරයන්ගේ හැසිරීම් වශයෙන් ඒ තියුණු අවබෝධය භජනය කෙරේනුයි **නිබ්බෙධභාගියි.**

**සබ්බෙ සංඛාරා** යනු හේතු සහිත සියලු ධර්මයි. ඒවා හේතුවකින් හටගත් සංස්කාරයි. හේතුන් එක්වී කෙරේනුයි සංස්කාර නම් වේ. ඒවාම ප්‍රත්‍යයන් එක්රැස්ව කරන ලද හෙයින් සංඛතයයි විශේෂකොට කියන ලදී. කර්මයෙන් හටගත් සියලු ත්‍රෛභූමික රූපාරූප ධර්ම අභිසංඛත සංඛාරයයි අර්ථකථාවන්හි කියන ලද්දේය. ඒවාද, 'සියලු සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍යයෝය, ආදී තන්හි සංඛත සංස්කාරයන්හි සංග්‍රහයට යෙත්. 'මහණෙනි, මේ අවිද්‍යාවෙන් මැඩුණු පුද්ගලයා පුණ්‍යමය වූ සංස්කාරයන් රැස් කෙරේ ආදීන්හි අවිද්‍යා ප්‍රත්‍යයෙන් ආවා වූ ත්‍රෛභූමික කුසලාකුසල චේතනා රැස්කිරීමේ සංස්කාරයි. අභිසංස්කාරයන්ගේ උත්පත්ති කොපමණද, එපමණ ගොස් රෝද සිඳුනා මෙන් සිටින්නෙහි යනාදී තන්හි කායික චෛතසික වීර්යය ප්‍රයෝගාභිසංස්කාර; 'ඇවැත්නි විසාඛය, සංඥා වේදයිත නිරෝධයට සමවන් භික්ෂුවගේ වචී සංඛාරය පළමුව නිරුද්ධ වේ. ඉන්පසු කාය සංඛාරයයි. ඉන්පසු චිත්ත සංඛාරයයි. මේ ආදී තන්හි විතර්ක විචාර වචනය රැස්කෙරෙත්නුයි වචී සංඛාරයි. ආස්වාස-ප්‍රස්වාස කයෙන් රැස්කරනු ලැබෙත්නුයි කාය සංඛාරයි. හැඟීමත්-දැනීමත් සිතෙන් රැස්කරනු ලැබෙත්නුයි-චිත්ත සංඛාරයි. මෙහි ප්‍රත්‍යයෙන් හටගත් සංස්කාරය අදහස් කරන ලදී. '**අනිච්චා**' යනු වී, තිබී, නැතිවීම් අර්ථයෙන්ය. '**දුක්ඛා**' යනු පීඩා අර්ථයෙන්ය. '**සබ්බෙ ධම්මා**' යනු නිර්වාණයද ඇතුළත් කොට කියන ලදී. '**අනත්තා**' යනු තම වසඟයෙහි නොපවත්නා අර්ථයෙනි. '**ඉදං දුක්ඛං අරියසච්චං**' යනාදීන්හි දුක්ඛ සමුදයො, දුක්ඛ නිරොධො යයි

කිවයුතු වුවත්, දුකඛ සමුදයං-දුකඛ නිරොධං ආදී වශයෙන් ලිංග විපර්යාසය කොට නපුංසක ලිංගයෙන් යොදා ඇත. බුද්ධාදී ආර්යයෝ අවබෝධ කෙරෙත්ද, එහෙයින් අරියසච්චානියි (ආර්ය සත්‍යයයි) කියති. දෙසූ පරිදි; මහණෙනි, මේ සතර ආර්ය සත්‍ය කෙනෙක් වෙති. -පෙ- මහණෙනි, මේවා සතර ආර්ය සත්‍යයෝ වෙති. මේවා ආර්යයෝ අවබෝධ කරත්. එහෙයින් ආර්ය සත්‍යයයි කියති. ආර්යයන්ගේ සත්‍යයෝනුයි ආර්ය සත්‍ය නම්. මෙසේ කියයි. දෙවිමිනිසුන් සහිත, දෙවියන් සහිත ලෝකයෙහි, තථාගතයන් වහන්සේ ආර්යනම් වෙති. එහෙයින් ආර්ය සත්‍යයයි කියති. ඔවුන් විසින් අවබෝධ කළ හෙයින්ද, ආර්යභාවයාගේ සිද්ධිය වූ හෙයින්ද ආර්ය සත්‍යයයි. මෙසේ කියයි. මහණෙනි, මේ චතුරාර්ය සත්‍යයන් නිසි ආකාරයෙන් අවබෝධ කළ හෙයින් තථාගත අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ආර්යයයි කියයි. උතුම් සත්‍ය වූයේනුයිද, ආර්ය සත්‍යයයි. අරියානි යනු අසත්‍ය නොවූ, බොරු නොකියන්නේ යන අර්ථයෙහිද යෙදේ. මෙසේද කියයි. මහණෙනි, මේ චතුරාර්ය සත්‍යයන් සත්‍යය අසත්‍ය නොවේ. අන් ආකාරයකින් නොවේ. එහෙයින් ආර්ය සත්‍යයයි කියති. සත්‍යයන් යන මෙහි කවර සත්‍යාර්ථයක් වේද, තවද, වැළැක්ම, මුල්හටගැන්ම, සංසිඳීම, සසරින් නිදහස්වීම ආදී ආකාරයෙන්ද, වෙනස්නොවන සත්‍යාකාරයෙන්ද, ආර්ය ඥානයට ගොදුරු වේමය. එය ගින්නෙහි ස්වභාවය මෙන්ද, ලෝකයෙහි ප්‍රකෘතිය මෙන්ද, සත්‍යය වෙනස් ස්වභාවයකට භාජන නොවේනුයි සත්‍යාර්ථයයි දතයුතුය. මහණෙනි, මේ දුක යනු සත්‍යයක්මය. අසත්‍යයක් නොවේ. අන්‍යාකාරයකට පත්නොවේ යනු විස්තරයයි. තව ද

නාබාධකං යතො දුකඛං - දුකඛා අඤ්ඤ නබාධකං
බාධකතත නියාමෙන - තතො සච්චමිදං මතං

තං විනා නාඤ්ඤතො දුකඛං - නහොති නච තං තතො
දුකඛ හෙතු නියාමෙන - ඉති සච්චං විසත්තිකා

නාඤ්ඤා නිබ්බානතො සනති - සනතං නච න තං යතො
සනතභාව නියාමෙන - තතො සච්ච මිදං මතං

මගගා අඤ්ඤං න නියානං - අනියානො නචාපි සො
තචඡ නීයාන භාවෙන - ඉති සො සච්ච සමමතො

ඉති තච්ඡා විපල්ලාස - භූත භාවං චතූසවපි
දුක්ඛාදි සච විසෙසෙන - සච්චට්ඨං ආහු පණ්ඩිතා'ති

යමකින් දුකක් හටගනීද, ඊට බාධක ඇති නොවේ. දුකින් අන්‍ය වූ බාධකයක්ද නැත. බාධකත්ව ස්වභාවයෙන් මෙය සත්‍යයයි දන්නා ලදී.

එය හැර වෙනත් ක්‍රමයකින් දුක හට නොගනී. එය එයින් නොවන්නේද නොවේ. දුකට හේතුවන නියමිත පිළිවෙළ අනුව තෘෂ්ණාව සත්‍යයකි.

නිර්වාණයට වඩා අන්‍ය ශාන්තියක් නොමැත. යම්හෙයකින් එය ශාන්ත භාවයක් නොවන්නේ නොවේද? ශාන්තභාව නියමයෙන් මෙය නිරෝධ සත්‍යයයි දන්නා ලදී.

මාර්ග සත්‍යයෙන් තොර නිවණට පමුණුවන අනෙකක් නොමැත. එය නිවණට නොපමුණුවන්නේද නොවේ. සත්‍ය වශයෙන්ම නිවණට පමුණුවන හෙයින් එය මාර්ග සත්‍යයයි සම්මතය.

සත්‍යය, වෙනස, සිදුවීම, නොවීම ආදී සතර දුක්ඛාදීන්හි විශේෂයෙන් ගෙන, සත්‍යාර්ථයයි පණ්ඩිතයෝ කීහ.

ඒ මෙම සත්‍ය ශබ්දය නොයෙක් අර්ථයන්හි දක්නා ලැබේ. ඒ කෙසේද යත්, 'සත්‍යයක්ම කථා කරන්නේය. කෝප නොවන්නේය ආදීන්හි වාක් සත්‍යයෙහිය. 'සත්‍යයෙහි පිහිටි මහණ බමුණෝ ආදීන්හි විරති සත්‍යයෙහිය. විරුද්ධවාද ඇති (ස්වලබ්ධියෙහි) අපිමැ දක්‍ෂයම්හයි කියන ඔහු කවර හෙයින් නානා සත්‍යවාදය කියත්ද ආදීන්හි දෘෂ්ටි සත්‍යයෙහිය. යමක් කෙරෙහි තමා දතුයේ, අනෙකා දැනුවත් කෙරේද එබඳු වූ එක් සත්‍යයක් ඇත. දෙවැන්නක් නැත යන ආදීන්හි පරමාර්ථ සත්‍ය නිර්වාණයෙහිද මාර්ගයෙහිද යෙදේ.

සිව් සත්‍යයන්ගේ කෙතෙක් කුසල්ද? කෙතෙක් අකුසල්ද? ආදීන්හි ආර්ය සත්‍යයෙහි යෙදේ. මෙහිද එය ආර්ය සත්‍යයෙහි යෙදේ.

**නිර්දේශ වාරයෙහි සංගෘහිත උද්දේසයෙහි,**
**විසඳුම් අර්ථ වර්ණනාව නිමි.**

දැන්, විසඳුම්, උදෙසීම් ඇතුළත් ධර්මයන් විවිධාකාරයෙන් දැක්වීමට 'කථං ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යාති' ආදී නිර්දේශ වාරයෙහි අරඹන ලදී. එහි අභිඤ්ඤෙය්‍ය නිර්දේශාදී, පංචකයෙහි, මුලින් එක එක ආදි වශයෙන් දස දස විසඳුම් දසුත්තර පර්යායයෙන් සංසන්දනය කොට දක්වන ලදහ. ඔවුන් අතරෙහි අභිඤ්ඤෙය්‍ය නිර්දේශයෙහි, පළමුකොට **සබ්බෙ සත්තා** යන්නේ කාමභවයන්හිද, සඤ්ඤා භවයන්හිද, ඒකවෝකාර භවාදි සියලු භවයන්හි සියලු සත්ත්වයෝ. ආහාරට්ඨිතිකා යනු ආහාරයෙන් පැවැත්ම මොවුන්ටනුයි ආහාරට්ඨිතිකයි. ඨිති යනු (ස්වකීය) ඒ මොහොතෙහි පැවැත්ම අදහස් කරන ලදී. (ආහාර ශක්තිය)

මෙසේ, සියලු සත්ත්වයින්ගේ ජීවත්ව සිටීමේ හේතුව ආහාරය නම් වූ එක් කරුණකියි අධික වූ ඤාණයෙන් දතයුතුය. ප්‍රත්‍යයන් දැනගත් කල්හි ප්‍රත්‍යයෙන් හටගත් දෙයද දැනගත්තේ වේ. දෙදෙනාටම (දෙකටම) ඔවුනොවුන් අපේක්‍ෂා කරන හෙයිනි. මෙයින් විශේෂ දැනීම කියන ලද්දේ වෙයි. මෙසේ ඇතිකල්හි අසඤ්ඤසත්ත දෙවියෝ අහේතුකය. ආහාර රහිතය. ස්පර්ශ රහිතය ආදිය කියන ලද්දේ නොවේද? එය එකඟ නොවේද? එහි විරුද්ධතාවයක් නොමැත. ඔවුන්ට ධ්‍යානය ආහාරයයි. මෙසේ ඇති කල්හිද, මහණෙනි, මේ ආහාර සතර වර්ගයක් අමනුෂ්‍යයන්ගේ හෝ සත්ත්වයින්ගේ, භවය සොයා පැමිණෙන්නන්ගේ පැවතීමට, අනුග්‍රහයට තිබේ. කවර සතරෙක්ද යත්? ගොරෝසු හෝ සියුම් වූ හෝ පිඩු වශයෙන් ගන්නා ආහාරය දෙවැන්න ස්පර්ශයයි. තෙවැන්න මනෝ සංචේතනා ආහාරයයි. සතරවැන්න විඤ්ඤාණාහාරයයි. මෙහි විරුද්ධතාවක් පෙනේද? මෙහිද විරුද්ධතාවක් නොපෙනේ. මෙම සූත්‍රයෙහි වෙනසක් නොමැතිව ආහාර ස්වභාව ඇති සියල්ල ආහාරයයි කියන ලදී. ප්‍රත්‍ය වන ආකාරයෙන් ආහාරයයි කියති. සියලු හේතුවකින් හටගත් ධර්මයන්ට ප්‍රත්‍යය ලැබිය යුතුය. යමෙක් යම් යම් ඵලයක් උපදවයිද? ඒ ඒ දෙය ගෙන එන්නේ නම් වේ. එහෙයින් ආහාරයයි කියති. එහෙයින් කියන ලදී. මහණෙනි, මම අවිද්‍යාවද ආහාර සහිතයයි වදාරමි. ආහාර නොමැතිව නොවේ. මහණෙනි, අවිද්‍යාවගේ ආහාරය කුමක්ද? පංච නීවරණයයිම කිවයුතුය. මහණෙනි, මම පංච නීවරණද ආහාරයන් සහිතයයි වදාරමි. ආහාර නොමැතිව නොවේ. මහණෙනි, පංච නීවරණයන්ගේ ආහාරය කවරේද? නුනුවණින් මෙනෙහි කිරීමයයි ඊට කිවයුතුය. මෙහි එය අදහස් කරන ලදී. මේ ප්‍රත්‍යයාහාර ගත්කල්හි ආකාරවත් ආහාරද වෙනස් නොකළ හැකි ආහාරද යන සියල්ලම ගන්නා

ලද්දේම වේ. අසඤ්ඤසත්ත භවයෙහි ප්‍රත්‍යාහාර ලැබේ. බුදුවරුන් නූපදිනා කාලයන්හි තීර්ථක අසපුවල පැවිදි වී වායොකසිණ පරිකර්මකොට චතුර්ථ ධ්‍යානය උපදවා, ඉන් නැගිට සිතට නින්දාවේවා. සිතට නින්දා වේවා. සිතෙහි අභාවයම යහපති. සිත නිසා වධ බන්ධනාදීන්ට හේතුවූ දුක් උපදියි. සිත නොමැති කල්හි එය නැතයයි සිතෙහි අභාවය පිළිබඳ කැමැත්ත රුචිය උපදවා නොපිරිහුණු ධ්‍යාන ඇත්තේ කළුරියකොට අසඤ්ඤ භවයෙහි උපදිත්. යමෙක් යම් ඉරියව්වකින් මිනිස්ලොව පිහිටා සිටියේ වූයේද? හෙතෙම ඒ ඉරියව්වෙන්ම ඉපදී කල්ප පන්සියයක් සිටියි. එතෙක් දීර්ඝ කාලයක් වැදහෝනේ හෝ හිඳගෙන හෝ සිටියේ හෝ වෙයි. මෙබඳු සත්ත්වයින්ට ප්‍රත්‍යයාහාරය ලැබෙයි. ඔවුන් විසින් යම් ධ්‍යානයක් වඩා උපන්නාහු වෙත්ද? එයම ඔවුන්ට ප්‍රත්‍යය වේ. දුන්නෙහි වේගයෙන් යවන ලද හීය, දුන්නෙහි වේගය යම්පමණ තිබේද එතෙක්යයි. එසේම ධ්‍යානයෙහි උපකාරය යම් පමණ සිටීද (තිබේද) එම වේගය නිම්කල්හි, වේගය හීන වූ හීය මෙන් වැටේ. යම් ඒ නිරයෙහි උපන් සත්ත්ව කෙනෙක් වෙත්ද ඔවුහු උත්සාහයෙන් ජීවත්වන්නෝද, පින් පලයෙන් ජීවත් වන්නෝද නොවෙති. ඔවුන්ට කවර ආහාරයක් ලැබේද? ඔවුන්ට කර්මයම ආහාරයයි. කිමෙක්ද ආහාර පසක් ඇත්ද? පහක්, පහක් නොවේයයි මෙය නොකිවයුතුය. ප්‍රත්‍යය ආහාරයයි කියන ලද්දේ නොවේද? යම් කර්මයකින් ඔවුහු නිරයෙහි උපන්නාහුද එයම ඔවුන්ට එහි සිටීමට ප්‍රත්‍ය ප්‍රත්‍යය වන හෙයින් ආහාරයි.

යමක් සඳහා මෙය කියන ලද්දේද? එම පාපකර්මය යම්තාක් කල් අවසන් වීමක් නොවේද? එතෙක් කාලක්‍රියා නොකරයි. එහෙයින් ආහාරයෙන් සිටී. ප්‍රත්‍යයෙන් සිටීයයි අර්ථයයි. පිඩුකොට ගනු ලබන ආහාරය සඳහායයි මෙහිදී විවාදයක් නොකළ යුතුය. මුඛයෙහි හටගත් කෙළද ඔවුන්ගේ අහරකිස ඉටුකරයි. කෙළ වනාහි නිරයෙහි දුක් වේදනාකාරීව ප්‍රත්‍යය වේ. ස්වර්ගයෙහි සුවවේදනාකාරීව ප්‍රත්‍යය වේ. කාම භවයෙහි වෙනස් නොකළ හැකි ආහාර සතරෙකි. රූපාරූප භවයන් අතර අසඤ්ඤ භවය හැර අනෙක් ඒවායින් තුනකි. අසඤ්ඤයන්ටද සෙස්සන්ටද ප්‍රත්‍යයාහාරයයි. මෙම ආහාරයෙන් සියලු සත්ත්වයෝ ජීවත්ව සිටිත්නුයි ආහාරට්ඨිතිකයි සබ්බෙ සත්තා යනු පුද්ගලයින් මුල්කොට පවත්වන ධර්මදේශනාවයි. සියලු සංස්කාරයන් යයි යන අදහසයි. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව ධර්ම පුද්ගල වශයෙන් සතරාකාරයි. ධර්මාධිෂ්ඨාන ධර්මදෙශනාව - ධර්මාධිෂ්ඨාන පුද්ගල

දේශනාව පුද්ගලාධිෂ්ඨාන පුද්ගල දේශනාව, පුද්ගලාධිෂ්ඨාන ධර්ම දේශනාව වශයෙනි. මහණෙනි, යමක් දියුණු කරන ලද්දේ - කර්මණ්‍ය වූයේ වෙයිද, එවැනි දෑ අතර යම් ඒ සිතක් වේද? සිත හා සම අන් එකම දැයක්වත් මම නොදකින්නෙමි. මහණෙනි, සිත දියුණු කරන ලද්දේ කර්මණ්‍ය වෙයි මෙවැනි අවස්ථා, ධර්මාධිටඨාන ධර්මදේශනා නම් වේ. 'මහණෙනි, යම් ඒ සම්‍යග් දෘෂ්ටියෙන් යුත් පුද්ගලයෙක් කිසිම සංස්කාරයක් නිත්‍ය වශයෙන් එළඹෙන්නේය යන්න කෙසේවත් සිදුවිය නොහැකිය. ඊට අවකාශයක් නැත. එවැනි කරුණක් කිසිසේත් විද්‍යමාන නොවේ. මෙවැනි අවස්ථා ධර්මාධිටඨාන පුද්ගල දේශනා නම් වේ. මහණෙනි, මේ ලෝකයෙහි එක් පුද්ගලයෙක් දෙව් මිනිසුන් සහිත බොහෝ ජනයාගේ යහපත සඳහා, බොහෝ ජනයාගේ සුවපිණිස, ලෝවැස්සාට අනුකම්පා පිණිස, වැඩපිණිස, හිතසුව පිණිස උපදිනු ලබන්නේ උපදියි. මෙවැනි අවස්ථා පුද්ගලාධිෂ්ඨාන පුද්ගල දේශනා නම් වේ. මහණෙනි, එක් පුද්ගලයෙකුගේ පහළවීම බොහෝ නැණැස්හි පහළවීම වේ. මෙවැනි අවස්ථා පුද්ගලාධිෂ්ඨාන ධර්මදේශනා නම් වේ. ඒවා අතර මෙහි පුද්ගලාධිෂ්ඨාන ධර්මදේශනායි. මත්තෙහි දශකය දක්වා ධර්මයන්ගෙන්ම ගත් බැවින් සත්ත්ව ග්‍රහණයෙන් ධර්මග්‍රහණය කරන ලදැයි දතයුතුය. විශේෂයෙන් සත්ත්ව සන්තානයෙහි ඇතුළත් වූ ධර්මයන්ම අධික ඥාණ තත්ත්වයකින් විශේෂයෙන් පරීක්ෂා කළයුතු හෙයින් සත්ත්ව ග්‍රහණය කරන ලදැයි දතයුතුය. සංස්කාරයන් සැලකිල්ලට ගෙන සත්ත්වයැයි ප්‍රඥප්ති මාත්‍රයක් ලැබෙන හෙයින් සමීප ඵලය වශයෙන් සංස්කාර, සත්ත්වයැයි කියන ලදැයි දතයුතුය. කිසිම සත්ත්වයෙක් සංස්කාරයන්ගෙන් තොරව ප්‍රත්‍යයෙන් සිටියෙක් නැත. ව්‍යවහාර වශයෙන් මෙසේ කියයි. මෙසේ මෙයින් ඥාත පරිඥඥාව කියන ලදී.

දෙව ධාතුයො යනු සංඛත හා අසංඛත ධාතුය. එහි නොයෙක් හේතූන් සංයෝග වී කරන ලද පංචස්කන්ධය සංඛත ධාතුයි. කිසිදු හේතුවකින් නොකරන ලද නිර්වාණ ධාතුව අසංඛත ධාතුයි. තිසෙසා ධාතුයො යනු කාමධාතු, රූපධාතු, අරූපධාතුයි. එහි කාමධාතුව කවරේද? යටින් අවීචි මහනිරය කෙළවරකොට, උඩින් පරනිර්මිත දෙව්ලොව ඇතුළත් කොට මේ අතරතුර, මෙහි හැසිරෙන, මෙහි ඇතුළත්, ස්කන්ධ ධාතු, ආයතන, රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥඥාණ යන සියල්ල කාමධාතු නම් වේ. එහි රූපධාතුව කවරේද? යටින් බඹලොව කෙළවරකොට උඩින් අකනිටා දෙවියන් ඇතුළත්කොට මේ අතරතුර,

මෙහි හැසිරෙන, මෙහි ඇතුළත්, සමවතට සමවත් හෝ උපන් හෝ ඉහාත්ම සුවයෙන් වාසය කරන්නහුගේ චිත්ත චෛතසික ධර්මයෝය. මෙය රූපධාතුවයයි කියයි. එහි අරූපධාතුව කවරේද? යටින් ආකාසානඤ්චායතනය ඇතුළත්වූ දෙවියන් කෙළවරකොට, උඩින් නේවසඤ්ඤා නාසඤ්ඤායතනයට ඇතුළත් දෙවියන් ඇතුළත්කොට මේ අතරතුර, මෙහි හැසිරෙන, මෙහි ඇතුළත්, සමවතට සමවත් හෝ උපන්නෝ ඉහාත්ම සුව විහරණයෙහි යෙදී සිටින්නහුගේ චිත්ත චෛතසික ධර්මයි. මෙය අරූප ධාතුවයි. අටුවාවන්හි වනාහි කාමධාතු යනු කාමභවයයි. පංචස්කන්ධයන් ලබත්. රූපධාතු යනු රූපභවයයි. පංචස්කන්ධයන් ලබත්. අරූප ධාතු යනු අරූප භවයයි. ස්කන්ධ සතරක් ලබත්යයි කියයි. සංගීති ක්‍රමයෙන් කුසලධාතු ත්‍රයයකි. නෛෂ්ක්‍රම්‍ය ධාතුව, අව්‍යාපාද ධාතුව, අවිහිංසා ධාතුව, වෙනත් ධාතු ත්‍රයයකි. රූප ධාතුව, අරූප ධාතුව, නිරෝධ ධාතුව, වෙනත් ධාතු ත්‍රයයකි. හීන ධාතුව (පහත්) මධ්‍යම ධාතුව, ප්‍රණීත (උසස්) ධාතුව. නෛෂ්ක්‍රම්‍යය හා යෙදුණු තර්කය, විතර්කය -පෙ- සම්‍යක් සංකල්පයක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍ය ධාතුයි. සියලු කුසල්දම් නෛෂ්ක්‍රම්‍ය ධාතුවයි. අව්‍යාපාදය හා යෙදුණු තර්කය. විතර්කය -පෙ- සම්‍යක් සංකල්පයක් වෙද, එය අව්‍යාපාද ධාතුවයි. සත්ත්වයින් කෙරෙහි පවත්නා යම් මෛත්‍රියක වේද, මෛත්‍රී කිරීමක් වේද, මෛත්‍රී කිරීමේ ස්වභාවයක් වේද, මෙය මෛත්‍රී චෙතොවිමුත්තියයි (සිත නිදහස් වීම) අවිහිංසාව හා යෙදුණු තර්කයක්, විතර්කයක් -පෙ- සම්‍යක් සංකල්පයක් වේද, එය අවිහිංසා ධාතුවයි. සත්ත්වයින් කෙරෙහි පවත්නා යම් කරුණාවක්, කරුණා කිරීමක්, කරුණා පැවැත්වීමක් වේද එය කරුණා චෙතො විමුත්තියයි. මෙය අවිහිංසා ධාතුවයි. රූපාරූප ධාතු කියන ලද්දේමය. නිර්වාණය නිරෝධ ධාතුවයි. දොළොස් අකුසල් සිත්හි ඉපදීම හීනධාතුයි. සෙසු ත්‍රෛභූමික ධර්ම මධ්‍යම ධාතුයි. නවලොවුතුරු දම් ප්‍රණීත ධාතුයි. සියල්ලම අජ්ඣාර්ථයෙන් ධර්ම නම් වේ.

**චත්තාරි අරියසච්චානි** යනු දුකඛාර්ය සත්‍යය - දුක්ඛ සමුදයාර්ථ සත්‍යය, දුක්ඛ නිරෝධාර්ය සත්‍යය, දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාර්ය සත්‍යයි. මේවාහි වර්ණනාව සත්‍ය විස්තර කිරීමෙහිම වන්නේය. **පඤ්ච විමුත්තායතනානීති** යනු තමාගේ හිතසුව සඳහා අනුන් විසින් පවත්වන දම්දෙසීම් ශ්‍රවණය කිරීම, අනුන්ගේ හිතසුව සඳහා තමා විසින් ඇසූ ධර්මය දේශනා කිරීම, ඇසූ ධර්මය ඒ අනුව සජ්ඣායනා කිරීම (කීම) ඇසූ ධර්මය සිතින් නැවත නැවත කල්පනා කිරීම. කසිණ අසුභාදි සුදුසු

අරමුණු ගැනීම, මේ කරුණු පස සසරින් මිදීමට හේතුවෙයි. ධර්මය දැනගත්තේද වේ. දෙසූ පරිදි මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවට ශාස්තෘන් වහන්සේ හෝ වෙනත් ගුරු තත්වයේ සබ්‍රම්සර තෙර කෙනෙකුන් හෝ ධර්මය දේශනා කෙරේද? මහණෙනි, ඒ භික්ෂුවට යම් යම් ආකාරයකින් ශාස්තෘන් වහන්සේ හෝ ගුරු තත්වයේ සබ්‍රම්සර තෙර හෝ ධර්මය දේශනා කෙරේද? එ ඒ අයුරින් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථ අවබෝධ කරන්නේද වේ. ධර්ම කරුණු අවබෝධ කරන්නේද වේ. අර්ථ අවබෝධ කරන්නා වූද, ධර්ම කරුණු අවබෝධ කරන්නා වූද ඔහුට ප්‍රමෝදය හටගනී. ප්‍රමෝද වූවහුට ප්‍රීතිය හටගනී. ප්‍රීතිය ඇති ඔහුගේ ශරීරය සන්සුන් වෙයි. සන්සුන් සිරුරු ඇත්තේ සුව විඳියි. සුවපත් වූවහුගේ සිත සමාධිගත වෙයි. මේ පළමු විමුක්තියට හේතුවන කරුණයි. නැවතද මහණෙනි, ඒ භික්ෂුවට ශාස්තෘන් වහන්සේ හෝ වෙනත් ගුරු තත්වයේ සබ්‍රම්සර තෙර කෙනෙකුන් ධර්මය දේශනා නොකරයි. නමුත් අසන ලද පරිද්දෙන් උගත් අයුරින් විස්තර වශයෙන් අනුන්ට ධර්මය දේශනා කරයි. මහණෙනි, ඒ භික්ෂුවට යම් යම් පරිද්දෙන් -පෙ- සුවපත් වූයේ, සිත සමාධිගත වේ. මේ දෙවන විමුක්තියට හේතුවන කරුණයි. නැවතද මහණෙනි, ඒ භික්ෂුවට ශාස්තෘන් වහන්සේ හෝ වෙනත් ගුරු තත්වයේ සබ්‍රම්සර තෙර කෙනෙකු ධර්මය දේශනා නොකරයි. අසන ලද පරිද්දෙන්, උගත් පරිද්දෙනී අනුන්ට විස්තර වශයෙන් ධර්මය දේශනා නොකරයි. එසේද වුවත්, අසන ලද පරිදි උගත් පරිදි ධර්මය විස්තර වශයෙන් ධර්මය සජ්ඣායනා (කියවීම) කරයි. මහණෙනි, යම් යම් පරිද්දෙන් ඒ භික්ෂුවට -පෙ- සුවපත් වූවහුගේ සිත සමාධිගත වෙයි. මේ තුන්වන විමුක්තියට හේතුවන කරුණයි. මහණෙනි, නැවතද භික්ෂුවට ශාස්තෘන් වහන්සේ හෝ අන්‍ය සබ්‍රම්සර තෙර කෙනෙකු ධර්මය දේශනා නොකරති. අසන ලද පරිදි, උගත් පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට ධර්මය දේශනා නොකරයි. අසන ලද පරිදි, උගත් පරිදි ධර්මය විස්තර වශයෙන් සජ්ඣායනා නොකරයි. එසේ වූයේ වී නමුත් සිතින් ධර්මය මෙනෙහි කරයි. සිතා බලයි. සිතින් විශේෂයෙන් බලයි. මහණෙනි, ඒ භික්ෂුවට යම් යම් පරිද්දෙකින් -පෙ- සුවපත් වූවහුගේ සිත සමාධිගත වේ. මේ සතරවන මිදීමේ කරුණයි. නැවතද මහණෙනි, භික්ෂුවට ශාස්තෘන් වහන්සේ හෝ අන්‍ය ගුරුතන්හිලා සලාකන සබ්‍රම්සර තෙර කෙනෙකු හෝ ධර්මය දේශනා නොකරත්. අසන ලද පරිදි උගත් පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දේශනා නොකරයි. අසන ලද පරිදි උගත් පරිදි ධර්මය විස්තර වශයෙන් සජ්ඣායනා නොකරයි. අසන ලද පරිදි, උගත්

පරිදි ධර්මය සිතින් මෙනෙහි නොකරයි. සිතින් සිතා නොබලයි. සිතින් විශේෂයෙන් නොබලයි. එසේද වුවත් එක්තරා සමාධියට හේතුවන කරුණක් නුවණින් මනාව ගන්නා ලද්දේ, මනාව මෙනෙහි කරන ලද්දේ වෙයි. මහණෙනි, ඒ භික්ෂුවට යම් යම් අයුරකින් එක්තරා සමාධියට හේතුවන කරුණක්, නුවණින් මනාව ගන්නා ලද්දේ, මනාව මෙනෙහි කරන ලද්දේ, මනාව සිත්හි දරාගන්නා ලද්දේ, මනාව අවබෝධ කරන ලද්දේ වෙයි. ඒ ඒ අයුරින් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථ අවබෝධ කරන්නේද, ධර්මය අවබෝධ කරන්නේද වේ. අර්ථය අවබෝධ කරන්නා වූද, ධර්මය අවබෝධ කරන්නා වූද ඔහුට ප්‍රමෝදය හටගනී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය හටගනී. ප්‍රීතිය ඇතියහුගේ සිත සන්සුන් වේ. සන්සුන් ශරීර ඇත්තේ සුවවිඳියි. සුවපත් වූවහුගේ සිත සමාධිගත වේ. මේ පස්වන මිදීමේ කරුණයි.

ඡ අනුත්තරියානී යන මෙහි ඒවාට වඩා ශ්‍රේෂ්ඨ වූවක් නැත්තේනුයි අනුත්තර නම් වේ. ඉතා ශ්‍රේෂ්ඨ වූයේම=අනුත්තරානි නම්. ප්‍රධානීහුය යන අර්ථයි. භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. මහණෙනි, මේ ශ්‍රේෂ්ඨතා සයකි. කවර සයෙක්ද යත්? දැකීමේ ශ්‍රේෂ්ඨතාව, ශ්‍රවණයෙහි ශ්‍රේෂ්ඨතාව, ලාභයෙහි ශ්‍රේෂ්ඨතාව, පුහුණුවේ ශ්‍රේෂ්ඨතාව, සේවය කිරීමේ ශ්‍රේෂ්ඨතාව, සිහිකිරීමේ ශ්‍රේෂ්ඨතාව යන සයයි. මහණෙනි, දැකීමේ ශ්‍රේෂ්ඨතාව කවරේද?

මහණෙනි, මෙලොව ඇතැමෙක් හස්තිරත්නයද දැකීමට යයි. අශ්ව රත්නයද දැකීමට යයි. මැණික් රත්නයද දැකීමට යයි. උසස් පහත් නොයෙක් දේ දැකීමට යයි. වැරදි මගට පිළිපන්, වැරදි දෘෂ්ටි ගත් මහණ බමුණන් දැකීමට යයි. මහණෙනි, එහි දර්ශනයක් තිබේද? එය දර්ශනයක් නොවේ. දර්ශනයක් නැතැයි වදාරමි. මහණෙනි, ඒ දර්ශනය වනාහි පහත්ය. ග්‍රාම්‍යය. පෘථග්ජනයන්ට අයත්ය. අනාර්යය. අවැඩ පිණිස පවතී. කලකිරීම සඳහා නොපවතී. විරාගය සඳහා නොපවතී. විශිෂ්ට ඥානය සඳහා නොපවතී. අවබෝධය සඳහා නොපවතී. නිවන සඳහා නොපවතී. මහණෙනි, යම්කිසිවෙක්, පිහිටුවා ගත් ශ්‍රද්ධා ඇති, පිහිටුවා ගත් භක්තිය ඇති, ඒකාන්ත නිශ්චයට ගිය (මනා ප්‍රසන්නතාවකින් යුත්) තථාගතයන් වහන්සේ නමක් හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේ නමක් හෝ දැක්මට යේද? මහණෙනි, මෙය දර්ශනයන් අතර උසස්ය. සත්ත්වයින්ගේ පිරිසිදු බව සඳහා සෝක වැළපීම් ඉක්මවීම් සඳහා, දුක් දොම්නස් විනාශ කිරීමට,

සත්‍ය මාර්ග අවබෝධය සඳහා නිර්වාණය සාක්ෂාත් කිරීම පිණිස පවතී. පිහිටුවා ගත් ශ්‍රද්ධාව ඇති, පිහිටුවා ගත් භක්තිය ඇති, ඒකාන්ත නිශ්චයට ගිය, මනා ප්‍රසන්නතාවකින් යුත් යම් ඒ තථාගතයන් වහන්සේ නමක් හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේ නමක් දැක්මට යේද? මහණෙනි, මෙය දස්සනානුත්තරිය යයි කියයි. මෙසේ දස්සනානුත්තරියයි.

ශ්‍රවණානුත්තරිය කෙසේ වේද? මහණෙනි, මෙලොව ඇතැමෙක් බෙර ශබ්දය ඇසීමටද යයි. වීණා ශබ්දය ඇසීමටද යයි. ගීත ශබ්දය ඇසීමටද යයි. උසස් පහත් නොයෙක් දෑ ඇසීමට යයි. වැරදි දෘෂ්ටි ඇති වැරදි මාර්ගයට පිළිපන් ශ්‍රමණයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ හෝ දහම් ශ්‍රවණයට යයි. මහණෙනි, එහි ශ්‍රවණයක් තිබේද? එය ශ්‍රවණයක් නොවේ. එහි ශ්‍රවණයක් නැතැයි වදාරමි. මහණෙනි, එම ශ්‍රවණය හීනය. -පෙ- නිර්වාණය සඳහා නොපවතී. මහණෙනි, යම් කිසිවෙක්, පිහිටුවා ගත් ශ්‍රද්ධා ඇති, පිහිටුවාගත් භක්තිය ඇති, ඒකාන්ත නිශ්චයට ගිය මනා ප්‍රසන්නතාවකින් යුත්, තථාගතයන් වහන්සේ නමකගේ හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේ නමකගේ හෝ ධර්ම ශ්‍රවණයට යේද? මහණෙනි, මෙය ශ්‍රවණයන් අතර උසස්ය. සත්ත්වයින්ගේ පිරිසිදු බව සඳහා -පෙ- නිර්වාණය සාක්ෂාත් කිරීම පිණිස පවතී. පිහිටුවාගත් ශ්‍රද්ධාව ඇති, පිහිටුවා ගත් භක්තිය ඇති, ඒකාන්ත නිශ්චයට ගිය, මනා ප්‍රසන්නතාවකින් යුත්, යම් ඒ තථාගතයන් වහන්සේ නමකගේ හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේ නමකගේ ධර්මශ්‍රවණයට යේද, මහණෙනි, මෙය ශ්‍රවණානුත්තරිය යයි කියනු ලැබේ. දර්ශනානුත්තරිය, ශ්‍රවණානුත්තරිය මෙසේය.

ලාභානුත්තරිය කෙසේ වේද? මහණෙනි, මෙලොව ඇතැමෙක් පුත්‍රලාභද ලබයි. භාර්යා ලාභද ලබයි. ධනලාභද ලබයි. උසස් පහත් නොයෙක් ලාභද ලබයි. වැරදි දෘෂ්ටි ගත, වැරදි මාර්ගයට පිළිපන් මහණ බමුණන් කෙරෙහි ශ්‍රද්ධාව ලබයි. මහණෙනි, එහි ලාභයක් තිබේද? එය ලාභයක් නොවේ. එහි ලාභයක් නැතැයි වදාරමි. මහණෙනි, එම ලාභය හීනය. -පෙ- නිර්වාණය සඳහා නොපවතී. මහණෙනි, යම්කිසිවෙක් පිහිටුවාගත් ශ්‍රද්ධාව ඇති, පිහිටුවාගත් භක්තිය ඇති, ඒකාන්ත නිශ්චයට ගිය, මනා ප්‍රසන්නතාවකින් යුත් තථාගතයන් වහන්සේ කෙරෙහි හෝ තථාගත ශ්‍රාවකයාණන් වහන්සේ නමක් කෙරෙහි හෝ ශ්‍රද්ධාව ලබයිද? මහණෙනි, මෙය ලාභයන් අතර උසස්ය. සත්ත්වයින්ගේ පිරිසිදු බව සඳහා -පෙ- නිර්වාණය සාක්ෂාත් කිරීම සඳහා පවතී. පිහිටුවාගත් ශ්‍රද්ධාව

ඇති, පිහිටුවාගත් භක්තිය ඇති, ඒකාන්ත නිශ්චයට ගිය, මනා ප්‍රසන්නතාවකින් යුත්, තථාගතයන් වහන්සේ නමක් කෙරෙහි හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේ නමක් කෙරෙහි ශ්‍රද්ධාවක් ලබයිද? මහණෙනි, මෙය ලාභානුත්තරියයයි කියයි. මෙසේ දස්සනානුත්තරිය, ශ්‍රවණානුත්තරිය ලාභානුත්තරිය වේ.

ශික්ෂානුත්තරිය කෙසේ වේද? මහණෙනි, මෙලොව ඇතමෙක් හස්ති ශිල්පයෙහිද පුහුණු වෙයි. අශ්ව ශිල්පයෙහිද පුහුණු වෙයි. රථ ශිල්පයෙහිද පුහුණු වෙයි. දුනු ශිල්පයෙහිද පුහුණු වෙයි. කඩු මිටි ශිල්පයෙහිද පුහුණු වෙයි. උසස් පහත් නොයෙක් ශිල්පයන්හි පුහුණු වෙයි. වැරදි දෘෂ්ටි ඇති, වැරදි මාර්ගයට පිළිපන් ශ්‍රමණයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ ශිල්ප ඉගෙන ගනී මහණෙනි එහි පුහුණුවක් තිබේද? එය පුහුණුවක් නොවේ. එහි පුහුණුවක් නැතැයි වදාරමි. මහණෙනි, එම පුහුණුව හීනය -පෙ- නිර්වාණය සඳහා නොපවතී. මහණෙනි, යම්කිසිවෙක් පිහිටුවාගත් ශ්‍රද්ධා ඇති පිහිටුවාගත් භක්තිය ඇති, ඒකාන්ත නිශ්චයට ගිය, මනා ප්‍රසන්නතාවකින් යුත් තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද, ධර්ම විනයෙහි ඇතුළත් අධිසීලයෙහි පුහුණු වේද? අධි චිත්තයෙහි පුහුණු වේද? අධි ප්‍රඥාවෙහි පුහුණු වේද? මහණෙනි, මෙය පුහුණුවීම් අතර උසස්ය. සත්ත්වයින්ගේ පිරිසිදු බව සඳහා -පෙ- නිර්වාණය සාක්ෂාත් කිරීම සඳහා පවතී. පිහිටුවාගත් ශ්‍රද්ධාව ඇති, පිහිටුවාගත් භක්තිය ඇති ඒකාන්ත නිශ්චයට ගිය, මනා ප්‍රසන්නතාවයකින් යුත්, යම් ඒ තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද ධර්ම විනයෙහි ඇතුළත් අධි සීලයෙහි පුහුණු වේද, අධි චිත්තයෙහි පුහුණු වේද, අධි ප්‍රඥාවෙහි පුහුණු වේද? මහණෙනි, මෙය ශික්ෂානුත්තරිය යයි කියනු ලැබේ. දර්ශනානුත්තරිය, ශ්‍රවණානුත්තරිය, ලාභානුත්තරිය, ශික්ෂානුත්තරිය මෙසේය.

පාරිචරියානුත්තරිය කෙසේ වේද? මහණෙනි, මෙලොව ඇතමෙක් ක්ෂත්‍රියයන්ටද සේවය කරයි. බ්‍රාහ්මණයන්ටද සේවය කරයි. ගෘහපතීන්ටද සේවය කරයි. උසස් පහත් නොයෙක් අයට සේවය කරයි. වැරදි දෘෂ්ටි ඇති, වැරදි මාර්ගයට පිළිපන් ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට සේවය කරයි. මහණෙනි, මෙහි සේවයක් තිබේද? එය සේවයක් නොවේ. සේවයක් නැතැයි වදාරමි. මහණෙනි, ඒ සේවය කිරීම හීනය. -පෙ- නිර්වාණය සඳහා නොපවතී. මහණෙනි, යම් කිසිවෙක්, පිහිටුවාගත් ශ්‍රද්ධාව ඇති, පිහිටුවාගත් භක්තිය ඇති, ඒකාන්ත නිශ්චයට ගිය මනා ප්‍රසන්නතාවකින්

යුත් තථාගතයන් වහන්සේට හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේට හෝ සේවය කරයිද? මහණෙනි, සේවය කිරීම් අතර එය ශ්‍රේෂ්ඨය. සත්ත්වයින්ගේ පිරිසිදු බව සඳහා -පෙ- නිර්වාණය සාක්ෂාත් කිරීම සඳහා පවතී. පිහිටුවාගත් ශ්‍රද්ධාව ඇති, පිහිටුවාගත් භක්තිය ඇති ඒකාන්ත නිශ්චයට ගිය මනා ප්‍රසන්නතාවකින් යුත් යම් ඒ තථාගතයන් වහන්සේට හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේ නමකට සේවය කරයිද? මහණෙනි, මෙය පාරිචරියානුත්තරියයි. දස්සනානුත්තරිය, සවණානුත්තරිය, ලාභානුත්තරිය, සික්ඛානුත්තරිය, පාරිචරියානුත්තරිය මෙසේය.

අනුස්සතානුත්තරිය කෙසේ වේද? මහණෙනි, මෙලොව ඇතමෙක් පුත්‍ර ලාභයද සිහිකරයි. භාර්යා ලාභයද සිහිකරයි. ධන ලාභයද සිහිකරයි. උසස් පහත් නොයෙක් දේ සිහිකරයි. වැරදි දෘෂ්ටි ගත්, වැරදි මාර්ගයට පිළිපන් ශ්‍රමණයකු බ්‍රාහ්මණයකු සිහිකරයි. මහණෙනි, මෙහි සිහිකිරීමක් තිබේද? සිහිකිරීමක් නොවේ. සිහිකිරීමක් නැතැයි වදාරමි. මහණෙනි, එම සිහිකිරීම හීනය. -පෙ- නිර්වාණය පිණිස නොපවතී. මහණෙනි, යම් කිසිවෙක් පිහිටුවාගත් ශ්‍රද්ධාව ඇති, පිහිටුවාගත් භක්තිය ඇති, ඒකාන්ත නිශ්චයට ගිය මනා ප්‍රසන්නතාවකින් යුත් තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේ නමක් සිහිකරයිද? මහණෙනි, සිහිකිරීම් අතර එය ශ්‍රේෂ්ඨය. සත්ත්වයින්ගේ පිරිසිදු බව සඳහා -පෙ- නිර්වාණය සාක්ෂාත් කිරීම සඳහා පවතී. පිහිටුවාගත් ශ්‍රද්ධාව ඇති, පිහිටුවාගත් භක්තිය ඇති, ඒකාන්ත නිශ්චයට ගිය, මනා ප්‍රසන්නතාවකින් යුත්, තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේ නමක් සිහිකරයිද? මහණෙනි, මේ අනුස්සතානුත්තරියයි. මහණෙනි, මේ ෂට් ශ්‍රේෂ්ඨතාවයන්ය.

**සතත නිද්දසවත්‍ථුනි** යන මෙහි මෙයට දසාවක් නැත්තේනුයි නිද්දසො නම් වේ. නිර්දසාවට නිර්දසාභාවයට වස්තු වූයේ නුයි හේතු වූයේනුයි නිද්දසිවත්‍ථුනි නම් වේ. ක්ෂීණාශ්‍රවයන් වහන්සේ නමක් දසවස් වයස් සීමාවේ පිරිනිවියහොත් නැවත ප්‍රතිසන්ධියගේ නොවීම වන හෙයින්, නැවත දසවර්ෂයක් නොවේනුයි නිද්දස යයි කියයි. හුදෙක් දස වර්ෂයම නොවේ. නව වර්ෂයද, -පෙ- එක් මොහොතකින්ද නොවන්නේමය. හුදෙක් දසවස් කාලයෙහි පිරිනිවන්පෑවේ නොවේ. සත්වන වියෙහි පිරිනිවියේද ආත්මයක් නොමැත්තේ නිද්දස වූයේ මොහොතක් පමණද නොලබන්නේ ප්‍රතිසන්ධියක් නොලබන්නේය. තීර්ථක සමයයන්හි

හටගත් ව්‍යවහාරයක් සස්නෙහි ක්ෂීණාශ්‍රවයන්ට ආරෝපණය කොට, එහි එවැනි දැයෙහි අභාවයත්, මෙ සස්නෙහි හටගනීයයි දක්වන්නේ, බුදුරදහු එබඳු කාරණයන්ට හේතුවූ නිද්දස වත්‍ථු සතක් වදාළහ. මහණෙනි, මේ නිද්දස වස්තු සතෙකි. කවර සතක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්‍ෂුව ශික්‍ෂා සමාදන්වීමෙහි තියුණු කැමැත්තක් ඇත්තේ වේද, මත්තෙහිද ශික්‍ෂා සමාදානයෙහි පහනොවූ ප්‍රේමයක් ඇත්තේ වේද ධර්මානුගතික වීමෙහි තියුණු කැමැත්තක් ඇත්තේ වේද, මත්තෙහිද ධර්මානුගතික වීමෙහි පහ නොවූ ප්‍රේමයක් ඇත්තේ වේද, මත්තෙහිද තෘෂ්ණාව යටපත් කිරීමෙහි පහනොවූ ප්‍රේමයක් ඇත්තේ වේද, විවේකයෙහි තියුණු කැමැත්තක් ඇත්තේ වේද, මත්තෙහිද විවේකයෙහි පහනොවූ ප්‍රේමයක් ඇත්තේ වේද, උත්සාහය ඇරඹීමෙහි තියුණු කැමැත්තක් ඇත්තේ වේද, මත්තෙහිද උත්සාහය ඇරඹීමෙහි පහනොවූ ප්‍රේමයක් ඇත්තේ වේද, සිහිනුවණෙහි තියුණු කැමැත්තක් ඇත්තේ වේද, මත්තෙහිද සිහිනුවණෙහි පහනොවූ ප්‍රේමයක් ඇත්තේ වේද, දෘෂ්ටි අවබෝධයෙහි තියුණු කැමැත්තක් වේද, මත්තෙහිද දෘෂ්ටි අවබෝධයෙහි පහනොවූ ප්‍රේමයක් ඇත්තේ වේද, මහණෙනි මේවා සප්ත නිද්දස වත්‍ථුනම් වේ. තෙරහුද එසේම දේශනාව උපුටා සප්ත නිද්දස වත්‍ථුයයි කීහ. අට්ඨ **අභිභායතනානි** යන මෙහි මැඩපවත්වනු ලබන කරුණු ඒ ධ්‍යානයන්ටනුයි = අභිභායතනයි- ධ්‍යානයෝය. ආයතන යනු අධිෂ්ඨාන කිරීමේ අර්ථයෙන් ආයතනයයි කියනු ලබන කසිණාරම්මණයෝය. ඥාණයෙන් උසස්, පිරිසිදු නුවණක් ඇති පුද්ගලයා මෙම අරමුණුවල සමවැදීමෙන් කවර ප්‍රයෝජනයක්ද? සිත එකඟ කිරීමෙහිලා මට බරක් නැතැයි එම අරමුණු මැඩපවත්වා සමවදියි. නිමිත්ත උපදිනවාත් සමගම අර්පණාව උපදවයි යන අර්ථයි. මෙසේ උපදවන ලද ධ්‍යානයන් අභිභායතනයයි කියති. කවර අටෙක්ද?

ආධ්‍යත්ම රූප සඤ්ඤාවෙන් හුදෙකලා වූයේ, බාහිරව මනා පැහැයෙන් හා දුර්වර්ණයෙන් යුත් රූප ස්වල්පයක් දකියි. ඒවා මැඩපවත්වා දනිමි. දකිමියි මෙසේ සංඥාවක් වේ. මේ පළමු අභිභායතනයයි.

ආධ්‍යාත්ම රූප සඤ්ඤාවෙන් හුදෙකලා වූයේ, බාහිරව මනා පැහැයෙන් හා දුර්වර්ණයෙන් යුත් රූප ප්‍රමාණ රහිතව දකියි. ඒවා මැඩපවත්වා දනිමි. දකිමියි මෙසේ සංඥාවක් වේ. මේ දෙවන අභිභායතනයයි.

අධ්‍යාත්ම අරූප සඤ්ඤාවෙන් හුදෙකලා වූයේ බාහිරව මනා පැහැයෙන් හා දුර්වර්ණයෙන් යුත් රූප ස්වල්පයක් දකියි. ඒවා මැඩපවත්වා දනිමි. දකිමියි මෙසේ සංඥාවක් වේ. මේ තෙවන අභිභායතනයයි.

අධ්‍යාත්ම අරූප සඤ්ඤාවෙන් හුදෙකලා වූයේ බාහිරව මනා පැහැයෙන් හා දුර්වර්ණයෙන් යුත් රූප ප්‍රමාණ රහිතව දකියි. ඒවා මැඩපවත්වා දනිමි. දකිමියි මෙසේ සංඥාවක් වේ. මේ සිවුවන අභිභායතනයයි.

අධ්‍යාත්ම අරූප සංඥාවෙන් හුදෙකලා වූයේ, බාහිරව නිල්වූ, නිල්වන්, නිල් පෙනුමින් යුත්, නිලෙන් බබලන රූප දකියි. යම්සේ නම් උම්මා පුෂ්පය, නිල්වූ, නිල්වන්, නිල් පෙනුමින් යුත්, නිලෙන් බබලයිද, යම්සේ නම් බරණැසෙහිම නිපදවූ, එම වස්ත්‍රය, දෙපැත්තම මටසිලිටු වේද, නිල්ය. නිල්වන්ය. නිල්පැහැයෙන් යුක්තය. නිලෙන් බබලයිද එපරිද්දෙන් අධ්‍යාත්ම අරූප සංඥාවෙන් හුදෙකලා වූයේ බාහිරව නිල් වූ, නිල්වන්, නිල් පෙනුමින් යුත් නිලෙන් බබලන රූපයන් දකියි. ඒවා මැඩ පවත්වා දනිමි. දකිමියි මෙසේ සංඥාවක් වෙයි. මේ පස්වන අභිභායතනයයි.

අධ්‍යාත්ම අරූප සංඥාවෙන් හුදෙකලා වූයේ, බාහිරව කහවූ, කහවන්, කහපෙනුමින් යුත්, කහපැහැයෙන් බබලන රූපයන් දකියි. යම්සේ නම් කිණිහිරි මල කහවූයේ, කහවර්ණ වූයේ කහපෙනුමින් යුක්ත වූයේ, කහ පැහැයෙන් බබලන්නේ වේද, යම්සේ නම් බරණැසෙහිම නිපදවූ, එම වස්ත්‍රය දෙපැත්තම මටසිළිටු වෙයිද, කහපැහැ වූ, කහවන් වූ, කහපෙනුමින් යුත් කහපැහැයෙන් බබලයිද? එපරිද්දෙන් අධ්‍යාත්ම අරූප සංඥාවෙන් හුදෙකලා වූයේ, බාහිරව, කහවූ, කහවන් කහ පෙනුමින් යුත්, කහ පැහැයෙන් බබලන රූපයන් දකියි. ඒවා මැඩපවත්වා දනිමි. දකිමියි මෙසේ සංඥාවක් වෙයි. මේ සවන අභිභායතනයයි.

අධ්‍යාත්ම අරූප සංඥාවෙන් හුදෙකලා වූයේ, බාහිරව රතු වූ, රතුවන්, රතු පෙනුමින් යුත්, රතෙන් බබලන රූප දකියි. යම්සේ නම් බඳු වදමල, රතුවූයේ, රතුවන් වූයේ, රතු පෙනුමින් යුතුව රතෙන් බබලයිද, යම්සේ නම් බරණැසෙහිම නිපදවූ එම වස්ත්‍රය දෙපැත්තම මටසිළිටු වෙයිද, රතුවූ, රතුවන් වූ, රතු පෙනුමින් යුත්, රතුපැහැයෙන් බබලයිද, එපරිද්දෙන් අධ්‍යාත්ම අරූප සංඥාවෙන් හුදෙකලා වූයේ, බාහිරව රතුවූ,

රතුවන් වූ, රතු පෙනුමින් යුත් රතු පැහැයෙන් බබලන රූපයන් දකියි. ඒවා මැඩපවත්වා දනිමි. දකිමියි මෙසේ සංඥාවක් වෙයි. මේ සත්වන අභිභායතනයයි.

අධ්‍යාත්ම අරූප සංඥාවෙන් හුදෙකලා වූයේ, බාහිරව සුදු වූ සුදුවන්, සුදු පෙනුමින් යුත්, සුදුපැහැයෙන් බබලන රූපයන් දකියි. යම්සේ නම් ඕෂධී තාරකාව, සුදුවූ, සුදුවන් සුදු පෙනුමින් යුත්, සුදු පැහැයෙන් බබලන්නේ වේද? යම්සේ නම් බරණැසෙහිම නිපදවූ එම වස්ත්‍රය දෙපැත්තම මටසිළුටු වූයේ වෙයිද? සුදු වූ, සුදුවන්, සුදු පෙනුමින් යුත්, සුදු පැහැයෙන් බබලන්නේ වේද, එපරිද්දෙන් ආධ්‍යාත්ම අරූප සංඥාවෙන් හුදෙකලා වූයේ බාහිරව සුදු වූ, සුදුවන් සුදු පෙනුමින් යුත්, සුදුපැහැයෙන් බබලන රූපයන් දකියි. ඒවා මැඩපවත්වා, දනිමි. දකිමියි මෙසේ සංඥාවක් වෙයි. මේ අටවන අභිභායතනයයි. මෙම අට අභිභායතනයි. **නව අනුපුබ්බ** විහාරා යනු පූර්ව පූර්ව අනුව ගියේ අනුපූර්වයි. අනුපිළිවෙළින් වාසය කළ යුතු වූද, සමවැදිය යුතු වූද විසීම් අනුපූර්ව විහරණයි. අනුපිළිවෙළින් සමවැදිය යුතු විහරණ යයි යන අර්ථයි. කවර නවයෙක්ද? මහණෙනි, මේ සස්නෙහි භික්ෂුව කාමයන්ගෙන් වෙන්වම, අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය සහිත ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්ම සංසිඳීම, සිතෙහි එකඟ බව ඇතිකරන විතර්ක රහිත, විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතියගේද, දුරුකිරීමෙන් උපේක්ෂකව වාසය කෙරෙයි. ප්‍රීතිය හා මනා නුවණින් යුක්තව කයින් සුව විඳියි. යම් ඒ ආර්ය කෙනෙක් මොහු උපේක්ෂාවෙන් යුත් සිහි ඇති සුවයෙන් වාසය කරන්නෙකියි ප්‍රකාශ කෙරෙත්ද? එබඳු වූ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපයෙහි ප්‍රහාණයෙන්ද, දුකෙහි ප්‍රහාණයෙන්ද, මුලදීම සොම්නස් දොම්නස් විනාශ කිරීමෙන්ද, දුක්නොවූද, සැප නොවූද, මධ්‍යස්ථභාවය සිහියගේ පිරිසිදුබව හා යෙදුණු චතුර්ථ ධ්‍යානියට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් රූප සංඥාවන්ගේ ඉක්මවීමෙන්, ක්‍රෝධ (කෝප) සංඥාවන්ගේ විනාශ කිරීමෙන් විවිධ සංඥා මෙනෙහි නොකිරීමෙන්, ආකාසය අනන්තයයි. එහිම සිත පිහිටුවා ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයැයි විඤ්ඤාණයෙහිම සිත පිහිටුවා විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය

කරයි. සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. සියලු ආකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා දැනීම් හා විඳීම් නිරුද්ධ වූ නිරෝධ සමාපත්තියට පැමිණ වාසය කරයි. මෙහි දක්වන ලද්දේ නව අනුපූර්ව විහාරයන්ය.

**දස නිජ්ජිර වත්‍ථූනි** යනු මිථ්‍යාදෘෂ්ටි ආදීන් විනාශ කෙරෙත් නසනු ලබත්නුයි = නිජ්ජරානියි - වත්‍ථූනි යනු හේතූන්ය. නසනු ලබන්නේද, වස්තූහුද ඒවානුයි නිජ්ජර වස්තුයි. සම්‍යග්දෘෂ්ටි ආදීන්ට මේ විශේෂ නමකි. කවර දසදෙනෙක්ද යත්, සම්‍යග් දෘෂ්ටියට මිථ්‍යාදෘෂ්ටිය විනාශ වේ. මිථ්‍යාදෘෂ්ටි හේතුවෙන් නොයෙක් පාපී අකුසල්දම් හටගනිත්ද? ඒවාද විනාශකරන ලද්දේ වෙයි. සම්‍යග් දෘෂ්ටි හේතුයෙන් නොයෙක් කුසලදම් වැඩිදියුණුවට පරිපූර්ණත්වයට යේ. සම්‍යග් සංකල්පයට මිථ්‍යා සංකල්පය විනාශ වේ. මිථ්‍යා සංකල්පය හේතුවෙන් නොයෙක් පාපී අකුසල්දම් හටගනීද ඒවාද විනාශකරන ලද්දේ වේ. සම්‍යග් සංකල්ප හේතුවෙන් නොයෙක් කුසල්දම් වැඩිදියුණුවට පරිපූර්ණත්වයට යෙයි. සම්‍යග් වචනයට මිථ්‍යා වචනය විනාශ වේ. මිථ්‍යා වචන හේතුවෙන් නොයෙක් පාපී අකුසල් දම් හටගනීද? ඒවාද විනාශ වේ. සම්‍යග් වචනය හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට පරිපූර්ණත්වයට යේ. සම්‍යක් කර්මාන්තයට මිථ්‍යා කර්මාන්තය විනාශ වෙයි. මිථ්‍යා කර්මාන්ත හේතුවෙන් නොයෙක් පාපී අකුසල් දම් හටගනීද? ඒවාද විනාශ වෙයි. සම්‍යග් කර්මාන්ත හේතුවෙන් නොයෙක් කුසල්දම් වැඩිදියුණුවට සම්පූර්ණත්වයට යේ. සම්‍යග් ආජීවයට මිථ්‍යා ආජීවය විනාශ වේ. මිථ්‍යා ආජීවය හේතුවෙන් නොයෙක් පාපී අකුසල්දම් හටගනීද? ඒවාද විනාශ වේ. සම්‍යග් ආජීව හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට පරිපූර්ණත්වයට යේ. සම්‍යග් ව්‍යායාමයට මිථ්‍යා ව්‍යායාමය විනාශ වේ. මිථ්‍යා ව්‍යායාම හේතුවෙන් නොයෙක් පාපී අකුසල්දම් හටගනීද? ඒවාද විනාශ වේ. සම්‍යග් ව්‍යායාම හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට පරිපූර්ණත්වයට යේ. සම්‍යක් සතියට මිථ්‍යා සතිය (සිහිය) විනාශ වේ. මිථ්‍යා සති හේතුවෙන් නොයෙක් පාපී අකුසල්දම් හටගනීද? ඒවාද විනාශ වේ. සම්‍යග් සති හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට පරිපූර්ණත්වයට යේ. සම්‍යග් සමාධියට මිථ්‍යා සමාධිය විනාශ වේ. සම්‍යග් සමාධි හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට

පරිපූර්ණත්වයට යේ. සම්‍යග් සමාධියට මිථ්‍යා සමාධිය විනාශ වේ. මිථ්‍යා සමාධි හේතුවෙන් නොයෙක් පාපී අකුසල්දම් හටගනීද? ඒවාද විනාශ වේ. සම්‍යග් සමාධි හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට පරිපූර්ණත්වයට යේ. සම්‍යග් ඤාණයට මිථ්‍යා ඤාණය විනාශ වේ. මිථ්‍යා ඤාණ හේතුවෙන් නොයෙක් පාපී අකුසල්දම් හටගනීද? ඒවාද විනාශ වේ. සම්‍යග් ඤාණ හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට පරිපූර්ණත්වයට යේ. සම්‍යග් සතියට මිථ්‍යා සතිය (සිහිය) විනාශ වේ. මිථ්‍යා සති හේතුවෙන් නොයෙක් පාපී අකුසල්දම් හටගනීද? ඒවාද විනාශ වේ. සම්‍යග් සති හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට පරිපූර්ණත්වයට යේ. සම්‍යග් සමාධියට මිථ්‍යා සමාධිය විනාශ වේ. මිථ්‍යා සමාධි හේතුවෙන් නොයෙක් පාපී අකුසල්දම් හටගනීද? ඒවාද විනාශ වේ. සම්‍යග් සමාධි හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට පරිපූර්ණත්වයට යේ. සම්‍යග් ඤාණයට මිථ්‍යාඤාණය විනාශ වේ. මිථ්‍යා ඤාණ හේතුවෙන් නොයෙක් පාපී අකුසල්දම් හටගනීද? ඒවාද විනාශ වේ. සම්‍යග් ඤාණ හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට පරිපූර්ණත්වයට යේ. සම්‍යග් විමුක්තියට මිථ්‍යා විමුක්තිය විනාශ වේ. මිථ්‍යා විමුක්තිය හේතුවෙන් නොයෙක් පාපී අකුසල් දම් හටගනීද? ඒවාද විනාශ වේ. සම්‍යග් විමුක්ති හේතුවෙන් නොයෙක් කුසල්දම් අභිවෘද්ධියට පරිපූර්ණත්වයට යේ. දස නිජ්ජර වස්තු කියන ලදී.

'මහණෙනි, සියල්ල විශේෂයෙන් දතයුතුයයි, ආදි වශයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්ද, මෙහි ගෙනහැර දක්වන ලද්දේයයි දතයුතුය. කිඤ්ච යන්නෙහි ච කාරය පද පූරණ මාත්‍ර නිපාතයයි. චක්ෂු ආදී තිස් විසඳුම් ෂට් ද්වාරයන්හි එක එකෙහි පහ පහ බැගින් කොට ද්වාරාරම්මණ පවත්නා ක්‍රමයෙන් දක්වන ලදහ. එහි ඇස දෙයාකාරය. මාංශ ඇසද, ප්‍රඥා ඇසද වශයෙනි. එහි ප්‍රඥා ඇස බුද්ධ චක්ඛු, සමන්ත චක්ඛු, ඤාණ චක්ඛු, දිබ්බ චක්ඛු, ධම්ම චක්ඛු වශයෙන් පස්වැදෑරුම්ය. 'මහණෙනි, මම බුදුඇසින් ලොව බලන්නේ දුටුවෙමියි මෙය බුදු ඇස නම් වේ.'

'සර්වඥතා ඥානයට සමන්ත චක්ඛු යයි කියයි. මෙය සමන්ත චක්ඛු නම් වේ. ඇස පහළවිය. ඤාණය පහළවිය. මෙය නැණැසයි. මහණෙනි, මම ඉතා පිරිසිදු දිවැසින් දිටිමි. මෙය දිවැසයි. කිලිටි නැති අපද්‍රව්‍ය නොමැති දහම් ඇස පහළවිය. මෙය යට මාර්ගත්‍රය සංඛ්‍යාත ඤාණය, දහම් ඇස නම් වේ.'

මසැසද, සසම්භාර (පිරිවර දේ සහිත) ඇස, ප්‍රසාද ඇසයයි දෙයාකාරය. යම් ඒ ඇස්වළෙහි පිහිටි, යට ඇස් වළෙහි ඇටයෙන්ද, මත්තෙහි නළල් ඇටයෙන්ද, දෙපස ඇස් කුළුවලින්ද පිටත ඇස් පිහාටුවලින්ද, සීමා වූ ඇස් කුල මැද තබන ලද නහර නමැති නූල්වලින්, හිස්මොළය හා බැඳුණු, සුදු ඉතාමත් කළු වටකුරු මස් පිඩක් වේද, මෙය පිරිවර දේවල් සහිත ඇසයි. සතරමහා භූතයන්ගේ දැඩි ග්‍රහණයෙන් ආශ්‍රිතව-බැඳුණු, යම් ඉන්ද්‍රිය ශක්තියක් වේද, එය ප්‍රසාද ඇසයි. මෙය මෙහි අදහස් කරන ලදී. ඒ සසම්භාර ඇසෙහි ශ්වේත මණ්ඩලය වටකොට, කෘෂ්ණ මණ්ඩලය මැද, ඉදිරිපස සිටියවුන්ගේ ශරීර සටහන් උපදනා පෙදෙසෙහි, දෘෂ්ටි මණ්ඩලයෙහි, පුළුන්රොද සතක වත්කරන ලද තෙලක් පුළුන් රොද පසාකරගෙන යන්නාක් මෙන්, හෘදයවස්තුව හා ව්‍යාප්ත සත් ඇස් රොද, ප්‍රමාණයෙන් මුංපියල්ලක් පමණ වූයේ, චක්ඛු විඤ්ඤාණාදීන්ට සුදුසු පරිද්දෙන් වස්තු ද්වාර භාවයන් සිදුකරමින් සිටී. පරීක්‍ෂාකර බලානුයි චක්‍ෂුයි. රූපය ආස්වාදනය කරයි. පැහැදිලි කෙරේ යන අර්ථයි.

වෙනස්වේනුයි රූප නම් වේ. වර්ණ වෙනසට පත්වන්නේ, හෘදය හා සබඳතාව, ප්‍රකාශ කෙරෙත් යනු අර්ථයි. ඇසින් සිදුවන විඤ්ඤාණය හෝ ඇසෙහි විඤ්ඤාණය **චක්ඛු විඤ්ඤාණයි.** ස්පර්ශ කෙරේනුයි ඵස්සයි. 'ස' උපසර්ගයෙන් පදය සරසා සම්ඵස්ස යයි කියන ලදී. ඇසින් පැවති මනා ස්පර්ශය **චක්ඛු සම්ඵස්ස** යයි. **චක්ඛු සම්ඵස්ස පච්චයා** යනු චක්‍ෂු විඤ්ඤාණය හා යෙදුණු ස්පර්ශ හේතුයෙන්, වෙදයිතං යනු විඳීමයි. විඳීමයි යනු අර්ථයි. එයම සුවපත් වේනුයි සුඛං නම් වේ. යමෙකුට එය උපදීද? ඔහු සුවපත් කෙරේනුයි යන අර්ථයි. කයෙහි හා සිතෙහි හටගත් ආබාධ කා දමයි. හාරා ඉවත් කෙරේනුයි සුඛයි. දුකට පත්වේනුයි දුක් නම් වේ. යමෙකුට එය උපදීද, ඔහු දුකට පත් අයෙකු කෙරේනුයි යන අර්ථයි. දුකත් නොවේ සැපත් නොවේනුයි අදුක්ඛමසුඛයි. මකාරය පද සන්ධි වශයෙන් කියන ලදී. ඒ චක්‍ෂු ස්පර්ශය තමා හා එකට යෙදුණු වේදනාවට, සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය, විපාක, ආහාර, සම්ප්‍රයුක්ත, අත්ථි, අවිගත වශයෙන් අට ආකාරයකින් ප්‍රත්‍යය වේ. සම්පටිච්ඡන හා එකට යෙදුණු කල්හි අනන්තර, සමනන්තර, අනන්තරූප නිස්සය, නත්ථි විගත වශයෙන් පස් ආකාරයකින්ද, සන්තීරණාදී සම්ප්‍රයුක්තයන්ට උපනිශ්‍රය වශයෙන්ම ප්‍රත්‍යය වේ.

ශ්‍රවණය කෙරේනුයි = **සොතයි.** එය පිරිවර සහිත කන් බිලෙහි ඇතුළත, තඹවන් ලෝම ගැවසීගත්, ඇඟිලි සෙලවිය හැකි සටහන් ඇති ප්‍රදේශයෙහි සෝත විඤ්ඤාණාදීන්ට සුදුසු පරිදි වස්තු ද්වාර භාවය සිදුකරමින් සිටී. ආඝ්‍රාණය කෙරේනුයි **ඝාණං** යි. එය පිරිවර දේ සහිත, නාස් සිදුරෙහි ඇතුළත එළුපා සටහන් ප්‍රදේශයෙහි ඝාණ විඤ්ඤාණාදීන්ට සුදුසු පරිදි වස්තු-ද්වාර භාවය සිදුකරමින් සිටී. සුවඳ-දුගඳ දැනේනුයි ගන්ධයි. තමාගේ ස්වභාවය හඟවත් යන අර්ථයි. ජීවිතය කැඳවත්නුයි= **ජිව්හායි** රස දැනීම් අර්ථයෙන්ද ජිව්හායි. එය සසම්භාර දිවෙහි ඉතා අග හා මුල පැති අත්හැර මතු තල මධ්‍යයෙහි කැඩුණු මානෙල් මල්පෙති අග සටහන වැනි ප්‍රදේශයෙහි ජිව්හා විඤ්ඤාණාදීන්ට සුදුසු පරිදි වස්තු-ද්වාර භාවය ඉටුකරමින් සිටියි. සත්ත්වයෝ එයින් තෘප්ත වෙත්නුයි රසයි. ආස්වාදනය කෙරෙත් යන අර්ථයි.

පිළිකුල් කෙලෙස් සහිත ධර්මයන්ගේ උත්පත්ති ස්ථානයනුයි කායො යි. ආය යනු උපදින දේශයයි. යම් පමණ මේ ශරීරයෙහි තෘෂ්ණාදීන් විසින් ගන්නා ලද පැවැත්මක් ඇත්ද? එහි බොහෝසෙයින් කාය ප්‍රසාදය කාය විඤ්ඤාණාදීන්ට සුදුසු පරිදි, වස්තුද්වාර භාවය ඉටු කරමින් සිටියි. ස්පර්ශ කෙරේනුයි - පොට්ඨබ්බයි. අවබෝධ කෙරේනුයි (මනො) මනයි දැනගනී යන අර්ථයි. තමාගේ ස්වභාවයන් දරත්නුයි = ධර්මයි. මනො යනු ආවර්ජන සහිත භවංගයයි. ධම්මා යනු දොළොස් ආකාර ධර්මාරම්මණ ධර්මයි. **මනො විඤ්ඤාණං** යනු ජවන මනෝ විඤ්ඤාණයයි. **මනො සම්ඵස්සො** යනු ඒ හා යෙදුණු ස්පර්ශයයි. එය තමා හා යෙදුණු වේදනාවට විපාක ප්‍රත්‍යය හැර අනෙක් ප්‍රත්‍යය සතෙන් ප්‍රත්‍යය වේ. අනන්තරාදීන්ට ඒවායින්මද, ඉතිරි ඒවාට උපනිශ්‍රය වශයෙන්ද ප්‍රත්‍යය වේ. රූපාදි පස්ආකාර විසඳුම් ස්කන්ධ වශයෙන් විස්තර කරන ලදී. සීතාදීන්ගෙන් වෙනස් වේ. පීඩාවට පත්වේනුයි = **රූප** යි - විඳීනුයි - වේදනායි. හඳුනාගනීනුයි - **සඤ්ඤා** යි. රැස්කෙරේනුයි **සංඛාර** යි. දැනගනීනුයි - **විඤ්ඤාණ** යි. චක්ෂු ආදීන් ධර්ම විචාරය කෙළවරකොට ඇති හයේ කොටස් දහය බැගින් ප්‍රිය රූප, සිහිල් රූප වශයෙන් විසඳුම් සැටකින් විස්තර කරන ලදී. චක්ඛු සම්ඵස්සජාදී වේදනාවන් ඒ ඒ අංග හා සමග යෙදුණෝමය. රූපයන්හි හැඟීම - **රූප සඤ්ඤා** යි. සිතාබලයිනුයි **සඤ්චෙතනා** යි. ගලාබසී යන අර්ථයි. ආශා කෙරේනුයි - **තණ්හා** යි. පිපාසිත වේ යන අර්ථයි. කල්පනා කෙරේනුයි **විතක්ක** යි. සිතාබැලීම විතර්කයයි. කල්පනා කිරීමයයිද කියන ලද්දේ වේ. එයින් අරමුණෙහි

සිත ගමන් කෙරේනුයි - විචාරයි. හැසිරීම හෝ විචාරයයි. ඔබිනොබ හැසිරීමයයි කියන ලද්දේ වේ.

පෘථුවි ධාතු ආදී විසඳුම් සය කෙටියෙන් නාම-රූප විභාග කිරීම් වශයෙන් විස්තර කරන ලදී. පැතිරුණු හෙයින් පෘථුවියයි. ද්‍රව්‍යයන් එකට බඳීනුයි කලවම් කෙරේනුයි, සම්බන්ධ කෙරේනුයි - ආපො යි. (ජලයයි)

උණුසුම් කෙලේනුයි තෙජො යි. හමායයි නුයි වායො යි. නොඇදියි. ඇදීමට නොහැකිය. ආපසු නොඇදියි. අදින්ට, කපන්ට නොහැක්කේනුයි ආකාසො - අහසයි. සත්ත්වයෙක් නොවන අර්ථයෙන් ධාතුනම් වේ.

පෘථුවි කසිණ ආදි දස විසඳුම් කසිණ භාවනා වශයෙන් විස්තර කරන ලදී. **කසිණං** යනු සියල්ලයි. පැතිරීම් වශයෙන් කසිණ මණ්ඩලයද, වැටහුණු නිමිත්තද, එය අරමුණුකොට පැවති ධ්‍යානයද අදහස් කරයි. මෙහි වනාහි ධ්‍යානය අදහස් කරන ලදී. මුල්සතර, මහාභූත කසිණාරම්මණව ලත් ධ්‍යානයන්ය. ඉන්පසු සතර, වර්ණ කසිණාරම්මණ ධ්‍යානයන්ය. **ආකාස කසිණං** යනු වෙන්කළ ආකාසයයි. එය අරමුණුකොට ලත් ධ්‍යානය කසිණුගඝාටිකමාකාසයයි. ආකාසානඤ්චායතනය එය අරමුණුකොට ඇත්තේය. **විඤ්ඤාණ කසිණං** යනු ආකාසානඤ්චායතන විඤ්ඤාණයයි. විඤ්ඤාණඤ්චායතනය එය අරමුණුකොට ඇත්තේය.

කෙස් ආදී දෙතිස් විසඳුම් දෙතිස් ආකාර කර්මස්ථාන වශයෙන් විස්තර කරන ලදී. ඔවුන් අතර කෙස් ආදීන් පිළිකුල් වශයෙන් වැටහුණු කල්හි කායගතාසති වශයෙන් අසුභ කර්මස්ථානය වෙයි. වර්ණ වශයෙන් වැටහුණු කල්හි වර්ණ කර්මස්ථානය වෙයි. ධාතු වශයෙන් වැටහුණු කල්හි සතර ධාතු වෙන්කොට සලකන කර්මස්ථානය වෙයි. කෙස් ආදීන් පිළිකුල් වශයෙන් හෝ වර්ණ වශයෙන් වැටහුණවුන්ට ඒවා අරමුණු කොට ධ්‍යාන ලැබේ. ධාතු වශයෙන් වැටහුණු තැනැත්තාට ඒ කොටස් අරමුණු වූයේ ධාතු භාවනාවයයි දතයුතුය. කෙසා කන් කුඩුම්බියෙන් දෙපැත්තෙහි, නළලින් පෙරටුවද, පිටුපසින් ගෙලෙහි වළෙන් සීමා කරන ලද්දේ, හිසෙහි පිටකටුව, වෙලී ඇති සමෙහි වී ඇටයක අග පමණ පිවිස සිටියේ නොයෙක් ලක්ෂ සංඛ්‍යාතය. බොහෝ සෙයින්, ලොමා, කෙස් පිහිටි ස්ථානයන්ද, අත්තල හා පාදතලයන්ද හැර, ශරීර හමෙහි අනූනව දහසක්, ලොම් ගස් පිහිටන වළවල්වල ලේඩියෙක් පමණ ඇතුළට පිවිස

සිටියේය. **තචො:-** ඇඟිලි අග මතුපිට පිහිටි විස්සකි. **දන්තා:-** හනු ඇට දෙකෙහි පිහිටියේය. බොහෝසෙයින් දත් දෙතිසකි. **තචො:-** මුළු හරීරය හාත්පසින් වසා, ප්‍රකට (නොවැසුණ) දලබුවට මත්තෙන් සිවියට යටින් තිබෙන සම. **මංසං:-** තුන්සියයකට අධික අස්ථීන්හි තැවරී ඇති මාංශපේශීන් නවසියයකි. **නහාරු:-** සියලු ශරීරයෙහි අස්ථි සම්බන්ධ කර, පවතින නවසියයක් නහර. **අට්ඨී:-** මුළු සිරුරෙහි යට හා උඩ තුන්සියයකට අධික අස්ථීන්. **අට්ඨිමිඤ්ජා:-** ඒ ඒ ඇටවල අභ්‍යන්තරයෙහි තිබෙන මිදුළු, **වක්කං:-** ගලවළුයෙන් නික්ම එක් මුලකින් මදක් ගොස් දෙකට බෙදී, මහ නහරවලින් බැඳී හෘදය මාංශය වටකොට සිටි මස්පිඩු දෙක. **හදයං:-** ශරීරාභ්‍යන්තරයෙහි දෙතන මධ්‍යයෙහි සිටි ඇතුළත සිත ඇසුරුකර ඇති. අත්ලෙන් අඩක් පමණ ලෙයින් පිරුණ දොඹ ඇටයක් තබන ප්‍රමාණ ආවාටයක් සහිත හෘදය මාංශය. **යකනං:-** දෙතන අතර දකුණුපසට බරව තිබෙන මස්පිඩු දෙකයි. **කිලොමකං:-** දලබුව හෘදය ආශ්‍රිත වකුගඩු වසා සිටි වැසුණු දලබු සංඛ්‍යාත වූද, මුළු ශරීර සමෙහි යටමාංශය හාත්පසින් වෙලාසිටි නොවැසූ දලබුවයයිද දෙයාකාරය. **පිහකං:-** බඩදිව හෘදයට වම්පසින් උදර වැස්මට මතුපැත්ත ආශ්‍රය කොට සිටි බඩදිව් මසයි. **පප්ඵාසං:-** පපුමස ශරීරාභ්‍යන්තරයෙහි දෙතන අතර හෘදය හා වකුගඩු වසා එල්ලෙමින් තිබෙන මස්කැබලි දෙතිසකින් යුත් පපුමස. **අන්තං:-** බඩවැල මත්තෙහි ගලවළුයෙන්ද, යට මල මාර්ගය හා බැඳී පවතින, ගලවළුව හා මලමාර්ගය කෙළවරකොට ශරීරාභ්‍යන්තරයෙහි තිබෙන, පුරුෂයාට දෙතිස් රියනක්ද ස්ත්‍රියට විසිඅට රියනක්ද වන, විසිඑක් තැනකින් නැමී පවතින බඩවැල් ගුළිය. **අන්තගුණං:-** විසිඑක් ඇතුල් බඩවැල් නොවිසිරෙන සේ එකට බැඳ ඇති බන්ධනයයි. **උදරියං:-** ආමාසයෙහි නොපැසුණු අහර: දත් මොහොල්වලින් මනාව කුඩුකරන ලද, දිව නමැති අතින් පෙරලන ලද කෙළ ගැලීමෙන් අපිරිසිදු වූ, එකෙණෙහිම පහවූ වර්ණ, ගන්ධ, රස ආදී සම්පතින් යුත්, රෙදිවියන පන්දුවෙහි යට අතට වූ නූල් මෙන් හිවල් වමනයක් සේ වැටී, පිත්, සෙම්, වාතාදියෙන් වෙලී කුසගිනි උෂ්ණ වේගයෙන්, ඉතා රත්වූයේ පණුවන් ගැවසී ගත්තේ, මතුමත්තෙහි පෙණබුබුළු මුදමින්, ඉතාමත් පිළිකුල් වූයේ, දුර්ගන්ධ, ඉතාමත් පිළිකුල් බවට පැමිණ ආමාසය සංඛ්‍යාත, නාභි මතුයෙහි බඩවැල් වැස්මෙහි තිබෙන නොයෙක් කන ලද, පානය කරන ලද, කඩාකන ලද, රසවිඳින ලද ආහාරයි. **කරීසං:-** මල නාභිය යට, පිටෙහි ඇටකටු මුල් අතර, උසින් අටඟුලක් පමණ පක්වාසයයි කියනු ලබන බඩවැල් අවසානයෙහි තිබෙන වර්චස්ය. **පිත්තං:-** පිත: හෘදය මාංශ හා

පපුමස අතරෙහි අක්මා මාංශය ආධාර කරගෙන පවතින, මහ වැටකොළු වැලක කුඩා කොපුවක් සමාන පිත් කෝෂයෙහි තිබෙන බද්ධ පිතයයි කියනු ලබන පිතද, කෙස්, ලොම්, නිය, දත් ආදී මාංශයෙන් තොර ස්ථානයන්හිද, තද වියලි සම් හැර සෙසු ශරීරයෙහි ව්‍යාප්තව තිබෙන අබද්ධ පිතද වශයෙන් දෙයාකාරය. **සෙම්හං:-** සෙම: උදරයෙහි පිටවැස්මෙහි ඇති එක් පාත්‍රයක පිරෙන ප්‍රමාණයේ සෙම. **පුබ්බො:-** සැරව උල් හා කටු ආදියෙන් ප්‍රහාරවලට ලක්වීම, ගිනිදැල්වලින් පහර දුන්විට, සිරුරු පෙදෙස්හි අභ්‍යන්තර ධාතු කිපීම් වශයෙන් හටගත් ගෙඩි පිළිකාදීන්හි මේරූ ලේවල වෙනස සැරව වේ. **ලොහිතං:-** ලෙය. අක්මාවෙහි යට කොටස පුරවා, හෘදය වකුගඩුව, හෘදය මාංශ ආදීන් මතුයෙහි ස්වල්පය බැගින් වගුරුවමින්, වකුගඩුව, හෘදය, අක්මාව, හෘදය මාංශය තෙමමින් තිබෙන එක් පාත්‍රයක් පිරෙන තරම් රැස්කළ ලෙයද, කෙස්, ලොම්, නිය, දත් හා මාංශයෙන් තොර හා තද වියලි සමද හැර, නහර ජාලය අනුසාරයෙන් සියලු තමාගේ යයි සිතාගත් ශරීරය පුරා, පැතිර සිටි හා සැරිසරන ලෙයද, වශයෙන් ලෙය දෙයාකාරය. **සෙදො:-** දහදිය ගින්නෙන් තැවීම, හිරු රැසින් තැවීම, ඍතු වෙනස්වීම් ආදියෙන් ශරීරය රත්වූ කල්හි සියලු කෙස්, ලොම්, කුප, සිදුරුවලින් වැගිරෙන ජල ස්වභාවයයි. **මෙදො:-** මේදය. ස්ථූල වූවහුගේ මුළු සිරුරෙහි සම් මස් අතරද, කෘශ වූවහුගේ උකුල, තුනටිය ආදිය ආශ්‍රයකොට තිබෙන දූර්වල තෙල **අසසු:-** කඳුළු. සොම්නස් - දොම්නස් විසභාග ආහාර ඍතුන්ගෙන් හටගෙන ඇස්වළෙහි පුරවා, තිබෙන්නා වූ හෝ වැගිරෙන්නා වූ ද්‍රව්‍යය ආපෝ ධාතුයි. **වසා:-** චුරුණු තෙල. ගින්නෙන්, හිරුරැසින් තැවීම, ඍතු විෂමතාවන්හිදී, වාතය උණුසුම්වී, මෙහිදී, බොහෝසෙයින් අත්ල, පිටිඅත්ල, පාතල, පාපිට, නළල, උරහිස ආදී ස්ථානයන්හි තිබෙනා දියාරු තෙත් ගතියයි. **ඛෙලො:** කෙල. ආහාර දකින්නහුට හෝ සිහිකරන්නහුට මුඛයෙහි තබන්නහුට කිසියම් පිළිකුලක් උපදවන්නහුට (පිළිකුලක් වූවිට) බොහෝ ඉපදී දෙකොපුල් පෙදෙසින් බැස දිවෙහි තිබෙන පෙණ මිශ්‍ර තෙත් ද්‍රව්‍යයයි. **සිංඝාණිකා:-** සොටු. විෂම ආහාර ඍතු ආදියෙන් හටගත් ශාරීරික සප්තධාතු කැළඹීමට පත්වූවහුට හෝ හඬන්නහුට, හිස ඇතුළත මොළ ලොදයෙන් ගලාවුත්, තල්ල මතුයෙහි විවරයෙන් බැස, නාස්පුඩු පුරවා, තිබෙන්නා වූ හෝ වැගිරෙන්නා වූ කුණු වූ අපවිත්‍ර ඇලෙන ස්වභාවයයි. **ලසිකා:-** සඳමිදුළු. ඇට සන්ධීන්හි තෙල් ගැල්වීමේ කෘත්‍යය ඉටුකරමින් එක්සිය අසූවක් සන්ධීන් ඇතුළත තිබෙන ඇලෙන ස්වභාව ඇති අපවිත්‍ර ද්‍රව්‍යයයි. **මුත්තං:-** මුත්‍ර: ආහාර හා ඍතු ගුණයෙන් හටගත් මුත්‍රාශය

ඇතුළත තිබෙන තෙත් ද්‍රව්‍යයයි. **මත්ථලුංගං**- මොළ ලොඳ. හිසෙහි පිටකටුව ඇතුළත, සිව් පූට්ටුව උපයෝගී කරගෙන තිබෙන සිව් පිඩ එක්කිරීමේ මිදුළු රැසයි.

චක්ඛායතන ආදී දොළොස් විසඳුම් ද්වාදසායතන වශයෙන් දක්වන ලදී. චිත්ත චෛතසික ධර්ම නමැති, ආයයන් හටගැනීමට මුල්වන හෙයින්ද, දීර්ඝව ඉදිරියට ගෙනයන හෙයින්ද ආයතනයි. ඇස, රූපය ආදී වශයෙන් ඒ ඒ දොරටු අරමුණු ඇතිව, හටගත් චිත්ත චෛතසික ධර්ම, ඒ ඒ අනුභව කිරීම් ආදී කෘත්‍ය වශයෙන් ඉපදේ. නැගිටී ගැටේ. උත්සාහ කෙරේනුයි යුසේයි. ඒවාට මුල්වූ ධර්මයන් මෙයින් පැතිරෙයි විස්ථාරණය වෙයි. මෙය නොදත් කෙළවර ඇති, සසරෙහි ඉතා දීර්ඝ සසරදුක යම්තාක් නොනවතීද, ඒ තාක් ගෙන යති පවත්වතියි යුසේයි. තවද, වාසස්ථානය, ආකරය, රැස්වීම ඉපදුණු දේශය, කාරණය යන අර්ථයන්හි ආයතන ශබ්දය යෙදේ. එසේම ලෝකයෙහි 'ඉසසරායතනං, වාසුදෙවායතනං, ආදීන්හි වාසස්ථානය ආයතනයයි කියයි. සුවණ්ණායතනං රජතායතනං ආදී තන්හි ආකාරය කියැවේ. (උපදනා තැන) ශාසනයෙහි වනාහි 'මනොරමෙ ආයතනෙ සෙවනති නං විහංගමා ආදී තන්හි රැස්වන ස්ථානයයි. **දකඛිණාපථො ගුනනං ආයතනං** ආදී තන්හි ඉපදෙන ස්ථානයයි. **තත්‍ර තත්‍රෙව සකඛිභබ්බතං පාපුණාති සත** සති ආයතනෙ, ආදී තන්හි කාරණයයි. ඇස් ආදීන්හි ඒ ඒ චිත්ත චෛතසික ධර්මයෝ ඊට අනුගත හෙයින් වාසය කෙරෙති. චක්ෂුරාදීන් ඔවුන්ගේ වාසස්ථානයයි. චක්ෂුරාදීන්හි එම චිත්ත චෛතසික ධර්මයන් ගැවසීගත් හෙයින්ද, ඒවා ආශ්‍රිත හෙයින්ද, ඒවා අරමුණුකොට ඇති හෙයින්ද, චක්ෂුරාදීන් ඔවුන්ගේ ආකරයකි. හටගන්නා ස්ථානයකි. ඒ ඒ තන්හි වස්තු, ද්වාර, අරමුණු වශයෙන් රැස්වන හෙයින්ද, චක්ෂුරාදීන් ඔවුන්ගේ රැස්වන ස්ථානයයි. එය ඇසුරුකොට අරමුණු සිදුවන හෙයින්ද, එහිම උපදින හෙයින්ද, ඇස් ආදීහු ඔවුන්ගේ හටගත් දේශයයි. චක්ෂුරාදීන්ගේ අභාවයෙන් චිත්ත චෛතසිකාදීන්ගේ අභාවය වන හෙයින්, චක්ෂුරාදීන් ඔවුන්ට හටගැනීමේ කාරණා වේ. කියන ලද අර්ථයට අනුව ඇසද, ආයතනයද එයම වූයේනුයි චක්ඛායතනයයි. සෙස්සද මෙසේය. චක්ෂු ධාතු ආදී අටළොස් විසඳුම්, අටළොස් ධාතු වශයෙන් විස්තර කරන ලදී. චක්ෂුරාදී එක් එක් ධර්මය පිළිවෙළින් විධාන කරයි. දරනු ලැබේ. එයින් විධාන කරයි. එහි හෝ දරනු ලැබේනුයි, ධාතුයි. රන් රිදී ආදී ලෞකික ධාතූහු, තත්වාවබෝධය රහිත තාවය තුළින්, රන්රිදී ආදීන්ට මූලාමය

වටිනාකම් ප්‍රක්ෂේපණය කොට ඒ හේතුකොට නොයෙක් සසර දුක් නියම කරති. (ලබති)

බරගෙන යන්නන්ගේ බර මෙන් සත්ත්වයින් විසින් උසුලනු ලැබෙත්, දරනු ලැබෙත්නුයි යන අර්ථයි. වසඟයෙහි නොපවත්නා හෙයින් මෙය දුක් පිළියෙල කිරීමක් පමණකි. මේවාට හේතුවන කරුණුවලින් සත්ත්වයින් විසින් සසර දුක් විඳිනු ලැබේ. එය එසේම කරන ලද්දේද වේ. ඒවාම දරනු ලැබේ. තබනු ලැබේනුයි අර්ථයි. තවද තීර්ථකයින්ගේ ආත්මය නම් සත්‍ය වශයෙන් නැත. මේවා එසේ නොවේ. මේවා වනාහි තමාගේ ස්වභාවයන් දරත්නුයි ධාතුයි. යම්සේ ලෝකයෙහි විසිතුරු හිරියල්, රත්හිරියල් ආදී ශෛලමය දෑ ධාතුයයි කියත්ද? එසේම මේවාද ධාතුන් මෙනැයි ධාතු නම් වේ. මේවා නුවණින් දතයුතු කරුණු බැවින් විසිතුරුය. යම්සේ වනාහි ශරීරය යයි කියනු ලබන රාශියට අවයව වූ රස ලේ ආදීන්හි ඔවුනොවුන්ගේ විෂම ලක්‍ෂණ නුවණින් පිරිසිඳ දැනගත් කල්හි ධාතු මාත්‍රයක්ම යයි දැනීමක් වේද, එපරිද්දෙන්ම පංචස්කන්ධ සංඛ්‍යාත ආත්ම භාවයාගේ අවයවවල ධාතුය යන හැඟීම දතයුතුය. ඇස් ආදීන්ගේ ඔවුනොවුන් අතර පවත්නා විෂම ලක්‍ෂණ පිරිසිඳ දතයුතුය. තවද ධාතු යනු අජීව මාත්‍රයකට විශේෂ නමකි. එසේම බුදුරදුන්, 'ඡ' ධාතුයො අයං භික්ඛවෙ පුරිසො, ජීව සංඥාව මුලිනුපුටා දැමීම සඳහා ධාතු දේශනාව කළ සේක. කියන ලද පරිද්දෙන් ඇසද එයමනුයි ධාතුවද එයම නුයි **චක්ඛුධාතුයි.** සෙස්සද මෙසේය.

**මනොධාතු** යනු සතර මනෝධාතුන්ය. **ධම්මධාතු** යනු වේදනා, සඤ්ඤා, සංස්කාර යන ස්කන්ධයන්ද, සොළොස් සියුම් රූපද නිර්වාණයද වේ. **මනො විඤ්ඤාණ ධාතු** යනු හැත්තෑහයක් වූ මනො විඤ්ඤාණ ධාතුන්ය.

චක්‍ෂු ඉන්ද්‍රිය ආදී දෙවිසි විසඳුම් දෙවිසි ඉන්ද්‍රිය වශයෙන් විස්තර කරන ලදී. ඇසම දැකීම් ලක්‍ෂණයෙන් අධිපතිත්වය කෙරේනුයි **චක්ඛුන්ද්‍රියයි** ශ්‍රෝත්‍රයම ඇසීම් ලක්‍ෂණයෙන් අධිපතිත්වය කෙරේනුයි **සොතින්ද්‍රියයි.** නාසයම ආඝ්‍රාණ ලක්‍ෂණයෙහි අධිපතිත්වය කෙරේනුයි = **ඝාණින්ද්‍රියයි.** දිවම රස දැනීම් ලක්‍ෂණයෙහි අධිපතිත්වය කෙරේනුයි = **ජිව්හින්ද්‍රිය යි.** ශරීරයම ස්පර්ශ කිරීම් ලක්‍ෂණයේ අධිපතිත්වය කෙරේනුයි = **කායින්ද්‍රිය යි.** මනීනුයි - මනයි - දැනගනී යන අර්ථයි. අර්ථකථාචාර්යවරු වනාහි

කීවාහුය. නැලියෙන් මණින්නාක් මෙන්ද, විශාල තරාදියක දමා මණින්නාක් මෙන්ද අරමුණ මනියි, දනීනුයි = මනයි. එයම මැණීම් ලක්ෂණයෙහි අධිපතිත්වය කෙරේනුයි = **මනින්ද්‍රියං** යි. ඒ හා යෙදුණු ධර්මයන් ජීවත් කෙරේනුයි = ජීවිතයි. එයම රැකීම් ලක්ෂණයෙහි ප්‍රධානත්වය කෙරේනුයි = **ජීවිතින්ද්‍රියං** යි. එය රූප ජීවිතින්ද්‍රිය, අරූප ජීවිතින්ද්‍රිය වශයෙන් දෙවදෑරුම්ය. සියලු කර්මජ රූප සහජය. සහජ රූප රැකීම රූප ජීවිතේන්ද්‍රියයි. සියලු චිත්තජ රූප සහජය. සහජ අරූප රැකීම අරූප ජීවිතේන්ද්‍රියයි. ඇයගේ ගැබ නැසේ, විනාස වේනුයි = ඉත්ථියි. ස්ත්‍රී ලිංගාදියෙහි අධිපතිත්වය කෙරේනුයි = ඉන්ද්‍රියයි. නියම වශයෙන් ස්ත්‍රියගේම ඉන්ද්‍රිය = **ඉත්ථින්ද්‍රියං** ය. නිරයට පුං යයි කියයි. පුං සංඛ්‍යාත නිරයෙහි වෙහෙසේ. පීඩනයට පත්වේනුයි = පුරිසොයි කියයි. පුරුෂ ලිංගාදියෙහි අධිපතිත්වය කෙරේනුයි = ඉන්ද්‍රියයි. නියම වශයෙන් පුරුෂයාගේම ඉන්ද්‍රිය පුරිසින්ද්‍රියයි. ඒ දෙකෙහි එකිනෙකෙහි ස්වභාවය අනුව එකිනෙකාට කර්මජ රූප සහජ වෙයි.

කුසල විපාක කාය විඤ්ඤාණය හා යෙදුණු සුවදායි කායික සිහිල් ලක්ෂණයෙහි ප්‍රධානත්වය කෙරේනුයි ඉන්ද්‍රියයි. දුකම ප්‍රධානත්වය කෙරේනුයි - **දුක්ඛින්ද්‍රියංයි**. ප්‍රීතිය හා සතුට සංයෝගයෙන් යහපත් මනසක් මොහුට ඇත්තේනුයි = සුමනයි - යහපත් මනසෙහි ස්වභාවය සොමනස්සයි. චෛතසික සිසිල් කිරීම් ලක්ෂණයෙහි ප්‍රධානත්වය කෙරේනුයි • ඉන්ද්‍රියයි. සතුටම ඉන්ද්‍රිය වූයේ නුයි **සොමනස්සින්ද්‍රියං** යි. දොම්නස යෙදීමෙන් දුෂ්ට වූ මනසක් මොහුටනුයිද, පහවූ සුව වේදනා ඇත්තේ, පිළිකුල් මනසක් මොහුටනුයි දුම්මනයි. නරක සිතෙහි ස්වභාවය = දොමනස්සයි. චෛතසික අමිහිරි ලක්ෂණයෙහි ප්‍රධානත්වය කෙරේනුයි= ඉන්ද්‍රියයි. දොම්නසම ඉන්ද්‍රිය වූයේ **දොමනස්සින්ද්‍රියංයි**. සුවදුක් ආකාර පැවැත්මෙහි මධ්‍යස්ථ වේ. මධ්‍යස්ථ ආකාරයෙන් පිහිටි හෙයින් ඒ ආකාරයෙන් පවතීනුයි - උපේක්ෂායි. මධ්‍යස්ථ ලක්ෂණයෙහි ප්‍රධානත්වය කෙරේනුයි - ඉන්ද්‍රියයි. උපේක්ෂාවම ඉන්ද්‍රිය වූයේ **උපෙක්ඛින්ද්‍රියංයි**. මෙය කරණකොට අදහති. තමා හෝ අදහයි. ඇදහිලි මාත්‍රයම මෙයනුයි - සද්ධායි. අශ්‍රද්ධාවගේ මැඩපැවැත්වීම කරන හෙයින් අධිපති අර්ථයෙන් ඉන්ද්‍රියයි. ස්ථිරත්ව ලක්ෂණයෙන් හෝ ප්‍රධානත්වය කෙරේනුයි = ඉන්ද්‍රියයි. ශ්‍රද්ධාවම ඉන්ද්‍රිය වූයේ = **සද්ධින්ද්‍රියංයි**. ශක්තිමත් භාවය වීර්යයි. වීරයන්ගේ කර්ම හෝ නියම ක්‍රමයෙන් ගෙන යායුතුය. පැවැත්විය යුතු වූයේනුයි විරියයි. කුසීතකම මැඩපවත්වන හෙයින් අධිපති අර්ථයෙන් ඉන්ද්‍රියයි.

දැඩිව අල්ලාගැනීම් ලක්‍ෂණයෙන් ප්‍රධානත්වය කෙරේනුයි ඉන්‍ද්‍රියයි. වීර්යයම ඉන්‍ද්‍රිය වූයේ (වීර්යෙන්‍ද්‍රියයි) **විරියින්‍ද්‍රියංයි**, එයින් සිහි කෙරෙත්. තමා හෝ සිහිකරයි. සිහිකිරීම් ප්‍රමාණයම මෙයනුයි සතියි. සිහිමුලාව මැඩපවත්වන හෙයින් අධිපති අර්ථයෙන් ඉන්‍ද්‍රියයි. අභිවෘද්ධි ලක්‍ෂණයෙහි ප්‍රධානත්වය කෙරේනුයි ඉන්‍ද්‍රියයි. සිහියම ඉන්‍ද්‍රිය වූයේ **සතින්‍ද්‍රියංයි**. අරමුණෙහි සිත මනාව පිහිටයි තබයිනුයි = සමාධියි. විසිරීම මැඩපවත්වන හෙයින් අධිපති අර්ථයෙන් ඉන්‍ද්‍රියයි. නොවිසිරෙන ලක්‍ෂණයෙහි ප්‍රධානත්වය කෙරේනුයි ඉන්‍ද්‍රියයි. සමාධියම ඉන්‍ද්‍රිය වූයේ **සමාධින්‍ද්‍රියංයි**. මෙය දුකයයි ආදී ක්‍රමයෙන් ආර්ය සත්‍යයන් විශේෂයෙන් දැනගනීනුයි= ප්‍රඥායි. අටුවාවන්හි, වනාහි, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් පැනවීම් වශයෙන් ප්‍රඥාව යයි යුසේයි. අවිද්‍යාව මැඩපවත්වන අර්ථයෙන් ඉන්‍ද්‍රියයි. දැකීම් ලක්‍ෂණයෙහි ප්‍රධානත්වය කෙරේනුයි ඉන්‍ද්‍රියයි. ප්‍රඥාවම ඉන්‍ද්‍රිය වූයේ **පඤ්ඤින්‍ද්‍රියංයි.**

කෙළවරක් නොමැති සංසාර වෘත්තයෙහි නොදත් අමෘතපද වන සිව්සස් දහමම දැනගන්නෙමියි පිළිපන්නහුට උපදනා හෙයින්ද, ඉන්‍ද්‍රියාර්ථය හටගන්නා හෙයින්ද **අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්‍ද්‍රියයි** කියයි. සෝවාන් මාර්ග ඤාණයට මේ නාමයකි. ප්‍රථම මාර්ගයෙන් දත් සීමාව නොඉක්මවා, ඒ මාර්ගයෙන් දත්, ඒ චතුරාර්ය සත්‍යය ධර්මයන්ම දැනගන්නා හෙයින්ද ඉන්‍ද්‍රියාර්ථය හටගන්නා හෙයින්ද, මනාසේ දැනගත්තා වූ ඉන්‍ද්‍රිය = **අඤ්ඤින්‍ද්‍රියයි.** සෝවාන් ඵලාදී ස්ථාන සයක ඤාණයට මෙය නාමයකි. සම්පූර්ණ දැනුම ඇත්තා වූ, චතුරාර්ය සත්‍යයන්හි, නිමවන ලද, ඤාණ කෘත්‍යය ඇති, ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාටම උපදනා හෙයින්ද, ඉන්‍ද්‍රියාර්ථය හටගන්නා හෙයින්ද, **අඤ්ඤාතාවින්‍ද්‍රියයි.** චතුරාර්ය සත්‍යයන්හි නිමවන ලද කෘත්‍යයන් ඇති, සම්පූර්ණ දැනුම ඇත්තා වූ, චතුරාර්ය සත්‍යයන් අවබෝධකොට සිටින අයට, අභ්‍යන්තර ඉන්‍ද්‍රියාර්ථය සිද්ධ කරන හෙයින්, **අඤ්ඤාතාවින්‍ද්‍රියයි.** අර්හත්ඵල ඤාණයට මෙය නාමයකි. මේ සියල්ලම සුදුසු පරිද්දෙන්, ප්‍රධාන ආකාරාර්ථයෙන්, ප්‍රධාන දේසිතාර්ථයෙන් ප්‍රධාන දර්ශනාර්ථයෙන්, ප්‍රධාන ශ්‍රේෂ්ඨාර්ථයෙන්, ප්‍රධාන සේවනාර්ථයෙන් ඉන්‍ද්‍රියයෝය. භාග්‍යවත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ, උතුම් ඓශ්වර්යභාවයට පත් හෙයින්, කුසලාකුසල කර්මයන්හි, කිසිම ඓශ්වර්යයට පත් අයෙක් නොමැති හෙයින් ඉන්‍ද්‍රියය. එහෙයින් කර්මජ කුසලකර්ම ඉක්මවා යයි. එයින්ම ශ්‍රේෂ්ඨත්වයට පත්වූයේ යයි, ප්‍රධාන ආකාරාර්ථයෙන්ද, ප්‍රධාන

ශ්‍රේෂ්ඨාර්ථයෙන්ද ඉන්ද්‍රියයෝය. මේ සියල්ලම භාග්‍යවත් මුනීන්ද්‍රයන් වහන්සේ විසින් තත්වාකාරයෙන් ප්‍රකාශකරන ලද්දේය, අවබෝධ කරන ලද්දේනුයි, ඉන්ද්‍රදේසිතාර්ථයෙන්ද, ඉන්ද්‍ර දෘශ්‍යාර්ථයෙන්ද ඉන්ද්‍රියයෝ වෙති. ඒවාම භාග්‍යවත් මුනීන්ද්‍රයාණන් වහන්සේ විසින් සමහර ඒවා ගෝචර සේවනයෙන්ද, සමහර ඒවා භාවනා සේවනයෙන්ද සේවනය කරන ලද්දේනුයි ඉන්ද්‍ර සේවනාර්ථයෙන්ද ඉන්ද්‍රියයෝ වෙති. තවද අධිපති සංඛ්‍යාත ඓශ්වර්යාර්ථයෙන්ද, ඉන්ද්‍රියයෝ වෙති. චක්ෂු විඤ්ඤාණාදීන්ගේ ප්‍රවෘත්තියෙහි චක්ෂුරාදීන්ගේ සිද්ධිය ආධිපත්‍යයයි. එහි තීක්ෂ්ණ භාවයෙහිදී තීක්ෂ්ණත්වයද, මන්ද භාවයෙහිදී මන්දත්වයද වේ.

කාමධාතු ආදී දොළොස් විසඳුම් භව ප්‍රභේද වශයෙන් විස්තර කරන ලදී. කාමරාග සංඛ්‍යාත වූ කාමයෙන් යුක්ත වූ ධාතුව = **කාමධාතුයි.** කාමසංඛ්‍යාත වූ හෝ ධාතුව = **කාමධාතුයි.** කාමය හැර රූපයෙන් යුත් ධාතුව = **රූපධාතුයි.** රූපසංඛ්‍යාත වූ හෝ ධාතුව = **රූපධාතුයි.** කාමයද, රූපයද හැර අරූපයෙන් යුත් ධාතුව = **අරූපධාතුයි.** අරූප සංඛයාත වූ හෝ ධාතුව අරූපධාතුයි. එම ධාතුම නැවත භව ක්‍රමයෙන් යූසේයි. උපදීනුයි භවයයි කියයි. සංඥාවෙන් යුත් භවය **සංඥාභවයයි.** සංඥාගත වූ භවයනුයි **සඤ්ඤාභවයයි.** මේ භවයෙහි සංඥාවක් ඇත්තේනුයි **සඤ්ඤා** භවයි. එය කාමභවයද, අසඤ්ඤභවය අත්හළ රූපභවයද, නේවසඤ්ඤා නාසඤ්ඤා භවය අත්හළ අරූපභවයද වේ. හැඟීමක් දැනීමක් නොමැති භවය. **අසඤ්ඤ භවයයි.** එය රූප භවයෙහි එක් කොටසකි. ගොරෝසු භාවය නොමැති හෙයින් හැඟීමක් නැත්තේය. සියුම් බැවින් මුළුමනින්ම හැඟීමක් නැත්තේනුයි **නේවසඤ්ඤානාසඤ්ඤායි.** එවැනි ස්වභාවයන්ගෙන් යුත් භවය **නේවසසඤ්ඤානාසඤ්ඤා** භවයයි. තවද, ගොරෝසු සංඥාවන්ගේ අභාවයද, සියුම් සංඥාවන්ගේ අභාවයෙන්ද නෙවසඤ්ඤා නාසඤ්ඤාව මේ භවයෙයි නුයි = **නේවසඤ්ඤා නාසඤ්ඤාභවයයි.** එය අරූප භවයෙහි එක් කොටසකි. එක් රූපස්කන්ධයකින් ගැවසීගත් භවය **එකවොකාර භවයයි.** එක් ස්කන්ධයක් හෝ මේ භවයට නුයි **එකවොකාර** භවයි. එය අසඤ්ඤ භවයයි. අරූප ස්කන්ධ සතරකින් ගැවසීගත් භවය චතුවොකාර භවයයි. ස්කන්ධ සතරක් මේ භවයට නුයි චතුවොකාර භවයයි. එය අරූප භවයමය. ස්කන්ධ පහකින් ගැවසීගත් භවය, ස්කන්ධ පහක් මේ භවයට ඇත්තේනුයි පඤ්චවොකාර භවයයි. එය කාමභවයද රූප භවයෙහි එක් කොටසක්ද වේ.

ප්‍රථමධ්‍යානාදී දොළොස් විසඳුම් ධ්‍යාන සමාපත්ති වශයෙන් විස්තර කරන ලදී. **ඣානං** යන මෙහි බ්‍රහ්මවිහාර පමණක් අදහස් කරන ලදී. විතර්ක, විචාර, ප්‍රීති, සුව, චිත්තෙකග්‍රතා හා යෙදුණේ **පඨමජ්ඣාන** යි. ප්‍රීති, සුව, සිතෙහි එකඟබව හා යෙදුණේ **දුතියජ්ඣානයි**. සුව, සිතෙහි එකඟ බව හා යෙදුණේ **තතියජ්ඣානයි**. මධ්‍යස්ථභාවය සිතෙහි එකඟ බව හා යෙදුණේ **චතුත්ථජ්ඣානයි**. මෘදුවෙයි, මොලොක් වෙයිනුයි මෙත්තායි. සිනිඳුවේය යන අර්ථයි. මෘදුබැව්හි වූයේ හෝ මෘදු භාවයාගේ මේ පැවැත්මනුයි = **මෙත්තායි** විරුද්ධ ධර්මයන්ගෙන් මිදුණු බැවින්ද අරමුණෙහි, තදින් බැඳුණු හෙයින්ද විමුක්තියයි. සිතෙහි විමුක්තිය චෙතො විමුත්තියි. මෛත්‍රියයම චෙතො විමුත්තියනුයි - **මෙත්තා චෙතො විමුත්තියි** කරුණාව කියන ලද අර්ථ ඇත්තේමය. එය හා යුක්ත වූයේ සතුටුවෙත්. තෙමේ හෝ තුටුවෙයි. සතුටුවීම් මාත්‍රයම එයමනුයි - **මුදිතායි**. අවෛර වෙත්වායි ආදී ව්‍යාපාද ප්‍රහාණයෙන් මැදහත්භාවයට පැමිණීමෙන් මධ්‍යස්ථව සිටීනුයි = **උපෙක්ඛායි** මෛත්‍රී ආදී ත්‍රිවිධ බ්‍රහ්ම විහාර, ප්‍රථමාදී ධ්‍යානත්‍රයයෙහි යෙදී ඇත. උපෙක්‍ෂා බ්‍රහ්ම විහාරය චතුර්ථ ධ්‍යානයෙහි යෙදේ. පැතිරීම් වශයෙන් මෙයට කෙළවරක් නැත්තේනුයි අනන්තයි. අහස කෙළවරක් නැත්තේනුයි ආකාසානන්තයි. කසිණය උගුළුවා දැමූ අහසයි. අහස අනන්ත වූයේනුයි ආකාසානඤ්චයි. ඒ ආකාසානඤ්චය, අධිෂ්ඨාන අර්ථයෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් සහිත ධ්‍යානයට වාසස්ථානය වන්නේනුයි, දෙවියන්ට දේවායතනය මෙන්, ආකාසානඤ්චායතනයයි. ආකාසානඤ්චායතනයම සමාපත්තියක් වූයේනුයි ආකාසානඤ්චායතන **සමාපත්තියි**. පැතිරීම් වශයෙන් මෙයට කෙළවරක් නැත්තේනුයි = අනන්තයි. එ අහස අරමුණුකොට පවත්නා විඤ්ඤාණය අනන්ත වූයේමනුයි **ආනඤ්චංයි**. විඤ්ඤාණය ආනඤ්ච වූයේ විඤ්ඤාණඤ්චයයි නොකියා විඤ්ඤාණඤ්ච යයි යූසේයි. මේ මේ ආරෝපණය කළ ශබ්දයයි. ඒ විඤ්ඤාණඤ්චය අධිෂ්ඨාන අර්ථයෙන්, සම්ප්‍රයුක්ත ධර්මයන් සහිත ධ්‍යානයට වාසස්ථානය වන්නේනුයි දෙවියන්ට දේවායතනය මෙන් විඤ්ඤාණඤ්චායතනයයි. මෙයට කිසිවක් නැත්තේනුයි අකිඤ්චනයි. යටත් පිරිසෙයින් චිත්තයාගේ භංග ප්‍රමාණයක් පමණ වූ ඉතිරියක් නැතැයි යූසේයි. අකිඤ්චනයාගේ ස්වභාවය ආකිඤ්චඤ්ඤයි. ආකාසානඤ්චායතන විඤ්ඤාණයාගේ අභාවයට මෙය විශේෂ නාමයකි. ඒ ආකිඤ්චඤ්ඤය අධිෂ්ඨාන අර්ථයෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් සහිත ධ්‍යානයට වාසස්ථානය වන්නේනුයි, දෙවියන්ට දේවායතනය මෙන් ආකිඤ්චඤ්ඤායතනයයි. (දළ) ගොරෝසු සංඥාවන්ගේද, සියුම් සංඥාවන්ගේද අභාවයෙන් ඒ හා

සම්ප්‍රයුක්ත ධර්මයන් සහිත ධ්‍යානයාගේ සංඥාවක් නොවන්නේය. සංඥාවක් නැත්තේනුයි = නේවසඤ්ඤා නාසඤ්ඤංයි, නේවසඤ්ඤා නාසඤ්ඤයද, එය මනායතන ධම්මායතනයන්ට ඇතුළත්ව ඇති බැවින් ආයතනයක් වූයේමනුයි නේවසඤ්ඤානාසඤ්ඤායතනයයි. නොහොත්, මෙහි යම් ඒ සංඥාවක් වේද, එය වනාහි සංඥා කෘත්‍යයක් කිරීමට අසමත් හෙයින් නේවසඤ්ඤායි. සංස්කාරවාසේස සියුම් භාවයෙන් විද්‍යමාන හෙයින් අසඥ නොවේයයිද, සංඥාවක් නැත්තේද, අසඥාවක් නැත්තේද එයමැයි. සෙසු ධර්මයන්ට අධිෂ්ඨානාර්ථයෙන් වාසස්ථානය වන්නේනුයි, නේවසඤ්ඤානාසඤ්ඤායතනයයි ආකිඤ්චඤ්ඤායතන අරමුණෙහි සමාපත්තියට මේ විශේෂ නාමයකි. හුදෙක් මෙහි සඤ්ඤාව පමණක් එසේ නොවෙයි. තවද, වේදනාවද, වේදනාව නොවේ. අවේදනාවද නොවේ. සිතද සිත නොවේ. නොසිතද නොවේ. ස්පර්ශයද ස්පර්ශය නොවේ. ස්පර්ශය නොවන්නේද නොවේ. සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන්හිද මේ ක්‍රමයමැයි. සංඥා ශීර්ෂයෙන් වනාහි මෙම දේශනය කරන ලද්දේය. අවිද්‍යාදී දොළොස් විසඳුම් ප්‍රතීත්‍ය සමුත්පාද අංග වශයෙන් විස්තර කරන ලදී. පුරවන්ට නුසුදුසුය යන අර්ථයෙන් කාය දුශ්චරිතාදීන් නොවිඳිය යුතුය. නොලැබිය යුතුය යන අර්ථයි. ඒ නොවිඳිය යුත්ත විඳිතියි = අවිජ්ජායි. එයට විපරීත වූ කායසුචරිතාදිය විඳිය යුතුනම් වේ. ඒ විඳිය යුතු දේ නොවිඳිතියි - අවිජ්ජායි. ස්කන්ධයන්ගේ රාශ්‍යර්ථය, ඉන්ද්‍රියයන්ගේ ආධිපතෙය්‍යාර්ථය සත්‍යයන්ගේ සත්‍යාර්ථය නොදත් බව කෙරේනුයි - අවිජ්ජායි. දුක්ඛාදීන්ගේ පිඩාකිරීම් වශයෙන් කියන ලද සිව්ආකාර සිව් ආකාර අර්ථය ප්‍රකට නොකෙරේනුයි - අවිජ්ජායි. කෙළවරක් නොමැති සංසාරයෙහි සියලු, යෝනි, ගති, භව, විඤ්ඤාණස්ථිති සත්තාවාසයන්හි දුවවයිනුයි = අවිජ්ජායි. පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වූ ස්ත්‍රී පුරුෂාදීන්හි, ස්ත්‍රී පුරුෂ වශයෙන් සිත දුවයිද, විද්‍යමාන වන ස්කන්ධාදීන්හි ඒ අනුව සිත නොදුවයිනුයි - අවිජ්ජායි. තවද, චක්ඛුවිඤ්ඤාණාදීන්ට වස්තු ආරම්මණයන්ද, ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි, හේතුවෙන් හටගත් ධර්මයන්ගේ වැසීම කරන හෙයින්ද = අවිජ්ජායි. ප්‍රත්‍යයෙන් සකස්කළ දේ රැස් කෙරේනුයි = සංඛාරායි. අවබෝධ කෙරේනුයි = විඤ්ඤාණංයි. නැමේනුයි = නාමංයි. නමවනු ලැබේනුයි = නාමංයි. වෙනසට පත්වේනුයි = රූපංයි. ඉපදීම් පතුරුවයිනුයි = ආයතනංයි. දිගටම ඒවා ගෙනයයිනුයි ආයතනයි. ස්පර්ශ කෙරේනුයි = ඵස්සායි. විඳීනුයි = වේදනායි. ආශාවෙන් පීඩිත වේනුයි = තණ්හායි. තදින් අල්ලාගනියි. බොහෝසේ ගනීනුයි = උපාදානංයි. වෙයි

වැඩිදියුණු කෙරේනුයි = **භවොයි.** ඉපදී නම් = **ජාතියි.** දිරීම = **ජරායි.** මෙයින් මැරේනුයි = **මරණංයි.**

දුක්ඛාදි අටසිය අටක් විසඳුම් චතුරාර්ය සත්‍ය යෝජනා වශයෙන් විස්තර කරන ලදී. දුක්ඛං අභිඤ්ඤෙය්‍යං ආදීන්හි චතුෂ්ක සය වශයෙන් සූවිසි විසඳුමකි. චක්ඛු ජරාමරණං ආදී පෙය්‍යාලයෙහි, චක්ඛු අභිඤ්ඤෙය්‍යං සොතං අභිඤ්ඤෙය්‍යං ආදියෙන් ආරම්භව ජාති අභිඤ්ඤෙය්‍යායි අවසාන කිරීමෙහි එකසිය අනූපහකට අධික විසඳුම් යොදා කියන ලද, අනූපහකට අධික චතුෂ්ක සියයක් වෙයි. ඒ චතුෂ්කයන්ගේ වශයෙන් විසඳුම් හත්සිය අසූවක් වේ. ජරා මරණං ආදී චතුෂ්කයෙහි සතර විසඳුම්ද, සියලු අටසිය අටක් විසඳුම් වෙති. මෙහිද ඒ ඒ ධර්මයන්ට ප්‍රධාන වූ, හේතුව සමුදයයයි දතයුතුය. සියලු සංස්කාරයන්ගෙන් ශූන්‍ය වූ නිර්වාණය නිරෝධයයි දතයුතුය. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියාදි ත්‍රයයෙහිම ලෝකෝත්තර ඉන්ද්‍රියයන්ගේ අභාවය දැක්වීම පිණිස, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය නිරෝධයයි ආදිය යෙදේ. නිරෝධගාමිණී ප්‍රතිපදා යනු සම්පූර්ණ ආර්ය මාර්ගයමය. මෙසේ කියනකල්හි ඵලයටද මාර්ග ව්‍යවහාරය ලැබෙන හෙයින්, අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රියයන්ටද යෙදේ. නැවත දුක්ඛාදීන්ගේ විශේෂ දැනීම් ආදි වශයෙන් අටසිය අටක් විසඳුම් විස්තර කරන ලදී. නැවත දුක්ඛාදීන්ගේ විශේෂ දැනුම, අවබෝධය ආදී වශයෙන් අටසිය අටක් විසඳුම් විස්තර කරන ලදී. විශේෂ දැනුමද එයයි. අවබෝධ කළයුතු අර්ථයෙන් ප්‍රතිවේධයද එයමනුයි පරිඤ්ඤා ප්‍රතිවේධයි - පරිඤ්ඤා ප්‍රතිවේධයෙහිම අර්ථය = **පරිඤ්ඤාපටිවෙධට්ඨොයි** නැවත ජරාමරණ කෙළවරකොට ඇති ඒ දුක්ඛාදී වූ, දෙසියදෙකක් පද, සමුදයාදී සත් සත් පදයන්හි යොදා, අටසිය සතරක් වශයෙන්, එක්දහස් හයසිය දහසයක්ද වූ විසඳුම් විස්තර කරන ලදී. එහි ප්‍රධාන වූ හේතුව සමුදයයි. එහි නිරෝධයි සමුදය නිරෝධයයි. ඡන්දයම රාගයනුයි **ඡන්දරාගයි.** දුකෙහි සුව හැඟීමෙන් දුකට කැමැත්තක් හා ආශාවක් හටගනී. එය දුරුකිරීම **ඡන්දරාග නිරොධොයි** දුක හේතුවෙන් උපදින්නා වූ, සුවය, සොම්නස **දුක්ඛස්ස අස්සාදො** දුකෙහි අනිත්‍යතාව, දුකෙහි වෙනස්වන ස්වභාවය **දුක්ඛස්ස ආදීනවො** දුකෙහි කැමැත්ත හා ඇල්ම දුරුකිරීම කැමැත්ත හා ඇල්ම ප්‍රහාණය කිරීම **දුක්ඛස්ස නිස්සරණංයි.** හටගත්, ප්‍රත්‍යයෙන් හටගත්, හේතුවෙන් උපන් යම්කිසිවක් වෙයිද, ඉන් නිදහස්වීම නිරෝධයයි යන වචනයෙන් නිර්වාණයම දුකින් නිදහස්වීමයි. දුක් නිරෝධය, සමුදය නිරෝධය කැමැත්ත හා ආශා නිරෝධය දුකින් නිදහස්වීම යයි නොයෙක්

ප්‍රත්‍යයේ හටගත් ධර්මයන්ට විරුද්ධ වශයෙන්ද, නොයෙක් ක්‍රම වශයෙන්ද, සතර ස්ථානයෙක්හි නිර්වාණයම කිය ලද්දේයයි දතයුතුය. සමහරු ආහාර සමුදයෙන්, දුක්ඛ සමුදයද, ආහාර නිරෝධයෙන් දුක්ඛ නිරෝධයද, ස්වකීය කෘත්‍යය වශයෙන් සමුදය නිරෝධය දක්වයි. නොහොත් උදයව්‍යය දර්ශනයෙන් සමුදය නිරෝධයද විදර්ශනාව සහිත මාර්ගය ඡන්දරාග නිරෝධයයිද කියති. මෙසේ කියන කල්හි, ලෝකෝත්තර ඉන්‍ද්‍රියයන්ගේ, විදර්ශනා නොවන තත්වයට පැමිණීම සර්වසාධාරණ නොවේයයි පළමු කියන ලද ක්‍රමයම ගතයුතුය. ලෝකෝත්තර ඉන්‍ද්‍රියයන්හි ඡන්ද-රාග නොමැති හෙයින් ඡන්ද රාග නිරෝධයයි යෙදේ. ශරීරයෙහි ඡන්දරාගයෙන්ම ශරීරයෙහි කොටසක් වන කේශාදීන්හිද ඡන්දරාගය කරන ලද්දේම වේ. ජරාමරණාදියට පත්වන්නන් කෙරෙහි ඡන්දරාගයෙන්ම ජරාමරණයන්හිද ඡන්දරාග කරන ලද්දේම වේ. ආස්වාද ආදීනවයන්ද මෙසේ යෙදිය යුතුය.

නැවත ජරාමරණ කෙළවරකොට ඇති දුකඛාදි දෙසිය දෙකක් පද, සමුදයාදී, ෂට් ෂට් පදයන්හි යොදා හත්සිය එකොළහක් වශයෙන්ද ක්‍රම එක්දහස් හාරසිය දාහතරක් විසඳුම් විස්තර කරන ලදී. දැන් ජරාමරණ කෙළවර කොට ඇති, දෙසියඑකක් පද සප්ත අනුපස්සනාවන්හි යොදා, විස්තර කරන්ට පළමුව අනිත්‍යානුපස්සනාදී සත් අනුපස්සනාවන් විස්තර කරන ලදී. ඒ සියල්ල සියලු සත් සුද්ධික අනුපස්සනා විසඳුම් සමග එක්දහස් හාරසිය දාහතරක් විසඳුම් වෙති. අනිත්‍යයයි නුවණින් බැලීම **අනිච්චානුපස්සනායි.** එය නිත්‍ය සංඥාවට විරුද්ධය. දුකයයි නුවණින් බැලීම **දුක්ඛානුපස්සනායි.** එය සුව සංඥාවට විරුද්ධය. ආත්මයක් නොවේ යයි නුවණින් බැලීම **අනත්තානුපස්සනා** යි. එය ආත්ම සංඥාවට විරුද්ධය. ත්‍රිවිධ අනුපස්සනාවන්ගේ පරිපූර්ණත්වයට පත්හෙයින් කලකිරේනුයි = නිබ්බිදායි. කලකිරීමද නුවණින් බැලීමද එයම වූයේනුයි **නිබ්බිදානු පස්සනායි.** එය තෘෂ්ණාවට විරුද්ධය. සතර අනුපස්සනාවන්ගේ සම්පූර්ණත්වයට පත්හෙයින් නොඇලේනුයි විරාගයි. නොඇලීමද, නුවණින් බැලීමද එයමනුයි **නිරොධානුපස්සනායි.** එය හටගැනීමට විරුද්ධය. සයවැදෑරුම් අනුපස්සනාවන්ගේ සම්පූර්ණත්වයට පත්හෙයින් දුරුකෙරේනුයි පටිනිස්සග්ගයි. අත්හැරීමද නුවණින් බැලීමද එයමනුයි **පටිනිස්සග්ගානු පස්සනායි** එය තදින් අල්ලා ගැනීමට විරුද්ධය. ලෝකෝත්තර ඉන්‍ද්‍රියයන්ගේ නොමැති කල්හිද විදර්ශනාවට එළැඹී, සියලු සංස්කාර අනිත්‍යයහ. සියලු සංස්කාර දුකඛයහ. සියලු ධර්ම අනාත්මයහ යන වචනයෙන් ඒවාහිද අනිත්‍ය, දුකඛ, අනාත්මතාවය වේ. එහි නිත්‍ය, සුව, ආත්ම සංඥාවන්ගේද,

තෘෂ්ණාවෙහි හා ඇල්මෙහිද, අභාවයෙන්, නිරෝධවත් වූහයි නුවණින් බලන කල්හි, පරිත්‍යාග, අත්හැරීම, පැනයාම ආදී දුරුකිරීම් හටගන්නා හෙයින් ඒ සමග සත් අනුපස්සනා යොදන ලදැයි දතයුත්තාහ.

ජරාමරණාදියට පත්වන්නන් කෙරෙහි, අනිත්‍යාදී වශයෙන්, දුටුකල්හි, ජරාමරණාදියද අනිත්‍ය වශයෙන් දුටුවේ නම් වෙයි. ජරාමරණාදියට පත්වන්නන් කෙරෙහි කලකිරෙන්නේ, නොඇලෙන්නේ, ජරාමරණයෙහි කලකිරුණේද, නොඇලුණේද වේ. ජරාමරණවත් අය කෙරෙහි නිරෝධ වශයෙන් දුටුකල්හි, ජරාමරණද නිරෝධ වශයෙන් දුටුවේනම් වෙයි. ජරාමරණවත් අය අත්හරින්නේ ජරාමරණද අත්හරින්නේම වේයයි ජරා මරණයෙහි සප්ත අනුපස්සනා යොදන ලදැයි දතයුතුය.

දැන් ආදීනව ඤාණයට හේතුවූ, උත්පාදාදී පස් ආරම්මණයන්ගේ වශයෙන් උත්පාදාදීන්ද, ඒවාහි පර්යාය වචනද, පසළොස් විසඳුම් විස්තර කරන ලදී. නිර්වාණ ඥානයට, ඊට විරුද්ධ අරමුණු වශයෙන් අනුත්පාදාදී පසළොස් විසඳුම් විස්තර කරන ලදී. නැවත එම උත්පාද-අනුත්පාදාදි පදයන්ම යුගල වශයෙන් යොදා තිස් විසඳුම් විස්තර කරන ලදී. මෙසේ මේ ක්‍රමයෙන්ම සැට විසඳුම් වේ. එහි **උප්පාදො** යනු පෙර කර්ම හේතුවෙන් මෙහි උපතයි. **පවත්ති** යනු උපන්නහුගේ පැවැත්මයි. **නිමිත්තං** යනු සියලුම සංස්කාර නිමිතියි. යෝගාවචරයාට වනාහි සංස්කාර ආකාරවත්ව වැටහෙයි. එහෙයින් නිමිත්තයයි කියති. **ආයූහනා** යනු මතු ඉපදීමට හේතුවන කර්මයයි. එය රැස්කිරීම් අර්ථයෙන් ආයූහනයයි කියති. **පටිසන්ධි** යනු මත්තෙහි ඉපදීමයි. එය වනාහි භවාන්තර ගළපන හෙයින් ප්‍රතිසන්ධියයි කියයි. **ගති** යනු යම් ගමනකින් යම් ප්‍රතිසන්ධියක් වේද, එය යා යුතු හෙයින් ගතියයි කියයි. **නිබ්බත්ති** යනු ස්කන්ධයන්ගේ ඉපදීමයි. **උපපත්ති** යනු පැමිණියහුගේ හෝ උපන්නහුගේ එසේ කියන ලද විපාක ප්‍රවෘත්තියයි. **ජාති** යනු උපතයි. ඒ ඒ ස්ථානයන්හි උපදිනු ලබන සත්ත්වයින්ට යම් යම් ස්කන්ධ පහළවෙත්ද, ඒ ඒ ස්කන්ධයන්ගේ පළමු පහළවීමයි. **ජරා** යනු දිරීමයි. ඕ දෙවදෑරුම්ය. සිටියහුගේ වෙනස්වීම් ලක්ෂණයයි කියනු ලබන සංඛත ලක්ෂණයද, කැඩුණු බව ආදී නියමිත පැවැත්මෙහිදී ඇතිවන එක් භවයකට ඇතුළත් ස්කන්ධයන්ගේ පැරණිවීම, ඕ මෙහි අදහස් කරන ලදී. **බ්‍යාධි** යනු සප්තධාතු කිපීම් හේතුවෙන් හටගත්, පිත්-සෙම්-වාත එකතුවීම, ඍතු විපර්යාස, ආරක්ෂාව විකෘතිවීම

උපක්‍රම - කර්ම විපාක වශයෙන් ආබාධ අටවැදෑරුම්ය. විවිධ දුක් ගෙන එයි. නියම කරයිනුයි බ්‍යාධියි. පෙළයි. තවයි. කම්පා කෙරේනුයි බ්‍යාධියි. මරණං යනු මෙයින් දිවි තොර වේනුයි මරණයි. එය දෙයාකාරය. විනාශවීම් ලක්‍ෂණ සංඛ්‍යාත වූ, හේතුවකින් හටගත් ලක්‍ෂණයද, එක් භවයකට අයත් ජීවිතින්‍ද්‍රියයාගේ විනාශයද වශයෙනි. එය මෙහි අදහස් කරන ලදී. **සොකො** යනු සෝක කිරීමයි. ඤාති, වස්තු, රෝග, සීල දෘෂ්ටි ආදී ව්‍යසනයන්ගෙන් පීඩා වූවහුගේ සිතෙහි තැවීමයි. **පරිදෙවො** යනු වැළපීමයි. ඤාතීන්ගේ විනාශවීම් ආදියෙන් පීඩයට පත්වූවහුගේ වාග් ප්‍රලාපයි. **උපායාසො.** විශාල කරදරය ඥාති ව්‍යසනාදීන්ගෙන් පෙලුණහුගේ ඉතා අධිකව සිතෙහි දුක වැඩිවීමේ දෝෂයයි. උත්පාදාදී පහ, ආදීනව ඤාණයට වස්තු වශයෙන් යූසේයි. සෙස්ස ඒවාහි පර්යාය වචනයි. 'නිබ්බත්ති යනු ඉපදීමටද, ජාති යනු ප්‍රතිසන්ධියට පර්යායයි. ගති, උපපත්ති යන දෙක පැවැත්මටද, ජරාදීන් නිමිත්තටද, අනුප්පාදාදී වචනයන්ගෙන් නිර්වාණයම කියන ලදී. නැවත එම උප්පාද අනුප්පාද ආදි සැට පදයන් දුක්ඛ සුඛ යන පදයන් සමග යොදා සැට විසඳුම්, භය, ඛෙම යන පදයන් සමග යොදා සැට විසඳුම්ද, සාමිස, නිරාමිස පදයන් සමග යොදා සැට විසඳුම්ද, සංස්කාර නිර්වාණ පදයන් සමග යොදා සැට විසඳුම්ද, විස්තර කරන ලදී. එහි **දුක්ඛං** යනු අනිත්‍ය බැවින් දුක්ය. දුකට විරුද්ධ බැවින් සුඛය. යමක් දුක්නම් එය භයංයි. භයට විරුද්ධ වූයේ **ඛෙමයි.** යමක් බිය ගෙන දේද, එය සංසාර වෘත්තයට හා ලෝක පැවැත්මට ආධාරවන තත්වයෙන් නොමිදුණ හෙයින් **සාමිසංයි.** සාමිසයට විරුද්ධ වූයේ **නිරාමිසංයි.** යමක් සාමිසද එය සංස්කාර මාත්‍රයක්මය. සංස්කාරයන්ට විරුද්ධ බැවින්ද ශාන්ත හෙයින්ද නිර්වාණයයි කියයි. සංස්කාර වනාහි ඇවිලී ඇත. නිර්වාණය ශාන්තය. දුක් ආකාරයෙන්, භය ආකාරයෙන්, සාමිසාකාරයෙන්, සංස්කාරයෙන්දැයි, මෙසේ ඒ ඒ ආකාරයෙන් පැවැත්ම සඳහා ඒ ඒ ආකාරයෙන් යූසේයි.

පරිග්ගහට්ඨාදී එක්තිස් විසඳුම් ආර්ය මාර්ගක්‍ෂණ වශයෙන් විස්තර කරන ලද්දේය. ආර්යමාර්ග හා යෙදුණු ධර්ම මුල පටන් ඉපදීම් පිණිස අල්ලා ගන්නේනුයි පරිග්‍රහ නම් වේ. ඒවාහි ස්වභාවය = **පරිග්ගහට්ඨායි** ඔවුන්ගේම ඔවුනොවුන්ට පිරිවර භාවයෙන් **පරිවාරට්ඨායි** භාවනාව සම්පූර්ණ කිරීම් වශයෙන් **පරිපූරිට්ඨායි** ඒවාහිම සමාධි වශයෙන් එක අරමුණක අල්ලාගැනීම අපේක්‍ෂාකොට = **එකග්ගට්ඨායි.** නොයෙක් අරමුණුවල වික්‍ෂෙප අභාවය අපේක්‍ෂාකොට = **අවික්ඛෙපට්ඨායි.** වීර්ය වශයෙන් = **පග්ගහට්ඨායි.** සමාධි වශයෙන් ජලයෙහි දැමූ ස්නාන

චූර්ණයන් මෙන් වූ නොවිසිරී පවත්නා ස්වභාවය **අවිසාරට්ඨොයි.** සමාධි යෝගයෙන් නොකැළඹුණු හෙයින් **අනාවිලට්ඨොයි.** කම්පා නොවන හෙයින් **අනිඤ්ජනට්ඨොයි.**

**එකත්තුපට්ඨානවසෙන** යනු සමාධිය හා යෙදීමෙන් එක් අරමුණෙක්හි මනාව පිහිටීම් වශයෙන්. **ඨිතට්ඨො** යනු අරමුණෙහි නිශ්චල භාවයෙන් පිහිටීම. නිවණ අරමුණුකොට ඇති මොහුට අරමුණෙහි එල්ලීම් වශයෙන්නුයි **ආරම්මණට්ඨොයි.** එහිම පහසුවෙන් හැසිරීම් වශයෙන්නුයි. **ගොචරට්ඨොයි.** සසර දුක ප්‍රහාණය කිරීම් වශයෙන් නිර්වාණයාගේ (ප්‍රහානාර්ථය) **පහානට්ඨොයි.** කෙලෙස් අත්හැරීම් වශයෙන් ආර්ය මාර්ගයාගේ පරිත්‍යාගාර්ථය **පරිච්චාගට්ඨොයි.** දෙයාකාරයකින් නැගිටීම් වශයෙන් **වුට්ඨානට්ඨොයි.** භාවනා අරමුණු නොවන පැවතුම්හි නැවතුම් වශයෙන් **නිවත්තනට්ඨොයි.** නිවුණු බැවින් **සන්තට්ඨොයි.** නොතැවෙන හෙයින්ද, ප්‍රණීත බැවින්ද **පණීතට්ඨොයි.** කෙලෙසුන්ගෙන් මිදුණු බැවින්ද, අරමුණෙහි ඇලුණු බැවින්ද **විමුත්තට්ඨොයි.** ආශ්‍රවයන්ට විෂය නොවීමෙන් පිරිසිදු බැවින් **අනාසවට්ඨොයි** ක්ලේශ කාන්තාරයද සංසාර කාන්තාරයද ඉක්මවීමෙන් **තරණට්ඨොයි.** සංස්කාර ලකුණු අභාවයෙන් **අනිමිත්තට්ඨොයි.** තෘෂ්ණා ප්‍රාර්ථනා අභාවයෙන් **අප්පණිහිතට්ඨොයි.** ආත්ම සාර අභාවයෙන් **සුඤ්ඤතට්ඨොයි.** විමුක්ති රසයෙන් එක්සෙයක් බැවින්ද සමථ විදර්ශනාවන්ගේ ඔවුනොවුන් ඉක්මවා නොයන බැවින්ද, **අනතිවත්තනට්ඨොයි.** ඔවුන්ගේම එකට බැඳීම **යුග නද්ධට්ඨොයි** ආර්ය මාර්ගයාගේ සංස්කාරයන්ගෙන් නික්මීමෙන් **නීය්‍යානට්ඨොයි.** නිවණට පැමිණවීමෙන් **හෙතුට්ඨොයි** නිවන අවබෝධ කිරීමෙන් **දස්සනට්ඨොයි** අධිපති භාවයෙන් **ආධිපතෙය්‍යට්ඨොයි,** යනාදී වශයෙන් සමථ ආදී සතර විසඳුම් සමථ විදර්ශනා වශයෙන් විස්තර කරන ලදී. අනිත්‍යාදී වශයෙන් නුවණින් බලනහෙයින් **අනුපස්සනට්ඨොයි** එකට වෙළී පවත්නා සමථ-විදර්ශනා දෙකට එක්රස භාවයෙන් **අනතිවත්තනට්ඨොයි.**

ශික්ෂාදී නව විසඳුම් ආර්ය මාර්ගයාගේ මුල, මැද, අග වශයෙන් දක්වන ලදී. හික්මිය යුතු හෙයින් **සික්ඛායි.** ඒවා සමාදන් වියයුතු හෙයින් **සමාදානට්ඨොයි,** සීලයෙහි පිහිටා කමටහන් වශයෙන් අරමුණු ගත්තහුගේ භාවනා පවත්වන ස්ථානය බැවින් **ගොචරට්ඨොයි.** සමථ හෝ විදර්ශනා භාවනා කාලයෙහි, කුසීත වශයෙන් හැකිලුණු සිතට, ධම්මවිචය, වීර්ය, ප්‍රීති සම්බොජ්ඣංග භාවනා වශයෙන් උත්සාහ

කිරීම් අර්ථයෙන් **පග්ගහට්ඨෙයාායි.** නොසන්සුන් වශයෙන් අවුල් වූ සිතට, පස්සද්ධි, සමාධි, උපේක්ෂා ආදී බොජ්ඣංග වැඩීම් වශයෙන් සන්සිඳුවීම් අර්ථයෙන් **නිග්ගහට්ඨෙයාායි.**

**උභො විසුද්ධානං** යනු දෙපරිද්දෙන් පිරිසිදු වූවන්ගේ හැකිලුණු හා විසිරුණු පක්ෂයෙන් වළක්වා පරිශුද්ධ චිත්තයන්ගේ යන අර්ථයි. මධ්‍යම ප්‍රමාණයෙහි සිටියවුන්ගේ නොකැඩී පවත්නා වූ චිත්තයන්ගේ වශයෙන් බහුවචන කරන ලදැයි දතයුතුය. උත්සාහය හා තැන්පත් වීමෙහිදී තදින් නොගැනීම. **අජ්ඣුපෙක්ඛනට්ඨෙයාායි.** සමව පැවති චිත්තයාගේ වශයෙන් ක්‍රියාකොට භාවනාවෙහි විශේෂතාවයන්ට පැමිණීම **භාවනා විසෙසාධිගමට්ඨෙයාායි.** ආර්යමාර්ගය පහළවීම් වශයෙන් **උත්තරි පටිවෙදට්ඨෙයාායි.** ආර්ය මාර්ගයෙන් සිදුවූ චතුරාර්ය සත්‍යයන් අවබෝධ වීම් වශයෙන් **සච්චාභිසමයට්ඨෙයාායි** ඵල සමාපත්ති වශයෙන් නිරොධයෙහි පිහිටීම් අර්ථය **පතිට්ඨාපකට්ඨෙයාායි** එය වනාහි ඊහා යුක්ත පුද්ගලයා නිරෝධ සංඛ්‍යාත නිර්වාණයෙහි පිහිටුවයි.

ශ්‍රද්ධා ඉන්‍ද්‍රිය ආදී පස් විසඳුම් ඉන්‍ද්‍රියාර්ථ වශයෙන් කියන ලද්දේය. **අධිමොක්ඛට්ඨො** යනු ස්ථිර ලෙස පිහිටීම යන අර්ථයි. **උපට්ඨානට්ඨො** යනු අරමුණට එළඹ පිහිටන අර්ථයයි. **දස්සනට්ඨො** යනු ඇති තතු බැලීම් අර්ථයි. ශ්‍රද්ධා බල ආදී පස් විසඳුම් බලාර්ථ වශයෙන් විස්තර කරන ලදී. කම්පානොවන අර්ථයෙන් ශ්‍රද්ධාව බලයක් වේනුයි = **සද්ධාබලං අස්සද්ධියෙ** යනු අශ්‍රද්ධාවෙන්. අස්සද්ධියං යනු ශ්‍රද්ධාවට ප්‍රතිපක්ෂ වූ සිත් ඉපදීමයි. **අකම්පියට්ඨො** යනු කම්පානොවිය යුතුය. කම්පාවීමට නොහැක්කේය යන අර්ථයි. **කොසජ්ජෙ** යනු කුසීතභාවයයි කියනු ලබන ථීනමිද්ධයෙන්, **පමාදෙ** යනු සිහියට ප්‍රතිවිරුද්ධ සිත් ඉපදීමෙන්, **උද්ධච්චෙ** යනු නොසන්සුන් බවයයි කියනු ලබන උද්ධච්චයෙන් **අවිජ්ජාය** යනු මෝහයෙන්,

සතිසම්බොජ්ඣංගාදී සත් විසඳුම් බොජ්ඣංග වශයෙන් විස්තර කරන ලදී. අවබෝධයෙහි කොටස බොජ්ඣංගයි. ප්‍රශස්ත වූද, සුන්දර වූද, බොජ්ඣංගය සම්බොජ්ඣංගයි. සිහියම සම්බොජ්ඣංගය වූයේ **සති සම්බොජ්ඣංගායි.** ධර්මය විමසයිනුයි - ධම්මවිචයයි. ප්‍රඥාවට මෙය නමකි. **පවිචයට්ඨො** යනු සෙවීම් අර්ථයි. සතුටට පැමිණේනුයි **පීතියි. ඵරනණට්ඨො** යනු පැතිරවීම් අර්ථයයි. සන්සිඳීම **පස්සද්ධියි උපසමට්ඨො** යනු දාහ නැති යන අර්ථයි. සමව බලානුයි **උපෙක්ඛායි.** සමව බලයි.

අපක්ෂපාතීව බලන්නේය යන අර්ථයි. එය මෙහි තත්‍රමජ්ඣත්තුපෙක්ෂාවයි. බොජ්ඣංගුපේක්ෂාවයයිද එයට නමකි. විමසා බැලීම ලක්ෂණකොට ඇත්තේ **පටිසංඛාණට්ඨායි.**

සම්මාදිට්ඨි ආදී අට විසඳුම් මාර්ග වශයෙන් විස්තර කරන ලදී. යහපත්ව බලයි. එයින් මනාව බලත්. ප්‍රශස්ත සුන්දර වූ දෘෂ්ටියනුයි. **සම්මාදිට්ඨියි.** ඒ සම්‍යක් දෘෂ්ටියෙන් **තස්සා සම්මාදිට්ඨියා.** යහපත්ව කල්පනා කරයි. මනාව එයින් සංකල්පනය කරත්. ප්‍රශස්ත, සුන්දර වූ සංකල්පයනුයි - **සම්මා සංකප්පොයි. අභිරොපණට්ඨො** යනු සිත අරමුණට නංවන අර්ථයයි. ආරම්මණාභිනිරොපණට්ඨො යනුද පාඨයි. යහපත්ව කියයි. යහපත් දැයක් එයින් කියති. ප්‍රශස්ත වූ හෝ සුන්දර වූ වචන යනුයි **සම්මා වාචායි.** වැරදි වචනයන්ගෙන් (කථාවෙන්) වැළකීමට මෙය නාමයකි. **පරිග්ගහට්ඨො** යනු සිවුවැදෑරුම් වාක් සංවරය ලබාගැනීම, යහපත්ව කරයි යහපත් වූවක් එයින් කරත්. ප්‍රශස්ත වූ හෝ සුන්දර වූ කර්මාන්තයක්නුයි = යහපත් කාර්යයයි. යහපත් කාර්යයම - **සම්මා කම්මන්තොයි** වැරදි ක්‍රියාවලින් වැළකීමට මෙය නාමයකි. **සමුට්ඨානට්ඨො** යනු තෙවැදෑරුම් කාය සංවර හටගැනීම් අර්ථයි. යහපත්ව ජීවත් වේ. මනාව එයින් ජීවත් වෙති. ප්‍රශස්ත වූ හෝ සුන්දර වූ දිවිපැවැත්මනුයි = **සම්මා ආජීවොයි** වැරදි දිවිපැවැත්මෙන් වැළකීමට මෙය නාමයකි. **වොදානට්ඨො** යනු පිරිසිදුවීම් අර්ථයි. යහපත්ව උත්සාහ කරයි. එයින් යහපත්ව උත්සාහ කරයි. ප්‍රශස්ත වූ හෝ සුන්දර වූ ව්‍යායාම යනුයි **සම්මා වායාමොයි.** යහපත්ව සිහිකරයි. එයින් මනාව සිහිකරත්. ප්‍රශස්ත වූ හෝ යහපත් වූ සිහි යනුයි **සම්මා සතියි.** යහපත්ව සිත එකඟ කරයි. යහපත්ව එයින් සිත එකඟ කෙරෙත්. ප්‍රශස්ත වූ හෝ සුන්දර වූ සමාධි යනුයි = **සම්මා සමාධියි.**

ඉන්ද්‍රියාදී දස විසඳුම් රාශිකොට අනුපිළිවෙළින් විස්තර කරන ලදී. **ආධිපතෙය්‍යට්ඨො** යනු ප්‍රධානාර්ථය වශයෙනි. අධිපති අර්ථයි. **අකම්පියට්ඨො** යනු විරුද්ධ ධර්මයන්ගෙන් කම්පා කරන්ට නොහැකි වන්නේය යන අර්ථයි. **නීය්‍යාණට්ඨො** යනු ලෞකික ලෝකෝත්තර ධර්මයන්ට විරුද්ධ දේවලින් නික්මයාමයි. **හෙතුට්ඨො** යනු මිථ්‍යා දෘෂ්ටි ආදීන්ගේ දුරුකිරීම සඳහා සම්‍යග් දෘෂ්ටි ආදීන් හේතුවේනුයි, සියලුම සම්‍යග් දෘෂ්ටි ආදීන් නිර්වාණයට පමුණුවන හේතු වේනුයි හෙතුට්ඨායි සතිපට්ඨාන ආදී අරමුණුවලට ඇතුල්වී, ඇතුළට වැදී වැටහෙන හෙයින් උපට්ඨානයි. සිහියම උපට්ඨාන වූයේ **සතිපට්ඨානයි.** කාය, වේදනා, චිත්ත

ධර්මයන්හි අසුභ, දුක්ඛ, අනිත්‍ය, අනාත්ම ආකාරයෙන් ගැනීම් වශයෙන්, සුභ, සුඛ, නිත්‍ය, ආත්ම සංඥාවන් ප්‍රහාණ කෘත්‍යයන් සිදුවීම් වශයෙන්ද, පැවති සිවු ආකර බෙදීමක් වේ. මේවා පූර්ව භාගයෙහි නොයෙක් සිත්වල ලැබේ. මාර්ග ක්ෂණයෙහි වනාහි, එකම සිහිය සිවුනාමයන්ම ලබයි.

සම්‍යක් ප්‍රධානයන්හි, බලවත් සේ උත්සාහ කරනුයේ මෙය කරණකොටගෙනනුයි = පධානං = ප්‍රධාන නම් වේ. යහපත් ප්‍රධානය. **සම්මප්පධානයි.** මනාව මෙයින් බලවත් සේ උත්සාහ කෙරේනුයි = සම්මප්පධානයි. එය සෝභන වූයේම කෙලෙස් විරූපී භාවයෙන්, වෙන්වූ බැවින් වීර්යයක් වූයේ, හිතසුව නිෂ්පාදනය කරන අර්ථයෙන්ද, ශ්‍රේෂ්ඨ භාවයක් ගෙන එන බැවින්ද, ප්‍රමුඛ භාවය කරන හෙයින්ද, සම්මප්පධානයි. මෙය වීර්යයට විශේෂ නාමයකි. උපන්නා වූද, නූපන්නා වූද, නූපන්නා වූද, උපන්නා වූද, අකුසලයන්ගේ, ප්‍රහාණ උත්පත්ති, උත්පාද, ස්ථිති, කෘත්‍ය සිදුකිරීම් වශයෙන්ද පැවැත්මෙන්ද-බෙදීම සතර ආකාර වෙයි. ඒවාද පූර්ව භාගයෙහි නොයෙක් සිත්හි ලැබෙත්. මාර්ග ක්ෂණයෙහි එකක්ම වූ වීර්යය සිව්නාමයන් ලබයි.

පදහනට්ඨො යනු උත්සාහ කිරීම් අර්ථයි. පධානට්ඨො යනුද පාඨයි. එම අර්ථයමය. **ඉද්ධිපාදානං** යන මෙහි, ඡන්ද, වීර්ය, චිත්ත, වීමංසාවන්හි එක එක සිද්ධවේනුයි ඉද්ධියි. සමෘද්ධ වෙයි. නිෂ්පාදනය වේයයි අර්ථයි. සත්ත්වයෝ මෙයින් සමෘද්ධ වෙති. සමෘද්ධ වූයේ, අභිවෘද්ධියට පත්වූයේ, උසස් බවට ගියේ වෙත්නුයි - ඉද්ධියි. පළමු අර්ථයෙන් ඍද්ධියම පාදය වූයේ **ඉද්ධිපාදොයි.** පාදො යනු අධිගම ආධාර උපායයයි යන අර්ථයි. යම්හෙයකින් මතු මතු විශේෂ සංඛ්‍යාත ඍද්ධියට පත්වෙත්ද? පැමිණෙත්ද එහෙයින් පාදයයි කියයි. මේ ඡන්දාදීන් පූර්ව භාගයන්හිදී අධිපති වශයෙන් නොයෙක් සිත්වල ලැබේ. මාර්ග ක්ෂණයෙහි එකටම ලැබේ. **ඉජ්ඣනට්ඨො** යනු නිෂ්පාදනය වන අර්ථයි. පිහිටන අර්ථය හෝ වේ. **සච්චානං** යනු චතුරාර්ය සත්‍යයන්ගේ. **තථට්ඨො** යනු ස්වභාව අනුවය යන අර්ථයි. මේ අටවැදෑරුම් විසඳුම් ලෞකික ලෝකෝත්තර මිශ්‍රවූවාහු වෙති. **යොගානං** යනු චතුරාර්ය මාර්ග ප්‍රයෝගයන්ගේ, **පටිප්පස්සද්ධට්ඨො** යනු සතර ආර්ය මාර්ග ඵලයන්ගේ සංසිඳීම් අර්ථයයි. මාර්ග ප්‍රයෝග වනාහි ඵලක්ෂණයෙහි සංසිඳුණේ වෙයි. කෘත්‍යය නිමවූ හෙයිනි. මාර්ග ප්‍රයෝගයන්ගේ ඵල උදාවීමෙන් සංසිඳුණු භාවය හෝ වෙයි. **ඵලානං සච්ඡිකිරියට්ඨො** යනු ආර්ය ඵලයන්ගේ ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන්

ප්‍රත්‍යක්ෂ කරන්නාවූය යන අර්ථයි. අරමුණෙහි සාක්ෂාත් කිරීම කියන ලද්දේ වෙයි. ලක්ෂණයෙහි ප්‍රතිලාභ සාක්ෂාත් කිරීම හෝ වෙයි.

විතර්කාදී පස්විසඳුම් ධ්‍යානාංග වශයෙන් විස්තර කරන ලදී. කල්පනා කිරීම = **විතක්කොයි**. කල්පනා කිරීමයයි යූසේයි. හැසිරීම = **විචාරොයි**, විචාරයයි. ඔබිනොබ හැසිරීම යයි යූසේයි. **උපවිචාරට්ඨො** යනු පිරිමදියි යන අර්ථයි. **අභිසන්දනට්ඨො** යනු තෙත් කිරීම යන අර්ථයි. සමාධි වශයෙන් සිතෙහි එකඟවීම යන අර්ථයි.

ආවර්ජනාදී පසළොස් විසඳුම් විස්තරාත්මක වශයෙන් විස්තර කරන ලදී. පංචද්වාර, මනෝද්වාරයන්හි භවංගාරම්මණයෙන් අන් අරමුණුවල චිත්ත සන්තානය නැමෙන කල්හි ද්විචිත්තයන්ට ඇතිවන ආවර්ජනය **ආවජ්ජනට්ඨොයි** විඤ්ඤාණයාගේ දැනගැනීම් අර්ථය **විජානනට්ඨොයි**. ප්‍රඥාවගේ විශේෂ දැනීම **පජානනට්ඨොයි**. සඤ්ඤාවගේ හැඳිනගැනීම **සංජානනට්ඨොයි**. සමාධියගේ එක් අරමුණක පැවතීම **එකාරම්මණට්ඨොයි**. දෙවන ධ්‍යානයෙහිදී සමාධිය විතර්ක, විචාරයන්ගෙන් තොරව තනිව උදාවේනුයි, **එකොදියි** කියයි. විතර්ක, විචාරයන් නොවැඩුණු හෙයින්, මැඩපවත්වා අග්‍රව ශ්‍රේෂ්ඨව උපදී යන අර්ථයි. ලෝකයෙහි තනි ද්‍රව්‍යය ශ්‍රේෂ්ඨයයි කියයි. විතර්ක, විචාරවලින් තොරව, තනිව අසහායව උදාවේයයි කීම සුදුසුය. සියලුම කුසල සමාධීන්, නීවරණයන් අතර උද්ධච්චයටම විරුද්ධය. එම නීවරණයන්ගෙන් පීඩිත නොවුණේ, ශ්‍රේෂ්ඨව උදාවෙයි හෝ, ඔවුන්ගෙන් වෙන්ව අසහායව පහළවේනුයි එකොදි යන්න යෙදේ. **අභිඤ්ඤාය ඤාතට්ඨො** යනු ඤාත පරිඥාවෙන් ස්වභාවය දැනගන්නා අර්ථයි. **පරිඤ්ඤාය තීරණට්ඨො** යනු තීරණ පරිඥාවෙන් අනිත්‍යාදි වශයෙන් විමසා බැලීමයි. **පහාණස්ස පරිච්චාගට්ඨො** යනු ප්‍රහාණ පරිඥාවෙන් විරුද්ධ දෑ අත්හැරීම් යන අර්ථයි. සමව පැවති භාවනාවගේ එක් රසයයි යන අර්ථයි. **ඵස්සනට්ඨො** යනු ස්පර්ශ කිරීම් යන අර්ථයි. විඳීම් අර්ථයි. පීඩා සමූහයේ බර උසුලන බැවින් **ඛන්ධට්ඨොයි** ශූන්‍යතා වශයෙන් බැලීම = **ධාතුට්ඨොයි**. ප්‍රත්‍යයන් එක්රැස්ව කරන ලදැයි සැලකීම **සංඛතට්ඨො** ඊට විරුද්ධ වූයේ **අසංඛතට්ඨොයි**.

චිත්තර්ථාදී පසළොස් විසඳුම් සිත පිළිබඳව විස්තර කරන ලදී. **චිත්තට්ඨො** යනු අරමුණ සිතයි නුයි (චින්තං) චිත්තයයි. අවබෝධ කරන්නේ යන අර්ථයි. මෙහි යම් ජවනයක් වේද, එය ජවන වීථි වශයෙන් තමාගේ

සන්තානය විසිතුරු කරයිනුයි - චිත්තං (සිතයි) යම් විපාකයක් වේද, එය කර්ම හා කෙලෙස්වලින් රැස් කළේනුයි චිත්තංයි සියල්ලම සුදුසු පරිද්දෙන් විසිතුරු බැවින්ද සිතය. විසිතුරු කරන හෙයින්ද සිතය. සංසාර වෘත්තයට යමක් ප්‍රත්‍යය වේද, ඒ සසර දුක රැස්කෙරේනුයිද = සිතය. මෙසේ අරමුණෙහි විසිතුරු ආදියෙන් **චිත්තට්ඨොයි** (සිත යන අර්ථය වේ) සිතෙහි ඉපදීමත් ඵලයෙහි ඉපදීමත් අතර අන්තරයක් නැතැයිනුයි = අනන්තරයි. අනන්තරයාගේ ස්වභාවය = ආනන්තරියයි චිත්තයාගේ ආනන්තරිය චිත්තානන්තරියයි. ඒ චිත්තානන්තරියාර්ථය **චිත්තා නන්තරියට්ඨොයි** රහතුන්ගේ චුති සිත හැර යම් කිසිවෙකුගේ අනන්තර නිරුද්ධ සිතට අනන්තරව සිතක් ඉපදීමේ සමර්ථ භාවයයි. මාර්ග සිතට අනන්තරව ඵල සිතෙහි ඉපදීමේ සමර්ථ භාවයයි යන අදහසයි. **චිත්තස්ස වුට්ඨානට්ඨො** යනු ගෝත්‍රභූ සිතට නිමිත්තෙන්ද මාර්ග සිතට නිමිත්තෙහි පැවැත්මෙන් නැගිටීම යන අර්ථයි. **චිත්තස්ස විවට්ටනට්ඨො** යනු ඒ සිත් දෙකින් කියන ලද පරිදි නැගිටියහුට නිර්වාණයෙහි නැඹුරුවීමයි. **චිත්තස්ස හෙතුට්ඨො** යනු සිතට හේතුප්‍රත්‍යය වූ නවවැදෑරුම් හේතුන්ගේ හේතු අර්ථයයි. **චිත්තස්ස පච්චයට්ඨො** යනු සිතට වස්තු අරමුණු වශයෙන් නොයෙක් ප්‍රත්‍යයන්ගේ ප්‍රත්‍යයාර්ථයයි. **චිත්තස්ස - වත්ථුට්ඨො** යනු සිතට වස්තු වූ ඇස, කන, නාසය, දිව, කය, හෘදය වස්තුව යනාදීන්ගේ වස්තු අර්ථයයි. **චිත්තස්ස භූමට්ඨො** යනු සිතෙහි උපදින ප්‍රදේශ වශයෙන් කාමාවචර ආදී භූමීන් යන අර්ථයි. **චිත්තස්ස ආරම්මණට්ඨො** යනු රූපාදී අරමුණුය යන අර්ථයි. පුරුදු අරමුණෙහි හැසිරෙන අර්ථයෙන් ගොචරට්ඨොයි මතු කියන විඤ්ඤාණචර්යා වශයෙන් **චරියට්ඨොයි** නොහොත් ක්‍රියා හැසිරවීම් වශයෙන් **චරියට්ඨොයි**. සිතෙහි ගමන් කිරීම් වශයෙන් දුර ළඟ අරමුණු ගැනීම් වශයෙන් **ගතට්ඨොයි. අභිනීහාරට්ඨො** යනු ගත් අරමුණින්, අන් අරමුණු මෙනෙහි කිරීමට සිතෙහි ඉදිරියට ගෙන යාම. **චිත්තස්ස නීය්‍යානට්ඨො** මාර්ග සිතෙහි සසරින් පිටව යන අර්ථයි. නෛෂ්ක්‍රම්‍යය ලදහුට කාමච්ඡන්දයෙන් ඉවත් වේනුයි ආදී ක්‍රමයෙන් **චිත්තස්ස නිස්සරණට්ඨොයි.**

එකඟ බව ආදී දෙසාළිස් විසඳුම් ඒකත්වය සම්බන්ධයෙන් විස්තර කරන ලදී. **එකත්ත** යනු අරමුණෙහි එකඟ බවයි. එක් අරමුණෙහිය යන අර්ථයි. ප්‍රථමධ්‍යාන වශයෙන් ඇතුළට වැදීම් අර්ථය - **පක්ඛන්දනට්ඨොයි.** ද්විතීය ධ්‍යාන වශයෙන් සතුටුවීම් අර්ථය - **පසීදනට්ඨොයි.** තෘතියධ්‍යාන වශයෙන් නිශ්චලවීම් අර්ථය - **සන්තිට්ඨනට්ඨොයි.** චතුර්ථධ්‍යාන වශයෙන්

මිදීම් අර්ථය - මුචචනට්ඨෝයි. එය ශාන්තයයි ප්‍රත්‍යවේක්‍ෂා වශයෙන් බැලීම = පසසනට්ඨො යානිකත ආදී පහ සමාධියෙහි වසීභාව විශේෂයන්ය. යානිකතට්ඨො යනු ගොනුන් යොදා නැගී යාහැකි යානයක් මෙන් කරගත්, වත්‍ථුකතට්ඨො පිහිටන අධිතාලමක් සේ කළ, මනාසේ පුහුණු කළ, අනුට්ඨිතට්ඨො එළඹ සිටි බව, පරිචිතට්ඨො හාත්පසින් පුරුදු කළ බව, සුසමාරද්ධෝ මනාව පටන්ගත් යහපත් සේ කරන ලද්දේ යයි අර්ථයි. මෙනෙහි කිරීම, සමවැදීම, අධිෂ්ඨානය, නැගිටීම, ප්‍රත්‍යවේක්‍ෂා යන වසී කිරීම් වශයෙන් යන පද පහ පිළිවෙළින් යෙදිය යුත්තාහ. කසිණ ආදී අරමුණුකොට භාවනාවෙහි මස්තකප්‍රාප්ත වූ කල, චිත්ත චෛතසිකයන්ගේ, අල්වාගැනීම, ළඟින් හැසිරීම පරිපූර්ණාර්ථයයි පරිපූරට්ඨෝයි.

එම කරුණුවලින්ම මනාව සිත තැන්පත් වූ බැවින්, එක් අරමුණක එක්තැන්වීමෙන් ගැළපීම සමොධානට්ඨෝයි. ඒවාහිම බලප්‍රාප්තියෙන් අරමුණ මැඩපවත්වා පිහිටීම් වශයෙන් අධිට්ඨානට්ඨෝයි. සමථයෙහි හෝ විදර්ශනාවෙහි මුලපටන් ආදරයෙන් සේවනය කිරීම් වශයෙන් ආසෙවනට්ඨෝයි බහුල භාවයට පත්කළහුට, යහපත් ආකාරයෙන්, හටගැනීම් වශයෙන් සුසමුග්ගතට්ඨෝයි මනාව හටගත්තහුට විරුද්ධ කෙලෙස් ආදීන්ගෙන් මනාව මිදීම් වශයෙන්ද, අරමුණෙහි මනාව යෙදීම් වශයෙන්ද, සුවිමුත්තට්ඨෝයි.

බුජ්ඣනට්ඨාදි සතර පද බොජ්ඣංග වශයෙන් කියන ලදී. සෝවාන් මාර්ගයෙහි අවබෝධ කළයුතු කොටස් බුජ්ඣනට්ඨො යි. අවබෝධ කරන අර්ථයි. සකෘදාගාමි මාර්ගයෙහි අවබෝධ කළයුතු කොටස් අනුබුජ්ඣනට්ඨෝයි මනාව අවබෝධ කළයුතුයි යන අර්ථයි. අනාගාමි මාර්ගයෙහි අවබෝධ කළයුතු කොටස් පටිබුජ්ඣනට්ඨෝයි. ප්‍රබෝධයෙන් අවබෝධ කළයුතුය යන අර්ථයි. අර්හත් මාර්ගයෙහි අවබෝධ කළයුතු කොටස් සම්බුජ්ඣනට්ඨෝයි. මනාව අවබෝධ කළයුතුය යන අර්ථයි. දර්ශන මාර්ග අවබෝධයෙහි කොටස් අනුබුජ්ඣනට්ඨෝයි. භාවනා මාර්ග අවබෝධයේ කොටස් පටිබුජ්ඣනට්ඨෝයි. ඵල අවබෝධයේ කොටස් සම්බුජ්ඣනට්ඨෝයි. කියන ලද ක්‍රමයෙන්ම බොජ්ඣංගයන්ගේ ඒ ඒ පුද්ගලයාට අවබෝධකරණයෙන්, අවබෝධනාර්ථාදි සතර අර්ථයන් දතයුතුය. කියන ලද බොජ්ඣංගයන්ට අවබෝධ කිරීම් අර්ථයෙන් බෝධයයි ලද නම් ඇති පුද්ගලයාගේ පක්‍ෂයෙහි වන හෙයින් බෝධි

පකඛියා (බෝධිපාක්ෂික) නම් වේ. ඔවුන්ගේ කියන ලද අයුරින්ම බෝධිපාක්ෂිකාදී සතර අර්ථ දතයුතුය. විදර්ශනා ප්‍රඥා වශයෙන් ජොතනටෙඨායි. ක්‍රමයෙන් සිවුමග ප්‍රඥා වශයෙන් **උජ්ජොතනුජ්ජොතන පටිජ්ජොතන සඤ්ජොතනටෙඨායි** කියා යෙදේ. ක්‍රමයෙන් සිවුමග ප්‍රඥා වශයෙන් ජොතනටඨාදීන් යෙදේ. ඵල ප්‍රඥා වශයෙන් **සඤ්ජොතනටඨාදිය** දතයුතුය.

පතාපනටඨාදි අටළොස් විසඳුම් ආර්ය මාර්ග වශයෙන් විස්තර කරන ලදී. යමෙකුට ආර්ය මාර්ගය උපදීද, එය **තේජස්** වේ. බැබලෙයි. දිලිසේනුයි. පතාපනොායි. - බබලවත්තේයි අර්ථයි. **තේජස්වන** අර්ථයි. එහි ඉතා බබලන ස්වභාවයෙන් තෙමේ **විරොචනටෙඨායි** දිලිසේ යන අර්ථයි. කෙලෙස් වියලවන අර්ථයෙන් **සනතාපනටෙඨායි.** කෙලෙස්මල රහිත නිර්වාණය අරමුණුකොට ඇති හෙයින් **අමලටෙඨායි.** එකට යෙදී ඇති කෙලෙස්මල අභාවයට පත්කිරීමෙන් **විමලටෙඨායි.** අරමුණු කරන කෙලෙස්මල අභාවයෙන් **නිමමලටෙඨායි.** නොහොත් සෝවාන් මාර්ගයට අමලටෙඨායිද සකෘදාගාමි අනාගාමි මාර්ගයන්ට විමලටෙඨායිද, අර්හත් මාර්ගයට නිමමලටෙඨායිද යෙදේ. නොහොත් ශ්‍රාවක මාර්ගයට අමලටෙඨායිද, පසේබුදු මාර්ගයට විමලටෙඨායිද, සම්මා සම්බුදු මාර්ගයට නිමමලටෙඨායිද යෙදේ. කෙලෙස් විෂම අභාවයෙන් **සමටෙඨායි.** මනාව මිනුම් අවබෝධය යන ආදී තන්හි මෙන් කෙලෙස් ප්‍රහාණ කිරීම් අර්ථයෙන් සමයටෙඨායි. තදංග, විකඛමහන, සමුචෙඡද, පටිපසසදධි නිසසරණ යන පස් විවේකයන් අතර, සමුචෙඡද විවේකයට අයත් බැවින් **විවෙකටෙඨායි.** විනාභාවටෙඨා = නොමැතිය යන අර්ථයි. සසරින් ගැලවීමේ විවේකයෙහි නිවනෙහි හැසිරෙන හෙයින් **විවේක චරියටෙඨායි.** පස්වැදෑරුම් විරාගයන්හි පූර්ණ ඡේදනයෙන් නොඇලුණු හෙයින් **විරාගටෙඨායි.** නොඇලෙන අර්ථයි. නිසසරණ විරාගයෙහි වූ නිර්වාණයෙහි හැසිරෙන හෙයින් **විරාග චරියටෙඨායි.** පස්වැදෑරුම් නිරෝධයන් සමුචෙඡද වශයෙන් නිරුද්ධ කළ හෙයින් **නිරොධටෙඨායි.** දුකඛ නිරෝධය වූ නිර්වාණයෙහි හැසිරෙන හෙයින් **නිරොධ චරියටෙඨායි.** පරිත්‍යාගයට හිත බැඳුණේ දීමෙහි ඇලුණේ **වොසසගගටෙඨායි.** ආර්ය මාර්ගය සමුචෙඡද වශයෙන්, කෙලෙස් ප්‍රහාණ කරන හෙයින් **පරිචචාග වොසසගෙගායි.** අරමුණු කිරීමෙන් නිර්වාණය තුළට ප්‍රවිශ්ට වන හෙයින් **පකඛනදන වොසසගෙගායි.** විදර්ශනාව තදංග වශයෙන් කෙලෙස් ප්‍රහාණ කරන හෙයින් **පරිචචාග වොසසගෙගායි.** එයට නැමුණු බැවින්, නිර්වාණය තුළට ප්‍රවිශ්ට වන හෙයින්, පකඛනදන

වොසසගෙගායි. එය මෙහි අදහස් නොකරන ලදී. වොසසගගයෙන් තොරව හැසිරෙන හෙයින් **වොසසගග චරියටෙඨායි**. පංච විමුක්තීන් අතර, සමුචෙඡද විමුක්තිය බැවින් **විමුතතටෙඨායි** නිසසරණ විමුක්තියෙහි හැසිරෙන හෙයින් **විමුතති චරියටෙඨායි**.

ඡනද, විරිය, චිත්ත, වීමංසා යන ඍද්ධිපාද හතර, එක එක ඍද්ධිපාදයක් දහය බැගින් කොට සතර ඍද්ධිපාදයන්හි සතළිස් ආකාර විසඳුම් විස්තර කරන ලදී. **කතතුකම්‍යතටෙඨා** කැමති යන අර්ථයි. භාවනා අරඹන කාලයෙහි ඡනදය ශීර්ෂ කළේනුයි **මූලටෙඨායි**. සමග උපන් ධර්මයන්ට පිහිටවන බැවින් **පාදටෙඨායි**. පදටෙඨා යනුද පාඨයි. ඍද්ධියට පාදක වන හෙයින් අධිපති භාවයෙන් **පධානටෙඨායි**. ප්‍රයෝග කාලයෙහි **ඉජඣනටෙඨායි**. ශ්‍රද්ධාව හා යෙදීමෙන් **අධිමොකඛටෙඨායි**. වීර්ය සම්ප්‍රයෝගයෙන් **පගගහටෙඨායි**. සිහිය හා යෙදීමෙන් **උපටඨානටෙඨායි**. සමාධිය හා යෙදීමෙන් **අවිකෙඛපටෙඨායි**. ප්‍රඥාව හා යෙදීමෙන් **දසසනටෙඨායි**. උත්සාහ අර්ථය **පගගහටෙඨායි**. සිතීම් අර්ථාදිය **චිතතටෙඨායි**. භාවනා ආරම්භ කාලයෙහි සිත ශීර්ෂකොට පවතිනුයේ **මූලටෙඨායි**. විශේෂ පරීක්‍ෂා කිරීම් අර්ථය **වීමංසටෙඨායි**. භාවනා ආරම්භ කරන කාලයෙහි විමසීම ශීර්ෂකොට පවතිනුයේ මූලටෙඨායි. තෙමේ විමසන හෙයින් දසසනටෙඨායි.

'**දුකඛසස පීනටෙඨාති**, ආදී සොළොස් විසඳුම් සත්‍යයන්ගේ සත්‍ය ලක්‍ෂණ වශයෙන් විස්තර කරන ලදී. දුක දර්ශනයෙන්ම **පීලනටෙඨායි**. දුක රැස්කරන සමුදය දර්ශනයෙන් **සංඛතටෙඨායි**. සියලු කෙලෙස් තැවීම් ඉවත් කරන ඉතා සිසිල් මාර්ග දර්ශනයෙන් **සනතාපටෙඨායි**. වෙනස් නොවන ධර්මයක් වූ නිර්වාණ දර්ශනයෙන් **විපරිණාමටෙඨායි**. හටගැනීම දර්ශනයෙන් **ආයූහනටෙඨායි**. සමුදයෙන් රැස්කරන ලද දුක දර්ශනයෙන් **නිදානටෙඨායි**. වෙන්වීම් ස්වභාව නිරෝධ දර්ශනයෙන් **සඤෙඤාගටෙඨායි**. පමුණුවන ස්වභාව මාර්ග දර්ශනයෙන් **පළිබොධටෙඨායි**. නිරෝධය දර්ශනයෙන්ම **නිසසරණටෙඨායි**. අවිවේක ස්වභාවය වූ සමුදය දර්ශනයෙන් **විවෙකටෙඨායි**. හේතුවකින් හටගත් මාර්ග දර්ශනයෙන් **අසංඛතටෙඨායි**. විස ස්වභාව දුක දර්ශනයෙන් **අමතටෙඨායි**. මාර්ග දර්ශනයෙන් **නීය්‍යාණටෙඨායි**. නිර්වාණ සම්පත්තියට හේතුසාධක නුවූ සමුදය දර්ශනයෙන් **හෙතුටෙඨායි**. මනාව දැකිය හැකි නිරෝධ දර්ශනයෙන් **දසසනටෙඨායි**. දුගී ජනයා සමාන දුක් දැකීමෙන් උසස් කුලවතුන් සමාන

ආධිපතෙය්‍යට්ඨෝයි. පහළවේයයි ඒ ඒ සත්‍ය දර්ශනයෙන්ද, ඊට අන්‍ය සත්‍ය දර්ශනයෙන්ද, එක් එක් සත්‍යයාගේ සතර, සතර ලක්‍ෂණාර්ථ කියන ලදී.

තථට්ඨාදි දොළොස් විසඳුම් සියලු ධර්ම සංග්‍රහකොට දොළොස් පද වශයෙන් විස්තර කරන ලදී. තථට්ඨෝ යනු ස්වභාව අර්ථයි. අනත්තට්ඨෝ යනු ආත්ම තොර යන අර්ථයි. සච්චට්ඨෝ යනු බොරු නොකියන යන අර්ථයි. පටිවෙදට්ඨෝ යනු අවබෝධ කළ යුතුය යන අර්ථයි. අභිජානනට්ඨෝ යනු ඤාත, තීරණ පරිඤ්ඤාවලින් විශේෂයෙන් දතයුතුය යන අර්ථයි. ධම්මට්ඨෝ යනු ස්වභාව, ධාරණ ආදී අර්ථයි. ධාතුට්ඨෝ යනු ශූන්‍යතාදී අර්ථයි. ඤාතට්ඨෝ යනු දැනගන්ට හැකිවන්නේය යන අර්ථයි. සච්ඡිකිරියට්ඨෝ යනු සාක්‍ෂාත් කළයුතුය යන අර්ථයි. ඵස්සනට්ඨෝ යනු ඤාණයෙන් ස්පර්ශ කළයුතුය යන අර්ථයි. අභිසමයට්ඨෝ යනු ප්‍රත්‍යවේක්‍ෂා ඤාණයෙන් ඉතා මැනවින් යායුතුය යන අර්ථයි. ඤාණයෙන් ලබාගත යුතුය යන අර්ථය හෝ ප්‍රතිලාභයද 'අත්ථාභි සමයා ධීරො, ආදීන්හි මෙන් අවබෝධයයි කියයි.

නෛෂ්ක්‍රම්‍යාදී සත් විසඳුම් උපචාර ධ්‍යාන වශයෙන් විස්තර කරන ලදී. නෙක්ඛම්මං යනු කාම වස්තූන්හි කැමතිවීමට විරුද්ධ අලෝභයයි. ආලොක සඤ්ඤා යනු ථිනමිද්ධයට විරුද්ධ ආලෝක නිමිත්තෙහි සංඥාවයි. අවික්ඛෙපො යනු උද්ධච්චයට විරුද්ධ සමාධියයි. ධම්මවවත්ථානං යනු විචිකිච්ඡාවට විරුද්ධ ඤාණයයි. ඤාණං යනු අවිද්‍යාවට විරුද්ධ ඤාණයයි. පාමුජ්ජං යනු නොඇල්මට විරුද්ධ ප්‍රීතියයි.

ප්‍රථමධ්‍යානාදී අට විසඳුම් රූප-අරූප සමාපත්ති වශයෙන් විස්තර කරන ලදී. කලින් රූප සමාපත්තියට අනතුරුව රූප ධ්‍යාන සම්බන්ධයෙන් සතර බ්‍රහ්ම විහාර දක්වන ලදී. අනිත්‍යානුපස්සනාදීන් ලොව්තුරු මගට පූර්ව භාගයෙහි අටළොස් මහා විදර්ශනා වශයෙන් දක්වන ලදී. යට රූප ධ්‍යානවලින් යොදන ලද සත් අනුපස්සනාවන්ම කියන ලදී. මෙහි සියල්ලම කියන ලදී. කලාප සම්මසන හා උදයව්‍යයානුපස්සනා කවර හෙයින් නොකියන ලදද යත්? ඒ දෙකෙන් අනිත්‍යානුපස්සනාදීන් සිද්ධවන හෙයිනි. මේවා කී කල්හි ඒ දෙක කියන ලද්දේම වෙයි. අනිත්‍යානුපස්සනාදීන් හැර ඒ දෙක නොපවතින හෙයින් මේවා කී කල්හි ඒ දෙකද කියන ලද්දේම වෙයි.

**ඛයානුපස්සනා** යනු වර්තමාන රූපස්කන්ධාදීන්ගේ බිඳීම (විනාශය) දක්නා නුවණද ඒ ඒ ස්කන්ධ බිඳීම දැකීමෙන් අනතුරුව එය අරමුණුකොට පැවති චිත්ත චෛතසිකයන්ගේ බිඳීමද දක්නා නුවණය. **වයානුපස්සනා** යනු වර්තමාන ස්කන්ධයන්ගේ බිඳීම දැක්මෙන් අනතුරුව ඒ ආකාරයෙන්ම අතීත අනාගත ස්කන්ධයන්ගේ බිඳීම දක්නා නුවණයි. **විපරිණාමානුපස්සනා** යනු ඒ භංග සංඛ්‍යාත නිරෝධයෙහි අධිකව යෙදුනු හෙයින්, සියලුම අතීත අනාගත වර්තමාන ස්කන්ධ වෙනස්වන සුලුයයි සියල්ලෙහි වෙනස්වනසුලු බව දක්නා ඥානයයි. **අනිමිත්තානුපස්සනා** යනු මෙසේ සියලු සංස්කාරයන්ගේ විපරිණාමය දැක අනිත්‍ය වශයෙන් විදර්ශනා කරන්නහුට අනිත්‍යානුපස්සනාවම, නිත්‍යය යන ලක්‍ෂණය දුරුකිරීම් වශයෙන් නිත්‍ය නිමිත්තෙහි අභාවය අනිමිත්තානුපස්සනායි. **අප්පණිහිතානුපස්සනා** යනු අනිත්‍යානුපස්සනාවට අනතුරුව පවත්නා දුක්ඛානුපස්සනාවම සුවපැතුම් අත්හැරීම් වශයෙන් ප්‍රාර්ථනා නොමැතිවීම අප්පණිහිතානුපස්සනායි. **සුඤ්ඤතානුපස්සනා** යනු දුක්ඛානුපස්සනාවට අනතුරුව පැවති අනත්තානුපස්සනාවම ආත්ම ඇල්ම දුරුකිරීම් වශයෙන් ආත්ම ශූන්‍යතායෙන් දක්නා හෙයින් ශූන්‍යතානුපස්සනායි. **අධිපඤ්ඤා ධම්ම-විපස්සනා** යනු මෙසේ සංස්කාරයන්ගේ බිඳීම දැක දැක අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කරන්නහුට සංස්කාරම බිඳෙති. (විනාශ වෙති) සංස්කාරයන්ගේ මරණයයි. වෙන අන්කිසිවක් නැතැයි භංග වශයෙන් ශූන්‍යතාව ගෙන පවත්නා විදර්ශනාවයි. අධිප්‍රඥාවද, ධර්මයන්හි විදර්ශනාවද එයම වූයේ නුයි අධි පඤ්ඤා ධම්ම විපස්සනායි කියයි. **යථාභූත ඤාණං දස්සනං** යනු භංගය දැක දැක සංස්කාර, බිය සහිත යයි පැවති භයතුපට්ඨාන ඤාණයයි. **ආදීනවානුපස්සනා** යනු, භයතුපට්ඨාන වශයෙන් උපන්නා වූ, සියලු භව ආදීන්හි දොස් දැකීමේ ඤාණයයි. යම් භයතුපට්ඨානයෙහි ප්‍රඥාවක් වේද, යම් ආදීනව ඤාණයක් වේද, යම් නිබ්බිදා ඤාණයක් වේද, මේ ධර්ම ඒකාර්ථය. අක්‍ෂරයන්ගේම වෙනසකියි යන වචනයෙන් භයතුපට්ඨාන ආදීනව අනුපස්සනාවන්හි කියන ලද, නිබ්බිදානුපස්සනාව මෙහිද යූ.සේයි. මුලදී සතරක් ලෙස කියන ලද මුත් මෙහි නොකියන ලදී. **පටිසංඛානුපස්සනා** යනු, මුඤ්චිතුකම්‍යතා ඤාණ වශයෙන් උපන්නා වූ, මිදීමෙහි උපාය සම්පාදනයෙහිලා නුවණින් සලකා බැලීමෙහිදී ඇතිවන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම නුවණින් බැලීමේ ඤාණයයි. යම් මුඤ්චිතු කම්‍යතාවක් වේද යම් පටිසංඛානුපස්සනාවක් වේද, යම් සංඛාරුපෙක්‍ෂාවක් වේද, මේවා ඒකාර්ථය. අක්‍ෂරයන්ගේම වෙනසක් පමණි යන වචනයෙන් පටිසංඛානුපස්සනා යයි කී කල්හි, මුඤ්චිතුකම්‍යතා,

සංඛාරුපෙක්ඛා ඤාණයත් කියන ලද්දේම වේ. **විවට්ටානුපස්සනා** යනු, අනුලෝම ඤාණ වශයෙන් උපන් ගෝත්‍රභූ ඤාණයයි. අනුලෝම ඤාණයෙන් ගොත්‍රභූ ඤාණය සිදුවන හෙයින් ගොත්‍රභූ ඤාණය කී කල්හි අනුලෝම ඤාණය කියන ලද්දේම වේ. මෙසේ අටළොස් මහා විදර්ශනාවන්ගේ පිළිවෙළ කියන කල්හි පෙළ හා සමවෙයි. ඉන්‍ද්‍රිය කථාවෙහි කියන ලද්දේමය. පූර්ව භාගයෙහි ඉන්‍ද්‍රියයන් පහකින් ප්‍රථමධ්‍යානයෙහි ඉන්‍ද්‍රිය පහකින් ද්විතීය ධ්‍යාන වශයෙන් ඉන්‍ද්‍රිය පහක් ඉවත්කරන ලද්දේ වෙයි. ආදී ක්‍රමයෙන් අර්හත් ඵලය දක්වා මතුමත්තෙහි පිළිවෙළින් ඉන්ද්‍රියයන් කියන ලද්දේය. එහෙයින් අටළොස් මහා විදර්ශනාවන් කියන ලද ක්‍රමයෙන් පෙළෙහි යෙදෙත්. විසුද්ධි මාර්ගයෙහි වනාහි **ඛයානුපස්සනා** යනු තදකොටස් වෙන්කොට, ක්‍ෂය අර්ථයෙන් අනිත්‍යයයි මෙසේ ක්‍ෂය බැලීමේ නුවණයි. **විපරිණාමානුපස්සනා** යනු, රූප සත්තකය, අරූප සප්තකය ආදි වශයෙන් බෙදීම් ඉක්මවා අන්‍යාකාරයකින් පැවැත්ම දැකීමයි. උපන්නහුගේ ජරාවෙන්ද මරණයෙන්ද යන දෙයාකාරයකින් විපරිණාම දර්ශනය වේ. **යථාභූත ඤාණදස්සනං** යනු ප්‍රත්‍යය සහිත වූ නාමරූපයන් අල්ලා ගැනීමයයි යූසේයි. එය පෙළට විරුද්ධ සේ පෙනේ. **විවට්ටානුපස්සනා** යනු සංඛාරුපෙක්ඛාවත්, අනුලෝමයත් යයි යූසේයි. එයද පෙළට විරුද්ධ සේ පෙනේ. චර්යා කථාවෙහි අනිත්‍යානුපස්සනාව සඳහා ආවර්ජන ක්‍රියාව ප්‍රකාශකොට ඇත. විඤ්ඤාණචර්යාව, අනිත්‍යානුපස්සනාව, ඤාණ චර්යාව -පෙ- පටිසංඛානුපස්සනාව සඳහා ආවර්ජන ක්‍රියාව ප්‍රකාශකොට ඇත. විඤ්ඤාණචර්යාව, අනිත්‍යානු පස්සනාව, ඤාණචර්යාව -පෙ- පටිසංඛානුපස්සනාව සඳහා ආවර්ජන ක්‍රියාව ප්‍රකාශකොට ඇත. විඤ්ඤාණචර්යාව, පටිසංඛානුපස්සනා ඤාණ චරියාව යයි යම් ඤාණයකට වෙන් වෙන්ව ආවර්ජන ලැබේද, ඒ ඒ ඤාණයට ආවර්ජනය යූසේයි. විවට්ටානුපස්සනාවෙහි ආවර්ජනය නොකියාම විවට්ටානුපස්සනා ඤාණ චරියාවයයි යූසේයි. ඉදින් සංඛාරුපෙක්ෂා අනුලෝම ඤාණ විවට්ටානුපස්සනා නම් වන්නේද? තදාවර්ජන සම්භවයෙන් ඒ සඳහා ආවර්ජනය කියන්නේය. ඒ සඳහා ආවර්ජනය නොකියන ලද්දේය. ගෝත්‍රභූ ඤාණයට වෙන්ව ආවර්ජනයක් නැත. අනුලෝම ආවර්ජන වීථියෙහිම උපදනා හෙයිනි. එහෙයින් විවට්ටානුපස්සනාව සඳහා ආවර්ජනය නොකියන ලද හෙයින් ගෝත්‍රභූ ඤාණයම විවට්ටානුපස්සනායි යෙදේ. සෝවාන් මාර්ගාදී අටවිසඳුම් ලෝකෝත්තර මාර්ගඵල වශයෙන් විස්තර කරන ලදී. ස්‍රෝත්‍රයට පැමිණීම සෝතාපත්තියි. ස්‍රොතාපත්තියම මාර්ගය වූයේ, **සොතාපත්තිමග්ගොයි.**

ස්‍රෝත්‍රයට පැමිණීමෙහි ඵලය = **සොතාපත්ති ඵලං** නම් වේ. සමවදිනුයි සමාපත්තියි. සෝවාන් ඵලයම සමාපත්ති වූයේ = **සොතාපත්ති ඵලසමාපත්තියි** ප්‍රතිසන්ධි වශයෙන් එක්වරක්ම මේ ලෝකයට පැමිණේනුයි සකෘදාගාමියි. එහි මාර්ගය **සකදාගාමි මග්ගොයි**. සකෘදාගාමීහුගේ ඵලය **සකදාගාමි ඵලංයි**. ප්‍රතිසන්ධි වශයෙන්ම කාමභවයට නොපැමිණේනුයි අනාගාමියි. එහි මාර්ගය = **අනාගාමි මග්ගොයි**. අනාගාමීහුගේ ඵලය = අනාගාමි ඵලයයි. කෙලෙසුන් දුරුකළ හෙයින්ද, කෙලෙසුන්ගෙන් දුරස්ථ වූ හෙයින්ද කෙලෙස් සතුරන් නැසූ හෙයින්ද, සංසාර දැතිරෝද නැසූ හෙයින්ද, රහසින්වත් පව් නොකරන හෙයින්ද, සිව්පසයන් ලැබීමට සුදුසු හෙයින්ද, අරහං නම් වේ. අර්හත්වයෙහි ස්වභාවය අරහත්තයි. ඒ කිමෙක්ද? අර්හත් ඵලයයි. අර්හත්වයාගේ මාර්ගය **අරහත්ත මග්ගොයි**. අර්හත්වයම ඵලය වූයේ = **අරහත්තඵලං**.

අධිමෝක්ෂාර්ථයෙන් සද්ධින්‍ද්‍රියං ආදී, සත්‍යාර්ථයෙන් සත්‍යයයි කෙළවරකොට ඇති තෙතිස් විසඳුම් විස්තර කරන ලදී. යට, සද්ධින්‍ද්‍රියගේ අධිමෝක්ෂාර්ථයයි ආදීන්ගෙන් දැක්වූ තෙතිස් විසඳීම් හා සමාන වූහ. හුදෙක්, එහි ධර්මයන්ගේ අර්ථ විස්තර කරන ලදී. මේ විශේෂයයි අවික්ෂෙපාර්ථයෙන් සමථ ආදී සිවු විසඳුම්වලද, යට සමථයාගේ අවික්ෂෙපාර්ථ ආදී සිවු විසඳුම්වලද විශේෂ යු.සේයි.

**සංවරට්ඨෙන** ආදී අටවිසඳුම්, සීල ආදී ප්‍රතිඵල අවසන් ධර්මය වශයෙන් ගෙන විස්තර කරන ලදී. **සීලවිසුද්ධි** යනු සුපිරිසිදු ප්‍රාතිමෝක්ෂ සංවරය ආදී සිවුආකාර සීලයයි. දුසිල් බව නමැති මල ශුද්ධ කරන හෙයින් සීල විශුද්ධියයි කියයි. **චිත්තවිසුද්ධි** යනු උපචාර සමාධි සහිත අට සමවත්ය. මෙහි චිත්ත යන්නෙන් සමාධිය කියන ලද්දේය. එය සිතෙහි අපද්‍රව්‍ය පිරිසිදු කරන හෙයින් චිත්ත විසුද්ධියි. **දිට්ඨි විසුද්ධි** යනු, නාමරූපයන්හි තත්වාකාරය දැකීමයි. සත් දෘෂ්ටිමල පිරිසිදු කරන හෙයින් දිට්ඨි විසුද්ධියි. **මුත්තට්ඨෙන** යනු තදංග වශයෙන් උපක්ලේශයන්ගෙන් මිදීම් අර්ථයෙන් අරමුණෙහි ඇලුණු අර්ථයෙන්ද වේ. **විමොක්ඛො** යනු (මෙතැන්හි) තාවකාලික මිදීමයි. **පටිවෙධට්ඨෙන විජ්ජා** යනු පූර්ව භවයන් අවබෝධ කිරීම් අර්ථයෙන් පූර්වෙනිවාසානුස්මෘති ඤාණය විජ්ජා නම් වේ. සත්ත්වයින්ගේ චුති-උත්පත්ති අවබෝධ කිරීම් අර්ථයෙන් දිව්‍යචක්‍ෂුර් ඥානය විජ්ජා නම් වේ. සත්‍යය අවබෝධ කිරීම් අර්ථයෙන් ආස්‍රවක්‍ෂයකර ඥානය විජ්ජා නම් වේ. පටිවෙධට්ඨෙන යනු, දැනගන්නා වූ අර්ථයෙන්ය.

පරිච්චාගට්ඨෙන විමුත්ති යනු යම් යම් දැයක් පරිත්‍යාග කළේද, ඒ ඒ දැයින් මිදුණු බැවින් ඵලවිමුත්තියි. **සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං** යනු කෙලෙස් විනාශකිරීම් අර්ථයෙන් කෙලෙස් ක්‍ෂය කරන ආර්ය මාර්ගයෙහි ඤාණයයි. **පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙඤාණං** යනු මාර්ග කෘත්‍යය සංඛ්‍යාත ප්‍රයෝග සංසිඳවූ බැවින් ප්‍රතිසන්ධි වශයෙන් නොඉපදෙන ස්වභාව වූ, ඒ ඒ මාර්ගයන්ගෙන් නැසිය යුතු කෙලෙසුන්ගේ නොඉපදීම් සංඛ්‍යාත කෙළවරෙහි උපන්නා වූ ආර්යඵල ඤාණයයි.

ඡන්දොමූලට්ඨෙන ආදී නව විසඳුම් ආර්ය මාර්ගයාගේ මුල, මැද, අග වශයෙන් විස්තර කරන ලදී. **ඡන්දො මූලට්ඨෙන** යනු කුසල්දම් කරනු කැමැත්තෙහි ඇල්ම, ප්‍රතිපත්ති සම්පූර්ණවීමට මුල්වන හෙයින් මූලාර්ථයෙන්, **මනසිකාරො සමුට්ඨානට්ඨෙන** යනු නුවණින් මෙනෙහි කිරීම සියලු කුසල්දම් හටගන්වයිනුයි හටගන්වන අර්ථයෙන්, **ඵස්සො සමොධානට්ඨෙන** යනු, තෘෂ්ණාවට විශේෂයෙන් වේදනාව ප්‍රධාන කරුණයි. තෘෂ්ණාව දුරුවනවිට, වේදනාවගේ සම්පූර්ණ දැනීම දුරුවෙයි. එම වේදනාවගේද ස්පර්ශය ප්‍රධාන කරුණයි. එය සම්පූර්ණයෙන් දත් කල්හි, වේදනාව සම්පූර්ණයෙන් දතුයේ වේ. එහෙයින් සත් විශිෂ්ටත්වයෙන් දතයුතු වස්තූන් අතර ස්පර්ශය පළමුව කියන ලද්දේ වේ. එයද වේදනාත්‍රිකය එකතුවීම තමාගේ අවශ්‍ය කරුණක් ලෙස දැනුම් දුන් හෙයින් ත්‍රිකයේ එකතුවීම වැටහෙන කරුණයයි කියන ලද හෙයින් ගැළපීම් අර්ථයෙන් දතයුතුය. සමහරු වනාහි ඤාණ ස්පර්ශය ස්පර්ශයයි කියත්. යම්හෙයකින් වනාහි වේදනා චිත්ත චෛතසිකයන් තමාගේ වසඟයෙහි පවතිනු ලබන්නේ එහි රජ් වේ. පිවිසේ. සිත් සතන්වලටම හෝ පිවිසෙයි. එහෙයින් රැස්වීම් අර්ථයෙන් විශිෂ්ට සේ දතයුතුයයි යූසේයි. සමහරු සියලුම දතයුතු දේවල් වේදනාවන්හි ඇතුළත් කරති. වේදනා දත්කල්හි සියලුම තෘෂ්ණා හේතු දක්නේ වෙයි. ඊට හේතු කවරේද යත්, සියලුම තෘෂ්ණාවෝ වේදනා ප්‍රත්‍යයෙන් හටගනිති. එහෙයින් වේදනාව එක්තැන්වීම් අර්ථයෙන් දතයුතුයයි කියති. වහලේ වක්වූ යටලීය හා සම්බන්ධ වූ ගෙයක මුදුන් කොත මෙන් චිත්ත චෛතසිකයන් හකුළුවන හෙයින් සමාධිය කුසල්දම්හි ප්‍රමුඛ වෙයි. ජ්‍යෙෂ්ඨ වෙයි. එහෙයින් සමාධිය ප්‍රමුඛාර්ථයෙන් යූ.සේයි. සමථ විදර්ශනා වඩන්නහුට අරමුණ වැටහීමෙහිදී සිහිය ප්‍රධාන ස්ථානය ගනී. අරමුණෙහි සිහිය එළඹ සිටි කල්හි සියලු කුසලාකුසල ධර්ම තම තමාගේ කටයුතු සිදුකරයි. එහෙයින් සිහිය අධිපති අර්ථයෙන් යයි යූ.සේයි. **පඤ්ඤාඤාතදුත්තරට්ඨෙන** යනු,

ආර්ය මාර්ග ප්‍රඥාව ඒ කුසල ධර්මයන්ට උසස් අර්ථයෙන්ද, ශ්‍රේෂ්ඨාර්ථයෙන්ද විශේෂයෙන් දතයුතුය. නොහොත් ඒ කෙලෙසුන්ගෙන් සංසාර වෘත්තයෙන් එතෙර වේ. ඉක්මවයිනුයි - තදනුත්තරායි. එහි අර්ථය ඉන් එතෙරවීම් අර්ථයි. ඒ **තදුත්තරට්ඨෙන** තතුත්තරට්ඨෙන යනුද පාඨයි. එයින් එතෙර වන අර්ථයෙන් යන අර්ථයි. විමුත්තිසාරට්ඨෙන යනු, ඵල විමුක්තිය නොපිරිහීම් වශයෙන් ස්ථිර බැවින් හරවත්ය. එය ඉක්මවා වෙනත් සෙවිය යුත්තක් නොමැති හෙයින්ද හරවත්ය. ඒ විමුක්තිය ඒ සාරාර්ථයෙන් දතයුතුය. **අමතොගධං නිබ්බානං** යනු එයට මරණ සංඛ්‍යාත වූ මත යන්නක් නැත්තේනුයි = අමත නම් වේ. කෙලෙස් විසට විරුද්ධ බෙහෙතක්නුයි අමත නම් වේ. සාක්‍ෂාත් කිරීමෙන් සත්ත්වයින්ට පිහිට වූයේනුයි බැසගත් තැනකි. සසර දුක් සන්සිඳුවන හෙයින් නිවුණේනුයි = නිබ්බණංයි.

මෙහි තෘෂ්ණා සංඛ්‍යාත වාන නැත්තේනුයි = නිබ්බානංයි. එය ශාසනයාගේ අවසානය වූ හෙයින් අවසානාර්ථයෙන් අභිඥෙය්‍යංයි. මෙසේ මේ අභිඥෙය්‍ය නිර්දේශයෙහි හත්දහස් හත්සිය හතළිහක් විසඳුම් වෙයි.

දැන් මෙසේ විස්තර කරන ලද ධර්මයන්ගේ, යම් යම් ධර්ම විශේෂයෙන් දැනගත්තේ වේද, ඒ ඒ ධර්ම දන්නා ලද්දේ වෙත් යයි නිගමනය කරයි. එම නිගමනය ප්‍රමුඛව සලකා දැනගන්නා ලද්දේ වෙතියි අදහසයි. **තඤ්ඤාතට්ඨෙන ඤාණං** යනු කියන ලද ආකාරයෙන් ඒ ධර්මයන්ගේ දැනගැනීම් අර්ථයෙන් ඤාණයි. **පජානනට්ඨෙන පඤ්ඤා** යනු පිළිවෙළින් දන්නා අර්ථයෙන් පඤ්ඤායි. **තෙන වුච්චති** යනු මුලින් විචාරන ලද ප්‍රශ්න නිගමනයකොට දක්වන ලදී. ඒ කරුණින් මේ ධර්මයන් විශේෂයෙන් දතයුතුයයි කන් යොමුකොට එය දැනගැනීමේ ප්‍රඥාව සුතමයෙ ඤාණයයි කියනු ලැබේයයි අර්ථයි.

**සද්ධර්ම ප්‍රකාශනී නම් වූ ප්‍රතිසම්භිදාමාර්ග අර්ථකථාවෙහි අභිඥෙය්‍ය නිර්දේශ වර්ණනාව නිමි.**

පරිඤ්ඤෙය්‍ය නිර්දේශයෙහි, පරිඤ්ඤා ශබ්දයෙන්, ඤාත පරිඤ්ඤා, තීරණ පරිඤ්ඤා, පහාණ පරිඤ්ඤා යයි තෙවැදෑරුම් පරිඥා සංගෘහිතයි යට අභිඤ්ඤෙය්‍ය යන්නෙන් ඤාත පරිඥාව ගැන කියන ලද හෙයින්ද මතුයෙහි ප්‍රහාණ කළයුතුයයි ප්‍රහාණ පරිඥාව ගැන කියන ලද හෙයින්, මෙහි තීරණ පරිඥාවම අදහස් කරන ලදී. **ඵස්සො සාසවො උපාදානියො** යනු ආස්‍රවයන්ටද, උපාදානයන්ටද ප්‍රත්‍යය වූ ත්‍රෛභූමික ස්පර්ශයයි. එය තමා අරමුණුකොට පවත්නා ආස්‍රවයන් සමගනුයි - සාසවොයි. අරමුණු ස්වභාවයට එළඹ උපාදාන හා සම්බන්ධ වීමෙන් උපාදානයන්ට හිතවත්නුයි උපාදානයෝයි. තීරණ පරිඥාවෙන් ස්පර්ශය දත්කල්හි ස්පර්ශය ප්‍රධාන සෙසු අරූප ධර්මයන්ද, ඒ අනුසාරයෙන් රූපධර්ම දත්තේ වේ. එහෙයින් එකම ස්පර්ශය කියන ලදී. මෙසේ සෙස්සෙහිද සුදුසු පරිදි යෙදිය යුතුය. **නාමං** යනු සතර අරූප ස්කන්ධයන්ද, නිර්වාණයද වේ. **රූපං** යනු සතර මහා භූත රූපද, සතර මහාභූත රූපයන්ට උපාදාය වූ රූප සූවිස්සද වේ. සතර ස්කන්ධ නැමෙන අර්ථයෙන් නාමයි. ඒවා අරමුණට අභිමුඛව නැමෙයි. සියල්ලම නැමෙන අර්ථයෙන් නාමයි. සතර ස්කන්ධයෝ අරමුණෙහි ඔවුනොවුනු නැමෙති. නිර්වාණය, ආරම්මණ, ආරම්මණාධිපති ප්‍රත්‍යය තාවයෙන් තමා කෙරෙහි පැවති නිවැරදි ධර්මයන් නමයි. නොකඩවා පැවතීම් වශයෙන්ද, සීතාදියෙන් වෙනස්වන අර්ථයෙන්ද රූපයි. රුප්පනට්ඨෙන යනු, කිපීම් අර්ථයෙන්, පැවැත්මේ වෙනස්වීම් වශයෙන් සීත ආදියෙන් ගැටෙන ස්වභාවය රූපයයි කියයි. මෙහි නාමය යනු ලෞකික දෙයම අදහස් කරන ලදී. රූපය ඒකාන්තයෙන්ම ලෞකිකය.

**තිස්සො වෙදනා** යනු, සුඛ, දුක්ඛ, උපේක්ෂා යන වේදනාවය. ඒවා ලෞකිකමය. **ආහාරා** යනු, ප්‍රත්‍යයයි. ප්‍රත්‍යයෝ වනාහි තමාගේ ඵලය ගෙන එත්නුයි = ආහාරයි. කබලිංකාර, ඵස්ස, මනො සඤ්චෙතනා, විඤ්ඤාණ වශයෙන් එය සතරකි. වස්තු වශයෙන්, පිඩු කළයුතු හෙයින්ද, පිඬු වශයෙන් ගිලදැමිය යුතු හෙයින්ද කබලිංකාරාහාරයි. බත් පිට්ටු ආදී මූලාධාරයන්ගෙන් හටගත් ඕජාවට මෙය නමකි. ඒවා ඕජෂ්ටමක රූප උපදවයි නුයි = ආහාරයි. චක්ෂු ස්පර්ශාදී සවැදෑරුම් ස්පර්ශයන්ද, ත්‍රිවිධ වේදනා ගෙන එයිනුයි ආහාරයි. සිතෙහි සිතිවිල්ල = මනො සංචෙතනායි. සිතෙහි ඒකාග්‍රතාව - චිත්තෙකාග්‍රතාව මෙනි. මනසෙහි හෝ ඒ හා යෙදුණු සිතිවිලි - මනෝ සංචේතනායි. ආජානීය අසුන් යෙදූ රථය - ආජඤ්ඤ රථයයි කියන්නාක් මෙනි. ත්‍රෛභූමික කුසලා කුසල චේතනාවන්ය. එය ත්‍රිවිධ භවයන් ගෙන ඒනුයි - ආහාරයි. විඤ්ඤාණං

යනු එකුන්විසි ආකාර ප්‍රතිසන්ධි විඤ්ඤාණයයි. එය ප්‍රතිසන්ධි නමැති රූපය ගෙන එයිනුයි - ආහාරයි.

**උපාදානක්ඛන්ධා** යනු, උපාදාන ගොදුරුකොට ඇති ස්කන්ධයන්ය. මධ්‍ය පාදයෙහි ලෝපය දතයුතුය. උපාදානයෙන් හටගත් ස්කන්ධ = උපාදානස්කන්ධයි. තණ (කොල) ගින්න දහයියා ගින්න යම්සේද, එසේය. උපාදානයන්ට යටහත්ව පවත්නා ස්කන්ධ උපාදානස්කන්ධයි. රාජ පුරුෂයන් මෙනි. උපාදානයන්ගෙන් හටගත් වූ ස්කන්ධ උපාදාන ස්කන්ධයි. මල් වෘක්ෂය ඵල වෘක්ෂය මෙනි. උපාදාන, කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාදූපාදාන වශයෙන් සතරකි. අර්ථ වශයෙන්, තදින් අල්ලා ගනීනුයි උපාදානයි. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ වශයෙන්ද පහකි. **ඡ අජ්ඣත්තිකානි ආයතනානීති** යනු, චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන යන ආයතන සයයි. **සත්ත විඤ්ඤාණට්ඨිතියො** යනු කවර සතක්ද? භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. මහණෙනි, නානාප්‍රකාර ශරීර ඇති නානාප්‍රකාර හැඟීම් ඇති, සත්ත්වයෝ සිටිත්. ඒ කෙසේද යත්, මිනිස්සු, සමහර දෙවිවරු, සමහර විනිපාතික අසුරයෝ, මේ පළමු විඤ්ඤාණ ස්ථිතියයි. මහණෙනි, නානාප්‍රකාර ශරීර ඇති ඒකාකාර හැඟීම් ඇති සත්ත්වයෝ සිටිත්. ඒ කෙසේද යත්, ප්‍රථමයෙන් උපන් බ්‍රහ්මකායික දෙවියෝ, මේ දෙවන විඤ්ඤාණස්ථිතියයි. මහණෙනි, එක් ආකාර ශරීර ඇති නානාප්‍රකාර හැඟීම් ඇති සත්ත්වයෝ සිටිත්. ඒ කෙසේද යත්,

ආභස්සර දෙවියෝ. මේ තෙවන විඤ්ඤාණස්ථිතියයි. මහණෙනි, ඒකාකාර ශරීර ඇති, ඒකාකාර හැඟීම් ඇති සත්ත්වයෝ සිටිත්. ඒ කෙසේද යත්, සුභකිණ්හක දෙවියෝ. මේ සතරවන විඤ්ඤාණ ස්ථිතියයි. මහණෙනි, සර්වප්‍රකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන්, කෝප සංඥා නැති කිරීමෙන් විවිධාකාර සංඥාවන් මෙනෙහි නොකිරීමෙන්, ආකාසය අනන්ත යයි ආකාසානඤ්චායතනයට පැමිණි සත්ත්වයෝ සිටිත්. මේ පස්වන විඤ්ඤාණස්ථිතියයි. මහණෙනි, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චා යතනයට පැමිණි සත්ත්වයෝ සිටිත්. මේ සවන විඤ්ඤාණස්ථිතියයි. මහණෙනි, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිත් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණි සත්වයෝ සිටිත්. මේ සත්වන විඤ්ඤාණස්ථිතියයි. මහණෙනි, මේ සත් විඤ්ඤාණස්ථිතීහු වෙති. විඤ්ඤාණ සහිත ස්කන්ධයෝය. එහි සෙය්‍යථාපි යනු නිදර්ශනාර්ථයෙහි නිපාතයි. මනුස්සා යනු, අප්‍රමාණ චක්‍රවාටයන්හි අප්‍රමාණ මනුෂ්‍යයින්ගේ,

වර්ණ හැඩරුව ආදී වශයෙන් එක සමාන දෙදෙනෙක් නැත. යමෙක් වර්ණ හැඩරුව ආදියෙන් සමාන වූවාහු වෙත්ද, ඔවුන් අතරද ඉදිරිය, වටපිටාව බැලීමෙහිදී සමාන නොවෙති. ඔවුන්ගේ, ත්‍රිහේතුක, ද්විහේතුක, අහේතුකයෝද වෙති. එහෙයින් විවිධ හැඳිනීම්යයි යූ.සේයි. එකච්ච දෙවා යනු, සවැදෑරුම් කාමාවචර දෙවියෝය. ඔවුන් අතර සමහරුන්ගේ ශරීර නිල්වන්ය. සමහරුන්ගේ කහ ආදී වර්ණයෝය. ඔවුන්ගේ ත්‍රිහේතුක, ද්විහේතුක අය සිටිති. අහේතුක අය නොවෙති. එකච්චච විනිපාතිකා යනු සතර අපායෙන් මිදුණු, පුනබ්බසුමාතා යක්‍ෂණිය, ප්‍රියංකර මාතාව, ඵුස්සමිත්තා, ධම්මගුත්තා යනාදීහුද, අනෙකුත් විමාන ප්‍රේතයෝද වෙති. මොවුන් අතරද, සුදු, කලු, කළු රත්වන්, කලු වර්ණ වශයෙන්ද, කෘශ-ස්ථූල, මිටි, උස වශයෙන්ද, ශරීර විවිධාකාර වෙයි. මිනිසුන්ට මෙන් ත්‍රිහේතුක, ද්විහේතුක, අහේතුක වශයෙන් සංඥාවෝද වෙති. ඔවුහු දෙවිවරුන් මෙන් මහේශාඛ්‍ය නොවෙති. දිළිඳු මිනිසුන් මෙන් අල්පේශාක්‍යය. දුර්ලභ කෑම්-ඇඳීම් ඇත්තාහු දුකින් පීඩිතව වාසය කරති. සමහරු කළුවර අඩමසෙහි දුකට පත්වූවාහු, සඳ ඇති අඩමසෙහි සුවපත් වූවාහු වෙති. එහෙයින් සුව හටගැනීමෙන් විවසව පතිත වන හෙයින්, විනිපාතික යයි යූ.සේයි.

මෙහි යමෙක් ත්‍රිහේතුක වෙත්ද? ඔවුන්ට පියංකර මාතාවන්ට මෙන් මාර්ගඵල ප්‍රතිලාභයද වෙයි. බ්‍රහ්මකායික යනු, බ්‍රහ්මපාරිසද්‍ය, බ්‍රහ්ම පුරෝහිත, මහාබ්‍රහ්ම යනාදීහුය. පඨමාභිනිබ්බත්තා යනු, ඒ සියල්ලෝම ප්‍රථමධ්‍යානයෙන් උපන්නාහුය. බ්‍රහ්ම පාරිසද්‍යයෝ ස්වල්ප වශයෙන් වැඩූ ධ්‍යානයෙනි. බ්‍රහ්ම පුරෝහිතයෝ මධ්‍යම වශයෙන් වැඩූ ධ්‍යානයෙනි. ඔවුන්ගේ ශරීරද විශාල ප්‍රදේශයක පැතිරී ඇත්තාහුය. මහා බ්‍රහ්මයෝ වනාහි ඉතා උසස් අන්දමින් වැඩූ ධ්‍යානයෙනි. ඔවුන්ගේ ශරීරයද ඉතා විශාල ප්‍රදේශයක පැතිරී ඇත්තාහුය. මේ මොවුන්ගේ ශරීර විවිධාකාරය. ධ්‍යාන වශයෙන් සංඥාව එකක් බැවින් නානත්තකායා එකත්තසඤ්ඤී යයි කියන ලදී. ඔවුන් යම්සේද, සතර අපායයන්හි සත්ත්වයෝද එසේය. නිරයෙහි සමහරුන්ගේ ගවුවක් පමණ. සමහරුන්ගේ අඩයොදුනක් පමණ සමහරුන්ගේ තුන් ගවුවක් පමණ ආත්මභාව වෙයි. දෙව්දතුට වනාහි යොදුන් සියයක සිරුරක් හටගත්තේය. තිරිසනුන් අතරෙහි සමහරු කුඩා වෙති. සමහරු විශාල වෙති. ප්‍රේත විෂයයන්හි සමහරු හැට රියනක්ද, සමහරු අසූරියනක්ද වෙති. සමහරු මනා පැහැයෙන් යුත් අතර සමහරු දුර්වර්ණය. කාලකඤ්ජික අසුරයෝ එසේය. තවද දීඝපිට්ඨික නම් වූ

ප්‍රේතයෝ හැඩයොදුන්වද වෙති. සංඥාව වනාහි සියල්ලන්ටම අකුසල විපාක අහේතුකවම වෙයි. මෙසේ අපායිකයෝද වෙනස් ශරීර ඇත්තාහු ඒකාකාර හැඟීම් ඇත්තාහු වෙතියි යන කොටසට වැටෙති. ආභස්සරා යනු ගිනිපන්දමක ගිනි මෙන් මොවුන්ගේ ශරීරයෙන් ආලෝකය කැඩි කැඩී වැටෙනුයේ, සරන්නාක්, විසිරෙන්නාක් මෙන් පෙනේනුයි ආභස්සරයි. ඔවුන් අතර, පහක් වන ධ්‍යාන ක්‍රමයෙහි දෙවන, තෙවන ධ්‍යාන දෙක මඳ වශයෙන් වඩා උපන්නාහු පරිත්තාභ නම් වෙති. මධ්‍යමව වඩා උපන්නාහු අප්පමාණාභා නම් වෙති. ප්‍රණීතව වඩා උපන්නාහු ආභස්සර නම් වෙති. මෙහි වනාහි උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් ඒ සියල්ලෝම ගණන් ගත්හ. ඒ සියල්ලන්ගේම ශරීර එකම පැතිරීම් ප්‍රමාණයකි. සංඥාව වනාහි අවිතර්ක, විචාර මාත්‍රද, අවිතර්ක, අවිචාර වශයෙන් වෙනස්ය. සුභකිණ්හ යනු මනා රුචින් ගැවසී ගත්තේ විසිරී පැවැත්තේනුයි සුභකිණ්හායි.

මනා වර්ණවත් ශරීරාලෝකයෙන් එකට කැටිව ඇත යන අර්ථයි. මොවුන්ට වනාහි ආභස්සර බ්‍රහ්මයින්ට මෙන් කැඩි කැඩී ආලෝකය නොයයි. ධ්‍යාන සතරේ ක්‍රමයෙහි තෙවන ධ්‍යානයෙහිද, පහේ ක්‍රමයෙහි සතරවන ධ්‍යානයෙහිද, චූල, මධ්‍ය, ප්‍රණීත ධ්‍යාන වශයෙන් පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්හ යන නම්වලින් උපදිත්. මේ සියල්ලෝම ඒකාකාර ශරීර ඇත්තාහු මෙන්ම, සිව්වන ධ්‍යාන සංඥාවගේ වශයෙන්, ඒකාකාර හැඟීම්වලින් යුක්තවූවෝ යයි දතයුතුයි.

වේහප්ඵල බ්‍රහ්මයෝද, සතරවන විඤ්ඤාණස්ථිතියටම ඇතුළත්ය. අසඤ්ඤසත්ත බ්‍රහ්මයෝ, විඤ්ඤාණය නොමැති හෙයින් මෙහි සංග්‍රහ නොවෙත්. සත්තාවාසයන්හි සංග්‍රහ වෙති. වර්ධනය වන පක්ෂයෙහි සිටිත්, සුද්ධාවාසිකයෝ සදාකාලික නොවෙති. කල්ප ලක්ෂයක්ද, අසංඛ්‍යයක් වූයේද, බුද්ධ ශූන්‍ය ලෝකයෙහි නූපදිති. කල්ප සොළොස් දහසක් අතරත, බුදුවරු උපන් කල්හිම උපදිති. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මචක්‍රය පවත්වන කල්හි කඳවුරු බැන්දා මෙනි. එහෙයින් විඤ්ඤාණ ස්ථිතියද නොවේ. සත්තාවාසයද නොවේ.

මහාසිව තෙරහු සාරිපුත්‍රය, මා විසින් මේ දීර්ඝ කාලය තුළ, සුද්ධාවාස දෙව්ලොව හැර නොවිසූ විරූ සත්තාවාස සුලභ නැත. මේ සූත්‍රයෙන් සුද්ධාවාසය සතරවන විඤ්ඤාණටඨිතියද සතරවන සත්තාවාසයද භජනය කෙරෙත් යයි කියයි. එය සූත්‍රයෙන් ප්‍රතික්ෂෙප

නොකොට අනුදත් නේවසඤ්ඤානාසඤ්ඤායතනයයි. සඤ්ඤාව යම්සේද විඤ්ඤාණයටද එසේය. සියුම් බැවින් විඤ්ඤාණයද නොවේය. අවිඤ්ඤාණයද නොවේය. එහෙයින් විඤ්ඤාණස්ථිතීන්හි නොකියන ලදී.

අට්ඨලොක ධම්මා යනු, ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, සැප, දුක් යන මේ අට, ලෝකයෙහි පැවැත්ම කෙරෙහි ඉතා උසස් අන්දමින් බලපාන ධර්ම බැවින් ලෝකයාගේ ධර්මනුයි = ලෝක ධර්මයි. මෙයින් මිදුණු සත්ත්වයෙක් නම් නැත. බුදුවරුන්ටද මුහුණ දෙන්ට සිදුවේමය. දෙසුම් පරිදි, මහණෙනි මේ අටලෝ දම් ලෝකය අනුව පෙරළේ. ලෝකයද අටලෝදම් අනුව පෙරළේ. කවර අටදෙනෙක්ද? ලාභය ද, අලාභය ද, අයස ද, යසස ද, නින්දාව ද, ප්‍රශංසාව ද, සුවය ද, දුක ද යන අටයි. මහණෙනි මේ අටලෝ දම් ලෝකය අනුව පෙරළේ. ලෝකයද මේ අටලෝදම් අනුව පෙරළේ. එහි අනුපරිවත්තනති යනු ලුහුබඳිත්. අත් නොහරිත්. ලෝකයෙන් නොනවතිත් යන අර්ථයි. ලාභ යනු පැවිද්දාට සිවුරු ආදියත්, ගෘහස්ථයාට ධනධාන්‍යාදී ලැබීම්ය. එම ලාභයම නොලබන්නේ, අලාභයයි. ලාභ නොවීම අලාභයයි කියන කල්හි, තේරුම් නොවන තත්වයට පත්වන හෙයින් පිරිසිඳ දැනීමක් නොවන්නේය. යසො යනු පිරිවරයි. එම යසසම නොලබන කල්හි අයසයි. නින්දා යනු නුගුණ කථා කිරීමයි. පසංසා යනු ගුණවර්ණනා කථා කිරීමයි. සුඛං යනු කාමාවචරයින්ට කායික හා චෛතසික වශයෙනි. දුක්ඛං යනු පෘථග්ජන සෝවාන්, සකෘදාගාමීන්ට කායික හා චෛතසික වශයෙනි. අනාගාමී හා රහත් අයට කායිකවම පවතී.

නවසත්තාවාසා යනු, සත්ත්වයින්ගේ විසීම්, වාසය කරන ස්ථාන යන අර්ථයි. ඒවා වනාහි මෙහි ප්‍රකාශිත ස්කන්ධයෝමය. කවර නවයෙක්ද? භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. මහණෙනි, මේ සත්තාවාස නවයකි. කවර නවයෙක්ද? මහණෙනි නානාප්‍රකාර ශරීර ඇති, නානාප්‍රකාර හැඟීම් ඇති සත්ත්වයෝ සිටිත්. ඒ කෙසේද යත්, මිනිස්සු සමහරු දෙවිවරු සමහර විනිපාතික අසුරයෝ, මේ පළමු සත්තාවාසයයි. මහණෙනි, නානාප්‍රකාර ශරීර ඇති, ඒකාකාර හැඟීම් ඇති සත්ත්වයෝ සිටිත්. ඒ කෙසේද යත්, ප්‍රථමයෙන් උපන් බ්‍රහ්මකායික දෙවියෝ. මේ දෙවන සත්තාවාසයයි. මහණෙනි, ඒකාකාර ශරීර ඇති නානාප්‍රකාර හැඟීම් ඇති සත්ත්වයෝ සිටිත්. ඒ කෙසේද යත්, ආභස්සර දෙවියෝ. මේ තෙවන සත්තාවාසයයි. මහණෙනි, ඒකාකාර ශරීර ඇති, ඒකාකාර

හැඟීම් ඇති සත්ත්වයෝ සිටිත්. ඒ කෙසේද යත්, සුභකිණ්හක දෙවියෝ, මේ සතරවන සත්තාවාසයයි. මහණෙනි, හැඟීම් නැති-සංවේදීතාවෙන් තොර සත්ත්වයෝ සිටිත්. ඒ කෙසේද යත්, අසඤ්ඤසත්ත දෙවියෝ මේ පස්වන සත්තාවාසයයි.

මහණෙනි, සර්වප්‍රකාරයෙන් රූප සංඥාවන්ගේ ඉක්මවීමෙන්, කෝප, සංඥාවන් දුරලීමෙන්, නොයෙක් සංඥාවන් (හැඟීම්) මෙනෙහි නොකිරීමෙන්, ආකාසය අනන්තයයි, ආකාසානඤ්චායතනයට පැමිණි සත්ත්වයෝ සිටිත්. මේ සවන සත්තාවාසයයි. මහණෙනි සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා, විඤ්ඤාණය අනන්තයයි (බවුන් වඩා) විඤ්ඤාණඤ්චායතනයට පැමිණි සත්ත්වයෝ සිටිත්. මේ සත්වන සත්තාවාසයයි. මහණෙනි, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි (බවුන් වඩා) ආකිඤ්චඤ්ඤායතනයට පැමිණි සත්ත්වයෝ සිටිත්. මේ අටවෙනි සත්තාවාසයයි. මහණෙනි, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා කිසිවක් නැතැයි බවුන් වඩා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණි සත්ත්වයෝ සිටිත්. මේ නවවන සත්තාවාසයයි. මහණෙනි, මේවා නව සත්තාවාසයි.

**දසායතනානි** යනු, චක්ඛායතනය, රූපායතනය, සෝතායතනය, සද්දායතනය, ඝාණායතනය, ගන්ධායතනය, ජිව්හායතනය, රසායතනය කායායතනය, ඵස්සායතනයයි මෙසේ දහයකි. මනායතන-ධර්මායතන ලෝකෝත්තර මිශ්‍ර හෙයින් නොගන්නා ලදී. මේ දස විසඳුම්හි විදර්ශනා වශයෙන් තීරණ පරිඤ්ඤාව කියන ලදී. 'සබ්බං භික්ඛවෙ පරිඤ්ඤෙය්‍යං ආදීන්හි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියාදීත්‍රයද, නිරෝධ ප්‍රතිපදාවන්ගේ සාක්ෂාත් කිරීමෙන් භාවනා කරුණද, ඒවාහිම ප්‍රතිවේධ කරුණද, දුක්ඛාදීන්ගේ ඉවත් කිරීමට හේතුවූ අනුත්පාදාදීන්ගේ වශයෙන් පසළොසක්ද, පරිග්‍රහර්ථාදීන්ගේ වශයෙන් එක්තිසක්ද, මතු ප්‍රතිවේධාර්ථාදියෙන් ත්‍රයයක්ද, මාර්ගාංගයන්ගේ වශයෙන් අටක්ද, ප්‍රයෝගයන්ගේ සංසිඳීම් අර්ථයදැයි ආදීන්ගෙන් වශයෙන් ද්වයයක්ද, අසංඛතාර්ථයාගේ නැගිටීම් ආදීන්ගේ වශයෙන් ද්වයයක්ද, නිර්යානාර්ථයාගේ අවබෝධ කිරීම් වශයෙන් ත්‍රයයක්ද, අවබෝධ කිරීම් අර්ථාදීන්ගේ වශයෙන් ත්‍රයයක්ද, අවබෝධ කිරීම් පක්ෂයට ඇතුළත් වීම් වශයෙන් ත්‍රයයක්ද, බබලවන අර්ථාදීන්ගේ වශයෙන් සතරක්ද ප්‍රකාශනාර්ථාදීන්ගේ වශයෙන් අටළොසක්ද, විවට්ටානුපස්සනාදීන්ගේ

වශයෙන් නවයක්ද, ක්‍ෂයයෙහි ඥාණය, අනුත්පාදයෙහි ඥාණයන්ද ප්‍රඥා විමුක්තියද, නිර්වාණයද යන මෙම ධර්මයන්ගේ ප්‍රතිලාභ වශයෙන් තීරණ පරිඥාව යූ.සේයි.

සෙස්සෙහි සුදුසු පරිදි විදර්ශනා වශයෙන්ද, ප්‍රතිලාභ වශයෙන්ද තීරණ පරිඥාව කියන ලදැයි දතයුතුයි. **යෙසං යෙසං ධම්මානං පටිලාභත්ථාය වායමනතසස තෙ තෙ ධම්මා පටිලද්ධා හොනති එවං තෙ** ධම්මා පරිඤ්ඤතාචෙව හොනති තීරිතාච යනු කෘත්‍යය නිමාකිරීම් අර්ථයෙන් තීරණ පරිඥාව කියන ලදී. කෘත්‍යයන් සමාප්ත වූ කල්හි ඒ ධර්ම ලැබුණාහු වෙති. සමහරු වනාහි ප්‍රමාදීව විදර්ශනා ප්‍රාප්තිකයින්ට ඥාත පරිඥාවයයි කියති. අභිඤ්ඤෙය්‍යයන්ගෙන් ඥාත පරිඥාව කියන ලද හෙයින් එය නොහොබී. පරිඤ්ඤතාචෙව හොනති තීරිතාච යනු ඔවුහු අවබෝධ කරගත් ධර්මයම සම්පූර්ණයෙන් දැනගත්තෝ මෙන්ම තීරණය කරන ලද්දාහුද නම් වෙතියි අර්ථයි. මෙසේ කෘත්‍ය සමාප්ත කරන අර්ථයෙන් පරිඤ්ඤාතාර්ථය කියන ලද්දේ වෙයි. දැන් එම අර්ථයම එක් එක් ධර්මයන්හි ප්‍රතිලාභ වශයෙන් යොදා, අන්තයෙහිද නිගමනයකොට දක්වන්ට, නෙකඛම්මං යන ආදිය කීහ. ඒ සියල්ල පෙර කියන ලද අයුරින්ම දතයුතුය.

**පරිඤ්ඤෙය්‍ය නිර්දේශ වර්ණනාව නිමි.**

පහාතබ්බ නිර්දේශයෙහි, **අසම්මානො** යනු රූපාදී පඤ්ච උපාදානස්කන්ධයන්හි මම වෙමියි මැනීමයි. එය ප්‍රහීණ වූ කල්හි අර්හත්වයට පැමිණියේ වෙයි. රූපරාගාදී සෙසු දෑ විද්‍යමාන කල්හිද ඒවා නොකියා අස්මි මානයම කියන ලද්දේ දෘෂ්ටියෝග්‍යතාවයෙන් එහි දෘඪ ගතිය නිසායයි දතයුතුය. **අවිජ්ජා** යනු, සූත්‍රාන්ත ක්‍රමයෙන් දුක්ඛාදී සතර ස්ථානයන්හි නොදැනීමයි. අභිධර්ම ක්‍රමයෙන් පූර්වාන්තාදීන් ඇතුළු අටෙහි නොදැනීමයි. කියන ලද්දේමය. එහි අවිද්‍යාව කවරේද? දුකෙහි නොදැනීම, දුක හටගැනීමෙහි නොදැනීම, දුක් නිරුද්ධයෙහි නොදැනීම, දුක් නිරෝධයට පමුණුවන ප්‍රතිපදාවෙහි නොදැනීම, පූර්වාන්තයෙහි

නොදැනීම, අපරාන්තයෙහි නොදැනීම, පූර්වාපරන්තයන්හි නොදැනීම මේ හේතුවෙන් හටගත්තේය යන ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයන්හි නොදැනීම වේ. **භවතණ්හා** යනු කාමාදී භවයන්හි ප්‍රාර්ථනයයි. දෙසූ පරිදි, එහි භව තණ්හාව කවරේද? භවයන්හි යම් භව කැමැත්තක්, භව ඇල්මක්, භව තෘෂ්ණාවක්, භව ස්නේහයක්, භව තදින් අල්ලා ගැනීමක්, භව බලවත් ඇල්මක් වේද ඒවා වෙයි. **තිසෙසා තණ්හා** යනු, කාම තෘෂ්ණා, භව තෘෂ්ණා, විභව තෘෂ්ණායි. ඒවා අභිධර්මයෙහි මෙසේ නිර්දේශ කරන ලදී. එහි භව තෘෂ්ණාව කවරේද? භව දෘෂ්ටි සහගත රාගයයි. -පෙ- සිතෙහි සරාගිත්වයයි. මෙය භව තෘෂ්ණාව යයි කියනු ලැබේ. එහි විභව තෘෂ්ණාව කවරේද? නැවත, නොඉපදීම් දෘෂ්ටියෙන් යුත් රාගයයි -පෙ- සිතෙහි සරාගිත්වයයි. මෙය විභව තෘෂ්ණාවයයි කියනු ලැබේ. සෙසු තෘෂ්ණා කාම තෘෂ්ණායි. එහි කාම තෘෂ්ණාව කවරෙක්ද? කාමධාතුව හා එකට යෙදුණු රාගයයි -පෙ- සිතෙහි සරාගිත්වයයි. මෙය කාම තෘෂ්ණාවයයි කියනු ලැබේ. එහි භව තෘෂ්ණාව කවරේද? රූපධාතු අරූපධාතු හා එකට යෙදුණු රාගයයි. -පෙ- එහි විභව තෘෂ්ණාව කවරේද? නැවත නොඉපදීම් දෘෂ්ටියෙන් යුත් රාගයයි. -පෙ- අටුවාවන්හි වනාහි පංචකාම ගුණයෙන් යුත් රාගය කාම තෘෂ්ණාවයි. රූප-අරූප භවයන්හි රාගය, ධ්‍යානයෙහි බලවත් ආශාව, ශාශ්වත දෘෂ්ටිය හා යෙදුණු රාගය, භව වශයෙන් ප්‍රාර්ථනාව භව තෘෂ්ණාවයි. උච්ඡේද දෘෂ්ටිය හා එකට යෙදුණු රාගය විභව තෘෂ්ණාවයයි කියන ලදී.

සංගීති ක්‍රමයෙන් හා අභිධර්ම ක්‍රමයෙන් වෙනත් ත්‍රිවිධ තෘෂ්ණාවකි. කාම, රූප, අරූප තෘෂ්ණා. වෙනත් ත්‍රිවිධ තෘෂ්ණාවකි. රූප, අරූප, නිරෝධ තෘෂ්ණා. තෘෂ්ණාවද මෙහි යෙදේ. ඒවාහි පංචකාම ධාතුව, රූප ධාතුව, අරූප ධාතුව හා එකට යෙදී ඇත. අන්තයෙහි තෘෂ්ණාව උච්ඡේද දෘෂ්ටිය හා බැඳී පවතී. **චත්තාරො ඔඝා** යනු කාමඕඝ, භවඕඝ, දිට්ඨි ඕඝ, අවිජ්ජා ඕඝ වශයෙනි. යමෙකුට මේවා විද්‍යමාන වේද, ඔහු සසර ගමන නමැති සැඩපහරට හසුවෙයි. හසුව ගිලාබස්වතීනුයි ඕඝයි. බලවත් කෙලෙස්. පංචකාම ගුණ සංඛ්‍යාත කාම සැඩපහරනුයි කාමෝඝයි. කාම තෘෂ්ණාවට මෙය නමකි. රූප, අරූප සංඛ්‍යාත කර්ම, උත්පත්ති යන දෙවැදෑරුම් භවයන්හි ඕඝයනුයි- භවෝඝයි. භව තෘෂ්ණාවට මෙය නමකි. දෘෂ්ටියම ඕඝයනුයි දෘෂ්ටි ඕඝයි. ලෝකය සදාකාලිකය ආදි වශයෙන් පවත්නා දෘෂ්ටියට මෙය නමකි. අවිද්‍යාවම ඕඝය වූයේ = අවිද්‍යා ඕඝයි. දුක් ආදීන්හි නොදැනීමට මෙය නමකි. **පඤ්ච නීවරණානි** යනු කාමච්ඡන්ද,

ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන නීවරණයි. සිත වළක්වයි. හාත්පසින් වසාගනියිනුයි නීවරණයි. කැමති වන්නේනුයි කාමායි. පංචකාමයන්ය = කාම වස්තූන්හි කැමැත්ත - කාමච්ඡන්දයයි. කැමැති වන්නේනුයි - කාමොයි. කාමයම කැමැත්ත වූයේ, කරනු කැමැත්තෙහි ඡන්දය නොවූයේ, ධර්මයෙහි කැමැත්ත නොවූයේ නුයි = කාමච්ඡන්දයයි. කාම තෘෂ්ණාවට එය නමකි. එයින් සිත කුණු වූ බවට පත්කරයි. විපතට පමුණුවයි. විනය, ආචාරධර්ම, රූසපුව, හිතසුව යනාදීන්ට බාධා පමුණුවයි නුයි = ව්‍යාපාදයි. ද්වේෂයට එය නමකි. මැලිබව ථීනයයි. අකර්මණ්‍යත්වය මිද්ධයි. මන්දෝත්සාහීව හැකිලීම, නොඇල්මෙන් වන විපත යන අර්ථයි. සිතෙහි උත්සාහවත් නොවන භාවය ථිනයි. චෛතසිකයන්ගේ අකර්මණ්‍යතාවය (පසුබැස්ම) මිද්ධයි. ථිනයද, මිද්ධයද = ථිනමිද්ධයි. නොසන්සුන්තාවයෙහි ස්වභාවය= උද්ධච්චයි. නොසන්සිඳුණු බව යන අර්ථයි. කලබලකාරී ස්වභාවයට මේ නමකි. පිළිකුල්ව කරන ලද්දේ = කුකතයි. පිළිකුල්ව කරන ලද්දෙහි ස්වභාවය කුක්කුච්චංයි. ගර්හා කළයුතු ක්‍රියා ස්වභාවය යන අර්ථයි. පසුතැවිල්ලට මෙය නමකි. පහවූ ප්‍රතිකාර ඇත්තේනුයි = විචිකිච්ඡායි. (අරමුණු නිශ්චය කරගැනීමෙහි අසමර්තායෙන් පිළියම් කටැටි නොවන රෝගයක් මෙන් දුසසාධ්‍ය වූ සැකකිරීම ලක්‍ෂණකොට ඇති ධර්මයකි.) පහවූ ප්‍රඥා ඇත්තේය යන අර්ථයි. සත්‍ය ස්වභාවය සොයන්නේ මෙයින් කරදරයට පත්වේ. වෙහෙසෙයිනුයි = විචිකිච්ඡායි. බුද්ධාදී අටතැන්හි සැක කිරීමට මෙය නමකි. කාමච්ඡන්දයම නීවරණයක් වූයේ නුයි = කාමච්ඡන්ද නීවරණයි. සෙස්සෙහිද මෙසේයි. ඡ ධම්මා ඡදධම්ම යනුද පාඨයි.

ඡ තණ්හාකායා යනු, රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම යන තෘෂ්ණාය. රූපයෙහි තෘෂ්ණාව = රූප තණ්හායි. එයම කාම තෘෂ්ණාදී භේදයෙන්, නානාවිධ ප්‍රභේද ඇති හෙයින් රාශ්‍යර්ථයෙන් කාය යයි කියන ලදී. සෙස්සෙහිද මෙසේයි. සත්ත අනුසයා යනු කාමරාග, පටිඝ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, භවරාග, අවිජ්ජා යනාදි ප්‍රහීණ නොවූ අර්ථයෙන් අත්නොහැර පවතිත් නුයි = අනුසයයි. කාමයන්හි රාගය - කාම රාගයයි. කාමයම රාගය වූයේනුයි - කාමරාගයි. අරමුණෙහි හැපේනුයි = පටිඝොයි. ස්වභාව තත්වයට විරුද්ධ දර්ශනාර්ථයෙන් = දිට්ඨියි. තමා උසස්කොට හඟීනුයි - මානයි. භවයන්හි රාගය භව රාගයි. බලවත් වූ කාමරාගය කාමරාගානුසයයි. සෙස්සෙහිද මෙසේය. අට්ඨ මිච්ඡත්තා යනු, මිච්ඡාදිට්ඨි, මිච්ඡා සංකප්ප, මිච්ඡා වාචා, මිච්ඡා කම්මන්ත, මිච්ඡා ආජීව, මිච්ඡාවායාම,

මිච්ඡා සති, මිච්ඡා සමාධි යන අටය. මට හිතසුව එළවීමක් වන්නේ යයි, මෙසේ බලාපොරොත්තු වූයේ නමුත්, එසේ නොවන හෙයින්ද, අශුභාදීන්හි සුභය යන විපර්යාස පැවැත්මක් හෙයින්ද වැරදි ස්වභාවයනුයි මිථ්‍යාවයි. අසත්‍ය ආකාරයට බලයි - මෙයින් අසත්‍ය ආකාරයට බලත්නුයි - මිථ්‍යා දෘෂ්ටියි. නොහොත් විපර්යාස දෘෂ්ටියනුයි - මිථ්‍යා දෘෂ්ටියි. ස්වභාව තත්වයට විරුද්ධ දෘෂ්ටියනුයි - මිථ්‍යා දෘෂ්ටියි. වරදවා ගන්නා හෙයින්ද, අසත්‍ය වූ දෘෂ්ටියනුයි - මිථ්‍යා දෘෂ්ටියි. අවැඩ එළවන හෙයින්ද, නුවණැත්තන් විසින් පිළිකුල් කරන ලද දෘෂ්ටියනුයි. මිථ්‍යා දෘෂ්ටියි. මිථ්‍යා සංකල්පාදීන්හිද මේ ක්‍රමයමැයි. මිථ්‍යා දෘෂ්ටි යනු ශාශ්වත-උච්ඡේද දෘෂ්ටීන්හි ඇතුළට වැදීමයි. මිථ්‍යා සංකල්ප යනු කාම විතර්කාදී ත්‍රිවිධ විතර්කයෝය. මිථ්‍යා වාචා යනු මුසාවාද ආදී සිවු ආකාර චේතනාවෝය. මිථ්‍යා කර්මාන්ත යනු, ප්‍රාණඝාත ආදී ත්‍රිවිධ චේතනා මිථ්‍යා ආජීව යනු, වැරදි ජීවන ප්‍රයෝග තුළින් හටගත් චේතනා. මිථ්‍යා ව්‍යායාම යනු, අකුසල් සිත හා එකට යෙදුණු වීර්යයයි. මිථ්‍යා සති යනු, සිහියට විරුද්ධ අකුසල් සිත්හි ඉපදීම්. මිථ්‍යා සමාධි යනු, අකුසල ආරම්මණ සමාධියයි.

නව තණ්හා මූලකා ධම්මා යනු, තෘෂ්ණාව හේතුකොට සෙවීමද, සෙවීම හේතුකොට ලැබීමද, ලැබීම හේතුකොට තීරණයද, තීරණය හේතුකොට ඡන්ද රාගයද, ඡන්ද රාගය හේතුකොට බලවත් ඇල්මද, බලවත් ඇල්ම හේතුකොට තදින් අල්ලා ගැන්මද, තදින් අල්ලා ගැන්ම හේතුකොට මසුරුකමද, මසුරුකම හේතුකොට ආරක්ෂා කිරීමද, ආරක්ෂා කිරීම් හේතුකොට, දඬුමුගුරු ගැනීම, කල කෝලාහල, විවාද, තෝ, උඹ වැනි කථා, කේලාම්, මුසාබස් තෙපලීම් වැනි නොයෙක් පාපී අකුසල ධර්ම හටගනියි. මේ නව තෘෂ්ණා මූලික ධර්ම වේ. තෘෂ්ණාව මුල් වූයේ මේවාට නුයි. තෘෂ්ණා මූලිකයි. පරියෙසනාදීන් අකුසලමය. තණ්හං පටිච්ච යනු, තෘෂ්ණාව හේතුකොට, පරියේසනා යනු රූපාදී අරමුණු සෙවීමයි. එය තෘෂ්ණාව ඇතිකල්හි වෙයි. ලාභො යනු, රූපාදී අරමුණු ප්‍රතිලාභයයි. එයද සෙවීම නිසා වෙයි. විනිශ්චය වනාහි, ඥාණ, තෘෂ්ණා, දෘෂ්ටි, විතර්ක වශයෙන් සිව්ආකාර වේ. එහි සුව විනිශ්චය දැනගන්නේය. සුව විනිශ්චය දැන අධ්‍යාත්ම සුවයෙහි යෙදෙන්නේය. මේ ඥාණ විනිශ්චයයි. විනිශ්චය වනාහි, තෘෂ්ණා විනිශ්චය, දෘෂ්ටි විනිශ්චය වශයෙන්, විනිශ්චය දෙකකි. මෙසේ දක්වා ඇති අටසියයක් තෘෂ්ණා ආශ්‍රිත තෘෂ්ණා විනිශ්චයෝය. දේවානමින්දය ඡන්දය විතර්කය නිදානකොට පවතී. මෙම සූත්‍රයෙහි විනිශ්චය යනු කියන ලද විතර්කයම දක්වයි. ලාභයක් ලැබ,

ඉටුඅනිටු, ශුභ අශුභ විතර්කයෙන්ම විනිශ්චය කරති. රූප අරමුණු සඳහා මට මෙපමණ වන්නේය. ශබ්දාදි අරමුණු සඳහා මට මෙපමණ වන්නේය. අනුන්ට මෙපමණය. මෙපමණ පරිභෝජනය කරන්නෙමි. මෙපමණ තැන්පත් කරන්නෙමි. එහෙයින් 'ලාභ පටිච්ච විනිශ්චයෝ'යි යූ.සේයි. ඡන්දරාගො, මෙසේ අකුසල විතර්කයෙන් විතර්කනය කල කල්හි වස්තුවෙහි දුර්වල රාගයට විශේෂ නාමයකි. රාගො යනු බලවත් රාගයටයි. අජ්ඣොසානං යනු, මම, මගේ යන බලවත් සනිටුහන් කිරීමයි. පරිග්ගහො යනු තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් තදින් අල්ලා ගැනීමයි. මච්ඡරියං යනු, සම්පත්හි අනුන් හා සාධාරණභාවය නොඉවසීමයි. එහෙයින් පෞරාණිකාචාර්යයෝ ඊට මෙම තේරුම කියති. මේ සම්පත් මටම වේවා. අනුන්ට නොවේවායි යන ස්වභාවයෙන් පවත්නා හෙයින් මච්ඡරිය යයි කියයි. ආරක්ඛො යනු දොරගුලු වසා, පෙට්ටි පියලිවල තැන්පත්කොට රැකීම් වශයෙන් කරන සංරක්ෂණයයි. මනාකොට විග්‍රහ කෙරේනුයි, නිරාකරණය කෙරේනුයි අධිකරණ කාරණයට එය නාමයකි. අරක්ඛාධිකරණං යනු, භාව නපුංසකයි. ආරක්ෂක හේතු යන අර්ථයි. දඬු ගැනීම් ආදීන්හි අන්‍යයා වැළැක්වීමට දඬුමුගුරු ගැනීම = දණ්ඩාදානයි. මුවහත් තල සහිත ආයුධ ගැනීම සත්ථාදානයි. කයින් වදනින් කලහය = කලහොයි. පළමු පළමු විරුද්ධතාවන් පෑම විග්‍රහයයි. පසු පසුවට එන්නේ විවාදයයි. තුවං, තුවං යනු අගෞරව වශයෙන් උඹ, උඹ කීමයි.

දස මිච්ඡත්තා යනු මිථ්‍යා දෘෂ්ටිය, -පෙ- මිථ්‍යා සමාධිය, මිථ්‍යා ඤාණය, මිථ්‍යා විමුක්තියයි, එහි මිච්ඡා ඤාණං යනු පාප ක්‍රියාවන්හි උපාය මාර්ග සිතීම් වශයෙන්, පාපයක් කොට, මවිසින් යහපතක් කරන ලදැයි ප්‍රත්‍යවේක්ෂාකාරයෙන් උපන් මෝහයයි. මිච්ඡා විමුත්ති යනු, නොමිදුණේම මිදුණි යයි යන හැඟීමෙන් යුක්ත වීම.

දැන් නොයෙක් භේද සහිත ප්‍රහාණයන්ගෙන්, ප්‍රහාණය කළයුතු දෑ දක්වන්ට 'දෙව පහාණානි' ආදිය පටන් ගන්නා ලදී. ප්‍රහාණයන් පිළිබඳව දත්කල්හි, එකිනෙකින් ප්‍රහාණය කළයුතු ධර්ම මනාව දතහැකි වෙතියි, පඤ්ච ප්‍රහාණයන්හි ලෞකික ප්‍රහාණද්වයයද, අප්‍රයෝග නිස්සරණ ප්‍රහාණයද හැර, අප්‍රයෝගම වූ ලෝකෝත්තර ප්‍රහාණ ද්වයය ප්‍රථමයෙන් යූ.සේයි.

මේ කරණකොට මනාව කෙලෙසුන් විනාශ කෙරෙත්නුයි සමුච්ඡෙදොයි. මෙයින් කෙලෙසුන් ප්‍රහාණ වෙත්නුයි පහාණංයි. මුලිනුපුටා දැමීම් සංඛ්‍යාත ප්‍රහාණයයි. ප්‍රහාණය කළයුතු ශේෂයක් නැත්තේනුයි **සමුච්ඡෙදප්පහාණං** යි. කෙලෙසුන්ගේ සිත් සිඳුණු බැවින් පටිප්පස්සද්ධියි. ප්‍රහීණ වූ බැවින් පහානංයි. සංසිඳීම් සංඛ්‍යාත ප්‍රහාණය **පටිප්පස්සද්ධිප්පහාණංයි** ලෝකයෙන් එතෙර වේනුයි **ලොකුත්තරොයි** නිර්වාණ සංඛ්‍යාත ක්‍ෂයයට යේනුයි ඛයගාමියි ක්‍ෂයගාමී වයේත් එයයි. මාර්ගය වූයේත් එයනුයි **ඛයගාමිමග්ගොයි.** එය වඩන කල්හි ඒ මාර්ගය සමුච්ඡෙද ප්‍රහාණයයි යන අර්ථයි. එසේම ඵල ක්‍ෂණයෙහි ලෝකෝත්තර ඵලයම පටිප්පස්සද්ධි ප්‍රහාණයයි. කාමානමෙතං නිස්සරණං ආදීන්හි කාමයෙන්ද, රූපයෙන්ද, සංඛතයෙන්ද මේ කරණකොටගෙන නිදහස් වෙතියි **නිස්සරණං** = ඒවායින් හෝ නිදහස් වන හෙයින් අසුභ ධ්‍යානය නිස්සරණයි. කාමයන්ගෙන් නික්මුණු හෙයින් **නෙක්ඛම්මංයි.** අනාගාමි මාර්ගය හෝ වෙයි. අසුභ ධ්‍යානය කාමයන් මැඩපවත්වන හෙයින් කාමයන්ගේ නිස්සරණයයි. ඒ ධ්‍යානය පාදකකොට උපදවන ලද අනාගාමි මාර්ගය වනාහි කාමයන් සර්වප්‍රකාරයෙන් මුලිනුපුටා සිඳ දමන හෙයින් අත්‍යන්ත නිස්සරණයයි. වෙනස් වේනුයි = රූපංයි. රූප නොවූයේ අරූපයි. මිත්‍ර ප්‍රතිවිරුද්ධ සතුරන් මෙන්ද, ලෝභාදීන්ට විරුද්ධ අලෝභාදීන් මෙන්ද, රූපයන්ට ප්‍රතිපක්‍ෂයයි යන අර්ථයි. ප්‍රතිඵල වශයෙන් හෝ රූපයක් නොමැත්තේ නුයි අරූපංයි. අරූපයම = ආරුප්පංයි අරූප ධ්‍යානයෝය. ඒවා රූපයන්ගෙන් නිස්සරණය නම් වේ. අරූපයන්හිදීද අර්හත් මාර්ගය නැවත උපත් වළක්වන හෙයින් සර්වප්‍රකාරයෙන් රූපයන්ගේ නිස්සරණය නම් වේ.

**භූතං** යනු, හටගත් යන අර්ථයි. **සංඛතං** යනු, ප්‍රත්‍යයන්ගෙන් එකතුව කරන ලද, **පටිච්ච සමුප්පන්නං** යනු ඒ ඒ ප්‍රත්‍යයන් හේතුකොට මනාව සමග උපන් පළමුවැන්නෙන් හටගත් බව දැක්වීමෙන් අනිත්‍යතාවයද, දෙවැන්නෙන් අනිත්‍යතාවයාගේ ඇතිකල්හිද, ප්‍රත්‍යය බලය දැක්වීමෙන් අන්සතු බවද, තෙවැන්නෙන් අන්සතු වූයේ නමුත් ප්‍රත්‍යයන්ගේ උනන්දු නොවීම දැක්වීමෙන් ස්වයං සිද්ධිය දක්වන ලද්දේ වෙයි. **නිරොධො** යනු නිර්වාණයයි. නිවනට පැමිණ දුක නිරුද්ධ කෙරේනුයි නිරෝධයයි කියනු ලැබේ. එයම සියලු ප්‍රත්‍යයෙන් හටගත් දැයින් ඉවත්වූ හෙයින් ඒ සංඛතයාගේ නිදහස්වීමයි. අටුවාවෙහි වනාහි 'නිරොධො තස්ස නිස්සරණං' යනු මෙහි අර්හත්ඵලය නිරෝධයයි අදහස් කරන ලදී.

අර්හත් ඵලයෙන් නිර්වාණය දුටුකල්හි නැවත මත්තෙහි සියලු සංස්කාරයෝ නොවෙත්නුයි, අර්හත්වයයි කියනු ලබන නිරෝධයට ප්‍රත්‍යය බැවින් නිරෝධයයි කියන ලදී. **නෙක්ඛම්මං පටිලද්ධස්ස** යනාදීන්හි අසුභ ධ්‍යාන නිදහසෙහි සමුච්ඡෙද ප්‍රහාණයෙන්ද, කාමයන් ප්‍රහීණ වූයේම අත්හරින ලද්දේද වේ. අරූප ධ්‍යානයන්ගේ නිදහසෙහිද, අර්හත් මාර්ගයාගේ නිදහසෙහිද එපරිද්දෙන්ම රූප යෙදිය යුතුය. රූපයන්හි ඡන්ද රාග ප්‍රහාණයෙන් රූපයන්ගේ පූර්ණ විනාශය වෙයි. රූපා යනු ලිංග විපර්යාසයි. නිර්වාණයාගේ නිදහසෙහි නිස්සරණ ප්‍රහාණයෙන්ද අර්හත් ඵලයෙහි නිදහසෙහි සන්සිඳීම් ප්‍රහාණයෙන්ද සංස්කාර ප්‍රහීණ මෙන්ම හැරදමන ලද්දේද වේ. නිර්වාණ නිදහසෙහි අරමුණු කිරීම් වශයෙන් ප්‍රතිලාභය දතයුතුය.

දුක්ඛ සච්චං ආදීන්හි **පරිඤ්ඤා පටිවෙධං** යනු භාව නපුංසක වචනයි. සම්පූර්ණයෙන් දැනගෙන සත්‍යාවබෝධය කිරීම = සම්පූර්ණ සත්‍යාවබෝධයයි. ඒ සම්පූර්ණ සත්‍යාවබෝධය; සෙස්සෙහිද මේ ක්‍රමයමැයි. **පජහාති** යනු ඒ ඒ අයුරින් සත්‍යාවබෝධ කරන්නේ ප්‍රහාණය කළයුතු කෙලෙසුන් ප්‍රහාණය කෙරේ යයි අර්ථය ගතයුතුය. ලෞකික ලෝකෝත්තරයන්හිද, ඡන්ද, රාග ප්‍රහාණයෙන් ඒවා දුරු කෙරේයයි අර්ථයි. නැව යම්සේ පෙර පසු නොවී එකෙණෙහි මෙතෙර අත්හරී. දියපහර සිඳියි. භාණ්ඩ උසුලයි. පරතෙරට පමුණුවයි. යන සිව් කිසක් කරයිද, එපරිද්දෙන්ම මාර්ග ඥානය පෙරපසු නොවී එකෙණෙහි, දුක සම්පූර්ණ දැනීම් අවබෝධයෙන් අවබෝධ කරයි. සමුදය ප්‍රහාණ අවබෝධයෙන් අවබෝධ කරයි. මාර්ගය වැඩීම් අවබෝධයෙන් අවබෝධ කරයි. නිරෝධය සාක්ෂාත් කිරීම් අවබෝධයෙන් අවබෝධ කරයි යන සිවුසස් අවබෝධ කරයි. මෙයින් කුමක් කියන ලදද? නිරෝධය අරමුණුකොට සිවුසසුන්ට පැමිණෙයි. දකියි. සත්‍යාවබෝධය කරයි යයි කියන ලද හෙයින්, එකෙණෙහි වූයේ නමුත් වෙන් වෙන්ව මෙන් ප්‍රහාණයන් කියන ලදැයි දතයුතුය. පස්වැදෑරුම් ප්‍රහාණයන්හි යම් සෙවෙල් සහිත ජලයෙහි බහාලූ කළයෙහි සෙවෙල් මෙන්, ඒ ඒ ලෞකික සමාධිවලින් නීවරණාදී විරුද්ධ ධර්මයන්ගේ යටපත් කිරීමක් වේද? මෙය විෂ්කම්භන ප්‍රහාණයයි. **වික්ඛම්භනප්පහානඤ්ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො** යනු නීවරණයන්ගේ ප්‍රහාණය ප්‍රකට බැවින් යූ.සේයි. නීවරණ, ධ්‍යානයට පූර්වභාගයෙහිදීත්, පසු භාගයෙහිදීත් වහා සිත වසාගෙන නොපැතිරෙත්.

එම නීවරණ වසාගෙන පැතිරුණු කල්හි ධ්‍යානය පිරිහෙයි. විතර්කාදීහු ද්විතීය ධ්‍යානයට පෙර හා පසුව විරුද්ධ නොවී පවතිත්. එහෙයින් නීවරණයන්ගේ යටපත් කිරීම ප්‍රකටය. රෑ කල බබලන පහනෙන් අඳුර දුරලන්නාක් මෙන් ඒ ඒ විදර්ශනාවගේ කොටස් වූ ධ්‍යානාංගයෙන්, විරුද්ධාකාරයෙන් වන ඒ ඒ ප්‍රහාණය කළයුතු ධර්මයන්ගේ ප්‍රහාණයක් වේද, එය තාවකාලික ප්‍රහාණයයි. **තදංගපපහානඤ්ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො** යනු, මිථ්‍යා දෘෂ්ටීන්ගේම ප්‍රහාණය දළ වශයෙන් යූ.සේයි. මිථ්‍යා දෘෂ්ටීහු දළය. නිත්‍ය සංඥාදීහු සියුම්ය. එහි **දිට්ඨිගතානං** යනු දෘෂ්ටියම දෘෂ්ටිගතය. අශුචිගත, මුත්‍රගත ආදීන් මෙනි. දෘෂ්ටියෙහි යා යුතු බව හෙයින්ද දෘෂ්ටියෙහි ගිය ප්‍රමාණයම මෙය වේනුයි දිට්ඨිගතයි. දෙසැටක් දෘෂ්ටීන්හි ඇතුළත් හෙයින්ද, දෘෂ්ටීන්හි ගිය හෙයින්ද දෘෂ්ටිගතයි. (බහුවචනයෙන්) ඒ දෘෂ්ටිගතයන්ගේ තියුණු අවබෝධය සහිත සමාධිය යනු විදර්ශනාව හා යෙදුණු සමාධියයි. හෙණ පැටලී සම්පූර්ණයෙන් නැසුණා වූ වෘක්ෂයක් මෙන්, නැවත පැවැත්මක් නොවන අයුරු ආර්ය මාර්ග ඥානයෙන් සියලු සංයෝජන ධර්මයන්ගේ එවන් ප්‍රහාණයයි. මෙය සමුච්ඡෙද ප්‍රහාණ නම් වේ. **නිරොධො නිබ්බානං** යනු නිරෝධ සංඛ්‍යාත නිර්වාණයයි.

මෙසේ ප්‍රහාණ වශයෙන් ප්‍රහාණය කළයුතු ධර්මයන් දක්වා, දැන් ස්වභාව තත්වයෙන්ම නැවත ප්‍රහාණය කළයුතු ධර්ම දක්වන්ට, සබ්බං භික්ඛවෙ පහාතබ්බං යනාදිය වදාළහ. එහි චක්ෂුරාදීන්හි ඡන්දරාග ප්‍රහාණයෙන් ප්‍රහාණය කළයුතුය. 'රූපං පස්සනෙතා පජහති ආදීන්හි රූපය අනිත්‍යාදි වශයෙන් බලන්නේ ප්‍රහාණය කළයුතු කෙලෙස් දුරුකරයි. **චක්ඛුං -පෙ- ජරාමරණං -පෙ- අමතොගධං නිබ්බාණං** පෙය්‍යාලද්වයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියයි. **පස්සනෙතාපජහති** ආදී ඒ ලෝකෝත්තර -යන්හි අනඤ්ඤස්සාමිතින්ද්‍රිය, බලන්නේ මනාව බලන්නේ, බලාපොරොත්තු වන්නේ, කැමති වන්නේ, විදර්ශනා ක්ෂණයන්හි ප්‍රහාණය කළයුතු සියලු කෙලෙස් දුරුකෙරේනුයි ඒ ඒ සුදුසු අයුරින් යෙදිය යුතුය.

**සද්ධර්මප්‍රකාශනී නම් වූ ප්‍රතිසම්භිදාමාර්ග අටුවාවෙහි**
**ප්‍රහාණය කළයුතු ධර්ම විස්තර වර්ණනාව නිමි.**

වැඩිය යුතු ධර්ම විස්තරයෙහි **කායගතා සති** යනු කායගතා සති සූත්‍රාන්තයෙහි කියන ලද ආශ්වාස ප්‍රශ්වාස, සිවු ඉරියව්, කුඩා ඉරියව්, දෙතිස් කුණප මෙනෙහි කිරීම, සිව්ධාතු, නව අමු සොහොන් පිළිකුල් මෙනෙහි කිරීම හා යෙදුණු, සුදුසු අයුරින් රූපධ්‍යාන හා එකට යෙදුණු සිහිය, ඒවා ඒ ශරීරයන්හි ඇතුළත් වූවාහු පවත්නාහුයි කායගතායි කියයි. **සාත සහගතා** යනු මිහිරි, සුව විඳීම් සංඛ්‍යාත සිසිලෙන් එකට ඉපදීම් ආදී ස්වභාවයන් සමග යුක්තවූවාහු, සහගත ශබ්දය, ඒ බැව්හි, ගැවසීමෙහි, අරමුණෙහි, ආශ්‍රයෙහි, මිශ්‍රවීමෙහි යන පංචවිධ අර්ථයන්හි බුදුවදනෙහි පෙනේ. තෘෂ්ණාව හා ඇල්ම සහිත පුනර්භවය ඇතිකරන යම් ඒ තෘෂ්ණාවක් වේද යන මෙහි ඒ බැව්හි, තෘෂ්ණාව හා ඇල්මෙන් යුක්ත වූයේය යන අර්ථයි. මහණෙනි, යම් කුසීතකමින් යුත්, කුසීතකම හා යෙදුණු යම් විමසීමක් වේද, මෙහි ගැවසීමෙහි යෙදේ. අතරතුර උපදින කුසීතකමින් ගැවසුණේය යන අර්ථයි. රූප සහගත, සමවත්වල හෝ අරූප සහගත සමවත්වල ලාභියෙක් වේ. මෙහි අරමුණෙහි යෙදේ. රූප අරූප අරමුණු යන අර්ථයි. අස්ථික සංඥා සහගත සති සම්බොජ්ඣංගය වඩයි. මෙහි ආශ්‍රයෙහි, අස්ථික සංඥාව නිශ්‍රය කොට, අටයික සංඥාව ලබන ලදැයි අර්ථයි. මේ සැපය, මේ ප්‍රීතිය සමග වේ. එක්ව උපන්නේ, එයට යෙදුණේ වේ. මෙහි මිශ්‍රවීමෙහි, මිශ්‍රවන්නාහ යන අර්ථයි. මෙම පදයෙහිද මිශ්‍ර වූයේ යන්න අදහස් කරන ලදී. සිසිල හා මිශ්‍රවූයේ සිසිල සමග යුක්ත වූයේය යන අර්ථයි. චතුර්ථ ධ්‍යානය හැර සෙස්සෙහි සිහිල් සහගත තත්වය වේ. සිහියද උපේක්ෂා සහගත බැවින් බොහෝසෙයින් සිසිල් සහගතයයි කියන ලදී. චතුර්ථ ධ්‍යානයට මුල් ධ්‍යාන මුල්වන හෙයින්, සිසිල් සහගත බව වන හෙයින්ද, උපේක්ෂා සහගත බව කියන ලද්දේම වේ. උපෙක්ෂාවගේ සාන්ත සුවය කියන ලද හෙයින් බුදුරදුන් විසින් චතුර්ථධ්‍යාන සම්ප්‍රයුක්තවද සිහිල් සහගතයයි යු.සේයි. **සමථොච විපසසනාච** යනු කාමච්ඡන්දාදී විරුද්ධ ධර්මයන් සමනය කරයි. විනාශ කෙරෙයිනුයි = සමථොයි. මෙය සමාධියට නාමයකි. අනිත්‍යාදි වශයෙන් විවිධාකාරයෙන් ධර්මයන් දකීනුයි විදර්ශනායි. මෙය ප්‍රඥාවට නමකි.

සංගීති පර්යායෙහිද ලෞකික - ලෝකෝත්තර මිශ්‍රයි. **තයො සමාධි** යනු, විතර්ක සහිත විචාර සහිත සමාධිය, අවිතර්ක විචාර මාත්‍ර සමාධිය, අවිතර්ක අවිචාර සමාධිය, සම්ප්‍රයෝග වශයෙන් පැවැත්වීමේදී, විතර්කය සමග වූයේ සවිතර්කයි. විචාරය සමග වූයේ සවිචාරයි. එය **ක්‍ෂණික** සමාධි, විදර්ශනා සමාධි, උපචාර සමාධි, ප්‍රථමධ්‍යාන සමාධි වශයෙනි.

මෙයට විතර්කයක් නොමැතිනුයි - අවිතක්කකායි. විතර්ක විචාරයන්හි විචාර මාත්‍ර උපරිම ප්‍රමාණය මෙයටනුයි = විචාරමත්තෝයි. මත්තෙහි විතර්කයන් සමග එකට යෙදීමට නොයේනුයි අර්ථයි. එය පඤ්චක ද්විතීයධ්‍යාන සමාධියයි. ඒ දෙයාකාරයෙන් වෙන්වූයේ අවිතර්ක අවිචාර සමාධියයි. එය චතුෂ්ක ක්‍රමයෙහි ද්විතීය ධ්‍යානාදි වූද, පඤ්චක ක්‍රමයෙහි තෘතීය ධ්‍යානාදී වූද, රූපාවචර සමාධියි. ඒවා මෙහි අදහස් නොකරන ලදී. **චත්තාරො සතිපට්ඨානා** යනු කායානුපස්සනා, වෙදනානුපස්සනා චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යන සතර සතිපට්ඨානයි. පූර්ව භාගයෙහි තුදුස් අයුරින් කය පිරික්සනුයේ කායානුපස්සනා සතිපට්ඨානයයි. නව අයුරින් විඳීම පිරික්සනුයේ වෙදනානුපස්සනා සතිපට්ඨානයයි. සොළොස් අයුරින් සිත පිරික්සනුයේ චිත්තානුපස්සනා සතිපට්ඨානයයි. පස් අයුරින් ධර්මයන් පිරික්සනුයේ ධම්මානුපස්සනා සතිපට්ඨානයයි. ලෝකෝත්තර තත්ව මෙහි අදහස් නොකරන ලදී. **පඤ්චංගිකො සමාධි** යනු, කොටස් පහක් මෙයට ඇත්තේනුයි පඤ්චංගිකයි. ඒ චතුර්ථ ධ්‍යාන සමාධියයි. ප්‍රීතිය පැතිරීම, සුවය පැතිරීම, සිත පැතිරීම, ආලෝකය පැතිරීම, ප්‍රත්‍යවේක්ෂා නිමිත්තයන අංග පසයි. ප්‍රීතිය පැතිරෙමින් උපදීනුයි දෙදැහැන්හි ප්‍රඥාව, ප්‍රීතිය පැතිරීමයි. සුව පැතිරෙමින් උපදීනුයි තෙදැහැන්හි ප්‍රඥාව සුව පැතිරීමයි. අන් සිත් යොමුව පැතිරෙමින් උපදීනුයි චෙතොපරිය ප්‍රඥාව සිත පැතිරීමයි. ආලෝකය පැතිරෙමින් උපදීනුයි දිවැස් පැණ ආලෝකය පැතිරීමයි. ප්‍රත්‍යවේක්ෂා ඥාණය ප්‍රත්‍යවේක්ෂා නිමිත්ත නම් වේ කියන ලද්දේය. දෙදැහැන්හි ප්‍රඥාව ප්‍රීතිය පැතිරීමයි. තෙ දැහැන්හි ප්‍රඥාව සුව පැතිරීමයි. අන් සිත් දැනීමේ ප්‍රඥාව සිත පැතිරීමයි. දිවැස් ප්‍රඥාව ආලෝකය පැතිරීමයි. ඒ ඒ සමාධියෙන් නැගිටියහුට පැවැති ආකාරය ගැනීම් වශයෙන් නිමිත්ත යයි කියන ලදී. එහි ප්‍රීතිය පැතිරීම, සුවය පැතිරීම දෙපා මෙනි. සිතෙහි පැතිරීම, ආලෝකයෙහි පැතිරීම දෙඅත් මෙනි. අභිඥාපාදක චතුර්ථධ්‍යානය මධ්‍යම ශරීරය මෙනි. ප්‍රත්‍යවේක්ෂා නිමිත්ත හිස මෙනි. මෙසේ ආයුෂ්මත් දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ පංචාංගික සම්‍යක් සමාධිය අඟපසඟින් යුත් පුරුෂයෙකු මෙන් උපමාකොට දක්වති.

**ඡ අනුස්සතිට්ඨානානි** යනු, නැවත නැවත උපදනා හෙයින් සිහියම අනුස්සතිහුය. පැවැත්විය යුතු ස්ථානයන්හිම පවත්වන හෙයින් ශ්‍රද්ධාවෙන් පැවිදි වූ කුල පුත්‍රයාට සුදුසු සිහිය වේනුයි = අනුස්සතියොයි. අනුස්සතීන්ම ප්‍රීති ආදීන්ගේ ස්ථාන බැවින් අනුස්සතිට්ඨානානියි. කවර සයෙක්ද? කංඛා

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති යන සයයි.

බොජ්ඣංගා යනු බෝධියට හෝ බෝධියගේ අංගයි. (කොටස්) මෙය කියන ලද්දේ වේ. මේ ධර්ම සාමග්‍රිය, යමක් කරණකොට ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි උපදිනු ලබන, මැලිබව, නොසන්සුන් බව, තැන්පත් කිරීම, කම්සුවෙහි යෙදීම, ශරීරයට තද දුක්දීම, මරණින් මතු විනාසය, නොනැසී පවත්නා ආත්මය ආදී ඇලීම්වලටද, නොයෙක් උවදුරුවලට විරුද්ධ වූ, සති, ධම්මවිචය, විරිය, පීති පස්සද්ධි, සමාධි, උපේක්ෂා සංඛ්‍යාත ධර්ම සාමග්‍රියෙන් ආර්යශ්‍රාවක තෙමේ අවබෝධ කෙරේනුයි සලකා බෝධියයි කියයි. බුජ්ඣති යනු කෙලෙස් සිත් පරම්පරාව සහිත නිද්‍රාවෙන් නැගිටියි. චතුරාර්ය සත්‍යයන් හෝ අවබෝධ කරයි. නිර්වාණයම හෝ සාක්ෂාත් කරයි. ඒ ධර්මසාමග්‍රි සංඛ්‍යාත බෝධියෙහි අංගනුයි. බොජ්ඣංගයි. ධ්‍යානාංග, මාර්ගාංග මෙනි. යමෙක් වනාහි මේ කියන ලද ආකාරයෙන් මේ ධර්ම සාමාග්‍රියෙන් අවබෝධ කෙරේනුයි සලකා ආර්යශ්‍රාවක තෙමේ බෝධියයි හඳුන්වයි. ඒ බෝධියගේ අංගනුයි= බොජ්ඣංගායි. සෙනංග, රථංග ආදිය මෙනි. අර්ථකථාචාරීහු එහෙයින් කීහ. අවබෝධ කරන පුද්ගලයාගේ අංගනුයි බොජ්ඣංගායි. තව ද, බොජ්ඣංගයි ආදි ක්‍රමයෙන් බොජ්ඣංගාර්ථය දතයුතුය.

අරියො අට්ඨංගිකො මග්ගො යනු ඒ ඒ මාර්ගයන්ගෙන් නැසිය යුතු කෙලෙසුන්ගෙන් දූරභාවය හෙයින්ද, ආර්ය භාවය හටගන්වන හෙයින්ද, ආර්යඵල ප්‍රතිලාභ කරන හෙයින්ද, ආර්යයි. කරුණු අටෙක් වන්නේනුයි අට්ඨංගිකයි. ඒ මෙය චතුරංගික සේනාව මෙන්ද, පංචාංගික තූර්යයන් මෙන්ද, කොටස් මාත්‍රයම වේ. කොටස් තොර වූයේ නම් නැත. බොජ්ඣංග, මාර්ගාංග ලෝකෝත්තරයහ. **නව පාරිසුද්ධි පධානියංගානි** යනු සීල විසුද්ධි, චිත්ත විසුද්ධි, දිට්ඨි විසුද්ධි, කංඛාවිතරණ විසුද්ධි, මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධි, පටිපදා ඤාණදස්සන විසුද්ධි, ඤාණ දස්සන විසුද්ධි, පඤ්ඤා, විමුත්ති මෙම නවයයි. සීල විසුද්ධි යනු, විශුද්ධියට පමුණුවන්ට සමත් සිවු පිරිසිදු සීලයයි. එය දුසිල් මල පිරිසිදු කෙරේනුයි පාරිශුද්ධියි. පධානියංගං යනු, පිරිසිදු බවට ප්‍රධානවන උතුම් කොටසයි. චිත්ත විසුද්ධි යනු, විදර්ශනාවට ආසන්න කරුණක් වන ප්‍රගුණ කළ අටසමවත්. ඒවා කාමාසාදී සිත්මල පිරිසිදු කරත්. දිට්ඨි විසුද්ධි යනු, හේතු සහිතව නාමරූප පිරිසිඳ දැනීම, එය සත් දෘෂ්ටිමල පිරිසිදු කරයි.

විතරණ විසුද්ධි යනු, ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ඤාණයයි. එහෙයින් ත්‍රිවිධ කාලයන්හි ප්‍රත්‍යය වශයෙන් ධර්ම පවතිත් යයි, බලන්නේ ත්‍රිවිධ කාලයන්හි පවත්නා සත් සැකමල තරණය කරන්නේ පිරිසිදු වේ. මගගා මගගඤාණ දස්සන විසුද්ධි යනු, හටගැනීම විනාශය අනුව බලන ක්ෂණයෙහි උපන්, ආලෝක, ඤාණ, ප්‍රීති, සන්සිඳීම, සුව, නොසැලෙන බව, උත්සාහය, වැටහීම, මධ්‍යස්ථ බව, තෘෂ්ණාව යන දශ විදර්ශනා උපක්ලේශයන් මාර්ගය නොවේය, වීථියට පිළිපන් උදයව්‍යයය නියම මගයැයි මෙසේ මග නොමග දැනීම නම් වේ. එයින් නොමං මල පිරිසිදු කරයි. පටිපදා ඤාණදස්සන විසුද්ධි යනු, වීථියට පිළිපන් උදයව්‍යයානු පස්සනා ඤාණය, භංගානුපස්සනා ඤාණය, භයතුපට්ඨානානුපස්සනා ඤාණය, ආදීනවානුපස්සනා ඤාණය, නිබ්බිදානුපස්සනා ඤාණය, මුඤ්චිතු කම්‍යතා ඤාණය, පටිසංඛානුපස්සනා ඤාණය, සංඛාරුපෙක්ෂා ඤාණය, අනුලෝම ඤාණය යන මෙම නවය විදර්ශනා ඤාණයි. ඒවා නිත්‍ය සංඥාදී මල පිරිසිදු කෙරෙයි. ඤාණ දස්සන විසුද්ධි යනු, චතුරාර්ය සත්‍ය මාර්ග ප්‍රඥාවයි. ඒවා සම්පූර්ණයෙන් විනාශ කරන්නේ, තම තම මාර්ගයන්ගෙන් නැසිය යුතු කෙලෙස් මල පිරිසිදු කරයි. පඤ්ඤා යනු අර්හත් ඵල ප්‍රඥාවයි. විමුත්ති යනු අර්හත් ඵල විමුක්තියයි.

**දස කසිණායතනාන** යනු එක් අයෙක් පඨවි කසිණය මනාසේ දැනගනී. උඩ, යට, සරස, දෙකක් නොවන සේ, අප්‍රමාණව එක් අයෙක් ආපෝ කසිණය, එක් අයෙක් තේජෝ කසිණය, එක් අයෙක් වායෝ කසිණය, එක් අයෙක් නීල කසිණය, එක් අයෙක් පීත (කහවන්) කසිණය, එක් අයෙක් ලෝහිත කසිණය, එක් අයෙක් ශ්වෙත කසිණය, එක් අයෙක් ආකාස කසිණය, එක් අයෙක් විඤ්ඤාණ කසිණය මනාසේ දැනගනී. උඩ, යට, සරස, දෙකක් නොවන සේ අප්‍රමාණව යයි මෙසේ කියන ලද දහයයි. මේවා හැමතැන පැතිරෙන අර්ථයෙන් කසිණයි. එය අරමුණු කොට ඇති ධර්මයන්ට ක්ෂේත්‍ර අර්ථයෙන්ද, අධිෂ්ඨානාර්ථයෙන්ද ආයතනයි. උද්ධං යනු මත්තෙහි අහස්තල අභිමුඛව, අධො යනු යට බිම් තලය අභිමුඛව, කුඹුරෙහි සම බිම මෙන් හාත්පසින් වසනලද, ඇතමෙක් අහසේ උස ප්‍රදේශයෙන්ම කසිණාරමුණු කසිණය වඩයි. ඇතමෙක් යට, ඇතමෙක් හාත්පස, තනිව ඒ ඒ කරුණට ගැළපෙන අයුරින් රූප දකිනු කැමැත්තාගේ ආලෝකය මෙන් කසිණය දිගු කරයි. එහෙයින්, පඨවි කසිණ මෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං යයි කියන ලදී. අද්වයං යන මෙය වනාහි එකක්හුගේ වෙනස් ස්වභාවයකට නොපැමිණීම් අර්ථය

සඳහා කියන ලදී. ජලයට පිවිසියහුට සියලු දිසාවන්හි ජලයම වේ. අනෙකක් නොවේ. පඨවි කසිණයද එපරිදිමය. පඨවි කසිණයම වේ. එහි අන් කසිණයන්හි මිශ්‍ර කිරීමක් නැත. හැමතැන මේ ක්‍රමයයි. අප්පමාණං යනු පැතිරවීමෙහි අප්‍රමාණතාවය වශයෙන් කියන ලදී. එය මනසින් පතුරුවන්නේ, හැමතැනම පතුරුවයි. මෙය මුලවන්නේය. මෙය මැද වන්නේ යයි ප්‍රමාණයක් නොගනී යන අර්ථයි. ආකාස කසිණං යනු කසිණ නිමිත්තෙන් ගළවා දැමූ අහස. විඤ්ඤාණ කසිණං යනු කසිණයෙන් ගළවා දැමූ ආකාසයෙහි පවත්නා විඤ්ඤාණයයි. එහි කසිණ වශයෙන්, කසිණ ඉගිලූ අහසෙහි, කසිණය උගුලුවාලූ අහසෙහි වශයෙන්, එහි පැවති විඤ්ඤාණයෙහි උඩ, යට, සරස් භාවය දතයුතුය. වෙන් කොටගත් අහසෙහි කසිණද, වැඩිය යුතු හෙයින්, ඊට අදාළ වන අයුරින් දැන් භාවනා ප්‍රභේද දක්වන්නේ දෙවභාවනා යනාදිය කීයේය. එහි ලොකියා යන ආදීන්හි කැඩී බිඳී, විනාශවන අර්ථයෙන් සංසාර වෘත්තය ලෝකයයි කියයි. ඊට ඇතුළත් භාවයෙන් ලෝකයෙහි යෙදුණේනුයි = ලොකියායි ලෞකික ධර්මයන්ගේ වැඩීම ලොකියායි. ධර්මයන්ගේ වැඩීමයයි ව්‍යවහාර වශයෙන් කියයි. එහි වෙන් වශයෙන් භාවනා නැත. ඒ ධර්මයන් වඩනු ලබන්නේ භාවනා යයි කියති. උත්තිණ්ණා යනු එතෙරවීමයි. ලෝකයෙහි ඇතුළත් නොවන බැවින් ලෝකයෙන් එතෙර වූයේනුයි = ලොකුත්තරායි. රූප භව සංඛ්‍යාත රූපයෙහි හැසිරෙත්නුයි රූපාවචරායි. කුසල ශබ්දය වනාහි මෙහි, නිරෝගී භාවයෙහි, නිරවද්‍යයෙහි, දක්ෂ යන්නෙහි, සුව විපාකයන්හි දක්නට ලැබේ. පින්වතාණෙනි, කොහොමද යහපත්ද, පින්වතාණෙනි කොහොමද නිරෝගිද, ආදී තන්හි නිරෝගී අර්ථයෙහි යෙදේ. ස්වාමීනි, කවරනම් කායික හැසිරීම් කුසලද? මහරජ, නිවැරදි කායික හැසිරීම්ය. භාග්‍යවතුන් වහන්සේ කුසල්දම් පිළිබඳව යම්සේ ධර්මය දේශනා කරත්ද? නැවතද ස්වාමීනි, දේශනා අතර එය උසස්ය. මේ ආදී තන්හි නිරවද්‍යතාවයෙහි යෙදේ. 'රාජකුමාරයාණෙනි, එය කිමැයි හඟින්නෙහිද? නුඹ රථයෙහි ලොකු කුඩා කොටස් පිළිබඳ දක්ෂද? නෘත්‍ය ගීතාදියෙහි දක්ෂ වූයේ දක්ෂභාවයෙහි හික්මුණේ ආදීන්හි දක්ෂතාවයෙහි යෙදේ. "කුසල්දම්හි සමාදන්වීම හේතුවෙන් මෙසේ මේ පුණ්‍යය මනාව වැඩේ." "කුසල කර්මයාගේ කළ බැවින්, රැස්කළ බැවින්, ආදීන්හි සුව විපාකයන්හි යෙදේ." එය මෙහි, නිරෝගිකමෙහිද, නිරවද්‍යතාවයෙහිද, සුව විපාකයෙහිද යෙදීම සුදුසුය. මෙහි වචනාර්ථය වනාහි, පිළිකුල් පාපී ධර්මයන් සොලවති. චලනය කරති. කම්පා කරති. විනාශ කරතියි = කුසල් නම් වේ. පිළිකුල් ආකාරයෙන් හොවිත්. පවතිත්නුයි කුසා නම්

වේ. ඒ අකුසල් සංඛ්‍යාත කුසයන් කපත්. සිඳිත්නුයි = කුසලයි. පිළිකුල් දැහි සියුම් කිරීමේ, මුවහත් කිරීම් වශයෙන් ඤාණය කුස නම් වේ. එම කුසයෙන් නැසිය යුතු හෙයින්, යථාර්ථ වශයෙන් ගතයුතු හෙයින් පැවැතිය යුතු හෙයින්ද, කුසලයි. යම්සේ කුසතණ දෙපසට ගියේ අත් ප්‍රදේශය කපත්ද, මෙසේ මේවාද උපනුපන් භාවයෙන්, ද්විපාර්ශ්ව ගතවූයේ කෙලෙස් පස සිඳිත්. එහෙයින් කුස මෙන් සිඳිත්නුයි කුසලායි. ඒ **රූපාවචර කුසලානං භාවනා** යනු අරූප භව සංඛ්‍යාත අරූපයෙහි හැසිරෙත්නුයි අරූපාවචරයි. ත්‍රෛභූමික වෘත්තයෙහි පර්යාපන්න වූවාහු ඇතුළත් වූවාහුනුයි පරියාපනනයි. එහි ඇතුළත් නොවූයේ නුයි **අපරියාපනනා ලොකුත්තරායි.**

කාමාවචර කුසල ධර්මයන්ගේ භාවනාව කුමක් හෙයින් නොකියන ලද්දේද යත්? අභිධර්මයෙහි අර්පණාප්‍රාප්ත භාවනාවම භාවනාවයයි අදහස් කරන ලදී. එහි කියන ලදී. කාර්ය නිරත කර්මාන්තායතනයන්හි හෝ කාර්ය නිරත ශිල්පායතනයන්හි හෝ කාර්ය නිරත විද්‍යාස්ථානයන්හි හෝ ක්‍රියාවන් කළ හෝ චතුරාර්ය සත්‍යයන්ට අනුලොම්ව රූපය අනිත්‍යයයි හෝ වේදනාව, -පෙ- සංඥාව -පෙ- සංස්කාර -පෙ- විඤ්ඤාණය අනිත්‍යයයි හෝ යම් මෙබඳු යෝග්‍ය කැමැත්තක්, දෘෂ්ටියක්, රුචියක්, දැනීමක්, බැල්මක්, ධර්මාවබෝධතාවක් අන්‍යයාගෙන් නොඅසා ලැබගනීද? මෙය චින්තාමය ප්‍රඥාවයයි කියයි. කාර්ය නිරත කර්මාන්තයන්හි හෝ -පෙ- ධර්මාවබෝධතාවක් අන්‍යයාගෙන් අසා ලැබගනීද? මෙය සුතමයෙ ප්‍රඥාවයයි කියයි. සමවතට සමවන්නහුගේ ප්‍රඥාව භාවනාමය ප්‍රඥාවයි. ඒ කාමාවචර භාවනාව ආවර්ජන භවංග පාතයන්හි ඇතුළත් භාවනායයි නොකියන ලදැයි දතයුතුය. සියලු පුණ්‍යයන්ට ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු ඇතුළත් හෙයින්, උපචාර සමාධි, විදර්ශනා සමාධීන්ගේ භාවනාමය පුණ්‍යතාවය සිද්ධය. මෙහි වනාහි ලෞකික භාවනාවම සංගෘහිතයි.

රූපාවචර අරූපාවචරයන්ගේ ත්‍රිවිධ භාවයෙහි **හීනා** යනු ලාමක, ලාමක හා උසස් තත්වයන් අතර වූයේ = මජ්ඣායි. **මජ්ඣිමායිද** පාඨයි. ප්‍රධාන භාවයට පැමිණවූයේනුයි **පණීතායි.** උතුම් යන අර්ථයි. රැස්කිරීම් වශයෙන් මෙය, හීන, මධ්‍යම, ප්‍රණීත වශයෙන් දතයුතුය. යමෙකුගේ රැ ස්කරන මොහොතෙහි (භාවනා වඩන) කැමැත්ත, වීර්යය, සිත හෝ නුවණින් පරීක්ෂාව ලාමක වේද, එය හීන නම් වේ. යමෙකුගේ ඒ ධර්ම මධ්‍යම වේද ඒ මධ්‍යමයි. යමෙකුට ඒ ධර්ම ප්‍රණීතද ඒ ප්‍රණීත නම් වේ. මෘදු ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් සමග යුක්ත වූයේ හීනයි. මධ්‍යම ඉන්ද්‍රියයන්

සමග යුක්ත වූයේ මධ්‍යමයි. අධිමාත්‍ර ඉන්ද්‍රියයන් සමග යුක්ත වූයේ ප්‍රණීතයි. කෙලෙසුන්ගෙන් ගහණ නොවූ කල්හි හීන, මධ්‍යම භාව නොමැති හෙයින් ප්‍රණීතතාවයම කියන ලදී. එය උතුම් අර්ථයෙන්ද, නොතැවෙන අර්ථයෙන්ද ප්‍රණීතයි. ප්‍රථම භාවනා චතුෂ්කයෙහි **භාවෙති** යනු එකෙණෙහිම ඒ ඒ අයුරින් අවබෝධ කරනුයේ ආර්ය මාර්ගය වඩයි. දෙවන භාවනා චතුෂ්කයෙහි **එසනා භාවනා** යනු අර්පණාවට පූර්ව භාගයෙහි භාවනාවයි. එය අර්පණාව සොයන්නේ මෙය කරණ කොටනුයි - එසනායි කියන ලදී. **පටිලාභා භාවනා** යනු අර්පණා භාවනාවයි. එය එම සෙවීමෙන් ලබාගනීනුයි ප්‍රතිලාභ යයි කියන ලදී. **එකරසා භාවනා** යනු ප්‍රතිලාභයෙහිදී වසී භාවයට පත්වනු කැමැත්තහුගේ ප්‍රයෝග කාලයෙහි භාවනාවයි. එය ඒ ඒ ප්‍රහාණයෙන්, ඒ ඒ කෙලෙසුන්ගෙන් මිදුණු හෙයින් මිදීම් රසයෙන් එක් රසයයි කොට එක් රසයයි යූ.සේයි. **ආසෙවනා භාවනා** යනු ප්‍රතිලාභයෙහිදී වසීප්‍රාප්ත වූ, පරිභෝග කාලයෙහිදී කැමති පරිදි සමවැදිය හැකි භාවනාවයි. එය බොහෝ සේ සේවනය කෙරේනුයි = ආසෙවනායි යූ.සේයි. සමහරු වනාහි ආසේවනයෙන් වසීප්‍රාප්ත, එක් රස යුත් භාවනාව හැමතැන පැතිර පවතීයයි වර්ණනා කරති.

චතුෂ්ක විභාගයෙහි, **සමාධිං සමාපජ්ජනකානං** යනු සමාධියට සමවන් සියල්ලන්ගේ, එහි **ජාතා** යනු එහි පූර්වභාගයෙහි හටගත්, **එකරසාභොනති** යනු අර්පණා ඉපදවීමෙහි සමාන කෘත්‍ය වෙතියි අර්ථයි. **සමාධිං සමාපනනානං** යනු අර්පණාවන්ගේ ඇතුලට වැදුනුයඃඅඃ **තත්‍රජාතා** යනු ඒ අර්පණාවෙහි හටගත්, **අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති** යනු සමපැවැත්ම තුළින් ඔවුන්නොවුන් නොඉක්මවති. **අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං භාවයතො** ආදීන්හි එකෙණෙහි එක් එක් ඉන්ද්‍රියයන්ගේ තම තමා අයත් කෘත්‍යයන් කිරීමෙහි, ඒ ඒ කරුණට සහාය වීම් වශයෙන්, තම තම කෘත්‍යකාරක වූ, සෙසු ඉන්ද්‍රියයන් විමුක්ති රසයෙන් එකම රසයෙක් වේනුයි, විමුක්ති රස වශයෙන්ම ඒක රසාර්ථයෙන්, භාවනාබල, බොජ්ඣංග, මාර්ගාංගයන්හිද මේ ක්‍රමයමැයි. එක රසා යනුවෙන් ලිංග විපර්යාසය කරන ලදී.

**ඉධ භික්ඛු** යනු, මේ සාසනයෙහි භික්ෂුව, සසර බිය බලයිනුයි භික්ෂුයි. **පුබ්බණ්හ සමයං** ආදීන්හි අත්‍යන්ත සංයෝගාර්ථයෙහි ද්විතියා වචනයි. අර්ථ වශයෙන් ජ්‍යෝෂ්ඨයි. දිනයෙහි පූර්ව කාලයෙහි යන අර්ථයි.

**ආසෙවති** යනු වසීප්‍රාප්ත සමාධිය බොහෝ සේ සේවනය කරයි. යන අර්ථයි. **මජ්ඣන්තික සමයං** යනු දවසෙහි මධ්‍ය කාලයෙහි, සායණ්හ සමයං යනු දවසෙහි සවස් කාලයෙහි, **පුරෙ භත්තං** යනු දිවා භෝජනයට පෙර කල්හි, **පච්ඡා භත්තං** යනු දිවා ආහාරයෙන් පසුකල්හි, **පුරිමෙපි යාමෙ** යනු රාත්‍රියෙහි පළමු කොටසෙහි, **කාලෙ** යනු, කළුවර පසෙහි - **පුණ්හා** යනු හඳ ඇති (ආලෝක) පසෙහි, **පුරිමෙපි වයො ඛන්ධෙ** යනු ප්‍රථම වයස් කොටසෙහි, ප්‍රථම වයසෙහියි අර්ථයි. ශත වර්ෂායුක පුරුෂයෙකුට, ත්‍රිවිධ වයස් කාණ්ඩයන්හි, එක් එක් වයස් කාණ්ඩයකට සිවුමාසාධික තෙතිස් වර්ෂ කාලයක් අයත් වේ.

තෘතීය භාවනා චතුෂ්කයෙහි **තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන** යනු එහි නෛෂ්ක්‍රම්‍යාදී භාවනා විෂයයන්හි හටගත් සමාධි ප්‍රඥා සංඛ්‍යාත එකට වෙළී පවත්නා ධර්මයන්ගේ ඔවුනොවුන් නොඉක්මවන ස්වභාවයෙන්, **ඉන්ද්‍රියානං එකරසට්ඨෙන** යනු එහිම ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් නොයෙක් කෙලෙසුන්ගෙන් මිදුණු බැවින්, විමුක්ති රසයෙන් එක් රස භාවයෙන්, **තදුපගවිරියවාහනට්ඨෙන** යනු ඒවාහි එක් රසභාවයන් නොඉක්මවන පරිදි සුදුසු වීර්ය උසුලන භාවයෙන් **ආසෙවනට්ඨෙන** යනු එයට එසමයෙහි පැවති යම් සේවනයක් වේද, ඒ සේවනයෙන්, පුරුදු කිරීම් භාවයෙන්, **රූපසඤ්ඤං** යනු කුසල, විපාක, ක්‍රියා වශයෙන් පසළොස් ආකාර රූපාවචර ධ්‍යාන සංඛ්‍යාත රූප සංඥාවයි. රූපාවචර ධ්‍යානයද රූපයයි කියයි. රූපී රූපානි පස්සති ආදීන්හි එම ධ්‍යානයෙහි අරමුණද ගැනේ. 'බහිද්ධා රූපානි පස්සති සුවණ්ණ දුබ්බණ්ණානි, රූපාවචර ධ්‍යානය සංඥා ශිර්ෂයෙන් රූපයෙහි සංඥායි කොට රූප සඤ්ඤායි කියයි. **පටිඝ සඤ්ඤං** යනු කුසල විපාක පහක් හා අකුසල විපාක පහක් යයි මෙසේ දසවැදෑරුම් ප්‍රතිඝ සංඥාවයි. ද්වි පඤ්ච (දස) විඤ්ඤාණ සමග යෙදුණු සංඥාව, චක්ඛු ආදී වස්තූන්ගේද, රූප ආදී අරමුණුවලද හැපීමෙන් උපන් බැවින් පටිඝ සඤ්ඤායි කියනු ලැබේ. රූප සංඥා, ශබ්ද සංඥා, ගන්ධ සංඥා, රස සංඥා, ස්පර්ශ සංඥා යනුද මෙයටම නාමයකි. **නානත්ත සංඥා** යනු අටවැදෑරුම් කාමාවචර සංඥාවන්ද, දොළොස් අකුසල සංඥාවන්ද, එකොළොස් කාමාවචර කුසල විපාක සංඥාවන්ද, දෙ අකුසල සංඥාවන්ද, එකොළොස් කාමාවචර විපාක, ක්‍රියා සංඥා යයි මෙසේ සිව්සාළිස් ආකාර නානත්ව සංඥාව.

එය නොයෙක් ආකාර, නොයෙක් ස්වභාව වූ, රූප ශබ්දාදී භේද

වූ ගෝචරයන්හි පවත්නා සංඥානුයි - නානත්ත සඤ්ඤායි. සිව්සාළිස් ප්‍රභේදයෙන් නානාප්‍රකාරය. නොයෙක් ස්වභාවය, ඔවුනොවුන් සමාන නොවූ සංඥානුයි නානාත්ත සඤ්ඤායි කියනු ලැබේ. සංඥාවන් බොහෝ වූයේ නමුත් ජාති ග්‍රහණයෙන් ඒකවචන කරන ලදී. නිච්ච සඤ්ඤං යනු නිත්‍යය යන සංඥාව නිත්‍ය සංඥාවයි. සුව සංඥාවද, ආත්ම සංඥාවද මෙසේය. නන්දි යනු ප්‍රීතිය සහිත තෘෂ්ණාවයි. රාග යනු, ප්‍රීති රහිත තෘෂ්ණාවයි. සමුදයං යනු රාගයාගේ හටගැන්මයි. නොහොත් භංගානුපස්සනාවෙන් භංගයන්ම දක්නා හෙයින් සංස්කාරයන්ගේ හටගැන්මයි. ආදානං යනු හටගැනීම් වශයෙන් කෙලෙසුන්ගේ නිදොස් බව දක්නා හෙයින් ප්‍රත්‍යයෙන් හටගත් අරමුණෙහි තදින් එල්බ ගැනීමයි. ඝණ සඤ්ඤං යනු නොකඩවා පැවැත්මෙහිදී ඇතිවන ඝණ සඤ්ඤාවයි. ආයූහනං යනු සංස්කාරයන් සඳහා උපාය මාර්ග කිරීමයි. ධුව සඤ්ඤං යනු ස්ථිරය යන හැඟීමයි. නිමිත්තං යනු නිත්‍ය නිමිත්තයි. පණිධි යනු සුව ප්‍රාර්ථනයයි. අභිනිවෙසං යනු ආත්මයක් තිබේයයි ඇලී සිටීමයි. සාරාදානාභිනිවෙසං යනු නිත්‍යසාර, ආත්ම සාරාදී වශයෙන් ඇලී සිටීමයි. සම්මොහාභිනිවෙසං යනු අතීත සංසාරය නමැති දීර්ඝ මාර්ගයෙහි ගමන්කළ මගියෙකු වශයෙන් මම වූයෙම්ද? ආදී වශයෙන්ද, මේ ලෝකය මැවුම්කාර දෙවියෙකුගෙන් හටගත්තේද ආදී වශයෙන්ද මූලාවෙහි පිහිටීමයි. ආලයාභිනිවෙසං යනු ආදීනව දර්ශනයෙන් මෙහි ඇලිය යුතුයයි යන අභිනිවේසය. අප්පටිසංඛං යනු අනුපාය ග්‍රහණයයි. වැරදි අයුරින් ගැනීමයි. සංයොගා භිනිවෙසං යනු කාමයෝගාදි කෙලෙස් පැවැත්මයි. දිට්ඨෙකට්ඨෙ යනු දෘෂ්ටීන් සමග එක්තන්හි සිටීනුයි = දිට්ඨෙකට්ඨායි. ඒ දිට්ඨෙකට්ඨයන්; කිලිටි කරත්, තවත්, වළක්වත්නුයි කෙලෙස්ය, ඒ කෙලෙසුන්. ඒකට්ඨය, පහාණෙකට්ඨ, සහජෙකට්ඨ යනුවෙන් දෙයාකාරය. ප්‍රහාණෙකට්ඨය. සක්කාය දෘෂ්ටිප්‍රමුඛ තෙසැටක් දෘෂ්ටීන්හි හා සෝවාන් මාර්ගයෙන් යම් පමණ කෙලෙසුන් ප්‍රහාණය කළයුතුද? ඒතාක් එක් පුද්ගලයෙකු කෙරෙහි සිටියේය යන අර්ථයි. මෙය මෙහි අදහස් කරන ලදී. දස කෙලෙසුන්හි මෙහි දෘෂ්ටි ක්ලේශයම ආයේය. සෙස්සෙහි වනාහි අපාය ගමනීය ලෝභ, ද්වේෂ, මෝහ, මාන, විචිකිච්ඡා, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන නව කෙලෙසුන් දෘෂ්ටිය සමග ප්‍රහාණ එක්තැන්වී සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ වෙයි. රාග, ද්වේෂ, මෝහ ප්‍රමුඛ එක්දහස් පන්සියයක් වූ කෙලෙසුන් අතර සෝවාන් මාර්ගයෙහි දෘෂ්ටිය ප්‍රහීණ වන කල්හි දෘෂ්ටිය හා අපායගාමී සියලු කෙලෙස් පහාණෙකට්ඨ වශයෙන් ප්‍රහීණ වෙයි. එකට උපන් දෘෂ්ටිය හා එක් සිතෙහි සිටියේය

යන අර්ථයි. සෝවාන් මාර්ගයෙන් දෘෂ්ටි සම්ප්‍රයුක්ත අසංඛාරික දෙසිත් ප්‍රහීණවන කල්හි ඒ හා සමග හටගත් ලෝභ, මෝහ, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන මේ කෙලෙස් සහජේකට්ඨ වශයෙන් ප්‍රහීණ වෙයි. දෘෂ්ටි සම්ප්‍රයුක්ත සසංඛාරික දෙසිත් ප්‍රහීණ වන කල්හි ඒවා සමග හටගත් ලෝභ, මෝහ, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන මේ කෙලෙස් සහජේකට්ඨ වශයෙන් ප්‍රහීණ වෙයි. **ඔළාරිකෙ කිලෙසෙ** යනු දළ වූ කාමරාග ව්‍යාපාද, **අනුසහගත කිලෙසෙ** යනු සියුම් වූ කාමරාග ව්‍යාපාද, **සබ්බකිලෙසෙ** යනු මාර්ගත්‍රයෙන් ප්‍රහීණව ඉතිරි වූ කෙලෙස්, **විරියංචා හොති** යනු යෝගාවචරයා වීර්යය පවත්වයි. යට ඒසනා, ප්‍රතිලාභ, ඒකරස, ආසේවන යන වචනයන් භාවනාවන්ගේ විශේෂතා දැක්වීම සඳහා කියන ලදී. මෙහි භාවනාව මෙසේ වූයේයයි, එහි හටගත් ධර්මයන්ගේ නොඉක්මවන අර්ථයෙන්, ඉන්ද්‍රියයන්ගේ ඒක රසාර්ථයෙන්, ඊට සුදුසු අයුරින් වීර්යය උසුලන අර්ථයෙන්ද, ආසේවන අර්ථයෙන්දැයි යන වචන භාවනා හේතු දැක්වීමට කියන ලදී. මේ මේ හේතුයෙන් භාවනායිද, යට යට ආසේවන භාවනායිද නොයෙක් ක්‍ෂණ වශයෙන් කියන ලදී. මෙහි ආසේවනාර්ථයෙන් භාවනා යනු එකක්‍ෂණ වශයෙනැයි වෙනසයි. **රූපං පස්සනෙතා භාවෙති** ආදීන්හි රූපාදීන් බැලිය යුතු අයුරින් බලමින් වැඩිය යුතු භාවනාව වඩයි යනු අර්ථයි. **එකරසා හොනති** යනු විමුක්ති රසයෙන්ද, කෘත්‍ය රසයෙන්ද, එක්රස වෙයි. විමුක්ති රස යනු සම්පත් රසයයි. 'කෘත්‍ය හා සම්පත්ති අර්ථයෙන් රසය නමැයි කියනු ලැබේ'යයි කියන ලදී.

**වැඩිය යුතු නිර්දේශ වර්ණනාව**
**නිමි.**

ප්‍රත්‍යක්‍ෂ කළයුතු නිර්දේශයෙහි එකින් එක වැඩිවන දස විසඳුම් ප්‍රතිලාභ ප්‍රත්‍යක්‍ෂ කිරීම් වශයෙන් කියන ලදී. එහි **අකුපපා චෙතො විමුතති** යනු අර්හත්ඵල විමුක්තියයි. එය වෙනස් නොවේ. නොසෙල්වේ. නොපිරිහේනුයි අකුප්පායි. සියලු කෙලෙසුන්ගෙන් සිත මිදුණු හෙයින් චෙතො විමුතතියි කියයි. **විජජා** යනු ත්‍රිවිද්‍යායි. **විමුතති** යනු, දසුත්තර පර්යායෙන් අර්හත්ඵලය කියන ලදී. සංගීති පර්යායයෙන් වනාහි, විමුක්ති යනු සිතෙහි අධිෂ්ඨානයද නිර්වාණයද යන ද්වි විමුක්තීන්ය. මෙහි

අටසමවත් නීවරණාදීන්ගෙන් මනාව මිදුණු හෙයින් විමුක්ති නම් වේ. **තිස්සො විජ්ජා** යනු පූර්වේනිවාසානුස්මෘති ඥාණ විද්‍යාව, සත්ත්වයින්ගේ චුති-උත්පත්ති දැනීමෙහි ඥාණ විද්‍යාව, ආස්‍රවයන්ගේ ක්‍ෂය කිරීමෙහි ඥාණ විද්‍යාව වේ. අඳුර විදින අර්ථයෙන් විද්‍යායි. පැහැදිලි කරන අර්ථයෙන්ද විද්‍යායි. පූර්වේනිවාසානුසසති ඥාණය උපදිනුයේ, පූර්ව නිවාසයන් වසා සිටි අඳුර විදියි. පෙර නිවාසයන්ද ප්‍රකට කෙරේනුයි විද්‍යායි. චුතුපපාත ඥාණය චුති-ප්‍රතිසන්ධි වැසීම කරන අඳුර විදියි. චුති-උත්පත්ති ප්‍රකට කෙරේනුයි විද්‍යායි. ආස්‍රවයන්ගේ ක්‍ෂය කිරීමෙහි ඥාණය සිවුසස් වසන අඳුර විදියි. සිවුසස් දම් ප්‍රකට කෙරේනුයි විද්‍යායි. **චත්තාරි සාමඤ්ඤඵලානි** යනු සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් ඵලයන්ය. දුශ්චරිත ධර්මයන් සමනය කරයි, විනාශ කරයිනුයි = සමණොයි. ශ්‍රමණයාගේ ස්වභාවය සාමඤ්ඤයි. සතර ආර්ය මාර්ගයන්ට මෙය නාමයකි. ශ්‍රාමණ්‍යයාගේ ඵල = ශ්‍රාමණ්‍යඵලයි. **පඤ්ච ධම්මක්ඛන්ධා** යනු සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඥාන දර්ශන ස්කන්ධයෝය. ධර්ම ස්කන්ධ යනු, ධර්ම බෙදීම්, ධර්ම කොටස්ය. සීලස්කන්ධාදීන්හිද මෙම ක්‍රමයමැයි. ලෞකික ලෝකෝත්තර සීල, සමාධි, ප්‍රඥාම, සීල, සමාධි, ප්‍රඥා ස්කන්ධයෝය. සමුච්ඡෙද, පටිප්පසසද්ධි, නිස්සරණ විමුක්තීම, විමුක්ති ස්කන්ධයයි ත්‍රිවිධ විමුක්තියෙහි ප්‍රත්‍යවේක්‍ෂණයම විමුක්ති ඥාණ දර්ශන ස්කන්ධයයි. එය ලෞකිකමය. දැනීම් අර්ථයෙන් ඥාණයම දර්ශනාර්ථයෙන් දැකීමනුයි = ඥාණ දර්ශනයි. විමුක්තීන්ගේ ඥාණ දර්ශනය = විමුක්ති ඥාණ දර්ශනයයි කියයි. විෂ්කම්භන, තදංග විමුක්තීහු වනාහි සමාධි, ප්‍රඥා ස්කන්ධයන්හිම සංගෘහිතයි. මේ පස් ආකාර ධර්ම ස්කන්ධයන් ශෛක්‍ෂ්‍යයින්ට ශෛක්‍ෂ්‍ය වශයෙන්ද, අශෛක්‍ෂ්‍යයින්ට අශෛක්‍ෂ්‍ය වශයෙන්ද කියන ලදී. **ඡ අභිඤ්ඤා** යනු ෂඩාදික ඥාණය. කවර සයෙක්ද යත්? ඍද්ධිවිධ ඥාණය, දිව්‍යශ්‍රෝත ධාතු ඥාණය, පූර්වේනිවාසානුස්මෘති ඥාණය, චෙතො පරියාය ඥාණය, දිව්‍යචක්‍ෂු ඥාණය, ආස්‍රවක්‍ෂයකර ඥාණය යන මේ සයයි.

**සත්ත ඛීණාසවබලානි** යනු ක්‍ෂීණ වූ ආස්‍රවයෝ මොහුටනුයි = ඛීණාසවොයි. ක්‍ෂීණාස්‍රවයාගේ බල ක්‍ෂීණාස්‍රව බලයන්ය. කවර සතක්ද? බුදුරදුන් විසින් වදාරන ලදී. මහණෙනි, මේ සාසනයෙහි ක්‍ෂීණාස්‍රව භික්‍ෂුව විසින් සියලු සංස්කාර අනිත්‍ය වශයෙන් තත්වාකාරයෙන් නිවැරදි නුවණින් මනාව දක්නා ලද්දේ වෙත්ද? මහණෙනි, යම් ඒ ක්‍ෂීණාශ්‍රව භික්‍ෂුව විසින් සියලු සංස්කාර අනිත්‍ය වශයෙන්, නිවැරදි නුවණින්, මනාව

දක්නා ලද්දේ වෙත්ද? යම් බලයකට පැමිණ ක්ෂීණාශ්‍රව භික්ෂුව මාගේ ආස්‍රව ක්ෂය වූයේ යයි ආස්‍රවයන්ගේ ක්ෂය වීම පිළිගනීද? මෙයද මහණෙනි, ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයක් වේ. මහණෙනි, නැවතද ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් කාමයන් ගිනිඅඟුරු වළකට සමානයයි තත්වාකාරයෙන් නිවැරදි නුවණින් මනාව දක්නා ලද්දේ වෙත්ද? මහණෙනි යම් ඒ -පෙ- මහණෙනි මෙයද ක්ෂීණාස්‍රව භික්ෂුවගේ බලයක් වේ. මහණෙනි, නැවතද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ සිත විවේක නිම්න වේද, විවේකයෙහි සිත අලවා ගත්තේ වේද? විවේකයෙහි සිත නැමුණේ වේද, විවේකයෙහි සිටියේ වේද, නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණේ වේද? ආස්‍රවයන් හටගන්නා ධර්මයන් විනාශ කරන ලද්දේ වේද, මහණෙනි යම් ඒ -පෙ- මහණෙනි, මෙයද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයක් වේ. නැවතද මහණෙනි, ක්ෂීණාශ්‍රව සතර සතිපට්ඨාන වඩනා ලද්දේ, මනාව වඩනා ලද්දේ වේද, පඤ්චේන්ද්‍රියයන් වඩනා ලද්දේ, මනාව වඩනා ලද්දේ වේද? සප්ත බොධ්‍යංග වඩනා ලද්දේ, මනාව වඩනා ලද්දේ වේද? ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩනා ලද්දේ, මනාව වඩනා ලද්දේ වේද, මහණෙනි, යම් ඒ ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ ආර්ය අෂ්ටාංගික මාර්ග වැඩීමක් වේද මනාව වැඩීමක් වේද, ක්ෂීණාශ්‍රව භික්ෂුව යම් බලයකට පැමිණ, මාගේ ආස්‍රව ක්ෂය වූයේ යයි ආස්‍රවයන්ගේ ක්ෂය වීම පිළිගනීද, මෙයද මහණෙනි, ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයක් වේ. එහි ප්‍රථම බලයෙන් දුක්ඛ සත්‍යය ප්‍රතිවේධය. දෙවැන්නෙන් සමුදය සත්‍යය ප්‍රතිවේධය. තෙවැන්නෙන් නිරෝධ සත්‍යය ප්‍රතිවේධය. සිව්වැන්නෙන් මාර්ග සත්‍යය ප්‍රතිවේධය ප්‍රකාශ කරන ලද්දේ වේ.

**අට්ඨ විමොක්ඛා** යනු අරමුණෙහි ස්ථිර ලෙස පිහිටන අර්ථයෙන්ද විරුද්ධ ධර්මයන්ගෙන් මනාව නිදහස්වන අර්ථයෙන්ද විමෝක්ෂයි. කවර අටෙක්ද යත්? රූපවත් වූයේ රූපයන් බලයි. මේ ප්‍රථම විමොක්ෂයයි. ආධ්‍යාත්ම අරූප සඤ්ඤීව පිටත රූපයන් බලයි. මේ දෙවන විමොක්ෂයයි. සුභයයිම ඇලුණේ වේද, මේ තෙවන විමෝක්ෂයයි. සර්වප්‍රකාරයෙන් රූප සඤ්ඤාවන්ගේ ඉක්මවීමෙන්, ක්‍රෝධ සංඥාවන්ගේ අස්තංගමයෙන්ද නානාප්‍රකාර සංඥාවන්ගේ මෙනෙහි නොකිරීමෙන්ද ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරයි. මේ සිව්වන විමෝක්ෂයයි. සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි. මේ පස්වන විමෝක්ෂයයි. සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිත් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මේ සවන විමෝක්ෂයයි.

සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤා යතනයට පැමිණ වාසය කරයි. මේ සත්වන විමෝක්ෂයයි. සර්වප්‍රකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා, සඤ්ඤාවෙදයිත නිරෝධ සමාපත්තියට පැමිණ වාසය කරයි. මේ අටවන විමෝක්ෂයයි.

නව අනුපුබ්බනිරොධා යනු අනුපිළිවෙළින් වන නිරෝධ නවයයි. කවර නවයෙක්ද යත්? ප්‍රථම ධ්‍යානයට සමවන්නහුට කාම සංඥා නිරුද්ධ වෙයි. දෙවන ධ්‍යානයට සමවන්නහුට විතර්ක-විචාර නිරුද්ධ වෙයි. තෙවන ධ්‍යානයට සමවන්නහුට ප්‍රීතිය නිරුද්ධ වේ. චතුර්ථ ධ්‍යානයට සමවන්නහුට ආස්වාස-ප්‍රස්වාස නිරුද්ධ වෙයි. ආකාසානඤ්චායතනයට සමවන්නහුට රූප සංඥා නිරුද්ධ වේ. විඤ්ඤාණඤ්චායතනයට සමවන්නහුට ආකාසානඤ්චායතන සංඥාව නිරුද්ධ වේ. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නහුට විඤ්ඤාණඤ්චායතන සංඥාව නිරුද්ධ වේ. නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්නහුට ආකිඤ්චඤ්ඤායතන සංඥාව නිරුද්ධ වේ. සඤ්ඤාවෙදයිත නිරෝධයට සමවන්නහුට සංඥාවද - වේදනාවද නිරුද්ධ වෙයි.

දස අසෙක්ඛා ධම්මා යනු මත්තෙහි හික්මිය යුතු දැයක් නොමැති හෙයින් නොහික්මෙත්නුයි **අශෛක්ෂ්‍යයි.** නොහොත් ත්‍රිවිධ ශික්ෂාවන්හි හික්මෙත්නුයි - ශෛක්ෂ්‍යයි. අභිවෘද්ධියට පත් ශෛක්ෂ්‍යයනුයි = අශෛක්ෂ්‍යයි. රහත්හුය. මේවා අසෛක්ෂ්‍යයන්ටනුයි - අසෙක්ඛායි. කවර දස අශෛක්ෂ්‍යයන්ද? සම්‍යග් දෘෂ්ටි, සම්‍යග් සංකල්ප, සම්‍යග් වචන, සම්‍යග් කර්මාන්ත, සම්‍යග් ආජීව, සම්‍යග් ව්‍යායාම, සම්‍යග් සතිය, සම්‍යග් සමාධිය, සම්‍යග් ඤාණය, සම්‍යග් විමුක්තිය යන මෙම දහයයි. 'සම්මා ඤාණං යනු අර්හත්ඵල ප්‍රඥාව හැර සෙසු ලෞකික ප්‍රඥාවන්ය. සම්මා විමුත්ති යනු අර්හත්ඵල විමුක්තියයි. අටුවාවෙහි වනාහි කියන ලදී. අශෛක්ෂ්‍ය සම්‍යක් දෘෂ්ටි ආදි සියල්ලම ඵල සම්ප්‍රයුක්ත ධර්ම ම ය. මෙහිද සම්මා දිට්ඨි, සම්මා ඤාණං යන දෙතන්හි ප්‍රඥාවම කියන ලදී. සම්මා විමුත්ති යන මේ පදයෙන් කියා ඉතිරි ඵලසමාපත්ති ධර්ම සංග්‍රහ කරන ලද්දේය.

**සබ්බං භික්ඛවෙ සච්ඡිකාතබ්බං** ආදීන්හි අරමුණු සාක්ෂාත් කිරීම දතයුතුය. **රූපං පස්සනෙතා සච්ඡිකරොති** ආදීන්හි රූපාදී ලෞකිකයන් බැලිය යුතු ආකාරයෙන් බලන්නේ එම රූපාදීන් අරමුණු සාක්ෂාත් කිරීමෙන්

සාක්ෂාත් කරයි. රූපාදීන් හෝ බැලිය යුතු ආකාරයෙන් බලන්නේ ඒ හේතුවෙන් සාක්ෂාත් කළයුත්ත සාක්ෂාත් නොකරයි. පසසනෙතා යනපදය හේතු අර්ථයෙහිද අක්ෂර චින්තකයෝ කැමති වෙත්. අනඤ්ඤාතඤ්ඤස්සා -මිතින්‍ද්‍රියාදී වනාහි ලෝකෝත්තරය. ප්‍රත්‍යවේක්ෂා වශයෙන් බලන්නේ, ඒවාම අරමුණු සාක්ෂාත් කිරීමෙන් සාක්ෂාත් කරයි. **අමතොගධං නිබබාණං පරියොසානවෙඨන සචඡිකරොති** යනු මෙය පරිඤ්ඤෙය්‍ය, පහාතව්‍ය, සචඡිකාතව්‍ය, භාවෙතව්‍යයන්හි ඍජුවම සාක්ෂාත් කළයුතුය. (නිෂ්ඨාර්ථයෙන්) **යෙ යෙ ධමමා සචඡිකතා හොනති, තෙ තෙ ධමමා ඵසසිතා හොනති** යනු, අරමුණු සාක්ෂාත් කිරීමෙන්, සාක්ෂාත් කරන ලද්දේ, අරමුණු ස්පර්ශයෙන් ස්පර්ශ කරන ලද්දේ වෙයි. ප්‍රතිලාභ සාක්ෂාත් කිරීමෙන්, සාක්ෂාත් කරන ලද්දේ, ප්‍රතිලාභ ස්පර්ශයෙන් ස්පර්ශ කරන ලද්දේ වෙයි.

### සාක්ෂාත් කළයුතු නිර්දේශ වර්ණනාව නිමි.

දැන් එක් එක් සමාධියට හානභාගියාදී වශයෙන් අවස්ථා භේද වෙයි. එහෙයින් හානභාගිය චතුෂ්කය එකටම විස්තර කරන ලදී. **පඨමසස ඣානසසලාභි** යනු ප්‍රථම ධ්‍යානලාභියා, ෂෂ්ඨී අර්ථයෙහි ද්විතියා වචනයි. සාක්ෂාත් කිරීමේ ලාභය මොහුට ඇත්තේනුයි ලාභීයයි කියයි. **කාමසහගතා** යන මෙහි සහගත ශබ්දයාගේ අරමුණු කිරීම් අර්ථය අදහස් කරන ලදී. වස්තුකාම, ක්ලේශකාම අරමුණුයයි අර්ථයි. **සඤ්ඤා මනසිකාරා** යනු ජවන සංඥාවද, තදාවර්ජන මනසිකාරයද වේ. සංඥාව හා එකට යෙදුණු මනසිකාරයයිද කීම සුදුසුය. **සමුදාචරනති** යනු පවතිත් යන අර්ථයි. **ධමෙමා** යනු ප්‍රථමධ්‍යාන ධර්මයි. ධ්‍යානයන්ගෙන් පිරිහෙනුයේ තෙකරුණකින් පිරිහෙයි. කෙලෙස් නිතර පැවතීමෙන්, නොගැළපෙන ක්‍රියාවන්ගෙන්, ධ්‍යානයෙහි නොයෙදීමෙන් කෙලෙස් නිතර පැවතීමෙන් පිරිහෙනුයේ වහා පිරිහෙයි. වැඩ කරනු කැමති බව, දෙඩවීමෙහි ඇලීම, නින්දෙහි ආශාව, සමූහයක් මැද විසීමට කැමති බව ආදියෙහි යෙදීම් වශයෙන් වන නොගැලපෙන ක්‍රියාවන්ගෙන් පිරිහෙනුයේ මඳ වශයෙන් පිරිහෙයි. ගිලන් බව, ප්‍රත්‍යය විකල්පතාදී පළිබෝධයන්ගෙන්ද, නිතර සමනොවදිනුයේ අනනුයෝගයෙන් පිරිහෙනුයේද මන්දව පිරිහෙයි. මෙහි වනාහි බලවත් කරුණම දක්වන්නේ නිතර කෙලෙස් පැවතීමම කීයේය. ද්විතීය ධ්‍යානාදියෙන් පිරිහෙන්නේ යට යට ධ්‍යාන තෘෂ්ණා පැවතීමෙන්ද

පිරිහේ. කොපමණ පිරිහීමක් වේද? යම්විටෙක සමවදින්ට නොහැකි වේද? එපමණ පිරිහුණේ වේ. **තදනුධම්මතා** යනු ඊට අනුකූලව පැවති ධර්මයි. ධ්‍යානය අධිකකොට පැවතියහුගේ ආශා කිරීමට මෙය නමකි. අනුධර්මයම - අනුධම්මතායි. ඒ ධ්‍යානයාගේ අනුව පැවැත්ම තදනුධම්මතායි. **සති** යනු ධ්‍යාන නිකන්තියයි. **සන්තිට්ඨති** යනු පිහිටයි. ඒ ප්‍රථමධ්‍යානය අනුව පවත්නා නිකන්තිය පවතීයයි යු.සේයි. **අවිතක්ක සහගතා** යනු ද්විතීය ධ්‍යානාරම්මණයි. එය වනාහි, මෙහි විතර්කයක් නැත්තේනුයි අවිතර්කයයි කියයි. **නිබ්බිදා සහගතා** යනු විදර්ශනා අරමුණුකොට ඇති. එය සංස්කාරයන්හි කලකිරෙනුයේ නිබ්බිදායි කියයි. කලකිරෙන්නේ නොඇලෙයි යු.සේයි. **විරාගූප සංහිතා** යනු ආර්ය මාර්ගය හා එකට යෙදුණු විදර්ශනාව වනාහි මස්තකප්‍රාප්ත වූයේ මාර්ග වුට්ඨානයට පමුණුවයි. එහෙයින් විදර්ශනාව අරමුණුකොට පවත්නා සංඥා - මනසිකාරයන් විරාගූප සංහිත යයි කියති. විරාගයෙන් මිදේයයි යූසේයි. **විතක්ක සහගතා** යනු විතර්ක වශයෙන් ප්‍රථමධ්‍යාන අරමුණු. **උපෙක්ඛා සුඛ සහගතා** යනු තත්‍රමධ්‍යස්ථ උපෙක්ෂාවද, සුව වේදනාවද වශයෙන් තෘතිය ධ්‍යාන අරමුණු. **පීති සුඛ සහගතා** යනු ප්‍රීතියද, සුව වේදනාවගේ වශයෙන්ද ද්විතීයධ්‍යාන අරමුණු. **අදුක්ඛමසුඛ සහගතා** යනු උපෙක්ෂා වේදනා වශයෙන් චතුර්ථධ්‍යාන අරමුණු. ඒ වේදනා තොමෝ දුක් නොවේ. සුව නොවේ. නොදුක් නොසුවයයි කියනු ලැබේ. මකාරය පද සන්ධි වශයෙන් යූ.සේයි. **රූප සහගතා** යනු රූපධ්‍යාන අරමුණු. නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි සිටියහුට, හානභාගිය, ඨිතිභාගිය, නිබ්බෙධභාගි තත්වයන් විද්‍යමාන කල්හිද, විසෙසභාගිත්‍වය නොමැති හෙයින් නේවසඤ්ඤා නාසඤ්ඤායතනය නොදක්වන ලදී. මෙම සියලුම ලෞකික සමාධි ප්‍රමාද විහාරී මෘදු ඉන්ද්‍රිය ඇත්තහුට හානභාගී වෙයි. අප්‍රමාද විහාරී මෘදු ඉන්ද්‍රිය ඇත්තහුට ස්ථිතිභාගී වෙයි. තෘෂ්ණා චරිත තීක්ෂණ ඉන්ද්‍රිය ඇත්තහුට විසේසභාගී වෙයි. දෘෂ්ටි චරිත තීක්ෂණ ඉන්ද්‍රිය ඇත්තහුට නිර්වේධභාගී වේයයි කියනු ලැබේ.

**හානභාගී චතුෂ්ක නිර්දේශ වර්ණනාව නිමි.**

දැන් තනි තනි වූද, ලෞකික ධර්ම ත්‍රිලක්ෂණයෙන් මඩනා ලද්දේ වේද, එහෙයින් **ලක්ෂණත්‍රිකය** එකට දක්වන ලදී. එහි **අනිච්චං ඛයට්ඨෙන**

යනු ඒ ඒ තැන්වලම ක්‍ෂය වන හෙයින් අනිත්‍යයි. ක්‍ෂය වන, විනාශවන, නොඇලෙන, නිරුද්ධවන ස්වභාවය නිසා අනිත්‍යයයි.

ඇතැම්හු කියති. **දුක්ඛං භයට්ඨෙන** යනු භය සහිත බැවින් දුක්වේ. යමක් අනිත්‍යයද, එය භය එළවන්නේ වෙයි. සීහොපම සූත්‍රයෙහි දෙවියන්ට මෙනි. ජාති, ජරා, ව්‍යාධි, මරණ භයාර්ථයෙන් දුකයයි ඇතැම්හු කියති. **අනත්තා අසාරකට්ඨෙන** යනු තමාට තමා වසී කරගත හැකිය, තමාට අවශ්‍ය විදීම් විදිය හැකිය. යනාදී ආත්මය ස්වයංවසීතාවයෙන් පැවැත්විය හැකිය යනාදී වශයෙන් පරිකල්පනය කරන ලද ආත්මසාරයාගේ අභාවයෙන් අනාත්මය. යමක් අනිත්‍යද, දුකද, තමා කෙරෙහි අනිත්‍යතාවය හෝ උදයව්‍යය පීඩාවත් දරන්ට නොහැකිය. එයට කාරකාදී භාවයක් කොහිද? කියන ලද්දේද වේ. මහණෙනි,මේ රූපය ආත්මය වන්නේද? එසේ වේනම් මේ රූපය රෝගාබාධ සඳහා නොපවත්නේය. ආත්මසාර, නිත්‍යසාර ආදියෙන් තොර හෙයින් අනාත්මයයි ඇතැම්හු කියති.

### ලක්‍ෂණත්‍රික නිර්දේශ වර්ණනාව නිමි.

ආර්ය සත්‍යය චතුෂ්කයෙහිද, සත්‍යාර්ථයෙන් සත්‍යයන්ගේ එකට සම්බන්ධ හෙයින් එකටම දක්වන ලදී. එහි **තත්‍ථ** යනු ඒ සිවු අරීසස්හි, **කතමං** යනු කියා දෙනු කැමැත්තෙන් කරන ප්‍රශ්න කිරීමයි. **දුක්ඛං අරියසච්චං** යනු විමසන ලද ධර්ම නිදර්ශනයයි. එහි ජාතිපි දුක්ඛා ආදීන්හි ජාති ශබ්දයෙහි නොයෙක් අර්ථ ප්‍රකාශිතය. දෙසූ පරිදි

**භවො කුලං නිකායොච - සීලං පඤ්ඤත්ති ලක්ඛණං**
**පසූති සන්‍ධි චෙ වාති - ජාති අත්‍ථා පවෙදිතා**

භවය, කුලය, නිකාය, සීලය, ප්‍රඥප්තිය, ලක්‍ෂණය ප්‍රසූතිය, ප්‍රතිසන්ධිය යන අර්ථයන්හි ජාති ශබ්දය දන්නා ලදහ.

එක් ජාතියක් ජාති දෙකක්ආදීන්හි භවයයි. ජාතිවාදයෙන් අපහාස නොලැබූ, නින්දිත නොවූ, මෙහි කුලයයි. විසාඛ නිඝණ්ඨ නම් ශ්‍රමණ ජාතියක් ඇත. මෙහි නිකායයි. නැගණිය යම්කලෙක පටන් මම ආර්ය

ජාතියෙහි උපන්නේ, නොදනිමි. මෙහි ආර්ය සීලයයි. තිරියානම් තෘණ ජාතියක් නැබ පමණින් මතුවී අහසෙහි ගැටී සිටියේ වීය. මෙහි ප්‍රඥප්තියයි. ජාතිය ස්කන්ධයන් දෙකකින් සංගෘහිතයි. මෙහි ප්‍රත්‍යයෙන් හටගත් ලක්‍ෂණයයි. ආනන්දය, උපන් කෙණෙහි බෝසත් තෙමේ මෙහි ප්‍රසූතියෙහි. භවය හේතුවෙන් ජාතිය, ජාතියද දුකය යන මෙහි සමානාර්ථ වශයෙන් ප්‍රතිසන්ධි ස්කන්ධයන්ය. අසමානාර්ථයෙන් වනාහි. ඒ ඒ තන්හි උපදින්නා වූ සත්ත්වයින්ගේ යම් යම් ස්කන්ධ පහළ වේද? ඒ ඒ ස්කන්ධයන්ගේ පළමු පහළවීමයි. කවර හෙයින් උත්පත්තිය දුක්වේද යත්? නොයෙක් දුක්ඛයන්ගේ මූලාධාරක ස්ථානය බැවිනි. දුක් විවිධාකාරය. ඒ කෙසේද යත්? දුක්ඛ දුක, විපරිණාම දුක, සංස්කාර දුක, වැසුණු දුක, නොවැසුණු දුක, පර්යාය දුක, නිෂ්පර්යාය දුක වශයෙනි. මෙහි කායික චෛතසික දුක් වේදනා ස්වභාව වශයෙන්ද, චිත්ත චෛතසික වශයෙන්ද දුක් බැවින් දුක්ඛ දුක්ඛයයි කියනු ලැබේ. සැප වේදනාව වෙනසට පත්වීමෙන් දුක් ඉපදවීමට හේතුවන හෙයින් විපරිණාම දුකයි. උපේක්‍ෂා වේදනාවද, සෙසු ත්‍රෛභූමික සංස්කාරයෝ, හටගැනීම්, විනාශවීම්වලින් පීඩිත හෙයින් සංස්කාර දුකයි. කන් කැක්කුම්, දත් කැක්කුම් රාගයෙන් හටගත් තැවීම් ද්වේෂයෙන් හටගත් තැවීම් ආදී, කායික චෛතසික ආබාධ විමසා දතයුතු හෙයින් හටගත් ක්‍රම අප්‍රකට හෙයින් වැසුණු දුකයි. දෙතිස් කර්ම කිරීම් ආදියෙන් හටගත් ආබාධ නොවිමසාම දැනගත හැකි හෙයින්ද, උපක්‍රමද ප්‍රකට හෙයින්, නොවැසුණු දුකයි. දුක්ඛදුක්ඛය හැර සෙස්ස දුක්ඛ සත්‍ය විභංගයෙහි ආයේය. ජාති ආදී සියල්ලම ඒ ඒ දුකට වස්තුභාවයෙන් පර්යාය දුකයි. දුක්ඛ දුක්ඛය නිප්පරියාය (වෙනස් කළ නොහැකි) දුකයයි කියනු ලැබේ. ඒ මෙහි ජාතියයි. යම් ඒ බාල පණ්ඩිත සූත්‍රාදීන්හි භාග්‍යවතුන් වහන්සේ විසින්ද උපමා වශයෙන් ප්‍රකාශිත ආපායික දුකද, යම් ඒ සුගතියෙහිද, මිනිස් ලොව කුසෙහි පිළිසිඳ ගැනීම් මූලිකාදීභේද වූ දුක උපදී. ඒවාට හේතුවන බැවින් දුක්ය.

එහි ගැබෙහි පිළිසිඳ ගැනීම් මූලිකාදිභේද දුක මෙසේයි. මේ සත්ත්වයා මව්කුසෙහි උපදිනුයේ, මානෙල්, නෙලුම්, සුදුනෙලුම් ආදීන්හි නූපදියි. තවද ආමාශයට යටින් පක්වාශය මතුයෙහි උදරපටල පිටකටුවලට මධ්‍යයෙහි ඉතාමත් සම්බාධ සහිත, තද අඳුරින් යුත්, නොයෙක් කුණප ගන්ධයන්ගෙන් ගැවසීගත් ඉතාම දුර්ගන්ධ සුළං හමන ඉතාමත් පිළිකුල් කුස් පෙදෙස්හි, කුණුමස්, කුණු පිට්ටු සහිත ගවර වළවල පණුවකු සේ උපදියි. ඔහු එහි උපන්නේ දසමසක් මව්කුසෙහි හටගන්නා උෂ්ණයෙන්,

මුල්බැඳ තැම්බූ දෙයක් මෙන් පැසෙන්නේ, පිටි පිඩක් මෙන් හුමාලයෙන් තැම්බෙනුයේ, අත්පා වකුටු කිරීම් - දිගහැරීම් විරහිතව අධිමාත්‍ර දුකක් අනුභව කෙරෙයි. මෙය මව්කුසෙහි පිළිසිඳ ගැනීම් මූලික දුකයි. ඒ මව් කුසවත් තැනැත්තා, මව ඉක්මණින් පය හැපීම්, ගමන්, හිඳීම්, නැගිටීම්, පෙරළීම් ආදියෙහිදී, සුරාධූර්තයෙකු අතට පත් එළුවකු මෙන්ද, අහිගුණ්ඨිකයෙකු අතට පත් සර්ප පැටියෙකු මෙන්ද, ඇදීම, එහිමෙහි ඇදීම ගසා දැමීම, සෙලවීම ආදී උපක්‍රමයන්ගෙන් අධිමාත්‍ර දුකක් අනුභව කරයි. මව සිසිල් දිය පානය කරන කල්හි, සීත නරකයෙහි උපන්නාක් මෙන්ද, උණු කැඳබත් ආදිය ගිලින කල්හි, තමා අවට ගිනිඅඟුරු වර්ෂාවකින් වටකළාක් මෙන්ද, ලුණුඇඹුල් ගිලිනකල්හි ඇඟමස් ඉරා ලුණු ඇඹුල් මිශ්‍ර පස් ගල්වන රාජදඬුවමට පත්වන්නාක් මෙන්ද, අධිමාත්‍ර දුක් අනුභව කරයි. මෙය ගැබ පවත්වා ගැනීම් මූලික දුකයි. යම් ඒ මවගේ ගැබ අක්‍රමවත් වන්නේද, යහළු මිත්‍රයින් සහෘදයින් විසින් නොදැකිය යුතු දුක් උපදින ස්ථානයන්හි කැපීම් පැළීම් ආදීන්ගෙන් දුක් අනුභව කරයි. මෙය ගැබ් විපත් මුල්කොට ඇතිවන දුකයි. මව දරුවා බිහිකරන කල්හි කර්මජ වාතයෙන් පෙරළා, නිරයෙහි ප්‍රපාතයක් බඳු ඉතා භයානක යෝනි මාර්ගයට ගෙනඑනු ලබන කල්හි අතිශය සම්බාධක යෝනි මුඛයෙන් යතුරු සිදුරකින් අදිනු ලබන මහා ඇතෙකු මෙන්ද, නිරිසතෙකු මෙන්ද එකට බැඳි පර්වත දෙකකින් කුඩු කරනු ලබන කල්හි මෙන් දුක් උපදියි. මෙය බිහිකිරීම් මූලික දුකයි. යම් ඒ අලුත උපන්, අලුත් තුවාලයක් බඳු සියුම් ශරීරයාගේ අත් ස්පර්ශ, නැහැවීම්, දෙවීම්, රෙදිකඩවලින් පිරිමැදීම් වන කල්හි, ඉඳිකටු තුඩින්, දැලිපිහිතලවලින් විදින පළන සමාන දුකක් උපදියි. මෙය මව්කුසින් පිටත නික්මීම් මූලික දුකයි. ඉන් මත්තෙහි දිවිපැවැත්මෙහිදී, තමා විසින්ම තමා නසන්නාටද, නිර්වස්ත්‍ර වත් පිරීම් ආදි වශයෙන් ආත්මය තැවීම්, විශේෂ තැවීම් ආදී යෝගයන්හි යෙදෙන්නාටද, ක්‍රෝධ වශයෙන් ආහාර නොගන්නාටද, ගෙල වැළලා ගන්නාටද, දුක් ඇතිවෙයි. මෙය ආතෙමාපක්‍රම මූලික දුකයි. යම් ඒ අනුන්ගෙන් වධබන්ධනාදීන් අනුභව කරන්නාට දුකක් උපදීද? මෙය පරෝපක්‍රම මූලික දුකයි. මේ සියලුම දුකට මේ ඉපදීම හේතුවම වේ. එහෙයින් මෙය යූ.සේයි.

ජායෙථ නො චෙ නරකෙසු සතෙතා
තත්‍ථග්ගි දාහාදික මප්‍ප සය්හං
ලභෙථ දුක්ඛනනු කුහිං පතිට්ඨං
ඉච්චාහ දුක්ඛාති මුනීධ ජාතිං

ඉවසිය නොහැකි ගිනිදැල් දැවීම් සහිත, නරකයෙහි ඉදින් සත්ත්වයෙක් උපදීද? එහි පිහිටක් කොයින්ද? ලබනුයේ දුකක් පමණක් නොවේද? මෙසේ බුදුරදුන් උපත දුකයයි වදාළ සේක.

**දුක්ඛං තිරච්ඡෙසු කසා පතොද**
**දණ්ඩාභිඝාතාදිභවං අනෙකං**
**යං තං කථං තත්‍ථ භවෙය්‍ය ජාතිං**
**විනා තහිං ජාති තතොපි දුක්ඛා**

තිරිසන් යෝනියෙහි, කස, කෙවිටි, දඬුවලින් පහරදීම් ආදී නොයෙක් දුක් වෙයි. උපත නොවේනම් එය එහි කෙසේ වන්නේද? එහෙයින් එහි උපත එකරුණින්ද දුක් වේ.

**පෙතෙසු දුක්ඛං පන ඛුප්පිපාසා**
**වාතාතපාදිප්පභවං විචිත්තං**
**යස්මා අජාතස්ස න තස්ස අත්‍ථි**
**තස්මාපි දුක්ඛං මුනි ජාති මාහ**

ප්‍රේත ලෝකයෙහි සාපිපාස, අව්(වැසි) සුළංවලින් හටගත් විසිතුරු දුක් හටගනී. යම්හෙයකින් නූපන්නහුට එය නොමැත්තේද? එහෙයින් බුදුරදහු ඉපදීම දුකයයි වදාළහ.

**තිබ්බන්ධකාරෙච අසය්හ සීතෙ**
**ලොකන්තරෙ යං අසුරෙසු දුක්ඛං**
**න තං භවෙ තත්‍ථ න චස්ස ජාති**
**යතො අයං ජාති තතොපි දුක්ඛා**

නොඉවසිය හැකි සීතල හා ඝන අඳුරින් සමන්විත ලෝකාන්තරික නරකයෙහි අසුරයන් කෙරෙහි යම් දුකක් වන්නේද, එහි ඉපදීමක් නොවන්නේ නම් එය එහි නොවන්නේය. යම් හෙයකින් උපත වන්නේද, එහෙයින්ද දුක්ය.

**යඤ්චාපි ගූථ නරකෙ විය මාතුගබ්භෙ**
**සත්තො වසං චිරමතො බහි නික්ඛමඤ්ච**
**පප්පොති දුක්ඛ මති ඝොර මිදම්පි නත්ථි**
**ජාතිං විනා ඉතිපි ජාති අයංහි දුක්ඛා**

සත්ත්වයා ගූථ නරකයෙහි මෙන් මාතෘ ගර්භයෙහි බොහෝ කලක් වැස, ඉන් පිටත නික්මෙන කල්හිද ඉතා භයානක දුකට පත්වෙයි. උපත නොවේනම් එයද නොවන්නේය. මෙකරුණින්ද ජාතිය දුකය.

**කිං භාසිතෙන බහුනා නනු යං කුහිඤ්චි**
**අත්ථීධ කිඤ්චිදපි දුක්ඛමිදං කදාචි**
**නෙවත්ථි ජාති විරහෙ යදතො මහෙසී**
**දුක්ඛාති සබ්බ පඨමං ඉමමාහ ජාති'නති**

මේ දුක මෙලොව කවරකලෙක කිසිසේත්, කොතැනක හෝ ඇතිවන්නේ නොවේද? උපත නැතිකල්හි පමණක් මෙය නොමැත්තේය. ඒ ගැන වැඩිපුර කථා කිරීමෙන් ඇති ඵලය කිමෙක්ද? මේ පිළිබඳව මහර්ෂින් වහන්සේ සියල්ලට පළමු උපත දුකයයි වදාළ සේක.

**ජරාපි දුක්ඛා** මෙහි ජරාව දෙයාකාරය. සංඛත ලක්ෂණයද, දත් වැටීම් ආදී වශයෙන් සම්මත, එක් භවයකට ඇතුළත් ස්කන්ධයන්ගේ නොකඩවා පැවැත්මෙහිදී වන පැරණි වීමද යන දෙයාකාරයයි. එය මෙහි අදහස් කරන ලදී. සංස්කාර දුක්ඛ ස්වභාවයෙන්ද, දුකට වස්තුවන හෙයින්ද එය වනාහි දුක්ය. යම් ඒ අංග ප්‍රත්‍යංගයන්හි ලිහිල් බව, ඉන්ද්‍රිය වෙනස්වීම, විරූපී ස්වභාවය යෞවනත්වය විනාශය, ශක්තිය නැසී යාම, සිහිය ඉවත්ව යාම අන්‍යයන්ගේ පරිභවයන්ට භාජනවීම් ආදී නොයෙක් හේතූන් මත කායික චෛතසික දුක් උපදී. ජරාව ඊට හේතුයි. එහෙයින් මෙය යුසේයි.

**අංගානං සිථිලීභාවා - ඉන්ද්‍රියානං විකාරතො**
**යොබ්බනස්ස විනාසෙන - බලස්ස උපඝාතතො**

ශරීරායවයන්ගේ ලිහිල් භාවයෙන්ද, ඉන්ද්‍රියයන්ගේ වෙනස් වීමෙන්ද, යෞවනත්වය විනාශ වීමෙන්ද, බල නාසනයෙන්ද, සිහිය ආදීන්ගේ ඉවත්ව යාමෙන්ද,

**විප්පවාසා සඛාදීනං - පුත්තදාරෙහි අත්තනො**
**අපසාදනියතො චෙව - හීයෙය්‍යා බාලත්ත පත්තියා**

තම අඹුදරුවන්ගේ නොපැහැදීම් තත්වයට පත්වීමෙන්ද, බොහෝ සේ කුඩා දරුවකුගේ තත්වයට බුද්ධිහීනතාවයට පත්වීමෙන්ද,

**පප්පොති දුක්ඛං යං මච්චො - කායිකං මානසං තථා**
**සබ්බමෙතං ජරා හෙතු - යස්මා තස්මා ජරා දුක්ඛා'ති**

යම් මිනිසෙක් කායික-මානසික දුකට පත්වේද? ඒ සියල්ල ජරා හේතුවෙන් වේ. යම් හෙයකින් ඒ දුක පැමිණේද? එහෙයින් ඒ ජරාව දුකය.

ජරා දුකට, අනතුරුව ව්‍යාධි දුක කිවයුතු වුවත්, කායික දුක් ග්‍රහණයෙන්ම ව්‍යාධි දුක ඇතුළත් වූ හෙයින් නොකියන ලදැයි දතයුතුය. මරණම්පි දුක්ඛං මෙහිද මරණය දෙයාකාරය. සංඛත ලක්‍ෂණද ජරාමරණ ස්කන්ධයන් දෙකකින් සංගෘහිතයයි යමක් සඳහා කියන ලද්දේද එයද, එක් භවයකට අයත් ජීවිතේන්ද්‍රියයාගේ නොසිඳී පැවැත්මේ විනාශයද, නිතර මරණයෙන් බිය හටගනීයයි යමක් සඳහා කියන ලද්දේද, එය මෙහි අදහස් කරන ලදී. ඉපදීම් හේතුයෙන් වන මරණය, උපක්‍රම තුළින් වන මරණය, ස්වාභාවික මරණය, පුණ්‍යක්‍ෂය මරණය යනුද එයටම නම්ය. නැවත ක්‍ෂණික මරණය, සම්මුති මරණය, සමුච්ඡේද මරණයයි යන මෙම බෙදීම්ද දතයුතුය. ප්‍රවෘත්තියෙහි රූපාරූප ධර්මයන්ගේ බිඳීම ක්‍ෂණික මරණය නම් වේ. තිස්ස මළේය ඵුස්ස මළේය යන මෙය පරමාර්ථ වශයෙන් සත්ත්වයෙක් නොමැති හෙයින් සම්මුති මරණ නම් වේ. ක්‍ෂීණාශ්‍රවයාගේ ප්‍රතිසන්ධි රහිත කාලක්‍රියාව සමුච්ඡේද මරණ නම් වේ. බාහිර සමමුති මරණ හැර, අනෙක් සම්මුති මරණයද, සමුච්ඡේද මරණයද කියන ලද පැවැත්මේ විනාශයෙහිම ඇතුළත් කරන ලදී. දුකට හේතුවන බැවින් දුක්ය. එහෙයින් මෙය කියන ලදී.

**පාපස්ස පාප කම්මාදි - නිමිත්ත මනුපස්සතො**
**භද්දස්සාපසහන්තස්ස - වියොගං පිය වත්ථුකං**

පාපියාට පාප කර්මාදී, නිමිති සිහිකරන කල්හිද, යහපත් පුද්ගලයාට ප්‍රිය වස්තුන්ගේ වියොව නොඉවසන කල්හිද,

**මීයමානස්ස යං දුක්ඛං - මානසං අවිසෙසතො**
**සබ්බෙසඤ්චාපි යං සන්ධි - බන්ධනච්ඡෙදනාදිකං**

මියැදෙන්නා වූ, සියල්ලන්ටම සමානතාවයෙන් යම් මානසික දුකක් වේද,

**විතුජ්ජමාන මම්මානං - හොති දුක්ඛං සරීරජං**
**අසය්හ මප්පටීකාරං - දුඛස්සෙසතස්සිදං යතො**
**මරණං වත්ථු තෙනෙදං - දුක්ඛ මිච්චෙව භාසිතන්ති**

එසේම යම් ඇටසන්ධි බැඳීම්, බිඳීම් ආදී වූද, මර්මස්ථාන අවි ආයුධවලින් විදිනු ලබන කල්හි වන යම් ශාරීරික දුකක් වේද? එසේම මරණයටද හේතු වේද? එහෙයින් මෙය දුකම යැයි වදාරණ ලදී.

සෝකාදීන්හි සෝකය නම් ඤාති ව්‍යසනාදියෙන් පෙලුණහුගේ අභ්‍යන්තර පසුතැවීම් ලක්‍ෂණ ඇති චිත්ත සන්තාපයයි. දුක වනාහි, දුක්ඛ දුක්ඛයෙන්ද, දුක්ඛ වස්තු වශයෙන්ද වේ. එහෙයින් මෙය කියනු ලැබේ.

**සත්තානං හදයං සොකො - විසසල්ලංච තුජ්ජති**
**අග්ගි තත්තොව නාරාචො - භුසංව දහතෙ පුන**

සත්ත්වයින්ගේ හෘදය සෝක නමැති විස හුලින් විදියි. ගින්නෙන් රත්වූ යකඩ හුලක් මෙන් බොහෝ සේ නැවතද දවයි.

**සමාවහති බ්‍යාධිඤ්ච - ජරා මරණ භෙදනං**
**දුක්ඛමපි විවිධං යස්මා - තස්මා දුක්ඛොති වුච්චතී'ති**

යම් හෙයකින් ජරා මරණාදී විනාශයන්ද, රෝගයන්ද, විවිධ දුක් ද එළවන්නේ වේද, එහෙයින් දුකයයි කියනු ලැබේ.

පරිදේව නම් ඤාති ව්‍යසනාදියෙන් පෙලුණහුගේ කටින් පිටවන හිස් වචනයි. සංස්කාර දුක්ඛ භාවයෙන්ද දුක්ඛ වස්තු හෙයින්ද දුකය. එහෙයින් මෙය කියනු ලැබේ.

**යං සොක සලල විහතො පරිදෙවමානො**
**කණ්ඨොට්ඨතාලුතල සොසජ මප්පසයහං**
**භියොහාධිමත්ත මධිගච්ඡති යෙව දුක්ඛං**
**දුක්ඛොති තෙන භගවා පරිදෙවමාහා'ති**

සෝක නමැති හුලින්, නසනු ලැබුයේ, වැලැපෙනුයේ බෙල්ල, තොල, තල්ලෙහි තලය වියලවනුයේ, නොඉවසනුයේ අධිමාත්‍ර දුකට පැමිණේද, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වැළපීම දුකයයි වදාළහ.

දුකනම් කය පීඩාවට පත්කරන ලක්‍ෂණ ඇති කායික දුකයි. දුක මානසික දුක් එළවන හෙයින් දුක්ඛ දුක්ඛයයි යෙති. එහෙයින් මෙය කියනු ලැබේ.

**පීළෙති කායික මිදං - දුක්ඛඤ්ච මානසං භියො**
**ජනයති යස්මා තස්මා - දුක්ඛන්ති විසෙසතො වුත්ත'න්ති**

මේ දුක කායිකවද සත්ත්වයා පෙළයි. මානසිකවද බොහෝ සෙයින් පීඩා හටගන්වයි. එහෙයින් දුකයයි විශේෂයෙන් කියන ලදී.

දොමනස්ස නම් සිත පෙළන ලක්‍ෂණ ඇති මානසික දුකයි. දුක වනාහි කායික දුක් එළවන හෙයින් දුක්ඛ දුක්ඛ වශයෙන් ගැනේ. සිතේ දුකින් යුත් කල්හි, කෙස් විසුරුවමින් හඬති. ළය පහරති. ඔබිනොබ පෙරළෙති. දෙපා උඩුකුරුව වැටෙති. ආයුධ ගනිති. වස විස කති. රැහැණෙන් ගෙල වැලලා ගනිති. ගින්නට පිවිසෙති. ආදී නානාප්‍රකාර දුක් අනුභව කරති. එහෙයින් මෙය කියනු ලැබේ.

**පීළෙති යතො චිත්තං - කායස්ස ච පීළනං සමාවහති**
**දුක්ඛන්ති දොමනස්සං - විදොමනස්සා තතො අහූ'ති**

යම් හෙයකින් සිත පෙළේද? සිරුරෙහි පෙළීම ගෙන ඒද? එහෙයින් දොම්නස දුකයයි සලකා, පහවූ දොම්නස් ඇත්තාහු වෙත්වා !

උපායාස නම් ඥාති ව්‍යසනාදියෙන් පෙළෙන ලද දුකින් මඩනා ලද අයෙකුගේ සිතෙහි හටගන්නා අධිමාත්‍ර දෝෂයමය. මෙය සංස්කාර

ස්කන්ධයන්ට ඇතුළත් යයි ඇතැමෙක් කියති. සංස්කාර දුක්ඛ ස්වභාවය හෙයින්ද, සිත හාත්පසින් දවන බැවින්ද සිරුර කම්පනයට පත්වන හෙයින්ද දුකයයි කියයි.

එහෙයින් මෙය කියනු ලැබේ.

**චිත්තස්සච පරිදහනා - කායස්ස විසාදනාච අධිමත්තං**
**යං දුක්ඛමුපායාසො - ජනෙති දුක්ඛො තතො වුත්තො'ති**

යම් ඒ උපායාස දුකක් වේද? එය සිත හාත්පසින් දැවීම, ශරීරය අධිමාත්‍ර පීඩනයට පත්කිරීම හටගන්වයි. එහෙයින් උපායාසය දුකයයි කියන ලද්දේය.

මෙහිද, සෝකය මඳගින්නේ භාජනය තුළ පැසෙන්නාක් මෙනි. පරිදේවය තද ගින්නෙහි පැසෙන කල්හි භාජනයෙන් පිටත නික්මීමක් මෙනි. පිටත නික්මී ඉතිරිය පිටත නික්මීමට අපොහොසත්ව භාජනය තුළම ක්‍ෂය වනතුරු පැසීම උපායාසයයි දතයුතුය. **අප්පියෙහි සම්පයොගො** නම් ප්‍රියනොවූ සත්ත්ව සංස්කාරයන් සමග එකට සම්බන්ධ වීමයි. දුකට හේතුවන බැවින් දුක්ය. එහෙයින් මෙය කියනු ලැබේ.

**දිස්වාව අප්පියෙ දුක්ඛං පඨමං හොති චෙතසි**
**තදුපක්කම සම්භූත මථ කායෙ යතො ඉධ**
**තතො දුක්ඛ ද්වයස්සාපි වත්ථුතො සො මහෙසිනො**
**දුක්ඛො වුත්තොති විඤ්ඤෙය්‍යො අප්පියෙහි සමාගමො'ති**

යම්හෙයකින් මෙහි අප්‍රියයෙකු දැක පළමුව සිතෙහි දුකක් හටගනී. ඒ සිතේ උපක්‍රමයෙන් හටගත් බලයෙන් ශරීරයටද දුක කාවදී. ඉක්බිති වස්තු වශයෙන් දුක කය සිත දෙකටම පැතිරෙයි. එබැවින් ඒ මහර්ෂීන් වහන්සේ විසින් අප්‍රියයන් හා එක්වීම දුකයයි වදාරණ ලද්දේයයි දතයුතුය.

**පියෙහි විප්පයොගො** නම් ප්‍රිය සත්ත්ව සංස්කාරයන්ගෙන් වෙන්වීම් ස්වභාවය දුක්ඛ වස්තු බැවින් දුක්ය. එහෙයින් මෙය කියනු ලැබේ.

**ඤාති ධනාදි වියොගා - සොක සරස මප්පිතා විතුජ්ජන්ති**
**බාලා යතො තතොයං - දුක්ඛොති මතො පිය විප්පයොගොති**

අඥානයෝ යම් හෙයකින් ඥාති ධනාදී වියෝගයෙන් සෝක ස්වභාවය හෘදයාභ්‍යන්තරයට වැදුණෝ එම සෝකය නමැති හුලින් විදිනු ලබත්. එහෙයින් මේ ප්‍රිය විප්‍රයෝගය දුක යයි දන්නා ලදී.

කැමති දෑ නොලැබෙන කල්හි, නොලැබිය යුතු වස්තුන්හි කැමැත්තම, **යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං** යයි යුසේයි. දැහැමින් නොලැබිය යුතු වස්තු කැමති වන්නා නො ලබයි. එයද නොලැබිය යුතු වස්තුන්හි කැමැත්තද දුකයයි අර්ථයි. දුකට හේතුවන බැවින් දුක්ය. එහෙයින් මෙය කියනු ලැබේ.

**තං තං පත්ථය මානානං තස්ස තස්ස අලාභතො**
**යං විඝාතමයං දුක්ඛං සත්තානං ඉධ ජායති**
**අලබ්භනෙය්‍ය වත්ථූනං පත්ථනා තස්ස කාරණං**
**යස්මා තස්මා ජිනො දුක්ඛං ඉච්ඡිතා ලාභමබ්‍රවී'ති**

ඒ ඒ දෙය ප්‍රාර්ථනා කරනවුන්ට ඒ ඒ දෙය නොලැබීමෙන් මෙලොව සත්ත්වයින්ගේ යම් සිත් පීඩාකරන දුකක් වේද? නොලැබිය යුතු වස්තුන්හි ප්‍රාර්ථනාව ඊට හේතුයි. එහෙයින් ජිනේන්ද්‍රයන් වහන්සේ කැමති දෑ නොලැබීම දුකයයි වදාළ සේක.

**සංඛිත්තෙන පඤ්චුපාදනක්ඛන්ධා** යන මෙහි **සංඛිත්තෙන** යන්න දේශනය සඳහා කියන ලදී. දුක, මෙතෙක් දුක්යයි හෝ දුක් සියයෙකැයි හෝ මෙතෙක් දුක් සහසකැයි කියා හෝ හකුළුවා දක්වන්ට නොහැකිය. දේශනාවෙහිදී එය කළ හැකිය. දුක නම් අන් කිසිවක් නොවේ. සංක්‍ෂේපයෙන් පංච උපාදානස්කන්ධ දුකයයි දේශනාව ලුහුඬු කරන්නේ මෙසේ වදාළ සේක. **පඤ්ච** යනු ගණන් පිරිසිඳීමයි. **උපාදානක්ඛන්ධා** යන උපාදාන ගෝචර ස්කන්ධයි.

**ජාතිප්පභුතිකං දුක්ඛං - යං වුත්තමිධ තාදිනා**
**අවුත්තං යඤ්ච තං සබ්බං - විනා එතෙන විජ්ජති**

උපත ප්‍රමුඛ කොට ඇති මෙහි යම් දුකක් ගැන තාදි ගුණයෙන් යුත් උතුමාණන් විසින් වදාරණ ලද්දේද? ඒ සියල්ල මෙයින් තොරව විද්‍යමාන වේයයි යමක් ගැන නොකියන ලද්දේය.

**යස්මා තස්මා උපාදානක්ඛන්ධා - සංඛෙපතොඉමෙ**
**දුක්ඛාති වුත්තා දුක්ඛන්ත - දෙසකෙන මහෙසිනා**

එහෙයින් උපාදානස්කන්ධයන් ලුහුඬින් මේවා වෙයි. එසේම දුක්යයිද, දුක් කෙළවර කිරීමේ මාර්ගය දේශනා කරන මහර්ෂින් වහන්සේ විසින් වදාරණ ලද්දේය.

එසේම ගින්නට දර මෙනි. පහරදීමට ඉලක්කය මෙනි. මැසිමදුරු ආදීන්ට ගවරූපය මෙනි. ගොයම් කපන්නන්ට කුඹුර මෙනි. ගම් පහරන්නන්ට ගම මෙනි. උපාදානස්කන්ධ පංචකයම ජාති ආදී විවිධාකාරයන්ගෙන් පෙළන්නේ, භූමියෙහි තෘණලතාදීන් මෙන්ද, වෘක්ෂයන්හි මල් ගෙඩි දලු ආදිය මෙන්ද, උපාදාන ස්කන්ධයන්හිම උපදිත්. උපාදානස්කන්ධාදීන්ගේද මුලදී වන දුක උපතයි. මධ්‍ය දුක ජරාවයි. අවසාන දුක මරණයයි. මාරාන්තික දුකින් පීඩනයට පත්වන කල්හි (හැපීම) දැවෙන දුක සෝකයයි. එය නොඉවසමින් විලාපනගන දුක පරිදේවයයි. ඉන් සප්තධාතු කිපීම් ආදී අනිටු ස්පර්ශ එක්වීමෙන් ශරීරය රෝගී භාවයට පත්කිරීමේ දුකඃ දුකයි. ඉන් පෙළෙනු ලබන පෘථජ්ජනයින්ට එහි කෝපය හටගන්නා බැවින් චිත්ත පීඩා දුක දෝමනස්සයයි. සෝක ආදියෙහි වෘද්ධියෙන් ජනිත සිත් තැවුල් හා ශෝකාතුර වචන ප්‍රකාශ කිරීමේ දුක උපායාසයි. බලාපොරොත්තු විනාශ වූවන්ගේ, කැමති දේ නැසීයාම, කැමති දේ නොලැබීමාදියද ඉහත කරුණුවලට අදාළ වේ. මෙසේ නොයෙක් ආකාරයෙන් පරීක්‍ෂා කරනු ලබන්නේ උපාදාන ස්කන්ධයන්ම දුකයයි, එකින් එක දක්වමින් කියන කල්හි නොයෙක් කල්ප ගණනාවකින්ද නිරවසේසව කියන්ට නොහැකිය. සමස්ත සමුද්‍රජල රසය එක් සමුද්‍ර ජල බිඳුවක පැතිර පවත්නා සේ, ඒ සියලුම දුක් පංච උපාදානස්කන්ධයන්හි හකුළුවා දක්වන්ට '**සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා**' යයි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද්දම තෙරහු කීහ.

**තත්ථ කතමා ජාති** ආදී පද බෙදීම්හි **තත්ථ** යනු දුක්ඛ සත්‍ය නිර්දේශයෙහි කියන ලද ජාති ආදීන්හි, **යාතෙසං තෙසං සත්තානං** යනු සංක්ෂේපයෙන් නොයෙක් සත්ත්වයින්ට සාධාරණ නිර්දේශයයි. යම් ඒ දේවදත්තයාගේ ජාතිය සෝමදත්තයාගේ ජාතිය යයි මෙසේ මුලු දවසම කියන කල්හිද සත්ත්වයින්ගේ සම්පූර්ණ ගණන් ගැනීමක් නොවේ. සියලු වෙනත් අර්ථ දැක්වීම් සිදුනොවේ. මෙම දෙපදයෙන් කිසිම සත්ත්වයෙක්

ගණන් නොගන්නා ලද්දේ නොවේ. අනෙක් කිසි වෙනත් අර්ථ දැක්වීම් සිදුනොවේ. **තමහි තමහි** යන මෙය පැවතුම්, හටගැනීම් වශයෙන් සත්ත්ව කොටස්වලට සාධාරණ නිර්දේශයයි. **සත්තනිකායෙ** යනු සත්ත්ව කොටස්හි, සත්ත්ව රාශිය, සත්ත්ව සමූහය යන අර්ථයි. **ජාති** ඉපදීම් වශයෙන්ම මෙය මෙහි වෙන් වශයෙන් වූ ස්වභාවයයි. **සඤ්ජාති** යනු හටගැනීම් වශයෙන්, උපසර්ගයෙන් පදය වර්ධනය කරන ලදී. **ඔක්කන්ති** යනු බැසගැනීම් වශයෙන්, ඉපදීම් අර්ථයෙන් හෝ ජාතියි. එය සම්පූර්ණ නොවූ ආයතන වශයෙන් යු.සේයි. හටගැනීම් අර්ථයෙන් සඤ්ජාතියි. එය සම්පූර්ණ ආයතන වශයෙන් යු.සේයි. බැසගැනීම් අර්ථයෙන් ඔක්කන්තියි. එය අණ්ඩජ, ජලාබුජ වශයෙන් යු.සේයි. ඒවා වනාහි අණ්ඩ කෝෂයට, වස්තිකෝෂයට බසිති. බසින්නාහු, පිවිසෙන්නාක් මෙන් ප්‍රතිසන්ධිය ගනිති. ඉපදීම් අර්ථයෙන් **අභිනිබ්බත්තියි** එය සංසේදජ, ඕපපාතික වශයෙන් යු.සේයි. ඒවා ප්‍රකටවම හටගනිති. මේ සම්මුති කථාවයි.

දැන් **ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො** යන පරමාර්ථ කථාව වේ. පරමාර්ථ වශයෙන් ස්කන්ධයෝම පහළ වෙති. සත්ත්වයෝ නොවේය. මෙහිද, **ඛන්ධානං** යනු එක් ස්කන්ධයක් ඇති භවයෙහි එකක් ද, සිවුස්කන්ධයක් ඇති භවයෙහි සතරක් ද, පංච ස්කන්ධයක් ඇති භවයෙහි පහක් ද වශයෙන් ගැනීම දතයුතුය. **පාතුභාවො** යනු උපතයි. **ආයතනානි** යනු ඒ ඒ තන්හි උපදිනු ලබන ආයතන වශයෙන් සංග්‍රහයි දතයුතුය. **පටිලාභො** යනු පැවැත්මෙහි පහළවීමයි. පහළවන්නාහාම ඒවා ලදුයේ නම් වෙති. **අයං වුච්චති ජාති** යනු මෙය ජාතිය නමැයි කියනු ලැබේ.

ජරා නිර්දේශයෙහි **ජරා** යනු ස්වභාවය වෙනස්වීමයි. **ජීරණතා** ආකාර නිර්දේශයයි. **ඛණ්ඩිච්චං** ආදි ත්‍රය කාලාතික්‍රමයේදී වන කෘත්‍ය නිර්දේශයයි. පසුව දැක්වෙන ද්වය ප්‍රකෘති නිර්දේශයි. අයංහි ජරා යන මේ පදයෙන් ස්වභාව වශයෙන් දක්වන ලදී. එහෙයින් මේ ජරාවගේ ස්වභාව වෙනස්වීමයි ජීරණතා යන මෙයින් ආකාර වශයෙන් එහෙයින් මෙය ආකාර නිර්දේශය වන්නේ ය. **ඛණ්ඩිච්චං** යන මෙයින් කාලයාගේ ඇවෑමෙන් දත් නිය ආදීන්ගේ කැඩුණු බව කරණ කෘත්‍ය වශයෙනි. **පාලිච්චං** මෙයින් කෙස් ලොම් ආදීන්ගේ පැසුණු බව කරණ කෘත්‍ය වශයෙනි. **වලිත්තචතා** යන මෙයින් මාංශ මැලවී හම රැලි වැටීම් භාව කරණ කෘත්‍ය වශයෙනි. මෙම ත්‍රය කල් ඉක්මීමෙහිදී වන කෘත්‍ය නිර්දේශය

වන්නේ ය. එයින් මෙම විකෘතීන්ගේ දර්ශන වශයෙන් ප්‍රකට වූ, ප්‍රකට ජරාව දක්වන ලදී. යම්සේ වනාහි ජලයෙහි හෝ වාතයෙහි හෝ ගින්නෙහි හෝ තණ රුක් ආදිය බිඳී ගිය, එරී බිඳී ගිය, දැවීගිය ආකාරයෙන් ගිය මාර්ගය ප්‍රකට වේද? ඒ ගිය මාර්ගය ඒ ජල ආදිය නො වේ. එපරිදි ජරාවෙන් දත් ආදීන්හි කැඩුණු ආදී ස්වභාවයෙන් ගිය මාර්ගය ප්‍රකටය. වැසූ ඇසින්ද ස්පර්ශ කිරීම් වශයෙන් ගතහැකිය. කැඩුණු බව ආදියම ජරාව නොවේ. ජරාව ඇසින් දැකිය නොහැකිය.

**ආයුනො සංහානි ඉන්‍ද්‍රියානං පරිපාකො** යන මේ පදවලින් කල් ඉක්මීමෙන්ම, මඩනා ලද ආයුක්ෂය වීමෙන්, චක්ෂුරාදී ඉන්ද්‍රියයන්ගේ මෙරීම් සංඛ්‍යාත ප්‍රකෘතිය දක්වන ලදී. එහෙයින් මේ ද්වයය ප්‍රකෘති නිර්දේශයයි දතයුතුය. යම්හෙයකින් ජරාවට පත්වූවහුගේ ආයුෂ පිරිහේද? එහෙයින් ජරාව 'ආයුනො සංහානි'යි ආසන්න ඵලය වශයෙන් කියන ලදී.

බාල වියෙහි තමාගේ විෂයයන් (අරමුණු) පහසුවෙන් ගැනීමට සමත් සුපසන් සියුම් වූ, චක්ෂුරාදී ඉන්‍ද්‍රියයන් ජරාවට පත් කල්හි මෝරා ගියේ, කැළඹුණේ, පිරිසිදු නොවූයේ, ඇඩිවූද, තමාගේ අරමුණ ගන්ට අසමත් වෙයි. එහෙයින් ඉන්‍ද්‍රියානං පරිපාකො යයි ආසන්න ඵලය වශයෙන් යු.සේයි.

මෙසේ දක්වන ලද ඒ සියලුම දිරීම් ප්‍රකට සංවෘතයයි දෙවැදෑරුම්ය. එහි දත් ආදීන්ගේ කැඩුණු ස්වභාව දර්ශනය වන හෙයින් රූප ධර්මයන්හි දිරීම් ප්‍රකට දිරීම් නම් වේ. අරූප ධර්මයන්හි දිරීම් එවැනි වෙනස්කම් නොපෙනෙන හෙයින් සංවෘත දිරීම් නම් වේ. එහි යම් ඒ කැඩුණු ආදී බවක් පෙනේද? එය එවැනි දන්තයන්හි වර්ණයමය. එය ඇසින් දැක, මනෝද්වාරයෙන් සිතා, මේ දත් ජරාවෙන් පහරන ලදැයි දැනගනී. ජලස්ථානයක පිටත ගව අං ආදිය බලා, යට ජලය ඇති බව දැනගන්නා මෙනි. නැවත මෙම ජරාව වර්ණාදි විපර්යාසයෙන් ප්‍රකටවන ජරාව, ප්‍රකට නොවන ජරාව (සවීචි, අවීචි) වශයෙන් දෙයාකාරය. එහි මැණික්, රන්, රිදී, පබළු, චන්ද්‍ර සූර්යයාදීන්ගේද, මන්ද දසකෘදීන්හි ප්‍රාණීන්ගේ මෙන්ද, මල්, ගෙඩි, දළු ආදී අප්‍රාණීන්ගේ මෙන්ද, අතරතුර වර්ණ වෙනස්වීම් දැනගැනීම දුෂ්කර හෙයින් එම ජරාව අතරක් නොමැති ජරාව නම් වේ. නිරන්තර ජරායයිද අර්ථයි. එයින් අන්‍යයන්හි වනාහි, කියන ලද අයුරින් අතරතුර වර්ණ වෙනස්වීම් ආදීන් දැනගැනීම පහසු හෙයින් එම ජරාව

සවීචි ජරාව නම් වේ. එම සවීචි ජරාව උපාදින්නක, අනුපාදින්නක වශයෙන් මෙසේ දතයුතුය. ළදරු කුමරුවන්ට පළමුවම කිරිදත් නම් දත් නගී. (හටගනී) ඒවා ස්ථිර නැත. ඒවා වැටුණු කල්හි නැවත දත් පැනනගී. ඒවා පළමුවම සුදු වෙයි. ජරා වාතයෙන් පහරණු ලැබූ කල්හි කාළවර්ණ වෙයි. කෙස් පළමුවම තඹවත් වෙයි. ඉන්පසු කාළවර්ණයි. ඉන්පසු සුදුය. සම (සිවිය) ලේ සහිතයි. වැඩෙන වැඩෙන කල්හි සුදු අයගේ සුදු බවද, කළු අයගේ කළු බවද ප්‍රකට වේ. ජරා වාතයෙන් පහර ලත් කල්හි රැළි ගනී. (හටගනී) සියලුම ශෂ්‍ය වපුළ කල්හි සුදුවන් වේ. පසුව නිල්පැහැ ගනී. ජරා වාතයෙන් පහර ලත් කල්හි පඬුවන් වේ. අඹ අංකුරයෙන්ද දක්වන්ට වටී.

මරණ නිර්දේශයෙහි, **චුති** යනු චුතවීම් වශයෙන් කියන ලදී. එක්, සිව්, පස්, කඳුවලට එය සම වදනෙකි. **චවනතා** යනු භාව වචනයෙන් ලක්‍ෂණ නිදර්ශනයයි. **භෙදො** යනු චුති ස්කන්ධයන්ගේ භංගය හා උත්පත්තිය දැක්වීමයි. **අන්තරධානං** යනු කළය බිඳුණාක් මෙන්, බිඳුණු චුති ස්කන්ධයන්ගේ යම්කිසි ආකාරයකින් සිටීමේ අභාවය දැක්වීමයි. **මච්චුමරණං** යනු මෘත්‍යු සංඛ්‍යාත මරණයයි. ක්‍ෂණික මරණය නොවේ. කාලනම් මාරයාය. ඔහුගේ ක්‍රියාවනුයි = **කාලකිරියායි.** මෙතෙකින් සම්මුතියෙන් වන මරණය දක්වන ලදී. දැන් පරමාර්ථ වශයෙන් දක්වන්ට, ඛන්ධානං භෙදො ආදිය වදාළහ. පරමාර්ථ වශයෙන් වනාහි ස්කන්ධයෝම බිඳෙති. කිසි සත්ත්වයෙක් නම් නොමැරෙයි. ස්කන්ධයන් බිඳෙන කල්හි සත්ත්වයා මැරේ. බිඳුණු කල්හි මළේයයි ව්‍යවහාරය වේ. මෙහිද සිව් ස්කන්ධ, පංචස්කන්ධ වශයෙන් ස්කන්ධයන්ගේ වෙනස වේ. එක් ස්කන්ධයක කළේබරයාගේ හැරදැමීම **කළෙබරස්ස නික්ඛෙපො**යි. ස්කන්ධ සතරෙහි වශයෙන් හෝ ස්කන්ධයන්ගේ භේදයයි. සෙසු ද්වයෙන් කළේබරයාගේ හැරදැමීම දතයුතුය. කුමක් හෙයින්ද යත්? භව ද්වයෙහිම රූපකාය සංඛ්‍යාත කළේබරයාගේ හටගැනීම වන හෙයිනි. යම් හෙයකින් චාතුර්මහාරාජිකාදීන්හි ස්කන්ධයෝ බිඳෙන්නාහුම කිසිත් හැර නොදමති. එහෙයින් ඔවුන්ගේ වශයෙන් ස්කන්ධයන්ගේ භේදය. මනුෂ්‍යාදීන්ගේ කළේබර හැරදැමීමයි. මෙහිද කළේබරයාගේ හැරදැමීම කරන හෙයින් මරණය කළෙබරස්ස නික්ඛෙපොයයි යූ.සේයි. **ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො** යන මෙයින් ඉන්ද්‍රිය බද්ධ වූයේම මරණය නම් වෙයි. ඉන්ද්‍රියබද්ධ නුවූ කල්හි මරණයක් නම් නැතැයි දක්වයි. ශෂ්‍ය මළේය. වෘක්‍ෂය මළේය. මෙය වනාහි ව්‍යවහාර මාත්‍රයක්මය. අර්ථ වශයෙන් වනාහි මෙබඳු වචන

ශෂ්‍යාදීන්ගේ ක්ෂයවීම් විනාශවීම් ස්වභාවයම දක්වති. තවද මේ ජරාමරණ මේ සත්ත්වයින්ගේ මාරක සතුරෙකු මෙන් දොසක් සොයමින් හැසිරෙයි. යම්සේ පුරුෂයෙකුට පසමිතුරන් තිදෙනෙකු දෝෂාපේක්ෂාවෙන් හැසිරෙන කල්හි එක් අයෙක් මම අසවල් අරණ්‍යය පිළිබඳව වර්ණනාකොට මොහු රැගෙන එහි යන්නෙමි. මෙහි මට අපහසුවක් නැතැයි කියන්නේය. දෙවැන්නා, මම මොහු ගෙන ගිය කල්හි, තලා දුර්වල කරන්නෙමි. මෙහි මට අපහසුවක් නැතැයි කියන්නේය. තෙවැන්නා නුඹ මොහු තලා පෙලා දුර්වල කළ කල්හි තියුණු කඩුවකින් හිස සිඳීම මට භාරවේවායි කියන්නේය. ඔවුහු මෙසේ කියා එසේ කරන්නාහ.

එහි පළමු සතුරාගේ අරණ්‍යය පිළිබඳව කරුණු කියා ඔහු රැගෙන ගිය කල මෙන් මිත්‍ර ඥාති මඬුල්ලෙන් ඇද දමා යම්කිසි තැනක ඉපදවීම නම් වූ ජාතියෙහි කෘත්‍යයයි දෙවැන්නාගේ තලා දුර්වල කිරීම මෙන් උපන් ස්කන්ධයන්හි වැටී පරාධීනව ඇද එකම පිහිටවන ස්ථානය බවට පත්කරන ජරාවගේ කෘත්‍යයයි. තෙවැන්නාගේ තියුණු කඩුවෙන් හිස සිඳීම මෙන් ජීවිතක්ෂයට පමුණුවන මරණයෙහි කෘත්‍යයයි දතයුතුය. තවද මෙහි උපත් දුක දොස් සහිත මහා කාන්තාරයකට පිවිසීම මෙනැයි දතයුතුය. ජරා දුක එහි ආහාරපාන රහිතයාගේ දුර්වලත්වය මෙනි. මරණ දුක, දුර්වලයාගේ ඉරියව් පැවැත්වීමෙහි පහවූ බලය ඇත්තේ ව්‍යාඝ්‍රාදීන්ගෙන් විනාශයට පත්වන්නාක් මෙනැයි දතයුතුය.

සෝක නිර්දේශයෙහි විනාශවේනුයි - ව්‍යසනයි. හිතසුව ඉවත දමයි. විනාශ කෙරේයයි අර්ථයි. ඥාතීන්ගේ ව්‍යසනය ඥාති ව්‍යසනයයි. සොර බිය රෝ බිය ආදීන්ගෙන් වන ඥාති විනාසයයි අර්ථයි. තෙන **ඥාති බ්‍යසනෙන, ඵුට්ඨස්ස** යනු මැඩගත්තහුට, මඩනා ලද්දහුට, යුක්ත වූවහුට යන අර්ථයි. සෙස්සෙහිද මේ ක්‍රමයමැයි. මේ විශේෂයයි. භෝගයන්ගේ ව්‍යසනය - **භොගබ්‍යසනංයි.** රජුන්ගෙන්, සොරුන්ගෙන් වන භෝගක්ෂය භෝග විනාසයයි අර්ථයි. රෝගයම ව්‍යසනයක් වූයේ **රොගබ්‍යසනංයි.** රෝගය වනාහි ආරෝග්‍යය නසයි. විනාශ කරයිනුයි- බ්‍යසන නම් වේ. සීලයෙහි විනාශය **සීලබ්‍යසනං** දුසිල් බවට මේ නාමයකි. සම්‍යග් දෘෂ්ටිය විනාශ කරමින් උපන් දෘෂ්ටියම ව්‍යසනයක් වූයේනුයි **දිට්ඨිබ්‍යසනයි.** මෙහිද ප්‍රථමද්වය අනිෂ්පන්නය. පසු ත්‍රයය තිලක්ෂණයෙන් මඩනා ලද්දේ නිෂ්පන්නයි. ප්‍රථමත්‍රයය කුසල් වූයේද අකුසල් වූයේද නොවේ. සීල, දෘෂ්ටි ව්‍යසනද්වයය අකුසල්ය. **අඤ්ඤතරඤ්ඤතරෙන**

යනු ඥාති සම්බන්ධතා ඇති හෝ නොමැති මිත්‍රාමාත්‍ය ව්‍යසනාදී යම් කිසිවකින්, සමන්නාගතස්ස යනු ඒ හා බැඳී එයින් නොමිදෙනු ලබන්නහුට **අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛ ධම්මෙන** යනු යම්කිසි සෝදුක් ඉපදීමට හේතුවන, **සොකො** යනු ශෝක කිරීම් වශයෙන් ශෝකයයි. මෙය ඒ කරුණුවලින් උපදනා ශෝකයෙහි සමානතාවයත්, වෙන් වෙන්වූ ස්වභාවයක් දක්වයි. **සොචනා** යනු ශෝක කරන ආකාරයයි. **සොචිතත්තං** ශෝක කරන ස්වභාවය. **අන්තොසොකො** යනු අභ්‍යන්තර ශෝකයයි. දෙවන පදය උපසර්ගයෙන් වෘද්ධියට පත්කරන ලදී. එය අභ්‍යන්තරය වියලවන්නාක් මෙන් මනාව වියලවන්නාක් මෙන් උපදීනුයි = ඇතුළත ශෝකය අන්තො පරිසොකොයි යු.සේයි. **චෙතසො පරිජ්ඣායනා** යනු සිතෙහි හාත්පසින් දවනාකාරයයි. ශෝකය උපදිනු ලබන්නේ ගින්නක් මෙන් සිත පුළුස්සයි. දවයි. මාගේ සිත දැවුණේය. මට කිසිවක් නොවැටහේයයි කියවයි. දුකට පත් මනස = දුම්මනයි. එහි ස්වභාවය = දොමනස්සංයි. අභ්‍යන්තරයට පිවිසීම් අර්ථයෙන් සෝකයම හුලක් වූයේනුයි = **සොකසල්ලං** යි.

පරිදේව නිර්දේශයෙහි මගේ දුව, මගේ පුතා යයි මෙසේ අසවලා යයි පෙන්වා වැළපෙති. හඬති. එය කරණකොටගෙනනුයි **ආදෙවොයි.** ඒ ඒ වර්ණනාවම වර්ණනා කරමින්, වර්ණනා කරමින් වැළපෙයි. මෙයිනුයි **පරිදෙවොයි.** ඉන් මත්තෙහි දෙපද පළමු ද්වයයෙහිම ආකාර ස්වභාව නිර්දේශ වශයෙන් කියන ලදී. වාචා යනු වචනයි. **පලාපො** යනු හිස් ප්‍රලාප වචනයි. අඩක් කීම, අනිකක් කීම ආදී වශයෙන් විරූප ප්‍රලාපයනුයි. **විප්පලාපොයි. ලාලප්පො** යනු නැවත නැවත කථාකිරීමයි. නැවත නැවත කථාකිරීම ලාලප්පනායි. නැවත නැවත දොඩවන්නාගේ ස්වභාවය **ලාලප්පිතත්තංයි.**

දුක්ඛ නිර්දේශයෙහි, ශරීරය ඇසුරුකොට පවත්නා හෙයින් **කායිකංයි.** අමිහිරි අර්ථයෙන් **අසාතංයි.** කායික පදයෙන් චෛතසික අමිහිරි බව ප්‍රතික්ෂෙප කරයි. අසාත පදයෙන් කායික සැපය ප්‍රතික්ෂේප කරයි. දුකට පත්වේනුයි - **දුක්ඛංයි.** යමෙකුට මෙය උපදීද ඔහු දුක්ඛිතයෙකු කෙරේයයි යන අර්ථයි. දුක් මාත්‍රය හෝ දුකයි. **කාය, සම්ඵස්සජං** යනු ශරීර ස්පර්ශයෙන් හටගත්. **අසාතං දුක්ඛං වෙදයිතං** යනු අමිහිරි විඳීම සැපනුවූයේ, දුක් වින්දනය සැප නොවේ. මත්තෙහි පදත්‍රය ස්ත්‍රීලිංග වශයෙන් යු.සේයි. අමිහිරි වේදනා තොමෝ සැප නුවූවා, දුක් වේදනා

තොමෝ සැප නොවූවා වේ. මෙයම වනාහි මෙහි අර්ථයයි. යම් කායික අමිහිරි දුක් වින්දනයක් වේද? මෙය දුකයයි කියනු ලැබේ. මෙසේ යෙදීම දතයුතුය.

දොමනස්ස නිර්දේශයෙහි, නොමනා මනසනුයි දුම්මනොයි. පහත් විඳීම බැවින් හෝ පිළිකුල් මනසනුයි = **දුම්මනොයි.** නොමනා මනසෙහි ස්වභාවය = **දොමනස්සංයි.** සිත ඇසිරිකොට පවත්නා හෙයින් **චෙතසිකංයි. චෙතො සම්ඵස්සජං** යනු සිත හා එකට ගැටීමෙන් හටගත්.

උපායාස නිර්දේශයෙහි, වෙහෙසවීම් අර්ථයෙන් **ආයාසොයි.** පසුබටවීම්, කලකිරීමට පත්වීම් ආදී ආකාරයෙන් පවත්නා වෙහෙසකර භාවයට මෙය නමකි. බලවත් වෙහෙස **උපායාසොයි.** වෙහෙසකර භාවය **ආයාසිතත්තංයි.** බලවත් වෙහෙසකර භාවය - **උපායාසිතත්තංයි.**

අප්‍රිය සම්ප්‍රයෝග නිර්දේශයෙහි, **ඉධ** යනු මේ ලෝකයෙහි, **යස්ස** යනු යමෙකුට වන්නේය. **අනිට්ඨ** යනු (ප්‍රිය නොවූ) නොසොයන ලද, සොයන ලද හෝ නොසොයන ලද, මනාප නොවූ අරමුණුවලට මෙය නාමයක්ම වන්නේය. සිතෙහි ගමන් නොකරත්. නොපිවිසෙත්නුයි **අකන්තායි** මනසෙහි අප්‍රිය වෙති මනස නොවැඩේනුයි **අමනාපායි.** රූපා යනාදිය ඒවාහි ස්වභාවය දැක්වීම සඳහායි. අනර්ථයට ආශා කරත්. කැමති වෙත්නුයි **අනත්ථකාමායි** අහිතවත් දෙයට ආශා කරත්. කැමති වෙත්නුයි **අහිතකාමායි.** අපහසු දුක් විහරණයට ආශා කරත්, කැමති වෙත්නුයි. **අඵාසුකාමායි.** චතුර්යෝගයන්ගෙන් ක්ෂේම වූ, නිර්භය වූ නිවන කැමති නොවෙත්. බිය සහිත සසරටම ඔවුහු ආශා කරත්. කැමති වෙත්නුයි = **අයොගක්ඛෙමකාමායි.** තවද ශ්‍රද්ධාදීන්ගේ වෘද්ධි සංඛ්‍යාත වූ අර්ථයට කැමති නොවන හෙයින්, ඔවුන්ගේම හානි සංඛ්‍යාත වූ අනර්ථයට කැමතිවන හෙයින් **අනත්ථකාමායි** ශ්‍රද්ධාදීන්ගේ අභිවෘද්ධියට හේතුවන යහපතට නොකැමති වන හෙයින්ද ශ්‍රද්ධාදීන්ගේ විනාශවීම් ආදියට හේතුවන අයහපතට කැමතිවන හෙයින් **අහිතකාමායි.** පහසු විහරණයට අකමැති වන හෙයින්ද, අපහසු විහරණයට කැමති වන හෙයින්ද **අඵාසුකාමායි.** යම්කිසිවෙක් නිර්භය යෝගයට, අකමැති වන හෙයින්ද, භයට කැමතිවන හෙයින්ද අයොගක්ඛෙමකාමායයි මෙහි මෙසේ අර්ථය දතයුතුය. **සංගති** යනු ගොස් එකතුවීමයි. **සමාගමො** යනු පැමිණි අය සමග එකතුවීමයි. **සමොධානං** යනු සිටීම්, හිඳීම් ආදීන්හි ඒකීය භාවයයි. **මිස්සීභාවො** යනු සියලු කෘත්‍යයන් එක්ව කිරීමයි. මෙය සත්ත්වයින්ගේ

වශයෙන් යෙදුමකි. සංස්කාර වශයෙන් වනාහි යමක් ලැබේද, එය ගතයුතුය. එම අප්‍රිය සම්ප්‍රයෝගය අර්ථ වශයෙන් එක ධර්මයක්නම් නැත. හුදෙක් අප්‍රිය සම්ප්‍රයුක්තයන්හිදී දෙවැදෑරුම් දුකට භාජනවිය හැකි හෙයින් දුක්ඛයයි කියන ලදී.

ප්‍රිය විප්‍රයෝග නිර්දේශය කියන ලද්දට විරුද්ධ අයුරින් දතයුතුය. මාතා වා යනාදිය මෙහි වැඩ කැමති ස්වරූපයෙන් දක්වන්ට කියන ලදී. එහි ආලය කෙරේනුයි **මාතායි**. ප්‍රිය කෙරේනුයි **පිතායි**. භජනය කෙරේනුයි භාතායි. භගිනි එසේමය. මෛත්‍රී කෙරේනුයි **මිත්තායි**. මනිති හෝ සියලු සැඟවිය යුතු කරුණු ඇතුළට දමත්නුයි, මිත්තායි. කටයුතු කිරීමෙහිදී එක්වීම් අර්ථයෙන් සමග වෙතියි **අමච්චායි**. මේ තෙමේ අපගේය. අපට අයත්යයි මෙසේ දනිත්. දන්වතිනුයි ඤාතියි. ලෙය සමග සම්බන්ධනුයි සාලොහිතායි. මව්පස පියපස ඤාතිහු සහ ලේ ඤාතිහුය. මව්පිය පසෙහි ඤාතිහුද, නැන්දා, මාමා පක්ෂයේ ඤාතිහුද, සහ ලේ ඤාතිහුය. මෙය ප්‍රිය විප්‍රයෝගයද අර්ථ වශයෙන් එක් ධර්මයක් නම් නැත. හුදෙක් ප්‍රියයන්ගෙන් වෙන්වීමෙහිදී දෙවැදෑරුම් දුකට වස්තු වන හෙයින් දුක්ඛ යයි කියන ලදී. මේ මෙහි සියලු අර්ථ කථා වචනයයි. සත්‍යයන් සත්‍ය ලක්‍ෂණයෙන් යුත් හෙයින්ද, සම්ප්‍රයෝග, විප්‍රයෝග වචනයන්ගෙන් අප්‍රිය ප්‍රිය වස්තුන්ම විශේෂිත කොට කියන්ට සුදුසුය.

කැමති දෑ නොලැබීම් නිර්දේශයෙහි, **ජාති ධම්මානං** යනු ජාති ස්වභාවයන්ගේ, ජාති මුල් ස්වභාවයන්ගේ, **ඉච්ඡා උප්පජ්ජති** තෘෂ්ණාව උපදී. අහොවත යනු ප්‍රාර්ථනාවයි. **අසසාම** යනු වන්නෙමු. **නඛොපනෙතං ඉච්ඡාය පත්තබ්බං** යනු බේදයකි. අප ඉපදීම් ස්වභාවය ඇත්තෝ නොවන්නෙමු. ඒකාන්තයෙන් අපට ඉපදීම නොඑන්නාහු මැනවැයි මෙසේ ප්‍රහීණ හටගැනීම් යුත් සාධූන් කෙරෙහි විද්‍යමාන නොඉපදීම් ස්වභාවය පිරිනිවන් පෑකල්හිද විද්‍යමාන වන උපතෙහි නොපැමිණීම කැමතිවීමයි. එය කැමති වන්නහුටද, මාර්ග භාවනාවෙන් තොරව නොපැමිණිය හැකි හෙයින්, නොකැමති වන්නහුටද, භාවනාවෙන් පැමිණිය යුතු හෙයින් කැමැත්තෙන් පැමිණිය යුත්තේ නොවන්නේ නම් වේ. **ඉදම්පි** යනු මෙයද, මත්තෙහි සෙස්ස සලකා අපි ශබ්දය වේ. උපාදාන ස්කන්ධ නිර්දේශයෙහි **සෙය්‍යථීදං** යනු නිපාතයි. ඒ කවරේද යන අර්ථයි. රූපයම උපාදානස්කන්ධ වූයේනුයි - රූපූපාදානක්ඛන්ධොයි. සෙස්සෙහිද මේ ක්‍රමයමැයි.

දුක්ඛසත්‍ය නිර්දේශ වර්ණනාව නිමි.

සමුදය සත්‍යය නිර්දේශයෙහි, **යායං තණ්හා** යනු ඒ මේ තෘෂ්ණාවයි. **පොනොභවිකා** යනු පුනර්භව කරණය **පුනොභවොයි.** නැවත භවයක ස්වභාවය මොහුටනුයි **පොනොභවිකයි.** තවද පුනර්භවය දෙයි. පුනර්භවය සඳහා පවතියි. නැවත නැවත භවයෙහි උපදීනුයි = පොනොභවිකායි. එය වනාහි ඒ පුනර්භවය දෙන්නාහුද, නොදෙන්නාහුද ඇත. පුනර්භවය සඳහා පවතින්නාහුද, නොපවතින්නාහුද ඇත. දුන් ප්‍රතිසන්ධියෙහිදී, මුහුකුරා ගිය කෙලෙස් ස්වභාවයෙහි සීමාව ඉක්මවා යාම පුනර්භවයයි. **පොනබ්භවිකා** යනුද පාඨයි. එයම අර්ථයි. සතුටුවීම් සංඛ්‍යාත තෘෂ්ණා ඇල්මෙන් යුක්ත වූයේනුයි, **නන්දිරාග සහගතායි.** නන්දිරාගය සමග අර්ථ වශයෙන් එකක් බවට ගියාහුයයි යු.සේයි. **තත්‍ර තත්‍රාභිනන්දිනී** යම් යම් තන්හි ආත්ම භාවයන් වේද, ඒ ඒ තන්හි විශේෂයෙන් සතුටු වේ. රූපාදී අරමුණුවල ඒ ඒ තන්හි සතුටුවේද, එය රූපාභි නන්දිනියි. ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන්හි සතුටුවේයයි අර්ථයි. තත්‍ර තත්‍රාභිනන්දිතියිද පාඨයි. ඒ ඒ තන්හි සතුටුවේයයි අර්ථයි. සෙය්‍යථීදං යනු නිපාතයි. එය කවරේද යන අර්ථයි. **කාමතණ්හා** යනු කාමයන්හි තෘෂ්ණාවයි. පඤ්චකාම ගුණයන්ගෙන් යුත් රාගයට මේ විශේෂ නාමයකි. **භව තණ්හා** යනු භවයෙහි තෘෂ්ණාවයි. භව ප්‍රාර්ථනා වශයෙන් උපන්නා වූ ශාශ්වත දෘෂ්ටි සහගත ඇල්මටද, රූප අරූප භවරාගයටද ධ්‍යාන තෘෂ්ණාවටද මෙය විශේෂ නාමයකි. විභව තණ්හා යනු භව විනාශයෙහි තෘෂ්ණාවයි. නැවත නොඉපදීම් සහිත ඇල්මට මෙය විශේෂ නාමයකි. දැන් ඒ තෘෂ්ණාවගේ හේතු විස්තර වශයෙන් දක්වන්ට, '**සා ඛො පනෙසා**' ආදිය වදාළහ. එහි **උප්පජ්ජති** යනු උපදී. **නිවිසති** යනු නැවත නැවත පැවැත්ම වශයෙන් පිහිටයි යන අර්ථයි. උපදිනු ලබන්නී කොතැන්හි උපදීද? පවතිනු ලබන්නී කොතැන්හි පවතීදැයි සම්බන්ධයි. **යං ලොකෙ පියරූපං සාතරූපං** යනු ලෝකයෙහි යම් ප්‍රිය ස්වභාවයක් වේද? මිහිරි ස්වභාවයක් වේද, එයයි. **චක්ඛුං ලොකෙති** ලෝකයෙහි චක්ෂුරාදීන්හි මමත්වයෙන් තදින් ඇලුණු සත්ත්වයෝ, සම්පත්හි පිහිටියාහු, තමාගේ ඇස කැඩපත් ආදීන්හි නිමිති ගැනීම් අනුසාරයෙන් මනා ප්‍රසන්න තාවයෙන් යුත්, පංච ප්‍රසාදයන්, රන් විමනෙහි ගළවා දැමූ සිංහ කුඩුවක් මෙන් හඟිත්. උස් නැහැයැයි ලද ව්‍යවහාර ඇති නැහැය ඔතා තබන ලද හිරියල් වැටියක් සේ හඟිත්. දිව රත් කම්බිලි වැස්මක් මෙන්ද, මෘදු, සිනිදු මිහිරි රසදායකයක් මෙන්ද හඟිත්. සිරුර සල් පැලයක් මෙන්ද, රන් තොරණක් මෙන්ද හඟිත්. සිත අන්‍යයන්ගේ මනසින් අසදෘශ (මාගේ මනස මෙන් උසස් මනසක් අන් අයට නැත. එකම උසස් මනස ඇත්තේ මාහටම පමණි.) කොට උසස්කොට

හඟිත්. රූපය රන්කිණිහිරි මල් ආදි වර්ණ මෙන්ද, ශබ්දය මත් කුරුවි කොවුලන්ගේ මන්දස්වර, මිණිගෙඩි බටනලා ඝෝෂාව මෙන්, තමා ලත් සතරමහා භූතයන්ගෙන් හටගත් ගඳ සුවඳ අරමුණු ගැන සිතා, අන් කවරහුට මෙවන් දෑ ඇත්දැයි හඟිත්. ඔවුන්ට මෙසේ හඟින කල්හි, ඒ චක්ෂුරාදී ප්‍රිය රූපයෝ මෙන්ම මධුර රූපයෝද වෙති. එකල්හි ඔවුන්ට එහි නූපන්නා වූද තෘෂ්ණා උපදියි. උපන්නා වූද තෘෂ්ණා නැවත නැවත පැවැත්ම වශයෙන් පිහිටයි. එහෙයින් තෙරහු, ඇස ලෝකයෙහි ප්‍රිය ස්වභාවයය, මධුර ස්වභාවයය, මෙහි මේ තෘෂ්ණා තොමෝ උපදිනු ලබන්නී උපදී යන ආදිය කීහ. එහි **උප්පජ්ජමානා** යනු යම් කලෙක උපදීද? එකල්හි එහි උපදීයයි යන අර්ථයි.

## සමුදය සත්‍ය නිර්දේශ වර්ණනාව නිමි.

නිරෝධ සත්‍ය නිර්දේශයෙහි : **යො තස්සා යෙව තණ්හාය** යන මෙහි, යම් ඒ දුක්ඛයාගේ යයි කිවයුතු වුවත්, යම්හෙයකින් හටගැනීම් නිරෝධයෙන්ම දුක නිරුද්ධ වේ. වෙනත් ක්‍රමයකින් නොවේ. දෙසූ පරිදි

යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනදෙව රූහති
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තතී දුක්ඛමිදං පුනප්පුනං

යම්සේ තදින් මුලට උපද්‍රව නොකළ කල්හි වෘක්ෂය සිඳ දැමූයේ වී නමුදු නැවතත් වැඩේද? එපරිද්දෙන්ම සියුම් තෘෂ්ණාවන් නොනැසූ කල්හි මේ දුක නැවත නැවතත් උපදී.

එහෙයින් එම දුක් නිරෝධය දක්වන්නේ, සමුදය නිරෝධයෙන් දක්වන්ට මෙසේ වදාළහ. තථාගතවරු සිංහ සමාන පැවතුම් ඇත්තාහුය. ඔවුහු දුක් නිරුද්ධ කරන්නාහු, දුක් නිරෝධය දක්වන්නාහු, හේතුයෙහි පිළිපදිත්. ඵලයෙහි නොවේ. අන්‍ය තීර්ථකයෝ (ශ්වාන) බලු පැවතුම් ඇත්තාහුය. ඔවුහු දුක් නිරුද්ධ කරන්නාහු, දුක් නිරෝධය දක්වන්නාහු, ආත්මය වෙහෙසට පත්කිරීමේ යෝගයෙන්ද, එයටම අදාළ දේශනාවෙන්ද

ඵලයෙහි පිළිපදිත්. හේතුයෙහි නොවේ. ශාස්තෘන් වහන්සේ සිංහ සමාන පැවතුම් ඇති හෙයින්ද, හේතුයෙහි පිළිපදින්නාහු යො තසසායෙව ආදිය වදාළහ. ධර්ම සේනාපති සැරියුත් තෙරණුවෝද ශාස්තෘන් වහන්සේ විසින් දේශනා කරන ලද ක්‍රමයෙන්ම වදාළේය. එහි, **තසසායෙව තණහාය** යනු යම් ඒ තෘෂ්ණාවක් වේද, එය පුනර්භවිකයයි කියන ලද්දේ, කාම තෘෂ්ණා වශයෙන් බෙදන ලද්දේ උත්පත්ති විසීම් වශයෙන්ද, යට ප්‍රකාශිත ඒ තෘෂ්ණාවගේම, අසෙස විරාග නිරොධො යනු මාර්ගය විරාගයයි කියනු ලැබේ. විරාගයෙන් මිදේයයි කියන ලදී. විරාගයෙන් නිරෝධය විරාග නිරෝධයයි. අනුසහගත කෙලෙස් උගුලුවා දමන හෙයින් සේස රහිත විරාගනි නිරෝධය = අසෙස විරාග නිරෝධයි. නොහොත් ප්‍රහාණය විරාගයයි කියනු ලැබේ. එහෙයින් සේස රහිත විරාගය සේස රහිත නිරෝධය, මෙසේද මෙහි යෙදුම් දතයුත්තාහුය. අර්ථ වශයෙන් වනාහි මේ සියලුම අසේස විරාග නිරෝධයන් ආදීන් නිර්වාණයටම පර්යාය නාමයෝය. පරමාර්ථ වශයෙන් වනාහි නිර්වාණය, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි කියනු ලැබේ. යම් හෙයකින් වනාහි, එයට පැමිණ තෘෂ්ණාව අසේසව, තොර වේද, නිරුද්ධ වේද, එහෙයින් එය ඒ තෘෂ්ණාවගේම අසේස විරාග නිරෝධයයි කියනු ලැබේ. නිර්වාණයට පැමිණ තෘෂ්ණාව අත්හරිනු ලැබේද, දුරු කෙරේද? මුදයිද? නොඇලේද? පස්කම් ගුණ ආලයන්හි එකද ආලයක් නැත්ද? එහෙයින් නිර්වාණය චාගො **පටිනිසසගෙගා මුතති අනාලයොයි** යූ.සේයි. නිර්වාණය එකක්මය. සියලු සංඛත නාමයන්ට ප්‍රතිපක්ෂ වශයෙන් මෙයට නොයෙක් නම් වෙති. ඒ කවරේද යත්? අසෙස විරාග, අසෙස නිරොධ, චාග, පටිනිසසගග, මුතති, අනාලය, රාගකඛය, දොසකඛය, මොහකඛය, අනුපපාද, අපපවතත, අනිමිතත, අපපණිහිත, අනායූහන, අපපටිසනධි, අනුපපතති, අනිමිතත, අපපණිහිත, අනායූහන, අපපටිසනධි, අනුපපතති, අගති, අජාත, අජර, අබ්‍යාධි, අමත, අසොක, අපරිදෙව, අනුපායාස, අසංකිලිට්ඨ ආදීහුය. සේස රහිත නොඇල්ම, සේස රහිත නිරුද්ධ කිරීම, අත්හැරීම, දුරුකිරීම, මිදීම, ඇල්ම නැතිකිරීම, ඇල්ම ක්‍ෂය කිරීම, ද්වේෂය ක්‍ෂය කිරීම, මෝහය ක්‍ෂය කිරීම, කෙලෙස් නොඉපදීම, කෙලෙස් නොපැවැත්ම, තෘෂ්ණා නිමිති නොගැනීම, තෘෂ්ණාවන්හි නොපිහිටිම, රැස් නොකිරීම, පිළිසිඳීම් නොමැතිවීම, නොඉපදීම්, පැවැත්ම නොමැතිවීම, නොඉපදීම, ජරාවට පත් නොවීම, ව්‍යාධි නොවීම, නොමැරීම, සෝක නොවීම, නොවැළපීම, බලවත් සිත්තැවුල් නොමැතිවීම, කෙලෙසුන්ගෙන් කිලිටි නොවීම් ආදීහුය.

දැන් මාර්ගයෙන් සිඳ නිවනට අවුත්, නොපැවැත්මට පත්වූද, තෘෂ්ණාවගේ යම් වස්තූන්හි එහි උපත දක්වන ලද්දීද? එහිම අභාවය දක්වන්ට 'සා ඛො පනෙසා', යනාදිය වදාළහ. එහි යම්සේ පුරුෂයෙක් කෙතෙහි හටගත් තිත්ත ලබුවැල දැක අග පටන් මුල සොයා කපන්නේය. ඒ වැල්තොමෝ පිළිවෙළින් මැලවී නොපැවැත්මට යන්නේය. ඉන්පසු ඒ කෙතෙහි තිත්ත ලබුවැල් නිරුද්ධ වූයේ ප්‍රහීණයයි කියන්නේය. එපරිද්දෙන් කෙතෙහි තිත්ත ලබුවැල් මෙන් චක්ෂුරාදීන්හි තෘෂ්ණාවක් වේද, ආර්ය මාර්ගයෙන් මුල් සිඳුනා ලද්දී, නිවනට පැමිණ නොපැවැත්මට යෙයි. මෙසේ ගිය වස්තූන්හි කෙතෙහි නොපෙනේ. යම්සේ කැලයෙන් සොරු ගෙනවුත් නගරයෙහි දක්ෂිණ ද්වාරයෙහි ඝාතනය කරන්නාහු වෙත්ද? ඉන්පසු කැලයෙහි සොරු මළේයයි හෝ මරණ ලද්දේයයි කියන්නාහුද? එපරිද්දෙන් චක්ෂුරාදීන්හි යම් තෘෂ්ණාවක් වන්නීද එය කැලයෙහි සොරුන් මෙනි. නිර්වාණයට පැමිණ කෙලෙස් නිරුද්ධ වූ හෙයින් නිර්වාණයෙහි නිරුද්ධ වූවාහු එය දක්ෂිණ ද්වාරයෙහි ඝාතනයට ලක්වූ සොරුන් මෙනි. මෙසේ නිරුද්ධ වූ මේ වස්තූන්හි කැලයෙහි සොරුන් මෙන් පෙනීමක් නොමැත. එහෙයින් එම තෘෂ්ණාවගේ නිරෝධය එහිම දක්වන්නේ, ඇස ලෝකයෙහි ප්‍රිය රූපයකි. සිසිල් රූපයකි. මෙහි ඒ තෘෂ්ණා තොමෝ ප්‍රහීණ වන්නී ප්‍රහීණ වේ යයි ආදිය වදාළහ. නොහොත් පිහිටා සිටීමට ප්‍රතිපක්ෂ වශයෙන් නිරුද්ධ වේ.

## නිරෝධ සත්‍යය නිර්දේශ වර්ණනාව නිමි.

මාර්ග සත්‍යය නිර්දේශයෙහි අයමෙව යනු අන්‍ය මාර්ගයන් ප්‍රතික්ෂෙප කිරීම සඳහා නියම කිරීමයි. අරියො යනු ඒ ඒ මාර්ගයන්ගෙන් නැසිය යුතු කෙලෙසුන් කෙරෙන් දුර හෙයින්ද, ආර්ය භාවය ඇතිකරන හෙයින්ද, ආර්යඵල ප්‍රතිලාභ කරන හෙයින්ද අරියො(යි) අෂ්ටාංගයක් මෙයටනුයි අට්ඨංගිකො(යි). ඒ මෙය චතුරංගික සේනාව මෙන්ද පංචාංගික තූර්යයන් මෙන්ද, අංග (කොටස්) මාත්‍රයම වේ. අංගයන්ගෙන් තොර වූයේ නැත. දැන් අංග මාත්‍රයම මාර්ගයයි. අංග විනිර්මුක්තව නැතැයි දක්වන්නේ සම්මා දිට්ඨිං -පෙ- සම්මා සමාධි ආදිය වදාළහ. එහි මනාව දක්නා ලක්ෂණ සම්මා දිට්ඨියි. මනාව සිත අරමුණට යොමුකිරීම් ලක්ෂණය.

**සම්මා සංකප්පොයි.** මනාව අල්වාගැනීම් ලක්ෂණය **සම්මා වාචායි.** මනාව හටගන්වන ලක්ෂණය **සම්මා කම්මන්තොයි.** මනාව පිරිසිදු කරවීම ලක්ෂණය **සම්මා ආජීවොයි.** මනාව උත්සාහ කිරීම් ලක්ෂණය **සම්මා වායාමොයි.** මනාව වැටහෙන ලක්ෂණය **සම්මා සතියි.** මනාව එකඟ කිරීම් ලක්ෂණය **සම්මා සමාධියි.** ඔවුනතර එක එකට ත්‍රය ත්‍රය බැගින් කෘත්‍යයෝ වෙති. සම්‍යග් දෘෂ්ටිය පළමුව අනෙකුත් තමාට විරුද්ධ ධර්මයන් සමග මිථ්‍යාදෘෂ්ටිය දුරුකරයි. නිර්වාණයද අරමුණු කරයි. ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන්ද බලයි. එය වසන මෝහය විනාශ කිරීම් වශයෙන් නුමුලාවීම් වශයෙන්ද ක්‍රියා කරයි.

සම්‍යග් සංකල්පාදීහුද එසේම මිථ්‍යා සංකල්පාදීන්ද දුරුකරත්. නිවණද අරමුණු කරත්. විශේෂයෙන් වනාහි මෙහි සම්‍යග් සංකල්පය ඒ හා සමග උපන් ධර්මයන් අරමුණුට යොමුකරයි. සම්‍යග් වචනය මනාව අල්ලා ගනියි. සම්‍යග් කර්මාන්තය මනාව හටගන්වයි. සම්‍යග් ආජීවය මනාව පිරිසිදු කරයි. සම්‍යග් ව්‍යායාමය මනාව පරිග්‍රහණය කරයි. සම්‍යග් ස්මෘතිය මනාව එළඹ සිටී. සම්‍යග් සමාධිය මනාව එක්තැන් කරයි. තවද, මේ සම්‍යග් දෘෂ්ටි තොමෝ පූර්ව භාගයෙහි නොයෙක් අවස්ථා නොයෙක් අරමුණු වෙයි. මාර්ග කාලයෙහි එක් අවස්ථා එක් අරමුණු වෙයි. කෘත්‍ය වශයෙන් වනාහි දුක්ඛෙ ඤාණං ආදි වශයෙන් සිව්නාමයන් ලබයි. සම්‍යග් සංකල්පාදීහුද පූර්ව භාගයෙහි නොයෙක් අවස්ථා, නොයෙක් අරමුණු වෙති. මාර්ග කාලයෙහි එක් අවස්ථා එක් අරමුණු වෙති. ඔවුන් අතර සම්‍යග් සංකල්පය කෘත්‍ය වශයෙන් නෛෂ්ක්‍රම්‍ය සංකල්පයයි ආදී ත්‍රිවිධ නාමයන් ලබයි. සම්‍යග් වාචාදීත්‍රය පූර්වභාගයෙහි විරතීහුද චෛතසිකද වෙති. මාර්ගක්ෂණයෙහි විරතීහුමය. සම්‍යග් ව්‍යායාම, සම්‍යග් ස්මෘතිය යන මෙම ද්වය කෘත්‍ය වශයෙන්, සම්‍යග් ප්‍රධාන, සතිපට්ඨාන වශයෙන් සිවුනාමයන් ලබයි. සම්‍යග් සමාධිය වනාහි පූර්වභාගයෙහිද මාර්ගක්ෂණයෙහිද, සම්‍යග් සමාධියමය. මේ අටවැදෑරුම් ධර්මයන් අතර නිර්වාණාධිගමය සඳහා පිළිපන් යෝගියාට බොහෝ උපකාරී හෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් පළමුව සම්‍යග් දෘෂ්ටිය දේශනා කරන ලදී. මෙය ප්‍රඥාලෝකයැයිද, ප්‍රඥායුධයැයිද කියන ලදී. එහෙයින් මේ පූර්වභාග විදර්ශනා ඤාණ සංඛ්‍යාත සම්‍යග් දෘෂ්ටියෙන් අවිද්‍යාන්ධකාරය විනාශකොට, කෙලෙස් සොරුන් ඝාතනය කොට, නිර්භයව යෝගාවචරයා නිවණට පැමිණෙයි. එහෙයින් පළමුව සම්‍යග් දෘෂ්ටිය දේශිතය. සම්‍යක් සංකල්පය වනාහි ඕහට බොහෝ උපකාරීය. එහෙයින් ඉන් අනතුරුව

එය යූ.සේයි. යම්සේ රන්කරුවා අතින් පෙරළ පෙරළා ඇසින් කහවණු බලන්නේ මෙය බොරුය. මෙය නිවැරදියයි දැනගනීද, මෙසේ යෝගාවචරයාද, පූර්වභාගයෙහි විතර්කයෙන්, කල්පනා කොට, විදර්ශනා ප්‍රඥාවෙන් බලන්නේ, මේ ධර්ම කාමාවචරය, මේ ධර්ම රූපාවචරාදීන් යයි දැනගනී. යම්සේ වනාහි පුරුෂයෙකු විසින් කෙළවරින් ගෙන පෙරළ, පෙරළා දුන් මහරුකෙක් ලී සහින්නා වැයෙන් සැස වැඩට යොමුකරයිද? මෙසේ විතර්කයෙන් විතර්කනය කොට දුන් ධර්මයන් යෝගාවචරයා ප්‍රඥාවෙන් මේ ධර්ම කාමාවචරය, මේ ධර්ම රූපාවචරයයි ආදී ක්‍රමයෙන් පිරිසිඳ ක්‍රියා සඳහා යොමුකරයි. එහෙයින් සම්‍යග් සංකල්පය සම්‍යග් දෘෂ්ටියට අනතුරුව කියන ලදී. ඒ මේ සම්‍යග් සංකල්පය සම්‍යග් දෘෂ්ටියට යම්සේද, සම්‍යග් වාචාවටද උපකාරකය. දෙසූ පරිදි, ගෘහපතිය මුලදී කල්පනාකොට, විමසා පසුව වචන බිඳියි. එහෙයින් ඊට අනතුරු සම්‍යග් වචනය කියන ලදී. යම්යේ වනාහි මේ මේ දෙය කරන්නෙමුයි පළමුව වචනයෙන් සංවිධානකොට ලෝකයෙහි කර්මාන්ත යොදවත්ද, එහෙයින් වචනය කාය කර්මයන්ට උපකාරකයයි සම්‍යග් වචනයට අනතුරුව සම්‍යග් කර්මාන්ත කියන ලදී. චතුර්විධ වාක් දුශ්චරිතය, ත්‍රිවිධ කාය දුශ්චරිතය හැර, දෙසූ චරිතයන් පුරන්නහුටම යම් හෙයකින් ආජීවෂ්ටමක සීලය පිරේද? අනෙකාට නැත්ද? එහෙයින් ඒ දෙකට අනතුරුව සම්‍යග් ආජීවය කියන ලදී. මෙසේ පරිශුද්ධාජීවයෙන් යුක්ත වූයේ, මාගේ ආජීවය පිරිසිදුයයි මෙපමණකින් සන්තෝෂයට පත්ව නිදීම් මාත්‍රයෙන් වාසය කරන්ට නුසුදුසුයි. තව ද, සියලු ඉරියව්හි මෙම වීර්යය ඇරඹිය යුතුයයි දක්වන්ට, ඉන් අනතුරුව සම්‍යක් ව්‍යායාමය කියන ලදී. ඉන්පසු පටන්ගත් වීර්ය ඇත්තහු විසින්ද, කායාදී සිව් වස්තුන්හි සිහිය මනාව පිහිටුවීම කළ යුතුයයි දක්වන්ට ඉන් අනතුරු සම්‍යග් සතිය යූ.සේයි. යම්හෙයකින් වනාහි මෙසේ මනාව පිහිටි සිහියෙන් සමාධි උපකාර අනුපකාර ධර්මයන්ගේ ස්වභාවය මනාව සොයා එක් අරමුණක සිත එක්තැන් කරන්ට පුළුවන් වෙයි. එහෙයින් සම්‍යක් සතියට අනතුරුව සම්‍යග් සමාධිය කියන ලද්දේයයි දතයුතුය.

සම්‍යග් දෘෂ්ටි නිර්දේශයෙහි 'දුක්ඛෙ ඤාණං' ආදියෙන් සිව්සස් කමටහන් දක්වන ලදී. එහි පළමුව කියන ලද සත්‍ය දෙක සසර වෘත්ත ආශ්‍රිතය. පසුව කියන ලද සත්‍ය දෙක සසර පැවැත්මට විරුද්ධය. ඔවුනතර භික්ෂුවට සසර වෘත්තයට අදාළ කර්මස්ථානයන්හි ඇල්ම වේ. නිවනෙහි ඇල්ම නැත. ප්‍රථම දෙසත්‍යයන් තෘෂ්ණා සමුදය පංචස්කන්ධ දුක්ය.

මෙසේ සංක්ෂේපයෙන්ද, පංච ස්කන්ධයෝ කවරහුද රූපස්කන්ධයයි. ආදී ක්‍රමයෙන් විස්තර වශයෙන් ගුරු ඇසුරින් උගෙන වදනින් නැවත නැවත පිරිවහන්නේ යෝගාවචරයා ක්‍රියා කරයි. අනෙකුත් දෙසත්‍යයන්හි නිරෝධ සත්‍යය මනෝඥය. සිත්ගන්නා සුළුය. ප්‍රියය. මාර්ග සත්‍යය මනෝඥය. සිත්ගන්නා සුළුය. ප්‍රියයයි මෙසේ ශ්‍රවණයෙන් ක්‍රියා කරයි. හෙතෙම මෙසේ ක්‍රියා කරන්නේ සිව්සස් එක් ප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කරයි. එක් අවබෝධයෙන් අවබෝධ කරයි. දුක් විශේෂ දැනීම් අවබෝධයෙන් අවබෝධ කරයි. සමුදය ප්‍රහාණ අවබෝධයෙන් අවබෝධ කරයි. නිරෝධ සාක්ෂාත් කිරීම් අවබෝධයෙන් අවබෝධ කරයි. මාර්ගය වැඩීම් අවබෝධයෙන් අවබෝධ කරයි. දුක විශේෂ දැනීම් අවබෝධයෙන් -පෙ- මාර්ගය වැඩීම් අවබෝධයෙන් අවබෝධ කරයි. මෙසේ මොහුට මුලින් කී දෙසත්‍යයන්හි, ඉගෙනීම්, විචාරීම්, ශ්‍රවණ, ධාරණ මෙනෙහි කිරීම් අවබෝධය වේ. ද්වයයෙහි ශ්‍රවණ ප්‍රතිවේධයම වේ. පසුත්‍රයයෙහි කෘත්‍ය වශයෙන් අවබෝධය වේ. නිරෝධයෙහි අරමුණු කිරීම් අවබෝධයයි. එහි සියලුම අවබෝධ ඥාණ ලෝකෝත්තරය. ශ්‍රවණ, ධාරණ, සම්මර්ශන ඥාණ ලෞකික කාමාවචරය. ප්‍රත්‍යවේක්ෂණය ප්‍රාප්ත සත්‍යයට වේ. මොහුද ආදි කර්මිකයෙකි. එහෙයින් එය මෙහි නොකියන ලද්දේය. මේ භික්ෂුවටද, පරිග්‍රහණයට පෙර දුක විශේෂයෙන් දනිමි. හටගැනීම දුරුකරමි. නිරෝධය සාක්ෂාත් කරමි. මාර්ගය වඩමියි. සිතාබැලීම්, සිත එක් අරමුණක පිහිටුවීම් මෙනෙහි කිරීම් ප්‍රත්‍යවේක්ෂා කිරීම් නැත. පරිග්‍රහණයේ සිට ඉහත කරුණු හටගනී. පසු කල්හි දුක සම්පූර්ණයෙන් දන්නා ලද්දේම වේ. -පෙ- මාර්ගය වඩන ලද්දේම වේ. එහි මුල් ද්වි සත්‍යයන් දර්ශනය (අවබෝධය) දුෂ්කර හෙයින්ද, ගැඹුරු හෙයින්ද දුද්දසය. දුක්ඛ සත්‍යය වනාහි, උපත් වශයෙන් ප්‍රකටය. කණු, කටු, ප්‍රහාරාදීන්හිදී, ඛේදයකි. දුකයයි කිවයුතු තත්වයට පැමිණේ. සමුදය සත්‍යය, කඩා කෑමට කැමති අනුභව කිරීමට කැමති ආදි වශයෙන් උත්පත්ති වශයෙන් ප්‍රකටය. ලක්ෂණ අවබෝධ වශයෙන් දෙකම ගැඹුරුයි. මෙසේ ඒවා දර්ශන දුප්කරත්වයෙන් ගැඹුරුයි. ඉතිරි ද්වයය දර්ශනය (අවබෝධය) සඳහා උත්සාහය, භවාග්‍ර ග්‍රහණය සඳහා හස්ත ප්‍රසාරණය මෙන්ද, අවීචි නිරය ස්පර්ශ කිරීම සඳහා පාද ප්‍රසාරණය මෙන්ද, සතට කැඩුණු අස් කෙන්දක් කොණින් කොණ ගෙන එකට එක් කරන්නාක් මෙන්ද වේ. මෙසේ ඒවා ගැඹුරු බැවින් දැකීම දුෂ්කරය. මෙසේ දැකීම දුෂ්කර හෙයින්ද, ගැඹුරු ධර්මයන්හි, ගැඹුරු බවද, දැකීම දුෂ්කර චතුරාර්ය සත්‍යයන්හි උගෙනුම් වශයෙන් පූර්වභාග ඥාණෝත්පත්තිය සඳහා 'මේ දුක නැණැ'යි ආදිය යූ.සේයි. අවබෝධක්ෂණයෙහි ඒ ඥාණය එකක්ම වේ.

චතුර්විධ සත්‍යයන්හි ඤාණය ශ්‍රුතමය ඤාණය, පිරිසිඳ දැනීමේ ඤාණය, විමසා බැලීමේ ඤාණය, අවබෝධයෙහි ඤාණය වශයෙන් සමහරු කීහු. එහි ශ්‍රුතමයෙ ඤාණය කවරේද? මෙය දුකය, මේ දුක් සමුදයයි. මේ දුක් නිරෝධයයි. මේ මාර්ගයයි කෙටියෙන් හෝ විස්තර වශයෙන් හෝ සිව්සසුන් අසා දැනගනීද? මේ ශ්‍රුතමයෙ ඤාණයයි. පිරිසිඳ දැනීමේ ඤාණය කවරේද? හෙතෙම අසන ලද්දෙහි අර්ථය වෙසෙසින් පිරික්සයි. ධර්ම වශයෙන් හා ලක්‍ෂණ වශයෙන්. මේ ධර්මයෝ මේ සත්‍යයෙහි ඇතුළත්ය. මෙම සත්‍යයාගේ මෙම ලක්‍ෂණයයි සනිටුහන් කරයි. මෙය පිරිසිඳ දැනීමේ ඤාණයයි. විමසා බැලීමේ ඤාණය කවරේද? හෙතෙම මෙසේ අනුපිළිවෙළින් සිව්සසුන් පිරිසිඳ දැන, නැවත දුකම ගෙන ගෝත්‍රභූ ඤාණය දක්වා අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් විමසා බලයි. මේ සම්මර්ශන ඥානයයි. අවබෝධයෙහි ඤාණය කවරේද? ලෝකෝත්තර මාර්ගක්‍ෂණයෙහි එක් ඤාණයකින් සිව්සස් පෙර පසු නොවී අවබෝධ කෙරේ. දුක විශේෂ අවබෝධයෙන්, සමුදය ප්‍රහාණාව බෝධයෙන් නිරෝධය සාක්‍ෂාත් කිරීම් අවබෝධයෙන්ද, මාර්ගය භාවනාවබෝධයෙන්ද අවබෝධ කරයි. මෙය අභිසම ඤාණයයි. සම්‍යක් සංකල්ප නිර්දේශයෙහි කාමයෙන් ඉවත් කළේනුයි නෛෂ්ක්‍රම්‍ය සංකල්පයයි. ව්‍යාපාදයෙන් ඉවත් කළේනුයි අව්‍යාපාද සංකල්පයයි. විහිංසාවෙන් ඉවත් කළේනුයි අවිහිංසා සංකල්පයයි. එහි නෛෂ්ක්‍රම්‍ය විතර්කය කාමච්ඡන්දයාගේ හේතු නැසීම හේතු සිඳීම කරන්නේ උපදී. අව්‍යාපාද විතර්කය ව්‍යාපාද විතර්කයාගේ -පෙ- අවිහිංසා විතර්කය විහිංසා විතර්කයාගේ -පෙ- සිඳීම කරන්නේ උපදී. එසේම නෛෂ්ක්‍රම්‍ය, අව්‍යාපාද, අවිහිංසා විතර්කයෝ, කාම, ව්‍යාපාද, විහිංසා විතර්කාදීන්ට විරුද්ධව උපදිත්. එහි යෝගාවචරයා කාම විතර්කයාගේ හේතු නැසීම සඳහා කාම විතර්කය හෝ අනෙක් කිසි සංස්කාරයක් හෝ මෙනෙහි කරයි. ඉක්බිති මොහුට විදර්ශනාක්‍ෂණයෙහි විදර්ශනා සම්ප්‍රයුක්ත සංකල්පය තදංග වශයෙන් කාම විතර්කයාගේ හේතුනැසීම, හේතු සිඳීම කරන්නේ උපදියි. විදර්ශනාව උත්සාහවත් කොට මාර්ගයට පමුණුවයි. ඉක්බිති මොහුට මාර්ග ක්‍ෂණයෙහි, මාර්ග සම්ප්‍රයුක්ත සංකල්පය මුළුමනින් විනාශ කිරීම් වශයෙන් කාම විතර්කයාගේ හේතු නැසීම, හේතු සිඳීම කරන්නේ උපදියි. ව්‍යාපාද විතර්කයාගේද, හේතු නැසීම සඳහා අව්‍යාපාද විතර්කය හෝ අනෙක් සංස්කාරයක් උපකාරී වේ. විහිංසා විතර්කයාගේ හේතු නැසීම සඳහා අවිහිංසා විතර්කය හෝ අනෙක් සංස්කාරයක් උපකාරී වේ. ඉක්බිති මොහුට විදර්ශනාක්‍ෂණයෙහි යන්න පළමු පරිද්දෙන්ම

යෙදිය යුතුය. කාම විතර්කාදී ත්‍රයයටම පෙළෙහි බෙදා දැක්වූ අටතිස් අරමුණු අතුරෙහි එක් කමටහනක් හෝ අවිරුද්ධ වූයේ නම් නැත. ඒකාන්තයෙන් වනාහි කාම විතර්කයට අශුභයන්හි ප්‍රථමධ්‍යානයම විරුද්ධය. ව්‍යාපාද විතර්කයට මෛත්‍රියෙහි තෙවන සිවුවන ධ්‍යානයෝය. විහිංසා විතර්කයට කරුණාවෙහි ත්‍රිචතුෂ්ක ධ්‍යානයෝය. එහෙයින් අශුභයෙහි පිරියම්කොට ධ්‍යානයට සමවන්නහුට සමාපත්තික්ෂණයෙහි ධ්‍යාන සම්ප්‍රයුක්ත විතර්කය විෂ්කම්භන වශයෙන් කාම විතර්කයට විරුද්ධ වී උපදියි. ධ්‍යානය පාදකකොට විදර්ශනා පිහිටුවන්නහුට විදර්ශනා ක්ෂණයෙහි විදර්ශනා සම්ප්‍රයුක්ත සංකල්පය තදංග වශයෙන් කාම විතර්කයට විරුද්ධ වී උපදියි. විදර්ශනාව උත්සාහවත් කරවා මාර්ගයට පැමිණෙන්නහුට මාර්ග ක්ෂණයෙහි මාර්ග සංයුක්ත සංකල්පය විනාශ කිරීම් වශයෙන් කාම විතර්කයට විරුද්ධව උපදී. මෙසේ උපන්නේ නෛෂ්ක්‍රම්‍ය සංකල්පයයි කියනු ලැබේයයි දතයුතුය. මෛත්‍රියෙහි පිරියම්කොට, කරුණාවෙහි පිරියම්කොට ධ්‍යානයට සමවදීයයි සියල්ල පළමු ක්‍රමයෙන්ම යෙදිය යුතුය. මෙසේ උපන්නේ අව්‍යාපාද සංකල්පයයි කියනු ලැබේ. අවිහිංසා සංකල්පයයි යු.සේයි. මෙසේ මේ නෛෂ්ක්‍රම්‍ය සංකල්පාදීන් විදර්ශනා ධ්‍යාන වශයෙන් උත්පත්තීන්ගේ නානාකාර බව පූර්වභාග නානාකාර බවයි. මාර්ග ක්ෂණයෙහි මේ ත්‍රිවිධ ස්ථානයන්හි උපන් අකුසල සංකල්පයාගේ හේතු නැසීමෙන් නොඉපදීම සිද්ධවීම් වශයෙන් මාර්ගාංගය සම්පූර්ණ කරනුයේ තනි වූයේම කුසල් සංකල්පය උපදී. මේ සම්‍යග් සංකල්ප නම් වේ.

සම්‍යග් වචන නිර්දේශයෙහි, වෙනත් සිතකින්ම මුසාවාදයෙන් වළකී. අන් සිතකින් කේළාම් කීමෙන් වළකී. මේ වැළකීම් සතරක්ම වූවා පූර්වභාගයෙහි නානාකාරය. මාර්ග ක්ෂණයෙහි වනාහි මිථ්‍යාවාචා සංඛ්‍යාත සිව්වැදෑරුම් අකුසල දුසිල් චේතනාවගේ හේතු නැසීමෙන් නොඉපදීම සිද්ධවීම් වශයෙන් මාර්ගාංගය සම්පූර්ණ කරනුයේ තනි වූවාම සම්‍යග් වචන සංඛ්‍යාත අකුසල වෙන්වීම් උපදී. මේ සම්‍යග් වචන නම් වේ.

සම්‍යග් කර්මාන්ත නිර්දේශයෙහිද, අනෙක් සිතකින්ම ප්‍රාණ ඝාතයෙන් වැළකේ. අන් සිතකින් නුදුන් දේ ගැනීමෙන්, අන් සිතකින් වැරදි හැසිරීම්වලින්, මේ ත්‍රිවිධ වැළකීම් පූර්වභාගයෙහි නානාකාරය. මාර්ග ක්ෂණයෙහි වනාහි වැරදි ක්‍රියා සංඛ්‍යාත ත්‍රිවිධ අකුසල දුසිල්

චේතනාවගේ හේතු සිඳින හෙයින් නොඉපදීම් සිද්ධවීම් වශයෙන් මාර්ගාංගය සම්පූර්ණ කරනුයේ තනිවූවාම සම්‍යග් කර්මාන්ත සංඛ්‍යාත අකුසල වෙන්වීම් උපදී. මේ සම්‍යග් කර්මාන්ත නම් වේ.

සම්‍යග් ආජීව නිර්දේශයෙහි, **ඉධ** යනු මෙ සස්නෙහි, **අරියසාවකො** යනු ආර්ය බුදුරදුන්ගේ ශ්‍රාවක තෙම, **මිච්ඡා ආජීවං පහාය** යනු පාපී දිවිපැවැත්ම අත්හැර. **සම්මා ආජීවෙන** යනු බුදුරදුන් පසස්නා ලද යහපත් දිවි පැවැත්මෙන්, **ජීවිකං කප්පෙති** යනු ජීවිතයාගේ පැවැත්ම පවත්වයි. මෙහිද, අන් සිතකින් කායද්වාර ව්‍යතික්‍රමණයෙන් වැළකී සිටියි. අන් සිතකින් වාග්ද්වාර ව්‍යතික්‍රමණයෙන් (නීති ඉක්මවීම්) වැළකී සිටියි. එහෙයින් පූර්ව භාගයෙහිදී නානාක්ෂණයන්හි උපදියි. මාර්ගක්ෂණයෙහි වනාහි ද්වාරද්වයයෙහි සප්ත කර්මපථයන්ගේ වශයෙන් උපන් මිථ්‍යාජීව දුසිල් චේතනාවගේ හේතු නැසීමෙන් නොඉපදීම් සිඳුකිරීම් වශයෙන් මාර්ගාංගය සම්පූර්ණ කරනුයේ තනි සම්‍යග් ආජීව සංඛ්‍යාත අකුසල වෙන්වීම් උපදී. මේ සම්‍යග් ආජීව නම් වේ.

සම්‍යග් ව්‍යායාම නිර්දේශයෙහි, **ඉධ භික්ඛු** යනු මෙ සස්නෙහි පිළිපන් භික්ෂුව, **අනුප්පන්නානං** යනු නොහටගත්, **පාපකානං** යනු නීච වූ, **අකුසලානං ධම්මානං** යනු අදක්ෂභාවයෙන් හටගත් ස්වභාවයන්ගේ, **අනුප්පාදාය** යනු නොඉපදීම සඳහා **ඡන්දං ජනෙති** කරනු කැමති බවයයි කියනු ලබන කුසල්හි කැමැත්ත ජනනය කරයි. උපදවයි. **වායමති** යනු උපාය උපදවයි. උත්සාහ කරයි. **විරියං ආරභති** යනු කායික චෛතසික වීර්යය කරයි. **චිත්තං පග්ගණ්හාති** යනු ඒ හා සමග හටගත් වීර්යයෙන් සිත ඔසවයි. **පදහති** යනු ප්‍රධන් වීර්යය කරයි. පිළිවෙළින් මේ සිව්පදයන්, සේවනය, වැඩීම, බහුල වශයෙන් කිරීම, නොනවත්වා ක්‍රියා කිරීම ආදියෙහි යෙදිය යුත්තාහ. **උප්පන්නානං** නූපන්නවුන්ටයයි නොකිවයුතු තත්වයට පත්වූවන්ට **පහානාය** දුරුකිරීම සඳහා. **අනුප්පන්නානං කුසලානං ධම්මානං** යනු නූපන් දක්ෂතාවයෙන් හටගත් ධර්මයන්ගේ, **උප්පාදාය** යනු ඉපදවීම සඳහා. **උප්පන්නානං** යනු උපන්නාවුන්ගේ **ඨිතියා** යනු සිටීම සඳහා. **අසම්මොසාය** යනු නුමුළා බව සඳහා. **භීය්‍යොභාවාය** යනු නැවත නැවත අධිකභාවය සඳහා. **වෙපුල්ලාය** යනු පැතිරුණු ස්වභාවය සඳහා. **භාවනාය** යනු වෘද්ධිය සඳහා. **පාරිපූරියා** යනු පරිපූරණය සඳහා. මේ සම්‍යග් ව්‍යායාම සංඛ්‍යාත සතර සම්‍යක් ප්‍රධානයන් පූර්වභාගයෙහි ලෞකිකය. මාර්ගක්ෂණයෙහි ලෝකෝත්තරය. මාර්ගක්ෂණයෙහි එක්ම වීර්යය සිව්තිස්

සැදුම් විසින් සිව් නම් ලබා එහි ලෞකිකයන් කාශ්‍යප සංයුක්තයෙහි කියන ලද ක්‍රමයෙන් දතයුත්තාහුය. එහි කියන ලද්දේමය. 'ඇවැත්නි, මේ සතර සම්‍යක් ප්‍රධානයෝය. කවර සතරෙක්ද යත්, ඇවැත්නි, මේ ශාසනයෙහි භික්‍ෂුව මාගේ නූපන් පාපී අකුසල ධර්ම උපදිනු ලබන්නේ අනර්ථය සඳහා පවතින්නේ යයි වීර්යය කරයි. මාගේ උපන් අකුසල ධර්ම ප්‍රහීණ නොවනුයේ අනර්ථය පිණිස පවතින්නේ යයි වීර්යය කරයි. මාගේ නූපන් කුසල ධර්ම නූපදිනු ලබන්නේ අනර්ථය සඳහා පවතින්නේයයි වීර්යය කරයි. මාගේ උපන් කුසලධර්ම නිරුද්ධ වනුයේ අනර්ථය සඳහා පවතින්නේ යයි වීර්යය කරයි. එහිද අනුප්පනනා යනු නොපැවතීම් වශයෙන් හෝ විඳිනු නොලැබූ අරමුණු වශයෙන් හෝ නූපන්, අනෙක් අතින්, නොදත් කෙළවර ඇති සසරෙහිදී නූපන් පාපී අකුසලධර්ම නොමැත්තේය. නූපන්නාහු උපදිනු ලබන්නාහුද, මේවාම උපදිති. ප්‍රහීණ වනුයේද මොවුහුම ප්‍රහීණ වෙති. ඇතැමෙකුට, වත්, ග්‍රන්ථධූර, ධුතාංග, සමාධි, විදර්ශනා නවකම් සිදුවීම්වලදී එක්තරා ආකාර වශයෙන් කෙලෙස් නොපවතී. කෙසේද? ඇතැම් පුඟුලෙක් විනය පිටකයෙහි සඳහන් අසූවත්ද, තුදුස් මහවත්ද, සෑමළුව, බෝමළුව, පැන්ශාලාව, පොහොය ගෙය, ආගන්තුක හා ගමික වත්ද පුරනු ලබන්නේ, මොහු මැඩයාමට කෙලෙස් ඉඩ නොලබයි. පසුකාලයෙහි වනාහි වත් හැරදමා, බිඳුණු වත් ඇතිව හැසිරෙන මොහුට නුනුවණින් මෙනෙහි කිරීම් හේතුයෙන්, සිහිය අත්හැරීමට පැමිණ සිටි කල්හි අකුසල් උපදියි. මෙසේද යහපත් අංග නොපැවතීම් වශයෙන් නූපන්නාහු උපදිති නම් වේ.

ඇතැම් පුඟුලෙක් ග්‍රන්ථ ධූරයෙහි යෙදුණේ වෙයි. එක් නිකායක්, දෙකක්, තුනක්, හතරක්, පහක් ඉගෙන ගනියි. ත්‍රිපිටක බුද්ධ වචනය, අර්ථ වශයෙන්ද, පෙළ වශයෙන්ද, අනුසන්ධි වශයෙන්ද, පූර්වාපර වශයෙන්ද, ඉගෙන ගන්නහුට, සජ්ඣායනා කරන්නහුට, සිතන්නහුට, කියවන්නහුට, දෙසන්නහුට, ප්‍රකාශ කරන්නහුට, කෙලෙස් අවකාශ නොලබයි. පසුකලෙක වනාහි ග්‍රන්ථකර්ම හැර කුසීතව හැසිරෙන කල්හි නුනුවණින් මෙනෙහි කිරීම් හේතුයෙන්, සිහිය අත්හැරීමට පැමිණ සිටි කල්හි මොහුට අකුසල් උපදියි. මෙසේද යහපත් අංග නොපැවතීම් වශයෙන් නූපන්නාහු උපදිති නම් වේ. ඇතැම් පුඟුලෙක් ධුතාංගධාරී වේ. තෙළෙස් ධුතාංග ගුණයන් සමාදන්ව (පවතී) දිවිපවත්වයි. ධුතාංග ගුණයන් පවත්වාගෙන යන කල්හි ඔහුට කෙලෙස් අවකාශ නොලබයි. පසුකල්හි ධුතාංගයන් හැරදමා කාර්ය බහුල බවට හැරී හැසිරෙන කල්හි නුනුවණින්

මෙනෙහි කිරීම් හේතුයෙන්, සිහිය අත්හැරීමට පැමිණ සිටි කල්හි, මොහුට අකුසල් උපදියි. මෙසේද යහපත් අංග නොපැවැතීම් වශයෙන් නූපන්නාහු උපදිති නම් වේ.

ඇතැම් පුඟුලෙක් අට සමවත්හි පුරුදුකළ වසී ඇත්තේ වේ. ප්‍රථම ධ්‍යානාදීන්හි ආවජ්ජනවසී ආදී පංචවිධ වසීතාවයන්ගේ වශයෙන් වාසය කරන්නාවූ ඔහුට කෙලෙස් අවකාශ නොලබයි. පසුකල්හි වනාහි පිරිගුණු ධ්‍යාන ඇත්තා වූ, අත්හළ ධ්‍යාන ඇත්තා වූ, ප්‍රලාප දෙඩවීම් ආදීන්හි යෙදී වසන්නා වූ ඔහුට නුනුවණින් මෙනෙහි කිරීම් හේතුයෙන් සිහිය අත්හැරීමට පැමිණ සිටි කල්හි අකුසල් උපදියි. මෙසේද යහපත් අංග නොපැවතීම් වශයෙන් නූපන්නාහු උපදිති නම් වේ.

ඇතැම් පුඟුලෙක් විදර්ශකයෙක් වේ. සත් අනුපස්සනාවන්හි, අටළොස් මහා විදර්ශනාවන්හි කර්ම කරනුයේ වාසය කරයි. මෙසේ වාසය කරන ඔහුට කෙලෙස් අවකාශ නොලබයි. පසුකල්හි වනාහි විදර්ශනා කර්ම හැර, කය දැඩිව ගැනීම් බහුලව වසන කල්හි, නුනුවණින් මෙනෙහි කිරීම් හේතුයෙන් සිහිය අත්හැරීමට පැමිණ සිටි කල්හි මොහුට අකුසල් උපදියි. මෙසේද යහපත් අංග නොපැවතීම් වශයෙන් නූපන්නාහු උපදිති නම් වේ.

ඇතැම් පුඟුලෙක් නව කාර්මිකයෙක් වේ. පොහෝ ගෙවල්, භෝජන ශාලාදීන් කරයි. ඔහුට ඒ උපකරණ ගැන සිතනකල්හි කෙලෙස් අවකාශ නොලබයි. පසුකල්හි වනාහි නවකම් නිමිකල්හි හෝ අත්හළ කල්හි හෝ ඔහුට, නුනුවණින් මෙනෙහි කිරීම් හේතුයෙන්, සිහිය අත්හැරීමට පැමිණ සිටිකල්හි, අකුසල් උපදියි. මෙසේද යහපත් අංග නොපැවතීම් වශයෙන් නූපන්නාහු උපදිති නම් වේ.

ඇතැම් පුඟුලෙක් බඹලොවින් පැමිණි ශුද්ධ සත්ත්වයෙක් වේ. නොසෙවිනා හෙයින් ඔහුට කෙලෙස් අවකාශ නොලබයි. පසුකල්හි වනාහි පච්කම්හි ලද සෙවුණෙන් නුනුවණින් මෙනෙහි කිරීම් හේතුයෙන් සිහිය අත්හැරීමට පැමණ සිටි කල්හි ඔහුට අකුසල් උපදියි. මෙසේද නොපැවතීම් වශයෙන් නූපන්නාහු උපදිත් නම් වේ. මෙසේ නොපැවතීම් වශයෙන් නොඉපදීම් ස්වභාවය දතයුත්තාහ.

පෙර නොවූ විරූ අරමුණු වශයෙන් කෙසේද යත්? මෙහි ඇතැම් පුඟුලෙක් පෙර නොවූ විරූ ප්‍රියමනාපාදී භේදයෙන් යුත් අරමුණක් ලබාද? එහි ඔහුට නුනුවණින් මෙනෙහි කිරීම් සිහිය අත්හැරීම් ආදියට පැමිණ රාගාදී කෙලෙස් උපදියි. මෙසේ පෙර නොවූවිරූ අරමුණු වශයෙන් නූපන්නාහු උපදිති නම් වේ. මෙසේ නූපන්නා වූ අකුසලයන්ගේ ඉපැත්ම ඇති කල්හි, තමාගේ අනර්ථය දැක, ඒවාහි නොපැවැත්ම සඳහා සතිපට්ඨාන භාවනාවෙහි යෙදීමෙන් පළමු සම්‍යක් ප්‍රධන් වීර්යය වඩයි. එම කෙලෙස් උපන් කල්හි, ඒවාහි අප්‍රහාණයෙන් තමාගේ අනර්ථය දැක, ඒවාහි ප්‍රහාණය සඳහා එසේම දෙවන, සම්‍යක් ප්‍රධන් වීර්යය වඩයි.

**අනුප්පන්නා කුසලා ධම්මා** යනු සමථ, විදර්ශනා හා මාර්ගයයි. ඒවාහි නොඉපැත්මෙහි තමාගේ අනර්ථය දැක ඒවාහි ඉපැත්ම සඳහා එසේම තෙවන සම්‍යක් ප්‍රධන් වීර්යය වඩයි. **උප්පන්නා කුසලා ධම්මා** යනු සමථය හා විදර්ශනාවයි. මාර්ගය වනාහි වරක් ඉපිද නිරුද්ධ වන්නේ අනර්ථය සඳහා පවත්නේ නම් නොවේ. එය ඵලයට ප්‍රත්‍යය දෙන ලදුයේම නිරුද්ධ වේ. ඒ සමථ විදර්ශනාවන්ගේ නිරෝධයෙන් තමා කෙරෙහි අනර්ථය දැක ඒවාහි පැවැත්ම සඳහා සිව්වන සම්‍යක් ප්‍රධන් වීර්යය වඩයි. ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි වනාහි එකක්ම වූ වීර්යය, මෙසේ යම් නූපන්නවුන් උපදවන්නාහුද, උපන්නාහු නැවත නොඉපදෙත්ද, මෙසේ නූපන්නවුන්ගේ අනුත්පාද කෘත්‍යයද උපන්නවුන්ගේ ප්‍රහාණ කෘත්‍යයද සිදුකරයි.

උප්පන්නා යන මෙහි උපන, වර්තමානුත්පන්නය, භූත්වා විගතුප්පන්නය, ඔකාසකතුප්පන්නය, භූමිලද්ධුප්පන්නයයි සිව් ආකාර වේ. එහි සියලුම උපත්, දිරීම්, විනාශවීම් හා සමග එක්වීම් සංඛ්‍යාත වූයේ වර්තමාන උප්පන්න නම් වේ. අරමුණු රස අනුභවකොට නිරුද්ධ වූ, විඳින ලද පහවූ කුසලාකුසල සංඛ්‍යාත, උත්පාද, ඨිති, භංග යන ත්‍රයයට පත්ව නිරුද්ධ වූ, අනුභවකොට පහවීම් සංඛ්‍යාත වූද ශේෂ වශයෙන් වෙනත් ගතයුතු දෑද, භූත්වාවිගතුප්පන්න නම් වේ. යම් ඒ පෙර කරන ලද කර්ම වන්නේ? මේ ආදී ක්‍රමයෙන් කියන ලද අතීත කර්මයට සමාන අන් විපාක වළක්වා, තමාගේ කර්මයට අවකාශ ලබා සිටිහෙයින් එසේ කරන ලද අවකාශයට විපාක නූපන්නේ වූයේ නමුදු, එයට ඉඩකඩ සලසා ඇතිහෙයින් ඒකාන්තයෙන්ම විපාක උපදනා හෙයින් ඔකාසකතුප්පන්න නම් වේ. ඒ ඒ භූමින්හිදි සමූලඝාතනය නොකළ

අකුසලය භූමි ලද්ධුප්පන්න නම් වේ. මෙහිද භූමියෙහි හා භූමියෙහි ලත් යන්නෙහි වෙනස දතයුතුය. භූමි යනු විදර්ශනාවට අරමුණු වූ ත්‍රෛභූමික පංචස්කන්ධය භූමිලද්ධ නම්. ඒ ස්කන්ධයන්හි උපදිනු ලබනකෙලෙස් සමූහයයි. එහෙයින් එය භූමිලද්ධ නම් වන්නේය. එහෙයින් භූමිලද්ධයි යූසේයි. එය අරමුණු කිරීම් වශයෙන් නොවේ. අරමුණු වශයෙන්, අතීත, අනාගත වශයෙන් මනාව දත් කෙලෙස් ප්‍රහීණ කළවුන්ට පංචස්කන්ධ අරබයා කෙලෙස් ඉපදිය නොහැකිය.

යම්හෙයකින් භූමිලද්ධ නම් වන්නේද? එයට අප්‍රමාණ වශයෙන් කිසි භවමූලයක් අත්නොහරින්නේය. වස්තු වශයෙන් වනාහි භූමිලද්ධය දතයුතුය. යම් යම් තැනෙක්හි විදර්ශනාවගේ විශේෂයෙන් නොදත් හෙයින් ස්කන්ධ උපදීද? ඒ ඒ තන්හි උපතෙහි පටන් ඒවාහි වෘත්තමූලික කෙලෙස් සමූහය අත්නොහැර පවතියි. එය ප්‍රහීණ නොවූ අර්ථයෙන් භූමිලද්ධයයි දතයුතුය. එහිද යමෙකුට යම් ස්කන්ධයන්හි අප්‍රහීණාර්ථයෙන් නොහැර පවතින කෙලෙස් වේද, ඔහුට එම ස්කන්ධයෝම, එම කෙලෙසුන්ට කරුණු වේ. අන්‍යයන්ට තමා සතු ස්කන්ධයෝය. අතීත ස්කන්ධයක්හි අප්‍රහීණව නොහැර පවත්නා කෙලෙසුන්ට අතීත ස්කන්ධයෝ වස්තුවෙති. අන්‍යයෝ නොවෙති. අනාගතාදීන්හිද මේ ක්‍රමයමැයි. කාමාවචර ස්කන්ධයන්හි අප්‍රහීණව නොහැර පවත්නා කෙලෙසුන්ට කාමාවචර ස්කන්ධයෝම වස්තු වෙති. අන්‍යයෝ නොවෙති. රූපාවචර-අරූපාවචර ආදීන්හිද මෙම ක්‍රමයමැයි. සෝවාන් ආදී යම් යම් ආර්ය පුද්ගල ස්කන්ධයන්හි, ඒ ඒ වෘත්ත මූල කෙලෙස් සමූහය ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණ වූයේද, ඒ ඒ පුද්ගලයාට ඒ ඒ ස්කන්ධයන්හි ප්‍රහීණ වූ ඒ ඒ වෘත්තමූලික කෙලෙසුන්ට වස්තු නොවන හෙයින් භූමියි යන ගණන් ගැනීම නොලබත්. පෘථග්ජනයාට සියලු වෘත්තමූලික කෙලෙසුන් අප්‍රහීණ හෙයින් යම්කිසි කරනු ලබන කර්මයක් වේද, එය කුසල හෝ අකුසල හෝ වෙයි. මෙසේ මොහුට කර්ම ක්ලේස ප්‍රත්‍යයම සසර වෘත්තයට යෝග්‍ය වේ. ඒ ඒ වෘත්තමූලික රූපස්කන්ධයෙහිම වේ. වේදනාදීන්හි නොවේ. විඤ්ඤාණස්කන්ධයෙහිම වේ. රූපස්කන්ධාදීන්හි නොවේයයි නොකිවයුතුය. කුමක් හෙයින්ද යත්? අවිසේසයෙන් පංචස්කන්ධයන්හිම නොපිහිටි හෙයිනි. කෙසේද? වෘක්ෂයෙහි පෘථුවි රසාදිය මෙනි. යම්සේ මහා වෘක්ෂයන් පෘථුවි තලය ආධාරකොට සිටියේ, පෘථුවි රසයද, ජල රසයද, නිශ්‍රයකොට ඒ හේතුයෙන් මුල්, කඳන්, අතු, කුඩා අතු, දලු, කොළ, මල්, ගෙඩිවලින් වර්ධනය වී අහස් කුස පුරවා, කල්පාවසානය

තෙක්, බීජ පරම්පරාවෙන් රුක් පරම්පරාව දරමින් සිටිනුයේ, ඒ පෘථුවි රසාදිය මුලෙහිමය. වෘක්ෂයන්ගේ කඳෙහි නොවේ. ගෙඩිවලමය. මුල් ආදීන්හි නැතැයි නොකිවයුතුය. කුමක් හෙයින්ද යත්? අවිශේෂයෙන් සියලු මුල් ආදීන්හි ඇතුළත්ව තිබෙන හෙයිනි. යම්සේ වනාහි එම වෘක්ෂයෙහි මල්ගෙඩි ආදීන්හි කළකිරුණු කිසියම් පුරුෂයෙක් සිව්දිසාවන්හි මඬුකටුව නම් විෂකටුවෙන් කොටන්නේය. ඉක්බිති ඒ වෘක්ෂය, ඒ විෂ ස්පර්ශයෙන් ස්පර්ශ වූයේ, පෘථුවි රස, ජලරස ආදීන් හාත්පසින් මඩනා ලද හෙයින්, රසහීන භාවයට පත්වූයේ නැවත පරම්පරාව නිපදවන්ට නොහැකි වන්නේය. එපරිද්දෙන්ම ස්කන්ධ ප්‍රවෘත්තියෙහි කළකිරුණු කුලපුත්‍රයා ඒ පුරුෂයාගේ වෘක්ෂයෙහි සිව් දිසාවන්හි විෂ යෙදීම මෙන්, තමාගේ සන්තානයෙහි සිව්මග භාවනා අරඹයි. ඉක්බිති ඔහුගේ ඒ ස්කන්ධ පරම්පරාව ඒ සිව්මග විෂ ස්පර්ශයෙන් සර්වප්‍රකාරයෙන් වෘත්තමූල කෙලෙසුන් හාත්පසින් මඩනා ලද හෙයින් කාය කර්මාදි සියලු කර්ම ප්‍රභේදයන්, ක්‍රියා ස්වභාව මාත්‍රයක්ම වූයේ, මත්තෙහි පුනර්භවයක නූපදින ස්වභාවයට පැමිණ භවන්තර පරම්පරා නිපදවන්ට නොහැකි වෙයි. හුදෙක් අවසන්හි වූ විඥානඥාණ නිරෝධයෙන් දර රහිත ගින්නක් මෙන් තෘෂ්ණාදී දෘඪ ගැනීම් රහිත වූයේ පිරිනිවන්පායි. මෙසේ භූමියෙහිද භූමි ලද්දහුගේද නානත්වය දතයුතුය. අන්‍යවූද සමුදාචාරුප්පන්න, ආරම්මණාධිගගහිතුප්පන්න, අවික්ඛම්භිතුප්පන්න, අසමූහතුප්පන්න යයි උත්පත්ති සතරෙකි. එහි වර්තමාන උපැත්මම සමුදාචාර උප්පන්නයයි. චක්ෂුරාදීන්ට හමුවූ අරමුණෙහි පූර්ව භාගයෙහි නූපදින්නා වූද කෙලෙස් සමූහය, අරමුණ අයිති කරගත් බැවින්ම පසුකල්හි ඒකාන්තයෙන්ම උපදනා හෙයින් ආරම්මණාධිගගහිතුප්පන්න යයි කියනු ලැබේ. සමථ විදර්ශනාවන්ගේ අප්‍රකට වූවක් ලෙසින් විෂ්කම්භනය නොකළ කෙලෙස් සමූහය සිත් පරම්පරාවට නොනැඟියේම උපත් වළක්නා හේතු අභාවයෙන් අවික්ඛම්භිතුප්පන්න නම් වේ. සමථ විදර්ශනා වශයෙන් විෂ්කම්භනය කරන ලද්දේ වී නමුත් ආර්ය මාර්ගයෙන් මුලිනුපුටා නොදැමූ හෙයින් උත්පත්ති ස්වභාවය නොඉක්මවූ හෙයින් අසමූහතුප්පන්න යයි යුසේයි. ආරම්මණාධිගගහිත, අවික්ඛම්භිත, අසමූහතප්පන්න යන මේ ත්‍රයයම භූමි ලද්ධයෙහි ඇතුළත් වීමට යේයයි දතයුතුය. මෙහි මෙසේ කියන ලද, ප්‍රභේද ඇති, උත්පත්තීන්හි, යම් ඒ වර්තමානයෙහි වූ, පහවූ අවකාශ ඇති, හටගැනීම් සංඛ්‍යාත ඉපැත්මක් වේද, එය මාර්ග වධ්‍ය නොවන හෙයින් කිසියම් මාර්ග ඥාණයකින් ප්‍රහාණය කළ නොහැක. යම් ඒ භූමි ලද්ධ ආරම්මණාධිගගහිත, අවික්ඛම්භිත, අසමූහත සංඛ්‍යාත උපත් වේද,

එයට එහි උපන් බව නසනු ලබන්නේ, යම්හෙයකින් ඒ ඒ ලෞකික ලෝකෝත්තර ඥාණ උපදීද? එහෙයින් ඒ සියල්ලම අත්හැරිය යුතු වෙයි. මෙසේ යම් මාර්ගයක් කෙලෙස් දුරුකරයිද? ඒවා සඳහා උපන්නාහු යයි ආදිය යුසේයි. නැවත මාර්ග ක්‍ෂණයෙහි කෙසේ නූපන් කුසලයන්ගේ ඉපැත්ම සඳහා භාවනා වේද? මාර්ග ප්‍රවෘත්තියෙහි කෙසේ උපන්නවුන්ගේ සිටීම වේද? මෙසේ මාර්ගය වනාහි පවතිනුයේ පෙර නූපන් විරූ හෙයින් නූපන්නේ නම් වේයයි යු.සේයි. පූර්ව අනාගත ස්ථානයට ගොස්, පෙර නොවිඳින ලද, අරමුණක් අනුභවකොට, අනාගත ස්ථානයට පැමිණියෙමු. අනුභව නොකළ අරමුණ අනුභව කෙළෙමු යයි කියන්නෝ වෙති. යම්තාක් පැවැත්ම වේද? මෙයම ඨිතිය නමැයිද, ඨිතියෙහි අභාවය යයිද කියන්ට සුදුසුය. මෙසේ මේ භික්‍ෂුවට මෙය ලෝකෝත්තර මාර්ගක්‍ෂණයෙහි එකම වීර්යය, නූපන් පාපී අකුසල් ධර්මයන්ගේ නොඉපැත්ම සඳහා යයි සිව් නාමයන් ලබයි. මේ ලෝකෝත්තර මාර්ගක්‍ෂණයෙහි සම්‍යක්ප්‍රධාන කථායි. මෙසේ මෙහි ලෞකික ලෝකෝත්තර මිශ්‍රිතව සම්‍යක් ප්‍රධානයෝ දක්වන ලද්දාහ.

සම්‍යක් සති නිර්දේශයෙහි **කායෙ** යනු රූප කායයෙහි මෙහි රූප කය වනාහි, අඟ පසඟ, කෙස් ආදී ස්වභාවයන්ගේ සමූහය යන අර්ථයෙන් හස්තිකාය, රථකාය (ඇත් සමූහය, රථ සමූහය) ආදීන් මෙන් කාය යයි අදහස් කරන ලදී. සමූහාර්ථයෙන් යම්සේද, එසේම එය පිළිකුල්, අතිශය පිළිකුල් ද්‍රව්‍යයන්ගේ උපදනා ස්ථාන යනුයිද කාය නම් වේ. ආය යනු උත්පත්ති ප්‍රදේශයයි. එහි මේ වචනාර්ථයි. ඉන් හටගනීනුයි = ආයයි. කවරක් හටගනීද? පිළිකුල් කේශාදීහුය. මෙසේ පිළිකුල් ද්‍රව්‍යයන්ගේ උපත් ප්‍රදේශය නුයි කාය නම් වේ. **කායානුපස්සී** යනු කය විමසා බලනසුළු වූයේ හෝ නුවණින් බලන්නේ, කායෙ යනුවෙන්ද කියා, නැවත 'කායානු පස්සී' යන දෙවන කාය ග්‍රහණය අසම්මිශ්‍ර වශයෙන් පිරිසිඳ දැනීම ඒක ඝණ ද්‍රව්‍ය බෙදා වෙන්කිරීම් ආදිය දැක්වීමට කරන ලදැයි දතයුතුය. එහෙයින් කයෙහිම පමණක් නොවේ. වේදනා, චිත්ත, ධර්මානුපස්සනා ඇතුළත් වේ. තවද, කායානුපස්සී යන මෙහි, කාය සංඛ්‍යාත වස්තුවෙහි, කය අනුව බලන ආකාරයෙහිම දර්ශනයෙන් අසම්මිශ්‍ර වශයෙන් පිරිසිඳ දැනීම දක්වන ලද්දේ වෙයි. එසේම ශරීරයෙහි අඟපසඟවලින් තොර එක් ධර්මානුපස්සනාවක්ද නැත. කෙස්, ලොම් ආදියෙන් තොර ස්ත්‍රී පුරුෂ අනුපස්සනාවක්ද නැත. මෙහි යම් ඒ කෙස්, ලොම් ආදී වූ භූත, උපාදාය රූප සමූහ සංඛ්‍යාත වූ කයක් වේද? එහිද භූත උපාදාය රූපවලින් තොර

එක් ධර්මානුපස්සනාවක්ද නැත. තවද රථ සමූහය අනුව බලන්නෙකු මෙන්, කෙස්ලොම් ආදිය අනුව බලන්නේ, නගරයෙහි කොටස් බලන්නෙකු මෙන්, කෙස්, ලොම් ආදී සමූහය අනුව බලන්නේ, කෙසෙල්කඳෙහි, පිලි ගලවා බෙදා වෙන්කරන්නෙකු මෙන්ද, හිස් මුට්ටියෙහි වෙළුම් ඉවත් කරන්නාක් මෙන්ද භූත-උපාදාය රූප සමූහය අනුව බලන්නේමයයි සමූහ වශයෙන්ම කාය සංඛ්‍යාත වස්තුවෙහි නොයෙක් ආකාරයෙන් බැලීමෙන් තද කොටස් වෙන්කිරීම දක්වන ලද්දේ වෙයි. කියන ලද රාශි ස්වභාවයෙන් තොර, සිරුරක් හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අන්කිසි ස්වභාවයක් මෙහි නොපැනේ. කියන ලද ආකාර ඇති ධර්ම සමූහ මාත්‍රයෙහිම වනාහි ඒ ඒ ආකාරයෙන් වැරදි ඇළීම් කරති. එහෙයින් පෞරාණිකයෝ කීහු,

යං පස්සති න තං දිට්ඨං - යං දිට්ඨං තං න පස්සති
අපස්සං බජ්ඣතේ'මූළ්හො - බජ්ඣමානො නමුච්චතී'ති

යමක් දකීද, එය නොදක්නා ලදී. යමක් දක්නා ලද්දේද එය නොදකී. අඥානයා නොදක්නේ බැඳේ. බඳිනු ලබන්නේ නොමිදෙයි.

ඝනය වෙන්කිරීම් ආදිය දැකීම සඳහා යයි කියන ලදී. ආදි ශබ්දයෙන් මේ අර්ථය දතයුතුය. මෙය මේ ශරීරයෙහි කය නුවණින් බලමින්ම, අන් ධර්මයන් අනුව බලන්නේ නොවේ. කුමක් කියන ලද්දේ වේද, යම්සේ දිය ස්වභාවයක් නොවූද, මිරිඟුවෙහි දියයයි සිතා ඒ අනුව බලන්නාහු වෙති. අනිත්‍යය, දුක්ඛ, අනාත්ම, අසුභ ස්වභාවය වූ මේ ශරීරයෙහි නිත්‍ය, සුඛ, ආත්ම, සුභ ස්වභාවය වශයෙන් බලන්නේ නොවේ. තවද, කය අනුව බලන්නේම වේ. අනෙක් ධර්මයන් අනුව බලන්නේ නොවේ. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අසුභ ආකාර සමූහය නුවණින් විමසා බලන්නේ යයි යූ.සේයි. නොහොත් යම් ඒ මහාසතිපට්ඨානයෙහි 'මහණෙනි, මෙ සස්නෙහි භික්ෂුව අරණ්‍යගත වූයේ, රුක්මුල් ගතවූයේ -පෙ- හෙතෙම සිහියෙන් යුක්තවම ආශ්වාස කරයි ආදී ක්‍රමයෙන් ආශ්වාස ප්‍රශ්වාසාදී, සුණුවිසුණු වී ගිය, අස්ථි කෙළවරකොට ඇති කය යූසේයි. යම් අන් සතිපට්ඨාන කථාවෙහි, මෙලොව ඇතැම් පුඟුලෙක් පෘථුවි කය, ජල කය, ගිනි කය, වාත කය, කෙස් කය, ලෝම කය, සිවි කය, සම් කය, මස් කය, ලේ කය, නහර කය, අස්ථි කය, ඇටමිදුලු කය යයි කියන ලද කායයන් අනිත්‍ය වශයෙන් නුවණින් බලයි. ඒ සියල්ලම මෙම කයෙහිම නුවණින්

බලන හෙයින් කයෙහි කය අනුව බලයි යයි මෙසේද අර්ථ දතයුතුය. නොහොත් කයෙහි මම කියා හෝ මාගේය කියා හෝ මෙසේ ගතයුතු කිසිවක් නොබලන්නේ, ඒ ඒ කෙස්, ලොම් ආදී වූ, නොයෙක් කොටස් සමූහයාගේ ආත්මීය වශයෙන් ගතයුතු කිසිවක් ඇතැයි නොබලන්නේ, කෙස් ආදී කොටස් සමූහයයි කියනු ලබන කයෙහි කය අනුව බලන්නේ යයි මෙසේ අර්ථය දතයුතුය. තවද මේ කයෙහි අනිත්‍ය වශයෙන් නුවණින් බලයි. නිත්‍ය වශයෙන් නොබලයි යනාදී අනුක්‍රමයෙන් දැක්වූ සියලුම ක්‍රමයන්හි අනිත්‍ය ලක්‍ෂණාදී ආකාර සමූහ සංඛ්‍යාත වූ කයෙහි නුවණින් බලන හෙයින්ද, කයෙහි කය අනුව බලන්නේ යයි මෙසේද අර්ථය දතයුතුය. මෙය සිව් සිහි පිහිටුවීමට සාධාරණ අර්ථයයි. **කායෙ කායානුපස්සී** යනු ආශ්වාස, ප්‍රශ්වාස කය මුල්කොට විවිධාකාරයෙන් කියන ලද කායයන්හි එක් එක් කයෙහි නුවණින් බලන්නේ, **විහරති** මෙය සිව් ඉරියව් විහරණයන්හි එක්තරා විහරණයක එක්වීම විස්තර කිරීමකි. එක් ඉරියව්වක ගතකිරීමෙන් වන පීඩාව අනෙක් ඉරියව්වකින් සිඳ, තමා නොවැටෙන සේ ගෙනයයි. පවත්වයි යන අර්ථයි. **ආතාපී** යනු මෙය කය අල්ලාගැනීම් සංඛ්‍යාත වීර්යයෙහි එක්වීම විස්තර කිරීමකි. එය යම්හෙයකින් එසමයෙහි යම් ඒ වීර්යයක් වේද, එය ත්‍රිවිධ භවයන්හි කෙලෙසුන් තවන හෙයින් 'ආතාප' යයි කියනු ලැබේ. එයින් යුක්ත වූයේ වෙයි. එහෙයින් 'ආතාපී' යයි කියනු ලැබේ. **සම්පජානො** යනු කය පිළිබඳ විමසන සම්‍යක් ඥාණ සංඛ්‍යාත ඥාණයෙන් යුක්ත වූ, **සතිමා** යනු කය පිළිබඳ විමසන සිහියෙන් යුක්ත වූවා. මෙය වනාහි සිහියෙන් අරමුණ හාත්පසින් අල්ලා ප්‍රඥාවෙන් විමසා බලයි. සිහියෙන් තොර වූවහුට විමසා බැලීමෙක් නම් නැත. එහෙයින් කීහ. 'මහණෙනි, මම සිහිය වනාහි හැමතැන ප්‍රයෝජනවත් වූවක් යයි වදාරමි. එහෙයින් මෙහි කයෙහි කය අනුව බලමින් වාසය කරයි, යන මෙතෙකින් කායානුපස්සනා සතිපට්ඨාන කර්මස්ථානය යූ.සේයි. නොහොත්, යම්හෙයකින් කෙලෙස් තැවීමෙහි නියුක්ත නොවූවහුගේ ඇතුළත හැකිලීම අන්තරායකර වේ. මනා නුවණින් යුක්ත නොවූවෝ උපාය අල්ලා ගැනීමෙහිද, අනුපාය අත්හැරීමෙහිද මුළාවෙත්. මුළා සිහි ඇත්තේ උපාය අත්හැරීමෙහිද, අනුපාය අල්වා ගැනීමෙහිද අදක්‍ෂ වෙයි. එහෙයින් ඔහුගේ ඒ කර්ම ස්ථානය සමෘද්ධ නොවේ. එහෙයින් යම් ධර්මයන්ගේ ආනුභාවයෙන් එය සමෘද්ධ වේද, ඒවා(හි) දැක්වීම සඳහා 'කෙලෙස් තැවීමෙන් යුක්ත වූයේ සිහි ඇත්තේ, මනා නුවණින් යුක්ත වූයේ යන මෙය යූ.සේයි. මෙසේ කායානුපස්සනා සතිපට්ඨානයද, සම්ප්‍රයෝග අංගයන්ද

ඉදිරිපත්කොට, දැන් ප්‍රහාණ අංග දක්වන්ට ලෝකයෙහි අභිධ්‍යා දෝමනස්සයන් දුරුකොට යනාදිය කියන ලදී. එහි විනෙය්‍ය යනු තාවකාලික යටපත් කිරීමෙන් හෝ, මැඩපවත්වන යටපත් කිරීමෙන් යටපත්කොට, ලොකෙ යනු යම් ඒ ශරීරයක් මුලදී පරීක්‍ෂා කළේද, එයම කැඩීබිඳී යාම්, විනාශවීම් අර්ථයෙන් ලෝකය නම් වේ. එම ලෝකයෙහි **අභිජ්ඣා දොමනස්සයන්** දුරුකොට යන අර්ථයි. යම් හෙයකින් වනාහි මොහුට ශරීර මාත්‍රයෙහිම දැඩි ලෝභය හා දොම්නස පහව යන්නේ නොවේ. වේදනාවන්හිද පහව යේමය. එහෙයින් පස්වැදෑරුම් උපාදානස්කන්ධයන්ම ලෝකය යැයි විභංගයෙහි යූ.සේයි. ලෝක සංඛ්‍යාත වූ එම ධර්මයන්ගේ අර්ථ උදුරා දැක්වීම් වශයෙන් මෙය යූ.සේයි. යමක් වනාහි වදාළහ. එහි ලෝකය කවරේද? එම කයම ලෝකයයි මෙයම මෙහි යන අර්ථයයි. අභිජ්ඣා දොමනස්සං යනුවෙන් එක්කොට යූ.සේයි. සංයුත්ත අංගුත්තර නිකායන්හි වෙන්කොට කියවත්. එය වනාහි දැඩිව ලෝභ කරත්. ප්‍රාර්ථනා කරත්. තමා හෝ දැඩිව ලෝභ කරයි. දැඩි ලෝභ කිරීම් මාත්‍රයම මෙයනුයි = අභිජ්ඣායි. යම්හෙයකින් වනාහි මෙහි අභිධ්‍යා ග්‍රහණයෙන් කාමච්ඡන්දයද, දොමනස්ස ග්‍රහණයෙන් ව්‍යාපාදය සංග්‍රහයට යේද, එහෙයින් නීවරණයන්ට ඇතුළත් බලවත් ධර්මද්වය දර්ශනයෙන් නීවරණ ප්‍රහාණය යූසේයි. විශේෂයෙන් වනාහි, දැඩි ලෝභය විනාශ කිරීමෙන්, කාය සම්පත් මූලික එකඟ බවද, දොම්නස විනාශ කිරීමෙන් කාය විපත්ති මූලික විරුද්ධත්වයෙහිද, දැඩි ලෝභය විනාශ කිරීමෙන් ශරීරයෙහි නොවූ සුභ, සුව ස්වභාව ආදීන්ගේ ඇතුල්කිරීමද, දොම්නස විනාශ කිරීමෙන් ශරීරයෙහි වූ අශුභ, අසුව ස්වභාවාදීන්ගේ ඉවත් කිරීමට ආධාර වන ප්‍රහාණය කියන ලදී. ඉන් යෝගාවචරයාගේ, යෝගයෙහි තේජසද, යෝග සමර්ථතාවද දක්වන ලදී. යෝගානුභාව යනු එකඟත්වයෙන් හා විරුද්ධත්වයෙන් මිදුණේ නොඇල්ම හා ඇල්ම ඉවසන සුලුවූයේ, නොවූවිරූ දෑ ඇතුල් කිරීමද, වූ දෑ ඉවත් කිරීමෙන් වෙන්වූයේම වේ. එකඟත්වය හා විරුද්ධත්වයෙන් මිදුණු මොහු, නොඇල්ම හා ඇල්ම ඉවසන්නේ, නොවූ දෑ ඇතුල් නොකරන්නේ, වූ දෑ ඉවත් නොකරන්නේ යෝග සමර්ථ වේයයි කියයි. වෙනත් ක්‍රමයක්. කායෙ කායානුපසසී යන මෙහි නුවණින් බැලීමෙහි කමටහන කියන ලදී. 'විහරති' යන මෙහි කියන ලද විහරණයෙන් කර්මස්ථානිකයාගේ කය පවත්වාගැනීම ආතාපී යන ආදීන්හි කෙලෙස් තැවීමෙන් සම්‍යක් ප්‍රධානයද, සිහියෙන් හා මනා දැනුමෙන් හැමතැන ප්‍රයෝජනවත් වන කර්මස්ථානයද, කර්මස්ථාන පරිහරණ උපාය මාර්ගයන්ද දැක්වේ. සිහියෙන් කායානුපස්සනා වශයෙන්

ලද සමථයද විමසුම් නුවණින් විදර්ශනාවද, අභිධ්‍යාව හා දොම්නස විනාශ කිරීමෙන් භාවනා ඵලයද යු.සේයි. වෙදනාසු වෙදනානුපසසී යන ආදීන්හිද, වේදනාදීන්ගේ නැවත කීමෙහි ප්‍රයෝජනය කායානුපස්සනාවෙහි කියන ලද ක්‍රමයෙන්ම සුදුසු පරිදි යොදා දැනගත යුතුයි. මෙය වනාහි අසාධාරණ අර්ථයයි. සුව ආදී නොයෙක් ආකාර ප්‍රභේද ඇති වේදනාදීන්හි, වෙන් වෙන්ව අනිත්‍යාදී වශයෙන්, එක් එක් වේදනා නුවණින් බලන්නේ යයි සරාගාදි සොළොස් ප්‍රභේද සිතෙහි වෙන් වෙන්ව අනිත්‍යාදී වශයෙන් එක් එක් සිත නුවණින් බලන්නේ යයි කාය, වේදනා චිත්තයන් හැර, සෙසු ත්‍රෛභූමික ධර්මයන්හි, වෙන් වෙන්ව අනිත්‍යාදි වශයෙන් එක් එක් ධර්මයන් නුවණින් බලන්නේ යයි, සතිපට්ඨාන සූත්‍රාන්තයෙහි කියන ලද ක්‍රමයෙන්, නීවරණාදී ධර්මයන් බලන්නේ යයි යන ක්‍රමයට දතයුතුය. මෙහිද ශරීරයෙහි යයි ශරීරය එකක් බැවින් ඒකවචනයෙන් යෙදී ඇත. සිතෙහි ස්වභාව භේද නොමැති හෙයින් ජාති ග්‍රහණයෙන් සිතෙහි යයි ඒකවචන කරන ලදැයි දතයුතුය. යම්සේ වේදනාදීහු නුවණින් බැලිය යුතු වේද? එසේ නුවණින් බලන්නේ වේදනාවන්හි වේදනාව නුවණින් බලන්නේ, සිතෙහි සිත නුවණින් බලන්නේ. ධර්මයන්හි ධර්මයන් නුවණින් බලන්නේ යයි දතයුතුය. පළමුව වේදනාව කෙසේ නුවණින් බැලිය යුතු වන්නේද? පළමුව සුව වේදනාව, දුක් වශයෙන්ද, දුක් වේදනාව හුලක් වශයෙන්ද නොදුක් නොසුව වේදනාව අනිත්‍යය වශයෙන්ද නුවණින් බැලිය යුත්තේය. දෙසූ පරිදි,

යො සුඛං දුක්ඛතොදක්ඛි - දුක්ඛ මද්දක්ඛි සල්ලතො
අදුක්ඛමසුඛං සනතං - අද්දක්ඛි නං අනිච්චතො
ස වෙ සච්චද්දසොභික්ඛු - පරිජානාති වෙදනා'ති

යමෙක් සුව, දුක් වශයෙන් දුටුයේද? දුක හුලක් වශයෙන් දුටුයේද? ශාන්ත උපේක්ෂා වේදනාව අනිත්‍ය වශයෙන් දුටුයේද, සත්‍යය දකින්නා වූ ඒ භික්ෂුව, ඒකාන්තයෙන් වේදනාව විශේෂයෙන් දැනගනී.

මේ සියල්ලම දුක් වශයෙන්ද නුවණින් බැලිය යුත්තාහුය. මෙය කියන ලද්දේමය. යම්කිසි විඳීමක් වේද, ඒ සියල්ලම දුකයයි වදාරමි යනුවෙනි. සුවදුක් වශයෙන්ද නුවණින් බැලිය යුත්තාහ. දෙසූ පරිදි, සුව වේදනාව පැවැත්මෙහි සුව ඵලවයි. වෙනස්වීමෙහිදී දුක්ය, දුක් වේදනාව පැවැත්මෙහි දුක් ඵලවයි. වෙනස්වීමෙහිදී සුව ගෙනදේ. උපෙක්ෂා වේදනාව දැනීමෙහිදී සුව ගෙන දේ. නොදැනීමෙහිදී දුක් ගෙනදේ. තවද අනිත්‍යාදී

සත් අනුපස්සනා වශයෙන්ද, නුවණින් බැලිය යුතුය. චිත්ත, ධර්ම අනුපස්සනාවන්හිද, පළමුව සිත, ආරම්මණාධිපති, සහජාත භූමි, කර්ම විපාක, ක්‍රියා ආදී නොයෙක් භේදයන්ගේද, අනිත්‍යාදී සත් අනුපස්සනා -වන්ගේ සරාගාදී සොළොස් භේදයන්ගේද, වශයෙන් නුවණින් බැලිය යුතුය. ධර්ම ලකුණු සහිත, සමානත්ව ලක්‍ෂණයන්ගේ වශයෙන්ද, ශූන්‍යතා ධර්මයෙහි අනිත්‍යාදී සත් අනුපස්සනාවන්ගේ, සන්සුන්, නොසන්සුන් ආදි වශයෙන්ද බැලිය යුත්තාහ. මෙහි යමෙකුගේ කාය සංඛ්‍යාත ලෝකයෙහි ඒකාන්තයෙන් අභිධ්‍යා-දෝමනස්සයන් ප්‍රහීණ වූයේද, ඔහුට වේදනාදී ලෝකයන්හිද එය ප්‍රහීණ වූයේමය. විවිධ පුද්ගලයින්ගේ වශයෙන් විවිධ ක්‍ෂණික සතිපට්ඨාන භාවනා වශයෙන්ද හැමතැන කියන ලදී. යම්කලෙක එකට ප්‍රහීණ වූයේද, සෙස්සද ප්‍රහීණ වේ. එහෙයින්ම එහි ප්‍රහාණ දැක්වීම සඳහා මෙය කියන ලද්දේයයි දතයුතුය. මෙසේ මේ සතර සතිපට්ඨාන පූර්වභාගයෙහි නොයෙක් සිත්වල ලබයි. අන් සිතකින්ම කය පරීක්‍ෂා කෙරේ. අන් සිතකින් වේදනාව, අන් සිතකින් සිත, අන් සිතකින් ධර්මයන් පරීක්‍ෂා කෙරේ. ලෝකෝත්තර මාර්ගක්‍ෂණයෙහි වනාහි එක් සිතෙහිම ලබත්. මුලදී කය පරීක්‍ෂාකොට පැමිණියහුගේ විදර්ශනාව හා එක්වූ සිහිය කායානුපස්සනා නම් වේ. ඒ සිහියෙන් යුත් පුද්ගලයා කායානුපස්සී නම් වේ. විදර්ශනාව උත්සාහවත් කොට ආර්ය මාර්ගයට පැමිණියහුට මාර්ගක්‍ෂණයෙහි මාර්ග හා එකට යෙදුණු සිහිය ධර්මානුපස්සනාව නම් වේ. ඒ සිහියෙන් යුත් පුද්ගලයා ධර්මානුපස්සී නම් වේ. මෙසේ මෙම දේශනා පළමුව පුද්ගලයන් කෙරෙහි සිටි. ශරීරයෙහි සුභය යන විපර්යාස ප්‍රහාණවන අයුරින් සිරුර හාත්පසින් පරීක්‍ෂා කිරීම් සංඛ්‍යාත සිහිය, මාර්ගයෙන් සමෘද්ධ වේනුයි - කායානුපසසනා නම් වේ. වේදනාව සුවයයි යන විපර්යාස ප්‍රහාණයෙන් වේදනාව හාත්පසින් පරීක්‍ෂා කිරීම් සංඛ්‍යාත සිහිය මාර්ගයෙන් සමෘද්ධ වේනුයි වේදනානුපස්සනා නම් වේ. සිතෙහි නිත්‍යයයි යන විපර්යාස ප්‍රහාණයෙන් හාත්පසින් පරීක්‍ෂා කිරීම් සංඛ්‍යාත සිහිය මාර්ගයෙන් සමෘද්ධ වේනුයි චිත්තානුපසසනා නම් වේ. ධර්මයන්හි ආත්මයයි විපර්යාස ප්‍රහාණයෙන් ධර්ම හාත්පසින් පරීක්‍ෂා කිරීම් සංඛ්‍යාත සිහිය මාර්ගයෙන් සමෘද්ධ වේනුයි ධම්මානුපසසනා නම් වේ. මෙසේ එකම මාර්ග සම්ප්‍රයුක්ත සිහිය සිවු කිස් සිදුකරන අර්ථයෙන් නාමයන් සතරෙක් ලබයි. එහෙයින් කියන ලදි. ලෝකෝත්තර මාර්ගක්‍ෂණයෙහි වනාහි එක් සිතෙහිම ලබත්.

සම්මා සමාධි නිර්දේශයෙහි, විවිච්චෙව කාමෙහි කාමයන්ගෙන්

වෙන්වී, නැතිව, ඉවත්ව, මෙහි යම් ඒ 'ඒව'කාරයක් වේද, නොවෙනස්ව සිදුවිය යුතුය යන අර්ථයෙහි දතයුතුය. යම්හෙයකින් නියමාර්ථයද යත්? එහෙයින් ප්‍රථමධ්‍යානයට එළඹ වසන සමයෙහි අවිද්‍යමාන වූද කාමයන්, ඒ ප්‍රථමධ්‍යානයට විරුද්ධ බව, කාම පරිත්‍යාගයෙන්ම ඔහුට ධ්‍යානාධිගමය දක්වයි. මෙම ධ්‍යානයට කාමයෝ විරුද්ධ වූවාහු නොවෙත්ද? යම් දෑ ඇති කල්හි මෙය නොපවතීද අඳුර ඇති කල්හි පහන් ආලෝකය මෙනි. එම කාමයන්ගේ අත්හැරීමෙන්ම ඔහුට අධිගමය වන්නේය. මෙතෙර අත්හැරීමෙන් පරතෙරට පැමිණෙන්නාක් මෙනි. එහෙයින් නොවෙනස් විය යුත්ත ප්‍රකාශ කරයි. මෙය පළමු පදයෙහිම කියන ලදුයේ ඇයි? මතු පදයෙක්හි සඳහන් නොවූයේ ඇයි? කිමෙක්ද? අකුසල ධර්මයන්ගෙන් වෙන් නොවූයේම, ධ්‍යානයන්ට පැමිණ වාසය කරන්නේද? එය මෙසේ නොදැකිය යුතුය. ඉන් නිදහස්වන හෙයින් පළමු පදයෙන්ම එය කියන ලදී. කාමධාතුන් ඉක්මවන හෙයින්ද, කාමරාගයට විරුද්ධ හෙයින්ද මෙම ධ්‍යානය කාමයන්ගේම නිදහස්වීමයි. දෙසූ පරිදි:- යම් ඒ නෛෂ්ක්‍රම්‍යයක් වේද, එය කාමයන්ගේම නිදහසයි. මතු පදයෙහිද සඳහන් පරිදි, මහණෙනි, ශ්‍රමණයා මේ ශාසනයෙහිමය. දෙවන ශ්‍රමණයාද මේ ශාසනයෙහිමය.

මෙහි 'එව'කාරය ගෙනවුත් කියයි. මෙසේ කිවයුතුය. මෙයින් අන්‍යවූද නීවරණ සංඛ්‍යාත අකුසල ධර්මයන්ගෙන් වෙන් නොවී ධ්‍යානයට පැමිණ වාසය කරන්ට නොහැකිය. එහෙයින් කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම යයි මෙසේ පදද්වයෙහිම මෙය දතයුතුය. පද ද්වයෙහිම කිසිසේත් විවිච්ච යන මෙම සාධාරණ වචනයෙන්, තදංග, විෂ්කම්භන, සමුච්ඡෙද, පටිප්පස්සද්ධි, නිස්සරණ යන විවේකයෝද චිත්ත, කාය, උපධි යන විවේකයෝද සංග්‍රහයට යෙති. එසේම පූර්වභාගයෙහි කාය විවේක, චිත්ත විවේක, විෂ්කම්භන විවේකයන් දතයුත්තාහ. ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි කාය විවේක, චිත්ත විවේක, සමුච්ඡෙද විවේක පටිප්පස්සද්ධි විවේක, නිස්සරණ විවේකයන් දතයුත්තාහ. කාමෙහි යන මෙම පදයෙන්, මහා නිර්දේශයෙහි යම් ඒ වස්තුකාමයෝ කවරහුද, සිත් අලවන රූපයෝය, ආදී ක්‍රමයෙන් වස්තුකාම කියන ලදී. යම් ඒ එම විභංගයෙහිම, කැමැත්ත කාමයයි, ඇල්ම කාමයයි. කැමැත්ත හා ඇල්ම කාමයයි. සිතිවිල්ල කාමයයි. ඇල්ම කාමයයි. සිතිවිල්ල හා ඇල්ම කාමයයි. මෙසේ කෙලෙස් කාම කියන ලදී. ඒ සියලුම සංගෘහිතයන් මෙසේ යයි දතයුත්තාහ. මෙසේ ඇතිකල්හි කාමයන්ගෙන් වෙන්වම යන්නෙන් වස්තු

කාමයන්ගෙන් වෙන්වම යැයි අර්ථය යෙදේ. එයින් කාය විවේකය යුසේයි. විවිච්ච අකුසලෙහි ධම්මෙහි යනු ක්ලේශ කාමයන්ගෙන්ද, සියලු අකුසලයන්ගෙන්ද වෙන්ව යයි අර්ථය යෙදේ. එයින් චිත්ත විවේකය යුසේයි. මෙහි ප්‍රථම දෙපදයෙන් වස්තු කාමයන්ගෙන් වෙන්වීම් වචනයෙන් කම්සුව පරිත්‍යාගයම දක්වයි. දෙවන දෙපදයෙන් ක්ලේශ කාමයන්ගෙන් වෙන්වීම් වචනයෙන් නෛෂ්ක්‍රම්‍ය සුවය අල්ලා ගැනීම විස්තර කරන ලද්දේ වෙයි. මෙසේ වස්තුකාම ක්ලේශ කාමයන්ගෙන් වෙන්වීම් වචනයෙන්ම, ඔවුන්ගේ ප්‍රථම ද්වයයෙන්, කිලුටුවීමේ හේතු ප්‍රහාණයද, ද්විතීය ද්වයයෙන්, කිලුටුවීම් ප්‍රහාණයද දක්වයි. පළමුවැන්නෙන් බලවත් ආශාවගේ හේතු අත්හැරීමද, දෙවැන්නෙන් අඥාන භාවයාගේ ප්‍රහාණයද, පළමුවැන්නෙන් උපාය ශුද්ධියද, දෙවැන්නෙන් සිතෙහි පවත්නා ස්වභාව පෝෂණය මනාකොට දක්වන ලද්දේ වේයයි දතයුතුය. මේ එහි ක්‍රමයයි. කාමයන්ගෙන් යනු, මෙහි කියන ලද කාමයන් අතර වස්තුකාම පක්‍ෂයෙහිය. ක්ලේශකාම පක්‍ෂයෙහි කැමැත්තය ඇල්මය යන මේ ආදී නොයෙක් ප්‍රභේද සහිත කාමච්ඡන්දයම කාමයයි අදහස් කරන ලදි. එයද අකුසලයන්ට ඇතුළත් වූයේම 'එහි කාමච්ඡන්දය කවරේද? කාමය' ආදී ක්‍රමයෙන් විභංගයෙහි මතු ධ්‍යානාංගයන්ට විරුද්ධ හෙයින් වෙන්ව කියන ලද්දේය. ක්ලේශ කාමයන් බැවින් මුල්පදයෙහි කියන ලදී. දෙවන පදයෙහි අකුසලයන්ට අයත්ය. නොයෙක් භේද වශයෙන් ඇති මෙය කාමයෙන් යයි නොකියා කාමයන්ගෙන් යයි කියන ලදී. අනෙක් ධර්මයන්හිද අකුසලභාවයන් විද්‍යමාන කල්හි, එහි අකුසල ධර්මයෝ කවරහුද? කාමච්ඡන්දයයි ආදී ක්‍රමයෙන් විභංගයෙහි මතු ධ්‍යානාංගයන්ට විරුද්ධ බව දක්වන හෙයින් නීවරණයන්ම කියන ලද්දාහ. නීවරණයෝ ධ්‍යානාංගයන්ට විරුද්ධ වූවාහු වෙති. ඒවාට ධ්‍යානාංගයන්ම විරුද්ධ වූවාහු, නසන්නාහු, විනාස කරන්නාහු යයි යු.සේයි. එසේම, සමාධිය කාමච්ඡන්දයට, ප්‍රීතිය ව්‍යාපාදයට විතර්කය ථීනමිද්ධයට, සැපය උද්ධච්ච කුක්කුච්චයට, විචාරය විචිකිච්ඡාවට විරුද්ධයයි පේටකයෙහි කියන ලදී. මෙසේ මෙහි, විවිච්චෙව කාමෙහි යන මෙයින් කාමච්ඡන්දයාගේ විෂ්කම්භන වශයෙන් වෙන්වීම යුසේයි. 'විවිච්ච අකුසලෙහි ධම්මෙහි' යන මෙයින් පස්වැදෑරුම් නීවරණයන්ගේ වෙන්වීම දක්වයි. නොගතයුතු දේ ගැනීම් සංඛ්‍යාත පළමුවැන්නෙන් කාමච්ඡන්දයද දෙවැන්නෙන් සෙසු නීවරණයන්ගේද, එසේම පළමු වැන්නෙන් ත්‍රිවිධ අකුසල මූලයන්හිද, පංච කාමගුණ භේදයන්ට විෂය වූ ලෝභයාගේද, ක්‍රෝධ කිරීම් ආදී භේදයන්ට හේතුවන ද්වේෂ, මෝහයන්ගේද, ඕඝාදී ධර්මයන්හි.

පළමුවැන්නෙන්, කාම ඕඝ, කාමයෝග, කාමාසව, කාම උපාදාන, අභිධ්‍යාකාය ග්‍රන්ථ-කාමරාග සංයෝජනයන්ගේද, දෙවැන්නෙන් සෙසු ඕඝ, යෝග, ආස්‍රව, උපාදාන, ග්‍රන්ථ ආදී සංයෝජනයන්ගේද, පළමු වැන්නෙන් තෘෂ්ණාවෙහි හා ඒ හා සමග යෙදුණුවුන්ගේද, දෙවැන්නෙන් අවිද්‍යාවෙහි හා ඒ හා සමග යෙදුණුවුන්ගේද, තවද පළමුවැන්නෙන්, ලෝභ සම්ප්‍රයුක්ත අෂ්ට චිත්තොත්පාදයන්ගේද, දෙවැන්නෙන් ඉතිරි සිවු අකුසල චිත්තොත්පාදයන්ගේ විෂ්කම්භන වශයෙන් වෙන්වීම කියන ලද්දේයයි දතයුතුයි.

මෙපමණකින් ප්‍රථම ධ්‍යානයාගේ ප්‍රහාණාංග දක්වා එක්ව යෙදෙන කරුණු දැක්වීමට, **සවිතක්කං සවිචාරං** ආදිය කියන ලදී. එහි අරමුණෙහි සිත යොමුකිරීම් ලක්ෂණය **විතක්කොයි.** අරමුණ පිරිමදින ලක්ෂණය, **විචාරො** = විචාරයයි. කිසිතැනෙක්හි ඒවාහි වෙන් නොවීමක් ඇති කල්හිද, දැඩි අර්ථයෙන්ද පූර්වාංගම අර්ථයෙන්ද ඝණ්ඨාරයක හැපීම මෙන්, සිතෙහි පළමු හෙළීම **විතක්කො** විතර්කයයි. සියුම් අර්ථයෙන්ද, පිරිමදින ස්වභාවයෙන්ද ඝණ්ඨාරයෙහි දෝංකාරය මෙන් ඒ අනුව බැඳුණේ **විචාරො** විචාරයයි. මෙහි පැතිරීම් ස්වභාවයෙන් යුත් විතර්කය ප්‍රථමයෙන් හටගන්නා කාලයෙහි, චිත්තයාගේ වෙවුලන ස්වභාව ඇත්තේ. අහසෙහි උඩට නගින්ට කැමති පක්ෂියාගේ පියාපත් විසිරවීම මෙන්ද, ගන්ධයට (සුගන්ධ-දුගන්ධ) බැඳුණු සිත් ඇති බඹරාගේ නෙලුම්මල ඉදිරියෙහි පතිත වන්නාක් වැනි ස්වභාවයෙන් යුක්තය. විචාරය අතිශය වෙවුලුම් ස්වභාව නොමැත්තේ, අහස්හි උඩට නගින්ට කැමැති පක්ෂියාගේ පියාපත් දිගහැරීම මෙන්ද, කැරැකීම මෙන්ද, නෙලුම්මල ඉදිරියෙහි පතිත වූ බඹරාගේ, නෙලුම්මල මත්තෙහි සිටින ආකාරය මෙන් සිතෙහි සන්සුන් පැවැත්මයි. දුක නිපාතට්ඨ කථාවෙහි, අහසෙහි ගමන් කරන විශාල පක්ෂියෙකුගේ දෙපියාපත්වලින්, වාතය ගෙන පියාපත් සන්සිඳුවා (තටු නොගසා) ගමන් කරන්නාක් මෙන්, අරමුණෙහි චිත්තයාගේ නංවන ස්වභාවයෙන් පැවැත්තේ, විතර්ක යයිද, වාත ග්‍රහණය සඳහා පියාපත් සොලවමින් යන්නාක් මෙන් පිරිමැදීම් ස්වභාවයෙන් පැවැත්තේ විචාරයයි යූසේයි. එය නොසිඳී පැවැත්ම වශයෙන් ප්‍රවෘත්තියෙහි යෙදේ. ඒවාහි එම විශේෂතාවය ප්‍රථම ද්විතීය ධ්‍යානයන්හි ප්‍රකට වේ. තවද මලබැඳුණු ලෝහ බඳුනක් එක් හස්තයකින් දැඩිව අල්ලා, අනෙක් හස්තයෙන්, හුණු තෙල් බුරුසුවකින් පිරිමදින්නහුගේ දැඩිව ගන්නා හස්තය මෙන් විතර්කයද පිරිමදින හස්තය මෙන් වූයේ විචාරයයි. එසේම දඬු පහරින් චක්‍රය

කරකවා බඳුන තනන කුඹල්කරුගේ මඩින හස්තය මෙන් විතර්කයද, ඔබිනොබ සරන හස්තය මෙන් විචාරයද වේ. වටරවුමක් කරන්නහුගේ, මධ්‍යය ආවරණයකොට, සිටවූ ලී හුලක් මෙන් අරමුණට යොමුකිරීම විතර්කයයි. පිටත කැරකෙන හුල මෙන් පිරිමැදීම විචාරයයි. මෙසේ මේ විතර්කයෙන්ද, මේ විචාරයෙන්ද, පුෂ්ප, ඵල සහිත වෘක්ෂයක් මෙන් මෙම ධ්‍යානය පවතී. මෙම ධ්‍යානය විතර්ක සහිතයයිද, විචාර සහිත යයිද යු.සේයි. **විවෙකජං** යන මෙහි වෙන්වීමට පත්වීම, විවේකය, නීවරණයන් පහවීමය යන අර්ථයි. වෙන්වීමට පත් වූයේනුයි විවේකයි. නීවරණයන්ගෙන් වෙන්වූ ධ්‍යානයන් එකට යෙදුණු ධර්මරාශියය යන අර්ථයි. එම විවේකයෙන් හෝ එම විවේකයෙහි හෝ හටගත්තේනුයි විවෙකජං නම් වේ. **පීතිසුඛං** යනු මෙහි සතුටට පත් කෙරේනුයි ප්‍රීතියි. එය ප්‍රියකරන ලක්ෂණ ඇත්තේය. එය වනාහි ඛුද්දිකා ප්‍රීති, ඛණිකා ප්‍රීති, ඔක්කනතිකා ප්‍රීති, උබ්බෙගා ප්‍රීති, ඵරණ ප්‍රීති යයි පස්වැදෑරුම් වේ. එහි කුඩා ප්‍රීතිය සිරුරෙහි ලොම් ඩැහැගැනීම් මාත්‍රයක්ම කරන්ට හැකිවේ. ක්ෂණික ප්‍රීතිය ක්ෂණයක් ක්ෂණයක් පාසා විදුලිය උපදින්නාක් (වැටෙන්නාක්) මෙන් වේ. ඔක්කනතිකා ප්‍රීතිය මුහුදුතෙර රළ මෙන් ශරීරයට ඇතුල්ව ඇතුල්ව බිඳෙයි. උද්වේග ප්‍රීතිය බලවත් වෙයි. ශරීරය ඔසවා අහසට පැන්නවීමේ ප්‍රමාණයට පත්වූ ප්‍රීතියයි. ඵරණ ප්‍රීතිය ඉතා බලවත්ය. එය උපන් කල්හි මුලු සිරුර පිඹ පිරූ වස්තියක් (මුත්‍රාශය) මෙන්ද, ඇතුළට වන් සැඩදිය පහරින් පිරිගිය පර්වත කුහරක් මෙන්ද, හැමතැන පිරී ඉතිරී ගියේ වෙයි. ඒ පස්ආකාර වූ ප්‍රීතිය ගැබ් ගන්වනුයේ, මේරීමට යනුයේ කයෙහි ශාන්ත බවද, සිතෙහි ශාන්ත බවද යන දෙවැදෑරුම් ශාන්ත භාවයන් සම්පූර්ණ කරයි. සන්සිඳීම ගැබ් ගන්වන්නී මේරීමට යන්නී කායික වූද, චෛතසික වූද, දෙවැදෑරුම් සුවය සම්පූර්ණ කරයි. සුවය ගැබ් ගන්වන්නේ මේරීමට යන්නේ ක්ෂණික සමාධි, උපචාර සමාධි, අර්පණා සමාධි යන ත්‍රිවිධ සමාධිය සම්පූර්ණ කරයි. ඒවාහිද යම් අර්පණා සමාධියට මූලාධාරය වී වැඩෙනුයේ, සමාධිය හා එක්වූ යම් ඵරණා ප්‍රීතියක් වන්නේද, මෙය මේ අර්ථයෙහි අදහස් කළ ප්‍රීතියයි. අනික වනාහි සුවපත් කෙරේනුයි - සුඛ නම් වේ. යමෙකුට එය උපදීද? ඔහු සුවපත් කෙරේයයි යන අර්ථයි. සැපය වේනුයි - සුඛ නම් වේ. මනාව කඩා කයි. කයෙහි හා සිතෙහි රෝග සාරා දමයිනුයි = සුඛ නම් වේ. සොම්නස් වේදනාවට මෙය නමකි. එය මධුර ස්වභාවය ගෙන දේ. කිසිතැනෙක්හි ඒවාහි විප්‍රයෝගයක් නොමැති කල්හි ශුභ අරමුණු ලැබීමෙන් වන සතුට ප්‍රීතියයි. ලද රස අනුභවය සුවයයි. යම්තැනක ප්‍රීතියද, එතැන සුවයයි. යම්තැනක සුවයද

එතැන නියම වශයෙන් ප්‍රීතිය ඇත. ප්‍රීතිය සංස්කාර ස්කන්ධයට ඇතුළත්ය. සුවය වේදනාස්කන්ධයට ඇතුළත්ය. කාන්තාරයේ වෙහෙසට පත්වූවහුට වනාන්තරය හා දිය දැකීමෙහි, ඇසීමෙහි ලබන සතුට ප්‍රීතියයි. වන සෙවනට පිවිස දිය පරිභෝජනය කරන්නාක් මෙනි සුවය. ඒ ඒ අවස්ථාවන්හි ප්‍රකට භාවයෙන් මෙය කියන ලදැයි දතයුතුය. මෙසේ මේ ප්‍රීතියද, මේ සුවයද මේ ධ්‍යානයට වන්නේනුයිද, මෙම ධ්‍යානයෙහි ඇත්තේනුයිද මෙම ධ්‍යානය ප්‍රීති සුවයයි කියනු ලැබේ. නොහොත්, ප්‍රීතියද සුවයද ප්‍රීති සුවයයි. ධර්ම විනයාදීන් මෙනි. විවේකයෙන් හටගත් ප්‍රීති සුවය මේ ධ්‍යානයටනුයි. මෙම ධ්‍යානයෙහි ඇත්තේනුයි මෙසේද විවේකජ ප්‍රීති සුඛං නම් වේ. ධ්‍යානය යම්සේද මෙහි ප්‍රීතිය හා සුවයද විවේකයෙන් හටගත්තේම වේ. මෙය මොහුට ඇත්තේනුයි එහෙයින් අලොප් සමාසය කොට එක් පදයෙන්ම විවේකජං පීති සුඛංයයි කියන්ට සුදුසුයි. **පඨමං** ගණන් අනුපිළිවෙළින් පළමුවැන්නයි. පළමුව හටගත්තේනුයිද ප්‍රථමයි. ඣානං යනු ධ්‍යානය දෙයාකාරයි. අරමුණ නැවත නැවත සිතීමේ ධ්‍යානයද, ස්වභාවය නැවත නැවත සිතීමේ ධ්‍යානයද වශයෙනි. එහි අටසමවත් පෘථුවි කසිණාදී අරමුණු නැවත නැවත සිතත්නුයි, ආරම්මණූපනිජ්ඣධානයයි යන සංඛ්‍යාවට ගියාහුය. විදර්ශනා මාර්ගඵල ස්වභාවය නැවත නැවත සිතීමේ ධ්‍යාන නම් වේ. එහි විදර්ශනාව අනිත්‍යාදී ලක්ෂණයාගේ ස්වභාවය නැවත නැවත සිතන හෙයින් ලක්ෂණූ පනිජ්ඣධ්‍යානයයි. විදර්ශනාවෙන් කරන ලද කෘත්‍ය ඇත්තහුට, මාර්ගයෙන් ඉතිරිය ඉටුවන හෙයින් මාර්ගය ලක්ඛණූපනිජ්ඣධානයි. ඵලය වනාහි නිරෝධ සත්‍යයද, සත්‍ය ලක්ෂණයද නැවත නැවත සිතයිනුයි ලක්ඛනූපනිජ්ඣධානයි. ඔවුන් අතරෙහි මෙහි පූර්ව භාගයෙහි ආරම්මනූපනිජ්ඣධානයද ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි ලක්ඛණූ පනිජ්ඣධානයද අදහස් කරන ලදී. එහෙයින් ආරම්මණූපනිජ්ඣධානයෙන්ද, ලක්ඛණූපනිජ්ඣධානයෙන්ද විරුද්ධ ධර්මයන් දවන හෙයින් ධ්‍යානයයි දතයුතුය. **උපසම්පජ්ජ** යනු එළඹ, පැමිණයයි යූසේයි. ඇතුළත් කරවා හෝ නිපදවායි යූ.සේයි. **විහරති** යනු ඊට අනුරූප ඉරියව් විහරණයෙන් මෙසේ කියන ලද ආකාර ධ්‍යානයෙන් යුක්තවී ආත්මභාවයාගේ පැවැත්ම මනාව නිෂ්පාදනය කරයි. **විතක්ක විචාරානං වූපසමා** යනු මෙහි විතර්කයාගේද, විචාරයාගේද මේ ද්වයයෙහි සන්සිඳීමෙන් ඉක්මවීමෙන්, ද්විතීය ධ්‍යානක්ෂණයෙහි පහළ නොවේයයි යූ.සේයි. එහි කිසිසේත් ද්විතීය ධ්‍යානයෙහි, සියලුම ප්‍රථමධ්‍යාන ධර්ම නොමැත. ප්‍රථමධ්‍යානයෙහි ස්පර්ශාදීහු අනෙකක්හු වේමය. මෙහි අනෙකක්හුය. දළ, දළ අංග

ඉක්මවීමෙන්, ප්‍රථමධ්‍යානයෙන් අන්‍ය, ද්විතීය ධ්‍යානාදීන්ගේ අධිගමය වේයයි දැක්වීමට, විතක්ක විචාරානං වූපසමා යන මෙය යූ.සේයි. **අජ්ඣත්තං** යනු මෙහි තමා අයත් ආධ්‍යාත්මය අදහස් කරන ලදී. එහෙයින් තමා කෙරෙහි හටගත්, තම සන්තානයෙහි හටගත්තේය යන අර්ථයි. **සම්පසාදනං** යනු, ශ්‍රද්ධාව සම්පසාදනයයි කියනු ලැබේ. සම්ප්‍රසාදන යෝගයෙන් ධ්‍යානයද සම්ප්‍රසාදනයි. නීලවර්ණ යෙදීමෙන් නිල් වස්ත්‍රය මෙනි. යම්හෙයකින් එම ධ්‍යාන සම්ප්‍රසාදනය සමග යුක්ත වූ හෙයින්, විතර්ක විචාර කැළඹීම සන්සිඳීමෙන්ද සිත සතුටට පත්වේ. එහෙයින්ද සම්පසාදනං යයි කියන ලදී. මෙම අර්ථ විකල්පයෙහි සිතෙහි සතුටයයි මේ පද සම්බන්ධය දතයුතුය. පළමු අර්ථ විකල්පයෙහි චෙතසො යනු මෙසේ සිතෙහි එකඟ බව සමග යෙදිය යුතුයි. එහි මේ අර්ථ යෙදීමයි. තනිව පහළවේනුයි - එකොදියි. විතර්ක විචාරයන් උස්ව නොනැගී අග්‍රව ශ්‍රේෂ්ඨව පහළවේයි අර්ථයි. ලෝකයෙහි ශ්‍රේෂ්ඨයාද තනියා යයි කියනු ලැබේ. විතර්ක විචාරයන් රහිතව තනිව අසහාය වී, මෙසේද කීම සුදුසුය. නොහොත් එකට යෙදුණු ධර්මයන් නැගිටුවයිනුයි උදි නම් වේ. නංවයි යන අර්ථයි. ශ්‍රේෂ්ඨාර්ථයෙන් තනිව හෝ නැගිටීනුයි එකොදියි. සමාධියට මෙය නාමයකි. මෙසේ මේ සමාධිය දියුණු කරයි. වඩයිනුයි මේ දෙවන ධ්‍යානයාගේ එකොදි භාවයයි. ඒ මේ එකොදිභාවය, සත්ත්වයෙකුගේ නොවී, ජීවයක නොවී, යම්හෙයකින් සිතෙහි වන්නේද, එහෙයින් මෙය **චෙතසො එකොදි භාවං** යයි කියන ලදී. මෙම ශ්‍රද්ධාව ප්‍රථමධ්‍යානයෙහිද ඇත්තේ නොවේද? නැවත කුමක් හෙයින් මෙම සමාධියම සම්පසාදනං චෙතසො එකොදි භාවං යයි කියන ලද්දේද යත්? කියනු ලැබේ. මෙම ප්‍රථමධ්‍යානය විතර්ක විචාරයන්ගේ කැළඹීමෙන්, රළ තරංගයන්ගෙන් ගැවසීගත් ජලය මෙන් සුපසන් නොවේ. එහෙයින් ශ්‍රද්ධාව ඇති කල්හිද සම්ප්‍රසාදනයයි නොකියන ලදී. සුපසන් නොවන බැවින්ම මෙහි මෙම සමාධියද මනාව ප්‍රකට නොවේ. එහෙයින් එකොදිභාවං යයි නොකියන ලදී. මෙම ධ්‍යානයෙහි වනාහි විතර්ක විචාර පළිබෝධ අභාවයෙන්, ලද අවකාශ ඇති ශ්‍රද්ධාව බලවත්ය. බලවත් ශ්‍රද්ධාවගේ සහායෙන් ප්‍රතිලාභයෙහිදීම සමාධියද ප්‍රකටය. එහෙයින් මෙයම මෙසේ කියන ලදැයි දතයුතුය. **අවිතක්කං අවිචාරං** යනු භාවනාවෙන් ප්‍රහීණ බැවින් මෙහි හෝ මෙයට හෝ විතර්කයක් නැත්තේනුයි අවිතක්ක නම් වේ. අවිචාරය මෙම ක්‍රමයෙන්ම දතයුතුය. මෙහි කීහ, විතක්ක විචාරානං වූපසමා යන මෙයින්ද මෙම අර්ථය සිද්ධවන්නේ නොවේද? කුමක් හෙයින් නැවත අවිතක්කං අවිචාරං යයි කියන ලද්දේද යත්? කියනු

ලැබේ. මෙසේ එම අර්ථය සිද්ධ වන්නේය. මෙය එම අර්ථය දැක්වීම සඳහා නොවේ. කියන ලද්දේ නොවූයෙම්ද? දළ දළ අංගයාගේ ඉක්මවීමෙන් ප්‍රථමධ්‍යානයෙන් අන්‍ය ද්විතීය ධ්‍යානාදීන්ගේ අවබෝධය වේයැයි දැක්වීම සඳහා 'විතක්ක විචාරානං වූපසමා' යයි මෙසේ කියන ලදී. තවද විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් වන, මේ සම්ප්‍රසාදනය කෙලෙස් කාලුෂ්‍යයාගේ වශයෙන් නොවේ. විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් වන සමාධිය උපචාර ධ්‍යානය මෙන් නීවරණ ප්‍රහාණ නොවේ. ප්‍රථම ධ්‍යානය මෙන් අංග පහළවීමක්ද නොවේ. මෙසේ සම්ප්‍රසාදන, එකොදිභාවාදී හේතු විස්තර කිරීමේ වචනයකි මේ. එසේම විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් මේ අවිතර්ක අවිචාරය තෘතීය, චතුර්ථ ධ්‍යානයන් මෙන්ද, චක්ෂු විඤ්ඤාණාදීන් මෙන් අභාවයක් නොවේයයි මෙසේ අවිතර්ක, අවිචාර භාවයට හේතු විස්තර කිරීමටද, විතර්ක විචාර අභාවමාත්‍රය විස්තර කිරීමටද නොවේ. විතර්ක විචාරභාව මාත්‍රය විස්තර කිරීමටම අවිතක්කං, අවිචාරං යන මේ වචනය යොදා ඇත. එහෙයින් පළමුව කියා, නැවතද කිවයුතුමය. **සමාධිජං** යනු ප්‍රථමධ්‍යාන සමාධියෙන් හෝ ඒ හා යෙදුණු සමාධියකින් හටගත්තේය යන අර්ථයි. එහි කෙසේ වෙතත් ප්‍රථමධ්‍යානයද, ඒ හා සම්ප්‍රයුක්ත සමාධියෙන් හටගත්තේය. තවද, මෙම සමාධියම 'සමාධි' යයි කිවයුතු බවට සුදුසු වේ. විතර්ක විචාර කැළඹීම් විරහිතව ඉතාම නිශ්චල බැවින්ද, සුපසන් බැවින්ද වේ. එහෙයින් මෙහි ගුණ කථනය සඳහා මෙයම සමාධිජං යයි කියන ලදී. **පීතිසුඛං** යන මෙය කියන ලද ආකාරමය. **දුතියං** යනු ගණන් අනුපිළිවෙළින් දෙවැන්නය. දෙවැනිව හටගත්තේනුයිද දුතියං නම් වේ.

**පීතියාච විරාගා** යනු විරාගය නම් කියන ලද ආකාර ඇති ප්‍රීතියගේ පිළිකුල් කිරීම හෝ ඉක්මවීම හෝ වෙයි. වචන ද්වයය අතර ච ශබ්දය එකතුකිරීම් අර්ථයෙහි වේ. එය විතර්ක විචාර සංසිඳීම හෝ සන්සිඳීම පමණක් පිඩුකොට දක්වයි. එහි යම් වෙලාවක සන්සිඳීමම වැඩිපුර කියන්නේ කුමකටදැයි මෙසේ යෙදීම දතයුත්තාහ. මෙම යෙදීමෙන් විරාගය පිළිකුල් අර්ථයෙහි වෙයි. එහෙයින් ප්‍රීතියගේ පිළිකුල් කිරීමෙහිද, ඉක්මවීමෙහිදැයි මේ අර්ථය දතයුතුය. යම්කලෙක්හි විතර්ක විචාර සන්සිඳීම පිඩු කෙරේද? එකල්හි විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් යයි කී කල්හි ප්‍රීතියගේ විරාගයෙන් යයි වැඩිපුර යමක් කිවයුතු නැත. මෙසේ යෙදීම දතයුත්තාහ. මෙම යෙදීමෙහි විරාගය ඉක්මවීම් අර්ථයෙහි වෙයි. එහෙයින් ප්‍රීතියගේ ඉක්මවීමෙන්ද, විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන්දැයි මෙම අර්ථය

දතයුතුය. ඒකාන්තයෙන්ම මෙම විතර්ක විචාරයන් ද්විතිය ධ්‍යානයෙන්ම සන්සිඳුණාහුය. මෙම ධ්‍යානයාගේ මාර්ග පැහැදිලි කිරීම සඳහාද, ගුණ කීම සඳහාද මෙය කියන ලදී. විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙනැයි කී කල්හි මෙය පැනේ. විතර්ක විචාර සන්සිඳීම මෙම ධ්‍යානයට මාර්ගය නොවේද? යම්සේ තෙවන ආර්ය මාර්ගයෙහි ප්‍රහීණ නොවූද, සක්කාය දෘෂ්ටි ආදී යට කොටසට අයත් පඤ්ච සංයෝජනයන්ගේ ප්‍රහාණයයි මෙසේ ප්‍රහාණයන් ගැන කියනු ලබන්නේ, එය අධිගමය සඳහා උත්සුක වූවන්ගේ උත්සාහ ඇතිකරලීම සඳහා වන ගුණකථනයක් වේ. එපරිද්දෙන්ම මෙහි සංසුන් නොවූද, විතර්ක විචාරයන්ගේ සන්සුන් බව කියනු ලබන්නේ ගුණකථනයක් වෙයි. එහෙයින්, ප්‍රීතියගේ ඉක්මවීමෙන්ද විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් යයි යන මෙම අර්ථය කියන ලද්දේය.

**උපෙක්ඛකො ච විහරති** යන මෙහි අනුප්‍රාප්තිකයෙකු කැමති වේනුයි උපෙක්ෂායි. සමව බලයි. අපක්ෂපාතී වී බලයි යන අර්ථයි. ඒ පිරිසිදු, මහත්, ශක්තිමත් භාවයෙන් යුක්ත හෙයින් තෘතිය ධ්‍යානය හා එකතු වූයේ උපේක්ෂකයයි කියනු ලැබේ. උපේක්ෂාව වනාහි දසවැදෑරුම් වේ. ඡලංගුපෙක්ඛා, බ්‍රහමවිහාරුපෙක්ඛා, බොජ්ඣංගුපෙක්ඛා, විරියුපෙක්ඛා, සංඛාරුපෙක්ඛා, වෙදනුපෙක්ඛා, විපස්සනූපෙක්ඛා, තත්‍රමජ්ඣත්තුපෙක්ඛා, ඣානුපෙක්ඛා, පරිසුද්ධුපෙක්ඛා යනු ඒවා වෙති. එහි යම්, මහණෙනි මේ ශාසනයෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුව ඇසින් රූපයක් දැක සතුටුවන්නේද නොවේ. නොසතුටු වන්නේද නොවේ. සිහියෙන් මනා නුවණින් යුක්ත වූයේ උපේක්ෂකව වාසය කරයි. මෙසේ සඳහන් වූ රහතන් වහන්සේගේ ෂට් ද්වාරයන්හි ඉටුඅනිටු ඉදිරියට හමුවූ ෂඩාරම්මණයන්හි පිරිසිදු, ප්‍රකෘති ස්වභාව අත්නොහරිනාකාර වූ උපේක්ෂාවක් වේද, එය ඡළංගුපේක්ෂා නම් වේ. යම් ඒ උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි යන මෙසේ සඳහන් වූ සත්ත්වයින් කෙරෙහි මධ්‍යස්ථ ආකාර වූ උපේක්ෂාවක් වේද? මෙය බ්‍රහ්මවිහාර උපේක්ෂාව නම් වේ. යම් ඒ විවේක නිශ්‍රිත උපේක්ෂා සම්බොධ්‍යංගය වඩයි යන මෙසේ දක්වා ඇති එකට හටගත් ධර්මයන්ගේ මධ්‍යස්ථාකාර වූ උපේක්ෂාවක් වේද, මෙය බොධ්‍යංගුපේක්ෂාව නම් වේ. යම් ඒ කලින් කල උපේක්ෂා නිමිත්ත මෙනෙහි කරයි යන මෙසේ සඳහන් වූ, ඉතා දැඩි නොවූ, ඉතා ලිහිල් නොවූ වීර්ය සංඛ්‍යාත උපේක්ෂාවක් වේද, මෙය වීර්ය උපේක්ෂාවයි. යම් ඒ අෂ්ට සංස්කාරපේක්ෂාවෝ සමාධි වශයෙන් උපදිත්. දස සංස්කාරුපේක්ෂාවෝ විදර්ශනා වශයෙන් උපදිත්. මෙසේ සඳහන් වූ

නීවරණාදීන්ගේ, නුවණින් සලකා, තීරණය ගැනීමෙහි මධ්‍යස්ථ වූ උපේක්ෂාවක් වේද, මෙය සංස්කාරුපේක්ෂා නම් වේ. යම් ඒ, යම් සමයෙක්හි කාමාවචර උපේක්ෂා සහගත කුසල් සිතක් උපන්නේ වේද? මෙසේ ආවා වූ, නොදුක් නොසුව හැඟීමෙන් යුත් උපේක්ෂාවක් වේද, මෙය වේදනුපේක්ෂාව නම් වේ. යම් යමක් ඇත්ද, යමක් වූයේද එය දුරුකරයි. උපේක්ෂාව ලබයි. මෙසේ සඳහන් වූ විමසීමෙහි මධ්‍යස්ථ වූ උපේක්ෂාවක් වේද, මෙය විදර්ශනුපේක්ෂාව නම් වේ. යම් ඡන්දාදී නොයෙක් තන්හි ආවා වූ, එකට හටගත්තවුන්ගේ එක්තැන් කිරීම වූ උපෙක්ෂාව, මෙය තත්‍ර මජ්ඣත්තුපේක්ෂාව නම් වේ. යම් ඒ උපේක්ෂකව වාසය කරයි. මෙසේ සඳහන් වූ එම උතුම් සුවයෙහිද අපක්ෂපාතිත්වය උපදවන උපේක්ෂාවක් වේද, මෙය ධ්‍යානුපේක්ෂාව නම් වේ. යම් ඒ උපේක්ෂාවෙන් හා සිහියෙන් පරිසුද්ධ චතුර්ථ ධ්‍යානයයි. මෙසේ සඳහන් සියලු විරුද්ධ ධර්මයන්ගෙන් පිරිසිදු, විරුද්ධතා සන්සිඳවීමෙහි අනුත්සාහි උපෙක්ෂාවක් වේද, මෙය පාරිශුද්ධි උපෙක්ෂාව නම් වේ. එහි, ඡළංගුපේක්ෂාවද, බ්‍රහ්මවිහාරුපේක්ෂාවද, බොජ්ඣංගුපේක්ෂාවද, තත්‍ර මජ්ඣත්තුපේක්ෂාවද, ධ්‍යානුපේක්ෂාවද, පාරිශුද්ධි උපේක්ෂාවද අර්ථ වශයෙන් එක් තත්‍ර මජ්ඣත්තුපේක්ෂාවම වන්නීය. ඒ ඒ අවස්ථා භේදයෙන් වනාහි මෙම භේදය වන්නීය. එකෙකුම වූ, සත්ත්වයාට, කුමාර, යෞවන, මහලු, සෙනෙවි, රජ ආදී වශයෙන් වන භේද මෙනි. එහෙයින් ඒවාහි යම්තැනක ඡළංගුපේක්ෂාව වේද? එතැන බොජ්ඣංගුපේක්ෂාදීහු නොවෙත්. යම්තැනක බොජ්ඣංගු පේක්ෂාවද, එතැන ඡළංගුපේක්ෂාවෝ නොවෙත් යයි දතයුතුය. යම්සේ ඒවාහි අර්ථ වශයෙන් ඒකීයභාවයක් වේද? සංස්කාරුපේක්ෂා, විදර්ශනුපේක්ෂාවන්හිද එසේමය. ප්‍රඥා තොමෝ වනාහි කෘත්‍ය වශයෙන් දෙකට කැඩී ඇත. යම්සේ සවස ගෙට පිවිසි සර්පයෙක්, එළුපාදණ්ඩ ගෙන, සොයන පුරුෂයෙකුට, ඌ දහයියා ඇහිරූ තැන ලැග සිටියහුදැක, සර්පයෙක්ද? නොවේදැයි බලන්නේ තයි පෙණයේ සෝවැති S ලකුණ දැක, විමතියක් නොමැත්තේ, සර්පයෙක්ද, සර්පයෙක් නොවේදැයි සෙවීමෙහි මධ්‍යස්ථතාවයක් උපදියි. එපරිද්දෙන්ම, ආරබ්ධ විදර්ශකයාට විදර්ශනා ඥාණයෙන් ලක්ෂණත්‍රය දුටුකල්හි සංස්කාරයන්ගේ අනිත්‍යභාවාදීන් සෙවීමෙහි මධ්‍යස්ථතාවයක් උපදීද? මේ විදර්ශනුපේක්ෂාවයි. යම්සේ වනාහි, ඒ පුරුෂයාගේ එළු පාදණ්ඩෙන්, සර්පයා දැඩිව ගෙන කෙසේනම් මම මේ සර්පයා වෙහෙස නොකරමින්, තමාද මොහුගෙන් දෂ්ට නොකරවා ගනිමින් මිදෙන්නේදැයි, මිදෙන ආකාරයම සොයන්නේ ග්‍රහණයෙහි මධ්‍යස්ථතාවක් වේද? එපරිද්දෙන්ම,

යම් ඒ ලක්ෂණත්‍රයයාගේ දිටි හෙයින්, ත්‍රිවිධ භවයන් ගිනිගත්තාක් මෙන් දක්නේ සංස්කාරයන්ගේ ග්‍රහණයෙහි මධ්‍යස්ථතාවක් වේද? මේ සංස්කාරෝපේක්ෂාවයි. මෙසේ විදර්ශනෝපේක්ෂාව ඉටුවූ කල්හි, සංස්කාරෝපේක්ෂාවද ඉටුවූයේම වේ. මේ ආකාරයෙන් වනාහි මේවා, සෙවීම් ග්‍රහණාදීන්හි මධ්‍යස්ථ සංඛ්‍යාත කෘත්‍යයෙන් දෙකඩ වූයේ වේ. වීර්යෝපේක්ෂාව වනාහි, වේදනොපේක්ෂාව හා ඔවුනොවුන්ද, සෙස්සන් සමගද, අර්ථ වශයෙන් බිඳුණාහුය. මෙහි කීය.

**මජ්ඣත්ත බ්‍රහ්ම බොජ්ඣංග - ඡළංග ඣාන සුද්ධියො**
**විපස්සනාව සංඛාර - වෙදනා විරියං ඉති**

**විත්ථාරතො දසොපෙක්ඛා - ඡ මජ්ඣත්තාදිතො තතො**
**දුවෙ පඤ්ඤා තතො ද්වීහි - චතසෙසාව භවනතිච්චා'ති**

තත්‍ර මජ්ඣත්ත, බ්‍රහ්ම විහාර, බොජ්ඣංග, ඡළංග, ඣාන, පරිසුද්ධ, විපස්සනා, සංඛාර, වෙදනා, විරිය යැයි විස්තර වශයෙන් දස උපේක්ෂාවෝ වෙති. ඉන් මධ්‍යස්ථතා වශයෙන් සයෙක්ද, ප්‍රඥා වශයෙන් දෙකක්ද, මත්තෙහි දෙකක් දැයි සතරෙක්ම වෙති.

මෙසේ මෙම උපේක්ෂාවන්හි ධ්‍යානෝපේක්ෂාව මෙහි අදහස් කරන ලදී. එය මධ්‍යස්ථ ලක්ෂණ ඇත. මෙහි කීහ. මෙය අර්ථ වශයෙන් තත්‍ර මධ්‍යස්ථෝපේක්ෂාවම නොවන්නේද? එය ප්‍රථම, ද්විතිය ධ්‍යානයන්හිද ඇත. එහෙයින් එහිද, උපේක්ෂකව වාසය කෙරේ යයි මෙසේ මෙය කිවයුතු වන්නේය. එය කවර හෙයින් නොකියන ලද්දේද යත්? මනා පුහුණුවක් නොමැති කෘත්‍යවත් භාවය හෙයිනි. මනා පුහුණුවක් නොමැති කෘත්‍යවත් භාවය නිසා එහි කෘත්‍යය විතර්කාදීන්ගෙන් මැඩපවත්වා ඇත. මෙහි වනාහි විතර්ක විචාර ප්‍රීතීන්ගෙන් නොමඩනා ලද හෙයින් ඔසවන ලද සිරස මෙන් උසස් කෘත්‍යවත් භාවය හෙයිනි. මනා පුහුණුවක් නොමැති කෘත්‍යවත් භාවය නිසා එහි කෘත්‍යය විතර්කාදීන්ගෙන් මැඩපවත්වා ඇත. මෙහි වනාහි විතර්ක විචාර ප්‍රීතීන්ගෙන් නොමඩනා ලද හෙයින් ඔසවන ලද සිරස මෙන් උසස් කෘත්‍යයවත් භාවය හටගති. එහෙයින් යූ.සේයි.

**සතොච සම්පජානො** යන මෙහි සිහි කෙරේනුයි සතොයි. මනාකොට දනීනුයි සම්පජානයයි. පුද්ගලයෙකු හා සම්බන්ධකොට සිහියද

මනා දැනුම දක්වයි. එහෙයින් සිහියෙන් හා මනා නුවණින් යුතු පුද්ගලයෙකු යැයි ගතයුතුය. එහි සිහිය සිහිකිරීම් ලක්‍ෂණ ඇත. විමසා බලන නුවණ නුමුළා වීම් ලක්‍ෂණකොට ඇත්තේය. එහි කිසිසේත් මෙම සිහිය හා විමසා බලන නුවණ පළමු ධ්‍යානයන්හිද ඇත. මුළා වූ සිහි ඇති විමසීම් නුවණ නැත්තහුට උපචාර මාත්‍රයකුදු නොසැපයේ. නොලැබේ. අර්පණා ගැන කියනුම කවරේද? එම ධ්‍යානයන්ගේ ස්වභාවය දළ හෙයින් පුරුෂයෙකුට පොළොවෙහි සිට ගත්තාක් මෙන් සිතෙහි ස්වභාවය සුව ගෙන ඒ. එහි සිහිය හා මනා නුවණෙහි කෘත්‍යයන් අව්‍යක්තය. පුරුෂයෙකුට දැළිපිහි තලයක් මෙන් දළ අංගයන්ගේ ප්‍රහාණයෙන් මෙම ධ්‍යානයාගේ සියුම් බව වන හෙයින්, සති සම්ප්‍රජන්‍ය කෘත්‍යයන්ගෙන්, හාත්පසින් අල්ලා ගන්නා ලද්දේම, සිතෙහි ස්වභාවය කැමතිවිය යුත්තාහුයයි මෙහිම කියන ලදී. වැඩිමනත් කුමකටද? යම්සේ දෙනට එළඹුණු වසුපැටියා, දෙනගෙන් ඉවත්කරන ලද්දේ, නොරක්නේ, නැවත දෙන වෙත එළඹේද, එසේම මේ තෘතීය ධ්‍යාන සුවය ප්‍රීතියෙන් ඉවත්කරන ලද්දේ, සිහිය හා විමසීම් නුවණ නමැති රැක්මෙන් රකිනු ලබන්නේ, නොරක්නේද, නැවත ප්‍රීතියට එළඹෙන්නේය. ප්‍රීතිය හා එක්වූයේම වන්නේය. මින් මත්තෙහි සුවයක් නොලැබේයයි, සුවයක් ලදවිට මෙය ඉතා මිහිරි සුවයෙකැයි සත්ත්වයෝ එම සුවයෙහි ඇලෙත්. සිහිය හා විමසීම් නුවණෙහි ආනුභාවයෙන් වනාහි මෙම සුවයෙහි නොඇල්ම වෙයි. අනෙක් ක්‍රමයකින් නොවේ යයි යන අර්ථ විශේෂය දක්වන්ට මෙය මෙහිම යු.සේයි.

දැන්, **සුඛඤ්චකායෙන පටිසංවෙදෙති** යන මෙහි කිසිසේත් තෘතිය ධ්‍යාන සමන්විත වූයේ සැප විඳීමේ සිතා බැලීමක් නැත. මෙසේ ඇතිකල්හිද, යම්හෙයකින් ඔහුට නාමකය කරණකොට ඒ හා එක්ව යෙදුණු සුවයක් වේද, යම් ආකාර වූ එය නාමකය හා එකට යෙදුණේද, එය හටගැනීමෙත්ම යම්හෙයකින්, අතිප්‍රණීත රූපයෙන්, රූපකය ස්පර්ශ කරන ලද්දේ වේද, ශරීරයාගේ ස්පර්ශය කරන ලද බැවින්, ධ්‍යානයෙන් නැගී සිටියේද, සැප විඳින්නේය. එහෙයින් මෙම අර්ථය දක්වන්නේ, සුඛංච කායෙන පටිසංවෙදෙතියි කීයේය.

දැන්, **යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛ විහාරීති** යන මෙහි ඒ තෘතීය ධ්‍යානයෙන් යුත් පුද්ගලයා යම් ධ්‍යාන හේතුවකින්, යම් ධ්‍යාන කාරණයකින් බුද්ධාදී ආර්යයෝ කියති. දෙසති. පනවති. පිහිටුවති. විවරණය කරති. මනාව බෙදති. පැහැදිලි කරති. ප්‍රකාශ කරති

යයි අදහසයි. කිමෙක්ද? සුව විහරණයෙන් යුත් සිහි ඇති උපේක්ෂකයෙකැයි ඒ තෘතිය ධ්‍යානයට පැමිණ වාසය කෙරේ යයි මෙසේ මෙහි යෙදීම දතයුත්තාහ. කුමක් හෙයින් එයට ඔවුහු මෙසේ ප්‍රශංසා කෙරෙත්ද? ප්‍රශංසාවට සුදුසු හෙයිනි. මෙය වනාහි සුවයෙහි සම්පූර්ණත්වයට පත්වූයේද, අතිමිහිරි සුව සහිත ප්‍රථමධ්‍යානයෙහි, උපේක්ෂාවට පත්වූවහු, එම සුවයෙහි ඇලීමෙන් ඇද දමනු නොලබති. යම්සේ ප්‍රීතිය නොඋපදීද, මෙසේ එළඹ සිටි සිහි ඇති බැවින්, සිහි ඇත්තේ නම් වේ. ආර්යයන්ගේ සිත් අලවන, ආර්ය ජනයා විසින් සෙවුණා ලද්දේම නොකිලිටි සුවයක් නාම කයින් විඳියි. එහෙයින් ප්‍රශංසා කටයුතුයි. එහෙයින් ප්‍රශංසාවට සුදුසු වේ. මෙසේ ප්‍රශංසාර්හ හෙයින් ඒ ආර්යයෝ එය මෙසේ ප්‍රශංසාර්හ භාවයට හේතුවූ ගුණයන් ප්‍රකාශ කරන්නේ, සුව විහරණ ඇති, සිහි ඇති උපෙක්ෂකයෙකැයි මෙසේ ප්‍රශංසා කරත්යැයි දතයුත්තාහ. **තතියං** යනු ගණන් අනුපිළිවෙළින් තෙවැන්නයි. තෙවනුව හටගත්තේනුයිද තතියං නම් වේ.

**සුඛස්සච පහාණා දුක්ඛස්සච පහාණා** යනු කායික සුවයාගේද කායික දුඃඛයාගේද ප්‍රහාණයෙන් **පුබ්බෙව** යනු එයද වනාහි කලින්ම, චතුර්ථ ධ්‍යානක්ෂණයෙහි නොවේ. **සොමනස්ස දොමනස්සානං අත්‍ථංගමා** යනු චෛතසික සුවයාගේද, චෛතසික දුඃඛයාගේද යන මේ ද්වයයෙහි කලින්ම විනාශය, ප්‍රහාණය යයි මෙසේම යු.සේයි. කවදා වනාහි ඒවාහි ප්‍රහාණය වේද? සිවු ධ්‍යානයන්ගේ උපචාරක්ෂණයෙහි; සොම්නස වනාහි චතුර්ථ ධ්‍යානයාගේ උපචාර ක්ෂණයෙහිම ප්‍රහාණ වෙයි. දුක්, දොම්නස් සුවයන්, ප්‍රථම, ද්විතීය, තෘතීය ධ්‍යානයන්ගේ උපචාර ක්ෂණයන්හිය. මෙසේ මෙම ධ්‍යානයන්ගේ ප්‍රහාණ ක්‍රමයෙන් නොකියන ලද්දවුන්ගේද ඉන්ද්‍රිය විභංගයෙහි ඉන්ද්‍රියයන්ගේ උදෙසීම් ක්‍රමයෙන්ම මෙහිද කියන ලද්දවුන්ගේද ක්‍රමයෙන් සුව, දුක්, සොම්නස්, දොම්නස් ආදීන්ගේ ප්‍රහාණය දතයුතුයි. ඉදින් මේවා වනාහි ඒ ඒ ධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහිම ප්‍රහීණ වෙත්ද? තවද කුමක් හෙයින්, කොතැන උපන් දුක් ඉන්ද්‍රිය සේස රහිතව නිරුද්ධ වන්නේ දැයි විමසයිද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව කාමයන්ගෙන් වෙන්වම -පෙ- ප්‍රථමධ්‍යානයට සමවැදී වාසය කරයි. මෙහි උපන් දුක් ඉන්ද්‍රිය ශේෂ රහිතව නිරුද්ධ වේ. කොතැන්හි උපන් දොම්නස් ඉන්ද්‍රියය සුව ඉන්ද්‍රියය, සොම්නස් ඉන්ද්‍රියය ශේෂ රහිතව නිරුද්ධ වේද? මහණෙනි, මෙ සස්නෙහි භික්ෂුව සුවයෙහිද ප්‍රහාණයෙන් -පෙ- චතුර්ථ ධ්‍යානයට සමවැදී වාසය කරයි. මෙහි උපන් සොම්නස් ඉන්ද්‍රිය ශේෂ රහිතව නිරුද්ධ

වේයයි, මෙසේ ධ්‍යානයෙහිම නිරෝධය කියන ලද්දේ ඇයිද යත්? උසස් නිරෝධය බැවිනි.

ඒ ප්‍රථම ධ්‍යානාදීන්හි උසස් නිරෝධයම වේ. නිරෝධයම නොවේ. උපචාරක්ෂණයෙහි නිරෝධයමය. උසස් නිරෝධය නොවේ. එසේම නානාවර්ජන ප්‍රථමධ්‍යාන උපචාරයෙහි නිරුද්ධ වූද, දුක් ඉන්‍ද්‍රියයාගේ ඇටමැස්සන්, මදුරුවන් ආදීන්ගේ ස්පර්ශයෙන් හෝ විෂම ආසන තුළින් වන තැවීමෙන් හෝ හටගැනීම් වන්නේය. අර්පණා සමාධිය තුළ නොවන්නේය. උපචාරයෙහි හෝ නිරුද්ධ වූද, එය මනාසේ නිරුද්ධ නොවේ. විරුද්ධතාවන් නොනැසූ හෙයිනි. අර්පණාව තුළ වනාහි ප්‍රීතිය පැතිරීමෙන් මුළු සිරුර පුරා සුවය බැසගත්තේ වේ. සුවයට බැසගත් ශරීරයෙන් දුක් ඉන්‍ද්‍රිය මනාව නිරුද්ධ වූයේ වේ. විරුද්ධ ධර්මයන් නැසූ හෙයිනි. නානාවර්ජන ද්විතීය ධ්‍යාන උපචාරයෙහිම ප්‍රහීණ වූ දොම්නස් ඉන්‍ද්‍රියයාගේ හටගැනීම වේ. එය විතර්ක විචාර ප්‍රත්‍යය ඇතිකල්හිද, ශරීර දුර්වලතායෙහිද සිතෙහි හිංසාවන් ඇතිකල්හිද උපදී. විතර්ක විචාර නොමැති කල්හි නූපදීමය. යම්තැනෙක්හි උපදීද? එහි විතර්ක විචාර අභාවයෙහි ද්විතිය ධ්‍යාන උපචාරයෙහි ප්‍රහීණ නොවූම විතර්ක විචාරයෝය. එහි හටගැන්මක් වන්නේද? ද්විතීය ධ්‍යානයෙහි නොවේ. ප්‍රහීණ ප්‍රත්‍යය බැවිනි. එසේම ද්විතීය ධ්‍යාන උපචාරයෙහි සුව ඉන්‍ද්‍රියය ප්‍රහීණ වූයේ වී නමුදු, ප්‍රීතියෙන් හටගත් ප්‍රණීත රූප කායයාගේ හටගැන්ම වන්නේය. තෘතීය ධ්‍යානයෙහි නොවන්නේමය. තෘතිය ධ්‍යානයෙහි සුවයට හේතුවූ ප්‍රීතිය සර්වප්‍රකාරයෙන් නිරුද්ධ වේ. එසේම චතුර්ථධ්‍යාන උපචාරයෙහි ප්‍රහීණ වූද, සොම්නස් ඉන්‍ද්‍රියයට ආසන්න බැවින්, අර්පණාප්‍රාප්ත අපේක්ෂාවගේ අභාවයෙන්, මනාව නොඉක්මවූ හෙයින්ද, ප්‍රීතිය හටගැන්ම වන්නේය. චතුර්ථ ධ්‍යානයෙහි නොවන්නේය. එහෙයින් එහි හටගත් දුක් ඉන්‍ද්‍රිය ශේෂ රහිතව නිරුද්ධ වේයැයි ඒ ඒ තන්හි ශේෂ රහිත ග්‍රහණය කරන ලදී. මෙහි කීයේය. ඉක්බිති මෙසේ ඒ ඒ ධ්‍යානයාගේ උපචාරයෙහි ප්‍රහීණ වූද, ඒ වේදනාවෝ මෙහි කුමක් හෙයින් දැක්වූවහුද? සුව ග්‍රහණය සඳහායි. යම් මේ නොදුක් නොසුවයයි මෙහි නොදුක් නොසුව වේදනාව කියන ලද්දීද? එය සියුම් වන්නේය. දැනගැනීම දුෂ්කර වන්නේය. පහසුවෙන් තේරුම්ගත නොහැකි වන්නේය. එහෙයින් යම් යම් ආකාරයකින් ළංවී අල්ලාගත නොහැකි ගොණෙකු අල්ලාගැනීම පිණිස, යම්සේ නම් ගොපල්ලා, එක් ගාලක සියලු ගවයන් එක්රැස් කරයි. නැවත එක එකා බැහැර කරන්නේ පිළිවෙළින් ආවහු දැක, මේ එම

ගවයාය. ඌ අල්ලා ගනිව් යයි, ඌ අල්ලා ගන්ට සලස්වයි. එපරිද්දෙන්ම සුවසේ ග්‍රහණය සඳහා සියලුම මේ වේදනාවන් රැස්කළෝය. මෙසේ රැස්කරන ලද මේවා දක්වා, යමක් සුවයක්ම නොවේද? දුකක් නොවේද? සොම්නසක් නොවේද? දොම්නසක් නොවේද? මේ නොදුක් නොසුව වේදනාව යයි මෝ ගැනීමට හැකිවන්නීද? තවද නොදුක් නොසුව චෙතො විමුක්තියෙහි ප්‍රත්‍යය දැක්වීම සඳහාද මෙය කියන ලද්දේයයි දතයුත්තේය. සුවදුක් ප්‍රහාණාදිය එයට ප්‍රත්‍යය වන්නේය. දෙසූ පරිදි ඇවැත්නි, නොදුක්-නොසුව චිත්ත විමුක්තියගේ සම්ප්‍රාප්තිය සඳහා කරුණු සතරෙක් ප්‍රත්‍යය වේ. ඇවැත්නි, මේ සාසනයෙහි භික්‍ෂුව, සුවයෙහිද ප්‍රහාණයෙන් -පෙ- චතුර්ථ ධ්‍යානයට සමවැදී වාසය කරයි. ඇවැත්නි, මේ සිව් ප්‍රත්‍යයන් නොදුක්-නොසුව චිත්ත විමුක්තියගේ සම්ප්‍රාප්තිය සඳහා පවතී. යම්සේ අන් තන්හි ප්‍රහීණ වූද, සක්කාය දෘෂ්ටි ආදීහු, තෘතීය මාර්ගයාගේ ගුණ කථනය සඳහාම මෙම ධ්‍යානයට මෙය මෙහි කියන ලද්දේ යයි යූසේයි. හේතු නැසීමෙන් හෝ මෙහි රාගද්වේෂාදීන්ගේ ඉතා දුර බව දක්වන්නටද මෙය කියන ලද්දීයයි යූසේයි. මේවාහි, සුවය සොම්නසට ප්‍රත්‍යය වේ. සොම්නස රාගයටද, දුක දොම්නසටද, දොම්නස ද්වේෂයටද සුව ආදියෙහි නැසීමෙන් ප්‍රත්‍යය සහිත රාග ද්වේශයන් නැසීය යන්න ඉතා දුර වෙති. (එය නොයෙදේ) **අදුක්ඛමසුඛං** යනු දුක් අභාවයෙන් නොදුක්, සුව අභාවයෙන් නොසුව, මෙයින් මෙහි දුක්, සුව ප්‍රතිපක්‍ෂ වූ, තෙවන වේදනාවක් වූ, නොදුක් නොසුව අභාව මාත්‍රයක් දක්වයි. එම තෙවන වේදනාව නම් නොදුක් නොසුවයි. උපේක්‍ෂාවයයිද කියනු ලැබේ. එය ඉටු අනිටු විපර්යාස වේදනා අනුභව කිරීම් ලක්‍ෂණකොට ඇත්තීය. **උපෙක්ඛා සති පාරිසුද්ධිං** යනු උපේක්‍ෂාවෙන් හටගත් පිරිසිදු සිහියයි. මෙම ධ්‍යානයෙහි සිහිය ඉතා පිරිසිදුය. ඒ සිහියෙහි යම් පිරිසිදු බවක් වේද, එය උපේක්‍ෂාවෙන් කරන ලද්දකි. අනෙකකින් නොවේ. එහෙයින් එය 'උපේක්‍ෂා සති පාරිසුද්ධි' යයි කියනු ලැබේ. මෙහි යම් උපේක්‍ෂාවෙන් හා සිහියෙන් පරිශුද්ධතාවය වේද? ඕ අර්ථ වශයෙන් තත්‍ර මධ්‍යස්ථතාවයයි දතයුත්තීය. හුදෙක් මෙහි ඉන් සිහිය පමණක් පිරිසිදු වූයේ නොවේ. තවද ඒ හා යෙදුණු සියලු ධර්මයෝ ඇතුළත් වූවාහු වෙති. සිහිය මාතෘකාකොට දේශනාව වදාරන ලදී. එහි කිසිසේත් මෙම උපේක්‍ෂාව, යටද ධ්‍යානත්‍රයෙක්හි විද්‍යමාන වේ. යම්සේ වනාහි දහවල් සූර්යාලෝකය ඉක්මවා සෞම්‍ය භාවයෙන්ද, තමාට උපකාරත්වයෙන්ද, සමාන පැවතුම් ඇති රාත්‍රියක් නොලැබ, දහවල් විද්‍යමාන වන්නාවූද, චන්ද්‍රරේඛා අපරිශුද්ධ වූයේ, ඉතා අපිරිසිදු වූයේ වෙයි. එසේම මෙම තත්‍ර මධ්‍යස්ථතා උපේක්‍ෂාවද

සඳරේඛා මෙන්, විතර්කාදී විරුද්ධ ධර්ම තෙද මැඩපවත්වා, සමාන පැවතුම් ඇති, උපේක්ෂා වේදනා නමැති රාත්‍රියගේ නොලැබීමෙන්, විද්‍යමාන වූද, ප්‍රථමධ්‍යානාදී භේදයන් අපිරිසිදු වෙයි. ඒ අපරිශුද්ධත්වයෙන්, දහවල් අපිරිසිදු සඳරේඛා ප්‍රභාව මෙන්, ඒ හා සමග හටගත්, සිහි ආදීහුද අපිරිසිදුම වෙති. එහෙයින් ඔවුනතර එකක් හෝ උපේක්ෂා සති පාරිශුද්ධ යයි නොකියන ලදී. මෙහි වනාහි විතර්කාදී විරුද්ධ තෙද මැඩපැවැත්වීමක් නොමැති හෙයින් සමාන පැවතුම් ඇති උපේක්ෂා වේදනා නමැති රාත්‍රියගේ ලැබීමෙන්, මේ තත්‍රමධ්‍යස්තුපේක්ෂාව සඳරේඛා මෙන් ඉතා පිරිසිදුය. එම තත්‍ර මධ්‍යස්තුපේක්ෂාවගේ පරිශුද්ධත්වය නිසා, පිරිසිදු චන්ද්‍රරේඛා ප්‍රභාව මෙන් ඒහා සමග හටගත් සති ආදීහු පිරිසිදු වෙත්. ඉතා පිරිසිදු වෙත්. එහෙයින් මෙය උපේක්ෂා සති පාරිශුද්ධියයි යූ.සේයි. චතුත්‍ථං යනු ගණන් අනුපිළිවෙළින් සතරවැන්නයි. සතරවැනිව හටගත්තේනුයිද චතුර්ථ නම් වේ. මේ සිව්දැහැන් පූර්වභාගයෙහිද, මාර්ගක්‍ෂණයෙහිද නානාවිධය. පූර්වභාගයෙහි සමවත් වශයෙන් වෙනස්ය. මාර්ග ක්‍ෂණයෙහි නොයෙක් මාර්ග වශයෙනි. එක් අයෙකුට ප්‍රථම මාර්ගය ප්‍රථමධ්‍යානික වෙයි. දෙවන මාර්ගාදීහුද, ප්‍රථම ධ්‍යානික හෝ ද්විතීයාදී ධ්‍යානාදීන්හි එක්තරා ධ්‍යානිකයෝ හෝ වෙති. එක් අයෙකුට ප්‍රථම මාර්ගය, ද්විතියාදී ධ්‍යානයන්හි එක්තරා ධ්‍යානිකයෙක් වේ. ද්විතීය මාර්ගාදීහුද ද්විතීය ධ්‍යානාදීන්හි එක්තරා ධ්‍යානිකයෝ හෝ ප්‍රථම ධ්‍යානිකයෝ හෝ වෙති.

මෙසේ සතර මාර්ගයෝම, ධ්‍යාන වශයෙන් සමාන වූවාහු හෝ අසමාන වූවාහු හෝ ඇතැම්හු සමාන වූවාහු වෙති. මෙම විශේෂය පාදකධ්‍යාන නියමයෙන් වෙයි. ප්‍රථමධ්‍යාන ලාභියාට වනාහි ප්‍රථමධ්‍යානයෙන් නැගිට විදර්ශනා කරන්නහුට උපන් මාර්ගය ප්‍රථමධ්‍යානික වේ. මෙහි මාර්ගාංග බොධ්‍යංග සම්පූර්ණ වූවාහුම වෙති. ද්විතිය ධ්‍යානයෙන් නැගිට විදර්ශනා කරන්නහුට උපන් මාර්ගය ද්විතිය ධ්‍යානික වෙයි. මෙහි මාර්ගාංග වනාහි සතක් වෙයි. තෘතිය ධ්‍යානයෙන් නැගිට විදර්ශනා කරන්නහුට උපන්නේ තෘතිය ධ්‍යානිකයි. මෙහි මාර්ගාංග සතෙකි. බොධ්‍යංග සයෙක් වෙයි. චතුර්ථ ධ්‍යානයෙන් නැගිට නේවසඤ්ඤා නාසඤ්ඤායතනය මෙම ක්‍රමයයි. ආරූප්‍යයෙහි චතුෂ්ක, පඤ්චක ධ්‍යාන උපදී. එය වනාහි ලෝකෝත්තරය. ලෞකික නොවේයයි යූ.සේයි. මෙහි කෙසේද යත්, මෙහිද, ප්‍රථම ධ්‍යානාදීන් අතරෙහි, යමකින් නැගිට සෝවාන් මාර්ගය ලැබ, අරූප සමවත් වඩා, යමෙක් අරූප තලයෙහි උපන්නේද, එම ධ්‍යානිකවම ඔහුට එහි ත්‍රිවිධ මාර්ග උපදී. මෙසේ පාදක ධ්‍යානයම

නියම කරයි. සමහර තෙරහු වනාහි විදර්ශනාවට අරමුණු වූ ස්කන්ධ නියම කෙරෙත් යයි කියති. සමහරු පුද්ගලධ්‍යාසය නියම කෙරෙත්යයි කියති. සමහරු වුට්ඨානගාමිනී විදර්ශනාව නියම කෙරේයයි කියති. ඒ මෙහි අනුපිළිවෙළ කථාවයි. විදර්ශනා නියමයෙන්, ශුෂ්ක විදර්ශකයාට උපන් මාර්ගයද සමවත් ලාභීහුට, ධ්‍යාන පාදක නොකොට උපන් මාර්ගයද ප්‍රථමධ්‍යානය පාදකකොට විසිරුණු සංස්කාර සම්මර්ශනය කොට උපදවන ලද මාර්ගයද ප්‍රථම ධ්‍යානිකම වේ. සියල්ලෙහිම සත්බොධ්‍යංග, අෂ්ට මාර්ගාංග - පඤ්ච ධ්‍යානාංග වෙයි. ඔවුන්ගේ පූර්වභාග විදර්ශනාව, සොම්නස් සහගතවද, උපේක්ෂා සහගතවද වී, ධ්‍යානයෙන් නැගිටුනා කල්හි සංස්කාරුපේක්ෂා භාවයට, පත් වූවාහු සොම්නස් සහගත වූවාහුම වෙති. පඤ්චක ක්‍රමයෙහි, ද්විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යානයන් පාදක කොට උපදවන ලද, මාර්ගයන්හි පිළිවෙළින්ම ධ්‍යානය, චතුරංගික, ත්‍රිවංගික, ද්වයංගික වෙයි. සියල්ලෙහිම වනාහි සත් මාර්ගාංගයෝ වෙති. සතරවැන්නෙහි බොධ්‍යංග සයකි. මෙම විශේෂය පාදක ධ්‍යාන නියමයෙන්ද, විදර්ශනා නියමයෙන්ද වෙයි. ඒවාහිද පූර්වභාග විදර්ශනාව සොම්නස් සහගතවද, උපේක්ෂා සහගතවද වේ. වුට්ඨානගාමිනී විදර්ශනාව සොම්නස් සහගත වේ. පඤ්චම ධ්‍යානය පාදකකොට උපදවන ලද මාර්ගයෙහි වනාහි, උපේක්ෂා චිතෙතකාග්‍රතා වශයෙන් ධ්‍යානාංග ද්වයයක්ද, බොධ්‍යංග මාර්ගාංග සයක් හා සතක් වේ. මෙම විශේෂය උභය නියම වශයෙන් වේ. මෙම ක්‍රමයෙහි පූර්වභාග විදර්ශනාව සොම්නස් සහගත හෝ උපේක්ෂා සහගත හෝ වුට්ඨානගාමිනී උපේක්ෂා සහගතව හෝ වේ. අරූප ධ්‍යානයන් පාදකකොට උපදවන ලද මාර්ගයෙහිද එම ක්‍රමයමැයි. මෙහි වනාහි චතුෂ්ක ක්‍රමයෙහි අවිතර්ක අවිචාර මාත්‍ර වූ ද්විතීය ධ්‍යානයෙහි අභාවයෙන් එය ඉවත්කොට සෙස්සන්ගේ වශයෙන් යෙදිය යුතුය. මෙසේ පාදක ධ්‍යානයෙන් නැගිට යම්කිසි සංස්කාරයන් සම්මර්ශනය කොට උපදවන ලද මාර්ගයට ආසන්න පෙදෙසෙහි නැගිටුනා ලද සමවත තමා හා සදෘශභාවය කරයි. තලගොයාගේ වර්ණය භූමියෙහි වර්ණය මෙනි. දෙවන තෙරුන්ගේ කීමෙහි වනාහි, යම් යම් සමවතකින් නැගිට, යම් යම් සමවත් ධර්මයන් මෙනෙහිකොට, උපදවන ලද මාර්ගය, ඒ ඒ සමවත සමාන වූයේම වේ. එහිද විදර්ශනා නියමය කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. තෙවන තෙරුන්ගේ කීමෙහි, තමාගේ අදහසට ගැළපෙන අයුරින් යම් යම් ධ්‍යානයක් පාදකකොට, යම් යම් ධ්‍යාන ධර්මයන් මෙනෙහිකොට මාර්ගය නිපදවන ලද්දේද? ඒ ඒ ධ්‍යානය හා සමාන වූයේම වේ. පාදක ධ්‍යානය වනාහි, සමමර්ශනය කරන ලද

ධ්‍යානය හෝ හැර, අදහස් මාත්‍රයෙන්ම එය ඉටු නොවේ. මෙහිද විදර්ශනා නියමය කියන ලද ක්‍රමයෙන්ම දයුතුය.

අයං වුච්චති සම්මා සමාධි යනු මේ සිවු ධ්‍යානයන්හි ඒකාග්‍රතාවයක් වේද, මෙය පූර්වභාගයෙහිදී ලෞකික වන අතර පසුභාගයෙහි ලෝකෝත්තර සම්‍යක් සමාධිය නමැයි කියනු ලැබේ. මෙසේ ලෞකික ලෝකෝත්තර වශයෙන් දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ මාර්ග සත්‍යය දේශනා කළහ. එහි ලෞකික මාර්ගයෙහි සියලුම මාර්ගාංග සුදුසු පරිදි සිවු ආරම්මණයන්හි එක්තරා අරමුණු වෙති. ලෝකෝත්තර මාර්ගයෙහි වනාහි සිවුසස් ප්‍රතිවේධය සඳහා පැවති ආර්ය ශ්‍රාවකයාගේ නිර්වාණාරම්මණ වූ අවිද්‍යාව ආදී අප්‍රකට කෙලෙස් සම්පූර්ණයෙන් නසන්නා වූ, ප්‍රඥා චක්ෂුස සම්‍යග් දෘෂ්ටියයි. එසේම දෘෂ්ටි සම්පන්න වූවහුගේ ඒහා යෙදුණු, තෙවැදෑරුම් මිථ්‍යා සංකල්ප නසන සිත නිර්වාණ පදයට නංවන හෙයින් සම්‍යක් සංකල්පයි. එසේ බලන්නහුට, සිතන්නහුට, ඒ හා සම්ප්‍රයුක්තවම, චතුර්විධ වාග් දුශ්චරිත සමූලඝාතනය කරන හෙයින් මිථ්‍යා වචනයෙන් වෙන්වීම සම්‍යග් වාචායි. එසේ වෙන් වන්නහුට, ඒහා සම්ප්‍රයුක්ත වූයේම ත්‍රිවිධ මිථ්‍යා කර්මාන්ත සමූලඝාතනය කරන, මිථ්‍යා කර්මාන්තයෙන වැළකීම සම්‍යක් කර්මාන්තයි. එම වාග් කර්මාන්තයන්ගේම පාරිශුද්ධත්වයට හේතුවූ, ඒ හා යෙදුණා වූම, නැතිගුණ පෙන්වීම් ආදී, මිථ්‍යා ආජීවය නසන කටයුතුවලින් වැළැක්ම සම්‍යග් ආජීවය වන්නේය. එම සම්‍යග් වාචා, සම්‍යග් කර්මාන්ත, ආජීව සංඛ්‍යාත සීල භූමියෙහි පිහිටියහුට එයට අනුරූපී වූ, ඒ හා යෙදුණා වූ කුසීතකම විනාශ කරන නූපන් අකුසල් හා නූපන් කුසලයන්ගේ නොඉපදීම හා ප්‍රහාණය උපදවා ගැනීම හා පිහිටුවා ගැනීම යනාදිය සිදුකරන්නා වූ වීර්යාරම්භය සම්‍යග් ව්‍යායාමයයි මෙසේ උත්සාහ කරන්නහුට, ඒ හා යෙදුණා වූම, වැරදි සිහිය සොලවා ඉවත්කරන, කායාදීන්හි, කායානුපස්සනාදිය සිදුකරන්නා වූ, සිතෙහි නුමුළා බව සම්‍යග් සතියයි මෙසේ උතුම් සිහියෙන් මනාව පිළියෙල කරන ලද, චිත්තාරක්ෂා සහිත වූයේ ඒ හා යෙදුණා වූම මිථ්‍යා සමාධිය විනාශ කරන සිතෙහි එකඟ බව සම්‍යග් සමාධියයි.

ලෞකික මාර්ගයෙන් දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව යැයි යන සංඛ්‍යාවට ගිය මෙය ලෝකෝත්තර ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි ඒ මේ මාර්ගය වනාහි, විද්‍යාවෙන් සම්‍යග් දෘෂ්ටි, සම්‍යග් සංකල්පයන්ගේද, චරණයෙන් ඉතිරි සියලු ධර්මයන්ගේද වශයෙන් ඇතුළත් කළ හෙයින්ද,

විද්‍යාවද, චරණයද, එසේම ඒ ද්වයයට විදර්ශනා ඥාණයෙන්ද, අනෙක් ඒවාට සමථයානයෙන්ද වනසේ, ඇතුළත් කළ හෙයින්, සමථයද, විදර්ශනාවද, යන එම ද්වයයට ප්‍රඥා ස්කන්ධයෙන්ද ඉන් අනතුරු ත්‍රයයට සීලස්කන්ධයෙන්ද, සෙසු ත්‍රයයට සමාධි ස්කන්ධයෙන්ද වනසේ සංග්‍රහ කරන ලදී. අධිප්‍රඥා, අධිසීල, අධිචිත්ත ශික්‍ෂාවන්හිද සංග්‍රහ කරන ලද හෙයින් ස්කන්ධත්‍රයයද, ශික්‍ෂාත්‍රයයද වෙයි.

යමෙකින් යුක්ත වූ ආර්ය ශ්‍රාවකයා, දැක්මට සමත් ඇස්වලින්ද ගමනට සමත් පාදයන්ගෙන්ද යුක්ත වූයේ, මගියෙකු මෙන්, විද්‍යා චරණ සම්පන්නව, විදර්ශනා යානයෙන්, කාමසුඛල්ලිකානුයෝගයද, සමථ යානයෙන්, ආත්ම කිලමථානුයෝගයද යන අන්තද්වය හැරදමා මධ්‍යම ප්‍රතිපදාවට පිළිපන්නේ, ප්‍රඥා ස්කන්ධයෙන් මෝහ ස්කන්ධයද, සීල ස්කන්ධයෙන් ද්වේෂ ස්කන්ධයද, සමාධි ස්කන්ධයෙන් ලෝභ ස්කන්ධයද, පළන්නේ, අධිප්‍රඥා ශික්‍ෂාවෙන් ප්‍රඥා සම්පත්තියද, අධිසීල ශික්‍ෂාවෙන් සීල සම්පත්තියද, අධිචිත්ත ශික්‍ෂාවෙන් සමාධි සම්පත්තියද යන ත්‍රිවිධ සම්පත්තීන් ලබා අමෘත නිර්වාණය සාක්‍ෂාත් කරයි. මුල, මැද, අවසානය යහපත් සත්තිස් බෝධිපාක්‍ෂික ධර්මරත්නය විසිතුරු නිවැරදි ක්‍රම සංඛ්‍යාත ආර්ය භූමියට බැසගත්තේ වේමය.

### මාර්ග සත්‍ය නිර්දේශ වර්ණනාව නිමි.

සිවු සස්හි දුක්ඛ සත්‍යය පීඩාකිරීම් ලක්‍ෂණකොට ඇත්තේය. සමුදය සත්‍යය හටගැනීම් ලක්‍ෂණකොට ඇත්තේය. නිරෝධ සත්‍යය සන්සිඳීම් ලක්‍ෂණකොට ඇත්තේය. මාර්ග සත්‍යය පමුණුවන ලක්‍ෂණ ඇත්තේය. පැවැත්ම-පැවැත්වීම, නැවැත්ම, නැවැත්වීම යන ලක්‍ෂණ පිළිවෙළින් වේ. ප්‍රත්‍යයෙන් හටගත්, තෘෂ්ණා, ප්‍රත්‍යයෙන් හටනොගත්, දර්ශන යන ලක්‍ෂණද වේ. කවර හෙයින් අඩු-වැඩි නොවූ ආර්ය සත්‍යය සතරක්ම වූයේද යත්, අනෙකක හටගැනීමක් නොවන හෙයින්ද, ඉවත් කළයුතු අන්‍යයක්හි අභාවය හෙයින්ද වේ. මේවායින් අන්‍ය, අධිකයක් හෝ මේවායෙහි ඉවත් කළයුතු එකක් හෝ නොලැබේ. දෙසූ පරිදි, මහණෙනි, මෙලොව ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ශ්‍රමණ භවත් ගෞතමයන් විසින් දෙසන ලද එය දුක්ඛාර්ය සත්‍යය නොවේ. දුක්ඛාර්ය සත්‍යය

අනෙකකියි කීමට එන්නේද? (ඉදිරිපත් වන්නේද?) මම එම ආර්ය සත්‍යය අත්හැර වෙනත් දුක්ඛාර්ය සත්‍යයක් පණවන්නෙමියි යන එම කරුණ විද්‍යමාන නොවෙයි ආදියයි. දෙසූ පරිදි:- මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් මෙසේ කියන්නේය. ශ්‍රමණ ගෞතමයන් විසින් දේශනා කරන ලද, එය ප්‍රථම දුක්ඛාර්ය සත්‍යය නොවේ. මම ඒ ප්‍රථම දුකඛාර්ය සත්‍යය ප්‍රතික්ෂෙප කොට, අන්‍ය ප්‍රථම දුකඛාර්ය සත්‍යයක් පණවන්නෙමියි යන එම කරුණ විද්‍යමාන නොවේ ආදියයි. තවද, භාග්‍යවතුන් වහන්සේ පැවැත්ම දේශනා කරන්නේ හේතු සහිතව දේශනා කළ සේක. නැවැත්මද උපාය සහිතවය. මෙසේ පැවැත්ම, නැවැත්ම යන එම ද්වයයෙහි හේතුන්ගේ වශයෙන් එය උතුම්කොට සතරක්ම දෙසූහ. එසේම, දතයුතු, ප්‍රහාණය කළයුතු, අවබෝධ කටයුතු, වැඩිය යුතු වශයෙන්ද, තෘෂ්ණාවට හේතු, තෘෂ්ණාව, තෘෂ්ණා නිරෝධය, තෘෂ්ණා නිරෝධ උපාය වශයෙන්ද, තෘෂ්ණාව, තෘෂ්ණාවෙහි තදින් ඇල්ම, තෘෂ්ණා විනාශය, තෘෂ්ණා විනාශ උපායයන්ගේ වශයෙන්ද, සතරෙක්ම දෙසන ලද්දේමය.

මෙහිද, දළ බැවින්ද, සියලු සත්ත්වයින්ට සාධාරණ හෙයින්ද අවබෝධය පහසුවන හෙයින්ද, දුක්ඛ සත්‍යය පළමුවද, එම දුකෙහිම හේතු දැක්වීම සඳහා ඉන් අනතුරුව සමුදය සත්‍යයද හේතු නැවැත්මෙන් ඵල නැවැත්ම වේයයි අවබෝධ කරවීමට ඉන්පසු නිරෝධ සත්‍යයද, එය අවබෝධ කිරීමේ ක්‍රමෝපාය දැක්වීම සඳහා අවසානයෙහි මාර්ග සත්‍යයද දෙසන ලදී.

භව සුව රස විඳීමෙහි තදින් ඇලුණු සත්ත්වයින්ට, බිය ඇතිකරලීම සඳහා පළමුව දුකද, එය ස්වයං සිද්ධව නොඑයි. ඊශ්වර නිර්මාණාදියකින්ද නොවෙයි. මෙකරුණෙන් වේයයි අවබෝධ කරවීමට ඉන් අනතුරුව සමුදයද, එම හේතු සහිත දුකින් මැඩුණු හෙයින් බියෙන් ඇලලුණු මනසින් යුත්, දුකින් නික්මීම සොයන්නවුනට, දුකින් නිදහස්වීම දැක්වීමෙන්, සැනසිල්ල ඇතිකරලීම සඳහා නිරෝධයද, ඉන් නිරෝධයට පැමිණීම සඳහා නිරෝධයට පමුණුවන මාර්ගයයි දේශනා කළේය. මේ ඒවායෙහි ක්‍රමයයි. ඒවාහි දුකඛ සත්‍යය බරක් මෙන් දතයුතුය. සමුදය සත්‍යය බර අල්ලාගැන්ම මෙනි. නිරෝධ සත්‍යය බර අත්හැර දමන්නාක් වැනිය. බර අත්හැර දමන උපාය මාර්ගය මෙනි මාර්ග සත්‍යය. දුකඛ සත්‍යය රෝගයක් මෙනි. සමුදය සත්‍යය රෝග නිදානයක් මෙනි. නිරෝධ සත්‍යය රෝග සන්සිඳීමක් මෙනි. මාර්ග සත්‍යය බෙහෙදක් මෙනි. දුක්ඛ

සත්‍යය දුර්භික්ෂයක් මෙනි. සමුදය සත්‍යය නොමනා වැස්සක් මෙනි. නිරෝධ සත්‍යය සශ්‍රීකයක් මෙනි. මාර්ග සත්‍යය මහා වර්ෂාපතනයක් මෙනි. තවද, සතුරා සතුරුකම, සතුරා නැසීම, සතුරා නසන උපාය මාර්ගයන් වශයෙන්ද, විෂ රුක, රුක්මුල, මුල් සිඳීම, මුල් සිඳිනා උපාය මාර්ගයන් වශයෙන්ද, බිය, බියෙහි හේතුව, නිර්භයතාවය, එයට පැමිණීමේ උපාය මාර්ගය වශයෙන්ද මෙතෙර, සැඩදිය පහර, පරතෙර, එතෙරට පමුණුවන උත්සාහයන් වශයෙන්දැයි මේවා යොදා උපමා වශයෙන් දතයුත්තාහ.

මෙහි සියලුම සත්‍යයෝ පරමාර්ථ වශයෙන් විඳින, කරන, නිවුණු, ගමන්කරන පුද්ගලයෙකුගේ අභාවයෙන් ශූන්‍යයයි දතයුත්තාහ. එහෙයින් මෙය කියනු ලැබේ.

**දුක්ඛමෙවහි න කොචි දුක්ඛිතො - කාරකො න කිරියාව විජ්ජති**
**අත්‍ථි නිබ්බුති න නිබ්බුතො පුමා - මග්ගමත්‍ථි ගමකො න විජ්ජති'ති**

දුකක් පමණක් ඇත. දුකට පත්වූවෙක් නැත. කරන්නෙක් නැත. ක්‍රියාවක් පමණක් ඇත. නිවීමක් ඇත. නිවුණු පුද්ගලයෙක් නැත. මාර්ගයක් ඇත. ගමන් කරන්නෙක් නැත. තවද,

**ධුවසුභ සුඛත්ත සුඤ්ඤං - පුරිමද්වය මත්ත සුඤ්ඤ මමත පදං**
**ධුව සුඛ අත්තරහිතො - මග්ගො ඉති සුඤ්ඤතා තෙසු**

ප්‍රථම ද්වයය ස්ථිර, ශුභ, සුව, ආත්ම ශූන්‍යයි නිවණ ආත්ම ශූන්‍යයි. මාර්ගය ස්ථිර, සුව, ආත්ම රහිතයි. ඒවාහි ශූන්‍යතාවය මෙසේයි.

නිරෝධය ස්ථිර, ශුභ-සුව යන ත්‍රයයෙක් ශූන්‍යයි. නිරෝධයද, සෙසු ත්‍රයයද ඵල ශූන්‍යයි. මෙහි දුකෙහි හේතු හටගැනීමෙහි අභාව හෙයින් මාර්ගයෙහිද නිරෝධයෙහිද අභාවය වේ. ප්‍රකෘතිවාදීන්ගේ ප්‍රකෘතිය මෙන් ඵලයෙන් අන්තර්ගතය විනාශ නොවේ. ඵලය හේතුයෙන් ශූන්‍යය වනවිට දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ගයන්ගේ එක්තැන් වීම නොවේ. හේතුඵලය හේතුවට සම නොවේය යන්න හේතුඵල සමවාය වාදීන්ගේ අනුකද්වයාදිය මෙනි.

**තයමිධ නිරෝධ සුඤ්ඤං - තයෙන තෙනාපි නිබ්බුති සුඤ්ඤා**
**සුඤ්ඤා ඵලනෙ හෙතු - ඵලම්පි තං හෙතුනා සුඤ්ඤ'න්ති**

ඒ මෙහි නිරෝධය ත්‍රයයකින් ශූන්‍යයි. එහෙයින් නිවණ ශූන්‍යයි. හේතුව ඵලයෙන් ශූන්‍යයි. ඵලයද හේතුවෙන් ශූන්‍යයි. මේ සියලුම සත්‍යයෝ අසත්‍ය නොවන හෙයින්ද, ආත්ම ශූන්‍යය හෙයින්ද, අවබෝධය දුෂ්කර හෙයින්ද ඔවුනොවුන් සමානයහ. දෙසූ පරිදි; ආනන්දය, ඔබ කුමක් කියා සිතන්නෙහිද? යමෙක් දුරසිටම යතුරු කඩොල්ලකින් හීයක් නොවැරදීම එකක් හැර එකක් විදින්නේය. යමෙක් කැබලි සියයකට කඩන ලද අස් කෙන්දක් කොණින් කොණ නැවත එකතු කරන්නේද, ඉන් කවරක් වනාහි අතිශය දුෂ්කරද? සිදුවීම ඉතා දුෂ්කර වන්නේද? යමෙක් සියක් කඩකට කඩන ලද අස්කෙන්දක් කොනින් කොන අවබෝධ කරන්නේද, ස්වාමීනි, එයම අතිශය දුෂ්කරද, සිදුවීම ඉතා දුෂ්කරද වන්නේය. එකල්හි ආනන්දය, යමෙක් මෙය දුකයයි යථා ස්වරූපයෙන් අවබෝධ කෙරෙත්ද -පෙ- මේ දුක් නිරෝධයට පමුණුවන ප්‍රතිපදාවයයි තත්වාකාරයෙන් අවබෝධ කෙරෙත්ද? ඔවුහු අවබෝධයට අති දුෂ්කර වූවක් අවබෝධ කරති. විසභාගයන් ලකුණු සහිතව වෙන් කිරීමෙන්ද, ප්‍රථම ද්වය ගැඹුරු බැවින්ද, ලෞකික බැවින්ද, ආස්‍රව සහිත බැවින්ද, අවබෝධ කිරීම් වශයෙන් බැසගැන්මෙහි සමාන වූවාහු වෙති. ඵල හේතු භේදයෙන් හා විශේෂයෙන් දතයුතු වශයෙන්ද ප්‍රහාණය කළයුතු වශයෙන්ද විසම වූවාහු වෙති. පශ්චිම ද්වයය ලෝකෝත්තර බැවින්ද, ආශ්‍රව රහිත බැවින්ද, ගැඹුරු බැවින්, අවබෝධය දුෂ්කර හෙයින්ද, සමාන වූවාහු වෙති. අරමුණ හා අරමුණු වන දෙය වශයෙන්ද, ප්‍රත්‍යක්ෂ කළයුතු හා වැඩියයුතු වශයෙන්ද විසභාග වූවාහු වෙති. ප්‍රථම තෘතිය ද්වයය ඵල පෙන්වීම හෙයින් සමාන වූවාහු වෙති. ප්‍රත්‍යයෙන් හටගත්, නොගත් වශයෙන් විසභාග වූවාහු වෙති. දෙවන සිව්වන ද්වයය හේතු පෙන්වන හෙයින් සමාන වූවාහු වෙති. ඒකාන්ත කුසල් අකුසල් වශයෙන් විසභාග වූවාහු වෙති. ප්‍රථම හා සිව්වන ද්වයය සංඛත වශයෙන් සමාන වූවාහු වෙති. ලෞකික ලෝකෝත්තර වශයෙන් විසභාග වූවාහු වෙති. දෙවන, තෙවන ද්වයය ශෛක්ෂ්‍ය නොවූ අශෛක්ෂ්‍ය නුවූ භාවයෙන් සමාන වූවාහු වෙති. අරමුණු සහිත හා අරමුණු රහිත භාවයෙන් විසභාග වූවාහු වෙති.

**ඉති එවං පකාරෙහි - නයෙහිච විචක්ඛණො**
**විජඤ්ඤා අරිය සච්චානං - සභාග විසභාගතන්ති**

මෙසේ මේ ආකාරයන්ගෙන්, ක්‍රමයන්ගෙන් නුවණැත්තේ ආර්ය සත්‍යයන්ගේ සමාන අසමානකම් මනාව දැනගන්නේය.

මෙහි සියලුම දුඃඛය පවත්නා ස්වභාවය වශයෙන් එක් ආකාරයකි. නාමරූප වශයෙන් දෙයාකාරය. කාම, රූප, අරූප, උත්පත්ති භව භේද වශයෙන් තෙවැදෑරුම්ය. සිවු ආහාර භේදයෙන් සතරාකාරය. පංච උපාදානස්කන්ධ භේදයෙන් පස්වැදෑරුම්ය. සමුදයද පවත්වන්නා වූ ස්වභාව වශයෙන් එක්වැදෑරුම්ය. දෘෂ්ටි සම්ප්‍රයුක්ත, අසම්ප්‍රයුක්ත වශයෙන් දෙයාකාරය. කාම, භව, විභව තෘෂ්ණා භේදයෙන් තෙවැදෑරුම්ය. චතුර් මාර්ග ප්‍රභේදයෙන් සිවු වැදෑරුම්ය. රූපාදීන්හි සතුටුවීම් වශයෙන් පස් වැදෑරුම්ය. ෂට් තෘෂ්ණා කාය භේදයෙන් සවැදෑරුම්ය. නිරෝධයද ප්‍රත්‍යයෙන් හටනොගත් ධාතුන්ගේ ස්වභාවයෙන් එක් වැදෑරුම්ය. ආකාර වශයෙන් සඋපාදිසෙස, අනුපාදිසෙස වශයෙන් දෙවැදෑරුම්ය. භවත්‍රය සන්සිඳවන හෙයින් තෙවදෑරුම්ය. සිවු මගින් අවබෝධ කළයුතු හෙයින් සිව් වැදෑරුම්ය. පස් අබිනන්දනයන් සංසිඳවන හෙයින් පස්වැදෑරුම්ය. ෂට් තෘෂ්ණා කායයන් ක්‍ෂය භේදයෙන් ෂට් වැදෑරුම්ය. මාර්ගයද වැඩිය යුතු වශයෙන් එක් වැදෑරුම්ය. සමථ විදර්ශනා වශයෙන්ද දර්ශන-භාවනා භේද වශයෙන්ද දෙවදෑරුම්ය. ස්කන්ධත්‍රය භේදයෙන් තෙවදෑරුම්ය.

දෙසූ පරිදි, ඇවැත්නි විශාඛය, ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් ස්කන්ධත්‍රය සංග්‍රහ නොකරන ලදී. ඇවැත්නි, විශාඛය ස්කන්ධත්‍රයකින් ආර්ය අෂ්ටාංගික මාර්ගය සංග්‍රහ කරන ලදී. ඇවැත්නි, විශාඛය යම් සම්‍යක් වචනයක් වන්නීද, යම් සම්‍යක් කර්මාන්තයක් වේද, යම් සම්‍යග් ආජීවයක් වේද, මේ ධර්ම සීල ස්කන්ධයෙහි සංග්‍රහ කරන ලදී. යම් සම්‍යග් ව්‍යායාමයක් වේද, යම් සම්‍යග් සතියක් වන්නීද, යම් සම්‍යග් සමාධියක් වේද, මේ ධර්ම සමාධි ස්කන්ධයෙහි සංග්‍රහ කරන ලදී. යම් සම්‍යග් දෘෂ්ටියක් වන්නීද, යම් සම්‍යග් සංකල්පයක් වේද, මේ ධර්ම ප්‍රඥා ස්කන්ධයෙහි සංග්‍රහ කරන ලදී. සෝවාන් මාර්ගාදි වශයෙන් සතරාකාරය. තවද, මේ සියලුම සත්‍යයෝ, අසත්‍ය නුවූ හෙයින්ද, විශිෂ්ට ඥානයෙන් දතයුතු හෙයින්ද එක් වැදෑරුම්ය. ලෞකික ලෝකෝත්තර වශයෙන්ද, සංඛත, අසංඛත වශයෙන්ද දෙවදෑරුම්ය. දර්ශන භාවනාවන්ගෙන්, ප්‍රහාණය කළයුතු වශයෙන්ද, ප්‍රහාණය නොකළයුතු වශයෙන්ද, ප්‍රහාණය නොකළ යුතු, ප්‍රහාණය නොකළ යුතු නොවන වශයෙන් තෙවදෑරුම්ය. විශේෂ ඥාණයෙන් දතයුතු, ප්‍රහාණය කළයුතු, ප්‍රත්‍යක්‍ෂ කළයුතු, වැඩිය යුතු වශයෙන් සිවු වැදෑරුම්ය.

එවං අරිය සච්චානං - දුබ්බොධානං බුද්ධො විධිං
අනෙක භෙදතො ජඤ්ඤා - හිතායච සුඛායචාති

මෙසේ ආර්ය සත්‍යයන්ගේ අවබෝධයට දුෂ්කර ක්‍රම තමාගේත්, අන්‍යයාගේත් හිතසුව සඳහා නැණැත්තේ දැනගන්නේය.

**චතුරාර්ය සත්‍යය ප්‍රකීර්ණක වර්ණනාව නිමි.**

දැන් දම්සෙනෙවි සැරියුත් මහරහතන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ක්‍රමයෙන්ම අන්තයෙහි සත්‍යය චතුෂ්කය නිර්දේශකොට එය 'ඤාතට්ඨෙන ඤාණං' ආදි සත්‍ය චතුෂ්කය වශයෙන් ශ්‍රැතමයෙ ඤාණය නිගමනය කොට දක්වයි. මෙසේ සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං යයි පෙර කියන ලද සියල්ල නිගමනය කොට දක්වයි.

**සද්ධර්මප්‍රකාශනී, ප්‍රතිසම්භිදා මාර්ග අටුවා කථායෙහි ශ්‍රැතමයෙ ඥාන නිර්දේශ වර්ණනාව නිමි.**

සීලමය ඤාණ නිර්දේශයෙහිඃ **පඤ්ච** යනු ගණන් පිරිසිඳීමයි. **සීලානි** යනු ධර්මයන් වෙන්කොට දැක්වීමයි. **පරියන්ත පාරිසුද්ධි සීලං** යනු පංචකයක් ස්වරූප වශයෙන් දැක්වීමයි. පරියන්ත පාරිසුද්ධි ආදීන්හි, යම්සේ නීලවර්ණය යෙදීමෙන් වස්ත්‍රයද, මෙයට නිල ඇත්තේනුයිඃ නීලයයි කියනු ලැබේ. මෙසේ ගණන් වශයෙන්, කෙළවරක් පිරිසිඳීමක් එයට ඇත්තේනුයි - පරියන්තයි. උපසපන් සීලයට පත් අනුපසපන් සීලයාගේ අවසාන යහපත් ස්වභාවය බැවින්, කෙළවරක් අවසානයක් එයට ඇත්තේනුයි පරියන්තායි. '**සපරියන්තයි**' කිවයුතු කල්හි 'සකාර ලෝපය කරන ලද්දේයයි දතයුතුය. එය '**දකාසයා පවිසන්ති**' යන මෙහි උකාර ලෝපය මෙනි. පිරිසිදු බව පාරිසුද්ධියි. පිරිසිඳීම, පාරිශුද්ධියද එයමනුයි.

පරියනත පාරිසුද්ධියි. පරියනත පාරිසුද්ධි සංඛ්‍යාත සීලය පරියනත පාරිසුද්ධි සීලයයි කියන ලද්දට විරුද්ධ ස්වභාවයෙන් පිරිසිඳීමක් නැත්තේනුයි **අපරියනතයි**. එයට පිරිසිඳීමක් නැත්තේනුයි අපරියනතයි. සමාදානයෙහි පටන්, භේදයට නොපැමිණවූයේ, භේදයක් වූයේද, කරන ලද පිළියම් ඇත්තාහු, චිතෙතාත්පාද මාත්‍ර වූද, මලින් තොර වූ බැවින්, පිරිසිදු දැරඟ මිණක් මෙන්, මනාව පිරියම් කරන ලද රත්බඳුනක් මෙන්ද පිරිසිදු බැවින් ආර්ය මාර්ගයට ආසන්න කාරණ වූ අඩු නොවූ අර්ථයෙන් **පරිපුණ්ණා** නම් වේ. දෘෂ්ටිය ප්‍රහීණ හෙයින් දෘෂ්ටි අල්වා ගැනීමෙන් අල්ලා නොගත් හෙයින් **අපරාමට්ඨ** නම් වේ. මේ ඔබගේ සීලයෙහි දොසැයි කිසි චූදිතයෙකු විසින් ස්පර්ශ කරන්ට නොහැකි වන හෙයින් හෝ අපරාමට්ඨයි. අර්හත් ලක්‍ෂණයෙහි සියලු දාහ සන්සිඳීම් අර්ථයෙන් පටිප්පසසද්ධියි.

**අනුපසමපනනානං** යනු සේස රහිත සමාදන්වීම් වශයෙන් සීල සම්පත්තියෙහි බොහෝ සේ යුක්ත වූයේනුයි උපසමපනනයි - උපසමපනන නුවූයේ අනුපසමපනනය ඒ උපසම්පන්න නුවූවන්ගේ **පරියනත සිකඛාපදානං** යනු මෙහි හික්මිය යුතු අර්ථයෙන් ශික්‍ෂායි. කොටස් අර්ථයෙන් පදයි. හික්මිය යුතු කොටඨාසයන්ය යන අර්ථයි. තවද, ශීලයෙහි පිහිටියහු විසින්, මත්තෙහි පැමිණිය යුතු හෙයින් සියලු කුසල්දම් ශික්‍ෂාවෝය. සීලයෝ ඒ ශික්‍ෂාවන්ගේ පිහිටීම් අර්ථයෙන්, පද වූවාහුයයි ශික්‍ෂාවන්ගේ පද හෙයින් ශික්‍ෂාපද වේ. පර්යන්ත ශික්‍ෂාපද මොවුන්ටනුයි පරියන්ත ශික්‍ෂාපදයි. ඒ පර්යන්ත ශික්‍ෂාපදයන්ගේ එහිද පර්යන්ත ද්වයයකි. ශික්‍ෂාපද පර්යන්තය, කාල පර්යන්තය වශයෙනි. ශික්‍ෂාපද පර්යන්තය කවරේද යත්, උපාසක උපාසිකාවන්ගේ සමාදන් වීම් වශයෙන් යම්සේ, එක, දෙක, තුන, හතර, පහ, අට, දහය හෝ ශික්‍ෂාපද වෙති. උපසම්පදාව සඳහා හික්මෙනු ලබන සාමණේර, සාමණේරීන්ට ශික්‍ෂාපද දසයකි. මේ ශික්‍ෂාපද පර්යන්ත නම් වේ. කාල පර්යන්තය කවරේද? උපාසක උපාසිකාවෝ දන් දෙනු ලබන්නාහු දන් වළඳවන කාලය පර්යන්ත කොට සිල් සමාදන් වෙති. වෙහෙරට ගියාහු එහි ගතකරන කාලය පර්යන්ත කොට සිල් සමාදන් වෙති. එක-දෙක-තුන හෝ ඊට වැඩියෙන් හෝ රෑ දවල් නියමකොට සිල් සමාදන් වෙති. මේ කාල පරියන්ත නම් වේ. මේ පර්යන්ත ද්වයෙහි ශික්‍ෂාපද පර්යන්තකොට සමාදන් වූ සීලය ඉක්මවීමෙහි හෝ මරණයෙහි සන්සිඳේ. කාල පර්යන්ත කොට සමාදන් වන ලද්ද, ඒ ඒ කාලාතික්‍රමණයෙන් සන්සිඳේ. **අපරියනත සිකඛාපදානං** යනු,

නවකොටි සහස්සානි - අසීතිං සත කොටියො
පඤ්ඤාසනා සත සහස්සානි - ඡත්තිංසච පුනාපරෙ

එතෙ සංවර විනයා - සම්බුද්ධෙන පකාසිතා
පෙය්‍යාල මුඛෙන නිද්දිට්ඨා - සික්ඛා විනය සංවරේ'ති

නවකෙළ දහස්, එකසිය අසූකෝටි
පනස් ලක්‍ෂ සතිසක්,

බුදුරදුන් විසින් ප්‍රකාශිත, ඒ සංවර විනය, පෙය්‍යාල ක්‍රමයෙන් දක්වන ලද්දාහු, සංවර විනයෙහි ශික්‍ෂාවෝ වෙති.

මෙසේ ගණන් වශයෙන් පර්යන්ත වුවද, ශික්‍ෂා පදයන්ගේ සේස රහිත සමාදන් වීම් භාව වශයෙන්, ලාභ, යස, ඥාති ශරීරායව, ජීවිත හේතු වශයෙන් නුදුටු පර්යන්ත භාව වශයෙන්ද මත්තෙහි රැකිය යුතු සීලයන්හි, පිරිසිඳීම් නොවීම් වශයෙන් ඒවාට පර්යන්තයක් නැත්තේනුයි අපරියන්ත වේ.

අපරියන්ත සික්ඛාපදයන් ඒවාමනුයි අපරියන්ත ශික්‍ෂාපදයි. ඒ අපරියන්ත ශික්‍ෂාපදයන්ගේ; බුද්ධ පර්යන්ත ශික්‍ෂාපදයන්ගේ හෝ යන අර්ථයි.

පුථුජ්ජන කල්‍යාණකානං යනාදීන්හි පැතිර සිටි කෙලෙස් ආදීන්ගේ, ඉපදවීම් ආදී කරුණුවලින් පෘථග්ජන නම් වේ. පෘථග්ජනයන්ට ඇතුළත් හෙයින්ද මෙම ජනයා පුථුයයි කියනු ලැබේ. කියන ලද පෘථග්ජන ලක්‍ෂණ නොඉක්මවීමෙහිදී ආදිච්ච බන්ධු බුදුරජුන් විසින්, එක් අන්ධ පෘථග්ජනයෙක්ද එක් කල්‍යාණ පෘථග්ජනයෙක්ද වශයෙන් පෘථග්ජනයෝ දෙදෙනෙක් දේශනා කරන ලදහ.

පුථූනං ජනනාදිහි - කාරණෙහි පුථුජ්ජනො
පුථුජ්ජනනෙතාගධත්තා - පුථුවායං ජනො ඉති

දුවෙ පුථුජ්ජනා වුත්තා - බුද්ධෙනාදිච්ච බන්ධුනා
අන්ධො පුථුජ්ජනො එකො - කල්‍යාණෙකො පුථුජ්ජනො'ති

කියන ලද පෘථග්ජනද්වයෙහි, යහපත් පුද්ගලයන් හා ආශ්‍රයෙන්, අන්ධ පෘථග්ජන භාවය ඉක්මවා, යහපත් පෘථග්ජන භාවයෙහි සිටියා වූ පෘථග්ජන කල්‍යාණයන්ගේ; කල්‍යාණ පෘථග්ජනයන්ගේ යයි යූසේයි. පෘථග්ජනයන් අතරෙහි යහපත් පෘථග්ජන කල්‍යාණකයන්ගේ, **කුසලධම්මෙ යුත්තානං** යනු මෙහි කුසල් ශබ්දය, ආරෝග්‍යයෙහි, නිරවද්‍යයෙහි, දක්‍ෂතාවෙහි සැපවිපාක ආදියෙහි පෙනේ. මේ වනාහි උදාහරණයි. කෙසේද භවත් ගෞතමයනි, යහපත්ද? කෙසේද භවත් ගෞතමයිනි, නිරෝගිද? ආදී තන්හි ආරෝග්‍යයෙහි පෙනේ. ස්වාමීනි කවරනම් කාය සමාචාරයෙක් යහපත්ද? මහරජ, යම් කාය සමාචාරයෙක් නිවැරදිද? එය යහපත්ය. ස්වාමීනි නැවතද භාග්‍යවතුන් වහන්සේ කුසල්දම්හි දම් දෙසත්. එය අතිශ්‍රේෂ්ඨය. මේ ආදීන්හි නිරවද්‍යයෙහි යෙදේ. නුඹ රථයෙහි අඟ පසඟයන්ගේ දක්‍ෂයෙකි. නෘත්‍ය ගීතයන්හි දක්ෂයෙකි. මනා දක්‍ෂතාවයෙහි හික්මුණාහු ආදීන්හි දක්‍ෂතාවයෙහි යෙදේ. මහණෙනි, කුසල් ධර්මයන්ගේ සමාදන් වීමේ හේතුවෙන්, කුසල කර්මයාගේ කළ බැවින්, රැස්කළ බැවින්, ආදීන්හි සැප විපාකයෙහි යෙදේ. එය මෙහි, ආරෝග්‍යයෙහිද, නිරවද්‍යයෙහිද, සැප විපාකයෙහිද වැටේ. මෙහි වචනාර්ථය වනාහි පිළිකුල් පාපධර්මයන් සොලවයි. චලනය කරයි. කම්පා කරයි. විනාශ කෙරෙයි. කුසල් නම් වේ. පිළිකුල් ආකාරයෙන් හොවිති. පවතිත්තුයි කුසයි. ඒ කුසයන් කපති. සිඳිත්නුයි කුසල් නම් වේ. පිළිකුල් ද්‍රව්‍යයන් සියුම් කරන හෙයින්ද තුනී කරන හෙයින්ද ඤාණය කුස නම් වේ. එම කුස නමැති ඤාණයෙන් කැපිය යුතු හෙයින්ද, ගතයුතු හෙයින්ද පැවැත්විය යුතු හෙයින්ද කුසල් නම් වේ. යම්සේ වනාහි කුසතණ දෙපැත්තෙන් අල්ලාගත් කල්හි අත් පෙදෙස කපත්ද? එසේ මේවාද උපන් නූපන් භාවයෙන් ද්විපාර්ශ්ව ගතවූයේ කෙලෙස් සහිත පක්‍ෂය කපති. එහෙයින් කුසතණ මෙන් කපත්නුයි කුසල නම් වේ. තවද ආරෝග්‍යාර්ථයෙන්ද නිරවද්‍යාර්ථයෙන්ද, දක්‍ෂතා හටගැනීම් අර්ථයෙන් හෝ කුසල්ය. මෙහි වනාහි විදර්ශනා කුසලයම අදහස් කරන ලදී. එහෙයින් සෙස්සන් හැර එයම දැක්වීම සඳහා 'කුසල ධර්මයෙහි යැයි ඒකවචන කරන ලදැයි දතයුතුයි. විදර්ශනා කුසල ධර්මයෙහි පසුබට නොවීම් වශයෙන්ද, මනාව කිරීම් වශයෙන්ද යෙදෙනවුන්ගේ යන අර්ථයි. **සෙකඛ පරියනෙත පරිපූරකාරීනං** යන මෙහි ත්‍රිවිධ ශික්‍ෂාවන්හි හටගත්තේනුයි සෙකඛායි. සප්ත ශෛක්‍ෂයන්ගේ මේවානුයි සෙකඛායි. තෙමේම හික්මේනුයි සෙකඛායි. සෝවාන් මාර්ග, ඵල, සකෘදාගාමි මාර්ග, ඵල, අනාගාමි මාර්ග, ඵල, අර්හත් මාර්ගය ධර්මය, ඒ ශෛක්‍ෂ ධර්ම, කෙළවරෙහි,

අවසානයෙහි මොහුටය, ඒ ශෛක්‍ෂ ධර්ම කෙළවර, අවසානය මොහුටනුයි ශෛක්‍ෂ පරියන්තයි. ඒ ශෛක්‍ෂ පර්යන්ත ධර්මයෙහි යැයි සම්බන්ධයි. පරිපූරණය, පරිපූර්ණත්වය කෙරෙත්නුයි පරිපූරකාරිනොයි. පරිපූරකාරීවීම, පරිපූරකාරිත්වය මොවුන්ට ඇත්තේනුයි = පරිපූර කාරිනො නම් වේ. සෝවාන් මාර්ගයට පූර්වභාගයෙහි වූ, ශෛක්‍ෂ පර්යන්ත, ප්‍රතිපදා ධර්මයෙහි, විදර්ශනා සම්පූර්ණ කීමෙහි තියැලි පරිපූරකයින්ගේ **කායෙච ජීවිතෙච අනපෙක්ඛානං** යන මෙහි කායෙ යනු ශරීරයෙහි, ශරීරය වනාහි අපද්‍රව්‍ය රැස්කරන හෙයින්ද, පිළිකුල් කෙස් ආදීන්ගේද, චක්‍ෂු රෝගාදී සියගණන් රෝගයන්ගේද හටගන්නා ස්ථානය වූ හෙයින් කායයැයි යූ.සේයි. **ජීවිතෙ** යනු ජීවිතින්ද්‍රියයෙහි, එය වනාහි එයින් ජීවත්වෙත්නුයි ජීවිතයයි යූ.සේයි. මොවුන්ට අපේක්‍ෂාවක් නැත්තේනුයි අනපෙක්ඛායි. ඇල්මක් නොමැතිය යන අර්ථයි. ඒ ශරීරයෙහිද ජීවිතයෙහිද අපේක්‍ෂා රහිත ඔවුන්ගේ, දැන් ඔවුන්ගේ ඒවාහි අපේක්‍ෂා රහිත භාවයට කරුණු දක්වන්නේ, **පරිච්චත්ත ජීවිතං** යන්න වදාළේය. බුදුරදුන්ට හෝ ආචාර්යයන් වහන්සේට හෝ සියදිවි පරිත්‍යාගයෙන්ම, ඔවුහු ක්ලාන්ත වන කල්හි හෝ සිරුර නැසෙන කල්හි හෝ ජීවිතයෙහි බලාපොරොත්තු රහිත වෙති. **සත්තන්නං සෙක්ඛානං** යනු හික්මෙත්නුයි සෙක්ඛ යයි ලබන ලද නම් ඇති, සෝවාන් මාර්ගස්ථාදී සප්ත ආර්ය පුද්ගලයන්ගේ. **තථාගත සාවකානං** තථාගත ශ්‍රාවකයින්ගේ, අටවැදෑරුම් ආර්ය පුද්ගලයෝ ශ්‍රවණාන්තයෙහි ආර්ය ජාතියෙහි උපන් බැවින්, භාග්‍යවතුන් වහන්සේගේ දේශනයෙන්, අනුසාසනා ලද හෙයින්, නොසෙල්වෙන ප්‍රසාද යෝගයෙන් සකස්ව අසත්නුයි ශ්‍රාවකයෝ වෙති. ඔවුනතරෙහි අර්හත් ඵලස්ථයින්ම විශේෂයෙන් දක්වන්නේ ඛීණාසවානං යනාදිය වදාළහ. අර්හත් මාර්ග ඥාණයෙන් සියලු ආශ්‍රවයන්ගේ ක්‍ෂය කිරීමෙනැයි යන අර්ථයි. **පච්චෙක බුද්ධානං** යනු ඒ ඒ කරුණු හේතුකොට හුදෙකලාව, ගුරුවරයෙකු නොමැතිව සිව්සස් අවබෝධ කරන ලද්දේනුයි පච්චෙක බුද්ධයි. එවැනි පසේබුදුවරුන්ගේ, **තථාගතානං** යනු මෙහි කරුණු අටෙකින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ. එසේ පැමිණියේනුයි= තථාගතයි. එසේ ගියේනුයි තථාගතයි. සත්‍ය ලක්‍ෂණයට පැමිණියේනුයි තථාගතයි. සත්‍ය ධර්මයන් යථා පරිදි අවබෝධ කළේනුයි = තථාගතයි. සත්‍යය පෙන්වන ලද හෙයින් තථාගතයි. එසේ කියන හෙයින් තථාගතයි. එසේ කරණ හෙයින් තථාගතයි. මැඩපැවැත්වීම් අර්ථයෙන් තථාගතයි. භාග්‍යවතුන් වහන්සේ එසේ පැමිණි හෙයින් කෙසේ තථාගත වූද? යම්සේ පූර්ව සම්‍යක් සම්බුදුවරු සියලු ලෝවාසීන්ගේ හිතසුව පිණිස උද්යෝග ප්‍රාප්තව

පැමිණියාහුද? මින් කුමක් කියන ලද්දේ වේද? යම් ප්‍රාර්ථනාවකින් පූර්ව බුදුවරු පැමිණියාහුද? ඒ ආකාරයෙන්ම අපගේ බුදුරදහුද පැමිණියෝය. නොහොත් යම්සේ පූර්ව බුදුවරු දාන, සීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්ය, ක්‍ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී-උපේක්‍ෂා සංඛ්‍යාත, දස පාරමී, දස උපපාරමී, දස පරමාර්ථ පාරමී යන සමතිස් පෙරුම් පුරා, ශරීරාවයව පරිත්‍යාගය, ඇස්, ධනය, රාජ්‍යය, අඹුදරු, ජීවිත යන මේ පඤ්ච මහා පරිත්‍යාගයන් පරිත්‍යාගකොට, පූර්වයෝග, පූර්වචර්යා ධර්මය කියාදීම, ඤාතාර්ථ චර්යාදීන් (ඤාති හිතසුව කාර්යයන්) සම්පූර්ණකොට බුද්ධි චර්යාවෙන් කෙළපත්ව පැමිණියාහුද? අපගේ භාග්‍යවතුන් වහන්සේද එසේ පැමිණියෝය. යම්සේ පෙර භාග්‍යවතුන් වහන්සේලා සතර සතිපට්ඨානයන්, සතර සම්‍යක් ප්‍රධානයන්, සතර ඍද්ධිපාදයන්, පඤ්ච ඉන්ද්‍රියයන්, පඤ්ච බලයන්, සප්ත බොජ්ඣංගයන්, ආර්ය අෂ්ටාංගික මාර්ගය, වඩා, වර්ධනයකොට පැමිණියාහුය. එසේම අපගේ භාග්‍යවතුන් වහන්සේද පැමිණියේනුයි තථාගත නම් වේ.

යථෙව දීපංකර බුද්ධ ආදයො
සබ්බඤ්ඤු භාවං මුනයො ඉධාගතා
තථා අයං සක්‍ය මුනීපි ආගතො
තථාගතො වුච්චති තෙන චක්ඛුමා'ති

යම්සේ දීපංකර බුද්ධාදී, මුනිවරු මෙහි සර්වඥභාවයට පැමිණියාහුද, එසේම මේ සාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේද පැමිණියෝය. ප්‍රඥා චක්‍ෂුසින් යුත් උතුමාණෝ එහෙයින් තථාගතයයි කියනු ලැබෙත්.

එසේ ගියේනුයි කෙසේ තථාගත වේද? යම්සේ උපන් සැණින් පූර්ව භාග්‍යවත්හු ගියාහුද? කවරනම් අයුරකින් ඔවුහු ගියාහුද? ඔවුන් විසින් උපන් සැණින් සමපාදයන් පෘථුවියෙහි පිහිටුවා, උතුරුදිසාභිමුඛව, සත් පියවරක් එකිනෙක ඔසවා තබමින් ගියාහුය. දෙසූ පරිදිඃ ආනන්දය, උපන් සැණින් බෝසත් තෙමේ, පෘථුවියෙහි සමව පා පිහිටුවා, උතුරු දිසාභිමුඛව සත්පියවරක් එකිනෙක ඔසවා තබමින් යයි. සුදුකුඩ දරනු ලබන්නේ, හාත්පස සියලු දිසාවන් බලයි. ශ්‍රේෂ්ඨ වචනයක්ද ප්‍රකාශ කරයි. මම ලෝකයට අග්‍රවෙමි. මම ලෝකයට ජ්‍යෙෂ්ඨ වෙමි. මම ලෝකයට ශ්‍රේෂ්ඨ වෙමි. මෙය මාගේ අන්තිම උපතයි. දැන් පුනර්භවයක් නැත. නොයෙක් විශේෂ අධිගමයන්ට පූර්ව නිමිති භාවයෙන් එතුමාගේ

එම ගමන සත්‍යය විය. බොරු නොවීය. එතුමා යම් කරුණක් නිසා උපන් සැණින් සමපාවලින් පෘථුවියෙහි පිහිටියේද, මෙය එතුමාගේ සිව් ඍද්ධිපාද ලාභයෙහි පෙරනිමිත්තයි. එතුමාගේ උතුරු දිසාවට අභිමුඛව ගමන්කිරීම සියලු ලෝකෝත්තර තත්වයන්ට පත්වීමේ පෙරනිමිත්තයි. සත්පියවරක් එකිනෙක ඔසවා තැබීම සප්ත බොජ්ඣංගරත්න ප්‍රතිලාභයෙහි පෙරනිමිත්තයි. රන් දඬුවලින් සෙමෙර සලත්. මෙහි කියන ලද සෙමෙර එසවීම වනාහි සියලු තීර්ථකයන් මැඩපැවැත්වීමෙහි පෙරනිමිත්තයි. සේසත් දැරීම, අර්හත්ඵල සංඛ්‍යාත, උතුම් විමුක්තිය වූ, නිර්මල ශ්වේත ඡත්‍රයාගේ ප්‍රතිලාභයට පෙරනිමිත්තයි. හාත්පස සියලු දිසාවන් බැලීම, සර්වඥතාඥාන අනාවරණ ඥාන ප්‍රතිලාභයෙහි පෙරනිමිත්තයි.

ශ්‍රේෂ්ඨ වචන කථාකිරීම වනාහි, කිසිවෙකු විසින් හෝ නොපවත්වන ලද, ශ්‍රේෂ්ඨ දම්සක් පැවතුම් දෙස්මෙහි පෙරනිමිත්තයි. මේ භාග්‍යවතුන් වහන්සේද එසේ ගියෝය. එතුමාගේ මෙම ගමනද සත්‍ය වීය. නිබොරු විය. එම විසේසාධිගමයන්ගේ පෙරනිමිති භාවයෙන් ඉහත කරුණු සිදුවිය. එහෙයින් පෞරාණිකයෝ කීහු :-

මුහුත්තජාතොව ගවම්පතී යථා
සමෙහි පාදෙහි ඵුසී වසුන්ධරං
සො වික්කමී සත්ත පදානි ගොතමො
සෙතඤ්ච ඡත්තං අනුධාරයුං මරූ

උපන් සැණින් වෘෂභයා යම්සේද? එසේ සම පාවලින් පෘථුවිය ස්පර්ශ කළේය. ඒ ගෞතම බෝසත්හු පියවර සතක් ගමන් කළහ. දෙවිවරු සුදු කුඩ දැරූහ.

ගන්ත්වාන සො සත්ත පදානි ගොතමො
දිසා විලොකෙසි සමා සමන්තතො
අට්ඨංගුපෙතං ගිර මබ්භුදීරයී
සීහො යථා පබ්බත මුද්ධ නිට්ඨිතො'ති

ඒ ගෞතම බෝසත්හු සත්පියවරක් ගොස්, හාත්පස සියලු දිසාවන් සමව බැලූහ. අෂ්ඨාංගයකින් යුත් ශබ්ද සහිතව පර්වත මුදුනෙහි සිටි සිංහයෙකු මෙන් හඬ නගා කීවෝය.

මෙසේ, එසේ ගියේනුයි තථාගතයි. නොහොත් පළමු බුදුවරු යම්සේද, මේ බුදුරදහුද එසේමය. නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයද, -පෙ- ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ද, -පෙ- අනිත්‍යානුපස්සනාවෙන් නිත්‍ය සංඥාවගේද, -පෙ- අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙසුන්ද දුරුකොට ගියෝය. මෙසේද එසේ ගියේනුයි තථාගතයි.

කෙසේ සත්‍ය ලක්‍ෂණයට පැමිණියේනුයි තථාගත නම් වේද? පෘථුවි ධාතුවෙහි කර්කශභාව ලක්‍ෂණය සත්‍යය. තිබොරුය. ආපෝ ධාතුවෙහි වැගිරෙන ලක්‍ෂණය, තේජෝ ධාතුවෙහි උෂ්ණත්ව ලක්‍ෂණය, වායෝ ධාතුවෙහි පිම්බවීම් ලක්‍ෂණය, ආකාස ධාතුවෙහි ස්පර්ශ නොකළ හැකි ලක්‍ෂණය, විඤ්ඤාණ ධාතුවෙහි දැනගැනීම් ලක්‍ෂණය, රූපයාගේ වෙනස්වීම් ලක්‍ෂණය, වේදනාවගේ විඳීම් ලක්‍ෂණය, සඤ්ඤාවගේ හැඳිනීම් ලක්‍ෂණය, සංස්කාරයන්ගේ රැස්කිරීම් ලක්‍ෂණය, විඤ්ඤාණයාගේ දැනගැනීම් ලක්‍ෂණය, විතර්කයාගේ අරමුණට නංවන ලක්‍ෂණයද, විචාරයාගේ පිරිමදින ලක්‍ෂණයද, ප්‍රීතියගේ පැතිරීම් ලක්‍ෂණයද, සුවයෙහි මිහිරි ලක්‍ෂණයද, චිත්තකාග්‍රතාවෙහි නොවිසුරුණු ලක්‍ෂණයද, ස්පර්ශයාගේ ඒ ස්පර්ශ කිරීමේ ලක්‍ෂණයද, සද්ධින්‍ද්‍රියාගේ ස්ථිර ලක්‍ෂණයද, වීර්ය ඉන්ද්‍රියයාගේ උත්සාහවත් වීමේ ලක්‍ෂණයද, සතින්ද්‍රියයාගේ වැටහෙන ලක්‍ෂණයද, සමාධින්ද්‍රියයාගේ නොවිසිරෙන ලක්‍ෂණයද, ප්‍රඥා ඉන්ද්‍රියයාගේ විශේෂයෙන් දැනගන්නා ලක්‍ෂණයද ශ්‍රද්ධා බලයාගේ අශ්‍රද්ධාවත් භාවයෙහි කම්පානොවන ලක්‍ෂණයද, වීර්ය බලයාගේ කුසීතකමෙහිද, සති බලයාගේ සිහි මුළාවෙහිද, සමාධි බලයාගේ නොසන්සුන්කමෙහිද, ප්‍රඥා බලයෙහි අවිද්‍යාවගේ කම්පානොවන ලක්‍ෂණද, සති සම්බොජ්ඣංගයාගේ විමසීම් ලක්‍ෂණයද, වීර්ය සම්බොජ්ඣංගයාගේ උත්සාහවීම් ලක්‍ෂණයද, ප්‍රීති සම්බොජ්ඣංගයාගේ සන්සිඳීම් ලක්‍ෂණයද, සමාධි සම්බොජ්ඣංගයාගේ චංචල නොවීම් ලක්‍ෂණයද, උපෙක්‍ෂා සම්බොජ්ඣංගයාගේ නුවණින් සලකා බැලීම් ලක්‍ෂණයද, සම්‍යක් දෘෂ්ටියගේ දර්ශන ලක්‍ෂණයද, සම්‍යක් සංකල්පයාගේ අරමුණට නංවන ලක්‍ෂණයද, සම්‍යක් වචනයෙහි අල්ලා ගැනීම් ලක්‍ෂණයද, සම්‍යක් කර්මාන්තයෙහි හටගැනීම් ලක්‍ෂණයද, සම්‍යක් ආජීවයාගේ පිරිසිදුකිරීම් ලක්‍ෂණයද, සම්‍යක් ව්‍යායාමයාගේ උත්සාහවත් වීම් ලක්‍ෂණයද, සම්‍යක් සතියෙහි වැටහෙන ලක්‍ෂණයද, සම්‍යක් සමාධියගේ නොවිසිරුණ ලක්‍ෂණයද අවිද්‍යාවගේ නොදැනීම් ලක්‍ෂණයද, සංස්කාරයන්ගේ (කුසලාකුසල කර්මයන්ගේ) චේතනා ලක්‍ෂණයද, විඤ්ඤාණයාගේ දැනගැනීම් ලක්‍ෂණයද, නාමයාගේ නැමෙන ලක්‍ෂණයද,

රූපයාගේ වෙනස්වීම් ලක්‍ෂණයද, සළායතනයාගේ උත්පත්ති ස්ථාන ලක්‍ෂණයද ස්පර්ශයාගේ ස්පර්ශකිරීම් ලක්‍ෂණයද, වේදනාවගේ විඳීම් ලක්‍ෂණයද, තෘෂ්ණාවගේ හේතු ලක්‍ෂණයද, උපාදානයාගේ තදින් අල්ලා ගැනීම් ලක්‍ෂණයද, භවයාගේ රැස්කරන ලක්‍ෂණයද, ජාතියගේ උපදවන ලක්‍ෂණයද, ජරාවගේ දිරන ලක්‍ෂණයද, මරණයාගේ චුතවීම් ලක්‍ෂණයද, ධාතුන්ගේ ශුන්‍යතා ලක්‍ෂණයද, ආයතනයන්ගේ හටගැනීම් ලක්‍ෂණයද, සතිපට්ඨානයන්ගේ වැටහෙන ලක්‍ෂණයද, සම්‍යක් ප්‍රධානයන්ගේ බලවත් උත්සාහ කිරීම් ලක්‍ෂණයද ඍද්ධිපාදයන්ගේ සමෘද්ධවීම් ලක්‍ෂණයද, ඉන්ද්‍රියයන්ගේ ප්‍රධානත්ව ලක්‍ෂණයද, බලයන්ගේ කම්පා නොවන ලක්‍ෂණයද, බොජ්ඣංගයන්ගේ නික්මයාම් ලක්‍ෂණයද, මාර්ගයාගේ හේතු ලක්‍ෂණයද, සත්‍යයන්ගේ සත්‍යය ලක්‍ෂණයද, සමථයාගේ චංචල නොවීම් ලක්‍ෂණයද විදර්ශනාවගේ නුවණින් බැලීම් ලක්‍ෂණයද, සමථ විදර්ශනාවන්ගේ ඒකරස ලක්‍ෂණයද, යුගනද්ධයන්ගේ නොඉක්මවීම් ලක්‍ෂණයද, සීල විසුද්ධියෙහි සංවර ලක්‍ෂණයද, චිත්ත විසුද්ධියෙහි නොකැළඹුණ ලක්‍ෂණයද දිට්ඨි විශුද්ධියෙහි දර්ශන ලක්‍ෂණයද, ක්‍ෂය ඥාණයාගේ විනාශකිරීම් ලක්‍ෂණයද, අනුත්පාද ඥාණයාගේ සන්සිඳීම් ලක්‍ෂණයද, ඡන්දයාගේ මුල්වීම් ලක්‍ෂණයද, මනසිකාරයාගේ හටගැනීම් ලක්‍ෂණයද, ස්පර්ශයාගේ සම්බන්ධවීම් ලක්‍ෂණයද, වේදනාවගේ එක්තැන්වීම් ලක්‍ෂණයද, සමාධියගේ ප්‍රමුඛ ලක්‍ෂණයද සිහියෙහි ආධිපත්‍ය ලක්‍ෂණයද, ප්‍රඥාවගේ උසස් පැතිරීම් ලක්‍ෂණයද, විමුක්තියෙහි සාර ලක්‍ෂණයද, අමතොගධ නිර්වාණයාගේ කෙළවරවීම් ලක්‍ෂණයද, සත්‍යය, නිබොරුය. ඒ සත්‍ය ලක්‍ෂණය ඥාණ ස්වභාවයෙන් පැමිණියේය. නොවැරදී පැමිණියේය. අනුප්‍රාප්ත වූයේනුයි තථාගතයි. මෙසේ සත්‍යය ලක්‍ෂණයට පැමිණියේනුයි තථාගතයි.

කෙසේ සත්‍ය ධර්මයන් තත්වූ පරිදි මනාව අවබෝධ කරන ලද්දේනුයි තථාගත වේද? සත්‍ය ධර්මයෝ නම් සිව් අරිසස්ය. දෙසූ පරිදි මහණෙනි, මේ කරුණු සතරෙක් සත්‍යය, නිබොරුය. අන් ආකාරයකින් නොවන්නේය. කවර සතරෙක්ද? මහණෙනි, මේ දුකයයි යන යමක් වේද, එය සත්‍යය. නිබොරුය. අන් ආකාරයකින් නොවේයයි විස්තරයයි. ඒවා භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කරගත්තාහුයි සත්‍යයන්ගේ මනා අවබෝධය ලත් හෙයින් තථාගතයි. මෙහි ගත ශබ්දය මනාව අවබෝධ කිරීම් අර්ථයෙහිය. තවද, ජරා මරණයාගේ ජාති ප්‍රත්‍යයෙන් හටගත්, හටගත් අර්ථය සත්‍යය. නිබොරුය. අන්‍ය ආකාරයකින් නොවන්නේය. -පෙ- සංස්කාරයන්ගේ

අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගත් හටගත් අර්ථය සත්‍යය, නිබොරුය. අන්‍ය ආකාරයකින් නොවන්නේය. එසේම අවිද්‍යාවගේ සංස්කාරයන්ට ප්‍රත්‍යාර්ථය, සත්‍යය, නිබොරුය. අන්‍ය ආකාරයකින් නොවන්නේය. උපත ජරා මරණයට ප්‍රත්‍යයාර්ථය. සත්‍යය, නිබොරුය. අන්‍ය ආකාරයකින් නොවන්නේය. ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළ සේක. එහෙයින්ද සත්‍යයන්ගේ මනා අවබෝධය ලත් හෙයින් තථාගතයි. මෙසේ සත්‍ය ධර්මයන් තත්වූ පරිදි මනාව අවබෝධ කරන ලද්දේනුයි තථාගතයි. කෙසේ සත්‍යය දක්නා ලද හෙයින් තථාගත වේද? භාග්‍යවතුන් වහන්සේ, දෙවියන් සහිත, දෙවි මිනිසුන් සහිත, අප්‍රමාණ ලෝකධාතූන්හි, අප්‍රමාණ සත්ත්වයින්ගේ, චක්ෂු ද්වාරයන්හි හමුවට එන යම් රූපඅරමුණක් නම් ඇත්ද? එය සර්වප්‍රකාරයෙන් දනියි. දකියි. මෙසේ දන්නේ, දක්නේ, එමගින් එහි ඉටු, අනිටු ආදී වශයෙන් හෝ දිට්ඨ, සුත, මුත, විඤ්ඤාතයන්හි ලැබෙන පද වශයෙන් හෝ එම රූපායතනය කවරේද? සතරමහා භූතයන්ගේ, උපාදාය රූපයන්ගේ, සනිදර්ශන, සප්පටිඝ වශයෙන්, නිල්, කහ, ආදී බබලන වර්ණ වශයෙන් යම් රූපයක් වේදැයි ආදී ක්‍රමයෙන් නොයෙක් නාමයන්ගෙන්, තෙළෙස් වාරයන්ගෙන්, දෙපණස් ක්‍රමයන්ගෙන් බෙදනු ලබන්නේ සත්‍යයම වේ. අසත්‍යයක් නැත. සෝතද්වාරාදීන්හි අභිමුඛයට එනු ලබන ශබ්දයන්හි මෙම ක්‍රමයමැයි. භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී.

මහණෙනි, දෙවියන් සහිත, දෙවි මිනිසුන් සහිත දුටු, ඇසූ, ඇස, කණ හැර අනෙක් ඉඳුරන්ගෙන් විඳිනා, මනසින් දත්, පත්, සෙවුණා ලද, හැසිරුණු යමක් වේද? මම ඒ සියල්ල දනිමි. මම එය මනාව දත්තෙමි. එය තථාගතයන් වහන්සේට ප්‍රකටය. එය තථාගතයන් වහන්සේට වැටහිණි. මෙසේ සත්‍යය දක්නා ලද හෙයින් තථාගතයි. එහි සත්‍යය දක්නා අර්ථයෙහි තථාගතයයි පද සම්බන්ධය දතයුතුය.

කෙසේ සත්‍යය කියන ලද හෙයින් තථාගත වේද? භාග්‍යවතුන් වහන්සේ, යම් රැයක බෝමැඩ අපරාජිත පර්යංකයෙහි වැඩසිටි සේක්, සිවුමරුන්ගේ මස්තකය මැඩ, අතිශ්‍රේෂ්ට සම්‍යක් සම්බුද්ධත්වය මනාව අවබෝධ කළ සේක්ද, යම් රැයක සල්රුක් ද්වය අතර අනුපාදිසේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑසේක්ද, මේ අතර පන්සාළිස් වර්ෂ ප්‍රමාණ කාලයෙහි ප්‍රථම බෝධියෙහිද, මධ්‍යම බෝධියෙහිද, පශ්චිම බෝධියෙහිද, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද යම් සූත්‍ර, ගෙය්‍ය -පෙ- වේදල්ලයක් වේද, ඒ සියල්ල අර්ථ වශයෙන්ද, ව්‍යංජන වශයෙන්ද,

නිරවද්‍යය. නිදොස්ය. ඌනාධික රහිතය. සර්වාකාරයෙන් සම්පූර්ණය. රාග මදය මද රහිත කරයි. ද්වේෂ, මෝහ මද මද රහිත කරයි. අස්කෙන්දක් තරම් වූද පැකිලීමක් නැත. ඒ සියල්ල එක් මුද්‍රාවකින් මුද්‍රා තැබුවා මෙනි. එක් නැළියකින් මිණුවා මෙනි. එක් තරාදියකින් සමබරව කිරන ලද්දක් මෙන් සත්‍යයම වේ. දෙසූ පරිදි : චුන්දය යම් රාත්‍රියක තථාගතයන් වහන්සේ ශ්‍රේෂ්ඨ සම්‍යක් සම්බුද්ධත්වය අවබෝධ කරත්ද, යම් රාත්‍රියක අනුපදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාන සේක්ද, ඒ අතරෙහි යමක් කියන සේක්ද, කථා කරන සේක්ද, ඒ සියල්ල සත්‍යයම වේ. අන් අයුරකින් නොවේ. එහෙයින් තථාගතයයි කියනු ලැබේ. මෙහි ගත ශබ්දය ශබ්දාර්ථයෙහි යෙදේ. මෙසේ සත්‍යය කියන ලද හෙයින් තථාගතයි. තවද, කීම ආගදයි. කීම යන අර්ථයි. සත්‍යය වෙනස් නොවූ කීම මොහුටනුයි දකාරයට තකාරය කොට තථාගතයැයි මෙසේ මෙම අර්ථයෙහි පද සිද්ධිය දතයුත්තාහ.

එසේ කරන ලද හෙයින් කෙසේ තථාගත වේද? භාග්‍යවතුන් වහන්සේගේ වචනය ශරීරයට අනුලොම් වේ. ශරීරයද වචනයට අනුලොම් වේ. එහෙයින් යම්සේ දෙසත්ද, එසේ කරත්. යම්සේ කරත්ද එසේ දෙසන්නේද වෙති. මෙසේ වන්නා වූ එතුමන්ට වචනයත් සිරුරත් යම්සේ සමාන වන්නේද? එසේ වූයේය. පැවැත්තේය යන අර්ථයි. සිරුර යම්සේද දෙස්මද එසේමය. එසේ වූහ. පැවැත්තාහුය යන අර්ථයි. එහෙයින්ම දෙසන ලදී. මහණෙනි, තථාගතයන් වහන්සේ යම්සේ දෙසත්ද, එසේ කරත්. යම්සේ කරත්ද, එසේ දෙසත්. මෙසේ යම්සේ දෙසත්ද, එසේ කරත්. යම්සේ කරත්ද, එසේ දෙසත්. එහෙයින් තථාගතයැයි කියනු ලැබේ. මෙසේ, එසේ කරන ලද හෙයින් තථාගතයි.

මැඩපැවැත්වීම් අර්ථයෙන් කෙසේ තථාගත වේද? මත්තෙහි භවාග්‍රය තෙක්ද යටින් අවීචිය තෙක්ද සීමාකොට සරසින් අප්‍රමාණ ලෝකධාතුන්හි සියලු සත්ත්වයින්, සීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන්, විමුක්තියෙන්, විමුක්ති ඤාණ දර්ශනයෙන් මැඩපවත්වයි. එතුමන්ට එහිලා මිණීමක් හෝ ප්‍රමාණයක් නොමැත. අතුල්‍යය, අප්‍රමෙය්‍යය. අනුත්තරය. රාජාධිරාජය. දේවාතිදේවය. ශක්‍රාතිශක්‍රය. බ්‍රහ්මාති බ්‍රහ්මය. එහෙයින් දෙසන ලදී. මහණෙනි, දෙවියන් සහිත දෙව් මිනිසුන් සහිත ලෝකයෙහි තථාගතයන් වහන්සේ මැඩපවත්වති. අන්‍යයා විසින් මැඩපැවැත්විය නොහැක. ඒකාන්තයෙන් සියල්ල දක්නේය. අන්‍යයා තම වසඟයෙහි

පවත්වයි. එහෙයින් තථාගත යැයි කියනු ලැබේ. එහි මෙසේ පද සිද්ධිය දතයුත්තාහුය. බෙහෙතක් මෙන් වූයේනුයි අගදොයි. එය කිමෙක්ද? දේශනා විලාසයද පිනෙන් පිරුණු බවයි.

එහෙයින් මෙතුමාණෝ මහානුභාව සම්පන්න වෛද්‍යවරයෙක්, දිව්‍යමය බෙහෙදකින් සර්පයන් මඩනා සේ සියලු මිථ්‍යා මතධාරී දෙවියන් සහිත ලෝකයා මැඩපවත්වති. මෙසේ මුළු ලෝකයා මැඩපැවැත්වීමෙහි, සත්‍යය වූ, අවිපරීත වූ දේශනා විලාසමය වූද, පුණ්‍යමය වූද, බෙහෙත් මොහුට ඇත්තේනුයි දකාරයට තකාර කොට තථාගතයයි දතයුත්තේය. මෙසේ මැඩපැවැත්වීම් අර්ථයෙන් තථාගතයි. තවද සත්‍යය කරා ගමන් කළේනුයි තථාගතයි. සත්‍යයට පැමිණුනෙයිද තථාගතයි. ගතො යනු අවබෝධ කළේය. ඉක්ම ගියේය. පැමිණියේය. පිළිපන්නේය යන අර්ථයි. එහි මුළු ලොව තීරණ පරිඥාවෙන් සත්‍යයට ගියේය. අවබෝධ කළේනුයි තථාගතයි. ලෝක සමුදය ප්‍රහාණ පරිඥාවෙන් සත්‍යයට ගියේය. ඉක්ම ගියේනුයි තථාගතයි. ලෝක නිරෝධය සාක්‍ෂාත් කිරීමෙන් සත්‍යයට ගියේය. පැමිණියේනුයි තථාගතයි. ලෝකනිරෝධගාමිනී ප්‍රතිපදා සත්‍යයට ගියේය. පිළිපන්නේනුයි තථාගතයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් වදාරන ලද්දේද? මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් ලෝකය මනාසේ අවබෝධ කරන ලදී. තථාගතයන් වහන්සේ ලෝකයෙන් වෙන්වූ සේක. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් ලෝක සමුදය අවබෝධ කරන ලදී. තථාගතයන් වහන්සේගේ ලෝක සමුදය ප්‍රහීණය. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් ලෝක නිරෝධය අවබෝධ කරන ලදී. තථාගතයන් වහන්සේ විසින් ලෝකනිරෝධ ගාමිනී ප්‍රතිපදාව අවබෝධ කරන ලදී. ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාව තථාගතයන් වහන්සේට භාවිතය. මහණෙනි, දෙවියන් සහිත ලෝකයාගේ මනසින් යම් හැසිරීමක් වේද, ඒ සියල්ල තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. එහෙයින් තථාගතයයි කියනු ලැබේ. එයට මෙසේද අර්ථය දතුයුතුය. මෙයද තථාගතයන් වහන්සේගේ තථාගතභාවය දැක්වීමෙහි මුඛ මාත්‍රයක්මය. සර්වාකාරයෙන් වනාහි තථාගතයන් වහන්සේම තථාගතයන් වහන්සේගේ තථාගතභාවය වර්ණනා කරන්නේය. යම්හෙයකින් වනාහි සියලු බුදුවරු තථාගත ගුණයෙන්ද සමසමය. එහෙයින් සියල්ලන්ගේ වශයෙන් තථාගතානංයැයි කීහ.

අරහනතානං යනු කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින් ද කෙලෙස්

සතුරන් හා අරයන් නැසූ හෙයින්ද, ප්‍රත්‍යයාදීන්ට සුදුසු හෙයින්ද, පව් කිරීමෙහි රහසක් නොමැති හෙයින්ද, තථාගතයන් වහන්සේ අරහංය. එතුමාණෝ සියලු ක්ලේශයන්ගෙන් දුරස්ථය. දුර ළඟ දෙකෙහිම සිටිනු මාර්ගයෙන් අනුසහිත කෙලෙසුන්ගේ ප්‍රහාණය කළහෙයින් අරහං නම් වෙති.

**සො තතො ආරකා නාම - යස්ස යෙනා සමංගිතා**
**අසමංගීච දොසෙහි - නාථො තෙනා රහං මතො**

යමෙකු යමකින් යුක්ත නුවූයේද? එහෙයින් ඔහු දුරු වූයේ නම් වේ. දෝෂයන්ගෙන් යුක්ත නොවූයේද? එහෙයින් නාථයන් වහන්සේ අරහං යයි දන්නා ලදහ.

ඔවුහුද මේ කෙලෙස් අර මාර්ගයෙන් නසන ලද්දේනුයිද, සතුරන් නසන ලද්දේනුයිද අරහං නම් වේ.

**යස්මා රාගාදි සංඛාතා - සබ්බෙපි අරයො හතා**
**පඤ්ඤා සත්ථෙන නාථෙන - තස්මාපි අරහං මතො**

ප්‍රඥා නමැති ආයුධයෙන්, නාථයන් වහන්සේ විසින් යම්හෙයකින් රාගාදි සංඛ්‍යාත, සියලු අර නසන ලද්දේද එහෙයින් අරහං යයි දන්නා ලදී.

යම් ඒ අවිද්‍යා භව තෘෂ්ණාමය නැබ සහිත, පුණ්‍යාදි අභිසංඛාරයන්ගේ හටගත් අර සහිත, ජරා මරණ නමැති රෝද පට්ටම් සහිත, කෙලෙසුන්ගෙන් හටගත්තා වූම රෝද සම්බන්ධ කරන අලවංගුවෙන් විද, ත්‍රිභව නමැති රථයෙහි යොදන ලද, කෙළවරක් නොමැති කාලයක පටන් පැවති සංසාර චක්‍රය එතුමාට බෝමැඩදී මේ වීර්යපාදයන්ගෙන්, සීල නමැති පෘථුවියෙහි පිහිටා, ශ්‍රද්ධා හස්තයෙන්, කර්මක්ෂය කර ඥාන නමැති පොරොව ගෙන සියලු අර නසන ලද්දේනුයි අරයන්ගේ විනාශය කළ හෙයින්ද අරහං නම් වේ.

**අරා සංසාර චක්කස්ස - හතා ඤාණාසිනා යතො**
**ලොකනාථෙන තෙනෙස - අරහන්ති පවුච්චති**

ලෝකනාථයන් විසින් නුවණ නමැති අසිපතින් සංසාර චක්‍රයෙහි අර යම්හෙයකින් නසන ලද්දාහුද? එහෙයින් එතුමා අරහ යයි කියනු ලැබේ.

අග්‍ර දක්ෂිණාර්හ බැවින්ද, චීවරාදි ප්‍රත්‍ය ඇතුළු පූජා විශේෂයන්ද ලැබීමට සුදුසු වේ. එහෙයින්ම, තථාගතයන් වහන්සේ උපන් කල්හි, යම්කිසි මහේශාක්‍ය දෙව් මිනිස්සු වෙත්ද? ඔවුහු අන් තන්හි පූජා නොකෙරෙත්. එසේම සහම්පතී මහබ්‍රහ්ම මහමෙර පමණ රන්දමකින් තථාගතයන් වහන්සේ පූජා කළේය. අනෙකුත් දෙවිවරුද මිනිස්සුද, බිම්සර, කොසොල් ආදී රජවරුද ශක්ති ප්‍රමාණයෙන් පූජා කළහ. පිරිනිවියා වූද, බුදුරදුන් උදෙසා සය අනූකෝටියක් ධනය වියදම්කොට අසෝක මහරජු, සමස්ත ජම්බුද්වීපයෙහි අසූහාර දහසක් විහාර පිහිටවීය. අනෙක් අයගේ පූජා විශේෂ ගැන කියනුම කවරේද? ප්‍රත්‍යයාදීන්ට සුදුසු හෙයින්ද අරහං නම් වේ.

**පූජා විසෙසං සහ පච්චයෙහි - යසමා අයං අරහති ලොකනාථො**
**අත්ථානුරූපං අරහනති ලොකෙ - තසමා ජිනො අරහති නාමමෙතං**

ප්‍රත්‍යයන් සහිත පූජා විශේෂයන්ට, යම්හෙයකින් මේ ලෝකනාථයන් වහන්සේ සුදුසුද? අර්ථානුරූපව ලෝකයෙහි පූජාවන්ට සුදුසු වෙති. එහෙයින් ජිනේන්ද්‍රයන් වහන්සේ ඒ නාමයට සුදුසුය.

යම්සේ ලොවැ, කිසි පණ්ඩිතමානී අඥානයෝ, කීර්තිහානි බියෙන් රහසින් පව් කෙරෙති. මෙතුමාණෝ එසේ කිසිදිනෙක නොකෙරෙතියි, පව්කම්හි රහස් නොමැති හෙයින්ද අරහං නම් වේ.

**යසමා නත්ථි රහොනාම - පාප කමෙමසු තාදිනො**
**රහාභාවෙන තෙනෙස - අරහං ඉති විසසුතො**

යම් හෙයකින් තාදි ගුණ යුත් බුදුරදුන්ට පව්කම්හි රහසක් නම් නැත්ද? රහස් අභාවයෙන් එතුමාණෝ අරහං යයි ප්‍රකටය. හැම අයුරකින්ම මෙසේයි.

**ආරකත්තා හතත්තාච - කිලෙසාරීන සොමුනි**
**හත සංසාර චක්කාරො - පච්චයාදීන චාරහො**
**න රහො කරොති පාපානි - අරහං තෙන වුච්චති**

ඒ මුනීන්‍ද්‍රයාණන් වහන්සේ, කෙලෙස් සතුරන්ගෙන් දුරවූ හෙයින්ද, කෙලෙස් සතුරන් නැසූ හෙයින්ද, සංසාර චක්‍රයාගේ අර සිඳලූ හෙයින්ද, ප්‍රත්‍යයාදීන්ට සුදුසුය. රහසින්වත් පව් නොකරයි. එහෙයින් අරහං යයි කියනු ලැබේ.

යම්හෙයකින් වනාහි සියලු බුදුවරු අර්හත් ගුණයෙන්ද සමානය. එනිසා සියල්ලන්ගේ වශයෙන් **අරහන්තානං** යයි කීහ.

**සම්මා සම්බුද්ධානං** යනු මනාව තෙමේම සියලු ධර්මයන්ගේ අවබෝධත්වයට පත්හෙයින් සම්මා සම්බුද්ධයි. එසේම එතුමාණෝ සියලු ධර්මයන් මනාව අවබෝධ කළහ. විශිෂ්ට සේ දතයුතු ධර්මයන් විශිෂ්ට සේ අවබෝධ කළහ. විශේෂයෙන් දතයුතු ධර්මයන්, විශේෂයෙන් දැනගැනීම් වශයෙන්ද, ප්‍රහාණය කළයුතු ධර්මයන් ප්‍රහාණය කළයුතු වශයෙන්ද, ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයන් ප්‍රත්‍යක්ෂ කළයුතු වශයෙන්ද, වැඩිය යුතු ධර්මයන් වැඩිය යුතු වශයෙන්ද ක්‍රියාත්මක භාවයෙහි පිහිටියහ. එහෙයින් කීහ.

**අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං - භාවෙතබ්බඤ්ච භාවිතං**
**පහාතබ්බං පහීණං මෙ - තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණා'ති**

විශිෂ්ට සේ දතයුතු ධර්මයන් විශිෂ්ට සේ දත්තෙමි. වැඩිය යුතු ධර්මයන්ද වඩන ලද්දේ වෙමි. මා විසින් ප්‍රහාණය කළයුතු දෑ ප්‍රහාණය කළෙමි. බ්‍රාහ්මණය, එහෙයින් මම බුද්ධ වෙමි.

නොහොත්, ඇස දුක්ඛ සත්‍යයයි. එයට මුල්වූ කරුණ වශයෙන්, උපදවන ලද, පූර්ව තෘෂ්ණාව සමුදය සත්‍යයයි. ද්වයයෙහිම නොපැවැත්ම නිරෝධ සත්‍යයයි. නිරෝධය අවබෝධ කරන්නා වූ ප්‍රතිපදාව මාර්ග සත්‍යයයි. මෙසේ එකිනෙක පද උදුරා දැක්වීමෙන්ද, සියලු ධර්මයන් මනාව තෙමේම අවබෝධ කරන ලදී. ශ්‍රෝත්‍ර, ඝ්‍රාණ, ජිව්හා, කාය, මනාදීන්හිද ඒ ක්‍රමයමැයි. ඒ ක්‍රමයෙන්ම රූපාදී ෂඩායතනයන්, චක්ෂුර්

විඤ්ඤාණාදී ෂට්විඤ්ඤාණ කායයන්ද, චක්ෂු සම්ඵස්සාදී ෂට් ස්පර්ශයන්ද, චක්ෂු සම්ඵස්සයෙන් හටගත් ෂට් වේදනාවන්ද, රූප සංඥාදී ෂට් සංඥාවන්ද, රූප සංචේතනාදී ෂට් චේතනාවන්ද, රූප තෘෂ්ණාදී ෂට් තෘෂ්ණා කායයන්ද, රූප විතර්කාදී ෂට් විතර්කයන්ද, රූප විචාරාදී ෂට් විචාරයන්ද, රූප ස්කන්ධාදී පංච ස්කන්ධයන්ද, දස කසිණයන්ද, දස අනුස්සතීන්ද, අමුසොහොනෙහි හැරදමන ලද, ඉදිමුණු මෘත ශරීර සංඥාදි වශයෙන් වූ දස සංඥාවන්ද, කේශාදී ද්වත්තිංසාකාරයන්ද, ද්වාදසායතනයන්ද, අටළොස් ධාතූන්ද, කාමභවාදී නව භවයන්ද, ප්‍රථමාදී සතර ධ්‍යානයන්ද, මෛත්‍රී භාවනාදි සතර අප්‍රමාණ්‍යයන්ද, සතර අරූප සමාපත්තීන්ද, ප්‍රතිලෝම වශයෙන් ජරා මරණාදීන්ද, අනුලෝම වශයෙන් අවිද්‍යාදී ප්‍රතීත්‍ය සමුත්පාද අංගයන්ද යෙදිය යුත්තාහ. මේ එහි එක් පද යෙදුමකි. ජරා මරණ දුක්ඛ සත්‍යයයි. ජාතිය (ඉපැත්ම) සමුදය සත්‍යයයි. දෙකින්ම නිදහස්වීම නිරෝධ සත්‍යයයි. නිරෝධය දැනගන්නා වූ ප්‍රතිපදාව මාර්ග සත්‍යයයි. මෙසේ එකිනෙක පද උදුරා දැක්වීමෙන් සියලු ධර්මයන් මනාව තෙමේම අවබෝධ කළේය. මනාව අවබෝධ කළේය. ප්‍රතිවේධ කළේය. යම් ඒ කිසි අවබෝධ කළයුත්තක් ඇත්ද, ඒ සියල්ල මනාව අවබෝධ කළ හෙයින්ද, රහත්ඵල ඤාණ වශයෙන් මනාව අවබෝධ කළ සේක. එහි බෙදා දැක්වීම මත්තෙහි ප්‍රකට වන්නේය. යම්හෙයකින් වනාහි සියලු බුදුවරු, සම්‍යක් සම්බුද්ධ ගුණයෙන් සමාන වූවාහුද, එහෙයින් සියල්ලන්ගේ වශයෙන් **සම්මා සම්බුද්ධානං** යන්න වදාළහ.

දැන් පර්යන්ත පාරිශුද්ධි, අපරියන්ත පාරිශුද්ධි යන සීලද්වයයෙහි එක් එක් සීලය පස් අයුරකින් බිඳ දැක්වීමට 'අත්ථි සීලං පරියන්තං, අත්ථි සීලං අපරියන්තං' යනාදිය දෙසූහ. අනෙක් ත්‍රිවිධ සීලයන්හි එබඳු භේදයක් නැත. එහි **ලාභ පරියන්තං** යනු ලාභයෙන් අවසන්කොට ඇති භේදයක් එයටනුයි =ලාභපරින්තංයි. සෙස්සෙහිද එසේමය. **යසො** යන මෙහි පිරිවරයි. **ඉධ** යනු මෙලොවෙහි, **එකච්චො** යනු එකෙක්. **ලාභහෙතු** යනු ලාභයම හේතුවනුයි - ලාභහේතුයි. එහෙයින් ලාභ හේතුයෙන් යයි යූසේයි. හේතු අර්ථයෙහි පංචමී වචනයි. ලාභ ප්‍රත්‍යයෙන්, ලාභ කාරණයෙනැයි ඊටම පර්යාය වචනයි. හේතුවම නිසා එම ඵලය එයිනුයි ප්‍රත්‍යයද වේ. ඵලෝත්පත්තිය කරවයිනුයිද, හේතුවයයිද කියනු ලැබේ. **යථා සමාදිනනං** යනු යම් යම් ශික්ෂාපදයක් සමාදන්ව ගන්නා ලද්දේද? **වීතික්කමති** යනු ශික්ෂාපද ඉක්මවයි. **එවරූපානි** යනු මෙවන් ස්වභාවයන්ගෙන් කියන ලද ආකාරයන්ගෙන් යන අදහසයි. **සීලානි** යනු ගෘහස්ථ සීල හෝ ප්‍රව්‍රජිත

සීල හෝ වේවා, යම් සීලයන්ගේ මුල හෝ කෙළවරෙහි එකක් බිඳුණේ වේද, ඒවා කෙළවර සිඳුණු වස්ත්‍රයක් මෙන් **ඛණ්ඩානි** නම් වේ. යම් සීලයන්ගේ මධ්‍යයෙහි එකක් බිඳුණෝ වේද, එය මධ්‍යය විනිවිද ගිය සළුවක් මෙන් **ඡිද්දානියි.** යම් සීලයන්ගේ පිළිවෙළින් ද්වයයක් හෝ ත්‍රයයක් බිඳුණේ වේද, පිටෙහි හෝ කුසෙහි හෝ හටගත් දික් වටකුරු සටහන්වලින්ද, කලු, රතු ආදී සමාන නොවූ වර්ණයෙන්ද යුත්, ශරීර වර්ණ ඇති ගවදෙනක් මෙන් **සබලයි.** (පුල්ලි සහිතයි.) යම් සීලයන්ගේ, අතරතුර එකිනෙක බිඳුණේ වේද ඒවා අතරතුර විසභාග බින්දුවලින් විසිතුරු ගවදෙනක මෙන් වූයේනුයි **කම්මාසානියි.** අවිසේසයෙන් සත්වැදෑරුම් මෛථුන සංයෝගයෙන්ද, ක්‍රෝධය, වෛරය ආදී පාපධර්මයන්ගෙන් පලුදු වී ඇති හෙයින් කැඩුණාහු, සිදුරු වූවාහු, පුල්ලි සහිත වූවාහු, මිශ්‍රපැහැ වූවාහු වෙති. ඒවාම තෘෂ්ණා දාසව්‍යතායෙන් මුදා, දාස බවින් නිදහස් බව නොකරන හෙයින් **නභූජිස්සානියි.** බුද්ධාදී නුවණැත්තන් විසින් ප්‍රශංසා නොකරන ලද හෙයින් **න විඤ්ඤූපසත්ථානියි.**

තෘෂ්ණා දෘෂ්ටීන් විසින් ස්පර්ශ කරන ලද හෙයින්, කිසිවෙකු විසින්, මෙය ඔබගේ සීලයෙහි දොසැයි ස්පර්ශ කරන්ට හැකිවන හෙයින් **පරාමට්ඨානියි.** උපචාර සමාධිය, අර්පණා සමාධිය හෝ නොහොත් මාර්ග සමාධියට, ඵල සමාධියට නොපවතිත්නුයි **අසමාධි සංවත්තනිකානියි.** න සමාධිසංවත්තනිකානියිද පාඨයි. සමහරු වනාහි, කුසලධර්මයන්ගේ නොපිහිටීම වූ හෙයින්, ඛණ්ඩානි, ඡිද්දානි, සබලානි, කම්මාසානි යයි වර්ණනා කරන හෙයින්, මෙසේ තෘෂ්ණා දාසත්වයට ගියහෙයින්, න භූජිස්සයයිද, නුවණැත්තන් විසින් ප්‍රශංසා නොකරන ලද හෙයින් න විඤ්ඤූපසත්ථානියයිද, තෘෂ්ණාවෙන් අල්ලාගත් බැවින් පරාමට්ඨයයිද, පසුතැවිල්ලට හේතුවූ බැවින් න සමාධි සංවත්තනිකා යයිද මෙසේ අර්ථ වර්ණනා කරත්. **න අවිප්පටිසාරවත්ථුකානි** යනු පසුතැවිල්ල ගෙන එන හෙයින් නොපසුතැවිල්ලට ආධාර නොවෙත් යන අර්ථයි. **න පාමුජ්ජවත්ථුකානී** යනු නොපසුතැවිල්ලෙන් හටගත් දුර්වල ප්‍රීතිය බැවින් ප්‍රමෝදයට හේතු නොවූවාහු එය නොඑලවන හෙයිනි. මෙසේ සෙස්සෙහිද කළයුත්තාහ. **න පීති වත්ථුකානි** යනු දුර්වල ප්‍රීතියෙන් හටගත්තේ බලවත් ප්‍රීතියට හේතු නොවූවාහු. **න පස්සද්ධි වත්ථුකාර** බලවත් ප්‍රීතියෙන් හටගත් හෙයින් කය හා සිතෙහි සන්සුන් බවට හේතු නොවූවාහු. **නසුඛවත්ථුකානි** සන්සිඳීමෙන් හටගත් කායික චෙතසික සුවයට හේතු නොවූවාහු, **න සමාධි වත්ථුකානි** සුවයෙන් හටගත් සමාධියට

හේතු නොවූවාහු, **න යථාභූත ඥාණ දසසන වත්‍ථූකානි** සමාධියට ආසන්න කාරණය වූ යථාභූත ඥාණ දර්ශනයට හේතු නොවූවාහු, **න එකනත නිබබිදාය** යනාදීන්හි 'න කාරයම ගෙනවුත් 'න විරාගාය' යන ආදී ක්‍රමයෙන් සෙසු පදයන්හිද යෙදිය යුතුය. න විරාගාය ආදියෙහි න කාර සහිතවම පාඨයි. එහි **එකනත නිබබිදාය** යනු ඒකාන්තයෙන් සසර වෘත්තයෙහි කළකිරීම සඳහා නොපවතිත් යනු සම්බන්ධයි. මෙසේ සෙස්සෙහිද යෙදිය යුතුය. විරාගාය යනු සසරෙහි නොඇලීම සඳහා. **නිරෝධාය** යනු සංසාර වෘත්තයාගේ නැවැත්ම සඳහා, **උපසමාය** යනු නැවැත්ම ලද්දහුගේ නැවත නොඉපදීම් වශයෙන් සංසාර වෘත්තයාගේ සංසිඳීම සඳහා. **අභිඤ්ඤාය** යනු සංසාර වෘත්තයාගේ තත්වය මනාව දැනගැනීම සඳහා. **සමෙබාධාය** කෙලෙස් නිද්‍රා පහකිරීමෙන් වෘත්තයෙන් පිබිදීම සඳහා.

**නිබබාණාය** යනු අමා නිවන සඳහා, **යථා සමාදිනනං සිකඛාපදං වීතිකකමාය** යනු යම් ආකාරයකින් සමාදන් වූ ශික්ෂාපදයාගේ ඉක්මවීම සඳහා, (විභක්ති පෙරළීම් වශයෙන් මෙහි ද්විතියා විභක්තිය යොදන ලදී.) **චිතතමපි න උපපාදෙති** යනු චිතෙතාත්පාද ශුද්ධියෙන් සීලයාගේ අති විශුද්ධභාවය දැක්වීම සඳහා කියන ලදී. සිතක් ඉපදීම් මාත්‍රයෙන් වනාහි සීලය නොබිඳේ. **කිංසො වීතිකකම්සසති** යනු කුමක් සඳහා ඉක්මවීම කරන්නේද? ඉක්මවීම නොකරන්නේය යන අර්ථයි. අඛණ්ඩානි ආදිය යට කියන ලද්දට විරුද්ධ වශයෙන් දතයුත්තාහුය. න ඛණ්ඩානි යනුද පාඨයි. එකනත නිබබිදාය යනාදීන්හි ඒකාන්තයෙන් සසර වෘත්තයෙහි කලකිරීම සඳහාය ආදී ක්‍රමයෙන් යෙදිය යුතුය. මෙහි වනාහි නිබබිදා යනු විදර්ශනාවයි. **විරාගාය** යනු මාර්ගයයි. **නිරොධාය උපසමාය** යනු නිර්වාණයයි. **අභිඤ්ඤාය සමෙබාධාය** යනු මාර්ගයයි. **නිබබාණාය** යනු නිර්වාණයමය. එක් ස්ථානයක විදර්ශනාවද, දෙතැනක මාර්ගයද, තෙතැනක නිර්වාණයද කියන ලදැයි මෙසේ විස්තර කථාව දතයුත්තාහුය. පිළිවෙළින් මේ සියල්ල මාර්ගයට සමානාර්ථ, නිර්වාණයට සමානාර්ථ ඇති වචන වෙයි.

දැන් පරියන්ත, අපරියන්ත වශයෙන් විද්‍යමාන ප්‍රභේද දක්වා, නැවත ධර්ම, ජාති, ප්‍රත්‍යය, සම්ප්‍රයුක්ත වශයෙන් සීලයාගේ ප්‍රභේද දක්වන්ට **කිං සීලං** ආදිය දෙසූහ. එහි එයින් හටගනීනුයි සමුට්ඨානයි. එය ප්‍රත්‍යයට නමකි. කවර හටගැනීමක් වන්නේදැයි, **කිං සමුට්ඨානංයි**. කෙතෙක්

ධර්මයන්ගේ එක්තැන් කිරීම, එක්තැන්වීම වන්නේදැයි. **කතිධම්ම සමොධානංයි චෙතනා සීලං** ප්‍රාණඝාතාදියෙන් වෙන් වන්නහුට හෝ වත්පිළිවෙත් පුරන්නහුට ඇතිවන චේතනායි. චෙතසිකං සීලං යනු ප්‍රාණඝාතාදියෙන් වෙන්වන්නහුට හටගන්නා විරති චෛතසිකයයි. තවද, චේතනා සීලය නම් ප්‍රාණඝාතාදීන් අත්හරින්නහුට හටගන්නා සප්ත කර්මපථ චේතනාවෝය. චෛතසික සීලය නම්, අභිධ්‍යාව දුරුකොට, පහවූ අභිධ්‍යාවෙන් යුත් සිතින් වාසය කෙරේ යයි ආදී ක්‍රමයෙන් කියන ලද අනභිධ්‍යා, අව්‍යාපාද, සම්‍යග් දෘෂ්ටි ආදී ධර්මයෝය. **සංවරො සීලං** යනු මෙහි පස්වැදෑරුම් සංවරය දතයුතුය. ප්‍රාතිමෝක්ෂ සංවරය, සති සංවරය, ඥාණ සංවරය, ක්ෂාන්ති සංවරය, වීර්ය සංවරය යනු ඒවාය. එහි, 'මේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වූයේ, මනාව යුක්ත වූයේ වෙයි, යන මෙය ප්‍රාතිමෝක්ෂ සංවරයයි, චක්ෂුඉන්‍ද්‍රිය රකියි. චක්ෂුන්‍ද්‍රියයෙහි සංවරයට පැමිණේ යන මෙය සති සංවරයයි.

**යානි සොතානි ලොකස්මිං (අජිතාතිභගවා) සතිතෙසං නිවාරණං සොතානං සංවරං බ්‍රෑමි - පඤ්ඤායෙතෙ පිථීයරේ'ති**

භාග්‍යවතුන් වහන්සේ අජිතයැයි ඔහු අමතා, ලෝකයෙහි යම්කිසි කෙලෙස් ශ්‍රෝතස් වෙත්ද, ඒවාහි වැළැක්ම සිහියයි. කෙලෙස් ශ්‍රෝතසුන්ගේ සංවරය වදාරමි. ඒවා ප්‍රඥාවෙන් වසනු ලැබේ. මේ ඥාණ සංවරයයි. ප්‍රත්‍යය පරිභෝජනයද මෙහිම ඇතුළත් බවට යේ. යම් ඒ සීතයාගේ, උෂ්ණයාගේ ගතිය ඉවසන්නේ වෙයි ආදී ක්‍රමයෙන් දක්වා ඇති මෙය ක්ෂාන්ති සංවරය නම් වේ. යම් මේ උපන් කාම විතර්කය නොඉවසයි ආදී ක්‍රමයෙන් එන ලද්දේ, මෙය වීර්ය සංවරය නම් වේ. ආජීව පාරිශුද්ධියද මෙහිම ඇතුළත් බවට යේ. මෙසේ මේ පස්වැදෑරුම් වූ සංවරය, පවට බිය, කුල පුතුන්ගේ සම්ප්‍රාප්ත වස්තුවෙන් වැළකීම ආදී ඒ සියල්ලම, සංවර සීලයයි දතයුතුය. **අවීතික්කමොසීලං** යනු සමාදන් වූ සීලයාගේ කායික වාචසික නොඉක්මවීමයි. මෙය කිංසීලං යන ප්‍රශ්නයට විසඳුමයි.

**කති සීලානි** යන ප්‍රශ්නයට විසඳුමෙහි, **කුසල සීලං, අකුසල සීලං අව්‍යාකත සීලං** යයි ත්‍රයයෙකි. මෙහි, ලෝකයෙහි ඒ ඒ සත්ත්වයින්ගේ ප්‍රකෘතිය සීලයයි කියනු ලැබේ. යමක් සඳහා මොහු සුවසීලි අයෙකි. මොහු දුක්සීලි අයෙකි. මොහු කළහසීලි අයෙකි. මොහු සැරසෙන සීලී අයෙකියි කියත්ද? එහෙයින් ඒ ක්‍රමයෙන් අර්ථ උදුරා දැක්වීමෙන් අකුසල

සීලයද සීලයයි යූ.සේයි. එය වනාහි සුත්වාන සංවරෙ පඤ්ඤා යන වචනයෙන් මෙහි අදහස් කරන ලද සීලය නොවේ. යම්හෙයකින් චේතනාදී භේද වූ, සීලයට ඒ හා සමග යුත් සිත සමුට්ඨානය වේද, එහෙයින් කුසල් සිත හා හටගත්තේ කුසල සීලයයි ආදිය වදාළහ.

**සංවර සමොධානං සීලං** යනු, සංවරය හා එකට යෙදුණු ස්කන්ධ ඒවා සංවරයෙන් එක්වූවාහු, මිශ්‍රවූවාහුනුයි සංවර සමොධානයයි යූ.සේයි. මෙසේ නොඉක්මවීම් එක්තැන් කිරීමේ සීලයද දතයුතුය. **තථාභාවෙ ජාතා චෙතනා සමොධානං සීලං** යනු සංවර ස්වභාවයෙහි, නොඉක්මවීම් ස්වභාවයෙහි හටගත් චේතනා හා එකට යෙදුණු ස්කන්ධයෝය. මේ ත්‍රයයෙහිම ඒ හා එකට යෙදුණු ධර්ම අදහස් කරන ලදී. එහෙයින් චේතනා එක්තැන් කිරීමෙන් චෛතසිකයන්ද සංග්‍රහ කරන හෙයින්, චෛතසික එක්තැන් කිරීමේ සීලය වෙන්ව විස්තර කරන ලදැයි දතයුතුය. යට චේතනාදී ධර්ම සීලයයි කියන ලද්දීය. හුදෙක් ඒවා පමණක්ම සීලය නොවේ. ඒ හා යෙදුණු ධර්මයෝද, සීලයමයැයි දැක්වීම සඳහා මේ ත්‍රිකය කියන ලදැයි දතයුතුය.

දැන් චේතනා, චෛතසික සංවර ඉක්මවායාම් වෙති. වෙන්ව නොවේ. එහෙයින් සංවර අව්‍යතික්‍රමයෙන්ම අර්හත්ඵල මාර්ගය දක්වා සාධාරණ ක්‍රමයෙන් යොදන්නේ, **පාණාතිපාතං සංවරට්ඨෙන සීලං අවීතික්කමට්ඨෙන සීලං** ආදිය වදාළහ. ප්‍රාණඝාතාදියෙන් වැළකීම් ආදිය තමාගේ විරුද්ධතා සංවර කරති. නොඉක්මවීම් නොකරත්. එහෙයින්, සංවරණයෙන්ද, නොඉක්මවීමෙන්ද, සංවරාර්ථයෙන් සීලයි. නොඉක්මවීම් අර්ථයෙන්ද සීලය නම් වෙති. එහි **පාණාතිපාතං සංවරට්ඨෙන** යනු ප්‍රාණඝාතයාගේ වැසීම් අර්ථයෙන් සීලයි. එය කිමෙක්ද? ප්‍රාණඝාතයාගේ වැළකීම. ඕ එය සංවර කරන්නීමය. එය නොඉක්මවයිනුයි **අවීතික්කමට්ඨෙන සීලං** නම් වේ. මෙපරිද්දෙන්ම **අදින්නාදානා වෙරමණී** ආදීහු, අනභිධ්‍යා, අව්‍යාපාද, සම්‍යග් දෘෂ්ටීහුද යෙදිය යුත්තාහ. **පාණාතිපාතං** ආදීන්හි වනාහි, දස අකුසල කර්මපථයන්හි ප්‍රාණීහුගේ නැසීම **පාණාතිපාතොයි.** ප්‍රාණය නැසීම, ප්‍රාණඝාතයයි යූ.සේයි. පාණො යන මෙහි ව්‍යවහාර වශයෙන් සත්ත්වයාය. පරමාර්ථ වශයෙන් ජීවිතේන්ද්‍රියයි. ඒ ප්‍රාණයෙහි ප්‍රාණියෙක්ය යන හැඟීමෙන්, ජීවිතේන්ද්‍රිය සිඳදමන උපක්‍රමයෙන් උපදවන ලද, කාය වාග් ද්වාරයන්ගේ එක්තරා ද්වාරයකින් පැවැත්තා වූ වධක චේතනාව පාණාතිපාතයයි. එය ගුණධර්ම

විරහිත තිරිසන්ගත ප්‍රාණීන් අතරෙහි, කුඩා ප්‍රාණීන් කෙරෙහි අල්ප සාවද්‍යයි. විශාල ශරීරයන්හි මහා සාවද්‍යයි. කුමක් හෙයින්ද යත්? ප්‍රයෝග මහත් බැවිනි. ප්‍රයෝග සමවූ කල්හිද, වස්තු මහත්තත්වය (සත්ත්වයාගේ විශාල බව) අනුව මහාසාවද්‍ය වේ. ගුණවත් මනුෂ්‍යාදීන් අතරෙහි මහා සාවද්‍යයි. අල්ප ගුණවත් ප්‍රාණීන් කෙරෙහි අල්පසාවද්‍යයි. මහා ගුණවතුන් කෙරෙහි මහා සාවද්‍යයි. මිනිස් ගුණයන්හි සමභාවය ඇතිකල්හි, කෙලෙසුන්ගේද උපක්‍රමයන්ගේද මෘදු බැවින් අල්ප සාවද්‍යයි. තීව්‍රතායෙන් මහා සාවද්‍යයයි දතයුතුය. ඊට කරුණු පහක් ඒකරාශී විය යුතුය. ප්‍රාණියෙක් වීම, ප්‍රාණියෙක්ය යන හැඟීම, නැසීමේ සිත, උපක්‍රමය, ඉන් මරණයට පත්වීම යන පංචකයයි.

නුදුන් දැයකගේ ගැන්ම = **අදින්නාදානංයි.** අන්‍යයාගේ දෑ ගෙනයාම, සොරකම, චෞර කර්මයයි යූ.සේයි. එහි **අදින්නං** යනු අන්‍යයා අයිති කොටගත්, යම්තැනක අතිකාගේ කැමැත්ත පරිදි කිරීමට පැමිණෙනුයේ, දඬුවම් නොලැබිය යුතු වන්නේ, දොස් පරොස් නොලැබිය යුතු වන්නේද වේ. ඒ අන් සතු දැයෙහි, අන් සතුයයි යන හැඟීමෙන්, එය ගැන්මේ උපක්‍රමයෙන් හටගත් කායවාග් ද්වාරයන්ගේ එක්තරා ද්වාරයක පැවැත්තා වූ සොර චේතනාව අදින්නාදානයයි. එය පහත් පරසන්තකයෙහි අල්ප සාවද්‍යයි. උසස්හි මහා සාවද්‍යයි. (ද්‍රව්‍ය) කුමක් හෙයින්ද යත්, වස්තු ප්‍රණීතතාව මතය. වස්තු සමකල්හි (සොර භාණ්ඩ) ගුණ අධික වූවන්ගේ සන්තකයෙහි වස්තුවෙහි මහා සාවද්‍යයි. ඒ ඒ ගුණාධික පුද්ගලයන්ගේ වශයෙන් ගෙන එයට පහත් ගුණැත්තාගේ සන්තකයෙහි වස්තුවෙහි අල්ප සාවද්‍යයි. ඊට කරුණු පහක් ඒකරාශි විය යුතුය. අන් සතුවීම, අන් සතුයයි හැඟීම, සොර සිත උපක්‍රමය, ඉන් ගෙනයාම යන පංචකයයි.

**කාමෙසු** යනු මෛථුන හැසිරීම්හි, **මිච්ඡාචාරො** යනු ඒකාන්ත නින්දිත-පහත් හැසිරීම, ලක්‍ෂණ වශයෙන් වනාහි මෛථුනයෙහි යෙදීමේ අදහසින්, කාය ද්වාරයෙහි පැවති නොයා යුතු ස්ථාන ඉක්මවීමේ චේතනාව කාමෙසු මිච්ඡාචාරයි. එහි නොයා යුතු ස්ථාන නම්, පුරුෂයින්ට, මව්රක්නී, පියරක්නී, මව්පිය රක්නී, සොයුරු රක්නී, සොයුරි රක්නී, ඤාති රක්නී, ගොත්‍ර රක්නී, ධර්ම රක්නී, ආරක්‍ෂා සහිතව රක්නී, දඬුවම් නියමයෙන් රක්නී යන මව්රක්නා යන දසයද, ධනක්කීතා, ඡන්දවාසිනී, භොගවාසිනී, පටවාසිනී, ඔදපත්තකිනී, ඔහතචුම්බටා, දාසීචභරියා, කම්මකාරිච භරියා, ඔජාහටා, මුහුත්තිකා යන දසයදැයි ස්ත්‍රීහු විස්සකි. ස්ත්‍රීන් අතරෙහි

වනාහි සාරක්‍ඛා, සපරිදණ්ඩා ද්වයද, ධනක්කීතාදී දසයද ඇතුළුව දොළොස් ස්ත්‍රීන් අන්‍ය පුරුෂයන් වෙත යාම, මෙය නොයා යුතු ස්ථාන නම් වේ. ඒ මිථ්‍යාචාරය වනාහි සීලාදී ගුණ රහිත නොයායුතු ස්ථානයන්හි අල්පසාවද්‍යයි. සීලාදී ගුණ යුත් අය කෙරෙහි, මහා සාවද්‍යයි. ඊට කරුණු සතරක් ඒකරාශී විය යුතුය. නොයායුතු වස්තුව, එහි සෙවුනා සිත, සෙවුනා ප්‍රයෝගය, මාර්ගයෙන් මාර්ගය පිළිපැදීම, ඉවසීමය යන සතරයි. (පහයි?)

මුසා යනු මුළා කිරීම පෙරටුකොට ඇති අර්ථය බිඳි වාක් ප්‍රයෝගය වන්නේය. කාය ප්‍රයෝගය හෝ වෙයි. මුළා කිරීම් අදහසින් අන්‍යයා මුළාකරන කාය වාග් ප්‍රයෝගයන්ගෙන් හටගන්වනු ලබන චේතනාව මුසාවාදය වන්නේය. අන් ක්‍රමයක්, මුසා යනු නොවූ විරූ අසත්‍ය වස්තුවකි. වාදො යනු එය සිදුවූ දෙයක් වශයෙන් සත්‍යයක් වශයෙන් හැඟවීමයි. ලක්‍ෂණ වශයෙන් වනාහි අසත්‍ය වස්තුවක් සත්‍යය වශයෙන් අන්‍යයාට හඟවනු කැමැත්තහුගේ එසේ හැඟවීමෙහි හටගත් චේතනාව මුසාවාදයයි. එය යමෙකුගේ අර්ථ හානිකරයිද? ඔහුගේ අල්පතායෙන් අල්ප සාවද්‍යයි. මහත් බැවින් මහා සාවද්‍යයි. තවද ගෘහස්ථයන්ගේ තම සන්තකයෙහි පවත්නා දෑ නොදෙනු කැමැත්තේ නැතයයි ආදි ක්‍රමයෙන් පැවැත්තේ අල්ප සාවද්‍යයි. සාක්‍ෂියක් වශයෙන් වී, ධන විනාශය සඳහා කියන ලද්දේ මහා සාවද්‍යයි. ප්‍රව්‍රජිතයන්ට ස්වල්ප වූද, තලතෙල් හෝ ගිතෙල් ලැබ සිනාසෙන අදහසින්, අද ගමෙහි තෙල් නදියක් ගලා යයි කියා හඟිම්යි සිදුවූවක් කථාකරන ලෙසින් පැවැත්තේ අල්ප සාවද්‍යයි. නොදිටියේම දිටිමියි ආදී ක්‍රමයෙන් කියන්නවුන්ට මහා සාවද්‍යයි. එයට කරුණු සතරෙක් ඒකරාශි විය යුතුය. අසත්‍ය වස්තුව, මුළා කිරීමේ සිත, ඉන් හටගත් උත්සාහය, ඒ අර්ථය දැනගැනීම වේ.

යම් වචනයකින් යමෙකුට ඒ වචනය කියයිද? ඔහුගේ හෘදයෙහි තමාට ප්‍රියභාවයද, අන්‍යයාට ශූන්‍යතාවය කරයිද, එය **පිසුනාවාචායි.** යම් වචනයකින් තමාද, අන්‍යයාද කර්කශ කරයිද, යම් වචනයක් තමාද කර්කශ වන් කර්ණ සුවය හෘදය සුවය හෝ නොවන්නේද මේ **ඵරුසාවාචායි.** යමකින් නිෂ්ඵල කථා, නිරර්ථක දෑ දොඩවයිද එය සම්ඵප්පලාප වේ. ඒවාට මුල්වූ චේතනා පිසුනාවාචාදී නාමයම ලබයි. එය මෙහි අදහස් කරන ලදී. එහි කිලිටි සිත් ඇත්තහුට, අන්‍යයාගේ බිඳීම සඳහා හෝ තමාගේ අන්‍යයාට ප්‍රියවීමේ කැමැත්තෙන් හෝ කැරෙන, කාය වාග් ප්‍රයෝගයන්ගෙන් හටගත් චේතනාව පිසුනාවාචායි. එය

යමෙකුගේ බිඳීම කරන්නේද ඔහුගේ අල්ප ගුණතායෙන් අල්ප සාවද්‍ය වන්නේය. මහ ගුණත්වයෙන් මහා සාවද්‍ය වන්නේය. ඊට කරුණු සතරෙක් ඒකරාශි විය යුතුය. බිඳවිය යුතු අන්‍යයා, මෙසේ මොවුහු වෙන් වන්නාහුයයි භේද පෙරටුකොට හෝ, මෙසේ මම ප්‍රිය වන්නෙමියි, විශ්වාසවන්තයෙක් වෙමියි හෝ ප්‍රියයෙකු වීමේ කැමැත්ත තිබීම, ඉන් හටගත් උත්සාහය ඔහුගේ ඒ අර්ථය දැනගැනීම වේ. අන්‍යයා නොබිඳුණු කල්හි කර්මපථ භේදයක් නැත. බිඳුණු කල්හිම වේ. අන්‍යයාගේ මර්මස්ථාන තුවාල කිරීම සේ, ඉතා නපුරු වූ, කාය වාග් ප්‍රයෝගවලින් හටගන්වන ලද ඒකාන්ත කර්කශක චේතනා ඵරුස වචනයි. ප්‍රයෝගය මර්ම චේඡදක වූයේ නමුත්, සිතෙහි මෘදු බැවින් ඵරුස වචන නොවේ. මව්පියවරු කිසිකලෙක කුඩා පුත්‍රයින්ට මෙසේද කියති. සොරු ඔහු කඩ කඩ කෙරෙත්වායි, එහෙත් ඔවුන්ගේ මතුයෙහි මහනෙල් මල් පෙත්තක් හෝ වැටීම නොකැමති වෙති. ආචාර්ය උපාධ්‍යායවරුද, කිසිකලෙක සිය අන්තෙවාසිකයින්ට, කිමෙක්ද මේ විළිබිය නොමැති ඔවුන් එළවා දමවුයයි මෙසේ කියති. එසේ වුවත් ඔවුන්ගේ ධ්‍යාන සමාධි සමාපත්තීන්ගේ ලාභය කැමති වෙති. සිතෙහි මොළොක්භාවය යම්සේ වේද, ඒ අනුව එය ඵරුස වචනයක් නොවේ. මෙසේ වදන් මොළොක් භාවයෙන් වූ වදන් ඵරුස නොවන්නේද නොවේ. මරවනු කැමැත්තහුට මොහු සුවසේ සයනය කරවවු යන්න ඵරුස නොවූ වචනයක් නොවේ. සිතෙහි ඵරුස බැවින් එය ඵරුස වචනයක්ම වන්නේය. එය යමෙකු සඳහා පැවැත්තේද, ඔහුගේ අල්ප ගුණතායෙන්, අල්ප සාවද්‍යයද, මහා ගුණතායෙන් මහා සාවද්‍යද වන්නේය. එයට කාරණත්‍රයයක් ඒකරාශි විය යුතු වන්නේය. අක්‍රෝෂ කළයුතු අන්‍යයා, කිපුණු සිත, අක්‍රෝෂ කිරීම යන්නයි.

අනර්ථ හඟවන, කායවාග් ප්‍රයෝගවලින් හටගන්වන ලද, අකුසල චේතනා **සම්ඵප්පලාපොයි.** එය සේවන මන්දතායෙන් අල්පසාවද්‍යයි. සේවන මහත්වයෙන් මහා සාවද්‍යයි. ඊට කරුණු දෙකක් ඒකරාශී විය යුතුය. භාරත යුද්ධ, සීතාවන් පැහැරගෙන යාම් වැනි නිරර්ථක කථා පෙරටුකොට ඇති බව, එබඳු ආකාර කථා කියමනද වේ. අන්‍යයා එම කථාව ගණන් නොගන්නාවිට කර්මපථ භේදයක් නැත. අන්‍යයා විසින් සම්ඵප්‍රලාපය ගණන් ගත්කල්හි කර්මපථය වේ.

දැඩි ලෙස ආශා කෙරේනුයි, **අභිජ්ඣායි.** අන්සතු භාණ්ඩ අභිමුඛ වී ඒවාට නැඹුරු බවක් පවත්වයි යන අර්ථයි. මෙය මාහට වන්නේ ඉතා

මැනවැයි මෙසේ අන් භාණ්ඩයන්හි දැඩි ලෝභ කිරීම ලක්‍ෂණකොට ඇත්තේය. නුදුන් දෑ ගැනීම මෙන් අල්ප සාවද්‍යද වේ. එය කරුණු දෙකක් ඒකරාශී විය යුතු වන්නේය. අන්සතු භාණ්ඩයක් වීම, තමාට පවරා ගැනීම අන්සතු භාණ්ඩ වස්තුවෙහි ලෝභය හටගත්තේද, මෙය මා හට වන්නේ ඉතා මැනවැයි යම්තාක් කලක් තමාට අයත් කරගැනීමට නොසිතාද එතෙක් කර්මපථ භේදය නොවෙයි.

හිතසුව බාධා කෙරේනුයි ව්‍යාපාදයයි. එය අන්‍යයාගේ විනාශය සඳහා සිත් දූෂ්‍යවීම ලක්‍ෂණකොට ඇත්තේය. ඵරුස වචනය මෙන් අල්ප සාවද්‍යද මහා සාවද්‍යද වේ. ඊට කරුණු දෙකක් ඒකරාශි විය යුතුය. අන් සත්ත්වයෙකු වීම, එම සත්ත්වයාගේ විනාශකිරීම් සිත, අන්සතු ජීව වස්තුවක, ක්‍රෝධය උපන්නේ වී නමුදු, යම්තාක්, මේ තෙමේ නැසීයන්නේ, විනාශවී යන්නේ මැනවැයි ඔහුගේ විනාශය නොසිතාද, එතෙක් කර්මපථ භේදය නොවේ.

සිදුවූ පරිදි, ග්‍රහණ අභාවයෙන් වරදවා දකීනුයි මිථ්‍යාදිට්ඨියි. එය දුන් දෑහි විපාක නැතැයි ආදී ක්‍රමයෙන් වූ විපර්යාස දර්ශන ලක්‍ෂණකොට ඇත්තේය. සම්ඵප්‍රලාප මෙන් අල්ප සාවද්‍ය, මහා සාවද්‍ය වේ. තවද, අනියතය අල්පසාවද්‍යයි, නියතය මහා සාවද්‍යයි. එය කරුණු දෙකක් ඒකරාශි වියයුතු වේ. වස්තුවෙහි ගත් ආකාර විපර්යාසයද, යම්සේ දෘෂ්ටි ගනීද? ඔහුගේ වැටහීම අනුව එය එසේ නොවීමෙන්ද යන ද්වයයයි.

එහි නාස්තික, අහේතුක, අක්‍රිය දෘෂ්ටීන්ගෙන්ම කර්මපථ භේදය වේ. අනෙක් දෘෂ්ටීන්ගෙන් නොවේ.

මෙම දස අකුසල කර්මපථයන්ගේ, ධර්ම, කොට්ඨාස, අරමුණු, වේදනා, මූල යන පස් අයුරකින් විනිශ්චය දතයුතුය. එහි ධම්මතො යනු මොවුන් අතරෙහි සතක් පිළිවෙළින් චේතනා ධර්මයෝම වෙති. අභිධ්‍යාදී ත්‍රයය චේතනා සම්ප්‍රයුක්තය කොට්ඨාස වශයෙන් යනු පිළිවෙළින් සතක් හා මිථ්‍යාදෘෂ්ටියද යන මෙම අට කර්මපථම වෙයි. මූලයෝ නොවෙති. අභිධ්‍යා ව්‍යාපාද කර්මපථ මෙන්ම මූලද වෙති. අභිධ්‍යාව මූලත්වයට පත්ව, ලෝභය අකුසල මූලය වෙයි. ව්‍යාපාදය ද්වේශ අකුසල මූලය වේ. ආරම්මණ වශයෙන් වනාහි, ප්‍රාණඝාතය ජීවිතින්ද්‍රියාරම්මණ වශයෙන්ද සංස්කාරාරම්මණ වශයෙන්ද වේ. අදින්නාදානය, සත්ත්වාරම්මණ හෝ සංස්කාරාරම්මණ වේ. මිථ්‍යාචාරය ස්පර්ශ වශයෙන් සංස්කාරාරම්මණ

වේ. ඇතැමෙක් සත්ත්වාරම්මණයැයි යෙති. මුසාවාදය සත්ත්වාරම්මණ හෝ සංස්කාරාරම්මණ වේ. එසේම කේළාම් හා එරුස වචන සත්ත්වාරම්මණ වේ. සම්ඵප්‍රලාපය. දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත වශයෙන් සත්ත්වාරම්මණ හෝ සංස්කාරාරම්මණ වේ. එසේම අභිධ්‍යා, ව්‍යාපාද සත්ත්වාරම්මණ වේ. මිථ්‍යා දෘෂ්ටිය ත්‍රෛභූමික ධර්ම වශයෙන් සංස්කාරාරම්මණම වේ.

වේදනා වශයෙන් වනාහි, ප්‍රාණඝාතය, දුක්වේදනා වෙයි. ක්ෂිසේත්, රජවරු සොරෙකු දැක, සිනාසෙනුයේම, 'කොල යවු. ඔහු මරව යයි කියති. ඒවාහි නිශ්චය කරන චේතනාව වනාහි දුක හා සම්ප්‍රයුක්තවම වේ. අදින්නාදානය ත්‍රිවේදනායි. එය වනාහි අන් භාණ්ඩයක් දැක තුටුපහටුව ගනු ලබන කල්හි සුව වේදනාව වේ. බියෙන් බියට පත්ව ගනු ලබන කල්හි දුක් වේදනායි. එසේම විපාක ගලායාම ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ග්‍රහණ කාලයෙහිද මධ්‍යස්ථ භාවයෙහි සිටියහුට, ගනු ලබන කල්හිද උපේක්ෂා වේදනාව වේ. මිථ්‍යාචාරය සුව, මධ්‍යස්ථ වශයෙන් ද්විවේදනයි. නිශ්චය කරන සිතෙහි මධ්‍යස්ථ වේදනාව නොවේ. මුසාවාදය, අදින්නාදානයෙහි කියන ලද ක්‍රමයෙන්ම ත්‍රිවේදනයි. එසේම පිසුනාවාචා, එරුසාවාචා දුක්වේදනයි. සම්ඵප්‍රලාපය ත්‍රිවේදනයි. සීතාහරණ, භාරත යුද්ධාදිය කියන කල්හි, අන්‍යයා සාධුකාර දෙන කල්හි, වස්ත්‍රාදිය ඔසවා තුටුවන කල්හි එය සුව වේදනාව වේ. පළමුව කුලිය දුන් අයෙකු පසුව අවුත්, මුලසිට කියවයි කී කල්හි, සේස රහිතව, අනුසන්ධි සහිතව විස්තර කියන්නෙම්ද? නොකියන්නෙම්දැයි දොම්නසට පත්වූවහුගේ කියන කල්හි දුක් වේදනා වෙයි. මධ්‍යස්ථයාගේ කියන කල්හි උපේක්ෂා වේදනාව වේ. අභිධ්‍යාව සුව, මධ්‍යස්ථ වශයෙන් ද්විවේදනයි. මිථ්‍යා දෘෂ්ටියද එසේය. ව්‍යාපාදය දුක්වේදනායි.

මූල වශයෙන් වනාහි, ප්‍රාණඝාතය, ද්වේෂ, මෝහ වශයෙන් ද්විමූලක වෙයි. අදින්නාදානය, ද්වේෂ මෝහ වශයෙන් හෝ ලෝභ, මෝහ වශයෙන් හෝ වෙයි. මිථ්‍යාචාරය, ලෝභ මෝහ වශයෙන්, මුසාවාදය ද්වේෂ මෝහ වශයෙන් හෝ ලෝභ, මෝහ වශයෙන් හෝ වෙයි. පිසුනාවාචා, සම්ඵප්‍රලාපද එසේය. එරුස වචන ද්වේෂ, මෝහ වශයෙනි. අභිධ්‍යාව මෝහ වශයෙන් එක් මූලකි. ව්‍යාපාදයද එසේය. මිථ්‍යා දෘෂ්ටිය ලෝභ මෝහ වශයෙන් ද්විමූලය.

**අකුසල කර්මපථ කථා නිමි.**

ප්‍රාණඝාතාදීන්ගෙන් වෙන්වීම් සංඛ්‍යාත අනභිධ්‍යා, අව්‍යාපාද, සම්‍යග් දෘෂ්ටි ආදී මේ දහය කුසල කර්මපථ නම් වේ. මෙය කරණකොට ප්‍රාණඝාතාදියෙන් වැළකෙයි. ඉවත්වේ. වැළකීම් මාත්‍රයම මෙයනුයි විරතියි. ප්‍රාණඝාතාදියෙන් වැළකෙන්නහුගේ කුසල් සිත හා යෙදුණු යම් විරතියක් වන්නේද, එය ප්‍රභේද වශයෙන් තෙවදෑරුම් වන්නේය. සම්ප්‍රාප්ති විරති, සමාදාන විරති, සමුච්ඡේද විරති යනුවෙනි. එහි ශික්ෂාපද සමාදන් නුවූයේම තමාගේ ජාතිය, වයස, බහුශ්‍රැත භාවය, ප්‍රත්‍යවේක්ෂාකොට (සිහිකොට) අපට මෙබඳු පවක් කරන්ට නුසුදුසුයයි පැමිණි වස්තුව නොඉක්මවන්නවුන්ට උපදිනු ලබන විරතිය සම්ප්‍රාප්ත විරතිය නම් වන්නේය. සමාදන් වූ ශික්ෂාපදයන්ගේ වශයෙන් සලකා ශික්ෂාපද සමාදානය අතිශ්‍රේෂ්ඨත්වයෙන් ගෙන තමාගේ ජීවිතයද, පරිත්‍යාගකොට, සීල වස්තුව නොඉක්මවන්නවුනට උපදිනු ලබන විරතිය සමාදාන විරති නම් වේ. ආර්ය මාර්ගය හා සම්ප්‍රයුක්ත විරතිය වනාහි සමුච්ඡේද (මුළුමනින්ම නැසූ) විරතිය නම් වේ. ආර්ය මාර්ගෝත්පත්තියේ සිට ආර්ය පුද්ගලයින්ට ප්‍රාණයක් නසන්නෙමියි ආදි සිතක් පවා නොඋපදියි.

අකුසල කර්මපථයන්ට මෙන් මේ කුසල කර්මපථයන්ටද ධර්ම, කොට්ඨාස, ආරම්මණ, වේදනා, මූල වශයෙන් පස් අයුරකින් විසඳීම දතයුතුය. එහි ධර්ම වශයෙන් යනු, මොවුන් අතරෙහි පිළිවෙළින් සත් චේතනාද විරතීද යෙදේ. අන්තයෙහි ත්‍රයය චේතනා සම්ප්‍රයුක්තවමය. කොට්ඨාශ වශයෙන් යනු, පිළිවෙළින් කර්මපථමය. මූලයෝ නොවෙති. අන්තයෙහි ත්‍රය කර්මපථ මෙන්ම මූලයෝද වෙති. අනභිධ්‍යාව මූලප්‍රාප්තව අලෝභ කුසලමූලය වේ. අව්‍යාපාදය අද්වේෂ කුසලමූලය වේ. සම්‍යග් දෘෂ්ටිය අමෝහ කුසලමූලය වේ. ආරම්මණතො යනු, ප්‍රාණඝාතාදීන්ගේ අරමුණුම මේවාට අරමුණු වෙයි. ඉක්මවිය යුතු හෙයින්ම වෙරමණී නම් වේ. යම්සේ වනාහි නිර්වාණාරම්මණ ආර්ය මාර්ගය කෙලෙස් දුරුකෙරේද?

මෙසේ ජීවිතින්ද්‍රියාදී අරමුණු තොර කර්මපථ ප්‍රාණඝාතාදී දුසිල්තාවයන් දුරුකෙරේ. වේදනා වශයෙන් යනු, සියල්ල සුව වේදනා හෝ මධ්‍යස්ථ වේදනා වේ. කුසල් බවට පත් දුක් වේදනාවක් නම් නැත. මුල් වශයෙන් යනු, පිළිවෙළින් සතක් ඤාණ සම්ප්‍රයුක්ත සිතින්, වෙන්වන්නහුට අලෝභ, අද්වේෂ, අමෝහ වශයෙන් ත්‍රෛමූලික වෙති. ඤාණ විප්‍රයුක්ත සිතින්, වෙන්වන්නහුට අද්වේෂ, අමෝහ වශයෙන් ද්විමූලයකි. අනභිධ්‍යාව ඤාණ සම්ප්‍රයුක්ත සිතින් වෙන්වන්නහුට අද්වේෂ,

අමෝහ වශයෙන් ද්විමූලයි. ඤාණ විප්‍රයුක්ත සිතින් වෙන්වන්නහුට අද්වේෂ වශයෙන් එක් මූලයකි. අලෝභය තමා විසින්ම තමාට මූලය නොවේ. අව්‍යාපාදයෙහිද මෙම ක්‍රමයමැයි. සම්‍යග් දෘෂ්ටිය අලෝභ, අද්වේෂ වශයෙන් ද්විමූලිකයි.

## කුසල කර්මපථ කථා නිමි.

මෙසේ දසකුසල කර්මපථ වශයෙන් සීලය දක්වා, දැන් නෛෂ්ක්‍රම්‍යාදී, අර්හත් මාර්ගය කෙළවරකොට ඇති සත්තිස් ධර්මයන්ගේ වශයෙන් දක්වන්ට, **නෙක්ඛම්මෙන කාමච්ඡන්දං සංවරට්ඨෙන සීලං අවීතික්කමට්ඨෙන සීලං** යනාදිය වදාළහ. එහි නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය යටපත් කෙරේද? නොඉක්මවයිද? එහෙයින් 'නෙක්ඛම්මං සීලං' යයි අදහසයි. ප්‍රථමා අර්ථයෙහි කරණ වචනයි. නෛෂ්ක්‍රම්‍යය යන අර්ථයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. පෙළෙහි වනාහි, නෛෂ්ක්‍රම්‍ය, අව්‍යාපාදයන් දක්වා යට කියන ලද ක්‍රම අනුව, සෙස්ස හකුළුවා කෙළවර අර්හත් මාර්ගයම දක්වන ලද්දේය.

මෙසේ සංවර, අව්‍යතික්‍රම වශයෙන් සීලය දක්වා දැන් ඒවාහිම ප්‍රභේද ද්වයක් දැක්වීම සඳහා, **පඤ්ච සීලානි පාණාතිපාතස්ස පහාණං සීලං** ආදිය වදාළහ. මෙහිද, ප්‍රාණඝාතයාගේ ප්‍රහාණ සීලය, ප්‍රාණඝාතයාගේ වෙන්වීම් සීලය, ප්‍රාණඝාතයට ප්‍රතිපක්ෂ චේතනා සීලය, ප්‍රාණඝාතයාගේ සංවර සීලය, ප්‍රාණඝාතයාගේ අව්‍යතික්‍රම සීලයැයි යෙදීම් කළයුත්තේය. කියන ලද ආකාර ප්‍රාණඝාතාදීන්ගේ නොඉපදවීම් මාත්‍රයට වඩා ප්‍රහාණයයි කිවයුතු කිසිවක් නම් නැත. ඒ ඒ ප්‍රහාණය ඒ ඒ කුසල ධර්මයාගේ පිහිටීම් අර්ථයෙන් විමසා බැලීම වෙයි.

විසිරුණු ස්වභාවය නොකිරීමෙන් එක්තැන් කිරීම වේ. එහෙයින් පෙර කියන ලද්දා වූම - විමසා බැලීම්, එක්තැන් කිරීම් සංඛ්‍යාත සංවරයට පැමිණවීම් අර්ථයෙන් සීලයයි යු.සේයි. ඉතිරි සිව්ධර්ම ඒ ඒ දැයින් වෙන්වීම් වශයෙන්ද, ඒ ඒ අංගයාගේ සංවර වශයෙන්ද, ඒ ඒ ද්වය හා සම්ප්‍රයුක්ත චේතනා වශයෙන්ද, ඒ ඒ දෑ අව්‍යතික්‍රමණය කරන්නහුට,

අව්‍යතික්‍රම වශයෙන්ද, සිතෙහි පවත්නා ස්වභාවය සඳහා යූ.සේයි. නොහොත් ප්‍රහාණයද, ස්වභාවයෙන් ඇත්තේමය. කෙසේ මෙයින් ප්‍රාණඝාතාදී ප්‍රතිපක්ෂ ධර්ම ප්‍රහාණය වේද? ඊට ප්‍රතිපක්ෂ ධර්ම අත්හරිනුයි ප්‍රහාණයි. ඒ කිමෙක්ද? සියලු කුසල ස්කන්ධයෝය. අනෙක් ආචාර්යවරු, නෛෂ්ක්‍රම්‍යාදීන්හිද, වෙරමණී සීලං යන වචන මාත්‍රය ගෙන, සියලු කුසලයන්හි ස්ථිර වශයෙන්ම වැළකීම් ස්වභාවය වූ විරතියක් නම් ඇතැයිද කියති. මෙහි එසේ නොවේ. මේ ප්‍රහාණාදී පස් පදයන්ගෙන් වෙසෙසා, පරියන්ත අපරියන්ත සීලද්වයෙහි අපරියන්ත සීලයම යූ.සේයි. එහෙයින්ම මෙබඳු වූ සීලයෝම, චිත්තයාගේ නොවිපිළිසර සඳහා පවතිත්. -පෙ- ප්‍රත්‍යක්ෂ කළයුතුය. ප්‍රත්‍යක්ෂ කරන්නේ හික්මේයයි යූ.සේයි. එහි **අවිප්පටිසාරාය සංවත්තනති** යනු සංවරය විපිලිසර නොවීම සඳහාය. ආනන්දය, කුසල වූ සීලයෝ නොවිපිළිසර සඳහාය. නොවිපිළිසර ආනිසංස කොට ඇත්තේය යන වචනයෙන් නොවිපිළිසර සඳහා පවතී. නොවිපිළිසර ප්‍රමෝදය සඳහාය. නුවණින් මෙනෙහි කරන්නහුට ප්‍රමෝදය හටගනී යන වචනයෙන් **පාමජ්ජාය සංවත්තනති** 'ප්‍රමෝදය ප්‍රීතිය සඳහාය'. 'ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය හටගනී' යන වචනයෙන් ප්‍රීතිය සඳහා පවතී. 'ප්‍රීතිය සංසිඳීම සඳහාය.' 'ප්‍රීතිමත් වූවහුගේ කය සංසිඳේ යන වචනයෙන් **පස්සද්ධියා සංවත්තනත** සන්සිඳීම සුවය සඳහාය. සන්සිඳුණු කය ඇත්තේ සුව විඳියි යන වචනයෙන් චෛතසික සුවය සොම්නසැයි කියතු ලැබේ.

**ආසෙවනාය** යනු බොහෝ සේ සෙවුණේ ආසේවනයි. කවරකගේ සෙවුණෙන්? අනතුරු සොම්නස් වචනයෙන් සුවය ගැන කියන ලද හෙයින්, සුව සිද්ධ, සුවපත් වූවහුගේ සිත තැන්පත් වේයයි යන වචනයෙන්, ඒ සුවයෙන් සමාධිය සිද්ධ වේ. මෙසේ සිද්ධ වූ සමාධියගේ සෙවුණෙන්, **ආසෙවනාය සංවත්තනති** ඒ සමාධියගේ සේවනය සඳහා පවතී. ප්‍රගුණ බලවත් භාවය සඳහා පවතී යන අර්ථයි. **භාවනාය** යනු ඒ සමාධියගේම අභිවෘද්ධිය සඳහා. **බහුලීකම්මාය** යනු ඒ සමාධියගේම නැවත නැවත ක්‍රියා කිරීමෙන් (සමවැදීමෙන්) විපිළිසර නොවීම් ආදිය පැවැත්මෙහි මුල් කරුණ වී සමාධියට ශ්‍රද්ධා ඉන්ද්‍රිය ආදී අලංකාර සාධනයෙන් කරුණු ඉටුවීම **අලංකාරාය සංවත්තනතියි**. විපිළිසර නොවීම් ආදී සමාධි රාශියගේ සාධනයෙන් උපකරණ වශයෙන් පවතිනුයි **පරික්ඛාරාය සංවත්තනතියි**. යම් ඒ පැවිද්දා විසින් ජීවිත පරිෂ්කාර රැස්කළ යුත්තේය. ආදීන්හි මෙන් මෙහි පරිෂ්කාර ශබ්දය උපකරණ අර්ථයෙහි යෙදේ. වීර්ය චක්‍ර සහිත, ධ්‍යාන අලවංගු සහිත, සුදු පරිෂ්කාර සහිත රථය යන ආදීන්හි වනාහි

අලංකාරාර්ථයෙහි යෙදේ. සත් නගර පරිෂ්කාරයන්ගෙන් මනාව වටකරන ලද්දේ වෙයි. ආදීන්හි පිරිවර අර්ථයයි. මෙහි වනාහි අලංකාර හා පරිවාරයන්ගේ වෙන්ව ආ හෙයින් රාශ්‍යර්ථයෙහි යයි යූ.සේයි. රාශ්‍යර්ථයද, ප්‍රත්‍යාර්ථයදැයි යන මූලකාරණා භාවයෙන්ම සමාධිය හා එකට යෙදුණු, ස්පර්ශාදී ධර්ම නමැති සම්පත් සාධනය කරන හෙයින් පිරිවර සඳහා පවතී. **පරිවාරාය සංවත්තන්ති** සමාධියගේද, විදර්ශනාවගේද, ආසන්න කාරණ භාවයට පැමිණවීමෙන්ද, වසීභාවයට පැමිණවීමෙන්ද, පිරිපුන් බව සිදුකරන හෙයින් **පාරිපූරියා සංවත්තන්ති** නම් වේ.

මෙසේ සීල මූලාධාරයෙන් සර්වාකාර පරිපූර්ණ වූ සමාධිය පෙන්වා, දැන් බැබලුණු සිතින් තත්වාකාරයෙන් දනියි. දකියි. තත්වාකාරයෙන් දන්නේ, දක්නේ, කලකිරෙයි. කලකිරුණේ නොඇලේ. නොඇලුණේ මිදේයයි යන වචනයෙන් සීලය මූලික සමාධිය ආසන්න කාරණය වූ, යථාභූත ඥාණ දර්ශනාදිය දක්වන්නේ **එකන්ත නිබ්බිදාය** ආදිය වදාළහ. නිර්වේදයගේ දැක්වීම කළ කල්හි, එහි ආසන්න කාරණය වූ යථාභූත ඥාණ දර්ශනය දක්වන ලද්දීම වන්නේය. එය සිදුනොවූ කල්හි නිර්වේදය සිදුනොවේ. ඒවා වනාහි කියන ලද තන්හිමය. යථාභූත ඥාණ දර්ශනය වනාහි මෙහි ප්‍රත්‍යය සහිත නාමරූප විමසීමයි. මෙසේ අමෘත මහා නිර්වාණය කෙළවරකොට ඇති, සීලයාගේ ප්‍රයෝජන පෙන්වා, දැන් ඒ සීලයාගේ අධිසීල ශික්ෂාභාවයද, එය මූලික වූ, අධිචිත්ත, අධිප්‍රඥා ශික්ෂාවන් දක්වනු කැමැත්තේ **එවරූපානං සීලානං සංවර පාරිශුද්ධි අධිසීලං** යනාදිය වදාළහ. එහි සංවරයම පාරිශුද්ධිය වූයේ **සංවර පාරිසුද්ධියි**. එබඳු අපරියන්ත වූ නිර්වාණ නිශ්‍රිත වූ සීලයන්ගේ සංවර පාරිශුද්ධිය නිවන නිශ්‍රිත හෙයින් සෙසු සීලයන්ට අධික සීලයනුයි අධිසීලයැයි යූ.සේයි. **සංවර පාරිසුද්ධියා ඨිතං චිත්තං** යනු එබඳු සීල සංවර පාරිශුද්ධියෙහි පිහිටි සිත මනාව නොවිපිළිසරාදීන් ගෙන එන හෙයින් වික්ෂිප්ත භාවයට නොයයි. සමාධියෙහි පිහිටයි යන අර්ථයි. අවික්ෂෙපයම පාරිශුද්ධිය වූයේ **අවික්ඛෙප පාරිසුද්ධියි**. එය සියලු කෙලෙස් මල විරහිත තියුණු අවබෝධයෙන් යුත් සමාධියයි. සෙසු සමාධීන්ට වඩා අධික බැවින් **අධිචිත්ත** යැයි යූ.සේයි. මෙහි චිත්ත ශීර්ෂයෙන් සමාධිය දක්වන ලදී. සංවර පාරිශුද්ධියමනාව දකීනුයි පිරිසිදුයි. සීල සංවරය ඥාත පරිඥා-තීරණ පරිඥා වශයෙන් මනාව දකියි. එපරිද්දෙන්ම අවික්ෂෙප පාරිශුද්ධි සංඛ්‍යාත පිරිසිදු බවින් යුතු සමාධිය මනාව දකියි. මෙසේ දක්නා දර්ශන සංඛ්‍යාත පාරිශුද්ධිය **දස්සන පාරිසුද්ධි** වන්නේය. එයම සෙසු ප්‍රඥාවන්ට වඩා අධික බැවින්

අධිපඤ්ඤා යැයි යූ.සේයි. **යො තත්‍ථ** යනු එහි යම් සංවර අවික්ෂෙප දර්ශනයන්හි. **සංවරට්ඨො** යනු සංවර භාවයයි. එපරිද්දෙන්ම අවික්ෂෙපාර්ථ, දර්ශනාර්ථ දතයුතුය. අධි සීලයම ශික්ෂාව වූයේනුයි. **අධිසීල සික්ඛායි** මෙසේ අනෙක් ඒවාද දතයුතුය.

මෙසේ ත්‍රිවිධ ශික්ෂා දක්වා, දැන් ඒවාහි සම්පූර්ණ කරන ක්‍රමය දක්වන්ට, **ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛතීති** ආදිය වදාළහ. එහි අර්ථය වෙන වෙනම සම්පූර්ණ කරන්ට, ආවර්ජනය කරන්නේද හික්මේනම් ආවර්ජනය කොට මෙයනම් ශික්ෂාව යැයි දැනගන්නේද හික්මේනම් දැන නැවත නැවත දක්නේද, හික්මේ නම්. දැක දුටු පරිදි ප්‍රත්‍යවේක්ෂා කරන්නේද හික්මේ නම්. ප්‍රත්‍යවේක්ෂාකොට සිත ස්ථිරකොට පිහිටුවන්නේද හික්මේ නම්. ඒ ඒ ශික්ෂා සම්ප්‍රයුක්ත ශ්‍රද්ධා වීර්ය, සති, සමාධි, ප්‍රඥාවන්ගෙන් තම තම කාර්යය කරනුයේද හික්මේ නම්. විශිෂ්ට සේ දතයුතු දෑ, දැනගන්නා කල්හිද ඒ ඒ කෘත්‍යයන් කරනුයේ ත්‍රිවිධ ශික්ෂා හික්මේ නම් වේ. නැවත, **පඤ්ච සීලානි** ආදිය කියන ලද අර්ථමය. **අරහත්ත මග්ගෙන සබ්බ කිලෙසානං** ආදීන්හි රහතුන්ට මනාව විපිළිසර ආදිය නොමැති හෙයින් ආසේවනාදිය වැඩීමෙන්ද ඒ පද යෙදේමය. **එකන්ත නිබ්බිදාය** ආදිය වනාහි සතිපට්ඨාන සම්‍යක් ප්‍රධානයන් මෙන් මාර්ගක්ෂණයෙහිම යෙදිය යුතුය. **සංවර පාරිසුද්ධිං සම්මා පස්සති අවික්ඛෙප පාරිසුද්ධිං සම්මා පස්සති** මෙම වචන ද්වයය වනාහි ඵල සමාපත්තිය සඳහා විදර්ශනා වශයෙන් යෙදිය යුතුය. දෙවන වචනය වනාහි නිරෝධ සමාපත්තිය සඳහා විදර්ශනා වශයෙන්ම යෙදේ. **අවජ්ජන්තො සික්ඛති** ආදී වචන පංචකයෙහි රහතුන්ට හික්මිය යුත්තක් නොමැති කල්හිද, අශෛක්ෂ සීලස්කන්ධාදී ස්වභාවයෙන් හික්මේයයි යූ.සේයි. **සද්ධාය අධිමුච්චන්තො සික්ඛති** ආදීන්හි මාර්ගක්ෂණයම සඳහා කියන ලද්දේය. අනෙකුත් උපචාර අර්පණා විදර්ශනා මාර්ග වශයෙන් කියන ලද වචනයන් සුදුසු පරිදි යෙදිය යුත්තාහ.

**සීලමය ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

සමාධි භාවනාමය ඥාණ නිර්දේශයෙහි, මුලදී පළමුව එක එක පටන් දහය තෙක් සමාධි ප්‍රභේදය දක්වන්නේ **එකො සමාධි** ආදිය වදාළහ. එහි **චිත්තස්ස එකග්ගතා** යනු නොයෙක් අරමුණුවල වික්ෂේප අභාවයෙන් එක් අරමුණක් අග්‍ර උතුම් වන්නේනුයි එකග්ගයි. ඒකාග්‍රතාවයාගේ ස්වභාවය ඒකග්ගතායි. එම ඒකාග්‍රතාව සිතෙහිය. සත්ත්වයෙකුගේ නොවේයයි දැක්වීම සඳහා චිත්තස්ස යයි යු.සේයි. ද්විකයෙහි **ලොකියො** යනු විනාශවන, බිඳවැටෙන අර්ථයෙන් සසර වෘත්තය ලෝකයයි කියනු ලැබේ. එහි ඇතුළත් භාවයෙන් ලෝකයෙහි නියුතු වූයේනුයි ලොකියො නම් වේ. **ලොකුත්තරො** යනු එතෙර වූයේනුයි උත්තරොයි. ලෝකයෙහි ඇතුළත් නුවූ ස්වභාවයෙන් ලෝකයෙන් එතෙර වූයේනුයි ලොකුත්තරොයි, ත්‍රිකයෙහිඃ විතර්ක සහිත වූයේම විචාර සහිත වූයේම හේනුයි සවිතක්ක සවිචාරොයි. අවිතර්ක අවිචාරද මෙසේමය. විතර්ක විචාරයන්හි විචාර මාත්‍රයම, මත්තෙහි, එම ප්‍රමාණයම එයටනුයි විචාර මත්තොයි. විචාරයෙන් මත්තෙහි විතර්කය සමග එක්වීමට නොයේ යන අර්ථයි. අවිතර්කයද, විචාර මාත්‍රයද එයමනුයි **අවිතක්ක විචාරමත්තොයි.** ත්‍රයයෙහිම වෙන්කොටද කියවති. චතුෂ්ක, පඤ්චකද කියන ලද අර්ථයමය.

ෂට්කයෙහි, නැවත නැවත උපදනා හෙයින් සිහියම අනුස්සතියි. පැවැත්විය යුතු ස්ථානයෙහිම, පවත්වන හෙයින් ශ්‍රද්ධා ප්‍රවෘජ්ජිත සුදුසු වූ සිහියනුයි අනුස්සතියි. බුදුරදුන් අරබයා උපන් අනුස්සතිය **බුද්ධානුස්සතියි.** අර්හත් ආදී බුදුගුණ අරමුණුකොට ඇති සිහියට එය විශේෂ නාමයකි. ඒ බුද්ධානුස්සතියගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතාවයම උද්ධච්ච සංඛ්‍යාත වික්ෂේපයට ප්‍රතිපක්ෂභාවයෙන් වික්ෂේප නොවේනුයි **අවික්ඛෙපොයි.** ධර්මය අරබයා උපන් අනුස්සතිය **ධම්මානුස්සතියි.** ස්වාක්ඛාත ආදී දහම්ගුණ අරමුණුකොට ඇති සිහියට එය විශේෂ නාමයකි. සංඝයා අරබයා උපන් අනුස්සතිය **සංඝානුස්සතියි.** සුපටිපන්න ආදී සඟගුණ අරමුණුකොට ඇති සිහියට එය විශේෂ නාමයකි. සීලය අරබයා උපන් අනුස්සතිය **සීලානුස්සතියි.** තමාගේ කඩනොවීමාදී සිල්ගුණ අරමුණුකොට ඇති සිහියට එය විශේෂ නාමයකි.

ත්‍යාගය අරබයා උපන් අනුස්සතිය **චාගානුස්සතියි.** තමාගේ හළ ත්‍යාගාදි ත්‍යාග ගුණ අරබයා උපන් සිහියට එය විශේෂ නාමයකි. දේවතාවුන් අරබයා උපන් අනුස්සතිය **දේවතානුස්සතියි.** දේවතාවුන්

සාක්ෂි ස්ථානයෙහි තබා තමාගේ ශ්‍රද්ධා ආදී ගුණ අරමුණුකොට ඇති සිහියට එය විශේෂ නාමයකි.

සප්තකයෙහි **සමාධි කුසලතා** යනු එක්වැදෑරුම් ආදී භේදයෙන් නොයෙක් භේද ඇති, සමාධියෙහි, මෙය මේ ආකාර සමාධියකි. මෙය මේ ආකාර සමාධියකැයි දක්‍ෂභාවයයි. සමාධිය පිරිසිඳ දක්නා ප්‍රඥාවට එය විශේෂ නාමයකි. සමාධිය උපදවන පිළිවෙළෙහිද දක්‍ෂභාවය සමාධි කුසලතායි. **සමාධිස්ස සමාපත්ති කුසලතා** යනු උපදවන ලද සමාධියට සමවැදීමේ දක්‍ෂතාවයයි. මෙයින් සමවැදීමේ වසීභාවය යූ.සේයි. **සමාධිස්ස ඨිති කුසලතා** යනු සමවන් සමාධියගේ, නොකඩවා පැවැත්වීම් වශයෙන් කැමැති පරිදි තැබීමෙහි දක්‍ෂභාවයයි. එයින් අධිෂ්ඨාන වසීභාවය යූ.සේයි. නොහොත් නිමිති ග්‍රහණයෙන්ම නැවත ඒ ආකාරයන් සම්පාදනය කරන කල්හි, අර්පණා මාත්‍රයම ඉටුවෙයි. කලක් නොපවත්නේය. කලක් පැවැතීම වනාහි සමාධියට උවදුරු වන ධර්මයන්ගේ මනාව සෝධනය කරන ලද හෙයින් වේ. යම් භික්‍ෂුවක් කාමයන්හි ආදීනව ප්‍රත්‍යවේක්‍ෂා කිරීම් ආදියෙන් කාමච්ඡන්දය මනාව යටපත් කිරීම නොකොට, කාය සන්සිඳීම් වශයෙන් කයෙහි දැඩිබව මනාව නොසන්සිඳුවා, ආරම්භ ධාතු මනසිකාරාදි වශයෙන් ථීන මිද්ධය මනාව දුරුනොකොට සමථ නිමිති මෙනෙහි කිරීම් ආදී වශයෙන්, නොසන්සුන්කම හා කුකුස මනාව සමූලඝාතනය නොකොට, අනෙකුත් සමාධියට උවදුරු ධර්මයන් මනාව ශුද්ධනොකොට ධ්‍යානයට සමවදීද? හෙතෙම පිරිසිදු නොකළ වාසස්ථානයට පැමිණි බඹරෙකු මෙන්ද, අපිරිසිදු උයනකට පිවිසි රජෙකු මෙන්ද, වහාම නික්මෙයි. යමෙක් වනාහි සමාධියට උවදුරුදායක ධර්මයන් මනාව ශෝධනයකොට ධ්‍යානයට සමවදීද? හෙතෙම මනාව ශුද්ධ කරන ලද, වාසස්ථානයකට පිවිසි බඹරෙකු මෙන්ද, සුපිරිසිදු උයනකට පිවිසි රජෙකු මෙන්ද, මුළු දිවා කාලයම සමාපත්තිය තුළම වෙයි. එහෙයින් පෞරාණිකයෝ කීහු :-

**කාමෙසු ඡන්දං පටිඝං විනොදයෙ**
**උද්ධච්ච ථීනං විචිකිච්ඡ පඤ්චමං**

**විවෙක පාමොජ්ජ කරෙන චෙතසා**
**රාජාව සුද්ධන්ත ගතො තහිං රමෙ'ති**

කාමයන්හි කැමැත්තද, ක්‍රෝධයද, නොසන්සුන් බවද, සිතෙහි ගිලන් බවද, පස්වන සැකයද දුරුකරන්නේය. විවේකය හා ප්‍රමෝදය

ගෙන එන සිතින් යුක්තව පිරිසිදු ස්ථානයකට ගිය රජෙකු මෙන් එහි ඇලනේනේය.

එහෙයින්, ධ්‍යානයෙහි චිරස්ථිතිය කැමැත්තහු විසින්, උවදුරු ධර්මයන්, ශුද්ධකොට ධ්‍යානයට සමවැදිය යුතුයයි කියන ලද හෙයින්, ඒ ක්‍රම සම්පාදනය කොට සමාධියගේ චිරස්ථිතිකරණයෙහි දක්‍ෂ බවයැයි යු.සේයි. **සමාධිස්ස වුට්ඨාන කුසලතා** යනු නොකඩවා පැවැත්වීම් වශයෙන් කැමති පරිදි පැවති සමාධියගේ, පිරිසිඳින ලද කාලයට අනුව නැගිටීමෙන් සමාධියගේ නැගිටීමෙහි දක්‍ෂභාවයයි. 'යස්මාහි ධම්මං පුරිසො විජඤ්ඤා, යනාදීන්හි මෙන්, පංචමී අර්ථයෙහි ෂෂ්ඨි වචනය කරන ලදැයි දතයුතුය. මෙයින් නැගිටීමේ වසීභාවය යූ.සේයි.

**සමාධිස්ස කල්ලතා කුසලතා** යනු නොගිලන් බව, නිරෝගි බව කල්ලතායි. ගිලනා 'අකල්ලකො,යි යූ.සේයි. විනයෙහිද කියන ලදී. 'ස්වාමීනි, මම ගිලනෙක් නොවෙමි. අනංගන සූත්‍ර, වත්ථ සූත්‍රාදීන්හි කියන ලද, ධ්‍යාන ප්‍රතිලාභයට විරුද්ධ, පාපී ආශාවලින් පිරුණු කෙලෙසුන්ගේ අභාවයෙන්ද, අභිධ්‍යාදී චිත්තෝපක්ලේශයන්ගේ පහව යාමෙන්ද, සමාධියගේ නොගිලන් බව හටගන්වන දක්‍ෂතාවය සමාධියගේ නොගිලන් දක්‍ෂතාවයයි. කෙලෙස් ගිලන්බව රහිත බව යයි යූ.සේයි. නොහොත් **කල්ලතා** යනු කර්මණ්‍යභාවයයි. කල්ල වචනයාගේ කර්මණ්‍යතාවයට අයත් බැවිනි. 'යා චිත්තස්ස අකල්ලතා අකම්මඤ්ඤතායි යූ.සේයි. **කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණ චිත්තං** යන මෙහි කල්ල ශබ්දය කර්මණ්‍ය අර්ථයෙහිය. එහෙයින් කසිණ අනුලෝම වශයෙන්, කසිණ ප්‍රතිලෝම වශයෙන්, කසිණ අනුලෝම ප්‍රතිලෝම වශයෙන්, ධ්‍යාන අනුලෝම වශයෙන්, ධ්‍යාන ප්‍රතිලෝම වශයෙන්, ධ්‍යාන අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ධ්‍යාන උගුලුවා දැමීමෙන්, කසිණ උගුලුවා දැමීමෙන්, ධ්‍යාන කසිණ උගුලුවා දැමීමෙන්, අංග ඉක්මවා යාමෙන්, අරමුණු ඉක්මවා යාමෙන් අංග අරමුණු ඉක්මවා යාමෙන්, අංග විභාග කිරීමෙන් අරමුණු විභාග කිරීමෙන් අංග හා අරමුණු විභාග කිරීමෙන් යන තුදුස් ආකාරයන් වන මෙයින් සහ පසළොස් ආකාරයන්ගෙන් සිත දමනයෙන් සමාධියගේ කර්මණ්‍යභාව කරණයෙහි දක්‍ෂභාවයයි යූ.සේයි.

**සමාධිස්ස ගොචර කුසලතා** යනු සමාධියට ගෝචර වූ (අරමුණු වූ) කසිණාදී අරමුණුවල ඒ ඒ ධ්‍යානයට සමවදිනු කැමැත්තෙන් කැමති පරිදි

ආවර්ජන කිරීම් වශයෙන් ඒ අරමුණුවල දක්ෂභාවයයි. මෙයින් කසිණාවර්ජන වශයෙන් ආවර්ජන වසීභාවය යු.සේයි. නොහොත් ඒ ඒ දිසාභාගයන්හි කසිණ පැතිරවීම් වශයෙන් මෙසේ ස්පර්ශ කරන ලද කසිණයාගේ කල් පැවතීම් වශයෙන් සමාධියගේ ගොදුරුවල දක්ෂභාවයයි. **සමාධිසස අභිනීහාර කුසලතා** යනු එකත්‍වයෙන් යට යට සමාධි මතු මතු සමාධි භාවයන් සමීපයට ගෙන ඒමෙන්, ඉදිරියට ගෙනඒමෙහි ඉදිරියට නැමීමෙහි දක්ෂභාවයයි. වසීප්‍රාප්ත උපචාර ධ්‍යානය වනාහි, ප්‍රථම ධ්‍යානය සඳහාද, විදර්ශනාව සඳහාද ඉදිරියට ගෙනයයි.

මෙසේ ප්‍රථමධ්‍යානාදීන්, ද්විතීය ධ්‍යානයන් සඳහාද, විදර්ශනාව සඳහාද වේ. චතුර්ථ ධ්‍යානය අරූප සමාපත්ති සඳහාද, අභිඥාවා සඳහාද විදර්ශනාව සඳහාද වේ. ආකාසානඤ්චායතනාදීහු, විඤ්ඤාණඤ්චා යතනාදීන් සඳහාද, විදර්ශනාව සඳහාද ඉදිරියට ගෙන එති. මෙසේ සමාධියගේ ඒ ඒ ඉදිරියට ගෙනයාම් කුසලතාවක් වේද? එම කුසලතාව නම් ප්‍රඥාවයි. ඕ සමාධි නම් නොවන්නීය. එහෙයින් ඒ සමාධිය අධිපතිත්වයෙන් වූ, විශේෂ දැනීම් වශයෙන් සත්වැදෑරුම් සමාධිය යු.සේයි. සමහර ආචාර්යවරු **සමාධි කුසලතා** යනු යම් මනසිකාරයකින් සිත වික්ෂිප්ත නොවේද? එහි දක්ෂතාවයැයි යෙති. **සමාපතති කුසලතා** යනු යම් මනසිකාරයකින් සමවදින්නහුට ධ්‍යානාංග පහළවේද? එහි දක්ෂතාවයයි. **ඨිති කුසලතා** යම් මනසිකාරයකින් ඇතුළට වැදුණු සමාධිය නොවිසිරේද, එහි දක්ෂතාවයි. **වුටඨාන කුසලතා** යනු ප්‍රථමධ්‍යානයෙහි නීවරණයන්ගෙන් නැගිටීම දනියි. ත්‍රිවිධ ධ්‍යානයන්හි අංගයන්ගෙන් නැගිටීම දනියි. අරූප සමාපත්තීන්හි අරමුණුවලින් නැගිටීම දනියි. අධිමාත්‍ර විෂයයන්හි විසිරීම් නැගිටීම් දනියි. අවසන් කාලයෙහි, අවසන් කළයුතු කාලයෙහිද, තම කැමැත්තෙන් නැගිටීම දනියි. **කලලකුසලතා** යනු සිතෙහි පහසුබවද, පුද්ගල පහසු බවද, සමාධියට කර්මණ්‍ය වේයයි දනී. **ගොචර කුසලතා** යනු අරමුණෙහි පිරිසිඳීම කරන්ට, දිසාවන්හි පැතිරීම් කරන්ට, වඩන්ට දනී. **අභිනීහාර කුසලතා** යනු ඒ ඒ තන්හි මනාව මෙනෙහි කිරීමෙන් සිත ඉදිරියට ගෙන ඒ. ඉදිරියට නමයි. උපචාරයෙහි වසීප්‍රාප්ත කල්හි ප්‍රථමධ්‍යානයෙහි ඉදිරියට ගෙන එයි. මෙසේ මතු මතු ධ්‍යාන අභිඥාවන්හිද, අරූප සමාපත්තීන්හිද, විදර්ශනා සුවය ඉදිරියට ගෙන එයි. මෙසේ ඒ ඒ තන්හි අභිනීහාර කුසලතාවයි මෙසේ ඒ පදයන්ගේ අර්ථ වර්ණනා කරති. අෂ්ඨකය කියන ලද අර්ථයමය.

නවකයෙහි : **රූපාවචරො** යනු කවර ධර්ම රූපාවචරද යටින් බ්‍රහ්ම පාරිසද්‍යය කෙළවරකොට, මත්තෙහි අකනිට්ඨා ඇතුළත්කොට යන ක්‍රමයෙන් කියන ලද, රූපාවචර ධර්මයන්හි ඇතුළත් කොටස්ය. එහි මේ වචනාර්ථයි. රූපස්කන්ධ සංඛ්‍යාත රූපය මෙහි හැසිරෙයි. කාමලෝකය නොවේනුයි රූපාවචරයි. රූපස්කන්ධයද රූපයයි යු.සේයි. 'රූපක්ඛන්ධො රූපං' ආදීන්හි මෙනි. එය වනාහි, බ්‍රහ්ම පාරිසද්‍ය, බ්‍රහ්ම පුරෝහිත, මහා බ්‍රහ්ම, පරිත්තාභ අප්පමාණාභ ආභස්සර, පරිත්තසුභ, අප්පමාණ සුභ, සුභකිණ්හ, අසඤ්ඤසත්ත, වෙහප්ඵල, අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සි, අකනිට්ඨ වශයෙන් සොළොස් ආකාර ප්‍රදේශයි. එය රූපාවචර සංඛ්‍යාත ප්‍රදේශයි. මතු පදය ලොප්කොට රූපයයි කියයි. එම රූපයෙහි හැසිරේනුයි රූපාවචරයි. රූප භවය හෝ වෙයි. රූපය එහි හැසිරේනුයි රූපාවචරයි. කිසිසේත් ඒ සමාධිය කාමභවයෙහිද හැසිරෙයි. යම්සේ වනාහි යුද්ධයෙහි හැසිරෙන හෙයින් සංගාමාවචරයයි ලද නම් ඇති හස්තියා නගරයෙහි හැසිරෙනුයේද සංගාමාවචරයැයි කියයිද? ගොඩ හැසිරෙන, දියෙහි හැසිරෙන ප්‍රාණීහු, ගොඩනුවූ, ජලනුවූ ස්ථානයන්හි සිටියාහු නමුත් ගොඩ හැසිරෙන, දියෙහි හැසිරෙන යයි කියත්ද? එසේම මෙය අන් තන්හි හැසිරෙන්නේද, රූපාවචරයයි කියන ලද්දේය. තවද රූප භව සංඛ්‍යාත රූපයෙහි ප්‍රතිසන්ධිය හසුරවයිනුයි රූපාවචරයි. **හීනො** යනු ලාමකයි. ලාමක උතුම් යන ස්වභාවයන්ගේ මධ්‍යයෙහි වූයේ **මජ්ඣායි** මධ්‍යමයි යනුද පාඨයි. එම අර්ථයමය. ප්‍රධාන භාවයට පමුණුවන ලද්දේ **පණීතොයි** උතුම්ය යන අර්ථයි. ඔවුහු වනාහි රැස්කිරීම් වශයෙන් දතයුත්තාහ. යමෙකුට වනාහි රැස්කරන අවස්ථාවෙහි, ඡන්දය හෝ වීර්යය හෝ චිත්තය හෝ වීමංසාව හෝ හීන වේද? එය හීන නම් වේ. යමෙකුට ඒ ධර්ම මධ්‍යමද, ඒ මධ්‍යමයි. යමෙකුට ප්‍රණීතද ඒ ප්‍රණීතයි. උපදවන ලද මාත්‍රයම හීනය. අතිශයින් මනාව නොවඩනා ලද්දේ මධ්‍යමයි. අතිශයින් මනාව වඩනා ලද්දේ වසීප්‍රාප්ත වූයේ ප්‍රණීතයි. **අරූපාවචරො** රූපාවචරයෙහි කියන ලද ක්‍රම අනුසාරයෙන්ද දතයුතුය. **සුඤ්ඤතො සමාධි** යන ආදීන්හි සියලු සංස්කාර, අනිත්‍යය, දුක්ඛය, අනාත්මයැයි පිළිවෙළින් විදර්ශනා කරන්නහුට අනත්තානුපස්සනාවෙන් මාර්ගයෙන් නැගිටීම හටගත් කල්හි ඒ විදර්ශනා තොමෝ ආත්ම විරහිත සංස්කාරයන්හි ශූන්‍ය වශයෙන් පවත්නා ලද්දීද? එහෙයින් ශුන්‍යතා නාමය වෙයි. එයින් සිද්ධ ආර්යමාර්ග සමාධිය සුඤ්ඤතො සමාධි නම් වේ. ශුන්‍යතා වශයෙන් පවත්වන ලද සමාධිය යයි අර්ථයි. විදර්ශනාව පැවති ආකාරයෙන්ම එය පවතී. අනිත්‍යානුපස්සනාවෙන් මාර්ගයෙන් නැගිටීම හටගත් කල්හි යම් හෙයකින්

ඒ විදර්ශනාව නිත්‍ය නිමිත්තට විරුද්ධ වශයෙන් පැවතීද? එහෙයින් අනිමිත්තා නම් වන්නේය. ඉන් සිද්ධ ආර්ය මාර්ග සමාධිය **අනිමිත්තො සමාධි** නම් වේ. නිත්‍ය නිමිත්තෙන් විරහිත සමාධිය යන අර්ථයි. විදර්ශනාවෙහි පැවැති ආකාරයෙන්ම එය පවතියි. දුකඛානුපස්සනාවෙන් මාර්ගයෙන් නැගිටීම හටගත් කල්හි යම්හෙයකින් ඒ විදර්ශනා ප්‍රාර්ථනා ප්‍රතිපක්ෂ වශයෙන් පැවැත්තීද? ප්‍රාර්ථනාවන්හි (ආශාවන්හි) නොපිහිටි නම් වන්නේය. එයින් සිද්ධ ආර්ය මාර්ග සමාධිය. **අප්පණිහිතො සමාධි** නම් වේ. ප්‍රාර්ථනා විරහිත සමාධියයි අර්ථයි. විදර්ශනාවෙහි පැවැති ආකාරයෙන්ම එය පවතී. එබඳු වූම ඵල සමාධිත්‍රයද, එම සමාධිත්‍රයෙහිම ඇතුළත් කරන ලදැයි දතයුත්තාහ. ලෝකෝත්තර සමාධි වනාහි ප්‍රණීත බැවින් හීනතාදී භේදයක් උදුරා නොදැක්විය.

දසකයෙහි, **උද්ධුමාතක සඤ්ඤාවසෙන** යනු ජීවිතය විනාශවීමෙන් මත්තෙහි, වායුවෙන් පිරුණු මයිනහමක් මෙන් අනුක්‍රමයෙන් හටගත් ඉදිමුණු ස්වභාවයෙන් ඉදිමුණු හෙයින් උද්ධුමාතංයි. ඉදිමුණෝම **උද්ධුමාතකංයි.** පිළිකුල් බැවින් හෝ පිළිකුල් ඉදිමීමනුයි **උද්ධුමාතකංයි.** එබඳු වූ මළ(මිනී) සිරුරට එය විශේෂ නාමයකි. මනාව බිඳීගිය වර්ණය විනීලයයි කියයි. විනීලයම **විනීලකංයි.** මස් බහුල ස්ථානයන්හි රත් වර්ණයාගේද, සැරව රැස්වූ ස්ථානයන්හි ශ්වේත වර්ණයාගේද බොහෝ සෙයින් නිල් තන්හි, නිල් සාටකයක් පෙරවූවා වැනි නිල්වන් මළ(මිනී) සිරුරට එය විශේෂ නාමයකි. බිඳීගිය ස්ථානයන්හි ගලායන සැරව විපුබ්බං නම් වේ. විපුබ්බයම **විපුබ්බකංයි.** පිළිකුල් හෙයින් පිළිකුල් සැරවනුයි **විපුබ්බකංයි.** එබඳු වූ මළ(මිනී) සිරුරට එය විශේෂ නාමයකි. දෙකට කැපීමෙන් අත්හළ සිරුර (යුද්ධාදියෙහිදී) විච්ඡිද්දයයි කියනු ලැබේ. විච්ඡිද්දයම **විච්ඡිද්දකංයි.** පිළිකුල් හෙයින් පිළිකුල් කැපුම් තුවාල සහිතනුයි විච්ඡිද්දකයි. මැදින් කපා දැමූ මළ(මිනී) සිරුරට එය විශේෂ නාමයකි. එහෙන් මෙහෙන් විවිධාකාරයෙන් බලු හිවලුන් විසින් කන ලද්දේනුයි **වික්ඛායිතංයි.** විඛායිතං කිවයුතු වුවත් වික්ඛායිතයි යු.සේයි.

තැනින් තැන කාදමන ලද්දේම **වික්ඛායිතකංයි** පිළිකුල් හෙයින් පිළිකුල් තැනින් තැන කඩා කන ලද්දේනුයි **වික්ඛායිතකංයි.** එබඳු වූ මළ(මිනී) සිරුරට එය නාමයකි. තැනින් තැන විසිරෙන ලද්දේ වික්ඛිත්තංයි. විසිරෙන ලද්දේම වික්ඛිත්තකයි. පිළිකුල් බැවින් හෝ පිළිකුල්, තැනින් තැන දමන ලද්ද **වික්ඛිත්තකංයි.** අත්, පා, හිස ආදී ශරීරාවයව තැනින්

තැන විසුරුවා දමන ලද, මළ(මිනී) සිරුරට එය විශේෂ නාමයකි. පහරදී (තුවාලකොට) පළමු පරිද්දෙන්ම විසුරුවන ලද්දේනුයි **හත විකඛිත්තකයි.** අඟපසඟ කපුටුපාද ආකාර ආයුධයකින් තුවාලකොට කියන ලද අයුරින් විසුරුවන ලද මළ(මිනී) සිරුරට මෙය විශේෂ නාමයකි. ලේ විසුරුවයි. විසුරුවා දමයි. ඔබ්නොබ වැගිරේනුයි **ලොහිතකයි.** වැගිරුණු ලේ තැවරුණු මළ(මිනී) සිරුරට එය විශේෂ නාමයකි. කෘමීහු පුලවා යයි කියති. පණුවන් විසුරවයිනුයි **පුලවකයි.** කෘමීන්ගෙන් පිරුණු මළ(මිනී) සිරුරට මෙය විශේෂ නාමයකි. අස්ථීහු නුයි **අට්ඨිකංයි.** පිළිකුල් හෙයින් හෝ පිළිකුල් අස්ථීහුනුයි **අට්ඨිකංයි.** ඇටසැකිල්ලටද එක ඇටයකටද එය විශේෂ නාමයකි. මේ උද්ධුමාතකාදීන් ඇසිරිකොට උපන් නිමිතීන්ටද, නිමිති ආශ්‍රයෙන් හටගත් ධ්‍යානයන්ටද එම නාමයෝම වෙති. මෙම උද්ධුමාතක නිමිත්තෙහි ප්‍රතික්කූලාකාර ග්‍රාහක අර්පණා වශයෙන් උපන් සංඥාව උද්ධුමාතක සංඥාවයි. ඒ උද්ධුමාතක සංඥාවගේ වශයෙන් **උද්ධුමාතක සඤ්ඤා** වසෙන සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**පඤ්ච පඤ්ඤාස සමාධි** යනු ඒකකාදි වශයෙන් කියන ලද පස් පනස් සමාධීහුය. මෙසේ ඒකකාදි වශයෙන් සමාධි ප්‍රභේද දක්වා, අනෙක් ක්‍රමයෙකින්ද සමාධිය දක්වනු කැමැත්තේ, 'අපිච' යනුවෙන් අනෙක් ක්‍රමයක ආරම්භය දක්වා, **පඤ්චවීසති** ආදිය වදාළහ. එහි **සමාධිස්ස සමාධට්ඨා** යනු සමාධියගේ සමාධි භාවයෙහි ස්වභාවයයි. යම් ස්වභාවයන්ගෙන් ඒ සමාධිය වේද? ඒවා එහි සිටියාහු නම් වේ. **පරිග්ගහට්ඨෙන සමාධි** යනු ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගෙන් අල්ලාගත් බැවින් එහෙයින් අල්ලාගත් ස්වභාවයෙන් සමාධියයි එම ඉන්ද්‍රියයෝම ඔවුනොවුන්ට පිරිවර වෙති. භාවනාවගේ සම්පූර්ණත්වය සඳහා සම්පූර්ණ වූවාහුද වෙති. එහෙයින්, **පරිවාරට්ඨෙන පරිපූරට්ඨෙන** සමාධි නම් වේ. එම සමාධීන්ගේම වශයෙන් එක අරමුණක් අපේක්ෂාකොට, ඒකාග්‍රාර්ථයෙන්, නොයෙක් අරමුණුවල වික්ෂෙප අභාවය අපේක්ෂාකොට අවික්ෂේපාර්ථයෙන්, ලෝකෝත්තර තත්වයටම මහත් වීර්ය බලයෙන් අල්ලා ගැනීමෙන් පැමිණිය යුතු හෙයින්, ලෝකෝත්තර මාර්ගයාගේම පිරිහීම් වශයෙන් විසාරදත්වයේ අභාවය හෙයින් යට ගන්නා ලද, අල්ලා ගැනීම්, නොවිසිරීම් අර්ථ මෙහි නොගන්නා ලදැයි දතයුත්තාහ.

කෙලෙස් කාලවර්ණයාගේ අභාවයෙන් **අනාවිලට්ඨෙන සමාධියි.** කම්පා නොවන හෙයින් **අනිඤ්ජනට්ඨෙන සමාධියි.** තාවකාලික යටපත්

කිරීම් වශයෙන් හෝ සම්පූර්ණයෙන් විනාශ කිරීම් වශයෙන් කෙලෙසුන්ගෙන් මිදුණු බැවින්ද, අරමුණෙහි නොමිදුණු බැවින්ද, **විමුත්තපටෙඨාන සමාධි** නම් වේ. **එකත්තුපට්ඨාන වසෙන චිත්තස්ස ඨිතත්තා** සමාධි යෝගයෙන්ම එක අරමුණෙහි වහා එකෙණෙහි සිටීම් වශයෙන් චිත්තයාගේ අරමුණෙහි නිශ්චල භාවයෙන් පිහිටි හෙයිනි. අෂ්ට යුගලයන්හි, සොයයි. නොසොයයි. ගනියි. නොගනියි. පිළිපදියි. නොපිළිපදියි යන මෙම ත්‍රිවිධ යුගලයන් අර්පණා වීථියෙන් පූර්ව භාගයෙහි උපචාරයාගේ මෘදු, මධ්‍යම, අධිමාත්‍රතා වශයෙන් යූ.සේයි. ඣායති, ඣාපෙති යන මෙය අර්පණා වීථියෙහි උපචාර වශයෙන් දතයුතුය. සොයන ලද හෙයින්, නොසොයන ලද හෙයින්, දැවූ හෙයින්, නොදවන ලද හෙයින් යන මේ සිව් යුගලයන් අර්පණා වශයෙන් යූ.සේයි. එහි **සමං එසතීති සමාධි** ආදීන්හි සමං යනු අර්පණායි. එය විරුද්ධ ධර්මයන් සමනය කරයි. නසයිනුයි සමායි. විරුද්ධ විෂමතා අභාවයෙන් හටගත්තේනුයි සමා නම් වේ. එය සමව සොයයි. අදහස් වශයෙන් සොයයි. ඉති ශබ්දය කාරණාර්ථයෙහි යෙදේ. සමව සොයයි. එහෙයින් සමාධිය යන අර්ථයි. **විසමං නෙසති** ඒ ඒ ධ්‍යාන විරුද්ධ යයි කියනු ලබන විසමය නොසොයයි. පූර්වභාග සමාධිය මුලදී හටගත් හෙයින් මෘදු වූයේ වෙයි. සමව සොයයි. විසමව නොසොයයි නම් වේ. මධ්‍යම ප්‍රමාණයෙන් හටගත්තේනුයි **සමං ආදියතං විසමං නාදියති** නම් වේ. අධිමාත්‍ර වූ අර්පණා වීථියට ආසන්න වූ හෙයින් **සමං පටිපජ්ජති විසමං නපටිපජ්ජති** නම් වේ. **සමං ඣායතී** යනු භාව නපුංසක වචනයි. සමව ධ්‍යාන වඩයි. සම ආකාරයෙන් ධ්‍යාන වඩයි යන අර්ථයි. අර්පණා වීථියෙහි වනාහි, සමාධියට විරුද්ධ ධර්මයන් පහවීමෙන් ශාන්ත හෙයින් ශාන්ත අර්පණාවට අනුකූල භාවයෙන්ද සිටි හෙයින් සම ආකාරයෙන් පවත්වයි. ධ්‍යාන කරයි. බබලයි යන අර්ථයි. ඒ මණ්ඩල මාලයෙහි පහන් දැල්වෙයි. මුළු රාත්‍රියෙහි තෙල් පහන දැල්වේ. මෙහි තෙල් පහන දැල්වෙන්නේය ආදීන්හි මෙනි. 'සමංජායතියිද' පාඨයි. සම ආකාරයෙන් උපදීයයි අර්ථයි. ඣායති, ඣාපෙති යුගලක් බැවින් පළමු පාඨයම වඩා සුන්දරය. ඣාපෙති යනු දවයි යන අර්ථයි. එය වනාහි සමාධියට විරුද්ධ ධර්මයන් ඉතා දුරකරන හෙයින් දවයි නම් වේ. ඒසන අනෙසනයන්හිදී වනාහි අර්පණාවගේ මස්තකප්‍රාප්තිය වූ හෙයින් එසිතත්තා නෙසිතත්තා ආදීන්හි අර්පණා සමාධියද යූ.සේයි. **සමං ඣාතත්තා** යනු සමව බැබලුණු හෙයින්, සමව හටගත් හෙයින් යයිද පාඨයි. මෙසේ මේ අට යුගලයන්ගේ වශයෙන් සොළසක්ද, පළමු නවයදැයි යන මේ පස්විස්ස සමාධියට සමාධි ස්ථායි වේ. සමවූයේද,

හිතවත් වූයේද, සුවපත් වූයේද, සමාධිය යැයි යන මෙය වනාහි පස්විසි ආකාරයකින් සමාධියට පත්වූවහුට සමාධියගේ අර්ථසිද්ධිය සඳහා යු.සේයි. එහි සමො යනු සම ශබ්දයාගේ සංශබ්දයාගේ යන අර්ථයි. එය වනාහි විරුද්ධ ධර්මයන්ගේ කැළඹීම් විසමතාවන් විරහිත හෙයින් සමාධියට පත්වූයේය යන්න ආදි ශබ්දයාගේ අර්ථයි. අරමුණෙහි එල්බුණේ නිශ්චල භාවකරණයෙන් පිහිට වූයේයයි අදහසයි. දෙයාකාරයෙන් සමව එල්බුණේනුයි සමාධියි යු.සේයි. සුඛො යනු ශාන්ත අර්ථයෙන් සුවයයි. 'යායං භනෙත අදුකඛමසුඛා වෙදනා සනතසමිං එසා පණීතෙ සුඛෙ වුතතා භගවතාතිච, උපෙකඛා පන සනතතතා සුඛ මිචෙචව භාසිතා'ති කියන ලද හෙයින් ශාන්ත අර්ථයෙන්ද සුව ශබ්දයෙන්ද, උපේක්‍ෂා සහගත සමාධියද ගන්නා ලද්දේ වෙයි. අනියමෙන් සියලු සමාධීහු මෙහි කියති. ඒ සුව ශබ්දයෙන් එල්බුණු භාවයාගේ කරුණ යු.සේයි. යම් හෙයකින් ශාන්තද, එහෙයින් එක් අරමුණක එල්බුණේ යයි අදහසයි දතයුතුය.

සමාධි භාවනාමය ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

ධම්මට්ඨිති ඤාණ නිර්දේශයෙහි, අවිජ්ජා සංඛාරානං උප්පාදට්ඨිති ආදීන්හි එය කරණකොට සංස්කාර සිටිනුයි ඨිතියි. එය කවරක් වන්නේද? අවිද්‍යාවයි. එය ඉපිදවීමට, නිපදවීමට ස්ථිතියට කරුණු වූයේනුයි උත්පාද ස්ථිතියි. උපන්නවුන්ගේ පැවැත්මෙහිද හේතුවූයේ නුයි = **පවත්තට්ඨිතියි.** කිසිසේත් ජනක ප්‍රත්‍යයට, උපදවන උපදවන ක්‍ෂණයම කෘත්‍යයෙහි බලය වේ. ඉන් හටගත්තවුන්ගේම පැවැත්ම හෙයින් ස්වකීය ක්‍ෂණයෙහි ප්‍රවෘත්තියෙහිද කරුණ නම් වේ. නොකඩවා පැවතීම් වශයෙන්ද, පැවැත්වෙන කාරණයයැයිද අර්ථයි. පවත්තං යනු මෙය නපුංසක වචනයි. එහෙයින් පවත්තං, යනුද පවත්ති යනුද එක් අර්ථයි. පවත්ති ශබ්දය ප්‍රකට හෙයින් එය සමග යොදා අර්ථය කීයේය. භාවාර්ථයෙහිද, ඨිති ශබ්දයාගේ සිද්ධවන හෙයින් මෙහි භාවාර්ථයෙහි ඨිති ශබ්දය යොදන ලදී. ඨිති ශබ්දය කාරණයෙහි යැයි දැක්වීම සඳහා **නිමිත්තට්ඨි** යයි යුසේයි. නිමිති වූ ස්ථිතියයි අර්ථයි. කරුණු වූයේයයි යු.සේයි. හුදෙක් නිමිති මාත්‍රයම නොවේ. තවද සංස්කාර ඉපිදවීමෙහි උත්සාහ වන්නාක් මෙන් වී රැස් කරයි. උත්සාහ කරයි යයි ප්‍රත්‍යය සමතාවය දක්වන්නේ **ආයූහනට්ඨිති**

යයි වදාළහ. රැස්කිරීම් ස්වභාවය වූ ස්ථිතියයි අර්ථයි. අවිද්‍යාව සංස්කාරයන් උපදවනු ලබන්නේ, උත්පාදයෙහි මනාව යොදවයි නමැ. ගටයි යන අර්ථයි. සංස්කාරයන් පවත්වනු ලබන්නේ පැවැත්මෙහි පළිබෝධ කරයි නමැ. බඳීයයි අර්ථයි. එහෙයින් **සඤ්ඤාගටඨීති පළිබොධටඨීති** යයි යූසේයි. එක්වීම් ස්වභාවය වූ ස්ථිතිය. බාධා ස්වභාවය වූ ස්ථිතිය යන අර්ථයි. අවිද්‍යාව සංස්කාරයන් උපදවනු ලබන්නේ ඉපැත්මෙහිද, පැවැත්මෙහිද මුල් කාරණාර්ථයෙන් සමුදය නමැ. සමුදය වූ ස්ථිතිය **සමුදයටඨීතියි** මුල් කාරණය වූ ස්ථිතියයි යන අර්ථයි. අවිද්‍යාවම සංස්කාරයන්ගේ ඉපැත්මෙහි ජනක ප්‍රත්‍යය බැවින් පැවැත්මෙහි උපකාර වන හෙයින් **හෙතුටඨීති පචචයටඨීතියි** යූසේයි. හේතුවූ ස්ථිතිය, ප්‍රත්‍යය වූ ස්ථිතියයි අර්ථයි. ජනක ප්‍රත්‍යය වනාහි හේතු වූයේනුයි උපස්ථම්භක ප්‍රත්‍යයයි කියති. සෙස්සෙහිද මෙසේ යෙදිය යුතුය.

**භවො ජාතියා ජාති ජරාමරණසස** යන මෙහි වනාහි උත්පාද ස්ථිතිය, සඤ්ඤාගස්ථිතිය, හේතුස්ථිතිය යන ඉපැත්ම වශයෙන් යොදන ලද පද, ජාති, ජරා, මරණවත් ස්කන්ධයන්ගේ වශයෙන් පර්යායෙන් යූ.සේයි.

සමහරු වනාහි උත්පාදයෙන් ස්ථිතියනුයි > උත්පාදස්ථිතිය යැයි මේ ආදී ක්‍රමයෙන් මෙහි අර්ථ වර්ණනා කරති. **අවිජජා පචචයො** යනු අවිද්‍යාවට සංස්කාරයන්ගේ ප්‍රත්‍යයභාවය අපේක්ෂාකොට යූ.සේයි. අවිද්‍යාවද ප්‍රත්‍යයෙන් හටගත් හෙයින් එහිද, ප්‍රත්‍යය පරිග්‍රහණ දැක්වීම සඳහා 'එම ධර්මද්වයයම ප්‍රත්‍යයෙන් හටගත්තාහුයැයි අවබෝධය ප්‍රත්‍යය පරිග්‍රහණයෙහි ප්‍රඥාවයැයි යූ.සේයි. සෙස්සෙහිද මෙසේ යෙදිය යුතුය. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ ප්‍රත්‍යය සමුත්පන්නයැයි ඒ අයුරින් යූ.සේයි.

**අතීතමපි අදධානං** යනු ඉක්මගියා වූද කාලයයි. **අනාගතමපි අදධානං** යනු අසමප්‍රාප්ත කාලයයි. දෙයාකාරයෙන්ම අත්‍යන්ත සංයෝගාර්ථයෙහි ද්විතියා වචනයි.

නවාකාර වාරයට අනතුරුව, එම නවාකාරයන්, විහාය හේතු, පටිචච-පචචය යන පදයන්හිම යොදා 'අවිජජා හෙතු, සංඛාරා හෙතු සමුපපනනා' යනාදී වාරත්‍රය නිර්දිෂ්ට නවාකාර වාරයෙහි ජනක, උපස්ථම්භක වශයෙන් ප්‍රත්‍යය යූසේයි. මෙහි වනාහි හේතු වාරයාගේද,

ප්‍රත්‍යය වාරයාගේද, වෙන්ව ආ හෙයින් හෙතු යනු ජනක ප්‍රත්‍යයතාවයි. **පච්චයො** යනු උපස්ථම්භක ප්‍රත්‍යයතාව දතයුතුය. තනි තනිවූද, අවිද්‍යාදී ප්‍රත්‍යයාගේ දෙඅයුරින් හටගත්තා හෙයින් පටිච්ච වාරයෙහි, **අවිජ්ජා පටිච්ච** යනු තම උත්පාදයෙහි සංස්කාරයන්ට අවිද්‍යාපේක්ෂා හෙයින් සංස්කාරයන්ගෙන් අවිද්‍යාව ප්‍රතිමුඛව යායුතුයි. ගමන් කළයුතුයිනුයි පටිච්ච නමැ. එයින් අවිද්‍යාවගේ සංස්කාර ඉපදවීමෙහි සමර්ථතාව යු.සේයි. **සංඛාරා පටිච්ච සමුප්පන්නා** යනු සංස්කාර අවිද්‍යාව හේතුකොට එයට අභිමුඛව පවත්නා හෙයින් ප්‍රතිමුවහැර සමව උපන්නාහ. මෙසේ සෙස්සෙහිද ලිංගානුරූපයෙන් යෙදිය යුතුය. අවිජ්ජා පටිච්ච යනු උත්සාහවත් වීම් වශයෙන් හෝ පාඨයි. මෙහි අර්ථය වනාහි අවිද්‍යාව තම ප්‍රත්‍යයන් නිසා පැවැත්තාහයි පාඨ ශේෂ වශයෙන් යෙදිය යුතුය. මෙසේ සෙසු සතරෙහිද, ඒ දොළොස් ප්‍රතීත්‍ය සමුත්පාදාංගයන්ට ප්‍රත්‍යය වීම් වශයෙන්ම ධර්මස්ථිති ඥාණය නිර්දේශ කළයුතු හෙයින් අවිද්‍යාදී එකොළොස් අංගයන්ගේ වශයෙන් ධර්මස්ථිති ඥාණය නිර්දිෂ්ටය.

ජරාමරණය වනාහි අන්තයෙහි සිටි හෙයින් ඒ වශයෙන් විස්තර කරන ලදී. ජරාමරණයටද, සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයන්ගේ ප්‍රත්‍යතාව හෙයින්, ජරාමරණ ඒවාට ප්‍රත්‍යය කොට පරීක්ෂා කරන්නහුට ඒ ජරාමරණයාගේ වශයෙන් ධර්මස්ථිති ඥාණය යෙදේමය.

දැන් ඒ දොළොස් ප්‍රතීත්‍ය සමුත්පාද අංගයන් විසි ආකාර වශයෙන් බෙදා, සිව්සංක්‍ෂෙප, ත්‍රියර්ධ, ත්‍රිසන්ධීන් දක්වා ධර්මස්ථිති ඥාණය විස්තර කරනු කැමැත්තේ, පුරිම කම්ම භවස්මිං යනාදිය වදාළහ. එහි **පුරිම කම්ම භවස්මිං** යනු පෙර කර්මභවයෙහි, අතීත ජාතියෙහිදී කර්මභවයන් කරනු ලබන කල්හිය යන අර්ථයි. **මොහො අවිජ්ජා** යනු දුකබාදීන් විඳීමෙහිදී එකල්හි යම් මෝහයක් වේද? යමෙකින් මුළා වූයේ කර්ම කෙරේද? එය අවිද්‍යා වන්නේය. **ආයූහනා සංඛාරා** යනු ඒ කර්ම කරන්නහුගේ පළමු චේතනාවෝයි. යම්සේ දනක් දෙන්නෙමියි සිතක් උපදවා මසක්ද, වසරක්ද, දානෝපකරණ පිළියෙල කරන්නහුට උපන් පළමු චේතනාවෝයි. ප්‍රතිග්‍රාහකයින්ගේ, හස්තයෙහි දක්ෂිණාව පිහිටුවන කල්හි වන චේතනාව භවයයි කියනු ලැබේ. ඒකාවර්ජනයන්හි හෝ ෂට් ජවනයන්හි චේතනාව ආයූහන සංස්කාර නමැ. සත්වන ජවන චේතනාව භවයයි. යම්කිසි චේතනා භවයක් වන්නීද? ඒ හා සම්ප්‍රයුක්ත රැස්කිරීම් සංස්කාර නමැ. **නිකන්ති තණ්හා** යනු යම් කර්මයක් කරන්නහුට ඒ

ඵලයට අදාළ උත්පත්ති භවයෙහි, ආශා කිරීමක් ප්‍රාර්ථනා කිරීමක් වන්නේද, එය තෘෂ්ණා නමැ. **උපගමනං උපාදානං** යනු කර්මභවයට ප්‍රත්‍යය වූ, මෙනම් කර්මය කළ කල්හි කාමයෝ සම්පූර්ණ වෙති. මෙය කොට අසවල් නම් තැන කාමයන් සේවනය කරන්නෙමියි හෝ ආත්මය සිඳුණේ හෝ මනාව සිඳුණේ හෝ වේයයි, සුවපත් වූයේ පහවූ දාහ ඇත්තේ යයි හෝ, සීල හා ව්‍රත සුවසේ සම්පූර්ණ කෙරෙයි හෝ පැවති එළඹීම, දෘඪ ග්‍රහණය මෙය උපාදාන නමැ. **චේතනා භවොති** රැස්කිරීම් අවසානයෙහි කියන ලද, චේතනාව භව නමැ. **පුරිමකම්ම භවස්මිං** යනු අතීත ජාතියෙහිදී කර්ම භවයන් කරනු ලබන කල්හි පැවැත්තා වූ. **ඉධ පටිසන්ධියා පච්චයා** යනු වර්තමාන ප්‍රතිසන්ධියට හේතුව වූ, **ඉධ පටිසන්ධි විඤ්ඤාණං** යනු වර්තමාන භවයාගේ භව අතර ගැළපීම් වශයෙන් උපන් හෙයින් ප්‍රතිසන්ධි යයි කියයි. ඒ විඤ්ඤාණයයි. **ඔක්කන්ති නාමරූපං** යනු ගර්භයෙහි පිටතින් පැමිණ පිවිසෙන්නාක් මෙන් රූපාරූප ධර්මයන්ගේ පිහිටීමක් වේද? මෙම නාමරූපයයි. **පසාදො ආයතනං** යනු, යම් ප්‍රසන්න භාවයක් වේද, මෙය ආයතනයයි. ජාති ග්‍රහණයෙන් ඒකවචනයෙන් කරන ලදී. මෙයින් ඇස් ආදී ආයතන පංචකය යූ.සේයි. මහණෙනි, මේ සිත ඉතාමත් බබලන සුළුය. එය වනාහි පිටතින් පැමිණෙන අපද්‍රව්‍යයන්ගෙන් කිළිටි වී ඇත යන මෙහි භවංග සිත අදහස් කරන ලද්දේයයි යන වචනයෙන් මෙහිද මනායතනයාගේ විපාක ස්වභාව හෙයින් ඒ කෙලෙස් කාලුෂ්‍යයාගේ අභාවයෙන්, ප්‍රසන්න හෙයින් ප්‍රසාද වචනයෙන් මනායතනය යූ.සේයි. **ඵුට්ඨො ඵස්සො** යනු යම් අරමුණක් ස්පර්ශ කරන ලද්දේ, ස්පර්ශ කරමින් හටගත්තේ වේද, මේ ස්පර්ශය නමැ. **වෙදයිතං වෙදනා** යනු යම් ප්‍රතිසන්ධි විඤ්ඤාණයෙන් හෝ ෂට් ආයතන ප්‍රත්‍යයෙන් හෝ ස්පර්ශය සමග උපන් විපාක විඳීමයි. මේ වෙදනා නමැ. **ඉධූපපත්ති භවස්මිං පුරෙ කතස්ස කම්මස්ස පච්චයා** යනු වර්තමාන විපාක භවයෙහි අතීත ජාතියෙහි කළ කර්මයාගේ ප්‍රත්‍යයෙන් පවත්නාහුයයි අර්ථයි. **ඉධ පරිපක්කත්තා ආයතනානං** වර්තමාන භවයෙහි ආයතනයන් මුහුකුරා ගිය බැවින් කර්ම කරන කල්හි වන මෝහාදීන් දක්වන ලදී. **ආයතිං පටිසන්ධියා** යනු අනාගත ප්‍රතිසන්ධිය සඳහා ආයතිං පටිසන්ධි විඤ්ඤාණාං යනාදිය කියන ලද අර්ථයමය.

දොළොස් ප්‍රතීත්‍ය සමුත්පාදයන්ගෙන් මේ විසි ආකාරයෝ කෙසේ ගන්නා ලද්දේ වෙත්ද? අවිද්‍යා සංස්කාර යන මේ අතීත හේතු ද්වයය ස්වරූප වශයෙන් කියන ලදී. යම් හෙයකින් වනාහි අඥානයා ආශාවෙන්

පීඩිත වූයේ දෘඪව අල්ලා ගනී. ඒ දෘඪ අල්ලා ගැනීම් හේතුයෙන් භවය වේ. එහෙයින් ඒ ද්වයය ගත් කල්හි තෘෂ්ණා, උපාදාන භවද ගන්නා ලද්දේම වෙත්. ප්‍රත්‍යුත්පන්න විඥඥාණයෙහි නාමරූප සළායතන, ඵස්ස, වේදනා, ස්වරූප වශයෙන් කියන ලද්දේමය.

භවය ගත්කල්හි, එයට පූර්වභාග වූ, ඒ හා යෙදුණු සංස්කාර ගන්නා ලද්දේම වෙයි. තෘෂ්ණා උපාදාන ග්‍රහණයෙන් ඒ හා සම්ප්‍රයුක්තයෝ ගන්නා ලද්දෝම වෙති. යමක් කරණකොට මුලා වූයේ ක්‍රියාවක් කෙරේද, එයි. අවිද්‍යාවෙන්ම ගන්නා ලද්දේය. අනාගතයෙහි ජරා මරණ යන ද්වය ස්වරූප වශයෙන් කියන ලදී. ජරාමරණ ග්‍රහණයෙන්ම විඥඥාණාදී පස් අනාගත ඵල ගන්නා ලද්දේම වෙයි. ඒ ජාති ජරා මරණයන්හිම යයි මෙසේ දොළොස් අංගයන්ගෙන් විසි ආකාර ගන්නා ලද්දේම වෙති.

**අතීතෙ හෙතවො පඤ්ච - ඉදානි ඵල පඤ්චකං**
**ඉදානි හෙතවො පඤ්ච - ආයතිං ඵල පඤ්චක'න්ති**

අතීත හේතු පංචකයකි. දැන් විපාක පංචකයකි. වර්තමානයේ හේතු පංචකයකි. මත්තෙහි විපාක පංචකයකි.

ගාථාවෙන්ද මෙම අර්ථයම යූ.සේයි. **ඉතිමෙති ඉතිමෙ** මෙසේ මොවුහු යනුද පාඨයි.

**චතුසංඛෙපෙ** යනු සිව්රාසියි. අතීතයෙහි පංච හේතුධර්ම එක් හේතු සංක්ෂේපයකි. වර්තමානයෙහි පංච විපාක ධර්ම එක් විපාක සංක්ෂේපයකි. වර්තමානයෙහි පංච හේතුධර්ම එක් හේතු සංක්ෂේපයකි. අනාගතයෙහි පංච විපාක ධර්ම එක් විපාක සංක්ෂේපයකි. **තයො අද්ධ** යනු කාලත්‍රයයෙහි ප්‍රථම පංචකය අතීත කාල වශයෙනි. දෙවන, තෙවන පංචකයන් වර්තමාන කාල වශයෙනි. සිව්වන පංචකය අනාගත කාල වශයෙන් දතයුත්තේය. **තිසන්ධිං** සන්ධිත්‍රයක් වන්නේනුයි තිසන්ධියි. ඒ ත්‍රිසන්ධිය. අතීත හේතු වර්තමාන ඵලයන් අතර එක් හේතුඵල සන්ධියකි. වර්තමාන ඵල හා අනාගත හේතු අතර එක් ඵලහේතු සන්ධියකි. ප්‍රතීත්‍ය සමුත්පාද පෙළෙහි ආවා වූ ස්වරූප වශයෙන් අවිද්‍යා සංස්කාර එක් සංක්ෂේපයකි. විඥඥාණ නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වේදනා දෙවැන්නය. තෘෂ්ණා, උපාදාන භව තෙවැන්නයි. ජරාමරණ සිව්වැන්නයි. අවිද්‍යා,

සංස්කාර අංගද්වය, අතීතකාලිකයි. භව අවසන්කොට ඇති විඤ්ඤාණාදී අට වර්තමානකාලිකය. ජාති, ජරා මරණ යන ද්වය අනාගත කාලිකයි. සංස්කාර විඤ්ඤාණයන් අතර එක් හේතුඵල සන්ධියකි. වේදනා තෘෂ්ණා අතර එක් ඵල හේතු සන්ධියකි. භවජාතීන් අතර ඒ හේතුඵල සන්ධියකි.

**වීසතියා ආකාරෙහි** යනු කොටස් විස්සකින්, සිව්රාශි, තෙකල්, ත්‍රිසන්ධි වශයෙන් ප්‍රතීත්‍ය සමුත්පාදය විසි ආකාරයකින් දනීයයි සම්බන්ධයි. **ජානාති** ඇසූ ආකාරයෙන් භාවනා අරඹන නුවණින් දනියි. **පසසති** යනු දතුයේම, ඇසින් දුටු මෙන් අත්තල නෙල්ලිගෙඩියක් මෙන්, ස්පර්ශකොට ඤාණයෙන්ම දකියි. **අඤ්ඤාති** යනු, දුටු ආකාරයන්ම සෙවුණේ නුවණින්ම දනියි. මෙහි මරියාදාර්ථය ආකාරයෙහිය. **පටිවිජඣති** යනු භාවනා සම්පූර්ණත්වයෙහි නිෂ්ඨාවට පමුණුවන්නේ නුවණින්ම අවබෝධ කරයි. වැටහෙන කරුණ වශයෙන් දනියි. ආසන්න කරුණ වශයෙන් අවබෝධ කරයි. එහි **පටිචච සමුපපාදො** යනු ප්‍රත්‍යය ධර්මයන් දතයුත්තාහ. **පටිචච සමුපපනන ධමමා** යනු ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් හටගත් ධර්මයි. මෙය කෙසේ දතයුත්තේද යත්, බුදුරදුන්ගේ වදනින්, බුදුරදුන් විසින්, ප්‍රතීත්‍ය සමුත්පාද, ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්ම දේශනා සූත්‍රයෙහි, මහණෙනි, ප්‍රතීත්‍ය සමුත්පාදය කවරේද? මහණෙනි, ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණයන්ගේ හටගැන්ම තථාගතයන් වහන්සේලාගේ උපන් කල්හිද, තථාගතයන් වහන්සේලාගේ නූපන් කල්හිද, මේ හේතුවෙන්, මෙය හටගනී යනු ස්ථිරව පිහිටි ස්වභාවයකි. ධර්ම ස්වභාවයයි. ස්වභාව ධර්ම නියමයයි. එය තථාගතයන් වහන්සේ මනාව අවබෝධ කරති. අවබෝධ කරත්. මනාසේ අවබෝධ කොට, අවබෝධ කොට, කියති. දෙසති. පනවති. පිහිටුවති. විවරණය කරති. බෙදති. නොගැඹුරු කරති. බලවු යයි වදාරති. මහණෙනි, ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වේ. මහණෙනි, භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ -පෙ- මහණෙනි, අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වේ. තථාගතයන් වහන්සේලාගේ උපන් කල්හිද, -පෙ- නොගැඹුරු කරති. බලවු යයි වදාළහ. මහණෙනි, අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වේ. මහණෙනි, මෙසේ වනාහි යම් ඒ මේ හේතුයෙන් මෙය හටගනී යනුවෙන් යමක් වේද? එය සත්‍යතායෙන් යුක්තය. අසත්‍යතායෙන් තොරය. අන් අයුරකින් නොවන්නේය. මහණෙනි, මෙය ප්‍රතීත්‍ය සමුත්පාදයැයි කියනු ලැබේ. මෙසේ ප්‍රතීත්‍ය සමුත්පාදය දේශනා කරන්නා වූ බුදුරදුන් විසින් සත්‍යතාදී සමාන වචනයන්ගෙන් ප්‍රත්‍යය ධර්මයෝම ප්‍රතීත්‍ය සමුත්පාදයයි යූ.සේයි. එහෙයින් ජරාමරණාදීන්ගේ ප්‍රත්‍යය ලක්ෂණය ප්‍රතීත්‍ය සමුත්පාදයයි. දුක්

ලුහුබඳින රසයි. වැරදි මාර්ගය වැටහෙන කරුණයි. මෙයද ප්‍රත්‍යය සහිත හෙයින්, තමාගේ විශේෂ ප්‍රත්‍යය ආසන්න කරුණයි. උප්පාදාවා, අනුප්පාදාවා යනු ඉපැත්මෙහි, නොඉපැත්මෙහි, තථාගතයන් වහන්සේලාගේ උපන් කල්හිද, නූපන් කල්හිද යන අර්ථයි. ඨිතාව සා ධාතු යනු ඒ ප්‍රත්‍යය ස්වභාවය පිහිටියේම කිසිකලෙකත් ජාතිය ජරාමරණයට ප්‍රත්‍යය නොවේයයි යන්න නොවේ යන අර්ථයි. ධම්මට්ඨිතතා, ධම්ම නියාමතා, ඉදප්පච්චයතා යනාදීන් ජාති ප්‍රත්‍යමය. ඉපැත්මේ හේතුයෙන්, ජරාමරණ සංඛ්‍යාත ප්‍රත්‍යයෙන් හටගත් ධර්ම ඊට අයත් ස්වභාවයෙන් සිටී. ජාති ප්‍රත්‍යය ජරා මරණ ධර්ම නියම කරයි. එහෙයින් ජාතිය (ඉපැත්ම) ධම්මට්ඨිතතා, ධම්මනියාමතා යැයි කියනු ලබයි. ඉපැත්ම ම මෙම ජරා මරණයට ප්‍රත්‍යය වේනුයි ඉදප්පච්චයොයි. ඉදප්පච්චයම ඉදප්පච්චයතායි 'තං' යනු ඒ ප්‍රත්‍යයයි. '**අභිසම්බුජ්ඣති**' යනු නුවණින් මනාව අවබෝධ කරයි. '**අභිසමෙති**' යනු නුවණින් අවබෝධයට පැමිණේ යනුයි. '**ආචික්ඛති**' යනු කියයි. '**දෙසෙති**' යනු දක්වයි. '**පඤ්ඤාපෙති**' යනු දන්වයි. '**පට්ඨපෙති**' යනු නැණ මුවෙහි තබයි. 'විවරති' යනු විවරණය කොට දක්වයි. '**විභජති**' යනු බෙදීම් වශයෙන් දක්වයි. 'උත්තානී **කරොති**' යනු ප්‍රකට කරයි. '**ඉති ඛො**' යනු මෙසේ වනාහි 'යා **තත්‍ර**' යනු යම් ඒවා අතරෙහි ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණයයි ආදීන්හි ඒ මේ ප්‍රතීත්‍ය සමුත්පාදය ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් අඩුවැඩි නොවූයේම ඒ ඒ ස්වභාවයාගේ හටගැනීම වන හෙයින් සත්‍යතායෙන් යුක්තයි. ප්‍රත්‍යයන් එකට එක්වූ කල්හි, මොහොතක් හෝ ඉන් උපදවන ධර්මයන්ගේ හටනොගැනීමක් නොවන හෙයින් තිබොරුය. අන් ධර්ම ප්‍රත්‍යයෙන් අන් ධර්ම නොඋදනා හෙයින් අනත්‍යාකාරයක් නොවේ. කියන ලද අයුරින් ඒ ජරා මරණාදීන්ට ප්‍රත්‍යය වශයෙන් හෝ ප්‍රත්‍යය සමූහ වශයෙන් හෝ '**ඉදප්පච්චයතායි**' යූ.සේයි. ඒ මේ වචනාර්ථයි. මොවුන්ගේ ප්‍රත්‍යය 'ඉදප්පච්චයා' ඉදප්පච්චයම - ඉදප්පච්චයතායි. ඉදප්පච්චයන්ගේ සමූහය ඉදප්පච්චයතායි. මෙහි ලක්ෂණ ශබ්ද ශාස්ත්‍රයෙන් දතයුතුය.

**ධර්මස්ථිති ඥාන නිර්දේශ වර්ණනාව නිමි.**

සම්මසන ඥාණ නිර්දේශයෙහි, **යංකිඤ්චි** යනු සේස රහිතව ගැනීම. රූප යනු අතිශය ඇල්මේ නියමයයි. මෙසේ දෙපදයෙන්ම රූපයාගේ අනවශේෂයෙන් තෘෂ්ණා ග්‍රහණය දක්වයි. නැවත එහි අතීතාදී වශයෙන් බෙදීම අරඹයි. එය වනාහි කිසිවක් අතීතය කිසිවක් අනාගතය යැයි භේදයකි. වේදනාදීන්හි එම ක්‍රමයමැයි. පළමුව එහි රූපය, අද්ධ, සන්තති, සමය, ක්‍ෂණ වශයෙන් අතීතය සතරාකාරයි. අනාගත වර්තමානයද එසේය. එහි කාල වශයෙන්, එක් රූපයකට එක් භවයෙක්හි ප්‍රතිසන්ධි පූර්වයෙහි අතීතයි. චුතියෙන් මත්තෙහි අනාගතයි. ද්වයන්තර වර්තමානයි. නොකඩවා පැවතීම් වශයෙන් සමාන එක් ඍතුවක් තුළ හටගැනීම එක් අහරකින් හටගැනීම පූර්වාපර භාවයෙන් පවත්නේ වර්තමානයි. ඉන් පෙර අසමාන ඍතු ආහාරයෙන් හටගත්තේ අතීතයි. පසුව වන්නේ අනාගතයි. චිත්තජරූප එක් වීථියක, එක් ජවනයක, එක් සමවතක හටගත්තේ වර්තමානයි. ඉන් පෙර වූයේ අතීතයි. පසුව හටගන්නේ අනාගතයි. කර්මජ රූපවල නොකඩවා පැවතීම් වශයෙන් වෙන් වෙන් අතීතාදී භේද නැත. එම ඍතු, ආහාර චිත්ත සමුට්ඨානයන්ට, උපකාර කිරීම් වශයෙන් එහි අතීතාදී භාවයන් දතයුතුය. කාල වශයෙන්, එක් මොහොතක්, පෙරවරු, පස්වරු, රෑදවල් ආදී කාලයන්හි සිත් පරම්පරා වශයෙන් පවත්නා ඒ ඒ කාලය වර්තමානය නමැ. ඉන් පෙර අතීතයි. පසු හටගැනීම් අනාගතයි. ක්‍ෂණ වශයෙන් උත්පාදාදී ක්‍ෂණත්‍රයට ඇතුළත් වූයේ වර්තමානයි. ඉන් පූර්වයෙහි අනාගතයි. පසුව වූයේ අතීතයි. තවද, ඉක්මගිය හේතු ප්‍රත්‍යය කෘත්‍යය අතීතයි. නිමියා වූ හේතුකෘත්‍යයද, නොනිමි ප්‍රත්‍යය කෘත්‍යයද වර්තමානයි. අසම්ප්‍රාප්ත දෙකිස් අනාගතයි. ස්වකෘත්‍යක්‍ෂණයෙහි හෝ වර්තමානයි. ඉන් පෙර අනාගතයි. පසු අතීතයි. මෙහිද, ක්‍ෂණ ආදී කථා වෙනස් නොකළ හැකිය. සෙස්ස වෙනස් කළ හැකිය. **අජ්ඣත්තං** යනු පංච ස්කන්ධයන්හි ස්වකීය ශරීරය අදහස් කරන ලදී. එහෙයින් තමාගේ සන්තානයෙහි පවත්නා වෙන්වූ පෞද්ගලික රූප අජ්ඣත්තයයි දතයුතුය. ඉන් පිටත වූ, ඉන්ද්‍රිය බද්ධ වූ හෝ ඉන්ද්‍රිය බද්ධ නුවූ හෝ රූපය බහිද්ධා නමැ. **ඔළාරිකං** යනු ඇස්, කන්, නාසය, දිව, ශරීරය, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සංඛ්‍යාත වූ පෘථුවි ගිනි, වායු යන දොළොස් ආකාර රූප ගැටීම් වශයෙන් ගතයුතු හෙයින් ඕළාරික නමැ.

සෙසු ජලය, ස්ත්‍රීන්ද්‍රිය, පුරුෂෙන්ද්‍රිය, ජීවිතේන්ද්‍රිය, හෘදය වස්තුව, ඕජාව, ආකාශ වස්තුව, කාය, වචී, විඤ්ඤප්ති, රූපයාගේ ලිහිල් බව, මෘදු බව, කර්මණ්‍යතාව, උපචය, සන්තති, ජරතා, අනිත්‍යතාදී සොළොස්

ආකාර රූප ගැටීම් වශයෙන් නොගතයුතු හෙයින් **සුඛුමං** නමැ. **හීනංවා පණීතංවා** යන මෙහි උසස් පහත් බව, වෙනස් කළහැකි හා වෙනස් කළ නොහැකි අයුරින් දතයුතුය. අකනිට්ඨයන්ගේ රූපයට වඩා සුදර්ශියේ රූප හීනය. එයම සුදර්ශියේ අනුව බලනවිට ප්‍රණීතය. මෙසේ නිරය දක්වා සත්ත්වයින්ගේ රූපයන් වෙනස් කළහැකි අයුරින් හීන ප්‍රණීතතා දතයුත්තාහ. වෙනස් නොකළ හැකි අයුරින් බලනවිට යම්තැනක අකුසල විපාක උපදීද, එය හීනය. යම්තැනක කුසල්විපාක උපදීද, එය ප්‍රණීතය. **යං දූරෙ සන්තිකෙ** යන මෙහි යමක් සියුම්ද එයම අවබෝධය දුෂ්කර ස්වභාව හෙයින් දූරෙනමැ. යමක් දැඩිද එයම අවබෝධ කරගැනීම පහසු හෙයින් සන්තිකෙ නමැ. **සබ්බං රූපං අනිච්චතො වවත්ථපෙති. එකං සම්මසනං දුක්ඛතො වවත්ථපෙති එකං සම්මසනං අනත්තතො වවත්ථපෙති එකංසම්මසනං** යන මෙහි මේ භික්ෂුව යම්කිසි රූපයක් යැයි මෙසේ අනියමින් දක්වන ලද රූපය, අතීත ත්‍රිකයෙන්ද, සිව් ආධ්‍යාත්මිකාදි, ද්වයයෙන්ද යන එකොළොස් අවකාශයන්ගෙන් පිරිසිඳ, සියලු රූප අනිත්‍ය වශයෙන් විභාග කරයි. අනිත්‍යයැයි මෙනෙහි කරයි. කෙසේද? වෙනත් කියන ලද පරිද්දෙන්, කියන ලද්දේමය. අතීත, අනාගත, වර්තමාන රූප ක්‍ෂය අර්ථයෙන් අනිත්‍යයි. එහෙයින් ඒ යම් අතීත රූපයක් වූයේද එය යම්හෙයකින් අතීතයෙහිදීම ක්‍ෂය වූයේද? මේ භවයට නොපැමිණියේය. ක්‍ෂය අර්ථයෙන් අනිත්‍යයි. යම් අනාගත රූපයක් අනතුරු භවයෙහි උපදින්නේද, එයද එහිම ක්‍ෂය වන්නේය. ඉන් මත්තෙහි භවයකට නොයන්නේය. ක්‍ෂය අර්ථයෙන් අනිත්‍යයි. වර්තමාන රූපය එය මෙහිම ක්‍ෂය වෙයි. මෙයින් ඉදිරියට නොයයි. ක්‍ෂය අර්ථයෙන් අනිත්‍යයි. යම් අධ්‍යාත්මික රූපයක් වේද? එයද අධ්‍යාත්මයෙහිම ක්‍ෂය වෙයි. පිටත නොයේ යයි ක්‍ෂය අර්ථයෙන් අනිත්‍යයි. යම් පිටත දළ, සියුම්, හීන, ප්‍රණීත, දුර, ළඟ රූප වෙත්ද, එයද එහිම ක්‍ෂය වේ. දුරබවට නොයයි. ක්‍ෂය අර්ථයෙන් අනිත්‍යයයි මෙනෙහි කරයි. මේ සියල්ල ක්‍ෂය අර්ථයෙන් අනිත්‍යයි. ඒ ආකාරයාගේ වශයෙන් එක් සම්මර්ශනයකි. ප්‍රභේද වශයෙන් වනාහි එකොළොස් ආකාර වේ. ඒ සියල්ලම බිය ගෙනදෙන අර්ථයෙන් දුකයයි මෙනෙහි කරයි. බිය අර්ථයෙන් යනු බිය සහිත භාවයෙනි. යමක් අනිත්‍යද එය බිය එළවයි. සීහෝපම සූත්‍රයෙහි දෙවියන්ට මෙනි. මෙසේ මෙයද බිය ගෙනදෙන අර්ථයෙන් දුකය ඒ වශයෙන් එක් මෙනෙහි කිරීමකි. ප්‍රභේද වශයෙන් වනාහි එකොළොස් ආකාර වේ. දුක යම්සේද සියල්ලම මෙසේයි. එය අසාර අර්ථයෙන් අනාත්මයැයි මෙනෙහි කරයි. අසාරකාර්ථයෙන් යනුඃ ආත්ම, වසන්නා, කරන්නා, විඳින්නා ස්වයං වසී

යන මෙසේ පරිකල්පනය කරන ලද, ආත්ම සාරයාගේ අභාවයෙන්ඃ යමක් අනිත්‍යයද? දුකද? එය ආත්ම වශයෙන්ද අනිත්‍යයි. උදය-ව්‍යය. පීඩා හෝ වළක්වන්ට නොහැකිවේද? එහි කාරකාදී බවක් කොයින්ද? එහෙයින් දෙසූහ. මහණෙනි, මෙම රූපය ආත්මය වන්නේද? එසේනම් මෙම රූපය ආබාධ සඳහා නොපවතින්නේය ආදිය. මෙසේ මෙය අනාත්ම, නිසරු අර්ථයෙන්දැයි යන එය වශයෙන් එක් මෙනෙහි කිරීමකි. ප්‍රභේද වශයෙන් වනාහි එකොළොස් ආකාර වේ. වේදනාදින්හිද එම ක්‍රමයමැයි. මෙසේ එක් එක් ස්කන්ධයෙහි එකොළහ,එකොළහ බැගින් කොට පංච ස්කන්ධයන්හි පස් පනස් මෙනෙහි කිරීම් වෙයි. අනිත්‍ය වශයෙන් පනස්පහයි, දුක් වශයෙන් පනස් පහයි, අනාත්ම වශයෙන් පනස් පහකැයි ත්‍රිවිධ නුවණින් බැලීම් වශයෙන් සියල්ල එකසිය හැටපහක් මෙනෙහි කිරීම් වෙයි.

සමහරු වනාහි, සියලු රූපය, සියලු වේදනාව, සියලු සංඥා, සියලු සංස්කාර, සියලු විඥඥාණයයි යන පදයද බහා එක් එක් ස්කන්ධයෙහි දොළහ බැගින් කොට අංග පසෙහි හැටක් කරයි. අනුපස්සනා වශයෙන් එක්සිය අසූවක් සම්මසනයයි කියති.

මෙහි අතීතාදි බෙදීම් වනාහි, නොකඩවා පැවතීම් වශයෙන්ද, ක්‍ෂණ ආදී වශයෙන්ද වේදනාවගේ අතීත, අනාගත වර්තමාන භාවය දතයුතුය. එහි, සනතති වශයෙන්, එක්වීථි, එක් ජවන, එක් සමවත් ඇතුළත් වූ ඒකාකාර විෂය එකට යෙදීම් අනුව පැවැත්තේ වර්තමානයි. ඉන් පෙර අතීතයි. පසුව වූයේ අනාගතයි. ක්‍ෂණාදි වශයෙන් ක්‍ෂණත්‍රයට ඇතුළත් වූ, පූර්වාන්තයට හා අපරාන්තයට මධ්‍යගත වූ තම කෘත්‍යයන්ද කරනු ලබමින් වන වේදනාව වර්තමානයි. ඉන්පෙර අතීතයි. පසුව වූයේ අනාගතයි. අධ්‍යාත්ම-බහිද්ධා භේදය. තමා අයත් අධ්‍යාත්ම වශයෙන්ම දතයුතුය. දළ සියුම් භාවය අකුසල වේදනායි. දළ කුශල අව්‍යාකෘත සියුම් වේදනායි ආදි ක්‍රමයෙන් විභංගයෙහි කියන ලද හෙයින්, ජාති ස්වභාව, පුද්ගල ලෞකික, ලෝකෝත්තර වශයෙන් දතයුතුය. ජාති වශයෙන් අකුසල වේදනාවෝ, සාවද්‍ය ක්‍රියා හේතු වශයෙන්ද, කෙලෙස් තැවීම් භාවයෙන්ද, නොසන්සුන් පැවැත්මයයි කුසල් වේදනාවන්ගේ දළ බවයි. උත්සාහවත්ව, උත්සාහ සහිතව, විපාක සහිතව, කෙලෙස් තැවීම් බැවින්, සාවද්‍ය බැවින්, විපාක අව්‍යාකෘත බැවින් දළය. විපාක සහිත බැවින් කෙලෙස් තැවීම් බැවින්ද, ව්‍යාපාද සහිත බැවින්ද වැරදි සහිත බැවින්ද,

ක්‍රියා අව්‍යාකෘත බැවින් දළය. කුසල් අව්‍යාකෘත වනාහි කියන ලද්දට වෙනස් අයුරින් අකුසල වේදනාවගේ සියුම් බව වේ. කුසල් අකුසල් වේදනා ද්වයයම උත්සාහවත්ව උත්සාහ සහිතව, විපාක සහිතවද, සුදුසු පරිදි දෙයාකාරයෙන්ම වේ. අව්‍යාකෘතයෙහි දළ බව කියන ලද්දට විපරීත ආකාරයෙන් ඉදින් දළ වූයේද දෙවදෑරුම් අව්‍යාකෘතයන්හි සියුම්ය. මෙසේ ජාති වශයෙන් දළ සියුම් බව දතයුත්තාහ.

ස්වභාව වශයෙන් දුක් වේදනාව, ආස්වාද රහිත හෙයින්, පැතිරීම් සහිත හෙයින්, කැළඹීම් කරණ හෙයින්, තැතිගන්නා ස්වභාව හෙයින්, මැඩපවත්වන හෙයින්ද අනෙක් ද්වයයෙහිලා දළය. අනෙක් ද්වයය මිහිරි හෙයින්ද, ශාන්ත හෙයින්ද ප්‍රණීත හෙයින්ද, ප්‍රිය හෙයින්ද, මධ්‍යස්ථ හෙයින් ද සුදුසු පරිදි දුක්වේදනාවෙන් සියුම්ය. සුව, දුක් ද්වය, පැතිරීම් සහිත හෙයින්ද තැතිගැනීම් ස්වභාවයෙන්ද, කැළඹීම් කරන හෙයින්ද, ප්‍රකට හෙයින්ද උපේක්ෂා වේදනාවෙන් දළය. එය කියන ලද්දට විපරීත වශයෙන් වන කල්හි ඒ ද්වයයෙන් සියුම්වන්නය. මෙසේ ස්වභාව වශයෙන් දළ සියුම් බව දතයුත්තාහ. පුද්ගල වශයෙන් සමවත් සම නොවන්නහුගේ වේදනාව නොයෙක් අරමුණුවල වික්ෂිප්ත ස්වභාවයෙන් සමවන්නහුගේ වේදනාවෙන් දළය. වෙනස් අයුරින් අනෙක් ඒවා සියුම්ය. මෙසේ පුද්ගල වශයෙන් දළ සියුම් බව දතයුත්තාහ.

ලෞකික ලෝකෝත්තර වශයෙන් ආශ්‍රව සහිත වේදනා ලෞකිකය. එය ආශ්‍රව උත්පත්ති හේතු වශයෙන්ද, කෙලෙස් සැඩපහරවලින් යුක්ත හෙයින්ද, කාමයෝගාදියෙන් යුක්ත හෙයින්ද, කෙලෙස් බැම්වලින් යුක්ත හෙයින්ද නිවන්මග අවුරන හෙයින්ද තෘෂ්ණා දෘෂ්ටි ආදියෙන් දැඩිව අල්ලාගන්නා හෙයින්ද, කෙලෙස් සහිත හෙයින්ද, පෘථග්ජන සාධාරණ හෙයින්ද, ආශ්‍රව සහිත හෙයින්ද දළය. ආශ්‍රවයන්ට විපර්යාසයෙන් ගත්කල අනාශ්‍රව සියුම්ය. මෙසේ ලෞකික ලෝකෝත්තර වශයෙන් දළ-සියුම් බව දතයුත්තාහ.

එහි ජාති ආදි වශයෙන් බිඳීම පවත්වාගත යුතුය. අකුසල විපාක කාය විඥඥාණ සම්ප්‍රයුක්ත වේදනාව ජාති වශයෙන් අව්‍යාකෘත හෙයින් සියුම් වූයේද, ස්වභාව ආදි වශයෙන් දළ වෙයි. එය වදාරන ලදී. අබ්‍යාකතා වෙදනා සුඛුමා, දුකඛා, වෙදනා ඔළාරිකා, සමාපනනසස වෙදනා සුඛුමා, අසමාපනනසස වෙදනා ඔළාරිකා, අනාසවා වෙදනා සුඛුමා සාසවා

වෙදනා ඔළාරිකා යනුවෙන් දුක්වේදනා යම් සේද, සුව ආදීහුද මෙසේය. ඒවාද ජාති වශයෙන් දළය. ස්වභාවාදී වශයෙන් සියුම් වෙයි. යම්සේ ජාති ආදී වශයෙන් භේදයක් නොවේද? එසේ වේදනාවන්ගේ දළ සියුම් බව දතයුත්තාහ. ඒ කෙසේද යත්? අව්‍යාකෘත ජාති වශයෙන් කුසල් අකුසල්හි සියුම්ය. එහි අව්‍යාකෘත කවරේද? දුක කුමක්ද? සුව කුමක්ද? සමවැදුනහුට යනු කුමක්ද? සම නොවැදුනහුට යනු කුමක්ද? ආශ්‍රව සහිත යනු කුමක්ද? ආශ්‍රව රහිත යනු කුමක්ද? මෙසේ ස්වභාව ආදී භේද ස්පර්ශ නොකළ යුතුය. හැමතැන එම ක්‍රමයයි. තවද, ඒ ඒ වේදනා ආකාරය දැඩිසේ ගෙන වේදනාවගේ දළ සියුම් බව දතයුත්තාහ යන වචනයෙන් අකුසල්හිද, ලෝභසහගතයන්හි, ද්වේෂ සහගත වේදනා ගින්නක් මෙන් ආශ්‍රිතයන් දවන හෙයින් සියුම්ය. ලෝභ සහගතයෝ සියුම්ය. නියත ද්වේෂ සහගත දළය. අනියත සියුම්ය. කල්පස්ථායි නියතයෝද දළය. අනෙක් ඒවා සියුම්ය. කල්පස්ථායින් අතරද අසංස්ඛාරික දළය. අනෙක් ඒවා සියුම්ය. ලෝභසහගතයන් අතර මිථ්‍යාදෘෂ්ටි හා සම්ප්‍රයුක්ත වූයේ දළය. අනෙක් ඒවා සියුම්ය. එහිද නියත කල්පස්ථායි අසංස්කාරික දළය. අනෙක්වා සියුම්ය. අවිසේසයෙන් බොහෝ විපාක ඇති අකුසල් දළය. අල්ප විපාක වූයේ සියුම්ය කුසල්හි අල්ප විපාක දළය. බොහෝ විපාක සියුම්ය. තවද, කාමාවචර කුසල් දළය. රූපාවචර සියුම්ය. අරූපාවචර එයින්ද, ලෝකෝත්තර එයින්ද සියුම්ය.

දානමය කාමාවචර දළය. සීලමය සියුම්ය. සීලමයද දළය. භාවනාමය එයින් සියුම්ය. භාවනාමය අතරින්ද ද්විහේතුක දළය. ත්‍රිහේතුක සියුම්ය. ත්‍රිහේතුකයන්හිද, සසංකාරික දළය. අසංස්කාරික සියුම්ය. රූපාවචර ප්‍රථමධ්‍යානික දළය. -පෙ- පංචමධ්‍යානික සියුම්ය. අරූපාවචරයන්හිද, ආකාසානඤ්චායතන සම්ප්‍රයුක්තවය දළය. -පෙ- නේවසඤ්ඤානාසඤ්ඤායතන සම්ප්‍රයුක්ත වූයේ සියුම්ය. ලෝකෝත්තරයන්හිද සෝවාන් මාර්ගය හා සම්ප්‍රයුක්ත වූයේ දළය. අර්හත්මාර්ගය හා සම්ප්‍රයුක්ත වූයේ සියුම්ය. ඒ ඒ භූමි, විපාක, ක්‍රියා, වේදනා, සුව, දුක් ආදියෙහිද සමවතට සමනොවන් ආදියෙහිද, ආශ්‍රව සහිතාදී වශයෙන්ද කියන ලද වේදනාවන්හිද ඒ ක්‍රමයමැයි. අවකාශ වශයෙන්ද නිරයෙහි දුක් දළය. තිරිසන් යෝනියෙහි සියුම්ය. -පෙ- පරනිර්මිත වසවර්තීන්හි සියුම්ය. දුක යම්සේද, මෙසේ සුවයද හැමතැන සුදුසු පරිදි යෙදිය යුත්තාහ. වස්තු වශයෙන්ද, හීන වස්තුක යම්කිසි වේදනාවක් වේද එය දළය. ප්‍රණීත වස්තුක වූයේ සියුම්ය. හීන ප්‍රණීත

භේදයෙහි යම් දළතාවක් වේද ඕ හීනය. යම් සියුම් භාවයක් වේද, ඒ ප්‍රණීතයයි දතයුත්තාහ. දූරසන්තික පදයන්හි අකුසල් වේදනා, කුසල අව්‍යාකෘත වේදනාවන්ගෙන් දූරය. අකුසල් වේදනා අකුසල් වේදනා සමීපයෙහි යැයි ආදී ක්‍රමයෙන් විභංගයෙහි බෙදා දැක්වූවාහ. අකුසල් වේදනා විසභාග වශයෙන්ද, මිශ්‍ර නොවීම් වශයෙන්ද, අසමානතාවයෙන්ද කුසල ව්‍යාකෘතයන්ගෙන් දූරය. කුසලාව්‍යාකෘතයන්ගේ අකුසල දූරය. සියලු වාරයන්හි ඒ ක්‍රමයමැයි. අකුසල් වේදනා සමානාකාර වශයෙන්ද, මිශ්‍රවීම් වශයෙන්ද, සමානතාවයෙන්ද අකුසලයන්ගේ සමීපයෙහිය. මේ වේදනාවගේ අතීතාදී භාවයෙහි විස්තර කථා මුඛයයි.

ඒ ඒ වේදනා සම්ප්‍රයුක්තයන්ගේ සංඥාදීන්හිද එපරිද්දෙන්ම දතයුතුය. මෙහි යම් ඒ වේදනාදීන්හි චක්ඛු -පෙ- ජරාමරණ පෙය්‍යාලයෙන් සංක්ෂිප්ත කරන ලද ධර්මයන්හි, ලෝකෝත්තර ධර්ම ආවාහුද? ඒවා සම්මර්ශනයට නොඑළඹී හෙයින් මෙම අධිකාරයෙහි නොගතයුත්තාහ. ඒවා වනාහි හුදෙක් ඒ ඒ පදයෙන් සංග්‍රහ කරන ලද, ධර්ම දර්ශන වශයෙන්ද අභිඤ්ඤෙය්‍ය නිර්දේශයෙහි ආ ක්‍රමයෙන්ද කියන ලද්දේය. ජාති ජරා මරණ වශයෙන් වෙන්ව සම්මර්ශන නොමැති කල්හිද ජාති ජරා මරණ වන්තයන් කෙරෙහිම සම්මර්ශනය කළ කල්හි ඒවාද සම්මර්ශනය කළාහු වෙත්යයි යන ආකාරයෙන් ඒවාහි සම්මර්ශනය යූ.සේයි.

'අතීතානාගත පච්චුප්පන්නං අනිච්චතො වවත්ථෙති' ආදී ක්‍රමයෙන් අතීතත්‍රිකයාගේ වශයෙන් සම්මර්ශනය කියන ලද හෙයින් අධ්‍යාත්මාදී භේද, ස්පර්ශ නොකොට, අතීත ත්‍රිකයාගේම වශයෙන් පිරිසිඳීම අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කළයුතුමය. යමක් අනිත්‍යයද, එය නියම වශයෙන්ම ප්‍රත්‍යයෙන් හටගත් ආදී භේද වේ. එහෙයින් එහි දැක්වීම සඳහා නොයෙක් ආකාරයන්ගෙන් මනසිකාර ප්‍රවෘත්තිය දැක්වීම සඳහා, රූපං අතීතානාගත පච්චප්පුන්නං අනිච්චං සංඛතං ආදිය වදාළහ. එය හටගෙන විනාශයට පත්වන අර්ථයෙන් අනිච්චං අනිත්‍යයි කළ කල්හි ආදි අන්තවත් භාවයෙන්ද අනිත්‍යයි. ප්‍රත්‍යයන් එකතුව කළ හෙයින් සංඛතංයි. ප්‍රත්‍යයන් හේතුකොට, ඇසිරිකොට සමව හා සමග උපන් හෙයින් පටිච්ච සමුප්පන්නංයි මෙයින් ප්‍රත්‍යයන්ගෙන් කරන ලදුයේ වී නමුත්, ප්‍රත්‍යයන්ගේ අනුත්සාහවත් භාවය දක්වයි. ඛයධම්මං ගෙවීයන ස්වභාව ඇති, ගෙවීයන ප්‍රකෘති ඇති. වයධම්මං යනු නැසෙනසුලු මෙය භිඟභාවයට පත්වීමෙන් වන ක්‍ෂය වීමක් නොවේ. හුදෙක් ඉවත්වයාම්

ස්වභාවයකි. බොහෝ ඇති කල්හි මඳභාවයට පත්වීමද ලෝකයෙහි ක්‍ෂය යැයි යෙති.

**විරාග ධම්මං** යනු මෙය කිසිසේත් ගමන් කිරීම් වශයෙන් වන නැසීමක් නොවේ. හුදෙක් ස්වභාව ඉක්මවන ස්වභාවයයි. නොඇල්ම නම් පිළිකුල් කිරීම හෝ ඉක්මවීම යයි යූ.සේයි. **නිරොධ ධම්මං** යනු මෙය පවත්නා ස්වභාව ඉක්මවීමෙන් ආපසු හැරී එන ස්වභාවයක් නොවේ. හුදෙක් පුනරාවර්තන නොවන නිරෝධයෙන් නිරුද්ධවන ස්වභාව යනුයි. පළමු පළමු පදයෙහි අර්ථ විවරණ වශයෙන් පසු පසු පද යූ.සේයි. නොහොත් එක් භවයකට ඇතුළත් වූ රූපයාගේ විනාශවීම් වශයෙන් ක්‍ෂය ධර්මයි. එක් නොකඩවා පැවතීම් වශයෙන් ඇතුළත් රූපයන්ගේ විනාශවීම් වශයෙන් නැසීම් ස්වභාවයයි. රූපයෙහි මොහොතක් පාසාවන විනාශවීම් වශයෙන් විරාගධර්මයි. ත්‍රයයෙහිම නැවත නැවත නොඉපැත්ම වශයෙන් නිරෝධ ධර්මයයි යෙදිය යුතුය. **ජරාමරණං අනිච්චං** යනාදීන්හි ජරාමරණ අනිත්‍ය නොවේ. අනිත්‍ය ස්වභාව ඇති ස්කන්ධයන්ගේ ජරාමරණ ස්වභාවය හෙයින් අනිත්‍ය නමැයි විය. ප්‍රත්‍යයෙන් හටගත් ආදීන්හිද එම ක්‍රමයමැයි. අන්තර් පෙය්‍යාලයෙහි ජාතියගේද, අනිත්‍යාදීතාවයන්හිඑම ක්‍රමයමැයි. ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණයැයි ආදීන්හි විදර්ශනා වශයෙන් යූ.සේයි. හුදෙක් ප්‍රතීත්‍ය සමුත්පාදයාගේ එක් එක් අංග වශයෙන් හකුළුවා විභාගකිරීම සම්මසන ඤාණ නමැයි පිළිවෙළින් යූ.සේයි. එය කලාප සම්මසන ඤාණය නොවේය. එය ධම්මට්ඨිති ඤාණයම වේ. **අසති ජාතියා** යනු වචනයේ ලිංග විපර්යාස කරන ලදී. නොමැති කල්හි ජාතියෙහි, **අසති සංඛාරෙසු** යනු වචන විපර්යාසය කරන ලදී. සංස්කාරයන් නොමැති කල්හියැයි යූ.සේයි. භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ. භවය නොමැති කල්හි උපත නැත. ආදී ක්‍රමයෙන් යෙදිය යුතුය.

සම්මර්ශන ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

දැන් අනතුරුව, කියන ලද, සම්මසන ඤාණයාගේ නොයෙක් ක්‍රමයෙන්, භාවනා ස්ථිර කිරීමෙහි පරතෙරට ගොස් සිටියහු විසින්, අනිත්‍යාදී වශයෙන් දුටු සංස්කාරයන්, උදයව්‍යය වශයෙන් පිරිසිඳ අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කිරීම සඳහා කියන ලද උදයව්‍යයානු පස්සනා ඤාණ නිර්දේශයෙහි ජාතං, රූපං යනාදීන්හි, නොකඩවා පැවතීම් වශයෙන්

තම තමා අයත් ප්‍රත්‍යයෙන් උපන් රූපය, **තස්ස** ඒ හටගත් රූපයෙහි, **නිබ්බත්ති ලක්ඛණං** යනු ජාතිය, ඉපැත්ම, අලුත් ආකාරය, **උදයොති** හටගැනීමයි. **විපරිණාම ලක්ඛණං** යනු, වෙනස්වීම් ලක්‍ෂණයයි. **ක්‍ෂයවීම**, බිඳීම වය නමැ. **අනුපස්සනා** යනු නැවත නැවත නුවණින් මෙනෙහි කිරීම උදයව්‍යයානුපස්සනා ඥාණයයි යන අර්ථයි. වේදනාදීන්හිද එම ක්‍රමයමැයි. ජාති, ජරා, මරණවත් අයටම, උදයව්‍යයාගේ පරිග්‍රහණය කළයුතු හෙයින් ජාති, ජරා, මරණයන්ගේ උදව්‍යය නොවන හෙයින්, ජාති, ජරා, මරණ ස්පර්ශ නොකොට, හටගත් ඇස හටගත් භවයයැයි පෙයාල කරන ලදී. හෙතෙම මෙසේ පංච ස්කන්ධයන්ගේ උදයව්‍යය දක්නේ මෙසේ දනියි. මේ ස්කන්ධයන්ගේ උපතින් පෙර නූපන්නා වූ රාශියක් හෝ රාශිභූත වීමක් නැත. උපදිනු ලබන්නේද, රාශි වශයෙන් හෝ රාශිභූත වීම් වශයෙන් පැමිණීමක් නම් නැත. නිරුද්ධ වනුයේද, දිසා අනුදිසා ගමන් කිරීමක් නම් නැත. නිරුද්ධ වූවන්ගේද, එක්තැනක, රාශි වශයෙන්, රාශිභූත වීම් වශයෙන් තැන්පත්වීම් වශයෙන් පැතිරයාමක් නම් නැත. යම්සේ වනාහි වීණාව වාදනය කරනු ලබන්නේ උපන් ශබ්දයාගේ හටගැනීමට පෙර තැන්පත්වීමක් නොමැත්තේද, උපදිනු ලබන්නේ තැන්පත්ව පැවතීමකින් නොපැමිණියේද, නිරුද්ධවනු ලබන්නේ දිසා අනුදිසා ගමනක් නොමැත්තේද? නිරුද්ධවූයේ කොතැනක හෝ එක්තැන් වීමක් නැත්ද? තවද, වීණාවද, උපවීණාවද, පුරුෂයාගේද, ඉන් හටගත් උත්සාහය නිසා, කලින් නොපැවත හටගනියි. හටගෙන ඉවත්වේ. මෙසේ සියලුම රූපී අරූපී ධර්ම කලින් නොපැවත හටගනිති. හටගෙන ඉවත්ව යෙතියි දකියි.

මෙසේ සංක්ෂේපයෙන් උදයව්‍යය දර්ශනය දක්වා දැන් විස්තර වශයෙන් දක්වන්ට, පංච ස්කන්ධයන්ගේ හටගැන්ම බලන්නේ කෙතෙක් ලක්‍ෂණ දකීද ආදී රාශි වශයෙන් ගණන විචාරා 'පංච ස්කන්ධයන්ගේ හටගැන්ම බලන්නේ, පස්විසි ලක්‍ෂණයන් දකී' යයි ආදී රාශි වශයෙන් ගණන විසඳ, නැවත රූපස්කන්ධයාගේ හටගැන්ම බලන්නේ කෙතෙක් ලක්‍ෂණ දකීද? ආදී විභාග වශයෙන් ගණන විචාරා 'රූපස්කන්ධයාගේ හටගැන්ම බලන්නේ පංච ලක්‍ෂණයන් දකීයයි' ආදී විභාගයෙන් ගණන විසඳ නැවත, රූපස්කන්ධයාගේ හටගැන්ම බලන්නේ කවර පංච ලක්‍ෂණයන් දකීදැයි ආදී ලක්‍ෂණ විභාග විචාරා විසඳුම් කරන ලදී. එහි, **අවිජ්ජා සමුදයා රූප සමුදයො** යනු පූර්වකර්ම භවයෙහි මෝහය අවිද්‍යාවයි, කියන ලද අයුරින්, අවිද්‍යාව ඇති කල්හි මෙම භවයෙහි

රූපයෙහි ඉපැත්ම වේයයි අර්ථයි. **පච්චය සමුදයට්ඨෙන** යනු ප්‍රත්‍යයාගේ හටගත් භාවයෙනැයි අර්ථයි. අවිද්‍යා, තෘෂ්ණා, කර්ම යන මේවා මෙහි ප්‍රතිසන්ධියට හේතුවූ අතීත ප්‍රත්‍යයෝය. මේ ත්‍රය ගත්කල්හි, සංස්කාර, උපාදාන ගන්නා ලද්දේම වෙයි.

**ආහාර සමුදයා** යනු, පැවැත්මට ප්‍රත්‍යය වන කබලිංකාරාහාරයාගේ බලවත් බැවින් එයම ගන්නා ලද්දේය. එය ගත් කල්හි, පැවැත්මට හේතුභූත වූ, ඍතු, චිත්තාදීහුද ගන්නා ලද්දෝම වෙති. **නිබ්බත්ති ලක්ඛණං** යනු කාල, නොකඩවා පැවැත්ම, ක්‍ෂණ වශයෙන් රූපයාගේ ඉපැත්ම, ඉපැත්මම ප්‍රත්‍යයෙන් හටගත් ලක්‍ෂණ බැවින් ලක්‍ෂණ යයි යූ.සේයි. **පඤ්ච ලක්ඛණානි** අවිද්‍යා, තෘෂ්ණා, කර්ම, ආහාර ඉපැත්ම යන මෙම පඤ්ච ලක්‍ෂණයෝය. අවිද්‍යාදීහු, රූපයාගේ හටගැන්ම ලකුණු කරත්. එයිනුයි ලක්ඛණානියි. හටගැන්ම වනාහි සංඛත ලක්‍ෂණමය. එයද ප්‍රත්‍යයෙන් හටගත්තේ යයි සලකුණු කෙරේනුයේ එයිනුයි > ලක්‍ෂණ නමැ. **අවිජ්ජානිරොධා රූප නිරොධො** අනාගත භවයට ප්‍රත්‍යය වූ, මේ භවයෙහි අවිද්‍යාව, අර්හත් මාර්ග ඤාණයෙන් නිරුද්ධ කළ කල්හි ප්‍රත්‍යයන්හි අභාවයෙන් අනාගත රූපයාගේ නොඉපැත්ම වේ. නිරුද්ධ වේයයි අර්ථයි. **පච්චය නිරොධට්ඨෙන** යනු ප්‍රත්‍යයාගේ නිරුද්ධභාවයෙනැයි අර්ථයි. මෙහි නිරෝධය වනාහි, අනාගත ප්‍රතිසන්ධීන්ට ප්‍රත්‍යය වූ, මෙහි අවිද්‍යා, තෘෂ්ණා, කර්මයන්ගේම නිරෝධයයි. **ආහාර නිරොධා රූපනිරොධො** යනු පැවැත්මට හේතුවූ කබලිකාරාහාරයාගේ අභාවයෙන් ඉන් හටගන්නා රූපයන්ගේ අභාවය වේ. **විපරිණාම ලක්ඛණං** යනු කාල, නොකඩවා පැවැත්ම ක්‍ෂණ වශයෙන් රූපයාගේ භංගයයි. භංගයම ප්‍රත්‍යයෙන් හටගත් ලක්‍ෂණ ඇති හෙයින් ලක්ඛණයැයි යූ.සේයි. **පඤ්ච ලක්ඛණානීති** අවිද්‍යා, තෘෂ්ණා, කර්ම, ආහාරයන්ගේ අභාව නිරෝධයෙන් සතරෙක්ද, එක් විපරිණාමයෙක්දැයි පඤ්චකයකි. වේදනා ස්කන්ධාදීන්හිද එම ක්‍රමයමැයි. මේ විශේෂයයි. අරූප ස්කන්ධයන්ට උදය-ව්‍යය දර්ශනය, කාල නොකඩවා පැවැත්ම වශයෙනි. ක්‍ෂණ වශයෙන් නොවේ. ස්පර්ශය, වේදනා, සංඥා, සංස්කාර ස්කන්ධයන්ට ප්‍රවෘත්ති ප්‍රත්‍යය වේ. එය නිරෝධයෙන් ඒවාහි නිරෝධය වේ. නාමරූප විඤ්ඤාණස්කන්ධයට ප්‍රවෘත්ති වශයෙන් ප්‍රත්‍යය වේ. එය නිරෝධයෙන් එහි නිරෝධය වේ. සමහරු කීහු. සිව්ආකාර ප්‍රත්‍යය වශයෙන් උදයව්‍යය දර්ශනයෙහි අතීතාදී බෙදීම් අනාමර්ශනය නොකොටම සියල්ලට සමාන වශයෙන් අවිද්‍යාදීන්ගෙන් උදාවේයයි උපත්නා බව පමණක් ගනියි. ඉපැත්ම නොගනියි. අවිද්‍යා නිරෝධයෙන් නිරුද්ධ වේයයි

නූපදින භාවය පමණක් ගනියි. භංගය නොවේ. ක්‍ෂණ වශයෙන් උදයව්‍යය දර්ශනයෙහි වර්තමාන ඉපැත්ම හා විනාශය ගනී.

විදර්ශනා වඩන, විදර්ශකයා විසින් පළමුව ප්‍රත්‍යය වශයෙන් උදයව්‍යය මෙනෙහිකොට, විදර්ශනා කාලයෙහි අවිද්‍යාදී සිව් ධර්මයන් විසඳ, උදයව්‍යය වත් වූයේම, ස්කන්ධයන් ගෙන, ඒවාහි උදයව්‍යය බලයි. මෙසේද ඒ විදර්ශකයාට, මෙසේ රූපාදීන්ගේ උදය මෙසේය. ව්‍යය මෙසේය. මෙසේ රූපාදීහු හටගනිත්. මෙසේ විනාශවෙතියි, ප්‍රත්‍යය වශයෙන්ද, ලක්‍ෂණ වශයෙන්ද විස්තර වශයෙන් උදයව්‍යය දක්නේ, මේ ධර්ම කලින් නොමැති වූයේ හටගති, හටගෙන විනාශ වෙතියි ඤාණය ඉතා ප්‍රකටතර වෙයි. සත්‍යය ප්‍රතීත්‍ය සමුත්පාද ක්‍රම ලක්‍ෂණ භේද ප්‍රකට වෙති. යම්සේ වනාහි හෙතෙම අවිද්‍යාදීන්ගේ හටගැනීමෙන්, ස්කන්ධයන්ගේ හටගැනීම, අවිද්‍යාදීන්ගේ නිරෝධයෙන් ස්කන්ධයන්ගේ නිරෝධය දකියි. මේ ඔහුගේ ප්‍රත්‍යය වශයෙන් උදයව්‍යය දර්ශනයයි. යම් ඒ උපත් ලක්‍ෂණ, වෙනස්වීම් ලක්‍ෂණ නුවණින් දක්නේ ස්කන්ධයන්ගේ හටගැනීම් විනාශ දකියි. මේ ඔහුගේ ක්‍ෂණ වශයෙන් උදයව්‍යය දර්ශනයයි. හටගන්නා ක්‍ෂණයෙහිම උපත් ලක්‍ෂණයද, භංගක්‍ෂණයෙහිම වෙනස්වීම් ලක්‍ෂණයද වේ. මෙසේ මොහුට ප්‍රත්‍යය වශයෙන්ද, ක්‍ෂණ වශයෙන්ද, දෙයාකාරයකින් උදයව්‍යය බලන්නහුට, ප්‍රත්‍යය වශයෙන් හටගැනීම් දර්ශනයෙන් සමුදය ප්‍රකට වේ. හටගැනීම් අවබෝධ වන හෙයිනි. ක්‍ෂණ වශයෙන් උදය දර්ශනයෙන් දුක්ඛ සත්‍යය ප්‍රකට වේ. ජාති දුක අවබෝධ වන හෙයිනි. ප්‍රත්‍යය වශයෙන් විනාශය දර්ශනයෙන් නිරෝධ සත්‍යය ප්‍රකට වේ. ප්‍රත්‍යය නොඉපදීමෙන්, ප්‍රත්‍යයවත් භාවයාගේ නොඉපදීම අවබෝධවන හෙයිනි. ක්‍ෂය වශයෙන් විනාශ දර්ශනයෙන් දුක්ඛ සත්‍යයම ප්‍රකට වේ. මරණ දුක අවබෝධ වන හෙයිනි. ඔහුට යම් උදයව්‍යය දර්ශනයක් වේද, මේ මාර්ගය ලෞකිකයැයි, එහිදී මුලාව විනාශවන හෙයින්, මාර්ග සත්‍යයි ප්‍රකට වේ. ප්‍රත්‍යය වශයෙන් මොහුට උදය දර්ශනයෙන් මෙය ඇති කල්හි මෙය වේයයි අවබෝධ වන හෙයින් අනුලෝම් ප්‍රතීත්‍ය සමුත්පාදය ප්‍රකට වේ. ප්‍රත්‍යය වශයෙන් විනාශය දර්ශනයෙන් මෙය නිරෝධයෙන් මෙය නිරුද්ධ වේයයි අවබෝධ වන හෙයින් ප්‍රතිලෝම ප්‍රතීත්‍ය සමුත්පාදය ප්‍රකට වේ. ක්‍ෂණ වශයෙන් වනාහි උදයව්‍යය දර්ශනයෙන් ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්ම ප්‍රකට වේ. ප්‍රත්‍යයෙන් හටගත් ලක්‍ෂණ අවබෝධ වන හෙයිනි. ප්‍රත්‍යයෙන් හටගත්තාහුම, උදයව්‍යයවත් වූයේ ප්‍රතීත්‍ය සමුත්පන්න වෙතියි, ප්‍රත්‍යය වශයෙන් මොහුට

උදය දර්ශනයෙන් ඒකත්වය ප්‍රකටවෙයි. හේතුඵල සම්බන්ධතාව මත සන්තානයාගේ නොසිඳීම අවබෝධ වන හෙයිනි. එකල්හි ඉතාමත් යහපත් අන්දමින් උච්ඡේද දෘෂ්ටිය දුරුකරයි. අලුත් අලුත් රූපයන්ගේ ඉපැත්ම අවබෝධ වන හෙයින්, ක්‍ෂණ වශයෙන් උදය දර්ශනයෙන් නානත්වය ප්‍රකට වෙයි. එකල්හි ඉතාමත් යහපත් අයුරින් ශාශ්වත දෘෂ්ටිය දුරුකරයි. රූපාදී ධර්මයන්ගේ තම වසඟයෙහි නොපවත්නා බව අවබෝධ වන හෙයින්, ප්‍රත්‍යය වශයෙන් මොහුට උදයව්‍යය දර්ශනයෙන් අව්‍යාපාරනය ප්‍රකට වෙයි. එකල්හි ඉතාමත් යහපත් අයුරින් ආත්ම දෘෂ්ටිය දුරුකරයි. ප්‍රත්‍යයානුරූපව ඵලයාගේ ඉපැත්ම අවබෝධ වන හෙයින් ප්‍රත්‍යයෙන් වන උදය දර්ශනයෙන් එවං ධර්මතා නය ප්‍රකට වෙයි. එකල්හි මනාව අක්‍රිය දෘෂ්ටිය දුරුකරයි. ධර්මයන්ගේ, අජීවතාවය, ප්‍රත්‍යය පිළිබඳ පැවැත්ම අවබෝධ වන හෙයින් මොහුට ප්‍රත්‍යය වශයෙන් උදය දර්ශනයෙන් අනාත්ම ලක්‍ෂණය ප්‍රකට වෙයි. හටගෙන පසුව වන අභාවය අවබෝධ වන හෙයින්ද පූර්වාන්ත අපරාන්ත නුවණින් විමසා අවබෝධ වන හෙයින්ද ක්‍ෂණ වශයෙන් උදයව්‍යය දර්ශනයෙන් අනිත්‍ය ලක්‍ෂණය ප්‍රකට වෙයි. උදයව්‍යයන්ගේ පෙළීම අවබෝධ වන හෙයින් දුක්ඛ ලක්‍ෂණයද ප්‍රකට වෙයි. උදයව්‍යය පිරිසිඳීම අවබෝධ වන හෙයින් ස්වභාව ලක්‍ෂණයද ප්‍රකට වෙයි. උදයක්‍ෂණයෙහි ව්‍යයාගේද, ව්‍යයක්‍ෂණයෙහි උදයයාගේද අභාවය අවබෝධ වන හෙයින් සංඛත ලක්‍ෂණයාගේ ස්වභාව ලක්‍ෂණයෙහි තාවකාලිකත්වයද ප්‍රකට වෙයි. මෙසේ ඔහුට ප්‍රකට වූ, සත්‍යය ප්‍රතීත්‍ය සමුත්පාද නය ලක්‍ෂණ භේදයාගේ මෙනම් වූ, මෙම ධර්ම පෙර නූපන් විරූ වූයේ, උපදී. උපන්නාහු නිරුද්ධ වෙතියි, නිත්‍ය නවතාවයෙන්ම වී සංස්කාර වැටහේ. හුදෙක් නිත්‍ය නව්‍යතා වූවාහුම නොවෙති. සූර්යෝද්ගමනයෙහිදී පිණිබිඳුවක් මෙන්ද, දිය බුබුළක් මෙන්ද, දියෙහි කෝටුවකින් ඇඳි ඉරක් මෙන්ද, ඉඳිකටු තුඩෙහි අබ ඇටයක් මෙන්ද, විද්‍යුත්පාදයක් මෙන්ද, ස්වල්පස්ථායී ලෙස වැටහේ. මායාවක් මෙන්ද, මිරිඟුවක් මෙන්ද, සිහිනයක් මෙන්ද ගිනි වළල්ලක් මෙන්ද, ගාන්ධර්ව නගරයක් මෙන්ද, පෙණපිඩක් මෙන්ද කෙසෙල්කඳක් ආදිය මෙන්ද, අසාරය, නිස්සාරය යයි කියා වැටහේ.

මෙතෙකින් ඉන් ව්‍යය ධර්මයම උපදියි. උපන්නේද ව්‍යයට එළඹේ යයි මේ ආකාරයෙන් සමපණස් ලක්‍ෂණයන් අවබෝධකොට සිටියේ උදයව්‍යයානුපස්සනා නමැ. ප්‍රථම තරුණ විදර්ශනා ඤාණය අවබෝධ කළේ වේ. යමකගේ අධිගමයෙන් ආරබ්ධ විදර්ශකයෙකැයි යන සංඛ්‍යාවට

යේද? එබඳු තත්වයට පත්වූයේ වේ. මෙම ඤාණයෙහි සිටියහුට ආලෝක ආදී දස විදර්ශනා උපක්ලේශයෝ උපදිති. යම් උපක්ලේශයන්ගේ ඉපැත්මෙන් අදක්‍ෂ යෝගාවචරයා ඒවාහි මාර්ගඥාන සංඥාව ඇතිවී නොමගම මාර්ගයයි ගනියි. උපක්ලේශ අවුලෙන් අවුලට පත්වූයේ වෙයි. දක්ෂ යෝගාවචරයා ඒවාහි විදර්ශනාව එළවනුයේ, උපක්ලේශ අවුල නිරවුල්කොට, ඒ ධර්මයෝ මාර්ගය නොවෙත්.ය. උපක්ලේශයන්ගෙන් මිදුණා වූ, වීථි පිළිපන් විදර්ශනා ඤාණය මාර්ගයැයි මාර්ගයද අමාර්ගයද දැන සිටි ඤාණය මාර්ගාමාර්ග ඤාණ දර්ශන විසුද්ධිය නමැ. මෙතෙකින් ඔහු විසින් චතුරාර්ය සත්‍යය වෙන්කරන ලද්දේ වෙයි. කෙසේද? නාමරූප පිළිබඳ විමසීම ඇතිකල්හි, ප්‍රත්‍යය විමසීම හටගන්නා හෙයිනි. ධර්මස්ථිති ඤාණ වචනයෙන්ම කියන ලද, දෘෂ්ටි විසුද්ධි සංඛ්‍යාත නාමරූප ව්‍යවස්ථානයෙන් දුක්ඛ සත්‍යයාගේ ව්‍යවස්ථානය කරන ලද්දේ වේ. කංඛාවිතරණ විසුද්ධි සංඛ්‍යාත ප්‍රත්‍යය පරිග්‍රහණයෙන් සමුදය සත්‍යයාගේ ව්‍යවස්ථානයද උදයව්‍යයානුපස්සනාවෙන්, ක්‍ෂණ වශයෙන් උදයව්‍යය දර්ශනයෙන් දුක්ඛ සත්‍යයාගේ ව්‍යවස්ථානය කරන ලදී. ප්‍රත්‍යය වශයෙන් උදය දර්ශනයෙන් සමුදය සත්‍යයාගේ ව්‍යවස්ථානය කරන ලද්දේ වේ.

උදයව්‍යය ඥාන නිර්දේශ වර්ණනාව නිමි.

උදයව්‍යයානුපස්සනාවෙහි සිටි ඒ යෝගාවචර තෙමේ, මාර්ගාමාර්ගව්‍යවස්ථාපනයෙන් කෙලෙසුන්ගෙන් මුක්ත, වීථි පිළිපන්, උදයව්‍යයානුපස්සනා ඤාණය මාර්ගයයි දැන, තිලකුණු සලකා බැලීමෙන් එම මාර්ගයාගේම මනාව පැහැදිලි කිරීම සඳහා නැවත උදයව්‍යයානුපස්සනාව අරඹා, උදයව්‍යයෙන් පිරිසිඳ දත් සංස්කාරයන් අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරයි. මෙසේ ඔහුට ඒ ඤාණය තීක්‍ෂණව උසුලයි. සංස්කාර සැහැල්ලුව වැටහෙයි. ඤාණය තීක්‍ෂණව උසුලන කල්හි සංස්කාරයන් සැහැල්ලුව වැටහෙන කල්හි, උත්පාදය ඉක්මවා භංගයෙහිම සිහිය පිහිටයි. නිවනෙහි තදින් ඇලුණු බැවින් උදය අත්හැර භංගයෙහිම සිහිය ගෙනැවිත් තබයි. මෙතැන්හි භංගානුපස්සනා ඤාණය උපදියි. දැන් ඒ ඤාණ නිර්දේශයෙහි, **රූපාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති** යනු රූපාරම්මණ සිත ඉපිද බිඳෙයි. නොහොත්, රූපාරම්මණ භාවයෙහි

සිත ඉපිද බිඳේයයි අර්ථයි. **තං ආරම්මණං පටිසංඛා** යනු ඒ රූපාරම්මණය නුවණින් දැන, ක්‍ෂය ව්‍යය වශයෙන් දැක යන අර්ථයි. **තස්ස චිත්තං භංගං අනුපස්සති** යනු යම් සිතකින් ඒ රූපාරම්මණය ක්‍ෂය, ව්‍යය වශයෙන් දුටු ඒ සිතෙහි භංගය අනෙක් සිතකින් නුවණින් දකී යන අර්ථයි. එහෙයින් පෞරාණිකයෝ කීහුː- 'දත් දෑද, ඤාණයද යන ද්වයය නුවණින් බලයි.

**චිත්තං** යනු මෙහි ඤාණ සම්ප්‍රයුක්ත සිත අදහස් කරන ලදී. **අනුපස්සති** යනු නැවත නැවත බලයි. නොයෙක් ආකාරයන්ගෙන් නැවත නැවත බලයි යන අර්ථයි. එහෙයින් කීහුː අනුපස්සති යනු කෙසේ අනුපස්සනා කෙරේද? අනිත්‍ය වශයෙන් අනුව බලයි. භංගය නම් අනිත්‍යතාවගේ අන්තිම කෙළවරයි. එහෙයින් ඒ භංගානුපස්සනා යෝගාවචර තෙමේ රූපයන්ට ඇතුළත් සියල්ල අනිත්‍ය වශයෙන් නැවත නැවත බලයි. නිත්‍ය වශයෙන් නොබලයි. ඉක්බිති අනිත්‍යයාගේ දුක්ඛතාව බැවින්ද, දුක්ඛයාගේ අනාත්මතාව බැවින්ද, එයම දුක් වශයෙන් නැවත නැවත බලයි. සුව වශයෙන් නොබලයි. අනාත්ම වශයෙන් නැවත නැවත බලයි. ආත්ම වශයෙන් නොබලයි. යමක් අනිත්‍යද දුකද අනාත්මද එයට සතුටු නොවිය යුතුය. යමක් සතුටු නොවිය යුතුද? එහි නොඇලිය යුතුය. එහෙයින් ඒ භංගානුපස්සනා අනුසාරයෙන් අනිත්‍යය, දුකඛය, අනාත්මයැයි රූපයන්ට අයත් දෑ කෙරෙහි කළකිරේ. සතුටු නොවේ. නොඇලේ. ඇල්ම නොකරයි. හෙතෙම මෙසේ නොඇලෙන්නේ, පළමුව ලෞකික ඤාණයෙන්ම ඇල්ම නිරුද්ධ කරයි. හට නොගන්වයි. හටගැනීම නොකරයි යන අර්ථයි.

හෙතෙම මෙසේ නොඇලුණේ රූපයන්ට අයත් දෑ, දුටු පරිදි, එසේම නොදිටියෙහිද, ඤාණ පිළිවෙළ අනුව නිරුද්ධ කරයි. හට නොගන්වයි. නිරෝධ වශයෙන්ම මෙනෙහි කරයි. එහි නිරෝධයම දකියි. හටගැනීම නොවේ යන අර්ථයි. හෙතෙම මෙසේ පිළිපන්නේ අත්හරියි. නොගනියි. කුමක් කියන ලද්දේද යත්? මේ තෙමේ අනිත්‍යාදී අනුපස්සනාවෙන් ස්කන්ධ, අභිසංඛාරයන් සහිත, කෙලෙසුන්, තදංග වශයෙන් අත්හැර දමන හෙයින්, ප්‍රත්‍යයෙන් හටගත් දැහි, දොස් දර්ශනයෙන්ද, ඊට විපරීත නිර්වාණයෙහි, ඊට නිම්නතාවයෙන් පරිත්‍යාග වශයෙන් අත්හැරීම යයිද, ඇතුළට වැදීම් වශයෙන් අත්හැරීම යයිද යූ.සේයි. එහෙයින් එයින් යුක්ත භික්‍ෂුව කියන ලද ක්‍රමයෙන් කෙලෙසුන්ද අත්හැර දමයි. නිර්වාණයෙහිද ඇතුළට වදියි. ඉපදීම් වශයෙන් කෙලෙස්

නොගනියි. දොස් රහිත බව දැක්වීම් වශයෙන් සංඛතාරම්මණද නොවේ. එහෙයින් අත්හරියි. නොගනියි යයි යුසේයි.

දැන් ඔහුට එම ඤාණයන්ගෙන්, යම් ධර්මයන්ගේ ප්‍රහාණය වේද, එය දක්වන්ට 'අනිච්චතො අනුපස්සනෙතා නිච්ච සඤ්ඤං පජහති, ආදිය වදාරන ලදී. එහි නන්දි යනු ප්‍රීතිසහගත තෘෂ්ණාවයි. රාගං යනු සෙසු තෘෂ්ණාවයි. සමුදයං යනු රාගයෙහි ඉපැත්මයි. නොහොත් රූපගතයාගේ පහළවීමයි. ආදානං යනු ඉපදීම් වශයෙන් කෙලෙසුන්ගේ අල්ලා ගැනීමයි.

වෙදනාරම්මණතා ආදිය මෙහිද, යටද කියන ලද ක්‍රමයෙන්ම දතයුත්තාහ. ගාථාවන්හි වනාහි වත්ථු සංකමනා යනු රූපාදී එකිනෙකෙහි භංගය දැක, නැවත යම් සිතකින් භංගය දිටීද එම චිත්තයාගේද, භංගය දැකීම් වශයෙන් පූර්ව වස්තුවෙන් අන්‍ය වස්තුවකට සංක්‍රමණයයි.

පඤ්ඤායච විවට්ටනා යනු උදය හැර ව්‍යයයෙහි පිහිටා සිටීමයි. ආවජ්ජනා බලඤ්චෙව යනු රූපාදී එකිනෙකෙහි භංගය දැක, නැවත භංගය අරමුණු චිත්තයාගේ භංගය දර්ශනය සඳහා අනතුරුවම ආවර්ජන සමර්ථතාවයි. පටිසංඛාවිපස්සනා යනු ඒ අරමුණු තොමෝ භංගය නුවණින් සලකා බලන අනුපස්සනා නම් වන්නීය. ආරම්මණ අන්වයෙන උභො එක වවත්ථානා යනු ප්‍රත්‍යක්ෂ වශයෙන් දුටු අරමුණෙහි පිළිවෙළ අනුගමනයෙන්, මෙය යම්සේද, අතීතයෙහිද සංස්කාරයන්ට අයත් දෑ බිඳී ගියේය. අනාගතයෙහිද බිඳී යන්නේය. මෙසේ ද්වයයම එක් ස්වභාවයෙන්ම ව්‍යවස්ථාපනය කෙරේයයි අර්ථයි.

පෞරාණිකයන් විසින් කියන ලද්දාහුමය.

**සංවිජ්ජමානම්හි විසුද්ධ දස්සනො**
**තදන්වයං නෙති අතීත නාගතෙ**
**සබ්බෙපි සංඛාර ගතාපලොකිනො**
**උස්සාව බින්දු සූරියෙව උග්ගතෙ'ති**

සුපිරිසිදු දැක්මක් විද්‍යමාන කල්හි, අතීත අනාගත සංස්කාරයන් ඒ අනුව ගෙනයයි. හිරු උදාවූ කල්හි පිණිබිඳ මෙන්, සංස්කාරයන්ට ඇතුළත් වූ සියල්ලම විනාශයට පත්වන සුලුය.

**නිරොධෙ අධිමුත්තතා** යනු මේ ද්වයයෙහි භංග වශයෙන් ඒකත්වයෙන් පිරිසිඳ දැන, එම භංග සංඛ්‍යාත නිරෝධයෙහිම ඇලුණු බව, එය ගරුකොට සැලකීම, එහි නැඹුරු බව, එහි ප්‍රවණතාවය, එහි නම්‍රතාවය යන අර්ථයි. **වය ලක්ඛණ විපස්සනා** යනු එම ව්‍යය ලක්‍ෂණ විදර්ශනා නමැයි යු.සේයි. **ආරම්මණඤ්ච පටිසංඛා** යනු පළමු රූපාදි අරමුණ දැන **භංගඤ්ච අනුපස්සති** යනු ඒ අරමුණෙහි භංගය දැක එයට අරමුණු වූ චිත්තයාගේ භංගය නැවත නැවත බලයි. **සුඤ්ඤතොච උපට්ඨානං** මෙසේ භංගයන් නැවත නැවත බලන්නා වූ ඔහුට සංස්කාරයෝම බිඳෙති. ඒවාහි භේදය මරණයයි. අන් කිසිවෙක් නොමැත්තේ යයි ශූන්‍යතා වශයෙන්ම වැටහීම සිදුවෙයි. එහෙයින් පෞරාණිකයෝ කීහු.

**ඛන්ධා නිරුජ්ඣන්ති නචත්ථි අඤ්ඤො**
**ඛන්ධානං භෙදො මරණන්ති වුච්චති**
**තෙසං ඛයං පස්සති අප්පමත්තො**
**මණිංව විජ්ඣං වජිරෙන යොනිසොති**

ස්කන්ධයෝ නිරුද්ධ වෙති. අන් කිසිවක් නැත. ස්කන්ධයන්ගේ භේදය මරණය යැයි කියනු ලැබේ. අප්‍රමාදී පුද්ගලයා, ඒවාහි ක්‍ෂයය, දියමන්තියෙන් මැණිකක් විදින්නාක් මෙන් නුවණින් දකියි.

**අධිපඤ්ඤා විපස්සනා** යනු යම් අරමුණු නුවණින් සැලකීමක් වේද? යම් භංගය අනුව බැලීමක් වේද? යම් ශූන්‍යතා වශයෙන් වැටහීමක් වේද? මෙය අධිප්‍රඥා විදර්ශනාවයැයි යු.සේයි. **කුසලො තීසු අනුපස්සනාසු** යනු අනිත්‍යානුපස්සනාදි ත්‍රයයෙහි දක්‍ෂ භික්‍ෂුව. **චතස්සොච විපස්සනාසු** යනු නිබ්බිදාදී සිව් විදර්ශනාවන්හි. **තයො උපට්ඨානෙ කුසලතා** යනු ක්‍ෂය, ව්‍යය, ශූන්‍යය යන මේ ත්‍රිවිධ වැටහීම්හි දක්‍ෂතායෙන්, **නානාදිට්ඨීසු නකම්පති** යනු ශාශ්වත දෘෂ්ටි ආදී නානාප්‍රකාර දෘෂ්ටීන්හි කම්පා නොවේ. හෙතෙම මෙසේ කම්පා නොවන්නේ නිරුද්ධ නොවූයේම නිරුද්ධ වූයේ යයිද, නොබිඳුණේම බිඳේයයි, පැවති මනසිකාරය, දුර්වල බඳුනක් බිඳෙන්නාක් මෙන්ද, විසුරුවනු ලබන සියුම් දූහුවිල්ලක් මෙන්ද, තලඇට බෙදනු ලබන්නාක් මෙන්ද, සියලු සංස්කාරයන්ගේ ඉපැත්මෙහි හා ස්ථිතියෙහි පැවති නිමිති අත්හැර බිඳීමම දකියි. හෙතෙම යම්සේ පාම් ඇස් ඇති පුරුෂයෙක්, පොකුණුතෙරක හෝ නදීතෙරක සිටියේ විශාල

බින්දු ඇති වැස්ස වසින කල්හි, දිය මතුයෙහි මහත් මහත් දිය බුබුළු ඉපිද ඉපිද වහ වහා බිඳෙනු ලබන්නේ දකින්නේද? එපරිද්දෙන්ම සියලු සංස්කාර බිඳෙතියි දකියි. මෙබඳු වූ යෝගාවචරයා සඳහා භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදහ.

**යථා බුබ්බුලකං පස්සෙ - යථා පස්සෙ මරීචිකං**
**එවං ලොකං අවෙක්ඛන්තං - මච්චුරාජා න පස්සති**

යම්සේ දියබුබුළක් දක්නේද? යම්සේ මිරිඟුවක් දක්නේද, මෙසේ ලොව දක්නේ, මෘත්‍යුරාජයා නොදකී. මෙසේ ඔහුට සියලු සංස්කාර බිඳෙති, බිඳෙතියි නිතර දක්නා කල්හි, අෂ්ටානිසංස පිරිවරකොට ඇති, භංගානුපස්සනා ඥාණය බලප්‍රාප්ත වේ. එහි මේ අට අනුසස්හුය. භව දෘෂ්ටි ප්‍රහාණය ජීවිත ආශාව අත්හැරීම, හැමකල්හි යහපත් ක්‍රියාවන්හි යෙදී, මනාව යෙදී සිටීම, පිරිසිදු දිවිපැවැත්ම, භවයන්හි උද්‍යොග ප්‍රහාණය පහවූ බය ඇතිවීම, ඉවසීම හා සුවච බව ලැබීම, නොඇල්ම හා ඇල්ම ඉවසන බව යනාදියයි.

**ඉමානි අට්ඨගුණෙ මුත්තමානි**
**දිස්වා තහිං සම්මසතී පුනප්පුනං**
**ආදිත්ත චෙලස්සිරසූපමො මුනී**
**භංගානුපස්සී අමතස්ස පත්තියා'ති**

මේ උතුම් අටගුණ දැක, එහි නැවත නැවතත් සම්මර්ශනය කරයි. ඇඳිවත, සිරස ගිනිගත්තහු මෙන් උපමිත භික්ෂුව නිවනට පැමිණීම සඳහා භංගය අනුව බලයි.

**භංගානුපස්සනා ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.**

ආදීනව ඥාණ නිර්දේශයෙහි **උප්පාදො** යනු පූර්ව කර්ම ප්‍රත්‍යයෙන් මෙලොව ඉපැත්මයි. **පවත්තං** යනු උපන්නහුගේ සුදුසු පරිදි පැවැත්මයි. **නිමිත්තං** යනු සියලු සංස්කාර නිමිතියි. **ආයූහනා** යනු මත්තෙහි ප්‍රතිසන්ධියට හේතුභූත වූ කර්මයයි. **පටිසන්ධි** යනු මතු උපතයි. **ගති** යනු

යම් ස්වභාවයකින් ඒ ප්‍රතිසන්ධි තොමෝ වන්නීද? **නිබ්බත්ති** යනු ස්කන්ධයන්ගේ හටගැන්මයි. **උපපත්ති** යනු සමවන්නහුගේ හෝ පැමිණියහුගේයයි මෙසේ කියන ලද විපාක ප්‍රවෘත්තිය වන්නීය. **ජාති** යනු ජරාදීන්ට ප්‍රත්‍යය වූම භව ප්‍රත්‍යයෙන් වූ ජාතියයි. අවිශේෂයෙන් ගත් කල ඒ ඒ තන්හි උපදින සත්ත්වයින්ගේ යම් යම් ස්කන්ධ පහළ වේද? ඒවාහි ප්‍රථම පහළවීම ජාතියි. **ජරා** යනු කැඩුණු බවයයි පිළිගත් එක් භවයකට අයත් ස්කන්ධ පරම්පරාවේ පැවැත්මෙහි වන පැරණි බවයි. **සොකො** යනු ඤාති ව්‍යසනාදීන්ගෙන් පෙලුණහුගේ වන සිත් තැවීමයි. **පරිදෙවො** යනු ඤාති ව්‍යසනාදීන්ගෙන් පෙලුණහුගේ වාග් ප්‍රලාපයි. **උපායාසො** යනු විශාල කරදරය. ඤාති ව්‍යසනාදීන්ගෙන් පෙලුණහුගේ සිතේ දුකින් අතිශයින් වර්ධනය වූ, අධිමාත්‍ර ද්වේෂයමය. මෙහි උත්පාදාදී පංචකයම ආදීනව ඤාණයට වස්තු වශයෙන් කියන ලද්දීය. සෙස්ස ඒවාට සමාන වචන ලෙසිනි. **නිබ්බත්ති ජාති** යන මේ ද්වයය ඉපැත්මට ප්‍රතිසන්ධියට යෙදෙන සමාන වචනයි. ගති **උපපත්ති** යන මෙම ද්වයය පැවැත්මට, ජරාදීන්ට හේතුවන්නේය. එහෙයින් වදාළහ.

> **උප්පාදඤ්ච පවත්තඤ්ච - නිමිත්තං දුක්ඛන්ති පස්සති**
> **ආයූහනං පටිසන්ධිං - ඤාණං ආදීනවෙ ඉද'න්ති ච**

ඉපැත්මද, පැවැත්මද යන කරුණු දුකයයි දකියි. රැස්කිරීම, ප්‍රතිසන්ධිය යන මෙය ආදීනව ඤාණයයි.

ආදීනවයෙහි ඤාණය ස්ථාන පහකදී හටගනී. සියලු පදයන්හි **භයන්ති** මෙම වචනයෙහි භයං+ඉති යනුවෙන් පදචෙඡ්දයි - **භයං** යනු පීඩා යෝගයෙන් භය සහිත බැවින් භයයි. ඉති යනු භය හටගන්නා කරුණු දැක්වීමයි. **අනුප්පාදො ඛෙමන්ති සන්තිපදෙ ඤාණං** යන ආදිය වනාහි ආදීනව ඤාණයට විරුද්ධ ඤාණ දැක්වීම සඳහා කියන ලදී. භය වශයෙන් වැටහීමෙන් හෝ ආදීනව දැක තැතිගත් හෘදය ඇත්තවුන්ට, නිර්භය, ක්ෂෙම ආදීනව රහිත තත්වයන්ද තිබේයයි. ආශ්වාස ඇතිකරලීම පිණිස එය යූ.සේයි. යම් කරුණක උත්පාදාදීහු භය වශයෙන් මනාව වැටහුණාහු වෙත්ද? ඒ සඳහා ඊට විරුද්ධ ප්‍රවණතා සහිත සිතක් වේ. එහෙයින් බිය වශයෙන් වැටහීම සිදුවූ ආදීනව ඤාණයාගේ අනුසස් දැක්වීම සඳහා මෙය යූ.සේයි. **අනුප්පාදො අප්පවත්තන්ති** මෙයින් නිර්වාණය දක්වයි. **සන්තිපදෙ** යනු ශාන්ති කොටසෙහි, නිර්වාණයෙහි යන අර්ථයි.

ශ්‍රවණය කිරීම් වශයෙන්ම සනතිපදං යන නාම මාත්‍රය ගෙන උපන් ඤාණයද සනතිපදෙ, ඤාණයයි යූ.සේයි. **උපපාදො භයං අනුපපාදො** බෙමං ආදිය විරුද්ධ ධර්මයන්ට විරුද්ධවීම් වශයෙන් ද්වයය කෙටිකොට, උපදිනු ලබන ඤාණය ගෙන යූ.සේයි. මෙහිද යමක් බිය ගෙන දේද, එය නියම වශයෙන්ම දුකකි. යමක් දුකද, එය සසරට අහරක්, ලොවට අහරක්, කෙලෙසුන්ට අහරක් යන තත්වයන්ගෙන් නොමිදුණ බැවින් සාමිසමය. යමක් සාමිසද එය සංස්කාර මාත්‍රයක්මය. එහෙයින් උපත දුකයයි බිය වශයෙන් වැටහෙන ප්‍රඥාව ආදීනවයෙහි ඤාණයයි යූ.සේයි. මෙසේ ඇතිකල්හිද බිය, දුක්, සාමිස, සංස්කාර ආකාරයෙන්දැයි යන ආකාරයන්ගේ වෙනස් භාවයෙන් පැවතීම් වශයෙන්ද මෙහි වෙනස්බව දතයුතුය.

'උපපාදො භයං, දුක්ඛං, සාමිසං සංඛාරා' ආදියෙහි ඉපැත්ම ආදී ආකාර අපේක්ෂා නොකොට, '**නෙතං ඛො සරණං බෙමං නෙතං සරණ මුත්තමං**' ආදීන්හි මෙන් තමාගේ ආකාරය අපේක්ෂාවෙන්ම කියන ලදී. 'සංඛාරා' යන්නෙහි ඒකත්වයක් අපේක්ෂා නොකොට 'අප්පච්චයා ධම්මා අසංඛතා ධම්මා' ආදීන්හි මෙන් බහුවචන කරන ලදී. උත්පාදාදීන්ගේ හෝ සංස්කාරාදීන්ගේ එක් කොටසක් බැවින් උත්තරෙ පඤ්චාලා ආදීන්හි මෙන් එක් දේශයක් වුවත්, බොහෝ දෙනෙකුන්ගේ ලෙසින් ගෙන බහුවචන කරන ලදැයි දතයුතුය. බෙමං, සුඛං නිරාමිසං නිබ්බාණං යනු නිර්වාණයම කියන ලද ආකාරයන්ට ප්‍රතිපක්ෂ වශයෙන් සිව් අයුරකින් යූ.සේයි. **දස ඤාණෙ පජානාති** යනු ආදීනව ඤාණය දැනගන්නේ, උත්පාදාදී පඤ්ච වස්තූන්ද, අනුත්පාදාදී පඤ්ච වස්තුවදැයි යන දස ඤාණයන් දැනගනියි. ප්‍රතිවේධ කරයි. සාක්ෂාත් කරයි. **ද්විනනං ඤාණානං කුසලතා** යනු ආදීනව ඤාණයෙහිද, සනතිපද ඤාණයෙහිද යන මේ ද්විඤාණයන්ගේ දක්ෂතාවයෙන්, **නානා දිට්ඨීසු න කම්පති** යනු විපරීත ක්‍රමයන්ගෙන් ලබන ඉහාත්ම භාව නිර්වාණාදී වශයෙන් පැවැති දෘෂ්ටීන්හි කම්පා නොවෙයි.

**ආදීනව ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

සංස්කාරුපේක්‍ෂා ඥාණ නිර්දේශයෙහි:- **උප්පාදාදි** යනු කියන ලද අර්ථයමය. **දුක්ඛං**, භයං, සාමිසං, **සංඛාරා** යනු උත්පාදාදියෙන් මිදීමට හේතු වූ වචනයෝය. මෙසේද ලක්‍ෂණ වශයෙන් සංස්කාරුපේක්‍ෂාව දක්වා දැන් අර්ථ වශයෙන් දක්වන්ට උප්පදො සංඛාරා, තෙ සංඛාරෙ අජ්ඣුපෙක්ඛතී සංඛාරුපෙක්ඛා' ආදිය වදාළහ. එහි **සංඛාරෙ අජ්ඣුපෙක්ඛති** යනු ආරබ්ධ විදර්ශකයාට විදර්ශනා ඥාණයෙන් ලක්‍ෂණත්‍රයයාගේ ස්වභාවය දුටු හෙයින් ස්වභාව සෙවීමෙහි පහවූ උත්සාහ ඇත්තහුට, ත්‍රිවිධ භවයන් ගිනිගත්තාක් මෙන් දක්නේ, සංස්කාර ග්‍රහණයෙහි මධ්‍යස්ථ වූවහුට, ඒ විදර්ශනා ඥාණය, ඒ සංස්කාරයන් බලයි, ග්‍රහණයෙන් අත්හැර දමන ලද්දේ වී බලයි. අවලෝකනය කෙරෙයිනුයි සංස්කාරුපේක්‍ෂා නමැයි අර්ථයි. යම්සේ ලෝකයෙහි විශේෂයෙන් දිනන්නේ අධිජයතියිද, ආහාර වර්ජිතව වසන්නේ උපවාස කෙරේයයි කියනු ලැබේ. නැවත සංස්කාරයන් අනිත්‍යාදී වශයෙන් මනාකොට බලා, ග්‍රහණ මධ්‍යස්ථ භාවයෙහි පිහිටියේ, සංස්කාරුපේක්‍ෂාවද අනිත්‍යාදී වශයෙන් මනාකොට බලා, ඒ සංස්කාරුපේක්‍ෂාවගේද අනිත්‍යාදී වශයෙන් මනාකොට බලා, ඒ සංස්කාරුපේක්‍ෂාවගේද ග්‍රහණයෙහි මධ්‍යස්ථාකාරයෙන් පිහිටි සංස්කාරුපේක්‍ෂාවගේ ස්වභාවයෙන් 'යෙච සංඛාරා, යාච උපෙක්ඛාති' ආදිය යූ.සේයි. දැන් සංස්කාරුපේක්‍ෂාවට සිත එළවීම් භේද දක්වන්ට කොපමණ ආකාරයන්ගෙන්දැයි ආදිය වදාළහ. එහි **සංඛාරුපෙක්ඛායා** යනු සත්තමී වචනයි. **චිත්තස්ස අභිනීහාරො** යනු සංස්කාරුපේක්‍ෂාලාභීහුගේ එයින් අන්‍ය වූ චිත්තයාගේ සංස්කාරුපේක්‍ෂාභිමුඛකොට බොහෝ සේ ගෙනයාම, මෙහි 'අභි' ශබ්දය අභිමුඛයෙහි යන අර්ථයි. 'නි' ශබ්දය බොහෝ සේ යන අර්ථයි. විමසන ලද විචාරීම කවර ආකාරයන්ගෙන්දැයි යතහොත්, අට ආකාරයකින් විසඳ දෙවන විමසීම් විසඳුමෙන්ම ඒ අට ආකාරයන් දක්වනු කැමැත්තේ, ඒවා නොදක්වාම, පෘථග්ජනයාට කවර ආකාරයන්ගෙන්දැයි ආදිය විමසීම කළේය. **පුථුජ්ජනස්ස** යන මෙහි වනාහි

**දුවෙ පුථුජ්ජනා වුත්තා - බුද්ධෙන ආදිච්ච බන්ධුනා**
**අන්ධො පුථුජ්ජනො එකො - කල්‍යාණෙකො පුථුජ්ජනො**

ආදිච්ච බන්ධු වූ, බුදුරදුන් විසින් පෘථග්ජනයින් දෙදෙනෙක් වදාරන ලදහ. එකෙක් අන්ධ පෘථග්ජනයි. එකෙක් කල්‍යාණ පෘථග්ජනයි. එහි යමෙකුට ස්කන්ධ, ධාතු, ආයතනාදීන්හි, ඉගෙනීම, විමසීම්, ශ්‍රවණ, ධාරණ,

ප්‍රත්‍යවේක්ෂානාදීන් නොමැතිද? මේ අන්ධ පෘථග්ජනයි. යමෙකුට ඒවා තිබේද? හෙතෙම කල්‍යාණ පෘථග්ජනයි. ඒ දෙදෙනාම වනාහි :-

පුථූනං ජනනාදීහි - කාරණෙහි පුථුජ්ජනො
පුථුජ්ජනනෙත්තාගධත්තා - පුථුවායං ජනො ඉති

පැතිරුණු බොහෝ කෙලෙස් උපදවන ආදී කරුණුවලින් පෘථග්ජන නමැ. පෘථග්ජනයින්ට අයත් හෙයින්ද, මේ ජන තෙමේ පුථු නමැ.

හෙතෙම බොහෝ නානාප්‍රකාර ක්ලේශාදීන්ගේ ඉපදවීම් ආදී කරුණුවලින් පෘථග්ජන නමැ. දෙසූ පරිදි; බොහෝ කෙලෙස් උපදවත්නුයි පෘථග්ජනයි. පහ නොකළ බොහෝ සක්කාය දෘෂ්ටි ඇත්තේනුයි, පෘථග්ජනයි. බොහෝ ශාස්තෘවරුන්ගේ මුහුණු බලන්නේනුයි පෘථග්ජනයි. බොහෝ සියලු ගතිවලින් නැගී නොසිටියේනුයි පෘථග්ජනයි. බොහෝ නොයෙක් අභිසංස්කාරයන් රැස් කෙරෙත්නුයි පෘථග්ජනයි. බොහෝ නොයෙක් දියපහරවලින් පාවී යෙත්නුයි පෘථග්ජනයි. බොහෝ නොයෙක් සන්තාපයන්ගෙන් තැවෙත්නුයි පෘථග්ජනයි. බොහෝ නොයෙක් දාහයන්ගෙන් දැවෙත්නුයි පෘථග්ජනයි. බොහෝ පඤ්ච කාම ගුණයන්හි ඇලී, ගිජුවී, ගැලී, මූර්ච්ඡාවට පත්ව, එහි බැස, ඇලී, තදින් ඇලී, කරදරයට පත්වූවාහුය යන අර්ථයෙන් පෘථග්ජනයි. බොහෝ පඤ්ච නීවරණයන්ගෙන් ඇමිණුනාහු, වටකරන ලද්දාහු බාධාකරන ලද්දාහු වසන ලද්දාහු වැසුනාහු යටිකුරු කළාහුනුයි පෘථග්ජනයි. බොහෝ සංඛ්‍යාතික්‍රාන්ත, ආර්ය ධර්මයන්හි ඉවතට හරවාගත් මුහුණු සහිත වූයේ පහත් හැසිරීම්වලින් යුත් ජනයන්ට ඇතුළත් වූ හෙයින්ද පෘථග්ජනයි. බොහෝසෙයින් මේ තෙමේ වෙන්වූයේමයැයි යන සංඛ්‍යාවට ගියේය. සීල ශ්‍රැත ආදී ගුණයුත් ආර්ය ජනයාගෙන් වෙන්වූයේනුයි පෘථග්ජනයි. ඔවුනතර කල්‍යාණ පෘථග්ජනයා මෙහි අදහස් කරන ලදී. අනෙකාට භාවනාවෙන්ම අභාවය දක්වයි. **සෙඛස්ස** මෙහි සප්ත ශෛක්‍ෂ්‍යයෝය. සෝවාන් මාර්ග, ඵල, සකෘදාගාමි මාර්ග ඵල, අනාගාමි මාර්ග, ඵල අර්හත් මාර්ගස්ථ වශයෙනි ඔවුහු ත්‍රිවිධ ශික්‍ෂා හික්මෙත්නුයි ශෛක්‍ෂ්‍යයි. ඔවුන් අතරෙහි සෝවාන්, සකෘදාගාමි, අනාගාමි ඵලයෙහි පිහිටි තිදෙන මෙහි අදහස්කරන ලදී. මාර්ගස්ථයින්ගේ සංස්කාරුපේක්‍ෂාව සඳහා සිත ඉදිරියට ගෙන ඒම නොමැති හෙයිනි. **වීතරාගස්ස** යනු මෙහි මුළුමනින් නැසීම් ප්‍රහාණයෙන් පහවූ ඇල්ම ඇත්තේනුයි වීතරාග නමැ. රහතුන්ට එය විශේෂ නාමයකි.

තෙපදයන්හිම ජාති ග්‍රහණයෙන් ඒකවචන කරන ලදී. **සංඛාරුපෙක්ඛං අභිනන්දති** යනු ඒ උපේක්ෂා විහරණයෙහි පහසු විහරණ සංඥාව ලැබ, පහසු විහරණ ඇල්මෙහි සංස්කාර උපේක්ෂා අභිමුඛව සතුටුවෙහි. ප්‍රීති සහිත තෘෂ්ණාව උපදවයි යන අර්ථයි. **විපස්සති** යනු සෝවාන් මාර්ග ප්‍රතිලාභය සඳහා අනිත්‍යාදී වශයෙන් විවිධාකාරයෙන් බලයි. ශෛක්ෂයයා මතු මාර්ග සඳහා වීතරාගී වූයේ ඉහාත්ම සුව විහරණය සඳහා විදර්ශනා කරයි. **පටිසංඛාය** යනු අනිත්‍යාදී වශයෙන්ම මනාව පරීක්ෂාකොට, සෝවාන් ආදී ආර්යයෝ තම තමන්ගේ ඵල සමවතට සමවදින්නාහු, උදයව්‍යය ඤාණාදී නව විදර්ශනා ඤාණයන්ගෙන් විදර්ශනාකොට සමවදින්ට නොහැකි වෙති. එහෙයින් අනිත්‍යාදී වශයෙන්ම මනාව පරීක්ෂාකොට ඵල සමවතට සමවදීයයි කියන ලදී. ඵල සමවතෙහි පැවැත්ම දැක්වීම සඳහා මේ ඒවා පිළිබඳ ප්‍රශ්න කර්මයයි. ඵල සමවත කවරක් වන්නේද? කවරහු එයට සමවදිත්ද? කවරහු සමනොවදිත්ද? කවර හෙයින් සමවදිත්ද? කෙසේ එම සමවැදීම වන්නේ වේද? සිටීම කෙසේද? නැගිටීම කෙසේ වේද? ඵලයට අනතුරු කිමෙක්ද? ඵලයට අනතුරු කවර දැයක්ද?

එහි ඵල සමවත කවරක් වන්නේද? ආර්ය ඵල නිරෝධයෙහි වන ධ්‍යානයයි. කවරහු එයට සමවදිත්ද? කවරහු සම නොවදිත්ද? සියලු පෘථග්ජනයෝ සම නොවදිති. කුමක් හෙයින්ද යත්? අවබෝධ නොකළ හෙයිනි.

සියලුම ආර්යයෝ සමවදිති. කුමක් හෙයින්ද? අවබෝධ කළ හෙයිනි. උපරිමයෙහි සිටියහු යට සමවත්හි සමනොවදිති. පුද්ගලාන්තර භාවෝපගමනයෙන් සන්සිඳුණු හෙයිනි. යට සමවත්හි අය මතු සමවත්හි සම නොවදිති. අවබෝධ නොකළ හෙයිනි. තම තමාගේම ඵලයෙහි සමවදිති. මේ මෙහි නිශ්චයයි.

සමහරු සෝවාන් සකෘදාගාමීහු සම නොවදිති. මතු ද්වයෙහිම සමවදිතියි කියති. මේ එයට හේතුයි. ඔවුහු සමාධියෙහි පරිපූර්ණත්වයට පත්වූවෝ වෙති. එය පෘථග්ජනයාටද, තමා ලත් ලෞකික සමාධියෙහි සමවැදීමෙහි දොසක් නැත. මෙහි හේතු අහේතු සිතීමෙහි ඵලය කිමෙක්ද? මෙහිම පෙළෙහි නොවේද? කවර දස සංස්කාරෝපේක්ෂාවන් විදර්ශනා වශයෙන් උපදිත්ද? කවර දස ගෝත්‍රභූධර්ම විදර්ශනා වශයෙන් උපදිත්ද? මේ ප්‍රශ්නයන්ගේ විසඳුමෙහි සෝවාන් ඵලසමාපත්තිය සඳහා, සකෘදාගාමී

ඵල සමාපත්තිය සඳහා යයි වෙන් වෙන්ව කියන ලද්දේ නොවේද? එහෙයින් සියලුම ආර්යයෝ තම තමාගේ ඵලයට සමවදිතියි මෙහි නිෂ්ඨාවට යායුතුය. කවර හෙයින් සමවදිත්ද? ඉහාත්ම සුඛ විහරණය සඳහායි. යම්සේ රජවරු රජසුවය, දේවතාවෝ දිව්‍ය සුවය අනුභව කෙරෙත්ද, මෙසේ ආර්යයෝ ලොවුතුරු සුවය අනුභව කරන්නෙමුයි, කාල පරිච්ඡේදයක් කොට, කැමති, කැමති කෙණෙහි ඵලසමවතට සමවදිති. කෙසේ මෙයට සමවැදීම වන්නේ වේද? සිටීම කෙසේද? නැගිටීම කෙසේද? දෙයාකාරයකින් මෙයට සමවැදීම වන්නේය. නිර්වාණයෙන් අන්‍ය වූ අරමුණු මෙනෙහි නොකිරීමෙන්ද, නිර්වාණයෙහි මෙනෙහි කිරීමෙන්ද යන දෙයාකාරයෙනි. දෙසූ පරිදි ඇවැත්නි, නිමිති රහිත චිත්ත විමුක්තියට සමවැදීම සඳහා කරුණු දෙකක් හේතුවේ. සියලු නිමිතීන්ගේ මෙනෙහි නොකිරීමෙන්ද, නිමිති රහිත ධාතුවගේ මෙනෙහි කිරීමෙන්ද වේ. මෙය වනාහි මෙහි සමවදින ක්‍රමයයි. ඵලසමවත් කැමති ආර්ය ශ්‍රාවකයා විසින්, රහසිගතව, හුදෙකලා වී උදයව්‍යය ආදී වශයෙන් සංස්කාර විදර්ශනා කටයුතුය. පැවැත්ම අනුපිළිවෙළින් විදර්ශනා කරන ඔහුට, සංස්කාර අරමුණුකොට ගෝත්‍රභූ ඥාණයට අනතුරුව ඵලසමවත් වශයෙන් නිරෝධයෙහි සිත පමුණුවයි. මෙහි ඵලසමවත් නිම්නතාවයෙන් ශෛක්‍ෂයාටද ඵලයම උපදියි. මාර්ගය නොවේ. යම් කෙනෙක් කියති. සෝවාන් වූයේ ඵල සමවතට සමවදින්නෙමියි විදර්ශනා පිහිටුවා සකෘදාගාමී වෙති. සකෘදාගාමී වූයේද අනාගාමි වේ. ඔවුන්ට කිවයුතුය. මෙසේ ඇතිකල්හි අනාගාමි වූයේ අර්හත් වන්නේය. රහත්වූයේ පසේ බුදුවන්නේය. පසේබුදුවූයේම බුද්ධ වන්නේය කියා එහෙයින් ඒ සියල්ල පෙළ වශයෙන්ම කිසිවක් ප්‍රතික්‍ෂෙප නොකරන ලද්දේයයි නොගත යුතුය. මෙයම ගතයුතුය. ශෛක්‍ෂයාටද ඵලයම උපදී. මාර්ගය නොවේ. ඉදින් ප්‍රථමධ්‍යානිකයා මෙයින් මාර්ගය අවබෝධ කරන ලද්දේ වේද, ඵලය ප්‍රථම ධ්‍යානිකවම ඉපදීම වන්නේය. ඉදින් ද්විතීයාදි එක්තරා ධ්‍යානිකයෙක් ද්විතීයාදී එක්තරා ධ්‍යානිකයෙක්ම වන්නේය. මෙසේ ධ්‍යානයගේ සමවැදීම වන්නේය. ඇවැත්නි, නිමිති රහිත චිත්ත විමුක්තියෙහි ස්ථිතිය සඳහා ප්‍රත්‍යය ත්‍රයයකි. සියලු නිමිතීන්හි මෙනෙහි නොකිරීමද, නිමිති රහිත ධාතුවෙහි මෙනෙහි කිරීමද, පූර්වයෙහි රැස්කිරීමද, යන වචනයෙන් ධ්‍යානයාගේ ත්‍රයාකාරයකින් සිටීම වන්නේය. එහි පුබ්බෙච අභිසංඛාරො යනු සමවතින් පූර්වකාල පරිච්ඡේදයයි, අසවල් නම් කාලයෙහි නැගිටින්නෙමි. පිරිසිඳි හෙයින් යම්තාක් එම ධ්‍යානයාගේ කාලය නොපැමිණේද? එතෙක් සිටීම වන්නේය. මෙසේ එහි සිටීම වේ.

ඇවැත්නි, නිමිති රහිත චිත්ත විමුක්තියෙන් නැගිටීම සඳහා කරුණු දෙකක් හේතු වේ. සියලු නිමිතීන්ගේ මෙනෙහි කිරීමද, නිමිති රහිත ධාතුවගේ මෙනෙහි නොකිරීම යයි යන වචනයෙන් එම ධ්‍යානයාගේ දෙයාකාරයකින් නැගිටීම වන්නේය. එහි සබ්බනිමිත්තානං යනු රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ යන නිමිතීන්ගේ, ඒකාන්තයෙන් මේ සියල්ල එකට මෙනෙහි නොකරයි. සියල්ල එකට එකතුකිරීම් වශයෙන් එය කියන ලදී. යමක් භවංගයට අරමුණු වේද, එය මෙනෙහි කරන්නේ ඵල සමාපත්තියෙන් නැගිටීම වේයයි මෙසේ එම ධ්‍යානයාගේ නැගිටීම දතයුතුය.

ඵලයට අනතුරු කිමෙක්ද? කවර ඵලයක් අනතුරුවද? ඵලයට ඵලයම අනතුරුව වේ. භවංගය හෝ වේ. ඵලය මාර්ගයට අනතුරුව තිබේ. ඵලයට අනතුරුවද තිබේ. ගොත්‍රභූ අනතුරුවද තිබේ. නේවසඤ්ඤා නාසඤ්ඤායතනය අනතුරුව තිබේ. එහි මාර්ග වීථිය මාර්ගානන්තරය. ප්‍රථම ප්‍රථම ඵලයන්ට පසු පසු ඵල අනන්තරය ඵල සමාපත්තීන්හි ප්‍රථම, ප්‍රථම ගෝත්‍රභූ අනන්තරය. ගෝත්‍රභූ යනු මෙහි අනුලෝමය දතයුතුය. පට්ඨානයෙහි කියන ලදී. රහතුන් වහන්සේට අනුලෝමය ඵල සමාපත්තියෙහි අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ශෛක්ෂයන්ට අනුලෝමය ඵල සමාපත්තියෙහි අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. යම් ඵලයකින් නිරෝධයෙන් නැගිටීම වේද? එය නේවසඤ්ඤානාසඤ්ඤා යතනයට අනන්තරවය. එහි මාර්ග වීථියෙහි උපන් ඵලය හැර සෙසු සියල්ල ඵල සමාපත්ති වශයෙන් පවත්නේ නමැ. මෙසේ එය මාර්ග වීථියෙහි හෝ ඵල සමාපත්තියෙහි ඉපදීම් වශයෙන්,

**පටිප්පසසද්ධ දරථං - අමතාරම්මණං සුභං**
**වන්තලොකාමිසං සන්තං - සාමඤ්ඤඵල මුත්තම'න්ති**

සන්සිඳුණු දාහ ඇත්තේ, සුභ අමෘතාරම්මණයෙන් යුක්ත වූයේ, වැමෑරූ ලෞකික පස්කම් සැප ඇත්තේ ශාන්ත සෝවාන් ඵලාදිය උතුම්ය.

මේ මෙහි ඵල සමාපත්ති කථාවයි.

**තදජ්ඣුපෙක්ඛිත්වා** යනු ඒ සංස්කාරුපේක්ෂාව අනෙක් එවැනිම විදර්ශනා ඥාණයකින් වෙසෙසින් උපේක්ෂාකොට, **සුඤ්ඤත විහාරෙනවා**

යන ආදීන්හි එලසමවත හැර විදර්ශනා විහාරයෙන්ම වසනු කැමැති රහතුන් වහන්සේට, ආත්මය වශයෙන් තදින් ගැනීම භය වශයෙන් දැක ශූන්‍යතාවයෙහි ඇලුණු සිතැත්තේ, සංස්කාරුපේක්‍ෂාවගේ ව්‍යය දක්නේ විදර්ශනාත්‍රය අනුව වාසය කරනුයේ ශූන්‍යතා විහාර නමැ. සංස්කාර නිමිත්ත භය වශයෙන් දැක අනිමිත්තයෙහි අධිකව ඇලුණු සිතැත්තේ, සංස්කාරුපේක්‍ෂාවගේ ව්‍යය දක්නේ විදර්ශනාත්‍රය අනුව වාසය කරන්නේ අප්‍රණිහිත විහාර නමැ. එසේම අන්‍යයන් විසින්ද කියන ලදී. තදින් ඇලීම භය වශයෙන් බලනුයේ ශූන්‍යතාවෙහි ඇලුණු සිතැත්තේ එහි ස්පර්ශ කරමින් ව්‍යය දකී. එය ශූන්‍යතා විහාර නමැ. නිමිත්ත භය වශයෙන් බලනුයේ අනිමිත්තයෙහි ඇලුණු සිතැත්තේ, ස්පර්ශ කරමින් ව්‍යය දකී. එය අනිමිත්ත විහාර නමැ.

ප්‍රණිධිය භය වශයෙන් බලනුයේ අප්‍රණිහිතයෙහි තදින් ඇලුණේ ස්පර්ශ කරමින් ව්‍යය දකියි. එය අප්‍රණිහිත විහාර නමැ. ෂඩංගුපේක්‍ෂාව හටගැනීමෙන් පිළිකුල් දැහි පිළිකුල් නොවන සංඥාදී විහරණ හටගැනීම වන හෙයින්ද, රහතුන්වහන්සේටම හැම අතින් සිත සිය වසයෙහි පවතියි. එහෙයින් මේ විදර්ශනා විහරණය රහතුන් වහන්සේටම සිද්ධ වේයයි යූ.සේයි. **වීතරාගො සංඛාරුපෙක්ඛං විපස්සති** යන මෙහි තෙවැදෑරුම්ය. එය තෙවැදෑරුම් වූයේ තදින් අල්වා ගැනීම්වලට නොපැමිණ තනි විදර්ශනාව යැයි දතයුත්තාහ. මෙසේ ඇතිකල්හි පූර්වාපර විශේෂ වේ.

දැන් දෙතුන් පුද්ගලයන්ගේ වශයෙන්, සංස්කාරුපේක්‍ෂාවගේ ඒකත්ව, නානත්ව භේදය දක්වනු කැමැත්තේ, 'කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච' යනාදිය වදාළහ. එහි **චිත්තස්ස අභිනීහාරො එකත්තං හොති** යනු තනි වේ. ස්වාර්ථයෙහි භාව වචනයි දතයුතුයි. යම්සේ ඉදප්පච්චයම - ඉදප්පච්චයත්තයි කියන ලදද, එසේම තනිවූයේම ඒකත්වයයි. අභිනීහාරො යනු ෂෂ්ඨී අර්ථයෙහි ප්‍රථමා විභක්තියි. අභිනීහාරයාගේ යන අර්ථයි. සො දෙසො සම්මජ්ජිතබ්බො ආදීන්හි මෙන් විභක්ති විපර්යාසය කරන ලදැයි දතයුතුය. **චිත්තං කිලිස්සති** යනු විදර්ශනා ඇලීම් සංඛ්‍යාත ලෝභ ක්ලේශයෙන් සිත කිලිටි වේ. තැවේ. පෙළයි යන අර්ථයි. **භාවනාය පරිපන්ථො හොති** යනු ලද විදර්ශනා භාවනාවගේ නැසීම වේ. **පටිවෙධස්ස අන්තරායොහොති** යනු විදර්ශනා භාවනාවෙන් ලැබිය යුතු සත්‍ය ප්‍රතිවේධයාගේ ප්‍රතිලාභයට අනතුරක් වේ. **ආයතිං පටිසන්ධියා පච්චයො හොති** යනු සංස්කාරුපේක්‍ෂා සම්ප්‍රයුක්ත කර්මයාගේ බලවත් බැවින්

එයින් සුගති ප්‍රතිසන්ධිය දෙනු ලබන කල්හි, සතුටුවීම් සංඛ්‍යාත, ලෝභ කෙලෙස් අනාගත කාමාවචර සුගති ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වේ. යම්හෙයකින් කෙලෙස් ආධාරයෙන් කර්මය, විපාක උපදවයිද, එහෙයින් කර්මය ජනක (හටගන්වන) ප්‍රත්‍යය වේ. කෙලෙස් ආධාරක ප්‍රත්‍යයෝ වෙති. ශෛක්ෂයාට වනාහි, **උත්තරි පටිවෙධස්ස** යනු සකෘදාගාමි මාර්ගාදි වශයෙන් ප්‍රත්‍යය ප්‍රතිවේධයාගේ, **ආයතිං පටිසන්ධියා පච්චයො හොති** යනු ශෛක්ෂයන් අතර, සෝවාන්, සකෘදාගාමීන්ට හා අවබෝධ නොකළ ධ්‍යාන ඇතියවුන්ට, සංස්කාරුපේක්ෂා කර්මයෙන් දෙනු ලබන, කාමාවචර සුගති ප්‍රතිසන්ධියෙහි සතුටුවන ප්‍රමාණ, කෙලෙස් ප්‍රත්‍යය වේ.

ධ්‍යානලාභීන් අතර, අනාගාමිහුට බ්‍රහ්මලෝකයෙහිම ප්‍රතිසන්ධි වශයෙන් ප්‍රත්‍යය වේ අනුලෝම, ගෝත්‍රභූ වලින් පතිසන්ධිය දෙනු ලබන කල්හි මෙම කෙලෙස්ම ප්‍රත්‍යය වේයයි දතයුතුය. **අනිච්චතො** යනු තිබී නැතිවන අර්ථයෙන්, නිත්‍ය නොවන හෙයින්ද, ආදි අන්තවත් භාවයෙන්ද, අනිත්‍ය වශයෙන්, **දුක්ඛතො** යනු නිතර පෙළන අර්ථයෙන් ඉපැත්ම, විනාශය දෙකින් පෙළන හෙයින්ද, දුකට හේතුවන බැවින්ද, දුක් වශයෙන්, **අනත්තතො** යනු සිය වසඟයෙහි නොපවත්නා හෙයින්ද, ප්‍රත්‍යයන්ට අයිති ස්වභාව හෙයින්ද, ස්වාමි, නිවාසි, කාරක, වේදක අභාවයෙන් අනාත්ම වශයෙන්, **අනුපස්සනට්ඨෙන** යනු නැවත නැවත අනිත්‍යාදී වශයෙන් බලන අර්ථයෙන්, **අභිනීහාරො නානත්තං හොති** යනු ඉදිරියට එළැවීම නොයෙක් ආකාර වේ. ඉදිරියට එළැවීමෙහි වෙනස් භාවය යයි දතයුතුයි. **කුසලා** නිරෝගාර්ථයෙන්ද, නිරවද්‍යාර්ථයෙන්ද, කුශලතාව හටගත් අර්ථයෙන්ද වේ. **අබ්‍යාකතා** යනු කුසල් අකුසල් වශයෙන් ප්‍රකාශ නොකළ. **කිඤ්චිකාලෙ සුවිදිතා** යනු, විදර්ශනා කාලයෙහි මනාව දත්, **කිඤ්චිකාලෙ නසුවිදිතා** සතුටුවන කල්හි මනාව නොදත්, **අච්චන්තං සුවිදිතා** යනු සතුටුවීම ප්‍රහීණ හෙයින් ඒකාන්තයෙන් මනාව දත්, **විදිතට්ඨෙන ච අවිදිතට්ඨෙනච** යන මෙහි පෘථග්ජන ශෛක්ෂයන්ට මනාව දත් අර්ථයද, වීතරාගීහුට අත්‍යන්තයෙන් මනාව දත් අර්ථයද, විදිතාර්ථම වේ. දෙදෙනාටම මනාව නොදත් අර්ථය අවිදිතාර්ථයමය. **අතිත්තත්තා** යනු විදර්ශනා කරණයෙහි සම්පූර්ණ නොවූ හෙයින් ප්‍රණීත නොවන ස්වභාවයෙන් (අතෘප්තභාවයෙන්) ඊට විපරීතයෙන් තෘප්ත භාවයෙන්, **තිණ්ණං සංයොජනානං පහාණාය** යනු සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාසයන්ගේ ප්‍රහාණය සඳහා පශ්චිමභවික බෝසත්වරු මෙහිම සංග්‍රහයට ඇතුළත් වෙති. **සොතාපත්ති මග්ගං පටිලාභත්ථාය** යනු සමාස

නොකොට කියවති. සමාසකොට පාඨය වඩා සුන්දරය. **සෙක්ඛා තිණ්ණං සංයෝජනානං පහීණත්තා** යනු සෝවාන්, සකෘදාගාමී, අනාගාමීන්ගේ සමාන භාවයෙන් යූ.සේයි. සකෘදාගාමී, අනාගාමීන්ටද ඒවා ප්‍රහීණ වූවාහුමය. **උත්තරිපටිලාභත්ථාය** යනු මතු මත්තෙහි මාර්ග ලැබීම් සඳහා දිට්ඨ ධම්ම **සුඛ විහාරත්ථාය** යනු ඉහාත්මයෙහිම ප්‍රත්‍යක්‍ෂ ආත්මභාවයෙහි යම් සුඛ විහරණයක් ඇත්ද? ඒ සඳහා **විහාර සමාපත්තට්ඨේන** යනු ශෛක්‍ෂයාගේ ඵල සමවත් අර්ථයෙන් වීතරාගීහුට විදර්ශනා විහාරඵල සමාපත්ති අර්ථයෙන්ද,

දැන් සංස්කාරුරෝපේක්‍ෂාවන්ගේ ගණන් පිරිසිඳ දක්වන්ට කෙතෙක් සංස්කාරෝපේක්‍ෂාවෝදැයි ආදිය වදාළහ. එහි **සමථවසෙන** යනු සමාධි වශයෙනි, මෙයම පාඨයයි. **නීවරණෙ පටිසංඛා** යනු පඤ්ච නීවරණයන් ප්‍රහාණය කළයුතු භාවයෙන් පරිග්‍රහණය කොට, **සන්තිට්ඨනා** නීවරණයන්ගේ ප්‍රහාණාභිමුඛ වූ හෙයින් ඒවාහි ප්‍රහාණයෙහි අනුත්සාහවත් බවට පැමිණීමෙන් මධ්‍යස්ථතාවයෙන් සිටිනා ප්‍රඥාව. **සංඛාරුපෙක්ඛාසු** යනු නීවරණ ප්‍රහාණයෙහි උත්සාහ කිරීමෙන් නීවරණ සංඛ්‍යාත සංස්කාරයන්හි මධ්‍යස්ථතාවන්හි, විතර්ක විචාරාදීන්හිද ඒ ක්‍රමයමැයි. සමථයෙහි සංස්කාරුපේක්‍ෂාව නම් අර්පණා වීථියට ආසන්න පූර්වභාගයෙහි බලවත්භාවයට පත් භාවනාමය ඥාණයයි. 'සොතාපත්ති මග්ග පටිලාභත්ථාය, ආදීන්හි සිව්මග වාරයන්හි සුඤ්ඤත, අනිමිත්ත අප්පණිහිත මාර්ගයන්ගේ එක්තරා මාර්ගයක් ලබයි. සොතාපත්ති ඵල සමාපත්තත්ථාය, ආදීන්හි සිව්ඵල වාරයන්හි, වනාහි අප්පණිහිත ඵල සමාපත්තිය සඳහාද, අනිමිත්ත විහාර සමාපත්තිය සඳහාද වේ. අනෙක් ද්විඵල සමාපත්තීන්ගේ කරුණු වෙන්ව කියන ලද හෙයිනි. අනිත්‍යානුපස්සනාව නැගී සිටීම් වශයෙන් අප්‍රණිහිත මාර්ගඵල සමාපත්තීහුය. අනත්තානුපස්සනාව නැගී සිටීම් වශයෙන් ශුන්‍යතා මාර්ගඵල සමාපත්තීහුයයි සූත්‍රාන්ත ක්‍රමයෙන් දතයුත්තේය. මෙහිද සිව්මග වාරයන්හි **උප්පාදං** ආදී මුල්පද පහක්ද, **ගති** ආදි දස සමානාර්ථ පදයන්දැයි යන පසළොස් පදයන් කියන ලද්දේනුයි ෂට් ඵල සමාපත්ති වාරයන්හි මුල්පදයන්ම පහක් කියන ලදී. එය කුමක් හෙයින්ද යත්? සංස්කාරෝපේක්‍ෂාවගේ තීක්‍ෂණ භාවය ඇතිකල්හි, කෙලෙස් ප්‍රහාණයෙහි සමත් මාර්ගයාගේ හටගැන්ම වන හෙයින්, එහි අති තීක්‍ෂණභාවය දැක්වීම සඳහා සමානාර්ථ පදයන්ගෙන් දැඩිකොට මුල්පද කියන ලදී. ඵලයාගේ නිරුත්සාහ භාවයෙන්, ශාන්ත ස්වභාව හෙයින්ද, මාර්ගයට

අයත් බැවින්ද, මඳ වූද සංස්කාරෝපේක්ෂාව ඵලයට ප්‍රත්‍යය වේයයි දැක්වීම සඳහා මුල්පදයන්ම කියන ලදැයි දතයුත්තාහ.

දැන් ජාති වශයෙන් විචාරා, ලැබීම් වශයෙන් විසඳන්ට කෙතෙක් සංස්කාරොපේක්ෂාවන් කුසල්දැයි ආදිය වදාළහ. එහි **පණ්ණරස සංඛාරුපෙක්ඛා** යනු සමථ වශයෙන් අටක්ද, සිව් මාර්ගයන්ගේ ත්‍රිවිධ ඵලයන්ගේ වශයෙන් සතක්දැයි පහළොවකි. සමථ වශයෙන් වන අටවැදෑරුම් සංස්කාරෝපේක්ෂාවන් රහතුන්ට නීවරණ නුවණින් සැලකීමක් නොමැති හෙයින්, විතර්ක විචාරාදීන්ගේ ප්‍රහාණ උත්සාහය හැර සුවයෙන් ප්‍රහාණය කරන හෙයින්, සංස්කාරෝපේක්ෂා නාමයට නුසුදුසු යයි කොට ඒවාහි අව්‍යාකෘතතාවය නොකියන ලදැයි දතයුත්තාහ. ඵලසමවතට සමවදින රහතන් වහන්සේ විසින් සංස්කාරෝපේක්ෂාව හැර සමවදින්ට නොහැක්කේනුයි ත්‍රිවිධ සංස්කාරෝපේක්ෂා අව්‍යාකෘත යයි කියන ලදී. අප්‍රණිහිත, සුඤ්ඤත, අනිමිත්ත වශයෙන් රහතුන්ට ත්‍රිවිධ සංස්කාරෝපේක්ෂායි.

දැන් සංස්කාරෝපේක්ෂාවන්ගේ වර්ණනා කිරීම් වශයෙන් කියන ලද ත්‍රිවිධ ගාථාවන්හි, **පටිසංඛාසන්තිට්ඨනා පඤ්ඤා** යනු සංස්කාරෝපේක්ෂාවයි. **අට්ඨ චිත්තස්ස** ගොචරා යනු සමථ වශයෙන් කියන ලද අට සංස්කාරෝපේක්ෂායි. සමාධියට විෂය වූ භූමීන්ය යන අර්ථයි. '**චිත්තං පඤ්ඤඤ්චභාවයං**' යන ආදීන්හි මෙන් චිත්ත ශීර්ෂයෙන් සමාධිය දක්වන ලදී. 'ගොචරෙ භික්ඛවෙ චරථ සකෙ පෙත්තිකෙ විසයෙ' ආදීන්හි මෙන් ගෝචර ශබ්දයෙන් විෂයය දක්වයි. යමකට යමක් අයත් වේද? එයට එය විෂයයයි යූ.සේයි. **පුථුජ්ජනස්ස** ද්වෙ යනු සමථ වශයෙන් හා විදර්ශනා වශයෙන්, **තයො සෙක්ඛස්ස** යනු සමථ, විදර්ශනා, සමාපත්ති වශයෙන්, **තයොච වීතරාගස්ස** යනු අප්‍රණිහිත, සුඤ්ඤත, අනිමිත්ත ඵල සමාපත්ති වශයෙන්, '**තිස්සො**' යනුවෙන් කිවයුතු කල්හි 'තයො' යයි ලිංග විපර්යාසය කරන ලදී. තයො සංඛාරුපෙක්ඛා ධම්මා යයි යෙදිය යුතුය. **යෙහි චිත්තං විවට්ටති** යම් සංස්කාරෝපේක්ෂා ධර්මයන්හි, විතර්ක විචාරාදීන්ගේ උත්පාදාදීන්හි සිත ඉවත්ව යේද, වීතරාගීහුටද, සංස්කාරෝපේක්ෂා හටගැන්මෙහිදී, සංස්කාරයන්ගෙන්, සිත ඉවත්ව නිර්වාණයට පනී යයි යූ.සේයි.

අට්ඨ සමාධිස්ස පච්චයා යනුඃ සමථ වශයෙන් කියන ලද, සංස්කාරෝපේක්ෂා අට, අර්පණාවන් සම්ප්‍රාප්ත කරවන හෙයින් අර්පණා

සමාධියට ප්‍රත්‍යය වේ. **දස ඤාණස්ස ගොචරා** යනු විදර්ශනා වශයෙන් කියන ලද දසමාර්ග ඤාණයාගේද ඵල ඤාණයාගේද භූමිහු, **තිණ්ණං විමොක්ඛානං පච්චයා** යනු සුඤ්ඤත, අනිමිත්ත අප්‍රණිහිත විමෝක්ෂයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවීම, **නානාදිට්ඨීසු නකම්පති** යනු භංගය නොහැරම සංස්කාරයන් අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරනුයේ ශාශ්වත දෘෂ්ටි ආදී නානාප්‍රකාර දෘෂ්ටීන්හි කම්පා නොවෙයි.

**සංස්කාරෝපේක්ෂා ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

ගෝත්‍රභූ ඤාණ නිර්දේශයෙහි, **අභිභුය්‍ය** යනු මැඩපවත්වයි. ඉක්මවයි. **බහිද්ධා සංඛාර නිමිත්තං** යනු ස්වකීය සන්තානයෙහි පවත්නා අකුසල ස්කන්ධයෙන් පිටත වූ සංස්කාර නිමිත්ත. ලෞකික සංස්කාර වනාහි, කෙලෙසුන්ට නිමිති බැවින්ද, නිමිති ආකාරයෙන් වැටහෙන හෙයින් නිමිත්ත යයි කියති. අභිභුය්‍යතීති **ගොත්‍රභූ** යනු පෘථග්ජන ගෝත්‍රය මැඩපවත්වන හෙයින් ගෝත්‍රභූභාවය යු.සේයි. **පක්ඛන්දතීති ගොත්‍රභූ** යනු ආර්ය ගෝත්‍රය වඩන හෙයින්ද, ගෝත්‍රභූභාවය යු.සේයි. **අභිභුයිත්වා, පක්ඛන්දතීති** ගොත්‍රභූ යනු අර්ථද්වය කෙටිකොට යු.සේයි.

වුට්ඨාතීති **ගොත්‍රභූ** පෙරළේ යන ශීර්ෂ පාඨයෙහි නැගිටීම් පෙරළීම් පදානු රූපයෙන් පෘථග්ජන ගෝත්‍රය මැඩපවත්වන අර්ථයම යු.සේයි. සමථ වශයෙන් කියන ලද ගෝත්‍රභූන්ගේ වනාහි, නීවරණාදී ගෝත්‍රයන් මැඩපවත්වන හෙයින්ද, ගෝත්‍රභූ යනු සෝවාන්ඵල සමාපත්ති සඳහායයි ආදීන්හි ෂට් සමාපත්ති වාරයන්හි උත්පාදාදී ගෝත්‍රයන් මැඩපවත්වන හෙයින් ගෝත්‍රභූයි, සකෘදාගාමි මාර්ග ප්‍රතිලාභය සඳහා යයි ආදී මාර්ග වාරයන්හි සෝවාන් ආදී ගෝත්‍රයන් මැඩපවත්වන හෙයින් ගෝත්‍රභූයයි අර්ථය දතයුතුය. මෙහි ගෝත්‍රාර්ථයෙහි බීජාර්ථය වැටේ. ප්‍රකරණයෙහි යු.සේයි. නිර්වාණය සියලු උවදුරුවලින් ආරක්ෂාවී ඇති හෙයින් ගෝත්‍රයයි කියනු ලැබේ. එය පිළිපදීනුයිද ගෝත්‍රභූයි. උවදුරුවලින් ආරක්ෂා වී ඇති හෙයින් අට සමවත්ද ගෝත්‍රයි. ඒ ගෝත්‍රයට පිළිපදී (බසී) නුයි ගෝත්‍රභූයි යු.සේයි. සතර මාර්ගයන්හිම ගෝත්‍රභූ නිවන අරමුණුකොට ඇත. සිව්ඵල සමාපත්තීන්ගේ ගෝත්‍රභූ, සංස්කාරාරම්මණ

වූයේ, ඵල සමාපත්ති ප්‍රවණතාව බැවින් යයි කියති. විසුද්ධි මාර්ගයෙහි කියන ලද්දේමය. එහි පැවති අනුපූර්ව විදර්ශනාව, සංස්කාරාරම්මණ ගෝත්‍රභූ ඤාණයන්ට අනතුරුව ඵලසමාපත්ති වශයෙන් නිරෝධයෙහි සිත පමුණුවයි. එහෙයින්ම මෙහි මාර්ග වාරයන්හි සොළොස්වෙනි කොටගත්, පිටත සංස්කාර නිමිති පදයෙහි සමාපත්ති වාරයන්හි සයවෙනි කොට ග්‍රහණය කරන ලදැයි දතයුතුය. අනෙක් අයුරින් මුල්පද ග්‍රහණයෙන් ගතයුතු වන්නේය.

අනෙකුත් අය, නිර්වාණයෙහි, යම් ප්‍රථම සිතා බැලීමක්, ප්‍රථම එක්තැන් කිරීමක් වේද? මෙය ගෝත්‍රභූයයි කියනු ලැබේයයි කියති. එය ඵලය සඳහා නොයෙදේ. 'පණ්ණරස ගොත්‍රභූධම්මා කුසලා' යන මෙහි රහතන් වහන්සේට මැඩපැවැත්විය යුතු නීවරණ නොමැති හෙයින් පහසුවෙන්ම විතර්ක විචාරාදීන්ගේ ප්‍රහාණය කළයුතු හෙයින්ද මැඩපැවැත්වීම් අර්ථයෙන් ගෝත්‍රභූ නාමය සුදුසු නොවෙත්යයි කොට ගෝත්‍රභූන්ට අව්‍යාකෘතතාවක් නොකියන ලදැයි යූ.සේයි. ඵලසමවතට සමවදින රහතන් වහන්සේ විසින් සංස්කාරයන් මැඩ නොපවත්වා සමවදින්ට නොහැකිවේනුයි ගෝත්‍රභූ ධර්මත්‍රය අව්‍යාකෘතයයි යූ.සේයි. සමහරු මෙහි නොදක්වන ලද ආර්ය මාර්ගයන්ගේ වශයෙන් අෂ්ට සමාපත්ති තියුණු අවබෝධය සහිත යයි කියති. එහෙයින් අටසමවත් ගෝත්‍රභූ කුසල් වේ යයි කියති. සංස්කාරෝපේක්ෂායෙහිද එසේමය. සාමිසං වා යනාදීන්හි වට්ටාමිස, ලොකාමිස, කිලෙසාමිසයන් අතර, කෙලෙසුන්ට ආහාර වශයෙන් සාමිසයි. තෘෂ්ණා සහිත බැවිනි. එය කිමෙක්ද? අටවැදෑරුම් සමථ ගෝත්‍රභූ ඤාණයයි. වට්ටාමිසං යනු ත්‍රෛභූමික වෘත්තයමය ලොකාමිසං යනු පස්කම් ගුණයෝය. කිලෙසාමිසං යනු කෙලෙස්මය. නිරාමිසං යනු දසවැදෑරුම් ගෝත්‍රභූ ඤාණයයි. තෘෂ්ණා නොමැති හෙයිනි. ආර්යයෝ ගෝත්‍රභූහි තෘෂ්ණා නොකරති. පොත්වල 'සාමිසංචෙ' යයි ලියති. එය සුන්දරතර නොවේ. එපරිද්දෙන්ම පණිහිත, අප්පණිහිත, සඤ්ඤුත්ත, විසඤ්ඤුත්ත, වුට්ඨිත, අවුට්ඨිත දතයුතුය. තෘෂ්ණා ප්‍රාර්ථනායෙහි පණිහිතං පිහිටියේ යයි අර්ථයි. එහි අභාවයෙහි අප්පණිහිතංයි තෘෂ්ණා සංයෝගයෙන්ම යුක්ත වූයේ සඤ්ඤුත්තංයි, එහි අභාවයෙන් විසඤ්ඤුත්තංයි.

වුට්ඨිතං යනු විදර්ශනා ගෝත්‍රභූ ඤාණයමය,එය තෘෂ්ණාව සිඳින හෙයින් වුට්ඨිත නමැ, එහි අභාවය අවුට්ඨිත නමැ. පිටත නැගී සිටුනා

හෙයින් හෝ වුට්ඨිතයි. ඵලගෝත්‍රභූහිද, නිර්වාණධ්‍යාශය වශයෙන් නිර්වාණාභිමුඛ වූ හෙයින්, පිටත සංස්කාර නිමිත්තෙන් නැගිටියේ නමැයි දතයුතුය. යට මැඩපැවැත්වීම් වශයෙන් නැගී සිටුනා, එයට පාරාම්මුඛ වූ හෙයින් මැඩපවත්වයි. නැගී සිටියි. පරාම්මුඛ වේයයි දතයුතුය. **තිණ්ණං විමොක්ඛානං පච්චයා** යනු ත්‍රිවිධ ලෝකෝත්තර විමෝක්ෂයන්ගේ, සමථ ගෝත්‍රභූ ද්වයට, පකති උපනිශ්‍රය ප්‍රත්‍යය වෙති. විදර්ශනා ගෝත්‍රභූ ද්වයට අනන්තර, උපනිශ්‍රය ප්‍රත්‍යය වෙති. විදර්ශනා ගොත්‍රභූ ද්වයට අනන්තර, උපනිශ්‍රය ප්‍රත්‍යය වෙති. **පඤ්ඤා යස්ස පරිචිතා** යනු යමෙකුට පූර්වභාග ප්‍රඥාව පුරුදු කරන ලද්දේ, මනාව පුරුදු කරන ලද්දේ වේද? **කුසලො විවට්ටෙ වුට්ඨානෙති** නුමුලා වීම් වශයෙන්ම විවිට්ට සංඛ්‍යාත ගෝත්‍රභූ ඤාණයෙහි කුසලතා ඇත්තේ, දක්ෂ වූයේ, පූර්වභාග ඤාණයෙන් හෝ නිපුණවූයේ. **නානා දිට්ඨීසු න කම්පති** යනු මුළුමනින් නැසීමෙන් ප්‍රහීණ වූ නානාප්‍රකාර දෘෂ්ටීන්හි කම්පා නොවේ.

**ගෝත්‍රභූ ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

මාර්ග ඤාණ නිර්දේශයෙහි, **මිච්ඡා දිට්ඨියා වුට්ඨාති** යනු දෘෂ්ටි අනුසය ප්‍රහාණයෙන් මුළුමනින් නැසීම් වශයෙන් තෙසැටක් භේද වූ මිථ්‍යා දෘෂ්ටියෙන් නැගිටියි. **තදනුවත්තක කිලෙසෙහි** යනු මිථ්‍යාදෘෂ්ටිය හා එකට යෙදීම් වශයෙන්ද, මිථ්‍යා දෘෂ්ටිය ඇසිරි කිරීමෙන්ද, උපදිනු ලබන, මිථ්‍යා දෘෂ්ටියට අනුව පවත්නා වූ නොයෙක් ආකාර කෙලෙසුන්ගෙන්, ඉන් එහා පැවති කෙලෙස් ප්‍රහාණය යු.සේයි. එකට පැවතීම දෙයාකාරය. හටගැන්මෙන් එකට පැවැත්ම හා ප්‍රහාණයෙන් එකට පැවැත්මයි. ඒ මිථ්‍යාදෘෂ්ටිය සමග එක් සිතක හෝ එක් පුද්ගලයෙකු කෙරෙහි හෝ ප්‍රහාණය තෙක් සිටියාහුද, එය ඒ හා සිටියාහු වෙති. මිථ්‍යා දෘෂ්ටිය ප්‍රහීණ වන කල්හි, මිථ්‍යා දෘෂ්ටිය හා යෙදුණු අසංඛාරික දෙසිත්හි ඒ දෘෂ්ටිය හා හටගත්, ලෝභ, මෝහ, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන මේ කෙලෙස්ද, සසංඛාරික දෙසිත්හි, ඒ දෘෂ්ටිය හා එකට හටගත්, ලෝභ, මෝහ, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන මේ කෙලෙස් හටගැන්මෙන් එකට පැවතීම් වශයෙන් ප්‍රහීණ වෙති. දෘෂ්ටි කෙලෙසුන්ම ප්‍රහීණ වන කල්හි, ඒ සමග එක් පුද්ගලයෙකු කෙරෙහි පිහිටි අපාය ගමනීය ලෝභ, ද්වේෂ, මෝහ, මාන, විචිකිච්ඡා, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන මේ කෙලෙස් ප්‍රහාණයෙන් එකට පැවතීම් වශයෙන්

ප්‍රහීණ වෙති. **ඛන්ධෙහි** යනු ඒ අනුව පවත්නා ස්කන්ධයන්ගෙන්, ඒ දෘෂ්ටිය අනුව පවත්නා සහජෙකට්ඨ හා ප්‍රහාණෙකට්ඨයන්හිද, සිව් අරූප ස්කන්ධයන්හි හා ඒ හා හටගත් රූපයන්හිද, පංචස්කන්ධයන්හිද, මිථ්‍යා දෘෂ්ටි ආදී කෙලෙස් ප්‍රත්‍යයෙන් අනාගතයෙහි ඉපදිය යුතු විපාක ස්කන්ධයන්ගෙන්, **බහිද්ධා ච සබ්බනිමිත්තෙහි** යනු කියන ලද ආකාර කෙලෙස් ස්කන්ධයන්ගෙන්, පිටත වූ සියලු සංස්කාර නිමිතිවලින්, **මිච්ඡා සංකප්පා වුට්ඨාති** යනු සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කළයුතු, සිව් දෘෂටි සම්ප්‍රයුක්තයන්හි හා විචිකිච්ඡා සහගත සිතද යන පඤ්ච චිත්තයන්හිද, අපායගමනීය සෙසු අකුසල චිත්තයන්හිද වූ මිථ්‍යා සංකල්පයෙන් නැගිටියි. **මිච්ඡා වාචාය වුට්ඨති** යනු මුසාවාදයෙන්ද, අපායගමනීය, පිසුන, ඵරුස, සම්ඵප්පලාපයන්ගෙන්ද නැගිටියි. **මිච්ඡා කම්මන්තා වුට්ඨාති** යනු ප්‍රාණඝාත, අදින්නාදාන, මිච්ඡාචාරයන්ගෙන් නැගිටියි. **මිච්ඡාජීවා වුට්ඨාති** යනු නැතිගුණ පෙන්වීම, චාටුබස් කීම, ශුභාභුභ නිමිති කීම, අත් ගුත සුණුවිසුණු කිරීම, ලාභයෙන් ලාභය සෙවීම හා ආජීව හේතුවූ සත්වැදෑරුම් කාය වාග් කර්මයන්ගෙන් නැගිටියි. මිථ්‍යා ව්‍යායාම, මිථ්‍යා සති, මිථ්‍යා සමාධීන්ගෙන් නැගිටීම මිථ්‍යා සංකල්ප වුට්ඨානයෙහි කියන ලද ආකාරයෙන්ම දතයුතුය. මිථ්‍යා සති යනු සිහියට විරුද්ධාකාරයෙන් උපදිනු ලබන අකුසල චිත්තොත්පාද මාත්‍රයමය. මතු මාර්ගත්‍රයයෙහි දර්ශනාර්ථයෙන් සම්මා දිට්ඨි යනාදී අට මාර්ගාංගයන්, ප්‍රථමධ්‍යානිකයෝ ප්‍රථම ධ්‍යානයෙහිදී යම්සේ ලබත්ද, එසේම ලබති. එහි ප්‍රථම මාර්ගයෙහි සම්‍යග් දෘෂ්ටිය, මිථ්‍යා දෘෂ්ටිය දුරුකෙරේනුයි සම්‍යග් දෘෂ්ටියි. සම්‍යග් සංකල්පාදීහුද, මිථ්‍යා සංකල්පාදීන්ගේ දුරුකිරීමේ අර්ථයෙන්ම දතයුත්තාහ. මෙසේ ඇතිකල්හි, ප්‍රථම මාර්ගයෙන්ම දෙසැටක් දෘෂ්ටිගතයන්ගේ ප්‍රහීණ වූ හෙයින්, මතු මාර්ගත්‍රයයෙන් ප්‍රහාණය කළයුතු දෘෂ්ටියක් නම් නැත. එහි 'සම්මා දිට්ඨි' යන නම කෙසේ වේද? යම්සේ විෂ ඇතියේ හෝ නොමැතියේ හෝ වේවා, බෙහෙත බෙහෙතමයැයි කියනු ලැබේ. මෙසේ මිථ්‍යා දෘෂ්ටිය ඇතියේ හෝ වේවා, නොමැතියේ හෝ වේවා මෙය සම්‍යග් දෘෂ්ටියම නමැ. ඉදින් එය නාම මාත්‍රයක්ම වේද? මතු මාර්ගත්‍රයයෙහි වනාහි සම්‍යග් දෘෂ්ටියෙහි කෘත්‍යය අභාවයට පැමිණේ. මාර්ගාංග සම්පූර්ණ නොකෙරේ. එහෙයින් සම්‍යග් දෘෂ්ටිය තම කෘත්‍යයන් කළයුතුය. මාර්ගාංග සම්පූර්ණ කළයුත්තාහුය. මෙහි තම කෘත්‍යයන් සම්‍යග් දෘෂ්ටි ලැබෙන අයුරින් දැක්විය යුත්තාහ. මතු මාර්ගත්‍රයයෙන් නැසිය යුතු එක් මානයක් ඇත. එය දෘෂ්ටි ස්ථානයෙහි සිටී. ඕ ඒ මානය දුරුකරන්නීනුයි සම්‍යග් දෘෂ්ටියි. සෝවාන් මාර්ගයෙහිදී

සම්‍යග් දෘෂ්ටිය මිථ්‍යා දෘෂ්ටිය දුරුකරයි. සෝවාන් වූවහුට, සකෘදාගාමි මාර්ගයෙන් නැසිය යුතු මානයක් ඇත. ඒ මානය දුරුකෙරේනුයි සම්‍යග් දෘෂ්ටියි. එහිම සත් අකුසල් සිත් සමග එකට හටගත් සංකල්පයක් ඇත. ඒ සිත් සමග වාචාංග සෙලවීමක් ඇත. ශරීරාංග සෙලවීමක් ඇත. ප්‍රත්‍ය පරිභෝගය ඇත. සහජාත ව්‍යායාමය ඇත. සිහි නැති ස්වභාවය ඇත. එකට හටගත් සිතෙහි එකඟබව ඇත. ඒවා මිථ්‍යා සංකල්පාදීහු නමැ. සකෘදාගාමි මාර්ගයෙහි සම්‍යග් සංකල්පාදීහු, ඒවාහි ප්‍රහාණයෙන් සම්‍යග් සංකල්පාදීන් බවට පත්වේයයි දතයුත්තාහ. මෙසේ සකෘදාගාමි මාර්ගයෙහි අෂ්ටාංගයෝ ස්වකෘත්‍යකාරී වෙති. සකෘදාගාමීහුට අනාගාමි මාර්ගයෙන් නැසියයුතු මානය ඇත. එය දෘෂ්ටි ස්ථානයෙහි සිටියි. එහි සත් චිත්තයන් සමග එකට හටගත් සංකල්පාදීහු ඇත. ඒවාහි ප්‍රහාණයෙන් අනාගාමි මාර්ගයෙහි අෂ්ටාංගයන්ගේ තම කෘත්‍ය කරන ලදැයි දතයුත්තාහ. අනාගාමීහුට අර්හත් මාර්ග වධ්‍ය මානය ඇත. එය දෘෂ්ටි ස්ථානයෙහි සිටී. යම් ඒ පස්වැදෑරුම් අකුසල චිත්තයන් වත්නේද, ඒවා සමග හටගත් සංකල්පාදීහු ඇත. ඒවාහි ප්‍රහාණයෙන් අර්හත් මාර්ගයෙහි අෂ්ටාංගයන්ගේ ස්වකීය කෘත්‍ය කරන ලදැයි දතයුත්තාහ. **ඕළාරිකා** යනු කාය වාක් ද්වාරයන්හි ව්‍යතික්‍රමණයට ප්‍රත්‍යය භාවයෙන් ස්ථූල වූ හෙයින් **කාමරාග සඤ්ඤොජනා** යනු මෛථුනරාග සංඛ්‍යාත සංයෝජනයෙන් එය කාමයන්හි එක්කොට බඳීනුයි සඤ්ඤොජනයයි යූ.සේයි. **පටිඝ සඤ්ඤොජනා** යනු ව්‍යාපාද සංයෝජනයයි. එය අරමුණෙහි හැපේනුයි පටිඝයයි යූ.සේයි. ඒවාම ශක්තිමත් භාවයට පත් අර්ථයෙන් සන්තානයෙහි අත්නොහැර පවත්නා හෙයින් අනුසයයි. **අණු සහගතා** යනු ඉතා කුඩා, සියුම් වූ යන අර්ථයි. මෙහි සහගත ශබ්දය එබැවිහි යන අර්ථයි. සකෘදාගාමිහුගේ කාමරාග ව්‍යාපාද, නිරායාසයෙන් හටගැනීමෙන් නැගී සිටීම මඳ හෙයින්ද යන දෙකරුණින් සියුම් වූවාහුය. ඔහුට අඥාන පෘථග්ජනයාට මෙන් නිතර කෙලෙස් නූපදී. සමහර අවස්ථාවන්හි උපදී. උපදිනුයේද, අඥාන පෘථග්ජනයාට මෙන්, මඩින, පතුරුවන-වසන අන්ධ කරන ස්වභාවයෙන් නූපදී. දෙමගින් ප්‍රහීණ හෙයින්, මන්දමන්දව සියුම් ආකාර වී උපදී. ව්‍යතික්‍රමණයට පමුණුවන්ට සමත් නොවේ. මෙසේ තුනී වූයේ අනාගාමි මාර්ගයෙන් ප්‍රහීණ වේ. **රූපරාගා** යනු, රූපභවයෙහි ඇලීමයි. **අරූපරාගා** යනු, අරූප භවයන්හි ඇලීමයි. **මානා** උඩඟුවීම් ලක්ෂණයයි. උද්ධච්ච යනු නොසන්සුන් ලක්ෂණයයි. **අවිජ්ජාය** යනු, අන්ධ ලක්ෂණයයි. **භවරාගානුසයා** යනු රූපරාග අරූපරාග වශයෙන් භවයන් පිළිබඳව අප්‍රකටව පවත්නා ආශාව.

දැන් මාර්ග ඤාණ සංවර්ණනාව කරනුයේ, අජාතංඣාපෙති ආදිය වදාළහ. එහිද, **අජාතං ඣාපෙති ජාතෙන ඣානං තෙන පවුච්චති** යනුː තම සන්තානයෙහි පහළ වූ ලෝකෝත්තර ධ්‍යානයෙන් ඒහා යුක්ත වූ පුද්ගල තෙමේ, නූපන්නා වූම ඒ ඒ කෙලෙස් දවයි. දහනය කරයි. සිඳ දමයි. ඒ කාරණයෙන් එය ලෝකෝත්තර ධ්‍යානයයි කියනු ලැබේ යයි අර්ථයි. **ඣාන විමොක්ඛ කුසලතා** යනු ඒ ආර්යමාර්ග සම්ප්‍රයුක්ත වූ විතර්කාදී ධ්‍යානයෙහිද, විමෝක්ෂ සංඛ්‍යාත ආර්ය මාර්ගයෙහිද, නුමුලාවීම් වශයෙන් කුසල බව හේතුකොටගෙන, ප්‍රථම මාර්ගයෙන්ම ප්‍රහීණ වූ නොයෙක් දෘෂ්ටීන්හි කම්පා නොවේ. ධ්‍යානය නම් දෙවදෑරුම්ය. ආරම්මණ උපනිධ්‍යානය, ලක්ෂණ උපනිධ්‍යානය වශයෙනි. ලෞකික ප්‍රථමධ්‍යානාදිය කසිණාදී අරමුණු නැවත නැවත සිතන අර්ථයෙන් ධ්‍යාන නමැ. විදර්ශනාව සංස්කාරයන්ගේ ස්වභාව සමාන ලක්ෂණ නැවත නැවත සිතන අර්ථයෙන් ධ්‍යාන නමැ. ලෝකෝත්තරය, නිර්වාණයෙහි සත්‍යය ලක්ෂණ නැවත නැවත සිතන අර්ථයෙන් ධ්‍යාන නමැ. මෙහි වනාහි ගොත්‍රභූ හා සාධාරණ වූ ලක්ෂණ, නැවත නැවත සිතීම් අර්ථය ස්පර්ශ නොකොට, සාධාරණ නොවූ අයුරින් කෙලෙස් දවන අර්ථයෙන් ධ්‍යානයයි යූ.සේයි. මෙහි විමොක්ෂාර්ථය වනාහි නිර්වාණාරම්මණයෙහි මනාව ස්ථිර ලෙස පිහිටන අර්ථයි. කෙලෙසුන්ගෙන් මනාව මිදෙන අර්ථයි. **සමාහිතවා යථාවෙ විපසසති** යනු අර්පණා, උපචාර, ක්ෂණික, සමාධීන් අතර එක්තරා සමාධියකින් පළමුව සිත එක්තැන්කොට පසුව සුදුසු පරිදි විදර්ශනා කරයි. මෙහි 'ච' ශබ්දය එක් කිරීම් අර්ථයි. විදර්ශනාව එක් කරයි. **විපසසමානො තථාචෙ සමාදහෙති** යනු මේ විදර්ශනා නම් රූක්ෂ වූයේ, ආස්වාද රහිතය. සමථය නම් සිනිඳු වූයේ ආස්වාද සහිතය. එහෙයින් විදර්ශනා කරනුයේ, එසෙයින්ම චිත්ත සමාධානයද කරන්නේය. විදර්ශනා කරනුයේ නැවත සමාධියට ප්‍රවිශ්ටව චිත්ත සමාධානය යම්සේ කරන්නේද, එසේම විදර්ශනාවද කරයි යන අර්ථයි. ගාථා බන්ධනයට අනුව චෙකාරය කරන ලදී. අර්ථය චකාරාර්ථය මය. **විපසසනාච සමථො තදා අහු** යනු සමථ විදර්ශනාවන්ගේ එකට බැඳී පවත්නා ස්වභාවය ඇතිකල්හි ආර්ය මාර්ගය පහළවීම වේ. ආර්ය මාර්ගය ඉපදවීමට සමත් හෙයිනි. යම්කලෙක එම ක්‍රම එකට යෙදීම වේද, එකල්හි විදර්ශනාවද, සමථයද වන්නාහුය. සමථ විදර්ශනා වූවාහු නම් වෙතියි අර්ථයි. සමථ විදර්ශනා ආර්ය මාර්ගාභිමුඛ කාලයෙහිද, මාර්ගක්ෂණයෙහිද, **සමානභාගා යුගනද්ධා වත්තරෙ** යනු සමාන වූ, සමවූ භාගයක්, කොටසක් ඒවාටනුයි සමානභාග නම් වේ. වියදණ්ඩහි එකට බඳිනා ලද්දේ මෙන් වූයේනුයි යුගනද්ධායි.

ඔවුනොවුන් නොඉක්මවන අර්ථයෙන් සම වීර්යය, සමබල යන අර්ථයි. මෙහි විස්තරය යුගනද්ධ කථායෙහි ප්‍රකට වන්නේය.

**දුක්ඛා සංඛාරා සුඛො නිරොධොති දස්සනං දුභතො වුට්ඨිතා පඤ්ඤා ඵස්සති අමතංපදං** යනු සංස්කාර දුක්ඛය. නිරෝධ සංඛ්‍යාත නිවන සුවයැයි පිළිපන්නහුට ඉන්වන නිර්වාණ දර්ශන සංඛ්‍යාත ආර්ය මාර්ග ඤාණය, දෙකින් නැගී සිටුනා ලද ප්‍රඥාව නමැ. එම ප්‍රඥා තොමෝ අමෘත පද නිර්වාණය අරමුණු ස්පර්ශයෙන් ස්පර්ශ කරයි. ලබයි යන අර්ථයි. නිර්වාණය වනාහි නොතැවෙන අර්ථයෙන් අමෘතය හා සමානනුයි අමතංයි. මළ, මැරුණු, විනාශය මෙයට නොමැත්තේනුයි අමතංයි. පූර්වභාගයෙහි පටන් මහත් උත්සාහයෙන් මහත් ප්‍රතිපදාවෙන් පිළිපදී. පිළිපදීනුයි පදයයි යූ.සේයි. **විමොක්ඛ චරියං ජානාති** විමෝක්ෂ ප්‍රවෘත්තිය මුළා නොවීම් වශයෙන්, දැනගනී. ප්‍රත්‍යවේක්ෂා වශයෙන් දැනගනී. දෙඅයුරින් නැගී සිටුනා විමෝක්ෂය, දෙඅයුරින් නැගී සිටුනා සිව් විමෝක්ෂයන්, දෙඅයුරින් නැගිටීම්වලට අනුලොම් සිව් විමෝක්ෂයන් දෙඅයුරින් නැගී සිටුනා සන්සිඳීම් සිව් විමෝක්ෂයන්දැයි, මතු විමෝක්ෂ කථායෙහිම පැමිණි විමෝක්ෂ චර්යා දතයුත්තාහ. එහි විස්තර එහිම ආයේය. **නානත්ත එකත්ත කොවිදො** යනු ඒ විමෝක්ෂයන්ගේ නානත්වයෙහිද, ඒකත්වයෙහිද, දක්ෂතාව දෙඅයුරින් නැගී සිටුනා විමෝක්ෂ වශයෙන් ඒවාහි ඒකත්වයද, චතුරාර්ය සත්‍ය මාර්ග වශයෙන් නානත්වයද, එක් එක් ආර්ය මාර්ගයෙහි නැවත නැවත බලන භේදයෙන් නානත්වයද, ආර්ය මාර්ග භාවයෙන් ඒකත්වයද දතයුතුය. **ද්විත්තං ඤාණානං කුසලතා** යනු දර්ශන සංඛ්‍යාත වූද, භාවනා සංඛ්‍යාත වූද, මේ ඤාණ ද්වයාගේ නිපුණතායෙන්; දස්සනං යනු සෝවාන් මාර්ගයයි. එය පළමුවෙන් නිර්වාණය දක්නා හෙයින් දස්සන යයි යූ.සේයි. ගෝත්‍රභූ ප්‍රථමයෙන්ම නිර්වාණය දකියි. යම්සේ වනාහි කිසියම් කළයුතු දැයක් සඳහා පැමිණි පුරුෂයා දුරින් ඇතුපිට නැගී, රථයෙහි සරණ, රජු, දිටියේ නමුත්, නුඹ රජ දිටීදැයි විමසන ලදුයේ, දැක කළයුතු කෘත්‍යය නොකළ හෙයින් නොදකිමියි කීයේය. එපරිද්දෙන්ම නිර්වාණය දැක කළයුතු කෙලෙස් ප්‍රහාණයාගේ අභාවය හෙයින් දර්ශනය නොවේයයි කියනු ලැබේ. එම ඤාණය මාර්ගයාගේ ආවර්ජන ස්ථානයෙහි සිටියි. **භාවනා** යනු සෙසු මාර්ගත්‍රයයි. එය ප්‍රථම මාර්ගයෙන් දුටුවා වූම ධර්මයෝ භාවනා වශයෙන් උපදිති. නොදුටුවීරූ කිසිවක් නොදකියි. එහෙයින් භාවනායයි යූ.සේයි. යට භාවනා මාර්ගයාගේ නොනිමි හෙයින් ද්වි ඤාණයන්ගේ යයි නොකියා,

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි මාර්ගලාභීන් සඳහා ධ්‍යාන විමෝක්ෂයන්හි දක්ෂතාවයයි යූ.සේයි. අර්හත් මාර්ගලාභීන් භාවනා මාර්ගයාගේ නිම් හෙයින්, ද්විඤාණයන්ගේ දක්ෂතාවයයි. යූ.සේයි.

## මාර්ගඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

ඵලඤාණ නිර්දේශයෙහි, **තං පයොග පටිපපසද්ධතතා** යනු ආධ්‍යාත්මික හා පිටත නැගීසිටීම් ප්‍රයෝගයාගේ සන්සිඳුණු හෙයිනි. මාර්ගය ස්වකීය ක්ෂණයෙහි කෙලෙස් ප්‍රහාණයෙන් දෙඅයුරින් නැගිටීම් කරයි නමැ. ඵල ක්ෂණයෙහි ක්ලේශයන්ගේ ප්‍රහීණ බැවින්, මාර්ගයාගේ දෙඅයුරින් නැගිටීම් ප්‍රයෝග සංසිඳවූ හෙයින් සන්සිඳුණේ නම් වේ. **උපපජ්ජති** යනු මාර්ගයට අනතුරුව වරක් හෝ දෙවරක් උපදියි. ඵලසමවත් කල්හි බොහෝවරක්ද, නිරෝධයෙන් නැගිටින්නහුට, දෙවරක් උපදී. ඒ සියල්ලම ප්‍රයෝග සන්සිඳුණු හෙයින් උපදී. **මගගසෙසතං ඵලං** යනු ඵලය අපේක්ෂාකොට නපුංසක වචනය කරන ලදී. සකෘදාගාමී මාර්ගක්ෂණයන්හිදීද, එක් එක් මාර්ගාංග වශයෙන්ම නැගිටීම් යෙදීම් දතයුත්තාහ.

## ඵල ඤාණ නිර්දේශ වර්ණනා නිමි.

විමුක්ති ඤාණ නිර්දේශයෙහි, **සකකාය දිටඨි** යනු විද්‍යමානාර්ථයෙන් පවතින, ස්කන්ධ පංචකයයි කියනු ලබන ශරීරයෙහි දෘෂ්ටියනුයි සකකාය දිටඨියි. **විචිකිචඡා** යනු පහවූ පිළියම් ඇත්තේනුයිද, ස්වභාවය හෝ සොයන්නේ එයින් වෙහෙසේ ක්ලාන්ත වේනුයි විචිකිචඡායි. **සීලබබත පරාමාසො** යනු සීලයෙන් පිරිසිදු වෙයි. ව්‍රතයෙන් පිරිසිදු වෙයි. සීල ව්‍රතයෙන් පිරිසිදු වේයයි තදින් පිහිටුවාගත් ඇල්ම, එය ස්වභාවය ඉක්මවා ඔබ්බෙහි ස්පර්ශ කෙරේනුයි පරාමාසයි. ද්වයයෙහි සමානතාව වූයේද, දෘෂ්ටි භාවයෙහි, තර්කයද අන්‍යෝපදේශද හැර ප්‍රකෘතියෙන්ම සක්කාය දෘෂ්ටි ග්‍රහණයෙන්, ප්‍රකෘති ස්වභාව වූ, විසිවැදෑරුම් සක්කාය දෘෂ්ටියෙහි ප්‍රහාණයෙන්ම සියලු දෘෂ්ටි ප්‍රහාණ දැක්වීම සඳහා සක්කාය

දෘෂ්ටිය යූ.සේයි. සීලබ්බත පරාමාසය වනාහි සුද්ධි ප්‍රතිපදාවට ඇතුල් වෙන්නෙමුයි, පිළිපන්නවුන්ගේ ප්‍රතිපදාවන්ගේ මිථ්‍යාභාවය දැක්වීම සඳහා වෙන්ව යූ.සේයි.

ත්‍රයයෙහිම අනුසය ප්‍රහාණයෙන්ම ප්‍රහාණය දක්වන්ට, දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො'යි යූසේයි. කෙලෙස් බැවින් වෙන්ව නොගන්නා ලදී. **උපක්කිලෙසා** යනු අපවිත්‍ර කරත්, තවත් බාධා කරත්නුයි කිලෙසායි. ශක්තිමත් වූ අර්ථයෙන් බොහෝ කෙලෙස්නුයි උපක්කිලෙසයි. **සම්මා සමුච්ඡින්නා හොන්ති** යනු සමුච්ඡේද ප්‍රහාණයෙන්, අනුත්පාද නිරෝධයෙන් මනාව විනාශ කරන ලද්දාහු වෙති. **සපරියුට්ඨානෙහි** යනු සිත හාත්පසින් වෙළන ලද්දාහු නැගී සිටිති. උපදිත්නුයි පරියුට්ඨානානියි. නිතර පවත්නා කෙලෙසුන්ට මෙය විශේෂ නාමයකි. වෙළීම් සහිත වූයේ සපරියුට්ඨානානියි. ඒ සපරියුට්ඨානයන්ගෙන්, අනුසහගතව පැවති කෙලෙසුන්ගෙන් සිත මිදුණේ වේයයි, ඒවාහි ඉපැත්ම අයෝග්‍ය හෙයින් නොකඩවා පැවතීම් වශයෙන් පවතිනු ලබන සිත ඉන් මිදුණේ නම් වේ. එයම මනාව මිදුණු හෙයින් සුවිමුත්තංයි **තං විමුත්ති ඤාතට්ඨෙන** යනු ඒ විමුක්තියගේ දැනීම් අර්ථයෙන්

විමුක්තිඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

ප්‍රත්‍යවේක්ෂා ඤාණ නිර්දේශයෙහි, මාර්ගක්ෂණයෙහිම, හේතු අර්ථයෙන් පළමුව මාර්ගාංගයන් වෙන් වෙන්ව කියා, නැවත මාර්ගාංග වූද, මාර්ගාංග නුවූද ධර්මයන්, අවබෝධ කිරීම් අර්ථයෙන් බෝධියැයි ලද නම් ඇති ආර්යයාගේ අංගභාවයෙන් බොජ්ඣංග මාර්ගාංගමය. ප්‍රීති, පස්සද්ධි, උපෙක්ෂා, සම්බොජ්ඣංග මාර්ගාංග නොවූවාහුය. නැවත බල වශයෙන්ද, ඉන්ද්‍රිය වශයෙන්ද, වෙනම දක්වන ලද, ශ්‍රද්ධාවම අමාර්ගාංග වූවාහුය. නැවත මාර්ගක්ෂණයෙහි හටගත්තා වූම ධර්මයන් රාශි වශයෙන්, දක්වන්නේ 'ආධිපතෙය්‍යට්ඨෙන' ආදිය වදාළහ. එහි **උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා** යනු තනි නිර්වාණාරම්මණ වූවාහු, කාය, වේදනා, චිත්ත, ධර්මයන්හි, සුභ, සුඛ නිත්‍ය ආත්ම සංඥා ප්‍රහාණ කෘත්‍ය සාධක වශයෙන් සිව් සතිපට්ඨාන නමැ. නිර්වාණාරම්මණ එකක්ම වූ වීර්යය උපන්නා වූද, නූපන්නා වූද අකුසලයන්ගේ, ප්‍රහාණ, නූපදීම් කෘත්‍යයාගේද, නූපන්නා වූ හෝ උපන්නා වූ කුසලයන්ගේ උත්පාද,

ස්ථිති කෘත්‍යයාගේ සිදුකිරීම් වශයෙන් සිව් සම්‍යක් ප්‍රධන් නමැ. **තථටෙඨන සච්චා** යනු දුක්භාවාදීන්හි බොරු නොවීම් අර්ථයෙන් සිව් අරිසස් ඒවාම මෙහි ප්‍රතිවේධාර්ථයෙන්, ඒ මාර්ග-ඵල ලක්‍ෂණයෙහි ප්‍රතිලාභ ප්‍රතිවේධ වශයෙන් පැමිණි, නිවනට බැසගත් නිර්වාණයයි වෙන්ව කියන ලද නිර්වාණයද, සෙසු ධර්ම ප්‍රතිලාභාර්ථයෙන් ඒ මාර්ග ඵල ලක්‍ෂණයෙහි ප්‍රතිලාභ ප්‍රතිවේධ වශයෙන් පැමිණියාහු සත්‍යාර්ථයෙන් සත්‍යය. තදා සමුදාගතා යන වචනයෙන් මාර්ගඵල අවසානයෙහි, ඒකාන්තයෙන් සිව්සස් ප්‍රත්‍යවේක්‍ෂා කෙරේයයි, මෙහි නිෂ්ඨාවට යායුතුය.

'කළයුත්ත කරන ලදී. මතු ආත්මභාවය සඳහා අන් කිසිවක් නැතැයි දනී යන වචනයෙන්, මා විසින් දුක සම්පූර්ණයෙන් දැනගන්නා ලද්දේය. මාගේ දුක හටගැන්ම ප්‍රහීණය. මා විසින් දුක් නිරෝධය අවබෝධ කරන ලද්දේය. මාර්ගයද මා විසින් වඩන ලද්දේයයි ප්‍රත්‍යවේක්‍ෂණ කියන ලද්දේම වේ. එසේ ප්‍රත්‍යවේක්‍ෂණය යෙදේ. මෙහි සමුදය යනු ඒ ඒ මාර්ගයෙන් නැසිය යුතු දැයම දතයුතුය. මෙහි කියන ලද සමුදය ප්‍රත්‍යවේක්‍ෂා වශයෙන්ම අටඨකථාවන්හි කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂණය, මාර්ගඵල නිර්වාණ ප්‍රත්‍යවේක්‍ෂණයයි දෙවැදෑරුම්ය. මෙහි ස්වරූපයෙන්ම ගෙනඑන ලදැයි යු.සේයි. හුදෙක් දුක් ප්‍රත්‍යවේක්‍ෂාවම නොකියන ලදී. කිසිසේත් නොකියන ලදී. තවද, වාක්‍ය හටගැනීමෙන්ද, යුක්ති යෙදෙන හෙයින්ද ගතයුතුමය. සත්‍යය ප්‍රතිවේධාර්ථයෙහි පිළිපන්නහුට, සත්‍යය ප්‍රතිවේධය නිමිකල්හි, තමා කළකිස ප්‍රත්‍යවේක්‍ෂා කිරීම යෙදේමය. අවික්ෂෙපාර්ථයෙන් සමථයයි ආදී මාර්ග සම්ප්‍රයුක්ත වූම සමථ විදර්ශනා ධර්මයන් ඒක රසාර්ථයෙන්ද, නොඉක්මවීම් අර්ථයෙන්ද දක්වන්ට යුසේයි. **සංවරටෙඨන සීල විසුද්ධි** යනු සම්‍යග් වාචා, සම්‍යග් කර්මාන්ත, සම්‍යග් ආජීවයන්මය. **අවික්ඛපටෙඨන චිත්ත විසුද්ධි** යනු සම්‍යග් සමාධියමය. **දස්සනටෙඨන දිට්ඨි විසුද්ධි** යනු සම්‍යග් දෘෂ්ටියමය. **විමුත්තටෙඨන** යනු මුළුමනින් නැසීම් වශයෙන් මාර්ගයෙන් නැසිය යුතු කෙලෙසුන්ගෙන් මිදීම් අර්ථයෙන්, නිර්වාණාරම්මණයෙහි ස්ථිර ලෙස පිහිටීම් අර්ථයෙන්, විමොක්ඛො යනු කෙලෙසුන් මනාසේ නැසීම් වශයෙන් මිදුණු ආර්ය මාර්ගයමය. **පටිවෙධටෙඨන විජ්ජා** යනු සත්‍යය ප්‍රතිවේධාර්ථයෙන් විද්‍යාවයි. සම්‍යග් දෘෂ්ටියමය. **පරිච්චාගටෙඨන විමුත්ති** යනු මාර්ගයෙන් නැසිය යුතු කෙලෙසුන්ගේ දුරලීම් අර්ථයෙන්, ඉන් මිදෙන හෙයින් විමුක්තියි. ආර්ය මාර්ගයමය.

**සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං** යනු කෙලෙස් විනාශ කරන අර්ථයෙන් කෙලෙස් ක්ෂය කරන ආර්ය මාර්ග ඥාණයයි. සම්‍යග් දෘෂ්ටියමය. ඡන්දාදීහු යට කියන ලද අයුරින්ම දතයුත්තාහ. හුදෙක් මෙහි මාර්ගක්ෂණයෙහිම මාර්ගයාගේ මුල, මැද, අග ආකාරයෙන් දක්වන ලදහ. **විමුත්ති** යන මෙහි මාර්ග විමුක්තියමය. සත්‍යාර්ථයෙන් සත්‍යයි. මෙහි නිර්වාණය ගන්නා ලද්දේම වේ. මෙහි අවසන් බව දැක්වීම සඳහා නැවත කියන ලදැයි දතයුතුය. ඵල ලක්ෂණයෙහිද එම ක්‍රමයමැයි. මෙහි වනාහි, **හෙතට්ඨෙන මග්ගො** යනු ඵල මාර්ග භාවයෙන්ම, **සම්මප්පධානානි** යනු මාර්ග ක්ෂණයෙහි, සිව්කිස් සාධක වීර්ය කෘත්‍ය ඵලයෙහි, උපදනා ක්ෂණයෙහි සිද්ධ හෙයින් යයි යූ.සේයි. අන් ආකාරයකින් ඵල ලක්ෂණයෙහි සම්‍යක් ප්‍රධානයෝ නොලබත්මය. මාර්ග ක්ෂණයෙහි සත්තිස් බෝධිපක්ෂික ධර්මයන් උදුරා දක්වන තෙරුන් විසින් යූ.සේයි. ඵල ලක්ෂණයෙහි සතර සම්‍යක් ප්‍රධානයන් හැර සෙසු තෙතිස් ධර්ම ලබතියි එපරිද්දෙන්ම ප්‍රතිවේධ කෘත්‍යාදිය සිදුවීම් වශයෙන්, සත්‍යාදීන්ද සුදුසු පරිදි දතයුත්තාහ. විමොක්ඛො යනු ඵල විමෝක්ෂයයි. විමුත්ති යනු ඵල විමුක්තියයි. සන්සිඳීම් අර්ථයෙන් අනුත්පාදයෙහි ඥාණය කියන ලද අර්ථයමය. **වුට්ඨහිත්වා** යනු අතරෙහි නැගිටීම් අභාවයෙන් ඵල වශයෙන් යූසේයි. **ඉම ධම්මා තදා සමුදාගතා** යනු මේ කියන ලද ධර්මයන් මාර්ගක්ෂණයෙහිද ඵල ක්ෂණයෙහිද, හටගත්තාහු යයි ප්‍රත්‍යවේක්ෂා කෙරේ.

### ප්‍රත්‍යවේක්ෂා ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.

වත්ථු නානත්ත ඥාණ නිර්දේශයෙහි, **චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති** යනු අධ්‍යාත්ම වූ ඇස පිරිසිඳ දනී. යම්සේ හෙතෙම පිරිසිඳ දනීද? එසේ කියනු කැමැත්තේ, 'කථං චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති'යි විචාරා නැවත ඇස අවිද්‍යාවෙන් හටගත්තේ යැයි නිශ්චය කරයි ආදියෙන් නිශ්චය කරන ආකාරය දැක්වීය. එහි අවිද්‍යා, තෘෂ්ණා, අතීත උපස්ථම්භක හේතුයි. කර්මය අතීත උපදවන හේතුයි. ආහාරය වර්තමාන උපස්ථම්භක හේතුයි. එයින් ඇසට උපස්ථම්භක වූ ඍතු චිත්තයන් ගන්නා ලද්දේම වෙති. **චතුන්නං මහාභූතානං උපාදාය** යනු ද්විතියාර්ථයෙහි ෂෂ්ඨයි. සතර මහා භූතයන් දැඩිසේ ගෙන පවතිත් යන අර්ථයි. එයින් ප්‍රසාද චක්ෂුභාවය දක්වන ලද්දේ වේ. සසම්භාර භාවය ප්‍රතික්ෂෙප කරන ලදී. **උප්පන්නං** යනු

කාල, නොකඩවා පැවතීම් ක්‍ෂණ වශයෙන් උපන්, **සමුදාගතං** යනු හේතුයෙන් හටගත්, මෙතෙකින් විදර්ශනා පූර්වභාග චක්‍ෂු ව්‍යවස්ථානය දක්වන ලදී. **අහුත්වා සමභූතං** ආදීන්හි අනිත්‍යානු පස්සනාවෙන් ඇස, හටගැනීමෙන් පෙර අවිද්‍යමානත්වයෙන් නොවී හටගති. ව්‍යයයෙන් මත්තෙහි අභාව හෙයින්, තිබී නොවන්නේය. **අනතවනතතො** අන්තය මෙයට ඇත්තේනුයි - අනතවායි. අන්තවත් වූයේම අනතවනෙතායි. සතිමනෙතා, ගතිමනෙතා, ධිතිමනෙතා ආදිය මෙනි. ඒ අන්තවත් භාවයෙන්, අවසානය විද්‍යමාන හෙයින් **අද්ධුවං** යනු සියලු අවස්ථාවන් බිඳවැටෙන හෙයින් ස්ථිරභාවය නොමැති හෙයින් ස්ථිර නොවේ. **අසසසතං** යනු නිත්‍ය නොවේ. **විපරිණාමධමමං** යනු ජරායෙන්ද, මරණයෙන්ද යන දෙයාකාරයෙන් වෙනස්වීම ස්වභාවකොට ඇත. 'චකඛුං **අනිච්චං, චකඛුං අනිච්චතො**' ආදිය කියන ලද අර්ථයි. **මනො** යන්නෙන් භවංග මනස අදහස් කරන ලද හෙයින්, **අවිජජා සමභූතො** ආදිය යෝග්‍යයි. **ආහාර සමභූතො** යන මෙහි එකට යෙදුණු ස්පර්ශාහාර, මනො සඤ්චෙතනාහාර වශයෙන් දතයුතුය. **උපපනෙනා** යනු කාල හා සන්තති වශයෙන්.

### චක්‍ඛුනානත්ව ඤාණ නිර්දේශ වර්ණනා නිමි.

ගොචර නානත්ව ඤාණ නිර්දේශයෙහි, රූපෙ බහිද්ධා වවත්ථෙති යනු අධ්‍යාත්මයෙන් පිටත වූ රූපායතන ධර්මයන් නිශ්චය කෙරේ යන අර්ථයි. අවිජජා සමභූතා යන ආදිය ආත්මභාවයට ඇතුළත් කර්මජ රූපය බැවින් යයි යූ.සේයි. ආහාරයද, කර්මජ රූපයට උපස්ථම්භක ප්‍රත්‍යය වේ. ශබ්දය, ඍතු, චිත්ත සමුට්ඨාන හෙයින් අවිද්‍යාවෙන් හටගත් ආදී චතුෂ්කය නොකියන ලදී. ස්පර්ශයන්ගේ ස්වයං මහාභූත හෙයින් චතුනනං මහාභූතානං උපාදායයි නො යූසේයි. **ධමමා** යන මෙහි භවංග සිත හා යෙදුන ත්‍රිවිධ අරූප ස්කන්ධයන්ද, ධර්මායතනයට ඇතුළත් සියුම් රූපද කර්මයෙන් හටගත් සියලුම රූපයන්ද, තවද යම් යම් රූප යම් යම් හේතුවකින් හටගනිත්ද, ඒ ඒ රූප ඒ ඒ හේතුවෙන් යයි දතයුත්තාහ. අනෙක් අතට, ස්වකීය සන්තානයට ඇතුළත් වූ රූපාදී සියලු ධර්මයන් ඇතුළත් නොකරන්නාහුය. අනින්ද්‍රිය බද්ධ රූපාදීහුද විදර්ශනාවටම ඇතුළත් වූවාහුය. එහෙයින් ඒවාහි කර්මයෙන් හටගත් (යන) පදයෙහි ඇතුළත්ය. ඒවාද සියලු සත්ත්වයින්ට සාධාරණ කර්මප්‍රත්‍ය ඍතු

සමුට්ඨානයි. අනෙක් ඉන්ද්‍රියබද්ධ නුවූ රූපාදීහු විදර්ශනාවට ඇතුළත් නුවූවාහුයයි කියති. එය

**සබෙබ සංඛාරා අනිචචාති - යදා පඤඤාය පසසති**
**අථ නිබබිනදතී දුකෙඛ - එසමගෙගා විසුදධියා**

සියලු සංස්කාර අනිත්‍යයෝයි, යම්කලෙක නුවණින් දකීද, එකල්හි දුකෙහි කලකිරේ. එය විසුද්ධියෙහි මාර්ගයයි (නිවණෙහි මගයි) යනාදිය පෙළට විරුද්ධ වේ. විසුද්ධි මාර්ගයෙහි කියන ලදී. මෙ සස්නෙහි ඇතමෙක් මුලදීම අධ්‍යාත්ම සංස්කාරයන්හි ප්‍රවිෂ්ටව විදර්ශනා කරයි. පිරිසිදු අධ්‍යාත්ම දර්ශන මාත්‍රයෙන්ම මාර්ග වුට්ඨානය නොවේද? පිටතද බැලිය යුතුමය. එහෙයින් තමාගේ යයි සිතා නොගත් අන්‍යයාගේ සංස්කාරයන් කෙරෙහිද, අනිත්‍ය, දුක්, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි. එහෙයින් අන්‍යයාගේ චක්ෂුරාදීන්ගේ නිශ්චය, ඉන්ද්‍රියබද්ධ නුවූ රූපාදීන්හි නිශ්චයද කැමතිවිය යුතුමය. (කළයුතුමය) එහෙයින් ත්‍රෛභූමික සංස්කාරයන්හි විදර්ශනාවට නොඑළඹෙන්නක් නම් නැත.

ගෝචර නානත්ව ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.

චර්යා නානත්ව ඥාණ නිර්දේශයෙහි, **විඤ්ඤාණචරියා** ආදීන්හි අරමුණෙහි හැසිරේනුයි චර්යායි. විඤ්ඤාණයම චර්යා වූයේනුයි විඤ්ඤාණ චර්යායි. නොදැන්මෙන් හැසිරීම, නොදැන්මෙන් හැසිරෙයි හෝ දත් දැහි හැසිරීම හෝ අඥානයන්ගේ හැසිරීම හෝ **අඤ්ඤාණචරියායි.** ඥාණයම චර්යාව වූයේ **ඤාණචරියායි.** ඥාණයෙන් හෝ හැසිරෙයි. දත් දැහි හෝ හැසිරේ. ඥාණයාගේ හැසිරීම නුයි ඥාණ චර්යායි. **දසසනත්ථාය** යනු රූප දර්ශනය සඳහා පැවති. **ආවජජන කිරියා බ්‍යාකතා** යනු භවංග චිත්ත පරම්පරාවෙන් ඉවත්කොට, රූපාරම්මණයෙහි, සිත් පරම්පරාව ආවර්ජනා කෙරෙයි නමයිනුයි ආවජ්ජනංයි. විපාක අභාවයෙන් කිරීම් මාත්‍ර යනුයි කිරියායි. කුසල් අකුසල් වශයෙන් ප්‍රකාශ නොකළේනුයි අබ්‍යාකතයි.

**දසසනත්ථො** යනු එයින් දකිති. තෙමේ හෝ දකියි. දර්ශන මාත්‍රයම හෝ එයනුයි දසසනංයි. දර්ශනයම අර්ථය දසසනත්ථොයි. **චකඛු විඤ්ඤාණං**

යනු කුසල විපාක හෝ අකුසල විපාක. දිට්ඨත්තා යනු නොදක්නා ලද්දෙහි ප්‍රතිග්‍රහණයෙහි අභාවය හෙයින් චක්ෂුර් විඥාණයෙන් රූපාරම්මණයෙහි දිටි බැවින්. **අභිනිරොපනා විපාක මනොධාතු** යනු දිටි අරමුණෙහිම නගීනුයි > අභිනිරෝපනායි. දවි විපාක සම්පටිච්ඡන මනෝධාතුයි. **අභිනිරොපිතත්තා** යනු රූපාරම්මණයෙහි නැගි හෙයින් **විපාක මනො විඥාණ ධාතු** යනු දවි විපාක සන්තීරණ මනෝ විඥාණ ධාතුයි. සෝතද්වාරාදීන්හිද එම ක්‍රමයමැයි. සන්තීරණාන්තරව වොත්ථපන නොකියන ලද්දේද අටුවා ඇදුරන් විසින් කියන ලද හෙයින් ලැබෙතියි ගතයුතුය. **විජානනත්ථාය** යනු ධර්මාරම්මණයෙහිද, රූපාදී ආරම්මණයාගේ දැනගැනීම සඳහා. **ආවජ්ජන කිරියා බ්‍යාකතා** යනු මනෝද්වාරාවර්ජන සිතයි. **විජානනත්ථො** යනු ඉන් අනතුරුව ජවන වශයෙන් ආරම්මණයාගේ දැනගන්නා වූම අර්ථයයි. අනෙකක් නොවේ. මත්තෙහි අකුසල ජවනයන්ගේද, විදර්ශනා මාර්ගඵල ජවනයන්ගේද, වෙන්ව කියන ලද හෙයින් සෙසු ජවනයෝ මෙහි ගතයුතු වන්නාහුය.

'කුසලෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඥාණ චරියා' ආදී වචනයෙන් හසිතෝත්පාද චිත්ත ජවනයම ගතයුතුය. ෂට් ද්වාරයන්හි අහේතුක චිත්තයන් කියන ලද හෙයින් ආවර්ජන ද්වයද, දෙපස් විඥාණයන්ද, සම්පටිච්ඡන ද්වයයද, සන්තීරණත්‍රයද, එක් හසිතෝත්පාද සිතද යන අටළොස් අහේතුක සිත්ම විඥාණචරියා යැයි දතයුත්තාහ. දැන් අරමුණ දැනගැනීම් මාත්‍රාර්ථයෙන් විඥාණ චර්යායැයි **නීරාගා චරතී** ආදිය වදාළහ. විඥාණය වනාහි, රාගාදීන්ගේ එක්වීමෙහිද, ශ්‍රද්ධාදීන්ගේ එක්වීමෙහිද පැතිර මැඩීමට පමුණුවයි. ඒවා නැතිකල්හි ස්වකීය අවස්ථායෙහිම සිටී. එහෙයින් නිරාගාදී වචනයෙන් ඒ කියන ලද විඥාණයන්ගේ විඥාණ කෘත්‍ය මාත්‍රය දක්වයි. එයට රාගය නැත්තේ යයි නීරාගායි. එය වනාහි ඇලීම් වශයෙන් **රාගොයි.** අනෙක්වාහි දූෂ්‍යවීම් වශයෙන් **දොසොයි.** මුළාවීම් වශයෙන් **මොහොයි** හැඟීම් වශයෙන් **මානොයි.** විපර්යාස වූ දර්ශන වශයෙන් දිට්ඨියි. උඩට එසවූ, නොසන්සුන් බව **උද්ධච්චංයි.** අත්නොහැර පවතින්නුයි **අනුසයායි.** නිරනුසයායි කිවයුතු කල්හි නානුසයායි යූ.සේයි. අර්ථය එකමය. මෙහි නැගී සිටීමට පත්වූවන්ගේම අභාවය දතයුතුය.

විඥාණචර්යාව ප්‍රහීණ වූ අනුසයන්ගේම වශයෙන් නොකියන ලදී. යම් නිරාගාදීහු කාම, රාග සහිතාදියෙන් වෙන් වූයේම නම් වේයයි,

පිළිවෙළ අන්තරය දක්වන්ට 'රාග විප්පයුත්තා' ආදිය වදාළහ. නැවත අන්‍යයන්ගෙන්ද වෙන්වීම් ස්වභාවය දක්වන්ට 'කුසලෙහි කම්මෙහි' ආදිය වදාළහ. කුසලයන්ම රාගාදී දෝෂයන් නොමැති හෙයින් **අනවජ්ජානියි.** පිරිසිදු බව හටගන්වන හිරි ඔත්තප්පයන්ගෙන් යුක්ත බැවින් **සුක්කානියි.** පැවැත්ම සුව හෙයින්, සුව හටගැන්ම, ඉපැත්ම මේවාටනුයි සුඛුද්‍රයානියි. සුවවිපාක හෙයින් හෝ සුව හටගැන්ම වර්ධනය මේවාටනුයි සුඛුද්‍රයානියි. කියන ලද්දට විරුද්ධාකාරයෙන් අකුසලයන් යෙදිය යුත්තාහ. **විඤ්ඤාතෙ චරති** යනු විඤ්ඤාණයෙන් අවබෝධ කරනු ලබන අරමුණ විඤ්ඤාත නමැ. ඒ අවබෝධ කළ අරමුණෙහි, කුමක් කියන ලද්දේ වේද? නිල් වර්ණ යෙදීමෙන් නිල් වස්ත්‍රය මෙන්, විඤ්ඤාණ යෝගයෙන් අවබෝධ කරන ලද්දේ විඤ්ඤාණ නමැ. ඒ අවබෝධයෙහි හැසිරේනුයි **විඤ්ඤාණ චරියායි** යූ.සේයි. **විඤ්ඤාණස්ස එවරූපා චරියාහොති** යනු කියන ලද ආකාර ඇති විඤ්ඤාණයට කියන ලද ආකාර චර්යා වේයයි අර්ථයි. 'විඤ්ඤාණයාගේ චර්යායයි' ව්‍යවහාර වශයෙන් කියනු ලැබේ. විඤ්ඤාණයෙන් වෙන්වූ චර්යා නැත. **පකති පරිසුද්ධමිදං චිත්තං නික්කිලෙසට්ඨෙන** යනු මේ කියන ලද ආකාර ඇති සිත රාගාදි කෙලෙස් අභාවයෙන් ප්‍රකෘතියෙන්ම පිරිසිදුය. එහෙයින් දැනගන්නා මාත්‍රයම චර්යාව යැයි විඤ්ඤාණ චරියායි යූසේයි. නික්කිලෙසට්ඨෙන යනු ද පාඨයි.

**අඤ්ඤාණ චරියාය මනාපිකෙසු** යනු සිතෙහි පැමිණෙති. පහදිති. සිත හෝ පමුණුවති. වඩ්ඪන්තුයි මනාපානියි. එම මනාප දැහි; ඒවා ප්‍රිය වූයේ හෝ වේවා අප්‍රිය වූයේ හෝ වේවා ග්‍රහණ වශයෙන් මනාප වූවාහු වෙති. කැමති දැහි පමණක් රාගයද, අකමැති දැහි පමණක් ද්වේෂයද උපදිනුයේ නොවේ. **රාගස්ස ජවනට්ඨාය** යනු නොකඩවා පැවතීම් වශයෙන් රාගයාගේ ජවනය සඳහා පැවැති. **ආවජ්ජන කිරියාබ්‍යාකතා** යනු චක්ඛු ද්වාරයෙහි නුනුවණින් මෙනෙහි කිරීමෙන් හටගත්, ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත මනෝධාතුයි. **රාගස්ස ජවනා** යනු බොහෝසෙයින් සත්වරක් රාගයෙහි පැවැත්ම, නැවත නැවත පැවති රාගයම අඥාන චර්යාව යයිද, නොදැනීමෙන් වන රාගයෙහි චර්යාව යැයිද යූ.සේයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **තදුභයෙන අසමපෙක්ඛනස්මිං වත්ථුස්මිං** යනු රාග ද්වේෂ වශයෙන් සලකා බැලීම් විරහිත රූපාරම්මණ සංඛ්‍යාත වස්තුයෙහි, **මොහස්ස ජවනට්ඨාය,** විචිකිච්ඡා, උද්ධච්ච වශයෙන් මෝහයෙහි ජවනය සඳහා, **අඤ්ඤාණ චරියා** යනු නුනුවණෙහිම චර්යාවයි. අනෙකක් නොවේ. **විනිබන්ධස්ස** යනාදිය මානාදීන්ගේ ස්වභාව හඟවන වචනයෝය. එහි

විනිබන්ධස්ස යනු ඉහළ නැගීම් වශයෙන් බැඳී සිටි මානයාගේ; **පරාමට්ඨාය** යනු රූපයාගේ අනිත්‍යභාවාදිය ඉක්මවා මත්තෙහි නිත්‍ය භාවාදිය ස්පර්ශකොට ගන්නා ලද්දෙහි, **වික්ඛෙපගතස්ස** යනු රූපාරම්මණයෙහි වික්ෂෙපභාවයට ගියාවූ. **අනිට්ඨංගතාය** සනිටුහන් නොකිරීම් ස්වභාවයට පත් - ථාමගතස්ස යනු ඵලප්‍රාප්ත. **ධම්මෙසු** රූපාදීන්හි හෝ ධර්මාරම්මණ වූ ධර්මයන්හි, රාගාදීහු නොදැනීමෙන් වෙත්ද? එහෙයින් රාගාදී සම්ප්‍රයෝගයෙන් නොදැනීම විශේෂයෙන් දක්වන්නේ, 'සරාගා චරති' ආදිය වදාළහ. එහි **සරාගා චරති** යනු මෝහ, මාන, දෘෂ්ටි අනුසයන්ගේද, අවිද්‍යානුස ජවන වශයෙන් චර්යා දතයුත්තාහ. **සදොසා චරති** යනු මෝහ, අවිද්‍යානුසය ජවන වශයෙන්, **සමොහා චරති** යනු රාග, ද්වේෂ, මාන, දෘෂ්ටි, උද්ධච්ච, විචිකිච්ඡා, අනුසය වශයෙන් **සමානා චරති** යනු රාග, මෝහ, කාම රාග, භවරාග, අවිද්‍යානුසය ජවන වශයෙන් **සදිට්ඨී චරති** යනු රාග, මෝහ, කාමරාග, අවිද්‍යානුසය ජවන වශයෙන් **ස උද්ධච්චා සවිචිකිච්ඡා චරති** යනු මෝහ, අවිද්‍යානු සය ජවන වශයෙන්, **සානුසයා චරති** යනු මෙහිද කියන ලද ක්‍රමයෙන්ම එක් එක් අනුසය මුල්කොට, එම සිතෙහි ලැබෙන සෙසු අනුසය වශයෙන්, අනුසයතාව යෙදිය යුත්තාහ. සරාගාදී **සම්පයුත්තා** ආදිය සරාගාදි බවට සමානාර්ථයි. එයම චර්යා සම්ප්‍රයෝග වශයෙන්, රාගාදීන් සමග පවතීනුයි **සරාගා** ආදී නම් ලබයි. රාගාදීන් හා සමව එක්ව ඉපැත්ම, එක්ව නිරෝධය එක් වස්තුව, එක්ව අරමුණු ගැනීම් ආදී ආකාරයන්ගෙන් යුක්ත වූවාහු **රාග සම්පයුත්තානි** ආදි නාමයන් ලබයි. එයම යම් කුසල් ක්‍රියාවන්ගෙන් වෙන්ව, අකුසල් කර්මයන් හා එක්වීද? එහෙයින්ද අඥාන චර්යාව යැයි දක්වන්ට, 'කුසලෙහි කම්මෙහි' ආදිය වදාළහ. එහි **අඤ්ඤාතෙ** යනු මෝහයෙහි අඥාන ලක්ෂණ හෙයින්, යථා ස්වභාවයෙන් නොදත් අරමුණුවල, සෙස්ස කියන ලද අර්ථයමය.

ඤාත චර්යාවෙහි, විවට්ටානුපස්සනාදීන්ට, අනන්තර ප්‍රත්‍යය වූ ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත නැත. ඒ සඳහා ආවර්ජන ක්‍රියා අව්‍යාකෘත නොකියා විවට්ටානුපස්සනාදීන්ම කියන ලදී. අනුලෝම ඤාණය සඳහාම ආවර්ජන වේ. ඉන්පසු විවට්ටානුපස්සනා මාර්ගඵලයි. **ඵල සමාපත්ති** යන මෙහි මාර්ගානන්තරව හටගත් හෝ, කාලාන්තරව හටගත් හෝ යන ද්වයයම අදහස් කරන ලදහ. නිරාගාචරති ආදීන්හි රාගාදීන්ට ප්‍රතිපක්ෂ වශයෙන් නිරාගාදිතාව දතයුත්තාහ. **විඤ්ඤාණ** චර්යායෙහි, රාගාදීන්ගේ අභාවමාත්‍ර අර්ථයෙන්, ඤාතෙ යනු යථා ස්වභාවයෙන් දත්,

ඤාත, අඤ්ඤාත, විඤ්ඤාත ආදී ත්‍රිවිධ චර්යාවන්හි ඔවුනොවුන්ගේ සම්මිශ්‍රණය දක්වයි. විඤ්ඤාණ කෘත්‍ය මාත්‍ර වශයෙන් අහේතුක චිත්තොත්පාද, විඤ්ඤාණ චර්යාව අඥාන කෘත්‍යවත් වූයේ, දොළොස් අකුසල චිත්තොත්පාදයන්ගේ වශයෙන්ම, අඥාන චර්යා, විශේෂයෙන්ද, ඥාණ කෘත්‍යකාරී විදර්ශනා මාර්ගඵලයන්ගේ වශයෙන් ඥාණ චර්යාවද, මෙසේ මෙහි ඔවුනොවුන් සම්මිශ්‍ර විදර්ශනාව හැර, සහේතුක කාමාවචර ක්‍රියා කුසල්ද, සහේතුකා කාමාවචර විපාකද, රූපාවචර කුසල අව්‍යාකෘතද, ත්‍රිවිධ චර්යාවන්ගෙන් විනිර්මුක්ත යැයි දතයුත්තාහ. නිර්වාණාරම්මණ, විවට්ටානුපස්සනාවෙන් ඥාණ චර්යාව දක්වන ලද හෙයින් නිර්වාණ මාර්ගඵල ප්‍රත්‍යවේක්ෂණ වූ, ශෛක්ෂ අශෛක්ෂයන්ගේ ප්‍රත්‍යවේක්ෂා ඥාණ ඥාණ චර්යායෙහි සංග්‍රහ කරන ලදැයි දතයුත්තාහ. ඒවාද, විශේෂයෙන් ඥාණ කෘත්‍යකාරකමය.

චර්යා නානත්ව ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.

භූමි නානත්ව නිර්දේශයෙහි, භූමියො යනු, කොටස, බෙදීම යන අර්ථයි. කාමාවචරා යනු මෙහි කාමය, ක්ලේශකාමය, වස්තුකාම යයි දෙවදෑරුම්ය. ක්ලේශ කාමය, ඡන්දරාගයයි. වස්තුකාමය ත්‍රෛභූමික වෘත්තයයි. ක්ලේශකාමය කැමැත්තේනුයි කාමයි. වස්තුකාමය ආශා කරයි නුයි කාමයි. ඒ දෙවදෑරුම් කාමය පැවැතීම් වශයෙන් යම් පෙදෙසක හැසිරේද, එම ප්‍රදේශය කාමයි. මෙහි හැසිරේනුයි කාමාවචරයි. එම ප්‍රදේශය, සතර අපාය, මිනිස් ලොව, සදිව් ලෝකයන්ගේ වශයෙන් එකොළොස් වැදෑරුම්ය. යම් පෙදෙසක ආයුධ සහිත මිනිස්සු හැසිරෙත්ද, අනෙකුත් දෙපා සිවුපාවුන්ගේ හැසිරීම් විද්‍යමාන කල්හි, සලකුණු කළ හෙයින් ඔවුන්ට ආයුධ සහිතයෝ යැයි කියනු ලැබේ. මෙසේ අනෙකුත්, රූපාවචරාදීන් එහි හැසිරෙන්නේ නමුදු එය කාමාවචර වශයෙන් සලකුණු කළ හෙයින් මේ ප්‍රදේශය කාමාවචරම යයි කියනු ලැබේ. ඒ මෙය රූපභවය යම්සේ රූපං වේද? මෙසේ මතු පදය ලොප්කොට කාමයයිම යුසේයි. ඒ හා බැඳුණු එක් එක් ධර්මය මෙම එකොළොස් ආකාර ප්‍රදේශ සංඛ්‍යාත කාමයෙහි හැසිරේනුයි කාමාවචරයි. කිසිසේත්, මෙහි සමහර ධර්ම රූපාරූප භවයන්හිද හැසිරෙත්, යම්සේ වනාහි යුදයෙහි හැසිරෙන සෙයින් සංගාමාවචරයැයි ලද නම් ඇති හස්තියා, නගරයෙහි සරන කල්හිද සංගාමාවචරමයයි කියනු ලැබේ. ගොඩදිය සරන ප්‍රාණීහු

නොගොඩ, නොජලයෙහි සිටියාහුද, ගොඩසර, දියසරයයිම කියනු ලබත්. මෙසේ ඒවා අන් තැන සරන්නාහුද කාමාවචරයයිම දතයුත්තාහ. අරමුණු කිරීම් වශයෙන් හෝ ඒ කියන ලද ආකාර ධර්මයන්හි කාමය සරානුයි කාමාවචරයි. එම කාමය රූපාවචර අරූපාවචර ධර්මයන්හිද සරයි. යම්සේ වනාහි කියයිනුයි වචෂයි. පොළොවෙහි සයනය කෙරේනුයි මහිසොයි කී කල්හි, යම් පමණ පොළොවෙහි නිදත්ද? ඒ සියල්ලට මහිස යන ඒ නාමය නොකියති. මෙම කරුණද එසේයයි දතයුතුය. මෙහි ඒ සියලු ධර්මයන් ඒකරාසී කොට කියන ලද, භූමි ශබ්දය අපේක්ෂාකොට කාමාවචරායි ස්ත්‍රීලිංග වචනය කරන ලදී. රූපාවචර ආදීන්හි රූපභවය රූපයයි, එම රූපයෙහි හැසිරෙත්නුයි **රූපාවචරයි**. අරූපභවය අරූපයි. එම අරූපයෙහි හැසිරෙත්නුයි **අරූපාවචරායි**. ත්‍රෛභූමික වෘත්තයෙහි අන්තර්ගත වූවාහු, ඇතුළත් වූවාහුනුයි පරියාපනනයි. එහි ඇතුළත් නුවූයේනුයි අපරියාපනනායි.

කාමාවචරාදී භූමි නිර්දේශයන්හි, හෙට්ඨතො යනු යට කොටසින්, **අවීචිනිරයං** යනු ගිනිදැල්වල හෝ සත්ත්වයින්ගේ හෝ වේදනාවන්ගේ හෝ රැළ අතර සිදුරක් මෙහි නැතැයි අවීචියි. සුව සංඛ්‍යාත අය මෙහි නැතැයි නිරයයි. ඇල්මක් නැත යන අර්ථයෙන්ද නිරයයි. **පරියනතං කත්වා** යනු ඒ අවීචි සංඛ්‍යාත නිරය කෙළවරකොට, උපරිතො යනු මතු කොටසින්, **පරනිම්මිත වසවත්ති දෙවෙ** යනු අන්‍යයා විසින් නිර්මිත කාමවස්තූන් තම වසඟයෙහි පවත්වන හෙයින් මෙසේ ලද ව්‍යවහාර ඇති දෙවිවරුන්, **අනෙතා කරිත්වා** යනු ඇතුළට දමා; **යංඑතසමිං අනතරෙ** යනු යම් ඒ අවකාශයෙහි, **එත්ථාවචරා** යනු මෙයින් ඒ අතරෙහි, කිසිවිටෙක, කිසිතැනක හටගන්නා හෙයින් අන් තන්හිද හැසිරෙත්. එහෙයින් ඒවාහි ඇතුළත් නොකිරීම සඳහා හැසිරේයයි යූ.සේයි. එයින් ඒ අතරෙහි යමක් දැඩිව හැසිරේද? සැම තැන, සැමදා හටගන්නා හෙයින් යට කොටසෙහි හැසිරෙත්. අවීචි නිරයෙහි යට භූත-උපාදාය රූපයන්ගේ ප්‍රවෘත්ති භාවයෙන් ඒවාහි සංග්‍රහය කරන ලද්දේ වේ. ඒවාහි ගැලී හැසිරෙති, යට කොටසෙහි හැසිරෙත්නුයි අවචරයි. **එත්ථ පරියාපනනා** යනු මෙයින් ඒවා මෙහි හැසිරෙන්නාහු අන් තන්හිද හැසිරෙත්, එහි ඇතුළත් වූවාහු නොවෙති. එහෙයින් ඒවාහි අන් තන්හිද, හැසිරෙන්නවුන්ගේ පරිග්‍රහණය කරන ලද්දේ වේ.

දැන්, මෙහි ඇතුළත් ඒ ධර්මරාශිය ශූන්‍යතා ප්‍රත්‍යය භාවයෙන්ද, ස්වභාව වශයෙන්ද දක්වන්නේ, **ස්කන්ධ, ධාතු ආයතන** ආදිය වදාළහ.

බ්‍රහමලොකං යනු ප්‍රථමධ්‍යාන භූමි සංඛ්‍යාත වූ බ්‍රහ්මස්ථානයයි. **අකණිට්ඨෙ** යනු කණිටු නොවූයේ උතුම් අර්ථයෙන්, **සමාපන්නස්ස** යනු සමවතට සමවන්නහුගේ, එයින් කුසල ධ්‍යානය යූ.සේයි. **උපපන්නස්ස** යනු විපාක වශයෙන් බඹලොව උපන්නහුගේ, එයින් විපාක ධ්‍යානය යූ.සේයි. **දිට්ඨධම්ම සුඛ විහාරිස්ස** යනු ඉහාත්මයෙහිම, ප්‍රත්‍යක්‍ෂ ආත්ම භාවයෙහි සුව විහරණය දිට්ඨධම්ම සුඛ විහරණයයි. එය මොහුට ඇත්තේනුයි දිට්ඨධම්ම සුඛ විහාරියි. (රහත්හුගේ) ඒ දිට්ඨධම්ම සුඛ විහාරීගේ, එයින් ක්‍රියාධ්‍යානය යූ.සේයි. **චෙතසිකා** යනු සිතෙහි වූයේ චෛතසිකයි. සිත හා එක්ව යෙදුණේය යන අර්ථයි. **ආකාසානඤ්චායතනූපගෙ** යනු ආකාසානඤ්චායතන සංඛ්‍යාත භාවයට එළඹි, දෙවන පදයෙහිද එම ක්‍රමයමැයි. **මග්ගා** යනු සිව් ආර්ය මාර්ගයන්ය. **මග්ග ඵලානි** යනු සිව් ආර්යමාර්ග ඵලයන්, **අසංඛත ධාතු** යනු ප්‍රත්‍යයන්ගෙන් නොකළ නිර්වාණ ධාතුව;

අපරාපි චතස්සො **භූමියො** යනු එකිනෙකෙහි චතුෂ්ක වශයෙන් දතයුත්තාහ. **චත්තාරො සතිපට්ඨානා** යනු කායානුපස්සනා, වෙදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යන සතර සතිපට්ඨානයි. එහි අර්ථය, පිහිටානුයි පට්ඨානයි. වැටහේ. එහි බැසගෙන ඇතුල්වී පවතීයයි යන අර්ථයි. සිහියම පිහිටීම සතිපට්ඨානයි. නොහොත් සිහිකිරීම් අර්ථයෙන් සිහියද, වැටහෙන අර්ථයෙන් පට්ඨානයි. සිහියද එය පිහිටුවීමද සතිපට්ඨාන නම් වන්නේය. අරමුණු කිරීම් වශයෙන් එම සතීහු බොහෝ වෙත්නුයි සතිපට්ඨානයි. **චත්තාරො සම්මප්පධානා** යනු;
නූපන් අකුසලයන්ගේ නොඉපැත්ම සඳහා වන සම්‍යක් ප්‍රධානය
උපන් අකුසලයන්ගේ ප්‍රහාණය සඳහා වන සම්‍යක් ප්‍රධානය
නූපන් කුසලයන්ගේ ඉපැත්ම සඳහා වන සම්‍යක් ප්‍රධානය
උපන් කුසලයන්ගේ ස්ථිතිය සඳහා වන සම්‍යක් ප්‍රධානය යන සතරයි. මෙය කරණකොට ගෙන, බලවත් සේ, උත්සාහ කෙරෙත්, ව්‍යායාම කෙරෙත්නුයි පධානංයි. එය වීර්යයට නාමයකි. **සම්‍යක් ප්‍රධාන** යනු, විපර්යාස නොවූ උත්සාහය, හේතුසහිත උත්සාහය, අභිවෘද්ධිදායක උත්සාහය, ඥාණාන්විත උත්සාහය යනාදියයි. එකක්ම වූ වීර්යය, කෘත්‍ය වශයෙන් සතරාකාර කොට සම්‍යක් ප්‍රධානයැයි යූ.සේයි. **චත්තාරො ඉද්ධිපාදා** යනු ඡන්‍ද, චිත්ත, වීර්යය, වීමංස යන සතරයි. එහි අර්ථ කියන ලද්දේමය. **චත්තාරි ඣානානි** යනු විතර්ක, විචාර, ප්‍රීති, සුව, චිත්තෛකාග්‍රතා වශයෙන් පංචාංගික ප්‍රථමධ්‍යානයයි. ප්‍රීති, සුව, චිත්තෛකාග්‍රතා වශයෙන් ත්‍රයංගික ද්විතිය ධ්‍යානයයි. සුව, චිත්තෛකාග්‍රතා වශයෙන් ද්වයංගික

තෘතිය ධ්‍යානයයි. උපේක්ෂා, චිත්තෙකාග්‍රතා වශයෙන් ද්වයංගික චතුර්ථ ධ්‍යානයයි. මෙම අංග අරමුණ නැවත නැවත සිතීම් අර්ථයෙන් ධ්‍යානයයි යූ.සේයි. **චතස්සො අප්පමඤ්ඤායො** යනු මෛත්‍රී, කරුණා, මෘදුබව, උපේක්ෂා යන සතර පැතිරීම ප්‍රමාණාතික්‍රාන්ත වශයෙන් අප්පමඤ්ඤායොයි.

ඒවා අරමුණු කිරීම් වශයෙන් ප්‍රමාණාතිකාන්ත සත්ත්වයින් කෙරෙහි පතුරුවති. එක් සත්ත්වයෙකු කෙරෙහි හෝ සේස රහිතව පැතිරීම් වශයෙන් පතුරුවති යන අර්ථයෙන්ද, පැතිරීමෙහි අප්‍රමාණතා වශයෙන් අප්පමඤ්ඤායොයි කියනු ලබති. **චතස්සො අරූප සමාපත්තියො** යනු ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන සතරයි. සිව්පිළිසිඹියා කියන ලද අර්ථයමය.

**චතස්සො පටිපදා** යනු දුක් ප්‍රතිපදාව ඉක්මන් නොවූ අභිඥායි. දුක් ප්‍රතිපදාව වහා අභිඥායි. සුව ප්‍රතිපදාව ඉක්මන් නොවූ අභිඥායි. සුව ප්‍රතිපදාව වහා අභිඥායි කියන ලද සිව් ප්‍රතිපදාවෝය. **චත්තාරි ආරම්මණානි** යනු ස්වල්ප වූ ස්වල්පාරම්මණය, ස්වල්ප වූ අප්‍රමාණාරම්මණය, අප්‍රමාණ වූ ස්වල්පාරම්මණය, අප්‍රමාණ වූ අප්‍රමාණාරම්මණය යන සිව් අරමුණු, කසිණාදී අරමුණු නිශ්චය නොකළ යුතු හෙයින්, අරමුණුවල අරමුණුවත් ධ්‍යාන යූ.සේයි. **චත්තාරො අරියවංසා** යනු බුදු, පසේබුදු, තථාගත ශ්‍රාවකයෝ ආර්යයයි කියනු ලැබෙත්. ඒ ආර්යයන්ගේ වංශය, පෙළ, පරම්පරාවනුයි, අරියවංශයි. ඒවා කවරහුද? චීවර, පිණ්ඩපාත, සේනාසනයන්හි ලද පමණින් සතුටුවීම භාවනාවෙහි ඇලීම යන මේ සතරයි. ගිලානප්‍රත්‍යය සන්තෝෂය, පිණ්ඩපාත සන්තෝෂයෙහිම ගැබ්වේ. යමෙක් පිණ්ඩපාතයෙහි සතුටුවූයේ වේද? හෙතෙම කෙසේ ගිලාන ප්‍රත්‍යයෙහි සතුටු නොවන්නේ වන්නේද? **චත්තාරි සංගහ වත්ථූනි** යනු ජනසංග්‍රහකාරක කරුණු සතරකි. දානය, ප්‍රිය වූ කිවයුතු දෑ, අර්ථචරියාව, සමානාත්මතාව යන මෙම සතරයි. දානං යනු සුදුසු පරිදි දීම, පෙය්‍යවජ්ජං යනු සුදුසු පරිදි ප්‍රියවචන කථාකිරීම, අර්ථචර්යා යනු ඒ ඒ තන්හි කළයුත්තෙහි කිරීම් වශයෙන්ද කළයුතු නොකළයුතු දැහි අනුසාසනා වශයෙන් අභිවෘද්ධිදායක කටයුතුවල යෙදවීම, **සමානත්තතා** යනු මැනීම් සමග වූයේ සමානයි. ප්‍රමාණ සහිත වූයේ ගණන් ගැනීම් සහිත වූයේ යන අර්ථයි. අන්‍යයාට. තෙමේ සමාන වූයේ එයිනුයි සමානත්තයි, සමානාත්මයාගේ ස්වභාවය සමානත්තතායි. මෙතෙම මට වඩා පහත්ය.

මෙතෙම මාහා සමානය. මෙතෙම මට වඩා උසස්යයි ගණින් ගෙන ඊට සුදුසු අයුරින් හැසිරීම කිරීමයි අර්ථයි. සමාන සුවදුක්තාවය සමානාත්මතාවයැයි කියති. **චත්තාරි චක්කානි** යන මෙහි චක්‍රය නම්, දැව චක්‍රය, රතනචක්‍රය, ධර්මචක්‍රය, ඉරියාපථ චක්‍රය, සම්පත්ති චක්‍රයයි පස්වැදෑරුම්ය. එහි 'දේවයන් වහන්ස, යම් ආකාර වූ මෙම චක්‍රය සයමස් තෙදිනකින් නිමවිය - මෙය දැව චක්‍රයයි' චක්‍රය පවත්වමින් පමුණුවයි මේ රත්නචක්‍රයයි. 'මා විසින් පවත්වන ලද චක්‍රය', මෙය ධර්ම චක්‍රයයි. 'සිව් චක්‍ර නවද්වාර' මෙය ඉරියව් චක්‍රයයි, යම් කරුණුවලින් යුත් දෙව් මිනිසුන්ට සිව්චක්‍ර පවතිද, මහණෙනි, මේ එම චක්‍ර සතරයි. කවර සතරෙක්ද? සුදුසු දෙස්හි විසීම, සත්පුරුෂයින්ගේ ආශ්‍රය, තම ආත්මය මනාකොට පිහිටුවා ගැනීම, පෙර කළ පින් ඇති බව, මෙය සම්පත් චක්‍රයයි. මෙහිදී එයම අදහස් කරන ලදී. එහි පතිරූප දෙස වාස යනු යම්තැනක සිව් පිරිස දක්නට ලැබෙත්ද? එබඳු සුදුසු දෙස්හි විසීමයි. සත්පුරුෂ ආශ්‍රය යනු, බුද්ධාදී සත්පුරුෂයින්ගේ ආශ්‍රය, සේවනය, භජනය, අත්ත සම්මා පණිධි යනු තමාගේ ආත්මය මනාව පිහිටුවීම, ඉදින් පෙර අශ්‍රද්ධාදීන්ගෙන් යුක්ත වූයේ වේද? ඒවා අත්හැර ශ්‍රද්ධාදීන්හි පිහිටුවීමයි. පුබ්බෙච කතපුඤ්ඤතා යනු - පෙර රැස්කරන ලද කුසල් ඇති බව, මෙහි මෙයම ප්‍රමාණවත්ය. යම් හෙයකින් ඤාණ සම්ප්‍රයුක්ත සිතෙන් කුසල කර්මයක් කරන ලද්දේ වේද? එම කුශලයම ඒ පුරුෂයා සුදුසු දේසයට එළවයි. සත්පුරුෂයන් භජනය කරවයි. එම පුද්ගලයාම තමා මනාව තබයි. **චත්තාරි ධම්මපදානි** යනු සිව්දම් කොටස්, කවර සතරෙක්ද? අනභිජ්ඣා, අව්‍යාපාද, සම්මා සති, සම්මා සමාධි යන සතරයි. අනභිජ්ඣා ධර්ම පදයනම් අලෝභය හෝ අනභිජ්ඣා වශයෙන් අවබෝධ කළ ධ්‍යාන, විදර්ශනා මාර්ගඵල නිර්වාණය හෝ; අව්‍යාපාද ධර්මපදය නම් කෝපනොවීම හෝ මෛත්‍රී ශීර්ෂයෙන් අවබෝධ කළ, ධ්‍යානාදිය හෝ; සම්මා සති ධර්මපදය නම්; මනාව පිහිටි සිහිය හෝ සති ශීර්ෂයෙන් අවබෝධ කළ ධ්‍යානාදිය හෝ; සම්මා සමාධි ධර්මපදය නම්: අටසමවත් හෝ අටසමවත් ශීර්ෂයෙන් අවබෝධ කළ ධ්‍යානාදිය හෝ දස අසුභ වශයෙන් අවබෝධ කළ ධ්‍යානාදිය අනභිජ්ඣා ධර්මපදයයි, සිව්බඹ විහරණ වශයෙන් අවබෝධ කළාහු අව්‍යාපාද ධර්මපදයි. දස අනුස්සති, ආහාරයෙහි පටික්කූල සංඥා වශයෙන් අවබෝධ කළාහු සම්මා සති ධර්මපදයි. දස කසිණ අනාපානාදි වශයෙන් අවබෝධය, සම්මා සති ධර්මපදයි. **ඉමා චතසෙසා භූමියො** යනු එක එක චතුෂ්ක වශයෙන්ම යෙදිය යුතුය.

**භූමි නානත්ත ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

ධර්ම නානත්ව නිර්දේශයෙහි, **කම්මපථෙ** යනු කර්මද ඒවාම අපාගමනට මාර්ගනුයි කර්මපථයි. ඒ කර්මපථයන්, දස කුසල කර්මපථනම්; ප්‍රාණඝාත, අදින්නාදාන, කාමයන්හි වරදවා හැසිරීම යන ත්‍රයයෙන් වෙන්වීම කාය සුචරිතයි. මුසාවාදයෙන්, කේලාම් කීමෙන්, එරුසවචනයෙන්, හිස්වචන කථා කිරීමෙන් වැළැක්ම යන සතර වාග් සුචරිතයි. අනභිධ්‍යා, අව්‍යාපාද, සම්‍යක් දෘෂ්ටි යන ත්‍රයය මනෝ සුචරිතයි.

දස අකුසල කර්මපථ නම්: ප්‍රාණඝාත, අදින්නාදාන, කාමයන්හි වරදවා හැසිරීම යන ත්‍රයය කාය දුශ්චරිතයි. මුසාවාද, කේළාම්, එරුසවචන, හිස්වචන කථාකිරීම යන සතර වාග් දුශ්චරිතයි. අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන ත්‍රයය මනෝ දුශ්චරිතයි. කුසල් අකුසල්හි ප්‍රතිසන්ධිජනක වූයේම කර්මපථයයි යූ.සේයි. ඉතිරි ප්‍රතිසන්ධි ඇතිකරලීමෙහි ඒකාන්තයෙන් ප්‍රබලතාවක් නොමැතියේ කර්මපථයයි නොකියන ලදී. දළ කුසල් අකුසල් ග්‍රහණයෙන්ම සෙසු කුසල් අකුසල් ගන්නා ලදැයි දතයුත්තාහ. **රූපං** යනු භූත-උපාදාය භේදයෙන් අටවිසි වැදෑරුම් රූප වේ. **විපාකං** යනු කාමාවචර කුසලවිපාක සොළොසද, අකුසල විපාක සතද වශයෙන් තෙවිසි වැදෑරුම් විපාක වේ. **කිරියං** ත්‍රිවිධ අහේතුක ක්‍රියාවන්ද අටවැදෑරුම් සහේතුක ක්‍රියාවන්ගේද වශයෙන් එකොළොස් වැදෑරුම් ක්‍රියා විපාක අභාවයෙන් ක්‍රියා මාත්‍රයමනුයි ක්‍රියායි. මෙපමණෙකින් කාමාවචරම රූප අව්‍යාකෘත, විපාක අව්‍යාකෘත වශයෙන් යූ.සේයි. **ඉධට්ඨස්ස** මෙලොව සිටියහුගේ, බොහෝසෙයින් මිනිස් ලොව, ධ්‍යාන භාවනා, සාධනයෙන් මිනිස්ලෝ වශයෙන් යූ.සේයි. ධ්‍යාන වනාහි සමහරවිට දිව්‍යලෝකයන්හිද ලැබෙත්. රූපී බඹලොවෙහිද, එහි උපදින, යට උපදින, මතු මත්තෙහි ඉපදීම් වශයෙන් ලැබෙත්. අරූපාවචරයන්හි සුද්ධාවාසයෙන් යට උත්පත්ති නැත. රූපාවචර, අරූපාවචරයන්හි, දියුණු නොකළ ධ්‍යාන සහිත වූවාහු යට උපදිනු ලබන්නාහු කාමාවචර සුගතියෙහිම උපදිති. දුගතියෙහි නූපදිති. **තත්‍රූපපන්නස්ස** යනු විපාක වශයෙන් බඹලොව උපන්නහුගේ ප්‍රතිසන්ධි-භවංග, චුති වශයෙන් පවත්නා සතර විපාක ධ්‍යානයන් රූපාවචර, අරූපාවචර ධ්‍යාන සමවත්හි ක්‍රියා අව්‍යාකෘත නොකියන ලදී. කිසිසේත් නොකියන ලදී. තවද, කුසලයන් හා සමාන පැවතුම් හෙයින් කුසලයන් කී කල්හි කියන ලද්දේම වෙත්යයි දතයුත්තාහ. පට්ඨානයෙහි, කුසලා කුසලයන් නිරුද්ධ කල්හි විපාකය තදාරම්මණතාවයෙන් උපදී. කුසල් ජවන් ග්‍රහණයෙන්ම ක්‍රියා ජවනය සංගෘහිතයි. මෙහිද එසේයයි දතයුතුය. **සාමඤ්ඤඵලානි** යනු සතර මාර්ගඵල, ඉන් ලෝකෝත්තර විපාක අව්‍යාකෘත

යු.සේයි. **නිබ්බාණං** යනු නිර්වාණ ව්‍යාකෘතයයි. **පාමුජ්ජ මූලකා** යනු ප්‍රමෝද්‍යය. මුල්වූයේ ආරම්භය වූයේ, ඒවාටනුයි ප්‍රමෝද්‍ය මූලිකයි. ප්‍රමෝදය ආදිකොට ඇත්තේය යන අර්ථයි. ප්‍රමෝද්‍යයෙන් එක්රැස් වූයේම වෙති. **අනිච්චතො මනසිකරොතො පාමුජ්ජං ජායති** මෙහි නුවණින් මෙනෙහි කරන්නා හටම ප්‍රමෝදය හටගනී. නුනුවණින් මෙනෙහි කරන්නාට නොවේ. නුනුවණින් මෙනෙහි කරන්නාහට කුසල් ඉපැත්මක් කැලම නැත. විදර්ශනා ගැන කියනුම කවරේද? කුමක් හෙයින් ස්වරූපයෙන් කියන ලදද යත්? ප්‍රමෝද්‍යයාගේ බලවත්භාවය දැක්වීම සඳහායි. ප්‍රමෝදය නොමැති කල්හි, විවේකස්ථානයන්හි පිහිටි සෙනසුන්හිද, අධිකුසල් දම්හිද නොඇල්ම කළකිරීම උපදී. මෙසේ ඇතිකල්හි, භාවනා මාර්ගයෙන් පිටපනී. ප්‍රමෝදය ඇතිකල්හි නොඇල්ම නොමැති හෙයින් භාවනාව පරිපූර්ණත්වයට යේ. නුවණින් මෙනෙහි කිරීම මූලික භාවයෙන් ගත්කල්හි භාවනාවට බොහෝ උපකාරවත් බව දක්වන්ට මතු නවකය කියයි.

**යතො යතො සම්මසති - ඛන්ධානං උදයබ්බයං**
**ලභතී පීතිපාමොජ්ජං - අමතං තං විජානතං**

යම්කලෙක පටන් ස්කන්ධයන්ගේ උදය-ව්‍යය සම්මර්ශනය කෙරේද? ඉන් නිවන් අවබෝධ කරන ප්‍රීති ප්‍රමෝද්‍යය ලබයි යන වචනයෙන් විදර්ශකයාට විදර්ශනා ප්‍රත්‍යයෙන් ප්‍රමෝද්‍යය උපදියි. මෙහි කලාප සම්මර්ශන ප්‍රත්‍යයෙන් වන ප්‍රමෝද්‍යය ගතයුතුය. ප්‍රමුදිතයාගේ ස්වභාවය ප්‍රමෝද්‍යයයි. දුර්වල ප්‍රීතිය, ආදි කර්මාර්ථයෙහි 'ප' කාරය දතයුතුය. **පමුදිතස්ස** යනු ඒ ප්‍රමෝදයෙන් ප්‍රමුදිත වූවහුට, සතුටු වූවහුට, පමොදිතස්ස යයිද පාඨයි. අර්ථය එයමය. **පීති** යනු බලවත් ප්‍රීතියයි. **පීති මනස්ස** යනු ප්‍රීති යුත් සිත් ඇත්තහුගේ, යුත්ත ශබ්දයාගේ ලෝපය දතයුතුය. අශ්වරථය යම්සේද එසේය. **කායො** යනු නාමකයයි. රූප කය සමග හෝ, **පස්සම්භති** යනු සන්සුන්දාහ ඇත්තේ වේ. **පස්සද්ධ කායො** යනු ද්විවිධ සන්සිඳීම් යෝගයෙන් නිවුණු සිරුරැතියේ. **සුඛං වෙදෙති** යනු චෛතසික සුව විඳියි. කායික සුවය සමග හෝ. **සුඛිනො** යනු සුව යුක්තහුගේ, **චිත්තං සමාධියති** යනු සිත සමව පවත්වයි. එකඟ වේ. සමාහිතෙ චිත්තෙ යන වැඩීමෙහි වැඩීම් ලක්ෂණාර්ථයෙහි සත්තමීයි. චිත්ත සමාධි භාවයෙන් තත්වාකාර දැනීම ලක්ෂ්‍ය කරයි. (දක්වයි). **යථාභූතං ජානාති** යනු උදයව්‍යය ඥාණාදී වශයෙන් සංස්කාරයන්ගේ යථා ස්වභාවය

දනී. **පසසති** යනු එයම ඇසින් දුටුවාසේ, පතළකොට ප්‍රඥා චක්ෂුසින් දකියි. **නිබබින්දති** යනු නව වැදෑරුම් විදර්ශනා ඤාණ යෝගයෙන් සංස්කාරයන්හි කළකිරේ. **නිබබින්දං විරජජති** යනු ඒ විදර්ශනාව මස්තකප්‍රාප්ත කරනුයේ, මාර්ග ඤාණ යෝගයෙන් සංස්කාරයන්හි නොඇලුණේ වේ. **විරාගා විමුචචති** යනු විරාග සංඛ්‍යාත මාර්ග හේතුඵල විමුක්තියෙන් නිර්වාණයෙහි අධිමෝක්ෂයෙන් මිදෙයි.

සමහර පොත්වල මෙම කරුණෙහිදී, තැන්පත් සිතින් මෙය දුකයයි තත්වාකාරයෙන් දනී ආදී සත්‍ය නය ලියන ලදී. එයද සමහර පොත්වල, මෙය දුකයයි නුවණින් මෙනෙහි කරයි, ආදී ක්‍රමයෙන් ලියන ලදී. වාර ද්වයෙහිම අක්ෂරයෙහිම වෙනසයි. අර්ථ වශයෙන් නැත. නිබබින්දං විරජජති යනු මාර්ග ඤාණයාගේ වශයෙන් කියන ලද හෙයින්, මාර්ග ඤාණයෙහි සිද්ධ වූ සිව්සස් අවබෝධ කෘත්‍යය සිදුවූයේම වේ. එහෙයින් සිව්සස් නයින් කියන ලද වාරයද, මෙම වාරයෙන් අර්ථ වශයෙන් ඉතිරි වූයේමය.

දැන් අනිචචතො ආදීන්හි අරමුණ ගැන විශේෂයක් නොදක්වා කියන ලද හෙයින්, අරමුණ විශේෂයෙන් දක්වන්නේ, රූපය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරයි ආදිය වදාළහ.

**යොනිසො මනසිකාර මූලකා** යනු නුවණින් මෙනෙහි කිරීම මුල් වූයේ, ආධාර වූයේ ඒවාටනුයි - යොනිසො මනසිකාර මූලකායි. නුවණින් මෙනෙහි කිරීම අත්හැර ප්‍රමෝද්‍යාදී නවය නොවෙත්, **සමාහිතෙන චිතෙතන** හේතුභූත වූ සිතින්, **යථාභූතං පජානාති** යනු ප්‍රඥාවෙන් දැනගනී. මෙය දුකයයි නුවණින් මෙනෙහි කරයි යයි කියනු ලබන කල්හි අනුසුව වශයෙන් පූර්වභාග සත්‍යානුබෝධයද සංග්‍රහ වේ. යොනිසො මනසිකාර යනු නිසි අයුරින් මෙනෙහි කිරීමයි. **ධාතු නානතතං පටිචච උපපජජති ඵසස නානතතං** යනු චක්ෂුරාදී ධාතු නානාප්‍රකාර බව හේතුවෙන්, චක්ෂු ස්පර්ශාදී නානාප්‍රකාර බව හටගනී යන අර්ථයි. ස්පර්ශ නානාප්‍රකාර බව හේතුවෙන් යනු චක්ෂු ස්පර්ශාදී නානාප්‍රකාර බව හේතුවෙන් යන අර්ථයි. **වෙදනා නානතතං** යනු චක්ෂු ස්පර්ශයෙන් හටගත් වේදනාවන්ගේ නානාප්‍රකාර බවයි. **සඤ්ඤා නානතතං** යනු කාම සංඥාදී නානාප්‍රකාර බවයි. **සංකපප නානතතං** යනු කාම සංකල්පාදී නානාප්‍රකාර බවයි. **ඡන්ද නානතතං** යනු සංකල්ප නානාප්‍රකාර භාවයෙන්, රූපයෙහි කැමැත්ත ශබ්දයෙහි කැමැත්ත යයි මෙසේ කැමැත්තෙහි නානාප්‍රකාර භාවය උපදී.

**පරිළාහ නානත්තං** යනු ඡන්ද නානත්වයෙන් වන රූප දාහයයි. ශබ්ද දාහයදැයි මෙසේ දාහ නානත්වය උපදී. **පරියෙසනා නානත්තං** යනුදාහ නානත්වයෙන් රූප සෙවීම් ආදී නානත්වය උපදී. **ලාභ නානත්තං** යනු සෙවීම් නානාප්‍රකාර භාවයෙන් රූප ප්‍රතිලාභ ආදී නානාප්‍රකාර බව උපදී.

ධර්ම නානත්ව ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

ඤාණ පඤ්චක නිර්දේශයෙහි, ඒ පස්වැදෑරුම් ඤාණයන්ගේ අනුපිළිවෙළ සම්බන්ධය යෙදෙන හෙයින් එකටම විමසීම්, විසඳුම් කරන ලදහ. **අභිඤ්ඤාතා හොන්ති** යනු ධර්ම, ස්වභාව, ලක්‍ෂණ, දැනීම් වශයෙන් මනාව දන්නේ වෙති. ඤාත පරිඥා වශයෙන් ස්වභාව වශයෙන් දැනගත් හෙයින් දත්තාහු නම් වෙති. යම් ඤාණයකින් ඒ ධර්ම දැනගත්තාහු වෙත්ද? එය ඤාතාර්ථයෙන් ඤාණයයි දැනගැනීම් අර්ථයෙන් ප්‍රඥායි සම්බන්ධයි. මෙම ක්‍රමයෙන් සෙසු ඤාණයන්ද යෙදිය යුත්තාහ. **පරිඤ්ඤාතා හොන්ති** යනු සමාන ලක්‍ෂණ වශයෙන්, හාත්පසින් දැනගත්තාහු, තීරණය කළාහු වෙති. තීරණ පරිඥා වශයෙන්, අනිත්‍යාදී වශයෙන් මනාව පරීක්‍ෂා කරනලදුයේ සමාප්ත කරන ලද්දාහු වෙති. **පහීණා හොන්ති** යනු අනිත්‍යානු පස්සනාදී ඤාණයෙන් නිත්‍ය සංඥාදීහු භංගානුපස්සනාවෙහි පටන් ප්‍රහීණ වෙති. **පරිච්චත්තා හොන්ති** යනු ප්‍රහාණ වශයෙන් අත්හැර දමන ලද්දාහු වෙති. **භාවිතා හොන්ති** යනු වඩන ලද්දාහු, මනාකොට වඩන ලද්දාහු වෙති. **එකරසා හොන්ති** යනු ස්වකෘත්‍ය සාධනයෙහි ප්‍රතිපක්‍ෂතා ප්‍රහාණයෙන් එක් කෘත්‍ය වෙති. විරුද්ධ වශයෙන් හෝ විමුක්ති වශයෙන්, විමුක්ති රසයෙන් එක්රස වෙති. **සච්ඡිකතා හොන්ති** යනු ප්‍රතිලාභ වශයෙන් ඵලධර්මද, ප්‍රතිවේධ වශයෙන් නිර්වාණ ධර්මයද ප්‍රත්‍යක්‍ෂ කරන ලද්දාහු වෙති. **ඵස්සිතා හොන්ති** යනු ප්‍රතිලාභ ස්පර්ශයෙන්ද, ප්‍රතිවේධ ස්පර්ශයෙන්ද ස්පර්ශ කරන ලද්දාහු අනුභව කරන ලද්දාහු වෙති. මේ පඤ්ච ඤාණයන් යට ශ්‍රැතමය ඤාණ වශයෙන් යු.සේයි. මෙහි ස්වකෘත්‍ය වශයෙනි.

පඤ්චක ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

ප්‍රතිසම්භිදා ඤාණ නිර්දේශයෙහි, ධර්මයන් නොකී කල්හි, එහි කෘත්‍යය කියන්ට නොහැක. එහෙයින් දක්වන ලද පිළිවෙල නොගෙන, පළමුව ධර්ම විස්තර කළාහුය අර්ථ යූ.සේයි. සද්ධින්‍ද්‍රියං ධම්මොති ආදීන්හි ධර්ම ශබ්දයෙහි ඇතුළත් ධර්මයන් කියා, නානත්ත ශබ්දයෙහි අර්ථ දක්වන්නේ 'අඤ්ඤා සද්ධින්‍ද්‍රිය ධම්මොයි' ආදිය වදාළහ. අන් ධර්මයැයි කී කල්හි ධර්මයන්ගේ නානාප්‍රකාර බව දක්වන ලද්දේ වේ. පටිවිදිතා අභිමුඛ භාවයෙන් දන්නා ලද්දාහු, ප්‍රකට වූවාහු නම් වෙති. ඉන් ප්‍රතිසම්භිදා පදයෙහි අර්ථ යූ.සේයි. අධිමොක්ඛට්ඨො අත්‍ථො ආදීන්හි ඒ ශ්‍රද්ධාදීන්ගේ ස්ථිර ලෙස පිහිටීම් ආදී කෘත්‍යයන් අර්ථ නමැයි දක්වයි. සඤ්ඤෙසතුං යනු අන්‍යයාට හඟවනු කැමැත්තහුගේ අන්‍යයාට පෙන්වන්ට, පරසස යන වචනය අසන්නහුටද ලැබේමය. ව්‍යඤ්ජන නිරුත්තාභිලාපා යනු නාම ව්‍යංජනය, නාම නිරුක්තිය, නාම වචනය; නාමය වනාහි අර්ථය ප්‍රකාශ කෙරේනුයි ව්‍යංජනයි. හේතුවකින් හටගත් දෑ රැස්කෙරෙත්. මහණෙනි, එහෙයින් සංස්කාර යැයි කියති. මෙසේ වෙන්කොට හේතු සහිතව කියනු ලබන හෙයින් නිරුක්තියි. එයින් අර්ථය කියැවේනුයි අභිලාප නම් වේ. ඒ නාමයද සිව් ආකාරයහ. සාමඤ්ඤනාම, ගුණ නාම, සාදන ලද නාම, ඕපපාතික නාම වශයෙනි. එහි ප්‍රථම කල්පිකයින් අතරෙහි මහජනයා විසින් සම්මතකොට පිහිටුවාගත් හෙයින් මහා සම්මත යැයි වූ රජුගේ නාමය සමානච්ඡන්‍දයෙන් කළ හෙයින් සාමඤ්ඤ නාමයි. යමක් සඳහා කියන ලද්දේද? වාසෙට්ඨය, මහජනයා විසින් සම්මත හෙයින් මහා සම්මත යැයිම ප්‍රථම අක්ෂර බන්‍ධනය විය.

ධර්මකථික, පංසුකූලික, විනයධර, ත්‍රිපිටකධර, සැදැහැවතා සත්පුරුෂයා ආදී මෙබඳු ගුණ වශයෙන් ආවා වූ නාමයන් ගුණනාමයි. භගවා, අරහං, සම්මා සම්බුද්ධ ආදී වූ තථාගතයන් වහන්සේගේ නොයෙක් සියගණන් නාම, ගුණ නාමයෝමය. එහෙයින් යූ.සේයි. මහර්ෂීන් වහන්සේට ගුණ සහිත නාමයෝ අසංඛෙය්‍යහ.

**අසංඛෙය්‍යානි නාමානි - සගුණෙන මහෙසිනො**
**ගුණෙහි නාමං උද්ධෙය්‍ය - අපි නාම සහස්සතො'ති**

ගුණයන් ඇතුළත්කොට, නාමයන් උදුරා දක්වන්නේ නම් එය දහසකින් වත් නිමකළ නොහැකිය.

උපන් කුමරුට නම් ගන්වන දිනයෙහි, දක්ෂිණාර්හයන්ට සත්කාර කොට, සමීපයෙහි සිටි ඥාතීහු, කල්පනාකොට, විශේෂයෙන් කල්පනාකොට, මෙතෙම අසවලා නමැයි නම් කරත්. මෙය සාදන ලද නාමයයි. යම් පළමු ප්‍රඥප්තිය පසු ප්‍රඥප්තියට වැටේද? පළමු ව්‍යවහාරය පසු ව්‍යවහාරයට වැටේද? ඒ කවරේද යත්? පළමු කල්පයෙහිද චන්ද්‍රයා චන්ද්‍රයාමය, දැනුදු චන්ද්‍රයාමය. අතීතයෙහි සූර්යයා, සමුද්‍රය, පෘථුවිය, පර්වතය පර්වතයම නම් වේ. දැනුදු පර්වතයමය. මෙය ඖපපාතික නාමයයි. මේ සිව්වැදෑරුම් නාමය එක් නාමයම වේ. එය ලෝක සංකේත සිද්ධ වූවකි. පරමාර්ථ වශයෙන් අවිද්‍යමානයි. අනෙක් අය, නාමය නම් අර්ථය බබළවන ශබ්දයයි කියති. ඵලබොජ්ඣංග මාර්ගාංගයන්ගේ අර්ථ කියන ලද ක්‍රම අනුසාරයෙන්ම දතයුතුය.

## ප්‍රතිසම්භිදා ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.

ඥාණත්‍රය නිර්දේශයෙහි, **නිමිත්තං** යනු සංස්කාර නිමිත්තයි. **අනිමිත්තෙ** යනු සංස්කාර නිමිත්තට ප්‍රතිපක්ෂ නිර්වාණයෙහි. **අධිමුත්තත්තා** යනු එහි නිම්නතාවයෙන් සිතෙහි හළභාවය. **ඵුස්ස ඵුස්ස වයං පස්සති** යනු සංස්කාර නිමිත්ත ඥාණයෙන් ස්පර්ශකොට, එහි භංගය විදර්ශනා ඥාණයෙන්ම බලයි. එයින් භංගානුපස්සනාව සිද්ධය. එය අනිත්‍යානුපස්සනාව සිදුකරයි. අනිත්‍යයාගේ දුක් බැවිනි. එය දුක්ඛානු පස්සනාවයි. දුඃඛයාගේ අනාත්ම බැවින් එය අනාත්මානුපස්සනාව යැයි මෙසේ මෙහි ත්‍රිවිධ අනුපස්සනා යු.සේයි. **අනිමිත්තො විහාරො** යනු නිමිත්ත භය වශයෙන් දුටු හෙයින් ඒ විදර්ශනාත්‍රය විහාරය අනිමිත්ත විහාරය නම් වේ. **පණිධිං** යනු තෘෂ්ණාවයි. **අප්පණිහිතෙ** යනු තෘෂ්ණා ප්‍රතිපක්ෂ නිර්වාණයෙහි. **අභිනිවෙසං** යනු ආත්මාභිනිවේශය. **සුඤ්ඤතෙ** යනු ආත්ම විරහිත නිර්වාණයෙහි, **සුඤ්ඤතො** යනු ශූන්‍යතා වශයෙන් පවත්නා ශූන්‍යයමය. **අජ්ඣුපෙක්ඛිත්වා** යනු විපාක ප්‍රවෘත්තිය සංස්කාරෝපේක්ෂාවෙන් මධ්‍යස්ථව බලා, සුගති සංඛ්‍යාත විපාක ප්‍රවෘත්තියෙහි සතුටුවන්නා වූ සත්ත්වයෝ, මේ ඵල සමවතට සමවදිනු කැමැත්තාහු, ඒ පැවති සියලු සංස්කාරගතයන්, අනිත්‍යාදී වශයෙන් බලා මධ්‍යස්ථ වෙත්මය. මෙසේ දුටුකල්හි ඵලසමවතට සමවදින්ට හැකිවේ. අන් අයුරකින් නොහැකි වේ. **ආවජ්ජිත්වා** යනු ආවර්ජනයෙන් ආවර්ජනය කොට, **සමාපජ්ජති** යනු ඵලසමවතට පිළිපදී. (සමවදී) **අනිමිත්තා සමාපත්ති**

යනු නිමිත්ත භය වශයෙන් දැක සමවත් හෙයින් අනිමිත්ත සමාපත්ති නම් වේ. **අනිමිත්තත විහාර සමාපත්ති** යනු විදර්ශනා විහාර වශයෙන්ද ඵල සමාපත්ති වශයෙන්ද යන ඒ දෙයාකාරයෙන් වෙති.

දැන් සංස්කාර නිමිත්තම බෙදා දක්වන්නේ, රූප නිමිත්තං ආදිය වදාළහ. ජරා මරණ ග්‍රහණයෙහි කිවයුත්ත පෙර කියන ලද්දේමය. අනෙක් අනිමිත්ත විහාරයයි ආදීන්හි කියූ අයුරින්ම නිගමනයකොට දක්වයි. සංක්ෂෙපයෙන් විහාරට්ඨෙ ඤාණය නම් ඵල සමාපත්තියෙහි පූර්වභාගයෙහි වූ, සංස්කාරෝපේක්ෂා ඤාණයෙහි පැවති විදර්ශනා විහාර නානත්ව ඤාණයයි. සමාපත්‍යාර්ථයෙහි ඤාණය නම් ඵලසමාපත්ති නානත්වයෙහි ඤාණයයි. විහාර සමාපත්‍යාර්ථයෙහි ඤාණයනම් ඒ ද්වයයෙහි නානත්වයෙහි ඤාණයයි. විදර්ශනා විහාරයෙන් කල්යවනු කැමැත්තේ විදර්ශනා විහාරයම පවත්වයි. ඵලසමවත් විහාරයෙන්ම කල්යවනු කැමැත්තේ විදර්ශනා පිළිවෙළින් උත්සාහවත් වී ඵලසමවත් විහාරයම පවත්වයි. ඒ දෙඅයුරින්ම කල්යවනු කැමැත්තේ ඒ දෙකම පවත්වයි. මෙසේ පුද්ගල අධිප්‍රාය වශයෙන් ත්‍රිවිධව හටගති. මෙහි කිවයුතු සෙස්ස සංස්කාරෝපේක්ෂා ඤාණ වර්ණනාවෙහි කියන ලද්දේමය.

**ඥානත්‍රය නිර්දේශ වර්ණනාව නිමි.**

ආනන්තරික සමාධි ඤාණ නිර්දේශයෙහි, **නෙක්ඛම්ම වසෙන** යන ආදීන්හි නෛෂ්ක්‍රම්‍ය, අව්‍යාපාද, ආලෝක සංඥා, අවික්ෂෙප ධර්ම ව්‍යවස්ථාපන ඤාණය, ප්‍රමෝද්‍යාදීන් ඇතුළත්ය. ශුෂ්ක විදර්ශකයාට උපචාර ධ්‍යාන සම්ප්‍රයුක්ත ඒ ඒ ක්ලේශයට විරුද්ධ සත්වැදෑරුම් ධර්ම එක් සිතක් සමග සම්ප්‍රයුක්ත වූයේමය. **චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො** යනු එකඟතාවගේ ස්වභාවය ඒකාග්‍රතාවයි. එය කරණකොට නානා ආරම්මණයන්හි වික්ෂෙප නොවේනුයි අවික්ෂෙපයයි. සිතෙහි ඒකාග්‍රතා සංඛ්‍යාත අවික්ෂෙපයයි අර්ථයි. සමාධි යනු එක් අරමුණෙක්හි සමව ඒ කරණකොට සිත පිහිටුවයිනුයි සමාධි නම් වේයයි අර්ථයි. **තස්ස සමාධිස්ස වසෙන** යනු උපචාර සමාධියෙන්ද සමාහිත සිතැත්තහුට යථා ස්වභාවයෙන් අවබෝධ වන හෙයින් කියන ලද ආකාරවත් සමාධියගේ වශයෙන්, **උප්පජ්ජති ඤාණං** යනු මාර්ග ඤාණය ක්‍රමානුකූලව උපදී. **ඛීයන්ති** මුළුමනින් නැසීම වශයෙන් ක්ෂය වෙති. ඉති යනු කියන ලද

ආකාර ඇති අර්ථයෙහි නිගමනයයි. **පඨමං සමථො** යනු පූර්වභාගයෙහි සමාධිය වේ. **පච්ඡා ඤාණං** යනු පසුකල්හි මාර්ගක්ෂණයෙහි ඤාණය වේ.

කාමාසවො යනු පඤ්චකාම ගුණයන්ට අයත් ඇල්මයි. **භවාසවො** යනු රූප අරූප භවයන්හි කැමැත්ත හා ඇල්මයි. ධ්‍යානයෙහි තෘෂ්ණාවද වේ. ශාශ්වත දෘෂ්ටිය සමග හටගත් ඇල්මද, භව වශයෙන් ප්‍රාර්ථනාද වේ. දිට්ඨාසවො යනු දෙසැටක් මිථ්‍යා දෘෂ්ටීහු **අවිජ්ජාසවො** යනු දුකඛාදී අටතන්හි නොදැන්මයි. සත්තමී වචනයෙන් අවසර විචාරීමකොට, සෝවාන් මාර්ගයෙන් ආදී ක්‍රමයෙන් ආශ්‍රව ක්ෂය කරන මාර්ගයෙන් ආශ්‍රවක්ෂය දක්වා, 'එත්ථ' යන්නෙන් අවකාශ විසඳුම කරන ලදී. මාර්ගක්ෂණයෙහි යැයි යූ.සේයි. **අනවසෙසො** යනු එයට ඉතිරියක් නැත්තේනුයි අනවසෙසයි. **අපායගමනීයො** යනු නිරය, තිරිසන්යෝනිය, ප්‍රේතවිෂය, අසුරකාය යන සතර සුව සංඛ්‍යාත අයයෙන් පහවූ හෙයින් අපායයි. යමෙකුට එය විද්‍යමාන වේද? එම පුද්ගලයා අපායට පමුණුවයිනුයි. අපාය ගමනීය නම් වේ. ආශ්‍රවක්ෂය කථාවෙහි යූ.සේයි.

අවික්ඛෙපවසෙන යනු පවත්නා සමාධියට උපනිශ්‍රය වූ සමාධි වශයෙන්, **පඨවි කසින වසෙන** ආදීන්හි දස කසිණයන් තදාරම්මණික අර්පණා සමාධි වශයෙන් යූ.සේයි. බුද්ධානුස්මෘති ආදීන්ද මරණානුස්මෘති, උපසමානුස්සතිද උපචාර ධ්‍යාන වශයෙන් යූ.සේයි. දස අසුභ ප්‍රථමධ්‍යාන වශයෙන් යූ.සේයි. බුදුන් අරභයා උපන් නැවත නැවත සිහිකිරීම **බුද්ධානුසසතියි**. ඉතිපි සො භගවා අරහං ආදී බුදුගුණ අරමුණුකොටගත් සිහියට එය විශේෂ නාමයකි. ඒ බුද්ධානුස්මෘතියගේ වශයෙන්, එසේම ධර්මය අරබයා උපන් නැවත නැවත සිහිකිරීම **ධම්මානුසසතියි**. ස්වාකඛාතො භගවතා ධම්මො යන ආදි දහම් ගුණ අරමුණුකොට ඇති සිහියට එය විශේෂ නාමයකි. සංඝයා අරබයා උපන් නැවත නැවත සිහිකිරීම **සංඝානුසසතියි**. සුපටිපන්නො භගවතො සාවක සංඝො යනාදී සඟ ගුණ අරමුණු කොට ඇති සිහියට එය විශේෂ නාමයකි. සීලය අරබයා උපන් නැවත නැවත සිහිකිරීම **සීලානුසසතියි**. තමාගේ අඛණ්ඩතාදී සිල්ගුණ අරමුණුකොට ඇති සිහියට එය විශේෂ නාමයකි. ත්‍යාගය අරබයා උපන් නැවත නැවත සිහිකිරීම **චාගානුසසතියි**. තමාගේ අත්හළ ත්‍යාගාදී ත්‍යාග ගුණ අරමුණුකොට ඇති සිහියට එය විශේෂ නාමයකි. දේවතාවුන් අරබයා උපන් නැවත නැවත සිහිකිරීම **දේවතානුසසතියි**.

දේවතාවුන් සාක්ෂි ස්ථානයෙහි තබා තමාගේ ශ්‍රද්ධාදී ගුණයන් අරමුණු කොට ඇති සිහියට එය විශේෂ නාමයකි. ආශ්වාස ප්‍රශ්වාස අරබයා උපන් සිහිය **ආනාපාන සතියි**. ආශ්වාස ප්‍රශ්වාස නිමිති අරමුණුකොට පැවති සිහියට එය විශේෂ නාමයකි. මරණය අරබයා උපන් සිහිය **මරණ සතියි**. එක් භවයකට ඇතුළත් ජීවිතේන්ද්‍රිය සිඳීම් සංඛ්‍යාත මරණය අරමුණුකොට පැවති සිහියට එය විශේෂ නාමයකි. පිළිකුල් කේශාදී, පිළිකුල් දැහි හටගන්නා හෙයින්ද, හටගන්නා ස්ථාන යනුයිද, කාය යයි යන සංඛ්‍යාවට ගිය ශරීරයෙහි ඇතුළත් පවත්නා, එබඳු වූ ශරීරය අනුව ගිය සිහියනුයි **කායගතා සතියි**. කායගත සතියයි කිවයුතු කල්හි හ්‍රස්ව නොකොට කායගතා සති යයි යූ.සේයි. එසේම මෙහිද කායගතා සති වශයෙන් යයි යූ.සේයි. කෙස් ආදී, ශරීර කොටස්හි පිළිකුල් නිමිති අරමුණුකොට ඇති සිහියට එය විශේෂ නාමයකි. සන්සිඳීම අරබයා උපන් නැවත නැවත සිහිකිරීම **උපසමානුස්සතිය**. සියලු දුක් සන්සිඳීම අරමුණුකොට ඇති සිහියට එය විශේෂ නාමයකි. දස අසුභ යට කියන ලද අර්ථයමය.

දීර්ඝ ආශ්වාස වශයෙනැයි ආදිය අර්පණා උපචාර සමාධි භේදය දක්වන්ට යූ.සේයි. **දීඝං අස්සාසවසෙන** යනු දීර්ඝයයි කියන ලද ආශ්වාස වශයෙන්, දීඝංවා අස්සසනෙතා, දීඝං අස්සසාමීති පජානාති යයි යූ.සේයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **සබ්බකාය පටිසංවෙදී** යනු සියලු ආශ්වාස ප්‍රශ්වාස කය විදින්නේ, **පස්සම්භයං කායසංඛාරං** යනු දළ ආශ්වාස ප්‍රශ්වාස සංඛ්‍යාත කාය සංස්කාර සන්සිඳුවන්නේ, ව්‍යපසමනය කරන්නේ, දීර්ඝ, හ්‍රස්ව, සබ්බකාය පටිසංවෙදී, පස්සම්භයං කාය සංඛාරං යන මෙම චතුෂ්කයෙන්ම අර්පණා සමාධි යූ.සේයි. **පීති පටිසංවෙදී** යනු ප්‍රීතිය ප්‍රකට කරන්නේ, **චිත්ත සංඛාර පටිසංවෙදි** යනු සංඥා, වේදනා සංඛ්‍යාත චිත්ත සංස්කාර ප්‍රකට කරන්නේද, **අභිප්පමොදයං චිත්තං** සිත සතුටු කරන්නේ, **සමාදහං චිත්තං** යනු අරමුණෙහි සිත සමව තබන්නේ, **විමොචයං චිත්තං** යනු සිත නීවරණයන්ගෙන් මුදවන්නේ; පීති පටිසංවෙදී, සුඛ පටිසංවෙදී, චිත්ත සංඛාර පටිසංවෙදී, පස්සම්භයං චිත්ත සංඛාරං යන චතුෂ්කයද, චිත්ත පටිසංවෙදී, අභිප්පමොදයං චිත්තං සමාදහං චිත්තං, විමොචයං චිත්තං යන චතුෂ්කයද, අර්පණා සමාධි වශයෙන්ද, විදර්ශනා සම්ප්‍රයුක්ත සමාධි වශයෙන්ද යූ.සේයි. **අනිච්චානුපස්සී** යනු අනිත්‍යානුපස්සනා වශයෙන් **විරාගානුපස්සී** යනු කලකිරීම් අනුව බැලීම් වශයෙන්, **නිරොධානුපස්සී** යනු භංගය අනුව බැලීම් වශයෙන්, එය

තදංග වශයෙන් ස්කන්ධ අභිසංඛාරයන් සමග කෙලෙස් අත්හරියි. සංඛත දොස් දර්ශනයෙන්ද, එය විපරීත නිර්වාණයෙහි එහි නිම්නතාවයෙන් පනියි. මෙම චතුෂ්කය විදර්ශනා සම්ප්‍රයුක්ත සමාධි වශයෙන්ම යූ.සේයි. මෙහි ආශ්වාස වශයෙන් ප්‍රශ්වාස වශයෙන්යැයි ආශ්වාස ප්‍රශ්වාස ප්‍රවෘත්ති (පැවතීම්) මාත්‍රය ගෙන යූ.සේයි. එය අරමුණු කිරීම් වශයෙන් නොවේ. මෙහි විස්තර කථාව ආනාපාන කථාවෙහි ප්‍රකට වන්නේය.

## ආනන්තරික සමාධි ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

අරණ විහාර ඤාණ නිර්දේශයෙහි, අනිත්‍යානුපස්සනාදීන් කියන ලද අර්ථමය. **සුඤ්ඤතො විහාරො** යනු අනත්තානුපස්සනාවෙන් නැගිටියහුගේ ශූන්‍යතාකාරයෙන්ම පැවැති අර්හත් ඵල සමාපත්තියයි, **අනිමිත්තො විහාරො** යනු අනිත්‍යානුපස්සනාවෙන් නැගිටියහුගේ අනිමිත්තාකාරයෙන් පැවැති අර්හත් ඵල සමාපත්තියයි. **අප්පණිහිතො විහාරො** යනු දුක්ඛානුපස්සනාවෙන් නැගිටියහුගේ අප්‍රණිහිතාකාරයෙන් පැවති අර්හත්ඵල සමාපත්තියයි. **සුඤ්ඤතෙ අධිමුත්තතා** ශූන්‍යතා ඵල සමාපත්තියෙහි, පූර්වභාග ප්‍රඥා වශයෙන් ඇලුණු බව, සෙසු ද්වයෙහි එම ක්‍රමයමැයි.

**පඨමංඣානං** යනාදීන්හි අර්හත්ඵල සමවතට සමවදිනු කැමැත්තහුගේ විදර්ශනාවට අරමුණු වූ ධ්‍යාන සමාපත්තීහු යූ.සේයි. සියලු කෙලෙසුන් ප්‍රහීණ හෙයින් රහතන් වහන්සේගේම, විදර්ශනා ඵල සමවත, ප්‍රණිතාධිමුක්ති ධ්‍යාන සමවත් අරණ විහාරයයි යූ.සේයි. ප්‍රථම ධ්‍යානයෙන් යුක්ත වූයේ ප්‍රථම ධ්‍යානයෙන් නීවරණයන් ඉවත් කෙරේනුයි අරණ විහාරයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. රහතන් වහන්සේට නීවරණ නොමැති හෙයින්ද, නීවරණයන්ට විරුද්ධ හෙයින්ද, ප්‍රථම ධ්‍යානයෙහිදී නීවරණ ඉවත් කෙරේනුයි යූ.සේයි. විදර්ශනා ඵලසමවත්, ප්‍රණිතාධිමුක්ති වශයෙන් තෙවැදෑරුම් අරණ විහාර ඤාණය කෙටියෙන් පෙන්වාදී, කුමක් හෙයින් ඣාන සමාපත්තීහුම අරණ විහාර වශයෙන් විස්තර කරන ලද්දාහුද යත්? උදෙසීම් වශයෙන්මය. ඒ තෙවදෑරුම් අරණ විහාරයන්ගේ සිද්ධියට බලපෑ ඵල සමාපත්ති විදර්ශනාවට භූමි වූ, ධ්‍යාන සමාපත්තීන්ගේ අරණ විහාරතාව නොකී කල්හි කරුණ සම්පූර්ණ නොවේ. සම්පූර්ණ

නොවූවක්ම සම්පූර්ණ කරන්ට ප්‍රථමධ්‍යානය අරණ විහාරයයි ආදිය යූ.සේයි. ඒවාහි අරණ විහාරතාව උදෙසීම් වශයෙන් සිදුනොවූයේද, ඒවාහි යොදන ලද ආකාරයෙන්ම අනිත්‍යානුපස්සනාව නිත්‍ය සංඥාව ඉවත් කෙරේනුයි අරණ විහාරයි. දුක්ඛානුපස්සනාව සුව සංඥාව ඉවත් කෙරේනුයි අරණ විහාරයි. අනත්තානුපස්සනාව ආත්ම සංඥාව ඉවත් කෙරේනුයි අරණ විහාරයි. ශූන්‍යතා විහාරය අශූන්‍යතාවය ඉවත් කෙරේනුයි අරණ විහාරයි. අනිමිත්ත විහාරය නිමිත්ත ඉවත් කෙරේනුයි අරණ විහාරයි. අප්‍රණිහිත විහාරය ප්‍රණිධිය ඉවත් කෙරේනුයි අරණ විහාරයි. ශූන්‍යතාධිමුක්තිතාව අශූන්‍යතාධිමුක්තිය ඉවත් කෙරේනුයි අරණ විහාරයි. අනිමිත්තාධිමුක්තිය නිමිත්තාධිමුක්තිය ඉවත් කෙරේනුයි අරණ විහාරයි. අප්‍රණිහිතාධිමුක්තිය ප්‍රණිතාධිමුක්තිය ඉවත් කෙරේනුයි අරණ විහාරයි. අරණ විහාරයයි යෙදිය යුතුය.

අරණ විහාර ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

නිරෝධ සමාපත්ති ඤාණ නිර්දේශයෙහි, **සමථ බලං** යනු කාමච්ඡන්දාදී විරුද්ධ ධර්මයන් සමනය කෙරේනුයි සමථයි. එයම කම්පා නොවන අර්ථයෙන් බලයයි. අනාගාමි රහතුන්ටම සමාධියට ප්‍රතිපක්ෂ කාමච්ඡන්දයාගේ ප්‍රහාණයෙන් සමාධියෙහි සම්පූර්ණ භාවයට පත්හෙයින් ඔවුන්ගේම සමාධිය බලප්‍රාප්තයයි නිශ්චිතකොට සමථ බලය යැයි යූ.සේයි. අන්‍යයන්ට නොවේ. සමාධි බලය යැයිද පාඨයි. **විපස්සනා බලං** යනු අනිත්‍යාදී වශයෙන් විවිධ ආකාරයන්ගෙන් ධර්මයන් බලයිනුයි විදර්ශනාවම කම්පා නොවන අර්ථයෙන් බලයයි. ඒ දෙයාකාරයෙන්ම බලප්‍රාප්ත විදර්ශනා ඥානය. එහි සමථ බලය පිළිවෙළින් සිත් සතන් සන්සිඳුවීම සඳහායි. නිරෝධයෙහිද සම්පාදනය සඳහායි. විදර්ශනා බලය පැවති කල්හි ආදීනව දැක්ම සඳහාද, නිරෝධයෙහි අනුසස් දැකීම සඳහාද වේ. **නීවරණෙ** නිමිත්තාර්ථයෙහි සත්තමීයි. නීවරණ නිමිතිකොට නීවරණ ප්‍රත්‍යය කොටයැයි අර්ථයි. කරණාර්ථයෙහි හෝ සත්තමීයි. නීවරණයන් කරණකොට යන අර්ථයි. **න කමපති** යනු ධ්‍යාන යුක්ත පුද්ගලයා නොහොත්, ධ්‍යානයයි ධ්‍යානාංගයන් අදහස් කළ හෙයින්, ප්‍රථම ධ්‍යානයෙන් ඒ හා සම්ප්‍රයුක්ත සමාධිය නීවරණයන්ගෙන් කම්පා නොවේ. මෙහි මෙයම යෙදීම ලෙස ගතයුතුය.

උද්ධච්ච යනු, නොසන්සුන් සහගත චිත්තෝත්පාදයෙහිද නොසන්සුන්කමෙහිද, උද්ධච්චං යනු එසවූ බවයි. එය නොසන්සුන් ලක්ෂණයි. **උද්ධච්ච සහගත කිලෙසෙච** යනු නොසන්සුන්කම සමග එකට යෙදුණු, ඒකෝත්පාදාදී භාවයන්හි ඇතුළත් වූ, නොසන්සුන්කම සමග එකට යෙදුණු මෝහ, අහිරික, අනොත්තප්ප ආදී ක්ලේශයන්, **ඛන්ධෙච** යනු නොසන්සුන්කම සමග එකට යෙදුණු සිව් ස්කන්ධයන්හි, **න කම්පති නචලති නවෙධති** යන අන්‍යොන්‍ය සමාන වචනයන්ය. නොසන්සුන්කමෙහි කම්පා නොවෙයි. නොසන්සුන්කම සමග එකට යෙදුණු ක්ලේශයන්හි නොසැලේ. නොසන්සුන්කම සමග එකට යෙදුණු ස්කන්ධයන්හි කම්පා නොවේයයි යෙදිය යුතුය. විදර්ශනා බලය සප්ත අනුපස්සනාවන්ගේ වශයෙන් කියන ලද හෙයින් ඒවාහිම වශයෙන් විදර්ශනා බලය සම්පූර්ණ වේයයි යූ.සේයි. **අවිජ්ජායච** යනු දොළොස් වැදෑරුම් අකුසල චිත්තෝත්පාදයන්හි අවිද්‍යාවගේ, **අවිජ්ජා සහගත කිලෙසෙච** යනු සුදුසු පරිදි, අවිද්‍යාව හා එකට යෙදුණු ලෝභ, ද්වේෂ, මෝහ, මාන, දෘෂ්ටි, විචිකිච්ඡා, ථීනමිද්ධ, උද්ධච්ච, අහිරික අනොත්තප්ප යන කෙලෙස් වේ. **වචීසංඛාරා** යනු විතර්ක විචාරයෝය. ඇවැත්නි, විශාඛය, කලින් කල්පනාකොට, සිතාබලා පසුව වචන බිඳියි. එහෙයින් විතර්ක විචාර වචී සංඛාර වෙතියි යන වචනයෙන්, වචන රැස්කරත්. උපදවත්නුයි වචී සංඛාරයි. **කායසංඛාරා** යනු ආශ්වාස ප්‍රශ්වාස; ඇවැත්නි විශාඛය ආශ්වාස ප්‍රශ්වාස කායිකය. ඒ ධර්ම කය හා බැඳී පවතී. එහෙයින් ආශ්වාස ප්‍රශ්වාස කාය සංස්කාරයයි යන වචනයෙන් කයින් රැස්කරනු ලැබෙත්නුයි කාය සංස්කාරයි. **සඤ්ඤා වෙදයිත නිරොධං** යනු සංඥාවගේද වේදනාවගේද නිරෝධයයි. **චිත්ත සංඛාරා** යනු සංඥාවද, වේදනාවද, ඇවැත්නි විශාඛය සංඥාව චෛතසිකයකි. එම ධර්ම සිත හා බැඳී පවතී. එහෙයින් සංඥාවද, වේදනාවද චිත්ත සංස්කාරයි යන වචනයෙන් සිතෙන් රැස්කෙරේනුයි චිත්ත සංඛාරයි.

ඤාණ චර්යාවන්හි, අනුපස්සනා වශයෙන් හෝ විවට්ටානුපස්සනා ග්‍රහණයෙන් හෝ එයට මුල්වූ චර්යා කථායෙහි කියන ලද, සෙසු අනුපස්සනාවෝද ගන්නා ලද්දෝ වෙත්යයි දතයුතුය. **සොළසහි ඤාණචරියාහි** යනු උත්කෘෂ්ට පරිච්ඡේදයෙන්, අනාගාමීහුට වනාහි අර්හත්, මාර්ග, ඵල හැර පූර්ණබල සහිත බැවින්, තුදුස් අයුරෙකින් වේ. **නවහි සමාධි චරියාහි** යන මෙහි ප්‍රථමධ්‍යානාදී අටක්ද, ප්‍රථමධ්‍යානාදීන්ගේ ප්‍රතිලාභය සඳහා හැමතැන උපචාර ධ්‍යාන වශයෙන් එකක්දැයි සමාධි

චර්යා නවයකි. බල චර්යාවන්ගේ කවර නානත්වයක්ද? සමථ බලයෙහිද, නෛෂ්ක්‍රම්‍ය වශයෙන් යන ආදි සත් අයුරකින් උපචාර සමාධි යූ.සේයි. පෙය්‍යාල විස්තර වශයෙන් ප්‍රථමධ්‍යාන වශයෙන් යනාදී සමසැත්තෑ වාරයන්ගෙන් සුදුසු පරිදි අර්පණා උපචාර සමාධිය යූ.සේයි. සමාධි චර්යායෙහිද, ප්‍රථමධ්‍යානය යන ආදී අට ක්‍රමයන්ගෙන් අර්පණා සමාධිය යූ.සේයි.

**පඨමජ්ඣානං පටිලාභත්ථාය** යනාදී අට ක්‍රමයන්ගෙන් උපචාර සමාධිය කියන ලදැයි දෙඅයුරකින්ම අර්පණා උපචාර සමාධියම යූ.සේයි. මෙසේ ඇතිකල්හිද, කම්පානොවන අර්ථයෙන් බලතාවන් වසී භාවාර්ථයෙන් චර්යායයි දතයුත්තාහ. විදර්ශනා බලයෙහි වනාහි සප්ත අනුපස්සනාවන්ම විදර්ශනා බලය යැයි යූ.සේයි. ඤාණ චර්යායෙහි සප්ත අනුපස්සනා යූ.සේයි. විවට්ටානුපස්සනාදී නවයද විශේෂකොට යූ.සේයි. මේ ඒවාහි නානත්වයයි. සප්ත අනුපස්සනා කම්පා නොවන අර්ථයෙන් බලයැයිද, වසී භාවාර්ථයෙන් චර්යායැයිද දතයුත්තාහ.

**වසීභාවතා පඤ්ඤා** යන මෙහි කියන ලද වසීහු විසඳීමට වසී යනු පඤ්චවසී යැයි ස්ත්‍රී ලිඟු වහරෙන් යූ.සේයි. එයම වසීයැයි යූ.සේයි. නැවත පුද්ගලාධිෂ්ඨාන දේශනාවෙන් ඒ වසීහු විසඳන්නේ ආවර්ජන වසී යන ආදිය වදාළහ. ආවර්ජනයෙහි වසිය ආවර්ජන වසියයි. එය මොහුට ඇත්තේනුයි ආවර්ජන වසීයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **පඨමජ්ඣානං යත්ථිච්ඡකං** යනු ගමෙහි හෝ අරණ්‍යයෙහි හෝ යම් යම් පෙදෙසක කැමැති වේද? ඒ ඒ තන්හි ආවර්ජනා කරයි. **යදිච්ඡකං** යනු සීත කාලයෙහි හෝ උෂ්ණ කාලයෙහි හෝ යම් යම් කාලයෙක්හි කැමැති වේද, එකල්හි ආවර්ජනා කරයි. නොහොත් කසිණාරම්මණ හෝ සෙසු අරමුණු වූ හෝ යම් යම් ප්‍රථමධ්‍යානයක් යම්තැනක කැමැති වෙත්ද? ඒ ඒ තන්හි ආවර්ජනා කරයි. එක් එක් කසිණාරම්මණ ධ්‍යානයාගේ වසීතාවයන්ගේ වශයෙන් කියන ලද හෙයින් ප්‍රථම යෝජනාවම වඩා යහපත්ය. **යාවතිච්ඡකං** යනු අසුරු සණක් පමණ හෝ සත්දිනක් පමණ වූ යම්තාක් කාලයක් කැමැති වේද? එපමණ කාලයක් ආවර්ජනය කරයි. **ආවජ්ජනාය** යනු මනෝද්වාරාවර්ජනයෙන්, **දන්ධායිතත්තං** සිය වසයෙහි නොපවත්නා බව හෝ අලස බව, **සමාපජ්ජති** යනු පිළිපදී, පමුණුවයි යන අර්ථයි. **අධිට්ඨාති** යනු සමවත තුළ අධික කොට සිටී. **වුට්ඨානවසියං පඨමජ්ඣානං** යනු පංචම්‍යාර්ථයෙහි ද්විතියා වචනයි. ප්‍රථම ධ්‍යානයෙන් යයි අර්ථයි.

පච්චවෙක්ඛති යනු ප්‍රත්‍යවේක්ෂණ ජවනයන්ගෙන් නැවතී බලයි. මේ මෙහි පාළි වර්ණනාවයි. මේ වනාහි අර්ථ ප්‍රකාශනයයි. ප්‍රථමධ්‍යානයෙන් නැගිටැ විතර්කය ආවර්ජන කරන කල්හි, භවංගය සිඳ, පැවැති ආවර්ජනයට අනතුරුව විතර්කාරම්මණ වූම සතරක් හෝ පහක් ජවන දුවයි. ඉන්පසු භවංග ද්වයයකි. ඉක්බිති නැවත විචාරාරම්මණ ආවර්ජනය කියන ලද අයුරින්ම ජවන වේයයි, මෙසේ පඤ්ච ධ්‍යානාංගයන්හි, යම් කලෙක නිතර සිත යවන්ට හැකි වේද? ඉක්බිති මොහුට ආවර්ජන වසී සිද්ධවූයේම වේ. මේ මස්තකප්‍රාප්ත වසිය භාග්‍යවතුන් වහන්සේට යමක ප්‍රාතිහාර්යයෙහි ලැබේ. එයට අධික සීඝ්‍රතර ආවර්ජන වසියක් නම් නැත. අන්‍යයන්ට වනාහි අතරතුර භවංග වාරයන්හි ගණනක් නැත. මහමුගලන් තෙරුන්ට, නන්දොපනන්ද දමනයෙහි මෙන් සීඝ්‍රව සමවත් සමවැදීමෙහි සමර්ථතාව සමවැදීමෙහි වසිය නමැ. අසුරු පමණ හෝ දස අසුරු පමණ හෝ ක්ෂණයක් සමවත තබන්ට (සමවැද සිටීමට) හැකි දක්ෂතාව අධිෂ්ඨාන වසී නමැ. එසේම එයටද වඩා ඉක්මන්ව නැගිටීමේ සමර්ථතාව වුට්ඨාන වසී නමැ. ප්‍රත්‍යවේක්ෂණ වසිය ආවර්ජන වසියෙහිම යූ.සේයි. ප්‍රත්‍යවේක්ෂණ ජවනයන්ම එහි ආවර්ජනාන්තරව යයි. මෙසේ ආවර්ජන වසිය සිද්ධ වූ කල්හි ප්‍රත්‍යවේක්ෂණ වසිය සිද්ධ වේ. අධිෂ්ඨාන වසියගේ සිද්ධ වූ කල්හි නැගිටීමේ වසිය සිද්ධ වේ. මෙසේ ඇතිකල්හිද, මේ මස්තකප්‍රාප්ත වසිය වනාහි භාග්‍යවතුන් වහන්සේට යමක ප්‍රාතිහාර්යයෙහිම ලැබේයයි කී හෙයින්, ප්‍රාතිහාර්ය කාලයෙහි, ධ්‍යානාංග ප්‍රත්‍යවේක්ෂණයන්ගේ අභාවයෙන් නානාවිධ වර්ණ නිර්මාණ වශයෙන් නොයෙක් ආකාර කසිණ වශයෙන් ඉටුවන හෙයින් ඒ ඒ කසිණාරම්මණ ධ්‍යානයට සමවදිනු කැමැත්තහුට කැමති පරිදි සැහැල්ලුවෙන් එම කසිණයෙහි, කියන ලද අයුරින් ආවර්ජන පැවැත්වීමෙහි දක්ෂතාව ආවර්ජන වසියයි. එම ආවර්ජන වීථියෙහිම ඒ ඒ ධ්‍යානයාගේ අර්පණා සමර්ථතාව, සමවැදීමේ සමර්ථතාව සමවැදීමේ වසියයි. මෙසේ කියනු ලබන කල්හි යුක්තියටද විරුද්ධ නොවේ. වසී පිළිවෙළද ක්‍රමානුකූලවම යෙදේ. මෙම ධ්‍යානාංග ප්‍රත්‍යවේක්ෂණය මස්තකප්‍රාප්ත වූයේම පස් ජවනයයි කියන ලද හෙයින් කියන ලද ක්‍රමයෙන්, සත් ජවනයන් දුවනකල්හි ප්‍රත්‍යවේක්ෂණ වසියම වේ. මෙසේ ඇතිකල්හි ප්‍රථමධ්‍යානය ආවර්ජන කෙරේයයි වචනය නොයෙදෙන්නේද? යම්සේ කසිණයෙහි පැවති ධ්‍යානය, ආසන්න කාරණ වශයෙන් ගෙන, කසිණයයි කියන ලද්දේද? එසේම ධ්‍යාන හේතුවූ කසිණය, බුදුවරුන්ගේ උපත සැපතකි ආදීන්හි මෙන් සමීපඵලය වශයෙන් ගෙන ධ්‍යානයයි කියන ලදී. යම්සේ

පිරිසිඳි කල්හි සිට නැගිටියහුට නින්දෙන් නැගිටියහුගේ නැවත නින්දට බස්නා මෙන්, නැවත ධ්‍යානයට බැසීම ඇතිකල්හිද අධිට්ඨාන වසියම නමැ. පිරිසිඳි පරිද්දෙන් නැගිටියහුට වනාහි නැගිටීමෙහි අධිෂ්ඨානය ඇතිකල්හිද වුට්ඨානවසී නම් වේ. මේ එහි විශේෂයයි.

නිරෝධ සමාපත්තියෙහි පැහැදිලි කිරීම පිණිස මේ ප්‍රශ්න කිරීමයි. නිරෝධ සමාපත්තිය කවරක් වන්නීද? කවරහු එයට සමවදිත්ද? කවරහු සමනොවදිත්ද? කවර තන්හි සමවදිත්ද? කවර හෙයින් සමවදිත්ද? කෙසේ මෙහි සමවැදීම වන්නේද? සිටීම කෙසේද? නැගිටීම කෙසේද? නැගිටියහුට කවර ප්‍රවණතා සිතක් වේද? මළහුගේද සමවන්නහුගේද වෙනස කවරේද? නිරෝධ සමාපත්තිය සංඛත, අසංඛත, ලෞකික, ලෝකෝත්තර, නිෂ්පන්න, අනිෂ්පන්න අතර කුමක්ද? එහි, නිරෝධ සමාපත්තිය කවරක් වන්නීද? අනුපිළිවෙළින් නිරුද්ධ කිරීම් වශයෙන් චිත්ත චෛතසික ධර්මයන්ගේ යම් නොපැවැත්මක් වන්නීද? එයයි. කවරහු එයට සමවදිත්ද? කවරහු සමනොවදිත්ද? සියලු පෘථග්ජනයෝද, සෝවාන්, සකෘදාගාමිහුද, ශුෂ්ක විදර්ශකයෝද, අනාගාමි හා රහත්හුද සමනොවදිත්. අෂ්ට සමාපත්තිලාභී අනාගාමීහුද ක්ෂීණාශ්‍රවයෝද සමවදිති. කවර තන්හි සමවදිත්ද? අනුපිළිවෙළින් සමවත් යෙදෙන හෙයිනි. චතුවොකාර භවයෙහි ප්‍රථමධ්‍යානාදීන්ගේ උපතක්ම නැත. එහෙයින් එහි සමවදින්ට නොහකිය. කවර හෙයින් සමවදිත්ද? සංස්කාරයන්හි පැවතීම් බිඳීම්හි කළකිරී ඉහාත්මයෙහිම අචිත්තකව නිරෝධයට නිර්වාණයට පැමිණ සුවසේ වාසය කරන්නෙමුයි සමවදිති. කෙසේ මෙහි සමවැදීම වන්නේද? සමථ විදර්ශනා වශයෙන්, උද්‍යොගවත්ව කරන ලද පූර්වකෘත්‍යය ඇත්තේ, නේවසඤ්ඤානාසඤ්ඤායතනය නිරුද්ධ කරනුයේ මෙසේ මෙහි සමවැදීම වන්නේය. යමෙක් සමථ වශයෙන්ම උද්‍යෝගවත් වේද? හෙතෙම නේවසඤ්ඤානාසඤ්ඤා සමාපත්තියට පැමිණ සිටියි. යමෙක් විදර්ශනා වශයෙන්ම උද්‍යොගවත් වේද? හෙතෙම ඵල සමාපත්තියට පැමිණ සිටියි. යමෙක් වනාහි දෙපරිද්දෙන්ම උද්‍යොගවත් වේද? නේවසඤ්ඤා නාසඤ්ඤායතනය නිරුද්ධ කෙරේද? හෙතෙම එයට සමවදී. මෙහි මේ සංක්ෂෙපයයි. මේ විස්තරයයි. මෙ සස්නෙහි නිරෝධයට සමවදිනු කැමැති භික්ෂුව කරන ලද බත්කිස ඇත්තේ, මනාව දොවින ලද අත්පා ඇත්තේ, විවේකී අවකාශයෙකැ මනාව පනවන ලද අස්නෙක පර්යංකය බැඳ, කය ඍජුව පිහිටුවා ඉදිරියෙහි සිහිය එළවා හිඳගනී. හෙතෙම ප්‍රථමධ්‍යානයට සමවැද, නැගිට, එහි සංස්කාරයන්, අනිත්‍ය වශයෙන් දුක් වශයෙන්,

අනාත්ම වශයෙන් විදර්ශනා කරයි. මේ විදර්ශනාව තෙවදෑරුම් වන්නේය. සංස්කාරයන් පරීක්ෂා කරන විදර්ශනාව, ඵල සමාපත්ති විදර්ශනාව, නිරෝධ සමාපත්ති විදර්ශනාව වශයෙනි. එහි සංස්කාර පරීක්ෂා කරන විදර්ශනාව මන්දව හෝ තීක්ෂණව මාර්ගයට ආසන්න කාරණය වේ. ඵලසමාපත්ති විදර්ශනාව, මාර්ග භාවනාව සමානව තීක්ෂණව යෝග්‍ය වේ. නිරෝධ සමාපත්ති විදර්ශනාව වනාහි අතිමන්ද නොවූයේ, අති තීක්ෂණ නොවූයේ යෝග්‍ය වේ. එහෙයින් ඒ අතිමන්ද නොවූ, අති තීක්ෂණ නොවූ විදර්ශනාවෙන් එම සංස්කාරයන් විදර්ශනා කරයි. ඉක්බිති ද්විතිය ධ්‍යානයට සමවැද නැගිට එහි සංස්කාරයන් එසේම විදර්ශනා කරයි. ඉක්බිති තෘතිය ධ්‍යානයට -පෙ- ඉක්බිති විඤ්ඤානඤ්චායතනයට සමවැද, නැගිට එහි සංස්කාරයන් එසේම විදර්ශනා කරයි. එසේම ආකිඤ්චඤ්ඤායතනයට සමවැද නැගිට සිව්වැදෑරුම් පූර්වකෘත්‍යය කරයි. නානාබද්ධ අවිකෝපනය, සංඝපටිමානනය, සත්ථුපක්කොසනය, අද්ධාන පරිච්ඡේදය යන සතරයි.

එහි නානාබද්ධ අවිකොපන යනු මේ භික්ෂුව සමග යමක් ඒකාබද්ධ නොවේද? වෙන්ව බද්ධව පැවැති, පාසිවුරු හෝ ඇඳ පුටු හෝ නිවාස ගෘහ හෝ අනෙක් යම්කිසි පිරිකර වර්ගයක් වේද? යම්සේ එය විනාශ නොවේද? ගිනි, දිය, වායු, සොර, මීයන් ආදීන්ගේ වශයෙන් විනාශ නොවේද? එසේ අධිෂ්ඨාන කළයුතුයි. එහි මේ පිළිවෙළයි. මේ මේ දෑ මෙම සත්දින ඇතුළත ගින්නෙන් නොදැවේවා. ජලයෙන් පාවී නොයේවා. සුළඟින් විනාශ නොවේවා. සොරු ගෙන නොයත්වා. මීයෝ විසින් කඩා නොකත්වායි මෙසේ අධිෂ්ඨාන කළකල්හි ඒ සත්දින ඇතුළත ඊට කිසි උවදුරක් නොවේ. අධිෂ්ඨාන නොකළ කල්හි ගිනි ආදියෙන් නස්නේය. මේ නානාබද්ධ අවිකොපන නමැ. හඳනා පොරෝනා හෝ හුනස්න හෝ යන ඒකාබද්ධ යමක් වේද? එහි වෙන්ව අධිෂ්ඨාන කෘත්‍යයක් අවශ්‍ය නැත. සමවතම එය රකියි. සංඝ පටිමානනං යනු භික්ෂු සංඝයාගේ බලාපොරොත්තුව බැලීම, යම්තාක් ඒ භික්ෂුව පැමිණේද? ඒ තාක් සංඝ කර්මයාගේ නොකිරීම යයි අර්ථයි. මෙහිද බලාපොරොත්තුව මොහුට පූර්වකෘත්‍යය නොවේ. බලාපාරොත්තුව පිළිබඳ ආවර්ජනා කිරීම වනාහි පූර්ව කෘත්‍යයයි. එහෙයින් මෙසේ ආවර්ජනා කළයුතුයි. ඉදින් මම සත්දිනක් නිරෝධයට සමවැද හුන් කල්හි, සංඝයා අපලෝකන කර්මාදී කිසියම් කර්මයක් කරනු කැමැත්තේ වේද? යම්තාක් කිසියම් භික්ෂුවක් අවුත් මා නොකැඳවාද? එකෙණෙහිම නැගිටින්නෙමියි මෙසේ කොට

සමවැදුණු තැනැත්තේ වනාහි එසමයෙහි නැගිටින්නේමය. යමෙක් වනාහි මෙසේ නොකෙරේද? සංඝයාද රැස්ව ඔහු නොදක්නේ අසවල් භික්ෂුව කොහිදැයි විමසා නිරෝධයට සමවන්නේයයි කී කල්හි කිසියම් භික්ෂුවක් යවයි. යව, ඔහු සංඝයාගේ වචනයෙන් කැඳවවයි කියා. එකල්හි ඔහුට ඒ භික්ෂුව ශ්‍රවණ සීමාවෙහි සිට, ඇවැත්නි ඔබ සංඝයා බලාපොරොත්තු වෙයයි කී කල්හිම නැගිටීම වේ. මෙසේ සංඝයාගේ අණනම් බරය. (බරපතලය). එහෙයින් එය ආවර්ජනය කොට යම්සේ තෙමේම නැගිටීද? එසේ සමවැදිය යුතුය. සත්‍ථුපක්කොසනං යනු මෙහිද ශාස්තෘන් වහන්සේගේ කැඳවීම ආවර්ජනා කිරීමම මොහුගේ පූර්වකෘත්‍යයයි. එහෙයින් එයද මෙසේ ආවර්ජනා කළයුතුය. ඉදින් මා සත්දිනක් නිරෝධයට සමවැද හුන් කල්හි ශාස්තෘන් වහන්සේ බැසගත් (හටගත්) වස්තුවෙක ශික්ෂාපදයක් හෝ පණවත්ද? එබඳු වූ අර්ථෝත්පත්තියකදී ධර්මයක් දෙසයිද? යම්තාක් කිසිවෙක් අවුත් මා නොකැඳවයිද? එකෙණෙහිම නැගිටින්නෙමියි මෙසේ කොට හුන්කල්හි එසමයෙහි නැගිටින්නේමය. යමෙක් වනාහි මෙසේ නොකරයිද? ශාස්තෘන් වහන්සේද, සංඝයාද රැස්වූ කල්හි ඔහු නොදක්නේ, අසවල් භික්ෂුව කොහිදැයි විචාරා, නිරෝධයට සමවන්නේ යැයි කී කල්හි, කිසියම් භික්ෂුවක් යවයි, යව, ඔහු මාගේ වචනයෙන් කැඳවවයි කියා, ඉක්බිති ඔහුට ඒ භික්ෂුව විසින් ශ්‍රවණ සීමාවෙහි සිට, ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් ආමන්ත්‍රණය කෙරෙත්යයි කී කල්හිම නැගිටීම වේ. මෙසේ ශාස්තෘ කැඳවීම බරය. (බරපතලය) එහෙයින් එය ආවර්ජනය කොට යම්සේ තෙමේම නැගිටීද එසේ සමවැදිය යුතුය. අද්ධාන පරිච්ඡෙදො යනු ජීවිත කාලයාගේ පිරිසිඳීම, මෙම භික්ෂුව විසින් ජීවන කාල පිරිසිඳීමෙහි දක්ෂතාවයෙන් පිරිපුන් අයෙකු ලෙසින් ක්‍රියා කළ යුතුය. තමාගේ ආයු සංස්කාර සත්දිනක් පවතින්නේද? නොපවතින්නේදැයි ආවර්ජනා කොට සමවැදිය යුතුය. ඉදින් සත්දිනක් ඇතුළත නිරුද්ධ වන ආයු සංස්කාරයන් අනාවර්ජනය නොකොටම සමවදීද? ඔහුට නිරෝධ සමාපත්තිය මරණය වළක්වන්ට නොහැකි වේ. නිරෝධාන්තරයෙහි මරණයෙහි සිදුවීමක් නොමැති හෙයින්, අතරතුරදීම සමවතින් නැගිටියි. එහෙයින් එය ආවර්ජනය කොටම සමවැදිය යුතුය. සෙස්සෙහි ආවර්ජනා නොකිරීමද සුදුසුය. මෙය ආවර්ජනා කළ යුතුමය. හෙතෙම මෙසේ ආකිඤ්චඤ්ඤා නාසඤ්ඤායතනයට සම වදී. එකල්හි එකක්, දෙකක් චිත්තවාර ඉක්මවා අචිත්තක වේ. නිරෝධය ස්පර්ශ කරයි. මොහුට කුමක් හෙයින් ද්වි චිත්තයන්ගේ මත්තෙහි සිතේ නොපවතිත්ද? නිරෝධයාගේ ප්‍රයෝගතාවය

හෙයිනි. මෙය වනාහි මේ භික්‍ෂුවට සමථ-විදර්ශනා ද්වි ධර්මයන් යුගනද්ධ කොට, අට සමවත් ආරෝහණය අනුපූර්ව නිරෝධයෙහි ප්‍රයෝගයයි. නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහි ප්‍රයෝගය නොවේ. නිරෝධයෙහි ප්‍රයෝගය බැවින් ද්වි චිත්තයන්ගේ මතු පැවැත්ම නොවන්නේය.

කථං ඨානං යනු මෙසේ සමවන් මොහුට, කාල පරිච්ඡේද වශයෙන්ද, අන්තරායුක්‍ෂයද, සංඝපටිමානනයද, ශාස්තෲ කැඳවීමද, අභාවයෙන් සිටීම වේ. කථං වුට්ඨානං යනු අනාගාමීහුට අනාගාමි ඵල සමාපත්තියෙන්ද රහත්හුට අර්හත් ඵල සමාපත්තියෙන්දැයි මෙසේ දෙඅයුරින් නැගිටීම වේ. නැගිටියහුගේ සිත කවර ප්‍රවණතාවයක වේද? නිර්වාණ නිම්නව පවතී. එය කියන ලද්දේමය. ඇවැත්නි විශාඛය, සංඥාවේදයිත, නිරෝධ සමාපත්තියෙන් නැගිටියා වූ, භික්‍ෂුවගේ සිත විවේක නිම්නතා, විවේක නම්‍රතා, විවේක ප්‍රවණතා වූයේ වේ. මළහුගේද සමවන්නහුගේද වෙනස කවරේද? මෙම අර්ථයද සූත්‍රයේ යු.සේයි. දෙසූ පරිදි, ඇවැත්නි යම් මේ මළ, කාලක්‍රියා කළ අයෙක් වේද, ඔහුගේ කාය සංස්කාර නිරුද්ධ වී සන්සිඳිණ වාක් සංස්කාර චිත්ත සංස්කාර නිරුද්ධ වී සන්සිඳින ආයුෂ ක්‍ෂය වීය. උෂ්ණය සන්සිඳිණ. ඉන්‍ද්‍රියයෝ බිඳී ගියාහුය. යම් මේ භික්‍ෂුව සංඥාවේදයිත නිරෝධයට සමවන්නේ වේද? ඔහුගේද කාය සංස්කාර නිරුද්ධ වී සන්සිඳිණ. වාක් සංස්කාර, චිත්ත සංස්කාර නිරුද්ධ වී සන්සිඳිණ. ආයුෂ ක්‍ෂය නොවීය. උෂ්ණය නොසන්සිඳිණ. ඉන්ද්‍රියයෝ නොබිඳුණාහුය. කිමෙක්ද, නිරෝධ සමාපත්තිය සංඛතද ආදී විමසීමෙහි වනාහි සංඛතයැයි හෝ අසංඛතයැයි හෝ ලෞකිකයැයි හෝ ලෝකෝත්තරයැයි හෝ නොකිව යුත්තාහ. කුමක් හෙයින්ද? ස්වභාවයෙන් නොමැති හෙයිනි. සමවන්නහුගේ වශයෙන් සමවන්නාහු නම් වේ. එහෙයින් නිෂ්පන්නයයි කියන්ට සුදුසුයි. අනිෂ්ඵන්නයයි නොවටී.

**ඉති සනතං සමාපත්ති අයං අරිය සෙවිතා**
**දිට්ඨෙව ධම්මෙ නිබ්බාණමිති - සංඛ මුපාගතාති**

මෙම ආර්යයන් විසින් සේවනය කරන ලද. මෙසේ ශාන්ත වූ සමාපත්තිය ඉහාත්මයෙහි නිර්වාණය යන සංඛ්‍යාවට එළඹියේය.

**නිරෝධ සමාපත්ති ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

පරිනිර්වාණ ඤාණ නිර්දේශයෙහි ඉධ යනු මෙ සස්නෙහි **සම්පජානො** යනු සාර්ථක, සත්ප්‍රාය, ගොචර, අසම්මොහ යන සිව් විමසන ඤාණයන්ගෙන් යුත්, **පවත්තං** යනු හැමතැන සුදුසු පරිද්දෙන් නැගී සිටීම් වශයෙන් පැවැත්මද, අනුසය වශයෙන් පැවැත්මද, **පරියාදියති** යනු; උපචාර අර්පණා වශයෙන් කියන ලද, විෂ්කම්භන වශයෙන්, විදර්ශනා වශයෙන් කියන ලද, තදංග වශයෙන් මාර්ග වශයෙන් කියන ලද, කෙලෙසුන් විනාශ කිරීම් වශයෙන් ක්‍ෂය කරයි. නොපැවැත්ම කරයි. පෙය්‍යාල මුඛයෙන් ද්විතීයාදී ධ්‍යාන සමාපත්ති විදර්ශනා මාර්ග සංක්‍ෂෙප කරන ලද්දාහ. එය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නහුට පැවැති ඤාණය පරිනිර්වාණයෙහි ඤාණ නමැ. එහෙයින් විෂ්කම්භන, තදංග, සමුච්ඡේද පරිනිර්වාණයැයි කියන ලද්දේම වේ. ඒවායින් කෙලෙස් පරිනිර්වාණය ප්‍රත්‍යවේක්‍ෂා ඤාණය යූ.සේයි. නොහොත් 'පන' යනාදීන්ගෙන් ස්කන්ධ පරිනිර්වාණය, ප්‍රත්‍යවේක්‍ෂා ඤාණය නිර්දේශ කරන්නේය. **අනුපාදිසෙසාය නිබ්බාණධාතුයා** යනු නිර්වාණ ධාතුව දෙවදෑරුම්ය. සඋපාදිසෙස - අනුපාදිසෙස වශයෙනි. එහි මම, මගේ යයි තදින් ගනු ලැබේනුයිද, බොහෝ සේ ගනු ලැබේනුයිද උපාදියි. එය ස්කන්ධ පංචකයට විශේෂ නාමයකි. තදින්ගැනීමම සේස වූයේ ඉතිරි වූයේනුයි උපාදිසේසයි. උපාදිසේසයන් සමග පවතීනුයි සඋපාදිසෙසයි. උපාදිශේෂයන් සහිත දෑ පළමුව කියන ලදී. මේ අනුපාදිශේෂයෝය. ඒ අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන්, **චක්ඛුපවත්ති** යනු ඇසෙහි පැවැත්ම, ඇසෙහි පැවැතීම, **පරියාදියති** යනු ක්‍ෂය කරනු ලැබේ. මර්දනය කරනු ලැබේ. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

### පරිනිර්වාණ ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

සමසීසට්ඨ ඤාණ නිර්දේශයෙහි, **පඤ්චක්ඛන්ධා** යනාදීන්හි දසරාශින්ගෙන් සියලු ධර්ම සංග්‍රහය දතයුත්තේය. එක එක වශයෙන්, ආයතන ධාතු රාශින්ගෙන් තොර, සෙසු අටරාශින්හි වෙන් වෙන්ව සියලු ධර්ම සංග්‍රහ නොවේ. ලෝකෝත්තර ධර්ම හේතු නැසීමෙන් නැසිය යුත්තාහු නොවෙති. එහෙයින් සර්ව ධර්ම ශබ්දයෙන්, සංග්‍රහ කරන ලද ලෝකෝත්තර ධර්ම මුළුමනින් නැසීම් වශයෙන් යෙදෙන හෙයින් මෙහි නොගතයුත්තාහ. **සම්මා සමුච්ඡින්නති** සුදු පරිදි විෂ්කම්භන, තදංග, සමුච්ඡේද, ප්‍රහාණ වශයෙන් මැඩගෙන මතුවීම් වශයෙන්ද අප්‍රකටව

පවත්නා වශයෙන්ද, නිරුද්ධ කරනුයේ මනාව සිඳියි. මෙසේ පුද්ගලාධිෂ්ඨාන දේශනාවෙන් මනාව නැසීම විස්තර කරන ලදී. **නිරොධෙති** යනු අනුත්පාද නිරෝධයෙන් නිරුද්ධ කරයි. මෙයින් නැසීම් අර්ථය යූ.සේයි. **න උපට්ඨාති** යනු මෙසේ නිරුද්ධ කළ ඒ ඒ ධර්ම නැවත නොසිටියි. නූපදියි යන අර්ථයි. මෙයින් නිරෝධාර්ථය යූ.සේයි. මෙසේ නූපදින ධර්මයන්ගේ වශයෙන් නූපදින ස්වභාවය විස්තර කරන ලදී. **සමං** යනු කාමච්ඡන්දාදීන්ගේ සමනය කළ හෙයින් සමයි. ඒවා වනාහි නෛෂ්ක්‍රම්‍යාදීන්ගේ වශයෙන් සතකි. රූප අරූප ධ්‍යානයන්ගේ වශයෙන් අටකි. මහා විදර්ශනා වශයෙන් අටළොසකි. ආර්ය මාර්ග සතරදැයි තිස්හතක් වෙති.

තෙළෙස් ශීර්ෂ ශීර්ෂ වූ සියල්ලෙහි සංග්‍රහ වශයෙන් යූ.සේයි. මෙහි වනාහි ශ්‍රද්ධාදී අටශීර්ෂයෝම යෙදෙති. රහතුන්ට තෘෂ්ණාදී පඤ්ච ශීර්ෂයෝ නොමැත. **පළිබොධ සීසං** බාධාවීම පළිබෝධයයි නිර්වාණමාර්ග ආවරණයයි අර්ථයි. **සීසං** යනු ප්‍රධාන, අධිකය යන අර්ථයි. බාධාවම ශීර්ෂයි. ඒ හා එකට යෙදුණු සියලු බාධාවන්හිම ශීර්ෂයනුයි පළිබොධ සීසයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. විශේෂයෙන් වනාහි **බන්ධනං** යනු බැඳීමයි. උණ්ණතිකාම වශයෙන් සංසාරයෙහි බැඳීමයි. **පරාමාසො** යනු තදින් අල්වා ගැනීමයි. **වික්ඛෙපො** යනු විසුරුණු බව. **කිලෙසො** යනු කිලිටිවීමයි. **අධිමොක්ඛො** යනු ස්ථිර ලෙස පිහිටීම. **පග්ගහො** උත්සාහය **උපට්ඨානං** නොඉල්පීමයි. **අවික්ඛෙපො** යනු නොවිසුරුණු බවයි. **දස්සනං** යථා ස්වභාව අවබෝධයයි. **පවත්තං** යනු තෘෂ්ණාදීන් විසින් ගන්නා ලද ස්කන්ධයන්හි පැවැති; **ගොචරො** යනු අරමුණයි. මේ ද්වාසාකාර වාරයන්හි ප්‍රධානාර්ථය සීසාර්ථයි. **විමොක්ඛො** යන විෂ්කම්භන, තදංග, සමුච්ඡෙද, පටිප්පස්සද්ධි, නිස්සරණ යන පඤ්ච විමුක්තීන්හි නිස්සරණ, විමුක්ති සංඛ්‍යාත නිර්වාණයයි. **සංඛාර සීසං** යනු සියලු ප්‍රත්‍යයන්ගෙන් හටගත් සංස්කාරයන්ගේ ශීර්ෂය, කෙළවර, අවසානය යන අර්ථයි. ඉන් අනුපාදිසේස පරිනිර්වාණය යූ.සේයි. සංස්කාර අභාවමාත්‍ර වශයෙන් හෝ ස්කන්ධ පරිනිර්වාණයම යූ.සේයි. නෛෂ්ක්‍රම්‍යාදී වූ සමයද ශ්‍රද්ධාදී වූ ශීර්ෂයද යන සමශීර්ෂයක් මොහුට ඇත්තේනුයි සමසීසියි. නොහොත්, තෙළෙස් ශීර්ෂයන්ගේ තෘෂ්ණාදී පඤ්ච ශීර්ෂයන් සමුදය සත්‍යයයි. ශ්‍රද්ධාදී පඤ්චකය මාර්ග සත්‍යයයි. ප්‍රවෘත්ත ශීර්ෂයද ජීවිතින්ද්‍රියද දුක්ඛ සත්‍යයයි. ගොචර ශීර්ෂයද, සංස්කාර ශීර්ෂයද, නිරෝධ සත්‍යයද යන මේ සිව් ආර්ය සත්‍යයන්ගේ එක් රෝගයක හෝ එක් ඉරියව්වක හෝ එක් සමාන

ජීවිතේන්ද්‍රියක හෝ අවබෝධයද, අනුපදිසේස පරිනිර්වාණයද, යමෙකුට වෙයිද? හෙතෙම පෙර කියන ලද 'සමයන්ගේද මේ ශීර්ෂයන්ගේද අස්තිත්වයෙන් සමසීසී යයි කියනු ලැබේ.

**සමසීසට්ඨ ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

සලෙලබට්ඨ ඤාණ නිර්දේශයෙහි, **රාගො පුථු** රාගය වෙන්වූයේ ලෝකෝත්තර ධර්මයන් සමග මිශ්‍රනොවූ යන අර්ථයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **රාගො** යනු ඇලීම් අර්ථයෙන්; **දොසො** යනු දූෂ්‍යවීම් අර්ථයෙන්; **මොහො** යනු මුළාවීම් අර්ථයෙන්; රාගය ඇලීම් ලක්‍ෂණයි. ද්වේශය දූෂ්‍යවීම් ලක්‍ෂණයි. මෝහය මුළාවීම් ලක්‍ෂණයි යන ශීර්ෂ ක්ලේශත්‍රය කියා, දැන් ප්‍රභේද වශයෙන් දක්වන්නේ කොධො ආදිය වදාළහ. එහි කිපීම් ලක්‍ෂණය කොධොයි. මෙහි සප්ත වස්තුක වශයෙන් අදහස් කරන ලදී. වෛර බැඳීම් ලක්‍ෂණය **උපනාහොයි.** දෘඪභාවයට පත් ක්‍රෝධයමය. අන් ගුණ මැකීම් ලක්‍ෂණය **මක්ඛොයි.** අන්ගුණ අත්හැරීමයි යන අර්ථයි. යුගග්‍රාහී ලක්‍ෂණය **පලාසොයි.** යුගග්‍රාහ වශයෙන් අන්ගුණ දැක්මයයි යන අර්ථයි. අන් සම්පත් විනාශකරන ලක්‍ෂණය **ඉස්සායි.** අන්සම්පත් නොඉවසන ලක්‍ෂණයයි යන අර්ථයි. තම සම්පත් සඟවන ලක්‍ෂණය **මච්ඡරියංයි.** මාගේ සම්පත් අන්‍යයාට නොවේවා යන අර්ථයි. තමා කළ පව් වැසීම් ලක්‍ෂණය **මායායි.** වැසීම් අර්ථයෙන් මායාවක් මෙනැයි අර්ථයි. තමාගේ අවිද්‍යමාන ගුණ ප්‍රකාශන ලක්‍ෂණය **සාඨෙය්‍යංයි.** කපටිභාවය යන අර්ථයි. චිත්තයාගේ ඉදිමුණු බව ලක්‍ෂණකොට ඇත්තේ **ථම්භොයි.** ඉහළ නැගීම් ලක්‍ෂණය **මානොයි.** අතිශයින් ඉහළ නැගීම් ලක්‍ෂණය **අතිමානොයි.** මත්බව ලක්‍ෂණකොට ඇත්තේ **මදොයි.** පස්කම් ගුණයන්හි සිත මූර්ඡා වීම ලක්‍ෂණකොට ඇත්තේ **පමාදොයි.**

මෙසේ වෙන් වෙන් කෙලෙස් වශයෙන්, අසම්මිශ්‍රකම් දක්වා කියන ලද හා නොකියන ලද කෙලෙස්ද, අන්‍ය කෙලෙස්ද, සියල්ල එකට සංග්‍රහ කිරීම් වශයෙන් දක්වන්ට, 'සබ්බෙකිලෙසා' ආදිය වදාළහ. එහි මෙලෝ පරලෝහිදී සත්ත්වයින් කිලිටි කරත්. තවත් බාධාකරත්තුයි ක්ලේශ නමැ. අකුසල කර්මපථ සංගෘහිතවද අසංගෘහිතවද වේ. නොමනා සේ වූ, හෝ චරිත, දුෂ්ට වූ චරිතනුයි දුශ්චරිතයි. ඒවා වනාහි, කාය, වචී, මනෝ දුශ්චරිත වශයෙන් තෙවදෑරුම්ය. විපාක රැස් කෙරෙත්තුයි අභිසංඛාරයි.

ඒවාද, පුඤ්ඤාභි සංස්කාර, අපුඤ්ඤාභි සංස්කාර, ආනෙඤ්ජාභිසංස්කාර යැයි තෙයාකාරය. විපාක වශයෙන් භවයට යෙත්නුයි භව ගාමිනොයි. භවගාමී වූ කර්ම භවගාමී කර්මයි. මෙයින් රැස්කිරීම් භාවය ඇතිකල්හිද, විදීම් රහිත කර්මයෝ ප්‍රතික්ෂෙප කරන ලද්දාහු වෙති. මේ දුච්චරිතා - කම්මා යන විසේස ලිංග විපර්යාස කරන ලදී. **නානත්තෙකත්තං** යන මෙහි උද්දෙසයෙහි, එකත්ත ශබ්දයාගේ අභාවයෙහිද, නානත්ව ඒකත්වයන්ගේ ඔවුනොවුන් අපේක්ෂා කළ හෙයින්ද, ඒකත්වයද නිර්දේශ කරනු කැමැත්තේ නානත්තෙකත්තයයි උද්දෙසය කරන ලදී. නානත්ව සලෙලබයෙහි ඒකත්වය දැක්වූ කල්හි සලෙලබ ඤාණය පහසුවෙන් පෙන්වයි. **නානත්තං** යනු අස්ථිර බැවින්ද, සැලෙන බැවින්ද නොයෙක් ආකාර ස්වභාවයයි. **එකත්තං** යනු ස්ථිර බැවින්ද, නොසැලෙන බැවින්ද ඒකාකාරි ස්වභාවයයි. **චරණතෙජො** යනු හැසිරෙත්. එයින් නොගිය දිශාවට, නිර්වාණයට යෙත්නුයි චරණංයි. එය කිමෙක්ද, සීලයයි. එයම විරුද්ධතාවයන් තවන අර්ථයෙන් තේජෝයි. **ගුණතෙජො** යනු සීලයෙන් ලද පිහිට ඇති සමාධි තේජසයි. **පඤ්ඤාතෙජො** යනු සමාධියෙන් ලද පිහිට ඇති විදර්ශනා තේජසයි. **පුඤ්ඤතෙජො** යනු විදර්ශනාවෙන් ලද පිහිටැති ආර්ය මාර්ග කුසල් තේජසයි. **ධම්මතෙජො** යනු සිව් තෙදසුන්ට පිහිට වූ බුදුවදන් තේජසයි. **චරණ තෙජෙන තෙජිතත්තා** යනු සිල්තෙදින් තියුණු කළ හෙයින් **දුස්සීල්‍ය තෙජං** යනු දුස්සීලභාව සංඛ්‍යාත තේජසයි. එයද සිත් පරම්පරාව තවන හෙයින් තේජස නමැ.

**පරියාදියති** යනු ක්‍ෂය කරයි. **අගුණ තෙජං** යනු සමාධියට ප්‍රතිපක්‍ෂ වික්‍ෂෙප තේජසයි. **දුප්පඤ්ඤ තෙජං** යනු විදර්ශනා ඤාණයට ප්‍රතිපක්‍ෂ මෝහ තේජසයි. **අපුඤ්ඤතෙජං** යනු ඒ ඒ මාර්ගයෙන් නැසිය යුතු කෙලෙස් ප්‍රහාණයෙන් කෙලෙසුන්ට සහාය වූ අකුසල කර්මතේජසයි. හුදෙක් එය අකුසලයම ක්‍ෂය කරන්නේ නොවේ. 'මහණෙනි, කෘෂ්ණ නොවූ, ශුක්ල නොවූ කර්මයක් ඇත. කෘෂ්ණ(කලු) නොවූ, ශුක්ල(සුදු) නොවූ එම කර්මය කර්මක්‍ෂය සඳහා පවතී' යන වචනයෙන් කුසල කර්මයද ක්‍ෂය කරයි. පුණ්‍යතේජසට ප්‍රතිපක්‍ෂ වශයෙන් අපුණ්‍ය තේජසම යු.සේයි. **අධම්මං තෙජං** යනු නොයෙක් තීර්ථකයින්ගේ ආගම් වචන තේජසයි. මෙම ඤාණයාගේ උද්දෙසීම් වර්ණනායෙහි කියන ලද, දෙවන අර්ථ විකල්පයෙහි රාගාදී එකුන්විසි වෙන්වූ දූසිත් තේජස් වෙයි. **අභිසංඛාරා භවගාමි කම්මා** යනු, මෙහි අපුණ්‍යාභි සංස්කාර අකුසල කර්මයද, අපුණ්‍ය තේජසයෝද වෙති. ආනෙඤ්ජාභි සංස්කාරයන්ද, ලෞකික කුසල

කර්මයන්ද, පුණ්‍ය තේජසින්ම ක්‍ෂය කළයුතු හෙයින් අපුණ්‍යතේජ පාක්‍ෂිකවම වෙයි. කාමච්ඡන්දාදී පසළොස් නානත්වයන් අගුණ තේජස් වේ. නිත්‍ය සංඥාදී අටළොස් නානත්ව දුශ්ප්‍රාඥ තේජස් වේ. සිව්මගින් නැසියයුතු සිව් නානත්ව අපුණ්‍ය තේජස් වේ. සෝවාන් මාර්ගයෙන් නැසියයුතු නානත්වයෙන් අධර්ම තේජස සංග්‍රහ කටයුතුයි. නිර්දේශයෙහි, සල්ලෙඛ ප්‍රතිපක්‍ෂ අසල්ලෙඛයේ සල්ලෙඛය දක්වනු කැමැත්තෙන් අසල්ලෙඛ පූර්වක සල්ලෙඛය දක්වන ලදී. නෛෂ්ක්‍රම්‍යාදී සත්තිස් ඒකත්ව ධර්මයෝම විරුද්ධ වූවන් හීන්කොට පෙතිගසා ලියන හෙයින් සල්ලෙඛ යයි යූ.සේයි. ඒ නෛෂ්ක්‍රම්‍යාදී වූ සත්තිස් ප්‍රභේද සල්ලෙඛයෙහි ඤාණය සල්ලෙඛට්ඨ ඤාණයයි.

## සල්ලෙකට්ඨ ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

විරියාරම්භ ඤාණ නිර්දේශයෙහි, **අනුප්පන්නානං** යනු එක් ආත්ම භාවයක, එක් අරමුණක හෝ නූපන්නා වූ, අනවරාග්‍ර සසරෙහි නූපන්නා වූ අකුසල නම් නැත. කුසල් වනාහි ඇත. **පාපකානං** යනු ලාමක වූ. **අකුසලානං ධම්මානං** යන අදක්‍ෂතායෙන් හටගත් ධර්මයන්ගේ; **අනුප්පාදාය** යනු නොඉපදවීම සඳහා. **උප්පන්නානං** යනු මෙ අත්බැව්හි නිපන්; **පහානාය** යනු දුරලීම පිණිස, **අනුප්පන්නානං කුසලානං ධම්මානං** යනු මෙ අත්බැව්හි, නොනිපන් විරූ, දක්‍ෂතායෙන් හටගත් ධර්මයන්හි, **ඨිතියා** යනු පැවතීම සඳහා **අසම්මොසාය** යනු විනාශනොවීම සඳහා, **භීය්‍යොභාවාය** යනු නැවත නැවත වීම (අභිවෘද්ධිය) සඳහා, **වෙපුල්ලාය** යනු මහත්භාවය සඳහා, **භාවනාය** යනු අභිවෘද්ධිය සඳහා, **පාරිපූරියා** සම්පූර්ණත්වය සඳහා.

දැන් අකුසලයන්හි කාමච්ඡන්දයද, කුසලයන්හි නෛෂ්ක්‍රම්‍යයද, විසේසකොට දක්වන්ට, අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස ආදිය වදාළහ. එහි **කාමච්ඡන්දො** යනු සමාධි ප්‍රතිපක්‍ෂ කාමරාගයයි **නෙක්ඛම්මං** ප්‍රථම ධ්‍යාන සමාධිය. ප්‍රථම ධ්‍යානය හෝ, සියලුම කුසල්දම් හෝ නෛෂ්ක්‍රම්‍යයයි.

සියලු කෙලෙසුන්ගේ, සියලු කෙලෙස් ප්‍රතිපක්‍ෂ, අර්හත් මාර්ගයාගේද, වශයෙන් යොදා දක්වන්ට අනුප්පන්නානං සබ්බ කිලෙසානං ආදිය වදාළහ. එහි **උප්පන්නස්ස අරහත්ත මග්ගස්ස ඨිතියා** ආදීන්හි

උත්පාද ක්ෂණයෙහි උපන්නා වූ අර්හත් මාර්ගයාගේද, ස්ථිතික්ෂණ, භංග ක්ෂණ වශයෙන්, ස්ථිතිය යැයි ආදි යෙදුම් දතයුත්තාහ. විභංග අට්ඨකථායෙහිද, යම් පැවැත්මක් වන්නීද, එය ස්ථිති නමැයි යූ.සේයි. සමහරු වනාහි අර්හත් මාර්ගයෙහි පූර්වභාග මාර්ගය දතයුතුයැයි කියති.

වීරියාරම්භ ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.

අර්ථ සන්දර්ශන ඥාණ නිර්දේශයෙහි, **පඤ්චක්ඛන්ධායන** ආදිය කියන ලද අර්ථයමය. **පකාසෙති** ප්‍රකට කරයි. අසන්නන්ගේ නැණැසින් දැක්ම සැපයේයයි අර්ථයි. **නානාධම්මා** ලෞකික ලෝකෝත්තර සියලු ධර්ම යූ.සේයි. කුමක් හෙයින් ප්‍රකාශන නිර්දේශයෙහි ලෞකික ඒවාම කියන ලද්දේ නොවේද? අනිත්‍යාදී වශයෙන් ප්‍රකාශනය අරඹන ලද හෙයිනි. ලෝකෝත්තරයන් අසම්මශ්‍රණ යුක්ත හෙයින්, ලෝකෝත්තරයන් නොකියන ලදී. නා නා ධර්ම නිර්දේශයෙන් හා අර්ථ සංදර්ශන නිර්දේශයෙන්ද, ඒවා සංගෘහිත හෙයින්, යම්සේ ඒවා ප්‍රකාශ කළ යුතුද, එසේ ප්‍රකාශිතය.

පජහනෙතා යනු අසන්නා දුරුකරවනුයේ යන අර්ථයි. **සන්දසෙසති** යනු අසන්නන්ට මනාව දක්වයි. සමහරු වනාහි කාමච්ඡන්දයාගේ ප්‍රහීණ හෙයින් නෛෂ්ක්‍රම්‍යාර්ථය මනාව පෙන්වත් ආදී ක්‍රමයෙන් කියවති. ඒවාහි ඍජුවම ශ්‍රෝතෘන්ගේ දොස් ප්‍රහාණයන්ද ගුණ ප්‍රතිලාභයන්ද කළ කල්හි දේශනා ඥානය මස්තකප්‍රාප්ත වේයයි දැක්වීම සඳහා මේ ක්‍රමය කියන ලදැයි දතයුතුය.

අර්ථ සංදර්ශන ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.

දර්ශන විසුද්ධි ඥාණ නිර්දේශයෙහි, **සබ්බෙ ධම්මා එකසංගහිතා** යනු සියලු සංඛත අසංඛත ධර්මයෝ එක් සංඛ්‍යායෙන් සංග්‍රහ කරන ලද්දාහ. පිරිසිඳින ලද්දාහ. **තථට්ඨෙන** යනු විද්‍යමානාර්ථයෙන්, තම තමාගේ ස්වභාව වශයෙන් විද්‍යමානාර්ථයෙනැයි අර්ථයි. **අනත්තට්ඨෙන** කරන්නා, විඳින්නා යන සංඛ්‍යාත වූ ආත්ම රහිතාර්ථයෙන්, **සච්චට්ඨෙන** යනු සත්‍යාර්ථයෙන්, තමාගේ ස්වභාවය දැන ආත්මීය වශයෙන් ව්‍යවස්ථාපන අභාවයෙන් යන අර්ථයි. **පටිවෙධට්ඨෙන** යනු ස්වභාව වශයෙන්

ඥාණයෙන් ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන්, මෙහි ලෝකෝත්තර ඥාණයෙන්, මුළානොවීම් වශයෙන්, අරමුණු වශයෙන් ප්‍රතිවේධය දතයුතුය. **අභිජානනට්ඨෙන** යනු ලෞකික ඥාණයෙන්, අරමුණු වශයෙන්ද, ලෝකෝත්තර ඥාණයෙන් මුළානොවීම් වශයෙන්ද, අරමුණු වශයෙන්ද, ඒ ඒ ධර්මයන්ගේ ස්වභාව වශයෙන් විශේෂයෙන් දැනීම් අර්ථයෙන්, 'මහණෙනි, සියල්ල විශිෂ්ට සේ දතයුතුය' යනාදියෙහි යූ.සේයි. **පරිජානනට්ඨෙන** යනු කියන ලද ක්‍රමයෙන්ම ලෞකික ලෝකෝත්තර ඥාණයන්ගෙන් ස්වභාව වශයෙන් විශිෂ්ට ලෙස දත් ධර්මයන්ගේ, අනිත්‍යාදී වශයෙන්ද සසරින් නිදහස්වීම් වශයෙන්ද, පිරිසිඳ දතයුතු අර්ථයෙන්, 'මහණෙනි, සියල්ල විශේෂයෙන් දතයුතුය' යනාදියෙහි යූ.සේයි. **ධම්මට්ඨෙන** යනු ස්වභාව දැරීම් ආදී ධර්මාර්ථයෙන්, **ධාතට්ඨෙන** යනු ජීව රහිතාදී ධාත්වර්ථයෙන්, **ඥාතට්ඨෙන** ලෞකික ලෝකෝත්තර ඥාණයන්ගෙන් දැනගන්ට හැකිවන්නේය යන අර්ථයෙන්, යම්සේ දක්නට හැකිවන්නේය යනාදී අර්ථයෙන් දිට්ඨං, සුතං, මුතං විඤ්ඤාතං රූපං යයි යූ.සේයි. මෙසේ මෙහිද දැනගන්ට හැකිවන්නේය යන අර්ථය ඥාතාර්ථයයි දතයුතුය.

**සච්ඡිකිරියට්ඨෙන** යනු අරමුණු වශයෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු අර්ථයෙන්, **ඵුසනට්ඨෙන** යනු ප්‍රත්‍යවේක්ෂා කරන ලද අරමුණු වශයෙන් නැවත නැවත ස්පර්ශ කිරීම් අර්ථයෙන්, **අභිසමයට්ඨෙන** යනු ලෞකික ඥාණයෙන් විශේෂයෙන් අවබෝධ කළයුතු අර්ථයෙන්, කිසිසේත් චතුස්සත්‍යයාගේ අවිපරීත භාවයෙහි පැවැති ප්‍රඥාව සත්‍ය විවර්ත ඥාණයයි. අභිඥා ප්‍රඥාව ඥාතාර්ථයෙහි ඥාණයයි. සාක්ෂාත් කිරීමේ ප්‍රඥාව ස්පර්ශකිරීම් අර්ථයෙහි ඥාණය යයි එකිනෙකම වූ ඥාණ යූ.සේයි. අටුවායෙහිද,

**සමවායෙ ඛණෙ කාලෙ - සමූහෙ හෙතු දිට්ඨීසු**
**පටිලාභෙ පහානෙච - පටිවෙධෙච දිස්සති**

රැස්වීමෙහි, ක්ෂණයෙහි, කාලයෙහි, සමූහයෙහි, හේතුයෙහි දෘෂ්ටීන්හි - ප්‍රතිලාභයෙහි, ප්‍රහාණයෙහි, ප්‍රතිවේධයෙහිද පෙනේ. ගාථා වර්ණනාවෙහි අභිසමය ශබ්දයාගේ ප්‍රතිවේධාර්ථය යූ.සේයි. මෙහි වනාහි කියන ලද අර්ථයෙන් ඒවාහි නානත්වය දතයුතුයි. අට්ඨකථායෙහිම ලෞකික ඥාණ වශයෙන් ඒ ධර්මාභිසමය යූ.සේයි. **කාමච්ඡන්දොනානත්තං** වික්ෂෙප ස්වභාව හෙයින්, නානාරම්මණ හෙයින් නොයෙක් ආකාර ස්වභාවයැයි අර්ථයි.

මෙසේ සියලු කෙලෙස් දතයුත්තාහ. **නෙක්ඛම්මං එකත්තං** චිත්තෛකාග්‍රතා ස්වභාව හෙයින්, නානාරම්මණ වික්ෂෙප අභාව හෙයින්ද, එක් ස්වභාවය යැයි අර්ථයි. මෙසේ සියලු කුසල් දතයුත්තාහ. මෙහි පෙය්‍යාලයෙන් සංක්ෂෙප කරන ලද, ව්‍යාපාදාදී අකුසලයන්ගේ කියන ලද ආකාර අර්ථයෙන් නානාත්වය දතයුතුය. විතර්ක විචාරාදීන්ගේ වනාහි යට යට ඒවාට මත්තෙහි දළ අර්ථයෙන් නානත්වය දතයුතුය. ඒක සංගෘහිත නානත්ව ඒකත්වයන්ගේ ප්‍රතිවේධය මාර්ග ක්ෂණයෙහි සත්‍යය ප්‍රතිවේධයෙන් සිදුවෙයි. එහෙයින් ප්‍රතිවේධයයි පදය උදුරා දක්වා සත්‍යාවබෝධය දැක්වීය. **පරිඤ්ඤා පටිවෙධං පටිවිජ්ඣති** යනු විශේෂයෙන් දතයුතු අවබෝධයෙන් අවබෝධ කරයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. සත්‍යාවබෝධ කාලයෙහි මාර්ගඥානයට එකෙණෙහිම පරිඥා, ප්‍රහාන, සාක්ෂාත් ක්‍රියා, භාවනා යන සිව් කෘත්‍යයෝ වෙති. යම්සේ නැව පෙර පසු නොවී එකෙණෙහිම, මෙතෙර අත්හරියි. දිය ස්‍රෝතස සිඳියි. භාණ්ඩ උසුලයි. පරතෙරට පැමිණේ යන සිව් කෘත්‍යයන් කරයි. එපරිද්දෙන්ම මාර්ගඥානය පෙර පසු නොවී එකෙණෙහි සිව්සස් අවබෝධ කරයි. දුක විශේෂ දැනීම් අවබෝධයෙන් අවබෝධ කරයි. සමුදය ප්‍රහාණ අවබෝධයෙන් අවබෝධ කරයි. මාර්ගය භාවනා අවබෝධයෙන් අවබෝධ කරයි. නිරෝධය සාක්ෂාත් කිරීම් අවබෝධයෙන් අවබෝධ කරයි යයි යු.සේයි. නිරෝධය අරමුණුකොට කෘත්‍ය වශයෙන්, චතුරාර්ය සත්‍යයන් අවබෝධ කරයි. දකියි. ප්‍රතිවේධ කරයි. යම්සේ මෙතෙර අත්හරීද, මෙසේ මාර්ග ඥානය දුක මනාව දැනගනී. යම්සේ ස්‍රෝතස සිඳීද? මෙසේ සමුදය අත්හරියි. යම්සේ භාණ්ඩ උසුලයිද? මෙසේ සහජාත ප්‍රත්‍යතායෙන් මාර්ගය වඩයි. යම්සේ පරතෙරට පැමිණේද? මෙසේ පරතෙර වූ නිරෝධය සාක්ෂාත් කරයි. මෙසේ උපමා සංසන්දනය දතයුතුය.

**දස්සනං විසුජ්ඣති** යනු ඒ ඒ මාර්ගයෙන් නැසිය යුතු කෙලෙස් අඳුර ප්‍රහාණයෙන් ඥාණ දර්ශනය විසුද්ධභාවයට පැමිණේ. **දස්සනං විසුද්ධං** යනු ඒ ඒ ඵලයාගේ උත්පාද ක්ෂණයෙහි ඒ ඒ මාර්ග ඥාණයාගේ කෘත්‍ය සිද්ධිප්‍රාප්තියෙන් ඥාණ දර්ශනය විසුද්ධභාවයට පත්වූයේ වේ. සියලු ධර්මයන්ගේ ඒක සංගෘහිත හෙයින් නානත්ව, ඒකත්ව ප්‍රතිවේධ ප්‍රඥාවෙන් මාර්ගඵල ඥාණයන්ගෙන් සිදුවන හෙයින් අන්තයෙහි මාර්ගඵල ඥාණයන් යු.සේයි.

**දර්ශන විශුද්ධි ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.**

ක්ෂාන්ති ඤාණ හාත්පසින් බැසගන්නා වූ ඤාණ නිර්දේශයන්හි, **රූපං අනිච්චතො විදිතං** යනු අනිත්‍යානුපස්සනාවෙන් අනිත්‍යයයි දන්නා ලද්දේ, **රූපං දුක්ඛතො විදිතං** යනු දුක්ඛානුපස්සනාවෙන් දුකයයි දන්නා ලද්දේ, **රූපං අනත්තතො විදිතං** යනු අනාත්මානුපස්සනාවෙන් අනාත්ම යයි දන්නා ලද්දේ, **යං යං විදිතං තං තං ඛමති** යනු යම් යම් රූපයක් අනිත්‍යාදී වශයෙන් දන්නා ලද්දේද, ඒ ඒ රූපය අනිත්‍යාදී වශයෙන් ඉවසයි. රුචි වේ. රූපය අනිත්‍ය වශයෙන් දන්නා ලද්දේ, යම් යම් දැයක් දන්නා ලද්දේද? ඒ ඒ දෑ ඉවසයි යයි වෙන් වෙන්කොට සමහර පොත්වල ලියන ලදී. වේදනා, සංඥා, සංස්කාර, අනිත්‍ය වශයෙන් දන්නා ලද්දේයයි ලිංග වචන, පෙරළා යෙදිය යුත්තාහ. **ඵුසති** යනු විදර්ශනා ඤාණ ස්පර්ශයෙන් ස්පර්ශ කරයි. පැතිරේ. **පරියොගහති** යනු විදර්ශනා ඤාණයෙන් පිවිසේ. පරියොගාහතියිද පාඨයි.

**ක්ෂාන්ති ඤාණ පරියොගාහන ඤාණ නිර්දේශ වර්ණනා නිමි.**

ප්‍රදේශ විහාර ඤාණ නිර්දේශයෙහි, යම් ආකාරයකින් මාතෘකාවෙහි උදෙසන ලද,. ප්‍රදේශය ප්‍රත්‍යවේක්ෂා කටයුතුද? එය දක්වන්නේ 'මිථ්‍යා දෘෂ්ටි ප්‍රත්‍යයෙන්ද විඳීම'යැයි ආදිය වදාළහ. එහි - **මිච්ඡාදිට්ඨි පච්චයා** යනු දෘෂ්ටි සම්ප්‍රයුක්ත වේදනාවද වටී. දෘෂ්ටිය උපනිශ්‍රයකොට උපන් කුසල් අකුසල් වේදනාද විපාක වේදනාද, එහි මිථ්‍යා දෘෂ්ටි සම්ප්‍රයුක්ත අකුසලම වේ. දෘෂ්ටිය උපනිශ්‍රයකොට කුසල්ද අකුසල්ද උපදී. මිථ්‍යාදෘෂ්ටිකයෝ දෘෂ්ටිය උපනිශ්‍රයකොට කාලපක්ෂ, ශුක්ල පක්ෂ දිනයන්හි කැඳබත් ආදිය දෙති. අන්ධ, කුෂ්ට ආදීන්ට වැටුප් පිහිටුවති. සිව්මංසල්හි විශ්‍රාමශාලා කරති. පොකුණු හාරති. පුෂ්පාරාම ඵලාරාම රෝපණය කරති. ගංගා දුර්ගම ස්ථානයන්හි ඒදඬු අතුරති. විසම ස්ථාන සම කරති. මෙසේ ඔවුන්ට කුසල වේදනා උපදී. මිථ්‍යා දෘෂ්ටිය නිසා සම්‍යක් දෘෂ්ටිකයින්ට අක්‍රෝශ කරති. පරිභව කරති. වධබන්ධනාදිය කරති. ප්‍රාණීන් මරා දේවතාවුන්ට එළවති. මෙසේ ඔවුන්ට අකුසල් වේදනා උපදී. භවන්තරගත වූවන්ට විපාක වේදනා වෙයි. ඒ මිථ්‍යාදෘෂ්ටිය සමග හටගත් වේදනාවට සහජාත, අඤ්ඤමඤ්ඤ, නිඃසය, සම්ප්‍රයුක්ත, අත්‍ථි, අවිගත ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වෙයි. සමනන්තර නිරුද්ධ මිථ්‍යා දෘෂ්ටිය වර්තමාන මිථ්‍යා දෘෂ්ටි සම්ප්‍රයුක්ත වේදනාවට, අනන්තර, සමනන්තර උපනිශ්‍රය, ආසේවන, නත්‍ථි, විගත යන ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වෙයි. මිථ්‍යා දෘෂ්ටිය ගරුකොට

සතුටුවන්නහුගේ ලෝභ සහගත වේදනාවට, ආරම්මණ අධිපති, ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වෙයි. සියලු අකුසලයන්හි, මිථ්‍යා දෘෂ්ටි ආරම්මණ මාත්‍රය කරන්නහුට, සියලු අකුසල් වේදනාවෙහි, මිථ්‍යාදෘෂ්ටිය, ප්‍රත්‍යවේක්‍ෂා කරමින්, විදර්ශනා කරන්නහුට, කුසලාව්‍යාකෘත වේදනා වශයෙන් ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මිථ්‍යාදෘෂ්ටි හේතුවෙන් උපදින්නා වූ කුසලාකුසල වේදනාවන්ට භවන්තර විපාක වේදනාවන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**මිච්ඡාදිට්ඨි වූපසම පච්චයා** යනු මිථ්‍යාදෘෂ්ටි සන්සිඳීම නම් සම්‍යක් දෘෂ්ටියයි. සම්‍යග් දෘෂ්ටි ප්‍රත්‍යයෙන් යම් විඳීමක් කියන ලද්දේද? එයම මිථ්‍යාදෘෂ්ටි සන්සිඳීම් ප්‍රත්‍යයයි දතයුතුය. සමහරු වනාහි මිථ්‍යා දෘෂ්ටි සන්සිඳීම නම් විදර්ශනා ක්‍ෂණයෙහි සෝවාන් ඵලක්‍ෂණයෙහි යයි කියති. **සම්මා දිට්ඨි පච්චයාපි වෙදයිතං** යනු මෙහිද සම්‍යග් දෘෂ්ටි සම්ප්‍රයුක්ත වේදනාවද සුදුසුය. සම්‍යක් දෘෂ්ටිය උපනිශ්‍රයකොට උපන් කුසලාකුසල වේදනාවද, විපාක වේදනාවද වේ. එහි සම්‍යග් දෘෂ්ටි සම්ප්‍රයුක්ත වූවාහු කුසල්ම වේ. සම්‍යග් දෘෂ්ටිය උපනිශ්‍රයකොට, බුද්ධපූජා, පහන් පූජා, මල් රෝපණ, මහා ධර්මශ්‍රවණ, නොපිහිටි දිසාභාගයන්හි චෛත්‍යයන් පිහිටුවීමය යන මේ ආදී පින් කරත්. මෙසේ ඔවුන්ට කුසල වේදනා උපදී. සම්‍යග් දෘෂ්ටියම නිසා මිථ්‍යාදෘෂ්ටිකයින්ට අක්‍රොශ කරති. පරිභව කරති. තමා උසස්කොට සලකති. අනුන් පහත්කොට සලකති. මෙසේ ඔවුන්ට අකුසල් වේදනා උපදියි. විපාක වේදනා භවන්තරගත වූවන්ටම වෙයි. එම සම්‍යග් දෘෂ්ටිය සමග හටගත්, සමනන්තර නිරුද්ධ වූ, වර්තමාන වේදනාවට, මිථ්‍යාදෘෂ්ටියෙහි කියන ලද ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වන්නේය. ලෞකික සම්‍යග් දෘෂ්ටිය ප්‍රත්‍යවේක්‍ෂණ සම්ප්‍රයුක්ත, විදර්ශනා සම්ප්‍රයුක්ත, නිකන්ති සම්ප්‍රයුක්ත වේදනාවට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මිථ්‍යා දෘෂ්ටියට කියන ලද අයුරින්ම උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මාර්ගඵල සම්‍යග් දෘෂ්ටි ප්‍රත්‍යවේක්‍ෂණ සම්ප්‍රයුක්ත වේදනාවට, ආරම්මණ, ආරම්මණාධිපති ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ.

**සම්මාදිට්ඨි වූපසම පච්චයාපි වෙදයිතං** යනු සම්‍යග් දෘෂ්ටි සන්සිඳීම නම් මිථ්‍යා දෘෂ්ටියයි. එහෙයින් ඒ මිථ්‍යාදෘෂ්ටි ප්‍රත්‍යයෙන් විඳීමක් කියන ලදද? එයම සම්‍යග් දෘෂ්ටි සන්සිඳීම් ප්‍රත්‍යය යැයි දතයුතුයි. **මිච්ඡා සංකප්ප පච්චයා මිච්ඡා සංකප්ප වූපසම පච්චයා** යන ආදීන්හිද එම ක්‍රමයමැයි. යමකට, යමකට සන්සිඳීම් ප්‍රත්‍යයැයි කියනු ලැබේද? එයට

ප්‍රතිපක්ෂ ධර්ම ප්‍රත්‍යයවම ඒ ඒ විදීම අදහස් කරන ලදී. මිථ්‍යා ඤාණාදීන්හි වනාහි **මිච්ඡා ඤාණ** නම් පාපක්‍රියාවන්හි ක්‍රමෝපාය සිතීමයි නොහොත් මිථ්‍යා ඤාණය මිථ්‍යා ප්‍රත්‍යවෙක්ෂා ඤාණයයි. **සම්මා ඤාණං** යනු විදර්ශනා සම්‍යග් දෘෂ්ටියද, ලෝකෝත්තර සම්‍යග් දෘෂ්ටියද හැර සෙසු කුසලා ව්‍යාකෘත ඤාණයයි. **මිච්ඡා විමුත්ති** නම් පාප විමුක්තියයි. නොහොත් අනිසි විමුක්තිය. අනිර්යානික විමුක්තියයි. නොමිදුණේම වූයේ මිදුණු සංඥාවත් වූයේ, **සම්මා විමුත්ති** නම් කල්‍යාණාධිමුත්තිතායෙන් යුත් ඵල විමුක්තියයි. සම්‍යග් දෘෂ්ටි ආදීහු යට කියන ලද අර්ථමය.

**ඡන්දපච්චයාපි** යනාදීන්හි ඡන්දය නම් ලෝභයයි. ඡන්ද ප්‍රත්‍යයෙන් අටවැදෑරුම් ලෝභ සහගත සිත හා සම්ප්‍රයුක්ත වේදනා දතයුත්තාහ. ඡන්දය සන්සිඳීම් ප්‍රත්‍යයෙන් ප්‍රථමධ්‍යාන වේදනාවවේ. විතර්ක ප්‍රත්‍යයෙන් ප්‍රථමධ්‍යාන වේදනාවද, විතර්ක සන්සිඳීම් ප්‍රත්‍යයෙන් ද්විතිය ධ්‍යාන වේදනාවද, ප්‍රථමධ්‍යානය හැර සෙසු ෂට් සමාපත්ති වේදනා සංඥා ප්‍රත්‍යයෙන් වේ. සංඥා සන්සිඳීම් ප්‍රත්‍යයෙන් නෙවසංඥා නාසංඥායතන වේදනාව වේ. **ඡන්දොච අවූපසන්තො හොති** ආදීන්හි ඡන්ද, විතර්ක සංඥා නොසන්සිඳුණේ වෙතියි අර්ථයි. **තප්පච්චයා** යනු ඡන්ද, විතර්ක සංඥාවන්ගේ නොසන්සුන් භාවයම ප්‍රත්‍යය වූයේ = තප්පච්චයොයි. එහෙයින් ඒ ප්‍රත්‍යයෙන්, ඡන්ද විතර්ක සංඥා නොසන්සිඳීම් හේතුයෙන් වේදනාවන් වෙතියි අර්ථයි. ඒ අෂ්ට ලෝභ සහගත සිත හා යෙදුණු වේදනා වන්නේය. ඉදින් ඡන්දය සන්සිඳුණේ විතර්ක සංඥා නොසන්සිඳුණාහු වෙති. ඒ හේතුවෙන් යයි යනු ඒ ඡන්දයාගේ සන්සිඳීම විතර්ක සංඥාවන්ගේ නොසන්සිඳීමම ප්‍රත්‍යය වූයේ තප්පච්චයොයි. එහෙයින් ඒ ප්‍රත්‍යයෙන්, එම ප්‍රථමධ්‍යාන වේදනාව වන්නේය. ඉදින් ඡන්ද විතර්ක සන්සිඳුණාහු, සංඥාව නොසන්සිඳුණාහු වෙත්ද? ඒ ප්‍රත්‍යයෙන් යයි යනු ඒ ඡන්ද විතර්කයන්ගේ සන්සිඳීම සංඥාවගේ නොසන්සිඳීමම ප්‍රත්‍යය වූයේ තප්පච්චයොයි. එහෙයින් ඒ හේතුවෙන් (ඒ කරුණෙන්) එම ද්විතීය ධ්‍යාන වේදනාව වන්නේය. ඉදින් ඡන්ද විතර්ක සංඥා සන්සිඳුණාහුද, ඒ ප්‍රත්‍යයෙනැයි ඒ ඡන්ද විතර්ක සංඥාවන්ගේ සන්සිඳීමම ප්‍රත්‍යය වූයේ තප්පච්චයොයි. එහෙයින් ඒ හේතුයෙන් එම නෙවසංඥානාසංඥායතන වේදනාව වන්නේය.

**සමහරු** වනාහි, ඡන්දය නම් අර්පණාවට පැමිණෙන්නෙමියි පූර්වභාග ධර්මච්ඡන්දයයි කියති. අර්පණාප්‍රාප්ත වූවහුට ඒ ඡන්දය

සන්සිඳුණේ වේ. ප්‍රථමධ්‍යානයෙහිදී විතර්කය වෙයි. ද්විතීය ධ්‍යානයට පත්වූවහුගේ විතර්කය සන්සිඳුණේ වෙයි. සත් සමාපත්තීන්හි සංඥාව වෙයි (තිබේ) නෙවසංඥා නාසංඥායතනයට සමවන්නහුගේද, නිරෝධයට සමවන්නහුගේද සංඥා සන්සිඳුණාහු වේයයි මෙසේ වර්ණනා කරති. මෙහි වනාහි නිරෝධ සමාපත්තිය නොයෙදේ. **අප්පත්තස්ස පත්තියා** යනු අර්හත් ඵලයට පැමිණීම සඳහා, **අත්ථි ආසවං** යනු වීර්යය ඇත. ආසාවනති යනුද පාඨයි. **කසම්මපි ඨානෙ අනුප්පත්තෙ** යනු ඒ වීර්යාරම්භයාගේ වශයෙන් අර්හත් ඵල කාරණයෙහි, ආර්ය මාර්ගයෙහි පැමිණි, **තප්පච්චයාපි වෙදයිතං** යනු අර්හත්වයාගේ ප්‍රීති ප්‍රත්‍යයෙන් විඳීම. එයින් සිව්මග සහජාතව නිපන් ලෝකෝත්තර වේදනාවන් ගන්නා ලදී. සමහරු වනාහි ගලා ඒනුයි ප්‍රතිපත්තිය යැයිද එතන්හිම පැමිණියේ යැයිද, එම භූමිප්‍රාප්ත වීම යැයිද වර්ණනා කරති.

## ප්‍රදේශ විහාර ඥාණ නිර්දේශ වර්ණනා නිමි.

විවට්ට ඥාණ චක්‍ර නිර්දේශයෙහි, **නෙක්ඛම්මාධිපත්තා පඤ්ඤා** යනු නෛෂ්ක්‍රම්‍ය අධික කොට, නෛෂ්ක්‍රම්‍ය අධික භාවයෙන් පවත්නා ප්‍රඥාව. **කාමච්ඡන්දතො සඤ්ඤාය විවට්ටති** යනු නෛෂ්ක්‍රම්‍යාධිපතිව කළ ප්‍රඥා සම්ප්‍රයුක්ත සංඥාවට හේතු වූ කරුණු වූ කාමච්ඡන්දයෙන් පෙරළේ. පරාර්වර්තනය වේ. පරාම්මුඛ වේයයි අර්ථයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**කාමච්ඡන්දො නානත්තං** යනු කාමච්ඡන්දය ශාන්ත පැවතුම් නොමැති හෙයින්, ඒකස්වභාව නොවේ. **නෙක්ඛම්මං එකත්තං** යනු නෛෂ්ක්‍රම්‍යය ශාන්ත පැවතුම් ස්වභාව හෙයින් ඒකස්වභාවයැ. **නෙක්ඛම්මෙකත්තං චෙතයතො** යනු කාමච්ඡන්දයෙහි ආදීනව දර්ශනයෙන් නෛෂ්ක්‍රම්‍ය පවත්වන කල්හි **කාමච්ඡන්දතො චිත්තං විවට්ටති** යනු දිටි ආදීනව හෙයින් කාමච්ඡන්දයෙන්, නෛෂ්ක්‍රම්‍ය ක්ෂණයෙහි සිත පෙරළේ. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**කාමච්ඡන්දං පජහන්තො** යනු නෛෂ්ක්‍රම්‍යය පැවැති ක්ෂණයෙහි කාමච්ඡන්දය විෂ්කම්භන ප්‍රහාණයෙන් දුරු කරනුයේ, **නෙක්ඛම්ම වසෙන චිත්තං අධිට්ඨාති** යනු ලද නෛෂ්ක්‍රම්‍යයාගේ වශයෙන් ඒ හා සම්ප්‍රයුක්ත

සිත අධිකව සිටී. අධික කරමින් සිටියි. පවත්වයි යන අර්ථයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**චක්ඛු සුඤ්ඤං අත්තේන වා** යනු අඥාන ජනයා විසින් පරිකල්පිත, කාරක, වේදක සංඛ්‍යාත ආත්මයෙහි අභාවය හෙයින් චක්ෂුස ආත්මයෙන් ශූන්‍යයි. යමක් යම්තැනක නොවේද? එහෙයින් එය ශූන්‍ය නම් වේ. **අත්තනියෙනවා** යනු තමාගේ ස්වභාවයෙන්ම තමා සතු කිසියම් දැයක අභාවයෙන් තම සන්තකයෙන්ද ශූන්‍යය. ලෝකයාගේ ආත්මය කියා හෝ ආත්මනීය යයි යන දෙයාකාරයෙන් ග්‍රහණය නොයෙදෙන හෙයින්, ඒ දෙවදෑරුම් ග්‍රහණ වැළක්වීම සඳහා ආත්ම අභාවයද, ආත්මනීය අභාවයද යුසේයි. **නිච්චෙන වා** යනු භංගය ඉක්මවා සිටියහුට කිසිවක් නොමැති හෙයින් නිත්‍යතායෙන් ශූන්‍යයි. **ධුවෙනවා** යනු ප්‍රවෘත්ති ක්ෂණයෙහිද, තිර කිසිදැයක අභාවය හෙයින් සැමදා පවත්නා බවින් ශූන්‍යයි. **අවිපරිණාම ධම්මෙනවා** යනු ජරා භංග නොපෙරළෙනු ලබන ස්වභාව සහිත කිසිදැයක අභාවය හෙයින් නොවෙනස්වන ස්වභාවයෙන්ද ශූන්‍යයි. නොහොත් නිත්‍ය භාවයෙන්ද, තිර භාවයෙන්ද ශාශ්වත භාවයෙන්ද, නොවෙනස්වන ස්වභාවයෙන්ද ශූන්‍යයයි අර්ථයි. වා ශබ්දය එක්කිරීම් අර්ථයෙහිය.

**යථාභූතං ජානතො පස්සතො** යනු මෙසේ මේ අනාත්මතාවයි. නැවත නැවත බැලීම් ඤාණයෙන් යථා ස්වභාවයෙන් දැනගන්නහුට, ඇසින් විසමව බලන්නහුට, **චක්ඛාභිනිවෙසතො ඤාණං විවට්ටති** යනු චක්ෂුස ආත්මයයි හෝ ආත්මයට අයත්යයි හෝ පවත්නා දෘෂ්ටිය තදින් ගන්නා ස්වභාවයෙන්, තදංග ප්‍රහාණ වශයෙන් ඤාණය පෙරළේ. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**නෙක්ඛම්මෙන කාමච්ඡන්දං වොසජ්ජති** යනු නෛෂ්ක්‍රම්‍යලාභී පුද්ගලයා නෛෂ්ක්‍රම්‍යයෙන් එයට ප්‍රතිපක්ෂ කාමච්ඡන්දය අත්හරියි. **වොස්සග්ගෙ පඤ්ඤා** යනු කාමච්ඡන්දයෙහි අත්හැරීම් ස්වභාවය වූ නෛෂ්ක්‍රම්‍යයෙහි ඒ හා සම්ප්‍රයුක්ත ප්‍රඥාවයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

පීළනාර්ථාදීහු යට කියන ලද අර්ථයමය. **පරිජානනෙතා විවට්ටති** යනු පුද්ගලාධිෂ්ඨාන දේශනාවයි. මාර්ගයුක්ත පුද්ගලයා දුකෙහි සිව් ආකාර අර්ථය කෘත්‍යය වශයෙන් විශේෂයෙන් දන්නේ දෙයාකාරයෙන්

නැගිටීම් වශයෙන් පෙරළේ. ඤාණ පෙරළීමෙන්ද ඤාණයුක්තහු පෙරළේ යයි යූ.සේයි. තථටෙඨ පඤ්ඤා යනු එම පුද්ගලයාගේම සත්‍යාර්ථයෙහි පෙරළීම් ප්‍රඥාවයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

දැන් මාර්ගක්ෂණයෙහිම කෘත්‍ය වශයෙන්, ආකාර නානත්ව වශයෙන් ෂට් පෙරළීම් ඤාණයන් දක්වන්ට සඤ්ඤා විවට්ට යැයි ආදී මාතෘකා තබා එය අර්ථ වශයෙන් මනාව බෙදන්නේ හඳුනන්නේ පෙරළේ යයි ආදිය වදාළහ. එහි **සඤ්ජානනෙතා විවට්ටතීති = සඤ්ඤාවිවටෙටායි** යම් හෙයකින් යෝගියා පූර්වභාග නෛෂ්ක්‍රම්‍යාදිය ප්‍රධානත්වයෙන් හඳුනන්නේ පසුව නෛෂ්ක්‍රම්‍ය සම්ප්‍රයුක්ත ඤාණයෙන් කාමච්ඡන්දාදීන්ගෙන් පෙරළේ. එහෙයින් ඒ ඤාණය සංඥා විවට්ට නමැයි අර්ථයි. **චෙතයනෙතා විවට්ටතීති = චෙතොවිවටෙටා** යම් හෙයකින් යෝගියා නෛෂ්ක්‍රම්‍යයෙහි ඒකත්වාදීන් සිතන්නේ ඒ හා සම්ප්‍රයුක්ත ඤාණයෙන් කාමච්ඡන්දාදීන්ගෙන් පෙරළේ. එහෙයින් ඒ ඤාණය චෙතො විවට්ටනමැයි අර්ථයි. **විජානනෙතා විවට්ටතීති = චිත්ත විවටෙටා** යනු යම්හෙයකින් යෝගියා නෛෂ්ක්‍රම්‍යාදී වශයෙන් සිතෙහි අධිෂ්ඨානයෙන් මනාව දන්නේ ඒ හා සම්ප්‍රයුක්ත ඤාණයෙන් පෙරළේ. එහෙයින් ඒ ඤාණය චිත්ත විවට්ට නමැයි අර්ථයි.

**ඤාණං කරොනෙතා විවට්ටතීති = ඤාණවිවටෙටා** යෝගියා සවැදෑරුම් ආධ්‍යාත්මිකායතන අනාත්මානුපස්සනා ඤාණයෙන් ශූන්‍යතාකාරයෙන් තමා දැනුවත් කරන්නේ, එම ඤාණයෙන්ම දෘෂ්ටි වශයෙන් තදින් එල්බ ගැනීමෙන් පරාවර්තනය කෙරේ. එහෙයින් එම ඤාණය ඥාන විවර්ත නමැයි අර්ථයි. **වොසසජනෙතා විවට්ටතීති විමොකඛ විවටෙටා** යනු යෝගියා නෛෂ්ක්‍රම්‍යාදීන්ගෙන් කාමච්ඡන්දාදීන් අත්හරින්නේ ඒ හා යෙදුණු ඤාණයෙන් කාමච්ඡන්දයෙන් පෙරළේ. එහෙයින් එම ඤාණය විමොකඛ විවට්ට නමැයි අර්ථයි. **තථටෙඨ විවට්ටතීති සචචවිවටෙටා** යනු යෝගියා සිව්ආකාර සත්‍යාර්ථයෙහි දෙඅයුරින් නැගිටීම් වශයෙන් පෙරළේ. එහෙයින් මාර්ග ඥානය සත්‍ය විවර්ත නමැයි අර්ථයි. මාර්ග ඤාණයම චිත්තාර්ථයෙහි දෙඅයුරින් නැගිටීම් භාවයෙන් පෙරළේනුයි සත්‍ය විවර්තයි අර්ථයි. යම්තැනක සංඥා විවර්ත යැයි ආදි සත්‍ය විවර්ත ඤාණ නිර්දේශයෙහි කියන ලද හෙයින් සත්‍ය විවර්ත ඤාණ ක්ෂණයම සඳහා කියන ලදැයි දතයුතුය. මාර්ග ඤාණයෙහිම සියල්ල යෙදෙති. කෙසේද? ඤාණ විවර්තයෙහි ඤාණය හැර සෙස්සෙහි ආර්ය මාර්ගය ස්වරූපයෙන්ම ආයේය. විදර්ශනා කර්මය

මාර්ගයෙන්ම සිදුවන හෙයින් විදර්ශනා කෘත්‍ය සිද්ධි වශයෙන් ඤාණ විවර්ත ඤාණයද මාර්ගක්ෂණයෙහි යෙදේ. මාර්ග ඤාණයෙන්ම හෝ චක්ෂුස ශූන්‍යයයි ආදී කෘත්‍ය වශයෙන් අවබෝධ කරන ලද්දේම වේයයි මාර්ගක්ෂණයෙහි ඒ ඤාණය කියන්ට සුදුසුමය. මෙහි අර්ථ යෝජනාව වනාහි, යම්තැනක මාර්ග ක්ෂණයෙහි සංඥා විවර්තය වේද, එහි චිත්ත විවර්තයයි. යම් මාර්ග ක්ෂණයෙහි චිත්ත විවර්තය වේද, එහි සංඥා විවර්තයයි. මේ ආදී ක්‍රමයෙන් සියලු ගැළපීම්හි යෙදීම කළයුත්තාහ. නොහොත් සංඥා විවර්ත, චේතෝවිවර්ත, විමෝක්ෂ විවර්තයන් සිව් ආර්ය මාර්ගයන්ගේ වශයෙන් ආ හෙයින්, සත්‍ය විවර්තය දැක්වූයේම වේ. ඤාණ විවර්තයම, සත්‍ය විවර්තයෙන්ම ආ හෙයින්, සත්‍ය විවර්තය දැක්වූයේම වේ. ඤාණ විවර්තයම, සත්‍ය විවර්තයෙන්ම කෘත්‍ය වශයෙන් සිද්ධ වේ. සංඥා, චෙතො, චිත්ත, විමොක්ඛ, විවර්තයන්හිද එසේමය. පෙය්‍යාලයෙහි විස්තර කරනු ලබන, අනත්තානුපස්සනා අධිපති හෙයින්, සංඥා තදින් ගැනීමෙන් සංඥාවෙන් පරාවර්තනය වේනුයි ප්‍රඥාධිපති හෙයින්, සංඥා විවර්ත ඤාණයයිද, දඬිව එල්බ ගැනීමෙහි නානත්ත්වය, අනත්තානුපස්සනාවෙන් ඒකත්වයට පත්වේ. අනත්තානුපස්සනාවෙන් ඒකත්වය සිතන කල්හි, දැඩිව එල්බ ගැනීමෙන් සිත පෙරළේයැයි නානත්වයෙහි ප්‍රඥාව චෙතො විවර්තයෙහි ඤාණයයිද, දැඩිව අල්ලාගැනීම දුරුකරන කල්හි අනත්තානුපස්සනා වශයෙන් සිත ස්ථිර ලෙස පිහිටුවයිනුයි අධිෂ්ඨානයෙහි ප්‍රඥාව චිත්ත විවර්තයෙහි ඤාණයැයිද, අනත්තානු පස්සනාවෙන් දැඩිව ගැන්ම අත්හරීනුයි අත්හැරීමෙහි ප්‍රඥාව විමෝක්ෂ විවර්තයෙහි ඤාණයැයිද, පාඨ සභාවයෙන් ඤාණ විවර්තයෙහි ඤාණයද ඒවාහි එන ලද්දේම වේ. ඤාණ විවර්තයෙහිම අනුත්තානුපස්සනාවෙන් නැගිට ආර්ය මාර්ගය ලදහුගේ සිත වශයෙන් චක්ෂුස, ආත්මයෙන් හෝ ආත්මනිය වශයෙන් හෝ ශූන්‍යය යන ආදිය යෙදෙන හෙයින්, සත්‍ය විවර්තය ලැබේ. එහෙයින් එක් එක් විවර්තයෙහි, සෙසු පස් පස් විවර්ත ලැබේ. එහෙයින් මෙසේ යම්තැනක සංඥා විවර්තයද, එහි චෙතෝ විවර්තයදැයි ආදී සංසන්දනයන් කියන ලදැයි දතයුතුය.

**විවට්ට ඤාණ ඡක්ක නිර්දේශ වර්ණනාව නිමි.**

ඉද්ධිවිධ ඤාණ නිර්දේශයෙහි, ඉධ භික්ඛු යනු මෙසස්නෙහි භික්ෂුව; **ඡන්ද සමාධි පධාන සංඛාර සමන්නාගතං** යනු මෙහි ඡන්ද හේතුක වූ

සමාධිය, ඡන්ද අධික වූ හෝ සමාධිය ඡන්ද සමාධියි, කරනු කැමැත්තෙහි ඡන්දය අධිපතිකොට ලද සමාධියට එය විශේෂ නාමයකි. ප්‍රධාන වූ සංස්කාර = ප්‍රධාන සංස්කාරයි. සිව්කිස් සිදුකරන සම්‍යක් ප්‍රධානයට එය විශේෂ නාමයකි. සිව්කිස් සිදුකිරීම් වශයෙන් බහුවචන කරන ලදී. සමන්නාගතං යනු ඡන්ද සමාධියෙන්ද, ප්‍රධාන සංස්කාරයන්ගෙන්ද යුක්ත වූයේ; ඉද්ධිපාදං යනු සම්පූර්ණවීම් ආකාරයන් හෝ සමෘද්ධවීම් අර්ථයෙන් සත්ත්වයෝ එයින් සමෘද්ධියට පත්වෙති. සමෘද්ධ වූවාහු, වෘද්ධියට පත්වූවාහු, උසස් තත්ත්වයට පත්වූවාහු වෙත්නුයි මේ ක්‍රමයෙන් හෝ ඍද්ධිය යයි සංඛ්‍යාවට ගියා වූ උපචාර ධ්‍යානාදී, කුසල චිත්ත සම්ප්‍රයුක්ත, ඡන්ද, සමාධි ප්‍රධාන සංස්කාරයන්ට අධිෂ්ඨානාර්ථයෙන් පාද වූ සෙසු චිත්ත චෛතසික රාශිය යැයි අර්ථයි. ඉද්ධිපාද විභංගයෙහි සූත්‍රාන්ත බෙදීමෙහි යු.සේයි. 'ඉද්ධිපාද යනු එසේ වූ වේදනා ස්කන්ධය -පෙ- විඥ්ඥාණ ස්කන්ධයයි, අභිධර්ම බෙදීමෙහි, ඉද්ධිපාද යනු එසේ වූ, ස්පර්ශ වේදනා -පෙ- උත්සාහය, අවික්ෂෙප යැයිද යු.සේයි. එහෙයින් සෙසු චිත්ත චෛතසික රාශිය යනු මෙහි ඡන්ද, සමාධි ප්‍රධාන සංස්කාරයන්හි එකඑක ඍද්ධිය කොට පසුව දෙක දෙක කොට සෙසු වචන සකස් කරන ලදැයි දතයුතුය. මෙසේ සතර ස්කන්ධයන්හි සියලුම ස්පර්ශාදී ධර්ම සංග්‍රහ කරන ලද්දාහු වෙති. මේ ක්‍රමයෙන් සෙස්සෙහිද අර්ථ දතයුතුය. යම්සේ වනාහි ඡන්දය අධිපතිකොට ලත් සමාධිය ඡන්ද සමාධි යයි කියන ලද්දේද? මෙසේ වීර්ය, චිත්ත, වීමංසාව අධිපතිකොට ලත් සමාධිය වීමංසා සමාධිය යයි යු.සේයි. මෙසේ එක් එක් ඍද්ධිපාදයෙහි ඡන්ද, වීර්ය, චිත්ත, වීමංසාදී ධර්මත්‍රය ඍද්ධිද, ඍද්ධිපාදද වෙති. සෙසු සම්ප්‍රයුක්ත සිව් ස්කන්ධ ඍද්ධිපාදයෝමය. යම්හෙයකින් මේ ත්‍රයයක්, ත්‍රයයක් බැගින් වූ ධර්මයෝ ඒහා එකට යෙදුණු සිව් ස්කන්ධයෝ සමගම සමෘද්ධ වෙත්ද? ඒවායින් තොරව සමෘද්ධ නොවෙත්ද? එහෙයින් ඒ ක්‍රමයෙන් සියලුම සිව් ස්කන්ධයෝ සමෘද්ධ වන අර්ථයෙන් ඍද්ධි නම් වෙති. පිහිටන අර්ථයෙන් පාද නමැයි දතයුතුය. **විරිය සමාධි පධාන සංඛාර සමන්නාගතං** යන මෙහි විරියං යනුද පධාන සංඛාර යනුද එකක්මය. කවර දෙඅයුරකින් කියන ලදද යත්? වීර්යයෙහි ප්‍රධාන බව දැක්වීම් වශයෙන් මෙහි පළමුව වීර්යග්‍රහණය කරන ලදී. එහිම සිව්කිස් සාධකත්වය දැක්වීම සඳහා පධාන සංඛාර වචනය කරන ලදී. (යොදන ලදී) මෙසේ දෙඅයුරකින් කියන ලද හෙයින් මෙසේ මෙහිද ධර්මත්‍රය බැගින් යයි යු.සේයි. සමහරු වනාහි විභංගයෙහි, 'ඉද්ධි යනු යම් ඒ ඒ ධර්මයන්ගේ ඉටුවීම සමෘද්ධිය සමෘද්ධවීම, සමෘද්ධිමත් වීම යැයි කියන

ලද හෙයින් ඍද්ධිය නම් අනිෂ්පන්නය. ඍද්ධියාපාද නම් නිෂ්පන්නයයි කියති. මෙහි වනාහි ඍද්ධියද, ඍද්ධිපාදද නිෂ්පන්නය. ලක්‍ෂණ මඩනා ලද්දේයයි සනිටුහන් කරන ලදී. ඍද්ධි, සමෘද්ධි ආදීන්ගෙන් සමෘද්ධ වන ආකාරයෙන් ධර්මයම කියන ලදැයි දතයුතුය.

**භාවෙති** යනු සේවනය කරයි. සූත්‍රාන්ත බෙදීමෙහි මෙන් මෙහිද ඍද්ධිපාද භාවනා ලෞකිකමය. ඍද්ධිවිධ සම්පාදනය කරනු කැමැති තැනැත්තේ, ලෞකික ඍද්ධිපාද වඩන්නේ පෘථුවි කසිණාදී අට කසිණයන්හි ලබන ලද වසීප්‍රාප්ත අෂ්ට සමාපත්තිලාභියා, කසිණානුලෝම වශයෙන්, කසිණ ප්‍රතිලෝම වශයෙන්, කසිණානුලෝම ප්‍රතිලෝම වශයෙන්, ධ්‍යානානුලෝම වශයෙන්, ධ්‍යාන ප්‍රතිලෝම වශයෙන්, ධ්‍යානානුලෝම ප්‍රතිලෝම වශයෙන්, ධ්‍යානුක්කනතික වශයෙන්, කසිණුක්කනතික වශයෙන්, ධ්‍යාන කසිණුක්කනතික වශයෙන් අංග සංකනතික වශයෙන්, ආරම්මණ සංකනතික වශයෙන්, අංගාරම්මණ සංකනතික වශයෙන්, අංග ව්‍යවස්ථාන වශයෙන්, ආරම්මණ ව්‍යවස්ථාන වශයෙන්දැයි යන මේ තුදුස් ආකාරයන්ගෙන් සිත දමනයකොට ඡන්‍දශීර්ෂ, වීර්යශීර්ෂ, චිත්ත ශීර්ෂ, වීමංසා ශීර්ෂ වශයෙන් නැවත නැවත ධ්‍යානයට සමවදියි. අංගාරම්මණ ව්‍යවස්ථානයද සමහරු කැමැති වෙති. පූර්ව හේතු සම්පත් නය විසින් කසිණයන්හි, චතුර්ථ ධ්‍යාන මාත්‍රයෙහි, පළපුරුදු වසීතායෙන් යුතු අයෙකු ලෙසින් ක්‍රියාකිරීම සුදුසුයයි ඒ ඒ ඍද්ධිපාද සමාධිය වඩන්නේ, නූපන් පාපී අකුසලයන්ගේ නොඉපැත්ම සඳහා යයි ආදී සිව්ආකාර වීර්යය අධිෂ්ඨාන කරයි. එහිද හානි, වෘද්ධි දැන වීර්ය සමතාව අධිෂ්ඨාන කරයි. හෙතෙම මෙසේ සිව් ඍද්ධිපාදයන්හි සිත මනාව වඩා ඍද්ධිවිධ සම්පාදනය කරයි. **සො ඉමෙසු චතුසු ඉද්ධිපාදෙසු** ආදීන්හි **සො** යනු ඒ වඩනා ලද සිව් ඍද්ධිපාදැති භික්‍ෂුව; **චතුසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙති** යනු නැවත නැවත ඡන්‍දාදීන්හි එක එක අධිපතිකොට ධ්‍යාන සමවැදීම් වශයෙන් ඒවාහි සිත මනාව වඩයි නමැ. ඡන්‍දාදි වශයෙන් ගන්ට සලස්වයි යන අර්ථයි. **පරිදමෙති** යනු මෘදුකරයි. අකම්ප්‍ය කරයි. පූර්මය පශ්චිමයට කාරණ වචනයි. මනාව වඩනා ලද සිත මනාව දමනය කරන ලද්දේ වේ. **මුදුං කරොති** එසේ දැමුණු සිත වසීප්‍රාප්ත කරයි. තම වසයෙහි පවත්නා සිත මෘදුයයි යු.සේයි. **කම්මනියං** යනු කර්මක්‍ෂම, කර්මයොග්‍ය කරය. මෘදු සිත මනාව ඔපමට්ටම් කළ රත්රන් මෙනි. කර්මණ්‍ය වේ. මෙහි වනාහි ඍද්ධිවිධ කර්මක්‍ෂම භාවයයි. **සො** යනු මනාකොට වඩනා ලද සිත් ඇති භික්‍ෂුව; **කායමපි චිතෙත සමොදහති** යන ආදී ඍද්ධි කරන

කල්හි සුව එළවන අයුරින් චිත්තචාරයාගේ ඉටුවීම සඳහා යෝග විධාන දක්වන්ට යු.සේයි. එහි **කායම්පි චිත්තෙ සමොදහති** යනු තමාගේ මව්පියන් නිසා හටගත් ශරීරයද පාදක ධ්‍යාන සිතෙහි මනාසේ ඇතුල් කරයි. ප්‍රවේශ කරයි. ආරෝපණය කරයි. කය සිත අනුව ක්‍රියාකාරී තත්වයට පත්කරයි යන අර්ථයි. මෙසේ කිරීම අදෘශ්‍යමාන කයින් වන ගමනට උපකාර පිණිස පවතී. **චිත්තම්පි කායෙ සමොදහති** යනු පාදකධ්‍යාන සිත තමාගේ කරජ කායයෙහි මනාසේ ඇතුල් කරයි. ප්‍රවේශ කරයි. ආරෝපණය කරයි. සිත කායානුගතික කරයි යන අර්ථයි. මෙසේ කිරීම දෘශ්‍යමාන ශරීරයෙන් ගමනට උපකාර පිණිස පවතී. සමාදහති, යනුද පාඨයි, පිහිටුවයි යන අර්ථයි. **කායවසෙන චිත්තං පරිණාමෙති** යනු කරජ කාය ගෙන පාදක ධ්‍යානයෙහි සිත ආරෝපණය කරයි. චිත්තානුගතික කරයි. මෙය කය සිතෙහි ප්‍රවේශ කිරීමට පර්යාය වචනයකි. **අධිට්ඨාති** යනු මෙසේ වේවායි අධිෂ්ඨාන කරයි. ආරෝපණයෙහි අර්ථ විවරණය සඳහා පරිණාමය කියන ලදී. පරිණාමයෙහි අර්ථ විවරණය සඳහා අධිෂ්ඨානය කියන ලදී. සමොදහති යනු මුල්පදයයි. පරිණාමෙති, අධිට්ඨාති යනු එහි අර්ථ විස්තර කරන පදයි. එහෙයින් ඒ දෙපදයන්ගේම වශයෙන්, පරිණාමෙත්වා, අධිට්ඨහිත්වා, සමොදහිත්වා යන වචන යු.සේයි.

**සුඛ සඤ්ඤඤ්ච ලහු සඤ්ඤඤ්ච කායෙ ඔක්කමිත්වා විහරති** යනු චතුර්ථ ධ්‍යානයෙන් හටගත් සුව සංඥාවද, සැහැල්ලු සංඥාවද සමවැදීම් වශයෙන් කරජකයෙහි ඇතුල්වී, ප්‍රවේශ වී වාසය කරයි. ඒ සංඥාවෙන් ඇතුල්වූ සිරුරැති මොහුගේ කරජකායයද පුළුන්පිඩක් මෙන් සැහැල්ලු වෙයි. සො යනු ඒ කරන ලද යෝග විධාන ඇති භික්ෂුව, **තථා භාවිතෙන චිත්තෙන** මෙසේ වූයේය යන ලක්ෂණයෙහි කරණ විභක්ති ඒකවචනයි. හේතු අර්ථයෙහිද යෙදේ. එසේ වඩන ලද සිත හේතුවීමෙන්, **පරිසුද්ධෙන** උපෙක්ෂා සති පාරිශුද්ධතාවයෙන් පිරිසිදු වූ, පිරිසිදු හෙයින්ම **පරියොදාතෙන** ප්‍රභාස්වරයැයි අර්ථයි. **ඉද්ධිවිධ ඤාණාය** යනු ඍද්ධි කොටසෙහි, ඍද්ධි කල්පනාවෙහි ඥාණය සඳහා, **චිත්තං අභිනීහරති** යනු ඒ භික්ෂුව කියන ලද ආකාර වශයෙන් එහි සිත අභිඥාපාදක වූ කල්හි ඍද්ධිවිධ ඥාණාධිගමය සඳහා පරිකර්ම සිත යොමුකරයි. කසිණ අරමුණින් ඉවත්කොට ඍද්ධිවිධ අභිමුඛව යවයි. **අභිනින්නාමෙති** අවබෝධ කටයුතු ඍද්ධි නම්‍රතාවට, ඍද්ධි ප්‍රවණතාවට යොමුකරයි. **සො** යනු මෙසේ කරන ලද ප්‍රාර්ථනා ඇති භික්ෂුව; **අනෙකවිහිතං** යනු නානාවිධ හා නානාප්‍රකාර, **ඉද්ධිවිධං** යනු ඍද්ධි කොටඨාසය, ඍද්ධි විකල්පය හෝ,

පච්චනුභොති යනු විඳියි. ස්පර්ශ කරයි. සාක්ෂාත් කරයි. පැමිණේ යන අර්ථයි.

දැන් මෙහි නොයෙක් ආකාර බව දක්වන්නේ 'එකොපි හුත්වා' ආදිය වදාළහ. එකොපි හුත්වා යනු ඍද්ධිකරණයෙන් පූර්වයෙහි ප්‍රකෘතියෙන් එකෙක්ව බහුධාභොති යනු බොහෝදෙනෙකු සමීපයෙහි සක්මන් කරනු කැමැත්තේ හෝ සජ්ඣායනා කරනු කැමැත්තේ හෝ ප්‍රශ්නයක් හෝ විචාරනු කැමැත්තේ වී, සියයක්ද, දහසක්ද වේ. කෙසේ වනාහි මෙය මෙසේ වේද? ඍද්ධියගේ, භූමි, පාද, පද යන මුල්වූ ධර්මයන් සම්පාදනය කොට, අභිඥාපාදක ධ්‍යානයට සමවැද නැඟිට, ඉදින් සියයක් කැමතිද? සියයක් වෙමි. සියයක් වෙමියි පරිකර්ම කොට නැවත පාදක ධ්‍යානයට සමවැද නැඟිට අධිෂ්ඨාන කරයි. අධිෂ්ඨාන සිත සමගම සියයක් වේ. සහස්‍රාදීන්හිද එම ක්‍රමයමැයි. ඉදින් මෙසේ නොසිදුවේද නැවත පරිකර්මකොට, දෙවනුවද සමවැද නැඟිට අධිෂ්ඨාන කළයුතුයි. සංයුත් අටුවාවෙහි වරක් දෙවරක් සමවදින්ට සුදුසුයයි යූ.සේයි. එහි පාදක ධ්‍යාන සිත නිමිත්තාරම්මණයි. පරිකර්ම සිත සියක් අරමුණු හෝ දහසක් අරමුණු වේ. ඒවා වනාහි වර්ණනා වශයෙන්මය ප්‍රඥප්ති වශයෙන් නොවේ.

අධිෂ්ඨාන චිත්තයද එසේම සියක් අරමුණු හෝ දහස් අරමුණු වෙයි. එය ප්‍රථම අර්පණා සිත මෙන් ගොත්‍රභූ අනතුරුව රූපාවචර චතුර්ථ ධ්‍යානිකව එක්වරක්ම උපදියි. එහි බොහෝ නිර්මිතයෝ වෙත්ද, ඒවා අනියමින් නිර්මිත කළ හෙයින් ඍද්ධිමතා සමගම වෙයි. සිටීම් හිඳගැනීම් ආදීන්හිද, කථාකරන තෘෂ්ණීභාවයන්හිද, ඍද්ධිමතා යම් යම් දැයක් කරයිද, ඒ ඒ දැයම කරයි. ඉදින් නොයෙක් වර්ණ කරනු කැමැත්තේ වේද, සමහරු ප්‍රථම වයසෙහි, සමහරු මධ්‍යම වයසෙහි, සමහරු පශ්චිම වයසෙහි එසේම දික් කෙස්, අර්ධයක් මුඩුකළ, මුඩුකළ, මිශ්‍රකෙස්, අඩක් රත් සිවුරු, පඬුවන් සිවුරු, හඬනගා දම් දෙසන, හඬනගා ප්‍රශ්න විචාරන ප්‍රශ්න විසඳන, පඬුපොවන, පඬු තම්බන (පිසින) සිවුරු මහන, සේදීම් ආදිය කරනවුන් නිර්මිත කරයි. අන්‍ය වූද, නානාප්‍රකාර දෑ කරනු කැමැත්තේ වේද, එයින් පාදකධ්‍යානයෙන් නැඟිට, මෙතෙක් භික්ෂූහු ප්‍රථම වයසෙහි වෙත්වා'යි ආදී ක්‍රමයෙන් පරිකර්ම කොට නැවත සමවැදී නැඟිට අධිෂ්ඨාන කළයුතුය. අධිෂ්ඨාන සිත සමගම කැමති වූ ආකාරයම වෙති. බොහෝ වී එකෙක් වේ ආදීන්හිද එම ක්‍රමයමැයි. මේ වෙනසයි.

මේ භික්ෂුව විසින් මෙසේ බහුත්වය නිර්මිතකොට, නැවත එකෙක්ව සක්මන් කරන්නෙමි. ප්‍රශ්න විසඳන්නෙමියි සිතා, මෙම විහාරය අල්ප භික්ෂුකය. ඉදින් කිසිවෙක් එන්නාහුද? මේ එක සමාන භික්ෂූහු මෙපමණ කොයින්ද? ඒකාන්තයෙන් මෙය තෙරුන්ගේ ආනුභාවය යැයි මා දැනගන්නාහුයයි අල්පේච්ඡතාවයෙන් අතරදී එකෙක් වෙමියි කැමැති වන්නහු විසින් පාදක ධ්‍යානයට සමවැද නැගිට එකෙක් වෙමියි පරිකර්ම කොට නැවත සමවැද නැගිට එකෙක් වෙමියි අධිෂ්ඨාන කළ යුතුය. අධිෂ්ඨාන සිත සමගම එකෙක් වේ. මෙසේ නොකරන්නහු විසින්, පිරිසිඳින ලද කාලය අනුව තෙමේම එකෙක් වේ.

ආවිභාවං යනු ප්‍රකටභාවය කෙරේයයි අර්ථයි. තිරොභාවං යනු වැසුණු බව කෙරේයයි අර්ථයි. ප්‍රකටභාවයට පැමිණේ. වැසුණු භාවයට පැමිණේයයි පළමු අයුරින්ම සම්බන්ධයයි. ඒ මේ ඍද්ධිමතා, ප්‍රකට භාවය කරනු කැමැත්තේ, අන්ධකාරය හෝ ආලෝකය කරයි. වැසුණු දැයක් හෝ ප්‍රකට කරයි. අබිමුවට හමුනොවූ දැයක අබිමුව කරයි. කෙසේද? මෙතෙමේ වැසුණු ඉතා දුර සිටියහු හෝ යම්සේ දර්ශනය වේද? එසේ තමා හෝ අන්‍යයා හෝ පෙනෙන ලෙස කරනු කැමැත්තේ, පාදක ධ්‍යානයෙන් නැගිට, මේ අන්ධකාර ස්ථානය ආලෝකවත් වේවායි හෝ, මේ වැසුණු දෑ විවෘත වේවායි හෝ මේ අබිමුවට හමුනොවූ දෑ හමුවට වේවායි හෝ ආවර්ජනය කොට පරිකර්මකොට කියන ලද අයුරින්ම අධිෂ්ඨාන කරයි. අදිටන් කළ කෙණෙහිම අධිෂ්ඨාන කළ පරිද්දෙන්ම වේ. අන්‍යයා දුර සිටියාහුද දකිත්. තෙමේ හෝ දකිනු කැමති අන්‍යයා දකියි. මුවහවීම කරනු කැමැත්තේ ආලෝකය, අන්ධකාරය කරයි. නොවැසුණු දෑ වැසීම් තත්වයටද අබිමුව පත් දෑ අනබිමුව බවටද පත්කරයි. කෙසේද? මෙතෙමේ යම්සේ නොවැසුණෝ සමීපයෙහි සිටියහුද නොපෙනේද? මෙසේ තමා හෝ අන්‍යයා හෝ කරනු කැමැත්තේ පාදක ධ්‍යානයයෙන් නැගිට මේ ආලෝකස්ථානය අන්ධකාර වේවායිද, මේ නොවැසුණු දෑ වැසුණු බවට පත්වේවායිද, මේ අබිමුව දෑ අනබිමුව වේවායි හෝ ආවර්ජනා කොට පරිකර්මකොට කියන ලද ක්‍රමයෙන්ම අධිෂ්ඨාන කරයි. අධිෂ්ඨානය සමගම අධිෂ්ඨිත අයුරින්ම වෙයි. අන්‍යයා සමීපයෙහි සිටියේ වී නමුත් නොදකිත්. තෙමේද නොදකිනු කැමැත්තේ නොදකී. තවද, සියලු ප්‍රකට ප්‍රාතිහාර්යය ආවිභාව නමැ. අප්‍රකට ප්‍රාතිහාර්යය තිරොභාව නමැ. එහි ප්‍රකට ප්‍රාතිහාර්යයෙහි ඍද්ධියද, ඍද්ධිමතාද පෙනේ. එය යමක මහා ප්‍රාතිහාර්යයෙන් දැක්විය යුතුය.

අප්‍රකට ප්‍රාතිහාර්යයෙහි ඍද්ධියම පෙනේ. ඍද්ධිමතා නොපෙනේ. එය මහක සූත්‍රයෙන්ද බ්‍රහ්ම නිමන්තණික සූත්‍රයෙන්ද දැක්විය යුතුය.

**තිරොකුඩ්ඩං** යනු බිත්ති පිටත, බිත්තියෙහි අනෙක් කොටසයයි යූ.සේයි. වැසුණු ප්‍රාකාර, වැසුණු පර්වතයන්හිද එම ක්‍රමයමැයි. කුඩ්ඩ යනු ගෘහ බිත්ති, **පාකාරො** යනු ගෘහ විහාර ග්‍රාමාදීන්හි වටකළ තාප්පය, **පබ්බතො** යනු පාංශු පර්වත හෝ ගල් පර්වත හෝ, **අසජ්ජමානො** යනු නොතැවරී. **සෙය්‍යථාපි ආකාසෙ** යනු අහසෙහි මෙන්, මෙසේ ගමන් කරනු කැමැත්තහු විසින් ආකාස කසිණයට සමවැදී නැගිට, බිත්තිය හෝ ප්‍රාකාරය හෝ පර්වතය හෝ ආවර්ජනා කොට, කළ පිරියම් ඇත්තහු විසින් අහස වේවායි අධිෂ්ඨාන කළයුතුය. අහසම වෙයි. යට බසිනු කැමැත්තහුට හෝ ඉහළ නගිනු කැමැත්තහුට සිදුරක් හටගනී. විනිවිද යනු කැමැත්තහුට සිදුරක් වේ. හෙතෙම එහි නොගැටෙමින් යයි. ඉදින් මේ අධිෂ්ඨාන කොට යන්නා වූ භික්ෂුවට අතරත පර්වතයක් හෝ වෘක්ෂයක් පැනනගීද? කිමෙක්ද? නැවත සමවැද අධිෂ්ඨාන කළයුතුද? වරදක් නැත. නැවත සමවැද අධිෂ්ඨානය වනාහි උපාධ්‍යායාගේ සමීපයෙහි පිහිට ලබාගැනීම හා සමාන වේ. මේ භික්ෂුව විසින් ආකාසය වේවායි අධිෂ්ඨාන කළ හෙයින් ආකාසය වේමය. පළමු අධිෂ්ඨාන බලයෙන්ම මොහුට අතරතුර අන්‍ය පර්වතයක් හෝ වෘක්ෂයක් ඍතුමය වශයෙන් පැන නගින්නේය යන එය කිසිසේත් සිදුනොවන්නේය. අනෙක් ඍද්ධිමතෙකු විසින් කරන ලද නිර්මිතය ප්‍රථම නිර්මාණයට වඩා බලවත් වේ. අනෙක් තැනැත්තා විසින් එයට ඉහළින් හෝ පහළින් යායුතුය. **පඨවියාපි උම්මුජ්ජ නිමුජ්ජං** යනු මෙහි උම්මුජ්ජං යනු දිය මතුපිට නැගිට සිටීමයි. නිමුජ්ජං යනු දියෙහි කිමිදීමයි. දියෙහි මතුපිට සිටීමද, දියෙහි කිමිදී සිටීමද, උම්මුජ්ජනිමුජ්ජයි. මෙසේ කරනු කැමැත්තහු වසින් ආපො කසිණයට සමවැදී නැගිට මෙතෙක් තන්හි පෘථුවිය ජලය බවට පත්වේවායි පිරිසිඳ පරිකර්මකොට කියන ලද ක්‍රමයෙන්ම අධිෂ්ඨාන කළයුතුය. අධිෂ්ඨානය සමග පිරිසිඳින ලද පරිදි, එම ස්ථානයෙහි පෘථුවිය ජලයම වේ. හෙතෙම එහි ජලයෙහි මෙන් දිය මතුපිට නැගී සිටීම, දියෙහි කිමිදීම කරයි. දිය මතුපිට සිටීම-කිමිදීම පමණක්ම නොවේ. දියනෑම, මුහුණ සේදීම, භාණ්ඩ සේදීම් ආදීන්හි, යම් යම් දැයක් කැමැති වේද? ඒ ඒ දෑ කරයි. හුදෙක් දිය පමණෙක්ම කරන්නේ නොවේ. ගිතෙල්, තලතෙල්, මීපැණි, උක්පැණි ආදීන්හි යම් යම් දැයක් කැමැති වේද, මේ මේ දෑ මෙතෙක් වේවායි ආවර්ජනාකොට, පරිකර්මකොට, අධිෂ්ඨාන කරන්නහුට අධිෂ්ඨාන කළ

පරිදිම වේ. ඉන් ගෙන භාජන ගත කරන්නුහට ගිතෙල්, ගිතෙල්මය, තෙල් ආදිය තෙල් ආදීහුමය. ජලය, ජලයමය. හෙතෙම එහි තෙමෙනු කැමැත්තේම තෙමෙයි නොතෙමෙනු කැමැත්තේ නොතෙමෙයි. ඔහුටම ඒ පෘථුවිය ජලය වන්නීය. සෙසු ජනයාට පෘථුවියමය. එහි මිනිස්සු පා ගමනින්ද යෙති. යානාවන්ගෙන්ද යෙති. කෘෂිකර්මාන්තාදියද කරත්මය. ඉදින් ඔවුන්ටද ජලය වේවායි කැමැති වේද, වේමය. පිරිසිඳි කාලය ඉක්මවීමෙන්, යම් ප්‍රකෘතියෙන් කළ, වැව් ආදීන්හි ජලයක් වූයේද? එය හැර සෙසු පිරිසිඳි ස්ථානය පෘථුවියම වේ.

උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති යන මෙහි යම් දිය ඉක්මවා ගිලීයාමක් වේද, එය බිඳෙනු ලබන්නේ යයි යූ.සේයි. විපරීතය. නොබිඳෙනු ලබන්නයි. මෙසේ ගමන් කරනු කැමැත්තහු විසින් පෘථුවි කසිණයට සමවැදී, නැගිට මෙතෙක් තන්හි ජලය පෘථුවිය වේවායි පිරිසිඳ, පරිකර්ම කොට කියන ලද අයුරින්ම අධිෂ්ඨාන කටයුතුය. අධිෂ්ඨානය සමග පිරිසිඳි ස්ථානයෙහි ජලය පෘථුවියම වේ. හෙතෙම එහි පෘථුවියෙහි යම්සේද එසේ ගමන් කරයි. හුදෙක් ගමන් කිරීම පමණෙක් නොවේ. යම් යම් ඉරියව්වක් කැමැති වේද, ඒ ඒ දෑ කරයි. හුදෙක් පෘථුවියම පමණක් කරන්නේ නොවේ. මාණික්‍ය, ස්වර්ණ, පර්වත වෘක්ෂාදීන්හි යම් යම් දැයක් කැමැති වේද? ඒ ඒ දෑ කියන ලද ක්‍රමයෙන්ම ආවර්ජනය කොට, අධිෂ්ඨාන කරයි. අධිෂ්ඨාන කළ පරිද්දෙන්ම එය සිදුවෙයි. ඔහුටම ඒ ජලය පෘථුවිය වේ. සෙසු ජනයාට ජලයමය. මත්ස්‍යයෝ, කැස්බෑවෝ, දියකාවෝ රිසිසේ හැසිරෙත්. ඉදින් මෙතෙමේ අන් මිනිසුන්ටද, එය පෘථුවිය කරන්ට කැමැති වේද? එසේ ඔහුට එය කළහැකිය. පිරිසිඳි කාල ඉක්මීමෙන් ජලය බවටම පත්වේ.

ආකාසෙපි පල්ලංකෙන කමති යනු අහසෙහි හාත්පස කලවාබද්ධ ආසනයෙන් යයි පක්ඛීසකුණො පියාපත් වලින් යුත් පක්ෂියා, අසම්පූර්ණ පියාපත් හෝ කපා දැමූ පියාපත් සහිත පක්ෂියෙක් නොවේ. එවැනි පක්ෂීන්ට අහසෙහි යන්ට නොහැක. මෙසේ අහස්හි ගමන් කරනු කැමැත්තහු විසින් පඨවි කසිණයට සමවැදී නැගිට, ඉදින් හුන්නේම ගමන්කරන්ට කැමැති වේද? පර්යංක ප්‍රමාණ ස්ථානය පිරිසිඳ, පරිකර්ම කොට, කියන ලද, ආකාරයෙන්ම අධිෂ්ඨාන කළයුතුය. ඉදින් වැදහෝනේ ගමන් කරනු කැමැත්තේ වේද, ඇඳක ප්‍රමාණයද, ඉදින් පා ගමනින් යනු කැමැත්තේ වේද, මාර්ග ප්‍රමාණයදැයි මෙසේ සුදුසු පරිදි ස්ථානය පිරිසිඳ,

කියන ලද ආකාරයෙන්ම පෘථුවිය වේවායි අධිෂ්ඨාන කළයුතුය. අධිෂ්ඨානය සමගම පෘථුවිය වේ. අහසෙහි අහසින් ගමන් කරන භික්ෂුව දිව්‍ය චක්ෂුර්ලාභියෙකු විය යුතුය. කුමක් හෙයින්ද, අතරතුර සෘතු සමුට්ඨාන පර්වත වෘක්ෂාදීහු වෙති. නාගයෝ හා ගුරුළෝ ඊර්ෂ්‍යා කරමින් බාධක මවති. ඒවාහි දැකීම සඳහා ඒවා දැක කුමක් කළයුතුද? පාදක ධ්‍යානයට සමවැද නැගිට ආකාසය වේවායි පරිකර්මකොට අධිෂ්ඨාන කළයුතුය. තවද, සුදුසු අවකාශයෙහි බැසීම සඳහාද, මොහු විසින් දිව්‍ය චක්ෂුර්ලාභියෙකු ලෙසින් ක්‍රියාකරන අයෙකු විය යුතුය. මොහු වනාහි ඉදින් ස්නාන තොටුපළෙක හෝ ගම්දොරක හෝ යන අනවකාස ස්ථානයෙහි බසීද? මහජනයාට ප්‍රකට වේ. එහෙයින් දිවැසින් බලා අනවකාස ස්ථාන අත්හැර සුදුසු ස්ථානයෙහි බසියි.

**ඉමෙපි චන්දිම සූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ** යන මෙහි චන්ද්‍ර සූර්යයන්ගේ, දෙසාළිස් දහසක් යොදුන් මතුයෙහි හැසිරීමෙන් මහර්ධිතාවයද, තෙදිවයන්හි ඒකක්ෂණයෙහි ආලෝක කරණයෙන් මහානුභාවයද දතයුත්තාහුය. මෙසේ පෘථුවි මතුයෙහි හැසිරීම, ආලෝකය පැතිරවීම ආදියෙන් මහර්ධික වූ එම මහර්ධිකත්වයෙන් මහානුභාවයෙහි පිහිටි; **පරාමසති** යනු හාත්පසින් ගනියි. එක් කොටසක් හෝ ස්පර්ශ කරයි. **පරිමජ්ජති** යනු හාත්පසින් කැඩපත් තලයක් මෙන් පිරිමදියි. මොහුගේ මෙම ඍද්ධිය අභිඥාපාදක ධ්‍යාන වශයෙන් ඉටුවේ. මෙහි කසිණ සමාපත්ති නියමයක් නැත. මෙතෙම ගොස් ස්පර්ශ කරන්ට කැමැති වේද? ගොස් ස්පර්ශ කරයි. ඉදින් මෙහිම හිඳගෙන හෝ වැදහෙව ස්පර්ශ කරන්ට කැමැති වේද, අත්පසෙහි වේවායි අධිෂ්ඨාන කරයි. අධිෂ්ඨාන බලයෙන් නැට්ටෙන් ගිලිහුණු තල්ගෙඩියක් මෙන් අවුත් අත්පසෙහි සිටියේ හෝ ස්පර්ශ කරයි. අත හෝ දීර්සකොට ස්පර්ශ කරයි.

අත වර්ධනය කරන්නහුට කිමෙක්ද, උපාදින්නකය වැඩේද? අනුපාදින්නකය වැඩේද? උපාදින්නකය ඇසිරිකොට අනුපාදින්නකය වැඩේ. (දීර්ස වේ.) හෙතෙම මෙසේ කොට හුදෙක් සඳහිරු පරාමර්ශනය මතුනොව, ඉදින් කැමැත්තේ නම් පාපුවරුවක් කොට පාදයන් තබයි. පුටුවක් කොට හිඳගනියි. ඇඳක් කොට නිදයි. හේත්තුවන ලෑල්ලක්කොට හේත්තු වේ. එක් අයෙකු මෙසේ කරද්දී, තවෙකෙක්ද එසේම කරයි. විවිධ භික්ෂූහු දසදහසක් මෙසේ කරන කල්හිද ඔවුන්ටද එකිනෙකාට එසේම සිද්ධ වේ. චන්ද්‍ර සූර්යයන්ගේ ගමනද ආලෝක කරණයද එසේම

වේ. යම්සේ භාජන දිය පිරවූ බඳුන් දසදහසක් ඇතිකල්හි සියලු බඳුන්හි චන්ද්‍ර මණ්ඩලය දක්නා ලැබෙත්ද? චන්ද්‍රයාගේ ගමනද, ආලෝක කරණයද, ප්‍රකෘති තත්වයෙන්ම වේ. එම ප්‍රාතිහාර්යයද එබඳුමය. **යාවබ්‍රහම ලොකාපි කායෙන වසං වතෙතති** යනු බ්‍රහ්මලෝකය සීමාකොට මේ අන්තරයෙහි නොයෙක් ආකාර අභිඥා කරනුයේ තමාගේ ශරීරයෙහි වසඟතාව, ඓශ්වර්යය පවත්වයි. මෙහි විස්තර වනාහි ඍද්ධි කථායෙහි ප්‍රකට වන්නේය.

## ඉද්ධිවිධ ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.

ශ්‍රොතධාතු විශුද්ධි ඥාණ නිර්දේශයෙහි, 'දූරෙපි සද්දානං' ආදී දිව්‍ය ශ්‍රෝතස නිපදවනු කැමැති ආදිකර්මික භික්ෂුවට ක්‍රම දැක්වීම සඳහා යූ.සේයි. එහි **දූරෙපි, සද්දානං සද්ද නිමිතතං** යනු දුර ශබ්දයන්ගේ අන්තරයෙහි ශබ්දය, ශබ්දයම නිමිති කරණ වශයෙන් ශබ්ද නිමිත්තයි. දුරයැයි කියන ලද නමුත්, ප්‍රකෘති ශ්‍රෝතසට හමුවන ස්ථානයෙහිම **ඔළාරිකානං** යනු දැඩිවූ, **සුඛුමානං** සියුම් වූ, **සණහ සණහානං** යනු සියුම් වූවගෙන්ද, සියුම් වූ, අතිශය සියුම් වූ යන අර්ථයි. එයින් ඉතා සියුම් ශබ්ද යූ.සේයි. මෙම ඥාණය උපදවනු කැමැති ආදි කර්මික ධ්‍යායකයා විසින් අභිඥාපාදක ධ්‍යානයට සමවැද නැගිට, පරිකර්ම සමාධි සිතින් ප්‍රථමකොට, ප්‍රකෘති ශ්‍රෝත්‍ර පථයෙහි ගැටෙන දුර, දළ, අරණ්‍යයෙහි සිංහාදීන්ගේ ශබ්දය ආවර්ජනා කළයුතුය. විහාරයෙහි ගෙඩි ශබ්දය, බෙර ශබ්දය, සංඛ ශබ්දය, සියලු ශක්තියෙන්ද, සජ්ඣායනා කරන්නා වූ සාමණේර තරුණ භික්ෂූන්ගේ සජ්ඣායනා ශබ්දයද ප්‍රකෘති කථා කථා කරන්නවුන්ගේ, ස්වාමීනි කිමෙක්ද? ඇවැත්නි කිමෙක්ද? ආදී ශබ්දය, පක්ෂි ශබ්දය, වායු ශබ්දය, පියවර තබන ශබ්දය අතිශයින් රත්කළ ජලයෙහි චිටිචිටි යන ශබ්දය, අව්වෙහි වියලී යන තල්පත් ශබ්දය, කුහුඹුවන්, හින්නන් ආදීන්ගේ ශබ්දය දැයි මෙසේ සියලු දළ ශබ්දයේ පටන් ක්‍රමක්‍රමයෙන් සියුම් සියුම් ශබ්ද ආවර්ජනය කළයුත්තාහ. මෙසේ කරන්නහු විසින්, නැගෙනහිර දිශාවෙහි සිට දසදිශාවන්හි ක්‍රමයෙන් එක් එක් දිශාවෙහි ශබ්ද නිමිත්ත කියන ලද අයුරින් මෙනෙහි කළ යුතුය. මෙනෙහි කරන්නහු විසින්, යම් ශබ්ද, ප්‍රකෘති ශ්‍රෝතසට ඇසේද? ඒවාහි ප්‍රකෘති ශ්‍රෝතාවධානයකොට මනෝද්වාරික සිතින් මෙනෙහි කළයුතුය. ඔහුට ඒ ශබ්ද ප්‍රකෘති සිතටද ප්‍රකට වෙයි. පරිකර්ම සමාධි සිතට අතිශයින් ප්‍රකට වෙයි. ඔහුට මෙසේ

ශබ්ද නිමිත්ත මෙනෙහි කරන කල්හි, දැන් දිව්‍ය ශ්‍රෝතධාතුව උපදින්නේ යයි ඒ ශබ්දයන්හි එක්තරා ශබ්දයක් අරමුණුකොට, මනෝද්වාරාවර්ජනය උපදී. එය නිරුද්ධ කල්හිසතරක් හෝ පහක් දුවයි. යම් ප්‍රථම තුනක් හෝ සතරක්, පරිකර්ම, උපචාර, අනුලෝම ගොත්‍රභූ නමැති කාමාවචරයන්ද, සිව්වෙනුව, පස්වෙනුව, රූපාවචර චතුර්ථධ්‍යානික අර්පණා චිත්තය වේ. එහි යම් ඒ අර්පණා සිත සමග උපන් ඤාණයක් වේද? එය දිව්‍යශ්‍රෝත ධාතුවයි. එය ශක්තිමත් කරන්නහු විසින් ඒ අතරෙහි ශබ්දයක් ශ්‍රවණය කරමියි එකඟුල් මාත්‍රයක් පිරිසිඳ වැඩිය යුත්තේය. ඉන්පසු, දෑඟුල්, සිවඟුල්, අටඟුල්, වියත, රියන, ඇතුල්ගැබ, ප්‍රධාන ප්‍රාසාදය, පිරුවන, සංඝාරාමය, ගොදුරුගම, ජනපද ආදී වශයෙන්, චක්‍රවාටය කෙළවර දක්වාද, ඉන් බහුතර වශයෙන්ද පිරිසිඳ, පිරිසිඳ වැඩිය යුතුය. මෙසේ අවබෝධ කළ අභිඥා ඇති මෙතෙමේ පාදකධ්‍යානාරම්මණයෙන් ස්පර්ශ කරන ලද ආකාස අභ්‍යන්තරගත ශබ්දයෙහි, පාදකධ්‍යානයට, සම නොවැදද අභිඥා ඤාණයෙන් ශ්‍රවණය කෙරේමය. මෙසේ ශ්‍රවණය කරන්නේද, බ්‍රහ්ම ලෝකය දක්වා සක් - බෙර - කුඩාබෙර (ගැටබෙර) ආදී ශබ්දයන්ගෙන් එකම කෝලාහලයක් වේ. වෙන් වෙන්ව ව්‍යවස්ථාපනය කරනු කැමැත්ත ඇතිකල්හි, මේ සක්හඬය. මේ බෙර ශබ්දයයැයි ව්‍යවස්ථාපනය කරන්ට හැකිවේමය. අභිඥා ඤාණයෙන් ශ්‍රවණය කළ ප්‍රයෝජනවත් ශබ්දයෙහි අර්ථය පසුව කාමාවචර සිතින් දැනගනී. දිව්‍ය ශ්‍රෝතය ප්‍රකෘති ශ්‍රෝතවත් වූවහුටම උපදී. බිහිරාට නූපදී. පසුව ප්‍රකෘති ශ්‍රෝතය නටුයේ වී නමුත් දිව්‍ය ශ්‍රෝතය නොනස්නේයයි කියති. **සො දිබ්බාය සොත ධාතුයා** යන මෙහි දිව්‍ය සමාන හෙයින් දිබ්බංයි. දෙව්වරුන්ට සුචරිත කර්මයෙන් උපන් හෙයින්, පිත් සෙම් රුධිරාදියෙන් පළිබෝධ රහිත හෙයින් කෙලෙසුන් කෙරෙන් මුක්ත හෙයින් දුර පිහිටියා වූද අරමුණු පිළිගැනීමට සමත් දිව්‍ය ප්‍රසාද ශ්‍රෝත ධාතුව වේ. මෙයද මෙම භික්ෂුවගේ වීර්යභාවනා බලයෙන් නිපන් හෙයින් ඤාණ ශ්‍රෝතධාතුව එබඳුම යයි දිව්‍ය සමාන හෙයින් දිබ්බංයි. තවද, දිව්‍ය විහරණ වශයෙන් ලද හෙයින්ද, තමාද දිව්‍ය විහරණ සනනිශ්‍රිත හෙයින්ද දිබ්බංයි. ශ්‍රවණාර්ථයෙන්ද, ජීවරහිතාර්ථයෙන්ද ශ්‍රොත ධාතුයි. ශ්‍රොතධාතු කෘත්‍යකරණයෙන්ද, ශ්‍රෝතධාතු මෙනැයි ශ්‍රෝතධාතුයි. ඒ දිව්‍ය ශ්‍රොත ධාතුයෙන්, **විසුද්ධාය** පිරිසිදු භාවයෙන්, උපක්ලේශ රහිත භාවයෙන්, **අතික්කනත මානුසකාය** යනු මිනිස් සීමා ඉක්මවා, ශබ්ද ශ්‍රවණයෙන්, මානුෂ්‍යයික මාංශ ශ්‍රෝතධාතුව ඉක්මවා, ඉකුත්කොට පැවැති, **උභො සදෙද සුණාති** ද්වි ශබ්දයන් අසයි. කවර ද්වයයක්ද යත්? **දිබෙබච මානුසෙච** දෙව්වරුන්ගේද, මනුෂ්‍යයින්ගේද ශබ්දයැයි යූ.සේයි. එයින්

ප්‍රදේශය සම්පූර්ණයෙන් ගැනීම දතයුතුය. යෙ දූරෙ සන්තිකෙච යනු යම් ශබ්ද දුර පිටසක්වළයන්හිද, යම් සමීපයෙහි, තම දේහාශ්‍රිත ප්‍රාණී ශබ්දද, ඒවා ශ්‍රවණය කෙරේයයි යූ.සේයි. එයින් ප්‍රදේශ රහිතව සම්පූර්ණයෙන් ගැනීම දතයුතුය.

## ශ්‍රෝතධාතු විශුද්ධි ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.

චෙතොපරියඥාණ නිර්දේශයෙහි, **සො එවං පජානාති** යනු දැන් කිවයුතු විධානය පෙන්වයි. **ඉදං රූපං සොමනස්සින්ද්‍රිය සමුට්ඨිතං** ආදිය ආදිකර්මික ධ්‍යායීහු විසින් පිළිපැදිය යුතු විධානයයි. කෙසේද? එම ඥාණය උපදවනු කැමැති, ධ්‍යානලාභියා විසින් ප්‍රථමයෙන් දිව්‍ය චක්‍ෂු ඥාණය උපදවාගත යුතුය. එය දිව්‍ය චක්‍ෂු ඥාණ වශයෙන් සිද්ධ වේ. එය එයට පරිකර්මයි. එහෙයින් ඒ භික්‍ෂුව විසින් ආලෝකය වඩා දිවැසින් අන්‍යයාගේ හෘදය රූපය ඇසිරිකොට පවත්නා ලෝහිත වර්ණය දැක දැක සිත සෙවිය යුතුය. එම ලෝහිතය සෝමනස්ස සහගත කුසල් සිත පවත්නා කල්හි ඉදුණු නුගඵල වර්ණ රක්ත වර්ණ වේ. සෝමනස්ස සහගත අකුසල් සිත පවත්නා කල්හි එයම කැළඹුණේ වෙයි. දෝමනස්ස සහගත අකුසල් සිත් පවත්නා කල්හි, දඹපලවන් කැළැඹුණු කාල වර්ණ වේ. උපේක්‍ෂා සහගත කුසල් සිත් පවත්නා කල්හි තලතෙල් වර්ණ වූයේ ප්‍රසන්න වේ. අකුසල උපේක්‍ෂා සහගත සිත් පවත්නා කල්හි එයම කැළැඹුණේ වෙයි. එහෙයින් එය කරණකොට, මෙම රූපය සෝමනස්ස ඉන්ද්‍රියයෙන් හටගත්තේය. මෙම රූපය දෝමනස්ස ඉන්ද්‍රියයෙන් හටගත්තේය. මෙම රූපය උපේක්‍ෂා ඉන්ද්‍රියයෙන් හටගත්තේ යයි අන්‍යයාගේ හෘද ලෝහිත වර්ණය දැක සිත සොයන්නහු විසින් චෙතොපරියඥාණය ශක්තිමත් කළයුතුය. මෙසේ ශක්තිමත් වූ කල්හි, එහි අනුක්‍රමයෙන් සියලුම කාමාවචරාදි භේදවූ සිත හෘදය රූප දර්ශනයෙන් තොරව සිතින් සිත සංක්‍රමණය වන්නේ දැනගනී. අටුවාවෙහි කියන ලදී. අරූපතලයෙහි අන්‍යයාගේ සිත දැනගනු කැමැති තැනැත්තේ කවරෙකුගේ හෘදය රූපය දකීද? කවරෙකුගේ බලයිද? යම්කිසිතැනක සිත ආවර්ජනා කරන්නේ සොළොස් ආකාර සිත දැනගනී යන මෙය කිසි ඍද්ධිමතෙකුට විෂය නොවේ. නොකරන ලද බැඳී පැවතීම් වශයෙන් මෙම කථාවය. **පරසත්තානං** තමා හැර සෙසු සත්ත්වයින්ගේ, **පරපුග්ගලානං** මෙයද මෙයින් එකසමානාර්ථයි, විනේයජනයන්ගේ වශයෙන්ද, දේශනා විලාස වශයෙන්ද, ව්‍යජනාක්‍ෂරයෙන් නානත්වය කරන ලදී.

**චෙතසා චෙතො පරිච්ච පජානාති** තමාගේ සිතින් ඔවුන්ගේ සිත පිරිසිඳ රාග සහිතාදි භාවයෙන්, ආදී නානාප්‍රකාර වශයෙන් දැනගනී. **සරාගංවා** ආදීන්හි වා ශබ්දය එක්කිරීම් අර්ථයෙහිය. එහි අටවැදෑරුම් ලෝභසහගත සිත සරාගී සිත නමැ. ද්වි දොම්නස් සිත් ද්වි විචිකිච්ඡා, උද්ධච්ච සිත්ද යන මේ සිව් සිත් මෙම ද්විකයෙහි සංග්‍රහයට නොයෙත්. සමහර තෙරවරු ඒවාද වීතරාග පදයෙන් සංග්‍රහ කරත්. ද්විවිධ දොම්නස් සහගත සිත් **සදොස** සිත් නමැ. සියලුම චාතුර්භූමික කුසලාව්‍යාකෘත **වීතදොස** නමැ. සෙසු දස අකුසල සිත් මෙම ද්විකයෙහි සංග්‍රහයට නොයෙත්. සමහර තෙරවරු ඒවාද වීතදෝස පදයෙන් සංග්‍රහ කරත්. **සමොහං වීතමොහං** යන මෙහි මෝහය ඒකහේතුක වශයෙන් විචිකිච්ඡා උද්ධච්ච සහගත ද්වයයම **සමොහංයි** මෝහය වනාහි සියලු අකුසල්හි හටගන්නා හෙයින් දොළොස් ආකාර අකුසල් සිත් සමොහයි දතයුතුය. සෙසු කුසලා ව්‍යාකෘතයන් **වීතමොහංයි.** ථීනමිද්ධානුගත වූයේ **සංඛිත්තංයි. උද්ධච්චානුගත** වූයේ **විකඛිත්තංයි.** රූපාවචර අරූපාවචර මහග්ගතංයි. **සෙස්ස අමහග්ගතංයි.** සියලු ත්‍රෛභූමික චිත්තයන් **සඋත්තරංයි** ලෝකෝත්තරය **අනුත්තරංයි.** උපචාර, අර්පණාප්‍රාප්ත වූයේ **සමාහිතංයි.** ඒ දෙඅයුරට නොපත් වූයේ **අසමාහිතංයි** තදංග, විකඛම්භන සමුච්ඡේද, පටිප්පස්සද්ධි, නිස්සරණ, විමුක්තිප්‍රාප්ත වූයේ **විමුත්තංයි** ඒ පස්වැදෑරුම් විමුක්ති නොපත්වූයේ **අවිමුත්තංයි** දතයුතුයි. මෙසේ, චෙතොපරියඤාණ ලාභී භික්ෂුව සොළොස්ප්‍රභේද වූ සිත් දනියි. පෘථග්ජනයෝ ආර්යයන්ගේ මාර්ගඵල සිත් නොදනිත්. යට ආර්යයෝද, මතු අයගේ මාර්ගඵල සිත් නොදනිති. මත්තෙහි වූවෝ යට අයගේ සිත් දනිත්.

## චෙතොපරිය ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

පූර්වෙනිවාසානුස්මෘති ඤාණ නිර්දේශයෙහි **එවං පජානාති** ආදී සිව් ඍද්ධිපාදයන්හි, මනාකොට වඩන ලද සිත් ඇති පූර්වේනිවාසානුස්මෘති ඤාණය උපදවනු කැමැත්තහුට එය උපදවාගැනීමේ පිළිවෙළ දැක්වීම සඳහා කියන ලදී. පිළිවෙළින් ප්‍රතීත්‍ය සමුත්පාදය දැක, විඤ්ඤාණ, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වේදනා සංඛ්‍යාත වර්තමාන ඵල සංක්‍ෂෙපය දකියි. **තසසා** යනු එයට ප්‍රත්‍යය වූ පූර්වභවයෙහි කර්ම ක්ලේශ සංඛ්‍යාත හේතු සංක්‍ෂෙපය දකියි. එයට ප්‍රත්‍යය වූ තෘතීය භවයෙහි හේතු සංක්‍ෂෙපය දකියි. එයට ප්‍රත්‍යය වූ පූර්වභවයෙහිම ඵල සංක්‍ෂෙපය දකියි. එයට

ප්‍රත්‍යය වූ තෘතීය භවයෙහි හේතු සංක්‍ෂෙපය දකියි. මෙසේ ප්‍රතීත්‍ය සමුත්පාද දර්ශනයෙන් ජාති පරම්පරාව දකියි. මෙසේ පූර්වේ නිවාසානුස්මෘති ඥාණයට ප්‍රතීත්‍ය සමුත්පාද මනසිකාරය බොහෝ උපකාරවත් වේ. එහි 'මෙය ඇතිකල්හි මෙය වෙයි. මෙය ඉපදීමෙන් මෙය උපදී යන මෙය ප්‍රතීත්‍ය සමුත්පාද නිර්දේශයෙහි උදෙසීම් වචනයයි. ඒවාහි එක්තරා වචනයකින්ම අර්ථය සිද්ධ කල්හි දෙයාකාර වචනයක් කුමක් සඳහාද යත්? අර්ථ නානත්වය යෙදෙන හෙයිනි. කෙසේද? **ඉමස්මිං සති** යනු මේ ප්‍රත්‍යය ඇතිකල්හි, විද්‍යමාන කල්හි, මෙය සියලු ප්‍රත්‍යයන්ට සාධාරණ වචනයයි. **ඉදං හොති** යනු මේ ප්‍රත්‍යයෝත්පන්නය වේ. මෙය සියලු ප්‍රත්‍යයෝත්පන්නයන්ට සාධාරණ වචනයයි. මේ සියලු වචනයන්ගෙන් අහේතුකවාදය ප්‍රතික්‍ෂිප්ත වූයේ වෙයි. යම් ධර්මයෝ ප්‍රත්‍යයන්ගෙන් හටගත්තාහු වෙත්ද? ප්‍රත්‍යය නොමැතිව නොවෙත්ද? ඒවා අහේතුක නම් වෙති. **ඉමස්සුප්පාදා** යනු මේ ප්‍රත්‍යයාගේ උත්පාදය හේතුකොටගෙන, මේ සියලු ප්‍රත්‍යයන්ගේ උත්පාදවත් බව දැක්වීමේ වචනයයි. **ඉදං උප්පජ්ජති** යනු මේ ප්‍රත්‍යයෝත්පන්නය උපදී. මෙය සියලු ප්‍රත්‍යයෝත්පන්නයන්ගේ, එයින් උපදනා බව දක්වන වචනයයි. මෙම සියලු වචනයන්ගෙන් ශාශ්වත අහේතුකවාදය ප්‍රතික්‍ෂෙප කරන ලද්දේ වෙයි. යම් උපදවන ස්වභාව ධර්ම කෙනෙක් වෙත්ද, ඒවා අනිත්‍යයහ. එහෙයින් සහේතුකත්වය ඇතිකල්හිද, එම ධර්ම අනිත්‍ය හේතුකය. ලෝකයෙහි නිත්‍ය සම්මත ප්‍රකෘති පුරුෂාදි හේතුක කිසිවක් නැතැයි යූ.සේයි. යදිදං යනු නිර්දේශ කළයුතු අර්ථ පෙන්වීමයි. **අවිජ්ජා පච්චයා** සංඛාරා යන මෙහි යමක් හේතුයෙන් ඵලයක් හටගනීද, එය ප්‍රත්‍යයයි. පටිච්ච යනු නුවණින් නොසලකා යන අර්ථයි.

එති යනු උපදියි මෙන්ම පවතී යන අර්ථයි. තවද උපකාරාර්ථය ප්‍රත්‍යයාර්ථයද වේ. අවිද්‍යාවද ඕ ප්‍රත්‍යයම වූයේනුයි අවිජ්ජා පච්චයොයි. එහෙයින් අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ හටගනිත් යයි යෙදීමයි. මෙසේ සම්භවනති ශබ්දයට සෙසු පදයන්හිද යෙදීම් කළයුතුය. සෝකාදීන්හිද සෝක කිරීම, සොකොයි. විලාප කීම පරිදෙවොයි. දුකට පත්වේනුයි - දුක්ඛංයි. උත්පාද ස්ථිති වශයෙන් දෙයාකාරයෙන් සාරයිනුයිද දුක්ඛංයි. නොසතුටු සිතෙහි ස්වභාවය - දොමනස්සංයි. මහත් වෙහෙස උපායාසොයි. **සම්භවනති** යනු උපදිති. **එවං** යනු නිර්දිෂ්ට ක්‍රම පෙන්වීමයි. එයින් අවිද්‍යාදී වූම කාරණයන්ගෙන් යයිද ඊශ්වර නිර්මාණාදීන්ගෙන් නොවේ යයිද දක්වයි. **එතස්ස** යනු ඒ කියන ලද්දෙහි, **කෙවලස්ස** අසම්මිශ්‍ර

හෝ සියල්ලෙහි යන අර්ථයි. දුක්ඛක්ඛන්ධස්ස යනු දුක් සමූහයාගේ, සුව, ශුභ ආදීන්ගේ හෝ සත්ත්වයාගේ හෝ නොවෙයි. සමුදයො යනු ඉපැත්ම, හොති යනු හටගනියි.

එහි අවිද්‍යාව කවරක් වන්නේද? දුකෙහි නොදැනීම, දුක් හටගැන්මෙහි නොදැනීම, දුක් නිරුද්ධ කිරීමෙහි නොදැනීම, දුක් නිරෝධයට පමුණුවන ප්‍රතිපදාවෙහි නොදැනීම, පූර්වාන්තයෙහි නොදැනීම, අපරාන්තයෙහි නොදැනීම, පූර්වාපරන්තාපරයන්තයෙහි නොදැනීම, මෙය හේතුකොට හටගන්නා වූ ධර්මයන්හි නොදැනීම, සංස්කාරයෝ කවරහුද? පුණ්‍යාභිසංස්කාර, අපුණ්‍යාභිසංස්කාර, ආනෙඤ්ජාභි සංස්කාර, කාය සංස්කාර, වාක් සංස්කාර, චිත්ත සංස්කාර, අටවැදෑරුම් කාමාවචර කුසල් චේතනා, පස්වැදෑරුම් රූපාවචර කුසල් චේතනා, පුණ්‍යාභිසංස්කාරයි. දොළොස් අකුසල් චේතනා, අපුණ්‍යාභි සංස්කාරයි. සිව් අරූපාවචර කුසල් චේතනා ආනෙඤ්ජාභිසංස්කාරයි.

කාය සඤ්චතනා කාය සංස්කාරයි. වාග් සඤ්චතනා වචී සංඛාරයි. මනො සඤ්චතනා චිත්ත සංඛාරයි. මෙම සංස්කාර අවිද්‍යා ප්‍රත්‍යයෙන් වෙත්යයි, එය කෙසේ දැනගත යුතුදැයි ප්‍රශ්නයක් මතුවන්නේය. අවිද්‍යාවගේ වීම ඇතිකල්හි වන හෙයිනි. යමෙකුට දුක්ඛාදීන්හි අවිද්‍යා සංඛ්‍යාත නොදැනීම අප්‍රහීණ වූයේ වේද? හෙතෙම පළමුව දුක්ඛයෙහි පූර්වාන්තාදීන්හි නොදැනීමෙන් සසර දුක සුව සංඥාවෙන් ගෙන එයටම හේතුවූ තෙවදෑරුම් සංස්කාරයන් අරඹයි. දුක්ඛ සමුදයෙහි නොදැනීමෙන්, දුකට හේතුභූත වූ, තෘෂ්ණා පරිෂ්කාර සංඛ්‍යාත සංස්කාරයන් සුවහේතු වශයෙන් හඟිමින් රැස්කිරීම අරඹයි. නිරෝධයෙහිද, මාර්ගයෙහිද නොදැනීමෙන්, දුකෙහි නිරෝධයට හේතුනොවන්නා වූද, ස්වභාව විශේෂයන්හි, දුක්ඛ නිරෝධසංඥීව, දුක්ඛ නිරෝධයට මාර්ග නොවූ, යාගහෝම, අමරා වික්ෂෙපිත හා තපො ව්‍රතාදීන්හි නිරෝධ මාර්ග සංඥීව, දුක්ඛ නිරෝධය ප්‍රාර්ථනා කරමින් යාගහෝම, අමරා වික්ෂෙපිත හා තපො ව්‍රතාදී ආකාරයෙන් තෙවදෑරුම් සංස්කාරයන් අරඹයි.

තවද හෙතෙම ඒ සිව්සස්හි, අප්‍රහීණ අවිද්‍යාතායෙන් විශේෂයෙන් ජාති, ජරා, රෝග මරණාදී නොයෙක් ආදීනවයන්ගෙන් ගැවසීගත් පුණ්‍යඵල සංඛ්‍යාත, දුක, දුක වශයෙන් නොදන්නේ එම දුක ලබාගැනීම සඳහා කාය, වාග්, චිත්ත සංස්කාරභේද වූ පුණ්‍යාභිසංස්කාර අරඹයි. දිව්‍යප්සරා

කැමැත්තේ මාරක ප්‍රපාතයට ඇදවැටී නැසෙන්නාක් මෙනි. සුවයැයි සම්මත වූයේද ඒ පුණ්‍ය ඵලයාගේ අන්තයෙහි මහත් දාහ හටගන්වන, විපරිණාම දුක්ඛතාවද, අල්පාශ්වාදතාවද, නොදක්නේම, එයට හේතුවන කියන ලද ආකාරම වූ පුණ්‍යාභිසංස්කාර අරඹයි. මීපැණි ආලේප කරන ලද ආයුධය ලොවින මීබිඳු ගිජුවූවෙකු මෙන්ද, පහන්සිළ මතුයෙහි පතිත වන පළඟැටියාද මෙනි. කාමසේවනාදීන්හි විපාක සහිත ආදීනව නොදක්නේ සුව සංඥාවෙන්ද, කෙලෙසුන්ගෙන් මැඩුණු හෙයින්ද, ද්වාරත්‍රයයෙහි පැවැති අපුණ්‍යාභිසංස්කාර අරඹයි. අශුචි සමග ක්‍රීඩා කරන ළදරුවෙකු මෙන්ද, මැරෙනු කැමැත්තහුගේ විෂ කෑම මෙන්ද වේ. අරූප විපාකයන්හිද, සංස්කාර විපරිණාම දුක්ඛතාව, අවබෝධ නොකරනුයේ, ශාශ්වතාදී චිත්ත විපර්යාසයෙන්, චිත්ත සංස්කාර වූ අනෙඤ්ජාභි සංස්කාර අරඹයි. පිශාච නගරාභිමුව මාර්ගයෙහි ගමන්කරන දිසා මුළාවූවෙකු මෙනි. මෙසේ අවිද්‍යාවගේම හටගැනීමෙන් සංස්කාරයන්ගේ හටගැනීම වේ. හටනොගැනීමෙන් නොවේ. එහෙයින් එය දැනගත යුතුය. මේ සංස්කාර අවිද්‍යා ප්‍රත්‍යයෙන් වෙයි. මෙහි කීහ. ඒ අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වේයයි යන්න පළමුව ගනිමු. කිමෙක්ද මේ තනිවූම අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වේද? නොහොත් අන්‍යවූද, ප්‍රත්‍ය ඇත්ද? කිමෙක්ද මෙහි පළමුව තනිවූයේම ඒක කාරණ වාදයට පැමිණේද, වෙනත් දෑද තිබේද? 'අවිජ්ජා පච්චයා සංඛාරායි' ඒක කාරණ නිර්දේශය නුපදීද? නූපදී. කුමක් හෙයින්ද යත්,

> එකං න එකතො ඉධ නානෙක මනෙකතොපි නො එකං
> ඵලමත්ථි අත්ථීපන එක හෙතුඵල දීපනෙ අත්‍ථො

මෙලොව එක් හේතුවකින් එක් ඵලයක් නැත. නොයෙක් ඵලද නැත. නොයෙක් හේතුන්ගෙන්ද එක් ඵලයෙක් නැත. අවිද්‍යා හේතුවෙන් සංස්කාර යනාදී වශයෙන් එක් එක් හේතු, එක් එක් ඵලයන් දැක්වීමෙහි ප්‍රයෝජනයක්ද ඇත.

භාග්‍යවතුන් වහන්සේ කිසිතැනෙක ප්‍රධානත්වයෙන්ද, කිසිතැනෙක ප්‍රකට භාවයෙන්ද, කිසිතැනෙක අසාධාරණත්වයෙන්ද, දේශනා විලාස වශයෙන්ද, හික්මවිය යුතු අයට සුදුසු අයුරින්ද, එකම හේතුවක් හා ඵලයක් දක්වයි. එහෙයින් මෙහි මේ අවිද්‍යාව, අනෙකුත් සංස්කාර කාරණ වූ වස්තු, ආරම්මණ ආදී සහජාත ධර්මයන් විද්‍යමාන කල්හිද, තෘෂ්ණාදීන් සංස්කාර හේතුන් වශයෙන් හේතුවේයයි ප්‍රධානත්වයෙන්ද, ප්‍රකට

භාවයෙන්ද, අසාධාරණත්වයෙන්ද සංස්කාරයන්ගේ හේතුභාවයෙන් දක්වන ලද්දේයැයි දතයුත්තාහ. මෙයින්ම එක් එක් හේතුඵල දැක්වීමෙහි අත්හැරීම් වචනයෙන්, හැමතැන එක් එක් හේතුඵල දැක්වීමෙහි ප්‍රයෝජන දතයුතුය. මෙහි කීහු, මෙසේ ඇතිකල්හිද, ඒකාන්ත අනිෂ්ට ඵල සහිත සාවද්‍ය අවිද්‍යායෙන් කෙසේ පුණ්‍ය ආනෙඤ්ජාභිසංස්කාර ප්‍රත්‍යයතාවය යෙදේද? කොහොඹ බීජයෙන් උක් හට නොගනී. කෙසේ නොයෙදෙන්නේද? ලෝකයෙහි වනාහි, විරුද්ධ අවිරුද්ධතාවන්ද, එසේම සමාන අසමානතාවන්ද, යනාදිය ධර්මයන්ගේ ප්‍රත්‍යයෙන් සිද්ධ වේ. ඒවා විපාකයන්ම නොවේ.

**විරුද්ධාවා විරුද්ධාවා - සදිසාසදිසොතථා**
**ධම්මානං පච්චයො සිද්ධා - විපාකා එව තෙච න**

මෙසේ මෙම අවිද්‍යාව විපාක වශයෙන් ඒකාන්ත අනිෂ්ට ඵල වූවාහු ස්වභාව වශයෙන්ද, සාවද්‍ය වූවාහු, ඒ සියලු පුණ්‍යාභිසංස්කාරාදීන්ට සුදුසු පරිදි, පිහිටීම, කෘත්‍යය, ස්වභාවය, විරුද්ධ, අවිරුද්ධ ප්‍රත්‍යය වශයෙන් සමාන වූවාහු, සමාන ප්‍රත්‍යය වශයෙන්ද, ප්‍රත්‍යය වේයයි දතයුත්තාහ. තවද

**චුතූපපාතෙ සංසාරෙ - සංඛාරානඤ්ච ලක්ඛණෙ**
**යො පටිච්ච සමුප්පන්න - ධම්මෙසුච විමුය්හති**

සසරෙහි චුති උත්පත්තීන්හිද, සංස්කාරයන්ගේ ලක්‍ෂණයෙහිද ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන්හිද, යම් පුග්‍ගලෙක් මුළා වේද?

**අභිසංඛරොති සො එතෙ - සංඛාරෙ තිවිධෙ යතො**
**අවිජ්ජා පච්චයො තෙසං - තිවිධානං අයං තතො**

යම්හෙයකින් හෙතෙම එම ත්‍රිවිධ සංස්කාරයන් රැස්කෙරේද, එහෙයින් මෙතෙමේ ඒ ත්‍රිවිධ සංස්කාරයන් අවිද්‍යා ප්‍රත්‍යයෙන් රැස් කෙරේ.

**යථාපි නාම ජච්චන්ධො - නරො අපරිණායකො**
**එකදා යාති මග්ගෙන - උම්මග්ගෙනාපි එකදා**

යම්සේ නම් මගපෙන්වන්නෙකු නොමැති, ජාත්‍යන්ධ මිනිසා එක්කලෙක නිසි මාර්ගයෙන්, එක්කලෙක වැරදි මාර්ගයෙන් යයිද?

සංසාරෙ සංසරං බාලො - තථා අපරිණායකො
කරොති එකදා පුඤ්ඤං - අපුඤ්ඤමපිච එකදා

එසේම මගපෙන්වන්නෙකු නොමැති, සසර සැරිසරන අඥානයා එක්කලෙක පින් හා එක්කලෙක පාපයන්ද කරයි.

යදා ච ඤත්වා සො ධම්මං - සච්චානි අභිසමෙස්සති
තදා අවිජ්ජූපසමා - උපසන්තො චරිස්සතීති

යම්කලෙක හෙතෙම ධර්මය දැන සත්‍යයන් අවබෝධ කරන්නේද? එකල්හි අවිද්‍යා සන්සිඳීමෙන් උපශාන්තව හැසිරෙන්නේය.

සංඛාර පච්චයා විඤ්ඤාණං යනු ෂට් විඤ්ඤාණ කායයන්, චක්ෂු, ශ්‍රෝත, ඝ්‍රාණ, ජිව්හා, කාය, මනො යන විඤ්ඤාණයන්ය. එහි චක්ෂු විඤ්ඤාණය කුසල විපාක, අකුසල විපාක වශයෙන් දෙවදෑරුම්ය. ශ්‍රෝත, ඝ්‍රාණ, ජිව්හා, කාය විඤ්ඤාණයන්ද එසේය. මනො විඤ්ඤාණය විපාක මනොධාතු ද්වයයද, අහේතුක මනො විඤ්ඤාණ ධාතුත්‍රයයද, සහේතුක කාමාවචර විපාක සිත් අටද, පඤ්චරූපාවචරයන්ද, සිව් අරූපාවචරයන්දැයි දෙවිසිවැදෑරුම්ය. මෙසේ සියලු ලෞකික විඤ්ඤාණ දෙතිසකි. මේ කියන ලද ආකාර ඇති විඤ්ඤාණය සංස්කාර ප්‍රත්‍යයෙන් වේයයි කෙසේ දැනගත යුතුද? රැස් කරන ලද, කර්ම නොමැති කල්හි විපාක නොමැති හෙයිනි. එය විපාකයකි. රැස්කරන ලද කර්ම නොමැති කල්හි විපාකයද නූපදී. ඉදින් උපදින්නේද, සියල්ලන්ට සියලු විපාක උපදින්නේය. එය නූපදීයයි දතයුතුය. සංස්කාර ප්‍රත්‍යයෙන් මෙම විඤ්ඤාණය වේයයි දතයුතුය. මෙම සියල්ලම ප්‍රවෘත්ති, ප්‍රතිසන්ධි වශයෙන් දෙයාකාරයෙන් පවතියි. එහි දෙපස් විඤ්ඤාණයන්ද, මනොධාතු ද්වයයද, සොම්නස් සහගත අහේතුක මනො විඤ්ඤාණ ධාතුවදැයි යන මේ තෙළෙස, පඤ්චවෝකාර භවයෙහි ප්‍රවෘත්තියෙහිම පවතී. සෙසු එකුන්විස්ස ත්‍රිවිධ භවයන්හි සුදුසු පරිදි ප්‍රවෘත්තියෙහිද, ප්‍රතිසන්ධියෙහිද පවතී.

ලද්ධපච්චයමිතිධම්ම - මත්තමෙතං භවන්තරමුපෙති
නාස්ස තතො සංකන්ති - න තතො හෙතුං විනාහොති

ලබන ලද ප්‍රත්‍යයයි යන ඒ ධර්මමාත්‍රය භවාන්තරයට එළැඹේ. එයින් ඉක්මවා යාමක් නොවන්නේය. එම හේතුයෙන් තොරව කිසිවක් නොවන්නේය.

මෙසේ ඒ ලබන ලද ප්‍රත්‍යය ඇති, රූපාරූප ධර්ම මාත්‍රය උපදිනු ලබන්නේ භවාන්තරයට එළැඹේයැයි යූ.සේයි. සත්ත්වයෙක් නොවේ. ජීවයක් නොවේ. එහිද අතීත භවයෙන් මෙහි සංක්‍රාන්තියක් නොමැත. එහෙයින් හේතුවෙන් තොරව මෙහි පහළවීමක් නොමැත. මෙහි පළමු වචනයෙන් චුතියද, පශ්චිම වචනයෙන් භවාන්තරාදීන්හි පිළිසිඳගන්නා හෙයින් ප්‍රතිසන්ධියයි යූ.සේයි මෙහි කීහ.

මෙසේ සංක්‍රමණයෙන් තොරව පහළවීම් ඇතිකල්හි මෙම මිනිසත් බැව්හි, යම් ස්කන්ධයෝ වෙත්ද, ඒවා නිරුද්ධ වූයේ ඵලයට ප්‍රත්‍යය වූ, කර්මයෙහි එහි නොයන හෙයින්ද, අනෙකෙකුට අනෙකෙකුගෙන් එම ඵලය වන්නේද, පරිභෝග කරන්නෙකු නොමැති කල්හි, කවරෙකුට එම ඵලය වන්නේද, එහෙයින් එම නියමය යහපත් නොවේ. එහි මෙය යූ.සේයි.

**සන්තානෙ යං ඵලං එතං - නාඤ්ඤස්ස න ච අඤ්ඤතො**
**බීජානං අභිසංඛාරො - එතස්සත්ථස්ස සාධකො**
**ඵලස්සුප්පත්තියා එව - සිද්ධා භුඤ්ජක සම්මුති**
**ඵලුප්පාදෙන රුක්ඛස්ස - යථා ඵලති සම්මුතී'ති**

පරපුරෙන් පැවතෙන යම් ඵලයෙක් ඇත්ද? එය අනෙකෙකුට නොවේ. අනෙකෙකුගෙන්ද නොවේ. බීජයන්ගේ මනා සංස්කරණය එම අර්ථයට සාධකයකි. යම්සේ වෘක්ෂයෙහි ඵල හටගැන්මෙන් ඵල දරයි යන සම්මුතිය වේද, එසේම ඵලයෙහි හටගැන්මෙන් පරිභෝග සම්මුතිය සිදුවේ.

මෙසේ ඇතිකල්හිද එම සංස්කාර, විද්‍යමාන වූයේ හෝ අවිද්‍යමාන වූයේ ඵලයට ප්‍රත්‍යය වන්නේය. ඉදින් විද්‍යමාන වූවාහු ප්‍රවෘත්ති ක්ෂණයෙහිම ඒවාහි විපාක විය යුතුය. තවද අවිද්‍යමාන වූවාහු ප්‍රවෘත්තියෙන් පූර්වයෙහිද පසුවද නිත්‍ය ඵල ගෙනඑනු ලබත්යයි යමෙක් කියන්නේද, ඔහුට මෙසේ කිවයුතුය.

කතත්තා පච්චයා එතෙ - නව නිච්චං ඵලාවහං
පාටිභොගාදිකං තත්ථ - වෙදිතබ්බං නිදස්සනං

ඒවා ප්‍රත්‍යයෙන් කළහෙයින් නිතර ඵල නොඑළවයි. එහි යෙදීම ඇප වී ණය ගැනීම මෙනැයි නිදර්ශන වශයෙන් දතයුතුය.

විඤ්ඤාණ පච්චයා නාමරූපං යන මෙහි වේදනා, සංඥා, සංස්කාර ස්කන්ධ නාමයි. සතරමහා භූතද සතර මහාභූතයන්ට උපාදාය වූ රූපද, රූපයි. ස්ත්‍රීපුරුෂභාව නොමැති ගැබ්හි සයනය කරන්නවුන්ගේද බිජුවටින් හටගන්නවුන්ගේද, ප්‍රතිසන්ධික්ෂණයෙහි, වස්තු දසකය කාය දසකය යන විසිරූපයෝද, ත්‍රිවිධ අරූපස්කන්ධදැයි යන එම තෙවිසි ධර්ම, විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වන නාමරූපයයි දතයුත්තාහ. ස්ත්‍රීපුරුෂභාව සහිතවුන්ට භාවදසකය ප්‍රක්ෂේපනය කොට තෙතිසකි. ඕපපාතිකයින් අතර, බ්‍රහ්මකායිකාදීන්ගේ ප්‍රතිසන්ධික්ෂණයෙහි චක්ෂු, ශ්‍රෝතාදී වස්තු දසකයන්ද, ජීවිතින්ද්‍රිය නවකයද යන එකුන්සාළිස් රූපයෝද, තෙවදෑරුම් අරූප ස්කන්ධද යන එම දෙසාළිස් ධර්ම විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වන නාමරූප වේ. කාම භවයෙහි, සෙසු ඕපපාතිකයින්ටද, සංසේදජයන්ටද ස්ත්‍රීපුරුෂ භාව සහිත පරිපූර්ණායතනයන්ගේ, ප්‍රතිසන්ධික්ෂණයෙහි චක්ෂු, සෝත, ඝාණ, ජිව්හා - කායවත්‍ථු භාව දසකයන්ද, තෙවදෑරුම් අරූප ස්කන්ධද යන එම තෙසැත්තෑ ධර්ම විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වන නාමරූප නම් වේ. මේ උපරිමයෙනි. අවමයෙන් වනාහි ඒ ඒ දශක විකලවූවන්ට ඒ ඒ වශයෙන් අඩුකොට අඩුකොට ප්‍රතිසන්ධියෙහි විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප ගණන් ගැනීම දතයුත්තාහ. ආරූප්‍යයින්ට ත්‍රිවිධ අරූපස්කන්ධද අසඤ්ඤීන්ට රූප වශයෙන් ජීවිතේන්ද්‍රිය නවකයම වේය. මේ ප්‍රතිසන්ධියෙහි ක්‍රමයැයි. එහි ප්‍රශ්නයක් වෙයි. ප්‍රතිසන්ධි නාමරූපය විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වේය යන එය කෙසේ දැනගත යුතුද කියා. සූත්‍රයාගේ වශයෙන්ද, යුක්ති වශයෙන්ද වේ. සූත්‍රයෙහි, ධර්ම සිත අනුව පෙරළේ. ආදී ක්‍රමයෙන් විවිධාකාරයෙන් වේදනාදීන්ගේ විඤ්ඤාණ ප්‍රත්‍යතාව සිද්ධය. යුක්ති වශයෙන් වනාහි,

චිත්තජේනහි රූපෙන - ඉධ දිට්ඨෙන සිජ්ඣති
අදිට්ඨස්සාපි රූපස්ස - විඤ්ඤාණං පච්චයො ඉති

මෙහි චිත්තජ රූපයෙන් දැකීම සිදුවේ. නොදක්නා ලද්දා වූද රූපයට විඤ්ඤාණය ප්‍රත්‍යය වේ.

**නාමරූප පච්චයා සළායතනං** යනු නාමය කියන ලද්දේමය. මෙහි වනාහි රූපය නියම වශයෙන්, සතරමහා භූතයන්ද, ෂට් වස්තූන්ද, ජීවිතේන්ද්‍රියයද වශයෙන් එකොළොස් වැදෑරුම්ය. සළායතන, චක්‍ෂු ශ්‍රෝත, ඝ්‍රාණ, ජිව්හා, කාය, මන යන සයයි. එහි ප්‍රශ්නයක් මතුවන්නේය. නාමරූප සළායතනයට කෙසේ ප්‍රත්‍යය වේද යන එය කෙසේ දැනගත යුතුද? නාමරූපයන් ඇතිකල්හි වන හෙයිනි. ඒ ඒ නාමයෙහිද, රූපයෙහිද ඇතිකල්හි ඒ ඒ ආයතන වෙයි. (හටගනියි) අන්‍යාකාරයකින් නොවේ.

**ඡළෙව ඵස්සා සංඛෙපා - චක්ඛු සම්ඵස්ස ආදයො**
**විඤ්ඤාණම්ව බත්තිංස - විත්‍ථාරෙන භවන්ති තෙ**

**සළායතන පච්චයා ඵස්සා** යනු චක්‍ෂුර්ස්පර්ශ ආදීහු සංක්‍ෂෙප වශයෙන් සයෙක්මය. විස්තර වශයෙන් විඤ්ඤාණාදී වශයෙන් ඒවා දෙතිසකි.

**ද්වාරතො වෙදනා වුත්තා - චක්ඛු සම්ඵස්සජාදිකා**
**ඡළෙවතා පභෙදෙන - ඉධ බත්තිංස වෙදනා**

**ඵස්ස පච්චයා වෙදනා** යනු චක්‍ෂුර් ස්පර්ශාදියෙන් හටගත් වේදනා ද්වාර වශයෙන් කියන ලද්දාහු සයෙක්මය. මෙහි ප්‍රභේද වශයෙන් වේදනා දෙතිසකි.

**රූප තණ්හාදි භෙදෙන - ඡ තණ්හා ඉධ දීපිතා**
**එකෙකා තිවිධා තත්‍ථ - පවත්තා කාරතො මතා**

**වෙදනා පච්චයා තණ්හා** යනු රූප තෘෂ්ණාදී භේදයෙන්, ෂට් තෘෂ්ණා මෙහි දක්වන ලදී. එහි පැවැති, ආකාර වශයෙන් එක එක ත්‍රිවිධ යයි දන්නා ලදී.

**දුක්ඛී සුඛං පත්‍ථයති - සුඛීභීයො‍්‍යාපි ඉච්ඡති**
**උපෙක්ඛා පන සන්තත්තා - සුඛ මිච්චෙව භාසිතා**

දුකට පත්වූයේ සුව පතයි. සුවපත් වූයේ වැඩිපුර කැමැති වේ. උපේක්‍ෂාව වනාහි ශාන්ත හෙයින් සුවයැයිම කියා වදාරණ ලදී.

**තණ්හාය පච්චයා තස්මා - හොන්ති තිස්සොපි වෙදනා**
**වෙදනා පච්චයා තණ්හා - ඉති වුත්තා මහෙසිනා**

එහෙයින් තෙවදෑරුම් වූ වේදනාවේ තෘෂ්ණාවට ප්‍රත්‍ය වෙත්. මෙසේ මහර්ෂීන් වහන්සේ වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේයයි වදාළ සේක.

**තණ්හා පච්චයා උපාදානං** යනු සිව් උපාදානයෙන්, කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද යන සතරයි. **උපාදාන පච්චයා භවො** යනු මෙහි කර්මභවය අදහස් කරන ලදී. උත්පත්ති භවය පද ඉදිරීම් වශයෙනි. **භව පච්චයා ජාති** යනු කර්මභව ප්‍රත්‍යයෙන් ප්‍රතිසන්ධි ස්කන්ධයන්ගේ පහළ වීමයි. එහි ප්‍රශ්නයක් වන්නේය. භවය ජාතියට ප්‍රත්‍යය වේය යන එය කෙසේ දැනගත යුතුද? බාහිර ප්‍රත්‍යය සමතාවෙහිද, හීන ප්‍රණීතතාදී විසේස දර්ශනයෙන්ද වේ. බාහිරයන්ගේ වශයෙන් වනාහි, පිය-මව්, ශුක්‍ර-ශ්‍රොණිත ආහාරාදී ප්‍රත්‍යයන්ගේ සමතාවයෙහිද, සත්ත්වයින්ගේ යුගල වශයෙන් වූ, හීන ප්‍රණීතතාදී විශේෂතා පෙනේ. එයද, සැමදා සැමදෙනාටම නොවන හෙයින් අහේතුක නොවේ. ඉන් උපදින සත්ත්වයින්ගේ අධ්‍යාත්ම සන්තානයෙහි අන්‍ය කරුණක අභාව හෙයින් කර්මභවයෙන් අන්‍ය හේතුකත්වයක් නොවේ. කර්මභව හේතුකමය. සත්ත්වයින්ගේ හීන ප්‍රණීතතාදී විශේෂයට කර්මයම හේතුවේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ, සත්ත්වයින් කෙරෙහි යම් මේ හීන ප්‍රණීතතාවයක් වේද, එය කර්මය බෙදයි.

**ජාති පච්චයා ජරාමරණං** යන ආදීන්හි ඉපැත්ම නොමැති කල්හි, ජරාමරණද, සෝකාදී ධර්මයෝ නොවෙත්ද? ඉපැත්ම ඇතිකල්හි, ජරාමරණයන්ද, ජරාමරණ සංඛ්‍යාත දුක්ඛ ධර්මයෙන් පෙලුණා වූ, අඥානයාට ජරාමරණ හා සම්බන්ධ වූ ඒ ඒ දුකඛ ස්වභාවයෙන් පෙලුණහුට ඒහා සම්බන්ධ නුවූ සෝකාදී ධර්ම වෙයි. එහෙයින් මේ ඉපැත්ම ජරාමරණයටද, ශෝකාදීන්ටද ප්‍රත්‍යය වේයයි දතයුත්තාහ. **සො තථා භාවිතෙන චිත්තෙන** යනාදීන්හි **පුබ්බෙනිවාසානුස්සති ඤාණාය** යන එම ඤාණයෙහි අවබෝධය, ප්‍රාප්තිය සඳහායි යු.සේයි. **අනෙක විහිතං** යනු නානාවිධ, නානාප්‍රකාර, නොයෙක් ආකාරයන්ගෙන්, පවත්වන ලද්දේය. වර්ණනා කරන ලද්දේය යනාර්ථයි. **පුබ්බෙනිවාසං** යනු ආසන්න අතීතභවය මුල්කොට ඒ ඒ තන්හි විසූ සිත් පරම්පරාව, **අනුස්සරති** යනු ස්කන්ධ

පිළිවෙළ වශයෙන්, චුති ප්‍රතිසන්ධි වශයෙන් හෝ අනුව ගොස් සිහිකරයි. මේ පූර්වනිවාසය ෂට් ජනකෙනෙක් සිහිකරති. තීර්ථකයින්, ප්‍රකෘති ශ්‍රාවකයින්, මහා ශ්‍රාවකයින් අග්‍ර ශ්‍රාවකයින්, පසේ බුදුවරුන්, බුදුවරුන් වශයෙනි. එහි තීර්ථකයෝ සතළිස් කල්පයක් සිහිකරති. ඉන් මත්තෙහි නොමැත. කුමක් හෙයින්ද යත්? දුර්වල ප්‍රාඥතාව නිසයි. ඔවුන්ට වනාහි නාමරූප පිරිසිඳ දැනීම් විරහිත හෙයින් දුර්වල ප්‍රඥාව වේ. ප්‍රකෘති ශ්‍රාවකයෝද, බලවත් ප්‍රඥාව හෙයින් කල්ප සියයක්ද, කල්ප දහසක් සිහි කරත්මය. අසූමහා ශ්‍රාවකයෝ සියක් දහසක් කල්ප සිහිකරති. දෑගසව්වෝ ඒකාසංඛ්‍ය කල්ප සතසහස්‍රයක් සිහිකරති. පසේබුදුවරු දෙයාසංඛ්‍ය ශතසහස්‍රයක් කල්ප සිහිකරති. ඔවුන්ගේ ප්‍රාර්ථනාව මෙපමණය. බුදුවරුන්ට වනාහි පිරිසිඳීමක් නම් නැත. තීර්ථකයෝ ස්කන්ධ පිළිවෙළම සිහිකරති. පිළිවෙළ අත්හැර චුතිප්‍රතිසන්ධි වශයෙන් සිහිකරන්ට නොහැකි වෙති. යම්සේ අන්ධයෝ සැරයටිය අත්නොහැරම යෙත්ද? මෙසේ ඔවුහු ස්කන්ධයන්ගේ පිළිවෙළ අත්නොහැරම සිහිකරති. ප්‍රකෘති ශ්‍රාවකයෝ කඳපිළිවෙළ අනුවද සිහිකරති. චුති ප්‍රතිසන්ධි වශයෙන්ද එකින් එකට යති. අසූමහ සව්වෝද එසේය. දෑගසව්වන්ට කඳපිළිවෙළ කිසක් නැත. එක් අත්බවෙකැ චුතිය දැක ප්‍රතිසන්ධිය දකිති. නැවැත අනෙකක චුතිය දැක ප්‍රතිසන්ධිය දැයි මෙසේ චුති ප්‍රතිසන්ධි වශයෙන් එකින් එකට සංක්‍රමණය වන්නාහුය. පසේබුදුවරුද එසේමය. බුදුවරුන්ට වනාහි කඳපිළිවෙළ කිසක් නැත. චුති ප්‍රතිසන්ධි වශයෙන් සංක්‍රමණ කිසක් නැත. එතුමන්ලාට වනාහි, නොයෙක් කල්පකෝටි අතර යට හෝ මතු හෝ යම් යම් තැනක් කැමති වෙත්ද? ඒ ඒ තැන් ප්‍රකටම වේ. එහෙයින් නොයෙක් කල්ප කෝටි හකුළුවා යම් යම් තැනක් කැමැති වෙත්ද, ඒ ඒ තන්හිම (සිංහයෙකු පැන එක්වර සතෙක් අල්ලාගන්නාක් මෙන්) සිංහ බැසගැන්ම වශයෙන් බැසගෙන යති. යන්නාහුද ඔවුන්ගේ ඥාණය අතරතුර ජාතීන්හි නොගැටෙමින් කැමැති කැමැති ස්ථානයම ගනියි. මේ පෙරවිසූ කඳ පිළිවෙළ සිහිකරන සදෙනා අතර, තීර්ථකයින්ගේ පූර්වෙනිවාස දර්ශනය කණාමැදිරි ආලෝකය සමානව වැටහේ. ප්‍රකෘති ශ්‍රාවකයින්ගේ ප්‍රදීපාලෝක සමානය. මහා ශ්‍රාවකයින්ගේ පන්දම් ආලෝකය සමානය. අග්‍ර ශ්‍රාවකයින්ගේ පහන් තාරකා ආලෝකය සමානය. පසේබුදුවරුන්ගේ චන්ද්‍රාලෝක සමානය. බුදුවරුන්ගේ, සහස්‍ර රශ්මීන් ප්‍රතිමණ්ඩිත සරදාකාශ සූර්යමණ්ඩල සමානව වැටහේ. තීර්ථකයින්ගේ පෙර විසූ කඳ පිළිවෙළ සරණය අන්ධයින්ගේ සැරයටි කොන ගෙන යන ගමන මෙනි. ප්‍රකෘති ශ්‍රාවකයින්ගේ සැරයටි ආධාරයෙන් පාලමකින් ගමන මෙනි. මහා

ශ්‍රාවකයින්ගේ කකුලේ කෙණ්ඩා ආධාරයෙන් පාලමකින් ගමන මෙනි, අග්‍ර ශ්‍රාවකයින්ගේ ගැලින් පාලමකින් ගමන මෙනි. පසේ බුදුවරුන්ගේ අඩිපාරෙහි ගමන මෙනි. බුදුවරුන්ගේ මහ ගැල් මාර්ගයෙහි ගමන මෙන් වේ. මෙම කරුණෙහිලා ශ්‍රාවකයින්ගේ පූර්වේනිවාසානුස්මරණය අදහස් කරන ලදී.

එහෙයින් මෙසේ සිහිකරනු කැමති ආදිකර්මික භික්ෂුව විසින් දිවා භෝජනයෙන් පසුව, පිණ්ඩපාතයෙන් වැළකුණේ, රහසිගතව, හුදකලා වූයේ, පිළිවෙළින් සිව් ධ්‍යානයන්ට සමවැදී, අභිඥාපාදක චතුර්ථ ධ්‍යානයෙන් නැගිට, කියන ලද අයුරින් ප්‍රතීත්‍ය සමුත්පාදය ප්‍රත්‍යවේක්ෂා කොට, සියලු පසු හිඳීම් සිහිකළ යුත්තාහ. ඉක්බිති අසුන් පැනවීම සෙනසුනට පිවිසීම, පාත්‍රාසිවුරු තැන්පත් කිරීම, අනුභව කළ කාලය, ගමෙහි සිට එන කාලය, ගමෙහි පිඬු පිණිස හැසිරුණු කාලය, ගමට පිඬු පිණිස පිවිසි කාලය, විහාරයෙන් නික්මුණු කාලය, චෛත්‍යය, බෝධිය වන්දනා කළ කාලය, පාත්‍රය ධෝවනය කළ කාලය, පාත්‍ර ප්‍රතිග්‍රහණය කළ කාලය, පාත්‍ර ප්‍රතිග්‍රහණ කාලයේ සිට මුවදෙවූ කාලය තෙක් කළකිස ප්‍රත්‍යූස කාලයෙහි කළ කෘත්‍යයයි. මධ්‍යම යාමයෙහි, ප්‍රථම යාමයෙහි කළ කෘත්‍යයයි මෙසේ ප්‍රතිලෝම ක්‍රමයෙන් සියලු දිවා රාත්‍රී කළ කිස ආවර්ජනා කළ යුතුය. මෙතෙක් දෑ ප්‍රකෘති චිත්තයටද ප්‍රකට වේ. පරිකර්ම සමාධි සිතට වනාහි අතිශයින්ම ප්‍රකට වේ. ඉදින් මෙහි කිසිවක් ප්‍රකට නොවේද? නැවත පාදක ධ්‍යානයට සමවැද නැගිට ආවර්ජනා කළයුතුය. මෙතෙකින් දල්වන ලද පහනෙහි එළිය මෙන් ප්‍රකට වේ. මෙසේ ප්‍රතිලෝම ක්‍රමයෙන්ම දෙවන දිනයෙහිද, තෙවන, සිව්වන, පංචම දිනයන්හිද, දස දිනයෙක්හිද, අඩමසෙහිද, මාසයෙහිද, වර්ෂයෙක්හිද කළ කෘත්‍යය ආවර්ජනා කළයුතුය. එම ක්‍රමයෙන් දසවස්, විසිවස් ආදී වශයෙන්, මේ භවයෙහි තමාගේ ප්‍රතිසන්ධිය තෙක් ආවර්ජනා කටයුතුය. එතෙක් ආවර්ජනා කරන්නහු විසින් පූර්වභවයෙහි චුතික්ෂණයෙහි පැවැති නාමරූප ආවර්ජනා කළයුතුය. නැණැවත් භික්ෂුව ප්‍රථමවාරයෙන්ම ප්‍රතිසන්ධිය උගුලුවා, චුතික්ෂණයෙහි පැවැති නාමරූප අරමුණු කරන්ට දක්ෂ වේ. පූර්ව භවයෙහි නාමරූප අසේසය, නිරුද්ධය. මෙහි අනෙකක් උපන්නේය. එහෙයින් එතැන සම්බාධකය. දැඩි අඳුරක් මෙන් වේ. දුෂ්ප්‍රාඥයා විසින් දැකීම ඉතා දුෂ්කරය. එසේද වුවත්, ප්‍රතිසන්ධිය උගුලුවා, චුතික්ෂණයෙහි නාමරූප අරමුණු කරන්ට මම සමර්ථ නොවෙමියි වීර්යය අත්හැරීම නොකටයුතුය. එම පාදකධ්‍යානයටම නැවත නැවත සමවැදී නැගිට එම

ස්ථානය ආවර්ජනා කළයුතුය. මෙසේ කරන්නහු විසින් නැගිට එම ස්ථානය ආවර්ජනා කළයුතුය. මෙසේ කරන්නහු විසින් යම්සේ නම් ශක්තිමත් පුරුෂයෙකු, ගෘහමුදුනෙහි කැණිමඬලක් සඳහා, විශාල වෘක්ෂයක් සිඳිනුයේ, අතුපතර සිඳ පමණින්ම පොරෝ තලයෙහි, මුවහත නට කල්හි, විශාල වෘක්ෂය සිඳින්ට නොහැකිවූයේ නමුත්, වීර්යය අත්හැරීම නොකොටම ලෝකුරුහලට ගොස්, තීක්ෂණව පොරොව කරවාගෙන නැවත අවුත් සිඳින්නේය. නැවත මුවහත නටකල්හි, නැවත එසේම කරවා සිඳින්නේය. හෙතෙම මෙසේ සිඳින්නේ, සිඳින ලද්දෙහි නැවත සිඳිය යුත්තක් නොමැති හෙයින්, නොසිඳින ලද කොටස්හිද සිඳීම කරන හෙයින් නොබෝ කලෙකින්ම මහරුක වැටෙන්නේය. එපරිද්දෙන්ම ප්‍රථමධ්‍යානයෙන් නැගිට පෙර ආවර්ජිතයන් ආවර්ජනය නොකොට ප්‍රතිසන්ධියම ආවර්ජනා කරනුයේ, නොබෝ කලකින්ම ඒ ප්‍රතිසන්ධිය උගුලුවා, චුතික්ෂණයෙහි නාමරූප අරමුණු කරන්නේය. එහි අවසන් හිඳගැනීමෙහි පටන් ප්‍රතිසන්ධිය තෙක් අරමුණුකොට පැවැති ඤාණය පූර්වෙනිවාස ඤාණය නම් නොවේ. එය පරිකර්ම සමාධි ඤාණය නම් වේ. සමහරු අතීතංස ඤාණයයිද යෙති. ඒ අතීතංස ඤාණය රූපාවචර හෙයින් රූපාවචර සඳහා කීම නොයෙදේ. යම්කලෙක්හි මෙම භික්ෂුවට ප්‍රතිසන්ධිය ඉක්මවා චුතික්ෂණයෙහි පැවති නාමරූප අරමුණුකොට මනෝද්වාරාවර්ජනයක් ඉපිද පෙර කියන ලද ආකාරයෙන් අර්පණා සිත උපදී. එකල්හි ඔහුට ඒ සිත හා සම්ප්‍රයුක්ත ඤාණය එම ඤාණය හා සම්ප්‍රයුක්ත සිහියෙන් පූර්වයෙහි වාසය සිහිකරයි.

එහි **සෙය්‍යථීදං** යනු අරඹන ලද ආකාර දර්ශනාර්ථයෙහි නිපාතයි. එයින්ම මේ පූර්වෙනිවාසය අරඹන ලදී. එහි ආකාර ප්‍රභේදය දක්වන්නේ 'එකම්පි ජාතිං' ආදිය වදාළහ. එහි **එකම්පි ජාතිං** යනු එකම ප්‍රතිසන්ධි මූලික චුති අවසාන කොට ඇති එක් භවයකට ඇතුළත් ස්කන්ධ පරම්පරාවයි. **ද්වෙපි ජාතියො** යනාදීන්හිද එම ක්‍රමයමැයි. **අනෙකෙපි සංවට්ට කප්පෙති** ආදීන්හි වනාහි පිරිහෙනු ලබන කල්පය සංවට්ට කල්පයි. එකල්හි සියල්ලන් බ්‍රහ්ම ලෝකයෙහි රැස්වන හෙයින්, වැඩෙනු ලබන කල්පය විවට්ට කල්පයි. එකල්හි බ්‍රහ්මලෝකයෙන් සත්ත්වයින්ගේ පෙරළීම වන හෙයිනි. එහි විනාශයෙන්, විනාශයෙහි පිහිටීම එය මූලිකව ගන්නා ලද්දේ වේ. හටගැනීමෙන්ද, හටගැනීම් පිහිටීම එය මූලිකව ගන්නා ලද්දේ වේ. මෙසේ ඇතිකල්හි, මහණෙනි මේ අසංඛ්‍ය කල්ප සතරෙකි. කවර සතරෙක්ද? මහණෙනි, යම්කලෙක කල්පය විනාශවේද?

එය සංඛ්‍යා වශයෙන් ගැනීම පහසු නොවේ. මහණෙනි, යම්කලෙක කල්පය නැසුණේ පවතීද? -පෙ- මහණෙනි, යම්කලෙක කල්පය හටගනීද, මහණෙනි යම්කලෙක කල්පය හටගැනුණේ පවතීද? එය සංඛ්‍යා වශයෙන් ගැනීම පහසු නොවේ යයි කියන ලද සිව් අසංඛ්‍යයන් අල්ලා ගත්තාහු වෙති. එහි විනාශත්‍රයයකි. ගිනි, දිය, වායු, විනාශ වශයෙනි. විනාශ සීමාත්‍රයයකි. ආභස්සර, සුභකිණ්හ, වෙහප්ඵල වශයෙනි. යම්කලෙක කල්පය ගින්නෙන් නැසේද? ආභස්සරයෙන් යට ගින්නෙන් දැවේ. යම්කලෙක වායුවෙන් විනාශ වේද, වේහප්ඵලයෙන් යට වාතයෙන් විනාශ වී යයි. විස්තර වශයෙන් වනාහි හැමකල්හිම එක් බුද්ධ ක්ෂේත්‍රයක් විනාශ වන්නේය. බුද්ධක්ෂේත්‍රය නම් තෙවදෑරුම් වේ. ජාති ක්ෂේත්‍රය, ආණා ක්ෂේත්‍රය, විෂය ක්ෂේත්‍රය වශයෙනි. එහි ජාති ක්ෂේත්‍රය දසදහසක් සක්වල කෙළවරකොට ඇත්තේය. තථාගතයන් වහන්සේගේ ප්‍රතිසන්ධි ග්‍රහණාදීන්හිදී කම්පාවේද, එම කොට්ඨාසයයි. ආණා ක්ෂේත්‍රය නම්, යම්තැනක රතන සූත්‍රය, කඳපිරිත, ධජග්ග පිරිත, ආටානාටිය පිරිත, මෝර පිරිත යන මේ පිරිත්හි ආනුභාවය පවතීද, එබඳු වූ කෝටි ලක්‍ෂයක් සක්වළ සීමාකොට ඇති ප්‍රදේශයයි. විෂය ක්ෂේත්‍රය අනන්තයි. අපරිමාණයි. යම්තාක් කැමැති වන්නේදැයි කියන ලද්දේද? යම්තැනෙක්හි තථාගතයන් වහන්සේ යම් යම් ප්‍රමාණයක් කැමැති වෙත්ද, ඒ ඒ දෑ දැනගනිත්. මෙසේ ඒ ත්‍රිවිධ බුද්ධ ක්ෂේත්‍රයන්හි එක් ආණා ක්ෂේත්‍රයක් විනාශ වන්නේය. එය විනාශවන කල්හි ජාති ක්ෂේත්‍රයද නටුයේම වේ. විනාශ වනුයේද, එකටම විනාශ වන්නේය. පිහිටනුයේද, එකටම පිහිටයි.

මෙසේ එහි විනාශයද, නැවත පිහිටීමද දතයුතුය. යම්කලෙක කල්පය ගින්නෙන් නසීද, මුලදීම කල්ප විනාශ මහා මේඝයක් පැන නගී. කෝටි ශත සහස්‍ර චක්‍රවාටයන්හි එක් මහවැස්සක් වසී. මිනිස්සු සතුටට පත්වූවාහු සියලු බීජ පිටතට ගෙනවුත් වපුරති. ශස්‍ය ගවයින් කන පමණට හටගත් කල්හි කොටළු හඬක් හඬනංවමින් එක් බිංදු මාත්‍රයක්වත් වැසි නොවසියි. එදා සිඳුණු වැස්ස සිඳුණේම වේ. වැස්සෙන් ජීවත්වන සත්ත්වයෝ, පුණ්‍යඵලයෙන් ජීවත්වන දේවතාවෝ ක්‍රමයෙන් බඹලොව උපදිත්. මෙසේ දීර්ඝකාලයක් ගතවූ කල්හි ඒ ඒ තන්හි ජලය ක්‍ෂයට යේ. නැවත ක්‍රමයෙන් මත්ස්‍ය, කැසුබුවෝද කළුරියකොට බඹලොව උපදිති. නේරයික සත්ත්වයෝද බඹලොව උපදිති. එහි නේරයිකයෝ සත්වන සූර්ය පහළවීමෙහිදී විනාශ වන්නාහුයයි ඇතැමෙක් කියති. ධ්‍යාන නොමැතිව බඹලොව ඉපදීමක් නොමැත. ඔවුන් අතරද, දුර්භික්‍ෂයෙන්

පීඩිත වූ සමහරු ධ්‍යානාධිගමයට නුසුදුස්සෝය. ඔවුහු කෙසේ එහි උපදිත්ද? දිව්‍ය ලෝකයෙහිදී ලද ධ්‍යාන වශයෙනි.

එකල්හි, වර්ෂ ලක්ෂයක්හුගේ ඇවෑමෙන් කල්ප විනාශය වන්නේයයි ලොකව්‍යුහ නමැති, කාමාවචර දේවතාවෝ මුදාහළ කෙස්වැටි, විසිරුණු කෙස් ඇත්තාහු හඬන මුහුණු ඇත්තාහු අත්වලින් කඳුළු පිසිනු ලබන්නාහු රතු වස්ත්‍ර අඳින ලද්දාහු ඉතාම විරූප වෙස් දරනු ලබන්නෝ වී, මිනිස් වාස ප්‍රදේශයෙහි සරන්නාහු, පින්වත්නි, පින්වත්නි, මෙයින් වර්ෂ ශත සහස්‍රයකගේ ඇවෑමෙන් කල්ප විනාශය වන්නේය. මේ ලෝකය විනාශ වන්නේය. මහා සමුද්‍රයද වියලී යන්නේය. මේ මහා පෘථුවියද, මහාමේරු පර්වත රාජයාද දැවී යන්නේය. විනාශ වන්නේය. බ්‍රහ්මලෝකය දක්වා ලෝකය විනාශ වන්නේය. පින්වත්නි, මෛත්‍රිය වඩවු. පින්වත්නි, කරුණාව, මෘදුබව, උපේක්ෂාව වඩවු. මවට උපස්ථාන කරවු. පියාට උපස්ථාන කරවු. කුලදෙටුවන් පුදන්නෝ වෙවුයයි මෙසේ සැලකරති. ඔවුන්ගේ වචන අසා, මනුෂ්‍යයෝද, භූම්‍යස්ථ දෙවිවරුද බොහෝ සංවේගප්‍රාප්ත වූවාහු, ඔවුනොවුන් කෙරෙහි මෘදු සිත් ඇත්තෝ වී මෛත්‍රී ආදී පින්කොට දෙව්ලොව උපදිති. එහි දිව්‍යභෝජන අනුභවකොට වායො කසිණයෙහි පිරියම්කොට ධ්‍යාන ලබති. එයින් අන්‍ය වූවෝ වනාහි අපරාපර්යවේදනීය කර්මයෙන් දෙව්ලොව උපදිති. අපරාපර්ය වේදනීය කර්ම රහිත වූයේ වනාහි සසර සැරිසරන සත්ත්වයෙක් නම් නැත. ඔවුහුද එහි එසේම ධ්‍යාන ලබති. මෙසේ දෙව්ලොව ලද ධ්‍යාන වශයෙන් සියල්ලෝම බඹලොව උපදිති.

වර්ෂාවෙහි සිඳීමෙන් මත්තෙහි, දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් දෙවන සූර්යයා පහළවේ. එය පහළවූ කල්හි, දිවාරාත්‍රී භේදයක් නොපෙනේ. එක් හිරුමඬලක් උදාවෙයි. එක් හිරුමඬලක් අස්තයට යේ. ලෝකය නොසිඳුණු සූර්ය සන්තාපයෙන්ම යුතු වූයේ වේ. යම්සේ නම් ප්‍රකෘති සූර්යයාගේ සූර්යදේව පුත්‍රයෙක් වේද, එසේ කල්ප විනාශක සූර්යයාගේ නැත. එහි ප්‍රකෘති සූර්යයා පවත්නා කල්හි අහසෙහි වලාකුළුද, දුම්සිළුද හැසිරෙයි. කල්ප විනාශක සූර්යයා පවත්නා කල්හි, පහවූ දුම්, වලාකුළු ඇත්තේ, කැඩපත් මඬලක් මෙන් අහස නිර්මල වේ. පඤ්ච මහා ගංගාවන් හැර සෙසු කුඩා නදීන්හි දිය වියැලී යයි. ඉන් දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන්, යමකගේ පහළවීමෙන් මහා නදීහු, වියැලී යෙත්ද? එබඳු වූ තෙවන සූර්යයා පහළ වේ. යමකගේ පහළවීමෙන් හිමවතැ මහා නදීන්හි

ප්‍රභව වූ, සීහපාතන, හංසපාතන, කණ්ණමුණ්ඩක, රථකාර, අනෝතත්ත, ඡද්දන්ත, කුණාල යන මේ සත්මහා විල් වියැලේද? යමකගේ පහළවීමෙන් පිළිවෙළින් මහා සමුද්‍රයෙහි ඇඟිලි පුරුකක් තෙමීමට ප්‍රමාණවත් වූ දිය නොපිහිටාද එබඳු තත්වයක් උදාකරන පස්වන සූර්යයා එයින්ද දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් පහළ වේ. යමකගේ පහළවීමෙන්, හාත්පසින් මඬනා ලද, තෙත් ගතියෙන් යුත් දුමෙන් සමස්ත චක්‍රවාටය එකම දුමාරයක් බවට පත්වේද, මේ සක්වළ යම්සේද, කෝටි ශතසහස්‍ර චක්‍රවාටයන්ද එබඳු තත්වයට පත්කරන, සවන සූර්යයාද දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් පහළවේ. යමක පහළවීමෙන් කෝටි ශතසහස්‍ර චක්‍රවාටයන් සමග මුළු සක්වළ එකම ගිනිජාලයක් බවට පත්වේද, යොදුන් සියගණන් ප්‍රභේද වූ, මහාමේරු පර්වතාදියද, කැඩී බිඳී ආකාශයෙහිම අතුරුදන් වෙයි. ඒ අග්නිජාලය නැඟී චාතුර්මහාරාජිකය ගනී. එහි රන්, රිදී, මැණික් විමානයන් දවා තව්තිසා භවනය ගනී. එම ක්‍රමයෙන්ම ප්‍රථමධ්‍යාන භූමිය දක්වා ගනියි. එහි බ්‍රහ්ම ලෝකත්‍රය දවා, ආභස්සරයෙහි ගැටී සිටියි. එය යම්තාක් අණුමාත්‍ර වූ හෝ සංස්කාර ගතයක් වේද, එතෙක් නොනිමෙයි. සියලු සංස්කාර ක්ෂයවීමෙන්, ගිතෙල්, තලතෙල් දවන ගිනිසිළු මෙන්, අළුද ශේෂ නොකොට නිවේ. යට ආකාසය හා මතු ආකාසය තනි මහ ගනදුරක් බවට පත්වේ. එබඳු වූ තත්වයක් ඇතිකරන සත්වන සූර්යයාද දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් පහළ වේ.

එකල්හි දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන්, මහාමේඝයක් පැන නැඟී පළමුව සියුම් සියුම් වැසි වසී. පිළිවෙළින් මානෙල් දඬු, සැරයටි, මොහොල්, තල්කඳන් ආදී ප්‍රමාණ ධාරාවන්ගෙන් වැසි වසින්නේ කෝටි ශතසහස්‍ර චක්‍රවාටයන්හි සියලු දැවීගිය තැන් පුරවා අතුරුදන් වේ. ඒ ජලස්කන්ධය යටින්ද සරසින්ද වාතය හටගෙන, රවුම් හැඩයට නෙළුම් කොළයක දියබිඳක් මෙන් ඝන කරයි. ඒ සා මහත් දිය රාශියක් කෙසේ ඝන කෙරේද, යත් මනාව සිදුරු හටගැනීමෙනි. ඊට තැනින් තැන සිදුරු දෙයි. එය මෙසේ වාතයෙන් පිඩුකරනු ලබන්නේ ඝන කරනු ලබන්නේ ක්ෂය කරනු ලබන්නේ ක්‍රමයෙන් යටට බසී. පහළට බට ජලයෙහි, බ්‍රහ්මලෝක ස්ථානයෙහි, බ්‍රහ්මලෝකයද මත්තෙහි කාමාවචර දේව ලෝකස්ථානයෙහි සිව් සිව් දිව්‍යලෝකද පහළ වේ. පළමු පෘථුවි ස්ථානයට බටකල්හි බලවත් වායු උපදී. එම වායු එය වැසූ දොරකි පෙරහන්කඩක රැඳි දිය මෙන් නිරුත්සාහීව මිරිකයි. මිහිරිදිය ක්ෂයට යනුයේ මතුයෙහි රස පෘථුවිය හටගන්වයි. එය පැහැපත් වර්ණයෙන් යුක්ත වූවා, සුවඳ රස යුක්ත වූවා,

දියරහිත ක්ෂීර පායාසයෙහි මතු පටලය මෙනි. එකල්හි ආභස්සර බඹලොවැ වඩාත් පළමුව උපන් සත්ත්වයෝ ආයුක්ෂයයෙන් හෝ පුණ්‍යක්ෂයයෙන් ඉන් චුතවැ මෙහි උපදිති. ඔවුහු තම සිරුරින් ආලෝකය විහිදුවන, අහස්හි සරන්නාහු වෙති. ඔවුහු අග්ගඤ්ඤ සූත්‍රයෙහි කියන ලද ක්‍රමයෙන් ඒ රස පෘථුවිය රස විඳ තෘෂ්ණාවෙන් මැඩුණාහු කොටස් කඩා වෙන්කොට පරිභෝග කරන්ට උත්සාහ කරති. එකල්හි ඔවුන්ගේ ස්වයං ආලෝකය අතුරුදන් වෙයි. අන්ධකාරය වෙයි. ඔවුහු අන්ධකාරය දැක බියවෙති. ඉක්බිති ඔවුන්ගේ බියනසා, සූරභාවය හටගන්වන්නාහු, පිරිපුන් පණස් යොදුන් සූර්ය මණ්ඩලය පහළ වේ. ඔවුහු එය දැක ආලෝකය ලැබුයෙමුයි තුටුපහටු වී බියට පත් අපගේ බිය නසා සූරභාවය උපදවමින් හටගත්තේය. එහෙයින් දක්ෂයෙක් වේවායි සුරිය (සූර්ය) යයිම එයට නාමය කරති. එකල්හි සූර්යයා දිවාකාලයෙහි ආලෝකය කොට අස්ථංගත කල්හි, යම්කිසි ආලෝකයක් ලැබුයෙමු එයද අපට නටුයේ යයි නැවත බිය වෙති. ඉදින් අන්‍ය ආලෝකයක් ලබන්නෙමු නම් ඒකාන්තයෙන් ඉතා යහපතක් වන්නේයයි ඔවුන්ට මෙබඳු සිතක් වෙයි. ඔවුන්ගේ සිත දැන මෙන් එකුන් පණස් යොදුන් චන්ද්‍ර මණ්ඩලය පහළ වෙයි. ඔවුහු එය දැක ඉතා අධිකව තුටුපහටු වී, අපගේ කැමැත්ත දැන මෙන් හටගත්තේය. එහෙයින් චන්ද වේවායි චන්ද යනුවෙන්ම එයට නම් කරති.

මෙසේ, සඳ හිරු පහළවූ කල්හි, නක්ෂත්‍ර තාරකාදීහු පහළවෙති. එතැන් පටන් දිවාරාත්‍රී ප්‍රකට වේ. අනුක්‍රමයෙන් මාස, අඩමස්, ඍතු, සංවත්සරාදීහු වෙති. චන්ද්‍ර සූර්යයන්ගේ පහළවූ දිනයෙහිම, මහමෙර, චක්‍රවාට හිමවත් පර්වත පහළවෙයි. ඒවා වනාහි පෙර පසු නොවී මැදින් මස පුරපසළොස්වක දිනයෙහිම පහළ වෙයි. කෙසේද? යම්සේ නම් තණහාල් බත් පිසින කල්හි එක පහරින්ම බුබුළු හටගනිත්ද, එසේම ඇතැම් ප්‍රදේශ ස්ථූප ස්ථූප ආකාර වෙයි. ඇතැම් පෙදෙස් නිම්න, නිම්නවද ඇතැම් පෙදෙස් සම සමවද වෙයි. එපරිද්දෙන්ම ස්ථූප, ස්ථූප වන් තන්හි පර්වත (ගල් හා පස්කඳු) වෙයි. නිම්න නිම්න ස්ථානයන්හි සමුද්‍රද, සමසම ස්ථානයෙහි දිවයින්ද වෙයි. එකල්හි ඒ රස පෘථුවිය අනුභව කරන සත්ත්වයින්ගේ ඇතැමෙක් ක්‍රමයෙන් වර්ණවත් වූවාහු, ඇතැමෙක් දුර්වර්ණ වූවාහු වෙති. එහි වර්ණවත් අය දුර්වර්ණයින් පහත්කොට සලකති. ඔවුන්ගේ ඒ අධික මාන හේතුයෙන් ඒ රස පෘථුවිය අතුරුදන් වේ. බිම්මල් පහළ වේ. එකල්හි ඔවුන්ට එම ක්‍රමයෙන්ම එයද අතුරුදන් වේ. පසුව බදාලතා නම් වැල් වර්ගයක් පහළ වේ. ඒ ක්‍රමයෙන් එයද අතුරුදන් වේ. කෘෂිකාර්මික

කටයුතු විරහිතව කුඩා පොතු නැති, පිරිසිදු සුවඳවත්, සහල් ඇට නමැති ඵල සහිත වූ ස්වයංජාත හැල් සහල් පහළ වේ. එතැන් සිට ඔවුන්ට භාජන හටගනී. ඔවුහු ඇල්සහල් භාජනයෙහි දමා ගල් තුනක් මතුපිට තබති. ස්වයං සිද්ධ ගිනිදැල්සිළු පැන නැඟී එය පිසයි. ඒ බත දෑසමන් මල් හා සමාන වූයේ වේ. එයට දිය රහිත හා දියර සහිත ව්‍යජනයෙන් අවශ්‍යතාවක් නොමැත. යම් යම් රසයක් අනුභව කරනු කැමැත්තේ වේද, ඒ ඒ රසයම වේ. ඔවුන්ට ඒ දළ ආහාර අනුභව කරන කල්හි, එතැන් පටන් මළමූත්‍ර හටගනී. එකල්හි ඔවුන්ට ඒවාහි නික්මීම සඳහා ව්‍රණ මුඛ පළාගෙන මතුවේ. පුරුෂයාට පුරුෂභාවයද ස්ත්‍රියට ස්ත්‍රී භාවයද පහළ වේ. එහි මෙවැන්නක් වේ. ස්ත්‍රිය පුරුෂයාද, පුරුෂයා ස්ත්‍රියද බොහෝ වේලාවක් නැවත නැවත සිහිපත් කරයි. ඔවුන්ට බොහෝ වේලාවක් සිහිපත් කිරීමේ හේතුවෙන් කාමදාහය උපදී. එහෙයින් මෛථුන ධර්ම සේවනය කරති. ඔවුහු අසද්ධර්ම සේවනය හේතුවෙන් නුවණැත්තන් විසින් ගර්හා කරනු ලබන්නේ, වෙහෙස කරනු ලබන්නේ, එම අසත්ධර්මය වැසීමේ හේතුවෙන් ගෘහයන් තනති. ඔවුහු ගෘහයන්හි වාසය කරන්නාහු ක්‍රමයෙන් එක්තරා අලස ස්වභාවයෙන් යුතු පුද්ගලයෙකුගේ, දිටි දේ අනුව යන ස්වභාවයට පත්වන්නාහු රැස්කිරීම් කරති. එතැන්පටන් කුඩු හා වී පොතු (දහයියා) හාල්ඇටය හාත්පසින් වෙළාගනියි. ගොයම් කැපූ තන්හි නැවත නොවැඩේ. ඔවුහු රැස්වී පින්වත්නි, ඒකාන්තයෙන් සත්ත්වයින් කෙරෙහි පාපී ධර්මයෝ පහළ වූවාහුය. අපි පෙර මනෝමය වූයෙමුයි ශෝකාතුර වචන කියතියි අග්ගඤ්ඤ සූත්‍රයෙහි කියන ලද අයුරින් විස්තර කළයුතුය. එයින් සීමාව තබති. ඉක්බිති එක්තරා සත්ත්වයෙක් අන්‍යයෙකුගේ කොටසක් නුදුන්නේ ගනියි. ඔහුට දෙවරක් බැණවැදී, තෙවනවර අත්ල, ගල්කැට, දඬු ආදියෙන් පහර දෙති. ඔවුහු මෙසේ අදින්නාදාන, ගර්හා, මුසාවාද, දඬුගැනීම් ආදිය උපන් කල්හි රැස්වී සිතති.

අපගේ යම් කෙනෙක් මනාව දොස් නැගිය යුතු තැනැත්තාට දොස් නගන්නේය. ගර්හා කළයුතු තැනැත්තාට ගර්හා කරන්නේය. පිටුවහල් කළයුතු තැනැත්තා පිටුවහල් කරන්නේය. අප ඔහුට සහල්වලින් භාගයක් දෙන්නෙමු. ඒ සඳහා අප එක් පුද්ගලයෙකු සම්මත කරන්නේ නම් ඉතා යෙහෙකි. මෙසේ කරන ලද සනිටුහන්හි පුද්ගලයින් අතර, මෙම කල්පයෙහි පළමුව මෙම භාග්‍යවතුන් වහන්සේම, බෝසත් වූයේ, එසමයෙහි එම පුද්ගලයින් අතර, මනනදන රූපවත් වූයේ අතිශය දැකුම්කළු

වූයේ අතිශය මහේශාඛ්‍ය වූයේ, බුද්ධිමත් වූයේ, නිග්‍රහ, පුග්‍රහ (පහත්කොට සැලකීම, උසස්කොට සැලකීම) කරන්ට දක්‍ෂයෙකි. ඔවුහු ඔහු කරා එළඹ, අයැද සම්මත කළහ. හෙතෙම ඒ මහජනයා විසින් සම්මත කෙළේනුයි මහා සම්මත යැයිද, ක්‍ෂේත්‍රයන්ට අධිපති හෙයින් ක්‍ෂත්‍රිය යැයිද, දැහැමින් සෙමෙන් අන්‍යයා සිත් අලවා ක්‍රියා කෙරේනුයි රාජා යයි යන තෙවදෑරුම් නාමයන්ගෙන් ප්‍රකට විය. ලෝකයෙහි යම් ආශ්චර්යවත් කරුණක් වේද, බෝසත්හුම එහි මුල් පුරුෂයා වෙති. මෙසේ බෝසතුන් මුල්කොට ක්‍ෂත්‍රිය මණ්ඩලය පිහිටිකල්හි පිළිවෙළින් බ්‍රාහ්මණාදී වර්ණයෝද (කුල) පිහිටියාහුය. එහි කල්ප විනාසක මහා මේඝයෙහි සිට පෘථුවි ජාලයෙගි පැටලිල්ල සිඳීම දක්වා වූ මෙම එක් අසංඛ්‍යය සංවට්ට යයි කියනු ලැබේ.

කල්ප විනාශක පෘථුවි ජාලයෙහි පැටලිල්ල සිඳීමෙහි සිට කෝටි ශතසහස්‍ර සක්වළ පුරවන්නා වූ සම්පත් මහාමේඝයකි. මෙම දෙවන අසංඛ්‍යය සංවට්ටට්ඨායි යයි කියනු ලැබේ. සම්පත් මහාමේඝයේ සිට සඳහිරු පහළවීම දක්වා වන මෙම තෙවන අසංඛ්‍යය විවට්ටයයි යූසේයි. සඳ හිරු පහළවීමෙන් නැවත කල්ප විනාශක මහාමේඝය දක්වා කාලය විවට්ටට්ඨායි යූ.සේයි. මෙම සිව් අසංඛෙය්‍ය එක් මහා කල්පයක් වේ. මෙසේ පළමුව ගින්නෙන් විනාශයද, පිහිටීමද දතයුතුය.

යම්කලෙක වනාහි කල්පය ජලයෙන් නසීද, පළමුව කල්ප විනාශක මහාමේඝය පැනනැගී යැයි පෙර කියන ලද අයුරින්ම විස්තර කළ යුතුය. මේ විශේෂයයි. යම්සේ එහි ද්විතීය සූර්යයාද, මෙසේ මෙහි කල්ප විනාශක ක්‍ෂාරෝදක (අළුහුනුමිශ්‍ර) මහාමේඝය පැනනගී. එය මුලදී සියුම් සියුම්ව වැසිවටනේ, කෙමෙන් මහා දහරාවන්ගෙන් කෝටි ශතසහස්‍ර සක්වළ පුරවන්නේ වැසි වසී. ක්‍ෂාරෝදකයෙන් ස්පර්ශ කළ කළ පෘථුවි පර්වතාදීහු දියවී යති. දිය හාත්පස වාතයෙන් දරනු ලැබේ. පෘථුවියෙහි සිට ද්විතිය ධ්‍යාන භූමිය දක්වා දිය අල්ලා ගනී. එහි ත්‍රිවිධ බ්‍රහ්මලෝක දියාරුකොට සුභකිණ්හයෙහි ගැටී නවතියි. එය යම්තාක් අණුමාත්‍රවූද සංස්කාරයන්ට අයත් යමක් ඇත්ද? එතෙක් නොසන්සිඳෙයි. දිය හා එක්වූ සියලු සංස්කාරගතයන් මැඩපවත්වා වහා සන්සිඳේ. අතුරුදන් වේ. යට අහස හා මතු අහස එකට එක්වූයේ මහන්ධකාර වූයේ යයි සියල්ල කියන ලද ආකාරමය. හුදෙක් මෙහි වනාහි ආභස්සර බඹලොව මුල්කොට ලෝකය පහළ වේ. සුභකිණ්හයෙන්ම චුතව ආභස්සර

ස්ථානාදීන්හි සත්ත්වයෝ උපදිති. එහි කල්ප විනාශක මහාමේඝයෙන් කල්ප විනාශක ක්ෂාරෝදක සිඳීම තෙක් මේ එක් අසංඛ්‍යයකි. ජල සිඳීමෙහි පටන් සම්පත් මහාමේඝය දක්වා මේ දෙවන අසංඛ්‍යයයි. සම්පත් මහාමේඝයෙහි පටන් -පෙ- මේ සිව් අසංඛ්‍යය එක් මහා කල්පයක් වේ. මෙසේ දියෙන් විනාශයද, නැවත හටගැනීමද දතයුතුය.

යම්කලෙකැ කල්පය වායුවෙන් විනාශ වන්නේද? මුලදීම කල්ප විනාශක මහාමේඝය හටගෙන යනාදී පෙර කියන ලද ආකාරයෙන්ම විස්තර කළයුතුය. මේ වනාහි විශේෂයයි. එහි දෙවන සූර්යයා යම්සේද, එසේ මෙහි කල්ප විනාශය සඳහා වාතය හටගනී. එය පළමුව දඬිවූ ධූලි හටගන්වයි. ඉක්බිති සියුම් ධූලි, සියුම් වැලි, දළ වැලි, කැටගල්, ගල් ආදීන්ද යන කූටාගාර ප්‍රමාණ දක්වා ගල්ද, විසමස්ථානයන්හි පිහිටි මහා වෘක්ෂයන්ද උගුලුවයි. ඒවා පෘථුවියෙන් අහසට නැංගාහු නැවත නොවැටෙති. එහිම සුණුවිසුණු වී අභාවයට යෙති. නැවත අනුක්‍රමයෙන් යට මහා පෘථුවියෙහි වාතය හටගෙන පෘථුවිය පෙරළා, උඩු යටිකුරු කොට අහසෙහි විසිකරයි. යොදුන් සියයක්, පන්සියයක් ප්‍රමාණ වූද, පෘථුවි කොටස් බිඳී වායු වේගයෙන්, ඔසවන ලද්දාහු, ආකාශයෙහිම සුණු විසුණු වී අභාවයට යෙති. චක්‍රවාට පර්වතයද, මහාමේරු පර්වතය, වාතයෙන් ඔසවා අහසෙහි විසිකරයි. ඒවා ඔවුනොවුන් නැසී සුණුවිසුණු වී විනාශ වෙයි. මෙම ක්‍රමයෙන්ම භූම්‍යස්ථ විමානයන්ද, අහසෙහි පිහිටි විමානයන්ද, විනාශ කරනුයේ, ෂට් කාමාවචර දිව්‍ය ලෝක විනාශකොට, කෝටි ශතසහස්‍ර චක්‍රවාටයන්ද විනාශ කරයි. එහි චක්‍රවාටයන්, චක්‍රවාටයන් සමගද, හිමාල පර්වත, හිමාල පර්වත සමගද, මහමෙර මහමෙර සමගද ගැටුණාහු සුණුවිසුණු වී විනාශ වේ. පෘථුවියෙහි සිට තෘතිය භූමිය දක්වා වාතය ස්පර්ශ කරයි. එහි ත්‍රිවිධ බඹලෝ විනාශකොට වේහප්ඵලයෙහි ගැටී සිටියි. මෙසේ සියලු සංස්කාරගතයන් විනාශකොට තෙමේද නැසෙන්නේය. යට ආකාශය සමග මතු ආකාශය එක් මහා අන්ධකාරයක් බවට පත්වේ. සියල්ල කියන ලද්ද හා සමානය. මෙහි වනාහි සුභකිණ්හ බඹලොව මුල්කොට ලෝකය පහළවේ. වේහප්ඵලයෙන් චුතව සුභකිණ්හ ස්ථානාදීන්හි සත්ත්වයෝ උපදිති. එහි කල්ප විනාශක මහාමේඝයෙහි පටන් කල්ප විනාශක වාතයෙහි සිඳීම දක්වා වූ, මෙය එක් අසංඛෙය්‍යයකි. වාතයෙහි සිඳීමෙහි පටන්, සම්පත් මහාමේඝය දක්වා වූ මෙය දෙවන අසංඛෙය්‍යයයි. -පෙ- මේ සිව් අසංඛ්‍යය එක් මහා කල්පයක් වේ. මෙසේ වාතයෙන් වන විනාශයද, නැවත හටගැනීමද දතයුතුය. කවර

කරුණක් නිසා මෙසේ ලෝකය විනාශ වන්නේද? අකුසල් මුල් හේතුකොට අකුසල් මුල් උත්සන්න වූ කල්හි මෙසේ විනාශ වන්නේය. එයද වනාහි රාගය අතිශයින් උත්සන්න වූ කල්හි ගින්නෙන් විනාශ වන්නේය. ද්වේශය අතිශයින් උත්සන්න වූ කල්හි ජලයෙන් විනාශ වන්නේය. සමහරු වනාහි ද්වේශය අතිශයින් උත්සන්න වූ කල්හි ගින්නෙන්ද, රාගයෙන් ජලයෙන්දැයි කියති. මෝහය අතිශයින් උත්සන්න වූ කල්හි වාතයෙන් විනාශ වන්නේය. මෙසේ විනාශ වනුයේද, නිරන්තරයෙන්ම සත්වරක් ගින්නෙන් විනාශ වන්නේය. අටවන වාරයෙහි ජලයෙන්ද, නැවත සත්වරක් ගින්නෙන්ද, අටවන වාරයෙහි ජලයෙන්දැයි මෙසේ අටවන අටවන වාරයෙහි විනාශ වනුයේ සත්වරක් ජලයෙන් නැසී නැවත සත්වරක් ගින්නෙන් නැසෙන්නේය. මෙපමණෙකින් තෙසැට කප්හු ඉක්ම ගියාහු වෙති. මේ අතරත දියෙන් නස්නා වාරය පැමිණියේද, වළකා ලද අවකාශ ඇති වාතය, පරිපූර්ණ සිව්සැට කල්පායුෂ්ක සුභකිණ්හය විනාශ කරනුයේ ලොව නසයි. පූර්ව නිවාසයන්, සිහි කරන්නා වූද, කල්ප සිහිකරන්නා වූද භික්ෂුව ඒ කල්පයන්හි නොයෙක් විනාශවන කල්පයන්ද, නොයෙක් හටගන්නා කල්පයන්ද, නොයෙක් විනාශවන, හටගන්නා කල්පයන්ද සිහිකරයි. **සංවට්ට කපෙප විවට්ට කපෙප** යනු කල්පයෙහි අඩක් ගෙන යූ.සේයි. **සංවට්ට විවට්ට කපෙප** යනු සියලු කල්පය ගෙන .යූ.සේයි. කෙසේ සිහිකෙරේද යත්? **අමුත්‍රාසිං** ආදී ක්‍රමයෙනි. එහි **අමුත්‍රාසිං** යනු අසවල් නස්නා කල්පයෙහි මම අසවල් භවයෙහි හෝ යෝනියෙහි හෝ උත්පත්ති ස්ථානයෙහි හෝ විඥාඥාණස්ථිතියෙහි හෝ සතතාවාසයෙහි හෝ සත්ත්ව නිකායෙහි හෝ වූයෙමි. **එවං නාමො** යනු තිස්ස හෝ ඵුස්ස යන නම්වලින්, **එවං ගොතෙතා** යනු කච්චායන හෝ කාශ්‍යප හෝ මේ මොහුගේ අතීත භවයෙහි තමාගේ නාමගොත්‍ර සිහිකිරීම් වශයෙන් යූ.සේයි. ඉදින් එකල්හි තමාගේ වර්ණ සම්පත්තිය හෝ රූක්ෂ, ප්‍රණීත ජීවිත ස්වභාවය හෝ සුවදුක් බහුලතාව හෝ අල්පායුෂ්ක, දීර්ඝායුෂ්ක භාවය හෝ සිහිකරනු කැමැත්තේ වේද, එයද සිහිකෙරේමය. එහෙයින් වදාළහ. '**එවං වණෙණා** -පෙ- **එවමායුපරියාපනෙනා**යි, එහි **එවං වණෙණා** යනු සුදු හෝ කළු හෝ, **එවමාහාරො** යනු ඇල්හාල් බත් හෝ තම ආසන්නයෙහි වට, පල බුදින හෝ, **එවං සුඛ දුකඛ පටිසංවෙදී**; අනේක ප්‍රකාරයෙන් කායික චෛතසික, කෙලෙස් සහිත, කෙලෙස් රහිතාදී ප්‍රභේද වූ සුවදුක් විඳිනුයේ, **එවමායුපරියාපනෙනා** මෙසේ වර්ෂ සියයක් ප්‍රමාණ වූ ආයුෂ ඇතුළත් වූයේ හෝ, කල්ප අසූහතර ලක්ෂයක් ආයුෂ ඇතුළත් වූයේ යයි හෝ, **සො තතො චුතො අමුත්‍ර උදපාදිං** ඒ මම එම භවයෙන්

යෝනියෙන්, එම උපතින්, විඤ්ඤාණ ස්ථිතියෙන්, සත්ව වාසයෙන්, සත්ත්ව කොටසින් චුතවූයේ, අසවල් නම් භවයෙහි, යෝනියෙහි, උපතෙහි, විඤ්ඤාණස්ථිතියෙහි, සත්ව වාසයෙහි, සත්ත්ව කොටසෙහි හෝ උපන්නෙමි. **තත්‍රාපාසිං** යනු නැවත එම භවයෙහිද, යෝනියෙහිද, උපතෙහිද, විඤ්ඤාණ ස්ථිතියෙහිද, සත්ත්ව වාසයෙහිද සත්ත්ව කොටසෙහි නැවත වූයෙමි. එවනනාමො ආදිය කියන ලද ආකාරයමය.

තවද, අමුත්‍රාසිං යන මෙය අනුපිළිවෙළින් ආරෝහණයෙහි කැමැති යම් ප්‍රමාණයක් සිහිකිරීමයි. 'සො තතො චුතො' යනු ආපසු හැරුණහුගේ ප්‍රත්‍යවේක්ෂණයයි. එහෙයින් 'ඉධූපපනෙනා' යනු මෙයින් උපතෙහි අනන්තරවම මොහුගේ උත්පත්ති ස්ථානය දැක්වීම සඳහා 'අමුත්‍ර උදපාදිං' යන මෙය කියන ලදැයි දතයුතුය. 'තත්‍රාපාසිං' මේ ආදිය වනාහි මොහුගේ එහි මෙම උපතින් අනන්තරව වූ උත්පත්ති ස්ථානයෙහි නාමගොත්‍රාදීන්ගේ සිහිකිරීම් දැක්වීම් සඳහා යු.සේයි. 'සො තතො චුතො ඉධූපපනෙනා' ඒ මම ඒ අනන්තර උත්පත්ති ස්ථානයෙන් චුතවූයේ, මෙහි අසවල් නම්, ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි හෝ උපන්නෙමියි යන අර්ථයි.

**ඉති** යනු මෙසේ; සාකාරං සඋද්දෙසං යනු නාම, ගොත්‍ර වශයෙන්, සඋද්දෙසයි. වර්ණාදී වශයෙන් සාකාරයි. නාමගොත්‍ර වශයෙන් වනාහි සත්ත්වයා, තිස්ස, ඵුස්ස, කස්සප යැයි නියම කරනු ලැබේ. වර්ණාදි වශයෙන් වනාහි, කළුය, සුදුය යන විවිධත්වයක් ප්‍රකට වේ. එහෙයින් නාමගොත්‍ර උද්දෙසයයි, අනෙක්වා ආකාරයන්ය.

## පූර්වෙනිවාසානුස්මෘති ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

දිව්‍ය චක්‍ෂු ඤාණ නිර්දේශයෙහි, **ආලොක සඤ්ඤං මනසිකරොති** යනු දිවාකල්හි හෝ රැයෙහි හෝ සූර්යාලෝක චන්ද්‍රාලෝක, මැණික් ආලෝක මෙනෙහි කරයි. මෙසේ මෙනෙහි කරන්නේම, ආලෝකයැයි යන සංඥාව සිත්හි පවත්වන හෙයින් ආලෝක සංඥාව මෙනෙහි කෙරේයයි යු.සේයි. **දිවා සඤ්ඤං අධිට්ඨාති** යනු මෙසේ ආලෝක සංඥාව මෙනෙහි කොට දිවා කල්යැයි සංඥාව පිහිටුවයි. **යථා දිවා තථා රත්තිං** යම්සේ දහවලෙහි ආලෝකය දක්නා ලද්දේද? එසේම රැයෙහිද මෙනෙහි කරයි. **යථා රත්තිං තථා දිවාති** යනු යම්සේ රැයෙහි ආලෝකය දක්නා

ලද්දේද? එසේම දහවලෙහිද මෙනෙහි කරයි. **ඉති විවටෙන චෙතසා** යනු නොවැසුණු සිතින්, **අපරියො නද්ධෙන** යනු හාත්පසින් නොවසන ලද, **සප්පභාසං චිත්තං භාවෙති** යනු ආලෝකවත් සිත දියුණු කරයි. එයින් දිව්‍ය චක්‍ෂුසට පරිකර්ම වූ, ආලෝකය අරමුණුකොට ඇති සිත කියන ලදී. ආලෝක කසිණාරම්මණය චතුර්ථ ධ්‍යානයම සඳහා යූ.සේයි. මෙසේ වඩනා ඔහුට පහවූ අන්ධකාරාවරණයෙන් යුත් ආලෝකවත් සිතක් වෙයි. එහෙයින් දිව්‍ය චක්‍ෂුස උපදවනු කැමති ආදිකර්මික කුලපුත්‍රයා විසින්, මේ පෙළෙහි අනුසාරයෙන්, කසිණාරම්මණ අභිඥාපාදක ධ්‍යානය සර්වාකාරයෙන් අභිනීහාරක්‍ෂම කොට තේජෝ කසිණ, ඕදාත කසිණ, ආලෝක කසිණ යන මේ තෙවදෑරුම් කසිණයන්හි එක්තරා එකක් ආසන්න කළයුතුය. උපචාර ධ්‍යානය අරමුණුකොට වඩා තැබිය යුතුය. එහි අර්පණා නොඉපදවිය යුතුය යන අදහසයි. ඉදින් උපදවයිද පාදක ධ්‍යානයට නිශ්‍රය වේ. පරිකර්ම නිශ්‍රය නොවේ. මෙම ත්‍රයයෙහි ආලෝක කසිණයම ශ්‍රේෂ්ඨතරය. එයට අනුලොම් වශයෙන් අනෙක් කසිණ ද්වයයම යූ.සේයි. එහෙයින් ආලෝක කසිණය අනෙක් කසිණයන්ගෙන් එකක් අරමුණුකොට සිව්දැහැන් උපදවා නැවත උපචාර භූමියෙහිම සිට කසිණය වැඩිය යුතුය. වඩන වඩන ලද තැන ඇතුළතම රූපගතයන් දැකිය යුතුය. රූපගතයන් බලන්නා වූ ඔහුට, ඒ උත්සාහවත් පරිකර්ම සිතින්, ආලෝක පැතිරවීම නොකරන කල්හි, පරිකර්ම වාරය ඉක්ම යයි. ඉක්බිති ආලෝකය අතුරුදන් වේ. එය අතුරුදන් කල්හි රූපගතයන්ද නොපෙනේ. ඉක්බිති මොහු විසින් නැවත නැවත පාදක ධ්‍යානයටම පිවිස ඉන් නැගිට ආලෝකය පැතිරවිය යුත්තේය. මෙසේ අනුක්‍රමයෙන් ආලෝකය ශක්තිමත් වූයේ වේ. මෙහි ආලෝකය වේවායි යම්තාක් තැන් පිරිසිඳීද, එහි ආලෝකය පවතීමය. මුළු දවස පුරාම හිඳ, බලනකල්හි රූප දැක්ම වේ. එහි යම්කලෙක්හි ඒ භික්‍ෂුවගේ මාංශ චක්‍ෂුසට හමුනොවන, කුස ඇතුළත වූ, හෘදයවස්තු ආශ්‍රිත, යට පෘථුවිතලය ආශ්‍රිත, බිත්ති හරහා වූද, පර්වත ප්‍රාකාර ගත වූද පිටසක්වළ ගතවූද, යන මෙම රූප මාංශ චක්‍ෂුසෙන්, දක්නා මෙන් වේ. එකල්හි දිව්‍ය චක්‍ෂුස උපන්නේ වේ. එයම මෙහි රූප දර්ශන සමර්ථය. පූර්වභාග චිත්තයෝ නොවෙත්.

එහි මේ දිව්‍ය චක්‍ෂුෂගේ උත්පත්ති ක්‍රමයයි. එය කියන ලද ආකාරයෙන්, රූපාරම්මණ කොට, මනෝද්වාරා වර්ජනය, ඉපිද නිරුද්ධ වූ කල්හි, එම රූපයම අරමුණුකොට සතරක් හෝ පහක් ජවන උපදිතියි පෙර කියන ලද අයුරින්ම දතයුතුය. මෙම ඥාණය සත්ත්වයින්ගේ

චුතුපපාතයෙහි ඥාණය යයිද, දිව්‍ය චක්ෂුර් ඥාණය යයිද යූ.සේයි. එය පෘථග්ජනයාට උවදුරු සහිත වේ. හෙතෙම වනාහි යම් යම්තැනක ආලෝක වේවායි අධිෂ්ඨාන කරයිද, ඒ ඒ පෘථුවි සමුද්‍ර, පර්වත විනිවිදද ඒකාලෝක වේ. ඉක්බිති මොහුට එහි භයානක යක්ෂ රාක්ෂසාදී රූප දක්නා කල්හි භය උපදියි. එයින් චිත්ත වික්ෂේපයට පත්ව ධ්‍යාන අත්හැර යන්නෙකු වෙයි. එහෙයින් රූප දර්ශනයෙහි අප්‍රමාද ක්‍රියා කරන්නෙකු ලෙසින් විය යුතුය.

**සත්තානං චුතුපපාත ඤාණාය** යනු සත්ත්වයින්ගේ චුතියෙහිද, උපතෙහිද වන ඥාණය සඳහා, යම් ඥාණයකින් සත්ත්වයින්ගේ චුතියද, උත්පත්තියද දැනගනීද, ඒ සඳහා දිව්‍ය චක්ෂු ඥාණය සඳහා යයි යූ.සේයි. **දිබ්බෙන චක්ඛුනා** යනු කියන ලද අර්ථයමය. **විසුද්ධෙන** යනු චුති උත්පත්ති දර්ශනය දෘෂ්ටි විසුද්ධියට හේතුවන හෙයින් පිරිසිදුය. යමෙක් වනාහි චුති මාත්‍රයම දකීද? උපත නොදකීද? හෙතෙම උච්ඡේද දෘෂ්ටිය ගනියි. යමෙක් උපතම දකීද, චුතිය නොදකීද හෙතෙම නව සත්ත්ව පහළවීම් දෘෂ්ටිය ගනී. යමෙක් වනාහි ඒ ද්වයයම දකීද, හෙතෙම දෙවදෑරුම් වූම දෘෂ්ටිගතයන් ඉක්මවයි. එහෙයින් මොහුට එම දර්ශනය දෘෂ්ටි විශුද්ධියට හේතුවෙයි. එම ද්වයයම බුදුපුත්හු දකිති.

චුති, උත්පත්ති දර්ශනයෙන් දෘෂ්ටි විශුද්ධි හේතු බැවින් විශුද්ධයයි. එහෙයින් කියන ලදී. මිනිස් සීමාව ඉක්මවා රූප දර්ශනයෙන් මනුෂ්‍යත්වය ඉක්මවාගිය, මනුෂ්‍යත්වය හෝ මාංශ චක්ෂුස ඉක්මවූ හෙයින් **අතික්කන්ත මානුසකං**යි එම විශුද්ධ වූ මනුෂ්‍යත්වය ඉක්මවා ගිය දිව්‍ය චක්ෂුසින් **සත්තෙ පස්සති** යනු මනුෂ්‍යයින්ගේ මාංශ චක්ෂුසෙන් මෙන් අවලෝකනය කරයි. **චවමානෙ උපපජ්ජමානෙ** යන මෙහි චුති ක්ෂණයන් හෝ උත්පත්ති ක්ෂණයන් දිවැසින් දක්නට නොහැක. දැන් චුතවන්නාහුයි යම් ආසන්න චුතිකයෝ වෙත්ද, දැන් චුතවන්නාහුද, ඔවුහු චවමානයෝය. ගත් ප්‍රතිසන්ධි ඇති, යම් කෙනෙක්, දැන් උපනනාහු වෙත්ද, ඔවුහු උපදිනු ලබන්නාහු යයි අදහස් කරන ලදහ. මෙබඳු වූ චුතවන්නා වූද, උපදිනු ලබන්නා වූද, අය දකීයයි දක්වයි. **හීනෙ** යනු මෝහයාගේ විපාකය හා යෙදුණු හෙයින් පහත් ගණයෙහි වූ, ජාති කුල භෝගාදීන්ගේ වශයෙන් නින්දා, ගර්හා, අවමන්, අවඥා ලැබූ, **පණීතෙ** යනු අමෝහයාගේ විපාකය හා යෙදුණු හෙයින් එයට විපරීත වූ, **සුවණ්ණෙ** යනු අද්වෙශයාගේ විපාකය හා යෙදුණු හෙයින් මනෝඥ වූ, සිත් අලවන මනාප වර්ණයෙන් යුත්,

**දුබ්බණ්ණෙ** යනු ද්වේශයෙහි විපාකය හා යෙදුණු හෙයින් අමනෝඥ වූ, සිත් නොඅලවන අමනාප වර්ණයෙන් යුත්, නොමනා රුවැති, විරූපයෙහි යන අර්ථයි. **සුගතෙ** සැපැති බවට පත්, අලෝභ විපාකය හා යෙදුණු හෙයින් ආඪ්‍ය වූ, මහා ධනවත් වූ, **දුග්ගතෙ** යනු සැප නොමැති බවට පත්, ලෝභ විපාකය හා යෙදුණු හෙයින් දිළිඳු අල්ප ආහාරපානයෙන් යුත්, **යථාකම්මූපගෙ** යනු යම් යම් කර්මයක් කරන ලද්දේද, ඒ ඒ කර්මයෙන් අදාළ විපාකයට එළැඹුණු, එහි ප්‍රථම 'චවමානෙ' ආදියෙන් දිව්‍ය චක්ඛු සකි යූ.සේයි. මෙම පදයෙන් යථා කම්මූපගඤාණ කෘත්‍යය යූසේයි. එම ඤාණයාගේද මේ උත්පත්ති ක්‍රමයයි. මේ ශාසනයෙහි භික්ෂුව යට නිරය අබිමුවකොට ආලෝකය වඩා මහදුක් අනුභව කරන නේරයික සත්ත්වයන් බලයි. එය දැකීම දිව්‍ය චක්ඛු කෘත්‍යමය. හෙතෙම මෙසේ මෙනෙහි කරයි. මෙම සත්ත්වයෝ කිනම් කර්මයක්කොට ඒ දුක් අනුභව කෙරෙත්ද කියා, ඉක්බිති මෙනම් කර්මයක් කොටයැයි ඒ කර්මය අරමුණුකොට ඔහුට ඤාණය උපදියි. එසේම මත්තෙහි දෙව්ලොව අබිමුවකොට ආලෝකය වඩා, නන්දන, මිස්සක, ඵාරුසක යන වනාදීන්හි මහා සම්පත් අනුභව කරන සත්ත්වයින් බලයි. එම දර්ශනයද දිව්‍ය චක්ඛු කෘත්‍යයමය. කිනම් කර්මයක්කොට, මෙම සත්ත්වයෝ ඒ සම්පත් අනුභව කෙරෙත්දැයි හෙතෙම මෙසේ මෙනෙහි කරයි. ඉක්බිති මෙනම් කර්මයක් කොටයැයි, ඒ කර්මය අරමුණුකොට ඔහුට ඤාණය උපදී. මෙය යථා කම්මූපග ඤාණ නමැ. මෙයට වෙනම පරිකර්මයක් නම් නැත. මෙයට යම්සේද අනාගතංස ඤාණයටද මෙසේමය. මේවා දිව්‍ය චක්ඛුස පාදක කොටමය, දිව්‍ය චක්ඛුස සමගම සිද්ධ වෙයි.

**ඉමෙ වත භොනෙතා** යනාදීන්හි **ඉමෙ** යනු දිවැසින් දුටුවන් දැක්වීමේ වචනයයි. **වත** යනු අනුලෝම වචනාර්ථයෙහි නිපාතයි. **භොනෙතා** යනු පින්වත්හු, නපුරු ආකාරයෙන් වූ හැසිරීම, දුෂ්ට වූ හැසිරීම, කෙලෙස් කරණකොට කුණු වූයේනුයි දුශ්චරිතයි. ශරීරයෙන් වන නරක හැසිරීම, කයෙන් උපන් නරක හැසිරීමනුයි කාය දුශ්චරිතයි. අනෙක්වාහිද එම ක්‍රමයමැයි. **සමන්නාගතා** යනු යුක්ත වූවාහු, **අරියානං උපවාදකා** යනු බුදු පසේබුදු ආර්ය ශ්‍රාවකයින්ටද, යටත් පිරිසෙයින් ගිහි සෝවාන් වූවහුටද, අවැඩ කැමැත්තේ වී, පාරාජිකා පත්තියෙන් හෝ ගුණ නැසීමෙන් හෝ, දොස් කියන්නාහු, ජාති ආදිය ගටා අපහාස කරන්නාහු, ගර්හා කරන්නාහුයයි යූ.සේයි. එහි මොවුන්ට ශ්‍රමණ ධර්මයක් නැත. ඔවුහු අශ්‍රමණයෝයැයි කියන්නේ පාරාජිකා ඇවතින් දොස් කියයි

නමැ. මොවුන්ට ධ්‍යානයක් හෝ කෙලෙසුන්ගෙන් මිදීමක් හෝ මාර්ගයක් හෝ ඵලයක් හෝ නැත යනාදිය කියන්නේ ගුණ නැසීමෙන් දොස් කියයි යයි දතයුතුය. එයද දැන හෝ නොදැන දොස් කියන්නේද? දෙඅයුරින්ම ආර්යෝපවාදයම වේ. ස්වර්ග, මාර්ග ආවරණ කරන, ආනන්තරිය කර්මය සමාන බැරෑරුම් කර්මයකි. එහෙත් පිළියම් කළහැකිද වෙයි. යමෙක් ආර්ය පුද්ගලයෙකුට දොස් කියයිද? ඔහු ගොස් ඉදින් තමා වඩා වැඩිමහල්ලෙක් වේද, උකකුටිකව හිඳ මම ආයුෂ්මතුන්ට මේ මේ දෑ කීවෙමි. එයට මට සමාවනු මැනවැයි ක්‍ෂමා කරවා ගතයුතුය. ඉදින් තමා නවකයෙක් වේද, වැඳ උකකුටිකවැ හිඳ, ඇඳිලි බැඳ ස්වාමීනි, මම ඔබතුමන්ට මේ මේ දෑ කීවෙමි. මට එයට සමාවනු මැනවැයි ක්‍ෂමා කරවාගත යුතුය. ඉදින් පිට ප්‍රදේශයකට පිටත්ව ගියේ වේද, තෙමේ හෝ ගොස් එකට වසන අයෙකු හෝ යවා ක්‍ෂමා කරවාගත යුතුය. ඉදින් යන්ට හෝ යවන්ට හෝ නොහැකි වේද, ඒ විහාරයෙහි යම් පමණ භික්‍ෂූහු වෙසෙත්ද? ඔවුන්ගේ සමීපයට ගොස් ඉදින් බාල වූ අය වෙත්ද, උකකුටිකව හිඳ, ඉදින් වැඩිමහලු අය වෙත්ද, වැඩිමහල්ලන්ට කියන ලද ආකාරයෙන්ම පිළිපැද, (ක්‍රියාකොට) ස්වාමීනි මම අසවල් නමැති ආයුෂ්මතුන්ට මේ මේ දෑ කීමි. ඒ ආයුෂ්මත්හු මට කමා කරනු මැනවැයි කියා ක්‍ෂමා කරවාගත යුත්තේය. හමුව ක්‍ෂමා නොකරනුයේද එයම කළයුතුය. ඉදින් හුදෙකලාව හැසිරෙන භික්‍ෂුවක් වේද, ඔහුගේ වාසස්ථානයක් හෝ ගිය තැනක් නොපැනේද, එක් නුවණැති භික්‍ෂුවක් සමීපයට ගොස් ස්වාමීනි, මම අසවල් නම් ආයුෂ්මතුන්ට මේ මේ දෑ කීමි. මට එය සිහිකරන කල්හි විපිළිසර වෙයි. කුමක් කරම්දැයි කිවයුතුය. ඔබ ඒ ගැන නොසිතව. තෙරහු ඔබ කමා කරයි. සිත සන්සිඳුවා ගනුව යයි හෙතෙම කියයි. ඔහු විසින්ද, ආර්යයන් වහන්සේගේ ගිය දිසාභිමුඛව ඇඳිලි බැඳ කමා කරනු මැනවැයි කිවයුතුය. ඉදින් හෙතෙම පිරිනිවියේ වේද, පිරිනිවි ඇඳ පැවැති ස්ථානයට ගොස්, අමුසොහොන දක්වාද ගොස් ක්‍ෂමා කරවාගත යුතුය. මෙසේ කළ කල්හි ස්වර්ගාවරණය නොවේ. මාර්ගාවරණය නොවේ. ප්‍රකෘති තත්වයම වේ. **මිච්ඡා දිට්ඨිකා** යනු විපරීත දර්ශනයෙන් යුත්, **මිච්ඡාදිට්ඨි කම්ම සමාදානා** යනු මිථ්‍යාදෘෂ්ටි වශයෙන් සමාදන්වන ලද නානාකාර කර්ම, යම් මිථ්‍යා දෘෂ්ටි මූලක කාය කර්මාදීන්හි අනෙක් අය සමාදන් කරවති. මෙහිද වචී දුශ්චරිත ග්‍රහණයෙන්ම ආර්යෝපවාදයද, මනෝ දුශ්චරිත ග්‍රහණයෙන්ද, මිථ්‍යා දෘෂ්ටියගේ සංග්‍රහය කරන ලද හෙයින්ද මේ ද්වයයෙහි නැවත දැක්වීම, මහා සාවද්‍ය බව දැක්වීම සඳහා යයි දතයුතුය. ආර්යෝපවාදය ආනන්තරිය සමාන මහා

සාවද්‍යමය. එය කියන ලද්දේමය. සාරිපුත්‍රය, යම්සේ නම්, සීල, සමාධි, ප්‍රඥා සම්පන්න භික්ෂුව මෙම ආත්මයෙහිදීම රහත් බව ලබාගත්තේද, සාරිපුත්‍රය, මේ කරුණ එසේයයි වදාරමි. එම වචනය, එම සිත නොහැර, එම දෘෂ්ටිය දුරුනොකොට මියැදේද? ගෙනඑන ලද බරක් බිම තබන්නේ යම්සේද, එසේ නිරයගාමී වන්නේය. මිථ්‍යාදෘෂ්ටියට වඩා මහා සාවද්‍යතර අන් කිසිවක් නම් නැත. දෙසූ පරිදි, මහණෙනි මේ මිථ්‍යා දෘෂ්ටිය යම්බඳුද, මහණෙනි මම යම් මෙබඳු මහා සාවද්‍යතර අන් එකද ධර්මයක් හෝ නොදකින්නෙමි. මහණෙනි, වැරදි ක්‍රියා මිථ්‍යා දෘෂ්ටිය මූලික කොට හටගනී.

**කායසස භෙදා** යනු තෘෂ්ණා දෘෂ්ටීන් විසින් ගන්නා ලද පංච ස්කන්ධයන්ගේ අත්හැරීමෙන්, **ජරං මරණා** යනු ඉන් අනතුරු ස්කන්ධය එහි ප්‍රකටව පහළවන කෙණෙහි **කායසස භෙදා** යනු ජීවිතින්ද්‍රියයාගේ සිඳදැමීමෙන්, **පරමමරණා** යනු චුති සිතින් මත්තෙහි, **අපායං** යන මේ ආදී සියල්ල නිරයට පර්යාය වේ. නිරය වනාහි ස්වර්ග මෝක්ෂයන්ට හේතුභූත වූ, පුණ්‍යසම්මත වෘද්ධියෙන් පහවූ හෙයින්, සුව වෘද්ධියෙහි අභාවය හෙයින් අපාය නමැ. දුක්ඛයාගේ ස්වභාවය පිළිසරණනුයි දුගගතියි. ද්වේශ බහුලතායෙන් දුෂ්ට කර්මයෙන් හටගත් හෙයින් දුගගතියි. අයහපත් ක්‍රියාකාරීහු එහි නපුරු අයුරින් වැටෙත්නුයි විනිපාතයි. සම්පූර්ණයෙන් බිඳෙනු ලබන අංග ප්‍රත්‍යංග ඇත්තේනුයිද, විනාශයට පත්වන්නාහු මෙහි වැටෙත්නුයි විනිපාතයි. මෙහි ආස්වාදයයැයි හඳුන්වා දුන් වෘද්ධිය නැත්තේනුයි නිරයයි. නොහොත් අපාය ග්‍රහණයෙන් තිරිසන්යෝනිය දක්වයි. තිරිසන් යෝනිය සුගතියෙන් පහවූ හෙයින් අපායයි. මහේශාඛ්‍ය නාගරාජාදීන්ගේ සම්භවය වන හෙයින් දුගතියක් නොවේ. ප්‍රේත විෂය දුගතියට ඇතුළත්ය. එය අපායද දුගතියද වේ. යහපත් ස්වභාවයෙන් පහවූ හෙයින්ද දුකට හේතුවූ හෙයින්ද වේ. විනිපාතය දුකට නොවැටෙන හෙයින් අසුරයන් හා සම නොවේ. විනිපාත ග්‍රහණයෙන් අසුර සමූහය ගැනේ. එය කියන ලද අර්ථයෙන් අපායද, දුගතියද සියලු ශරීරයන් සහිතව විනාශකරන හෙයින් විනිපාතයැයි යූ.සේයි. නිරය ග්‍රහණයෙන් අවීචි ආදී නොයෙක් ආකාර නිරයන්මය.

**උපපනනා** යනු එළැඹියාහුය. එහි ඉපදුණාහුයයි අර්ථයි; කියන ලද්දට විපර්යාසයෙන් ශුක්ල පක්ෂය දතයුතුය. මේ විශේෂයයි. එහි සුගති ග්‍රහණයෙන් මනුෂ්‍ය ගතියද සංග්‍රහ වේ. දේව ග්‍රහණයෙන් දිව්‍ය ගතියමය.

එහි යහපත් ගතියනුයි සුගතියි. රූපාදී විෂයයන්හි මනාව අග්‍ර වූයේනුයි සගගයි. ඒ සියල්ලම කැඩී බිඳී යන අර්ථයෙන් ලෝකය නමැ. මේ වචනාර්ථයි. මෙසේ දිව්‍යමය චක්‍ෂුසෙන් යනාදි සියල්ල නිගමන වචනයයි. මෙසේ චක්‍ෂුසින් දකියිනුයි මේ මෙහි සංක්‍ෂෙපාර්ථයි.

## දිව්‍ය චක්‍ෂු ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

මෙ පස් නැණතර, ඍද්ධිවිධ ඤාණය, පරිත්ත මහගගත, අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න, ආධ්‍යාත්මික, බාහිර අරමුණු වශයෙන් සත් අරමුණුවල පවතියි. ශ්‍රෝත්‍රධාතු විශුද්ධි ඤාණය, පරිත්ත, ප්‍රත්‍යුප්පන්න, ආධ්‍යාත්මික, බාහිර අරමුණු වශයෙන් සතර අරමුණුවල පවතියි. චේතොපරියඤාණය, පරිත්ත, මහග්ගත, අප්‍රමාණ. මාර්ග, අතීත, අනාගත, වර්තමාන, බහිද්ධාරම්මණ වශයෙන් අෂ්ටාරම්මණයන්හි පවතියි. පූර්වේනිවාසානුස්මෘති ඤාණය, පරිත්ත, මහගගත අප්‍රමාණ, මාර්ග, අතීත, ආධ්‍යාත්මික බහිද්ධාරම්මණ වශයෙන් අෂ්ටාරම්මණයන්හි පවතියි. දිව්‍ය චක්‍ෂුර් ඤාණය, පරිත්ත, ප්‍රත්‍යුත්පන්න, ආධ්‍යාත්මික, බහිද්ධාරම්මණ වශයෙන් චතුරාරම්මණයන්හි පවතියි, යථා කම්මූපගඤාණය, පරිත්ත, මහගගත, අතීත, ආධ්‍යාත්මික, බහිද්ධාරම්මණ වශයෙන් පංචාරම්මණයන්හි පවතියි. අනාගතංස ඤාණය, පරිත්ත, මහග්ගත, අප්‍රමාණ, මාර්ග, අනාගත, ආධ්‍යාත්මික, බාහිර, නවතතබබාරම්මණ වශයෙන් අෂ්ටාරම්මණයන්හි පවතියි.

## පඤ්චඤාණ ප්‍රකීර්ණකය නිමි.

ආශ්‍රවක්‍ෂය ඤාණ නිර්දේශයෙහි, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්‍ද්‍රියාදීන් කියන ලද අර්ථමය. **කතිඨානානි ගච්ඡති** යනු එකිනෙකෙහි උත්පත්ති ස්ථාන නියම කිරීම සඳහා විමසීමයි. **එකං ඨානං ගච්ඡති** එක් ස්ථානයෙක්හි උපදීයයි යූ.සේයි. උත්පත්ති අවකාශ ස්ථානයෙහි සිටිනුයේ මෙහිනුයි ඨානයයි යූ.සේයි. **ඡඨානානි** යනු ෂට් මාර්ග ඵලක්‍ෂණයෙහි, ඉන්‍ද්‍රියයන්ගේ අනඤ්ඤාතඤ්ඤස්සා මිතින්‍ද්‍රියාදී ත්‍රයයෙහි, එකින් එකම අධික වේයයි දැක්වීම සඳහා 'සද්ධින්‍ද්‍රියං අධිමොක්ඛ පරිවාරං හොති' ආදිය යූ.සේයි.

යම්සේ 'සද්ධින්‍ද්‍රියං ධම්මො අධිමොක්ඛට්ඨො අභෙඤ්‍ඤා' යන ආදීන්හි අධිමෝක්‍ෂාදීහු සද්ධින්ද්‍රියාදීන්ට කෘත්‍ය වශයෙන් යූ.සේයි. මෙසේ මෙහිද අධිමෝක්‍ෂය පිරිවර වේයයි සද්ධින්ද්‍රිය අධිමෝක්‍ෂාර්ථයෙන් පිරිවර වේයයි යූ.සේයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. පරිවාරං යනුවෙන් ලිංග විපර්යාසය කරන ලදී. **පඤ්ඤින්ද්‍රියං** යනු අනඤ්ඤාතඤ්ඤස්සාමිති ඉන්ද්‍රියයමය. දැනගැනීම් ස්වභාවය දැක්වීම සඳහා වෙන්කොට යූ.සේයි. අභිධර්මයෙහිද ප්‍රඥාවගේ කෘත්‍ය විශේෂ දැක්වීම සඳහා, මාර්ගක්‍ෂණයෙහිද, ඵලක්‍ෂණයෙහිද, එකම ප්‍රඥාව අටවැදෑරුම්කොට බෙදන ලදී.

**අභිසන්දන පරිවාරං** යනු ස්නාන චූර්ණයන්ට දිය මෙන් චිත්ත චෛතසිකයන්ගේ තෙත් කිරීමෙන් පිරිවර වේ. මෙය සොම්නස හා යෙදුණු මාර්ග වශයෙන් යූ.සේයි. උපේක්‍ෂා සම්ප්‍රයුක්ත මාර්ගයෙහි වනාහි සොම්නස් ඉන්ද්‍රියස්ථානයෙහි උපේක්‍ෂා ඉන්ද්‍රිය දතයුතුය. එය වනාහි සම්ප්‍රයුක්තයන්ට අතිශය අභිවෘද්ධියට පැමිණවීමේ පරිවාරයයි නොගත යුතුය. **පවත්ත සන්තතාධිපතෙය්‍ය පරිවාරං** යනු පවත්නා නොකඩවා පැවැත්ම පවත්ත සන්තතියි. වර්තමාන චිත්ත පරම්පරාව යයි අර්ථයි. ප්‍රධාන භාවය = ආධිපතෙය්‍යයි. පවත්නා නොකඩවා පැවැත්මෙහි අධිපතිත්වය පවත්ත සන්තතාධිපතෙය්‍ය නමැ. වර්තමාන ජීවිතේන්ද්‍රියයාගේ මතු පැවැත්මෙහි ප්‍රත්‍යය වන හෙයින් පූර්වාපර වශයෙන් පවත්නා සන්තතියෙහි අධිපතිභාවයෙන් අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියට පිරිවර වේ.

**සොතාපත්ති මග්ගක්ඛණෙ ජාතා ධම්මා** යනාදී සියලු මාර්ග මාර්ග සම්ප්‍රයුක්තයන්ගේ ගුණකථනය සඳහා යූ.සේයි. එහි **මග්ගක්ඛණෙ ජාතා** යනු මාර්ග සමග හටගත්තාහුමය. අන්‍යයෝ නොවෙති. මාර්ග සමග හටගත්තා වූද, රූපය කුසල් ආදී නාමය නොලබයි. එහෙයින් එය ඉවත් කරනුයේ **ඨපෙත්වා චිත්ත සමුට්ඨානාංරූපං** ආදිය වදාළහ. ඒ සියලුම ධර්මයෝ පිළිකුල් දෑහි සෙලවීම් ආදී අර්ථයන්ගෙන් **කුසලායි** (කුසල්ය). ඒවා අරමුණුකොට පවත්නාහු ඔවුන්ට ආශ්‍රවයෝ නැත්තේනුයි **අනාසවායි.** සසර වෘත්තයෙහි මුල සිඳින්නාහු නිර්වාණය අරමුණුකොට සසර වෘත්තයෙන් ගෙන යෙත්නුයි **නිය්‍යාණිකායි.** කුසල්, අකුසල් සංඛ්‍යාත රැස්කිරීමෙන් පහවූ හෙයින් රැස්කළ දෙය විසුරුවීම් සංඛ්‍යාත නිර්වාණය අරමුණුකොට පවත්නා හෙයින් රැස්කළ දෙය විසුරුවීමට යෙත්නුයි **අපචයගාමිනොයි** පැවැත්ම සිඳබිඳලමින්, විනාශ කරමින් යෙත්නුයි

අපචයගාමිනොයි ලෝකයෙහි අන්තර්ගත නොවන ස්වභාවයෙන් ලෝකයෙන් එතෙර වූවාහු, එගොඩ වූවාහුනුයි **ලොකුත්තරායි.** නිර්වාණය අරමුණුකොට ඇත්තේ ඔවුන්ටනුයි **නිබ්බාණාරම්මණායි. ඉමානි අට්ඨින්ද්‍රියානි** යනු පෙර මුලදී කියන ලද පරිවාර ස්වභාවයාගේද ඒවා සමග එක්ව යෙදීම් ආදී ස්වභාවයාගේද මුලදී කියන ලද ආකාරයන්ද දැක්වීම සඳහා යූ.සේයි. එහි **අට්ඨින්ද්‍රියානි** යන පෙර කියන ලද ආකාරයෙන් පඤ්ඤින්ද්‍රිය සමග අටකි. **සහජාත පරිවාරා** යන අටෙහි එකිනෙක සමග අනෙක් අනෙක් සත එකට හටගෙන එයට සහජාත වශයෙන් පරිවාර වෙයි. එසේම අනෙකක් අනෙකකට, අනෙකක් අනෙකකටදැයි මෙසේ ඔවුහු අන්‍යොන්‍යව පරිවාර වෙති. එසේම, නිශ්‍රය, පරිවාර, සම්ප්‍රයුක්ත පරිවාරද වෙති. **සහගතා** යනු එයින් අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය සමග ඒකෝත්පාදාදී ස්වභාවයට ගියාහු, **සහජාතා** යනු එය සමගම හටගත්තාහු, **සංසට්ඨා** යනු එය සමගම එකට මිශ්‍රවූවාහු, **සම්පයුත්තා** යනු එය සමගම සමව ඒකෝත්පාදාදී ආකාරයන්ගෙන් යුක්ත වූවාහු, **තෙ වා** යනු එම අෂ්ට ඉන්ද්‍රිය ධර්මයන්ම, **තස්සා** යනු අඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට, **ආකාරා** යනු පිරිවර කොටස්, **ඵලක්ඛණෙ ජාතා ධම්මා සබ්බෙව අබ්‍යාකතා හොන්ති** යනු රූපයාගේ අව්‍යාකෘතභාවය හෙයින්, චිත්ත සමුට්ඨාන රූපය සමග මාර්ගයාගේම කුසලතාවය නෛර්යාණිකත්වය, සිඳ බිඳ දැමීම් ස්වභාවය කියන ලදී. ඵලක්ෂණයෙහි, කුසලයැයිද, නෛර්යාණිකයැයිද, සිඳ බිඳ දැමීම් ස්වභාවය යැයිද නොකියන ලදී. **ඉති** ආදි කියන ලද ආකාර නිගමනයයි, එහි, **අට්ඨට්ඨකානි** යනු අට මාර්ග ඵලයන්හි, එකිනෙකට අෂ්ටකයාගේ වශයෙන් අට ඉන්ද්‍රිය අෂ්ටකයෝය. **චතුසට්ඨී හොන්ති** යනු සිව්සැට ආකාර වෙති. **ආසවා** යනු යටකියන ලද අර්ථමය. මෙහි අර්හත් මාර්ගයෙන් නැසිය යුතු ආශ්‍රවයන් නොකියා සෙසු මාර්ගත්‍රයෙන් නැසිය යුතු ආශ්‍රවයන්ගේ කීම, ආශ්‍රවක්ෂය කර වචන සමාන ප්‍රමාණයෙන් කියන ලදැයි දතයුතුය. අර්හත් මාර්ග ඥාණයම, ආශ්‍රවයන් ශේෂ නොකොට, ආශ්‍රවයන් ක්ෂය කරන හෙයින් ක්ෂයෙහි ඥාණයයි කියනු ලැබේ. එහෙයින්ම රහත්හුම ක්ෂීණාශ්‍රවයයි කියනු ලැබෙත්.

**ආශ්‍රවක්ෂය ඥාණ නිර්දේශ වර්ණනාව නිමි.**

සත්‍යඥාණ චතුෂ්ක ද්වය නිර්දේශයෙහි, **දුක්ඛස්ස පීළනට්ඨො** යන ආදිය කියන ලද අර්ථමය. **මග්ග සමංගිස්ස ඤාණං දුක්ඛෙපෙතං ඤාණං** යන ආදිය අනතුරු චතුෂ්කයෙහි මෙන් තනිව අවබෝධ කිරීම්

වශයෙන් යු.සේයි. සත්‍ය ඥාණය ලෞකික-ලෝකෝත්තර වශයෙන් දෙවදෑරුම්ය. ලෞකිකය, අනුබෝධ ඥාණය, ප්‍රත්‍යවේක්‍ෂණ ඥාණයයි දෙවදෑරුම්ය. ආදි කර්මිකයාට අනුබෝධ ඥාණය අනුසුව (ඇසීම්) වශයෙන් නිරෝධයෙහිද, මාර්ගයෙහිද පවතී. දුකෙහිද, සමුදයෙහිද අරමුණු කිරීම් වශයෙන් ප්‍රත්‍යවේක්‍ෂණ ඥාණය පවතී. අවබෝධ කරන ලද සිව් සස්හි අරමුණු කිරීම් වශයෙන්, ලෝකෝත්තර ප්‍රතිවේධ ඥාණය, නිරෝධය අරමුණු කිරීම් වශයෙන් කෘත්‍යය වශයෙන් සිව්සස් අවබෝධ කරයි. දෙසූ පරිදි, 'මහණෙනි, යමෙක් දුක දකීද? හෙතෙම දුක්ඛ සමුදයද, දුක්ඛ නිරෝධයද, දුක්ඛනිරෝධගාමිණී ප්‍රතිපදාවද දකී'යයි සියල්ල කිවයුතුයි. මෙහිද මෙම වාරයෙන් මෙයම යු.සේයි. එය වනාහි ලෝකෝත්තර වූයේම 'දුක්ඛෙ ඥාණං' ආදී නාමයන් ලබයි යයි දැක්වීම සඳහා යු.සේයි. මෙහි වනාහි ලෞකික ඥාණයම අදහස් කරන ලදී. එහෙයින්ම 'තත්‍ථ කතමං දුක්ඛෙ ඥාණං' ආදිය වදාළහ. එහි දුක්ඛං ආරබ්භ යනු දුක්ඛ සත්‍යයෙහි එල්බී, අරමුණු කොටයැයි අර්ථයි. පඤ්ඤා යන ආදීන්හි ඒ ඒ අර්ථයාගේ ප්‍රකට කිරීම් සංඛ්‍යාත වූ පැනවීම් අර්ථයෙන් පඤ්ඤායි. ඒ අනිත්‍යාදී ප්‍රකාරයෙන් ධර්මයන් දනීයයි පඤ්ඤායි. මෙය මෙයට ස්වභාව පදයයි. දැනගන්නා ආකාරය **පජානනායි**. අනිත්‍යාදීන් සොයයිනුයි **විචයොයි**. **පවිචයො** යනු උපසර්ගයෙන් පදය වඩන ලදී. නොයෙක් ආකාරයෙන් සොයානුයි යන අර්ථයි. සිව්සස් දම් සොයානුයි ධම්ම **විචයොයි** අනිත්‍යාදීන්ගේ ස්වභාව ලක්‍ෂණ මනාව සලකා බැලීම **සල්ලක්ඛණායි**. එයම උපසර්ග නානත්වයෙන්, **උපලක්ඛණා**, **පච්චුපලක්ඛණායි** යු.සේයි. ඒ ඒ අනිත්‍යාදී ධර්මයන් හේතුයෙන් හටගන්නා බොහෝ ලක්‍ෂණ උප ලක්‍ෂණයයි අර්ථයි. පණ්ඩිත භාවය **පණ්ඩිච්චං** දක්‍ෂභාවය **කොසල්ලංයි**. නිපුණභාවය - **නෙපුඤ්ඤංයි**. අනිත්‍යාදීන්ගේ පැහැදිලි කිරීම් වශයෙන් **වෙභව්‍යායි**, අනිත්‍යාදීන්ගේ සිතීම් වශයෙන් **චින්තායි**. යමෙකුට එය හටගනීද, එය අනිත්‍යාදී වශයෙන් චින්තනය කරවයිනුයි **චින්තායි**. අනිත්‍යාදීන් මනාව පරීක්‍ෂා කෙරේනුයි **උප පරික්ඛායි**. **භූරි** යනු පෘථුවියයි. මෙයද සියුම් අර්ථයෙන්ද, පැතිරීම් අර්ථයෙන්ද, පෘථුවිය මෙන් වූයේනුයි **භූරියි**. නොහොත් ප්‍රඥාවම සිදුවූ අර්ථයෙහි සිත් අලවානුයි භූරියයි යු.සේයි. පර්වතයන්හි හෙණක් මෙන් කෙලෙස් සංසිඳවයි. පීඩා කෙරේනුයි **මෙධායි**. වහා ශිල්ප ශාස්ත්‍ර ග්‍රහණධාරණ අර්ථයෙන් හෝ මෙධායි. යමෙකුට එය උපදීද? සත්ත්ව හිත ප්‍රතිපත්තියෙහි යෙදුණේ, ඒ හා යෙදුණු ධර්මයන්හිද ස්වභාව ලක්‍ෂණ ප්‍රතිවේධයෙහි මෝරවයිනුයි **පරිණායිකායි**, ධර්මයන්හි අනිත්‍යාදි වශයෙන් විවිධාකාරව බලානුයි

විපස්සනායි. මනා ආකාරයන්ගෙන් අනිත්‍යාදීන් දනීනුයි සම්පජානොයි. එහි ස්වභාවය **සම්පජඤ්ඤංයි.** නොමං පිළිපන් සෛන්ධව අසු නිසි මං පිළිපන්නහු, කරන කෙවිටක්හු ලෙසින්, නොමං දුවන කුළු සිත මං එළැවීමට විදිනුයේ නුයි, කෙවිට මෙනැයි **පතොදොයි.** දැකුම් ලකුණැ ඉඳටැ කැරේනුයි **ඉන්‍ද්‍රියංයි.** ප්‍රඥා සංඛ්‍යාත ඉන්‍ද්‍රිය **පඤ්ඤින්‍ද්‍රියංයි.** කුමක් යූසේයි? මෙය පුරුෂයාගේ ඉන්‍ද්‍රිය පුරිෂේන්‍ද්‍රිය මෙන් නොව ප්‍රඥාවගේ ඉන්‍ද්‍රිය ප්‍රඥේන්‍ද්‍රියයි. තවද ප්‍රඥාවම ප්‍රඥේන්‍ද්‍රිය යයි යූ.සේයි. අවිද්‍යාවෙන් නොසැලේනුයි **පඤ්ඤාබලංයි.** කෙලෙස් සිඳලන අර්ථයෙන් ප්‍රඥාවම අවියක් වූයේනුයි පඤ්ඤාසත්ථංයි. ඉතා උස්ව නැගි අර්ථයෙන් ප්‍රඥාවම ප්‍රාසාදයක් වූයේනුයි **පඤ්ඤාපාසාදොයි.** ආලෝකවත් කරන අර්ථයෙන් ප්‍රඥාවම ආලෝකයක් වූයේනුයි **පඤ්ඤා ආලොකොයි.** බැබළීම් අර්ථයෙන් ප්‍රඥාවම බැබලේනුයි දීප්තිමත්ව බබලන අර්ථයෙන් ප්‍රඥාවම දීප්තිමත්ව බැබලේනුයි **පඤ්ඤා පජ්ජොතොයි.** එක් පර්යංකයක හුන් නැණවතාට දස දහසක් ලෝදා ඒකාලෝක, ඒකෝභාෂ, එකප්‍රද්‍යොත වේ. එහෙයින් එය යූ.සේයි. යම් ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද මෙම තෙපදයන් අතර එක් පදයකින්ද එකම අර්ථය ගෙනදේ. 'මහණෙනි, මේ ආලෝක සතරෙකි. කවර සතරෙක්ද යත්? චන්ද්‍රාලෝකය, සූර්යාලෝකය, ශ්‍රේෂ්ඨාලෝකය, ප්‍රඥාලෝකය යන සතරයි. මහණෙනි, මේ සිව් ආලෝකය. මහණෙනි මේ සිව් ආලෝකයන් අතර, යම් ඒ ප්‍රඥාලෝකයක් වේද, එයම ශ්‍රේෂ්ඨය. එසේම මහණෙනි, මේ බැබළීම් සතරෙකි. මහණෙනි, මේ දීප්තිමත් බැබළීම් සතරෙකියි සත්ත්වයින්ගේ අදහස් වශයෙන් සූත්‍ර දේශනා කරන ලදහ. එයට අනුරූපව මෙහිද තෙරුන් විසින් දේශනා කරන ලදහ. අර්ථය නොයෙක් ආකාරයන්ගෙන් බෙදනු ලබන්නේ මනාව බෙදන ලද්දේ වෙයි. අනෙක් ආකාරයකින් අනෙකෙක් අනෙක් ආකාරයකින් අනෙකෙක් අවබෝධ කරයි. ඇල්ම කරන, ඇල්ම දෙන, ඇල්ම හටගන්වන, සිතුවම් කළ, දුලබ පහළවීම්, අසමාන, උසස් සත්ත්වයින් පරිභෝග කළ යනාදී අර්ථයෙන්ද, ප්‍රඥාව රත්නයක් වූයේනුයි > **පඤ්ඤාරතනංයි.** එයින් සත්ත්වයෝ මුළා නොවෙත්. තෙමේ හෝ අරමුණෙහි මුළා නොවේනුයි **අමොහොයි.** ධම්මවිචය පදය කියන ලද අර්ථමය. එය කවරහෙයින් නැවත කියන ලද්දේද යත්? අමෝහයාගේ මෝහයට ප්‍රතිපක්ෂ බව දැක්වීම සඳහා. එහෙයින් එය මෙසේ දක්වයි. යම් මේ අමෝහයක් වේද, හුදෙක් එය මෝහයෙන් අන්‍ය ස්වභාවයක් පමණෙක්ම නොවේ. මෝහයට ප්‍රතිපක්ෂ ධර්මවිචය සංඛ්‍යාත අමෝහය මෙහි අදහස් කරන ලදී. **සම්මා දිට්ඨී** යනු නෛර්යාණික කුසල්

දෘෂ්ටියයි. එහි දුක්ඛ සමුදයෙහි ඤාණය කවරෙක්ද ? එහි දුකඛ නිරෝධයෙහි ඤාණය කවරෙක්ද? එහි දුක් නිරෝධයට පමුණුවන ප්‍රතිපදා ඤාණය කවරෙක්දැයි විමසුම් වචන සංක්‍ෂෙප වශයෙන් යූ.සේයි.

## සත්‍ය ඤාණ චතුෂ්ක ද්වය නිර්දේශ වර්ණනාව නිමි.

සුද්ධික ප්‍රතිසම්භිදා නිර්දේශයෙහි, මෙම ඤාණයන්ගේ ප්‍රභේද නොමැති හෙයින්ම, යට මෙන් ප්‍රභේද නොදක්වාම 'අර්ථයන්හි ඤාණ අර්ථ ප්‍රතිසම්භිදා'යයි ආදිය යූ.සේයි. ප්‍රඥා ප්‍රභේද නොමැති කල්හිද, තමා විසින් අවබෝධ කරන ලද සිව්සස් දම් මාත්‍ර වශයෙන් වෙනස් බව යෙදෙන හෙයින් 'අර්ථ නානත්වයෙහි ප්‍රඥාව අර්ථ ප්‍රතිසම්භිදා ඤාණයයි' ආදිය යූ.සේයි. **නානතෙත** යනු අර්ථාදීන්ගේ විවිධාකාර භාවයෙහි, **වවත්‍ථානෙ** යනු අර්ථාදීන්ගේ නිශ්චය කිරීමෙහි, **සලලකඛණෙ** යනු අර්ථාදීන් මනාව දැක්මෙහි, **උපලකඛණෙ** යනු අර්ථාදීන්හි වැඩිමනත් දැක්මෙහි, **පභෙදෙ** යනු අර්ථාදීන්හි නොයෙක් භේදයන්හි, **පභාවනෙ** යනු අර්ථාදීන්හි ප්‍රකට කිරීමෙන් හටගැන්වීමෙහි, **ජොතනෙ** යනු අර්ථාදීන්ගේ දැක්වීමෙහි, **විරොචනෙ** යනු අර්ථාදීන්ගේ විවිධාකාරයෙන් දැක්වීමෙහි, **පකාසනෙ** යනු අර්ථාදීන්ගේ බැබළවීමෙහි නානතෙතයයි මුල්පදය කොට සියල් සාධාරණ වශයෙන් යූ.සේයි. **වවත්‍ථානෙ** යනු සෝවාන් වූවහුගේ වශයෙන්, සලලකඛණෙ, උපලකඛණෙ යනු සකෘදාගාමිහුගේ වශයෙන්, 'පභෙදෙ පභාවනෙ' අනාගාමිහුගේ වශයෙන්, 'ජොතනෙ විරොචනෙ පකාසනෙ' යනු අර්හත්හුගේ වශයෙන් කියන ලදැයි මෙසේද මෙහි යෙදීම් කළයුත්තාහ.

## සුදධික ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

ඉන්ද්‍රිය පරොපරියත්ත ඤාණ නිර්දේශයෙහි, **තථාගතසස** යන වචන උදෙසීමෙහි, ස්වරූපයෙන් අවිද්‍යමාන වූද, ශ්‍රාවකයින්ගෙන් අසාධාරණ ෂට් ඤාණයන්යැයි කියන ලද හෙයින්, තථාගතයන් වහන්සේටමැයි කියන ලද්දේම වේ. එහෙයින් උද්දේශයෙහි අර්ථ වශයෙන්, සිද්ධ වූ, තථාගත වචන නිර්දේශයෙහි ග්‍රහණය කරන ලදී. **සතෙත පසසති** යනු රූපාදීන්හි කැමැත්ත හා ඇල්මෙන් ඇලුණු බැවින්, ඇලී සිටි හෙයින්

සත්ත්වයෝය. එම සත්ත්වයින් ඉන්‍ද්‍රිය පරෝ පරියත්ත ඤාණ චක්ෂුසින් බලයි. **අප්පරජක්ඛ** යන ප්‍රඥාමය ඇසෙහි ස්වල්ප වූ රාගාදී රජස් ඔවුන්ටනුයි අල්ප රජස්කයි. එම අල්ප රජස්කයින්, මහා රජක්ඛ යනු ප්‍රඥාමය ඇසෙහි මහත් වූ රාගාදී රජස් ඔවුන්ටනුයි මහාරජස්කයි. මහත් වූ රාගාදී කෙලෙස් ඔවුන්ටනුයි හෝ මහා රජස්කයි. **තික්ඛින්‍ද්‍රියෙ මුදින්‍ද්‍රියෙ** යනු තීක්ෂණ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඔවුන්ටනුයි තික්ඛින්‍ද්‍රියායි. මෘදු වූ ශ්‍රද්ධාදී ඉන්‍ද්‍රියයන් ඔවුන්ටනුයි මුදින්‍ද්‍රියායි. **ස්වාකාරෙ ද්වාකාරෙ** යනු සොඳුරු ශ්‍රද්ධාදී, ආකාර, කොටස් ඔවුන්ටනුයි ස්වාකාරයි.

පිළිකුල් ගර්හා කරන ලද, ශ්‍රද්ධාදී ආකාර කොටස් ඔවුන්ටනුයි ද්වාකාරයි. **සුවිඤ්ඤාපයෙ, දුවිඤ්ඤාපයෙ** යනු යම්කෙනෙක් කියන ලද කරුණ, තිසිපරිදි විමසා වටහා ගනිත්ද? ඉතා පහසුවෙන් අවබෝධ කරවීමට හැකිවෙත්ද? ඔවුහු සුවිඤ්ඤාපයයි. ඉන් විපරීතය දුවිඤ්ඤාපයයි. **අප්පෙකච්චෙ පරලොක වජ්ජභය දස්සාවිනො** යනු ඇතැම්හු පරලොවදී, රාගාදී දොස්ද භය වශයෙන් දක්නාහු, මෙම පද විස්තරයෙහි, ලෝකය පිළිබඳවම කියන ලද හෙයින් ස්කන්ධාදී ලෝකයෙහිද, රාගාදී දෝෂයන්හි, දැඩිව භය දක්නා සුලුයයි හෝ පරලොක භය දස්සාවිනොයි. ඒ පරලොව දොස්හි බියදක්නා සුලුවූයේ යයි මෙසේ අර්ථගත යුතුය. **අප්පෙකච්චෙ න පරලොක වජ්ජ භය දස්සාවිනො** යනු ඉන් විපරීතයයි ලෝක යනු කැඩී බිඳී යන අර්ථයෙනි. වජ්ජං යනු දුරුකළයුතු අර්ථයෙනි. මෙතෙකින් උද්දෙසයෙහි නිර්දේශය කරන ලද්දේ වේ.

නැවත නිර්දේශයෙහි, ප්‍රතිනිර්දේශය කරනුයේ 'අප්පරජක්ඛ මහා රජක්ඛ' ආදිය වදාළහ. එහි ත්‍රිවිධ රත්නයන්හි විශ්වාස කිරීම් සංඛ්‍යාත ශ්‍රද්ධාව මොහුට ඇත්තේනුයි **සද්ධොයි**. ඒ ශ්‍රද්ධා සම්පන්න පුද්ගලයා අශ්‍රද්ධා නමැති දුහුවිල්ලගේද, අශ්‍රද්ධාමූලික සෙසු අකුසල දුහුවිල්ලගේද, අල්ප බැවින් **අප්පරජක්ඛොයි**. ඔහුට ශ්‍රද්ධාව නැත්තේනුයි **අස්සද්ධොයි**. හෙතෙම කියන ලද ආකාර ඇති කෙලෙස් දුහුවිල්ලෙන් මහත් බැවින් **මහා රජක්ඛොයි**. මොහු විසින් වීර්යය අරඹන ලද්දේනුයි **ආරද්ධවිරියොයි**. හෙතෙම කුසීතකම නමැති දුහුවිල්ලගේද, කුසීතකම මූලිකකොට ඇති සෙසු අකුසල් දුහුවිල්ලගේද අල්ප බැවින් **අප්පරජක්ඛොයි**. දුර්වල වීර්යවත් බැවින්, පිළිකුල් ආකාරයෙන් ගිලාබසීනුයි කුසීදයි. කුසීදම **කුසීතොයි**. හෙතෙම කියන ලද ආකාර ඇති දුහුවිල්ලගේ මහත් බවින් මහරජක්ඛොයි. අරමුණට එළැඹ සිටි සිහිය මොහුටනුයි **උපට්ඨිත සතියි**. ඔහු සිහිමුළාව

නමැති දුහුවිල්ලගේද, සිහිමුලාව මූලික සෙසු අකුසල් දුහුවිල්ලගේද, අල්පතාව බැවින් **අප්පරජක්ඛායි.** මුළා වූ නට සිහිය මොහුටනුයි **මුට්ඨස්සතියි.** හෙතෙම කියන ලද ආකාර ඇති දුහුවිල්ලගේ මහත් බැවින් මහා රජක්ඛායි අර්පණා සමාධියෙන් හෝ උපචාර සමාධියෙන් අරමුණෙහි සමව, මනාව, එළවන ලද්දේ සිටියේනුයි **සමාහිතොයි.**

එය නොසන්සුන්කම නමැති දුහුවිල්ලගේද, නොසන්සුන්කම මූලික සෙසු අකුසල් දුහුවිල්ලගේද අල්ප බැවින් අප්පරජක්ඛායි. තැන්පත් නුවූයේ **අසමාහිතොයි.** එය කියන ලද ආකාර ඇති දුහුවිල්ලගේ මහත් බැවින් මහාරජක්ඛායි. හටගැනීම හා විනාශය දක්නා නුවණ මොහුට ඇත්තේනුයි **පඤ්ඤවායි.** එය මෝහ නමැති දුහුවිල්ලගේද, මෝහමූලික සෙසු අකුසල් දුහුවිල්ලගේද අල්ප බැවින් අප්පරජක්ඛායි. මෝහයෙන් මුළාවූ හෙයින් දුෂ්ට ප්‍රඥාව මොහුටනුයි **දුප්පඤ්ඤායි.** එය කියන ලද ආකාර ඇති දුහුවිල්ලගේ මහත් බැවින් මහාරජක්ඛායි.

**සද්ධො පුග්ගලො තික්ඛින්ද්‍රියො** යනු බහුලව උපදිනු ලබන බලවත් ශ්‍රද්ධාවෙන් ශ්‍රද්ධාවත් වූයේ, එම ශ්‍රද්ධා ඉන්ද්‍රියයෙන්ම තීක්ෂණ ඉන්ද්‍රිය ඇතියේ. **අස්සද්ධො පුග්ගලො මුදින්ද්‍රියො** යනු බහුලව උපදිනු ලබන අශ්‍රද්ධාවෙන් අශ්‍රද්ධාවත් වූයේ අතරින්පතර උපදිනු ලබන දුර්වල සද්ධින්ද්‍රියෙන් මුදින්ද්‍රියොයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**සද්ධො පුග්ගලො ස්වාකාරො** යනු එම ශ්‍රද්ධාවගේම බබළන ආකාරයයි. **අස්සද්ධො පුග්ගලො ද්වාකාරො** යනු එම අශ්‍රද්ධාවෙන්ම විරූපාකාරයයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **සුවිඤ්ඤාපයො** යනු පහසුවෙන් අවබෝධ කරවන්ට හැකිවන්නේය. **දුවිඤ්ඤාපයො** යනු දුකසේ අවබෝධ කරවන්ට හැකිවන්නේය යනුයි. **පරලොක වජ්ජ භය දස්සාවී** යන මෙහි නුවණැත්තහුගේම ශ්‍රද්ධාදීහු සුපිරිසිදු වෙති. එහෙයින් සුපිරිසිදු ශ්‍රද්ධාදියෙන් සමන්විත, ඒහා යෙදුණු සුපිරිසිදු ශ්‍රද්ධාදියෙන්, සමන්විත වූයේද, ඒ හේතුයෙන් හටගත් ප්‍රඥාවෙන් පරලොව දොස් භය වශයෙන් දක්නේ වේ. එහෙයින්ම ශ්‍රද්ධාදී සතර, පරලෝ දොස් භය වශයෙන් දක්නේ යයි යූ.සේයි.

දැන් 'පරලොක භය දස්සාවී' යන මෙහි කියන ලද, ලෝකයද, දොස්ද දක්වන්ට. 'ලොකො' යන ආදිය වදාළහ. එහි ස්කන්ධයෝම

කැඩී බිඳී යන අර්ථයෙන් ලෝක යනුයි **ඛන්ධලොකොයි.** සෙසු ද්වයයෙහිම එම ක්‍රමයමැයි.

**විපත්ති භව ලොකො** යනු අපාය ලෝකයයි. එය වනාහි අනිටුඵල හෙයින් විරූපී ලාභයනුයි විපත්තියි. වේනුයි භවයයි. විපත්ම භවයනුයි විපත්ති භවයි. විපත්තිභවයම ලෝකයනුයි **විපත්ති භව ලොකො, විපත්ති සම්භව ලොකො** යනු අපායට එළැඹෙන කර්මයයි. එය වනාහි එයින් ඵලය හටගනීනුයි සම්භවයි. විපත්තෙහි හටගැන්ම විපත්ති සම්භවයි. විපත්ති හටගැන්මම ලෝකයනුයි විපත්ති සම්භව ලොකො, **සම්පත්ති භව ලොකො** යනු සුගති ලෝකයයි. එය යහපත් ඵලදෙන හෙයින්, ලාභයනුයි සම්පත්තියි වේනුයි භවයි. සම්පත්තියම භවයනුයි සම්පත්ති භවයි. සම්පත්ති භවයම ලෝකයනුයි සම්පත්ති භව ලොකො, **සම්පත්ති සම්භව ලොකො** යනු සුගතියට එළැඹෙන කර්මයයි. එය වනාහි ඉන් ඵලය හටගනීනුයි සම්භවයි. සැපතෙහි හටගැන්ම සම්පත්ති සම්භවයි. සම්පත්ති සම්භවයම ලෝකයනුයි සම්පත්ති සම්භව ලොකො, **එකො ලොකො** යනාදිය යට කියන ලද අර්ථමය. **වජ්ජං** යනු අසවලා යැයි අනිර්දිෂ්ටහෙයින් නපුංසක වචනය කරන ලදී.

**කිලෙසා** යනු රාගාදීහුය. **දුච්චරිතා** යනු ප්‍රාණඝාතාදීහුය. **අභිසංඛාරා** යනු පුණ්‍යාභිසංස්කාරාදීහුය. **භවගාමි කම්මා** යනු තමාට විපාකදීම් වශයෙන් භවයට යෙත්නුයි භවගාමිනො; අභිසංස්කාරයන්හිද විපාක හටගන්වන්නා වූම කර්ම යූ.සේයි. **ඉති** යනු කියන ලද ආකාර දැක්වීමයි. **ඉමස්මිං ච ලොකෙ ඉමස්මිං ච වජ්ජෙ** යනු කියන ලද ආකාර ඇති ලෝකයෙහි ද, වද්‍යයෙහිද, **තිබ්බාභය සඤ්ඤා** බලවත් භය සංඥාව, තිබ්බා පර ශබ්දයෙහි අර්ථය යූ.සේයි. 'භය සඤ්ඤා' යනු භය ශබ්දයෙහි ලෝක වද්‍ය ද්වයයද භය හේතු හෙයින් භයද, බිය හෙයින් බියවූයේ බියවෙමියි සංඥාව භය සංඥායි. **පච්චුපට්ඨිතා හොති** ඒ ඒ කරුණ හේතුකොට එළඹ සිටියාහු වේ. **සෙය්‍යථාපි උක්ඛිත්තාසිකෙ වධකෙ** යනු යම්සේ නම් පහරදෙන්ට ඔසවන ලද කඩුව සහිත පසමිතුරා කෙරෙහි තියුණු බිය හැඟීම එළඹ සිටියාහු වේද? එපරිද්දෙන් ලෝකයෙහිද වද්‍යයෙහිද තියුණු බිය හැඟීම එළඹ සිටියාහු වේ. **ඉමෙහි පඤ්ඤාසාය ආකාරෙහි** යනු අල්ප රජස්ක පංචකාදීන්හි, දස පඤ්චකයන් වශයෙන්, එකිනෙකෙහි පහක් පහක් බැගින් වූ ආකාර වශයෙන් 'පණස් ආකාරයන්ගෙන්' **ඉමානි පඤ්චින්ද්‍රියානි** යනු සද්ධින්ද්‍රිය ආදී පඤ්චෙන්ද්‍රියයන්, **ජානාති** යනු තථාගතයන්

වහන්සේ ප්‍රඥාවෙන් දැනගනිති. **පසසති** යනු දිවැසින් දිටියේ මෙන් කරයි. **අඤ්ඤාති** යනු සියලු ආකාරයන්ගෙන් වැළඳගෙන දනියි. **පටිවිජ්ඣති** එක් කොටසක් හෝ ඉතිරි නොකොට නිරවශේෂ දර්ශන වශයෙන් ප්‍රඥාවෙන් පළයි යන අර්ථයි.

## ඉන්ද්‍රිය පරාවරතා ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

ආසයානුසය ඤාණ නිර්දේශයෙහි, **ඉධ තථාගතො** යන ආදී පංචාකාරයෙන් තබන ලද නිර්දේශයයි. එහි ආසයානුසය කියන ලද අර්ථමය. **චරිතං** පෙර කරන ලද කුසලාකුසල කර්ම, **අධිමුත්ති** යනු කුසල්, අකුසල් හැමතන්හි සිත්හි ඇල්ම අත්හැරීම, **භබ්බා භබ්බෙ** යනු සුදුසු නුසුදුසු, ආර්ය ජාතියෙහි හටගනිත්, උපදිත්නුයි භබ්බායි. සමීප වර්තමාන, වර්තමාන වචනයි. වන්නාහුය උපදින්නාහුයයි භබ්බායි. උපකාර වූයේ යයි යන අර්ථයි. ආර්ය මාර්ග ප්‍රතිවේධයට සුදුසු, උපනිශ්‍රය සම්පන්න යම්කෙනෙක් වෙත්ද? ඔවුහු භබ්බ නම් වෙති. කියන ලද්දට ප්‍රතිපක්ෂ වූයේ අභබ්බයි. 'කතමො ච සත්තානං ආසයො' යනාදී නිර්දේශයෙහි ප්‍රතිනිර්දේශය. එහි **සස්සතො** යනු ලෝකය නිත්‍යයයි යන අර්ථයි. මෙහි සිරුරම නැසේ. ආත්මය වනාහි මෙහිද අන් තන්හිද ඔහුම යැයි හඟිත්. **අසස්සතො** යනු ආත්මය අනිත්‍යයි. ශරීරය සමගම නස්නේ යයි හඟිත්. **අන්තවා** යනු අල්ප කසිණයෙහි ධ්‍යාන උපදවා ඒ පරිත්ත කසිණය අරමුණු කොටගත් කසිණ සිත කෙළවර සහිත ආත්මයැයි හඟිත්. **අනන්තවා** යනු අප්‍රමාණ කසිණයෙහි ධ්‍යාන උපදවා, ඒ අප්‍රමාණ කසිණාරම්මණ සිත කෙළවර රහිත ආත්මයයි හඟිත්. **තංජීවං තංසරීරං** යනු ජීවයද ශරීරයද එයමය. ජීවය යනු ආත්මයයි ලිංග විපර්යාසයෙන් නපුංසක වචනයෙන් කරන ලදී. සරීරං යනු රාශ්‍යර්ථයෙන් ස්කන්ධ පංචකයයි. **අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං** යනු ජීවය අනෙකකි. ස්කන්ධ පංචකය අනෙකකි. **හොති තථාගතො පරම්මරණා** යනු ස්කන්ධ මෙහිම විනාශ වේ. සත්ත්වයා මරණින් මතු විද්‍යමාන වේ. විනාශ නොවේ. තථාගත යනු සත්ත්වයාට විශේෂ නාමයකැයි සමහරු කියති. සමහරු වනාහි තථාගත යනු රහත්හු යැයි කියති. මේවා නොවේයයි එක් පක්ෂයක දොස් දැක මෙසේ ගනිත්. **නහොති තථාගතො පරම්මරණා** යනු ස්කන්ධයෝද මෙහිම නසිත්. සත්ත්වයාද මරණින් මතු නොවේ.

සිඳෙන්නේය. විනාශ වන්නේය. මෙම 'හොති' යන පක්‍ෂයෙහි දොස් දැක මෙසේ ගනිත්. **හොතිච නහොතිච** මේ එක් එක් පක්‍ෂයක් දැඩිව ගැනීමෙහි දොස් දැක දෙපාර්ශ්වයම ගනිත්. **නෙව හොති න නහොති** යනු මොවුහු දෙපාර්ශ්වයෙහි දැඩිව ගැනීමෙහි, දෙපාර්ශ්ව දොස් පැමිණීම දැක වූයේද නොවූයේද වේ. නොවන්නේද නොවේ. වන්නේද නොවේ යයි අමරා වික්‍ෂෙප පක්‍ෂය ගනිත්. මේ මෙහි අටුවා ක්‍රමයයි.

**සස්සතො ලොකොතිච** යන ආදියෙහි දස ආකාරයන්ගෙන් දෘෂ්ටි ප්‍රභේදයම යූ.සේයි. එහි **සස්සතො ලොකො** යනු ස්කන්ධ පංචකය ලෝකයැයි ගෙන මේ ලෝකය නිත්‍යය, තිරය, සර්වකාලිකයැයි ගන්නහුට ශාශ්වතැයි ග්‍රහණාකාරයෙන් පවත්නා දෘෂ්ටියයි. **අසස්සතො** යනු එම ලෝකයම නැසෙන්නේය. විනාශ වන්නේ යයි ගන්නහුට විනාශය ග්‍රහණාකාරයෙන් පවත්නා දෘෂ්ටියයි. **අන්තවා** යනු පරිත්ත කසිණලාභියා, කුල්ල පමණ නැළිය පමණ කසිණයෙහි සමවැදුණහුට, සමවත තුළ පවත්නා ලද, රූපාරූප ධර්මයන් ලෝකය යැයිද, කසිණ පරිච්ඡේදදාන්තයෙන් අන්තයැයි ගන්නහුට, ලෝකය අන්තවත්යැයි ග්‍රහණාකාරයෙන් පවත්නා දෘෂ්ටියයි. එය ශාශ්වත දෘෂ්ටියද, උච්ඡේද දෘෂ්ටියද මේ එම කසිණයෙහි සමවැදුණු පැතිරුණු කසිණ ලාභිහුට, සමවත තුළ පැවැති රූපාරූප ධර්මයන් ලෝකයයැයිද, කසිණ පරිච්ඡේදාන්තයෙන්ද, අන්තයක් නැතැයි ගන්නහුට ලෝකය අනන්තයැයි ග්‍රහණාකාරයෙන් පැවැති දෘෂ්ටියයි එය ශාශ්වත දෘෂ්ටියද, උච්ඡේද දෘෂ්ටියද වේ. **තං ජීවංතං සරීරං** යනු බිඳෙන ස්වභාවැති ශරීරයටම ජීවය යැයි ගත් හෙයින් ශරීරය විනාශවන කල්හි, ජීවයද විනාශ වේයැයි නැසීම් ග්‍රහණාකාරයෙන් පැවැති දෘෂ්ටියයි. දෙවන පදයෙහි, ශරීරයෙන් අන්‍ය ජීවයාගේ ග්‍රහණය කළ හෙයින්, ශරීරය විනාශවන කල්හිද ජීවය විනාශ නොවන්නේ යැයි සාශ්වත ග්‍රහණාකාරයෙන් පැවැති දෘෂ්ටියයි. **හොති තථාගතො** යනු ආදීන්හි සත්ත්වයා තථාගත නමැ. ඔහු මරණින් මතු වේයයි ගන්නා කල්හි ප්‍රථම ශාශ්වත දෘෂ්ටියයි. නොවේයයි ගන්නා කල්හි දෙවන උච්ඡේද දෘෂ්ටියයි. වෙයි, නොවෙයි ආකාරයෙන් ගන්නා කල්හි තෙවන ඒකච්ච ශාශ්වත දෘෂ්ටියයි නොම වේ. නොවන්නේද නොවේයයි ගන්නා කල්හි සිව්වන වික්‍ෂෙප දෘෂ්ටියයි.

**ඉති** යනු කියන ලද ආකාර ඇති දෘෂ්ටි හේතු දැක්වීමයි. **භව දිට්ඨි සන්නිස්සිතා වා සත්තා හොන්ති විභව දිට්ඨි සන්නිස්සිතාවා** යනු භවය

ශාශ්වතැයි යූ.සේයි. ශාශ්වත වශයෙන් උපදිනු ලබන දෘෂ්ටිය භව දෘෂ්ටියයි. භව යනුද, දෘෂ්ටි යනුද යූ.සේයි. උච්ඡේදය විභවයැයි යූ.සේයි. උච්ඡේද වශයෙන් උපදිනු ලබන දෘෂ්ටිය විභව දෘෂ්ටියි. විභවයැයිද දෘෂ්ටියැයිද යූ.සේයි කියන ලද ආකාර ඇති දසවැදෑරුම් දෘෂ්ටිය, භව දෘෂ්ටියැයිද, විභව දෘෂ්ටියැයිද දෙයාකාරවම වේ. ඒ ද්වයය එකිනෙක ආශ්‍රිත වූවාහු, ආශ්‍රිත නොවූවාහු, එකට ඇලුණාහු වෙති.

**එතෙවා පන උභො අනෙත අනුපගමම** යන මෙහි 'අගගිතොවා උදකතොවා මිවුභෙදාවා' යන ආදීන්හි මෙන් 'වා' ශබ්දය එක් කිරීම් අර්ථයෙහිය. ඒවා කියන ලද ආකාර ඇති ශාශ්වත උච්ඡේද වශයෙන්, පක්ෂ ද්වයයෙහි නොඑළඹී, නොඇලී, අත්හැර යන අර්ථයි. අනුලෝමික ක්ෂාන්තිය යනු විකල්පාර්ථයෙහි හෝ යෙත්. **ඉදපපචචයතා පටිචච සමුපපනෙනසු** මේ ජරාමරණාදීන්ට ප්‍රත්‍යය වූයේ, ඉදපපචචයායි. ඉදපපචචයම > ඉදපපචචයතායි. ඉදපපචචයන්ගේ සමූහය හෝ ඉදප්පච්චයතායි. මෙහි ලක්ෂණය ශබ්ද ශාස්ත්‍රයෙන් පර්යේෂණ කළයුතුයි. ඒ ඒ ප්‍රත්‍යයන් නිසා සමග මනාව උපන්නාහු පටිචච සමුප්පන්නයි. ඒ ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන්හි ඒ ඉදප්පච්චයතාවයෙහි. **අනුලොමිකාති ඛනති** යනු ඤාණයයි. ඤාණය වනාහි ඉවසන හෙයින් ඛනතියි. **පටිලදධාහොති** යනු සත්ත්වයින් විසින් අවබෝධ කරන ලද්දාහු වෙති. ප්‍රත්‍යයෙන් හටගත් ධර්මයන්ට, ප්‍රත්‍යය සාමාග්‍රිය අයත් බැවින් ඉදප්පච්චයතා ක්ෂාන්තියෙන් උච්ඡේදත්‍වයට නොපැමිණීම වේ. ප්‍රත්‍යයන් අනුව උසස් දැක්මෙන්, ඵලයන් අනුව උසස් දර්ශනයක් වන හෙයිනි. ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන්හි ක්ෂාන්තියෙන් ශාශ්වතත්වයට නොඑළඹීම වේ. ප්‍රත්‍යය සාමග්‍රියෙහිදී අලුත් අලුත් ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා වූ ධර්මයන්ගේ ඉපැත්ම දක්නා හෙයිනි. මෙසේ මේ අන්තද්වයට නොපැමිණ, ප්‍රතීත්‍ය සමුත්පාද, ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්ම දැක්මෙන් උච්ඡේදය නොවේ. ශාශ්වත නොවේයැයි පවත්නා මනා දර්ශනය අනුලොම් ක්ෂාන්තිය යැයි දතයුත්තාහ. මෙසේ එම දෘෂ්ටි ද්වයට ප්‍රතිපක්ෂ වූ සම්‍යග් දෘෂ්ටිය යූ.සේයි. **යථාභූතං වා ඤාණං** යනු, තත් වූ පරිදි, ස්වභාව පරිදි, දතයුතු දෑ එහි පැවැති ඤාණයද, විෂය ව්‍යවහාරයෙන් යථාභූත ඤාණයයි යූ.සේයි. එය වනාහි සංස්කාරෝපේක්ෂා කෙළවර කොටැති විවසුන් නැණ මෙහි අදහස් කරන ලදී. යට වනාහි යථාභූත ඤාණ දර්ශනයැයි භයතුපට්ඨාන ඤාණය යූ.සේයි. තත්වූ පරිද්දෙන් දන්නා නුවණ සත්ත්වයින් විසින් ලබන ලද්දේ වේයයි සම්බන්ධයයි.

දැන් 'සස්සතො ලොකො' ආදීන්හි මිථ්‍යා දෘෂ්ටිය වඩන ලදී. 'එතෙවා පන, ආදීන්හි සම්‍යග් දෘෂ්ටිය වඩනා ලද සත්ත්ව සන්තානය ගෙනහැර දක්වා 'කාමං සෙවන්තඤ්ඤෙව' ආදී සෙසු අකුසලයන්ගෙන්ද, සෙසු කුසලයන්ගෙන්ද වඩන ලද සත්ත්ව සන්තානය දක්වයි. එහි කාමය සේවනය කරන්නා වූම පුද්ගලයා තථාගතයන් වහන්සේ දනීයයි යෙදීම කළයුත්තාහ. **සෙවන්තං** යනු නිතර හැසිරීම් වශයෙන් සෙවුනා. පෙර සේවනය කිරීම් වශයෙන් කෙලෙස් කාම බර මොහුට නුයි **කාමගරුකොයි.** එසේම කාමය චිත්ත සන්තානයෙහි වන්නේනුයි **කාමාසයොයි.** සිතෙහි පැතිරීම් වශයෙන්ම, කාමයෙහි අධික ලෙස ඇලුණේ, ලග්න වූයේනුයි **කාමාධිමුත්තොයි.** සෙස්සෙහිද එම ක්‍රමයමැයි. නෛෂ්ක්‍රම්‍යාදීහු කියන ලද අර්ථමය. කාමාදි ත්‍රයයෙන් සෙසු අකුසල්ද, නෛෂ්ක්‍රම්‍යාදී ත්‍රයයෙන් සෙසු කුසල්ද ගන්නා ලද්දේ හෝ වෙතියි දතයුත්තාහ. මෙම සත්ත්වයින්ගේ ආසය යැයි තෙඅයුරින් කියන ලද සන්තානයම දක්වයි. මේ වනාහි මෙහි අටුවා ක්‍රමයයි. 'ඉති භවදිට්ඨි සන්නිස්සිතාවා' යනු ශාශ්වත දෘෂ්ටිය හෝ ආශ්‍රිතය. ශාශ්වත දෘෂ්ටිය වනාහි භව දෘෂ්ටිය යැයි යූ.සේයි. උච්ඡේද දෘෂ්ටියද විභව දෘෂ්ටිය යැයි කියන ලදී. සියලු දෘෂ්ටීන් ශාශ්වත, උච්ඡේද යන දෘෂ්ටීන්හි ඇතුළත්කොට ඇති හෙයින්, මේ සියලුම දෘෂ්ටිගතික සත්ත්වයෝ මේ දෘෂ්ටි ද්වයෙහි ආශ්‍රිත වූවාහු (ඇතුළත් වූවාහු) වෙති. එය කියන ලද්දේමය. කච්චානය බොහෝසෙයින් ලෝකය ද්වයයක් ආශ්‍රිත වූයේ වේ. එය ඇත්තේමය. එය නැත්තේමය යන ද්වයයයි. මෙහි වනාහි අස්තිත්වය යනු ශාශ්වතයි. නාස්තිත්වය යනු උච්ඡේදයයි. මේ වෘත්ත නිශ්‍රිතයින්ගේ සිතෙහි පවත්නා ආකාරයයි. දැන් නිර්වාණ නිශ්‍රිත වූ ශුද්ධ සත්ත්වයින්ගේ සිතේ පවත්නා ආකාරය දක්වන්ට, 'එතෙවා පන උභො අනෙත අනුපගම්ම ආදිය වදාරන ලදී. එහි **එතෙවා පන** යනු ඒවාම, **උභො අනෙත** යනු සාශ්වත උච්ඡේද සංඛ්‍යාත ද්වයාන්තයෙහි, **අනුපගම්ම** යනු නොඇලී, **ඉදප්පච්චය යතා පටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු** යනු ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන්හි මෙය ප්‍රත්‍යවීමෙන්, **අනුලොමිකා ඛන්ති** යනු විදර්ශනා ඤාණයයි. **යථාභූත ඤාණං** යනු මාර්ග ඤාණයයි. මෙය යූ.සේයි. යම් ඒ ප්‍රතීත්‍ය සමුත්පාදයෙහිද, ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන්හිද යන එම ශාශ්වත-උච්ඡේද ද්වයන්තයට නොඑළඹ විදර්ශනා ලදහ. ඉන් මත්තෙහි යම් මාර්ග ඤාණයක් වේද, මේ සත්ත්වයින්ගේ ආසයයි. මෙය සංසාර වෘත්ත නිශ්‍රිත වූ සියලුම සත්ත්වයින්ගේ ආසයයි. මෙය වාසය කරන ස්ථානය යැයි ඇදුරන්ගේ සමාන අර්ථ කථනයයි.

පරලොවක් නැතැයි කියන්නෝ වනාහි කීහු. මාර්ගය නම් වාසය නසමින් යයි. නුඹ මාර්ගය වාසය යැයි කියන්නෙහිද? ඔහුට කිවයුතුය. නුඹ ආර්ය වාසය කියන්නෙක් වෙහිද? නොවෙහිද? ඉදින් නොවෙමියි කියයිද? නුඹ අභාණකතායෙන් (කටපාඩම) නොදන්නෙහියයි කිවයුතුය. ඉදින් භාණකයෙක් වෙමියි කියයිද? සූත්‍රය ගෙනඑවයි කිවයුතුය. ඉදින් ගෙන එයිද? එසේනම් එය යහපති. ඉදින් ගෙන නොඑයිද? තෙමේ ගෙන ආ යුතුය. මහණෙනි, යම් ඒ ආර්යයෝ වාසය කළාහුද? වාසය කරත්ද? වාසය කරන්නාහුද? එබඳු වූ මේ දස ආර්ය වාස කෙනෙක් වෙති. එම සූත්‍රය මාර්ගයෙහි වාසභාවය දක්වයි. එහෙයින් එය මනාව කියන ලද්දේම වේ. මෙය වනාහි භාග්‍යවතුන් වහන්සේ සත්ත්වයින්ගේ ආසය දන්නේ, මෙම දෘෂ්ටිගතයන්ගේද, මෙම විදර්ශනා ඤාණ මාර්ග ඤාණයන්ගේ නොපවත්නා ක්ෂණයන්ද දනීමය. එහෙයින්ම කාමය සෙවුණාහුම දනීයයි ආදිය යු.සේයි.

අනුසය නිර්දේශයෙහි අනුසය යනු කවරාර්ථයකින් අනුසය වේද? අනුසයනාර්ථයෙහි එම අනුසයනාර්ථය කිනම් වේද? අප්‍රහීණාර්ථයයි. ඒවා අප්‍රහීණාර්ථයෙන් ඒ ඒ සන්තානයෙහි අත්නොහැර පවතිත් නමැ. එහෙයින් අනුසය යැයි කියති. අනුසෙනති යනු අනුරූප කරුණක් ලැබ උපදිත් යයි අර්ථයි. එසේද වුවත් ප්‍රශ්නයක් වන්නේය. අනුසයනාර්ථය නම් අප්‍රහීණකාරයයි. එයද උපදීයයි කියන්ට නොයෙදේ. (කීම නුසුදුසුයි.) එහි මේ ප්‍රතිවචනයි. අප්‍රහීණාකාරය නොවේ. අනුසය යනු අප්‍රහීණාර්ථයෙන් බලවත් භාවයට පත් ක්ලේශය යු.සේයි. එය සිත හා එකට යෙදුණේ අරමුණු සහිත වූයේ, ප්‍රත්‍යය සහිතාර්ථයෙන් සහේතුක ඒකාන්ත අකුසල් වූයේ, අතීත වූයේද අනාගත වූයේද වර්තමාන වූයේද වේ. එහෙයින් උපදීයයි කීම ගැලපේ. එහි මේ ප්‍රමාණයයි. පළමුව මෙහිම අභිසමය කථා වත්මත් කෙලෙස් දුරුකෙරේයයි විමසුම්කොට, අනුසයයන්ගේ වර්තමාන භාවය ඇතිහෙයින්, ශක්තිමත් වූයේ අනුසය දුරුකරයි යයි යු.සේයි. ධම්මසංගණියෙහි, මෝහයාගේ පද බෙදුමෙහි, අවිද්‍යානුසය, අවිද්‍යාව මැඩගෙන නැගීසිටින, අවිද්‍යාවෙහි ඇලුණු මෝහය අකුසල මූලයයි. මේ එසමයෙහි මෝහය වේයයි අකුසල් සිත සමග මෝහයෙහි උපන් බැව් යු.සේයි. කථා වස්තුවෙහි අනුසය අව්‍යාකෘතය, අනුසය අහේතුකය. අනුසය සිතෙන් වෙන්වූවාහු යැයි සියලු වාද ප්‍රතික්ෂෙප කරන ලදහ. අනුසය යමකයෙහි සත්වාරයන් අතර, එක්තරා උපදින වාරයෙක්හි යමෙකුට කාමරාගානුසය උපදීද? ඔහුට ප්‍රතිඝානුසය උපදීයයි

ආදිය යූ.සේයි. එහෙයින් අනුසෙනති යනු යෝග්‍ය කරුණක් ලැබ උපදිත් යයි යමක් කියන ලදද, එය මෙම පෙළෙහි ප්‍රමාණයෙන් යෝග්‍යයැයි දතයුතුය. යම් සිත හා එක්ව යෙදුණ අරමුණ යයි ආදිය කියන ලදද? එයද මනාව කියන ලද්දේමය. එම අනුසය නම් මනාව තිපන් සිත හා එකට යෙදුණු අකුසල ධර්මය යැයි මෙහි නිෂ්ඨාවට යායුතුය.

**කාමරාගානුසයො** යනාදීන්හි කාමරාගයද, එය ප්‍රහීණ නොවූ අර්ථයෙන් අනුසයනුයි, කාමරාගානුසයයි. සෙසු පදයන්හිද එම ක්‍රමයමැයි. කාමරාගානුසය මෙහි ලෝභ සහගත චිත්තයන්හි සහජාත වශයෙන්ද, ආරම්මණ වශයෙන්ද, අමනාප සෙසු කාමාවචර ධර්මයන්හි ආරම්මණ වශයෙන්ම උපදිනු ලබන ලෝභයයි. **පටිඝානුසයො** යනු දොම්නස් සහගත චිත්තයන්හි සහජාත වශයෙන්ද, ආරම්මණ වශයෙන්ද, මනාප වූ සෙසු කාමාවචර ධර්මයන්හි ආරම්මණ වශයෙන් උපදිනු ලබන ද්වේශයයි. **මානානුසයො** යනු දෘෂ්ටිගත විප්‍රයුක්ත ලෝභ සහගත චිත්තයන්හි සහජාත වශයෙන්ද, ආරම්මණ වශයෙන්ද, දුක් වේදනා අත්හළ සෙසු කාමාවචර ධර්මයන්හිද, රූපාවචර, අරූපාවචර ධර්මයන්හිද, ආරම්මණ වශයෙන්ම උපදිනු ලබන මානයයි. **දිට්ඨානුසයො** යනු සිව් දෘෂ්ටිය හා එක්ව යෙදුණු සිත්හි, **විචිකිච්ඡානුසයො** යනු විචිකිච්ඡාව සමග යෙදුණු සිත්හි, **අවිජ්ජානුසයො** දොළොස් අකුසල් සිත්වල සහජාත වශයෙන් හා ආරම්මණ වශයෙන්, දෘෂ්ටි, විචිකිච්ඡා මෝහ යන ත්‍රයයම සෙසු ත්‍රෛභූමික ධර්මයන්හි (ලෝකයන්හි) අරමුණු වශයෙන්ම උපදින්නාහුය. භවරාගානුසය සිව් දෘෂ්ටිගත විප්‍රයුක්ත සිත්වල උපදිනු ලබන්නේද සහජාත වශයෙන් නොකියන ලදී. රූපාවචර අරූපාවචර ධර්මයන්හි උපදිනු ලබන ලෝභය අරමුණු වශයෙන්ම යූ.සේයි.

දැන් කියන ලද පරිදි අනුසයයන්ගේ අනුසයනස්ථාන දක්වන්නේ 'යං ලොකෙ'යන ආදිය වදාළහ. එහි **'යං ලොකෙ පියරූපං'** යනු මෙලොව යම් ප්‍රිය ජාතියට අයත් ප්‍රිය ස්වභාවයට අයත් **සාතරූපං** යනු සිසිල් ජාතියට අයත්. ආස්වාදය ආසන්න කරුණ වූ ඉටු අරමුණ. **එත්ථ සත්තානං කාමරාගානුසයො අනුසෙති** යනු එම මනොඥ අරමුණෙහි සත්ත්වයින්ගේ අප්‍රහීණාර්ථයෙන් කාමරාගානුසය අත්නොහැර පවතී. 'පියරූපං සාතරූපං' යනු මෙහි කාමාවචර ධර්මයම අදහස් කරන ලදී. යම්සේ නම් දියෙහි ගිලුණහුට, යටද, මත්තෙහිද, හාත්පසද ජලයම වේද? එපරිද්දෙන්ම මනොඥාරම්මණයෙහි රාග ඉපදීම නම් පුරුද්ද මනාව පුරුදුකළ බැවින්

වෙයි. අමනොඥ අරමුණෙහි කෝපය ඉපදීමද එසේමය. **ඉති ඉමෙසු ද්වීසු ධම්මෙසු** යනු මෙසේ මෙම ඉටුඅනිටු අරමුණු ස්වභාවයන්හි, **අවිජ්ජානුපතිතා** යනු කාමරාග කෝප සම්ප්‍රයුක්තව අරමුණු කිරීම් වශයෙන් අවිද්‍යාව මත්තෙහි වැටුණාහු අනුව ගියාහු වෙති. විනාශකොට යනුද පාඨයි. **තදෙකට්ඨො** එම අවිද්‍යාව සමග එකට හටගෙන සිටීම් වශයෙන් එක්ව සිටියේ. **මානොච දිට්ඨිච විචිකිච්ඡාච** යනු නවවැදෑරුම් මානය, දෙසැට ආකාර දෘෂ්ටිය, අෂ්ට වස්තුක විචිකිච්ඡාව තදෙකට්ඨ මානය, තදෙකට්ඨ දිට්ඨිය, තදෙකට්ඨ විචිකිච්ඡා යයි යනු යෙදීම්ය. දට්ඨබ්බා දැකිය යුතුය. අවබෝධ කළයුතුය. ත්‍රයය එකතුකොට බහුවචන කරන ලදී.

මෙහි භවරාගානුසය වනාහි කාමරාගානුසයෙන්ම සංග්‍රහ කරන ලදැයි දතයුතුය.

චරිත නිර්දේශයෙහි, තෙළෙස් චේතනා **පුඤ්ඤාභිසංඛාරොයි.** දොළොස් **අපුඤ්ඤාභිසංඛාරොයි**, සිව් **ආනෙඤ්ජාභි සංඛාරොයි** එහි කාමාවචරය **පරිත්ත භූමකොයි** අනෙක්වා **මහා භූමකොයි**, එම ත්‍රයයෙහි යම්කිසි අල්ප විපාක භූමියක් වේද? එය **පරිත්ත භූමකොයි** මහා විපාක ඇත්තේ **මහා භූමකොයි** දතයුතුය.

අධිමුත්ති නිර්දේශයෙහි, **සන්ති** යනු විද්‍යමාන වෙති. **හීනාධිමුත්තිකා** යනු ලාමක අදහස්, **පණීතාධිමුත්තිකතා** යනු යහපත් අදහස්, **සෙවන්ති** යනු ආශ්‍රය කරත්. ඇලෙත්. **භජන්ති** යනු එළැඹෙත්. **පයිරුපාසන්ති** යනු නැවත නැවත එළැඹෙත්. ඉදින් ආචාර්ය උපාධ්‍යායයෝ සිල්වත්හු නොවෙත්ද? අන්තෙවාසික හා සද්ධිවිහාරිකයෝ සිල්වත්හු වෙත්ද? ඔවුහු තමාගේ ආචාර්ය උපාධ්‍යායයන් වෙතද නොඑළඹෙත්. තමා හා සමාන ගැළපෙන භික්ෂූන් වෙතම එළැඹෙති. ඉදින් ආචාර්ය උපාධ්‍යාදීහු යෝග්‍ය අය වෙත්ද? අනෙක් භික්ෂූහු අයෝග්‍ය අය වෙත්ද? ඔවුහු ආචාර්ය උපාධ්‍යාදීන් වෙත නොඑළැඹෙති. තමා හා සම ලාමක අදහස් ඇතියවුන් වෙතම එළැඹෙති. මෙවැනි එළැඹීම් හුදෙක් දැන් පමණක් නොව අතීතානාගතයන්හිද වීම් හා වියහැකි බැව් දක්වන්ට අතීතමපි අද්ධානං ආදිය වදාළහ.

එහි **අතීතමපි අද්ධානං** යනු අතීත කාලයෙහි, අත්‍යන්ත සංයෝගාර්ථයෙහි ද්විතියා වචනයි. සෙස්ස නොගැඹුරු අර්ථමය. මෙය

දුසිලන්ට දුසිල් සේවනයමය. සුසිලන්ට සුසිල් සේවනයමය. දුෂ්ප්‍රාඥයින්ට, දුෂ්ප්‍රාඥසේවනයමය. ප්‍රඥාවන්තයින්ට ප්‍රඥාවන්ත සේවනයමයැයි කවරෙක් නියම කෙරේද, අදහස් ස්වභාවය නියම කරයි.

භව්‍යාභව්‍ය නිර්දේශයෙහි, හැරදැමිය යුතු දෑ පළමුව නිර්දේශකොට ගතයුතු දෑ පසුව නිර්දේශ කරන්ට, උද්දේශයාගේ උපිළිවෙළින් පළමුව අභව්‍යතා නිර්දේශ කරන ලදහ. උද්දේශයෙහි වනාහි ද්වන්ද සමාසයෙහි අච්චිතසසච මන‍ඤක්ඛරසස යන පදයෙහි පූර්වනිපාත ලක්‍ෂණ වශයෙන් 'භබ්බ ශබ්දය' පෙරටුයෙහි යොදන ලදී.

**කම්මාවරණෙන** යනු පස්වැදෑරුම් ආනන්තරිය කර්මයෙන්, **සමන්නාගතා** යනු යුක්තවූවාහු, **කිලෙසාවරණෙන** යනු නියත මිථ්‍යා දෘෂ්ටියෙන් මෙම ද්වයය ස්වර්ග මාර්ගයන්ට ආවරණ හෙයින් ආවරණයෝය. භික්‍ෂුණී දූෂකාදී කර්මයෝද, කර්මාවරණයෙහිම සංග්‍රහ කරන ලදහ. **විපාකාවරණෙන** යනු අහේතුක ප්‍රතිසන්ධියෙන්, ද්විහේතුකයින්ටද ආර්යමාර්ග ප්‍රතිවේධයක් නොමැත. එහෙයින් ද්විහේතුක ප්‍රතිසන්ධි විපාකාවරණමයැයි දතයුත්තාහ. **අසසද්ධා** යනු බුද්ධාදී උතුමන් කෙරෙහි ශ්‍රද්ධා රහිත භාවයයි. **අච්ඡන්දිකා** යනු කුසල් කරනු කැමැත්තෙහි ඇල්ම රහිත භාවයයි. උතුරුකුරු දිවයින් වැසි මනුෂ්‍යයෝ අච්ඡන්දික ස්ථානයට පිවිසියාහුය. **දුප්පඤ්ඤා** යනු භවංග ප්‍රඥාවෙන් පිරිහුණා වූ භවංග ප්‍රඥාවගේ පරිපූර්ණත්වයට පත්වූයේ වී නමුදු, යමෙකුගේ භවංගය ලෝකෝත්තර මාර්ග ඵලයන්ට පාදක නොවේද? එයද දුෂ්ප්‍රාඥම නමැ. **අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං** යනු කුසල්දම්හි නිවැරදි ස්වභාවානුකූල නියමිත පිළිවෙළ සංඛ්‍යාත ආර්ය මාර්ගයට අවතීර්ණ වීමට නුසුදුසුය. ආර්ය මාර්ගය යහපත් ස්වභාවය බැවින් සම්මත්තංයි. එයම අනන්තරව ඵල දානයෙහි තෙමේම හෝ අචල භාවයෙන් නියම කරන්ට, අවතීර්ණ වන්ට පිවිසෙන්ට නුසුදුසුයි. **න කම්මා වරණෙන** ආදිය කියන ලද්දට, වෙනස් ආකාරයෙන් දතයුත්තාහ.

**ආසයානුසය ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

යමක ප්‍රාතිහාර්ය ඤාණ නිර්දේශයෙහි, **අසාධාරණං සාවකෙහි** යනු සෙසු ශ්‍රාවක අසාධාරණ ඤාණ නිර්දේශයෙහි අන්‍ය වචනයන්ගෙන්

අවකාශ අභාව හෙයින් නොයූ.සේයි. මෙහි වනාහි අන්‍ය වචන අභාව හෙයින් යූ.සේයි. **උපරිමකායතො** යනු ශරීරයෙහි නාභියෙන් මතුයෙහි, **අගගික්ඛන්‍ධො පවත්තති** යනු තේජෝ කසිණ අරමුණු කොට, පාදක ධ්‍යානයට සමවැද නැගිට, මතු ශරීරයෙන් ගිනිදැල් නැගී සිටීවායි ආවර්ජනය කොට පරිකර්මකොට අභිඥා ඤාණයෙන් මතු කයින් ගිනිදැල් නැගී සිටීවායි අධිෂ්ඨාන කළ කල්හි අධිෂ්ඨානය සමග මතු කයින් ගිනිදැල් නැගී සිටියි. ඕ වනාහි රාශ්‍යර්ථයෙන් ඛන්‍ධයැයි යූ.සේයි. **හෙට්ඨිම කායතො** යනු නාභියෙන් යට ශරීරයෙන්, **උදකධාරා පවත්තති** යනු ආපො කසිණාරම්මණ පාදක ධ්‍යානයට සමවැද නැගිට යමකයෙන් දියදහරා නැගී සිටීවායි, ආවර්ජනය කොට, පරිකර්ම කොට අභිඥා ඤාණයෙන් යට කයෙන් දියදහරා නැගී සිටීවායි අධිෂ්ඨාන කළ කල්හි, අධිෂ්ඨානය සමගම යට කයෙන් දියදහරා නැගී සිටියි. ද්විපාර්ශ්වයෙන්ම නොසිඳීම් වශයෙන්ම පවතීයයි යූ.සේයි.. අධිෂ්ඨානයෙහිද, ආවර්ජනයෙහිද, අතරත භවංග චිත්තද්වයයක් පවතී. එහෙයින්ම යුගලව ගිනිකඳ හා දියදහරා පවතිත්. අතරක් නොපෙනේ. අන්‍යයන්ට වනාහි භවංග පිරිසිඳීමක් නැත.

**පුරත්‍ථිමකායතො** යනු ඉදිරිපසින්, **පච්ඡිම කායතො** යනු පසුපසින්, **දක්ඛිණ අක්ඛිතො වාම අක්ඛිතො** යන ආදිය සමාස පාඨයමය. අනෙකක් නොවේ. දකුණු නාස්පුඩුවෙන්, වම්නාසා පුඩුවෙන් යයි පාඨය සුන්දරය. හ්‍රස්ව කොටද කියවති. **අංසකූටතො** යනු මෙහි ඉහළ නැගි අර්ථයෙන් කුළක් මෙනැයි කූටොයි. උරහිසම කුළක් වූයේ **අංසකූටයි. අංගුලංගුලෙහ** එකෙකි ඇඟිල්ලෙන්, **අංකුලන්තරිකාහි** යනු ඇඟිලි අතරින් එකෙක **ලොමතො අගගික්ඛන්‍ධො පවත්තති එකෙක ලොමතො උදකධාරා පවත්තති** යනු දෙඅයුරින්ම ආමෙණ්ඩිත වචනයෙන් සියලු ලෝමයන්ගේ හාත්පසින් ගැනීම කළ හෙයින්, එක එක ලෝමයෙන්ම ගිනිකඳ, දියදහර යුගල යුගලව පවත්වතියි යූ.සේයි. ලෝම (රෝම) කූපයෙන්, ලෝමකූපයෙන් දියදහර පවත්වයි යන මෙහිද එම ක්‍රමයමැයි. සමහර පුස්තකයන්හි එක් එක් ලෝම (රෝම)යෙන් ගිනිකඳ පවත්වයි. ලෝමකූපයෙන් ලෝමකූපයෙන් දියදහර පවත්වයි. ලෝම කූපයෙන්, ලෝමකූපයෙන් ගිනිකඳ පවත්වයි. එක් එක් ලෝමයෙන් දියදහර පවත්වයි යයි ලියන ලදී. එයද යෙදේමය. ප්‍රාතිහාර්යයාගේ ඉතා සියුම් බව දක්වන හෙයින් ප්‍රථම පාඨයම වඩා සුන්දරය.

දැන් **ඡනනං වණ්ණානං** යනු යට, මතුකයෙන් යැයි ආදී නොයෙක් ආකාරයන්ගෙන් ශරීරාවයව යූ.සේයි. ඒ ශරීරාවයව සම්බන්ධව පවත්වයි යන වචන සම්බන්ධයෙන් යමක ප්‍රාතිහාර්යාධිකාරයෙන්ද, ෂට් වර්ණයන්ගේ, ශරීරාවයව වූ, රශ්මීන් යුග්මවැ පවතිත්යැයි යූ.සේයි. **ෂෂ්ඨී** වචන සම්බන්ධයෙන්ද, ඒකාන්තයෙන් රශ්මීහුයැයි පාඨශේෂ කැමැති විය යුතුය. **නීලානං** යනු නිල්වත් උම්මා පුෂ්ප වර්ණයන්ගේ, **පීතකානං** යනු කිණිහිරි පුෂ්ප වර්ණයන්ගේ, **ලොහිතකානං** යනු උඳුගොව් වර්ණයන්ගේ, **ඔදාතානං** යනු ඔසධී නමැති තාරක වර්ණයන්ගේ මඤ්ජිට්ඨානං යනු මඳ රත් වර්ණයන්ගේ, පභස්සරානං යනු ඉතා බබළන ප්‍රකෘතික වර්ණයන්ගේ, ප්‍රභාස්වර වර්ණය වෙන්ව අවිද්‍යමාන වූයේද, කියන ලද පංච වර්ණයන්හි, යම් යම් ආලෝක බබළනුයේද, ඒ ඒ ආලෝක ප්‍රභාස්වර නමැ. එසේමැයි. යමක මහා ප්‍රාතිහාර්ය කරන්නා වූ, තථාගතයන් වහන්සේට, යමක මහා ප්‍රාතිහාර්ය බලයෙන්ම, කෙහෙ, රැවුල්, අක්ෂි ආදී නිල් ස්ථානයන්ගෙන් නිල් රශ්මීහු නික්මෙති. අහස්තලය අඳුන් සුණු විසුරුවන ලද්දක් මෙන්ද, නිල්පැහැති උම්මා පුෂ්ප හා නිලුපුල් පෙතිවලින් වැසුණාක් මෙන්ද, සෙලවී වැටෙන මැණික් තල් නටුවක් මෙන්ද, විසුරුවන ලද මොණර ඇස් පිලෙන් තැනූ වස්ත්‍රයක් මෙන්ද වේ. චර්මයෙන්ද, අක්ෂීන්ගේද කහපැහැති ස්ථානයන්ගෙන් කහ රශ්මීහු නික්මෙති. දිසා ප්‍රදේශ රන්රස විසුරුවන්නාක් මෙන් රන් වස්ත්‍ර දිගහරින ලද්දාක් මෙන්ද කොකුම් චූර්ණ කිණිහිරි මලින් ගැවැසී ගත්තාක් මෙන්ද බබළති. මස් ලේ හා අක්ෂීන්හි රත් ස්ථානයන්ගෙන් ලෝහිත(රත්) රශ්මීහු නික්මෙති. යමකගේ වශයෙන් දිසා ප්‍රදේශ රත්සිරියල් චූර්ණයෙන් වර්ණගැන්වූ ආකාරයෙන්, මනාව ඉදුණු, දියකළ ලාකඩ රස ඉසින්නාක් මෙන්, රත් කම්බිලියකින් වටකළාක් මෙන්ද, දෑසමන් එරබදු වද යන මල්වලින් ගැවසී ගත්තාක් මෙන්ද, බබළති. අස්ථීන්ගෙන්ද, දන්තයන්ගෙන්ද, නේත්‍රයන්හි ශ්වේතස්ථානයන්ගෙන් ශ්වේත රශ්මීහු නික්මෙති. යමකගේ වශයෙන් දිශා ප්‍රදේශ රිදී පර්වත මුදුන්වලින් ඉසිනු ලබන ක්ෂීරධාරා ගැවසී ගත්තාක් මෙන්ද, දිගහරින ලද රිදී තහඩු වියනක් මෙන්ද, පතිතවන රිදී තල් නැටි මෙන්ද, කොඳ, සුදු මානෙල්, තික, සමන්, දෑසමන් ආදී පුෂ්පයන්ගෙන් ගැවසී ගත්තාක් මෙන්ද බබළති. අත්ල, පතුල ආදී මඳ රත් ස්ථානයන්ගෙන් මදටිය පැහැති රශ්මීහු නික්මෙති. යමකගේ වශයෙන් දිසා ප්‍රදේශ පබළු දැලකින් වටකළාක් මෙන්ද, රතු කටුකරඬු විසිරවූවා මෙන්ද බබලති. සියුම් රෝම නිය ආදී ප්‍රභාස්වර ස්ථානයන්ගෙන් ප්‍රභාශ්වර රශ්මීහු නික්මෙති. යමකගේ වශයෙන් දිසා ප්‍රදේශ දවහත් තරු රාශියකින්

පිරුණාක් මෙන්ද විදුලි පටලයකින් පිරුණාක් මෙන්ද බබළති. භගවා චංකමති ආදීන්ගෙන්, බුදුරදුන්ගේද, නිර්මිතයන්ගේද, විවිධ ඉරියව් පැවැත්වීම යමක මහා ප්‍රාතිහාර්යයෙන්ම වේයයි දැක්වීම සඳහා යූ.සේයි. එම නිර්මිතයන්ගේ ඉරියව් යුගලව පවතී. ඉදින් නිර්මිතයෝ බොහෝ ප්‍රමාණ වෙත්ද? 'නිර්මිතයා ආදි වශයෙන් කවර හෙයින් ඒකවචන කරන ලද්දේද යත්?' නිර්මිතයන්හිද එකිනෙකාගේ විවිධ ඉරියව්භාවය දැක්වීම සඳහායි.

බහුවචනයෙන් කී කල්හි සියලුම නිර්මිතයෝ එක්වර එකිනෙක ඉරියව් පවත්වන්නාහු වෙති. ඒකවචනයෙන් කී කල්හි නිර්මිතයින් වෙන වෙනම නොයෙක් ඉරියව් පවත්වන්නෙකු මෙන් හැඟේ. (සිවුරු පඬු පොවනවිට සියල්ලෝම සිවුරු පඬු පොවති. එක් අයෙක් පඬු පොවයි. එක් අයෙක් සක්මන් කරයි. එක් අයෙක් බවුන් වඩයි ආදී වශයෙනි) එහෙයින් ඒකවචන නිර්දේශය කරන ලදී. චූලපන්ථක තෙරද විවිධ ඉරියව්වලින් යුත් භික්ෂූන් දහසක් මැවීය. කිමෙක්ද බුදුරජ, යමක මහා ප්‍රාතිහාර්යයෙහිදී බහු නිර්මිතයන් නොකරන්නේද? කරන්නේමය. චූලපන්ථක තෙරුන් හැර අනෙක් ශ්‍රාවකයින් එක් ආවර්ජනයෙන්, විවිධ ඉරියව් සමන්විතයින්ගේද විවිධ රූපයන්ගේද නිර්මාණය සිදුනොවේ. නියම නොකොට නිර්මිත කරන ලද්දාහු ඍද්ධිමතා සමාන වූවාහුම වෙති. සිටීම් හිඳීම්, කථාකිරීම්, තෂ්ණීම්භූතාදියෙහි ඍද්ධිමතා යම් යම් දැයක් කරයිද, නිර්මිතයද ඒ ඒ දැයම කරයි. විසදෘශකරණයද, විවිධ ක්‍රියා කරණයද මෙතෙක් මේ ආකාර වෙත්වා. මෙතෙක් මෙනම් දෑ කරත්වායි වෙන් වෙන්ව ආවර්ජනාකොට අදිටන් කිරීමෙන් ඉටුවේ. තථාගතයන් වහන්සේට වනාහි ඒකාවර්ජන අධිෂ්ඨානයෙන්ම නානාප්‍රකාර නිර්මාණ සිදුවේ. එපරිද්දෙන්ම ගිනිකඳ, දියදහර නිමැවුමෙහිද, විවිධ වර්ණ නිමැවුමෙහිද සිදුවේයයි දතයුතුය.

එහි **භගවා චංකමති** යනු ආකාශයෙහි හෝ පෘථුවියෙහි සක්මන් කරයි. **නිම්මිතො** යනු ඍද්ධියෙන් මවන ලද බුදුරුව. **තිට්ඨතිවා** යන ආදියද ආකාශයෙහි හෝ පෘථුවියෙහි, **කප්පෙති** යනු කරයි. **භගවා තිට්ඨති** ආදීන්හිද එම ක්‍රමයමැයි.

**යමක ප්‍රාතිහාර්ය ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

මහා කරුණා ඤාණ නිර්දේශයෙහි, **බහුකෙහි ආකාරෙහි** යනු දැන් කියනු ලබන එකුන් අනූ ආකාරයන්ගෙන්, **පසසනතානං** යනු නැණැසින්ද, බුදුඇසින්ද බලනවුන්ට, **ඔකකමති** බසියි, පිවිසෙයි. **ආදිතෙතා** යනු දුක් ස්වභාව වශයෙන්, පීඩා යෙදීමෙන් තැවීම් අර්ථයෙන් ඇවිලිණි. 'යමක් අනිත්‍යයද, එය දුකයැයි කියන ලද හෙයින්, සියලු සංඛතයාගේම දුක් ස්වභාව වශයෙන් පීඩිත වූ හෙයින් දුකටද, කරුණාවටද මුල්වූ හෙයින් පළමුව දුක් ස්වභාව වශයෙන් ඇවිළුණේ යයි කියන ලදැයි දතයුතුය. රාගාදීන්ගෙන් ඇවිළුණු ස්වභාවය මත්තෙහි කියයි.

නොහොත්, **ආදිතෙතා** යනු රාගාදීන්ගෙන්ම ඇවිළුණේය. මත්තෙහි එයට අන්කිසි නිවීමක් නැතැයි අන්තය බැලීම් වශයෙන් නැවත කියන ලදැයි දතයුතුය. **ලොක සනනිවාසො** යනු පංචස්කන්ධය විනාශවීම් අර්ථයෙන් ලෝක නමැ. තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් මෙහි සත්ත්වයෝ වෙසෙත්නුයි සනනිවාසයි. ලෝකයද සන්නිවාසයද එයමනුයි ලොකසනනිවාසොයි. දුක්විඳින ස්කන්ධ පරම්පරාව දැඩිසේ ගෙන සත්ත්ව ව්‍යවහාරය යෙදෙන හෙයින් ලෝක සන්නිවාස යෝගයෙන් සත්ත්ව සමූහයද ලෝක සනනිවාසොයි. එයද ස්කන්ධ සහිතවමය. **උයයුතෙතා** යනු නොයෙක් කෘත්‍යයන්හි නිතර උත්සාහවත් වන හෙයින් කළ යෝග ඇත්තේ කළ උත්සාහ ඇත්තේ, නිතර කෘත්‍යයන්හි මනාව යෙදුණේයයි යනු කඳු මුදුන්හි සරන ගංගා මෙන් චංචල වූ ගමනින් මරණයට යන්ට අරඹන ලදී. **කුමමගග පටිපනෙනා** යනු පිළිකුල් මිථ්‍යා මාර්ගයට පිළිපන්නේ, මත්තෙහි වනාහි **විපථ පටිපනෙනායි** නොයෙක් පදයන්ගෙන් වෙසෙසා යූ.සේයි.

**උපනීයති** යනු දිරීම් වශයෙන් මරණයට පමුණුවයි. ගෙනයයි දිරීම වනාහි ආයුෂයාගේ හැකිළීමයයි යූ.සේයි. **අදධුවො** යනු ස්ථිර නොවේ. හැමකල්හි එක් ආකාරයකින් නොවේ. යම්හෙයකින් ස්ථිර නොවේද? එහෙයින් පමුණුවයි යන එය ප්‍රථම වචනයට හේතුවචනයයි. එයින් කරුණු සහිත ජරා දුක යූ.සේයි. එම ජරා දුක දැක, ජරාවෙන් දිරායාම් රහිත නැණවත්හු පැවිදිවෙති. **අතාණො** යනු රකින්ට, ආරක්ෂා කරන්ට සමර්ථතායෙන් රහිත වූයේ අනාරක්ෂකයයි යූ.සේයි.

**අනභිසසරො** යනු මනාව සිහිකොට, ඉදිරියට ගොස්, ප්‍රකාශ කිරීමෙන්, සැනසවීමට අපොහොසත් වූයේ, සහායකයෙක් නොමැතියේ

යන අර්ථයි. රැකවරණයක් නොමැතියේද එහෙයින් අතාණ යනු පළමු වචනයට එය හේතු වචනයකි. එයින් කරුණු සහිතව ප්‍රිය විප්‍රයෝග දුක යූ.සේයි. එම ප්‍රිය විප්‍රයෝග දුක දැක ඥාති ව්‍යසන රහිතවද නැණැතියෝ පැවිදි වෙති. **අසසකො** යනු තම සතු කිසි ද්‍රව්‍යොපකරණයක් රහිත වූයේ, **සබබං පහාය ගමනීයං** යනු තම සතු භාණ්ඩයැයි සැලකූ සියල්ල හැර ලොවින් යායුතුය. යම්හෙයකින් සියල්ල හැර යායුතුද එහෙයින් අසසකො යන එය පළමු වචනයට අදාළ වේ. (න+සක = අසසක) එයින් හේතු සහිත මරණ දුක යූ.සේයි. එය දැක භෝග ව්‍යසන රහිතවද, නැණැතියෝ පැවිදි වෙති. අනෙක් අර්ථයෙක්හි, මාණවකය, සත්ත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහුයයි යූ.සේයි. මෙහිද රට්ඨපාල සූත්‍රයෙහිද ස්වකීය නුවූ ලෝකයැයි යූ.සේයි. එය කෙසේ යෙදේද යත්? හැරයාම සඳහා අස්සකයැයි යූ.සේයි. කර්මය නොහැර යා යුතුය. එහෙයින් කර්මය ස්වකීයයැයි යූ.සේ. රට්ඨපාල සූත්‍රයෙහිද එය එසේම යූ.සේයි. 'නුඹ කම් වූ පරිද්දෙන් යන්නෙහි?

**ඌනො** යනු සම්පූර්ණත්වය රහිත, **අතිතෙතා** යනු වඩ වඩා ප්‍රාර්ථනා කිරීමෙහිද තෘප්තියට පත්නුවූයේ, මෙය ඌනතාවයට හේතු වචනයයි. **තණහාදාසො** යනු තෘෂ්ණාවගේ වසඟයෙහි පවත්නා හෙයින් තෘෂ්ණාවට දාස වූයේ. මෙය අතෘප්තිමත් භාවයට හේතු වචනයයි. එයින් කැමැතිවීම් රෝගය පෙන්වීමෙන් හේතුසහිත ව්‍යාධි දුක යූ.සේයි. එම ව්‍යාධි දුක දැක ව්‍යාධි ව්‍යසන රහිතවද නැණැතියෝ පැවිදි වෙති. **අතායනො** යනු පුත්‍රාදීන්ගෙන්ද, ආරක්‍ෂාව නොමැති හෙයින් අතායනයි, අනාරක්‍ෂිතයි. ක්‍ෂෙම නොලැබිය හැකිය යන අර්ථයි. **අලෙණො** යනු ඇලෙන්ට, ඇසුරුකරන්ට නුසුදුසු වූයේ ඇලුණවුන්ටද ආරක්ෂා කටයුතු නොකරන හෙයින්ද **අසරණො** යන නිශ්‍රිතයන්ගේ භය ඉවතට ගෙන නොයනුයේ, භය විනාශ නොකරනුයේ **අසරණීභූතො** උපතට පෙර **තමාගේ අභාවයෙන්ම අසරණ වූයේ,** උපත හා සම කාලයෙහිම අසරණ වූයේ යයි අර්ථයි.

**උදධතො** යනු සියලු අකුසලයන්හි උද්ධච්චයාගේ උපදින හෙයින් සත්ත්ව සන්තානයෙහිද, අකුසල් ඉපදීම් බහුල හෙයින් අකුසලයන් සමග යුත් ලෝකයා ඒ නොසන්සුන්කමින් නොසන්සුන් වූයේ, **අවූපසනෙතා** යනු නොසන්සුන් ලක්‍ෂණයට උදධච්චයාගේම යෝගයෙන් නොසන්සුන් වූයේ බියට පත් මුවෙකු සම වූයේ, 'උපනීයති ලොකො' ආදී සතරෙහිද,

උද්ධතො ලොකො යන පංචස්ථානයන්හි ලොකො යයි සඳහන් විය. සෙස්සෙහි ලොක සතනිවාසයැයි සඳහන් විය. දෙඅයුරින්ම සඳහන් වූයේ ලෝකයමය. **සසල්ලො** යනු පීඩාජනනය කරන හෙයින්ද, ඇතුළත විදින හෙයින්ද, ඉවත් කරලීම දුෂ්කර හෙයින්ද 'සල්ල' යැයි සංඛ්‍යාවට ගියා වූ සල්ලයන් සමග පවත්නා හෙයින්, **විද්ධො** මුව ආදීන් සමහරවිට අන්‍යයන් විසින් විදින ලද්දාහු වෙති. මෙම ලෝකය වනාහි නිතර තමාම විදින ලදී. **පුථුසල්ලෙහි** යනු රාග, ද්වේෂ, මෝහ, මාන, දෘෂ්ටි, ක්ලේශ, දුශ්චරිත යයි කියන ලද සත් සල්ලයන්ගෙන්, **තස්ස** යනු ඒ ලෝක සත්නිවාසයාගේ, **සල්ලානං උද්ධතා** යනු සත්ත්ව සන්තානයෙන් ඒ සල්ලයන් උදුරන පුද්ගලයා, **අඤ්ඤත්‍රමයා** යනු මා හැර, භාග්‍යවතුන් වහන්සේගේ යම් ශ්‍රාවකයෝ හුල් උදුරත්ද, ඔවුන් භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙන්ම උදුරන හෙයින් භාග්‍යවතුන් වහන්සේ උදුරති නමැ. **අවිජ්ජන්ධකාරාවරණො** යනු අවිද්‍යාවම ස්වාභාවික දර්ශනය ආවරණය කිරීමෙන් අන්ධයෙකු මෙන් කෙරේනුයි අවිජ්ජන්ධකාරොයි. එයම ස්වභාවික ගමන වැළැක්වීමෙන් එය ආවර්ණය කෙරේනුයි අවිද්‍යාන්ධකාර ආවරණයි. **කිලෙස පඤ්ජර පක්ඛිතො** යනු කෙලෙසුන්ම කුසල් ගමන අවහිර කරන අර්ථයෙන් කුඩුවක් වූයේනුයි කෙලෙස් පඤ්ජරයි. අවිද්‍යා ප්‍රභව වූ කෙලෙස් කුඩුවෙහි බහාලන ලද්දේ, හෙළන ලද්දේ, **ආලොකාං දස්සතා** යනු ප්‍රඥාලෝකය දක්වන සුලුවූයේ. ප්‍රඥාලෝකයාගේ ස්වභාවය දක්වනසුලු වූයේ යයි අර්ථයි. **අවිජ්ජාගතො** යනු අවිද්‍යාවට ගියේ පිවිසියේ, හුදෙක් අවිද්‍යාවගේ ආවරණ මාත්‍රයම පමණෙක් නොවේ. තවද ග්‍රහණ වශයෙන් අවිද්‍යා කෝෂයෙහි ඇතුළට පිවිසියේයයි ප්‍රථම සඳහනට වඩා විශේෂයයි. **අණ්ඩභූතො** යනු බිජුවටක්වැ උපන්නේ යම්සේ වනාහි බිත්තරයෙහි උපන්නා වූ ඇතැම් සත්ත්වයෝ අණ්ඩභූතායි කියත්ද? එසේ මෙම ලෝකය අවිද්‍යා අණ්ඩකෝෂයෙහි උපන් හෙයින් අණ්ඩභූතයයි යූ.සේයි. **පරියොනද්ධො** යනු ඒ අවිද්‍යා අණ්ඩකෝෂයෙන් හාත්පසින් ඔතන ලද්දේ, බඳනා ලද්දේ වෙළන ලද්දේ වේ.

**තන්තාකුලක ජාතො** යනු නූලක් අවුල් වුණාක් මෙන්, යම්සේ නම්, නොමනාව බහා තැබූ, මීයන් විසින් කපන ලද පේෂකාර්මිකයන්ගේ හූවට ඒ ඒ තන්හි ආකුල වේද? මේ අග කොටසය. මේ මුල කොටසයැයි, අගින් අග මුලින් මුල සම කරන්ට දුෂ්කර වේද? එපරිද්දෙන්ම සත්ත්වයෝ ප්‍රත්‍යයාකාරයන්හිද, පැකිළුණාහු ආකුල ව්‍යාකුල වෙත්ද? ප්‍රත්‍යයාකාරයන් ඍජු කරන්ට නොහැකි වෙති. එහි නූල එක් එක් පුද්ගලයාට, වෙන් වෙන්

වූ පුරිස ක්‍රියාකාරිතවයෙහි පිහිටා ප්‍රත්‍යයාකාර ඤාණය ඍජු කරන්ට හැකිවන්නේද? බෝධිසත්ත්ව දෙදෙනෙක් හැර අන් සත්ත්වයෙක් තමාගේ ශක්තියෙන් ප්‍රත්‍යයාකාර ඤාණය ඍජු කරන්ට සමර්ථයෙක් නම් නැත. යම්සේ නම් ආකුල වූ තන්තුව කැඳ දමා, බුරුසුවෙන් පහරනුයේ ඒ ඒ තන්හි අවුල් වූයේ ගැට බැඳුණේ වෙයි. එසේ මෙම ලෝකය ප්‍රත්‍යයන්හි පැකිළී ප්‍රත්‍යයෙහි සිත ඍජු කරන්ට නොහැකි වන්නාහු, දෙසැට දෘෂ්ටිගත වශයෙන් අවුල් වූයේ, ගැට බැඳුණේ වේ. යම් ආකාර දෘෂ්ටි නිශ්‍රිත ඒ සියල්ලෝම දෘෂ්ටි ඍජු කරන්ට නොහැක්කාහුමය. ගුලාගුණ්ඩිකජාතො යනු ගුලාගුණ්ඩිකයක් මෙන් වූයේ; පේෂකාර කැඳහුය < ගුලා ගුණ්ඩික යැයි කියු ලැබේ.

ගුලා නමැති පක්ෂීහු වර්ගයක් වෙති. එම පක්ෂියාගේ කැදැල්ල යයිද ඇතැමෙක් කියති.

එම ද්වයයම ආකුලය. අගින් අග, මුලෙන් මුල සමකරන්ට දුෂ්කර යැයි පළමු ක්‍රමයෙන්ම යෙදිය යුතුය. මුඤ්ජබබ්බජභූතො යනු මුඤ්ජ තෘණ හා බබ්බජ තෘණ මෙන් වූයේ, මුඤ්ජතෘණ බබ්බජ තෘණ මෙන් හට ගත්තේය. යම්සේ වනාහි එම තෘණ කොටා (තළා) කළ රැහැණ දිරූ කල්හි කිසියම් තැනෙක්හි වැටුණේ ගෙන, එම තෘණවල මෙය අගය, මෙය මුලයැයි අගින් අග, මුලින් මුල සමකරන්ට දුෂ්කරය. එයද තම පුරුෂ වීර්යය යොදා ඍජු කරන්ට හැකිවන්නේය.

බෝධිසත්ව දෙදෙනෙකු හැර අන් සත්ත්වයෙක් තමාගේ ශක්තියෙන් ප්‍රත්‍යයාකාර ඤාණය ඍජු කරන්ට සමර්ථ වූයේ නම් නොවේ. මෙසේ මේ ලෝකයා ප්‍රත්‍යයාකාර ඤාණය ඍජු කරන්ට, නොහැකි වනුයේ දෙසැට දෘෂ්ටිගත වශයෙන්ම ගැට හටගත්තේ වී, සැපයෙන් පහවූ, දුකට හේතු වූ, විවසව පතිත වන සංසාරය නොඉක්මවයි. එහි අපායො යනු නිරය, තිරිසන් යෝනිය, ප්‍රේත විෂය, අසුරකාය යන සතරයි. සියළුම තිවෘතත සංඛ්‍යාත සුව දායකත්වයගේ අභාවය හෙයින් අපාය යැයි යු.සේයි. එසේම දුක්ඛයාගේ ස්වභාව හෙයින් දුගගතියි. සුව ශරීරයෙන් විවසව පතිත වන හෙයින් විනිපාතො; අනෙකක් වනාහි,

ඛන්ධානඤ්ච පටිපාටි - ධාතු ආයතනනානිච
අබ්බොච්ඡින්නං වත්තමානා - සංසාරොති පවුච්චති

ස්කන්ධ, ධාතු, ආයතනයන්ගේ පිළිවෙළ නොසිඳී පැවැත්ම සංසාරයැයි කියනු ලැබේ. ඒ සියල්ලම ඉකුත් නොකරයි. නොඉක්මවයි. තවද, චුතියෙන් ප්‍රතිසන්ධියද ප්‍රතිසන්ධියෙන් චුතියදැයි මෙසේ නැවත නැවත චුති ප්‍රතිසන්ධීන්ගනු ලබන්නේ, ත්‍රිවිධ භවයන්හි සිව් යෝනීන්හි, පඤ්ච ගතීන්හි, සප්ත විඤ්ඤාණස්ථිතීන්හි, නව සත්තාවාසයන්හි, මහා සමුද්‍රයෙහි ඇතුල් කළ නැවක් මෙන්, යන්ත්‍රයෙහි යොදවන ලද ගොණෙකු මෙන්ද පරිභ්‍රමණය වේමැයි. **අවිජ්ජා විසදොස සලලිතෙතා** යනු අවිද්‍යාවම අකුසල් ඉපැත්මෙන් කුසල් ජීවිත නසන හෙයින් විසනුයි අවිජ්ජා විසංයි. එය චිත්ත සන්තානය දූෂණය කරන හෙයින් අවිජ්ජා විසදොසොයි. ඉන් යටපත් වූ හා නැගී සිටුනා දුශ්චරිත ස්වභාවයෙන් බොහෝ තැවරුණේ, ආලේප කරන ලද්දේනුයි අවිජ්ජා විසදොස සලලිතෙතායි. **කිලෙස කලලී භූතො** අවිද්‍යාදී මූලික කෙලෙස් ගිලාබැසීම් අර්ථයෙන් කලල, මඩනුයි කිලෙස කලලංයි. එය මොහුට ඇත්තේනුයි කිලෙස කලලියි. මෙසේ වූයේ. **රාගදොස මොහ ජටා ජටිතො** යනු ලෝභ, කෝප, අවිද්‍යා සංඛ්‍යාත - රාග, ද්වේෂ මෝහ යන මෙබඳු රූපාදී අරමුණුවල, යට මතු වශයෙන් නැවත නැවත උපත්නා හෙයින් එකට එකතුකොට මැසීම් (ගැටගැසීම්) අර්ථයෙන් උණපඳුරු ආදී, සාඛාජාල සංඛ්‍යාත ගෙතුම මෙනැයි ජටායි. ඒ රාග, ද්වේෂ, මෝහ ආදී ගෙතුමෙන් ගෙතුණේ (අවුලෙන් අවුලට පත්වූයේ) යම්සේ නම් උණපඳුරු ආදීන් සමග උණපඳුරු ආදීන් මෙන් මෙසේ ඒ අවුලෙන් මේ ලෝකය (ලෝවැසියා) ගැට ගැසුණේය. වෙළුණේය. මසන ලද්දේයයි අර්ථයි. **ජටං විජටෙතා** යනු මෙසේ මේ ත්‍රෛලෝක ධාතුව, ගැට ගසා සිටි ගැටය ලිහනුයේ, මනාව සිඳලනුයේ, මනාව ප්‍රදාලනය කරනුයේ **තණ්හා සංඝාට පටිමුකෙකා** යනු තෘෂ්ණාවම නොසිඳී පවත්නා හෙයින් එක්කොට බැඳීම් අර්ථයෙන් සංඝාටනුයි තෘෂ්ණා සංඝාටයි. ඒ තෘෂ්ණා බන්ධනයෙහි බැඳුණේ මනාව පිවිසියේ, ඇතුළත් වූයේනුයි තණ්හා සංඝාට පටිමුකෙකා, **තණ්හාජාලෙන ඔත්ථටො** යනු තෘෂ්ණාවම පෙර කියන ලද ආකාරයෙන්, එකට එකතුකොට මැසීම් අර්ථයෙන් ජාලයනුයි තෘෂ්ණා ජාලයයි. ඒ තෘෂ්ණා ජාලයෙන් මඩනා ලද්දේ හාත්පසින් වසන ලද්දේ මනාව වෙළන ලද්දේ වේ. **තණ්හා සොතෙන වුයහති** යනු තෘෂ්ණාවම සංසාරයෙහි ඇදගෙන යන අර්ථයෙන් ස්‍රෝතය නුයි තෘෂ්ණා ස්‍රෝතයි. ඒ තෘෂ්ණා ස්‍රෝතයෙන් පාවීයයි. ඇදගෙන යනු ලැබේ. **තණ්හා සංයෝජනෙන සඤ්ඤුතෙතා** යනු තෘෂ්ණාව ලෝකයා සංසාර වෘත්තයෙහි එකට යොදන හෙයින්, බන්ධනය කරන හෙයින් තෘෂ්ණා සංයෝජනයි. එම තෘෂ්ණා සංයෝජනයෙන් යුක්ත වූයේ බද්ධ

වූයේ, **තණ්හානුසයෙන අනුසටො** යනු තෘෂ්ණාවම අප්‍රකටව පැවතීම් අර්ථයෙන් අනුසය නුයි තෘෂ්ණානුසයොයි. ඒ තෘෂ්ණා අනුසයෙන් විසුරුවන ලද්දේ, අනුව ගියේ, ශක්තිමත් වූයේ, **තණ්හා සන්තාපෙන, සන්තපපති** යනු තෘෂ්ණාවම ප්‍රවෘත්ති කාලයෙහිද ඵලකාලයෙහිද, ලෝකයා තවයි නුයි සන්තාපොයි. ඒ තෘෂ්ණා සන්තාපයෙන් තවයි තවනු ලැබේ. **තණ්හා පරිළාහෙන පරිඩය්හති** යනු තෘෂ්ණාවම බලවත් වූයේ ප්‍රවෘත්ති කාලයෙහිද, ඵල කාලයෙහිද හාත්පසින් දවන අර්ථයෙන් මහා දාහයනුයි තණ්හා පරිළාහොයි. ඒ තෘෂ්ණා දාහයෙන් මනාව දවයි. හාත්පසින් දවයි. දෘෂ්ටි සංඝාටාදීහුද මෙම ක්‍රමයෙන්ම යෙදිය යුත්තාහ.

**අනුගතො** යනු ඇතුළට වැදුණේ **අනුසටො** යනු ලුහුබඳිනුයේ, අභිභූතො යනු පීඩාවට පත්වූයේ. **අබ්භාහතො** යනු මනාසේ පහරදුන්, අබිමුව, බොහෝසේ පහරදෙන ලදුයේ, **දුක්ඛෙ පතිට්ඨිතො** යනු දුකෙහි පිහිටි ස්කන්ධ පංචකයෙහි සුවයැයි විපර්යාසයෙන් ගත් දෘෂ්ටියෙහි පිහිටියේ ඇතුළට බැස සිටියේ, **තණ්හාය උඩ්ඩිතො** යනු තෘෂ්ණාවෙන් උඩින් පැන යන ලද්දේ (පියඹා ගියේ) ඇස වනාහි තෘෂ්ණා රැහැණින් අවුණා රූපය නමැති නාගදත්තයෙහි පියඹා ගියේ, ශ්‍රෝතාදීන් තෘෂ්ණා රැහැණින් අවුණා ශබ්දාදී නාගදන්තයන්හි පියඹා ගියාහු, එයින් යුක්ත ලෝකයාද පියඹා ගියේ නමැ. **ජරා පාකාර පරික්ඛිත්තො** යනු නොඉක්මවීම් අර්ථයෙන් ප්‍රාකාරයක් සමාන වූ ජරාවෙන් පිරිවරන ලද්දේ, **මච්චුපාසෙන පරික්ඛිත්තො** යනු, මිදීම් දුෂ්කරාර්ථයෙන් මළපුඩුවක් බඳු වූ මරණයෙන් බඳනා ලද්දේ, **මහා බන්ධන බද්ධොති** යනු දැඩි බැවින්ද, සිඳීම දුෂ්කර හෙයින්ද, මහත් වූ බන්ධනයන්ගෙන් බද්ධ වූ, **රාග බන්ධනෙන** යනු රාගයම බඳියි. සංසාරයෙන් සෙලවෙන්ට නොදෙයිනුයි රාග බන්ධනයයි, ඒ රාග බන්ධනයෙන් සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**කිලෙස බන්ධනෙන** යනු දක්වන ලද ඒවායින් සෙසු ක්ලේශ බන්ධනයෙන්, **දුච්චරිත බන්ධනෙන** යනු ත්‍රිවිධ දුශ්චරිත බන්ධනයෙන්, සුචරිතය වනාහි බන්ධන මෝක්ෂයට හේතු වූවක්ද බන්ධන මෝක්ෂ වූවක්ද ඇත. එහෙයින් එය නොගත යුතුය. **බන්ධනං මොචෙතා** යනු එම බන්ධනය මුදවන, බන්ධනයෙන් ඔහු මුදවයි යන අර්ථයි. **මහා සම්බාධ පටිපන්නො** යනු කුසල් හැසිරීම් පීඩනයෙන් මහා සම්බාධ සංඛ්‍යාත වූ, රාග, ද්වේෂ, මෝහ, මාන, දෘෂ්ටි ආදී කෙලෙස් දුශ්චරිත සමූහයට පිළිපන්නේ, **ඔකාසං දස්සෙතා** යනු ලෞකික ලෝකෝත්තර සමාධි ප්‍රඥා

ප්‍රතිලාභ සඳහා අවකාශ දක්වනුයේ, **මහා පළිබොධෙන පළිබුද්ධො** යනු මහා වැළැක්මෙන් වටකරන ලද්දේ, මහාලේපයෙන් ආලේප කරන ලද්දේ, පළිබෝධ යනු රාගාදී සත්වැදෑරුම් වූයේමය. තෘෂ්ණා දෘෂ්ටි පළිබෝධයැයි ඇතැමෙක් දක්වති. **පළිබොධං ජෙතා** යනු ඒ පළිබෝධය සිඳුණා වූ, **මහා පපාතෙ** යනු පඤ්චගතික වූ ප්‍රපාතයෙහි, ජාති ජරා මරණ ප්‍රපාතයෙහි හෝ ඒ සියල්ල එතෙරවීම දුෂ්කර අර්ථයෙන් ප්‍රපාත නමැ. **පපාතා උද්ධතා** යනු ඒ ප්‍රපාතයෙන් උදුරනු ලැබූවාහු, **මහා කන්තාර පටිපන්නා** යනු ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාස නමැති කාන්තාරයට පිළිපන්නේ, ඒ සියල්ලම ඉක්මවා යාම දුෂ්කර අර්ථයෙන් කාන්තාර නමැ. එම කාන්තාර එතෙර කරවන්නා වූ **තං කන්තාරං තාරෙතා** කන්තාර තාරෙතායිද පාඨයි. **මහා සංසාර පටිපන්නා** යනු නොසිඳී පවත්නා ස්කන්ධ සන්තානයට පිළිපන්. **සංසාර මොචෙතා** යනු සසරින් මුදවන්නා වූ, සංසාරා මොචෙතායිද පාඨයි.

මහා විදුග්ග යනු සංසාර නමැති දුර්ගමස්ථානයෙහි, සසරම ගමන් කිරීමට දුෂ්කර හෙයින් දුර්ගයැයි කියනු ලැබේ. **සම්පරිවත්තන්ති** යනු බොහෝසෙයන් නැවති නැවතී හැසිරෙයි. එහිම කැරකෙයි. මහා **පලිපෙ** යනු මහත් වූ කාම මඩ ගොහොරුවෙහි, කාමය වනාහි කිඳබසින අර්ථයෙන් පලිප නමැ. **පළිපන්නා** යනු ඇළුණේ, මහා පලිප පළිපන්නායිද පාඨයි.

අබ්භාහතො යනු සියලු උපද්‍රවයන්ගෙන් මඩනා ලද්දේ, **රාගග්ගිනා** යනු රාගාදීහුම මනාකොට දවන අර්ථයෙන් අග්ගයි. එම රාග ගින්නෙන්, සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **උන්නීතකො** යනු ඔසවා ගෙනයන ලද්දේ, ජාතියෙන් ඔසවා ජරා ආදී උපද්‍රවයට ගෙනයන ලදැයි අර්ථයි. මෙහි 'ක' කාරය අනුකම්පා අර්ථයෙහි දතයුතුය.

**හඤ්ඤන්ති නිච්ච මතාණො** යනු ආරක්ෂකයෙකු රහිතව නිතර පෙළේ. **පත්ත දණ්ඩො** යනු රාජාදීන්ගෙන් ලද අණ ඇතියේ, **තක්කරො** යන සොරහු. **වජ්ජ බන්ධන බද්ධො** යනු රාගාදී දොස් බන්ධනයන්ගෙන් බද්ධ වූයේ, **ආඝාත පච්චුපට්ඨිතො** යනු මරණ ස්වභාවය නමැති දම්ගෙඩිය පිහිටි තැනට එළඹ සිටියේ, **කිසියම් මුදවන්නෙක්, කොච් බන්ධනා** මොචෙතායිද පාඨයි. **අනාථො** යනු ඔහුට පිහිටවන ස්වාමියෙක් නැත. තෙමේ හෝ තමාම පිහිටවූයේ, ස්වාමි වූයේ නොවේනුයි අනාථයි.

අසරණයයි යනුද අර්ථයි. **පරම කාපඤ්ඤප්පත්තො** යනු ජරාදීන්ගේ ප්‍රතිබාහනයෙහි නොපොහොනා හෙයින් අතිශය දිළිඳු බවට පත්වූයේ, **තායෙතා** යනු රකින්නහු. තායිතා යන පාඨය වඩා යෝග්‍යයි.

**දුක්ඛාභිතුණ්ණො** යනු ජාති දුක්ඛාදී නොයෙක් දුක්ඛයන්ගෙන් මඩනා ලද්දේ, අතිශයින් පීඩාවූයේ, අතිශයින් කම්පිත වූයේ වේ. **චිරරත්ත පිළිතො** යනු දුක්ඛයන්ගෙන්ම ඉතා දීර්ඝ කාලයක් පීඩිත වූයේ, ගැටුණේ වේ. **ගධිතො** යනු බලවත් ඇල්මෙන් ගිජුවූයේ අභිධ්‍යා කාය ග්‍රන්ථයෙන් හෝ වෙළනලදුයේ, **නිච්චං පිපාසිතො** යනු පානය කරන්ට, බුදින්ට කැමැත්ත පිපාසායි. තෘෂ්ණා පිපාසායෙන් නිරතුරු පිපාසිත වූයේ, **අන්ධො** යනු දර්ශනාර්ථයෙන් චක්ෂුයයි සංඛ්‍යාවට ගිය ප්‍රඥාවෙහි අභාවයෙන් කණවූ, ප්‍රඥාව චනාහි ධර්ම ස්වභාව දකියි. **අචක්ඛුකො** යනු එම අන්ධතාව පසුව ජනිත වූවක් නොව, ප්‍රකෘතියෙන්ම අවිද්‍යමාන චක්ෂුකයායි එයම අන්ධතාව විශේෂයෙන් දක්වයි. **හත නෙත්තො** යනු ගෙන යන අර්ථයෙන් නේත්‍රයයි සංඛ්‍යාවට ගිය ප්‍රඥාවගේ අභාවයෙන්ම නට නෙතැත්තහු, සම විසම දර්ශනය කරනුයේ ආත්මභාවය ගෙනයයි නුයි නෙත්‍රයයි යු.සේයි.

ප්‍රඥාවෙන් සුගතියටද, අගතියටද ගෙනයයි. නටනෙත් ඇත්තාවූම, මොහුගේ ගෙනයාමෙහි අභාවය දක්වන්නේ **අපරිණායකො** යි දෙසූහ. අවිද්‍යමාන නෙතැත්තහුයැයි අර්ථයි. ඔහුට අන්‍ය වූද, නෙත්‍ර විද්‍යමාන නොවේයයි යු.සේයි. **විපථ පක්ඛන්තො** විපරීත වූ, විසම වූ හෝ මාර්ගය විපථයි. එම විපරීත මාර්ගය ඇතුළට වැදුණේ, පිවිසියේ, පිළිපන්නේනුයි විපථ පක්ඛන්තොයි. මිථ්‍යා මාර්ග සංඛ්‍යාත මිථ්‍යා දෘෂ්ටියට පිළිපන්නේ යයි අර්ථයි. **අඤ්ජසාපරද්ධො** යනු මාර්ගයෙහි, ඍජු මාර්ගයෙහි මධ්‍යම ප්‍රතිපදාවෙහි වැරැදි ලෙස කළේය. වැරැද්දේය. **අරියපථං ආනෙතා** යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයට ගෙනඑනු ලබන්නා වූ එළවනු ලබන්නා වූ **මහොඝ පක්ඛන්තො** යනු යමෙකුට එය විද්‍යමාන වේද? ඔහු සසර වෘත්තයෙහි ඇතුළට දමයි. ගිලාබස්වයිනුයි ඔඝායි. ප්‍රකෘති ඕඝයට වඩා මහත් වූ ඕඝයනුයි මහොඝායි. ඒවා කාමොඝ, භවොඝ, දිට්ඨිඕඝ, අවිජ්ජා ඕඝ යයි සතරාකාරයි. ඒ මහෝඝයන්හි ඇතුළට වැදුණේ පිවිසියේනුයි මහොඝ පක්ඛන්තොයි. සංසාර සංඛ්‍යාත වූ මහෝඝයෙහි හෝ ඇතුළට වැදුණේ වේ.

දැන් එකින් එක මත්තෙහි වැඩිවන ක්‍රමයයි. එහි ද්වීහි දිට්ඨිගතෙහි යනු ශාශ්වත උච්ඡෙද දෘෂ්ටීන්ගෙන්, එහි දෘෂ්ටියම දෘෂ්ටිගතයි. අසූචි සමග මුත්‍ර සමග යුක්ත වූයේ යයි යන ආදීන්හි මෙනි. යායුතු දැයක් නොමැති හෙයින්ද එය දෘෂ්ටියගේම ගමන් මාත්‍රයමනුයිද දෘෂ්ටිගතයි. දෘෂ්ටීන්හි ඇතුළත් වූ මෙම දර්ශනය දෙසැටක් දෘෂ්ටීන්හි ඇතුළත් වූ හෙයින්ද දෘෂ්ටිගතයි. දෙසැටක්, තෙසැටක් දෘෂ්ටීහුද ශාශ්වත දෘෂ්ටි-උච්ඡේද දෘෂ්ටි යැයි දෘෂ්ටීහු ද්වයයක්ම වෙති. එහෙයින් සංක්ෂෙප වශයෙන් සියලු දෘෂ්ටීහු ඇතුළත් කරනුයේ ද්වි දෘෂ්ටි ගතයන්හි යැයි යූ.සේයි. පරියුට්ඨිතො යනු හාත්පසින් මැඩගෙන මතුවීමට පත්වූයේ නිතර පැවැත්මට පත්වූයේ, ඉපැත්මට නොදීමෙන් කුසල් වාරයෙහි ග්‍රහණයට පත්වූයේ යයි අර්ථයි. භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මහණෙනි, දෙවැදෑරුම් දෘෂ්ටිගතයන්ගෙන් හාත්පසින් මැඩගෙන සිටියා වූ, දිව්‍ය මනුෂ්‍යයන් අතර ඇතැමෙක් පසුබසිති. ඇතැමෙක් අතිධාවනය කෙරෙති. චක්ඛුමන්තුම මනාසේ දකිත් ආදිය.

තීහි දුච්චරිතෙහි යනු ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන්, සිව් වැදෑරුම් වාග් දුශ්චරිතයෙන්ද, ත්‍රිවිධ මනො දුශ්චරිතයෙන්ද වශයෙනි. විප්පටිපනෙනා යනු නොමනා අයුරින් පිළිපන්නේ, වැරැදි අයුරින් පිළිපන්නේ යයි අර්ථයි.

යොගෙහි යුතෙතා යනු වෘත්තයෙහි යොදවත්නුයි යොගායි. විපත්ති අර්ථයෙන් හෝ යෝගායි. එම යෝගයන්ගෙන් යුක්ත වූයේ පෙළන ලද්දේ, චතුයොග යොජිතො යනු කාම, භව, දිට්ඨි අවිජ්ජා යන මෙම සිව් යෝගයන්ගෙන්, ගැලෙහි යෙදූවාක් මෙන් සංසාර වෘත්තයෙහි යොදන ලද්දේ, පංචකාම ගුණයෙන් යුත් රාගය කාමයෝගයි. රූපාරූප භවයන්හි කැමැත්ත හා ඇල්මද, ධ්‍යාන තෘෂ්ණාවද ශාස්වත දෘෂ්ටිය සමග හටගත් රාගයද භව වශයෙන් ප්‍රාර්ථනාවද, භවයෝගයයි. දෙසැටක් දෘෂ්ටීහු දෘෂ්ටි යෝගයයි. බුද්ධාදී අටතන්හි නොදැන්ම අවිද්‍යා යෝගයයි. එම සතරමා බලවත් වූයේ ඕසයැයිද ඒවා දුර්වල වූවාහු යෝග නමැ.

චතූහි ගන්ථෙහි යනු යමෙකුට එය විද්‍යමාන වෙත්ද? ඔහු චුතිප්‍රතිසන්ධි වශයෙන් සසර වෘත්තයෙහි වෙළයි. ගළපයි නුයි ග්‍රන්ථයි. ඒවා, අභිධ්‍යා, ව්‍යාපාද, සීලබ්බත පරාමාස, ඉදං සච්චාභිනිවෙස (මෙයම සත්‍යය. අනෙක් සියල්ලම බොරුය) වශයෙන් සිව්ආකාරය. දැඩි ලෙස

ආශා කෙරේ. තෙමේ හෝ දැඩි ලෙස ආශා කෙරේ. දැඩි ලෙස ආශා කිරීම් මාත්‍රයම එයමනුයි අභිධ්‍යා නම් වන්නේය. ලෝභයමය. නාමකය වෙළයි. චුති ප්‍රතිසන්ධි වශයෙන් සසර වෘත්තයෙහි ගළපයිනුයි කාය ග්‍රන්ථයි. කෝපයට පත්වේ. එයින් සිත කුණුවූ ස්වභාවයට පත්වේ. කෝපයට පත් කෙරේනුයි හෝ සංවරසීලි පැවතුම්, රූප සම්පත්ති හිතසුව ආදියි නොමගට පෙරළේනුයිද ව්‍යාපාදයි. මෙයින් බාහිර ශ්‍රමණ බ්‍රාහ්මණයින්ගේ සීලයෙන් ශුද්ධිය වේ. ව්‍රතයෙන් ශුද්ධිය වේ. සීල ව්‍රතයෙන් ශුද්ධිය වේයයි අල්ලාගැනීම සීලබ්බත පරාමාසයයි. සර්වඥ භාෂිතයද ප්‍රතික්‍ෂෙප කොට ලෝක ශාශ්වතය මෙයම සත්‍යය. අන් සියල්ල හිස්යැයි ආදී ආකාරයෙන් තදින් ඇලී පවතීනුයි ඉදං සච්චාභිනිවෙසයි. ඒ සිව් වෙළුම්වලින් වෙළන ලද්දේ බඳනා ලද්දේ යයි අර්ථයි.

**චතුහි උපාදානෙහීති** යනු බොහෝ සේ ගනිත්. දැඩිව ගනිත්නුයි උපාදානයි. ඒවා කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද උපාදාන යැයි සිව් ප්‍රභේදයි. වස්තු සංඛ්‍යාත වූ කාමය තදින් අල්ලා ගනීනුයි කාමූපදානයි. කාමයද උපාදානයද එයම වූයේ නුයි කාමූපාදානයි. දෘෂ්ටියද උපාදානයද එයමනුයි දෘෂ්ටි උපාදාන නම් වේ. ආත්මයද ලෝකයද ශාශ්වත යැයි ආදීන්හි ප්‍රථම දෘෂ්ටිය මතු දෘෂ්ටිය තදින් ගනියි. සීල හා ව්‍රතය තදින් ගනීනුයි සීලබ්බතුපාදානයි. ගවසීල, ගවව්‍රත ආදීන්ගෙන් මෙසේ විශුද්ධිය වේයයි තදින් එල්බ සිටීම තෙමේම තදින් ගනීනුයි උපාදානයෝයි. එය කරණකොට කථා කෙරේනුයි වාදයි. එයින් තදින් ගනීනුයි උපාදානයි. කුමක් කියයි හෝ තදින් ගනියි නම් වේද? ආත්මවාදයයි ආත්මවාද මාත්‍රයම හෝ එය කරණකොට ආත්මයයි තදින් ගැනීම හෝ ආත්මවාද උපාදානයයි. මෙම දෘෂ්ටිද්වයය හැර සියලුම දෘෂ්ටීහු දෘෂ්ටි උපාදානයි. එම සිව් උපාදානයන්ගෙන් තදින් ගනිත්නුයි බොහෝකොට ගනිත්නුයි උපාදානයි. උපාදියති යනුද පාඨයි. ලෝකයා තදින් ගැනීම්වලින් ඒ ඒ අරමුණ තදින් ගනී යන අර්ථයි.

**පඤ්චගති සමාරූළ්හා** යනු යහපත් අයහපත් කරුණුවලින් පමුණුවයි එළැඹේනුයි ගතියි. අවකාශ සහිත ස්කන්ධ නිරය, තිරිසන්යෝනිය, ප්‍රේත විෂය, මිනිස් ලොව, දෙව්ලොව යන මෙම පඤ්ච ගතීහු බැසගැනීම් භාවයෙන් බොහෝකොට නැගී සිටියේ; **පඤ්ච කාම ගුණෙහි** යනු රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සංඛ්‍යාත වූ වස්තු කාම කොටස්වලින්, **රජ්ජති** තුනුවණින් මෙනෙහි කිරීම් හේතුයෙන් රාගය

ඉපදීමෙන් ඒ හා සමග ඇලෙනු ලැබේ. තදින් ඇලීම් බව කෙරේයයි අර්ථයි. පඤ්චහි නීවරණෙහි යනු සිත වළක්වති. හාත්පසින් වෙළාගනිත්නුයි නීවරණයි. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා සංඛ්‍යාත පංච නීවරණයන්ගෙන්; ඔත්ථටො යනු මතුයෙහි මඩනා ලද්දේ වසන ලදුයේ

ඡහි විවාද මූලෙහි, යනු විවාදයට මුල්වූ කරුණු සයකින්, දෙසූ පරිදි, මහණෙනි මේ විවාදමූල සයකි. කවර සයෙක්ද යත්? මහණෙනි, මෙ සස්නෙහි භික්ෂුව ක්‍රෝධ කරනුයේ, වෛර කරනුයේ වේද? මහණෙනි, යම් ආකාර වූ එම භික්ෂුව ක්‍රෝධ කරනුයේ වෛර කරනුයේ වේද? හෙතෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහිද, ධර්මයෙහිද, සංඝයා කෙරෙහිද ගෞරව රහිත වූයේ අකීකරු වූයේ, ශික්ෂාවෙහිද පරිපූර්ණත්වයට පත් නුවූයේ වෙසේ. මහණෙනි, යම් ඒ භික්ෂුවක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි, සංඝයා කෙරෙහිද ගෞරව රහිත වූයේ අකීකරු වූයේ ශික්ෂාවෙහිද පරිපූර්ණත්වයට පත් නුවූයේ වෙසේද? හෙතෙම සංඝයා කෙරෙහි විවාද ජනනය කරයි. එම විවාදය බොහෝ ජනයාට අහිත පිණිස, බොහෝ ජනයාට නොසුව පිණිස, බොහෝ ජනයාට අනර්ථ පිණිස දෙව් මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස පවතී. මහණෙනි, නුඹලා මෙබඳු වූ විවාද මූලයක් ආධ්‍යාත්මිකව හෝ බාහිරව දකින්නාහුද? මහණෙනි, නුඹලා එහිදී, එම පාපී වූ විවාද මූලයාගේම ප්‍රහාණය සඳහා උත්සාහ කෙරෙත්වා. මහණෙනි, නුඹලා මෙබඳු වූ විවාද මූලයක් ආධ්‍යාත්මිකව හෝ බාහිරව නොදක්නාහුද? මහණෙනි, නුඹලා එහිදී එම පාපී විවාද මූලයාගේ මතු නොවැගිරීම සඳහා පිළිපදිනු යෙහෙකි. මෙසේ එම පාපී විවාද මූලයෙහි ප්‍රහාණය වේ. මෙසේ එම පාපී විවාද මූලයාගේ මත්තෙහි නොවැගිරීම වේ.

නැවතද මහණෙනි, භික්ෂුව අන් ගුණ මැකීම් ස්වභාව ඇත්තේද අන්‍යයන්ගේ දොස් කියනුයේ, මායාකාරී වූයේ පව්ටු අදහස් ඇත්තේ වේද, මිථ්‍යාදෘෂ්ටික වූයේ තම දෘෂ්ටියම ස්පර්ශ කර සිටින්නේ වේද, අත්නොහැර අල්ලාගන්නා කුම්භීලග්‍රාහී වේද? තම දෘෂ්ටිය අත්හැරීම දුෂ්කරද? මහණෙනි, යම් ඒ භික්ෂුවක් තම දෘෂ්ටියම ස්පර්ශ කර සිටීද? අත්නොහැර අල්ලාගන්නා ස්වභාවය වේද? තම දෘෂ්ටිය අත්හැරීම දුෂ්කර වේද, හෙතෙම බුදුරදුන් කෙරෙහිද -පෙ- මත්තෙහි

එහි 'කොධනො' යනු කිපීම් ලක්ෂණයෙන් යුත් ක්‍රෝධයෙන් යුක්ත වූයේ, 'උපනාහී' යනු වෛරය අත්නොහරින ලක්ෂණයෙන් යුත් වෛරයෙන් යුක්ත වූයේ, 'අහිතාය දුකඛාය දෙවමනුසසානං' යනු භික්ෂූන් දෙනමකගේ විවාදය කෙසේ දෙව් මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස පවතීද? කොසම්බකඛන්‍ධකයෙහි මෙන් භික්ෂූන් දෙනමක් විවාදයට පත් කල්හි, එම විහාරයෙහි ඔවුන්ගේ අතවැස්සෝ විවාද කරති. ඔවුන්ගේ අවවාද ගන්නා වූ භික්ෂුණී සංඝයාද විවාද කරයි. ඉන්පසු ඔවුන්ගේ උපස්ථායකයෝ විවාද කරති. ඉක්බිති මිනිසුන්ගේ ආරක්‍ෂක දේවතාවෝ දෙකොටස් වෙති. ධර්මවාදීන්ගේ ආරකෂක දේවතාවෝ ධර්මවාදිනියෝ වෙති. අධර්මවාදීන්ගේ අධර්මවාදිනියෝ වෙති. ඉක්බිති ආරක්ෂක දේවතාවන්ගේ මිත්‍රවූ භූම්‍යස්ථ දේවතාවෝ බිඳෙති. මෙසේ පරම්පරාවෙන් බ්‍රහ්මලෝකය තෙක් ආර්ය ශ්‍රාවකයින් හැර සියලු දෙව් මිනිස්සු දෙකොටස් වෙති. ධර්මවාදීන්ගෙන් බලනවිට අධර්මවාදීහුම බහුතරයක් වෙති. ඉන් යමක් බොහෝ දෙනෙකු විසින් ගන්නා ලද්දේද? එය සත්‍යයයි ගෙන ධර්මය අත්හැර බොහෝ දෙනෙක් අධර්මය ගනිති. ඔවුහු අධර්මය පෙරටුකොට වසන්නාහු අපායයන්හි උපදිති. මෙසේ භික්ෂූන් දෙදෙනෙකුගේ විවාදය දෙව් මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වේ. ආධ්‍යාත්මිකව හෝ යනු ඔබගේ අභ්‍යන්තර පිරිස සමග බාහිර හෝ යනු අන්‍යයාගේ පිරිස සමග 'මකඛී' යනු අන්‍යයන්ගේ ගුණ මැකීම් ලක්ෂණ වූ මකඛයෙන් යුක්ත වූයේ, 'පලාසී' යනු තරගකාරී ලක්ෂණයෙන් යුත් අන් දොස් කියන්නා 'ඉසසුකී' යනු අනුන්ගේ ලාභ සත්කාර නොඉවසීම් ලක්ෂණයෙන් යුත් ඊර්ෂ්‍යාවෙන් යුක්ත වූයේ, මචඡරී යනු ආවාස මාත්සර්යාදී පස්වැදෑරුම් මාත්සර්යයන්ගෙන් යුක්ත වූයේ. 'සඨො' යනු කපටිවූයේ, 'මායාවී' යනු කළ පව් වසනසුලු වූයේ, 'පාපිචෙඡා' යනු තමා ළඟ නොමැති ගුණවත් භාවයන් වෙනුවෙන් ජනතාවගේ පුදසත්කාර අපේක්ෂා කරන දුසිල් තැනැත්තේ. 'මිචඡා දිට්ඨී' යනු නාස්තිකවාද, අහේතුකවාද, කර්මඵල නැතැයි යන වාද, 'සන්‍දිට්ඨිපරාමාසි' යන තම දෘෂ්ටියම නිවැරදියයි පරාමර්ශනය කිරීම, 'ආධානගාහී, දෘඪග්‍රාහිත්වය, කුමහීලග්‍රාහිත්වය 'දුපපටිනිසසගගි' යනු ගත් දෑ අත්හැර දැමීමට නොහැකි වේ.

ඛුද්දක වස්තු විභංගයෙහි වනාහි, එහි විවාදමූල සය කවරහුද? ක්‍රෝධය, ගුණමකු බව, ඊර්ෂ්‍යාව, කපටිකම, පාපිචඡතාව, තම දෘෂ්ටියෙහි පිහිටීම යන මේවා ෂට් විවාද මූලයැයි ප්‍රධාන වශයෙන් එකිනෙකවම ධර්ම කියන ලද්දේය.

ඡහි තණ්හාකායෙහි යනු රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධර්මයයි කියන ලද ෂට් තෘෂ්ණාවන්ගෙන්, එක් එක් ආකාර වූම තෘෂ්ණාව විවිධ විෂය බැවින්, එක් එක් විෂයයෙහි නැවත නැවත උපදනා හෙයින් නානාවිධ වෙති. එහෙයින් සමූහාර්ථයෙන් කාය ශබ්දය සමග යොදා තෘෂ්ණා කාය යැයි යූ.සේයි. තෘෂ්ණා කාය යැයි කියන ලදුයේද, තෘෂ්ණාවමය. **රජ්ජති** යනු තෙමේ අරමුණෙහි ඇලෙයි. මනාව ඇලුණේ වේ.

ඡහි දිට්ඨිගතෙහි යනු සබ්බාසව සූත්‍රයෙහි කියන ලද ආකාරයන් අනුව, එහි කියන ලද්දේමය. 'මෙසේ ඔහුට නුනුවණින් මෙනෙහි කරන කල්හි, ෂට් දෘෂ්ටීන්හි එක්තරා දෘෂ්ටියක් උපදී. මට ආත්මයක් ඇතැයි ඔහුට සත්‍ය වශයෙන් ඇදහිය යුතු ලෙසින් දෘෂ්ටිය උපදී. මට ආත්මයක් නැතැයි ඔහුට සත්‍ය වශයෙන් ඇදහිය යුතු ලෙසින් දෘෂ්ටිය උපදී. ආත්මය විසින් ආත්මය හඳුනාගනිමියි ඔහුට සත්‍ය වශයෙන්, ඇදහිය යුතු ලෙසින් දෘෂ්ටිය උපදී. ආත්මය නොවූයේම ආත්මය හඳුනා ගනිමියි ඔහුට, සත්‍යය වශයෙන් ඇදහිය යුතු ලෙසින් දෘෂ්ටිය උපදී. තවද ඔහුට මෙසේ දෘෂ්ටිය වේ. ඒ ඒ තන්හි යහපත් හා පාපී කර්මයන්ගේ විපාක විඳීද, එබඳු වූ මාගේ යම් ආත්මයක් වේද? එය කියන්නාද විඳින්නාද වේ. ඒ මාගේ ආත්මය වනාහි නිත්‍යය. ස්ථිරය. ශාශ්වතය. නොවෙනස්වන සුළුය. ශාශ්වතයන් හා සමව වෙනස් නොවී සිටින්නේය.

එහි 'මට ආත්මයක් ඇතැයි' යනු හැමකල්හි තමාගේ (ආත්මයෙහි) අස්ථිත්වය ගනී. එය ශාශ්වත දෘෂ්ටියයි. සත්‍ය වශයෙන් තිර වශයෙන් යනු සත්‍ය වශයෙන් හා ස්ථිර වශයෙන්, මෙය සත්‍යයයි මනාව දැඩිභාවයෙන් යයි යූ.සේයි. 'මට ආත්මයක් නැත යනු උච්ඡේද දෘෂ්ටිය සහිත සත්ත්වයාගේ ඒ ඒ විභව ග්‍රහණ වශයෙනි. තවද පූර්වයන්ද තෙකල්හිම විද්‍යමානයයි ග්‍රහණය කරන හෙයින් ශාශ්වත දෘෂ්ටියයි. වර්තමානය පමණෙක් ඇතැයි ගනු ලබනුයේ උච්ඡේද දෘෂ්ටියයි. පශ්චිමයන්ද අතීත, අනාගතයන්හි නැතයයි ග්‍රහණය කරන හෙයින් පුදපූජා අළුධූලි වීමෙන් අභාවයට යෙති. එහි ප්‍රතිඵල නැතැයි ගත් දෘෂ්ටිගතිකයින්ගේ මෙන් උච්ඡේද දෘෂ්ටියි. අතීතයෙහිම නැතැයි ගනු ලබන්නී හේතුවක් නොමැතිව හටගත්තේය යන, දෘෂ්ටිකයාගේ මෙන් ශාශ්වත දෘෂ්ටියයි.

'අත්තනාව අත්තානං සඤ්ජානාමි' යනු සංඥා ස්කන්ධ ශීර්ෂයෙන් ස්කන්ධයන් ආත්මයයි ගෙන, සංඥාවගෙන් අවශේෂ ස්කන්ධයන් දැනගන්නා හෙයින් මේ ආත්මයෙන් මේ ආත්මය දැනගනිමියි වේ.

'අත්තනාව අනත්තානං' යනු සංඥා ස්කන්ධයම ආත්මයයි ගෙන අනෙක් සතර ස්කන්ධයන්ම අනාත්මයැයි ගෙන සංඥාවෙන් ඒවා හඳුනා ගන්නා කල්හි මෙසේ සිතක් වේ. 'අනත්තනාව අත්තානං' යනු සංඥා ස්කන්ධය අනාත්මයැයි ගෙන, අනෙක් සතර ස්කන්ධයන් ආත්මයැයි ගෙන එම හැඟීමෙන් ඒවා හඳුනනවිට මෙසේ සිතක් වේ. සියල්ලම ශාශ්වත උච්ඡේද දෘෂ්ටීහුමය.

'වදොවෙදෙය්‍යො' යනාදීහු වනාහි ශාශ්වත දෘෂ්ටියෙහිම තදින් සිත පිහිටුවා ගැනීමයි. එහි කියානුයි වදො නමැ. වාග් කර්මයෙහි කාරකයායි යු.සේයි. විඳීනුයි වෙදෙය්‍ය නමැ. දනියි අනුභව කරයි යයි යු.සේයි. කුමක් විඳීද? ඒ ඒ තන්හි යහපත් හා පාපී කර්මයන්ගේ විපාක මනාව විඳියි. 'තත්‍ර තත්‍ර' යනු. ඒ ඒ යෝනි-ගති-ඨිති-නිවාස, නිකාය හෝ ආරම්මණයන්හි, 'නිච්චො' යනු උත්පාද ව්‍යය රහිත, 'ධුවො' යනු ස්ථිර, සාර වූ, 'සස්සතො' යනු සර්වකාලික 'අවිපරිණාම ධම්මො' යනු තමාගේ ප්‍රකෘති ස්වබාවය අත්නොහරින ස්වභාවය ඇතියේ, කටුස්සා මෙන් විවිධාකාරත්වයට නොපැමිණේ. 'සස්සති සමං' සඳ හිරු, සමුද්‍ර, මහා පෘථුවිය, පර්වත ලෝක ව්‍යවහාරයෙන් සස්සති යයි කියති. එම සස්සතීන් සමග සම වූයේ සස්සති සමංයි. යම්තාක් කල් සස්සතීහු පවතිත්ද ඒතාක් එසේම සිටීයයි ගන්නා කල්හි මෙබඳු දෘෂ්ටි වේ.

ඛුද්දක වස්තු විභංගයෙහි, වනාහි ඒ ඒ තන්හි බොහෝ කාලයක් යහපත් හා පාපී කර්මයන්ගේ විපාක අනුභව කරයි. හෙතෙම නූපන්නේය (හට නොගත්තේය) එහෙයින් නුවූයේය. හෙතෙම නූපන්නේය. (හට නොගත්තේය) එහෙයින් නොවන්නේය. නිත්‍යය, සැමදා පවත්නේය, ශාශ්වතය, වෙනස් නොවන ස්වභාව ඇත්තේ යයි මොහුට සත්‍ය වශයෙන්, තිර වශයෙන් දෘෂ්ටි උපදීයයි ෂට් දෘෂ්ටීන් මෙසේ වෙසෙසා යු.සේයි. එහි 'න සොජාතො නාහොසි' යනු එම ආත්මය හට නොගන්නා ස්වභාවයෙන් හට නොගත්තේ නමැ. සදාකල්හි විද්‍යමාන වේමයැයි අර්ථයි. එහෙයින්ම අතීතයෙහි නුවූයේය. අනාගතයෙහි නොවන්නේය. යමෙක් වනාහි හටගත්තේද (උපන්නේද) ඔහු වූයේය. යමෙක් හටගත්තේද? (උපදින්නේද)

ඔහු වන්නේ යයි යු.සේයි. නොහොත් 'නසො ජාතො නාහොසි' යනු හෙතෙම හැමකල්හි විද්‍යමාන හෙයින් අතීතයෙහිද, ඒකාන්තයෙන් නුවූයේය. අනාගතයෙහිද ඒකාන්තයෙන් නොවන්නේය. අනුසය කියන ලද අර්ථමය.

**සත්තහි සඤ්ඤොජනෙහි** යනු සූත්‍ර නිපාතයෙහි කියන ලද ආකාරයන්ගෙන්, එහි කියන ලද්දේමය. මහණෙනි, මේ සංයෝජන සත්දෙනෙකි. කවර සත්දෙනෙක්ද යත්? අනුනය, පටිඝ, දෘෂ්ටි, විචිකිච්ඡා, මාන, භවරාග, අවිද්‍යා යන සතයි. මහණෙනි, මේවා වනාහි සත් සංයෝජනයෝය. එහි අනුනය සංයෝජන යනු කාමරාග සංයෝජනයයි. ඒ සියල්ලම බන්ධනාර්ථයෙන් සංයෝජනයෝය.

**සත්තහි මානෙහි** යනු ඛුද්දක වස්තු විභංගයෙහි කියන ලද ආකාරයන්ගෙන්, එහි කියන ලද්දේමය. මානය, අතිමානය, මානාතිමානය, ඕමානය, අධිමානය, අස්මිමානය, මිච්ඡාමානය යන සතයි. එහි 'මානො' යනු මම ශ්‍රේෂ්ඨයෙක් වෙමියි පුද්ගලයෙකු නොසලකා ජාති ආදී වස්තු වශයෙන්ම උසස් හැඟීමයි. 'අතිමානො' යනු ජාති ආදීන්ගෙන් මා හා සමානයෙක් නැතයයි අන්‍යයා ඉක්මවා උසස් හැඟීමයි. 'මානාති මානො' යනු පෙර මෙතෙමේ මා හා සමානය. දැන් මම ශ්‍රේෂ්ඨයෙක් වෙමි. මෙතෙමේ ඉතා පහත් යයි උපන් මානයයි. 'ඕමානො යනු ජාති ආදීන්ගෙන් තමා පහත් තත්වයේ කොට පවත්නා මානයයි. මම හීනයෙක් වෙමියි මානයමය. (මැනීමය) 'අධිමානො' යනු සිව් සස්දම් අවබෝධ නොකළේම අවබෝධ කළෙමියි මානයයි. මෙම අධිමානය සුපිරිසිදු ශීලයෙන් යුත්, කර්මස්ථානයෙහි අප්‍රමාද වූ, නාමරූප පිරිසිඳ දැන ප්‍රත්‍යය පරිග්‍රහණයෙන් ඉක්මවූ සැක ඇති, ත්‍රිලක්ෂණ ආරෝපණය කොට සංස්කාරයන් සම්මර්ශනය කරන්නා වූ, ආරබ්ධ විදර්ශක පෘථග්ජනයාට උපදියි. අන්‍යයන්ට නූපදියි. 'අස්මිමානො' යනු රූපාදී ස්කන්ධයන්හි මම වෙමියි මානයයි. රූපය මම වෙමියි ආදී වශයෙන් උපන් මානය යු.සේයි. 'මිච්ඡාමානො' යනු පාපී කර්මාන්තායතනාදියෙන් උපන් මානය, ලෝක ධර්මයයි කියන ලද අර්ථමය.

**සංපරිවත්තති** යනු ලෝක ස්වභාවයන්ට අදාළ වූ ලාභාදී චතුෂ්කයෙහි අනුකූලතා වශයෙන්ද, අලාභාදී චතුෂ්කයෙහි විරුද්ධතා වශයෙන් බොහෝ නවතියි. ප්‍රකෘති ස්වභාවය අත්හරී යන අර්ථයි. මිච්ඡත්ත

කියන ලද අර්ථමය. **නීයාතො** යනු ගියේ, පැනගියේ මඬනා ලදුයේ යන අර්ථයි.

**අට්ඨහි පුරිස දොසෙහි** යනු අෂ්ටක නිපාතයෙහි උපමා සහිතවද, ඛුද්දක වස්තු විභංගයෙහි උපමා තොරව කියන ලද අයුරින්, එහි කියන ලදී. අෂ්ට පුරිස දෝෂයෝ කවරහුද? මෙසස්නෙහි භික්ෂූහු භික්ෂුවකට ඇවැතින් චෝදනා කරති. ඒ භික්ෂුව භික්ෂූන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ සිහි නොකරමි. සිහිනොකරමියි සිහිනැතිකමින්ම අවුල් බේරයි. මේ පළමු පුරිස දෝෂයයි. නැවතද භික්ෂූහු භික්ෂුවකට ඇවැතින් චෝදනා කරති. එම භික්ෂුව භික්ෂූන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ චෝදකයාටම ආපසු පතුරුවයි. (යොමුකරයි.) බාල අඥාන අව්‍යක්ත නුඹගේ කියමනෙන් කවර ඵලයෙක්ද? නුඹ නම් මා විසින් කිවයුතු යයි (චෝදනා කළයුතුයයි) හඟින්නෙමි. මේ දෙවන පුරිස දෝෂයයි. නැවතද භික්ෂූහු භික්ෂුවකට ඇවැතින් චෝදනා කරති. ඒ භික්ෂුව භික්ෂූන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ, චෝදකයාටම ප්‍රත්‍යාරෝපණය කරයි. නුඹද මෙනම් ඇවැතකට පැමිණියේ වෙහිය. නුඹ පළමුව ප්‍රතිකර්ම කරව යනුවෙන් කියයිද? මේ තෙවන පුරිස දෝෂයයි. නැවතද භික්ෂූහු භික්ෂුවකට ඇවැතින් චෝදනා කරති. එම භික්ෂුව භික්ෂූන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ අනෙකකින් අනෙකක් වශයෙන් හසුනොවී කථාකරයි. (ලිස්සා යයි) කතාව වෙනතකට යොමුකරයි. කෝපයද ද්වේෂයද අහේතුකත්වයද (නොසතුට පළකරයි) ප්‍රකට කරයි. මේ සිව්වන පුරිස දෝෂයයි. නැවතද භික්ෂූහු භික්ෂුවකට ඇවැතින් චෝදනා කරති. ඒ භික්ෂුව භික්ෂූන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන කල්හි සඟමැද අත් විසුරුවමින් කථාකරයි. මේ පස්වන පුරිස දෝෂයයි. නැවතද භික්ෂූහු භික්ෂුවකට ඇවැතින් චෝදනා කරති. ඒ භික්ෂුව භික්ෂූන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන කල්හි, සංඝයා නොගෙන, චෝදකයා නොගෙන (නොසලකා හැර) කැමැති අතක් බලා ඉවත්ව යයි. මේ සවන පුරිස දෝෂයයි. නැවතද භික්ෂූහු භික්ෂුවකට ඇවැතින් චෝදනා කරති. ඒ භිජෂුව, භික්ෂූන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන කල්හි, මම ඇවැතට පැමිණියේ නොවෙමි. මම ඇවැතට නොපැමිණියේද නොවෙමියි හෙතෙම තුෂ්ණිම්භූත වූයේ සංඝයා වෙහෙසයි. මේ සත්වන පුරිස දෝෂයයි. නැවතද භික්ෂූහු භික්ෂුවකට ඇවැතින් චෝදනා කරති. ඒ භික්ෂුව භික්ෂූන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන කල්හි මෙසේ කියයි. කිමෙක්ද ආයුෂ්මත්නි, නුඹලා ඉතා තදින් මා ගැන ව්‍යාවෘත වන්නේ

ඇයි? දැන් මම ශික්‍ෂා ප්‍රතික්‍ෂේපකොට ගිහියෙකු බවට පරිවර්තනය වන්නෙමියි හෙතෙම ශික්‍ෂා ප්‍රතික්‍ෂේප කොට ගිහියෙකු බවට පරිවර්තනය වී මෙසේ කියයි. ඇවැත්නි, නුඹලා දැන් වනාහි සතුටුවනු මැනැවැයි. මේ අටවන පුරිස දෝෂයයි. මේ පුරිස දෝෂ අටය.

එහි 'පුරිස දොසා' යනු පුරුෂයින්ගේ දොස්, ඒවා වනාහි පුරිස සන්තානය දූෂණය කෙරෙත්නුයි = දොසායි 'න සරාමි' යනු මාම එම කර්මයෙහි කළ ස්ථානයක් සිහි නොකරමි. නොසලකමියි මෙසේ නොමැති බැවින් ඉවත් කරයි. මුදයි. 'චොදකං යෙව පටිප්ඵරති' ප්‍රතිවිරුද්ධව එය පතුරුවයි. ප්‍රතිවිරුද්ධතායෙන් සිටියි 'කිනනුඛො තුයහං' අඥාන අව්‍යක්ත නුඹගේ කීමනම් කිමෙක්ද? එබඳු වූ ඔබ චෝදනා වස්තුව නොදනී. ඇවැත නොදනී. චෝදනාව නොදන්නෙහියි දක්වයි. මෙසේ කිසිත් නොදන්නා ඔබනම් චෝදකයෙකුගේ තත්වයේ සිට, කිවයුතු අයෙක් ලෙස හඟින්නෙහිදැයි ඔහු වසාගෙන පැතිරෙයි. 'පච්චාරොපෙති, නුඹද එවැනි වරදකට පත්වූයේ නොවෙහිදැයි ආදිය කියමින් ඔහු කෙරෙහිම එය ආරෝපණය කරයි. 'පටිකරොහී' යනු දේශනාගාමී ඇවැත් දෙසව, නැගීසිටිය හැකි ඇවැත්වලින් නැගී සිටුව. ඉක්බිති පිරිසිදු භාවයෙහි පිහිටියේ, අන්‍යයෙකුට චෝදනා කරන්නේ යයි දක්වයි. 'අඤ්ඤෙනඤ්ඤං පටිචරති' යනු අනෙක් කරුණකින් හෝ වචනයකින් හෝ අනෙක් කරුණක් හෝ වචනයක් වසයි. ඇවැතට පැමිණියෙහියැයි කියන ලද්දේ කවරෙක් පැමිණියේද? කුමක් පැමිණියේද? කුමක් කෙරෙහි පැමිණියේද? කෙසේ පැමිණියේද? කවරක්හු කියහුද? කුමක් කියහුදැයි කියයි. මෙබඳු වූ කිසිවක් නුඹ දිටීදැයි (කණ ළංකරයි) 'බහිද්ධා කථං අපනාමෙති' යනු මෙනම් ඇවතකට පැමිණියෙහිදැයි විමසන ලදුයේ, පැලලුප් නුවරට ගියෙමියි කියා නැවත නුඹගේ පැලලුප් නුවර යාමක් ගැන අපි නොවිමසුවෙමු ඇවැත විමසුවෙමුයි කී කල්හි ඉක්බිති රජගහ නුවරට ගියෙමියි කී කල්හි රාජගහට හෝ බ්‍රාහ්මණගහට යව. ඇවතකට පැමිණියෙහිද? එහි මට ඌරුමස් ලදැයි ආදිය කියමින් කථාව පිටත විසුරුවයි. 'කොපං' යනු කිපීම් ස්වභාවයයි. 'දොසං' යනු දුෂ්ට ස්වභාවයයි. ඒ ද්වයය ක්‍රෝධයටම නාමයෝ වෙත්. 'පාතුකරොති' දක්වයි. ප්‍රකාශ කරයි. 'බාහාවික්ඛෙපකං භණති' අත් විසුරුව විසුරුවා ලජ්ජා නැති වදන් කියයි. 'අනාදියිත්වා' යනු ගෞරවයෙන් නොගෙන අවමන්කොට, නොසැලකිලිමත් වී යන අර්ථයි. 'විහෙසෙති' වෙහෙසයි. බාධාකරයි. 'අතිබාළ්හං' ඉතා දැඩි, ප්‍රමාණය ඉක්මවා, 'මයි බ්‍යාවටා' මා කෙරෙහි උත්සාහවත්ව,

'හීනායාවත්තිත්වා' හීනවූ ගිහිභාවය සඳහා පෙරළී, ගිහියෙකු වී යන අර්ථයි. 'අත්තමනා හොථ' සතුටුසිත් ඇත්තෝ වවු. මවිසින් ලැබිය යුත්තක් ලබවු. මා වුසූ ස්ථානයෙහි වාසය කරවු. මවිසින් ඔබලාට පහසු විහරණ කරන ලදැයි අදහසින් කියයි. දූසසති යනු දූෂ්ට වේ.

**නවහි ආඝාත වත්ථූහි** යනු සත්ත්වයින් කෙරෙහි උත්පත්ති වශයෙන්ම දෙසන ලදී. දෙසූපරිදි, මහණෙනි, මේ නව ආඝාත වස්තූහු වෙති. කවර නවයෙක්ද? මට අනර්ථ පිණිස හැසිරිණියි ක්‍රෝධය බඳියි. මට අනර්ථ පිණිස හැසිරේයයි ක්‍රෝධ බඳියි. මට අනර්ථ පිණිස හැසිරෙන්නේ යයි ක්‍රෝධය බඳියි. මාගේ ප්‍රියමනාපයාගේ අනර්ථය පිණිස හැසිරිණි. අනර්ථය පිණිස හැසිරේ. අනර්ථය පිණිස හැසිරෙන්නේ යයි ක්‍රෝධය බඳියි. මාගේ අප්‍රිය අමනාපයාගේ අර්ථය පිණිස හැසිරිණි. අර්ථය පිණිස හැසිරේ. අර්ථය පිණිස හැසිරෙන්නේ යයි ක්‍රෝධය බඳියි. මහණෙනි, මේ නවය වනාහි ක්‍රෝධ වස්තූහුය.

එහි 'ආඝාත වත්ථූනි' ක්‍රෝධ කාරණාය. මෙහි ආඝාත යනු කෝපයයි. එයම මතු මතු කෝපයට වස්තු බැවින් ආඝාත වස්තු නමැ. 'ආඝාතං බන්ධති' යනු ක්‍රෝධය බඳියි. කරයි. උපදවයි. මාගේ අභිවෘද්ධිය පිණිස නොහැසිරිණි. නොහැසිරේ. නොහැසිරෙන්නේය. මාගේ ප්‍රියමනාපයාගේ අභිවෘද්ධිය පිණිස නොහැසිරිණි. නොහැසිරෙයි. නොහැසිරෙන්නේය. මාගේ අප්‍රිය අමනාපයාගේ අනර්ථය සඳහා නොහැසිරිණි. නොහැසිරේ. නොහැසිරෙන්නේයයි නිර්දේශයෙහි කියන ලද අන්‍ය වූද, නව ආඝාත වස්තූහු මේවා සමගම සංග්‍රහ කරන ලද්දාහුය. ආඝාතිතො යනු ගටනා ලද්දේ.

**නවවිධමානෙහි** යනු නවවිධ මාන කවරහුද? ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨ වෙමියි මානය, ශ්‍රේෂ්ඨයාට සමානවෙමියි මානය ශ්‍රේෂ්ඨයාට පහත්වෙමියි මානය, සමානයාට ශ්‍රේෂ්ඨවෙමියි මානය සමානයාට සමාන වෙමියි මානය සමානයාට පහත්වෙමියි මානය පහත් තැනැත්තාට ශ්‍රේෂ්ඨ වෙමියි මානය පහත් තැනැත්තාට සමාන වෙමියි මානය පහත් තැනැත්තාට පහත් වෙමියි මානය මේවා නවවිධ මානයෝය. මෙහි වනාහි ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨ වෙමියි මානය රජවරුන්ටද, ප්‍රව්‍රජිතයින්ටද උපදී. රජු වනාහි රටින් හෝ ධනයෙන් හෝ වාහනයන්ගෙන් හෝ මාහා සමකවරෙක් ඇත්දැයි එම මානය කරයි. ප්‍රව්‍රජිතයාද සීල ධූතංගාදීන්ගෙන් මා හා සම

කවරෙක් ඇත්දැයි එම මානය කරයි. ශ්‍රේෂ්ඨයාට සමානවෙමියි යන මානයද, ඔවුන්ටම උපදී. රජු වනාහි රටින් හෝ ධනයෙන් හෝ වාහනයන්ගෙන් අන් රජවරුන් සමග මාගේ වෙනස්වීමක්දැයි එම මානය කරයි. ප්‍රව්‍රජිතයාද සීල ධුතංගාදියෙන් අනෙක් භික්ෂූන් සමග මාගේ කවර වෙනස්වීමක්දැයි එම මානය කරයි. ශ්‍රේෂ්ඨයාට පහත්වෙමියි යන මානයද ඔවුන්ටම උපදී. යම් රජෙකුගේ රට හෝ ධනය හෝ වාහනාදිය අතිශය සමෘද්ධිමත් වූවාහු නොවෙති. එබඳු වූ මාහට රජුයයි ව්‍යවහාර සුව මාත්‍රයක්මය. මම කවර රජෙක්දැයි එම මානය කරයි. ප්‍රව්‍රජිතයාද අල්ප ලාභසත්කාර ඇතියේ මම ධර්මකථිකයෙකි. බහුශ්‍රැතයෙකි. මහතෙර කෙනෙකැයි කථා මාත්‍රයක්මය. මම කවරනම් ධර්මකථිකයෙක්ද? මම කවරනම් බහුශ්‍රැතයෙක්ද? මම කවරනම් මහතෙර කෙනෙක්ද? එබඳු තත්වයක් ඇති යමෙකුට ලැබෙන ලාභසත්කාර මට නැතැයි එම මානය කරයි. සමානයාට ශ්‍රේෂ්ඨ වෙමියි යන මානාදීහු අමාත්‍යාදීන්ට උපදිති. අමාත්‍යයා වනාහි රටවල් ඇත්තෙක් හෝ භෝග යානවාහනාදින්ගෙන් පරිපූර්ණයෙකි. මා සමාන අන් රාජපුරුෂයෙක් ඇත්දැයි හෝ මගේ අන්‍යයන් සමග සසඳ බැලීමෙහිදී කවර වෙනස්කමක්ද? මට ඇත්තේ අමාත්‍යයාය යන නාමමාත්‍රය පමණෙකි. කෑම ඇඳීම මාත්‍ර වූවක්ද මට නැත. මම කවරනම් අමාත්‍යයෙක් දැයි එම මානය කරයි. හීනයාට ශ්‍රේෂ්ඨ වෙමියි යන මානාදීහු මෙහෙකරු ආදීන්ට උපදිති. මවගෙන් හෝ පියාගෙන් ප්‍රවේණි වශයෙන් වූ දාසයා මා හා සමාන අන් කවරනම් දාසයෙක් ඇත්ද? අන්‍යයෝ ජීවත්වීමට නොහැකි වන්නාහු කුස් හේතුයෙන් දාසනම් වූහ. මම වනාහි ප්‍රවේණියෙන් පැමිණි හෙයින් ශ්‍රේෂ්ඨ වෙමියි ප්‍රවේණියෙන් ආ ස්වභාවයෙන් මව්පිය උභය පාරිශුද්ධ දාසත්වයෙන් අසවල් නම් දාසයා සමග මාගේ කවරනම් වෙනස්කමක්දැයි මව්කුසින් බිහිවීම් වශයෙන්ම මම දාසත්වයට එළැඹියෙමි. මව්පිය කෙළවරින් මට දාසස්ථානයක් නම් නැත. මම කවරනම් දාසයෙක්දැයි හෝ එම මානය කරයි. දාසයා යම්සේද, මෙසේ කසලසෝධ, සැඩොල් ආදීහුද එම මානය කෙරෙත්මය. මෙහිද ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨ වෙමියි උපන් මානයම තත්වූ පරිදි වූ මානයයි. අනෙක් ද්වයය තත්වූ පරිදි නොවන මානයෝය. එසේම සමානයාට සමානවෙමියි, හීනයාට හීනවෙමියි උපන් මානයම තත්වූ පරිදි වන මානයයි. අනෙක් ද්වයය අයථා මානයි. තත්වූ පරිදි නොවන මානයෝය. එහි තත්වූ පරිදි වන මානයෝ අර්හත් මාර්ගයෙන් නැසිය යුත්තාහ. තත්වූ පරිදි නොවන මානයෝ සෝවාන් මාර්ගයෙන් නැසිය යුත්තාහ.

**තණ්හාමූලකා** කියන ලද්දේමය. රජ්ජති හුදෙක් රාගයෙන්ම නොඇලේ. තවද තෘෂ්ණාමූලික සෙවීම්ද, හටගන්නා හෙයින්, තෘෂ්ණා මූලික සියලු ධර්මයන්ගෙන් ඇලේ. යෙදේ. බැඳේ යයි අදහසයි.

දසහි **කිලෙස වත්ථූහි** යනු කවර දස ක්ලේශ වස්තූහුද? ලෝභය, ද්වේෂය, මෝහය, මානය, දෘෂ්ටිය, විචිකිච්ඡාව, ථිනය, උද්ධච්චය, අහිරිකය, අනොත්තප්පය යන මේවා දස ක්ලේශ වස්තුය. එහි කෙලෙස්ම ක්ලේශ වස්තුය. මෙහි වාසය කරත්, ක්ෂීණාශ්‍රව නුවූ සත්ත්වයෝ ලෝභාදීන්හි පිහිටි හෙයින් වස්තූහුය. ඉකෙලෙස්ම ඒවා වූයේ, එය පිහිටන්නා වූ සත්ත්වයින්ට වස්තුන් වූයේම නුයිද, ක්ලේශ වස්තුය. මෙහි අනන්තර ප්‍රත්‍යයාදී භාවයෙන් උපදිනු ලබන්නා වූද කෙලෙස් වසන්නාහුම නමැ. එහෙයින් කෙලෙසුන්ට වස්තු වූයේනුයිද කෙලෙස් වස්තුය. ඇලෙත්. ඉන් තෙමේම හෝ ඇලෙයි. ඇලීම් මාත්‍රයම හෝ එයනුයි ලෝභයි. දූෂ්‍ය වෙත්. ඉන් තෙමේ හෝ දූෂ්‍ය වේ. දූෂ්‍යවීම් මාත්‍රයම හෝ එයනුයි දෝෂයි. මුළාවෙත්. තෙමේ හෝ ඉන් මුළාවේ. මුළාවීම් මාත්‍රයම හෝ එයනුයි මෝහයි. හඟීනුයි මානයි. දෘෂ්ටි ආදීහු කියන ලද අර්ථමය. ලජ්ජා නොවේනුයි අහිරිකයි. එහි ස්වභාවය අහිරිකයි. පවට බිය නොවේනුයි අනොත්තාපියි. එහි ස්වභාවය අනොත්තප්පයි. එහි අහිරිකය කාය දුශ්චරිතාදීන්හි පිළිකුල් නොවීම් ලක්ෂණයි. අනොත්තප්පය ඒවාහිම නොඇලීම් ලක්ෂණයි. කිලිස්සති යනු තවයි. ප්‍රකට කරයි. දසහි ආඝාත වත්ථූහි යනු පෙර කියන ලද නවයෙන්ද, 'අට්ඨානෙ වා පනාඝාතො ජායති' කියන ලද්දෙන් දැයි යන දහයෙන්, අනත්‍ථං මෙ අචරීති ආදීන්හි විකල්පනයක් නොකොටද, කණු, කටු ආදියෙහි හැපීමෙන් අස්ථානයෙහි ක්‍රෝධය උපදී.

දසහි **අකුසල කම්මපථෙහි** යනු දස අකුසල කර්මපථ කවරහුද? ප්‍රාණඝාතය, අදින්නාදානය, කාමයන්හි මිථ්‍යාචාරය, මුසාවාදය, කේළාම් කීම, එරුසවචන-හිස්වචන-අභිධ්‍යාව-ව්‍යාපාදය-මිථ්‍යා දෘෂ්ටිය යන මෙම දහය අකුසල කර්මපථ නම් වේ. **සමන්නාගතො** යුක්ත වූයේ.

දසහි **සඤ්ඤොජනෙහි** යනු කවර දස සංයෝජනද? කාමරාග, ප්‍රතිඝ, මාන, දෘෂ්ටි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, භවරාග, ඊර්ෂ්‍යා, මච්ඡරිය, අවිද්‍යා - මේවා දස සංයෝජනා නමැ. මිච්ඡත්ත කියන ලද්දීමය.

**දස වත්ථුකාය මිච්ඡාදිට්ඨියා** යනු කවර දසවස්තුක මිථ්‍යාදෘෂ්ටියක්ද? නත්ථි දින්නං, නත්ථියිට්ඨං, නත්ථිහුතං, නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො. නත්ථි අයංලොකො. නත්ථි පරො ලොකො. නත්ථිමාතා. නත්ථිපිතා. නත්ථි සත්තා, ඕපපාතිකා. නත්ථි ලොකෙ සමණ බ්‍රාහ්මණ සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. මේ දසවස්තුක මිථ්‍යා දෘෂ්ටියයි.

එහි 'දසවත්ථුකා' වස්තූන් දහයක් එයටනුයි දසවස්තුකායි. නත්ථි දින්නං යනු දුන් දෙයනම් ඇත. කිසිවෙකුට කිසිවක් දෙන්ට හැකි බව දනියි. දුන් දෑහි ඵලය නැතැයි ගනී. 'නත්ථි යිට්ඨං' යනු මහායාගය යිට්ඨං යැයි යු.සේයි. එය යාග කරන්ට හැකියයි දනියි. යාගයාගේ ඵලය විපාකය නැතැයි ගනියි. 'හුතං' යනු පූජා පඬුරු යැවීම් ආදී මංගල ක්‍රියාය. එය කරන්ට හැකි බව දනී. එහි ඵලය විපාකය නැතැයි ගනියි. 'සුකට දුක්කටානං' යන මෙහි දසකුසල කර්මපථ යහපත් කර්ම නමැ. දස අකුසල කර්මපථ අයහපත් කර්ම නමැ. ඒවාහි අස්තිත්වය දනී. ඵලය විපාකය නැතැයි ගනී. 'නත්ථි අයං ලොකො' යනු පරලෙව්හි සිටියහුට මෙලොව නැතැයි ගනී. 'නත්ථි පරොලොකො' යනු මෙලොව සිටියහුට පරලොව නැතැයි ගනී. 'නත්ථි මාතා නත්ථි පිතා' යනු මව්පියවරුන්ගේ අස්ථිත්වය දනී. ඔවුන් කෙරෙහි ආහාරපානාදී ප්‍රත්‍යයන්ගේ ඇප උපස්ථාන කිරීමෙහි කිසි ඵල විපාකයක් නැතැයි ගනී. 'නත්ථි සත්තා ඕපපාතිකා' යනු චුතවන හා උපදනා සත්ත්වයෝ නැතැයි ගනී. 'සම්මග්ගතා සම්මා පටිපන්නා' යනු අනුලෝම ප්‍රතිපදාවට පිළිපන් ධාර්මික මහණ බමුණෝ ලොව නැතැයි ගනී.

යෙ ඉමඤ්ච ලොකං -පෙ- පවෙදෙන්ති යනු මෙලොව පරලොව තමා විසින්ම අති විශිෂ්ට ඤාණයෙන් දැන, අන්‍යයාට දැන්වීමෙහි සමත් සර්වඥ බුදුවරයෙක් නැතැයි දෘෂ්ටි ගනී.

**අන්තග්ගාහිකාය දිට්ඨියා** යනු ලෝකය ශාශ්වතය යන ආදී වූ එක් එක් අන්ත කොටස් ගනීනුයි අන්තග්ගාහිකායි. නොහොත් අන්තයෙහි ග්‍රහණය අන්තග්‍රාහයි. අන්තග්‍රාහය එයට ඇත්තේනුයි අන්තග්‍රාහිකායි. ඒ අන්තග්‍රාහිකාවෙන් එය වනාහි යු.සේයි.

**අට්ඨ සත තණ්හා පපඤ්චසතෙහි** යනු එක්සිය අටක් තෘෂ්ණා,

සසරෙහි ප්‍රමාද කරයි. බොහෝ කලක් වාසය කරවයිනුයි පපඤ්චයි. තෘෂ්ණාවම ප්‍රපංචය වූයේ තණ්හා පපංචයි. අරමුණු භේදයෙන් නැවත නැවත ඉපදීම් වශයෙන්ද, තෘෂ්ණාවන්ගේ, බොහෝ බැවින් බහුවචන කොට, තෘෂ්ණා ප්‍රපංචයන්ගේ සියය තෘෂ්ණා ප්‍රපංච සියයයි. එම තෘෂ්ණා ප්‍රපංච සියයෙන් යැයි කිවයුතු කල්හි වචන විපර්යාස වශයෙන් තෘෂ්ණා ප්‍රපංච සිය ගණනකින්යැයි බහුවචන නිර්දේශය කරන ලදී. අට්ඨසතං යනු සංඛ්‍යාත්මකව තෘෂ්ණා ප්‍රපංච සියයෙන් යයි අර්ථය දතයුතුය. අට ගණන් නොගතයුතු සේ සලකා සියයම ගන්නා ලදැයි දතයුතුය. ඛුද්දක වස්තු විභංගයෙහි තෘෂ්ණා ප්‍රපංච යැයි ආයේය. දෙසූ පරිදි, ආධ්‍යාත්මිකව දැඩිසේ ගෙන තෘෂ්ණා ප්‍රපංච අටළොසකි. බාහිරව දැඩිව ගෙන තෘෂ්ණා ප්‍රපංච අටළොසකි. එය එකට මනාව සම්බන්ධකොට මනාව සංක්‍ෂෙප කොට සතිස් තෘෂ්ණා ප්‍රපංචයෝ වෙති. මෙසේ අතීත සතිස් තෘෂ්ණා ප්‍රපංචයෝය. අනාගත සතිස් තෘෂ්ණා ප්‍රපංචයෝය. වර්තමාන සතිස් තෘෂ්ණා ප්‍රපංචයෝය. එය එකට මනාව සම්බන්ධකොට මනාව සංක්‍ෂෙප කොට එක්සිය අටක් තෘෂ්ණා ප්‍රපංච වේ. මෙහි තෘෂ්ණා ප්‍රපංචයන්ම තෘෂ්ණා විචරිතයැයි යූ.සේයි. තෘෂ්ණා හැසිරීම, තෘෂ්ණා පැවැත්ම යයි අර්ථයි. අජ්ඣත්තිකස්ස උපාදාය යනු අධ්‍යාත්මික ස්කන්ධ පංචකය තෘෂ්ණාවෙන් දැඩිසේ ගෙන මෙය වනාහි ද්විතීයාර්ථයෙහි ෂෂ්ඨී වචනයි. මෙහි විස්තරය වනාහි එම නිර්දේශයෙහි කියන ලද අයුරින්ම දතයුතුයි. මේ වනාහි වෙනත් ක්‍රමයෙකි. රූපාරම්මණ වූම කාම තෘෂ්ණා, භව තෘෂ්ණා, විභව තෘෂ්ණා යැයි තෘෂ්ණාවෝ ත්‍රිවිධ වෙති. එසේම ශබ්දාදී අරමුණුදැයි ෂඩාරම්මණයන්හි අටළොස් තෘෂ්ණාවෝ වෙති. ආධ්‍යාත්මිකාරම්මණ අටළොසෙකි. බාහිරාරම්මණ අටළොසෙකැයි සතිසක් වෙති. ඒවාම අතීතාරම්මණ සතිසෙක. අනාගතාරම්මණ සතිසෙක. වර්තමානාරම්මණ සතිසෙකැයි එක්සිය අටක් තෘෂ්ණා විචරිත වේ. **පපඤ්චිතො** යනු අරමුණෙහි හෝ සසරෙහි ප්‍රමාද වූයේ, බොහෝ කල් වසන්නේ වේ.

**ද්වාසට්ඨියා දිට්ඨිගතෙහි** යනු කවර දෙසැටක් දෘෂ්ටිගතයෝද? භාග්‍යවතුන් වහන්සේ විසින්, බ්‍රහ්මජාල විස්තර දේශනාවෙහි වදාරන ලද, ශාශ්වතවාද සතරෙකැ. ඒකාන්ත ශාශ්වත වාද සතරෙකැ. අන්තානන්තික සතරෙකැ. අමරා වික්‍ෂෙපිත සතරෙකැ. අධිච්ච සමුප්පන්නික දෙකෙකැ. සඤ්ඤීවාද සොළසෙකැ, අසංඥීවාද අටෙකැ. නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද අටෙකැ. උච්ඡේදවාද සතෙකැ. දිට්ඨධම්ම

නිබ්බානවාද පසෙකැයි මෙම දෙසැටක් වූ දෘෂ්ටිගතයෝ බ්‍රහ්මජාල විස්තර දේශනාවෙහි බුදුරදුන් විසින් වදාරන ලදහ. මෙහි විස්තරය වනාහි බ්‍රහ්මජාල සූත්‍රයෙහි කියන ලද ක්‍රමයෙන්ම දතයුතුයි.

අභඤ්ඤවමහි **තිණ්ණො** යනු මමද සිව් සැඩපහර සහිත සංසාර නමැති මහා සමුද්‍රය තරණය කළේ අමහි වෙමි. **මුත්තො** යනු රාගාදී බන්ධනයන්ගෙන් මිදුණේ, **දන්තො** යනු මෘදු වූයේ නොවෙවුලනුයේ, **සන්තො** යනු සිසිල් වූයේ, **අසසත්ථො** යනු නිර්වාණ දර්ශනයෙහි ලද ආස්වාස ඇතියේ, **පරිනිබ්බුතො** යනු කෙලෙස් පරිනිර්වාණයෙන් පිරිනිවියේ, පහොමි යනු සමර්ථවෙමි. **ඛො** යනු ඒකංශාර්ථයෙහි නිපාතයි. **පරෙච පරිනිබ්බාපෙතුං** යන මෙහි පරෙච ශබ්දය, අන්‍යයාද එතෙර කරන්ට ආදීන්හි යෙදිය යුත්තේය.

මහා කරුණා ඥාණ නිර්දේශ වර්ණනා නිමි.

සබ්බඤ්ඤුත ඥාණ නිර්දේශයෙහි, **කතමං තථාගතසස සබ්බඤ්ඤුත ඤාණං** යයි විචාරා ඒ හා සම ස්වභාව හෙයින් ඒ සමගම අනාවරණ ඥාණය දක්වන ලදී. අනාවරණ ඥාණය ස්වභාව වශයෙන් වෙන්ව නැත. එකම ඥාණය ආකාර භේදයෙන් දෙයාකාරයෙන් යූ.සේයි. ශ්‍රද්ධා ඉන්ද්‍රිය, ශ්‍රද්ධාබල ආදීන් මෙනි. සර්වඥතා ඥාණයම, එයට ආවරණයක් නැත්තේනුයිද, කිසි ස්වභාවයකින් හෝ පුද්ගලයෙකු විසින් හෝ ආවරණ කරන්ට නොහැකි හෙයින් අනාවරණයයි යූ.සේයි. සියලු ධර්මයන්ගේ ආවර්ජන ප්‍රතිබද්ධ හෙයිනි. අන්‍යයෝ වනාහි ආවර්ජනා කොටද නොදනිති. සමහරු කීහු. සියල්ල අරමුණු කළහැකි හෙයින් සර්වඥතා ඥානය මනො විඤ්ඤාණය මෙනි. එම ඥාණයම උසස් දියමන්තියක් මෙන් විෂයයන්හි නොගැටෙන හෙයින් අනාවරණ ඥාණයයි. සර්වඥතා ඥානය අනුපූර්ව සර්වඥතාව ප්‍රතික්ෂිප්තය. අනාවරණ ඥාණය සකිං සබ්බඤ්ඤුතාව ප්‍රතික්ෂිප්තය. භාග්‍යවතුන් වහන්සේ සර්වඥතා ඥාන ප්‍රතිලාභයෙන් සර්වඥයයි යූ.සේයි. අනුපූර්ව සර්වඥ නොවේ. අනාවරණ ඥාණ ලාභයෙන්ම සර්වඥයැයි යූ.සේයි. සකිං සර්වඥ නොවේ.

**සබ්බං සංඛත මසංඛතං අනවසෙසං ජානාති** යන මෙහි සබ්බං ජාති වශයෙන් සියලු ධර්මයන්ගේ ශේෂ රහිත ගැනීමයි. **අනවසෙසං**

යනු එක් එක් ධර්මයාගේ සියලු ආකාර වශයෙන් ශේෂ රහිතව ගැනීමයි. **සංඛත මසංඛතං** යනු සංඛත යන්නෙහි දෙයාකාර ප්‍රභේද දැක්වීමයි. ප්‍රත්‍යයන් එක්ව කරන ලද සංඛතය. ස්කන්ධ පංචකය එක් ප්‍රභේදයකි. එසේ සංඛත තත්වයට පත්නුවූයේ අසංඛතංයි. නිර්වාණයයි. සංඛතය අනිත්‍ය දුක්ඛ අනාත්මතාදී ආකාරයන්ගෙන් ශේෂ රහිතව දනියි. අසංඛතය සුඤ්ඤත අනිමිත්ත අප්‍රණිහිතාදී ආකාරයන්ගෙන් ශේෂ රහිතව දනියි. ඒ සංඛතයට හා අසංඛතයට ශේෂයක් නැත්තේනුයි අනවශේෂයි. සංඛතය හා අසංඛතය නොයෙක් ප්‍රභේද වූද, ප්‍රඥප්තිය ප්‍රත්‍යයන්ගෙන් නොකළ හෙයින් අසංඛත පක්‍ෂය භජනය කරයි. සර්වඥතාඤාණය වනාහි සියලු ප්‍රඥප්තීන් නොයෙක් භේද වශයෙන් දනියි. නොහොත් සබ්බං යනු සියලු ධර්මයන්ගේ ග්‍රහණයයි. අනවසෙසං යනු ශේෂ රහිතව ගැනීමයි. **තත්‍ථ ආවරණං නත්‍ථීති** යනු එහි එම ශේෂ රහිත සංඛතා සංඛතයන්හි ඇලීම් නැති හෙයින් සර්වඥතා ඥානයට ආවරණ නැත්තේනුයි එම සර්වඥතා ඥානයම අනාවරණ ඤාණ නමැයි අර්ථයි. දැන් නොයෙක් විෂය භේද වශයෙන් දක්වන්ට, **අතීතං** යනාදිය වදාළහ. එහි අතීත, අනාගත, වර්තමාන යන කාලභේද වශයෙන් දක්වන ලදී. **චක්‍ඛුඤ්චෙව රූපාච** ආදිය වස්තු අරමුණු භේදයෙන්, **එතං සබ්බං** යනු ඒ චක්‍ෂු රූපාදීන්ගේ ශේෂරහිතව ගැන්මයි. සෙස්සෙහිද මෙසේය. **යාවතා** යනු ශේෂරහිතව ගැනීමයි. **අනිච්චට්ඨං** යන ආදිය සමාන ස්වභාව ලක්‍ෂණ භේදයෙන් දක්වන ලදී. **අනිච්චට්ඨං** යනු අනිත්‍යාකාරයයි. ප්‍රථමාර්ථයෙහි ද්විතියා වචනයි. ඒ ආකාරයන්හි එම ක්‍රමයමැයි. **රූපස්ස** යනු ස්කන්ධ භේදයෙන් දක්වන ලදී. චක්‍ඛුස්ස -පෙ- **ජරා මරණස්ස** යනු යට කියන ලද පෙය්‍යාලයෙන් යෙදිය යුතුය.

**අභිඤ්ඤාය** යනු යට කියන ලද ඤාණයෙන්ම. **අභිඤ්ඤට්ඨං** යනු දැනගන්නා ස්වභාවය. ඒ ආකාරයන්හි එම ක්‍රමයමැයි. **ඛන්‍ධානං ඛන්‍ධට්ඨං** ආදිය යට කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. **කුසලෙ ධම්මෙ** යන ආදිය කුසලත්‍රික වශයෙන් භේදයයි. **කාමාවචර ධම්මෙ** යන ආදිය සිව් භූමි වශයෙනි. දෙ අයුරින්ම **සබ්බෙ ජානාති** යන මෙහි බහුවචන පාඨය වඩා යහපත්ය. ඒකවචන ස්‍රොතයෙහි වැටුණු හෙයින් පොත්වල ඒකවචනයෙන් ලියන ලදී.

**දුක්ඛස්ස** යන ආදිය තුදුස් බුද්ධ ඤාණයන්ගේ විෂය භේදයයි.

ඉන්ද්‍රිය පරොපරියත්තෙ ඤාණං යනාදී සිව් ඤාණයන් කියා, සර්වඥතා ඥානය කවර හෙයින් නොකියන ලද්දේද යත්? කියනු ලබන කල්හි, සර්වඥතා ඥානත්වයෙහි විෂය භේදවන හෙයින්, සර්වඥතා ඥානය කියන කල්හි එම ඤාණය නොකිව යුතු වෙයි. සර්වඥතා ඤාණය වනාහි සර්වඥතා ඤාණයටම විෂය වේ.

නැවත කාලාකාරාම සූත්‍රාදීන්හි කියන ලද ක්‍රමයෙන්ම සර්වඥතා ඤාණ භූමි දක්වන්නේ 'යාවතා සදෙවකස්ස ලොකස්ස' යනාදිය දෙසූහ. එහි දෙවියන් සහිත වූයේ **සදෙවකස්සයි** මාරයා සමග වූයේ **සමාරකස්සයි.** බ්‍රහ්මයා සමග වූයේ **සබ්‍රහ්මකස්සයි. සමණ** බ්‍රාහ්මණයන් සහිත ලෝකයාගේ, දෙව් මිනිසුන් සහිත වූයේ **සදෙව මනුස්සාය යි.** ප්‍රජාවගේ, ප්‍රජාවට අයත් බැවින් පජා යනු සත්ත්ව ලෝකයට එය සමාන වචනයකි. එහි සදෙවක වචනයෙන් පඤ්ච කාමාවචර දේව සමූහයයි. සමාරක වචනයෙන් ෂට් කාමාවචර දේව සමූහයයි. සබ්‍රහ්මක වචනයෙන් බ්‍රහ්ම කායිකාදී බ්‍රහ්ම ගහණයයි. සස්සමණ බ්‍රාහ්මණී වචනයෙන් සාසනයට විරුද්ධ, පසමිතුරු ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයයි. සංසිඳවූ පාපයන් ඇති, යටපත් කළ පාපයන් ඇති ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයාද ගැනේ. ප්‍රජා වචනයෙන් සත්ත්ව ලෝක සමූහයයි. සදෙව මනුස්ස වචනයෙන් සම්මුති දෙවිවරුද, සෙසු මිනිස් සමූහයාද වේ. මෙසේ මෙහි තෙපදයන්ගෙන් අවකාශ ලෝකයද, දෙපදයකින් ප්‍රජා වශයෙන් සත්ත්ව ලෝකය ගන්නා ලදී.

අනෙක් ක්‍රමයක්, සදෙවක ග්‍රහණයෙන් අරූපාවචර ලෝකය ගන්නා ලදී. සමාරක ග්‍රහණයෙන් ෂට් කාමාවචර දේව ලෝකද, සබ්‍රහ්මක ග්‍රහණයෙන් රූපාවචර බ්‍රහ්ම ලෝකයද, සස්සමණ බ්‍රාහ්මණාදී ග්‍රහණයෙන් සිව් පිරිස් වශයෙන් සම්මුති දෙවියන් වශයෙන් හෝ මිනිස්ලොව සහිත සෙසු සත්ත්ව ලෝකය හෝ ගැනේ.

තවද මෙහි සදෙවක වචනයෙන් උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් සියලු ලෝකයාගේ දැකීම් ආදිය දන්නා බැව් ඔප්පු කරයි. ඉන් සමහරුන්ට මෙසේ සිතක් වන්නේය. මාරදිව්‍ය පුත්‍රයා මහානුභාවය. ෂට් කාමාවචර ලෝකයන්ට ඓශ්වර්යයි. ලෝකය සිය වසයෙහි පවත්වයි. කිමෙක්ද, ඔහුගේද දැකීම් ආදිය දනීද? ඔවුන්ගේ විමතිය දුරුකරන්නේ මාරයා සහිතයයි දෙසූහ. යම් කෙනෙකුන්ට මෙබඳු අදහසක් විය හැකිය. බ්‍රහ්මයා මහානුභාවය. එක් ඇඟිල්ලකින් එක් සක්වළෑ දහසෙක ආලෝකය පතුරයි.

ඉතා උතුම් ධ්‍යාන සමාපත්ති සුවයද විඳියි. කිමෙක්ද, ඔහුගේද දැකීම් ආදිය දනීද? ඔවුන්ගේ විමතිය දුරුකරන්නේ (සබ්‍රහ්මකස්ස) බ්‍රහ්මයා සහිතයැයි වදාළහ. ඉක්බිති යමෙකුන්ට මෙබඳු අදහසක් විය හැකිය. බොහෝ මහණ බමුණෝ සාසනයට සතුරෝ වෙති. කිමෙක්ද ඔවුන්ගේද දැකීම් ආදිය දනීද? ඔවුන්ගේ විමතිය දුරුකරන්නේ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවයයි වදාළහ. මෙසේ උත්කෘෂ්ටයන්ගේ දැකීම් ආදිය දන්නා බැව් ප්‍රකාශකොට නැවත සම්මුති දෙව්වරුන්ද සෙසු මිනිසුන්ද ගෙන, උත්කෘෂ්ට පරිච්ඡේද වශයෙන් සෙසු සත්ත්ව ලෝකයාගේ දැකීම් ආදිය දන්නා බැව් ප්‍රකාශ කරයි. මේ මෙහි අනුසන්ධි ක්‍රමයයි. පෞරාණිකයෝ කීහු. **සදෙවකස්ස** යනු දෙවියන් සහිත ලෝකයා විසින්, **සමාරකස්ස** යනු මරුන් සහිත වූ සෙසු ලෝකයා විසින් **සබ්‍රහ්මකස්ස** යනු බඹුන් සහිත සෙසු ලෝකයා විසින්, මෙසේ සියලුම ත්‍රිභවයන්ට ඇතුළත් සත්ත්වයින් ත්‍රිවිධාකාරයන්ගෙන් තෙපදයන්හි බහා දෙයාකාරයන්ගෙන් ග්‍රහණයට **සස්සමණ බ්‍රාහමණියා පජාය සදෙව මනුස්සාය** යනාදිය යු.සේයි. මේ පස්වැදෑරුම් පදයන්ගෙන් ඒ ඒ ආකාරයෙන් ත්‍රෛධාතුක ලෝකය හාත්පසින් ගන්නා ලද්දේ වේ.

දිට්ඨං යනු රූපායතනයයි. **සුතං** යනු ශබ්දායතනයයි. **මුතං** යනු වෙත පැමිණ ගතයුතු හෙයින්, ගන්ධ, රස, ස්පර්ශයෝය. **විඤ්ඤාතං** යනු සුවදුක් ආදී ධර්මාරම්මණයි. **පත්තං** යනු සොයා හෝ නොසොයා පැමිණෙන ලද, **පරියෙසිතං** යන පැමිණි හෝ නොපැමිණි සොයන ලද, **අනුවිචරිතං මනසා** මනසින් විමසන ලද, (හැසිරෙන ලද) **සබ්බං ජානාති** මෙයින් එය දක්වයි. මේ සදේවක ලෝකයෙහි යම් පමණ අප්‍රමාණ ලෝකධාතුන්හි නිල්, කහ ආදී රූපාරම්මණයක් චක්‍ෂුද්වාරයෙහි හමුවට ඒද? මෙම සත්ත්වයා මෙම ක්‍ෂණයෙහි මෙනම් රූපාරම්මණයක් දැක සුන්දර මනසක් හෝ අසුන්දර මනසක් හෝ මධ්‍යස්ථ හෝ වූයේයයි ඒ සියල්ල තථාගතයන් වහන්සේගේ සර්වඥතා ඤාණය දනී. එසේම මේ සදේවක ලෝකයෙහි යම්පමණ අප්‍රමාණ ලෝකධාතුන්හි බෙර ශබ්දය ආදි ශබ්දාරම්මණයක් ශ්‍රෝතවාරයෙහි හමුවට එයිද? මුලෙහි ගඳ, පොත්තෙහි ගඳ ආදී (සුගඳ-දුගඳ) ගන්ධාරම්මණයක් ඝ්‍රාණද්වාරයෙහි හමුවට එයිද? මුලෙහි රස, කඳෙහි රසයැයි රසාරම්මණයක් ජිව්හා ද්වාරයෙහි හමුවට එයිද? කර්කශ, මොළොක් ආදී පෘථුවි ධාතු, තේජෝ ධාතු, වායො ධාතු ආදී භේද වූ ස්පර්ශාරම්මණය කාය ද්වාරයෙහි හමුවට එයිද? මෙම සත්ත්වයා මෙම ක්‍ෂණයෙහි මෙනම් ස්පර්ශාරම්මණය

ස්පර්ශකොට සුන්දර මනසක් හෝ අසුන්දර මනසක් හෝ මධ්‍යස්ථ හෝ වූයේ යයි සියල්ල තථාගතයන් වහන්සේගේ සර්වඥතා ඥාණ දනියි. එසේම මේ සදේවක ලෝකයෙහි, යම් පමණ අප්‍රමාණ ලෝකධාතුන්හි සුවදුක් ආදී භේද වූ ධර්මාරම්මණයක මනෝද්වාරයෙහි හමුවට එයිද මෙම සත්ත්වයා මෙම ක්‍ෂණයෙහි මෙනම් ස්පර්ශාරම්මණය ස්පර්ශකොට සුන්දර මනසක් හෝ අසුන්දර මනසක් හෝ මධ්‍යස්ථ හෝ වූයේයයි සියල්ල තථාගතයන් වහන්සේගේ සර්වඥතා ඥාණය දනියි. එසේම මේ සදේවක ලෝකයෙහි, යම් පමණ අප්‍රමාණ ලෝක ධාතුන්හි සුවදුක් ආදී භේද වූ ධර්මාරම්මණයක් මනෝද්වාරයෙහි හමුවට එයිද? මේ සත්ත්වයා මෙම ක්‍ෂණයෙහි මෙනම් ධර්මාරම්මණයක් දැන, සුන්දර මනසක් හෝ අසුන්දර මනසක් හෝ මධ්‍යස්ථ හෝ වූයේ යයි සියල්ල තථාගතයන් වහන්සේගේ සර්වඥතා ඥාණය දනියි.

මෙයට මහජනයාගේ සොයා නොපැමිණියේද ඇත. සොයා පැමිණියේද ඇත. නොසොයා නොපැමිණියේද ඇත. නොසොයා පැමිණියේද ඇත. සියල්ල තථාගතයන් වහන්සේගේ සර්වඥතා ඥානයෙන් නොපැමිණියේ නම් නැතැයි වෙනත් ක්‍රමයකින් සර්වඥභාවය දැක්වීම සඳහා 'න තස්ස' යන ගාථාව වදාළහ.

එහි **න තස්ස අදිට්ඨමිධත්ථි කිඤ්චි** යනු ඒ තථාගතයන් වහන්සේට මෙහි මෙම ත්‍රෛලෝක ධාතුයෙහි මෙම වත්මනැ පැනැසින් නුදුටු ස්වල්පමාත්‍ර වූද කිසිවක් නොමැත. විද්‍යමාන නොවේ. අර්ථ යන මෙය වර්තමානකාලික ආඛ්‍යාත පදයයි. මින් වර්තමාන කාලයට අයත් සියලු ධර්මයන්ගේ දත්බව දක්වයි. ගාථා බන්ධන පහසුව සඳහා 'ද' කාරය එක්කරන ලදී. **අථො අවිඤ්ඤාතං** යනු මෙහි 'අථො' යනු වචන ගැන්මෙහි නිපාතයි. **අවිඤ්ඤාතං** යනු අතීතකාලික නොදත් කිසි ධර්ම සමූහයක් නාහොසි යනු පාඨ ශේෂයයි. අව්‍යය වූ අත්ථි ශබ්දයාගේ ග්‍රහණයෙහි පාඨශේෂය නොමැතිවද යෙදේමය. මින් අතීතකාලික සියලු ධර්මයෙහි දත්බව දක්වයි. **අජානි තබ්බං** යනු අනාගතකාලික නොදතයුතු ධර්ම සමූහයක් නම් නොවන්නේය. නොමැති හෝ වෙයි. මෙයින් අනාගතකාලික සියලු ධර්මයාගේ දත්බව දක්වයි. මෙහි අකාරය දැනුම් ක්‍රියා විශේෂණ මාත්‍රයක්මය. **සබ්බං අභිඤ්ඤායි යදත්ථි නෙය්‍යං** යනු මෙහි යම් ත්‍රෛකාලික හෝ කාලවිමුක්ත හෝ දතයුතු - දැනගත යුතු කිසි ධර්ම සමූහයක් ඇත්ද? ඒ සියල්ල තථාගතයන් වහන්සේ මනාව

දැනගත් සේක. සර්වඥතා ඥානයෙන් දැනගත් සේක. ප්‍රතිවේධ කළ සේක. මෙහි අත්‍ථි ශබ්දයෙන් ත්‍රෛකාලිකද කාලවිමුක්තද ග්‍රහණය කළේය. අත්‍ථි ශබ්දය ක්‍ෂය නුවූයේම යයි දතයුතුයි. **තථාගතො තෙන සමනත චක්ඛු** යනු කාල වශයෙන්ද, අවකාශ වශයෙන්ද, (සීමා) ශේෂ රහිතව, හාත්පස සර්වාකාරයෙන් පවත්නා නැණැස වූයේනුයි සමනත චක්ඛුයි. ඒ කියන ලද කාරණයෙන් තථාගතයන් වහන්සේ ඒ සමනත චක්ඛුයි. සියල්ල දත් සේකැයි යු.සේයි.

මෙම ගාථාවෙහි පුද්ගලාධිෂ්ඨාන දේශනාවෙන් සර්වඥතා ඥානය සිද්ධය. නැවත බුද්ධ ඤාණයන්ට විෂය වශයෙන් සර්වඥතා ඥානය දක්වනු කැමැත්තේ, **සමනත චක්ඛූති, කෙනට්ඨෙන සමනත චක්ඛූ** යන ආදිය දෙසූහ. එහි ගාථාවෙහි සමන්ත චක්ඛුයයි කියන ලද පදයෙහි යම් ඒ සමනත චක්‍ෂුවක් වේද? එය කවරාර්ථයෙන් සමන්ත චක්‍ෂුද යන අර්ථයි. එහි අර්ථය වනාහි **යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො** ආදීන්හි කියන ලද්දේම වේ. සර්වඥතා ඥානය වනාහි සමන්ත චක්‍ෂුයි. දෙසූ පරිදි, සමන්ත චක්‍ෂුයයි සර්වඥතා ඥානය කියනු ලැබේ. එහි සර්වඥතා ඥානාර්ථය කී කල්හි සමන්ත චක්‍ෂු අර්ථය කියන ලද්දේම වේ. බුදුන්ගේම **ඤාණ** නුයි **බුද්ධ ඤාණානියි. දුක්ඛෙ ඤාණාදීනිපි** දුක්ඛෙ ඤාණාදීහුද සර්වප්‍රකාරයෙන්ම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේටම පවතිත්. අනෙක් අයට එක් කොටස් මාත්‍රයක් වශයෙන්ම (ඉතා සුළුවෙන්) පවතිත්. **සාවක සාධාරණානි** යනු එක් කොටසක් වශයෙන් ඇත. ඒ සඳහා යු.සේයි. **සබ්බො ඤාතො** යනු සියල්ල ඤාණයෙන් දත්තේය. **අඤ්ඤාතො දුක්ඛට්ඨො නත්‍ථි** යනු කියන ලද අර්ථයම වැළැක්මෙන් පැහැදිලි කරයි. **සබ්බො දිට්ඨො** යනු හුදෙක් දැනගත් පමණම නොවේ. තව, ඇසින් දුටුවාක් මෙන් කරන ලදී. **සබ්බො විදිතො** යනු හුදෙක් දිටි මාත්‍රයම නොවේ. තවද එය ප්‍රකටය. **සබ්බො සච්ඡිකතො** යනු හුදෙක් දත්තේම පමණෙක් නොවේ. වැලිත් එහි නුවණ ප්‍රතිලාභ වශයෙන් ප්‍රත්‍යක්‍ෂ කරන ලදී. **සබ්බො ඵස්සිතො** යනු හුදෙක් සාක්‍ෂාත් කරන ලද්දේම නොවේ. වැලිත් කැමැති පරිද්දෙන් නැවත නැවත නිතර හැසිරීම් වශයෙන් ස්පර්ශ කරන ලද්දේ වේ.

නොහොත් **ඤාතො** ස්වභාව ලක්‍ෂණ වශයෙන් දතුයේ, **දිට්ඨො** ස්වභාව ලක්‍ෂණ වශයෙන් දිටියේ, **විදිතො** රස වශයෙන් විදිනා ලදුයේ, **සච්ඡිකතො** වැටහීම් වශයෙන් සාක්‍ෂාත් කරන ලදුයේ, ඵස්සිතො ආසන්න

කරුණ වශයෙන් ස්පර්ශ කරන ලදුයේ නොහොත්, ඤාණෝත්පාද වශයෙන් දන්නා ලදුයේ, චක්‍ෂුත් පාද වශයෙන් දක්නා ලදුයේ, ප්‍රඥොත්පාද වශයෙන් දන්නා ලදුයේ, විද්‍යෝත්පාද වශයෙන් සාක්‍ෂාත් කරන ලදුයේ, ආලෝකෝත්පාද වශයෙන් ස්පර්ශ කරන ලදුයේ, **යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො සබ්බො දිට්ඨො, අදිට්ඨො දුක්ඛට්ඨො නත්ථි** දුක්ඛයාගේ යම්පමණ දුක්ඛාර්ථයක් වේද, ඒ සියල්ල දුටුයේය. නොදිටි දුක්ඛාර්ථයක් නැතැයි ආදි ක්‍රමයෙන්ද, **යාවතා සදෙවකස්ස ලොකස්ස -පෙ- අනුවිචරිතං මනසා සබ්බං ඤාතං අඤ්ඤාතං නත්ථීති** යනාදි ක්‍රමයෙන් යම්පමණ දෙවියන් සහිත ලෝකයා විසින් -පෙ- සිතින් හැසිරිණිද? ඒ සියල්ල දතුයේය. නොදත් දැයක් නැත්තේයයි ආදී ක්‍රමයෙන් විස්තරය දතයුත්තේය.

ප්‍රථමයෙන් කියන ලද ගාථාවෙහි නිගමන වශයෙන් නැවත යූ.සේයි. එම නිගමනය කළකල්හි ඤාණ නිගමනයද කරන ලද්දේම වේ.

**සර්වඥතා ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

**සද්ධර්ම ප්‍රකාශනී නම් වූ ප්‍රතිසම්භිදා මාර්ග අර්ථ කථාවෙහි ඤාණ කථා වර්ණනාව නිමි.**

දැන් ඤාණ කථා අනන්තරව ප්‍රකාශිත දෘෂ්ටිකථායෙහි අනුපූර්ව අනු වර්ණනාව පැමිණියේය. මේ දෘෂ්ටි කථාවය. ඤාණකථාවෙන් කරන ලද ඤාණ පුරුදු ඇති, අවබෝධ කළ සම්‍යග් දෘෂ්ටියෙන් මිථ්‍යා දෘෂ්ටි නමැති මල, පිරිසිදු කිරීම පහසු වේ. සම්‍යග් දෘෂ්ටියද මනාව පිරිසිදු වේයයි ඤාණ කථා, අනන්තරව කියන ලදී. එහි **කා දිට්ඨි** ආදිය විචාරීමයි. **දිට්ඨීති අභිනිවෙස පරාමාසො දිට්ඨි** යනාදී වූ විමසන ලද විමසුමෙහි විසඳුමයි. **කථං අභිනිවෙස පරාමාසො** දිට්ඨි යන ආදී වශයෙන් විසඳන ලද විසඳුමෙහි විස්තර නිර්දේශයයි. **සබ්බාව තා දිට්ඨියො අස්සාද දිට්ඨියො** යනාදී වූ දෘෂ්ටි සංසන්දනයයි මෙසේ මේ සිව් පරිච්ඡේදයයි. එහි විමසුම් පරිච්ඡේදයෙහි **කා දිට්ඨි** යනු ධර්ම විමසීම, ස්වභාව විමසීමයි. **කති දිට්ඨිට්ඨානානි** යනු හේතු විමසීම, ප්‍රත්‍යය විමසීම දෘෂ්ටීන්ට කෙතෙක්

කාරණාදැයි අර්ථයි. **කති දිට්ඨි පරියුට්ඨානානි** යනු හැසිරීම් විමසුම්ය. දෘෂ්ටීහුම හැසිරීම් වශයෙන්, සිත හාත්පසින් වෙළමින් නැගිටිත්නුයි දෘෂ්ටි පරියුට්ඨානානි නම් වෙති. **කති දිට්ඨියො** යනු දෘෂ්ටීන්ගේ සංඛ්‍යා විමසීම, ගණන විමසීම. **කති දිට්ඨාභිනිවෙසා** යනු වස්තු ප්‍රභේද වශයෙන්ද, අරමුණු විවිධත්වය වශයෙන්ද දෘෂ්ටි ප්‍රභේද විමසුමයි. දෘෂ්ටීහුම ඒ ඒ වස්තුවෙහි ඒ ඒ අරමුණෙහි තදින් පිහිටති. ස්පර්ශ කෙරෙත්නුයි දෘෂ්ටි පරාමාසයැයි කියති. **කතමො දිට්ඨිට්ඨාන සමුග්ඝාතො** යනු දෘෂ්ටීන්ගේ ප්‍රතිපක්ෂ විමසුම, ප්‍රහාණ උපාය විමසුම, ස්කන්ධාදීහු දෘෂ්ටි හේතුකොට හටගනිත්. දෘෂ්ටි නැසීමෙන් එම ස්කන්ධයන්ගේ හටගැනීමට හේතු නොවෙති. එම හේතුද නැසුවාහු නම් වෙති. එහෙයින් දෘෂ්ටි කරුණු මනාව බොහෝ සේ එයින් නසත්නුයි දිට්ඨිට්ඨාන සමුද්ඝාතයයි යූ.සේයි.

දැන් ඒ ෂට් විමසීම්හි **කා දිට්ඨි** යනාදී ෂට් විසඳුම්ය. එහි **කාදිට්ඨි** යනු විසඳිය යුතු විසඳුම්ය. **අභිනිවෙස පරාමාසො** දිට්ඨි යනු විසඳුමයි. එය අනිත්‍යාදී වස්තුවෙහි නිත්‍යාදී වශයෙන් ඇලුම් කරයි. පිහිටුවයි. දැඩිව ගනීනුයි **අභිනිවෙසොයි**. අනිත්‍යාදී ආකාරය ඉක්මවා නිත්‍යයයි ආදී වශයෙන් පවත්නා මත්තෙහි (වැඩිපුර) ස්පර්ශ කරයි. ගනීනුයි **පරාමාසොයි** නොහොත් නිත්‍යයයි ආදී වශයෙන් මත්තෙහි උතුම් සත්‍යයයි ස්පර්ශ කරයි. ගනීනුයි පරාමාසොයි. තදින් ඇලුම් කිරීමද ස්පර්ශයද එය මනුයි. **අභිනිවෙස පරාමාසොයි**. මේ ආකාර වූ දෘෂ්ටිය යනු කෘත්‍යය වශයෙන් දෘෂ්ටි ස්වභාවය විසඳයි. **තිණිසතං** තුන්සියයයි. වචන විපර්යාසය කරන ලදී. **කතමො දිට්ඨිට්ඨාන සමුග්ඝතොයි** විමසීම නොඋදුරාම **සොතාපත්ති මග්ගො දිට්ඨිට්ඨාන සමුග්ඝාතොයි** විසඳුම කරන ලදී.

දැන් කෙසේ **අභිනිවෙස පරාමාසො** යනාදී විස්තර නිර්දේශය වේද? එහි රූපං යනු ද්විතියා වචනයි. රූපය අභිනිවෙස පරාමාසයයි සම්බන්ධයි. මෙහි රූපං යනු රූප උපාදානස්කන්ධයද කසිණ රූපයද, එය මාගේයයි ගැනීම අභිනිවෙස පරාමාස දෘෂ්ටියයි. එය මම වෙමියි යනුවෙන් ගැනීම අභිනිවෙස පරාමාස දෘෂ්ටියයි. එය මාගේ ආත්මයයි ගැනීම අභිනිවෙස පරාමාස දෘෂ්ටියයි. වෙන වෙනම යෙදිය යුතුය. එතං යනු සමාන වචනයයි. එහෙයින්ම එම වේදනාව මාගේය. එම සංස්කාරයන් මාගේ යයි නපුංසක වචන හා ඒකවචන කරන ලදී. එසො යයි කිවයුත්ත අපේක්ෂාකොට පුල්ලිංග ඒකවචන කරන ලදී. **එතංමම** යනු තෘෂ්ණා හැඟීම මූලික දෘෂ්ටියයි. **එසො හමසමි** යනු මාන හැඟීම් මූලික දෘෂ්ටියයි.

එසො මෙ අත්තා යනු දෘෂ්ටි හැඟීමමය. සමහරු වනාහි 'එතං මම' යනු මගේ යන කල්පනයයි. 'එසො හමස්මි' මම යන කල්පනයයි. 'එසො මෙ අත්තා', මමය මාගේය යන කල්පිතයෙන් යුක්ත ආත්මයයි තදින් ගැනීමයි කියති. එසේම පිළිවෙළින් තෘෂ්ණාමූලික සිත පිහිටුවීම, මානය දැඩිව ගැනීම, තෘෂ්ණාමූලික ඇලීම සංස්කාරයන්හි මානයෙන් දැඩිව ගත් ආත්මය යන ඇල්ම, සංස්කාරයන්ගේ දුක්ඛ ලක්‍ෂණ දර්ශනයද, සංස්කාරයන්ගේ අනිත්‍ය ලක්‍ෂණ දර්ශනයද, ලක්‍ෂණ දැක්මට හේතුවූ ආත්මාභිනිවේසයද, දුකෙහි හා අසුභයෙහි, සුව ශුභයැයි විපර්යාස ග්‍රහණයෙහිද, අනිත්‍යයෙහි නිත්‍යයයි විපර්යාස ග්‍රහණයෙහිද යන චතුර්විධ විපර්යාස ග්‍රහණයෙහි ආත්මාභිනිවේසයද, පූර්වේ නිවාස ඤාණයාගේ ආකාර කල්පනයද, දිව්‍ය චක්ෂුර් ඤාණයාගේ අනාගත ප්‍රතිලාභ කල්පනයද, පූර්වාන්තාපරාන්ත හා මෙයින් මෙය හට ගත්තේය යන ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන්හි විතර්ක මූලික ආත්මාභි නිවේසයද? තෘෂ්ණාවෙන් අතීතයට පමුණුවයි. තෘෂ්ණාවෙන් අනාගතය අපේක්‍ෂා කරයි. තෘෂ්ණාවෙන් වර්තමානයෙහි ගැළෙයි නුයි ආත්මාභි නිවේසයයි.

පූර්වාන්තයෙහි නොදැනීම්හෙතුක දෘෂ්ටිය, අපරාන්තයෙහි නොදැනීම් හේතුක දෘෂ්ටිය පූර්වාන්තාපරන්තයන්හි, මෙයින් මෙය හටගත්තේය යන ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන්හි නොදැනීම් හේතුක වූ අන්තයෙහි අභිනිවේසයදැයි එම ත්‍රිවිධ වචනයන්ගේ අර්ථ වර්ණනා කරති.

මෙහි දෘෂ්ටීහු වනාහි පළමුව පංචස්කන්ධ වස්තුකය ඉක්බිති, ෂට් ආධ්‍යාත්මික හා බාහිරායතනයන්ද, විඤ්ඤාණ කාය, ස්පර්ශ කාය, වේදනා කාය, සංඥා කාය, චේතනා කාය, තෘෂ්ණා කාය, විතර්ක, විචාර, ධාතු කසිණ, දෙතිස් ආකාර වස්තුක දෘෂ්ටීහු යූ.සේයි. දෙතිස් ආකාර කුණපයන්හි වෙන්ව ඇල්ම නොයෙදේ. මුළු ශරීරයෙහිම ඇලුම් කිරීම් වශයෙන්ම වෙන්ව කරන ඇලුම් කිරීම් මෙන් කරන ලදැයි දතයුතුය.

ඉක්බිති ද්වාදසායතන, අටළොස් ධාතු, එකුන්විසි ඉන්ද්‍රිය වශයෙන් යෙදීම් කරන ලදී. ත්‍රිවිධ ඒකාන්ත ලෝකෝත්තර ඉන්‍ද්‍රිය නොයොදන ලදී. ලෝකෝත්තර වස්තුක දෘෂ්ටීහු නොවෙත්. හැමතන්හිම ලෞකික ලෝකෝත්තර මිශ්‍ර ධර්මයන්හි ලෝකෝත්තර හැර ලෞකිකයන්ම ගතයුතුය. ඉන්‍ද්‍රිය බද්ධ නුවූ රූපයද නොගත යුතුමය.

ඉක්බිති ත්‍රෛධාතුක වශයෙන්ද, නව වැදෑරුම් වශයෙන්ද ධ්‍යාන බ්‍රහ්ම විහාර සමවත් වශයෙන්ද, ප්‍රතීත්‍ය සමුත්පාදාංග වශයෙන්ද යෙදීම් කරන ලදී. ජාතිජරා මරණයන්ගේ වෙන්ව ග්‍රහණයෙහි යෙදෙන ක්‍රමය කියන ලද ක්‍රමයමය. එම සියලු ජරා මරණ අන්ත අන්ත කොට ඇති, රූපාදීහු එක්සිය අනූඅටක් පද වෙයි.

දෘෂ්ටි කාරණයන්හි **ඛන්‍ධාපි දිට්ඨිට්ඨානං** යනු විසි ආකාර සක්කාය දෘෂ්ටියට පංචස්කන්ධයන්ම හේතුවන හෙයින්, 'මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ ආත්මය බලන්නාහු බලන්නාහුය. ඒ සියල්ලෝම පංච උපාදානස්කන්ධයන්හි හෝ ඒවා අතරින් එකකම බලන්නාහුය' යයි දෙසූ හෙයින් පංච උපාදානස්කන්ධ දෘෂ්ටීන්ට හේතුයි. **අවිජ්ජාපි දිට්ඨිට්ඨානං** යනු අවිද්‍යාවෙන්, අන්‍ධීකෘතයින්ට දෘෂ්ටි උපදනා හෙයින්, ස්වාමීනි සම්‍යක් සම්බුද්ධත්වයට පත් නුවූවන් කෙරහි, සම්මා සම්බුද්ධ යැයි යම් ඒ දෘෂ්ටියක් වේද, ස්වාමීනි මේ දෘෂ්ටිය කුමක් නිසා පෙනේද? කච්චායනය, යම් මේ අවිද්‍යා ධාතුවක් වේද, එම ධාතුව මහත්ය. කච්චායනය, හීනධාතුව නිසා, හීන සංඥා, හීන දෘෂ්ටි උපදීයයි යන වචනයෙන් අවිද්‍යාව දෘෂ්ටීන්ට හේතුවේ. **ඵස්සොපි දිට්ඨිට්ඨානං** යනු එම ස්පර්ශයෙන් ස්පර්ශ වූවහුට දෘෂ්ටි උපදනා හෙයින්, මහණෙනි යම් ඒ මහණ බමුණෝ පූර්වාන්ත කල්පිත වූවාහු, පූර්වාන්තය අරබයා නොයෙක් ආකාර ඒ හා යෙදුණු පද ප්‍රකාශ කරති. එයද ස්පර්ශය හේතුවෙනි යන වචනයෙන්ද, ස්පර්ශය දෘෂ්ටීන්ට හේතුයි. **සඤ්ඤාපි දිට්ඨිට්ඨානං** යනු ආකාර මාත්‍ර ග්‍රහණයෙන් සංඥාවගේ අයථා ස්වභාව ග්‍රහණ හේතුව බැවින්, යම් ඒ තෙසැටක් බාහිර ශ්‍රමණ ප්‍රවාද නිශ්‍රිත වූ, මහාප්‍රාඥ වූයේ සංඥාක්ෂර, සංඥා නිශ්‍රිත බැසගැනීම් දුරුකොට කාමෝඝ අඳුරට බරවේ යන වචනයෙන්ද, ප්‍රපංච සංඛ්‍යාතයෝ සංඥ නිදානයහයි, වචනයෙන්ද සංඥාව දෘෂ්ටීන්ට හේතුයි. **විතක්කොපි දිට්ඨිට්ඨානං** යනු ආකාර සිතා බැලීමෙන්ද දෘෂ්ටි උපදනා හෙයින්;

**නහෙව සච්චානි බහූනි නානා**
**අඤ්ඤත්‍ර සඤ්ඤාය සච්චානි ලොකෙ**
**තක්කඤ්ච දිට්ඨී සු පකප්පයිත්වා**
**සච්චං මුසාති ද්වය ධම්මමාහු'ති**

සංඥායෙන් තොර, බොහෝ නානාවිධ සත්‍යයෝ නොවේමය. දෘෂ්ටීන්හි තර්කය උපකල්පනය කොට සත්‍යය, මුසාවය යන දෙකරුණ

කිහු, යන වචනයෙන් විතර්කය දෘෂ්ටීන්ට හේතුයි. **අයොනිසො මනසිකාරොපි දිට්ඨිට්ඨානං** යනු නුනුවණින් මෙනෙහි කිරීම අකුසලයන්ට අසාධාරණ හේතුවන බැවින් එහිම, නුනුවණින් මෙනෙහි කරන්නහුට ෂට් දෘෂ්ටීන් අතර, එක්තරා දෘෂ්ටියක් උපදීයයි, වචනයෙන්ද, නුනුවණින් මෙනෙහි කිරීම දෘෂ්ටීන්ට හේතුයි. **පාපමිත්තොපි දිට්ඨිට්ඨානං** යනු පව්ටු මිතුරාගේ දෘෂ්ටියට අනුව පැවැත්මට පැමිණීමෙන් දෘෂ්ටි උපදනා හෙයින් 'මහණෙනි, යම් මේ පාපමිත්‍රතාවයක් (සේවනයක්) වේද? මහණෙනි, බාහිර කරුණක් සේ සලකා මහත් අනර්ථය සඳහා පවත්නා එබඳු වූ අන් එකද කරුණක්වත් මම නොදකින්නෙමියි යන වචනයෙන්ද පව්ටු මිතුරා දෘෂ්ටීන්ට හේතුයි. **පරතොපි සොසො දිට්ඨිට්ඨානං** යනු නොමනාව දෙසන ලද ධර්ම ශ්‍රවණයෙන්ද දෘෂ්ටි උපදනා හෙයින් මහණෙනි, මිථ්‍යා දෘෂ්ටියගේ ඉපැත්ම සඳහා හේතු දෙකකි. ප්‍රත්‍යය දෙකකි. අන්‍යයාගෙන් ශ්‍රවණය කිරීමද, නුනුවණින් මෙනෙහි කිරීමද යන වචනයෙන්ද, අන්‍යයාගෙන් ශ්‍රවණය මිථ්‍යාදෘෂ්ටික වූයේ මිථ්‍යා දෘෂ්ටිය හා එකට යෙදුනේ දෘෂ්ටීන්ට හේතුයි.

දැන් දිට්ඨිට්ඨානං යන පදයට අර්ථ විවරණය කරනුයේ **ඛන්ධා හේතු ඛන්ධා පච්චයො** යන ආදිය වදාළහ. ස්කන්ධයෝම දෘෂ්ටීන්ගේ උපපාදාය ඉපැත්ම සඳහා ජනක හේතුවමද, උපස්ථම්භක ප්‍රත්‍යය යයිද අර්ථයි. **සමුට්ඨානට්ඨෙන** යනු එය කරණකොට හටගනිත්. උපදිත්නුයි සමුට්ඨානංයි. කරුණයැයි අර්ථයි. ඒ හටගැනීම් අර්ථයෙන් දෘෂ්ටි හේතු භාවයෙනැයි අර්ථයි.

දැන් කෘත්‍ය භේදයෙන් දෘෂ්ටි භේදය දක්වනුයේ **කතමානි අට්ඨාරස දිට්ඨි පරියුට්ඨානානි** යනාදිය දෙසූහ. එහි **යාදිට්ඨි** යනු දැන් කියනු ලබන අටළොස් පදයන්ගේ සාධාරණ මූලපදයයි. යම් දෘෂ්ටියක් වේද, එයම දෘෂ්ටිගතයි. යම් දෘෂ්ටියක් වේද, එයම දෘෂ්ටි ග්‍රහණයැයි සියල්ලෙහි සම්බන්ධය කළයුතුය. අයථා දර්ශනාර්ථයෙන් **දිට්ඨියි** එම දෘෂ්ටීන්හිම ගිය දර්ශනයයි. දෙසැටක් දෘෂ්ටීන්හි ඇතුළත් වූයේනුයි **දිට්ඨිගතංයි**. යටද අර්ථය කියන ලද්දේමය. දෙඅන්තයන්ට ඒකාන්තයෙන් ගිය හෙයින්ද **දිට්ඨිගතංයි**. එම දෘෂ්ටියම ඉක්මවීම දුෂ්කරාර්ථයෙන් **දිට්ඨිගහනංයි**. තෘණ ගහණය, වන ගහණය, පර්වත ගහණයන් මෙනි. සැක සහිත, බිය සහිත අර්ථයෙන් **දිට්ඨි කන්තාරංයි**. චෝර කාන්තාරය, වාළ (නපුරු සතුන් සහිත) කාන්තාරය, නිරුදක කාන්තාරය, දුර්භික්ෂ කාන්තාරය මෙනි.

ධම්මසංගණියෙහි, දිට්ඨි කන්තාරොයි ස්වකීය ලිංගයෙන්ම ආයේය. සම්‍යග් දෘෂ්ටියගේ විනිවිද යන අර්ථයෙන් ප්‍රතිලෝම අර්ථයෙන් **දිට්ඨි විසූකංයි.** මිථ්‍යා දර්ශනය උපදිනු ලබන්නේ, සම්‍යක් දර්ශනය විනිවිද යයිද, විරුද්ධ වූයේද වේ. ධම්මසංගණියෙහි දිට්ඨි විසූකායිකං යයි ආයේය. කිසිකලෙකැ ශාශ්වතයාගේද, කිසිකලෙකැ උච්ඡේදයාගේද ග්‍රහණය හෙයින් දෘෂ්ටියගේ විරූප වූ චලනය නුයි දිට්ඨි විප්ඵන්දිතංයි. දෘෂ්ටිගතිකයා වනාහි එක් අරමුණෙක්හි පිහිටීමට නොහැකි වේ. කිසිකලෙකැ ශාශ්වතය සිහිකරයි. කිසිකලෙක උච්ඡේදය සිහිකරයි. දෘෂ්ටියම අනර්ථයෙහි යොදවයි නුයි **දිට්ඨි සංයෝජනංයි.** දෘෂ්ටියම ඇතුළත විදින අර්ථයෙන් ඉවත්කිරීම දුෂ්කර අර්ථයෙන්ද, දැඩි සම්බාධ යනුයි. **දිට්ඨි සමබාධොයි.** දෘෂ්ටියම මෝක්ෂය ආවරණ කරන අර්ථයෙන් පරිබෝධ යනුයි **දිට්ඨි පළිබොධොයි** දෘෂ්ටියම ඉන් මිදීම දුෂ්කර අර්ථයෙන් බන්ධනයනුයි දිට්ඨි බන්‍ධනංයි. දෘෂ්ටියම එසවීම දුෂ්කර අර්ථයෙන් ප්‍රපාතයක් වැනිනුයි **දිට්ඨි පපාතොයි.** දෘෂ්ටියම බලවත් භාවයට පත් අර්ථයෙන් අප්‍රකටව පවතීනුයි **දිට්ඨානුසයොයි** දෘෂ්ටියම තෙමේ මනාව තවයිනුයි **දිට්ඨි සන්තාපොයි** දෘෂ්ටියම තෙමේ දවයිනුයි **දිට්ඨි පරිළාහොයි.** දෘෂ්ටියම කෙලෙස් කය ගැටගසානුයි **දිට්ඨි ගන්‍ථොයි** දෘෂ්ටියම බොහෝ සේ ගනීනුයි **දිට්ඨුපාදානංයි** දෘෂ්ටියම සත්‍යයයි ආදී වශයෙන් ඇලේනුයි **දිට්ඨාභිනිවෙසොයි.** දෘෂ්ටියම මෙය ශ්‍රේෂ්ඨයයි ස්පර්ශ කෙරේ. තදින් ස්පර්ශ කෙරේනුයි **දිට්ඨි පරාමාසොයි.**

දැන් රාසි වශයෙන් සොළොස් දෘෂ්ටීන් උදෙසනුයේ **කතමා සොළස දිට්ඨියො** යනාදිය වදාළහ. එහි සුව සොම්නස් සංඛ්‍යාත ආස්වාදයෙහි දෘෂ්ටිය **අස්සාද දිට්ඨියි.** ආත්මානුගත දෘෂ්ටිය **අත්තානු දිට්ඨියි.** නැතයයි පවත්නා හෙයින් විපරීත දෘෂ්ටිය **මිච්ඡා දිට්ඨියි.** කයෙහි දෘෂ්ටිය ඇතිකල්හි, හෝ කාය දෘෂ්ටිය මෙහි කය යනු ස්කන්ධ පංචකයයි. ස්කන්ධ පංචක සංඛ්‍යාත සක්කාය වස්තුවෙහි පිහිටීම එයටනුයි **සක්කාය වත්‍ථුකායි.** ශාශ්වතයැයි පැවැති දෘෂ්ටිය **සස්සත දිට්ඨියි** විනාශයැයි පැවැති දෘෂ්ටිය **උච්ඡෙද දිට්ඨියි.** ශාශ්වතාදී අන්තය ගනීනුයි **අන්තග්ගාහිකායි.** අතීත සංඛ්‍යාත පූර්වාන්තය අනුව ගිය දෘෂ්ටිය **පුබ්බන්තානු දිට්ඨියි.** අනාගත සංඛ්‍යාත අපරාන්තය අනුව ගිය දෘෂ්ටිය **අපරන්තානු දිට්ඨියි** අනර්ථයෙහි මනාව යොදවයි නුයි **සංයොජනිකායි** මම යන හැඟීම් වශයෙන් මමයැයි උපන් මානයෙන්, දෘෂ්ටියෙහි මූල ස්වභාවයෙන්, මනාව බද්ධව ගැටී උපදවන ලද දෘෂ්ටිය **අහන්ති මාන විනිබද්ධා දිට්ඨියි.** මාගේ යන හැඟීම්

වශයෙන් මාගේ යයි උපන් මානයෙන් මනාව බද්ධ වූ දෘෂ්ටිය **මමන්ති මාන විනිබන්ධා දිට්ඨියි.** ආත්මය ගැන කීම අත්තවාදයි. ඒ හා මනාව සංයුක්ත වූ, බද්ධ වූ දෘෂ්ටිය **අත්තවාද පටිසඤ්ඤුත්තා දිට්ඨියි** ආත්මය ලෝකය යැයි කීම, කථනය ලෝකවාදයයි. ඒ හා සමග යෙදුණු දෘෂ්ටිය **ලොකවාද පටිසඤ්ඤුත්තා දිට්ඨියි.** ශාශ්වතය භවයැයි කියනු ලැබේ. ශාශ්වත වශයෙන් උපදනා දෘෂ්ටිය **භව දිට්ඨියි** විනාශය විභවය යැයි කියනු ලැබේ. විනාශවීම් වශයෙන් උපදනා දෘෂ්ටිය **විභව දිට්ඨියි.**

දැන් තුන්සියයක් දෘෂ්ටාභිනිවේසයන් නිර්දේශ කරනු කැමැත්තේ **කතමෙ තීණි සතං දිට්ඨාභි නිවෙසං** යයි විචාරා, ඒවා නොවිසඳම, වෙන් වෙන් අභිනිවෙස විසඳුමෙන්ම ඒවා විසඳනු කැමැත්තේ, **අස්සාද දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති** යැයි ආදී ක්‍රමයෙන්, සොළොස් දෘෂ්ටීන්ගේ අභිනිවෙසාකාර ග්‍රහණය නොවිචාරා, නැවත **අස්සාද දිට්ඨියා පංචතිංසාය ආකාරෙහි අභිනිවෙසො** හොති යැයි ඒ සොළොස් දෘෂ්ටීන්ගේ අභිනිවෙසාකාර ග්‍රහණය විසඳ, නැවත එම ගණන් විසඳන්නේ **අස්සාද දිට්ඨියා කතමෙහි පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො** හොතියැයි ඒ සොළොස් දෘෂ්ටීන්ගේ අභිනිවෙසාකාර ග්‍රහණය විසඳ, නැවත එම ගණන් විසඳන්නේ **අස්සාද දිට්ඨියා කතමෙහි පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො හොති** යනාදිය වදාළහ.

එහි **රූපං පටිච්ච** යනු රූපස්කන්ධ හේතුයෙන්, **උප්පජ්ජති සුඛං සොමනස්සං** යනු මාගේ මේ ශරීරය මේ ආකාරයැයි රූපසම්පත්තිය හේතුයෙන් ලෞකික දෑ හා සම්බන්ධ වූ, රාග සම්ප්‍රයුක්ත සුව සොම්නස උපදී. යට කියන ලද අර්ථයෙන් සුවයද, සොම්නසද, **එයම රූපස්ස අස්සාදොයි** රූප නිශ්‍රිත ආස්වාදයයි. එම සුවය තෘෂ්ණා වශයෙන් ආස්වාදනය කෙරේ. පරිභෝග කෙරේනුයි = ආස්වාදයයි. **අභිනිවෙස පරාමාසො දිට්ඨි** යනු එම ආස්වාදය ශාශ්වතයයැයි හෝ විනාශ වන්නේ යැයි හෝ ශාශ්වත හෝ විනාශවන්නා වූ ආත්මය සුවපත් කෙරේනුයි හෝ අභිනිවෙස පරාමාසය වේ. එහෙයින් යම් දෘෂ්ටියක් වේද, යම් ආස්වාදයක් වේද, ආස්වාදයෙහි දෘෂ්ටි භාවයෙහිද අභාවයෙහිද, ආස්වාදයෙන් තොරව එම දෘෂ්ටිය නොවේ යයි කොට ද්වයයම එක්කරන ලදී. **අස්සාද දිට්ඨි** යනු ආස්වාදයෙහි පවත්නා දෘෂ්ටිය යැයි යූ.සේයි.

දැන් නොයෙක් සූත්‍රයන් සමග සංසන්දනය කොට මිථ්‍යා දෘෂ්ටියද,

මිථ්‍යා දෘෂ්ටිත්වයද ගර්හා කරනු කැමැතියේ අසසාද දිට්ඨී මිච්ඡා දිට්ඨී ආදිය වදාළහ. එහි **දිට්ඨී විපත්ති** යනු සම්‍යක් දෘෂ්ටිය විනාශ කරන මිථ්‍යා දෘෂ්ටි සංඛ්‍යාත දෘෂ්ටියෙහි විපතයි. **දිට්ඨී විපනෙනා** යනු පෙරළුනු, නට සම්‍යක් දෘෂ්ටිය වන්නේනුයි දිට්ඨී විපනෙනායි. පෙරළුණු දෘෂ්ටිය යැයි යූ.සේයි. මිථ්‍යා දෘෂ්ටියෙහි හෝ පෙරළුණේ, නටුයේනුයිද දිට්ඨී විපත්නයි. **නසෙවිතබ්බො** යනු එළැඹීම් වශයෙන්, **නභජිතබ්බො** යනු සිතින්, **නපයිරුපාසිතබ්බො** යනු එළඹ හිඳීමෙන්. **තං කිසස හෙතු** එම සේවනාදීන් කවර කරුණෙකින් නොකටයුතුදැයි එහි කරුණු විමසීමයි. **දිට්ඨිහිසස පාපිකාති** යනු කරුණු විසඳීමයි. මෙම පුද්ගලයාගේ දෘෂ්ටිය පවිටුද? එහෙයින් ඔහු සෙවුණාදිය නොකටයුතුයැයි අර්ථයි. **දිට්ඨියා රාගො** යනු මාගේ දෘෂ්ටිය යහපත්යැයි දෘෂ්ටිය අරබයා උපදනා ඇල්මයි. **දිට්ඨිරාග රතෙතා** යනු එම දෘෂ්ටි රාගය නමැති සායමින් රතු වූයේ රතු වස්ත්‍රයක් මෙනි. **න මහපඵලං** යනු විපාක ඵලයෙන් **න මහානිසංසං** යනු විපාක ඵලයෙන්, **පුරිස පුගගලසස** යනු පුරිස සංඛ්‍යාත වූ පුද්ගලයාගේ, ලෞකික ව්‍යවහාරයෙන් ශරීරය පුරියැයි යූ.සේයි. එම ශරීරයෙහි සයනය කරයි. පවතීනුයි පුරිස නමැ. නිරය පුං යැයි යූ.සේයි. එම නිරයට ගිලිහේ යෙයිනුයි පුද්ගලයි. බොහෝසෙයින් සත්ත්වයෝ සුගතියෙන් චුතව දුගතියෙහිම උපදිති. **තං කිසස හෙතු** එය මහත්ඵල නොවේ. කවර කරුණෙකින් වේද? **දිට්ඨී හිසස පාපිකා** යනු මෙම පුද්ගලයාගේ දෘෂ්ටිය පාපීද? එහෙයින් මහත්ඵල නොවේයයි අර්ථයි. **දෙවච ගතියො** යනු පඤ්ච ගතීන්හි දෙගතියක්ම, විද්‍යමාන දෘෂ්ටියෙන් **නිරයොයි**. දියුණුවට පත්වනු ලබන දෘෂ්ටියෙන් **තිරචඡානයොනියි යඤ්චව කාය කමමං** යනු තම ස්වභාවය දැරීම, ප්‍රතිපදාවන්හි යෙදීම, වැඳීම, එළඹ සිටීම, ඇඳිලි බැඳීම් ආදී කාය කර්මයි. **යඤ්ච වචී කමමං** යනු තම ආගම පුහුණු කරන පාඩම් කීම් දේශනා සමාදන් කරවීම් ආදී වාග්කර්මයි. **යඤ්ච මනොකමමං** යනු මෙලොව චින්තාවන් හා ප්‍රතිසංයුක්ත වූද, පරලොව චින්තාවන් හා ප්‍රතිසංයුක්ත වූද, කළ නොකළ චින්තාවන් හා ප්‍රතිසංයුක්ත වූද, තෘණ, කාෂ්ඨ, ධාන්‍ය බීජයන්හි සත්ත්වයෙක් යන දෘෂ්ටියද, දීම් මනාව දීම්, ප්‍රතිග්‍රහණ, පරිභෝගයන්හිද වූ කාය, වාග්, මනො කර්මයි. **යථාදිට්ඨී** යනු යම් මේ දෘෂ්ටියක් වේද, එයට අනුරූපව, **සමතතං** යනු පරිපූර්ණ, **සමාදිනනං** යනු ගන්නා ලද,

අටුවායෙහි වනාහි යූ.සේයි. යම් ඒ දෘෂ්ටියක් වේද, එය දෘෂ්ටියට අනුව සිටි කායකර්මය දෘෂ්ටිය අනුව එකට හටගත් කායකර්මය, දෘෂ්ටියට

අනුලොම් කාය කර්මය යයි තෙවදෑරුම් වේ. එහි ප්‍රාණය නසන්නහුට, නුදුන් දැය ගන්නහුට, මිථ්‍යා කාමයෙහි හැසිරෙන්නහුට, ඒ හේතුයෙන් පාපයෙක් නැත. පවෙහි පැමිණීමෙක් නැතැයි යම් මෙබඳු වූ දෘෂ්ටිකයෙකුව ඇතිකල්හි, ප්‍රාණඝාත, අදින්නාදාන, මිථ්‍යාචාර සංඛ්‍යාත කායකර්මයන්හි යෙදේ. මෙය දෘෂ්ටිය අනුව සිටි කායකර්මය නමැ. ප්‍රාණය නසන්නහුට, නුදුන් දෑ ගන්නහුට, මිථ්‍යා කාමයෙහි හැසිරෙන්නහුට, ඒ හේතුයෙන් පාපයෙක් නැත. පවෙහි පැමිණීමෙක් නැතැයි යම් මෙබඳු දෘෂ්ටියෙන්, මේ දර්ශනයෙන් සමග හටගත් කායකර්මයක් වේද? මෙය දෘෂ්ටිය හා එකට හටගත් කායකර්මය නමැ. එයම සම්පූර්ණයෙන් සමාදන් වූයේ ගන්නා ලද්දේ ස්පර්ශ කරන ලද්දේ දෘෂ්ටි අනුලෝමික කායකර්මය නමැ. වාක් කර්ම මනෝ කර්මයන්හිද එම ක්‍රමයමැයි. මෙහි වනාහි අසත්‍යය තෙපලන්නහුට, කේළාම් තෙපලන්නහුට, කර්කශ වචන තෙපලන්නහුට, හිස් ප්‍රලාප දොඩවන්නහුට අභිධ්‍යාවෙහි ගැලුනා වූ, ක්‍රෝධ සිතැති මිථ්‍යා දෘෂ්ටිකත්වයෙහි පැවතීම වූයේ නමුදු, ඒ හේතුයෙන් පාපයෙක් නැත. පාපයෙහි පැමිණීමෙක් නැතැයි යෙදීම් කළයුත්තාහ. ආකාර, දැරීම්, පුරුදු කිරීම් ආදී ලෝක සිතිවිලි ආදී වශයෙන් කියන ලද ක්‍රමය වඩා සුන්දරයි.

චේතනාදීන්හි, දෘෂ්ටිය සමග හටගත් චේතනාව චෙතනා නමැ. දෘෂ්ටිය සමග හටගත් ප්‍රාර්ථනාව **පත්‍ථනා** නමැ. චේතනා ප්‍රාර්ථනාවන්ගේ වශයෙන් සිතෙහි තැබීම **පණිධි** නම. ඒ චේතනාදීන් හා සම්ප්‍රයුක්ත ස්පර්ශාදී සංස්කාරස්කන්ධයන්ට ඇතුළත් ධර්ම **සංඛාරා** නමැ. **අනිට්ඨාය** ආදීන්ගෙන් දුකබයම යු.සේයි. දුක වනාහි සුව කැමැති සත්ත්වයින් විසින් නොසොයන ලද හෙයින් **අනිට්ඨංයි**. අප්‍රිය බැවින් **අකන්තංයි**. චිත්තයාගේ අනභිවෘද්ධිය හෙයින්ද, සිතෙහි නොදැගලීම හෙයින්ද **අමනාපංයි**. මත්තෙහි අයහපත්භාවය සඳහා පැවැත්තේ **අහිතංයි**. පීඩා ගෙනදෙන හෙයින් **දුකඛංයි**. **තං කිස්ස හෙතු** යනු එය මෙසේ පැවැත්ම කවර කරුණෙකින් වේදැයි අර්ථයි.

දැන් මෙයට කාරණයයි. **දිට්ඨි හිස්ස පාපිකා** යනු යම්හෙයකින් එම පුද්ගලයාගේ දෘෂ්ටිය පාපී ලාමකද? එහෙයින් මෙසේ පවතීයයි අර්ථයි. **අල්ලාය පඨවියං නික්ඛිත්තං** යනු ජලයෙන් තෙත්වූ භූමියෙහි රෝපණය කරන ලද **පඨවිරසං ආපොරසං** ඒ ඒ තන්හි පෘථුවියෙහිද, ජලයෙහිද සමෘද්ධත්වය, බීජ නික්ෂිප්ත හැම පෘථුවි ස්ථානයක හා හැම

ජල ස්ථානයක බීජ ඵල නොගනී. යම් ප්‍රදේශයක් එම බීජ ස්පර්ශ කරයිද? එම ප්‍රදේශයම බීජ ඵල ගන්වයි. එහෙයින් බීජ පෝෂණයට ප්‍රත්‍යය වූම එම ප්‍රදේශය පෘථුවි රසය, ජල රසයයි දතයුතුය. රස ශබ්දයෙහි සම්පත්ති යන අර්ථයද වේ. දෙසූ පරිදි, 'කෘත්‍ය සම්පත්ති අර්ථයෙන් රසය නමැයි කියනු ලැබේ. ලෝකයෙහිද, සූරස ගන්‍ධර්වයායි කී කල්හි මනා ගුණ යුත් ගාන්ධර්වයායි අර්ථය හැඟේ. **උපාදියති** යනු ගනී. එම ප්‍රදේශය වනාහි ප්‍රත්‍යය වේ. එම ප්‍රත්‍යය ලබන්නා වූ බීජය එය ගනී නමැ. **සබ්බං තං** යනු ඒ සියලු රසජාතය. **තිත්තකත්තාය** යනු, එම පෘථුවි රසයද, ජල රසයද තිත්ත රස නොවූයේ නමුදු, තිත්ත බීජය හේතුයෙන්, කොහොඹ රුක් ආදීන්ගේද, ඒවාහි ඵලයන්ගේද තිත්තභාවය පවත්වයි. **කටුකත්තාය** යනු මෙය පළමු පදයටම පර්යාය වචනයකි.

> **වණ්ණ ගන්ධ රසූපෙතො - අම්බායං අහුවා පුරෙ**
> **තමෙව පූජං ලභමානො - කෙනම්බො කටුකප්ඵලො**'ති

'පෙර මේ අඹ වර්ණ, ගන්ධ, රසයන්ගෙන් යුක්ත වූයේ විය. එම පූජාවම ලබනුයේ, කවර හෙයින් අඹ කටුක ඵල විණිද? ආ තන්හි මෙන්, මෙහිද, තිත්තම, අප්‍රියාර්ථයෙන් කටුකැයි දතයුතුය. **අසාතත්තාය** යනු අමිහිරි භාවය සඳහා, **අසාදුතතාය** යනුද පාඨයි. අමිහිරි භාවය යයි අර්ථයි. සාදු යනු මිහිරියි. **බීජං හිසස** යනු කොසොඹ ආදී බිජුවටෙහි, **එවමෙවං** යනු මෙසේ, මෙසේ, යම්හෙයකින් සුව වේදනාව උතුම් ආස්වාදයද? එහෙයින් මිථ්‍යා දෘෂ්ටියෙහි දුක් වේදනා වශයෙන් ආදීනව දක්වන ලදී.

නැවත අටළොස් භේදයෙන් දෘෂ්ටියෙහි ආදීනව දක්වන්ට අසසාද **දිට්ඨි මිච්ඡා දිට්ඨියි** ආදිය වදාළහ. එය කියන ලද අර්ථමය.

**ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි පරියුට්ඨිත චිත්තසස සංයොගො** යනු දෘෂ්ටියෙන්ම සංසාරයෙහි බන්ධනය දක්වයි. යම්හෙයකින් වනාහි දෘෂ්ටිභූත වූද, අදෘෂ්ටි භූත වූද සංයෝජන ඇත. එහෙයින් ඒ ප්‍රභේද දක්වනුයේ, **අත්‍ථි සංයොජනානිචෙව** ආදිය වදාළහ. එහි යම්හෙයකින් කාමරාග සංයෝජනයටම අනුනය සංයෝජනයයි ආ ස්ථානද ඇත. එහෙයින් **අනුනය සංයොජනං** යයි යු.සේයි.

කාමරාග භාවයට, නොපත්ව පැවැති ලෝභය සඳහා මෙසේ යූ.සේයි. සෙසු ස්කන්ධ ආයතන මුල්කොට ඇති වාරයන්හි මෙම ක්‍රමයෙන්ම අර්ථය දතයුතුය. වේදනා කෙළවරකොට ඇති ආස්වාදයාගේ වේදනා අවසන්කොටම දේශනය කරන ලදී. සංඥාදීහු නොගන්නා ලදහ.

**ඉමෙහි පඤ්චතිංසාය ආකාරෙහි** යනු ආධ්‍යාත්මිකාදී පංචස්කන්ධයන්ද, පස්වැදෑරුම් ෂට්කයන්ද යන මේ තිස්පස් වස්තූන් නිශ්‍රයකොට, උපන් ආස්වාද අරමුණු වශයෙන් තිස්පස් ආකාරයන්ගෙන්

**ආස්වාද දෘෂ්ටි වර්ණනාව නිමි.**

ආත්මානු දෘෂ්ටියෙහි **අසසුතවා පුථුජ්ජනො** යනු ඇදහීම්, අධිගම අභාවයෙන් අශ්‍රැතවතා යැයි දතයුතුය. යමෙකුට වනාහි ස්කන්ධ, ධාතු ආයතන, සත්‍ය, ප්‍රත්‍යයාකාර, සතිපට්ඨානාදීන්හි, ඉගෙනීම් විචාරීම් විනිශ්චය විරහිත හෙයින්, ආත්මානු දෘෂ්ටිය ප්‍රතිෂේධකාරිත්වය නොපැමිණේ. ප්‍රතිපත්තියෙන් අවබෝධ කොටගත යුතු දෑ අවබෝධ නොකළ හෙයින් අධිගමයද නොමැත. හෙතෙම ආගම අධිගම අභාවයෙන් අශ්‍රැතවතා යැයි දතයුතුය. **සුතං** යනු, බුදුවදන් ඉගෙනීමද, ශ්‍රැත ඵලය හෙයින්, හේතු ව්‍යවහාර වශයෙන් අධිගමයද, එම ශ්‍රැතය ඔහුට ඇත්තේනුයි ශ්‍රැතවායි. ශ්‍රැතයක් නොමැතියේ අශ්‍රැතවායි.

පුථූනං ජනනාදීහි - කාරණෙහි පුථුජ්ජනො
පුථුජ්ජන නෙතා ගධතතා - පුථුවායං ජනො ඉති

ඒ මෙය බොහෝ පැතිර සිටි දැහි ඉපදවීම් ආදී කාරණයන්ගෙන් පෘථග්ජනයි. පෘථග්ජනයන්ට ඇතුළත් හෙයින් මේ ජනයා පුථුනම් වේ.

හෙතෙම වනාහි බොහෝ නානාප්‍රකාර කෙලෙසුන්ගේ ඉපදවීම් ආදී කාරණයන්ගෙන් පෘථග්ජනයි. දෙසූ පරිදි, බොහෝ කෙලෙස් උපදවන්නුයි පෘථග්ජනයි. බොහෝ පහනොකරන ලද සත්කාය දෘෂ්ටිකනුයි පෘථග්ජනයි. බොහෝ ශාස්තෘන්ගේ මුහුණු බලන්නේනුයි පෘථග්ජනයි. බොහෝ නොයෙක් උත්පත්තීන්ගෙන් නොනැගිටියේනුයි පෘථග්ජනයි.

බොහෝ නොයෙක් අභිසංස්කාරයන් රැස් කෙරෙත්නුයි පෘථග්ජනයි. බොහෝ නොයෙක් ඕඝයන්ගෙන් පාවී යත්නුයි පෘථග්ජනයි. බොහෝ නොයෙක් සන්තාපයන්ගෙන් තැවෙත්නුයි පෘථග්ජනයි.

බොහෝ නොයෙක් දාහයන්ගෙන් දැවෙත්නුයි පෘථග්ජනයි. බොහෝ පඤ්චකාම ගුණයන්හි ගැලුණාහු, මූර්ඡා වූවාහු, බැසගත්තාහු, ඇලුණේ, ඇලී සිටියේ, කිළිටි වූයේනුයි පෘථග්ජනයි. බොහෝ පඤ්ච නීවරණයන්ගෙන්, අමුණන ලදුයේ, වසන ලදුයේ, බාධාකරන ලදුයේ, ඡාදිත වූයේ, යටිකුරු කරන ලදුයේ නුයි පුථුජ්ජනයි. බොහෝ වූ ගණන් කළ නොහැකි තරම් ඉක්මුණු ආර්ය ධර්මයන් පරම්මුඛ වූ, නීච ධර්මයන්හි හැසිරීම්වලට ඇතුළත් වූ හෙයින්ද පෘථග්ජනයි. සීල ශ්‍රැත ආදී ගුණයුත් ආර්යජනයන් සමග සම්බන්ධ නුවූයේ, මෙතෙම බොහෝසෙයින් වෙන් වූයේම යැයි යන සංඛ්‍යාවට ගිය හෙයින්ද පෘථග්ජනයි. මෙසේ එම 'අසසුතවා පුථුජ්ජනො' යන දෙපදයෙන් යම් ඒ

**දුවෙ පුථුජ්ජනා වුතතා - බුදෙධනාදිචච බනුධුනා**
**අනෙධා පුථුජ්ජනොඑකො - කලාහාණෙකො පුථුජ්ජනො**

ආදිච්චබන්ධු බුදුරදුන් විසින් පෘථග්ජනයෝ දෙදෙනෙක් දේශනා කරන ලදහ. එක් අයෙක් අන්ධ පෘථග්ජනයාය. අනෙකා කල්‍යාණ පෘථග්ජනයායි යූ.සේයි.

**අරියානං අදසසාවි** යනාදීන්හි, කෙලෙසුන්ගෙන් දුර හෙයින්ද, අක්‍රමවත් දැහි ක්‍රියා නොපවත්වන හෙයින්ද, වර්ධනයෙහි ක්‍රියා පවත්වන හෙයින්ද, සදේවක ලෝකයා විසින් කෙලෙස් තොරතාවයෙන් සලකනු ලබන හෙයින් බුදු පසේබුදු ශ්‍රාවකයෝ යූ.සේයි.

බුදුවරුම හෝ මෙහි ආර්යයෝය. දෙසූ පරිදි, මහණෙනි, දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- තථාගතයන් වහන්සේ ආර්යයැයි කියනු ලැබේ. **සපපුරිසං** යන මෙහි පසේ බුදුවරු තථාගත ශ්‍රාවකයෝ සත්පුරුෂ යැයි දතයුත්තාහ. ඔවුහු වනාහි ලෝකෝත්තර ගුණ යෝගයෙන් යහපත් පුරුෂයෝ නුයි සත්පුරුෂයෝය. එම දෙයාකාරයෙන් කියන ලද සියලුම බුදුවරුද ආර්යයෝද, සත්පුරුෂයෝද, පසේබුදුවරුද, බුද්ධ ශ්‍රාවකයෝද වෙති. දෙසූ පරිදි,

**යොවෙ කතඤ්ඤූ කතවෙදී ධීරො**
**කල්‍යාණ මිත්තො දළ්හභත්තීච හොති**
**දුඛිතස්ස සක්කච්ච කරොති කිච්චං**
**තථාවිධං සප්පුරිසං වදන්ති**

යමෙක් ඒකාන්තයෙන්, කළගුණ දත්, කළ උපකාරය දත් ප්‍රඥාවෙන් යුත්, දැඩි භක්තිය ඇති කළණ මිතුරෙක් වේද, දුප්පතාගේ අවශ්‍ය කාර්යයන් සකස්ව කෙරේද? එබඳු ආකාර ඇත්තේ සත්පුරුෂයා යැයි කියති.

මෙහි වනාහි 'කතඤ්ඤූකතවෙදී ධීරො' පසේ බුදුරද යූ.සේ. කල්‍යාණ මිත්තො දළ්හ භත්ති යනු බුද්ධශ්‍රාවක තෙමේ, **දුඛිතස්ස සක්කච්ච** කරොති කිච්චං යනු සම්මා සම්බුදුරජාණන් වහන්සේයි.

යමෙක් ඒ ආර්යයන්ගේ නොදක්නා සුලුවූයේ, දර්ශනයෙහිද යහපත් ප්‍රතිචාරයක් නොදක්වයිද? හෙතෙම අරියානං අදස්සාවී යයි දතයුතුය. එයද චක්ෂුසින් නොදැක්ම, නුවණින් නොදැක්ම යැයි දෙයාකාරය. ඒවා අතර නුවණින් නොදැක්ම මෙහි අදහස් කරන ලදී. මසැසින් හෝ දිවැසින් හෝ ආර්යයෝ දිටියේද නොදිටියේම වෙති. ඔවුන්ගේ ඇස්වලට වර්ණය පමණක් ග්‍රහණය වන හෙයින්, ආර්යභාවය ගෝචර නොවන හෙයිනි. බලු සිවල් ආදීහුද චක්ෂුසින් ආර්යයන් දකිති. එම සත්තු ආර්ය දර්ශකයෝ නොවෙති. එහෙයින් චක්ෂුසින් දැක්ම දර්ශනයක් නොවේ. නුවණින් දැක්මම දර්ශනයයි. දෙසූ පරිදි, වක්කලිය, නුඹට මේ කුණුකය දැක්මෙන් කවර ප්‍රයෝජනයෙක්ද? වක්කලිය, යමෙක් වනාහි ධර්මය දකීද? හෙතෙම මා දකියි. එහෙයින් මසැසින් දක්නා ලද්දේද? නුවණින් ආර්යයන් විසින් දක්නා ලද අනිත්‍යාදි ලක්ෂණ නොදක්නේ, ආර්යයන් විසින් අවබෝධ කරන ලද ධර්මය අවබෝධ නොකරන්නේ, ආර්යභාවය හටගන්වන ධර්මයන්ද ආර්යභාවයද නොදුටු හෙයින් අරියානං අදස්සාවීයි දතයුතුය. **අරියධම්මස්ස අකොවිදො** යනු සතිපට්ඨානාදී භේද වූ ආර්ය ධර්මයන්හි අදක්ෂ වූයේ, **අරියධම්මෙ අවිනීතො** යන මෙහි වනාහි,

**දුවිධො විනයො නාම - එකමෙකෙත්ථ පඤ්චධා**
**අභාවතො තස්ස අයං - අවිනීතොති වුච්චති**

විනය දෙයාකාරය. එම දෙවැදෑරුම් විනය නැවත එකින් එක පස්වැදෑරුම්ය. එහි අභාවයෙන් මෙතෙමේ අවිනීතයැයි යූ.සේයි.

මෙය වනාහි, සංවර විනය, ප්‍රහාණ විනය යැයි විනය දෙවදෑරුම්ය. මෙහි දෙවදෑරුම් විනයෙහි එක් එක් විනය පස් ආකාරයකට බිඳේ. සංවර විනයද, සීල සංවරය, සති සංවරය, ඤාණ සංවරය, ක්‍ෂාන්ති සංවරය, වීර්ය සංවරයැයි පස්වැදෑරුම්ය.

පහාණ විනයද, තදංග, විකඛමහන, සමුචෙඡ්ද, පටිපපසසදධි, නිසසරණ යයි පස්වැදෑරුම්ය. එහි 'මේ ප්‍රාතිමෝක්‍ෂ සංවරයෙන් යුක්ත වූයේ, මනාව යුක්ත වූයේ යන මෙය සීල සංවරයයි. චක්‍ෂු ඉන්‍ද්‍රිය රකියි. චක්‍ෂුන්‍ද්‍රියෙහි සංවරයට පැමිණේ. මේ සති සංවරයයි.

**යානි සොතානි ලොකසමිං (අජිතානි භගවා) සති තෙසං නිවාරණං සොතානං සංවරං බ්‍රෑමි - පඤඤායෙතෙ පිථීයරේ'ති**

බුදුරදුන් අජිතයැයි ඔහු අමතා, මෙසේ වදාළේය. ලෝකයෙහි යම් ශ්‍රෝතස්හු කෙනෙක් වෙත්ද? සිහිය ඒවාහි නොමග යාම්, වැලැක්මේ ආධාරකයයි. ශ්‍රෝතෑන්ගේ සංවරය වදාරමි. ප්‍රඥායේ ඒවා වසා දමනු ලැබේ.

මේ ඤාණ සංවරයයි. සීතයාගේ උෂ්ණයාගේ ස්වභාවය (සීත උෟෂ්ණ) ඉවසන්නේ වේ. මේ ක්‍ෂාන්ති සංවරයයි. උපන් කාම විතර්කය නොඉවසයි. මේ වීර්ය සංවරයයි. මෙම සියලුම සංවරය තම තමාට හැකි පරිදි, සංවර විය යුතු හෙයින්ද, හික්මවිය යුතු හෙයින්ද, කාය දුශ්චරිතාදීන්ගේ හික්මීම කරන හෙයින්ද, සංවරයි. හික්මවන හෙයින් විනය යයි යූ.සේයි. මෙසේ සංවර විනය පස් ආකාරයකට බිඳේයයි දතයුතුය.

එසේම මේ නාමරූප පිරිසිඳීම් ආදී විදර්ශනා ඤාණයන්හි ප්‍රතිපක්‍ෂ භාවයෙන්, අඳුරට ප්‍රදීපාලෝකය මෙන් ඒ ඒ විදර්ශනා ඤාණයෙන් ඒ ඒ අංගයාගේ ප්‍රහාණය වේ. ඒ කෙසේද යත් නාමරූප පිරිසිඳ දැනීමෙන් සක්කාය දෘෂ්ටියෙහිද ප්‍රත්‍යය පරිග්‍රහණයෙන් අහේතු විෂම හේතු දෘෂ්ටීන්ගේද, කංඛාවිතරණයෙන් සැක සහිත භාවයාගේද කලාප සම්මර්ශනයෙන් මම මාගේ යන ග්‍රාහයාගේද, මාර්ගාමාර්ග පිරිසිඳ දැනීමෙන් නොමගෙහි මාර්ග සංඥාවගේද, උදය දර්ශනයෙන් උච්ඡේද දෘෂ්ටියගේද, ව්‍යය දර්ශනයෙන් ශාශ්වත දෘෂ්ටියගේද, භය දර්ශනයෙන්

බියවිය යුත්තෙහි පවත්නා අභය සංඥාවගේද, ආදීනව දර්ශනයෙන් ආස්වාද සංඥාවගේද, නිර්වේදානුපස්සනාවෙන්, ඇලීම් සංඥාවගේද, මුඤ්චිතුකම්‍යතා ඤාණයෙන් අමුඤ්චිතු කම්‍යතාවගේද, උපේක්ෂා ඤාණයෙන් අනුපේක්ෂාවගේද, අනුලොම ඤාණයෙන් ධර්ම සථිතියෙහිද, නිර්වාණයෙහිද ප්‍රතිලෝම භාව භාවයාගේද ගෝත්‍රභූ ඤාණයෙන් සංස්කාර නිමිති ග්‍රාහයාගේ ප්‍රහාණයද වේ. එය තදංග ප්‍රහාණ නමැ.

යම් ඒ උපචාර අර්පණා භේද සමාධියගේ ප්‍රවෘත්තිභාවය වළක්වන හෙයින්, විලෙහි දිය මතුපිට සෙවෙල, කළය දියට දැමූ විට වේගයෙන් ඉවත් වන්නාක් මෙන් තාවකාලිකව ඒ ඒ නීවරණාදීන්ගේ ප්‍රහාණයක් වේද, මෙය විෂ්කම්භන ප්‍රහාණ නමැ. යම් ආකාර සිව් ආර්ය මාර්ගයන්ගේ වඩනා ලද හෙයින්, ඒ ඒ මාර්ගවත් වූ, තම සන්තානයෙහි 'දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය' සඳහායි ආදී ක්‍රමයෙන් කියන ලද සමුදය පාක්ෂික වූ කෙලෙස් සමූහයාගේ අත්‍යන්ත නොපැවැත්වීම් භාවයෙන් ප්‍රහාණයයි. මේ සමුච්ඡේද ප්‍රහාණ නාමැ ඵලක්ෂණයෙහි කෙලෙසුන්ගේ සංසුන් භාවයට පත්වීම මෙය පටිප්පසසද්ධි ප්‍රහාණ නමැ. සියලු සංඛතයන් ඉවත්කරන හෙයින්, සියලු සංඛතයන්ගේ ප්‍රහීණ සංඛ්‍යාත නිර්වාණයක් වේද? මෙය නිස්සරණ ප්‍රහාණයයි.

මෙම සියලුම ප්‍රහාණයන් අත්හැරීම් අර්ථයෙන් ප්‍රහාණයි. හික්මවීම් අර්ථයෙන් විනයයි. එහෙයින් ප්‍රහාණ විනය යැයි යූ.සේයි. ඒ ඒ ප්‍රහාණයට ඇතුළත් වූයේ හෝ ඒ ඒ දැහි හික්මවීම හටගන්නා හෙයින්ද ප්‍රහාණ විනයයැයි යූ.සේයි. මෙසේ ප්‍රහාණ විනයද පස් ආකාරයකට බිඳේයයි දතයුතුය.

මෙසේ මේ සංක්ෂේප වශයෙන් දෙවදෑරුම් වූද, ප්‍රභේද වශයෙන්, දසවැදෑරුම් වූ, හික්මීම බිඳුණු සංවර හෙයින්ද ප්‍රහාතව්‍යයාගේ අප්‍රහීණ හෙයින්ද, අශ්‍රැතවත් පෘථග්ජනයාට නැත. එහි අභාවය හෙයින් මෙතෙමේ අවිනීතයැයි යූ.සේයි. **සප්පුරිසානං අදසසාවී සප්පුරිස ධම්මසස අකොවිදො සප්පුරිස ධම්මෙ අවිනීතො** යන මෙහි එය අර්ථ වශයෙන් සත්පුරුෂ ධර්මයන්ට නොනැමුණු යනුයි. දෙසූ පරිදි, යමෙක්ම එම ආර්යයෝද, ඔවුහුම එම සත්පුරුෂයෝය. යමෙක්ම එම සත්පුරුෂයෝද ඔවුහුම එම ආර්යයෝය. යමෙක්ම එම සත්පුරුෂයෝද ඔවුහුම එම ආර්යයෝය. යමක්ම එම ආර්යයන්ගේ ධර්මයද, එයම ඒ ආර්යයන්ගේ ධර්මයයි.

යමක්ම ඒ ආර්ය විනයද, එයම ඒ සත්පුරුෂ විනයයි. යමක්ම ඒ සප්පුරිස විනයද, එයම ඒ ආර්ය විනයයි. ආර්යයන් කෙරෙහි, සත්පුරුෂයන් කෙරෙහි හෝ ආර්ය ධර්මයෙහි හෝ සත්පුරුෂ ධර්මයෙහි හෝ, ආර්ය විනයෙහි හෝ සත්පුරුෂ විනයෙහි හෝ ඒ ඒ ඒකාර්ථයෙහි සම තත්වයෙහි සමභාගයෙහි, එයින් හටගත්තේ හෝ එයම වූයේ යන අර්ථයි. කවර හෙයින් වනාහි තෙරහු, **අතතානුදිට්ඨියා කතමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොතියි** විචාරා එය නොවිසඳම, '**ඉධ අසසුතවා පුථුජ්ජනො**'යි මෙසේ පෘථග්ජනයා නිර්දේශ කළේද යත්? පුද්ගලාධිෂ්ඨාන දේශනායෙන් එම අර්ථය ප්‍රකට කරන්ට ප්‍රථමයෙන් පෘථග්ජනයා නිර්දේශ කළේ යයි දතයුතුය. මෙසේ පෘථග්ජනයා නිර්දේශකොට දැන් අභිනිවෙස උද්දේශය දක්වන්නේ, 'රූපං අතතතො සමනුපසසති' ආදිය දෙසූහ.

එහි, **රූපං අතතතො සමනුපසසති** යනු රූපස්කන්ධයද කසිණ රූපයද, ආත්මයැයි මිථ්‍යා දෘෂ්ටි දැක්මෙන් දකියි. නිර්දේශයෙහි වනාහි රූපස්කන්ධයෙහි සිත පිහිටුවීම, පංචස්කන්ධයන්ට ඇතුළත් හෙයින් ප්‍රකටයයි එය නොකියා, කසිණ රූපයම රූපයයි සමාන වශයෙන් යු.සේයි. **රූපවනතංවා අතතානං** යනු අරූපය ආත්මයැයි ගෙන එම ආත්මයෙහි රූපය දකී. **රූපසසංවා අතතානං** යනු අරූපය ආත්මයැයි ගෙන එම ආත්මයෙහි රූපය දකී. **රූපසසංවා අතතානං** අරූපයම ආත්මයයි ගෙන එම ආත්මය රූපයෙහි දකී. එහි **රූපං අතතතො සමනුපසසති** යනු ශුද්ධ රූපයම ආත්මයැයි කියන ලදී. **රූපං වනතං වා අතතානං අතතනිවාරූපං, රූපසමිං වා අතතානං වෙදනං අතතතො සමනුපසසති, සඤඤං, සංඛාරෙ, විඤඤාණං අතතතො සමනුපසසති** යන මේ සත් තන්හි අරූපය ආත්මයැයි කියන ලදී. **වෙදනාවනතං වා අතතානං, අතතනිවා වෙදනං වෙදනායවා අතතානං** යනු මෙසේ සිව් ස්කන්ධයන්හි ත්‍රයයක් ත්‍රයයක් වශයෙන්, දොළොස් තන්හි රූපාරූප මිශ්‍රක ආත්මය කියන ලද්දේය. එම විසි දෘෂ්ටීහුම මාර්ගාවරණයි. ස්වර්ගාවරණ නොවේ. සෝවාන් මාර්ගයෙන් නැසිය යුතුය.

දැන් එය නිර්දේශ කරනුයේ, කථං රූපං ආදිය දෙසූහ. එහි **පඨවි කසිණං** යනු පෘථුවි මණ්ඩලයයි. එය ආශ්‍රයෙන් උපදවන ලද, ප්‍රතිභාග නිමිත්තයයි කියනු ලබන, සම්පූර්ණ පැතිරීම් වශයෙන් පෘථුවි කසිණය මමයයි තමා සඳහාම ගනියි. **අතතං** යනු තෙමේ, **අදවයං** යනු එකම. **තෙලපපදීපසස** තෙල් සහිත පහනෙහි. **ඣායතො** යනු දැල්වෙන කල්හි

යා අචචි සො වණෙණා යන ආදී දැල්ල අත්හැර, වර්ණයෙහි අභාවය යූ.සේයි. **යාච දිටඨී යඤච වත්‍ථුං** එම ද්වය එකතුකොට රූප වස්තුක ආත්මානු දෘෂ්ටිය යූ.සේයි.

**ආපොකසිණාදීන්,** ජල ආදීන් ආධාරකොට උපදවන ලද කසිණ නිමිතිමය. පිරිසිඳි ආකාස කසිණය වනාහි රූපධ්‍යානයට අරමුණු වනුයේද, ආකාස කසිණයයි කියනු ලබන කල්හි, අරූප ධ්‍යානාරම්මණයෙන් කසිණය උගුලුවාගත් ආකාසයෙන් සංකීර්ණ වේයයි නොගත්තේ යයි දතයුතුය. රූපාවචර කොටස බැවින් විඤඤාණ කසිණය නොගත යුතුමය. **ඉධෙ කචෙචා වෙදනං - සඤඤං - සංඛාරං - විඤඤාණං අතතතො සමනුපසසති** යනු සතර ස්කන්ධයන්හි සතුටුවී එකට ගැනීම් වශයෙන් යූ.සේයි. එය වනාහි චිත්ත චෛතසිකයන්ගේ වෙන් වෙන්ව ගැන්මෙහි අසමත් හෙයින් සියල්ල එකක් වශයෙන් ගෙන ආත්මයයි ගනී. **ඉමිනා රූපෙන රූපවා** යන මෙහි ශරීර රූපයද, කසිණ රූපයද ලැබේ. **ඡායා සමපනෙනා** යනු ඡායාවෙන් යුත්, තමෙනං යන මෙහි එන ශබ්දය නිපාත මාත්‍රයයි. එය යනු අර්ථයි. ඡායාවා යනු විද්‍යමාන ඡායාවන් වූයේ, රූපය ආත්මයැයි නොගත්තේ නමුදු, රූපය අත්නොහැර දෘෂ්ටිය උපන් හෙයින් රූපවස්තුක යැයි යූ.සේයි.

**අතතනි රූපං සමනුපසසති** යනු ශරීර රූපයාගේද කසිණ රූපයාගේද, සිත නිශ්‍රිත හෙයින් එම අරූප සමුදාමය ආත්මයෙහි ඒ රූපය දකී. අයංගනෙධා යනු ආඝ්‍රාණය කළයුත්ත කීහ. **ඉමසමිං පුපෙඑ** යනු මල් නිශ්‍රිත සුවඳට මෙසේ කීහ. **රූපසමිං අතතානං සමනුපසසති** යනු යම්තැනක රූපය යයිද එහි සිත යයි. එහෙයින් රූප නිශ්‍රිත සිත ගෙන එම අරූප සමුදය ආත්මයකොට එම රූපය දකී. දළහෙයින් රූපයාගේ දළ දහරාව කරඬුවකැයි කීහ.

**ඉධෙකචෙචා චකඛුසමඵසසජං වෙදනං** යනාදීන්හි වෙන් වෙන්ව දෘෂ්ටි ග්‍රහණයෙහි අවශ්‍යතාවක් නොමැති කල්හිද, වේදනායයි එක් ග්‍රහණයෙන් ගත් කල්හි සියලු වේදනාවන්, ඇතුළත්ව ඇති හෙයින් වෙන් වෙන්ව ගන්නා ලද්දේම වෙත් යයි වෙන් වෙන්ව යෙදීම් කරන ලදැයි දතයුත්තාහ. එය වනාහි විඳීම් වශයෙන් වේදනාවගේ දළ හෙයින් වේදනාවම ආත්මයැයි ගනියි. **සඤඤං, සංඛාරෙ විඤඤානං රූපං අතතතො සමනුපසසති** යනු සංඥාදී අරූපධර්මයන්ද, රූපයද එකක් සේ

සලකා මනාව බලයි. පෘථග්ජනයා උමතු වූවකු ලෙසින් යම් යම් ආකාරයකින් වැටහෙයිද ඒ ඒ අයුරින් ගනී. චක්ඛු සම්ඵස්සජං සඤ්ඤං ආදීන්හි, හැඳිනීම් වශයෙන් සංඥාව ප්‍රකට හෙයින් සංඥාව ආත්මයැයි ගනියි. සෙස්ස වේදනාවෙහි කියන ලද අයුරින් දතයුතුය.

**චක්ඛු සම්ඵස්සජං චෙතනං** ආදීන්හි සංස්කාර ස්කන්ධයන්ට ඇතුළත් ධර්මයන්හි, චේතනාවගේ ප්‍රධානත්වය ප්‍රකට හෙයින්ද චේතනාවම නිර්දේශ කරන ලදී. ඒ සමග අනෙක්වාද නිර්දේශ කරන ලද්දේම වෙයි. එය වනාහි චෛතසික භාව වශයෙන් ප්‍රකට හෙයින් චේතනාව ආත්මයැයි ගනී. සෙස්ස කියන ලද ක්‍රමයමැයි. **චක්ඛු විඤ්ඤාණං** ආදීන්හි දැනගැනීම් වශයෙන් සිතෙහි ප්‍රකටතාව හෙයින් සිත ආත්මයැයි ගනී. මෙහි සෙස්ස කියන ලද ක්‍රමයමැයි.

**ආත්මානුදෘෂ්ටිය නිමි.**

**මිච්ඡාදිට්ඨි**

මිථ්‍යා දෘෂ්ටිය යට කියන ලද අර්ථමය. මේ වනාහි වෙනත් ක්‍රමයකි. **නත්ථි දින්නං** යන්නෙන් උච්ඡේද දෘෂ්ටි හෙයින් දානයන්හි විපාක ප්‍රතික්ෂේප කරයි. **නත්ථි යිට්ඨං** යන මෙහි 'යිට්ඨං' යනු කුඩා යාගයයි. **හුතං** යනු මහා යාගයයි. ද්වයයෙහිම විපාක ප්‍රතික්ෂේප කරයි. **නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො** යනු දීමෙහි විපාක ප්‍රතික්ෂේප කළ බැවින් සීලාදි පුණ්‍ය කර්මයන්ගේද ප්‍රාණඝාතාදී පාප කර්මයන්ගේද විපාක ප්‍රතික්ෂේප කරයි. **නත්ථි අයං ලොකො** යනු පෙර කරන ලද කර්මයෙන් මෙලොව ඉපැත්මක් නැත. **නත්ථි පරො ලොකො** යනු මෙලොව කරන ලද කර්මයෙන් පරලොවක් නොලැබේ. **නත්ථිමාතා නත්ථිපිතා** යනු මව්පියවරුන් කෙරෙහි කරන ලද යහපත් අයහපත් කර්මයන්හි විපාක ප්‍රතික්ෂේප කරයි. **නත්ථි සත්තා ඔපපාතිකා** යනු කර්මහේතුක උත්පත්තිය ප්‍රතික්ෂේප කරයි. **නත්ථි ලොකෙ සමණ බ්‍රාහමණා -පෙ- පවෙදෙන්ති** මෙලෝ පරලෝ දක්නට සමත් අභිඥා ප්‍රතිලාභය සඳහා වන ප්‍රතිපදාව ප්‍රතික්ෂේප කරයි.

මෙහි පෙළෙහි, **නත්ථි දින්නන්ති වත්ථුං** යනු දුන් දැයෙහි විපාක නැතැයි කියන දානයයි. එම දෘෂ්ටියට හේතුව යැයි අර්ථයි. **එවං වාදො මිච්ඡා** යනු මෙසේ දුන් දැහි විපාක නැතැයි කීමයි වචනයයි. වැරදි විපරීතතාවයයි.

**සක්කාය දිට්ඨි** යනු ආත්ම දෘෂ්ටියමය. අන් තන්හි පැමිණි ක්‍රමයට අනුව වචන දැක්වීම සඳහා යූ.සේයි. ස්වකාය වස්තුක ශාශ්වත දෘෂ්ටිය යැයි කම්මධාරය සමාසයි. **රූපවන්තං වං අත්තානං** ආදී පසළොස් වචනයන්ගේ අන්තයෙහි මනාසේ බලයි යන්න සම්බන්ධ කළ යුතුය. පාඨය වෙනත් අයුරෙකින් නොගැළපේ. මෙසේ රූපවත් වූ ආත්මය මනාසේ බලයි යනුවෙන් එකක්ම ගෙනහැර දක්වා සෙසු තුදුස සංක්ෂිප්ත කරන ලදී.

ස්වකාය වස්තුක උච්ඡේද දෘෂ්ටියෙහි 'රූපය ආත්ම වශයෙන් මනාසේ බලයි. එකක්ම ගෙනහැර දක්වා සෙසු සතර සංක්ෂිප්ත කරන ලදී.'

අන්තර්ග්‍රාහික දෘෂ්ටියෙහි ප්‍රථම වාරයෙහි ආකාර විමසීමයි. දෙවැන්නෙහි ආකාර ග්‍රහණයයි. තෙවැන්නෙහි ආකාර විසඳුමයි. එහි **ලොකො** යනු ආත්මයයි. **නො අනෙතා** යනු ඔවුනොවුන්ට ප්‍රතිපක්ෂවූ ශාශ්වත උච්ඡේද අන්තයන්හි ශාශ්වත ග්‍රාහයෙහි ශාශ්වතාන්තයද, අශාශ්වත ග්‍රාහයෙහි උච්ඡේදාන්තයද වේ. **පරිත්තං ඔකාසං** යනු කුල්ලක් පමණ හෝ නැඹිලියක් පමණ, **නීලකතො එරති** යනු නිල්යැයි අරමුණු කරයි. **අයං ලොකො** යන ආත්මය සඳහා යූ.සේයි. **පරිවටුමො** යනු හාත්පස සීමාව, **අනතසඤ්ඤී** අන්තයෙක් ඇත්තේයැයි හැඟීම කෙළවරක් මෙයට ඇත්තේනුයි අන්තයැයි ගතයුතුය. **යංඑරති** යනු යම් කසිණ රූපයක් පැතිරේද? **තං වත්ථුං චෙව ලොකොච** යනු එම කසිණරූප ආරම්මණයද, ආලෝකාර්ථයෙන් ලෝකය වේ. **යෙන එරති** යනු යම් සිතකින් පැතිරේද? **සො අත්තා චෙව ලොකොච** යනු ආත්මය අපේක්ෂා කොට පුංලිංග කරන ලදී. ඒ සිත ආත්මයද ආලෝකාර්ථයෙන් ලෝකයදැයි යූ.සේයි.

**අනතවා** යනු අන්තයයි. **ඔභාසකතො එරති** යනු ආලෝක කසිණ වශයෙන්, තේජෝ කසිණ වශයෙන්, ශ්වේත කසිණ වශයෙන් හෝ ආලෝකය පතුරුවයි. නිල් ආදී පංචකය ප්‍රභාශ්වර කසිණයන්ගේ

වශයෙන්ගත් හෙයින්, පෘථුවි, ආපො, වායො, කසිණ වශයෙන් ආත්මාභිනිවේසයක් නොවේයයි ගතයුතුය.

**විපුලං ඔකාසං** යනු ගොයම් මැඩීම සඳහා සාදාගත් බිම (කමත) තරම් ආදී වශයෙන් විශාලස්ථානයක් නොවේ. අනනතවා යනු බුද්ධ අනන්තවත් භාවයයි. අපරියනෙතා යනු බුද්ධ අපරියන්තතාවයි. අනනතසඤ්ඤී යනු අනනත සංඥාවයි. **තංජීවං** යනු එය ජීවයයි. ලිංග විපර්යාසය කරන ලදී. ජීව යනුද ආත්මයමය. රූපාදී පංචකයම වෘත්තාකාර අර්ථයෙන් ශරීරයයි. **ජීවං න සරීරං** යනු ආත්ම සංඛ්‍යාත ජීවය රූප සංඛ්‍යාත ශරීරය නොවේ. වේදනාදීන්හිද එම ක්‍රමයමැයි.

**තථාගතො** යනු සත්ත්වයායි. රහත්හුයැයි ඇතැමෙක් කියති. **පරමමරණා** යනු මරණින් මත්තෙහි, පරලෙව්හිය යන අර්ථයි. **රූපං ඉධෙව මරණ ධමමං** යනු තමාට ප්‍රකට ස්කන්ධ ශීර්ෂයෙන් පංචස්කන්ධ ග්‍රහණයයි. එය මෙලෙව්හිම නස්නා ස්වභාවයැයි අර්ථයි. සෙසු ස්කන්ධයන්හිද එම ක්‍රමයමැයි. **කායසසභෙදා** යනු ස්කන්ධ පංචක සංඛ්‍යාත වූ ශරීරයාගේ බිඳීමෙන් මත්තෙහි මෙම වචනයෙන් මරණින් මත්තෙහි යැයි යන එම උද්දේශයාගේ අර්ථය යූ.සේයි. ප්‍රීති ආදීන්හි වේයැයි මුල්පදයයි. සතරෙහිම අපි ශබ්දය එක්කිරීම් අර්ථයෙහිය. **තිටඨති** යනු ශාශ්වත බැවින් සිටී. චුත නොවේයයි අර්ථයි. (හොති) වේ. පදයට අර්ථ විශේෂණ සඳහා (තිටඨති) සිටී යන පදය යූ.සේයි. **උපපජජති** බිජුවට හා ගර්භාෂ උපතට පිවිසීම් වශයෙන් පැමිණේ නමැ. **නිබබතත ති** යනු සංසේදජ, ඕපපාතික උපතට පිවිසීම් වශයෙන් උපදී නමැයි අර්ථ යෙදීම් දතයුතුය.

**උච්ඡිජජති** යනු නොසිඳී පැවැත්ම නොමැතිවීම් වශයෙන්, **විනසසති** යනු විනාශවීම් වශයෙන්, **න හොති පරමමරණා** යන පළමු පදයන්ගේ අර්ථ විවරණයයි. චුතියෙන් මත්තෙහි විද්‍යමාන නොවේ යයි අර්ථයි.

**හොතිච න ච හොති** යනු ඒකාන්ත ශාශ්වතිකයින්ගේ දෘෂ්ටියයි. එක් ක්‍රමයකින් වෙයි. එක් ක්‍රමයකින් නොවේයයි අර්ථයි. ජීව ස්වභාවයෙන් වෙයි. පූර්ව ජීවයෙහි අභාවයෙහි නොවේයයි යූ.සේයි.

**නෙව හොති න නහොති** යනු අමරා වික්ෂෙපයින්ගේ (ආඳ මෙන් ලිස්සා පැන යනවුන්ගේ) දෘෂ්ටියයි. විය හැකිද නොවිය හැකිද වේ.

නොවිය හැකිද වියහැකිද වේ යන අර්ථයි. දෝෂාරෝපණ බියද, මුසාවාද බියද, අඥාන බැවින්ද, මෝහයෙන් මුළාවූ බැවින්ද, පෙර කියන ලද ක්‍රමයෙහි ප්‍රතික්ෂෙප මාත්‍රයක් කරයි. **ඉමෙහි පඤ්ඤාසාය ආකාරෙහි** යනු කියන ලද ආකාර ඇති දස පඤ්චකයන්ගේ වශයෙන්, පණස් ආකාරයන්ගෙන් යනුයි.

## අන්තර්ග්‍රාහික දෘෂ්ටිය නිමි

පූර්වාන්තාපරන්ත දෘෂ්ටීන්හි ශාශ්වතය කියත්නුයි ශාශ්වතවාදයි. **සසසතවාදායි.** නොහොත් මෙය කරණ කොටගෙන කියත්නුයි වාදොයි. එය දෘෂ්ටි සහගතයට විශේෂ නාමයකි. ශාශ්වතයැයි කීමද, ශාශ්වත යෝගයෙන් ශාශ්වතයි. ශාශ්වත වාදය ඔවුන්ටනුයි ශාශ්වත වාදයයි. එසේම ඇතැම් කොටසක් ශාශ්වතයැයි කීම ඒකච්ච ශාශ්වතයි. එය ඔවුන්ගේ ඇත්තේනුයි **එකච්ච සසසතිකායි.** එසේම කෙළවරක් ඇත්තේ හෝ කෙළවරක් නැත්තේ, කෙළවරක් ඇත්තේද, කෙළවරක් නැත්තේද? කෙළවරක් නොමැත්තේ කෙළවරක් ඇත්තේ නොවේයයි පැවැති වාදය, අනන්තානන්තයි එය ඔවුන්ට ඇත්තේනුයි **අනන්තානන්තිකායි** නොමැරේනුයි අමරායි. ඒ කවරෙක්ද? මෙසේද මාහට, අප හට ආදී ක්‍රමයෙන් කෙළවර රහිත දෘෂ්ටිගතිකයාගේ දෘෂ්ටියද වචනයද, විවිධ වූ අවුල = වික්ෂෙපයයි. නොමැරෙන දෘෂ්ටියෙන් හෝ වචනයෙන් වන අවුල අමරා වික්ෂෙපයයි. එය ඔවුන්ට ඇත්තේනුයි අමරා **වික්ඛෙපිකායි.** වෙනත් ක්‍රමයක් අමරා නමැති මත්‍ස්‍ය ජාතියකි. එම මත්‍ස්‍යයා දිය මතුපිටට ඒම හා කිමිදීම් වශයෙන් දුවනු ලබන්නේ අල්ලාගන්ට නොහැකි වේ. එපරිද්දෙන්ම මෙම වාදයද ඔබිනොබ දුවයි. ග්‍රහණයට නොඑළඹේනුයි අමරා වික්ෂෙපයි. එය ඔවුන්ට ඇත්තේනුයි අමරා වික්ෂෙපිකායි.

**අධිච්ච සමුප්පනෙනා** යනු අහේතුකව, ආත්මයද ලෝකයද, හටගත්තේය යන දර්ශනයයි. එය ඔවුන්ට ඇත්තේනුයි **අධිච්ච සමුප්පන්නිකායි** සංඥාව කියත්නුයි **සඤ්ඤීවාදායි** අසංඥීභාවය කියත්නුයි අසඤ්ඤීවාදයි. නේවසඤ්ඤීනාසඤ්ඤී භාවය කියත්නුයි **නේවසඤ්ඤී නාසඤ්ඤීවාදායි.** නොහොත් සංඥායයි පැවැති වාදය සඤ්ඤීවාදයයි. එය යම් කෙනෙකුන්ට ඇත්ද? ඔවුහු සංඥීවාදීහුය. අසඤ්ඤීවාදී, නෙවසඤ්ඤී,

නාසඤ්ඤීවාදීහුද එසේමය. විනාශය කියත්නුයි **උච්ඡෙදවාදායි** **දිට්ඨධම්මො** යනු ප්‍රත්‍යක්ෂ ධර්මයයි. ඒ ඒ තන්හි ලද ආත්ම භාවයට එය විශේෂ නාමයකි. ඉහාත්මයෙහි නිර්වාණය දිට්ඨධර්ම නිර්වාණයයි. මෙ අත්බැව්හි දුක් සංසිඳීම යැයි අර්ථයි. එය කියත්නුයි **දිට්ඨධම්ම නිබ්බානවාදායි.** මෙහි මෙය විස්තර කරනු ලබන කල්හි අටුවා සහිත සමස්ත බ්‍රහ්මජාල සූත්‍රයම කියයුතු වේ. මෙසේ ඇතිකල්හි ඉතාමත් ප්‍රමාද වේයයි විස්තර නොකරන ලදී. එය කැමතියවුන් විසින් එය අපේක්ෂාකොට (සොයා) ගතයුතුය.

සංයෝජනික දෘෂ්ටි, සර්ව දෘෂ්ටි සාධාරණ වෙත්ද? එනිසා සියලු දෘෂ්ටි සංයෝජන හෙයින්, හැම දෘෂ්ටි සාධාරණයයි අර්ථය නිර්දේශ කරන ලදී. එය යට කියන ලද දෘෂ්ටි මැඩගෙන නැගී සිටින්නේමය.

මානය හා බැඳී පවත්නා දෘෂ්ටීන්හි, **චක්ඛු අහනති අභිනිවෙස පරාමාසො** යන මැනීම් පූර්ව ඇලීම් ස්පර්ශ කිරීමයි. දෘෂ්ටිය මාන සම්ප්‍රයුක්ත නොවේ. එහෙයින්ම මාන විනිබන්ධායි යූ.සේයි. මානය හා බැඳී, මානමූලිකයයි අර්ථයි. **චක්ඛු මමනති අභිනිවෙස පරාමාසො** යන මෙහිද එම ක්‍රමයමැයි. මෙහි වනාහි මමා යයි කියයුතු කල්හි මමං යයි අනුනාසික ආගමය දතයුතුය.

**අහනති මාන විනිබන්ධාය** යනු රූපාදීන්ද, ආධ්‍යාත්මිකවමය. කසිණ රූපයෙන් තොර බාහිරයක් මමයයි නොගනී. **මමනති මාන විනිබන්ධාය** බාහිරයන්ද ලැබෙත්. බාහිරයන්ද මගේ යයි ගනියි. දුක්වේදනා අනිෂ්ට හෙයින් මානවස්තු නොවේද? ෂට් වේදනාවන්ද එහි මූලප්‍රත්‍යය වූ ෂට් ස්පර්ශද නොගන්නා ලදී. සංඥාදීහු මෙහි සිඳලන ලද හෙයින් නොගන්නා ලදැයි දතයුතුය. **අත්තවාද පටිසඤ්ඤුත්තා දිට්ඨී** යනු ආත්මානු දෘෂ්ටියමය. ආත්මයැයි වාදයෙන් යුක්තවූ හෙයින් නැවැතැ මෙසේ යූ.සේයි.

**අත්තාච ලොකොච** යනු එයම ආත්මයය. බැලීම් අර්ථයෙන් ලෝකයැයි අර්ථයි. **සස්සතො** යනු ශාශ්වත වාදයන්ගේ දෘෂ්ටියයි. **අසස්සතො** යනු උච්ඡේද වාදයන්ගේ **සස්සතොච අසස්සතොච** යනු ඇතැම් ශාශ්වතිකයන්ගේ, **නෙව සස්සතො නාසස්සතො** යනු අමරා වික්ෂෙපිකයන්ගේ, **අන්තවා** යනු ස්වල්ප කසිණ ලාභීන්ගේද, තාර්කිකයින්ගේද, නිඝණ්ඨ, ආජීවිකයන්ගේද, නොහොත් උච්ඡේදවාදීහු,

සත්ත්වයා උපතින් පූර්වාන්තවත්ය. මරණයෙන් අපරාන්තවත් යැයි කියති. අධිච්ච සමුප්පන්නිකයෝ සත්ත්වයා උපතින් පූර්වාන්තවත් යැයි කියති.

අනන්තවා යනු අප්‍රමාණ කසිණලාභීන්ගේ, ශාශ්වතවාදීහු වනාහි පූර්වාන්තයක් හෝ අපරාන්තයක් නොමැත. එහෙයින් අනන්තවත්යැයි කියති. අධිච්ච සමුප්පන්නිකයෝ අපරාන්තයෙන් අනන්තවත් යැයි කියති.

අන්තවාච අනන්තවාච යනු උඩයට නොවඩා සරස්ව වඩනා ලද කසිණයන්ගේ, නෙව අන්තවා නානන්තවා යනු එය අමරා වික්ෂෙපිකයන්ගේ

භව විභව දෘෂ්ටීන්ගේ, කියන ලද ආකාර ඇති දෘෂ්ටියෙන් වෙන්ව, අභිනිවෙස නොමැති හෙයින් වෙන්ව නිර්දේශ නොකොට කියන ලද දෘෂ්ටීන්ගේම වශයෙන් පසුබට වීම, අතිධාවනය යන එක් එක් ආකාර නිර්දේශ කරන්ට විමසුම් නොකොට, **ඔලීයනාභිවෙසො භවදිට්ඨි අතිධාවනාභිනිවෙසො විභවදිට්ඨියි** වදාළහ. එහි භව නිරෝධය සඳහා ධර්මයන් දෙසනකල්හි සිත පැන නොයයි යයි යූ.සේයි. පසුබට වීම් ඇල්ම ශාශ්වත සංඥාවෙන් නිර්වාණයෙන් හැකිළෙන ඇල්මයයි අර්ථයි. ඇතැමෙක් භවයෙන්ම පීඩාවට පත්වන්නාහු, පිළිකුල් කරන්නාහු ජුගුප්සා කරන්නාහු විභවයට සතුටුවෙත්යයි යූ.සේයි. අතිධාවන ඇල්ම උච්ඡේද සංඥාවෙන් නිරෝධගාමිණී ප්‍රතිපදා ඉක්මවන ඇල්මයයි අර්ථයි.

දැන් භව විභව දෘෂ්ටීන්, සියලු දෘෂ්ටීන්හි යොදා දක්වන්ට **අස්සාද දිට්ඨියායි** ආදිය වදාළහ. එහි යම්හෙයකින් ආස්වාද දෘෂ්ටිකයෝ ශාශ්වත හෝ උච්ඡේදය හෝ හේතුයෙන් කාමයන්හි දොසක් නැතැයි ගනිත්ද? එහෙයින් තිස්පස් ආකාර වූද **අස්සාද දිට්ඨියො සියා භවදිට්ඨියො සියා විභව දිට්ඨියො සියායි** යූ.සේයි. එහි යම්හෙයකින් එක් එක්වූද දෘෂ්ටීහු ශාශ්වත ග්‍රාහ වශයෙන් භව දෘෂ්ටීහු වන්නාහුද? උච්ඡේද ග්‍රාහ වශයෙන් විභව දෘෂ්ටීහු වන්නාහුයයි අර්ථයි.

ආත්මානු දෘෂ්ටියෙහි, **රූපං අත්තතො සමනුපස්සති වෙදනං සඤ්ඤං සංඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති** යන රූපාදී පංචකයෙහි ආත්ම වශයෙන් නොදත් (නොගත්) හෙයින් ඒවා සිඳීගිය කල්හි ආත්මය සිඳීගියේ යැයි ග්‍රහණය හෙයින් විභව දෘෂ්ටියැයි යූ.සේයි.

සෙසු පසළොස් ස්ථානයන්හි රූපාදී වශයෙන් ආත්මයෙන් අන්‍ය හෙයින් ඒවා සිඳීගිය කල්හිද, ආත්මය ශාශ්වතයැයි ග්‍රහණය හෙයින් **පණ්ණරස භවදිට්ඨියොයි** යූ.සේයි.

මිථ්‍යා දෘෂ්ටියෙහි **සබ්බාව තා විභව දිට්ඨියො** යනු උච්ඡේද වශයෙන් පැවැති හෙයින්, අනතවා අනනතවා ආදී දෘෂ්ටීන්හි, පරිතතාරමමණ, අප්‍රමාණාරම්මණ ධ්‍යානලාභී වූ දිව්‍ය චක්ෂුසයෝ, රූපධාතුයෙන් චුතව, සත්ත්වයින් අන්තන්හි උපනවුන් දැක, භව දෘෂ්ටිය නොදැක විභව දෘෂ්ටිය ගනිති. එහෙයින් එහි, **සියා භව දිට්ඨියො සියා විභව දිට්ඨියොයි** යූ.සේයි. **හොතිච න ච හොති** යන මෙහි හොතිච යනු භව දෘෂ්ටියයි. **නච හොතිච** යනු විභව දෘෂ්ටියයි. **නෙව හොති න නහොති** යන මෙහි නෙව හොති යනු විභව දෘෂ්ටියයි. න න හොති යනු භව දෘෂ්ටියයි. එහෙයින් එහි 'සියා'යි යූ.සේයි.

පූර්වාන්තානු දෘෂ්ටියෙහි එකච්ච ශාශ්වතිකයෝ ශාශ්වතයද, පනවති. අශාශ්වතයද පනවති. එහෙයින් එය භව දෘෂ්ටියද විභව දෘෂ්ටියද වේ. සිව් අනතානනතිකයෝ අනතානනත වූ ආත්මය පනවති. එහෙයින් එය ආත්මානුදෘෂ්ටිය හා සමානය. භව දෘෂ්ටියද විභව දෘෂ්ටියද වේ. සිව් අමරා වික්ෂෙපිකයෝ භව දෘෂ්ටිය හෝ විභව දෘෂ්ටිය ආශ්‍රිතව වචන වික්ෂෙපයට පැමිණෙති. සෙස්ස භව දෘෂ්ටීහුමය. එහෙයින් ඒවා ඔවුන් සඳහා වන්නේ යයි යූ.සේයි. අපරන්තානු දෘෂ්ටියෙහි සප්ත උච්ඡේදවාද විභව දෘෂ්ටීහුය. සෙස්ස භවදෘෂ්ටීහුය. එහෙයින් ඒවා ඔවුන් සඳහා වන්නේ යයි යූ.සේයි. සඤ්ඤොජනිත දෘෂ්ටියෙහි සියලු දෘෂ්ටීන්ගේ වශයෙන් වන්නේ යයි යූ.සේයි. මමයැයි මාන විනිබන්ධ දෘෂ්ටියෙහි චක්ෂුරාදීන්හි මමයැයි ගත් හෙයින් ඒවාහි නැස්මෙහි ආත්මය විනාශ වේයැයි **සබ්බාව තා විභව දිට්ඨියොයි** යූ.සේයි.

ආත්මානුදෘෂ්ටියෙහි මෙන්, මගේයැයි මානය හා බැඳි දෘෂ්ටියෙහි චක්ෂුරාදියෙන් ආත්මය අනෙකක් බැවින් ඒවාහි විනාශයෙහිද ආත්මය විනාශ නොවන්නේ යැයි ඒ සියල්ලම භව දෘෂ්ටිය යැයි යූ.සේයි. ලෝක ප්‍රතිසංයුක්ත දෘෂ්ටියෙහි 'සසසතො අතතාච ලොකොච' ආදී ක්‍රමයෙන් කියන ලද හෙයින් භව විභව දෘෂ්ටි ප්‍රකටමය. මෙතෙකින් ආස්වාද දෘෂ්ටි ආදිකොට ඇති, විභව දෘෂ්ටි කෙළවර කොට ඇති, තුන්සිය සොළොසෙක් දෘෂ්ටාභිනිවෙස නිර්දේශිත වෙයි. ආත්මානු දෘෂ්ටියද, සක්කාය දෘෂ්ටියද,

ආත්මවාද ප්‍රතිසංයුක්ත දෘෂ්ටියද අර්ථ වශයෙන් එකමය. සමානාර්ථ වශයෙන් ත්‍රිවිධව යූ.සේයි. සංයෝජනික දෘෂ්ටි අවස්ථා භේදයෙන් සියල්ලම දෘෂ්ටීහු වෙති.

දැන් **සබ්බාව තා දිට්ඨියො අසසාද දිට්ඨියො** යනාදී අන් ක්‍රමයකින් සුදුසු පරිදි දෘෂ්ටි සංසන්දනයයි. එහි **සබ්බාව තා දිට්ඨියො** යනු කියන ලද පරිද්දෙන්, සියලු දෘෂ්ටීහු දෘෂ්ටි රාගයෙන් රත්වූ හෙයින්ද, තෘෂ්ණා ආස්වාද නිශ්‍රිත හෙයින්ද **අසසාද දිට්ඨියොයි.** ආත්ම ඇල්ම අනුගත හෙයින්ද, **අතතානු දිට්ඨියොයි** විපර්යාස වූ දර්ශනය හෙයින්ද මිච්ඡාදිට්ඨියොයි. ස්කන්ධ වස්තුක හෙයින් **සකකාය දිට්ඨියොයි.** එක් එක් අන්තයාගේ ග්‍රහණය කළ හෙයින් **අනතගගාහිකා දිට්ඨියොයි.** අනර්ථයෙහි යොදවන හෙයින් **සංයොජනිකා දිට්ඨියොයි.** ආත්මවාදයෙන් යුක්ත හෙයින් **අතතවාද පටිසංයුතතා දිට්ඨියොයි.** මෙම සත් දෘෂ්ටීහු සියලු දෘෂ්ටීන්හි සංගෘහිතයි. සෙසු නව දෘෂ්ටීහු සියලු දෘෂ්ටීන්හි සංගෘහිත නොවේ.

දැන් විස්තර වශයෙන් කියන ලද, සියලු දෘෂ්ටීහු ද්වි දෘෂ්ටීන්හිම හකුළුවා, සත්ත්වයින්ගේ දෘෂ්ටි ද්වයයෙහි නිශ්‍රය දක්වනුයේ, **භවඤච දිට්ඨිං** යන ගාථාව වදාළහ. සියලුම එම දෘෂ්ටීහු භව දෘෂ්ටීහු හෝ විභව දෘෂ්ටීහු වෙති. **භවඤච දිට්ඨිං විභවඤච දිට්ඨිං** යන මෙහි ච ශබ්දය දෘෂ්ටියම එක්කරයි. නිශ්‍රය නොවේ. එක් අයෙක් භව විභව දෘෂ්ටි ද්වයය නිශ්‍රය නොකරයි. දෙසූ පරිදි, මෙසේ සත්ත්වයෝ භව දෘෂ්ටි ආශ්‍රිත වූවාහු හෝ වෙති. විභව දෘෂ්ටි ආශ්‍රිත වූවාහු හෝ වෙති. **තකකිකා** යනු තර්කයෙන් කියත්නුයි තාර්කිකයෝය. ඔවුහු වනාහි දෘෂ්ටි ගතිකයෝය. ස්වභාව අවබෝධ ප්‍රඥාවගේ අභාවයෙන්, හුදෙක් තර්කයෙන් කරුණු දැක්වීම කෙරෙහි පවතිත්. යම් ධ්‍යානලාභීහුද, අභිඥාලාභීහුද දෘෂ්ටි ගනිති. ඔවුහුද තර්කකොට ග්‍රහණය කරන හෙයින් තාර්කිකයෝමය. **නිසසිතාසෙ** යනු නිශ්‍රයකර යන අර්ථයි. එකම පදයයි. 'සෙ' යනු නිපාත මාත්‍රය හෝ. **තෙසං නිරොධමහි න හතථි ඤාණං** යනු දෘෂ්ටි නිශ්‍රයට එය හේතුවචනයයි. යම් හෙයකින් ඔවුන්ට සක්කාය දෘෂ්ටි නිරෝධයෙහිද, නිර්වාණයෙහිද ඥාණයක් නැත්ද? එසේවන්නේ එම දෘෂ්ටි ද්වයය නිශ්‍රිත බැවින් යයි අර්ථයි. නහි අත්ථි ඤාණං යන්නෙහි හි කාරය කරුණු පෙන්වීමේ නිපාතයයි. **යතථායං ලොකො විපරීත සඤඤී** යනු නිරෝධ සුවයෙහි මේ දෙවියන් සහිත ලෝකයා සුවයයි විපරීත හැඟීම් ඇත්තේ වේද? එම නිරෝධයෙහි ඥාණයක් නැත යයි සම්බන්ධයයි. දුකයයි විපරීත හැඟීම්තාවයට මේ සූත්‍රය කරුණු දක්වයි.

රූපා සද්දා රසා ගන්ධා - ඵස්සා ධම්මාච කෙවලා
ඉට්ඨා කන්තා මනාපාච - යාවතත්ථීති වුච්චති

රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ හා ධර්මයන්හි, මනොඥ සිත් අලවන මනාපතාවත් යම් පමණ ඇතැයි කියයිද?

සදෙවකස්ස ලොකස්ස - එතෙ තෙ සුඛ සම්මතා
යත්ථ චෙතෙ නිරුජ්ඣන්ති - තං තෙසං දුක්ඛ සම්මතං

ඒවා, එම දෙවියන් සහිත ලෝකයා සුවයැයි සම්මත කර ගත්තාහු වෙති. ඒවා යම්තැනක නිරුද්ධ වෙත්ද, එය ඔවුන්ට දුකයැයි සම්මතය.

සුඛං තං දුක්ඛමරියෙහි - සක්කාය යස්සූපරොධනං
පච්චනීකමිදං හොති - සබ්බ ලොකෙන පස්සතං

යම් සුව දුක්හි වැළැක්ම ආර්යයන් විසින් කළහැකිද මෙය සියලු ලෝකයා විසින් දක්නා වූ ප්‍රත්‍යනීත තාවයකි.

යං පරෙ සුඛතො ආහු - තදරියා ආහු දුක්ඛතො
යං පරෙ දුක්ඛතො ආහු - තදරියා සුඛතොපිච

අන්‍යයා යමක් සුව වශයෙන් කීවාහුද? ආර්යයෝ එය දුක් වශයෙන් කීවාහුය. අන්‍යයා යමක් දුක් වශයෙන් කීවාහුද ආර්යයෝ එය සුව වශයෙන් කීවාහුය.

පස්සධම්ම දුරාජානං - සම්මුළ්හෙත්ථ අවිද්දසු
නිවුතානං තමොහොති - අන්ධකාරො අපස්සතං

අවබෝධයට දුෂ්කර ධර්මය බලව. අඥානයා අර්ථයෙහි මුළාවේ. අන්ධකාරයෙහි බලන ප්‍රතිච්ඡන්න වූවන්ට අඳුරම වේ.

සතඤ්ච විවටංහොති - ආලොකො පස්සතා මිධ
සන්තිකෙ න විජානන්ති - මගා ධම්මස්ස කොවිදා

මෙහි ආලෝකය දක්නා මෙන් සත්පුරුෂයාට විවෘතය. ළඟ ඇසුරෙන් නොදනිත්. ධර්මයෙහි දක්ෂ වූවෝ නුවණ විහිදුවා බැලිය යුත්තාහුය.

**භවරාග පරෙතෙහි - භවසොතානුසාරිහි**
**මාරධෙය්‍යාභිපනෙනහි - නායං ධම්මො සුසම්බුධො**

භව ආලයෙන් පීඩිත වූ, භවය නමැති දිය පහරට අනුව යන්නා වූ, ක්ලේශමාරයා විසින් යටපත් කරනු ලැබූවහු විසින් මෙම ධර්මය අවබෝධ කිරීම දුෂ්කරය.

**කොනු අඤ්ඤත්‍ර අරියෙහි - පදං සමබුද්ධ මරහති**
**යං පදං සමම දඤ්ඤාය - පරිනිබ්බනති අනාසවා'ති**

යම්බඳු වූ නිර්වාණ ශාන්තිපදය මනාව දැන, ආශ්‍රව රහිත වූවාහු පිරිනිවෙත්ද? එබඳු වූ සම්බුද්ධ පදවියට ආර්යයන්ගෙන් තොර කවරෙක් නම් සුදුසු වේද?

දැන් සියලු දෘෂ්ටීන්ගේ සංක්‍ෂෙපය දෘෂ්ටි ද්වයයක් බවද, දෘෂ්ටි සහමුලින් උගුලුවා දැමීමද, සම්‍යග් දෘෂ්ටියද සූත්‍රයෙන් දක්වනු කැමැත්තේ, **ද්වීහි භික්ඛවෙ** යයි සූත්‍රය ගෙනහැර දැක්වීය. එහි **දෙවා** යයි බ්‍රහ්මයින්ද කියති. **ඔලීයනති** යනු හැකිළෙති. **අතිධාවනති** යනු ඉක්මවා යෙති. **චකඛුමනෙතා** යන ප්‍රඥාවන්තයෝ, **ච** ශබ්දය අතිරේක අර්ථයි. **භවාරාමා** යනු භවයෙහි ඇල්ම, ඇලීම් කරුණ ඔවුන්ටනුයි භවාරාමායි. **භවරතා** යනු භවයෙහි විශේෂයෙන් ඇල්මයි. **භව සමුදදිතා** යනු භවයෙන් සතුටුවීමයි. **දෙසියමානෙ** යනු තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු විසින් දෙසනු ලබන කල්හි, **න පකඛන්දති** යනු ධර්මදේශනයට හෝ භව නිරෝධයට නොපිවිසේ. **නපපසීදති** යනු එහි ප්‍රසාදයට නොපැමිණේ. **න සංතිට්ඨති** යනු එහි නොපිහිටයි. **නාධිමුච්චති** යනු එහි ඝන භාවයට නොපැමිණේ. මෙතෙකින් ශාශ්වත දෘෂ්ටිය යූ.සේයි.

**අට්ටියමානාය** යනු දුකට පමුණුවනු ලබනුයේ, **හරායමානා** යනු ලජ්ජාවට පමුණුවනු ලබනුයේ, **ජිගුච්ඡමානා** යනු පිළිකුලට පමුණුවනු ලබනුයේ, **විභවං අභිනන්දනත** යනු උච්ඡේද හේතුවෙන් සතුටුවෙති.

උච්ඡේදය ප්‍රාර්ථනා කෙරෙත් යනු අර්ථයි. තිර යනු අනුශ්‍රවණාර්ථයෙහි නිපාතයි. **භොති** යනු ආලපන මාත්‍රයයි. **සනතං** යනු නිවුණේය යන අර්ථයි. පණීතං යනු දුක් අභාවයෙන් ප්‍රණීතයි. ප්‍රධාන භාවයට ගෙන ගියේනුයිද පණීතංයි. **යාථාවං** යනු යථා ස්වභාවය මෙතෙකින් උච්ඡේද දෘෂ්ටිය යූ.සේයි.

**ඉධ** යනු මෙසස්නෙහි, **භූතං** යනු හේතුයෙන් හටගත් ස්කන්ධ පංචක සංඛ්‍යාත වූ දුකය. **භූතතො පසසති** යනු මෙම භූතය දුකයැයි දකියි. **නිබබිදාය** යනු විදර්ශනාව සඳහා **විරාගාය** යනු ආර්ය මාර්ගය සඳහා. නිරොධාය යනු නිර්වාණය සඳහා **පටිපනෙනා හොති** යනු ඊට අනුරූප වූ ප්‍රතිපදාවට පිළිපන්නේ වේ. **එවං පසසනති** යනු මේ ආකාරයෙන් පූර්වභාග ලෞකික ඥාණයෙන්ද, ප්‍රතිවේධ කාලයෙහි ලෝකෝත්තර ඥාණයෙන්ද දකිත්. මෙතෙකින් සම්‍යග් දෘෂ්ටිය යූ.සේයි.

දැන් ගාථා ද්වයයකින් ඒ සම්‍යග් දෘෂ්ටියෙහි අනුසස් දක්වයි. එහි **යොභූතං භූතතො දිසවා** යනු දුක විශේෂ දැනීම් අවබෝධයෙන් අවබෝධ කොටයැයි අර්ථයි. **භූතසසච අතිකකමං** යනු නිරෝධය සාක්‍ෂාත් කිරීම් අවබෝධයෙන් අවබෝධ කොට යැයි අර්ථයි. **යථා භූතෙධිමුචචති** යනු මාර්ග භාවනා අවබෝධ වශයෙන්, යථා ස්වභාව නිරෝධයෙහි එය ශාන්තය. එය ප්‍රණීතයැයි ස්ථිර ලෙස සිතාගනියි. **භව තණහා පරිකඛයා** යනු සමුදයෙහි ප්‍රහාණයෙන් යැයි අර්ථයි. සත්‍යයන්ගේ නොමැති කල්හිද, නොයෙක් අවබෝධයන් දැකයයි, පූර්වකාලික වචනය සමග පූර්වභාග ප්‍රතිපදාවගේ ව්‍යවහාර වශයෙන් යූ.සේයි.

පූර්වයෙහි දැක පසුව නොඇලේ. සිව්සස් අවබෝධ කරන සමයට සමාන කාලයම වේ. සමාන කාලයෙහිද, පූර්වකාලික පදය වෙත් යනු නිදොස්ය. **සවෙ** යනු ඒකාන්තයෙන් ඒ රහතුන් වහන්සේ, **භූත පරිඤඤාතො** යනු දුක විශේෂයෙන් දැන. **වීත තණෙහා** යනු පහවූ තෘෂ්ණා ඇතියේ. **භවාභවෙ** යනු කුඩා වූද, මහත් වූද භවයන් වෘද්ධි අර්ථයෙහිද අකාරයාගේ යෙදීමෙන් අභවො යනු මහාභවයයි. එහි කුඩා මහත් බව ආකාරය ගෙන දතයුතුය. නොහොත් **භවෙ** යනු ශාශ්වතයෙහි, **අභවෙ** යනු උච්ඡේදයෙහි, ඒ දෙක්හිම දෘෂ්ටි රාග අභාවයෙන් පහවූ තෘෂ්ණා ඇතියේ, **භූතසස විභවා** යනු සංසාර වෘත්ත දුක්ඛයාගේ මුළුමනින් සිඳීමෙහි, **නාගචඡති පුනබභවං** යනු රහතුන්ගේ පරිනිර්වාණය යූ.සේයි.

තයො පුග්ගලා යන ආදිය මිථ්‍යා දෘෂ්ටිකත්වයට ගර්හා කිරීම සඳහාත්, සම්‍යක් දෘෂ්ටිකත්වයට ප්‍රශංසා කිරීම සඳහාත් යූ.සේයි. එහි විරූපභාවයට ඇතුළත් වූ, ගිය දෘෂ්ටිය ඔවුන්ටනුයි **විපන්නදිට්ඨියි** සුන්දර භාවයට ඇතුළත්ව ගිය දෘෂ්ටිය ඔවුන්ටනුයි **සම්පන්න දිට්ඨියි තිත්ථියො** යනු දෘෂ්ටිය තිත්ථයයි යූ.සේයි. එම දෘෂ්ටියෙහි පිළිපන් හෙයින් යහපත් දෘෂ්ටියක් යමෙකුට ඇත්තේනුයි හෝ තිත්ථියොයි. මෙ සස්නෙන් පිටත ප්‍රව්‍රජ්‍යාවට පැමිණියේ, **තිත්ථිය සාවකො** ඔවුන්ගේ දෘෂ්ටිය අනුව පැවැත්මට පැමිණි ගෘහස්ථයා

**යොච මිච්ඡාදිට්ඨිකො** යනු එම ද්විස්වභාවයට නොපැමිණ යම්කිසි දෘෂ්ටියකින් මිථ්‍යා දෘෂ්ටික වූයේ.

**තථාගතො** යනු සම්‍යක් සම්බුදුරදුන් පසේ බුදුන්ද එහිම සංග්‍රහ කරන ලදී. **තථාගත සාවකො** යනු මාර්ගයට හා ඵලයට පත්වූ තැනැත්තේ, **යොච සම්මා දිට්ඨිකො** යනු එම ද්වයයෙන් මිදුණු ලෞකික සම්‍යක් දෘෂ්ටියෙන් යුක්ත සම්‍යග් දෘෂ්ටිකයා.

ගාථාවන්හි **කොධනො** යනු යමෙක් නිතර කෝපයට පත්වේද ඔහුය. **උපනාහී** යනු එම කෝපයම දියුණුකොට වෛර බඳනා සුලුවූයේ, **පාපමක්ඛී** යනු ලාමක වූ අන්ගුණ මැකීම, **මායාවි** යනු කළ පව් වසන සුලු බැව්, **වසලො** යනු පහත් ඉපදීම් ඇති, **විසුද්ධො** යනු ඥාණ දර්ශන විශුද්ධියෙන් පිරිසිදු වූ, **සුද්ධතං ගතො** යනු මාර්ගඵල සංඛ්‍යාත පිරිසිදුබවට ගියේ, **මෙධාවී** යනු ප්‍රඥාවත් වූයේ. මෙම ගයෙන් ලෝකෝත්තර සම්‍යග් දෘෂ්ටියෙන් යුක්ත වූවහුම ප්‍රශංසිතයි.

විරූපභාවයට ගිය දෘෂ්ටිය, සුන්දරභාවයට ගිය දෘෂ්ටිය යැයි පුද්ගල ව්‍යවහාරය අත්හැර ධර්මයම ගරහන්නේ ප්‍රශංසා කරන්නේ යැයි වදාළහ. **එතං මම** යනු තෘෂ්ණා හැඟීම් වශයෙන් වන දෘෂ්ටියි. **එසො හමස්මි** යනු මැණීම් හැඟීම මූලික දෘෂ්ටියයි. **එසො මෙ අත්තා** යනු දෘෂ්ටි හැඟීමමය.

**එතං මමන්ති කාදිට්ඨි** යන ආදීන්හි ත්‍රිවිධ විරූප භාවයට ගිය දෘෂ්ටීන්ගේ විභාගයද, ගණනද කාල සංග්‍රහයද විචාරා විසඳුම කරන ලදී. එහි **කා දිට්ඨි** යනු නොයෙක් දෘෂ්ටීන්හි කවර දෘෂ්ටියදැයි අර්ථයි. **කතමන්තානුග්ගහීතා** යනු පූර්වාන්ත අපරාන්ත සංඛ්‍යාත කාලද්වයයෙහි

කවර අනුග්‍රහිතැයිද අනුබද්ධ යැයිද අර්ථයි. යම්හෙයකින් එය මගේයැයි පරාමර්ශනය කරනුයේ, එය මාගේ වූයේය මෙසේ මාගේ වූයේය. මෙතෙක් මාගේ වූයේයයි අතීත වස්තුව සාක්ෂ්‍යකොට දක්වා ස්පර්ශ කරයි. එහෙයින් **පුබ්බන්තාදිට්ඨි** වෙයි. **පුබ්බන්තානුගගහිතාව** පූර්වාන්තානුග්‍රහිතව ඒ දෘෂ්ටීහු වෙති. යම්හෙයකින් එය වෙමියි පරාමර්ශනය කරනුයේ මම මේ සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ ඒ මම වෙමි. පිරිසිදු වන්නෙමියි අනාගත ඵලය අපේක්ෂාවෙන් ස්පර්ශ කරයි. එහෙයින් **අපරන්තානු** දෘෂ්ටිය වේ. **අපරන්තානුගගහිතාව** අපරාන්තානුග්‍රහිතව ඒ දෘෂ්ටීහු වෙති. යම්හෙයකින් එය මාගේ ආත්මය යැයි ස්පර්ශ කරනුයේ අතීතානාගතය තෘෂ්ණාදීන් විසින් ගන්නා ලද, නොකඩවා පැවැත්ම සලකා ඒ මාගේ ආත්මය යැයි ස්පර්ශ කරයි. සක්කාය දෘෂ්ටි වශයෙන් ස්පර්ශ කරයි. එහෙයින් සක්කාය දෘෂ්ටිය වේ. **පුබ්බන්තාපරන්තානුගගහිතාව** පූර්වාන්ත අපරාන්ත අනුග්‍රහිතව ඒ දෘෂ්ටීහු වෙති. යම්හෙයකින් වනාහි දෙසැට දෘෂ්ටීහු සක්කාය දෘෂ්ටි ප්‍රමුඛවම වෙත්ද? සක්කාය දෘෂ්ටිය සහමුලින් ඉදිරීමෙන්ම දෙසැට දෘෂ්ටීහු සහමුලින් ඉදිරීමට යෙති. එහෙයින් **සක්කාය දිට්ඨි පමුඛෙන ද්වාසට්ඨි දිට්ඨිගතානියි** යු.සේයි. සක්කාය දෘෂ්ටි ප්‍රමුඛ සක්කාය දෘෂ්ටි ද්වාරයෙන් දෙසැට දෘෂ්ටිගතිකයෝ වෙත්යයි අර්ථයි. **සක්කාය දිට්ඨි පමුඛානි** යන පාඨය වඩා සුන්දරය. සක්කාය දෘෂ්ටි ප්‍රමුඛ ආදිය ඔවුන්ටනුයි සක්කාය දිට්ඨි පමුඛානියි. ඒ ඒ දෙසැට දෘෂ්ටිගතයෝ.

**කා දිට්ඨි** යන විමසුම්හි, විසිවස්තුක ආත්මානු දෘෂ්ටිය, විසිවස්තුක සක්කාය දෘෂ්ටිය යැයි විසඳුමයි. **කති දිට්ඨියො** යන විමසුම්හි සක්කාය දෘෂ්ටි ප්‍රමුඛ, දෙසැටක් දෘෂ්ටිගතයන් යැයි විසඳුමයි. එම සක්කාය දෘෂ්ටිය එය මාගේ ආත්මයැයි වචන සමානතාවයෙන් ආත්මානු දෘෂ්ටිය යැයි යු.සේයි. එය කී කල්හි ආත්මවාද ප්‍රතිසංයුක්ත දෘෂ්ටියද කියන ලද්දේම වේ.

**'යෙ කෙචි භික්ඛවෙ'** ආදී සූත්‍ර ගෙනහැර දැක්වීම සුන්දර දෘෂ්ටි යුත් පුද්ගලයා සම්බන්ධයෙන්, සුන්දර දෘෂ්ටි යුත් පුද්ගලයාගේ බෙදීම දැක්වීම සඳහා කරන ලදී. එහි **නිට්ඨංගතා** යනු මාර්ග ඥාණ වශයෙන් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ නිශ්චයට ගියාහුය. විමතියක් නැත්තේයයි අර්ථයි. නිට්ඨාගතා යන පාඨය සමාස පදයක් වේ. අර්ථය වනාහි එයමය.

**දිට්ඨි සම්පන්නා** යනු දෘෂ්ටියෙන් සුන්දරභාවයට ගියාහු **ඉධනිට්ඨා** යනු මෙම කාමධාතුයෙන් පිරිනිවීමයි.

**ඉධ විහාය නිට්ඨා** යනු මෙම කාමභවය අත්හැර සුද්ධාවාස බ්‍රහ්ම ලෝකයෙහි පිරිනිවීමයි. **සත්තක්ඛත්තුපරමස්ස** යනු සත්වරක් උපරිම වූයේ, සත්වරක් උපරිම භව උපත්, ආත්මභාව ග්‍රහණය වන්නේය. ඉන් මත්තෙහි අටවන භවය නොගනීනුයි සත්තක්ඛත්තු පරමොයි. ඒ සත්වරක් උපරිම සෝවාන් වූවහුට, **කොලං කොලස්ස** යනු කුලයෙන් කුලයට යේනුයි කොලං කොලොයි. සෝවාන්ඵල සාක්‍ෂාත් කිරීමෙහි සිට පහත් කුලයෙහි උපතක් නම් නැත. මහා භෝග කුලයන්හිම උපදීයයි අර්ථයි. ඒ කොලං කොල සෝවාන් වූවහුට **ඒකබීජිස්ස** යනු ස්කන්ධ බීජ නමැයි කියන ලදී. යම් සෝවාන් වූවහුට එකම ස්කන්ධ බීජයක්, එක් ආත්මභාව ග්‍රහණයක් ඇත්ද? හෙතෙම ඒකබීජි නමැ. එම ඒකබීජි සෝවාන් වූවහුට, භාග්‍යවතුන් වහන්සේ විසින් ගන්නා ලද නම් වශයෙන්ම ඒවා ඔවුන්ගේ නාමයෝය. මෙපමණ ස්ථානයට ගියේ සත්තක්ඛත්තු පරම නම් වේ. මෙපමණ කොලංකොලය. මෙපමණ ඒකබීජීයයි භාග්‍යවතුන් වහන්සේ විසින් ඔවුන්ට නාමයන් ගන්නා ලදී. භාග්‍යවතුන් වහන්සේ වනාහි මෙතෙමේ මෙපමණ තැන් යන්නේය. මෙතෙමේ මෙපමණ තැන් යන්නේයැයි දැන ඔවුන්ට ඒ ඒ නම් ගත් සේක. මෘදු ප්‍රඥා ඇති සෝවාන් වූවහු සත් භවයෙක්හි උපදින්නේ **සත්තක්ඛත්තු පරම** නමැ. මධ්‍යම ප්‍රාඥයා මත්තෙහි ෂට් භවයක් උපදින්නේ කොලං කොල නමැ. තීක්‍ෂණ ප්‍රාඥයා එක් භවයක් උපදින්නේ ඒකබීජ නමැ. එය වනාහි ඔවුන්ගේ මෘදු, මධ්‍යම, තීක්‍ෂණ ප්‍රාඥතාවය පූර්වහේතු නියමයෙනි. මෙම ත්‍රිවිධ සෝවාන්හු කාමභව වශයෙන් යූ.සේයි. රූප අරූප භවයන්හි බොහෝ වශයෙන් ප්‍රතිසන්ධි ගනිති.

**සකදාගාමිස්ස** යනු ප්‍රතිසන්ධි වශයෙන් එක්වරක් කාම භවයට පැමිණේනුයි සකෘදාගාමියි. ඒ සකෘදාගාමිහුට **දිට්ඨෙව ධම්මෙ අරහා** යනු මෙම ආත්ම භවයෙහිම අර්හත්වයට පත්වන අරහං යනුද පාඨයි. **ඉධ නිට්ඨා** යනු කාමභවයෙහි හැසිරෙන්නවුන්ම සඳහා යූ.සේයි. රූප අරූප භවයන්හි උපන්නා වූ ආර්යයෝ වනාහි කාම භවයෙහි නූපදිති. එහිම පිරිනිවෙත්.

**අන්තරා පරිනිබ්බායිස්ස** යනු ආයුෂ මධ්‍යයෙහි අතරතුරම ක්ලේශ

පරිනිර්වාණයෙන් පිරිනිවෙන හෙයින් අන්තරා පරිනිබ්බායි නමැ. එය වනාහි උපත හා සමනන්තරව පිරිනිවෙයි. ආයුෂ මධ්‍යයට නොපැමිණ පිරිනිවෙයි. ආයුෂ මධ්‍යයට පැමිණ පිරිනිවෙයි යයි තෙවදෑරුම් වෙයි. එහි අන්තරා පරිනිබ්බායිසස යනු අනාගාමීහුය. **උපහච්ච පරිනිබ්බායිසස** යනු ආයුෂ මධ්‍යය ඉක්මවා කාලක්‍රියාවට එළඹෙන්නා වූ ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවන්පානා අනාගාමීහුට, **අසංඛාර පරිනිබ්බායිසස** යනු අසංස්කාරයෙන් අප්‍රයෝගයෙන් අධිමාත්‍ර යෝගයක් නොකොටම ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවෙන ස්වභාව ඇති අනාගාමීහුට, **සසංඛාර පරිනිබ්බායිසස** යනු උත්සාහයෙන් දුකින්, කරදරයෙන්, අධිමාත්‍ර යෝග කරන ලදුයේම ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවෙන ස්වභාව වූ අනාගාමීහුට, **උද්ධං සොතසස අකනිට්ඨගාමිනො** යනු ඉහළට ගෙන යන ස්වභාවයෙන් තෘෂ්ණා ස්‍රෝතස්, වෘත්ත ස්‍රෝතස් මත්තෙහි වන්නේනුයි උද්ධංසොතයි. ඉහළට ගොස් ලැබිය යුතු හෙයින් මාර්ග ස්‍රෝතස මත්තෙහි වන්නේනුයි උද්ධංස්‍රොතයි. අකනිට්ඨගාමි අනාගාමීහුට මේ අනගැමි සිව් අයුරුයි. යමෙක් අවිහයෙහි පටන් සිව්බඹලෝ පිරිසිදුකොට අකනිට්ඨයට ගොස්, පිරිනිවේද මේ උද්ධං ස්‍රෝත අකනිට්ඨගාමී නමැ. යමෙක් යට තෙඹමලෝ පිරිසිදුකොට, සුදසසී බ්‍රහ්ම ලෝකයෙහි සිට පිරිනිවේද? මේ උද්ධං ස්‍රෝතයි. අකනිට්ඨගාමි නම් නොවේ. යමෙක් මෙයින් කෙළින්ම අකනිට්ඨයටම ගොස් පිරිනිවේද, මේ උද්ධංස්‍රෝත නොවේ. අකනිට්ඨගාමී නමැ. යමෙක් යට සිව් බ්‍රහ්ම ලෝකයන්හි ඒ ඒ තන්හිම පිරිනිවේද? මේ උද්ධංස්‍රෝත නොවේ. අකනිට්ඨගාමීද නොවේ නමැ. මෙම පඤ්ච අනාගාමීහු සුද්ධාවාසය අරබයා යූ.සේයි. අනාගාමීහු වනාහි රූප රාග අරූප රාගයන්ගේ අප්‍රහීණ හෙයින් කැමැති වන්නාහු නම් සෙසු රූපාරූප භවයන්හිද උපදිති. සුද්ධාවාසයෙහි උපන්නා වූ වනාහි අන් තන්හි නූපදිති. **අවෙච්චපපා සනනා** යනු ආර්යමාර්ග වශයෙන් දැන, අවබෝධ කොට, අචල ප්‍රසාදයෙන් ප්‍රසන්න වූවාහු, **සොතාපනනා** යනු ආර්යමාර්ග ස්‍රෝතසට පැමිණියාහු මෙයින් සියලුම ආර්ය ඵලස්ථ පුද්ගලයෝ ගන්නා ලද්දාහුය.

**සද්ධර්ම ප්‍රකාශනී ප්‍රතිසම්භිදා මාර්ග අර්ථ කථායෙහි**
**දෘෂ්ටිකථා වර්ණනාව නිමි.**

දැන් දෘෂ්ටි කථානන්තරව කියන ලද, ආනාපාන සති කථාවෙහි පෙර සඳහන් නොකළ විරූ අර්ථ වර්ණනාව පැමිණියේය. මෙම ආනාපාන සති කථාව, දෘෂ්ටි කථාවෙන් මනාව දත් දෘෂ්ටි ආදීනවයන්ගේ, මිථ්‍යා දෘෂ්ටි මල, මනා සෝධනයෙන් සුවිසුද්ධ සිතැත්තහුට යථා ස්වභාව අවබෝධයෙන් සමාධි භාවනාව පහසු වේ. සියලු සර්වඥ බෝධිසත්ත්වයින්ට, බෝධි මූලයෙහිදී සියලු සමාධි භාවනාවන් අතර, මෙම භාවනා සමාධියෙන්ම සමාධිගත සිතැත්තේ, තත්වාකාරාවබෝධය වන හෙයින්, මෙම සමාධි භාවනාවම ප්‍රධානයැයි දෘෂ්ටිකථානන්තරව කියන ලදී. එහි, **සොළස වත්ථුකං ආනාපාන සති සමාධිං භාවයතො සමධිකානි දෙව ඤාණ සතානි උපපජ්ජන්ති** යනු ඤාණයන්හි ප්‍රමාණය උදෙසීමයි. **අට්ඨ පරිපන්ථෙ ඤාණානි** යන ආදිය ඤාණ ප්‍රමාණ නිර්දේශයයි. **කතමානි අට්ඨ පරිපන්ථෙ ඤාණානි** ආදියද **ඉමානි එකවීසති විමුත්ති සුඛෙ ඤාණානි** ආදිය කෙළවරකොට ඇති සියලු ඤාණයන්ගේ විස්තර නිර්දේශයයි. කෙළවරෙහි **සොළස වත්ථුකං ආනාපාන සති සමාධිං භාවයතො** යන ආදිය නිගමනයැයි මෙසේ පළමුව පෙළෙහි නියමකොට දැක්වීම දතයුතුය.

එහි ප්‍රමාණ උදෙසීම් ගණන් වාරයෙහි, පළමුව **සොළස වත්ථුකං** යන්නෙහි, දීර්ඝ, හ්‍රස්ව, සබ්බකාය පටිසංවෙදී පස්සම්භයං කායසංඛාරං යනු කායානුපස්සනා චතුෂ්කයයි. ප්‍රීති පටිසංවෙදී, සුඛ පටිසංවෙදී, චිත්ත සංඛාර පටිසංවෙදී පස්සම්භයං චිත්ත සංඛාරං යනුවෙන් වේදනානුපස්සනා චතුෂ්කයයි. චිත්ත පටිසංවෙදී, අභිප්පමොදයං චිත්තං සමාදහං චිත්තං විමොචයං චිත්තං යනු චිත්තානුපස්සනා චතුෂ්කයයි. අනිච්චානුපස්සී, විරාගානුපස්සී, නිරොධානුපස්සී, පටිනිස්සග්ගානුපස්සී යනු ධම්මානුපස්සනා චතුෂ්කයයි යන මේ සිව් චතුෂ්කයන්ගේ වශයෙන් සොළොස් වස්තූන් ආධාරය අරමුණු මෙයටනුයි සොළොස් වස්තුකයි. ඒ සොළොස් වස්තුකය මෙහි සමාස වශයෙන් විභක්ති ලෝපය කරන ලදී. **ආන** යනු අභ්‍යන්තරයට පිවිසෙන වාතයයි. **අපාන** යනු පිටත නික්මෙන වාතයයි. සමහරු වනාහි වෙනස් ක්‍රමයෙන් කියති. අපානං යනු ආශ්වාසයෙන් පහවූයේ අපානයැයි කියති. නිර්දේශයෙහි වනාහි, නකාරයෙහි, දීර්ඝත්වය අධ්‍යුපේක්ෂණය කොට ආනයැයි යූ.සේයි.

එම ආනාපානයෙහි සිහිය ආනාපාන සතියි. ආස්වාස පරිග්‍රාහික සිහියට එය විශේෂ නාමයකි. ආනාපාන සිහියෙන් යුත් සමාධිය, ආනාපාන

සතියෙහි හෝ සමාධිය ආනාපාන සති සමාධියි. **භාවයතො** යනු තියුණු අවබෝධයෙන් වඩන්නහුට, **සමධිකානි** යනු අධිකය සමග පවතිත්නුයි සමධිකානියි අතිරේක සහිතයැයි අර්ථයි. මෙහි මකාරය පදසන්ධිකාරකයි.

සමහරු සමධික යැයි කියති. මෙසේ ඇති කල්හි ඥාණ දෙසියයක්ම අධික කොටයැයි කීමට පත්වේ. එය නොයෙදේ. මෙම ඥාණ දෙසිය විස්සක්ම වේ.

**පරිපන්ථෙ ඤාණානි** යනු උවදුරු අරමුණුකොට පැවැති ඥාණ උපක්ලේශ උපකාරයෙහි ඥාණද එසේය. **වොදානෙ ඤාණානි** යනු පිරිසිදු කෙරේ. එයින් සිත පිරිසිදු වේයයි = වොදානංයි. එය කිමෙක්ද? ඥාණයයි. වොදාන ඤාණානියි කිවයුතු කල්හි, 'සුතමයෙ ඤාණං' ආදීන්හි මෙන් 'වොදානෙ ඤාණානි'යි යු.සේයි. සිහියෙන් මනා නුවණින් කෙරේනුයි **සතොකාරියි. ඒ සතොකාරිසස ඤාණානි, නිබ්බිදා ඤාණානි** නිර්වේදයට හේතුවූ ඥාණ. **නිබ්බිදානුලොම ඤාණානි** යනු නිර්වේදයට අනුකූල ඥාණ, නිබ්බිදානුලොම් ඥාණයයිද පාඨයි. නිර්විදානුලෝමය ඔවුන්ට ඇත්තේනුයි නිබ්බිදානුලොම්යි අර්ථයි. **නිබ්බිදා පටිප්පසසද්ධි ඤාණානි** යනු නිර්වේදයාගේ සංසිඳීමෙහි ඥාණ. **විමුතති සුඛෙ ඤාණානි** යනු විමුක්ති සුවය හා සම්ප්‍රයුක්ත ඥාණ.

## ගණන් වාර වර්ණනාව නිමි.

කතමානි අට්ඨ යනාදීන්හි උවදුරු, උපකාරයන්ගේ ප්‍රතිපක්‍ෂ, විපක්‍ෂ යුගල හෙයින් එම ඥාණයෝ එකටම නිර්දේශ කරන ලදහ. **කාමච්ඡන්ද නෙක්ඛම්මාදීනි** යට කියන ලද අර්ථමය. **උපකාරං** යනු ලිංග විපර්යාස වශයෙන් නපුංසක වචනය කරන ලදී. **සබ්බෙපි අකුසලා ධම්මා** යනු දක්වන ලද්දෙන් ශේෂ යම්කිසි අකුසල් ධර්මකෙනෙක් වෙත්ද ඒවා, සියලුම නිර්වේදභාගී කුසල්දම්ද එසේමය. **කුසලා ධම්මා** උවදුර, උපකාරය යන එය එයම අපේක්‍ෂාකොට ඒකවචන කරන ලදී. මෙහිද උවදුරු ඥාණද, උපකාර ඥාණද විචාරා, ඒවාහි ආරම්මණයන්ම විසඳ, ඒවායින්ම ඒවා විසඳන ලද්දේ වෙත්යැයි, තදාරම්මණයන් නිගමනයකොට දැක්වීය. **උපක්කිලෙසෙ ඤාණාදීන්** හිද එම ක්‍රමයමැයි.

**සොළසහි ආකාරෙහි** යනු ඤාණයන්ට පක්‍ෂ වශයෙන් කියන ලද සොළොස් ඤාණ කොට්ඨාසයන්ගෙන්, **උදුචිතං චිත්තං සමුදුචිතං** යනු උපචාර භූමියෙහි සිටි සිත, උසස් සිතය, මනාව උසස් සිතය, මතු මත්තෙහි කරන ලද පුරුදු ඇති, මනාව මතුමත්තෙහි කරන ලද පුරුදු ඇත්තේය යන අර්ථයි. උදුජිතං චිත්තං සමුදුජිතංයිද පාඨයි. මතු අභිවෘද්ධිය සඳහා දිනන ලදී. මතු අභිවෘද්ධිකාරක ඤාණයන්ගෙන් දිනන ලද්දේනුයි **උදුජිතංයි. සමුදුජිතං** යනු සමව මතු අභිවෘද්ධිය සඳහා මතු අභිවෘද්ධිකාරක ඤාණයන්ගෙන් දිනන ලදී. සම යනු මෙහි විසමභාව ප්‍රතික්‍ෂෙපයයි. මෙම පාඨයෙහි, 'උ, දු' යයි උපසර්ග ද්වය, ද්වය වෙති. 'උදාජිතං චිත්තං සමුදුජිතං'යිද පාඨයි. මෙහිද දිනතලද අර්ථයමය. 'උදා' යන මෙය නිපාත මාත්‍රයක්මයැයිද කියති. වීණොපමාර්ථ කථායෙහි, තර්ජිත, සුතර්ජිත යැයි යූ.සේයි එය මෙහි නොයෙදේ.

**එකත්ත සනතිට්ඨති** යනු උපචාර භූමියෙහි නානාරම්මණ වික්‍ෂෙප අභාවයෙන් ඒකත්වයෙහි පිහිටයි. **නීයාාණාවරණට්ඨෙන නීවරණාති** මෙහි නොඇල්මද, සියලු අකුසලයන් ආවරණ අර්ථයෙන් නීවරණයැයි යූ.සේයි. නියාාණාවරනට්ඨෙන නිර්යාණයන්ගේ පැමිණෙන මාර්ගය වැසීම් අර්ථයෙන් නියාාණාවරණට්ඨෙන යනුද පාඨයි. නිර්යාණයන්ගේ ප්‍රතික්‍ෂෙපන අර්ථයෙන් යැයි අර්ථයි. **නෙක්ඛම්මං අරියානං නියාාණං** යනු මාර්ග ස්ථානය ආර්යයන්ගේ නීයාාණ සංඛ්‍යාත ආර්ය මාර්ගයට හේතු හෙයින්, ඵලය සමීප හේතු වශයෙන් ආර්යයන්ගේ නිර්යාණයි. එයට හේතුභූත වූ මාර්ග ක්‍ෂණයෙහි ආර්යයෝ ගෙනයනු ලබත්. නික්මෙති. සමහරු වනාහි 'නියාාණං' යනු මාර්ගයයි කියති. මෙහි සමීප හේතු වශයෙන් අදහස් කරන ලද හෙයින් මාර්ගක්‍ෂණයෙහිද, ආලෝක සංඥාවගේද, සියලු කුසල ධර්මයන්ගේද අභාව හෙයින් එය නොයෙදේ. නිවුණු හෙයින්ද, වැසුණු හෙයින්ද, නොදනී යයි පුද්ගල වශයෙන් යූ.සේයි.

**සොළොස් ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

**විසුද්ධචිත්තසස** යනු උපචාර භූමියෙහිම **ඛණික සමොධානා** යනු චිත්තක්‍ෂණයක්, චිත්තක්‍ෂණයක් පාසා, උපදනා හෙයින් ක්‍ෂණය ඒවාට ඇත්තේනුයි ඛණිකායි. උපක්ලේශයි. ක්‍ෂණිකයන්ගේ සම්බන්ධය, එක්වීම, බැඳීම ක්‍ෂණික සමෝධානයි. එහෙයින් ක්‍ෂණික සමොධාන, උපදිනු ලබන

උපක්ලේශ ක්‍ෂණික නොසිඳී පැවතීම් වශයෙන්, ක්‍ෂණික පරම්පරා වශයෙන් උපදිති. එක් චිත්තක්‍ෂණ වශයෙන් නොවේයයි යූ.සේයි. ප්‍රථම ෂට්කයෙහි, **අස්සාසාදි මජ්ඣ පරියොසානං** යනු අභ්‍යන්තරයට පිවිසෙන වාතයෙහි, නාසිකාග්‍රය හෝ මුව නිමිත්ත (ආදියි) මුලයි. හෘදය මධ්‍යයයි. නැබ කෙළවරයි. මුල, මැද, අග සිහිය අනුව යන එම යෝගියාට නානත්‍ව අනුගමන හේතුයෙන් අධ්‍යාත්ම සිත වික්‍ෂෙපයට යයි. ඒ අධ්‍යාත්ම වික්‍ෂෙපගත සිත එකාග්‍රතාවයෙහි නොපිහිටන හෙයින් සමාධියට උවදුරෙකි. **පස්සාසාදි මජ්ඣ පරියොසානං** යනු පිටත නික්මෙන වාතයෙහි නැබ මුලයි. හෘදය මධ්‍යයයි නාසිකාග්‍රය මුව නිමිත්ත හෝ පිටත ආකාශය හෝ කෙළවරයි. මෙහි යෙදුම කියන ලද ක්‍රමයෙන්ම දතයුත්තාහ. **අස්සාස පටිකංඛනා නිකන්ති තණ්හා චරියා** යනු මෙම කමටහන නාසිකා වාතයට ඇතුළත් වූවෙකැයි සලකා දළ දළ ආශ්වාසයෙහි ප්‍රාර්ථනා සංඛ්‍යාත කැමැත්තෙහිම තෘෂ්ණාව පවතී. තෘෂ්ණාවගේ පැවැත්ම ඇතිකල්හි ඒකාග්‍රතාවයෙහි නොපිහිටන හෙයින් සමාධියට උවදුරෙකැ.

**පස්සාස පටිකංඛණා නිකන්ති** යනු නැවැතැ ආශ්වාස පූර්වක ප්‍රශ්වාසයෙහි ප්‍රාර්ථනා සංඛ්‍යාත ඇල්මයි. සෙස්ස කියන ලද අයුරින් යෙදිය යුතුය.

**අස්සාසෙනාභිතුන්නස්ස** යනු ඉතා දීර්ඝ හෝ ඉතා හ්‍රස්වව ආශ්වාස කරන්නහුට, ආශ්වාස මූලක, කායචිත්ත වෙහෙස ස්වභාව හෙයින්, ඒ ආශ්වාසයෙන් විදින ලද පෙළුණහුගේ, **පස්සාස පටිලාභෙ මුච්ඡනා** යනු ආශ්වාසයෙහි පීඩිත වූයේම ප්‍රශ්වාසයෙහි ආස්වාද සංඥී වූයේ, ප්‍රශ්වාසය ප්‍රාර්ථනා කරනුයේ ප්‍රශ්වාස ප්‍රතිලාභයෙහි ඇලීමය. ප්‍රශ්වාස මූලකයෙහිද එම ක්‍රමයයි.

කියන ලද අර්ථයෙහිම, අනුවර්ණනා අර්ථ කියන ලද ගාථා බන්ධනයන්හි, **අනුගච්ඡනා** යනු අනුව යන්නා වූ, **සති** යනු අධ්‍යාත්ම, බාහිර වික්‍ෂෙපයට හේතුවූ සිහිය, මෙය කරණ කොටගෙන සිත වික්‍ෂෙප වේනුයි වික්ඛපොයි. එය කවරෙක්ද? ආශ්වාසයයි. අධ්‍යාත්මයෙහි වික්‍ෂෙපය අධ්‍යාත්ම වික්‍ෂෙපයයි. එහි කැමැතිවීම **අජ්ඣත්ත වික්ඛපාකංඛනා** යනු නොමනා මෙනෙහි කිරීම් වශයෙන් අධ්‍යාත්ම වික්‍ෂෙපක ආශ්වාසයාගේ කැමැතිවීම යයි යූ.සේයි. එම ක්‍රමයෙන්ම පිටත වික්‍ෂෙප ප්‍රාර්ථනා දතයුත්තාහ. **යෙහි** යනු යම් උපක්ලේශයන්ගෙන්, **වික්ඛපමානස්ස** යනු වික්‍ෂේප වන්නහුට වික්‍ෂේපය පමුණුවනු ලබන්නේ,

**නොච චිත්තං විමුච්චති** යනු සිත ආශ්වාස ප්‍රශ්වාස ආරම්මණයන්හිද නොඇලේ. විරුද්ධ ධර්මයන්ගෙන්ද නොමිදේ. සිතද නොමිදේ. අන්‍ය කෙලෙසුන්ගේ ප්‍රාප්තියද වේ යයි සම්බන්ධයයි. **විමොක්ඛං අප්පජානන්තා** යනු එය හෝ අන්‍ය හෝ ආරම්මණාධිමුක්ති විමොක්ෂයද, විරුද්ධ විමුක්ති විමෝක්ෂයද මෙසේ නොදන්නාහු, **පරපත්තියා** යනු අන්‍ය ප්‍රත්‍ය, අන්‍ය ඇදහීම්වලට සුදුසු වෙති. ආත්මප්‍රත්‍යක්ෂ ඥාණයක් නැත්තේනුයි පරපච්චකායි කිවයුතු කල්හි පරපත්තියායි යූ.සේයි. අර්ථය එයමය.

දෙවන ෂට්කයෙහි, **නිමිත්තං** යනු ආශ්වාස, ප්‍රශ්වාසයන්ගේ ස්පර්ශවන ස්ථානයයි. ආශ්වාස, ප්‍රශ්වාස වනාහි දීර්ඝ නාසිකයාට නාස්පුට ගැටෙමින් පවතී. හ්‍රස්ව නාසිකයාට උඩුතොලයි. යම්හෙයකින් වනාහි මෙම යෝගියා එම නිමිත්තම ආවර්ජනා කෙරේද? ඔහුට නිමිත්තම ආවර්ජනා කරන කල්හි ආශ්වාසයෙහි සිත චංචල වේ. නොපිහිටයි යන අර්ථයි. ඔහුට එහි සිත නොපිහිටි කල්හි සමාධියෙහි අභාවය හෙයින් එම කම්පනය සමාධියට උවදුරුය. ඉදින් ආශ්වාසයම ආවර්ජනා කෙරේද? ඔහුගේ සිත අභ්‍යන්තර ප්‍රවේශ වශයෙන් වික්ෂෙපය එළවයි. නිමිත්තෙහි නොපිහිටයි. එහෙයින් නිමිත්තෙහි කම්පා වේ. මෙම ක්‍රමයෙන් සෙස්සෙහිද යෙදීම් කළයුතුය. ගාථාවන්හි **වික්ඛිප්පතෙ** යනු වික්ෂෙපයට පත්වේ. වික්ෂෙපයට පැමිණේ යන අර්ථයි.

තෙවන ෂට්කයෙහි, අතීතානුධාවනං චිත්තං යනු ස්පර්ශ කරන ස්ථානය ඉක්මවා ගිය ආශ්වාස හෝ ප්‍රශ්වාස අනුව යන සිත **වික්ඛෙපානුපතිතං** යනු වික්ෂෙපය අනුව ගිය හෝ වික්ෂෙපයට තෙමේ අනුව පතිත වූයේ, අනුව ගියේ, **අනාගත පටිකංඛනං චිත්තං** යනු ස්පර්ශ ස්ථානයට නොපත් ආශ්වාස හෝ ප්‍රශ්වාස හෝ බලාපොරොත්තු වන, අපේක්ෂිත සිතයි. **විකම්පිතං** යනු එහි නොපිහිටීමෙන්ම වික්ෂෙපයෙන් කම්පිත වූ **ලීනං** යනු ඉතා ලිහිල් වීර්යාදියෙන් හැකිළුණු. **කොසජ්ජානු පතිතං** යනු කුසීතභාවයට පත්. **අතිපග්ගහිතං** යනු ඉතා තදින් අරඹන ලද වීර්යාදීන්ගෙන් ඔසවන ලද, **උද්ධච්චානුපතිතං** යනු වික්ෂෙපය අනුව ගිය, **අභිනතං** යනු ආශ්වාද වස්තූන්හි බොහෝ සේ නැමුණු එකට ඇලුණු, **අපනතං** යනු නිරශ්වාද වස්තූන්හි තෘෂ්ණාව බැහැර කිරීම ඉන් ඉවත් වූයේ, පහකළ තෘෂ්ණා ඇත්තේ ඇල්මෙන් පහවූයේ යයි යන අර්ථයි.

**රාගානුපතිතං** යන මෙහි ආශ්වාස ප්‍රශ්වාස නිමිත්ත මෙනෙහි කරන කල්හි උපන් ප්‍රීති සුවයෙහි හෝ පෙර සිනහසුණු, කථාකළ, ක්‍රීඩා කළ වස්තූන්හි හෝ ඇල්ම මත්තෙහි වැටේ. **බ්‍යාපාදානුපතිතං** යන මෙහි නිරශ්වාදගත චිත්තයාගේ මනසිකාරයෙහි, උපන් දොම්නස් වශයෙන් හෝ පෙර පුරුදු කරන ලද, ක්‍රෝධ වස්තූන්හි හෝ ව්‍යාපාදය මත්තෙහි වැටේ.

ගාථාවන්හි **න සමාධියති** යනු සමාහිත නොවේ. **අධි චිතතං** යනු චිත්ත ශීර්ෂයෙන් නිර්දේශිත අධික සමාධියයි.

මෙතෙකින් ෂට්කත්‍රයයකින් අටළොස් උපක්ලේශයන් නිර්දේශකොට, දැන් ඒ උපක්ලේශයන්ගේ සමාධියට බලපාන උවදුරුභාවය සිදුවීමෙන් වන ආදීනව දක්වන්නේ නැවත, **අසසාසාදි මජඣ පරියොසානං** ආදිය වදාළහ. එහි **කායොපි චිතතමපි සාරදධාච හොනති** යනු වික්ෂෙපයෙන් හටගත් රූපයන්ගේ වශයෙන්, රූපකායයද, වික්ෂෙප නොකඩවා පැවැතීම් වශයෙන් සිතද මහත් කැළැඹීමෙන් කැළැඹුනාහු විඩා සහිත වූවාහුද වෙති. ඉන් මඳ ස්වභාවයෙන් **ඉඤජිතා, කමපිතා** කම්පිත වූවාහු සැලුණාහු ඉන් මඳ ස්වභාවයෙන් **ඵන්දිතා චලිතා** සෙලවුණාහු, චලනය වූවාහු වෙති. බලවත්, මධ්‍යම, මන්ද වශයෙන් කැළැඹීම වේමය. කැළැඹීමෙන් නොවන්ට නොහැකියයි දු.සේයි. **චිතතං විකමපිතතතා** යනු සිතෙහි කම්පිත වූ බැවින්,

ගාථාවන්හි, **පරිපුණණං අභාවිතා** යනු යම්සේ සම්පූර්ණ වේද, එසේ නොවඩනා ලද්දේ, **ඉඤජිතො** යනු කම්පා වූයේ, **ඵන්දිතො** යනු මඳ කම්පනය, යට නීවරණයන් අනන්තර බැවින් **ඉමෙහිච පන නීවරණෙහි** යනු අත්‍යන්ත සමීප නිදර්ශන වචනය කරන ලදී. මෙහි වනාහි නිගමනයෙහි නීවරණයන්ගේ අන්තර සහිත බැවිනි. **තෙහිච පන නීවරණෙහී** යනු පරාම්මුඛ (අභිමුව නොවන) නිදර්ශන වචනය කරන ලදී.

**උපක්ලේශ ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

**වොදානෙ ඤාණානි** යනු විසුද්ධ ඤාණයි. **තං විවජ්ජයිත්වා** යනු පෙර කියන ලද, අතීතය ලුහුබඳනා, වික්ෂෙපය අනුව ගිය යම් සිතෙක් වේද, එය අත්හැර යයි සම්බන්ධ කළ යුතුය. **එකට්ඨානෙ සමාදහති** යනු ආශ්වාස, ප්‍රශ්වාස ස්පර්ශ කරන ස්ථානයෙහි සමව ගනියි. පිහිටුවයි. **තත්ථෙව අධිමොචෙති** යනු එක් ස්ථානයකැයි කියන ලද, ආශ්වාස-ප්‍රශ්වාසයන්ගේ ස්පර්ශ කරන ස්ථානයෙහිම නිශ්චය කරයි. සනිටුහන් කරයි. **පග්ගණ්හිත්වා** යනු ධම්ම විචය, ප්‍රීති, සම්බොජ්ඣංග භාවනාවෙන් දැඩිසේ උත්සාහකොට, **විනිග්ගණ්හිත්වා** යනු පස්සද්ධි, සමාධි, උපේක්ෂා සම්බොධ්‍යාංග භාවනාවෙන් මනාව නිග්‍රහකොට, සතින්ද්‍රිය, විරියෙන්ද්‍රිය යන්ගෙන් ප්‍රග්‍රහණයකොට, සතින්ද්‍රිය සමාධින්ද්‍රියයන්ගෙන් මනාව නිග්‍රහකොටැ යයිද කියති. **සම්පජානො හුත්වා** යනු අසුභ භාවනාදීන්ගෙන් නැවත. **සම්පජානො හුත්වා** මෛත්‍රී භාවනාදීන්ගෙන්, යම් රාගයෙන් පෙළීමක් වේද, යම් ව්‍යාපාදයෙන් පෙළීමක් වේද, එය දුරලයි යයි සම්බන්ධයයි. එම සිත මෙවැනි යයි නුවණින් දන්නේ, එයට ප්‍රතිපක්ෂ රාගය දුරලයි. ව්‍යාපාදය දුරලයි හෝ අර්ථයි. **පරිසුද්ධං** යනු උපක්ලේශ රහිත **පරියොදාතං** යනු ප්‍රභාශ්වර, **එකත්තගතංහොති** යනු ඒ ඒ විශේෂයට පැමිණියේ, ඒ ඒ ඒකත්වයට ගියේ වේ. **කතමෙ තෙ එකත්තා** යනු මෙහි යෙදෙන්නා වූ ද, ඒකත්වයෙහි එක්කොට විචාරයි. **දානූපසසග්ගුපට්ඨා නෙකත්තං** යනු දාන වස්තු සංඛ්‍යාත දානයෙහි එළඹ සිටි පරිත්‍යාගය දානුපසග්ගොයි. ඒ දාන වස්තු පරිත්‍යාග චේතනාව, එහි එළැඹ සිටි සිහිය ආරම්මණ කරණ වශයෙන් හෝ එළැඹ සිටීම දානුපසසග්ගු පට්ඨානංයි. එහිම එකඟතාව එයින් හෝ වන එකඟතාව ඒකාග්‍රභාවය **දානූපසසග්ගුපට්ඨානෙකත්තංයි** දාන පරිත්‍යාගයෙහි එළැඹ සිටි භාවයයි යන්න වඩා සුන්දරය. එයම අර්ථයයි. එයින් ශ්‍රද්ධාව උදුරා දැක්වීම් වශයෙන් ත්‍යාගානුස්මෘති සමාධිය යූ.සේයි. ශ්‍රද්ධාව උදුරා දැක්වීම් වශයෙන් කියන ලද්දේ නමුත්, මෙය අනෙක් ත්‍රයයටම ඒකත්වයාගේ වශයෙන් උපනිශ්‍රය ප්‍රත්‍යය වේ. එහෙයින් මෙහි නිර්දිෂ්ටයැයි කියති.

විශාඛා මහා උපාසිකාවද කීවාය. ස්වාමීනි, නොයෙක් දිසාවන්හි වස් විසූ, මෙසස්නෙහි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දැක්මට සැවතට පැමිණෙන්නාහ. ඔවුහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹැ, ස්වාමීනි, මෙනම් භික්ෂුව කළුරිය කළේය. ඔහුගේ උපදනා තැන කවරේද? මරණින් මතුයෙහි කවරෙක් වේදැයි විචාරන්නාහ. භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂුව සෝවාන් ඵලයෙහි හෝ සකෘදාගාමි ඵලයෙහි හෝ අනාගාමි

ඵලයෙහි හෝ අර්හත්වයෙහි යැයි ප්‍රකාශ කරන්නාහ. මම එම භික්ෂූන් වෙත එළැඹ, ස්වාමීනි, එම ආර්යයන් වහන්සේලා සැවැතට පැමිණි විරූදැයි විමසන්නෙමි. ඉදින් ඔවුහු, එම භික්ෂූහු සැවැතට පැමිණි විරූයයි මට කියත්ද? ඒකාන්තයෙන් එම ආර්යයන් වහන්සේලා විසින්, වැසි සළු ආගන්තුක බත්, ගමික බත්, ගිලන් බත්, ගිලානෝපස්ථාන බත්, ගිලන් බෙහෙත්, නිත්‍ය කැඳ, පරිභෝජනය කරන ලදැයි මෙහි නිෂ්ඨාවට යන්නෙමි. එසේ වූ මට එය සිහිකරන කල්හි ප්‍රමුදිතතාවය හටගන්නේය. ප්‍රමුදිතතාවයෙන් ප්‍රීතිය හටගන්නේය. සතුටු සිතැත්තේ කය සන්සුන් වන්නේය. සන්සුන් කය ඇත්තේ සුව විඳින්නෙමි. සුව විඳිනු ලබන්නී සිත සමාධිගත වන්නීය. එය මාගේ ඉන්ද්‍රිය භාවනාවද බල භාවනාවද, බොජ්ඣංග භාවනාවද වන්නේය.

නොහොත් - ඒකත්වයන්හි, ප්‍රථමය උපචාර සමාධි වශයෙන්ද දෙවැන්න අර්පණා සමාධි වශයෙන්ද, තෙවැන්න විදර්ශනා වශයෙන්ද, සිව්වැන්න මාර්ගඵල වශයෙන්දැයි දතයුතුය. සමථයෙහි නිමිත්ත **සමථ නිමිත්තංයි.** ව්‍යයය, භංගයම ස්වභාවය වූයේ වය **ලක්ඛණංයි.** නිරෝධය නිර්වාණයයි. සෙස්ස එම ත්‍රයයෙහි කියන ලද ක්‍රමයෙන්ම යෙදිය යුතුය.

**චාගාධිමුත්තානං** යනු ත්‍යාගයෙහි (දානයෙහි) අධික ලෙස යෙදුණවුන්ට, **අධිචිත්තං** යනු විදර්ශනාපාදක සමාධියයි. **විපස්සකානං** යනු භංගානුපස්සනායෙහි පටන් ත්‍රිවිධ අනුපස්සනාවන්ගෙන් සංස්කාරයන් විදර්ශනා කරනවුනට, **අරියපුග්ගලානං** යනු අෂ්ට ආර්ය පුද්ගලයන්ට ද්විතියාදී ත්‍රිවිධ ඒකත්වයෝ ආනාපාන සති වශයෙන්ද, සෙසු කර්මස්ථාන වශයෙන්ද යෙදෙත්. **චතූහි ඨානෙහි** යනු සිව් කාරණයන්ගෙන්,

සමාධි විදර්ශනා මාර්ගඵලයන්ගේ වශයෙන් ඒකත්වයට ගිය සිත ප්‍රතිපදා විශුද්ධියට පිවිසියේද වෙයි. උපේක්ෂායෙන් වඩනා ලද්දේත් ඤාණයෙන්ද විශෝධිත වූයේ යයි යනු උද්දේශපදයි. ප්‍රථම ධ්‍යානයාගේ මුල කවරේදැයි ආදිය ඒවාහි උද්දේශ පදයන්ගේ විස්තර කරනු කැමැති විමසුම් පූර්වංගම නිර්දේශපදයි.

**එහි පටිපදා විසුද්ධි පක්ඛන්තං** යනු ප්‍රතිපදාවම නීවරණ මල පිරිසිදු කරන හෙයින් විසුද්ධියි. එම ප්‍රතිපදා විශුද්ධියට පිවිසියේ ප්‍රවිශ්ට වූයේ, **උපෙක්ඛානුබෲහිතං** යනු තත්‍ර මධ්‍යස්ථ උපෙක්ෂායෙන් වර්ධනය කරන

0ලද, වඩන ලද, **ඤාණෙන සම්පහංසිතං** යනු පිරිසිඳු කරන ඥාණයෙන්, සතුටුකළ, පිරිසිඳු කළ මනාව පිරිසිඳු කළ, **පටිපදා විසුද්ධි** නම් අඞ්ගු දේ සහිත උපචාරයයි. **උපෙක්ඛානුබ්‍රෑහනා** නම් අර්පණායි. **සම්පහංසනා** නම් ප්‍රත්‍යවේක්ෂණම යැයි ඇතැමෙක් වර්ණනා කරති. යම්හෙයකින් වනාහි, **එකත්තගතං චිත්තං පටිපදා විසුද්ධි පක්ඛන්නඤ්චෙව හොති** යයි ආදිය කියන ලදද, එහෙයින් අර්පණාව තුළම පැමිණීම් වශයෙන් ප්‍රතිපදා විශුද්ධියයි. තත්‍ර මධ්‍යස්ථ උපේක්ෂාවගේ කෘත්‍යය වශයෙන් උපේක්ෂාවගේ වැඩීමයි. ධර්මයන්ගේ නොඉක්මවන ආදි ස්වභාව සාධනයෙන්, පිරිසිඳු කරන ඥාණයාගේ කෘත්‍ය නිෂ්පත්ති වශයෙන් සතුටුකිරීම දතයුතුය. කෙසේද? යම්වරෙකැ අර්පණාව උපදීද? එකල්හි එම ධ්‍යානයට උවදුරු ඇතිකරන යම් නීවරණ සංඛ්‍යාත කෙලෙස් සමූහයක් වේද, ඉන් සිත පිරිසිඳු කෙරේ. පිරිසිඳු වූ හෙයින්, ආවරණ විරහිතව, මධ්‍යම සමථ නිමිත්තට පිළිපදී. **මජ්ඣිමං සමථ නිමිත්තං** යනු සමව පවත්නා අර්පණා සමාධියමය. ඉන් අනතුරුව පළමු සිත එක් සන්තතියෙක පරිණාම ක්‍රමයෙන් එබඳු ආකාරයට එළඹෙනු ලබන්නේ මධ්‍යම සමථ නිමිත්තට පිළිපදී නමැ. (**පටිපජ්ජති නාම**) මෙසේ පිළිපන් හෙයින් එබඳු භාවයට පැමිණීමෙන් එහි පිවිසියේ නමැ (**පක්ඛන්දති නාම**)

මෙසේ පළමුව පළමු සිතෙහි විද්‍යමානාකාරයෙන් නිපදවනු ලැබූ, ප්‍රථම ධ්‍යානයෙහි, උත්පාදක්ෂණයෙහිම පැමිණීම් වශයෙන් ප්‍රතිපදා විශුද්ධිය දතයුත්තාහ. මෙසේ පිරිසිඳු වූ ඔහුට නැවත පිරිසිඳු කළයුත්තක් නොමැති හෙයින් විසෝධනයෙහි උත්සාහ නොකරනුයේ පිරිසිඳු සිත **අජ්ඣුපෙක්ඛති** මධ්‍යස්ථ වේ නමැ. සංසිඳීම් භාවයට පැමිණීමෙන්, සංසිඳීම්භාවයට පිළිපන්නහුට නැවත නිශ්චල කිරීමෙහි උත්සාහ නොකරනුයේ, සංසිඳීමට පිළිපන්නේ මධ්‍යස්ථ වේ නමැ. සංසිඳීමට පිළිපන් භාවයෙන්ම ඔහුට කෙලෙස් සංසර්ගය අත්හැර ඒකත්වයෙන් එළැඹැ සිටියහුට නැවත ඒකත්වයෙන් එළැඹැ සිටීමෙහි උත්සාහ නොකෙරෙනුයේ ඒකත්වයෙන් එළැඹැ සිටීමෙහි මධ්‍යස්ථවේ නමැ. **එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති** මෙසේ තත්‍ර මධ්‍යස්ථතා උපේක්ෂායෙන් කෘත්‍යය වශයෙන් උපේක්සාවගේ වැඩීම දතයුත්තාහ.

මෙසේ උපේක්ෂාව මනාව වැඩුණු කල්හි, එහි හටගත් සමාධි ප්‍රඥා සංඛ්‍යාත යුගනද්ධ ධර්ම ඔවුනොවුන් නොඉක්ම වන්නාහු වී පවත්නාහුය. යම් ඒ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ නොයෙක් කෙලෙසුන්ගෙන් මිදුණු හෙයින්

විමුක්ති රසයෙන් එක්රස වී පවත්නාහුය. යමක් මේ ද්වයයට ඇතුළත් වූයේද, ඒවා නොඉක්මවන ඒකරස භාවයන්ට සුදුසු වූ වීර්යය උසුලයිද ඒ ක්‍ෂණයෙහි යම් ආසේවනයක් වේද? ඒ සියලුම ආකාරයන් යම්හෙයකින් ඤාණයෙන් කිලුටෙහි හා පරිශුද්ධතාවෙහි ඒ ඒ ආදීනව දැක, ඒ ඒ ආකාරයෙන් සතුටුකළ හෙයින්ද, පිරිසිඳු කළ හෙයින්ද විශේෂයෙන් පිරිසිඳු කළ හෙයින්ද, නිෂ්පන්නයහ. එහෙයින් ධර්මයන්ගේ නොඉක්මවන ආදි ස්වභාව සිද්ධියෙන් පිරිසිඳු කළයුතු ඤාණයෙහි කෘත්‍ය නිෂ්පත්ති වශයෙන් සතුටුවීම දතයුතුයැයි යූ.සේයි.

එහි උපේක්‍ෂා වශයෙන් ඤාණය ප්‍රකට වෙයි. දෙසූ පරිදි එසේ උත්සාහවත් කළ සිත උපේක්‍ෂා වශයෙන් මනාව මධ්‍යස්ථ වේ. ප්‍රඥා වශයෙන් ප්‍රඥෙන්ද්‍රිය උපේක්‍ෂා වශයෙන්ද අධිමාත්‍ර වෙයි. නොයෙක් කෙලෙසුන්ගෙන් මිදීම් වශයෙන් සිත මිදෙයි. ප්‍රඥා වශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වෙයි. මිදුණු හෙයින් එම ධර්ම එක්රසාර්ථයෙන් වැඩීමෙන් එක්රස වේ. එහෙයින් ඤාණකෘත්‍යය වූ **සමපහංසනා පරියොසාන** යැයි යූ.සේයි.

**එවං තිවත්තගතං** ආදිය එම චිත්තයටම ස්තුති වචනයි. එහි **එවං තිවත්තගතං** යනු මෙසේ කියන ලද ආකාරයෙන් නුවණින් පිරිසිඳු කිරීම් වශයෙන් ත්‍රිවිධ භාවයට ගිය, **විතක්ක සම්පන්නං** යනු කෙලෙස් කැළැඹීම් විරහිත හෙයින් විතර්කයෙන් සුන්දර භාවයෙන් යුක්ත වූ, සුන්දර භාවයට ගිය, **චිත්තස්ස අධිට්ඨාන සම්පන්නං** යනු එම අරමුණෙහිම චිත්තයාගේ නිරතුරු පැවැතීම් සංඛ්‍යාත වූ අධිෂ්ඨානයෙන් යුක්ත වූ නොඅඩු, අධිෂ්ඨාන වසිය පරිද්දෙන්, ධ්‍යාන පැවැත්මෙහි අධිෂ්ඨානයයි එසේම මෙහිද, චිත්තයාගේ අධිෂ්ඨානයැයි චිත්තෙකාග්‍රතාවද යෙදේ. එහෙයින් එකම අරමුණෙහි සිත අධිෂ්ඨාන කරයි. මෙහි වික්ෂේප නොවේනුයි **සමාධි සම්පන්නං** යයි වෙන්ව කියන ලද හෙයින් කියන ලද ක්‍රමයෙන්ම ගතයුතුය.

නොහොත් සමාධියටම ධ්‍යානාංග සංග්‍රහ කරන ලද හෙයින්, **චිත්තස්ස අධිට්ඨාන සම්පන්නං** යනු ධ්‍යානාංග පංචක වශයෙන් යූ.සේයි. **සමාධි සම්පන්නං** යනු ඉන්ද්‍රිය සංගෘහිත හෙයින් ඉන්ද්‍රිය පංචක වශයෙන් යූ.සේයි. ද්විතිය ධ්‍යානාදීන්හි නොලබන ප්‍රමාණ පදයන් හැර, ලැබෙන ප්‍රමාණ වශයෙන් **පීති සම්පන්නං** යන ආදිය යූ.සේයි.

**අනිච්චානුපස්සනාදී** අටළොස් මහා විදර්ශනාවන්හි විතර්කාදීහු පරිපූර්ණමය. ඒවා කාමාවචර හෙයින් ඒවාහි අර්පණායෙහි අභාව හෙයින්, ප්‍රතිපදා විසුද්ධි ආදීහු **ක්‍ෂණික** සමාධි වශයෙන් යෙදිය යුතුය. සිව් මාර්ගයන්හි ප්‍රථම ධ්‍යානික වශයෙන් විතර්කාදීන්ගේ ලැබීම වන හෙයින්, ලැබීම් ප්‍රමාණ වශයෙන්ම විතර්කාදීහු සම්පූර්ණයයි කියන ලදී. මාර්ගයන්හි විතර්කාදීහු ද්විතිය ධ්‍යානිකාදීන්හි මෙන් පිරිහෙත්.

මෙතෙකින් තෙළෙස් වොදාන ඥාණයෝ විස්තර වශයෙන් නිර්දේශ කරන ලද්දාහු වෙති. කෙසේද? එක් ස්ථානයෙක්හි තැන්පත් කිරීමෙන් එහිම ස්ථිර ලෙස පිහිටීම් වශයෙන් කුසීතකම දුරුකිරීමෙන් නොසන්සුන්කම දුරුකිරීමෙන්, රාගය දුරුකිරීමෙන්, ව්‍යාපාදය දුරුකිරීමෙන් ඒහා සම්ප්‍රයුක්ත ෂට් ඥාණයන්ද, සිව් ඒකත්තයන්හි සම්ප්‍රයුක්ත සිව් ඥාණයන්ද, ප්‍රතිපදා විසුද්ධිය උපේක්‍ෂානු බ්‍රෑහනය සම්ප්‍රහංසනය හා සම්ප්‍රයුක්ත ත්‍රිවිධ ඥාණයන්දැයි මෙසේ තෙළෙස් ඥාණ නිර්දිෂ්ටය.

මෙසේ ඇතිකල්හිද, ආනාපාන සති සමාධි භාවනා වශයෙන් ඒවාහි නිෂ්පත්තිය දක්වනු කැමැතියේ එම ඥාණයන් නිගමනය නොකොටම, **නිමිත්තං අස්සාස පස්සාසා** යනාදී ක්‍රමයෙන් චෝදනා පූර්වංගම ආනාපාන සති සමාධි භාවනා ක්‍රමය ඉදිරිපත් කොට, කෙළවර එම ඥාණයන් නිගමනය කොට දැක්වීය. එහි **නිමිත්තං** යනු කියන ලද්දේමය. **අනාරම්මණාමෙක චිත්තස්ස** යනු එක් සිතකට අරමුණු නොවූ, මෙහි මකාරය පද සන්ධි කරයි. අනාරම්මණං එක චිත්තස්ස යනුද පාඨයි. එක් සිතකට අරමුණු නොවෙත් යයි අර්ථයි. **තයොධම්මෙ** යනු නිමිති ආදි ධර්මත්‍රය භාවනා යනු ආනාපාන සති සමාධි භාවනාවයි.

**කථං** යනු ප්‍රථමයෙන් කියන ලද චෝදනා ගාථාවෙහි අනතුරුව කියන ලද, පිළිතුරු ගාථාවෙන් අර්ථය කියාදෙනු කැමැති විමැසීමයි. **නච්මෙ** යනු මේවා නොවේ. නචමෙ යනුද පාඨයි. එයම පදච්ඡෙදයි. කෙසේ නොදන්නා ලද්දේ වේද? කෙසේ සිත වික්‍ෂෙපයට නොයේද? මෙසේ 'කථං' ශබ්දය සෙසු පසෙහිම යෙදිය යුතුය. **පධානං පඤ්ඤායති** යනු ආනාපාන සති සමාධි භාවනාරම්භක වීර්යය දක්නා ලැබේ. වීර්යය එය කරණකොට බලවත් සේ උත්සාහ කෙරේනුයි පධානංයි යූ.සේයි.

**පයොගඤ්ච සාධෙති** යනු නීවරණ යටපත් කරන ධ්‍යානයද යෝගියා

නිෂ්පාදනය කරයි. ධ්‍යානය වනාහි නීවරණ යටපත් කිරීම පිණිස මනාකොට යෙදේනුයි, ප්‍රයෝගයැයි යූ.සේයි. **විසෙසමධිගච්ඡති** සංයෝජන ප්‍රහාණකර මාර්ගයද ලබයි. මාර්ගය වනාහි සමථ විදර්ශනාවන්ගේ අනුසස් බැවින් විශේෂයැයි යූ.සේයි. විශේෂයාගේ ප්‍රමුඛතාව බැවින් චකාරයෙන් එක්කිරීම නොකරන ලදී.

දැන් එම විමසන ලද අර්ථය උපමාවකින්, ඔප්පු කරනුයේ, **සෙය්‍යථාපි රුක්ඛො** යනාදිය වදාළහ. එහි අර්ථය යම්සේ නම් කියතෙන් පැළීම (ඉරීම) සඳහා වැයෙන් සැස වෘක්ෂය පළන (ඉරන) කල්හි නිශ්චලබව සඳහා **සමෙ** සම භූමි ප්‍රදේශයක ක්‍රියාවට සුදුසුකොට තබන ලද්දේ වේද? **කකචෙන** යනු අත් කියතෙන්, **ආගතෙ** යනු වෘක්ෂය ස්පර්ශ කොට තමාගේ සමීප කොටසට පැමිණිකල්හි, **ගතෙ** යනු වෘක්ෂය ස්පර්ශකොට අන් කොටසට ගිය කල්හි, වා ශබ්දය එක්කිරීම් අර්ථයි. **න අවිදිතා හොනති** යනු වෘක්ෂය කියත් දත්වලින් ස්පර්ශ කරන පුරුෂයා විසින් බලනු ලබන ස්ථානයට නොපත්ව ඒවාහි පැමිණීම්-යාම් නොවන හෙයින් සියලුම කියත් දත් දතුයේම වේ. **පධානං** යනු වෘක්ෂය සිඳීමේ ක්‍රියාවයි. විසෙසමධිගච්ඡති යන වචනය උපමාවෙහි නැත. **උපනිබන්ධනා නිමිත්තං** යනු ළංකොට බැඳීමෙන්, සිහියට නිමිති වූ, හේතු වූ, නාසිකාග්‍රහය හෝ මුව නිමිත්ත හෝ, එයින් අරමුණෙහි සිත ළංකොට බඳීනුයි උපනිබන්ධනා නමැ, සිහියයි. **නාසිකග්ගෙවා** යනු හ්‍රස්ව නාසිකයාගේ උඩුතොලෙහි, උඩුතොලෙහි සිහිය පිහිටුවා ගැනීම මුඛයෙහි සිහිය පිහිටුවා ගැනීම යැයිද, මුව නිමිත්ත යැයිද යූ.සේයි.

**ආගතෙ** යනු ස්පර්ශ කළ ස්ථානයෙන් අභ්‍යන්තරයට පැමිණි, **ගතෙ** යනු ස්පර්ශ කළ ස්ථානයෙන් පිටත ගිය, **න අවිදිතාහොනති** යනු ස්පර්ශ කරන ස්ථානයට නොපැමිණ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ පැමිණීම් පිටවීම් නොමැති හෙයින්, එම සියල්ල ප්‍රකටවම වේ. **කම්මනියං හොති** යනු යම් වීර්යයකින් කයද, සිතද, කර්මණ්‍ය වේද, භාවනා කර්මක්ෂම වේද, භාවනා කර්මයට යෝග්‍ය වේද? **ඉදං** මේ වීර්යය, **පධානං** ප්‍රධාන නමැයි ඵලයෙන් හේතුව යූ.සේයි.

**උපක්කිලෙසා පහීයනති** යනු විෂ්කම්භන වශයෙන් නීවරණ ප්‍රහීණ වෙයි. **විතක්කා වූපසම්මනති** යනු නොයෙක් අරමුණුවල සරනා, ස්ථිරව නොපිහිටි විතර්ක සංසිඳීමට යේ. යම් ධ්‍යානයකින් උපක්ලේශ ප්‍රහීණ

වෙත්ද, විතර්ක සංසිඳෙත්ද, **අයං පයොගො** යනු ප්‍රයෝගය අපේක්ෂාකොට පුංලිඟු නිර්දේශය කරන ලදී. **සංයෝජනා පහීයනති** යනු ඒ ඒ මාර්ගයෙන් නැසිය යුතු සංයෝජන මුළුමනින් නැසීම් ප්‍රහාණයෙන් ප්‍රහීණ වෙති. **අනුසයා බ්‍යනති හොනති** යනු ප්‍රහීණ වූවන්ගේ නැවත ඉපැත්ම නොවන ස්වභාව හෙයින් පහවූ උත්පාදාන්තයද, ව්‍යයාන්තයද ඒවාටනුයි බ්‍යනතායි. පූර්වයෙහි නොනැසුණාහු නැසුණාහු වෙත්නුයි විනාශය අන්තකොට වෙත්. විනාශ වන්නාහුයයි අර්ථයි. සංයෝජන ප්‍රහාණය අනුසය ප්‍රහාණයෙන් වෙයි. අන් අයුරෙකින් නොවේයැයි දැක්වීම සඳහා අනුසය ප්‍රහාණය වදාළහ. යම් මාර්ගයකින් සංයෝජන ප්‍රහීණ වේද? අනුසය විනාශ වේද? **අයං විසෙසො** මෙය විශේෂයයි අර්ථයි.

සිව්වන චතුෂ්කයෙහි ආර්ය මාර්ගයාගේද, නිර්දේශ කරන ලද හෙයින් මෙහි ආර්ය මාර්ගය යූ.සේයි. එක් සිතකට අරමුණු ද්වයයක නොවන බව නොකියන ලදුයේද, එය එසේම සිද්ධවන හෙයින්, එය නොවිසඳන ලදුයේම, **එවං ඉමෙ තයො ධම්මා එකචිත්තසස ආරම්මණා න හොනති** යයි නිගමනය කරන ලදී.

දැන් භාවනා අභිවෘද්ධිය සිදුකරන්නා වූ, යෝගාවචරයාට ස්තුති කරනුයේ, **ආනාපාන සතියසස** යන ගාථාව වදාරා, එහි නිර්දේශය වදාළහ. එහි ආනාපාන සතීහු, **යථා බුදෙධන දෙසිතා** යම්සේ බුදුරදුන් විසින් දේශිතද? එසේ, **පරිපුණණා සුභාවිතා අනුපුබබං පරිචිතා** මනාව වඩනා ලද්දාහු සම්පූර්ණ වූවාහු, පිළිවෙළින් පුරුදු කරන ලද්දාහු යමෙකුට ඇත්ද, විද්‍යමාන වෙත්ද, **සොඉමං ලොකං පභාසෙති** හෙතෙම මෙලොව ආලෝකමත් කරයි. කුමක් මෙන්ද? **අබභාමුතෙතාව චන්දිමා** යනු යම්සේ වලාකුළුවලින් මිදුණු චන්ද්‍රයා මෙම අවකාශ ලෝකය බබළවයි. එසේම එම යෝගාවචරයා, මෙම ස්කන්ධාදි ලෝකය බබළවයි යයි ගාථාවෙහි සම්බන්ධයයි. 'අබභාමුතෙතාව චන්දිමා' යන පදයට නිර්දේශයෙහි මීදුම් ආදියද කියන ලද හෙයින්, මෙහි ආදි ශබ්දය ලොප් කරන ලදැයි දතයුතුය. ගාථා නිර්දේශයෙහි **නො අසසාසො නො පසසාසො** යනු එම අර්ථයම වැළැක්වීම් වශයෙන් විශේෂකොට යූ.සේයි. **උපට්ඨානං සති** යනු මුළා නොවීම් ස්වභාවයෙන් එම ආශ්වාසයට එළැඹැ සිටි සිහිය නමැයි අර්ථයි. **පසසාසං** එසේමය. මෙතෙකින් ආනාපානයන්හි සිහිය **ආනාපානසති** යැයි අර්ථය යූ.සේයි.

දැන් සිහි වශයෙන්ම 'යමෙකුට' යැයි කියන ලද පුද්ගලයා නිර්දේශ කරනු කැමැතියේ, **සො අසසසති තසසුපටඨාති යො පසසසති තසසුපටඨාතියි** යූ.සේයි. යමෙක් ආශ්වාස කෙරේද, ඔහුගේ සිහිය ආශ්වාසයට එළැඹැ සිටී. යමෙක් ප්‍රශ්වාස කෙරේද, ඔහුගේ සිහිය ප්‍රශ්වාසයට එළැඹැ සිටීයයි අර්ථයි. **පරිපුණණා** යන ධ්‍යාන විදර්ශනා මාර්ග පරම්පරාවෙන් අර්හත් මාර්ගෝත්පත්තියෙන් සම්පූර්ණ, ඒවාම ධ්‍යාන, විදර්ශනා, මාර්ග ධර්මයන් සඳහා, පරිග්‍රහණාර්ථයෙන් යැයි ආදිය කීහ. එම ධර්ම මෙම යෝගියා විසින් අල්ලාගනු ලබන හෙයින් පරිග්‍රහයි. ඒ **පරිගගහටෙඨන** පරිග්‍රාහර්ථයෙන් සම්පූර්ණ වූ. එහි සියලුම චිත්ත චෛතසිකයන්ගේ අන්‍යොන්‍ය පිරිවර හෙයින් **පරිවාරටෙඨන පරිපුණණායි**. භාවනාව සම්පූර්ණත්වයට පත්වීම් වශයෙන් **පරිපූරටෙඨන පරිපුණණායි චතසෙසා භාවනා** යනාදීන්හි මනාකොට වඩනා ලදැයි කියන ලද පදයට අර්ථ වශයෙන් යූ.සේයි. සිව් භාවනා යට කියන ලද්දේමය. **යානි කතා** යනු අසුන් බඳින ලද යානයක් ලෙසින් කරන ලද. **වතථුකතා අනුටඨිතා** යනු එළැඹැ සිටි. **පරිචිතා** යනු හාත්පසින් පුරුදු කළ, මනාව රැස්කළ, **සුසමාරදධා** යනු මනාව අරඹන ලද, මනාව කරන ලද, **යතථ යතථ ආකංඛති** යනු, යම් යම් ධ්‍යානයන්හි යම් යම් විදර්ශනාවන්හි ඉදින් කැමැති වේද, **තතථ තතථ** යනු ඒ ඒ ධ්‍යානයන්හි, ඒ ඒ විදර්ශනාවන්හි, **වසිපපතෙතා** යනු වසීභාවයට බහුල භාවයට, පැමිණියේ, **බලපපතෙතා** යනු සමථ විදර්ශනා බලයට පත්වූයේ, **වෙසාරජජපපතෙතා** යනු විශාරද භාවයට ප්‍රකට භාවයට පත්වූයේ, **තෙ ධමමා** යනු සමථ විදර්ශනා ධර්ම, **ආවජජන පටිබදධා** යනු ආවර්ජනයන්ට අයත්, ආවර්ජනා කළ සැණෙකින්ම ඔහුගේ සන්තානය ඤාණය සමග එක්වීමට යේ යන අර්ථයි. **ආකංඛන පටිබදධා** යනු කැමැත්තට අයත්, කැමැති වූ සැණින්ම කියන ලද ආකාරයෙන් එක්වීමට යේ යන අර්ථයි. මෙහි මනසිකාරය වනාහි ආවර්ජන සිතෙහි හටගැන්මයි. කැමැත්තෙහි පර්යාය වචන වශයෙන් අර්ථ විවරණ සඳහා යූ.සේයි. **තෙන වුචචති යානිකතානි** යනු මෙසේ කළ හෙයින්ම ඒවා අසුන් යෙදූ යානයක් හා සමාන කරන ලදුයේ වෙත්යයි යූ.සේයි.

**යසමිං යසමිං වතථුසමිං** යනු සොළොස් වස්තූන් අතරෙහි එකිනෙකෙහි, **සවාධිටඨිතං** යනු මනාව පිහිටියේ, **සුපටඨිතා** යනු මනාව එළැඹියේ, සිහිය හා සිත සම්ප්‍රයුක්තව එකට තම තමාගේ කෘත්‍යයන් කරන හෙයින් අනුලෝම ප්‍රතිලෝම වශයෙන් යොදා එම ද්වි ධර්මයෝ

දක්වන ලදහ. **තෙන වුච්චති වත්‍ථුකතා** මෙසේ වූ හෙයින්ම කරන ලද පිහිට වේයයි යූ.සේයි.

**යෙන යෙන චිත්තං අභිනීහරති** යනු පෙර පැවැත්මෙන් ඉවත්කොට යම් යම් භාවනා විශේෂයන්හි සිත එළවයි. **තෙන තෙන සති අනුපරිවත්තති** යනු ඒ ඒ භාවනා විසේසයන්හි සිහිය අනුකූල වී පෙර පැවැත්මෙන් නැවැතී පැවැතේ. **යෙන තෙන** යන මෙහි 'යෙන භගවා තෙනුපසංකමි' ආදීන් මෙන් සත්තමී අර්ථය දතයුතුය. **තෙන වුච්චති අනුට්ඨිතා** යනු මෙසේ කිරීමෙන්ම ඒ ඒ භාවනාව අනුව ගොස් සිටියාහු වෙත්යයි යූ.සේයි. ආනාපාන සතියෙහි සිහිය ප්‍රධාන හෙයින් වත්‍ථුකතා, අනුට්ඨිත පදයන්හි, සිහිය සමග යෙදීම් කරන ලදැයි දතයුත්තාහ. යම්හෙයකින් සම්පූර්ණ වූයේම මනාව වඩනා ලද්දාහු වෙත්ද, වඩන ලද්දාහු ලද ආසේවන නම් වෙති. එහෙයින් 'පරිපුණ්ණායි' පදයෙහි කියන ලද අර්ථත්‍රය පරිචිතා යන පදයෙහිද යූ.සේයි. සිව්වන විශේෂාර්ථයද යූ.සේයි.

එහි, **සතියා පරිග්ගණ්හන්තො** යනු, සම්ප්‍රයුක්ත, පූර්වභාග ස්මෘතියෙන් පරිග්‍රහණය කළයුතු දෑ පරිග්‍රහණය කරන යෝගී තෙමේ, **ජිනාති පාපකෙ අකුසලෙ ධම්මෙ** යනු මුළුමනින් නැසීම් වශයෙන් ලාමක අකුසල ධර්මයන් දිනයි. මැඩපවත්වයි. මෙයද පුද්ගලාධිෂ්ඨාන ධර්මදේශනායි. ධර්මයන් දිනන කල්හි ඒ හා යුක්ත පුද්ගලයාද දිනයි නමැ. එම ධර්ම ස්මෘතිය නොහැර, තමාගේ ප්‍රවෘත්ති ක්‍ෂණයෙහි දිනන්ට අරඹන ලද්දාහුයයි කියති. යම්සේ නම් අනුභව කරන්ට අරඹන ලදුයේ, අනුභව කළේයයි කියයිද, එසේය. මෙහි ලක්‍ෂණය ශබ්ද ශාස්ත්‍රයෙන් දතයුතුය. මෙසේ ඇති කල්හිද 'පරිජිතායි' කිවයුතු කල්හි 'ජ' කාරයට 'ච' කාරය කොට පරිචිතායි යූ.සේයි. යම්සේ යහපත් කථාව වන්නේනුයි සුගතොයි. අර්ථ විකල්පයෙහි 'ද' කාරයට 'ත' කරය නිරුක්ති ලක්‍ෂණයෙන් කරන ලදී. මෙහිද මෙසේ දතයුතුය. මෙම අර්ථ විකල්පයෙහි පරිචිතා යන පදය කර්තෘකාරකය. ප්‍රථම ත්‍රයය කර්මකාරකය. **චත්තාරො සුසමාරද්ධා** යනු සුසමාරබ්ධයෝ (මොනොවට කරන ලද්දාහු) සතර දෙනෙකියි යූ.සේයි. අත්‍ථ ශබ්දයාගේ ලෝපය දතයුතුය. **සුසමාරද්ධා** යන පදයෙහි අර්ථයද මෙහි මොනොවට කරන ලද්දාහුයයි දතයුතුය. මනා සම තත්ත්වයෙන් අරඹන ලද ධර්ම හෝ, අර්ථ සතරෙකැ භේදයෙන්ද, ධර්ම භේදයෙන්ද සතරකැයි යූ.සේයි. යම්හෙයකින් වනාහි මනාව වඩනා ලද්දේම මනාව අරඹන ලද්දාහු වෙත්ද, අනෙක්වා නොවෙත්ද, එහෙයින්

භාවනාර්ථත්‍රයය මෙහිද යු.සේයි. ආසේවනාර්ථයද ත්‍රයයක්හුගේ කීකල්හි යු.සේයි. එහෙයින් එය ප්‍රකාශ නොකොට, ඊට විරුද්ධ වූවන්ගේ නැසීම් අර්ථය යු.සේයි. විරුද්ධ ධර්මයන් නැසීමෙන් ආරම්භය හා කෙළවර පෙනේ. එහෙයින් මොනොවට අරඹන ලද්දහුගේ අභිමතාර්ථයන් මුදුන් පත්වූයේ යයි අර්ථය යු.සේයි. එහි **තපපච්චනිකානං** යනු ඒ ධ්‍යාන, විදර්ශනා මාර්ගයන්ට ප්‍රතිපක්ෂ වූ, **කිලෙසානං** යනු කාමච්ඡන්දාදීන්ද, නිත්‍ය සංඥාදීන් හා සම්ප්‍රයුක්ත සක්කාය දෘෂ්ටි ආදීන්ද, **සුසමූහතත්තා** යනු විෂ්කම්භන තදංග, සමුච්ඡේද වශයෙන් මනාව නසන ලද හෙයින්ද, නසන ලද හෙයින්ද, සමහර පොත්වල සුසමුඝාතතත්තායිද ලියති. එය නොමැනවි.

නැවත එම පදයෙහිම අනෙක් අර්ථ විකල්පයක් දක්වනුයේ, සුසමං ආදිය වදාළහ. එහි, **තත්‍ථ ජාතා** යනු එම මස්තකප්‍රාප්ත භාවනා විශේෂයෙහි හටගත්තාහු, **අනවජ්ජා** යනු කෙලෙසුන් අරමුණු භාවයට නොඑළඹීමෙන් කෙලෙස් දොස් විරහිත, **කුසලා** යනු ඉපදීම් වශයෙන් කුසල් වූ.

**බොධිපක්ඛියා** යනු අවබෝධ කිරීම් අර්ථයෙන් බෝධියයි ලද නම් ඇති, ආර්ය පක්ෂයෙහි වූ හෙයින් බෝධි පාක්ෂික, පක්ෂයෙහි වූ හෙයින් යනු උපකාරක භාවයෙහි සිටි හෙයිනි. ඒවා වනාහි, සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද, පඤ්චෙන්ද්‍රිය, පඤ්චබල, සප්ත බොජ්ඣංග, ආර්ය අෂ්ඨාංගික මාර්ග යනාදී සත්තිස් ධර්ම.

**ඉදං සමං** යනු මාර්ගක්ෂණයෙහි උපන් යම් බෝධිපාක්ෂික ධර්ම කෙනෙක් වෙත්ද, මුළුමනින් නැසීම් වශයෙන් කෙලෙස් සමනය කරයි. විනාශ කෙරෙයිනුයි සම නමැ. **නිරොධො නිබ්බාණං** යනු දුක් නිරුද්ධ කළ හෙයින් නිරෝධයි. වාන සංඛ්‍යාත තෘෂ්ණාවගේ අභාව හෙයින් නිර්වාණයි. **ඉදං සුසමං** යනු මෙම නිර්වාණය සියලු ප්‍රත්‍යයෙන් හටගත් විසමයන්ගෙන් පහවූ හෙයින් මනාව සම වූ හෙයින් සුසම නමැ. **ඤාතං** යනු බෝධිපාක්ෂික සංඛ්‍යාත සමය නුමුළාවීම් වශයෙන් නුවණින් දන්නා ලදුයේ, නිර්වාණ සංඛ්‍යාත සුසමය අරමුණු වශයෙන් නුවණින් දන්නා ලදුයේ, එම ද්වයයම එලෙසින්ම නැණැසින්ද දිටියේ, දිට්ඨං යි. **විදිතං** යනු එම ද්වයයම සන්තානයෙහි උත්පාදනයෙන්ද, අරමුණු කිරීමෙන්ද ලබන ලදුයේ, දැනගත්තාක් මෙන් ප්‍රඥාවෙන් සාක්ෂාත් කරන ලදුයේ

ස්පර්ශ කරන ලදුයේ, **සචජිකතං එසසිතඤච** අසලලීනං අසමමුටඨා, අසාරදෙධා, එකගගං යනු පළමු පළමු පදයෙහි අර්ථ ප්‍රකාශනයයි. එහි ආරදධං යනු පිහිටුවන ලදී. **අසලලීනං** යනු නොහැකිළුණේ, **උපටඨිතා** යනු එළැඹැ සිටියාහු. **අසමමුටඨා** යනු නොනැසුණාහු, **පසසදෙධා** යනු නිවුණේ, අසාරදෙධා යනු දාහ රහිත වූයේ, **සමාහිතං** යනු සමව තබන ලදුයේ, **එකගගං** යන නොවිසුරුණු.

චතතාරො **සුසමාරදධා** යන ආදිය සියලු සුසමාරදධ වචනයන්ගේ මූලාර්ථයයි. **අත්‍ථි සමං** යන ආදිය සුසම වචනයාගේ වශයෙනි. **ඤාතං** ආදිය ආරදධ වචනයෙහි විකල්පතාව බැවිනි. එහි මේ පදාර්ථ සංසන්දනයයි සමද සුසමද ධර්ම සමසුසමායි කිවයුතු කල්හි, එක් කොටසක්, එක් ස්වරූපයෙන් හ්‍රස්වකොට සුසමා යනුවෙන්ම යූ.සේයි. යම්සේ වනාහි නාමඤච රූපඤච නාමරූපං ලෙසිනි. මෙය සමය, මෙය සුසමයැයි අනෙකක් අපේක්‍ෂා නොකොට නපුංසක වචනය කරන ලදී. යම්හෙයකින් වනාහි දත් දැද, සිදුවූයේ යයි කියයිද, සිදුවූ දේද අරඹන ලද්දේද අර්ථ වශයෙන් එකය. දැනගත්, සාක්‍ෂාත් කළ, ස්පර්ශ කරන ලද්දාහු දත් යන වචනයට පර්යායයෝය. එහෙයින් දත් යනු අරඹන ලද අර්ථයම යූ.සේයි. **ආරදධං හොති විරියං අසලලීනං** යන මෙය වනාහි ආරදධ වචනයෙහි ඍජු අර්ථයමය. **උපටඨිතා සති** යනාදිය වනාහි සම්ප්‍රයුක්ත වීර්යයෙහි උපකාර ස්වභාවය දැක්වීම සඳහා යූ.සේයි. ආරදධ වචනයෙහි අර්ථ දැක්වීම සඳහා නොවේ. ප්‍රථම අර්ථයෙන් 'සුටඨු සමාරදධා' මනාව අරඹන ලද්දාහු, මෙම අර්ථයෙන් මනා සම තත්ත්වයෙන් අරඹන ලද්දේනුයි මනාකොට අරඹන ලද්දේනුයි එක් අක්‍ෂරයක් ශේෂ කළ කල්හි සුසමාරදධායි කියති. (සුසමා ආරදධා සුසමාරදධා) මෙම අර්ථය පරිග්‍රහණය කොට, එහෙයින් සුසමාරදධ යයි කියනු ලැබේ යයි යූ.සේයි.

අනුපුබෙබන යනු (ක්‍රමය පරිදි) අනුපිළිවෙළින් යන අර්ථයි. පූර්ව පූර්වයට අනුවයැයි යූ.සේයි. **දීඝං අසසාසවසෙන** යනු දීර්ඝයයි කියන ලද ආශ්වාස වශයෙන්, **පුරිමා පුරිමා** යනු පළමු පළමු සිහිය, එයින් පුබබං යන පදයට අර්ථ යූ.සේයි. **පචඡිමා, පචඡිමා** යනු සිහියමය. එයින් අනු යන පදයට අර්ථ යූ.සේයි. පුරිමා, පුරිමා, පචඡිමා පචඡිමා යන ද්වයයෙන් පළමු පළමු සිහියෙන් ප්‍රගුණතාවද පසුව පසුව පුන පුනා සිහියෙහි ප්‍රගුණතාවයිද අර්ථය යූ.සේයි. මතුයෙහි සොළොස් වස්තූන් විස්තරකොට කියන හෙයින් සංක්‍ෂෙප කොට පටිනිසසගගානුපසසී යයි අවසානයම

දක්වන ලදී. භාවනාවෙහි මස්තකප්‍රාප්තියෙන් සියලුම ආනාපානසතීහු නැවත නැවත කැමැති පරිද්දෙන් පවත්වන හෙයින් ප්‍රගුණ කරන ලද්දාහු වෙති. එහෙයින් ඔවුනොවුන් පුරුදු කරන ලද්දාහු මෙන්ම, පුන පුනා පුරුදු කරන ලද්දාහු වෙත්යයි යු.සේයි. **යථත්‍ථා** යනු යථා ස්වභාවාර්ථයෙන්, **අත්තදමථත්‍ථො** යනු අර්හත් මාර්ගක්ෂණයෙහි තමාගේ ආත්මාර්ථකාමිත්වයෙන් තොරවූයේ, **සමථත්‍ථො** යනු සිසිල් භාවාර්ථය, **පරිනිබ්බානත්‍ථො** යනු කෙලෙස් පිරිනිවීමෙන් **අභිඤ්ඤත්‍ථො** යනු සියලු ධර්මයන් විශිෂ්ට ඥානයෙන් අවබෝධ කිරීම් වශයෙන්, **පරිඤ්ඤත්‍ථො** යනු මාර්ග ඤාණ කෘත්‍ය වශයෙන්, **සච්චාභිසමයත්‍ථො** යනු සිව්සස් එක්වර ප්‍රතිවේධ දර්ශන වශයෙන්, **නිරොධෙ පතිට්ඨා පකට්ඨා** යනු අරමුණු කිරීම් වශයෙන්, **බුද්ධා** යන පදයෙහි, අභාවයෙහිද, 'බුද්ධන' යන පදයෙන් යම් බුදුවරයෙක් වේද, ඔහු නිර්දේශ කරනු කැමැතියේ බුද්ධා යයි යු.සේයි.

**සයම්භූ** යනු උපදේශයන්ගෙන් තොරව තෙමේම අවබෝධ කළේ.

**අනාචරියකො** යනු සයම්භූ පදයෙහි අර්ථ විවරණයයි. යමෙක් වනාහි ගුරුවරයෙකු නොමැතිව සත්‍යයන් අවබෝධ කෙරේද, හෙතෙම සයම්භූ නමැ. **පුබ්බෙ අනනුස්සුතෙසු** යන ආදිය ගුරුවරයෙකු නොමැති භාවයෙහි අර්ථ ප්‍රකාශනයයි. **අනනුස්සුතෙසු** යනු ගුරුවරයෙකුගෙන් ශ්‍රවණය නොකළ - **සාමං** යනු තෙමේම, **අභි සම්බුජ්ඣි** යනු වහා මනාව ප්‍රතිවේධ කළේය. **තත්‍ථ ච සබ්බඤ්ඤුතං පාපුණි** යනු එම සත්‍යයන්හිදු සර්වඥත්වයට පැමිණියේය. යම්සේ වනාහි සත්‍යයන් ප්‍රතිවේධ කරන්නාහු සර්වඥවරු වෙත්ද? එසේ සත්‍යයන් ප්‍රතිවේධ කළ හෙයින් මෙසේ යු.සේයි. සර්වඥතාවට පැමිණියේ යයිද පාඨයි. **බලෙසුච වසීභාවං** යනු දස තථාගත බලයන්හි ඓශ්වර්යය භාවයට පැමිණියේය. යමෙක් මෙම දස තථාගත බලයන්ගෙන් යුක්තද හෙතෙම බුද්ධයයි යු.සේයි. එහි සියලු ධර්මයන්හි නොගැටුණු ඤාණ නිමිත්තෙන්, අනුත්තර විමෝක්ෂය අවබෝධ කරගැනීම පිණිස වඩනා ලද ස්කන්ධ සන්තානය නිමිතිකොට නියම කරන ලද, සර්වඥතාවට ආසන්න කාරණය වූ සත්‍යයන් අවබෝධය සඳහා නියම කරන ලද සත්ත්ව විශේෂය බුද්ධයයි.

මෙතෙකින් අර්ථ වශයෙන් බුද්ධ යන්නෙහි අර්ථය පැහැදිලි කිරීම කරන ලද්දේ වේ.

දැන් අක්ෂර වශයෙන් පැහැදිලි කරනුයේ, **බුජ්ඣිති සෙනටෙඨන** බුදෙධා යනාදිය වදාළහ. එහි යම්සේ ලෝකයෙහි අවබෝධ කරන්නවුන්, අවබෝධ කළ තැනැත්තේ යයි යූ.සේයි. මෙසේ **බුජ්ඣිතා සච්චානීති** = බුදෙධා සත්‍යයන් අවබෝධ කළේනුයි බුද්ධයි. යම්සේ කොළ වියලවන වාතය කොළ වියලවනයැයි කියත්ද? එසේම **බොධෙතාපජායාති බුදෙධා, සබ්බඤ්ඤුතාය බුදෙධ** යනු සියලු ධර්ම අවබෝධයට හැකි බුද්ධියෙන් යුක්ත හෙයින් බුද්ධයයි යූ.සේයි. **සබ්බ දස්සාවිතාය බුදෙධ** යනු සියලු ධර්මයන් නැණැසින් දිටි හෙයින් බුද්ධයයි යූ.සේයි. **අනඤ්ඤ නෙය්‍යතාය** බුදෙධා යනු අන්‍යයන් ලවා විසින් අවබෝධ කරවන හෙයින්ද, තෙමේම අවබෝධ කළ හෙයින් බුද්ධයැයි යූ.සේයි. **විසවිතාය බුදෙධා** යනු නොයෙක් ගුණ පුබුදු කරවන හෙයින් නෙළුම්මලක් මෙන් පුබුදු කරවන අර්ථයෙන්, **ඛීණාසව සංඛාතෙන බුදෙධා** යන ෂට් ක්‍රමයන්ගෙන් සිත හකුළුවන ස්වභාවයන් ප්‍රහාණයෙන් නිද්‍රාව ක්‍ෂය කිරීමෙන් ප්‍රබුද්ධ පුරුෂයෙකු මෙන් සියලු කෙලෙස් නිද්‍රා ක්‍ෂය කිරීමෙන් බුද්ධයයි යූ.සේයි. සංඛා සංඛතං යනු අර්ථයෙන් ඒක ස්වභාව හෙයින්, **සංඛාතෙන** යන වචනයට කොටසින් යයි අර්ථයි. **නිරූපලෙප සංඛාතෙන** යනු තෘෂ්ණා, දෘෂ්ටි ආලේප අභාවයෙන්, ඉතා සියුම් වූද, කෙලෙසුන් සහිත සියලු කෙලෙසුන් ප්‍රහීණ හෙයින්, ඒකාන්ත වචනයෙන් වෙසෙසා, **එකනත වීතරාගො** ආදිය යූ.සේයි. **එකනත නිකකිලෙසො** යනු රාග, ද්වේෂ, මෝහ ඇතුළු සෙසු සියලු කෙලෙසුන්ගෙන් නිකෙලෙස් වූයේ, **එකායන මගගං ගතොති බුදෙධා** යනු ගමනාර්ථ ධාතුන්ගේ අවබෝධනාර්ථයද, අවබෝධනාර්ථ වූද ධාතූහු ගමනාර්ථ වෙති. එහෙයින් ඒකායන මාර්ගයට ගිය හෙයින් බුද්ධයැයි යූ.සේයි. මෙහි ඒකායන මාර්ගය වනාහි,

**මගෙගා, පනෙථා පථො පජෙජා අඤජසං වටුමායනං**
**නාවා උතතර සෙතුච - කුලෙලාච භිසි සංකමො**

මාර්ගය, පන්ථ, පථ, පජ්ජ, අඤ්ජස, වටුම, අයන, නැව, එතෙරවීම, ඒදණ්ඩ, පහුර, බිස්ස, සංක්‍රමණය යන මාර්ගයට ඇතුළත් බොහෝ නාමයන් අතර, අයන නාමයෙන් යූ.සේයි. එහෙයින් එක් මාර්ගයක් වූ මාර්ගයයි. දෙමගක් නොවූයේය යන අර්ථයි. නොහොත් හුදෙකලාවෙන් පිළිපැදිය යුතු මාර්ගයනුයි ඒකායන මාර්ගයයි. 'එකෙන' යනු ගණ සංගණිකාරාමතාව අත්හැර විවේක සිතින්, අයිතබ්බා යනු පිළිපැදිය යුත්තේය. එය කරණකොටගෙන ගමන් කෙරේනුයි අයනයි. සංසාරයෙන්

නිවනට යෙත් යයි අර්ථයි. ශ්‍රේෂ්ඨයින්ගේ ගමන ඒකායනයි. එකෙ යනු ශ්‍රේෂ්ඨ වූයේ, සියලු සත්ත්වයින්ට ශ්‍රේෂ්ඨ වූයේ සම්‍යග් සම්බුදුරදුය. එහෙයින් ඒකායන මගෙගා යනු සම්‍යග් සම්බුදුරජාණන් වහන්සේලාගේ ගමන්කරන ස්වභාව වූ මාර්ගයයි යූ.සේයි. යේනුයි අයනයි. යයි පවතීයයි අර්ථයි. එකෙක්හිම ගමන් කරන මාර්ගයනුයි එකායන මගෙගායි, එකම බුදුසස්නෙහි පවත්නා වූ මාර්ගයයි අන් අයුරෙකින් නොවේ යයි අර්ථයි.

තවද එකක් ගෙන යේනුයි ඒකායනොයි. පූර්ව භාගයෙහි නොයෙක් ආකාර භාවනා ක්‍රම අනුව පැවැත්තේ වී නමුත් පසුකල්හි එක නිර්වාණයටම යේයයි යූ.සේයි. එහෙයින් එකායන මගෙගා යනු එක් නිර්වාණ ගමන් මාර්ගයයි අර්ථයි.

**එකො අනුතතරං සමමා සමෙබාධිං අභිසමබුදෙධාති බුදෙධා** යනු අන්‍යයන්ගෙන් අවබෝධ කළ හෙයින් බුද්ධ නොවේ. කිමෙක්ද? තෙමේම වෙනත් ශ්‍රේෂ්ඨයෙකු නොමැති සම්‍යක් සම්බෝධිය අවබෝධ කළ හෙයින් බුද්ධයැයි යූ.සේයි. **අබුදධි විහතතතා බුදධි පටිලාභා බුදෙධා** යනු බුද්ධි බුදධ, බොධ යන මේවා පර්යාය වචනයෝය. එහි යම්සේ නිල් රතු ආදී විශේෂතා යෙදීමෙන් නිල් වස්ත්‍රය, රතු වස්ත්‍රය යැයි කියයිද, මෙසේ බුද්ධි විශේෂතා යෝගයෙන් බුද්ධයයි හැඟවීමට යූ.සේයි.

ඉත් මත්තෙහි, **බුදෙධාති නෙතං නාමං** යන ආදියෙහි මේ අර්ථානුගත ප්‍රඥප්තියකැයි හැඟවීමට යූ.සේයි. එහි **මිතතා** යනු සහායකයෝයි. **අමචචා** යනු පෝෂණය කටයුතු අය, **ඤාති** යනු පියපස ඤාතීහු, **සාලොහිතා** යනු මව්පස ඤාතීහු, **සමණා** යනු පැවිද්දට එළැඹි අය, **බ්‍රාහමණා** යනු සංසිඳවූ පාපයන් ඇති, බහා තැබූ පාපයන් ඇති බ්‍රාහ්මණයෝය. **දෙවතා** යනු ශක්‍ර, බ්‍රහමාදීහු, **විමොකඛනතිකං** යනු අර්හත් මාර්ගය විමෝක්ෂයයි. අර්හත් ඵලය විමෝක්ෂයාගේ අන්තයයි. එම විමොක්ෂාන්තයෙහි වූයේ විමොක්ෂාන්තික නමැ. සර්වඥභාවය වනාහි අර්හත් මාර්ගයෙන් සිද්ධ වෙයි. අර්හත්ඵල උදාවීමෙන් සිද්ධ වේ. එහෙයින් සර්වඥභාවය විමොක්ෂාන්තයෙහි වීම වේ. එහෙයින් කියන ලදී. **විමොකඛනතිකමෙතං බුදධානං භගවනතානනති බොධියා මූලෙ සහ සබබඤඤුත ඤාණසස පටිලාභා** යනු මහ බෝරුක් මුල, කියන ලද ක්ෂණයෙහි සර්වඥතා ඥානයෙහි ප්‍රතිලාභය සමග, **සචඡිකා පඤඤතති** යනු අර්හත්ඵල සාක්ෂාත් කිරීමෙන්, සියලු ධර්ම සාක්ෂාත් කිරීමෙන් හෝ

හටගත්තා වූ ප්‍රඥප්තිය, **යදිදං බුද්ධො** යනු යම් මේ බුද්ධයයි ප්‍රඥප්තිය. මේ අක්‍ෂර වශයෙන් බුද්ධ යන වචනය පැහැදිලි කිරීමයි.

යථා බුද්ධෙන **දෙසිතා** යන ගාථා පදයට මෙම පද බෙදීමෙහි කියන ලද අර්ථය හා මේ සැසඳීමයි. ආනාපාන සතීහු යම් අයුරෙකින් බුදුරදුන් විසින් දේශිතද? යම් ආකාරයකින් දේශිතද? යථා ශබ්දයෙන් සංගෘහිත, දස යථාර්ථයන්ද යම්සේ බුදුරදුන් විසින් දේශිතද, යම් ප්‍රකාරයකින් දේශිතද, ප්‍රකාරාර්ථයාගේද, යථා ශබ්දයාගේද, ස්වභාවාර්ථයාගේද, යථා ශබ්දයාගේද, ස්වරූපය ඒකාකාර වශයෙන් ඒකාකාර කොට, යම්සේ යයි යූ.සේයි.

**සොති ගහට්ඨො වා හොති පබ්බජිතො වායි** කියන ලද හෙයින් මුල් පදයෙහිද, යම් ගෘහස්ථයෙකුට හෝ ප්‍රව්‍රජිතයෙකුට යයි යූ.සේයි. ලෝකාර්ථය කියන ලද්දේම වේ. **පභාසෙති** යනු තම ඥාණයෙහි ප්‍රකට භාවය කෙරේයයි අර්ථයි. **අභිසම්බුද්ධත්තා** යනු, ශ්‍රාවක පාරමී ඥාණයෙන්ද, අවබෝධ කළ බැවින්, **ඔභාසෙති** යනු කාමාවචර වූ ලෝකය **භාසෙති** යනු රූපාවචර වූ ලෝකය. **පභාසෙති** යනු අරූපාවචර වූ ලෝකය, **අරියඤාණං** යනු අර්හත් මාර්ග ඥාණය, **මහිකාමුත්තො** මීදුමෙන් මුක්ත, මහිකා යැයි මීදුම යූ.සේයි.

මහියා මුත්තොයිද පාඨයි. **ධූමරජා මුත්තො** යනු දූම්වලින්ද දුහුවිල්ලෙන්ද මිදුණු, **රාහුගහණා විප්පමුත්තො** යනු රාහුගෙන් චන්ද්‍රයාට වූ ආසන්න උපක්ලේශය බැවින් උපසර්ග ද්වයයකින් වෙසෙසා යූ.සේයි. **භාසතෙ** යනු බැබළීම් සහිත යන අර්ථයෙන්, **තපතෙ** යන බැබළීම් සහිතාර්ථයෙන්, **විරොචතෙ** යනු බැබළීම් අර්ථයෙන්, **එවමෙවං** යනු මෙසේ මෙසේ, යම්හෙයකින් චනාහි චන්ද්‍රයාද තෙමේ බබළනුයේ, වඩාත් බබළනුයේ, මනාව බබළනුයේ මෙම අවකාශ ලෝකය බබළවයි. භික්‍ෂුවද, ප්‍රඥාවෙන් බබළනුයේ, වඩාත් බබළනුයේ, මනාව බබළනුයේ, මෙම ස්කන්ධාදී ලෝකය බබළවයි. එහෙයින් දෙතන්හිම කියයි යයි නොකියා කියනු ලැබේ යයි යනුවෙන්ම යූ.සේයි. මෙසේ කී කල්හි හේතු අර්ථය යූ.සේයි. ඉතා ප්‍රකට ආලෝකයක් සහිත සූර්ය උපමාව නොගෙන කුමක් හෙයින් චන්ද්‍රොපමාව ගන්නා ලද්දේද යත්? සියලු කෙලෙස් දාහයන් සන්සිඳීමෙන් සන්සුන් භික්‍ෂුවට සන්සුන් ගුණයෙන් යුත්, චන්ද්‍රොපමාව සුදුසුයැයි ගන්නා ලදැයි දතයුතුය. මෙසේ ආනාපාන සති භාවනා

සිද්ධිය, සිදුකරන යෝගාවචරයාට ප්‍රශංසාකොට, ඉමානි තෙරස වොදානෙ ඤාණානියි එම ඤාණයන් විනිශ්චයකොට දැක්වීය.

### ව්‍යවදාන ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.

සතොකාරි ඤාණ නිර්දේශ මාතෘකාවෙහි, ඉධ භිකඛු යනු මෙ සස්නෙහි භික්‍ෂුව, මෙහි මේ ඉධ ශබ්දය වනාහි, සියලු ආකාර, ආනාපාන සති සමාධිය උපදවන පුද්ගලයාට, ආශ්‍රිත වූ සාසනය විදහා දැක්වීම, අන් සසුන්හි එසේවීම් ප්‍රතික්‍ෂෙපයද වේ යූ.සේයි. මහණෙනි, මෙ සස්නෙහිම ශ්‍රමණයා වේ. අන් ශ්‍රමණයන්ගේ අන්‍ය මතයන් ශූන්‍යයි. අරඤඤගතොවා, රුකඛ මූලගතොවා, සුඤඤාගාරගතොවා යන මෙය ආනාපාන සති සමාධි භාවනාවට අනුරූප සෙනසුන් පරිග්‍රහණය දැක්වීමයි. මේ භික්‍ෂුවගේ බොහෝ කලක් රූපාදී අරමුණුවල විසුරුවන ලද සිත ආනාපාන සති සමාධියට නැගීමට නොකැමැති වේ. කුළු ගොණෙකු යොදන ලද රියක් මෙන් නොමගම දුවයි. එහෙයින් යම්සේ නම් කුළු දෙනගේ සියලු කිරි බී වැඩුණු කුළුවස්සා දමනය කරනු කැමැත්තේ දෙනගෙන් ඉවත්කොට, එක්පසෙක විශාල ටැඹක් වළලා (සිටුවා) එහි යොතින් බඳින්නේය. ඉක්බිති ඒ වස්සා, ඔබිනොබ දඟලා පැනයාමට නොහැකි වනුයේ එම ටැඹෙහිම ළංව හිඳින්නේ, ළංව වැද හෝනේ වන්නේය. එපරිද්දෙන් දීර්ඝ කාලයක් රූපාදී අරමුණු රස පානය කර වැඩුණු දුෂ්ට සිත දමනය කරනු කැමැති මෙම භික්‍ෂුව විසින්, රූපාදී අරමුණුවලින් ඉවත්කොට අරණ්‍යයකට හෝ, රුක් මුලකට හෝ ශූන්‍යාගාරයකට හෝ පිවිස එහි ආශ්වාස, ප්‍රශ්වාස නමැති ටැඹෙහි සිහිය නමැති යොතින් බැඳිය යුතුය. මෙසේ ඔහුගේ එම සිත ඔබිනොබ දඟලාද, පෙර පුරුදු අරමුණු නොලබනුයේ, සිහිය නමැති යොත සිඳ, පැනයන්ට නොහැකි වනුයේ, එයම අරමුණුකොට උපචාර, අර්පණා වශයෙන් ළංව හිඳින්නේද, ළංව වැදහෝන්නේද වේ. එහෙයින් පෞරාණිකයෝ කීහු,

යථා ථමෙභ නිබනෙධය්‍ය - වචඡං දමමං නරො ඉධ
බනෙධයේ‍යවං සකං චිතතං - සතියාරමමණෙ දළහං

මෙලොව, කුළු වසු දමනය කරන මිනිසා, යම්සේ ස්තම්භයෙහි

(කුළු වස්සා) බඳින්නේද, එසේම යෝගාවචරයා සිය සිත සිහියෙන් අරමුණෙහි දැඩිව බඳින්නේය.

මෙසේ ඔහුට එම සෙනස්න භාවනාවට යෝග්‍ය වේ. නොහොත් කර්මස්ථාන ප්‍රභේදයන්හි මුදුන වූ (ප්‍රමුඛ වූ) සියලු බුදු, පසේබුදු, බුද්ධ ශ්‍රාවකයින්ගේ ධ්‍යාන මාර්ගඵලාදී, විශේෂයන්ගේ අධිගමයටද, ඉහාත්ම සුව විහරණයටද, ආසන්න කාරණය වූ, ආනාපාන සති කර්මස්ථානය ස්ත්‍රී, පුරුෂ, ඇත්, අස් ආදී ශබ්දයන් ගැවසීගත් ග්‍රාමාන්තය අත්නොහැර වඩන්ට පහසු නොවේ. ශබ්දය ධ්‍යානයට කටුවක් හෙයිනි. ග්‍රාමය නොවන, ආරණ්‍යයක වෙසෙන යෝගාවචරයා විසින් මෙම කර්මස්ථානය පරිග්‍රහණය කොට, ආනාපාන චතුර්ථ ධ්‍යානය, නිපදවා එයම පාදකකොට, සංස්කාරයන් සම්මර්ශනය කොට අග්‍රඵලය වූ අර්හත්වයට පැමිණෙන්ට පහසුය. එහෙයින් එයට අනුරූප සෙනසුනක් පෙන්වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ අරඤ්ඤගතොවා යන ආදිය වදාළහ. තෙරහු එසේම වදාළහ. භාග්‍යවතුන් වහන්සේ වාස්තු විද්‍යාචාර්යයෙක් බඳුය. යම්සේ වාස්තු විද්‍යාචාර්ය තෙමේ, නගරබිම බලා, මනාව පරීක්ෂාකොට, මෙහි නුවර නිර්මාණය කරවු යයි හෙතෙම උපදෙස් දෙයි. ඉතා යහපත් අයුරින් නුවර නිමිකල්හි රජ කුලයෙන් මහා සත්කාර ලබයි. එපරිද්දෙන්ම යෝගාවචරයාට සුදුසු සෙනසුනක් මනාව පරීක්ෂාකොට, මෙහි කර්මස්ථානයෙහි යෙදිය යුතුයයි පෙන්වයි. ඉක්බිති එහි කමටහනෙහි යෙදෙන්නා වූ යෝගියා විසින්, ක්‍රමයෙන් අර්හත්වයට පත්කල්හි, ඒකාන්තයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයැයි, මහත් සත්කාර ලබති.

මේ භික්ෂුව දිවියෙකු හා සමානයැයිද කියයි. යම්සේ වනාහි මහා දිවිරජෙකු, අරණ්‍යයෙහි, තෘණ, වන, පර්වත බහුලව පවත්නා ස්ථාන ඇසුරුකොට සැඟවී, කුළුගොණුන්, ගෝනුන්, ඌරු ආදී මෘගයින් ගනීද? එපරිද්දෙන්ම අරණ්‍යාදීන්හි කර්මස්ථානයෙහි යෙදෙන්නා වූ මෙම භික්ෂුව, පිළිවෙළින්, සෝවාන්, සකෘදාගාමි අනාගාමි, අර්හත් මාර්ගයන් හා ඵලයන්ද ගනීනුයි දතයුතුය. එහෙයින් පෞරාණිකයෝ කීහු.

**යථාපි දීපිකො නාම - නිලීයිත්වා ගණ්හතී මිගෙ**
**තථෙවායං බුද්ධපුත්තො - යුත්තයොගො විපස්සකො**
**අරඤ්ඤං පවිසිත්වාන - ගණ්හාති ඵල මුත්තමං**

යම්සේ නම් දිවියා සැඟැවී මෘගයින් අල්ලා ගනීද? එසේම මේ භාවනා යෝගයන්හි යෙදුනා වූ, විදර්ශක බුද්ධ පුත්‍රයා අරණ්‍යයට පිවිස උතුම් ඵලය (ආර්යමාර්ග ඵල) ගනී. එහෙයින් මොහුගේ, පරාක්‍රම ජවයට යෝග්‍ය භූමිය වූ, අරණ්‍ය සේනාසනය දක්වන සේක්, අරඤ්ඤගතොවා යන ආදිය වදාළහ. **එහි අරඤ්ඤගතො** යනු මත්තෙහි කියන ලක්‍ෂණ ඇති යම්කිසි විවේක සුව ඇති අරණ්‍යයට ගියේ, **රුක්ඛමූලගතො** යනු වෘක්‍ෂයක් සමීපයට ගියේ, **සුඤ්ඤාගාර ගතො** යනු ජනශූන්‍ය විවේකී අවකාශයට ගියේ, මෙහිද, අරණ්‍යයද, රුක්මුලද හැර, සෙසු සත්වැදෑරුම් සෙනසුනට ගියේද, ශූන්‍යාගාරගත යැයි කියන්ට සුදුසුයි. සෙනසුන් නව වැදෑරුම්ය. දෙසූ පරිදි, හෙතෙම අරණ්‍යය. රුක්මුල පර්වතය කඳුර, ගල්ලෙන, සොහොන, වනාශ්‍රමය, (අභ්‍යවකාශය) එළිමහන, පිදුරු බිස්ස යන විවේකී සෙනසුන ඇසුරු කරයි. මෙසේ මොහුට ඍතු ත්‍රයයට අනුකූල වූද ධාතු චර්යාවන්ට අනුකූල වූද, ආනාපාන සති භාවනාවට යෝග්‍ය සෙනසුන පෙන්වා, නොහැකිළුණු, නොසන්සුන් නුවූ, ශාන්ත ඉරියව්ව පෙන්වනුයේ **නිසීදති** හිඳීයයි වදාළහ. ඉක්බිති මොහුට හිඳීමෙහි දැඩිබව, ආශ්වාස, ප්‍රශ්වාසයන්ගේ පැවැත්මෙහි හැකියාව අරමුණු පරිග්‍රහණ උපායද දක්වනුයේ 'පලලංකං ආභුජිත්වා' යනාදිය වදාළහ.

එහි **පලලංකං** යනු හාත්පසින් කලවා බද්ධ ආසනයයි. **ආභුජිත්වා** යනු බැඳ, **උජුං කායං පණිධාය** යනු මතු සිරුර ඍජුව තබා, අටළොස් පිටකටු අගින් අග එකට සිටින සේ පිළියෙල කොට, මෙසේ හුන්නහුට සම්මස් නහර නොනැමේ. ඉක්බිති ඔහුට යම් ඒවාහි නැමීම් හේතුයෙන් ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා වේදනා උපදින්නේද, ඒවා නූපදී. ඒවා නොඉපදෙන කල්හි සිත එකඟ වේ. කමටහන නොවැටෙයි. අභිවෘද්ධියට, වැඩිදියුණුවට එළැඹේ. **පරිමුඛං සතිං උපට්ඨපෙත්වා** යනු කර්මස්ථානාභිමුඛව සිහිය තබා, **සො සතොව අස්සසති සතො පස්සසති** යනු එම භික්‍ෂුව මෙසේ හිඳ, මෙසේ සිහිය මනාව පිහිටුවා, එම සිහිය අත්නොහරින්නේ, සිහියෙන්ම ආශ්වාස කරයි. සිහියෙන්ම ප්‍රශ්වාස කරයි. සිහියෙන් ක්‍රියාකාරී වේයයි යු.සේයි.

දැන් යම් ආකාරයන්ගෙන් සිහියෙන් ක්‍රියාකාරී වේද, ඒ ආකාරයෙන් දක්වන්ට, **දීඝංවා අස්සසන්තො** ආදිය වදාළහ. එහි **දීඝං අස්සසන්තො** යනු දීර්ඝව ආශ්වාස පවත්වනුයේ, **රස්සං** හ්‍රස්වද එසේය. ඒවා යම් දීර්ඝ හ්‍රස්වතා වේද? එය කාල වශයෙන් දතයුත්තාහ. කිසිකලෙක මනුෂ්‍යයෝ

හස්ති, සර්ප ආදීන් මෙන් කාල වශයෙන් දීර්ඝව ආශ්වාස කරන්නාහුද, ප්‍රශ්වාස කරන්නාහුද වෙති. කිසිකලෙකැ සුනඛ, සාවුන් මෙන් හ්‍රස්වව ආශ්වාස ප්‍රශ්වාස කරති. අනෙක් ආකාරයෙන් කැඩී පොඩිවී ගිය ආශ්වාස, ප්‍රශ්වාස දීර්ඝ හ්‍රස්ව නම් නොවේ. එහෙයින් ඒවා දීර්ඝ කාලයක් පිවිසෙන්නාහුද, නික්මෙන්නාහුද, දීර්ඝය. කෙටි කාලයක් පිවිසෙන්නාහුද, නික්මෙන්නාහුද හ්‍රස්වයයි දතයුත්තාහ. එහි මේ භික්ෂුව මතු කියනු ලබන නවාකාරයන්ගෙන් දීර්ඝව ආශ්වාස කරනුයේද, ප්‍රශ්වාස කරනුයේද, **දීඝං අස්සසාමි පස්සසාමීති** පජානාති. එසේම **රස්සං** යන්නද යෙදිය යුතුය. මෙසේ දැනගනුයේද,

දීර්ඝ, හ්‍රස්ව, ආශ්වාස, ප්‍රශ්වාස දැයි යන සතර ආකාරයක් එබඳු වූ භික්ෂුවගේ නාසිකාග්‍රයෙහිම පවතී.

ඔහුට නව ආකාරයන් අතර, එක් ආකාරයකින් කායානුපස්සනා සතිපට්ඨාන භාවනාව සම්පූර්ණ වේයයි දතයුත්තාහ. **සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති** යන සියලු ආශ්වාස, කායයාගේ මුල, මැද, කෙළවර දැනුවත් කරනුයේ, ප්‍රකට කරනුයේ ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සියලු ප්‍රශ්වාස කායයාගේ මුල, මැද, කෙළවර දැනුවත් කරනුයේ, ප්‍රකට කරනුයේ, ඥාණ සම්ප්‍රයුක්ත සිතින් ආශ්වාසද, ප්‍රශ්වාසද කරයි. එහෙයින් ආශ්වාස කරන්නෙමි. ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි යයි යූ.සේයි. ඇතැම් භික්ෂුවකට වනාහි, සුණු විසුණු වී, පැතිරී ගිය ආශ්වාස කායයෙහිද ප්‍රශ්වාස කායයෙහි හෝ මුල ප්‍රකට වේ. මධ්‍යය හා කෙළවර ප්‍රකට නොවේ. ඔහුට මුල් අවස්ථාවම පරිග්‍රහණය කරන්ට හැකිවෙයි. මධ්‍ය හා අවසානයෙහි ක්ලාන්ත වේ. ඇතමෙකුට මධ්‍යය ප්‍රකට වේ. මුල හා අග ප්‍රකට නොවේ. ඔහුට මධ්‍යයම පරිග්‍රහණය කරන්ට හැකිවේ. මුල හා කෙළවරෙහි ක්ලාන්ත වේ. ඇතැමෙකුට කෙළවර ප්‍රකට වේ. මුල හා මැද ප්‍රකට නොවේ. ඔහුට අවසානයම පරිග්‍රහණය කරන්ට හැකිවේ. මුල හා මැද ක්ලාන්ත වේ. ඇතැමෙකුට සියල්ලම ප්‍රකට වේ. ඔහුට සියල්ලම පරිග්‍රහණය කරන්ට හැකිවේ. කිසිතැනෙක ක්ලාන්ත නොවේ. එබඳු අයෙකු මෙන් විය යුතුයයි දක්වනුයේ, සබ්බකාය පටිසංවෙදී යනාදිය වදාළහ.

එහි **සික්ඛති** යනු උත්සාහ කෙරේ. ව්‍යායාම කෙරේ. යම් ආකාර එබඳු සංවරයක් වේද, මෙහි මේ අධිශීල ශික්ෂාවයි. යම් ආකාර එබඳු සමාධියක් වේද, මේ අධිචිත්ත ශික්ෂාවයි. යම් ආකාර එබඳු ප්‍රඥාවක්

වන්නීද? මේ අධිප්‍රඥා ශික්‍ෂාව වන්නීය. මේ ත්‍රිවිධ ශික්‍ෂාවෝ, එම අරමුණෙහි, ඒ සිහියෙන්, ඒ මනසිකාරයෙන් හික්මෙයි. සේවනය කරයි. වඩයි. බහුල කෙරේනුයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. එහි පළමු ක්‍රමයෙන් හුදෙක් ආශ්වාස කළයුතුය. ප්‍රශ්වාස කළයුතුමය අන් කිසිවක් නොකටයුතුය. මෙතැන් පටන් ඤාණෝත්පාදනාදීන්හි යෙදීම් කළයුතුය. එහෙයින් එහි ආශ්වාස කෙරෙමියි දනියි. ප්‍රශ්වාස කෙරෙමියි දනියි යයි වර්තමාන කාල වශයෙන් පෙළෙහි කියා මෙතැන් පටන් කළයුතු ඤාණොත්පාදනාදී ආකාරයාගේ දැක්වීම සඳහා, 'සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමී' යන ආදී ක්‍රමයෙන් අනාගත කාල වශයෙන් පෙළෙහි නංවන ලදැයි දතයුත්තාහ.

**පස්සම්භයං කාය සංඛාරං -පෙ- සික්ඛති** යනු දළ ආශ්වාස, ප්‍රශ්වාස සංඛ්‍යාත කාය සංස්කාර සංසිඳවනුයේ, යටපත් කරනුයේ, නිරුද්ධ කරනුයේ, ව්‍යපශමනය කරනුයේ ආශ්වාස කරන්නෙමි. ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. මෙසේ එහි දළ, සියුම් බවද සංසිඳීමද දතයුත්තාහ. මේ භික්‍ෂුවගේ පෙර පරිග්‍රහණය නොකළ කල්හි, කය ද සිත ද දාහ සහිත දළ වෙති. කාය චිත්තයන්ගේ දළ බව නොසන්සුන් කල්හි ආශ්වාස, ප්‍රශ්වාසද දළ වේ. බලවත්ව පවතී. නැහැය ප්‍රමාණවත් නොවේ. මුඛයෙන් ආශ්වාස කරනුයේද ප්‍රශ්වාස කරනුයේද (කරමින්ද) සිටියි. යම්කලෙක වනාහි ඔහුගේ කයද, සිතද පරිගෘහිත වේද එකල්හි ඒවා ශාන්ත වූවාහු සන්සිඳුනාහු වෙති. ඒවා සන්සුන් කල්හි ආශ්වාස ප්‍රශ්වාස සියුම්ව පවතී. ඇත්ද නැත්දැයි සෙවිය යුතු ආකාරයට පැමිණියාහු වෙති. යම්සේ වනාහි, ධාවනයකොට, කන්දකින් බැස, මහ බරක් හිසින් බිම තබා සිටි පුරුෂයාට දළ ආශ්වාස ප්‍රශ්වාස වේද, නැහැය නොපොහොනේ වේද, මුඛයෙන් ආශ්වාස ප්‍රශ්වාස කරනුයේ සිටියි. යම්කලෙකැ මෙතෙමේ ඒ පරිශ්‍රමය දුරුකොට, ස්නානය කොට, දිය බී, තෙත් වස්ත්‍රයක් පපුව මත තබා සිසිල් සෙවනක වැදහොත්තේ වේද, එකල්හි ඔහුගේ ඒ ආශ්වාස-ප්‍රශ්වාස සියුම් වේ, ඇත්ද, නැත්දැයි සෙවිය යුතු ආකාරයට පැමිණියාහු වෙති. එපරිද්දෙන්ම මෙම භික්‍ෂුවගේ අපරිගෘහිත කාලයෙහි යැයි විස්තර කළයුතුය. එසේම ඔහුට පෙර පරිග්‍රහණය නොකළ කාලයෙහි දළ දළ කාය, සංස්කාර සංසිඳවමියි, සිතාබැලීම්, එක්තැන් කිරීම් පිළිබඳ මෙනෙහි කිරීමක් නැත. පරිග්‍රහණය කළ කල්හි (අල්ලාගත්) ඇත. එහෙයින් ඔහු පරිග්‍රහණය නොකළ කාලයට වඩා පරිග්‍රහණය කළ කල්හි කාය සංස්කාර සියුම් වේ. එහෙයින් පෞරාණිකයෝ කීහුඃ-

සාරදෙධ කායෙ චිතෙතච - අධිමතතං පවතතති
අසාරදධමහි කායමහි - සුඛුමං සමපවතතති

දාහ සහිත කයෙහිද සිතෙහිද අධිමාත්‍රව පවතී. දාහ රහිත කයෙහි සියුම්ව පවතී.

පරිග්‍රහණයෙහිද දළය. ප්‍රථම ධ්‍යානොපචාරයෙහි සියුම්ය. එහිද දළය. ප්‍රථමධ්‍යානයෙහි සියුම්ය. ප්‍රථමධ්‍යානයෙහිද ද්විතිය ධ්‍යාන උපචාරයෙහි දළය. ද්විතිය ධ්‍යානයෙහි සියුම්ය. ද්විතියධ්‍යානයෙහිද, තෘතීය ධ්‍යාන උපචාරයෙහිද දළය. තෘතීය ධ්‍යානයෙහි සියුම්ය. තෘතිය ධ්‍යානයෙහිද චතුර්ථ ධ්‍යාන උපචාරයෙහිද දළය. චතුර්ථ ධ්‍යානයෙහි අති සියුම්ය. නො පැවැත්මටම පැමිණේ. මෙය දීඝභාණක, සංයුක්ත භාණකයින්ගේ මතයයි. මජ්ඣිම භාණකයෝ වනාහි, ප්‍රථමධ්‍යානයෙහි දළය. ද්වියධ්‍යාන උපචාරයෙහි සියුම්යයි. මෙසේ යට යට ධ්‍යානයෙන් මතු මතු ධ්‍යාන උපචාරයන්හි අති සියුම් බව කැමැති වෙති. සියල්ලන්ගේම මතයෙන් වනාහි පරිග්‍රහණය නොකළ කල්හි පැවැති කාය සංස්කාර පරිග්‍රහණය කළ කල්හි යටපත් වෙයි. පරිග්‍රහණය කළ කල්හි පැවැති කාය සංස්කාර ප්‍රථම ධ්‍යානොපචාරයෙහි -පෙ- චතුර්ථ ධ්‍යානොපචාරයෙහි පැවැති කාය සංස්කාර චතුර්ථ ධ්‍යානයෙහි දී යටපත් වෙයි. මෙය සමථ ක්‍රමයයි.

විදර්ශනාව පරිග්‍රහණය නොකළ කල්හි, පැවැති කාය සංස්කාර දළය. මහාභූත පරිග්‍රහණයෙහි සියුම්ය. එයද දළ උපාදාරූප පරිග්‍රහණයෙහි සියුම්ය. එයද දළය. සියලු රූප පරිග්‍රහණයෙහි සියුම්ය. එයද දළය. අරූප පරිග්‍රහණයෙහි සියුම්ය. එයද දළය. රූප අරූප පරිග්‍රහණයෙහි සියුම්ය. එයද දළය. ප්‍රත්‍යය පරිග්‍රහණයෙහි සියුම්ය. එයද දළය. ප්‍රත්‍යය සහිත නාමරූප දර්ශනයෙහි සියුම්ය. එයද දළය. ලක්ෂණාරම්මණික විදර්ශනාවෙහි සියුම්ය. එයද දුර්වල විදර්ශනාවෙහි දළය. බලවත් විදර්ශනාවෙහි සියුම්ය. එහි පෙර කියන ලද ක්‍රමයෙන්ම පළමු පළමු අංගයන්ට පසු පසු අංගයන්ගෙන් සංසිඳීම දතයුත්තාහ. මෙසේ මෙහි දළ සියුම් බවද, සංසිඳීමද දතයුත්තාහ. මේ මෙහි කායානුපස්සනා වශයෙන් කියන ලද ප්‍රථම චතුෂ්කයෙහි අනුපිළිවෙළ පද වර්ණනාවයි.

මෙහි මෙම චතුෂ්කය ආදි කර්මිකයාගේ කර්මස්ථාන වශයෙන්

යූ.සේයි. අනෙක් ත්‍රිවිධ චතුෂ්කයන් ධ්‍යානප්‍රාප්තයාගේ, වේදනා, චිත්ත ධර්මානුපස්සනා වශයෙනි. එහෙයින් මෙම කර්මස්ථානය වඩා ආනාපාන චතුර්ථ ධ්‍යානය ආසන්න කාරණයකොට විදර්ශනාවෙන් සිව්පිළිසිඹියා සමග අර්හත්වයට පැමිණෙනු කැමති ආදිකර්මික කුලපුත්‍රයා විසින් විශුද්ධි මාර්ගයෙහි කියන ලද ක්‍රමයෙන් සිල් පිරිසිදු කිරීම් ආදී සියලු කෘත්‍යයන් කොට සප්තාංග සමන්විත ගුරුවරයාගේ සමීපයෙහි පංචසන්ධික කර්මස්ථානය උගත යුතුය. එහි මෙම පඤ්ච සන්ධීහුය. උග්ගහ, පරිපුච්ඡා, උපට්ඨාන, අප්පණා, ලක්ඛණං යනුයි.

එහි 'උග්ගහ' නම් කර්මස්ථානයෙහි ඉගෙනීමයි. 'පරිපුච්ඡා' නම් කර්මස්ථානය පිළිබඳව විමැසීමයි. 'උපට්ඨාන' නම්, කර්මස්ථානය පිළිබඳ වැටහීමයි. 'අර්පණා' නම් කර්මස්ථානයට පැමිණීම, 'ලක්ඛණ' නම් කර්මස්ථානයෙහි ලක්ෂණයි. මෙම කර්මස්ථානය මෙවන් ලක්ෂණයැයි කර්මස්ථාන ස්වභාවය සලකා බැලීම යැයි යූ.සේයි.

මෙසේ පංචසන්ධික කර්මස්ථානය ඉගෙන ගනුයේ තමාද වෙහෙස නොවෙයි. ගුරුවරයාද වෙහෙස නොවේ. මෙසේ මඳක් කියවා, බොහෝ කලක් සජ්ඣායනා කොට, මෙසේ පඤ්චසන්ධික කර්මස්ථානය ගුරුවරයාගේ සමීපයෙහි හෝ අන් තැනක හෝ උගෙන, අටළොස් දෝෂ යුක්ත විහාරයන් දුරුකොට කරුණු පසෙකින් යුත්, සෙනසුනෙහි වසමින් විනාශ කරන ලද කුඩා පළිබෝධ ඇත්තේ, කරන ලද බත්කිස ඇත්තේ බත් මත දුරුකොට සුවසේ හිඳ, රත්නත්‍රය ගුණ සිහි කිරීමෙන් සිත මනාව සතුටුකොට, ගුරුවරයාගෙන් උගත්, එක් පදයක් හෝ නොපිරිහෙළනුයේ මෙම ආනාපාන සති කර්මස්ථානය මෙනෙහි කළයුතුය. එහි මේ මෙනෙහි කිරීම් ක්‍රමයයි.

**ගණනා අනුබන්ධනා - ඵුසනා ඨපනා සලක්ඛණා**
**විවට්ටනා පාරිසුද්ධි - තෙසඤ්ච පටිපස්සනාති**

එහි ගණන යනු, ගණන් කිරීමය. අනුබන්ධනා යනු අනුගමනයයි. ඵුසනා යනු ස්පර්ශ කළ ස්ථානයයි. ඨපනා යනු අර්පණාවයි. සලක්ඛණා යනු විදර්ශනාවයි. විවට්ටනා යනු මාර්ගයයි. පාරිසුද්ධි යනු ඵලයයි. තෙසඤ්ච පටිපස්සනා යනු ප්‍රත්‍යවේක්ෂණයයි.

එහි මේ ආදිකර්මික කුලපුත්‍රයා විසින් ප්‍රථමයෙන් ගණන් කිරීමෙන් මෙම කර්මස්ථානය මෙනෙහි කළයුතුය. ගණන් කරන්නහු විසින් පහකින් යට නොතැබිය යුතුය. දසයකින් මත්තෙහි ගෙන නොයා යුතුය. අතරතුර කැඩීමක් නොදැක්විය යුතුය. පහකින් යට තබන කල්හි බාධක සහිත අවකාශයෙහි චිත්තෝත්පාද දඟලයි. බාධා සහිත ගාලෙහි අවහිර වූ ගව සමූහයා මෙන්, දසයකින් මත්තෙහි ගෙනයන්නහුට ගණන් නිශ්‍රිත චිත්තෝත්පාද වෙයි. අතර කැඩීගිය බැව් දකින්නුට මාගේ කර්මස්ථානය මස්තකප්‍රාප්ත වූයේද, නොවූයේදැයි සිත කම්පනයට පත්වේ. එහෙයින් එම දෝෂයන් දුරුකොට ගණන් කළයුතුය. ගණන් කරන්නහු විසින්ද පළමුව මන්‍දගාමි ගණන් කිරීමෙන් ධාන්‍ය මණින ගණන් කිරීමෙන් ගණන් කළයුතුය. ධාන්‍ය මනින්නා නැළිය පුරවා එකයයි කියා භාජනයකට දමයි. නැවත පුරවනුයේ කිසි කසල ද්‍රව්‍යයක් දැක ඉවත දමන්නේ, එකයි, එකයි යනුවෙන් කියයි. දෙක, දෙක ආදීන්හිද එම ක්‍රමයමැයි. එපරිද්දෙන් මොහු විසින්ද ආශ්වාස ප්‍රශ්වාසයන්හි යමක් වැටහේද, එය ගෙන එකයි, එකයි ආදීකොට, දහය දහය දක්වා පවත්නා වූ පවත්නා වූම ආශ්වාස ප්‍රශ්වාසයන් සලකා ගණන් කළ යුතුය. ඔහුට මෙසේ ගණන් කරන කල්හි නික්මෙන්නා වූද, පිවිසෙන්නා වූද ආශ්වාස ප්‍රශ්වාස ප්‍රකට වෙයි. ඉක්බිති මොහු විසින් එම මන්දගාමි ගණන් කිරීමද, ධාන්‍ය මනින ගණන් කිරීමද අත්හැර සීඝ්‍ර ගණන් කිරීමෙන්, ගොපල්ලාගේ ගණන් කිරීමෙන් ගණන් කළ යුතුය. දක්ෂ ගොපල්ලා කැටගල් උකුලෙන් ගෙන රැන හා කෝටුව අතැතිව උදෑසන ගාලට ගොස්, ගවයින්ගේ පිටට පහරදී, බාධක ස්තම්භය, මත හිඳගත්තේ, දොරකඩට පැමිණි ගවයා, එක, දෙකයයි කැටගල් දමමින් ගණන් කරයි. තුන්යම් රාත්‍රියක් පීඩා සහිත අවකාශයෙහි, දුකින් විසූ ගවසමූහයා නික්මෙනුයේ, ඔවුනොවුන් ගැටෙමින් වේගයෙන්, වේගයෙන්, රාශි රාශීව නික්මෙයි. ඔහු වේගයෙන් තුන, හතර, පහ, දහය යයි ගණන් කෙරේමය. මෙසේ එම යෝගියාටද පළමු ක්‍රමයෙන් ගණන් කරන කල්හි ආශ්වාස, ප්‍රශ්වාස ප්‍රකටව සීඝ්‍ර සීඝ්‍රව නැවත නැවත එහා මෙහා යෙයි. ඉක්බිති ඔහු විසින් නැවත නැවත එහාමෙහා යෙත්යැයි දැන, ඇතුළතද, පිටතද ගණන් නොගෙන, දොරකඩට පැමිණි පැමිණි ආශ්වාස, ප්‍රශ්වාසයෙන්ම ගෙන, එක, දෙක-තුනහතර-පහ-එක-දෙක-තුන-හතර-පහ-සය -පෙ- සත, අට, නවය, දහය යැයි සීඝ්‍ර සීඝ්‍රව ගණන් කළයුතුමය. ගණන් කිරීම පිළිබඳව වූ කමටහනෙහි ගණන් කිරීමේ බලයෙන්ම සිත එකඟ වේ. හබල ආධාරයෙන් සැඩ දියපහරෙහි නැව නතරකර තැබීම මෙනි. මෙසේ ඔහුට සීඝ්‍ර සීඝ්‍රව ගණන් කරන කල්හි

කමටහන නිරතුරු පවත්නාක් මෙන්ව වැටහේ. ඉක්බිති නිරතුරු පවතීයැයි දැන ඇතුළතද පිටතද වාතය, පරිග්‍රහණය නොකොට, පළමු ක්‍රමයෙන්ම වේගයෙන් ගණන් කළයුතුය. ඇතුළත පිවිසෙන වාතය සමග, සිත ප්‍රවේශ කරන කල්හි, අභ්‍යන්තරය වාතයෙන් මඩනා ලද කල්හි, මේදය පිරුණාක් මෙන් වේ. පිටත නික්මෙන වාතය සමග සිත බැහැරවන හෙයින්, පිටත බොහෝ අරමුණුවල සිත වික්ෂේප වේ. ස්පර්ශිත අවකාශයෙහි සිත පිහිටුවා වඩන්නහුටම භාවනාව සම්පූර්ණ වේ. එහෙයින් කියන ලදී. 'ඇතුළතද, පිටතද වාතය පරිග්‍රහණය නොකොට පළමු ක්‍රමයෙන්ම වේගයෙන් ගණන් කළයුතුය. කොපමණ කාලයක් එය ගණන් කළයුතුද? ගණන් කිරීමකින් තොරව ආශ්වාස ප්‍රශ්වාස ආරම්මණයන්හි සිත පිහිටාද එතෙක් කල් කළයුතුය. පිටත පැතිරීගිය විතර්ක සිඳ ආශ්වාස ප්‍රශ්වාස ආරම්මණයන්හි සිහිය පිහිටුවීම සඳහාම ගණන් කිරීම කළයුතුය.

මෙසේ ගණන් කිරීමෙන් මෙනෙහිකොට, අනුබන්ධන (පසුපස යෑම්) වශයෙන් මෙනෙහි කළයුතුය. අනුබන්ධන නම් ගණන හකුළුවා සිහියෙන් නිරතුරු ආශ්වාස ප්‍රශ්වාස අනුගමනයයි. එය මුල, මැද, අග අනුගමනය වශයෙන් නොවේ. එහි මුල, මැද, අග අනුගමනයෙහි ආදීනව යට කියන ලදී. එහෙයින් අනුබන්ධන වශයෙන් මෙනෙහි කරන්නහු විසින්, එක්වරම මුල, මැද, අග වශයෙන් මෙනෙහි කළයුතුය. තව, ස්පර්ශ කිරීම් වශයෙන්ද පිහිටුවීම් වශයෙන්ද මෙනෙහි කළ යුතුය. ගණන් අනුගමන වශයෙන් මෙන්ම, ස්පර්ශ කිරීම්, පිහිටුවීම් වශයෙන් වෙන්ව මෙනෙහි කිරීමක් නැත. ස්පර්ශ කළ කළ තන්හිම ගණන් කරනුයේ, ස්පර්ශ කිරීමෙන් මෙනෙහි කරයි. එහිම ගණන හකුළුවා ඒවා සිහියෙන් අනුගමනය කරනුයේ, අර්පණා වශයෙන්ද, සිත පිහිටුවනුයේ අනුගමනයෙන්ද, ස්පර්ශයෙන්ද, පිහිටුවීමෙන්ද මෙනෙහි කෙරේ යයි යූ.සේයි. ඒ මෙම අර්ථය අර්ථකථාවන්හි කියන ලද කොරාගේද, දොරටුපාලයාගේද උපමාවෙන් මෙහිම පෙළෙහි කියන ලද කියත් උපමාවෙන්ද දතයුතුය.

ඒ මෙහි කොරාගේ උපමාවයි. යම්සේ නම් දෝලාවෙහි ක්‍රීඩා කරන්නා වූ, මව හා පුතු දෝලාවෙහි බහා, එහිම දෝලාස්තම්භ මුල සිටියේ, ක්‍රමයෙන් එන්නා වූද, යන්නා වූද, දෝලා පුවරුවෙහි දෙකෙළවරද, මධ්‍යයද දකීද? දෙකෙළවරද මධ්‍යයද දර්ශනය සඳහා ව්‍යාවෘත නොවේද? එපරිද්දෙන්ම භික්ෂුවද සිහිය ලෙසින් මනාව බඳනා ලද ටැඹ මුල සිට ආශ්වාස ප්‍රශ්වාස දෝලාවට දමා එහිම නිමිත්තෙහි සිහියෙන් හිඳිනුයේ,

ක්‍රමයෙන් එන්නා වූද, යන්නා වූද, ස්පර්ශ ස්ථානයන්හි ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ මුල, මැද, අග සිහියෙන් අනුව යන්නේ එහිම සිත තබා බලයි. ඒවා දැකීම සඳහා ව්‍යාවෘත නොවේ. මේ කොරාගේ උපමාවයි.

මෙය වනාහි දොරටුපාලයාගේ උපමාවයි. යම්සේ වනාහි දොරටුපාලයා, නගරයෙහි ඇතුළෙහි හා පිටත මිනිසුන් දැක නුඹ කවරෙක්ද? කොහි සිට පැමිණියෙහිද? කවර තැනකට හෝ යන්නෙහිද? නුඹගේ හස්තයෙහි කිමෙක්දැයි නොවිමසයි. ඔහුට ඒවා පවරා නැත. දොරකඩට පැමිණි පැමිණියහුම පිළිබඳ විමසයි. එපරිද්දෙන්ම මෙම භික්ෂුවට ඇතුළට පිවිසි වාතයන්ද, පිටත නික්මෙන වාතයන්ද පිළිබඳ අවශ්‍යතා නොවේ. දොරකඩට පැමිණි පැමිණි වාතයන් පිළිබඳ සෙවීම පමණක් ඔහුට අයත්ය. මේ දොරටුපාල උපමාවයි.

කියතෙහි උපමාව වනාහි, 'නිමිත්තං අස්සාය පස්සාති' ආදි ක්‍රමයෙන් යූ.සේයි. මෙහි වනාහි එහි පැමිණි නොපැමිණි වශයෙන් මෙනෙහි නොකිරීම් මාත්‍රයම ප්‍රයෝජනයැයි දතයුතුය. මෙම මෙනෙහි කරන කල්හි සමහරෙකුට නිමිත්තද උපදී. සෙසු ධ්‍යානාංගයන්ගෙන් යුක්ත වූ, අර්පණා සංඛ්‍යාත සිත පිහිටුවීම සම්පූර්ණ වේ. සමහරෙකුට ගණන් වශයෙන්ම, මෙනෙහි කරනකාලයෙහි පටන් යම්සේ දාහ සහිත දැඩි ස්වභාව ශරීර ඇතියහුගේ ඇඳෙහි හෝ පුටුවෙහි හෝ හිඳගන්නා කල්හි, ඇඳ පුටු පහත් වේ. (ගිලාබසී) නාද කරයි. ඇතිරිල්ල රැලි ගන්වයි. දාහ රහිත ලිහිල් ස්වභාවයෙන් යුත් ශරීර ඇතියහුගේ හිඳගන්නා කල්හි ඇඳ පුටු පහත් නොවේ. නාද නොකරයි. ඇතිරිල්ල රැලි නොගන්වයි. ඇඳ පුටු කපුපුළුන් පිරවූවාක් මෙන් වෙයි. කුමක් හෙයින්ද යත්, දාහ රහිත ලිහිල් ස්වභාව සහිත ශරීරය සැහැල්ලු වෙයි. එපරිද්දෙන්ම ගණන් කිරීම් වශයෙන් මෙනෙහි කිරීමට ආරම්භ කළ කාලයෙහි පටන් අනුක්‍රමයෙන් දළ ආශ්වාස ප්‍රශ්වාස නිරුද්ධ කිරීම් වහයෙන් ශරීරයෙහි විඩාව (තද ස්වභාවය) සන්සුන් කල්හි ශරීරයද, සිතද සැහැල්ලු වේ. ශරීරය අහසට පනින්නාක් වැනි ස්වභාවයකට පැමිණියාක් මෙන් වෙයි. ඔහුගේ දළ ආශ්වාස-ප්‍රශ්වාසයන් නිරුද්ධ කල්හි, සියුම් ආශ්වාස ප්‍රශ්වාස නිමිති අරමුණුකොට සිත පවතියි. එයද නිරුද්ධ කල්හි එකින් එක අතිශය සියුම් ආශ්වාස-ප්‍රශ්වාස නිමිති අරමුණුකොට පවතීමය. ඒ මෙම අර්ථය මතු කියනු ලබන ලෝහ තලියෙහි උපමාවෙන් දත යුතුය. අනෙක් කර්මස්ථාන මතු මත්තෙහි ප්‍රකට වෙයි. මෙය එසේ නොවේ. මෙය වනාහි මතු

මත්තෙහි වඩන වඩනා කල්හි සියුම් භාවයට යයි. වැටහීමද නොඑළඹේ. එය මෙසේ නොවැටහෙන කල්හි, ඒ භික්ෂුව විසින් දැන් මාගේ කර්මස්ථානය නැසුණිදැයි, ගුරුවරයාගෙන් විමසන්නෙමියි ඒ භික්ෂුව විසින් හුනස්නෙන් නැගිට නොයා යුතුය. ඉරියව් කඩකොට යන කල්හි කර්මස්ථානය අලුත් අලුත්ම වේ. හුන් අයුරින්ම කොටස් වශයෙන් ගෙනහැර බැලිය යුතුය.

ඒ මෙහි ගෙන එන ක්‍රමයයි. ඒ භික්ෂුව විසින් කර්මස්ථානයෙහි නොවැටහෙන බව දැන මෙසේ සිතා බැලිය යුතුය. මෙම ආශ්වාස-ප්‍රශ්වාස කොතැන්හි ඇත්ද? කොතැන්හි නැත්ද, කවරෙකුට හෝ ඇත්ද? කවරෙකුට හෝ නැත්ද යනුවෙන් ඉක්බිති මෙසේ සිතා බලන කල්හි මෙම ආශ්වාස-ප්‍රශ්වාස මව්කුස තුල නැත. දියෙහි කිමිදුණවුන්ට නැත. හදිසි කම්පනාදියෙන් විසංඥී වූවන්ට, මළවුන්ට, චතුර්ථ ධ්‍යානයට සමවන්නවුන්ට, රූපාරූප භවයන්ගෙන් යුක්ත වූවන්ට, නිරෝධ සමවතට සමවන්නවුන්ට යයි දැන මෙසේ තමාම තමාට නුවණැතිය. නුඹ මව්කුස ගත නොවූයේ නොවේද? දියෙහි කිමිදුණේ නොවූයේය. නොමළේය. චතුර්ථ ධ්‍යානයට නොසම වනුයේය. රූපාරූප භවයන් සමග යුක්ත නොවූයේය. නිරෝධ සමවතට නොසමවැදුණේය. නුඹට ආශ්වාස ප්‍රශ්වාස ඇත්තේමය. නුවණ මද හෙයින් අල්ලාගන්ට නොහැකි වූයේයයි ආපසු චෝදනා කළයුතුය. ඉක්බිති මොහු විසින් ප්‍රකෘති ස්පර්ශ වශයෙන් සිත පිහිටුවා මෙනෙහි කිරීම පැවැත්විය යුතුයි. මේවා දීර්ඝ නාසිකයාගේ නාස්පුඩු ගැටෙමින් පවතී. හ්‍රස්ව නාසිකයාගේ උඩුතොලය. එහෙයින් මොහු විසින් මෙනම් ස්ථාන ගැටේයයි නිමිත්ත තැබිය යුතුය. මෙම කරුණම සැලකිල්ලට ගෙන භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. මහණෙනි, මම මුළාවූ සිහි ඇති, මනා නුවණින් තොරවූවහුට ආනාපාන සති භාවනාව නොවදාරමි. කෙසේ වෙතත්, යම්කිසි කමටහනක් වේද, එය සිහි ඇති මනා නුවණැත්තහුට සමෘද්ධ වේ. මෙයින් අන්‍ය කමටහනක් මෙනෙහි කරන්නහුට ප්‍රකට වේ. මෙම ආනාපාන සති කර්මස්ථානය බරය. මෙම බර භාවනාව බුදු, පසේබුදු, බුද්ධපුත්‍ර මහා පුරිසයන්ගේම මනසිකාරයට භූමි වූයේය. අන්‍යයන්ට නොවේ. යම් යම් අයුරකින් මෙනෙහි කරයිද? ඒ ඒ අයුරින් ශාන්තද සියුම්ද වේ. එහෙයින් මෙහි බලවත් විඳින කල්හි ඉඳිකටුවද, සියුම්ව කැමැති විය යුතුය. ඉඳිකටු සිදුරද, එයට වඩා ඉතා සියුම්ය. එපරිද්දෙන්ම මට්ටම් සිහිඳු වස්ත්‍රයක් බඳු මෙම කමටහනෙහි භාවනා කාලයෙහි, ඉඳිකටු හා සමාන සිහියද,

ඉඳිකටු සිදුර හා සමාන ඒ හා සම්ප්‍රයුක්ත ප්‍රඥාවද, බලවත්ව කැමැති විය යුතුය. එම සිහිය හා ප්‍රඥාවන්ගෙන් යුක්ත වූ භික්‍ෂුව විසින්, එම ආශ්වාස, ප්‍රශ්වාස ප්‍රකෘතියෙන් ස්පර්ශ කළ ස්ථානය හැර අන් තන්හි නොසෙවිය යුතුය. යම්සේ වනාහි ගොවියා, කෙත, සීසා, ගොණුන් මුදා ගොදුරු මුවකොට, සෙවනෙහි හුන්නේ විවේක ගන්නේය. ඉක්බිති, ඔහුගේ එම ගොන්නු වේගයෙන් පිවිසෙන්නාහුය. යමෙක් දක්‍ෂ ගොවියෙක් වේද? හෙතෙම නැවත ඔවුන් අල්ලාගෙන කටයුතුවල යොදවනු කැමැතියේ, ගොණුන්ගේ පියසටහන් අනුව වනයෙහි නොඇවිදියි. ඉක්බිති රැහැනද කෙවිටද ගෙන ඍජුවම උන්ගේ පැන් බොන තොටුපොළට ගොස් හිඳී හෝ වැදහෝනේ හෝ වෙයි. ඉක්බිති ඒ ගොණුන් දිවාකාලය කැලයෙහි හැසිර, පැන් බොන තොටට බැස, දිය නා දියබී එගොඩ වී සිටියවුන් දැක, රැහැනෙන් බැඳ කෙවිටෙන් විදිමින් ගෙනවුත් නගුලෙහි යොදා නැවත කර්මාන්ත කරයි. එපරිද්දෙන්ම එම භික්‍ෂුව විසින් එම ආශ්වාස, ප්‍රශ්වාස ප්‍රකෘතියෙන් ස්පර්ශ කළ තන්හිම සෙවිය යුතුය. අන්තන්හි නොසෙවිය යුතුය. සිහිය නමැති රැහැනද, ප්‍රඥාව නමැති කෙවිටද ගෙන ප්‍රකෘතියෙන් ස්පර්ශ කළ ස්ථානයෙහි සිත තබා මනසිකාරය පැවැත්විය යුතුය. මෙසේ මෙනෙහි කරන්නා වූ ඔහුට නොබෝ කලෙකින්ම පැන් බොන තොටෙහි ගොණුන් මෙන් එම ආශ්වාස ප්‍රශ්වාස වැටහෙයි. ඉක්බිති ඔහු විසින් සිහිය නමැති යොතින් බැඳ, එම ස්ථානයෙහිම යොදා ප්‍රඥා නමැති කෙවිටෙන් විදින්නහු විසින් නැවත නැවත කමටහනෙහි යෙදිය යුතුය. මෙසේ යෙදෙන්නා වූ ඔහුට නොබෝ කලෙකින්ම නිමිත්ත වැටහේ. එය වනාහි සියල්ලන්ටම එක සමාන නොවේ. තවද සමහරෙකුට සුවපහස් උපදවමින් කපු පුළුන් (කපු පුළුන්වලින්) හටගත් වායු දහරාවක් මෙන්ද, වැටහේයයි ඇතැමෙක් කීහු. මේ වනාහි අටුවාවන්හි විනිශ්චය යයි. මෙය වනාහි සමහරෙකුට තාරකා රූවක් මෙන්ද, මැණික් බෝලයක් මෙන්ද, මුතු බෝලයක් මෙන්ද, සමහරෙකුට කර්කශ ස්පර්ශ හටගෙන කපුඇට මෙන්ද, දැව අරටු ඉඳිකටුවක් මෙන්ද, සමහරෙකුට හවඩියෙහි නූලක් මෙන්ද, මල්දමක් මෙන්ද, දුම් සිළුවක් මෙන්ද, සමහරෙකුට පළල් වූ මකුළු හූයක් මෙන්ද, වලාපටලයක් මෙන්ද, නෙළුම්මලක් මෙන්ද, රියසකක් මෙන්ද, සඳමඬලක් මෙන්ද, හිරුමඬලක් මෙන්ද වැටහේ. එයද වනාහි, බොහෝ භික්‍ෂූන් රැස්ව, සූත්‍රාන්ත ගණ සජ්ඣායනා කොට හුන්කල්හි එක් භික්‍ෂුවක් විසින්, ඔබට කවරාකාරයක්ව, මෙම සූත්‍රය වැටහේදැයි කීකල්හි, එක් අයෙක්, මට මහා කන්දකින් හටගෙන ගලා බස්නා නදියක් මෙනැයි කීය. අනෙකෙක්

මට එක් වන පේළියක් මෙනැයිද, අනෙකෙක් මට සිහිල් සෙවනැති මනා අතුපතරින් යුත්, එලබර හරිත වර්ණ එක් රුකක් මෙන්යයි කීය. ඔවුන්ට එම එකම සූත්‍රය සංඥා නානාප්‍රකාර භාවයෙන්, වෙනස් ආකාරයෙන් වැටහේ. එය සංඥාවෙන් ජනිතය. සංඥා නිදානය. සංඥා ප්‍රභවයැ. එහෙයින් සංඥා නානත්වයෙන්, නොයෙක් ආකාරයෙන් වැටහේයයි දතයුතුය. මෙසේ නිමිති වැටහුණු කල්හි ඒ භික්ෂුව විසින් ගුරුවරයාගේ සමීපයට ගොස්, 'ස්වාමීනි, මට මෙබඳු වූවක් (මෙබඳු ආකාරයක්) නම් වැටහේයයි දැනුම්දිය යුතුය. ගුරුවරයා විසින් ඇවැත්නි, මෙය නිමිත්තය. සත්පුරුෂය, කමටහන නැවත නැවත මෙනෙහි කරවයි කිවයුතුය. ඉක්බිති මොහු විසින් නිමිත්තෙහි සිත තබාගත යුතුය. මෙසේ මොහුට මෙතැන් පටන් මෙය ඨපනා වශයෙන් භාවනාව වේ. පුරාණයන් විසින් යූ.සේයි.

**නිමිතෙත ඨපයං චිතතං - නානාකාරං විභාවයං**
**ධීරො අසසාස පසසාසෙ - සකං චිතතං නිබනධති**

නිමිත්තෙහි සිත තබනුයේ, නොයෙක් ආකාරයන් ප්‍රකට කරමින් ප්‍රාඥයා ආශ්වාස ප්‍රශ්වාසයන්හි තම සිත බඳී.

මෙසේ ඔහුට නිමිත්ත වැටහීමෙහි පටන් නීවරණයෝ විෂ්කම්භනය කරන ලද්දාහුම, කෙලෙස්හු සන්සුන් වූවාහුම වෙති. සිත උපචාර සමාධියෙන් සමාධිගත වූයේමය. ඉක්බිති මොහු විසින් එම නිමිත්ත වර්ණ වශයෙන් මෙනෙහි නොකටයුතුය. ලක්‍ෂණ වශයෙන් ප්‍රත්‍යවේක්‍ෂා නොකටයුතුය. තවද වනාහි ක්‍ෂත්‍රිය මහේෂිකාවගේ සක්විති ගැබක් මෙන්ද, ගොවියෙකු විසින් ඇල් සහල්, යව ගබඩාවක් මෙන්ද, ආවාස ආදී සප්ත අසත්ප්‍රායයන් දුරුකොට, එම සප්ත සත්ප්‍රායයන් සෙවුණාහු විසින් මනාව රැකිය යුතුය. ඉක්බිති එය මෙසේ රැක නැවත නැවත මෙනෙහි කිරීම් වශයෙන් වෘද්ධියට, අභිවෘද්ධියට පමුණුවා, දස වැදෑරුම් අර්පණා කෞශල්‍යයන් සම්පාදනය කළයුතුය. වීර්යය සමතාවය යෙදිය යුතුය. මෙසේ උත්සාහ කරන්නා වූ ඔහුට, විශුද්ධි මාර්ගයෙහි කියන ලද ක්‍රමයෙන්, එම නිමිත්තෙහි චතුර්ථ, පඤ්චමධ්‍යානයෝ උපදිති. මෙසේ උපන් චතුර්ථ, පඤ්චමධ්‍යානී භික්ෂුව, සලලකඛණ විවටටන වශයෙන් කමටහන් වඩා පාරිශුද්ධත්වයට පත්වනු කැමැතියේ එම ධ්‍යානයම පස් ආකාරයකින්, වසීප්‍රාප්ත කොට, ප්‍රගුණකොට නාමරූප පිරිසිඳ දැන, විදර්ශනා පිහිටුවයි. කෙසේද, හෙතෙම සමවතින් නැගිට ආශ්වාස-ප්‍රශ්වාසයන්ගේ හටගැන්මද, කරජකයද (මවුපියන් නිසා හටගත් ශරීරයද) සිතද යන මේවා බලයි.

යම්සේතම් ලෝකුරුවාගේ මයිනහමින් පිඹින කල්හි, භස්ත්‍රාව (හම් පසුම්බිය) පුරුෂයාගේ ජනිත උත්සාහය හේතුකොට වාතය පිරී හැසිරේද? එපරිද්දෙන්ම කයද, සිතද ආශ්‍රයකොට ආශ්වාස ප්‍රශ්වාස පවතී. ඉක්බිති ආශ්වාස ප්‍රශ්වාසයන්ද කය, රූපයද, සිතද ඒහා එකට යෙදුණු ධර්මයන්ද, අරූපයයිද නිගමනය කරයි. මෙසේ නාමරූප නිශ්චය කොට, එයට හේතු සොයයි. සොයනුයේද, එය දැක ත්‍රෛකාලයන්හි, නාමරූපයාගේ පැවැත්ම අරබයා සැක දුරුකරයි. දුරුකරන ලද සැක ඇතියේ, කලාප සම්මර්ශන වශයෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්මයැයි ත්‍රිලක්‍ෂණයට නංවා, හටගැනීම්, විනාශවීම් අනුව බැලීමෙන් උපන්, ආලෝකාදී දස විදර්ශනා උපක්ලේශයන් දුරුකොට, උපක්ලේශයන්ගෙන් තොර, උදයව්‍යයානුපස්සනා ඥාණය මාර්ගයයි නිශ්චයකොට, උදය හැර භංගානුපස්සනාවට පැමිණ නිරතුරු භංගානුපස්සනාවෙන් භය වශයෙන් වැටහුණු කල්හි, සියලු සංස්කාරයන්හි කලකිරෙනුයේ, නොඇලෙනුයේ, මිදෙනුයේ, පිළිවෙළින් සිව් ආර්ය මාර්ගයන්ට පැමිණ අර්හත් ඵලයෙහි පිහිටා, එකුන්විසි ප්‍රභේද වූ, ප්‍රත්‍යවේක්‍ෂණ ඥාණයෙහි කෙළවරට පැමිණියේ දෙවියන් සහිත ලෝකයාගේ අග්‍රදක්‍ෂිණාර්හ බවට පත්වේ. මෙතෙකින් ඔහුගේ ගණන් කිරීම මුල්කොට විදර්ශනා කෙළවර කොට ඇති ආනාපාන සති සමාධි භාවනාව සමාප්ත වේ.

මේ සර්වාකාරයෙන් ප්‍රථම චතුෂ්ක වර්ණනාවයි.

අනෙක් ත්‍රිවිධ චතුෂ්කයන්හි, වෙන්ව කර්මස්ථාන භාවනා ක්‍රමයක් නම් නැත. එහෙයින් අනුපද වර්ණනා ක්‍රමයෙන්ම ඒවාහි මෙසේ අර්ථ දතයුතුය. **පීති පටිසංවෙදී** යනු ප්‍රීතිය මනාව විඳිනු ලබන්නක් කරනුයේ, ප්‍රකට කරනුයේ ආශ්වාස කරන්නෙමි. ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. එහි දෙයාකාරයකින් ප්‍රීතිය මනාව දැනගත්තේ වෙයි. අරමුණු වශයෙන්ද අසම්මෝහ වශයෙන් ද වේ. කෙසේ ආරම්මණ වශයෙන් ප්‍රීතිය මනාව දැනගත්තේ වේද, ප්‍රීති සහිත දෙදැහැන්හි සමවදියි. එහි සමවත් කෙණෙහි ධ්‍යාන ප්‍රතිලාභයෙන්, ඊට අදාළ අරමුණෙහි මනාව දැනගත් හෙයින් ආරම්මණ වශයෙන් ප්‍රීතිය මනාව දැනගත්තේ වේ. අසම්මෝහ වශයෙන් කෙසේද? ප්‍රීති සහිත දෙදැහැන්හි සමවැද නැගිට, ධ්‍යානය හා එකට යෙදුණු ප්‍රීතිය ක්‍ෂය ව්‍යය වශයෙන් විමසා බලයි. ඔහුට විවසුන් කෙණෙහි ලක්‍ෂණ අවබෝධයෙන් අසම්මමෝහ වශයෙන් ප්‍රීතිය මනාව දතුයේ

වේ. එම ක්‍රමයෙන්ම සෙසු පදයන්ද අර්ථ වශයෙන් දතයුත්තාහ. මෙය වනාහි මෙහි විශේෂ මාත්‍රයයි. ත්‍රිවිධ ධ්‍යානයන්ගේ වශයෙන් **සුඛ පටිසංවෙදිතා** සුවය මනාව දැනගත්තේ වෙයි. සිව් ධ්‍යානයන්ගේ වශයෙන් **චිත්ත සංඛාරො පටිසංවෙදිතො** චිත්ත සංඛාර මනාව දැනගැනීම වෙයි. **චිත්ත සංඛාරො** යනු වෙදනා සංඥා ස්කන්ධයෝය. **පස්සම්භයං චිත්ත සංඛාරං** යනු දළ දළ චිත්ත සංස්කාර සන්සිඳුවනුයේ, නිරුද්ධ කරනුයේ යන අර්ථයි. එය විස්තර වශයෙන් කාය සංස්කාරයෙහි කියන ලද ක්‍රමයෙන් දතයුතුය. තවද, මෙහි ප්‍රීති පදයෙහි ප්‍රීති ශීර්ෂයෙන් වේදනාව යූ.සේයි. සුඛ පදයෙහි ස්වරූපයෙන්ම වේදනාවය. චිත්ත සංස්කාර පද ද්වයෙහි සංඥාවද වේදනාවද චෛතසිකයි. එම ධර්ම සිත හා බැඳි චිත්ත චිත්ත සංස්කාරයයි කියනු ලබන හෙයින්, සංඥාව හා එකට යෙදුණු වේදනාව යැයි වේදනානුපස්සනා ක්‍රමයෙන් මෙම චතුෂ්කය වදාරන ලදැයි දතයුතුය.

තෙවන චතුෂ්කයෙහිද, සිව් ධ්‍යානයන්ගේ වසයෙන් **චිත්ත පටිසංවෙදිතාව** දතයුත්තේය. **අභිප්පමොදයං චිත්තං** යනු සිත සතුටු කරනුයේ, විශේෂයෙන් සතුටු කරනුයේ, ප්‍රීතිමත් කරනුයේ විශේෂයෙන් ප්‍රීතිමත් කරනුයේ, ආශ්වාස කරන්නෙමි. ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. එහි දෙයාකාරයකින් අභිප්‍රමෝදය වේ. සමාධි වශයෙන්ද විදර්ශනා වශයෙන්ද වේ. සමාධි වශයෙන් කෙසේද? ප්‍රීති සහිත දෙදැහැන්හි සමවදියි. එය සමාපත්තික්ෂණයෙහි ඒහා යෙදුණු ප්‍රීතියෙන් සිත සතුටු කරයි. විශේෂයෙන් ප්‍රීතිමත් කරයි. විදර්ශනා වශයෙන් කෙසේද? ප්‍රීති සහිත දෙදැහැන්හි සමවැදී, නැගිට ධ්‍යානය හා එකට යෙදුණු ප්‍රීතිය ක්‍ෂය, ව්‍යය වශයෙන් විමසා බලයි. මෙසේ විදර්ශනා ක්‍ෂණයෙහි ධ්‍යානය හා එකට යෙදුණු ප්‍රීතිය අරමුණුකොට සිත සතුටු කරයි. විශේෂයෙන් ප්‍රීතිමත් කරයි. මෙසේ පිළිපන්නේ, '**අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමී පස්සසිස්සාමීති සික්ඛති**'යයි යූ.සේයි.

**සමාදහං චිත්තං** යනු ප්‍රථමධ්‍යානාදි වශයෙන් අරමුණෙහි සිත සමව අල්වාගනුයේ, සමව තබනුයේ, එම ධ්‍යානයන්ට සමවැද, නැගිට ධ්‍යානය හා එකට යෙදුණු සිත ක්‍ෂය, ව්‍යය වශයෙන් මෙනෙහි කරන කල්හි, විදර්ශනා ක්‍ෂණයෙහි ලක්‍ෂණ අවබෝධයෙන් ක්‍ෂණික සිතෙහි එකග්‍රතාව උපදී. මෙසේ උපන්නා වූ, ක්‍ෂණික සිතෙහි එකග්‍රතාව වශයෙන්ද, අරමුණෙහි සිත සමව අල්ලාගනුයේ, සමව තබනුයේ, '**සමාදහං චිත්තං අස්සසිස්සාමි, පස්සයිස්සාමිති සික්ඛති**'යි යූ.සේයි.

**විමොචයං චිත්තං** යනු ප්‍රථමධ්‍යානයෙන්, නීවරණයන්ගෙන් සිත මුදවනුයේ, මනාව මුදවනුයේ, ද්විතිය ධ්‍යානයෙන් විතර්ක විචාරයන්ගෙන්ද, තෘතීය ධ්‍යානයෙන් ප්‍රීතියගෙන්ද, චතුර්ථ ධ්‍යානයෙන් සුඛ, දුක්ඛයන්ගෙන්ද සිත මුදවනුයේ මනාව මුදවනුයේ, එම ධ්‍යානයන්ට සමවැද, නැගිට ධ්‍යාන සම්ප්‍රයුක්ත සිත ක්‍ෂය ව්‍යය වශයෙන් විමසා බලයි. හෙතෙම විදර්ශනාක්‍ෂණයෙහි, අනිත්‍යානුපස්සනාවෙන් නිත්‍ය සංඥාවෙන් සිත මුදවනුයේ, මනාව මුදවනුයේ, දුක්ඛානුපස්සනාවෙන් සුව සංඥාවගෙන්ද, අනාත්මානුපස්සනාවෙන්, ආත්ම සංඥාවගෙන්ද, නිර්විදානුපස්සනාවෙන් තෘෂ්ණාවගෙන්ද, විරාගානුපස්සනාවෙන් රාගයෙන්ද, නිරෝධානුපස්සනාවෙන්, හටගැන්මෙන්ද, සිත මුදවනුයේ මනාව මුදවනුයේ ආශ්වාස කරනුයේද, ප්‍රශ්වාස කරනුයේද වේ. එහෙයින් '**විමොචයං චිත්තං අස්සසිස්සාමි - පස්සසිස්සාමි සික්ඛති**' යැයි යූ.සේයි. මෙසේ චිත්තානුපස්සනා වශයෙන් මෙම චතුෂ්කය වදාරන ලදැයි දතයුතුය.

සිව්වන චතුෂ්කයෙහි, **අනිච්චානුපස්සී** යන මෙහි පළමුව අනිත්‍යය දතයුතුය. අනිත්‍යතාව දතයුතුය. අනිත්‍යානුපස්සනාවද දතයුතුය. අනිත්‍ය අනුව බලන්නා දතයුතුය.

එහි අනිත්‍යය යනු පංචස්කන්ධයයි. කුමක් හෙයින්ද? හටගැන්ම, වෙනස්වීම්, විනාශය යන ස්වභාව හෙයිනි. අනිච්චතා යනු එම හටගැනීම් විනාශවීම්, වෙනස්වීම්හිම, කලක් පැවැත විනාශවීමයි. හටගත්තවුන්ගේ එම ආකාරයෙන්ම නොසිට ක්‍ෂණයක් පාසා විනාශයෙන් බිඳේයයි අර්ථයි. **අනිච්චානුපස්සනා** යනු එම අනිත්‍යතා වශයෙන් රූපාදීන්හි අනිත්‍යයයි නුවණින් විමසා බැලීමයි. අනිච්චානුපස්සී යනු එම නුවණින් විමසා බැලීමෙන් යුක්ත වූයේ. එහෙයින් මෙවන් ස්වභාවයෙන් යුක්ත වූයේ ආශ්වාස කරනුයේද, ප්‍රශ්වාස කරනුයේද මෙහි **අනිච්චානුපස්සී අස්සයිස්සාමි පස්සයිස්සාමීති සික්ඛති** යයි දතයුතුය.

**විරාගානුපස්සී** යන මෙහි විරාග ද්වයයකි. ක්‍ෂය විරාගය, අත්‍යන්ත විරාගයද වශයෙනි. එහි ක්‍ෂය විරාගය යනු සංස්කාරයන්ගේ ක්‍ෂණයක් පාසා වන බිඳීමයි. අත්‍යන්ත විරාගය යනු නිර්වාණයයි. **විරාගානුපස්සනා** එම ද්වයය නුවණින් දැකීම් වශයෙන් පැවැති විදර්ශනාවද, මාර්ගයද වේ. එම දෙවැදෑරුම් වූද, අනුපස්සනාවන්ගෙන් යුක්තව, ආශ්වාස ප්‍රශ්වාස කරනුයේද, **විරාගානුපස්සී අස්සසිස්සාමි පස්සසිස්සාමීති සික්ඛති** යයි දතයුතුය.

**නිරොධානුපස්සී** පදයෙහිද එම ක්‍රමයමැයි. **පටිනිස්සග්ගානුපස්සී** යන මෙහිද, අත්හැරීම් ද්වයයකි. පරිත්‍යාග වශයෙන් අත්හැරීමද පැනවැදීම් වශයෙන් අත්හැරීමද වේ. අත්හැරීමම නුවණින් බැලීම පටිනිස්සග්ගානුපස්ස නායි. එය විදර්ශනා මාර්ගයට විශේෂ නාමයකි. විදර්ශනාව වනාහි තදංග වශයෙන් ස්කන්ධ අභිසංස්කාරයන් සහිත කෙලෙස් අත්හරියි. ප්‍රත්‍යයෙන් හටගත් දැහි දොස් දර්ශනයෙන්ද එයට විපරීත නිර්වාණයෙහි එයට නිම්නතාවයෙන් පැනවදීනුයි පරිත්‍යාග අත්හැරීමද, පැනවැදීම් වශයෙන් වන අත්හැරීම යයි යූ.සේයි. මාර්ගය සිඳ දැමීම් වශයෙන් ස්කන්ධ අභිසංස්කාරයන් සහිත කෙලෙස් අත්හරියි. අරමුණු කිරීම් වශයෙන් නිර්වාණයෙහි පැන වදීනුයි. අත්හැරීම් පරිත්‍යාගද, පැනවැදීම් පරිත්‍යාගයයිද යූ.සේයි. ද්වයයම පළමු පළමු ඥාණයන් අනුව, අනුව බලන හෙයින් අනුපස්සනායි යූ.සේයි. ඒ දෙවදෑරුම් වූම අත්හැරීම් නුවණින් බැලීමෙන් යුක්තව ආශ්වාස කරනුයේද ප්‍රශ්වාස කරනුයේද, **පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමි පස්සසිස්සාමීති සික්ඛති** යයි දතයුතුය. මෙහිද අනිච්චානුපස්සී යනු තරුණ විදර්ශනාවගේ වශයෙන් යූ.සේයි. විරාගානුපස්සී යනු තරුණ විදර්ශනාවගේ වශයෙන් යූ.සේයි. විරාගානුපස්සී යනු තරුණ විදර්ශනාවගේ වශයෙන් යූ.සේයි. විරාගානුපස්සී යනු එයට වඩා බලවත් අයුරින් සංස්කාරයන්හි නොඇල්මෙහි සමත් විදර්ශනා වශයෙනි. නිරොධානුපස්සී යනු එයට වඩා බලවත් අයුරින්, කෙලෙස් නිරුද්ධ කිරීමෙහි සමත්, විදර්ශනාවගේ වශයෙනි. පටිනිස්සග්ගානුපස්සී යනු මාර්ගයට ආසන්න වූ අති සියුම් විදර්ශනාවගේ වශයෙන් කියන ලදැයි දතයුතුය. යම්තැනක මාර්ගය ලදද? එය නොබිඳුණේමය. මෙසේ මේ චතුෂ්කය සුද්ධ විදර්ශනා වශයෙන් යූ.සේයි. ප්‍රථමත්‍රය සමථ විදර්ශනා වශයෙනි.

**ආනාපාන සති මාතෘකා වර්ණනාව නිමි.**

දැන් ඉදිරිපත් කරන ලද, මාතෘකා පිළිවෙළින් බෙදා දැක්වීමට **ඉධාති ඉමිස්සා දිට්ඨියා** ආදිය අරඹන ලදී. එහි **ඉමිස්සා දිට්ඨියා** යන ආදී දස පදයන්ගෙන් ශික්ෂාත්‍රය සංඛ්‍යාත සර්වඥ බුද්ධ සාසනයම කියන ලදී. එය භාග්‍යවත් බුදුරදුන් විසින් දක්නා ලද හෙයින් දිට්ඨියයි යූ.සේයි. එයම **ඉවසීම්** වශයෙන් **ඛන්තියි**. කැමැතිවීම් වශයෙන් **රුචියි**. ග්‍රහණ වශයෙන් **ආදායොයි**. ස්වභාව අර්ථයෙන් **ධම්මොයි**. හික්මිය යුතු අර්ථයෙන්

විනයයොයි. එම ද්වයය වශයෙන් ධම්ම විනයයොයි. කියන ලද වශයෙන් පාවචනයි. ශ්‍රේෂ්ඨචර්යාර්ථයෙන් බ්‍රහමචරියංයි, අවවාද දීම් වශයෙන් සත්‍ථුසාසනංයි. එහෙයින් 'ඉමිස්සා දිට්ඨියා' ආදීන්හි, මේ බුද්ධ දිට්ඨියා, මේ බුද්ධ ඛන්තියා, මේ බුදධ රුචියා, මේ බුදධ ආදායෙ, මේ බුදධ ධම්මෙ මේ බුදධ විනයෙ, මේ බුදධ, ධම්ම විනයෙ මේ බුදධ පාවචනෙ, මේ බුදධ බ්‍රහමචරියෙ, මේ බුදධ සත්‍ථු සාසනෙ යයි අර්ථය දතයුතුය. තවද මෙහි ශික්‍ෂාත්‍රය සංඛ්‍යාත බුදුරදුන් විසින් වදාළ සකල නවාංග ශාස්තෘ සාසනය බුදුරදුන් විසින් දිටි හෙයින්ද, සම්‍යග් දෘෂ්ටි හේතුකත්වයෙන්ද සම්‍යග් දෘෂ්ටි පූර්වාංගමත්වයෙන්ද දෘෂ්ටියි. බුදුරදුන්ගේ, ඉවසීම් වශයෙන් ක්‍ෂාන්තියි. රුචිවීම් වශයෙන් රුචියි. ග්‍රහණ වශයෙන් ආදායොයි. තමාගේ නියමයන් අනුව ක්‍රියා කරන්නා අපායෙහි නොහෙළමින් දරානු ධර්මයි. එහිම සකෙලෙස් පස හික්මවයිනුයි විනයයි. ධර්මයද, විනයද, එයමනුයි ධර්ම විනයයි. කුසල ධර්මයන්හි හෝ අකුසල ධර්මයන්ගේ එය හික්මීමනුයි ධර්ම විනයයි. එහෙයින්ම කියන ලදී. 'ගෝතමිය, නුඹ යම් ඒ ධර්මයන්හි මෙම ධර්මයෝ නොඇල්ම සඳහා පවතිත්. ඇල්ම සඳහා නොවෙත්යයි දන්නෙහිද? -පෙ- ගොතමිය, ඒකාන්තයෙන්, එය ධර්මයයිද එය විනය යයිද එය ශාස්තෘ ශාසනය යැයිද දරාගනුව. ධර්මයෙන්ම හික්මීමයි දණ්ඩණාදීන්ගෙන් නොවේනුයි ධර්ම විනයයි.

දණ්ඩෙනෙකෙ දමයන්ති - අංකුසෙහි කසාහිච
අදණ්ඩෙන අසත්‍ථෙන - නාගො දන්තො මහෙසිනා

ඇතැම්හු, හෙණ්ඩුවලින්, කසවලින්, දණ්ඩෙන් දමනය කරති. දඬු රහිතව, ආයුධ රහිතව මහර්ෂීන් වහන්සේ ඇත් රජු දමනය කළ සේක. දැහැමින් කටයුතු කරනවුන්ට ඊර්ෂ්‍යාවෙහි කවර දැනීමෙක්ද? ධර්මයෙහි (හෝ) හික්මීම ධර්ම විනයයි. නිරවද්‍ය ධර්මාර්ථය සඳහා මෙම විනයයි, භව භෝගානිසංසාර්ථ සඳහා නොවේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ. මහණෙනි, මෙම බ්‍රහ්මචර්යාව ජනතාවට නැති ගුණ පෙන්වීම සඳහා පුරනු නොලැබේ යනු විස්තරයයි. පුණ්ණ තෙරණුවෝද, ඇවැත්නි, තෘෂ්ණාදී වශයෙන් ඇඩිසේ නොගෙන පරිනිර්වාණය සඳහා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර පුරනු ලැබේයයි කීහ. විශුද්ධත්වයට හෝ ගෙනයේනුයි විනයයි. යහපත් පැවතුම් වශයෙන් හික්මේනුයි ධර්ම විනයයි. සාංසාරික ස්වභාවයෙන්ද, සෝකාදී ස්වභාවයෙන්ද, ඉවත්කොට මෙය විශුද්ධ නිවනට ගෙනයයි. ධර්මයෙහි හෝ විනයයි. තීර්ථංකරයන්ගේ

නොවේයයිද ධර්ම විනයයි. භාග්‍යවතුන් වහන්සේ ධර්මයෙහිම පිහිටි සේක. මෙය එතුමන් වහන්සේගේම විනයයි. යම්හෙයකින් මාර්ගඵලාදී ධර්මයෝම අභිඤ්ඤෙය්‍ය, පරිඤ්ඤෙය්‍ය, පහාතබ්බ, භාවෙතබ්බ, සච්ඡිකාතබ්බයන්ගෙන් යුක්තද, එහෙයින් එම ධර්මයන්හි විනයයි. සත්ත්වයින් කෙරෙහි හෝ ජීවයන් කෙරෙහි ඇතුළත් නොවේනුයි ධර්ම විනයයි. අර්ථ සහිත, අක්ෂර සහිත අන්‍යයින්ගේ කීම්වලට වඩා ප්‍රධාන වචනයනුයි පවචනයි. පවචනයම පාවචනයි. සියලු චර්යාවන් අතර, විශිෂ්ට චර්යා භාවයෙන් බ්‍රහ්මචරියයි. දෙවි මිනිසුන්ට ශාස්තෘ වූ, භාග්‍යවතුන් වහන්සේගේ සාසනයනුයි සත්‍ථුසාසනංයි. ශාස්තෘ වූවහුගේ සාසන යනුයි සත්‍ථුසාසනංයි. ආනන්දය, මා විසින් නුඹලාට යම් ධර්මයක්ද, විනයක්ද, දේශනා කරන ලද්දේද පනවන ලද්දේද, එය මාගේ ඇවෑමෙන් ශාස්තෘ යයි සඳහන් අයුරින්, ධර්මයද, විනයද ශාස්තෘ නම් වේ. මෙසේ එම පදයන්ගේ අර්ථ දතයුතුය. යම්හෙයකින් වනාහි, මෙසස්නෙහිම සර්වාකාර සම්පූර්ණ ආනාපාන සති සමාධි උපදවන භික්‍ෂුහු විද්‍යමාන වෙත්ද, අන් තන්හි නොවෙත්ද? එහෙයින් ඒ ඒ න්හි ඉමිස්සායිද, ඉමෙසම්ංයිද මෙම නියමය කරන ලදැයි දතයුතුය. මෙ ඉධ යන මාතෘකාවෙහි විස්තරාර්ථයයි.

**පුථුජ්ජන කල්‍යාණකොවා** යන ආදියෙන්, භික්‍ෂු ශබ්දයාගේ වචනාර්ථය, නොදක්වා, මෙහි අදහස් කරන ලද භික්‍ෂුවම දක්වන ලදී. හෙතෙම කෙලෙසුන්, නොසිඳලූ හෙයින්, පෘථග්ජන වූයේද සීලාදී ප්‍රතිපත්තිවලින් යුක්ත වූ හෙයින් යහපත් වූයේනුයි කල්‍යාණ පෘථග්ජනයි. කල්‍යාණ පෘථග්ජනයාම පෘථග්ජන කල්‍යාණකයි. අධි සිල්හි හික්මේනුයි, **සෙඛොයි.** සෝවාන් හෝ සකෘදාගාමි හෝ අනාගාමි හෝ අයයි. වෙනස් නොවන, සෙලවිය නොහැකි අර්හත් ඵල ධර්මය වන්නේනුයි **අකුපපධමෙමායි,** ඔහු වනාහි මෙම සමාධිය වඩයි.

අරණ්‍ය නිර්දේශයෙහි, විනය ක්‍රමයෙන්, ගමද, ගම්සීමාවද හැර සෙසු ප්‍රදේශය **අරඤ්ඤං** යයි දක්වයි. සෞත්‍රාන්තික ක්‍රමයෙන් ආරණ්‍යක භික්‍ෂූන් සඳහා, අරණ්‍ය සෙනසුන නම් දුනු පන්සියයක් පශ්චිමයෙහි යැයි දක්වයි. විනය සූත්‍රාන්ත යන ද්වයයම පර්යාය දේශනා නමැ. අභිධර්මය නිප්පරියාය (වෙනස් කළ නොහැකි) දේශනා නමැයි.

අභිධර්ම ක්‍රමයෙන් අරණ්‍යය දක්වන්ට **නික්ඛමිත්වා බහි ඉන්දඛීලායි** යූසේයි. නුවර දොරටුව අබියස සිටවූ ශක්තිමත් කණුවෙන් පිටත නික්මී යන අර්ථයි. **නික්ඛමිත්වා බහි ඉන්දඛීලංයිද** පාඨයි. ඉන්ද්‍රඛීලය ඉක්මවා පිටතය යන අර්ථයි. මෙහි ඉන්ද්‍රඛීලො යනු ගමෙහි හෝ නගරයෙහි එළිපත්තයි.

වෘක්ෂමූල නිර්දේශයෙහි, වෘක්ෂමූල යනු ප්‍රකට හෙයින් එය නොකියාම, 'යත්‍ථ', ආදිය වදාළහ. එහි **යත්‍ථ** යනු යම් වෘක්ෂ මූලයෙක්හි, මෙහි වාඩිවෙයි හිඳගනියිනුයි **ආසනංයි. පඤ්ඤත්තං** යනු තබන ලද, පිළියෙළ කළ, **මඤ්චො** යනු ආසනයෙහි ප්‍රභේද වචනයි. ඇඳ හිඳගැනීමටද, අවකාශ ඇති හෙයින් මෙහි ආසනයන්හි ඇතුළත්කොට යූ.සේයි. එය වනාහි, සත්ත්වරූප සහිත විට්ටම හාරා ගිල්වන ලද පා ඇති ආසන බද්ධ දිග පුටු ආදී එක්තරා එකක්, **පීඨං** යනු එවැනි ආකාරයන්ගෙන්ම සාදන ලද්දක්, **භිසි** යනු බැටළු ලොමින් කළ බිස්ස, රෙදි බිස්ස, කෙඳි බිස්ස, තෘණ බිස්ස, කොළ බිස්ස යන බිසි අතරින් එක්තරා එකක්, **තට්ටිකා** යනු තල්පත් ආදිය පිළිවෙළකට තබා කළ ආස්තරණය, **චම්ම ඛණ්ඩො** යනු හිඳගැනීමට සුදුසු යම්කිසි සම්කඩක්, **තිණ සත්‍ථරාදයො** යනු තෘණාදීන් එකට රාශිකොට තැනූ මෙට්ටය.

**තත්‍ථ** යනු එම රුක්මුලෙහි, **චංකමති වා** යනාදීන්ගෙන් රුක්මුලෙහි සිව් ඉරියව් පැවැත්මෙහි යෝග්‍යතාව කියන ලදී. යත්‍ථ යන සියලු පදයන්ගෙන් රුක්මුලෙහි සන සෙවනැලි බවද, ජනයාගෙන් වෙන්වූ බවද යූ.සේයි.

**කෙනචි** යනු කිසියම් සමූහයකින්, එම සමූහය බිඳ යැයි විස්තර කරන්නේ, **ගහට්ඨෙහි වා පබ්බජිතෙහිවායි** වදාළහ. **අනාකිණ්ණං** අනාකීර්ණ වූයේ, බාධා රහිත වූයේ, යම් සෙනසුනක හාත්පස, ගව්වක්ද, අඩයොදුනක්ද, පර්වත ගහණ, වන ගහණ, නදී ගහණ වේද, කිසිවෙකුට අවේලාවෙහි පැමිණෙන්ට නොහැකි වේද, මෙය සමීපයෙහි පිහිටියේද අනාකීර්ණ නමැ. යමක් වනාහි අඩයොදුනක් පමණ හෝ යොදුනක් පමණ වේද? මෙය දුරබැවින් අනාකීර්ණ නමැ.

**විහාරො** යනු ගුරුළු පියාපත් වැනි වහලක් ඇති ගෘහයන් හැර සෙසු වාසස්ථාන, **අඩ්ඪයොග** යනු ගුරුළෙකු මෙන් නැමුණු ගෙය,

**පාසාදො** යනු මුදුන්කොත් දෙකක් ගෙන කරන ලද දීර්ඝ ප්‍රාසාදය, **හම්මියං** යනු මතු අහස් තලයෙහි පිහිටි සඳලුතල සහිත ප්‍රාසාදයමය, **ගුහා** යනු ගඩොල් ගුහාව, ගල්ගුහාව, දැවගුහාව, පස්ගුහාව යැයි මෙසේ ඛන්ධක අටුවායෙහි යූ.සේයි. විභංගට්ඨ කථාවෙහි වනාහි **විහාරො** යනු හාත්පස වටේ යන්ට තිබෙන මාර්ගය ඇතුළතම රාත්‍රිස්ථාන දිවාස්ථානයන් පෙන්වා කළ සෙනසුනයි. **ගුහා** යනු යම්තැනක රෑ දවල් ආලෝකය ලැබේද, එබඳු වූ බිම්ගෙවල්, **පබ්බත ගුහා** යනු මෙම ද්වයය විශේෂයෙන් යූ.සේයි.

මාතෘකාවෙහි හැමකල් සාධාරණ ලක්ෂණ වශයෙන් **නිසීදති** යැයි වර්තමාන වචනය කරන ලදී. මෙහි හුන්නහුට භාවනාරම්භය තිසි අයුරින් යෙදෙන හෙයින් හිඳගැනීම ඇරඹීම හා අවසානය දැක්වීම සඳහා **නිසිනෙනායි** අවසන් වීමේ වචනය යොදන ලදී. ඍජුව කය පිහිටුවා සිටින්නහුගේ කය ඍජු වෙයි. එහෙයින් අක්ෂරයෙහි සැලකිල්ලක් නොකොට, අදහස් කරන ලද දැයම දක්වන්නේ **උජුකො** යනාදිය වදාළහ. එහි **ඨිතො සුපණිහිතො** යනු ඍජුව පිහිටුවන ලද හෙයින්, තබන ලද හෙයින්, ඍජුවී සිටියේ, ස්වයංසිද්ධ නොවේයයි අර්ථයි.

**පරිග්ගහට්ඨො** යනු අල්ලාගැනීමයි. කුමක් අල්ලාගන්නා ලද්දේද? ගෙනයාමයි. කුමක් ගෙන යයිද? ආනාපාන සති සමාධියම අර්හත් මාර්ගය දක්වා ගෙනයයි. එහෙයින් **නිය්‍යාණට්ඨොයි** කීහු. මුඛ ශබ්දයාගේ ජ්‍යෙෂ්ඨතා අර්ථ වශයෙන් ගෙන සංසාරයෙන් නිවනට ගෙනයයි කියා යූ.සේයි. **උපට්ඨානට්ඨො** යනු ස්වභාවාර්ථයමය. මෙම සියලු පදයන්ගෙන් පරිගෘහිත නිර්යාණය සිහිකොට යැයි අර්ථය යූ.සේයි.

සමහරු වනාහි පරිග්ගහට්ඨො යනු සිහියෙහි අල්ලාගැනීම් අර්ථයයි කියති. නිය්‍යාණට්ඨො යනු ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ පිවිසෙන නික්මෙන ද්වාරාර්ථයයි වර්ණනා කරති. අල්ලාගත් ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ගෙනයාමෙහි සිහිය එළඹ සිටුවායයිද යූ.සේයි. **දවත්තිංසාය ආකාරෙහි** යනු ඒ ඒ අවස්ථාවන්හි ක්‍රමානුකූලව ලැබෙන සේස රහිත වැළඳගැනීම් වශයෙන් යූ.සේයි. **දීඝං අස්සාස වසෙන** යනු මාතෘකාවෙහි දීර්ඝයයි කියන ලද ආශ්වාස වශයෙන්, සෙස්සෙහිද මෙසේය. **එකග්ගතං** යනු එකඟභාවයයි. **අවික්ඛෙපං** යනු අවික්ෂෙපනය, ඒකාග්‍රතාවයම නානාරම්මණයන්හි සිතෙහි චංචල නොවන හෙයින් අවික්ෂෙපයයි යූ.සේයි.

පජානතො යනු මුළානොවීම් වශයෙන් දන්නහුට විඳින්නහුට යැයි අර්ථයි. මා විසින් අවික්ෂෙපය ලදැයි අරමුණු කිරීම් වශයෙන් දන්නහුට, **තාය සතියා** යනු ඒ එළැඹ සිටි සිහියෙන්, **තෙන ඤාණෙන** යනු එම අවික්ෂෙපය දන්නා වූ නුවණින්, **සතො කාරීහොති** මෙහි යම්හෙයින් ඤාණ සම්ප්‍රයුක්ත වූම සිහිය අදහස් කරන ලදද, දෙසූ පරිදි ශ්‍රේෂ්ඨ සිහි නුවණැති බැවින් යුක්ත වූයේ සිහි ඇත්තේ වේ. එහෙයින් සතො යන වචනයෙන්ම ඤාණයද ගන්නා ලද්දේ වේ. **අද්ධාන සංඛාතෙ** යනු දීර්ඝයයි කියනු ලබන කාලයෙහි, දීර්ඝ මාර්ගය අද්ධාන යයි යූ.සේයි. මෙම කාලයද දීර්ඝ හෙයින්, දීර්ඝ මාර්ගයක් මෙනැයි අද්ධානයයි යූ.සේයි. ආශ්වාස කරයි. ප්‍රශ්වාස කරයි යයි ආශ්වාසයද, ප්‍රශ්වාසයද වෙන් වෙන්ව දැක්වූයේ වී නමුත් භාවනාවෙහි නිරතුරු පැවැත්ම දැක්වීම සඳහා අසසසති, පසසසතියි නැවත සමාසකොට යූ.සේයි. **ඡන්දො උප්පජ්ජති** යනු භාවනාභිවෘද්ධිය සඳහා, අධික භාවය සඳහා කැමැත්ත හටගනී. **සුඛුමතරං** යනු සංසිඳීම් ස්වභාවයෙන් යූ.සේයි. **පාමුජ්ජං උප්පජ්ජති** යනු භාවනාව සම්පූර්ණ වීමෙන් ප්‍රීතිය හටගනී. **අස්සාස පස්සාසාපි චිත්තං විවත්තති** යනු ආශ්වාස ප්‍රශ්වාසයන් ඇසිරිකොට ප්‍රතිභාග නිමිත්ත උපදනා කල්හි, ප්‍රකෘති ආශ්වාස ප්‍රශ්වාසයන්ගෙන් සිත නවතියි. **උපෙක්ඛා සණ්ඨාති** යනු එම ප්‍රතිභාග නිමිත්තෙහි, උපචාර, අර්පණා සමාධි ප්‍රාප්තියෙන් නැවත එක්තැන් කිරීමෙහි, උත්සාහ නොමැති හෙයින්, තත්‍රමධ්‍යස්ථ උපේක්ෂාව පිහිටයි නමැ. **නවහාකාරෙහි** යන මෙහි භාවනාරම්භයෙහි පටන් ඡන්දෝත්පාදයෙන් පෙර ආශ්වාස කෙරේ යයිද, ප්‍රශ්වාස කෙරේයයිද කියන ලද තෙයාකාරයන්ද ඡන්දෝත්පාදයෙහි පටන්, ප්‍රමොදොත්පාදයෙන් පෙර තෙයාකාරයන්ද ප්‍රමොදොත්පාදයෙහි පටන් තෙයාකාරයන්දැයි යන නවකාර.

**කායො** යනු සුණු විසුණු වූද, ආශ්වාස ප්‍රශ්වාස සමූහාර්ථයෙන් කාය නමැ. ප්‍රකෘති ආශ්වාස, ප්‍රකෘති ප්‍රශ්වාස ඇසිරිකොට උපන් නිමිත්තද ආශ්වාස ප්‍රශ්වාස නාමය ලබයි. **උපට්ඨානං සති** යනු ඒ අරමුණට එළැඹ සිටීනුයි සිහිය උපට්ඨාන නමැ. **අනුපස්සනා ඤාණං** සමථ වශයෙන් කායානුපස්සනා නිමිත්තද, විදර්ශනා වශයෙන් නාමකය හා රූපකය අනුව බලන ඤාණයයි අර්ථයි. **කායො උපට්ඨානං** යනු ඒ කය ඇසිරිකොට මෙහි සිහිය නවතියිනුයි උපට්ඨානං නමැ. **නො සති** යනු ඒ කය සිහිය නම් නොවේයයි අර්ථයි. **තාය සතියා** යනු දැන් කියන ලද සිහියෙන්, **තෙන ඤාණෙන** යනු දැන් කියන ලද ඤාණයෙන්, **තං කායං අනුපස්සති**

යනු සමථ විදර්ශනා වශයෙන් කියන ලද පරිදි, කය අනුව ගොස්, ධ්‍යාන සම්ප්‍රයුක්ත ඤාණයෙන් හෝ විදර්ශනා ඤාණයෙන් හෝ බලයි.

මාතෘකාවෙහි, කායාදී පදයන්ගේ නොමැති කල්හිද, මේ චතුෂ්කයෙහි කායානුපස්සනා වශයෙන් කියන ලද හෙයින්, දැන් කිවයුතු කයෙහි කය අනුව බලන සතිපට්ඨාන භාවනාව යැයි වචනය සඳහා කාය පද නිර්දේශය කරන ලදී. **කායෙ කායානුපස්සනා** යනු බොහෝ ආකාර කයෙහි එම කයෙහි නුවණින් බැලීමයි. නොහොත් කයෙහි කය අනුව බැලීමයි. අනෙක් ධර්මයන්හි නුවණින් බැලීමක් නොවේයයි යූ.සේයි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අසුභ වූ කයෙහි, නිත්‍ය, සුව, ආත්ම, ශුභ අනුව බැලීමක් නොවේ. තවද, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අශුභ වශයෙන් ශරීරයෙහිම නුවණින් බැලීමයි. නොහොත් කයෙහි මමයැයි හෝ මගේ යැයි හෝ ස්ත්‍රියකැයි හෝ පුරුෂයෙකුයැයි හෝ ගතයුතු කිසි අයුරකින් නොබලන හෙයින් එම කාය මාත්‍රයාගේම නුවණින් බැලීමයැයි යූ.සේයි. මතුයෙහි **වෙදනාසු වෙදනානුපස්සනා** යන ආදී ත්‍රයයෙහිම එම ක්‍රමයමැයි. සිහියම යථා ස්වභාවයෙන් වැටහීම සතිපට්ඨානයි. කය අනුව නුවණින් බැලීම හා සම්ප්‍රයුක්ත ස්මෘතියෙහි යථා ස්වභාවයෙන් වැටහීම කායානුපස්සනා සතිපට්ඨානයි. එහි අභිවෘද්ධිය **කායානුපස්සනා සතිපට්ඨාන භාවනා, තං කායං** යනු නාමරූප කායයන් නොදක්වන ලදුයේද කාය ශබ්දයෙන් එයද සංගෘහිත හෙයින් දක්වන ලද්දක් සේ සලකා යූ.සේයි. අනිත්‍යානුපස්සනාදීහු නාමරූප කායයන්හිම ලැබෙත්. නිමිත්ත කායයන්හි නොවේ. අනුපස්සනාවද, භාවනාවද කියන ලද අර්ථමය. **දීඝං අස්සාස පස්සාස වසෙන** යනාදිය ආනාපාන සති භාවනාවෙහි අනුසස් දැක්වීමට යූ.සේයි. එහිද සිහියෙහි පැතුරුණු බවද, ඤාණයෙහි පැතුරුණු බවද ආනිසංසයි. එහි **චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො** යනු ලද ධ්‍යානයෙහි විදර්ශනා කාලයෙහි සිතෙහි එකඟතාව සඳහා යූ.සේයි. **විදිතාවෙදනා** යනු මාර්ගඵලාවබෝධයෙන් හටගැන්ම දැක්මෙන් වේදනාව ප්‍රකටව දන්නා ලද්දාහු, **විදිතා උපට්ඨහන්ති** යනු ක්ෂය, ව්‍යය, ශූන්‍ය වශයෙන් ප්‍රකටකොට දන්නා ලද්දාහු වැටහෙති. **විදිතා අබ්භත්ථං ගච්ඡන්ති** යනු මාර්ගඵලාවබෝධයෙන්, ව්‍යය දැක්මෙන්, ප්‍රකටකොට දන්නා ලද්දාහු විනාශයට යෙති. බිඳෙත් යයි අර්ථයි. **සඤ්ඤා විතක්කෙසුපි** එම ක්‍රමයමැයි. මෙම ත්‍රයය කී කල්හි සෙසු අරූප ධර්මයෝද යූ.සේයි. මෙම ත්‍රයය කී කල්හි කවර හෙයින් අනෙක්වා කියන ලද්දේද යත්, අල්ලාගැනීම දුෂ්කර හෙයිනි. වේදනාවන්හි වනාහි සුවදුක් ප්‍රකට

වේ. උපේක්ෂාව වනාහි සියුම්ය. අල්ලාගැනීම දුෂ්කර හෙයින් මනාව ප්‍රකට නොවේ. එයද මොහුට ප්‍රකට වේ. හැඟීම් ආකාර මාත්‍ර ග්‍රහණයක් හෙයින්, නිසි ආකාර ග්‍රහණයක් නොවේ. එයද ස්වභාව සමානතා ලක්‍ෂණ ග්‍රාහක විදර්ශනා ඤාණය හා සම්ප්‍රයුක්ත වූයේ අතිශයින් අප්‍රකටය. එයද මොහුට ප්‍රකට වේ. විතර්කයද ඤාණය හා සමාන හෙයින් ඤාණයෙන් වෙන්කොට ග්‍රහණය දුෂ්කරය. විතර්කය ඤාණය හා සමානය. දෙසූ පරිදි, 'ඇවැත්නි, විශාඛය යම් සම්‍යග් දෘෂ්ටියක් වේද, යම් සම්‍යක් සංකල්පයක් වේද, මෙම ධර්ම ප්‍රඥාස්කන්ධයෙහි සංගෘහීතය. **යොපි චසස විතකෙකා පාකටො හොති** මෙසේ නොමනා අල්ලාගැනීම්හි කියන ලද සෙස්ස යූ.සේයි. මෙම පදයන්ට නිර්දේශයෙහි, **කථං විදිතො වෙදනා උපපජජනතියි** විචාරා එය නොවිසඳූයේම, වේදනෝත්පාදයෙහි ප්‍රකට තත්වයත් විසඳූකල්හි, වේදනාවගේ ප්‍රකට භාවයත් විසඳන ලද්දේම වේයයි **කථං වෙදනාය උපපාදො විදිතො හොති** යැයි ආදිය වදාළහ. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**අවිජජා සමුදයා - අවිජජා නිරොධො** ආදිය යට කියන ලද අර්ථමය. මෙම ක්‍රමයෙන්ම සංඥා-විතර්කද දතයුතුය. විතර්ක වාරයෙහි වනාහි, ඵසස සමුදයා - ඵසස නිරොධායි සඳහන් නොකොට, ඵසස යන ස්ථානයෙහි, සඤඤා සමුදයා සඤඤා නිරොධායි යූ.සේයි. එය කවර හෙයින්ද යත්? විතර්කයෙහි සංඥා මූලකත්වය හෙයිනි. සංඥා නානාප්‍රකාරතාව හේතුයෙන් සංකල්ප නානාප්‍රකාරභාවය හටගනී යයි යූ.සේයි.

**අනිචචතො මනසි කරොතො** යන ආදීන්හිද, වේදනාව අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහු විසින් යන ආදී ක්‍රමයෙන් ඒ ඒ වාරයන්හි ඒ ඒ ස්වභාවය යෙදිය යුතුය. යම්හෙයකින් වනාහි, විදර්ශනා සම්ප්‍රයුක්ත වේදනාව, විදර්ශනා කෘත්‍යකරණයෙහි, අසමත් හෙයින් විදර්ශනාව උපකාරක නොවේ. එහෙයින්මම බෝධිපාක්‍ෂික ධර්මයන්හි ඇතුළත් නොකළහ. විදර්ශනා සම්ප්‍රයුක්ත සංඥාවෙහි කෘත්‍යයම කෘත්‍යවත් භාවයෙන් තොරය. එහෙයින් එය විදර්ශනාවට ඒකාන්තයෙන් අනුපකාරකමය. විතර්කයෙන් තොර විදර්ශනා කෘත්‍යයක්ම නැත. විතර්ක සහායෙන්ම විදර්ශනාව සිය කෘත්‍යය කරයි. දෙසූ පරිදි, ප්‍රඥාව තම ස්වභාවයෙන්, අනිත්‍යය, දුකය, අනාත්මයැයි අරමුණ නිශ්චය කරන්ට නොහැකි වෙයි. විතර්කය වනාහි තට්ටුකොට, තට්ටුකොට දෙන කල්හි

හැකිවේ. යම්සේ වනාහි රන්කරුවා කහවණුව, අත්ලෙහි තබා, හැමකොටස් බලනු කැමැති වූයේ නමුදු, ඇස්තලයෙන්ම පෙරළීමට නොහැකි වෙයි. ඇඟිලිපුරුක්වලින්, පෙරළ පෙරළා ඔබිනොබ බලන්ට හැකිවෙයි. එපරිද්දෙන්ම ප්‍රඥාව තමාගේ ස්වභාවයෙන් අනිත්‍යාදී වශයෙන් අරමුණ නිශ්වය කරන්ට නොහැකි වේ. අරමුණට නැංවීම් ලක්‍ෂණයෙන් වනාහි, හැප්පීම් නැවත නැවත හැප්පීම් රසයෙන්, විතර්කයෙන් තට්ටු කරන්නාක් මෙන්ද, පෙරළන්නාක් මෙන්ද, ගෙන ගෙන දුන් දැයම නිශ්වය කරන්ට හැකිවෙයි. එහෙයින් වේදනා සංඥාවන්ගේ විදර්ශනාවට අනුපකාරවත් හෙයින්, ලක්‍ෂණ මාත්‍ර වශයෙන්ම, දක්වන්ට 'වෙදනාය සඤ්ඤාය'යැයි ඒ ඒ තන්හි ඒකවචනයෙන් නිර්දේශ කරන ලදී. විදර්ශනාවෙහි භේද යම් පමණද, විතර්කයෙහිද භේද, එපමණකැයිම දක්වන්ට 'විතක්කානං'යැයි ඒ ඒ තන්හි බහුවචනයෙන් නිර්දේශ කරන ලදැයි කියන්ට වටී. නැවත **දීඝං අස්සාස පස්සාස වසෙන** යනාදී ආනාපාන සති භාවනායෙහි සම්ප්‍රාප්තියද, භාවනා ඵලයද දක්වන්ට යු.සේයි.

එහි **සමොධානෙති** යනු අරමුණෙහි තබයි. අරමුණෙහි පිහිටුවයි යන අර්ථයි. තැන්පත් කිරීමෙහි උත්සාහයක් නොමැති හෙයින්ද, භාවනා සම්පූර්ණත්වයෙන්ම, මනාසේ තැන්පත් කරයි නමැ. **ගොචරං** යන විදර්ශනා ක්‍ෂණයෙහි, සංස්කාරාරම්මණවද, මාර්ග ක්‍ෂණයෙහිද, ඵලක්‍ෂණයෙහිද, නිර්වාණාරම්මණවද, **සමත්‍ථං** යනු සමවූම අර්ථය, සමවූවහුගේ අර්ථය නුයි සමත්‍ථයි. ඒ සමර්ථය සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **මග්ගං සමොධානෙති** යනු මාර්ග ඵලක්‍ෂණයෙහිම ගෝචර නිර්වාණයමය. **අයං පුග්ගලො** යනු ආනාපාන සති භාවනාවෙහි යෙදුණ යෝගාවචරයාය. **ඉමස්මිං ආරම්මණෙ** යන මෙහි වනාහි කාය යන පදයෙන් සංගෘහිත නාමරූප සංඛ්‍යාත සංඛාරම්මණයන්හි, එම ක්‍රමයෙන්ම මග්ග **නිබ්බාරම්මණෙච, යං තස්සා** යනාදීන්ගෙන් අරමුණට ගෝචර වූ ශබ්දයන්ගේ ඒකාර්ථවත් බැව් යු.සේයි. තස්ස යනු එම පුද්ගලයාට, **පජානාතීති පුග්ගලො පජානනා පඤ්ඤා** යන පුද්ගලයා ප්‍රඥායෙන් දැනගනී යයි යු.සේයි. **ආරම්මණස්ස උපට්ඨානං** යනු විදර්ශනා ක්‍ෂණයෙහි සංස්කාරාරම්මණයාගේද, මාර්ග ඵලක්‍ෂණයෙහි නිර්වාණාරම්මණයාගේද එළැඹ සිටීම, **සමං** යන මෙහි කර්මාර්ථයෙහි ෂෂ්ඨියි. රාජ උපස්ථානය අයුරිනි. **අවික්ඛෙපො** යනු සමාධියයි. **අධිට්ඨානං** යනු කියන ලද ආකාර සංස්කාරාරම්මණයද, නිර්වාණාරම්මණයද වේ. එය වනාහි මෙහි සිත අධිෂ්ඨාන කෙරෙයිනුයි අධිට්ඨානං නමැ. **වොදානං** යනු ඤාණයයි. එය

වනාහි එයින් සිත පිරිසිදු කරයි. මනාව පිරිසිදු කරයිනුයි වොදාන නමැ. හැකිළුණු පසට අයත් සමාධිය නොහැකිළුණු බවට පැමිණීමෙහි සමවූ හෙයින් සමංයි. නොසන්සුන් පසට අයත් ඥාණය, සන්සුන් බවට පැමිණීමෙහි සමවූ හෙයින් සමංයි. ඉන් විදර්ශනා මාර්ග ඵලක්ෂණයන්හි, සමථ විදර්ශනාවන්ගේ, එකට වෙළී පවත්නා ස්වභාවය යූ.සේයි. සිහිය වනාහි හැමතන්හි අවශ්‍යහෙයින් එම ද්වයයෙහි සමතායෙන් උපකාරී වූයේනුයිද සමංයි. අරමුණ සමාධියට කරුණු වන හෙයින් සමංයි. අනවජ්ජට්ඨො යනු විදර්ශනාවෙහි නිරවද්‍ය ස්වභාවයයි. නික්ලෙසට්ඨො යනු මාර්ගයාගේ නිකෙලෙස් බවයි. 'නික්කිලෙසට්ඨො'යිද පාඨයි. වොදානට්ඨො යනු ඵලයෙහි පිරිසිදු බවයි. පරමට්ඨො යනු නිර්වාණයාගේ සියලු ධර්මයන්ට වඩා උසස් බවයි. පටිවිජ්ඣති යනු, එම ස්වභාවය නුමුළා භාවයෙන් අවබෝධ කරයි. මෙහිද අරමුණෙහි එළැඹ සිටීමයැයි ආදීන්ගෙන් සම ප්‍රතිවේධය යූ.සේයි. මෙහිද වොදානාර්ථය ප්‍රතිවේධයාගේ වශයෙන් කියන ලද හෙයින් එයින් සමාන ලක්ෂණ වූ, නිරවද්‍යාර්ථ, නිකෙලෙස් අර්ථ, පරමාර්ථ ලක්ෂණගෙන ඒම් වශයෙන් යූ.සේයි. දෙසූ පරිදි,

> වුත්තම්හි එකධම්මෙ - යෙ ධම්මා එක ලක්ඛණා කෙචි
> වුත්තා භවන්ති සබ්බෙ - ඉති වුත්තො ලක්ඛණො හාරො'ති

කිසියම් සමාන ලක්ෂණ ඇති ධර්මයෝ වෙත්ද, එක් ධර්මයෙක්හි ස්වභාවය කී කල්හි සියල්ලම කියන ලද්දාහු වෙති. මෙය ලක්ෂණහාරයැයි යූ.සේයි.

මෙහි නිරවද්‍යාර්ථය, නික්ලේශාර්ථය අවික්ෂෙප සංඛ්‍යාත 'සම'යෙහි අර්ථයැයි ප්‍රයෝජනය නුයි සමත්ථයි, ව්‍යවදානාර්ථය විදර්ශනා මාර්ග ව්‍යවදානය සඳහා සමවූම අර්ථයනුයි සමත්ථයි. ඵල ව්‍යවදානය සඳහා මාර්ග ව්‍යවදාන සංඛ්‍යාත සමයෙහි අර්ථයනුයි සමත්ථයි. පරමාර්ථය වනාහි සමවූම අර්ථයනුයි හෝ නිර්වාණයෙහි යොදවන හෙයින් සියලු සමයයන්ගේ අර්ථයනුයි හෝ සමත්ථයි. එය කියන ලද ආකාර ඇති, සමයද, සමත්ථයද, එක් කොටසක් සමානතායෙන් එකක් සේ සලකා, සමත්ථඤ්ච පටිවිජ්ඣති යයි යූ.සේයි. ඉන්ද්‍රිය, බල, බොධ්‍යංග ධර්ම, විදර්ශනා මාර්ග ඵලක්ෂණයෙහිද ලැබේ. මාර්ගයද විසුද්ධිත්‍රයයද මාර්ග ඵලක්ෂණයෙහිමය. විමෝක්ෂයද, විද්‍යාවද ක්ෂය ඥාණයද මාර්ග

ක්‍ෂණයෙහිමය. විමුක්තියද, අනුත්පාදයෙහි ඥානයද එලක්‍ෂණයෙහිමය. සෙසු විදර්ශනා ක්‍ෂණයෙහි ප්‍රීතිය ධර්මවාරයෙහිද, මෙම ධර්ම මෙම අරමුණෙහි එක්තැන් කරයිනුයි, නිර්වාණය හැර සෙස්ස සුදුසු පරිදි දතයුත්තාහ. මෙය වනාහි බොහෝ වශයෙන් යු.සේයි. මෙහි නොකියන ලද අර්ථයට යු.සේයි. මෙහි එක එක චතුෂ්ක වශයෙන් නිර්යාණයත් දක්වන ලදුයේද, චතුෂ්කයන්ට ඇතුළත් වූ, එක එක කොටසෙහි නිර්යාණයට උපනිශ්‍රය හෙයින් එක් එක් කොටස් වශයෙන් නිර්යාණය දක්වන ලදී. එකිනෙකින් තොරව නිර්යාණය නොවේ.

## දීර්ඝ ආශ්වාස ප්‍රශ්වාස නිර්දේශ වර්ණනා නිමි.

හ්‍රස්ව නිර්දේශයෙහි, **ඉත්තර සංඛාතෙ** යනු ස්වල්ප සංඛ්‍යාත කාලයෙහි, මෙහි සෙස්ස කියන ලද ක්‍රමයෙන් දතයුතුය.

සබ්බකාය පටිසංවෙදී නිර්දේශයෙහි, අරූප ධර්මයන්හි වේදනාව දළ හෙයින්, සුවසේ ග්‍රහණය සඳහා, පළමුව, ඉටුනිටු අරමුණු දනවන වේදනාව යු.සේයි. ඉක්බිති, යමක් විඳියිද එය හඳුනයි යයි මෙසේ වේදනාවට විෂය වූ ආකාර ග්‍රාහක සංඥාවද, ඉක්බිති සංඥා වශයෙන් රැස්කළ චේතනාවද, ඉක්බිති ස්පර්ශ කරන ලදුයේ විඳියි. ස්පර්ශ කරන ලදයේ හඳුනයි. ස්පර්ශ කරන ලදුයේ සිතයි යන වචන, ස්පර්ශයද, ඉක්බිති සියල්ලන්ට සාධාරණ ලක්‍ෂණ මනසිකාරයදැයි, චේතනාදීන්හි ඇතුළත් සංස්කාර ස්කන්ධය යු.සේයි. මෙසේ ස්කන්ධත්‍රයන්හි කී කල්හි එය හා ආශ්‍රිත විඥාණ ස්කන්ධය කියන ලද්දේම වේ. **නාමඤ්ච** යනු කියන ලද ආකාර ඇති නාමයද, **නාම කායොච** යනු මෙම නාමයෙන්, නිර්වාණයාගේද, සංගෘහිත හෙයින්, ලෝකෝත්තරයන්ගේද, විදර්ශනාවට නොඑළඹුණු හෙයින් එය ඉවත් කරන්ට යු.සේයි.

නිර්වාණයාගේ රාශි විනිර්මුක්ත හෙයින් කාය යන වචනයෙන් නිර්වාණය ඉවත්කරන ලද්දේ වේ. **යෙච වුච්චන්ති චිත්ත සංඛාරා** යනු සංඥාවද, වේදනාවද චෛතසිකයෝය. එම ධර්ම සිත හා බැඳී ඇති හෙයින් **චිත්ත සංඛාරයැයි** මෙසේ කියනු ලබන කල්හිද, චිත්ත සංස්කාර මෙහි නාමකයෙන්ම සංගෘහිත යැයි යු.සේයි. **මහාභූතා** යනු විශාලව පහළවන හෙයින්ද මහාභූත යන සාමාන්‍යතාවයෙන්ද, මහත් පරිවාර

හෙයින්ද මහත් වෙනස්වීම්වලට භාජනය වන හෙයින්ද, මහත් වූ හෙයින්ද මහාභූතයි. ඒවා වනාහි පෘථුවි, ආපො, තෙජො, වායො යන සතරයි. **චතුන්නං මහාභූතානං උපාදාය රූපං** යනු ද්විතියාර්ථයෙහි ෂෂ්ඨියි. සතරමහා භූතයන් දැඩිසේ ගෙන, ඇසුරුකොට, අත්නොහැර පැවැති රූපයයි යන අර්ථයි. එය වනාහි ඇස, කණ, නැහැය, දිව, ශරීරය, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ත්‍රීන්ද්‍රිය, පුරිසේන්ද්‍රිය, ජීවිතේන්ද්‍රිය, හෘදය වස්තුව, ඕජාව, කාය විඥප්ති, වචි විඥප්ති, ආකාශ ධාතුව, රූපයෙහි ලිහිල් බව, මෘදු බව, කර්මණ්‍යතාවය, උපචය, සන්තති ජරතා, අනිච්චතා යයි සූවිසි අයුරුය. **අස්සාසො පස්සාසො** නියම ස්වභාවයෙන් යුක්ත වූයේම, ආශ්වාස ප්‍රශ්වාසයන් ඇසිරිකොට, උපන් ප්‍රතිභාග නිමිත්තද, එම නාමයම ලබයි. 'පිටත රූපයන් දකී.' යනාදියෙහි මෙනි. **නිමිත්තඤ්ච උපනිබන්ධනා** යනු සිහිය ළංකොට බැඳීමෙන් නිමිත්ත වූ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ස්පර්ශ කළ ස්ථානය, **යෙච වුච්චන්ති කාය සංඛාරා** යනු ආශ්වාස ප්‍රශ්වාස නමැති එම කායිකය, කය හා බැඳී පවතීනුයි කාය සංස්කාරයැයි, මෙසේ කියනු ලබන්නා වූද, කාය සංස්කාර මෙහි රූප කායයෙන්ම සංගෘහිත යැයි යූ.සේයි.

**තෙ කායා පටිවිදිතා හොන්ති** යනු ධ්‍යාන ක්ෂණයෙහි ආශ්වාස ප්‍රශ්වාස නිමිත්ත කාය වශයෙන්ද, විදර්ශනා ක්ෂණයෙහි සෙසු රූපාරූප කායයන් අරමුණු වශයෙන්ද, ප්‍රකට කොට දන්නා ලද්දාහු වෙති. මාර්ග ක්ෂණයෙහි නුමුළා භාවයෙන් ප්‍රකට කොට දන්නා ලද්දාහු වෙති.

ආශ්වාස, ප්‍රශ්වාස වශයෙන්, ලද ධ්‍යානී යෝගියාට උපන් විදර්ශනා මාර්ගය සඳහාද, දීර්ඝ ආශ්වාස ප්‍රශ්වාස වශයෙනැයි ආදිය යූ.සේයි. **ආවජ්ජතො පජානතො** යනාදිය සීලකථායෙහි කියන ලද අර්ථමය. ඒවා කියන ලද ආකාර ඇති කයෙහි ඇතුළත්කොට, සබ්බකාය පටිසංවෙදී ආදිය යූ.සේයි.

**සබ්බකාය පටිසංවෙදී අස්සාස පස්සාසානං සංවරට්ඨෙන** යනාදීන්හි, සබ්බකාය පටිසංවෙදී යයි කියන ලද ආශ්වාස ප්‍රශ්වාසයෙන් උපදනා ධ්‍යාන, විදර්ශනා මාර්ගයන්හි සංවරයම සංවරාර්ථයෙන් **සීල විසුද්ධියි. අවික්ෂෙපයම අවික්ඛෙපට්ඨෙන චිත්ත විසුද්ධියි.** ප්‍රඥාවම **දස්සනට්ඨෙ දිට්ඨි විසුද්ධියි,** ධ්‍යාන විදර්ශනාවන්හි විරති නොමැති වූයේම, පාපී ස්වභාව අභාව මාත්‍රයම සංවර නමැයි දතයුතුය.

**පසසමහයං** යනාදීන්ගේ නිර්දේශයෙහි, **කායිකා** යනු රූපකයෙහි වූ, **කාය පටිබද්ධා** යනු කය හා බද්ධව, කය නිශ්‍රිතව, කය ඇති කල්හි වෙති. නොමැති කල්හි නොවෙති. එහෙයින්ම ඒවා කයින් රැස් කෙරෙත්නුයි කායසංඛාරායි. **පසසමෙහනෙතා** නිවනුයේ සන්සිඳවනුයේ, පසසමහන වචනයෙන් දළ වූවන්ගේ සන්සිඳවීම සිද්ධය. **නිරොධෙනෙතා** යනු දළ ස්වභාවයෙන් නොඉපැත්මෙන් නිරුද්ධ කරනුයේ, **වූපසමෙනෙතා** යනු දළ ස්වභාව වූම එක් පැවැත්මක පරිණාම ක්‍රමයෙන් ශාන්ත භාවයට ගෙන යනුයේ, **සිකඛති** යනු ප්‍රාර්ථනා වශයෙන් ආශ්වාස කරන්නෙමියි හික්මේයයි සම්බන්ධයයි. ත්‍රිවිධ ශික්ෂාවන්හි හික්මේයයි අර්ථයි.

දැන් දළ සංසිඳීම දක්වන්ට 'යථාරූපෙහි' යනාදිය වදාළහ. එහි **යථාරූපෙහි** යනු යම්බඳු වූ, **ආනමනා** යනු පසුපසට නැමීමක්, **විනමනා** යනු දෙපසට නැමීම, **සනනමනා** යනු සර්වාකාරයෙන් නමන්නහුගේ මනාව නැමීමයි. **පණමනා** යනු පෙරට නැමීමයි. **ඉඤජනා** යනු කම්පනයයි. **එඤනා** යනු මද චලනයයි. **පකමපනා** යනු බලවත් කම්පනයක් යම් ආකාර වූ කාය සංස්කාරයන්ගෙන්, කයෙහි පසුපසට නැමීම -පෙ- බලවත් කම්පනයක් වේද, එබඳු වූ කාය සංස්කාර සංසිඳුවතිද, කයෙහි යම් පෙරට නැමීමක් -පෙ- බලවත් කම්පනයක් වේද, එයද සංසිඳුවතියි සම්බන්ධ කළ යුතුය. කාය සංස්කාරයන් සන්සිඳුණු කල්හි, ශරීරයාගේ පෙරට නැමීම් ආදීහුද, සන්සිඳුණාහුම වෙත් යයි, යම් ආකාර වූ කාය සංස්කාරයන්ගෙන් කයෙහි පෙරට නැමීම් ආදිය නොවෙයිද, එබඳු වූ ශාන්ත සියුම් වූද, කාය සංස්කාර සංසිඳවත් යයිද, ශරීරයෙහි යම් පෙරට නැවීම් ආදිය නොවෙයිද, එබඳු වූ ශාන්ත, සියුම් වූද දෑ සංසිඳවත් යයි සම්බන්ධය දතයුතුය. **සනතං සුඛුමං** යන එය භාව නපුංසක වචනයි.

**ඉති කිර** යන මෙහි, ඉති යනු මෙසේ යන අර්ථයෙහි යෙදේ. 'කිර' යනු ඉදින් යන අර්ථයෙහිය. ඉදින් මෙසේ සියුම් වූද, ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමි. ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ යයි චෝදකයා විසින් චෝදනාව අරඹන ලද්දේ වේ. නොහොත් කිර යනු චෝදක වචනය හෙයින් නොපිළිගන්නා අර්ථයෙහි, පරොක්ෂාර්ථයෙහිද යෙදේමය. මෙසේ සියුම් වූද, සංසිඳුවීම් හික්මේයයි නොඅදහමි. අප්‍රත්‍යක්ෂයැයි යූ.සේයි.

**එවංසනෙත** යනු මෙසේ සියුම් වූවන්ගේ සන්සිඳවීම ඇතිකල්හි,

**වාතූපලද්ධියාච පභාවනා නහොති** යනු ආශ්වාස ප්‍රශ්වාස වාතයෙහි උපලබ්ධියෙහි, උපලද්ධි යනු විඤ්ඤාණයයි. ආශ්වාස ප්‍රශ්වාස වාතය ලබන කල්හි, තදාරම්මණ භාවනා විඤ්ඤාණයාගේ ඉපදීම, උත්පාදනය නොවේ. එම අරමුණ කරණකොට භාවනාව නොවේ යයි අර්ථයි. **අස්සාස පස්සාසනඤ්ච පභාවනා නහොති** යනු භාවනාවෙහි සියුම් වූද ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ නිරෝධය වන හෙයින් ඒවාහි උත්පාදනය, පැවැත්ම නොවේයයි අර්ථයි. **ආනාපාන සතියා ච පභාවනා නහොති** යනු ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ අභාවයෙන්ම තදාරම්මණ භාවනා විඤ්ඤාණ **සම්ප්‍රයුක්ත** සිහියගේද පැවැත්ම නොවේ. එහෙයින්ම ඒහා සම්ප්‍රයුක්ත ආනාපාන සති සමාධියගේ භාවනාව නොවේ. **නච නං තං** යන මෙහි **ච නං** යනු නිපාත මාත්‍රයයි. 'භික්ඛුවනං' යන ආදීන්හි මෙනි. ඒ කියන ලද ආකාර ඇති සමවතට නුවණැතියෝ සම නොවදිති. ඉන් නොනැගිටිතියි සම්බන්ධයි. චෝදනා පක්ෂයට ගෙනහැර දැක්වීම් වචනයෙහි, **ඉතිකිර** යනු එපරිද්දෙන්ම මෙහි එවකාරාර්ථයෙහි කිර ශබ්දය දතයුතුය.

**එවං සනෙත** යනු මෙසේ සන්සිඳවීම් ඇතිකල්හි, **යථාකථං** විය යනු ඒ කියන ලද විධානය ලෙස, කෙසේ එය එසේ වේදැයි උපමාවෙන් විචාරයි.

දැන් **සෙය්‍යථාපි** යයි එම උපමාව දක්වයි. **කංසෙ** යනු ලෝහ බඳුන්හි. **නිමිත්තං** යනු ඒ ශබ්දයන්ගේ ආකාරයයි. **නිමිත්තං** යනු ෂෂ්ඨ්‍යාර්ථයෙහි ද්විතියා ඒකවචනයි. නිමිත්තගේ යන අර්ථයි. ශබ්ද නිමිත්තද යනු ශබ්දයෙන් අනෙකක් නොවූයේ, **සුග්ගහිතත්තා** යනු මනාව ගන්නා ලද හෙයින්, **සුමනසිකතත්තා** යනු මනාව ආවර්ජනය කළ හෙයින්, **සූපධාරිතත්තා** යනු මනාව සිතෙහි තබන ලද හෙයින්, **සුඛුම සද්ද නිමිත්තා රම්මණධාරිතත්තා** යනු එකල්හි සියුම් වූද ශබ්දයන්ගේ නිරුද්ධය වූ හෙයින් අනුග්‍රහ නොලද, ශබ්ද නිමිත්තෙහි, අරමුණු නොවන හෙයින් ඉතා සියුම් ශබ්ද නිමිත්ත අරමුණුකොට, ඉතා සියුම් ශබ්ද නිමිත්ත අරමුණු වූද සිත පවතියි. ඉතා සියුම් ශබ්ද නිමිත්ත අරමුණු භාවයෙන් ප්‍රීතිය හෝ යන අර්ථයි. මෙම ක්‍රමයෙන්ම අර්පණාවෙහිද අර්ථය දතයුතුය. **පස්සම්භයං** යනාදීන්හි 'පස්සම්භයං කාය සංඛාරං' යයි කියන ලද ආශ්වාස ප්‍රශ්වාස කය යැයි හෝ 'පස්සම්භයං කාය සංඛාරං' යන මෙහි ආශ්වාස ප්‍රශ්වාස කය යැයි හෝ යෙදීම දතයුත්තාහ. භාවනා විශුද්ධියෙහි කාය සංස්කාරයන් සන්සිඳෙන කල්හිද, දළ කාය සංස්කාර සන්සිඳවමියි

යෝගියාගේ සිතාබැලීම ඇතිකල්හි ඔහු විසින් සැලකිල්ලෙන් අතිශයින් සංසිඳවයි. නොවැටහෙනුයේද සියුම්ව මනාව ගෙනඒම වෙයි. **අට්ඨ අනුපස්සනෙ ඤාණානි** යනු දීර්ඝ, හ්‍රස්ව, සබ්බකාය පටිසංවේදී, පස්සම්භයං කායසංඛාරං යයි කියන ලද සතර වස්තූන්හි ආශ්වාස වශයෙන් සතරෙක්ද, ප්‍රශ්වාස වශයෙන් සතරෙක්දැයි අට අනුපස්සනා ඤාණයෝ, **අට්ඨච උපට්ඨානානුස්සතියො** යනු දීර්ඝව ආශ්වාස වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතාව, අවික්ෂෙපය දන්නහුට සිහිය එළැඹ සිටියේ වේයයි ආදී ක්‍රමයෙන් කියන ලද සිව් වස්තූන්හි ආශ්වාස වශයේ සතරෙක්ද, ප්‍රශ්වාස වශයෙන් සතරෙක්දැයි යන අට අරමුණට එළැඹ සිටීම් අනුස්සතීහුය. අට්ඨ චුපට්ඨානානුස්සතියොයිද පාඨයි. **චත්තාරි සුත්තන්තික වත්ථූනි** යනු භාග්‍යවතුන් වහන්සේ විසින් ආනාපාන සති සූත්‍රාන්තයෙහි දේශනා කරන ලද හෙයින් ප්‍රථම චතුෂ්ක වශයෙන් සිව් සූත්‍රාන්තික වස්තූහුය.

## ප්‍රථම චතුෂ්ක නිර්දේශ වර්ණනාව නිමියේය.

දෙවන චතුෂ්කයෙහි, පීති පටිසංවෙදී නිර්දේශයෙහි, **උප්පජ්ජති පීති පාමුජ්ජං** යන මෙහි පීති යනු මුල්වූ පදයයි. **පාමුජ්ජං** යනු එහි අර්ථ පදයයි. **යා පීති පාමුජ්ජං** යනාදීන්හි යම් ප්‍රීතියක්ද ප්‍රමෝද්‍යයක්දැයි මේ ආදී නම් ලබයි. එම ප්‍රීතිය යයි යූ.සේයි. එහි පීති යනු ස්වභාව පදයයි. ප්‍රමුදිත භාවය **පාමුජ්ජංයි.** සතුටුවීම් ආකාරය **ආමොදනායි.** වඩාත් සතුටුවීම් ආකාරය **පමොදනායි.** යම්සේ වනාහි භෛසජ්‍යයන්ගේ හෝ තෛලයන්ගේ හෝ උණුහෝදක සීතෝදකයන්ගේ එකට එක්කිරීම මිශ්‍රකිරීම යයි කියනු ලැබේද? මෙසේ මෙම ධර්මයන්ගේ එක්තැන් කිරීමෙන් මිශ්‍ර කිරීමයි. උපසර්ග වශයෙන් පදය වර්ධනය කොට **ආමොදනා පමොදනායි** යූ.සේයි. සතුටු වේනුයි **හාසොයි.** මහත්සේ සතුටුවේනුයි **පහාසොයි.** තුටු පහටු වන ආකාරයට එය විශේෂ නාමයකි. **විත්ති** යනු ධනයයි. එය ධනයට නාමයකි. මෙය වනාහි සොම්නස් හේතු හෙයින් ධනය හා සමාන හෙයින් **විත්තියි.** යම්සේ වනාහි ධනවතාට, ධනය හේතුවෙන් සතුට උපදීද? එසේම ප්‍රීතිමත්හුට ප්‍රීති හේතුවෙන් සතුට උපදී. එහෙයින් **විත්තියයි** යූ.සේයි. සන්තුෂ්ට භාවය පිහිටි හෙයින් ප්‍රීතියට එය නාමයකි. ප්‍රීතිමත් පුද්ගලයා කාය චිත්තයන්ගේ නැගුණු හෙයින්, උස්ව නැගුණු හෙයින්, ඉතා ප්‍රීතිමත් වූයේයයි යූ.සේයි. තමන් විසින් සිතන ස්වභාවය

**අත්තමනතායි.** නොඇලුණහුගේ මනස, දුක ආසන්න කරුණ හෙයින් සිය මන නම් නොවේ. ඇලුණහුගේ මනස සුව ආසන්න කරුණ හෙයින් සිය මන නම් වේ. මෙසේ සියමන භාවය අත්තමනතායි. සිය මන භාව යන අර්ථයි. එය වනාහි අන් කිසිවකට නොවේ. එම සිය මන භාවය වනාහි සිතෙහිම වූ චෛතසික ධර්මයකි. එහෙයින් **අත්තමනතා චිත්තස්ස** යයි යූ.සේයි. මෙහි සෙස්ස මතුයෙහිද, යටද කියන ලද ක්‍රමයෙන් යොදා දතයුතුය.

සුඛ පටිසංවෙදී නිර්දේශයෙහි, **දෙව සුඛානි** යයි සමථ විදර්ශනා භූමි දැක්වීම සඳහා යූ.සේයි. කායික සුවය වනාහි විදර්ශනාවගේ පිහිටන ස්ථානයයි. චෛතසික සුවය සමථයෙහිද, විදර්ශනාවගේද පිහිටන ස්ථානයයි. **කායිකං** යනු ප්‍රසාද කයයි. ඉන් තොරව නූපදනා හෙයින්, කයෙහි යෙදී සිටීනුයි කායිකංයි. **චෛතසිකං** අධිකව යෙදීම් වශයෙන් සිතෙහි යෙදී සිටීනුයි චෛතසිකයි. එහි කායික පදයෙන්, චෛතසික සුවය ප්‍රතික්‍ෂෙප කරයි. සුව පදයෙන් කායික දුක ප්‍රතික්‍ෂෙප කරයි. එසේම චෛතසික පදයෙන් කායික සුව ප්‍රතික්‍ෂෙප කරයි. සුව පදයෙන් චෛතසික දුක ප්‍රතික්‍ෂෙප කරයි. **සාතං** යනු මිහිරි, ඉතා මිහිරි, **සුඛං** යනු සුවයමය දුක නොවේ. **කායසම්ඵස්සජං** යනු ශරීර ස්පර්ශයෙන් හටගත්, **සාතං සුඛං වෙදයිතං** යනු මිහිරි වේදනාවක් වේද, අමිහිරි වේදනාවක් නොවේ. සුව වේදනාවකි. දුක් වේදනාවක් නොවේ. මතුයෙහි තෙපදයන් ස්ත්‍රීලිංග වශයෙන් යූ.සේයි. මිහිරි වේදනාව, අමිහිරි වේදනාව නොවේ. සුව වේදනාව දුක් වේදනාව නොවේ යයි මෙහි වනාහි මෙයම අර්ථයි.

චෛතසික සුඛ නිර්දේශය, කියන ලද්දට විරුද්ධ ක්‍රමයෙන් යෙදිය යුතුය. **තෙ සුඛා** යයි ලිංග විපර්යාස කරන ලදී. එම සුවයන් යයි යූ.සේයි. මෙහි සෙස්ස චතුෂ්කයෙහි යට ප්‍රථම චතුෂ්කයෙහි කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. සිව් සූත්‍රාන්තික වස්තූන් ද්විතීය තෘතීය චතුෂ්ක වශයෙන් දතයුත්තාහ.

**ද්විතීය චතුෂ්ක නිර්දේශ වර්ණනාව නිමි.**

තෘතීය චතුෂ්ක නිර්දේශයෙහි, **චිත්තං** යනු මූලපදයයි. **විඤ්ඤාණං** යනු අර්ථපදයයි. **යංචිත්තං** ආදිය ප්‍රීතියෙහි කියන ලද අයුරින් යෙදිය යුතුය. එහි **චිත්තං** යනු විසිතුරු බැවින් චිත්තයි. අරමුණ මනිමින් දනීනුයි

**මනොයි මානසං** යනු සිතමය. 'අන්තලික්ඛචරො පාසො යවායං චරති මානසො' මෙහි වනාහි ඒහා යෙදුණු ධර්ම මානසයයි කියන ලදී.

**කථංහි භගවා තුය්හං - සාවකො සාසනෙ රතො**
**අප්පත්ත මානසො සෙඛො - කාලං කයිරා ජනෙසුතා**

භාග්‍යවතුන් වහන්ස, ඔබතුමන්ගේ සස්නෙහි ඇලුණා වූ ජන අභිවෘද්ධියෙහි ඇලුණා වූ, ශ්‍රේෂ්ඨ ශ්‍රාවක තෙමේ, නොපත් රහත් බැව් ඇති, ශෛක්‍ෂයෙකු වූයේ, කෙසේ නම් කළුරිය කරන්නේද? යන මෙහි අර්හත්වය මානසයයි යූ.සේයි. මෙහි වනාහි මනසම මානසයි. අක්‍ෂර වශයෙන් එම පදය වඩන ලදී. **හදයං** යනු ඔබගේ සිත හෝ ඉවත්කර දමන්නෙමි. ඔබගේ හෘදය හෝ පළන්නෙමි යන මෙහි ළය හෘදය යැයි යූ.සේයි. හෘදයෙන් හෘදය හෝ දැන සසීයයි හඟිමි යන මෙහි සිතයි. 'වක්කං හදයං' යන මෙහි හෘදය වස්තුවයි. මෙහි වනාහි සිතමය. අභ්‍යන්තරාර්ථයෙන් හෘදය යැයි යූ.සේයි. එයම පරිශුද්ධාර්ථයෙන් **පණ්ඩරංයි.** භවංගය සඳහා එය යූ.සේයි. දෙසූ පරිදි: මහණෙනි, මෙම සිත ප්‍රභාශ්වරය. එය වනාහි ආගන්තුක උපක්ලේශයන්ගෙන් කිලිටි විය.

ඉන් නික්මුණා වූ, කුසලයද, ගංගා නදියෙන් නික්මුණු ගංගා නදී ජලය මෙන්ද, ගෝදාවරී ගඟෙන් නික්මුණු ගෝදාවරි ජලය මෙන් සුදු පැහැයෙන් යුක්තමයැයි යූ.සේයි. අරමුණු දැනගන්නා ලක්‍ෂණ ඇති සිත උපක්ලේශයන්ගෙන් කිලිටි නොවූයේ වේද, ස්වාභාවිකව පිරිසිදු වූයේම වේ. උපක්ලේශ යෙදීම් ඇතිකල්හි කිලිටි වූයේ නම් වේ. එහෙයින් පිරිසිදු යයි කියන්ට සුදුසුය. **මනො මනායතනං** යනු මෙහි වනාහි මනො ග්‍රහණයෙන් මනසෙහිම ආයතනභාවය දැක්වීම සඳහායි. එහෙයින් එය මෙසේ දක්වයි. මෙය දේවායතනයක් මෙන් නොවේ. මනසෙහි චිත්ත චෛතසික ධර්මයන් නමැති ආයයන් හටගැනීමට මුල්වන හෙයින් මනායතනයි. තවද, මනසම ආයතන වූයේ මනායතනයි. ආයනාර්ථ යට යූ.සේයි. සිතානුයි මනයි, දනී යන අර්ථයි. අටුවාචාරීහු කීහු, නැළියෙන් මනින්නාක් මෙන්ද, විශාල තරාදියකින් දරන්නාක් මෙන්ද, අරමුණ දනීනුයි මනොයි. එම මැනීම් ලක්‍ෂණයෙහිම ප්‍රධානත්වය කෙරේනුයි ඉන්ද්‍රියයි. මනසම ඉන්ද්‍රිය වූයේ **මනින්ද්‍රියයි.** දැනගනීනුයි **විඤ්ඤාණංයි.** විඤ්ඤාණයම ස්කන්ධ වූයේ **විඤ්ඤාණක්ඛන්ධොයි.** වැඩීම් වශයෙන් ස්කන්ධයයි යූ.සේයි. රාශ්‍යර්ථයෙන් වූ විඤ්ඤාණස්කන්ධයෙහි එක් කොටසක් ගත් කල්හි එක්

විඤ්ඤාණයයි. යම්සේ වෘක්ෂයක එක් කොටසක් සිඳිනුයේ, වෘක්ෂය සිඳීයයි කියයිද, එපරිද්දෙන්ම විඤ්ඤාණස්කන්ධයෙහි එක් කොටසක් වූ එක් විඤ්ඤාණයක් වැඩීම් වශයෙන් විඤ්ඤාණස්කන්ධයයි යූ.සේයි. රාශ්‍යර්ථයම ස්කන්ධාර්ථය නොවේ. කොට්ඨාශාර්ථයද ස්කන්ධාර්ථමය. එහෙයින් කොටස් අර්ථයෙන් විඤ්ඤාණ කොටසයැයිද අර්ථයි. **තජ්ජා මනො විඤ්ඤාණ ධාතු** යනු ඒ ස්පර්ශාදීන් හා සම්ප්‍රයුක්ත ධර්මයන්ට සුදුසු වූ මනො විඤ්ඤාණ ධාතුයි. මෙම පදයෙහි වනාහි එකම සිත මිනුම් අර්ථයෙන් මනයි. දැනගැනීම් අර්ථයෙන් විඤ්ඤාණයි. ස්වභාවාර්ථයෙන්, ආත්මයෙන් තොර අර්ථයෙන් ධාතු යන නාමත්‍රයෙන් යූ.සේයි. **අභිප්පමාදො** යනු අධික වූ සන්තුෂ්ටියයි.

සමාධි නිර්දේශයෙහි, නොසෙල්වෙන ස්වභාවයෙන් අරමුණෙහි සිටීනුයි **ඨිතියි**. මත්තෙහි පද ද්වයය උපසර්ග වශයෙන් වඩනා ලදී. තවද, සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි කැටිකොට සිටීනුයි **සණ්ඨිතියි**. අරමුණට බැස, ඇතුළට පිවිස සිටීනුයි **අවට්ඨිතියි**. කුසල පක්ෂයෙහි වනාහි ශ්‍රද්ධා, සති, සමාධි, ප්‍රඥා යන සිව්ධර්ම අරමුණට බැස සිටී. එහෙයින්ම ශ්‍රද්ධාව විශ්වාස කළ යුතුයයි. (ඇදහිය යුතුයයි) යූ.සේයි.

සිහිය නොඉල්පේයයිද, සමාධිය පිහිටා සිටීයයිද, ප්‍රඥාව හාත්පසින් බැසගනීයයිද යූ.සේයි. අකුසල පක්ෂයෙහි, තෘෂ්ණා, දෘෂ්ටි, අවිද්‍යා යන ධර්මත්‍රය අරමුණට බසී. එහෙයින්ම ඒවා සැඩපහරයයි යූ.සේයි. උද්ධච්ච විචිකිච්ඡා වශයෙන් පැවැති විසිරීමට ප්‍රතිපක්ෂ වූයේ නොවිසිරීමයි. නොවිසිරීමයයි අර්ථයි. උද්ධච්ච, විචිකිච්ඡා වශයෙන් යන්නා වූ සිත වික්ෂිප්ත වූයේ නමැ. මෙය වනාහි එසේ නොවේයයි **අවික්ඛෙපොයි**. උද්ධච්ච විචිකිච්ඡා වශයෙන්ම සිත විසුරුණේ නම් වේ. ඔබිනොබ ගෙන යයි, මෙය වනාහි ඔබිනොබ නොවිසුරුණු මනසෙහි ස්වභාවයනුයි **අවිසාහට මානසතායි සමථ** යනු චිත්ත, අධිකරණ, සබ්බ සංඛාර සමථ වශයෙන් තෙයාකාරයි. එහි අටසමවත්හි සිතෙහි එකඟතාවය චිත්ත සමථ නමැ. එයට පැමිණ සිතෙහි චලනය, සිතෙහි දැඟලීම සම වේ. සන්සිඳෙයි. එහෙයින් එය චිත්ත සමථයැයි යූ.සේයි. අභිමුඛයට පැමිණ කරනු ලබන විනය පරීක්ෂණ ආදී සත්වැදෑරුම් සමථය අධිකරණ සමථ නමැ. එයට පැමිණ ඒ ඒ අධිකරණයන් සමනය කරති. සන්සිඳුවති. එහෙයින් එය අධිකරණ සමථයැයි යූ.සේයි. සියලු සංස්කාර නිර්වාණයට පැමිණ සමනය කරයි. සන්සිඳුවයි. එහෙයින් එය සියලු සංස්කාර සන්සිඳීම

යැයි යූ.සේයි. මෙම අර්ථයෙහි සිතෙහි සන්සිඳීම අදහස් කරන ලදී. **සමාධි** ලක්‍ෂණයෙහි ප්‍රධානාර්ථය කෙරේනුයි **සමාධින්ද්‍රියං** නමැ. නොසන්සුන්කමින් කම්පා නොවේනුයි **සමාධිබලංයි. සම්මා සමාධි** තත්වූ පරිදි සමාධිය. නිර්යාණික සමාධිය කුසල සමාධියයි තෙවදෑරුම්ය.

**රාගතො විමොචයං චිත්තං** යනාදීන්හි දස කෙලෙස් වස්තුන්ගෙන් මිදීම යූ.සේයි. මෙහි චිත්තයාගේ අරමුණු ගැන්මෙහි මඳ මඳ පසුබැස්ම ග්‍රහණයෙන්, වේදනාදී ස්කන්ධත්‍රයාගේ අරමුණු ගැන්මෙහි මඳ මඳ පසුබැස්ම ගන්නා ලදී. චිත්ත චෛතසිකයන්ගේ නොසන්සුන්කම ග්‍රහණයෙන් කළ පව් අරමුණුකොට හෝ නොකළ පින් අරමුණුකොට පසුතැවීම් ලක්‍ෂණකොට, ඇති කුකුසද ග්‍රහණය කරන ලද්දේ වේයයි, අන්‍ය පාඨයන් සමග හැසිරෙන හෙයින්ද කෙලෙස් වස්තු හෙයින්ද, මිදීම් වචනයෙන්ම ප්‍රථමධ්‍යානාදීන්හි නීවරණාදීන්ගෙන් මිදීමද, අනිත්‍යානුපස්සනාදීන්ගෙන්, නිත්‍ය සංඥාදීන්ගෙන්ද මිදීම යූ.සේයි. **කථං තං චිත්තං අනුපස්සති** යන මෙහි පෙය්‍යාලයෙහිද අනිත්‍යානුපස්සනාවෙන් නිත්‍ය සංඥාවගේද ප්‍රහාණය යූ.සේයි.

සිව් සූත්‍රාන්තික වස්තූන් තෘතීය චතුෂ්ක වශයෙන් දතයුත්තාහ.

## තෘතීය චතුෂ්ක නිර්දේශ වර්ණනාව නිමි.

සිව්වන චතුෂ්ක නිර්දේශයෙහි, අනිර්දිෂ්ටයෙහි නපුංසකයැයි වචනයෙන් අසවල් දෑ අනිර්දිෂ්ට හෙයින්, අනිත්‍යය යනු කුමක් අනිත්‍යදැයි නපුංසක වචනයෙන් විමසීම කරන ලදී. **උප්පාද වයට්ඨෙන** යනු උත්පාද-ව්‍යය සංඛ්‍යාත අර්ථයෙන්, උත්පාද-ව්‍යය ස්වභාවයෙනැයි අර්ථයි. මෙහිද පංචස්කන්ධ ස්වභාව ලක්‍ෂණයයි. පංචස්කන්ධයන්ගේ හටගැන්ම හා විනාශය වෙනස්වීම ලක්‍ෂණයයි. එයින් පැවැත අභාවයෙන් අනිත්‍යයයි යූ.සේයි. එහෙයින්ම අටුවායෙහි ප්‍රත්‍යයෙන් හටගත් ලක්‍ෂණ වශයෙන් අනිත්‍යයැයි ප්වාහිම, හටගැන්ම ව්‍යය, වෙනස් ආකරයැයි පෙන්වා, අභාවය යැයි යූ.සේයි. එයින් හටගෙන පැවත අභාවයට යන ආකාරය අනිත්‍ය ලක්‍ෂණයැයි යූ.සේයි. පංචස්කන්ධයන්ගේ හටගැන්ම හා විනාශය දක්නේ මේ පණස් ලක්‍ෂණයැයි පෙය්‍යාල කොට යූ.සේයි. **ධම්මා** යනු සංඥාස්කන්ධාදී කියන ලද ආකාර ධර්මමය.

**රූපෙ ආදීනවං දිස්වා** යනු භංගානුපස්සනායෙහි පටන් මතුයෙහි කියනු ලබන අනිත්‍යාර්ථාදී, රූපස්කන්ධයෙහි ආදීනව දැක, **රූප විරාගෙ** යනු නිර්වාණයෙහි, නිවණට පැමිණ රූපයෙහි නොඇලේ. පුනරුත්පත්ති ස්වභාවයට නොපැමිණීමෙන් නිරුද්ධ වේ. එහෙයින් නිර්වාණය රූප විරාග යැයි යූ.සේයි. **ඡන්දජාතොහොති** යනු අනුසුව වශයෙන් උපන් ධර්මච්ඡන්දය වේ. **සද්ධාධිමුත්තො** යනු එම නිර්වාණයෙහිම ශ්‍රද්ධාවෙන්ද, අධික ලෙස ඇලුණේ, නිශ්චයට පැමිණියේ, **චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං** යනු මෙම යෝගියාගේ සිත ක්‍ෂය විරාග සංඛ්‍යාත රූප භංගයෙහි අරමුණු වශයෙන් අත්‍යන්ත විරාග සංඛ්‍යාත රූප විරාග නිර්වාණයෙහි අනුසුව වශයෙන් මනාව අධිෂ්ඨාන කරන ලදුයේ, මනාව පිහිටන ලද්දේ වේයයි සම්බන්ධ වශයෙන් දතයුතුය. **රූපෙ විරාගානුපස්සී** යනු රූපයෙහි ක්‍ෂය විරාගය රූපයෙහි විරාගයැයි ප්‍රකෘති සත්තමී වචනයෙන් යූ.සේයි. රූපයෙහි අත්‍යන්ත විරාගය, රූපයෙහි විරාගය යැයි නිමිත්තාර්ථයෙහි සත්තමී වචනයෙන් යූ.සේයි. ඒ දෙවැදෑරුම් වූද, විරාගය අරමුණු විරාගානුපස්සී යැයි යූ.සේයි. වේදනාදීන්හිද එම ක්‍රමයමැයි. නිරෝධානුපස්සී පද නිර්දේශයෙහිද එම ක්‍රමයමැයි.

**කතිහාකාරෙහි** යනාදිය වනාහි මෙහි විශේෂයයි. එහි අවිද්‍යාදී ප්‍රතීත්‍ය සමුත්පාදාංගයන්ගේ ආදීනව නිරෝධ දර්ශනයෙන්ම, රූපාදීන්ගේද ආදීනව නිරෝධය දක්වන ලදුයේ වෙයි. ඒවාහිද ප්‍රතීත්‍ය සමුත්පාදාංගයන් නොඉක්මවන හෙයිනි. මෙයින්ම යන විශේෂ වචනයෙන් විරාගානු පස්සනාවෙන් නිරෝධානුපස්සනාවෙහි විශිෂ්ට භාවය යූ.සේයි. එහි **අනිච්චට්ඨෙන** යනු ක්‍ෂය අර්ථයෙන් හටගෙන පැවත අභාවයට යන අර්ථයෙන් හෝ, **දුක්ඛට්ඨෙන** යනු භයාර්ථයෙන් පෙළීම් අර්ථයෙන් හෝ **අනත්තට්ඨෙන** යනු අසාරාර්ථයෙන්, තම වසඟයෙහි නොපවත්නා අර්ථයෙන් හෝ, **සන්තාපට්ඨෙන** යනු කෙලෙස් තවන අර්ථයෙන් **විපරිනාමට්ඨෙන** යනු ජරා භංග වශයෙන් වෙනස්වීම් අර්ථයෙන්,

**නිදාන නිරොධෙන** යනු මූල ප්‍රත්‍යය අභාවයෙන්, **නිරුජ්ඣති** යනු නොවේ. **සමුදය නිරොධෙන** යනු ආසන්න ප්‍රත්‍යය අභාවයෙන්, මූලප්‍රත්‍යය වනාහි රෝගියාට අසත්ප්‍රාය බොජුනක් මෙන් නිදානයැයි යූ.සේයි. ආසන්න ප්‍රත්‍යය වනාහි රෝගියාට වා, පිත්, සෙම් මෙන් සමුදය යැයි යූ.සේයි. නිදානය වනාහි ඒකාන්තයෙන් ඵලය දේනුයි නිදානයි. සමුදය වනාහි මනාව පහළ වේ. එයින් ඵලය දේනුයි සමුදයොයි.

**ජාති නිරොධෙන** යනු මූල ප්‍රත්‍යයාගේ හටගැනීම නොවීමෙන්, **පභව නිරොධෙන** යනු ආසන්න ප්‍රත්‍යයාගේ හටගැනීම නොවීමෙන්, ඉපැත්මම වේ. එයින් දුක හටගනීනුයි ප්‍රභවයැයි කියන්ට සුදුසුයි. **හෙතු නිරොධෙන** යනු හටගැන්වීම් ප්‍රත්‍යය අභාවයෙන්, **පච්චය නිරොධෙන** උපස්තම්භක ප්‍රත්‍යය අභාවයෙන්, මූලප්‍රත්‍යයම වනාහි, ආසන්න ප්‍රත්‍යයද, ජනක ප්‍රත්‍යයද, උපස්තම්භක ප්‍රත්‍යයද වේමය. ඒවා අතර තීක්‍ෂණ විදර්ශනා ක්‍ෂණයෙහි තදංග නිරෝධයද, මාර්ගක්‍ෂණයෙහි සමුච්ඡේද නිරෝධයද යූ.සේයි. **ඤාණුපපාදෙන** යනු තීක්‍ෂණ විදර්ශනා ඤාණයාගේ හෝ මාර්ග ඤාණයාගේ ඉපිදවීමෙන්, **නිරොධුපට්ඨානෙන** යනු විදර්ශනා ක්‍ෂණයෙහි ප්‍රත්‍යක්‍ෂ වශයෙන් ක්‍ෂය නිරෝධයාගේද, අනුසුව වශයෙන් නිරෝධ සංඛ්‍යාත නිර්වාණයාගේ එළැඹ සිටීමෙන්, ඒවායින් විෂය හා විෂයාන්තර්ගත නියමයම කරන ලද්දේ වේ. තදංග සමුච්ඡේද නිරෝධය යූ.සේයි.

පටිනිස්සග්ගානුපස්සී පද නිර්දේශයෙහි, **රූපං පරිච්චති** යනු ආදීනව දර්ශනයෙන් නිරපේක්‍ෂාතායෙන් රූපස්කන්ධය අත්හරියි. **පරිච්චාග පටිනිස්සග්ගො** යනු අත්හැරීම් අර්ථයෙන් පටිනිස්සග්ග යැයි යූ.සේයි. එයින් පටිනිස්සග්ග පදයට අත්හැරීම් අර්ථයි යූ.සේයි. එහෙයින් කෙලෙසුන්ගේ දුරුකිරීම යයි අර්ථයි. මෙහිද වුට්ඨානගාමිනී විදර්ශනාව කෙලෙසුන් තදංග වශයෙන් අත්හරියි, මාර්ගය මුළුමනින් සිඳීම් වශයෙන්, **රූප නිරොධෙ නිබ්බානෙ චිත්තං පක්ඛන්දති** යනු වුට්ඨානගාමිනී විදර්ශනාව එහි ප්‍රවණතාවයෙන් ඇතුළට වදියි. මාර්ගය අරමුණු කිරීමෙන්, **පක්ඛන්දන පටිනිස්සග්ගො** යනු ඇතුළට වැදීම් අර්ථයෙන් පටිනිස්සග්ගයයි යූ.සේයි. සිත නිර්වාණයෙහි යොමුකරයි යන අර්ථයි. සිව් සූත්‍රාන්තික වස්තූන් චතුර්ථ චතුෂ්ක වශයෙන් දතයුත්තාහ. මෙම චතුෂ්කයෙහි ජරාමරණයන් පිළිබඳ කිවයුතු දෑ යට කියන ලද ආකාරයෙන්ම දතයුතුය. සතිපට්ඨානයන්හිද, කයෙහි කය අනුව බැලීම, සිතෙහි සිත අනුව බැලීම යන කාය චිත්තයන්ගේ ඒකත්ව ව්‍යවහාර වශයෙන් ඒකවචන නිර්දේශය කරන ලදී. වේදනාවන්හි වේදනා අනුව බැලීම, ධර්මයන්හි ධර්මය අනුව බැලීම යැයි වේදනා, ධර්මයන්ගේ නානත්ව ව්‍යවහාර වශයෙන් බහුවචන නිර්දේශය කරන ලදැයි දතයුතුය.

**සිව්වන චතුෂ්ක නිර්දේශ වර්ණනාව නිමි.**

**සතොකාරි ඤාණ නිර්දේශ වර්ණනාව නිමි.**

දැන් ෂට් රාශීන්හි, උදෙසන ලද ඤාණයන්හි, සූවිසි සමාධි ඤාණ නිර්දේශයෙහි, පළමුව කායානුපස්සනා ආදී ත්‍රිවිධ චතුෂ්කයන්ගේ වශයෙන් දොළොස් වස්තූන්ගේ එකිනෙකෙහි ආශ්වාස වශයෙන් එකක්ද, ප්‍රශ්වාස වශයෙන් එකක්දැයි, සමාධිය ද්වයය, ද්වයය බැගින් සමාධීන්යැයි දොළොස් වස්තූන්හි සූවිසි සමාධීහු වෙති. ධ්‍යාන ක්‍ෂණයෙහි ඒ හා සම්ප්‍රයුක්ත සූවිසි සමාධි වශයෙන් ඤාණයෝ වෙති.

දෙසැත්තෑ විදර්ශනා ඤාණ නිර්දේශයෙහි, **දීඝං අස්සාසා** යනු දීර්ඝයයි කියන ලද ආශ්වාසයෙන්, කුමක් කියන ලද්දේ වේද, දීර්ඝ ආශ්වාස හේතුයෙන් ධ්‍යාන ලැබ, සමාහිත සිතින්, විදර්ශනා ක්‍ෂණයෙහි අනිත්‍ය වශයෙන් අනුව බලන අර්ථයෙන් විදර්ශනායි යූ.සේයි. මත්තෙහිද මෙම ක්‍රමයම වන්නේය. ඒ දොළොස් වස්තූන්ගේ එකිනෙකෙහි ආශ්වාස වශයෙන් ත්‍රයයක්ද, ප්‍රශ්වාස වශයෙන් ත්‍රයයක්දැයි ෂට් අනුපස්සනායැයි, දොළොස් වස්තූන්හි දෙසැත්තෑ අනුපස්සනා වෙති. එම දෙතැස්තෑ අනුපස්සනා දෙසැත්තෑ විදර්ශනා වශයෙන් වන ඤාණයෝය.

නිර්වේද ඤාණ නිර්දේශයෙහි, **අනිච්චානුපස්සී අස්සසං** අනිත්‍යය අනුව බලමින් ආශ්වාස කරනුයේ, අනිත්‍යය අනුව බලන්නේ වී, පවතින්නේ යයි අර්ථයි. අස්සසනති යන මේ වචනය හේතු අර්ථයෙහි දතයුතුය. **යථාභූතං ජානාති පස්සතීති නිබ්බිදා ඤාණං** යනු කලාප සම්මර්ශනයෙහි පටන් භංගානුපස්සනාව දක්වා පැවැති විදර්ශනා ඤාණයෙන් සංස්කාරයන්ගේ තත්වාකාරය දනියි. ඇසින් දුටුවාක් මෙන්ම. එම නැණැසින්ම දකියි. එහෙයින් නිර්වේද ඤාණය යැයි අර්ථයි. සංස්කාරයන්හි නිර්වේද ඤාණය නමැයි යූ.සේයි. මත්තෙහි භයතුපට්ඨානාදීන්ගේද, මුඤ්චිතු කම්‍යතා ඤාණාදීන්ගේද වෙන්ව දක්වා ඇති හෙයින් මෙහි කියන ලද ආකාර වූව විදර්ශනා ඤාණයන්, නිර්වේද ඤාණයෝයි දතයුත්තාහ.

නිර්වේද අනුලෝම ඤාණ නිර්දේශයෙහි, **අනිච්චානු පස්සී අස්සසං** යනු අනිත්‍යය අනුව බලමින් ආශ්වාස කරන්නහුගේ, ෂෂ්ඨ්‍යාර්ථයෙහි ප්‍රථමා ඒකවචනයි. **භයතුපට්ඨානෙ පඤ්ඤා** යන වචනයෙන්ම භයතුපට්ඨාන, ආදීනවානුපස්සනා, නිබ්බිදානුපස්සනා ඤාණයන් යූ.සේයි. මෙම ත්‍රයයම එක හා සමාන ලක්‍ෂණ හෙයින් මෙම ත්‍රිවිධ ඤාණයන් අනන්තරව කියන ලද නිර්වේද ඤාණයන්ට අනුකූලභාවයෙන් අනුලෝම් වන හෙයින් නිර්වේදානුලෝම ඤාණයෝයි යූ.සේයි.

නිර්වේද ප්‍රතිප්‍රශබ්ධි ඥාණ නිර්දේශයෙහි, අනිච්චානු පස්සී අසසසං යනු අනතුරු කරුණ හා සමානය. **පටිසංඛා සනතිට්ඨානා පඤ්ඤා** යන වචනයෙන්ම, මුඤ්චිතු කම්‍යතා, පටිසංඛානුපසසනා සංස්කාරොපේක්ෂා ඥාණ යුසේයි ත්‍රයයම එක හා සමාන ලක්‍ෂණ හෙයින්, පටිසංඛා සනතිට්ඨනා යන වචනයෙන්ම, අනුලෝම ඥාණ, මාර්ග ඥාණයන්ද ගන්නා ලද්දාහුම වෙති. සංස්කාරොපේක්‍ෂා හා අනුලොම යන ඥාණ නිර්වේදයෙහි මුදුන් පත්හෙයින් නිර්වේද හටගැන්වීමෙහි උත්සාහ ප්‍රහාණයෙන් නිර්වේද ප්‍රතිපශ්‍රබ්ධි ඥාණ නම් වෙති. මාර්ග ඥාණය වනාහි නිර්වේද ප්‍රතිප්‍රශබ්ධි අන්තයෙහි උපදනා හෙයින් නිර්වේද ප්‍රතිප්‍රශබ්ධි ඥාණය නම් වේයයි මුඤ්චිතුකම්‍යතා ඥාණය නොගෙන, පටිසංඛා සනතිට්ඨානායයි අන්තයෙහි ඥාණද්වය ගැනීම මාර්ග ඥාණය සංග්‍රහය සඳහායි මුඤ්චිතු කම්‍යතායි කී කල්හි අනුලෝම ඥාණය සංග්‍රහ වේ. මාර්ග ඥාණය නොවේ.

මාර්ග ඥාණය වනාහි මුඤ්චිතු කම්‍යතා නම් නොවේ. කෘත්‍ය සිද්ධියෙහි පිහිටා සිටින හෙයින් සනතිට්ඨනා නම් වේ. අටුවාවෙහිද ස්පර්ශ කිරීම යැයිද, පැමිණවීම යැයිද යූ.සේයි. මෙම මාර්ග ඥාණයද, නිර්වාණයට පමුණුවයි සලකා සනතිට්ඨනා නම් වේ. සනතිට්ඨනා යන වචනයෙන් මාර්ග ඥාණයද ඇතුළත් කෙරේ. නිර්වේදානුලෝම ඥාණයෝද අර්ථ වශයෙන් නිර්වේද ඥාණයෙහිම වෙත්යයි ඒවාද නිර්වේද ඥාණයන්හි සංග්‍රහකොට, නිර්වේද ප්‍රතිප්‍රශබ්ධි ඥාණයෝ යයි නිර්වේද ග්‍රහණයෙහිම ඇතුළත් කරන ලදී. නිර්වේදානුලෝම ග්‍රිහණයෙහි නොවේ. මෙම ත්‍රයයම ඥාණෂ්ටක නිර්දේශයන්හි, සිව්වන ධර්මානුපස්සනා චතුෂ්කයාගේ වශයෙන් කියන ලද, සිව් වස්තුන්හි එකිනෙකෙහි ආශ්වාස වශයෙන් එකයයි ඥාණද්වයය බැගින්, සිව් වස්තුන්හි ඥාණ අටක් වෙයි.

විමුක්ති සුව නිර්දේශයෙහි, **පහීණත්තා** යනු ප්‍රහාණය දක්වා එම ප්‍රහාණයෙහි මුළුමනින් සිඳදැමීම් වශයෙන් ප්‍රහාණත්වය දක්වන්නේ මුළුමනින් සිඳදැමූ හෙයිනැයි කීය. **විමුත්ති සුඛෙ ඥාණං** යනු ඵල විමුක්ති සුවය හා සම්ප්‍රයුක්ත ඥාණයද, ඵල විමුක්ති සුව අරමුණුකොට ඇති ප්‍රත්‍යවේක්‍ෂා ඥාණයද වේ. අනුසය වස්තුක ක්ලේශ ප්‍රහාණයෙන්, මැඩගෙන මතුව දුශ්චරිත වස්තුන්හි ප්‍රහාණය වේයයි දැක්වීම සඳහා නැවත අනුසයයන්ගේ ප්‍රහාණය යූ.සේයි. එක්විසි ඵල ඥාණය සඳහා ප්‍රහාණ කෙලෙස් ගණනය අනුව ඥාණ ගණනය කරන ලද්දේ වේ. ප්‍රත්‍යවේක්‍ෂණ

ඥාණය සඳහා ප්‍රහීණ කෙලෙස් ප්‍රත්‍යවේක්ෂණ ගණනට අනුව, ඵල ප්‍රත්‍යවේක්ෂ ගණන ලද්දේම වේ.

### ඥාණ රාසි ෂට්ක නිර්දේශ වර්ණනාව නිමි.

### සද්ධර්ම ප්‍රකාශනී නම් වූ ප්‍රතිසම්භිදා මාර්ග අර්ථ කථායෙහි ආනාපාන සති කථා වර්ණනාව නිමි.

දැන් ආනාපාන සති කථා අන්තරව, කියන ලද ඉන්ද්‍රිය කථායෙහි, පෙර සඳහන් නොකළ අර්ථයන්ගේ, අනුවර්ණනාව පැමිණියේය. මෙම ඉන්ද්‍රිය කථාව වනාහි ආනාපාන සති භාවනාවට උපකාරක වූ, ඉන්ද්‍රියයන්ගේ, අභාවයෙහිදී, ආනාපාන සති භාවනාවෙහි අභාවය වන හෙයින්, එයට උපකාර වූ, ඉන්ද්‍රියයන්ගේ පිරිසිදු කිරීම් ආදී ක්‍රම දැක්වීම සඳහා ආනාපාන සති කථාවට, අනතුරුව කියන ලදැයි එයද කිවයුතුය. ඉන්ද්‍රිය කථාව තමා විසින්, භාග්‍යවතුන් හමුයෙහි, අසන ලද, දැනගත් අදහස් සූත්‍රාන්තික දේශනාව පූර්වාංගම කොට, එහි අර්ථ ප්‍රකාශ කිරීම් වශයෙන්, කියනු කැමැතියේ, පළමුව **එවං මෙ සුතං** යනාදිය වදාළහ.

එහි **එවං** යනු නිපාත පදයයි. **මෙ** යනාදිය නාම පදයන්ය. **විහරති** යන මෙහි 'වි' යනු උපසර්ග පදයයි. 'හරති' යනු ආඛ්‍යාත පදයයි සලකා මෙම ක්‍රමයෙන් පද බෙදීම දතයුතුය.

අර්ථ වශයෙන් වනාහි උපමා, උපදේශ, ගැරහීම්, ප්‍රශංසා කිරීම් ආදී ආකාර වචන සමූහයෙහි එවං ශබ්දය දක්නා ලැබේ. නිදර්ශනාර්ථයෙහිද, අවධාරණාර්ථයෙහිද යෙදේ. මෙහි වනාහි එවං ශබ්දය, ආකාරාර්ථයෙහිද, නිදර්ශනාර්ථයෙහිද, නැණැති ජනයා විසින් පනවන ලදී (නියමකොට). එසේම අවධාරණාර්ථයෙහිද යෙදේ. එහි ආකාරාර්ථයෙන් එවං ශබ්දයෙන් එම අර්ථය දක්වයි. නොයෙක් ක්‍රමවේදයන්හි දක්ෂ, නොයෙක් අදහස් හටගන්වන, අර්ථ හා අක්ෂර පරිපූර්ණව නොයෙක් ප්‍රාතිහාර්යයන්ගෙන් යුක්තව කරනු ලබන, සියලු සත්ත්වයින්ට තම තම භාෂානුරූපව, ශ්‍රොතාභිමුඛයට පැමිණෙන, ප්‍රතිවේධ ගම්භීර, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මාර්ථ දේශනා වචනය සර්වාකාර පරිපූර්ණව අවබෝධ කරන්ට කවරෙක් සමර්ථද? සියලු ශක්තියෙන් ශ්‍රවණ

කාම්‍යතාව උපදවාද, මා විසින් මෙසේ අසන ලදැයි යනු එක් ආකාරයකින් අසන ලද්දේ යනුයි.

නිදර්ශනාර්ථයෙන්, මම තෙමේම අවබෝධ කළේ නොවෙමි. මා විසින් මෙය සාක්ෂාත් නොකරන ලදීයයි තමා නිදහස් කරගනුයේ මා විසින් මෙය අසන ලදී. මා විසින් මෙසේ අසන ලදැයි දැන් කිවයුතු සමස්ත සූත්‍රය දක්වයි.

අවධාරණාර්ථයෙන්, සැරියුත් තෙරහු, 'මහණෙනි, මාගේ ශ්‍රාවක මහාප්‍රාඥ භික්ෂූන් අතර, යම් ඒ සැරියුත් තෙර වේද, ඔහුම අග්‍රය. මහණෙනි, යමෙක් තථාගතයේ වහන්සේ විසින්, පවත්වන ලද, ශ්‍රේෂ්ඨ ධර්මචක්‍රය මනාව අනුව පවත්වයිද, මහණෙනි, මෙම සැරියුත් තෙරණුවෝ යම්සේ එය කරත්ද? එබඳු වූ අන් එකද, පුද්ගලයෙකු හෝ මම නොදකින්නෙමි. මහණෙනි, සැරියුත් භික්ෂුව තථාගතයන් වහන්සේ විසින් පවත්වන ලද, උතුම් ධර්මචක්‍රය මනාව අනුව පවත්වයි යන මේ ආදී ක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රශංසා කරන ලද ආකාරයට අනුරූපව, තමාගේ ධාරණ බලය දක්වනුයේ සත්ත්වයින්ගේ අසනු කැමැත්ත උපදවයි. මා විසින් මෙසේ අසන ලදී. එයද වනාහි අර්ථ වශයෙන්, අක්ෂර වශයෙන්ද අඩුවැඩි නොවී එපරිද්දෙන්ම දැකිය යුතුය. අන් අයුරකින් නොවේ.

'මෙ' ශබ්දය, කරණ, සම්ප්‍රදාන, ෂෂ්ඨී අර්ථයන්හි පෙනේ. මෙහි වනාහි, මා විසින් අසන ලදී. මාගේ ඇසීමයයි යන අර්ථද්වයයෙහි යෙදේ.

**සුතං** යන මෙම ශබ්දය උපසර්ග සහිතවද, උපසර්ග රහිතවද ප්‍රකට, ගමන, තෙත්, රැස්කළ, යෙදීම, කණින් ශබ්ද තේරුම් ගැනීම්, ශ්‍රෝතද්වාරානුසාරයෙන් දැනගැනීම්හිද පෙනේ. මෙහි වනාහි ශ්‍රෝත ද්වාරානුසාරයෙන් සලකා බලන ලදුයේ හෝ සලකා බැලීම යැයිද අර්ථය වන්නේය. 'මෙ' ශබ්දයෙහි මා විසින් යයි අර්ථය ඇතිකල්හි, මෙසේ මා විසින් අසන ලදී. ශ්‍රෝත ද්වාරානුසාරයේන මෙසේ සලකා බලන ලදී යයි යෝග්‍යයයි. මාගේ යැයි අර්ථය ඇතිකල්හි, මෙසේ මාගේ ඇසීම ශ්‍රෝත ද්වාරානුසාරයෙන් සලකා බලන ලද්දේ යැයි සුදුසුයි. තවද, එව මෙම **සුතං** යනු තමා විසින් උපදවන ලද බව නොපිළිගනුයේ ප්‍රථම ශ්‍රවණය විවර කරනුයේ, මා විසින් චතුර් වෛශාරද්‍ය විශාරද, දශබලධාරී, ශ්‍රේෂ්ඨ

ස්ථානයෙහි සිට සිහනද නදන, සියලු සත්ත්වයින්ට උතුම්, ධර්මේශ්වර, ධර්මරාජ, ධර්මාධිපති, ධර්මදීප, ධර්ම සරණ, සද්ධර්මවර චක්‍රවර්ති සම්‍යක් සම්බුද්ධ, ඒ භාග්‍යවතුන් වහන්සේගේ, හමුයෙහි මෙය මා විසින් පිළිගන්නා ලදී. මෙම අර්ථයෙහි හෝ ධර්මයෙහි හෝ පදයෙහි හෝ අක්ෂරයෙහි හෝ, සැකයක් හෝ විමතියක් හෝ නොකටයුත්තාහුය. මෙම ධර්මයෙහිදී අශ්‍රද්ධාවත් භාවය විනාශ කරයි. ශ්‍රද්ධා සම්පත උපදවයි. එහෙයින් එය යූසේයි.

**විනාසයති අසසද්ධං - සද්ධං වඩ්ඪෙති සාසනෙ**
**එව මෙම සුතම්චෙචවං - වදං ගොතම සාවකො**

මෙසේ මා විසින් අසන ලදැයි යනුවෙන් මෙසේ කියන්නා වූ, ගෞතම ශ්‍රාවක තෙමේ අශ්‍රද්ධාව විනාශ කරයි. ශ්‍රද්ධාව දියුණු කරයි.

**එකං** යනු ගණන පිරිසිඳීම් නිර්දේශයයි. **සමයං** යනු පිරිසිඳීම් නිර්දේශයයි. **එකං සමයං** යනු කාලය අනියමෙන් දැක්වීමයි.

**සමවායෙ ඛණෙ කාලෙ - සමූහෙ හෙතු දිට්ඨීසු**
**පටිලාභෙ පහාණෙච - පටිවෙධෙච දිසසති**

එහි සමය ශබ්දය, රැස්වීමෙහි, ක්ෂණයෙහි, කාලයෙහි, සමූහයෙහි, හේතුවෙහි, දෘෂ්ටීන්හි, ප්‍රතිලාභයෙහි, ප්‍රහාණයෙහි, ප්‍රතිවේධයෙහිද පෙනේ.

මෙහි වනාහි කාලය යන අර්ථයි. එයින් සංවත්සර, ඍතු, මාස, අඩමස්, දිවා රාත්‍රී, පූර්වාහ්න, මධ්‍යාහ්න, සවස්කාලය, ප්‍රථම, මධ්‍යම, පශ්චිමාදී යාමයන්, මුහුර්තාදී කාලප්‍රභේද වූ සමයයන් අතරෙහි එක් සමයයකයැයි දක්වයි. එහි කිසිසේත් එම සංවත්සරාදී සමයයන්හි, යම් යම් සූත්‍රයක් යම් සංවත්සරයක, ඍතුවක, මාසයක, පක්ෂයක, රාත්‍රී කාලයෙහි, දිවා කාලයෙහි යයි දක්වන ලද්දේද, ඒ සියල්ල තෙරුන්ගේ ප්‍රඥායෙන් මනාව දන්නා ලදී. මනාව ව්‍යවස්ථාපිතය. යම්හෙයකින් වනාහි අසවල් සංවත්සරයෙහි, අසවල් ඍතුයෙහි, අසවල් මාසයෙහි, අසවල් පක්ෂයෙහි, අසවල් රාත්‍රී භාගයෙහි, අසවල් දිවා භාගයෙහි මා විසින් මෙසේ අසන ලදැයි, මෙසේ කී කල්හි සුවසේ ධාරණය කිරීමට හෝ, උදෙසීමට හෝ උදෙසවීමට හෝ නොහැකිය. බොහෝසේ කිවයුතුද

වේ. එහෙයින් එක් පදයකින්ම එම අර්ථය කැටිකොට 'එකං සමයං' යැයි වදාළහ.

යම් ආකර වූ මෙම, ගර්භාවක්‍රාන්තික සමය, ජාති සමය, සංවේග සමය, අභිනිෂ්ක්‍රමණ සමය, දුෂ්කර ක්‍රියා සමය, මාරවිජය සමය, බුද්ධත්වයට පත් සමය, ඉහාත්ම සුව විහරණ සමය, පිරිනිවන් සමය යැයි මේ ආදී භාග්‍යවතුන් වහන්සේගේ දෙව්මිනිසුන් අතර අතිශයින් බැබළුණු නොයෙක් කාල ප්‍රභේදයන්ම සමය නමැ. එම සමයයන් අතර දේශනා සමය සංඛ්‍යාත එක් සමයයෙකැයි දක්වයි. යම් මේ ඤාණ කරුණා කෘත්‍ය සමයයන්හි, කරුණා කෘත්‍යය සමයයි. ආත්මහිත පරහිත ප්‍රතිපත්ති සමයයන්හි, පරහිත ප්‍රතිපත්ති සමයයි. රැස්වූවන්ට කළයුතු ද්විකාර්ය සමයයන්හි, ධාර්මික කථා සමයයි. දේශනා ප්‍රතිපත්ති සමයයන්හි දේශනා සමයයි. එම සමයයන් අතර එක්තරා සමයක් සඳහා එක් සමයෙක්හි යැයි වදාළහ. යම් හෙයකින් වනාහි එක් සමයෙක්හියැයි අත්‍යන්ත සංයෝගාර්ථය හටගනීද, යම් සමයෙක්හි භාග්‍යවතුන් විහන්සේ මෙය හෝ අන්‍ය හෝ සූත්‍රාන්තයක් දේශා කළසේක්ද, අත්‍යන්තයෙන්ම එසමය කරුණා විහරණයෙන් වාසය කළ සේක. එහෙයින් එම අර්ථය බැබළවීම සඳහා මෙහි ද්විතියා වචන නිර්දේශය කරන ලදී. එහෙයින් එය යු.සේයි.

**තං තං අත්ථමපෙක්ඛිත්වා - භුමෙමන තරණෙනව**
**අඤ්ඤත්ථ සමයො වුතෙතා - උපයොගෙන සො ඉධා ති**

ඒ ඒ අර්ථ අපේක්ෂාකොට, සත්තමියෙන්, හෝ කරණයෙන්ද, අන් තන්හි සමය කියන ලදී. එය මෙහි ද්විතියාවෙන් දක්වයි.

පෞරාණිකයෝ වර්ණනා කරති. තසමිං සමයෙ හෝ තෙන සමයෙන හෝ තං සමයං හෝ යන එය කීම් මාත්‍ර භේදයකි. හැමතන්හිම සත්තමියටම අදාළ අර්ථයයි. එහෙයින් එකං සමයං යයි කී කල්හිද, එකසමිං සමයෙ එක් කලෙක්හි යැයි අර්ථය දතයුතුය.

**භගවා** යනු ලෝකයෙහි ගුරුන්ගෙත් ගුරු භගවා යැයි කියති. මෙතුමාණෝද, සියලු ගුණයන්ගෙන් විශිෂ්ට හෙයින්ද, සියලු සත්ත්වයින්ට ගුරුය. එහෙයින් භගවා යැයි දතයුතුය. පෞරාණිකයින් විසින්ද යු.සේයි.

**භගවාති වචනං සෙට්ඨං - භගවාති වචන මුත්තමං**
**ගරුගාරව යුත්තො සො - භගවා තෙන වුච්චතීති**

භගවා යන වචනය ශ්‍රේෂ්ඨය. භගවා යන වචනය උතුම්ය. එතුමාණෝ ගුරු ගෞරවයෙන් යුක්තය. එහෙයින් භගවායි යු.සේයි. තවද,

**භාග්‍යවා භග්ගවා යුත්තො - භගෙහිච විභත්තවා**
**භත්තවා වන්තගමනො - භවෙසු භගවා තතො'ති**

පිනැත්තේ, කෙලෙස් බිඳින ලද්දේද, වාසනාවෙන් යුක්ත වූයේ, සියලු ධර්මයන් මනාව බෙදා වෙන්කරන ලද්දේ,

භවයන්හි වැමෑරූ ගමන් ඇත්තේ, එහෙයින් භගවා නම් වේ. මෙම ගාථාවගේ වශයෙන්ද, එම පදයෙහි විස්තර වශයෙන් අර්ථය දතයුතුය. එය විශුද්ධි මාර්ගයෙහි බුද්ධානුස්මෘති නිර්දේශයෙහි යූසේයි. මෙතෙකින් මෙහි 'එවං' යන වචනයෙන් දේශනා සම්පත්තිය නිර්දේශ කරයි. 'මෙ සුතං' යනු ශ්‍රාවක සම්පත්තියයි. 'එකං සමයං' යනු කාල සම්පත්තියයි. 'භගවා' යනු දේශක සම්පත්තියයි.

සාවත්ථියං යන මෙහිද, සවත්ථ ඍෂිවරයාගේ නිවාසස්ථානය වූ නගරය සාවත්ථියි. කාකන්දි, මාකන්දි යම්සේද, මෙසේ අක්‍ෂර චින්තකයෝ කියති. අට්ඨකථාචාර්යයෝ වනාහි මෙසේ කියති. වෙළඳාම සඳහා භාණ්ඩ ගෙන යන පිරිස එක්වී, කවර භාණ්ඩ ඇත්දැයි විමසූකල්හි සියල්ල ඇත්තේ යයි යන වචනය ගෙන සාවත්ථි නම් වේ. හැමකල්හි සියලු උපකරණ සැවැත්හි රැස්කරන ලදී. එහෙයින් සියල්ල යන වචනය ගෙන සාවත්ථි යයි කියනු ලැබේ.

එම සැවතෙහි, සමීපාර්ථයෙහි සත්තමී වචනයි. **විහරති** යනු අවිශේෂයෙන්, ඉරියව්, දිව්‍ය, බ්‍රහ්ම, ආර්ය විහරණයන්හි, එක්තරා විහරණයකින් යුක්ත බව දැක්වීමයි. මෙහි වනාහි සිටීම, ගමන් කිරීම, හිඳගැනීම, සයනය ආදී ප්‍රභේදගත ඉරියව්හි එක්තරා ඉරියව්වක එක්වීම දැක්වීමයි. එහෙයින් සිටියේද, ගමන් කරනුයේද, හිඳිනුයේද, සයනය කරනුයේද, භාග්‍යවතුන් වහන්සේ වාසය කරත් කියාම දතයුතුය. ඒ භාග්‍යවතුන් වහන්සේ එක් ඉරියව් ප්‍රයෝගයක් අන් ඉරියව්වකින් මනාව

සිඳ, බිඳ නොවැටීම් මාත්‍රභාවයක් ගෙනයත්. පවත්වත්. එහෙයින් වාසය කරත් යයි යූ.සේයි.

**ජෙතවනෙ** යනු තමාගේ සතුරු ජනයා දිනයිනුයි ජෙතොයි. රජුගේ තම සතුරු ජන ජයග්‍රහණයෙන් හටගත්තේනුයි ජෙතොයි. යහපත කැමැත්තේ එයට මේ ආකාර නාමයම කරන ලදැයි ජෙතොයි. වැඩේනුයි වන නම් වේ. තම සම්පතින් සත්ත්වයින්ගේ භක්තිය ඇති කරයි. ස්නේහය උපදවයි යන අර්ථයි. නොයෙක් ආකාර පුෂ්ප සුගන්ධයන්ගෙන් හටගත් සන්තුෂ්ටියෙන් මත් කොවුල් ආදි විහඟ නාදයන්ගෙන්ද, මදනල සලිත රුක් අතුරිකිලි හා කොළවලින් එවු මා පරිභෝග කරවු යයි ප්‍රාණීන්ට යාඥා කරන්නාක් මෙනැයි අර්ථයි. ජේතගේ වනය ජේතවනංයි. එම ජේත නමැති රාජ කුමාරයා විසින් රෝපණය කරන ලද්දේ සංවර්ධනය කරන ලද්දේ, පරිපාලනය කරන ලද්දේ, ඔහුම එහි ස්වාමියා වූයේය. එහෙයින් ජේතවනං යැයි යූ.සේයි. එම ජේතවනයෙහි, වනය රෝපණය කරන ලද හා ස්වයංජාතයයි දෙවදෑරුම්ය. මෙයද වේළුවනාදීන්ද රෝපිතය. අන්ධවන මහාවනාදීහු ස්වයංජාතය.

**අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ යනු මව්පියවරුන් විසින් කරන ලද නම් වශයෙන්, ඒ සුදත්ත නම් ගෘහපති තෙමේ, සියලු කැමති දැයින්, සමෘද්ධිමත් හෙයින්, පහවූ මසුරුමල ඇතියේ, කරුණා ආදී ගුණයන්ගෙන් යුක්ත හෙයින්ද, සැමදා අනාථයින්ට බත් පිඩු දුන්නේය. එහෙයින් අනාථ පිණ්ඩික යයි යන සංඛ්‍යාවට ගියේය. මෙහි ප්‍රාණීහු සිත් අලවති. විශේෂයෙන් පැවිද්දෝනුයි ආරාමොයි.

එහි පුෂ්ප ඵලාදී සෝභායෙන්ද, නොදුරු, නොළං ආදී පස්වැදෑරුම් සේනාසනාංග සම්පත්තියෙන්ද, ඒ ඒ තැන්වලින් අවුත් සිත් අලවත්. සතුටින් කල් යවත්. නොකලකිරී වාසය කෙරෙත් යයි අර්ථයි. කියන ලද ආකාර සැපතින් පිරී ඇති හෙයින්, ඒ ඒ තන්හි ගියේද, තම අභ්‍යන්තරයට ගෙනවුත් සිත් අලවයිනුයි ආරාමොයි. එය වනාහි අනාථ පිණ්ඩික ගෘහපතියා විසින්, අටළොස් කෝටියක් රන්කහවණු ඇතිරවීමෙන්, ජේත නම් රජකුමරුන්ගේ අතින් මිලට ගෙන රන් කහවණු අටළොස් කෝටියකින් සෙනසුන කරවා, රන් කහවණු අටළොස් කෝටියකින් මහා විහාරය නිමවා, මෙසේ රන් කහවණු සිව්පණස් කෝටියක් පරිත්‍යාගයෙන් බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට භාරදෙන ලදී. එහෙයින් අනාථ පිණ්ඩිකගේ ආරාම

යැයි යූ.සේයි. එම අනාථ පිණ්ඩිකගේ ආරාමයෙහි, මෙහිද 'ජේතවනෙ' යන වචනය පළමු හිමිකරු වර්ණනා කිරීමයි. 'අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ' පසු හිමිකරු වර්ණනා කිරීමයි. ඔවුන්ගේ වර්ණනා කිරීමෙන් කවර ප්‍රයෝජනයෙක්ද? පුණ්‍යකාමීන්ට (දෘෂ්ටානුගතියට) දුටු දේ අනුව යාමට පැමිණීම සඳහායි. එහි වනාහි, දොරටු, තාප්ප, ප්‍රාසාද තැනීමෙහිලා, භූමිය විකිණීමෙන් ලත් අටළොස් කෝටියක් රන් කහවණුද, නොයෙක් කෝටි ගණන් වටනා වෘක්‍ෂද ජේතගේ පරිත්‍යාගයි. සිව්පණස් රන් කහවණු අනාථ පිණ්ඩිකගේය. මෙසේ ඔවුන්ගේ ගුණ වර්ණනා කිරීමෙන් මෙසේ පුණ්‍යකාමීහු පින් කරත්යැයි දක්වනුයේ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අනෙකුත් පුණ්‍යකාමීන්ද, ඔවුන්ගේ දෘෂ්ටානුගතියට පැමිණීමෙහි යොදවති. එහි පැනයක් වේ. භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර, දෙව්රම්හි අනාථ පිණ්ඩිකගේ අරම්හි වෙසෙති යයි නොකිවයුතුය. තවද එහි වසති. සැවතෙහි යති නොකිව යුතුය. දෙතැනක එක් වේලාවක වසන්ට නොහැකිය. එය එසේ නොදැකිය යුතුය. සමීපාර්ථයෙහි සතතමීයයි කියන ලදුයේ නොවේද? යම්සේ ගංගා යමුනා නදීන්ට සමීපයෙහි ගව රංචු සරන්නාහු ගංගා නම් ගඟෙහි යමුනා නම් ගඟෙහි සරතියි කියත්ද? එපරිද්දෙන් මෙහිද යම් මේ සැවැතට සමීපයෙහි දෙව්රම්හි අනාථපිණ්ඩිකගේ ආරාමයයි. එහි වසනුයේ සැවැත්හි, දෙව්රම්හි අනාථපිණ්ඩිකගේ ආරාමයෙහි වාසය කරත් යයි යූ.සේයි.

ගොදුරුගම දැක්වීම සඳහා සැවැත් යන වචනය වන්නේය. ප්‍රව්‍රජිතයාට සුදුසු වාසස්ථාන දැක්වීම සඳහා සෙසු වචනයි. එහි සැවත වර්ණනා කිරීමෙන්, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ ගෘහස්ථ අනුග්‍රහ කරණය දක්වයි. ජේතවනාදිය වර්ණනා කිරීමෙන් ප්‍රව්‍රජිතයින්ට අනුග්‍රහ කරණයයි. පළමුවැන්නෙන් ප්‍රත්‍යය ග්‍රහණයෙන් ශරීරය තදින් පීඩාවට පත්කිරීමේ යෙදීමේ දුරුලීමයි. පශ්චිමයෙන්, වස්තුකාම ප්‍රහාණයෙන් කාමසුඛල්ලිකානුයෝගය දුරුලීමේ උපායයි. නොහොත් පළමුවැන්නෙන් ධර්මදේශනාවන්හි යෙදීමයි. පශ්චිමයෙන් විවේකයෙහි ඇලුණු බවයි. පළමුවැන්නෙන් කරුණාවෙහි එළැඹීමයි. පශ්චිමයෙන් ප්‍රඥාවෙහි ඉවත්වීමයි. පළමුවැන්නෙන් සත්ත්වයින්ට හිතසුව නිෂ්පාදනයෙහි ඇලුණු බවයි. පශ්චිමයෙන් අන්‍යයන්ට හිතසුව ඇති කරලීමෙහි නොතැවරීමයි. පළමුවැන්නෙන් ධාර්මික සුව අත්හැරීම් හේතුව වූ පහසු විහරණයයි. පශ්චිමයෙන් ධ්‍යාන මාර්ග ඵලාදී උසස් මනුෂ්‍ය ධර්මයන්හි යෙදීමේ කරුණයි. පළමුවැන්නෙන්

මනුෂ්‍යයන්ට උපකාර බහුලතාවයි. පශ්චිමයෙන් දෙවියන්ට උපකාර බහුලතාවයි. පළමුවැන්නෙන් ලොව උපන්නහුට ලොවෙහි සංවර්ධිත ස්වභාවයයි. පශ්චිමයෙන් ලෝකයෙහි නොතැවරුණු ස්වභාවයයි. පළමුවැන්නෙන්, මහණෙනි ලෝකයෙහි උපදනා වූ එක් පුද්ගලයෙක් බොහෝ ජනයාට හිත පිණිස, බොහෝ ජනයාට සුව පිණිස, ලෝකානුකම්පාව පිණිස දෙව් මිනිසුන්ට වැඩ පිණිස, සුව පිණිස, උපදියි. කවර එක් පුද්ගලයෙක්ද? තථාගත අර්හත් සම්‍යක් සම්බුදු රදාණෝය, යන වචනයෙන් යම් අර්ථයක් සඳහා භාග්‍යවතුන් වහන්සේ උපන් සේක්ද, එම අර්ථය දැක්වීමය. පශ්චිමයෙන් යම්තැනෙක්හි උපන්නේද, එයට අනුරූප විහරණය දැක්වීමයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි පළමුව ලුම්බිණි -යෙහිද, දෙවනුව බෝමැඩෙහිදැයි ලෞකික ලෝකෝත්තර උත්පත්තියෙන් වනයෙහිම උපන්නේය. එහෙයින්, මෙතුමන් වහන්සේගේ වනයෙහිම විහරණයි දැක්වූයේ යයි මේ ආදී ක්‍රමයෙන් මෙහි අර්ථ යෙදීම දතයුත්තාහ.

**තත්‍ර** යනු දේශ, කාල දැක්වීමයි. එය වනාහි යම් සමයෙක්හි වෙසේද එම සමයෙහි, යම් කලෙක්හි දෙව්රමෙහි වෙසේද, එකල්හි දෙව්රම යැයි දක්වයි. කීමට සුදුසු දේශ, කාලයන් දක්වයි. භාග්‍යවතුන් වහන්සේ නුසුදුසු දේශයෙහි හෝ කාලයෙහි හෝ ධර්මයි දේශනා නොකරත්. 'බාහිය එතෙක් නොකල්යයි' ආදිය මෙහි සාධකයි. **ඛො** යනු පද පූර්ණ මාත්‍රයෙහි හෝ එකක් වෙන්කොට දැක්වීමෙහි, පුරාණ සිද්ධියක් දැක්වීමෙහි නිපාතයි. **භගවා** යනු ලෝකගුරු භාවය දැක්වීමයි. **භික්ඛූ** යනු කථා ශ්‍රවණයෙහි යෙදුණු පුද්ගල වචනයයි. තවද මෙහි පිඬු සිඟානුයි භික්ෂු නමැ. පිඬු සිඟීම් චර්යාවට පැමිණියේනුයි භික්ෂු යයි ආදී ක්‍රමයෙන් වචනාර්ථය දතයුතුය. **ආමන්තෙසි** යනු කථා කළේය. කීයේය. ආමන්ත්‍රණය කළේය. මෙහි මේ අර්ථයයි. අන් තන්හි වනාහි හැඟවීමෙහිද, කැඳවීමෙහිද **භික්ඛවො** යයි අමතන ආකාරය දැක්වීමයි. ඉන් ඒ භික්ෂූන්ගේ සිඟන සීලිබව, සිඟන ස්වභාවය, සිඟීමෙහි යහපත් ක්‍රියාකාරිත්වය ආදී, ගුණයෝග සිද්ධ වචනයෙන්, උසස් පහත් ජන සෙවුනා පැවැත්ම ප්‍රකාශ කරනුයේ, උඩඟු හා දීනභාවයට නිග්‍රහ කරයි. 'භික්ඛවො' යන මෙයින්ද, කරුණාව පැතිරුණ සෞම්‍ය හෘදය හා ඇස් හෙළීම් පූර්වාංගම වචනයෙන් ඔවුහු තම මුව අබිමුව කරනුයේ, එහෙයින්ම කියනු කැමැත්ත දක්වන වචනයෙන්, ඔවුන්ට අසනු කැමැත්ත හටගනියි. එහෙයින්ම ආමන්ත්‍රණාර්ථ වචනයෙන් මනා ශ්‍රවණ, මෙනෙහි කිරීම්හි ඔවුහු යොදවයි. සාසන සම්පත මනාව ශ්‍රවණ, මනසිකාර හා බැඳී පවත්තේය.

වෙනත් දෙව් මිනිසුන් විද්‍යමාන කල්හි කවර හෙයින් භික්ෂූන්ම ආමන්ත්‍රණය කළේද යත්, ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨ, ආසන්න හැමකල්හි තැන්පත් තාවයන් පිහිටන ස්වභාව හෙයිනි. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව සියලු පිරිසට සාධාරණය. පිරිසෙහිද, පළමුව උපන් හෙයින් ඔවුහු ජ්‍යෙෂ්ඨයෝය. අනගාරිකභාවය ආදීකොට ශාස්තෘ චර්යානුකූලව ක්‍රියා කරන හෙයින්ද, සමස්ත ශාසනයාගේ ප්‍රතිග්‍රාහකත්වය දරන හෙයින්ද ශ්‍රේෂ්ඨය. එහි හුන් කල්හි ශාස්තෘන් වහන්සේට සමීප හෙයින් ආසන්නය. ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි හැසිරෙන හෙයින් හැමකල්හි තැන්පත් වූවාහු වෙති. ධර්මදේශනාවටද ඔවුහුම බඳුන් වෙති. අනුසාසික පරිදි ප්‍රතිපත්ති සම්පාදනය කරන හෙයිනි. එහි මෙම පැනය වන්නේය. කවර කරුණක් සඳහා භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරන සේක් ප්‍රථමයෙන් භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක්ද, ධර්මයම නොදෙසූද? සිහිය ඉපදවීම සඳහායි. පිරිසෙහි භික්ෂූහු අනෙකක් සිතන්නාහුද, විසිරුණු සිත් ඇත්තාහුද, ධර්මය ප්‍රත්‍යවේක්ෂා කරන්නාහුද, කමටහන් මෙනෙහි කරන්නාහුද හුන්නාහු වෙති. ඔවුහු ආමන්ත්‍රණය නොකොට ධර්මය දෙසන කල්හි, මේ දේශනාව කුමක් නිදානකොටද, කුමක් ප්‍රත්‍යයකොටද, කවර අර්ථෝත්පත්තියක් මුල්කොට දෙසන ලදදැයි සලකන්ට නොහැකි වනුයේ වික්ෂේපයට පැමිණෙන්නාහුය. වැරදි ලෙස තේරුම් ගන්නාහුය. එහෙයින් ඔවුන්ට සිහිය හටගැන්වීම සඳහා, භාග්‍යවතුන් වහන්සේ ප්‍රථමයෙන් ආමන්ත්‍රණයි කොට පසුව ධර්මය දේශනා කරත්.

භදන්‍තෙ යනු එය ශාස්තෘන් වහන්සේට කරන ගෞරව වචනයකි. ප්‍රතිවචන දීම හෝ වෙයි. තවද මෙහි භික්ඛවෝයි වදාරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂූන් ආමන්ත්‍රණය කරත්. භදන්‍තෙ යයි කියන්නා වූ ඔවුහු පසු ආමන්ත්‍රණය කරත්. එසේම භික්ඛවො යයි භාග්‍යවතුන් වහන්සේ වදාරත්. භදන්‍තෙ යයි ප්‍රතිවචන දෙති.

තෙ භික්ඛූ යනු භාග්‍යවතුන් වහන්සේ යම් කෙනෙකුන්ට ආමන්ත්‍රණය කරත්ද? ඔවුහු **භගවතො පච්චස්සොසුං** යනු භාග්‍යවතුන් වහන්සේගේ ආමන්ත්‍රණයට උත්තර දුන්නාහ. අභිමුඛ වී ඇසූහ. මනාව පිළිගත්හ. පිළිගත්හ යන අර්ථයි. **භගවා එතදවොච** යනු භාග්‍යවතුන් වහන්සේ එම දැන් දෙසිය යුතු සියලු සූත්‍රය වදාළහ.

මෙතෙකින් ආයුෂ්මත් සැරියුත් තෙරුන් විසින්, නෙළුම් මහනෙල්

මල්වලින් බබළන, පිරිසිදු, යහපත් රසඳිය දහරින් යුත්, පොකුණෙක්හි සුවසේ බැසීම සඳහා, නිර්මල ගල් තලායෙක හිණිමගක්, සකසන්නාක් මෙන්ද, විසිරුණා වූ මුතුදැලක් සමාන වැලිවලින්, ගැවසීගත්, ශ්වේත භූමි භාගයෙක්හි පිහිටි තොටුපළක් මෙන්, මනාව බෙදන ලද බිත්තීන් සහිත විසිතුරු වේදිකාවකින් වටකරන ලද, තාරකා ගමන්මග, ස්පර්ශ කරනු කැමැත්තේ මෙන්, ඇඟ කිලිපොළා යන අහස උසට නංවන ලද, මහා ප්‍රාසාදයකට සුවසේ නැගීම සඳහා ඇත්දළමය සියුම් මෘදු පුවරුව රත්රන් වැලකින් ඔතා මාණික්‍යාලෝකයෙන්, හටගන්නා ආලෝකයෙන් බබළන හිණිමගක් මෙන්ද, රන්, රන්වළලු, පාවළලු ආදිය ගැටීමෙන් වන ශබ්ද සම්මිශ්‍රිත, කථාකරන, සිනහසෙන, මධුර ස්වරයෙන් ගෘහවාසීන් සේවිත, උදාර ඓශ්වර්ය සම්පත්තීන්ගෙන්, ශෝභමාන වූ, මහා ගෘහයට සුවසේ පිවිසීම සඳහා, රන්රිදී, මැණික්, මුතු, පබළු ආදියෙන් බබළන ඉතා පිරිසිදු බැබළීම් සහිත මනාව පිහිටි විශාල දොර කවුළුවක (උලුවස්සක) මහාදොරක් මෙන්, අර්ථ ව්‍යංජන සම්පූර්ණ වූ, බුදුවරුන්ගේ දේශනා, ඥාණ ගම්භීරභාවය ප්‍රකාශ කරන්නා වූ, මෙම සූත්‍රයෙහි මනාව අර්ථග්‍රහණය සඳහා කාල, දේශ, දේශක, පිරිස, ප්‍රදේශ යන අංගයන්ගෙන් යුක්ත, යම්බඳු වූ නිදානය වදාරන ලද්දේද? එහි අර්ථ වර්ණනාව සමාප්තයි.

සූත්‍රාන්තයෙහි, **පඤ්ච** යනු ගණන් පිරිසිඳීමයි. **ඉමානි ඉන්‍ද්‍රියානි** යනු පිරිසිඳි ධර්ම (නිදර්ශනයයි) දැක්වීමයි. ඉන්‍ද්‍රියාර්ථය යට යූ.සේයි. දැන් මේ සූත්‍රාන්තය ඉදිරිපත්කොට, මෙම සූත්‍රාන්තයෙහි කියන ලද, ඉන්‍ද්‍රියයන්ගේ විශුද්ධි භාවනා නියමය වැඩීමද, සංසිඳීමද දක්වනු කැමැතියේ, 'ඉමානි පඤ්චින්‍ද්‍රියානි' යනාදිය වදාළහ. එහි **විසුජ්ඣනති** යනු විශුද්ධියට පැමිණෙත්. **අසද්ධෙ** යනු ත්‍රිවිධ රත්නයෙහි ශ්‍රද්ධා විරහිත වූයේ, **සද්ධෙ** යනු ත්‍රිවිධ රත්නයන්හි ශ්‍රද්ධා සම්පන්න වූයේ. **සෙවතො** යනු සිතින් සෙවුනාහට, **භජතො** යනු එළැඹෙන්නහුට, **පයිරුපාසතො** යනු සකස්ව හිඳින්නහුට, **පසාදනීයෙ සුත්තනෙත** යනු ප්‍රසාදජනක තුණුරුවන්හි ගුණ හා ඒකාබද්ධ සූත්‍රාන්තයන්, **කුසීතෙ** යනු පිළිකුල් ආකරයෙන් ගිලාබසීනුයි කුසීදායි. කුසීදාම කුසීතායි. එම කුසීතකම්හි, **සම්මප්පධානෙ** යනු සිව් කිස් සිදුකරන වීර්ය හා වීර්යය හා යෙදුණු සූත්‍රාන්තයන්හි, **මුට්ඨස්සති** යනු නට සිහි ඇත්තවුන්, **සතිපට්ඨානෙ** සතිපට්ඨාන ප්‍රාර්ථනා ඇතිකරන සූත්‍රාන්තයන්, **දුප්පඤ්ඤෙ** යනු ප්‍රඥා රහිත, ප්‍රඥාවගේ අභාවයෙන් හෝ දුෂ්ට වූ ප්‍රඥාව ඔවුන්ටනුයි දුප්පඤ්ඤායි.

එම දුෂ්ප්‍රාඥතාවත්, **ගම්භීර ඤාණචරියං** යනු සිව්සස්, ප්‍රතීත්‍ය සමුත්පාද, ප්‍රතිසංයුක්ත සූත්‍රාන්තයන්, ඤාණකථා සමානවම හෝ **සුත්තකබන්ධෙ** යනු සූත්‍රාන්ත කොට්ඨාශයන්හි, **අසසද්ධියං** යනාදීන්හි, අසසද්ධියං යනු අශ්‍රද්ධාවත් භාවයයි. අශ්‍රද්ධායෙහි ආදීනව දක්නාසුලු වූයේ, අශ්‍රද්ධාව දුරලනුයේ ශ්‍රද්ධා ඉන්ද්‍රියයෙහි අනුසස් දක්නාසුලු වූයේ, ශ්‍රද්ධා ඉන්ද්‍රියය දියුණු කරනුයේ අශ්‍රද්ධාව දුරලයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **කොසජ්ජං** යනු කුසීතභාවයයි. පමාදං යනු සිහියෙන් තොරව විසීම, **උද්ධච්චං** යනු නොසන්සුන් බවයි. වික්ෂෙපයයි යන අර්ථයි. **පහීණතතා** යනු අර්පණා වශයෙන් ධ්‍යාන සම්පූර්ණ වීමෙන් ප්‍රහීණ හෙයින්, **සුපපහීණතතා** යනු ව්‍යුත්ථාන ගාමිණී වශයෙන් විදර්ශනාවගේ පරිපූර්ණත්වයෙන්, මනාව ප්‍රහීණ වූ හෙයින්, **භාවිතං හොති සුභාවිතං** කියන ලද ක්‍රමයෙන්ම යෙදිය යුතුය. විදර්ශනාවට විපක්ෂ වශයෙන් ප්‍රහීණ හෙයින් මනාව ප්‍රහීණ වූයේයයි කියන්ට සුදුසුයි. එහෙයින්ම මනාව වඩන ලදී. ධ්‍යානයෙන් එසේ නොවේ. ප්‍රහාණය කළයුතු දෑහි ප්‍රහාණයෙන් භාවනාව සිද්ධ වූයේද, භාවනා සිද්ධියෙන්ම ප්‍රහාණය කළයුතු දෑහි ප්‍රහාණ සිද්ධිය වේ. එනිසා යමකයක් වශයෙන් නිර්දිෂ්ටය.

සන්සිඳීම් වාරයෙහි **භාවිතාති චෙව හොනති සුභාවිතාති** ච යනු වඩන ලද්දවුන්ගේම මනාකොට වැඩීම **පටිපපසසද්ධානිච සුපපටිපපසසද්ධානිච** යනු සංසිඳවූවන්හිම මනාකොට මනාකොට සංසිඳීම යු.සේයි. ඵලක්ෂණයෙහි මාර්ග කෘත්‍යය නිපදවීම් වශයෙන් වඩන ලද ස්වභාවය සන්සිඳීම්තාවැයි දතයුත්තාහ. **සමුචෙඡද විසුද්ධියො** යනු මාර්ග විශුද්ධීහුමය. **පටිපපසසද්ධි විසුද්ධියො** යනු ඵල විශුද්ධීහුය.

දැන් එසේ කියන ලද නියමයන්, ඉන්ද්‍රිය, කාරක පුද්ගල වශයෙන් යොදා, දක්වන්ට කතීනං පුගගලානං ආදිය වදාළහ. එහි **සවණෙන බුද්ධො** යනු සම්‍යක් සම්බුදුරදුන් කෙරෙන් ධර්මකථා ශ්‍රවණයෙන් සිව්සස් අවබෝධ කරන ලදුයේ දැනගන්නා ලද්දේ හෝ යන අර්ථයි. මෙය වඩනා ලද ඉන්ද්‍රියභාවයට හේතුවචනයි. භාවනාවගේ අවබෝධ වීම් වශයෙන් මාර්ගය අවබෝධ කළහෙයින් ඵලක්ෂණයෙහි භාවිතින්ද්‍රිය නම් වෙයි. අටවැදෑරුම් ආර්යයෝ තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක හෙයින් විශේෂකොට අර්හත් ඵලස්ථයාම දක්වන්නාහු **ඛීණාසවොයි** වදාළහ.

හෙතෙමේම සියලු කෘත්‍යය සම්පූර්ණ වීමෙන් භාවිතින්ද්‍රිය යැයි

යූ.සේයි. අනෙක් අයද ඒ ඒ මාර්ග කෘත්‍යය සම්පූර්ණවීම් ආකාරයෙන් භාවිතින්ද්‍රියයෝමය. එහෙයින්ම සිව් ඵලක්‍ෂණයන්හි පංචින්ද්‍රියයෝ වඩන ලද්දාහුම වෙති. මනාකොට වඩන ලද්දාහුයයි යූ.සේයි. ඔවුන්ගේ මතු මාර්ග සඳහා ඉන්ද්‍රිය භාවනා ඇත්තේමය. එහෙයින් ඒවා අවිශේෂයෙන් භාවිතින්ද්‍රිය නොවේ. **සයමභූතට්ඨෙන** යනු අනාචාර්යව, තෙමේම ආර්ය ජාතියෙහි වූ අර්ථයෙන් හටගත් අර්ථයෙන්, භාග්‍යවතුන් වහන්සේ තෙමේම භාවනා ඉෂ්ටවීම් වශයෙන් ඵලක්‍ෂණයෙහි සයම්භූ නම් වේ. මෙසේ ඵලක්‍ෂණයෙහි තෙමේම හටගත් අර්ථයෙන් භාවිතින්ද්‍රියයි, **අප්පමෙය්‍යට්ඨෙන** යනු කෙළවරක් නොමැති ගුණ යෙදීමෙන් ප්‍රමාණ කරන්ට නොහැකි වන්නේය යන අර්ථයෙන්, භාග්‍යවතුන් වහන්සේ ඵලක්‍ෂණයෙහි භාවනා ඉෂ්ටවීමෙන්, අප්‍රමෙය්‍යයි, එහෙයින්ම භාවිතින්ද්‍රියෝයි.

## ප්‍රථම සූත්‍රාන්ත නිර්දේශ වර්ණනාව නිමි.

නැවත අන් සූත්‍රාන්තයක් බහා ඉන්ද්‍රිය නියමය නිර්දේශ කරනු කැමැතියේ, **පඤ්චිමානි භික්ඛවෙ** යන ආදී සූත්‍රාන්තයේ දක්වයි. එහි **යෙහි කෙචි** යනු ශේෂ රහිත ගැනීමයි. හිකාරය පද පූරණ මාත්‍ර නිපාතයි. **සමණාවා බ්‍රාහමණා වා** යනු ලෝක ව්‍යවහාර වශයෙන් යූ.සේයි. **සමුදයං** යනු ප්‍රත්‍යයයි. **අත්ථංගමං** යනු හටගත් දැහි අභාවයට යාම, නූපන් දැහි නොඉපැත්ම හෝ, **අස්සාදං** යනු අනුසස්, **ආදීනවං** යනු දොස්, **නිස්සරණං** යනු නික්මයාමයි. **යථාභූතං** යනු තත්වාකාර, **සමණෙසු** යනු සංසිඳවූ පාපයන් ඇත්තවුන් කෙරෙහි, **සමණ සම්මතා** යනු මවිසින් ශ්‍රමණයන් සම්මත නුවූවාහු, සම්මතා යයි වර්තමාන කාල වශයෙන් කියනු ලබන කල්හි ශබ්ද ලක්‍ෂණ වශයෙන් මාගේ යයි මෙහි ෂෂ්ඨී වචනයම වෙයි. **බ්‍රාහමණෙසු** යනු බහා තැබූ පාපයන් ඇත්තවුන් කෙරෙහි, **සමාඤ්ඤත්ථං** ශ්‍රමණ භාවයාගේ අර්ථයයි. **බ්‍රහමඤ්ඤත්ථං** යනු බ්‍රාහ්මණ භාවයෙහි අර්ථයයි. ද්වයෙන්ම අර්හත් ඵලයම යූ.සේයි. නොහොත් **සාමඤ්ඤත්ථං** යනු යට ඵලත්‍රයයයි. **බ්‍රහමඤ්ඤත්ථං** යනු අර්හත් ඵලයයි. සාමඤ්ඤ බ්‍රහමඤ්ඤ යනු ආර්ය මාර්ගයමය. **දිට්ඨෙව ධම්මෙ** යනු වර්තමාන ආත්මභාවයෙහි, **සයං අභිඤ්ඤා සච්ඡිකත්වා** යනු තමා විසින්ම අධික වූ ඤාණයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට, **උපසම්පජ්ජ** යනු පැමිණ හෝ නිපදවා හෝ.

සූත්‍රාන්ත නිර්දේශයෙහි, පළමුව, ඉන්ද්‍රිය හටගැනීම් ආදීන්හි ප්‍රභේද සංඛ්‍යාව විචාරා නැවත ප්‍රභේද සංඛ්‍යාව විසඳන ලදී. එහි **අසීති සතං** යනු එක්සිය අසූවකි. පණ්ඩිතයන් විසින් එක්සිය අසූවකැයි කියන ලද ආකාරයන්ගෙන් යෙදීමයි.

නැවත ප්‍රභේද සංඛ්‍ය විමැසීම් පූර්වාංගම සංඛ්‍යා නිර්දේශයෙහි, **අධිමොක්ඛත්ථාය** යනු ස්ථිර ලෙස පිහිටීම සඳහා, විශ්වාස කිරීම සඳහා, **ආවජ්ජනාය සමුදයො** යනු මනෝද්වාරාවර්ජන චිත්තයෙහි හටගැන්ම, **සද්ධින්ද්‍රියස්ස පච්චයො** යනු ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වේ. ශ්‍රද්ධාව උපදවන්නෙමියි පූර්වභාග ආවර්ජනය ශ්‍රද්ධෙන්ද්‍රියට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ශ්‍රද්ධෙන්ද්‍රිය ජවනයාගේ ආවර්ජනය ප්‍රථම ජවනයට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ද්විතීය ජවනාදීන් උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. **අධිමොක්ඛවසෙන** යනු ඡන්දය හා සම්ප්‍රයුක්ත සිතේ ස්ථිරත්වය වශයෙන්, **ඡන්දස්ස සමුදයො** යනු පූර්වභාග ආවර්ජන ප්‍රත්‍යයෙන් උපන්නා වූ අධිමොක්ෂ සම්ප්‍රයුක්ත අනුරූප නිසි ප්‍රමාණ වූ, ධර්මඡන්දයාගේ හටගැන්මයි. ඒ ශ්‍රද්ධෙන්ද්‍රියයට සහජාත, අඤ්ඤමඤ්ඤ නිස්සය සම්ප්‍රයුක්ත, අත්ථි, අවිගත වශයෙන් ප්‍රත්‍යය වේ. ඡන්දය අධිපති කල්හි අධිපති ප්‍රත්‍යයද වේ. එයම දෙවැන්නට අනන්තර සමනන්තර, අනන්තරූප නිශ්‍රය, ආසෙවන, නත්ථි, විගත වශයෙන් ප්‍රත්‍යය වේ. මෙම ක්‍රමයෙන්ම මනසිකාරයෙහිද යෙදීම් කළයුත්තාහ. හුදෙක් මෙහි **මනසිකාරො** යනු එය සිහිකරවීම් ලක්ෂණකොට ඇත්තේය. අනුරූප නිසිප්‍රමාණ මෙනෙහි කිරීම, එයට අධිපති ප්‍රත්‍යයතාව නොවේ. මේවා හා යෙදුණු ද්වයෙහිම ග්‍රහණය බලවත් ප්‍රත්‍යය හෙයිනැයි දතයුතුය. **සද්ධින්ද්‍රියස්ස වසෙන** යනු භාවනාභිවෘද්ධියෙන් ඉන්ද්‍රියභාවයට පත් ශ්‍රද්ධා ඉන්ද්‍රියයගේ වශයෙනි. **එකත්තුපට්ඨානං** යනු එක් අරමුණෙක්හි නොසෙල්වෙන ස්වභාවයෙන් බොහෝකලක් සිටීම (පැවතීම) මතු මතු ශ්‍රද්ධා ඉන්ද්‍රියයට ප්‍රත්‍යය වේ. ශ්‍රද්ධා ඉන්ද්‍රියයෙහි කියන ලද ආකාරයෙන්ම සෙසු ඉන්ද්‍රියයන්ද දතයුත්තාහ.

මෙසේ එක් එක් ඉන්ද්‍රියයට සිව් සිව් සමුදය යැයි පඤ්ච ඉන්ද්‍රියයන්ට විසි සමුදයයෝ වෙත්. නැවත සිව් සමුදයන්ගේ එක් එක් සමුදයෙහි, පහක් පහක් බැගින්, ඉන්ද්‍රියයන් යොදා විසි සමුදය කෙනෙක් යූ.සේයි. ප්‍රථම විස්ස නානා මාර්ග වශයෙන් දතයුත්තාහ. ද්විතීය විස්ස එක් මාර්ගයක් වශයෙන් දතයුත්තේ යයි කියති. මෙසේ සතළිස් ආකාර වෙති. අස්තංගම වාරයද මෙම ක්‍රමයෙන් දතයුතුය. එම අස්තංගමය

ඉන්‍ද්‍රිය භාවනාවෙහි නොයෙදුණහුට, නොලත් දෑ ලැබීම් අස්තංගමයයි, ඉන්‍ද්‍රිය භාවනාවෙන් පිරිහුණහුට ලත් දෑ පිරිහීම් අස්තංගම යයි, ඵලප්‍රාප්තිකයාට සන්සිඳීම් අස්තංගමයයි, **එකතත අනුපට්ඨානං** යනු ඒකත්වයෙහි නොසිටීම,

ආස්වාද නිර්දේශයෙහි, **අසසද්ධියසස අනුපට්ඨානං** යනු අශ්‍රද්ධාවත් පුද්ගලයින් දුරුකරනුයේ, ශ්‍රද්ධාවත් පුද්ගලයන් සෙවුණේ, ප්‍රසාදනීය සූත්‍රාන්තයන් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි, එහි නුවණින් මෙනෙහි කරනුයේ, බහුල වශයෙන් කරනුයේ, අශ්‍රද්ධාවගේ නොඑළඹ සිටීම වේ. **අසසද්ධිය පරිළාහසස අනුපට්ඨානං** යන මෙහි අශ්‍රද්ධාවත් වූවහුට ශ්‍රද්ධා කථා පවත්නා කල්හි දුක් දොම්නස් උපදී. මේ අශ්‍රද්ධභාව සංඛ්‍යාත පරිදාහයයි. **අධිමොකඛ චරියාය වෙසාරජ්ජං** යනු ශ්‍රද්ධා වස්තු වශයෙන් වසීප්‍රාප්ත භාවනායෙහි ශ්‍රද්ධාවගේ පැවැත්මෙහි නිපුණ වූ භාවයයි. **සනෙතාව විහාරාධිගමො** යනු සමථයෙහි හෝ විදර්ශනායෙහි ප්‍රතිලාභයයි. **සුඛං සොමනසසං** යන මෙහි චෛතසික සුවපත්භාවය දැක්වීමට සොමනසස වචනයයි. ශ්‍රද්ධෙන්ද්‍රියයෙන් හටගත් ප්‍රණීත රූප ස්පර්ශිත කයෙහි කායික සුවයද ලැබේමය. සුවය හා සොම්නස ප්‍රධාන ආස්වාදයන් බැවින් මේ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ ආස්වාදයැයි වෙසෙසා යූසේයි. මෙම ක්‍රමයෙන් සෙසු ඉන්ද්‍රියයන්ගේද යෙදීම් දතයුත්තේය.

ආදීනව නිර්දේශයෙහි, **අනිච්චටෙඨන** යනු ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අනිත්‍යාර්ථයෙන්, ඒ අනිත්‍යාර්ථය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ ආදීනව යැයි යූ.සේයි. අනෙක් ද්වයෙහිද එම ක්‍රමයමැයි. මේවාහි, හටගැන්ම, අස්තංගම, ආස්වාද, ආදීනව ලෞකික ඉන්ද්‍රියයන් මෙනැයි දතයුත්තේය.

නිසසරණ නිර්දේශයෙහි, **අධිමොකඛටෙඨන** යන ආදීන්හි එකිනෙකෙහි ඉන්ද්‍රියයන් පහ, පහ බැගින්කොට, පඤ්ච ඉන්ද්‍රියයන්ගේ පස්විසි නිස්සරණයෝ මාර්ගඵල වශයෙන් විස්තර කරන ලදහ. එහි **තතො පණීත තර සද්ධින්ද්‍රියසස පටිලාභා** යන විදර්ශනා ක්ෂණයෙහි පැවැති ශ්‍රද්ධෙන්ද්‍රියයට වඩා, මාර්ගක්ෂණයෙහි ප්‍රණීතතර ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ ප්‍රතිලාභ වශයෙන්, **පුරිමතර සද්ධින්ද්‍රියා නිසසටං හොති** යනු එම මාර්ගක්ෂණයෙහි පැවැති ශ්‍රද්ධෙන්ද්‍රිය පළමු විදර්ශනාක්ෂණයෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය කෙරෙන් නික්මුණේ වේ. මෙම ක්‍රමයෙන්ම ඵලක්ෂණයෙහි ශ්‍රද්ධෙන්ද්‍රියයද, දෙතැන්හි සෙසු ඉන්ද්‍රියයෝද යෙදිය යුත්තාහ. **පුබ්බභාගෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි**

යනු ප්‍රථම ධ්‍යානෝපචාරයෙහි පඤ්ච ඉන්ද්‍රියයන්ගෙන් ප්‍රථමධ්‍යානාදී අට සමවත් වශයෙන්, අට නිස්සරණයන්, අනිත්‍යානුපස්සනාදී, අටළොස් මහා විදර්ශනා වශයෙන් අටළොස් නිස්සරණයන් සෝතාපත්ති මාර්ගාදී වශයෙන් අට ලෝකෝත්තර නිස්සරණයන්, මෙසේ ධ්‍යාන, සමවත් මහා විදර්ශනා මාර්ග ඵල වශයෙන් තිස් සතරෙක් වූ නිස්සරණ පළමු පළමු ඉක්මවීමෙන් යයි විස්තර කරන ලදී. **නෙක්ඛම්මෙ පඤ්චින්ද්‍රියානි** යනාදී සත්තිස් නිස්සරණයෝ ප්‍රතිපක්ෂ ප්‍රහාණ වශයෙන් ප්‍රතිපක්ෂ වශයෙන් විස්තර කරන ලදහ. එහි නෛෂ්ක්‍රම්‍යාදී සතෙහි, සිත් නිස්සරණ උපචාර භූමි වශයෙන් යූ.සේයි. ඵල වනාහි ප්‍රතිපක්ෂ ප්‍රහාණයෙන් නොවන හෙයින් නොකියන ලදී. **දිට්ඨෙකට්ඨ** යනු සෝවාන් මාර්ගය දක්වා දෘෂ්ටිය සමග එක් පුද්ගලයෙක් කෙරෙහි සිටියේ (පැවැතියේ) නුයේ දිට්ඨෙකට්ඨායි. එම දෘෂ්ටිය හා සමග එක්වැ සිටි කෙලෙසුන් කෙරෙන්, **ඔළාරිකෙහි** යනු දළ කාමරාග ව්‍යාපාදයන්ගෙන්, **අනුසහගතෙහි** යනු සියුම් වූ කාමරාග ව්‍යාපාදයන්ගෙන්ම, **සබ්බ කිලෙසෙහි** යනු රූපරාගාදියෙන්, ඒවා ප්‍රහීණ වූ කල්හි සියලු කෙලෙස්හු ප්‍රහීණ වූවාහු වෙති. එහෙයින් සියලු කෙලෙසුන්ගෙන් යයි යූ.සේයි. මෙහි නොකියන ලද පදයන්හි අර්ථ යූ.සේයි. **සබ්බෙ සඞ්ඛෙඤ්ච ඛීණාසවානං තත්‍ථ තත්‍ථ පඤ්චින්ද්‍රියානි** යනු අධිමෝක්ෂාර්ථයෙන් යැයි ආදි පෙර කියන ලද ස්ථානයන්හි, ඒ ඒ ස්ථානයන්හි පංච ඉන්ද්‍රියයෝ, බුදු, පසේබුදු, බුද්ධශ්‍රාවක, ක්ෂීණාශ්‍රවයින්ට සුදුසු පරිදි නික්මුණාහු වෙති. මෙම වාරයෙහි පළමු කියන ලද ක්‍රමයෙන්ම සුදුසු පරිදි, ක්ෂීණාශ්‍රව වශයෙන් යූ.සේයි.

කෙසේ වනාහි එම නිස්සරණ එක්සිය අසූවක් වේද යත්? කියනු ලැබේ. මාර්ගඵල වශයෙන් විසිපහකි. සමතික්‍රම වශයෙන් තිස්හතරකි. ප්‍රතිපක්ෂ වශයෙන් තිස්හතක්දැයි ප්‍රථම වාරයෙහි කියන ලද අනූහයක් නිස්සරණයෝ වෙති. ඒවාම දෙවනවර ක්ෂීණාශ්‍රවයන්ගේ වශයෙන් දොළස ඉවත් කළ කල්හි, අසූහතරක් වෙයි. මෙසේ පළමු අනූහයද, මෙම අසූහතරද එක්වූ කල එක්සිය අසූවක් වෙයි. කවර දොළසෙක් ක්ෂීණාශ්‍රවයන්ගෙන් ඉවත් කළයුතුද? සමති ක්‍රමයෙන් යැයි කී කල්හි මාර්ගඵල වශයෙන් කියන ලද අට නිස්සරණයන්ද, ප්‍රතිපක්ෂ වශයෙන් කියන ලද්දෙහි මාර්ග වශයෙන් කියන ලද සතරදැයි මෙම දොළොස ඉවත් කළයුතුය. අර්හත් ඵල වශයෙන් කියන ලද ඒවා කවර හෙයින් ඉවත් කළයුතුද යත්? සියල්ලට පළමුව කියන ලද පස්විසි නිස්සරණයන් මාර්ගඵල වශයෙන් ලැබෙන හෙයින්, අර්හත්ඵල වශයෙන් නිස්සරණයෝ කියන ලද්දාහුම

වෙති. යට යට ඵල සමවතට, මතු මතු ඵල සමාපත්තිලාභීහු සම නොවදිත්මයැයි යට යට ඵලයන් නොලබත්මය. මෙම ඉන්‍ද්‍රිය පසම කල් ඇතිවම ප්‍රතිපක්ෂයන් සංසිඳවූ හෙයින් ප්‍රතිපක්ෂ වශයෙන් තික්මුණාහුම වෙති.

### ද්විතීය සූත්‍රාන්ත නිර්දේශ වර්ණනාව නිමි.

නැවත අන් සූත්‍රයක් බහා, ඉන්‍ද්‍රිය නියමය, නිර්දේශ කරනු කැමැතියේ, 'පඤ්චිමානි භික්ඛවෙ' යනාදිය වදාළහ. එහි සොතාපත්ති යංගෙසු යන මෙහි සොත යනු ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. එම ස්‍රෝතසට පැමිණීම බොහෝකොට පැමිණීම සෝතාපත්තියි. ස්‍රෝතසට පැමිණීමේ අංගනුයි, කොටස්නුයි. ස්‍රෝතාපත්ති අංගයෝය, ස්‍රෝතයට පැමිණීමේ ස්වභාවයෙහි පූර්වභාග ප්‍රතිලාභ අංගයෝය. සත්පුරුෂ සේවනය ස්‍රෝතාපත්ති අංගයකි. සද්ධර්ම ශ්‍රවණය ස්‍රෝතාපත්ති අංගයකි. නුවණින් මෙනෙහි කිරීම ස්‍රෝතාපත්ති අංගයකි. ධර්මානුධර්ම ප්‍රතිපත්තිය ස්‍රෝතාපත්ති අංගයකි. මෙම සතර ස්‍රෝතාපත්ති අංගය. සෙස්ස යට යු.සේයි. මෙයද මෙම ඉන්‍ද්‍රියයන්ගේ තම විෂයයෙහි ජ්‍යෙෂ්ඨකස්වභාවය දැක්වීම සඳහා යු.සේයි. යම්සේ සිව් සිටු පුත්හු රජුද යැයි රාජපංචම යහළුවන් අතරෙහි නැකැත් ක්‍රීඩා කරන්නෙමුයි, වීථියට බටකල්හි එක් සිටුපුත්‍රයෙකුගේ නිවසට ගියකල්හි අනෙක් සිව්දෙනා නිශ්ශබ්දව හිඳිත්. ගෙහිමියාම කැයුතු දෑ බුදිය යුතු දෑ දෙවු. මොවුන්ට, සුවඳ මල්මාලා ලංකාරාදිය දෙවු යයි ගෙයි විධාන කරයි. දෙවැන්නාගේ, තෙවැන්නාගේ, සිව්වැන්නාගේ ගෘහයට ගියකල්හි අනෙක් සිව්දෙන නිශ්ශබ්දව හිඳිත්. ගෙහිමියාම මොවුන්ට කැයුතු දෑ, බිය යුතු දෑ දෙවු. මොවුන්ට සුවඳ මල්මාලාලංකාර දෙවු යයි ගෙයි විධාන කරයි. ඉක්බිති සියල්ලම රජුගේ ගෘහයට ගියකල්හි කිසිසේත් රජ හැමතැන ඓශ්වර්යවත්වයෙන් යුක්ත වූයේ නමුදු මෙම අවස්ථාවෙහි තමාගේ ගෘහයෙහිම මොවුන්ට කැයුතු දෑ බිය යුතු දෑ දෙවු. මොවුන්ට සුවඳ මල් මාලාලංකාර දෙවු යයි විධාන කරයි. එපරිද්දෙන්ම ශ්‍රද්ධා පංචම ඉන්‍ද්‍රියයන්හි ඒවාහි සහයෝගයෙන්ම එක්ව වීථියට බස්නාක් මෙන් එක් අරමුණෙක් උපදනා කල්හිද, යම්සේ පළමු ගෘහයෙහි අකේ සිව්දෙන නිශ්ශබ්දව හිඳිත්ද, ගෙහිමියාම විධාන කරයිද, එපරිද්දෙන් ස්‍රෝතාපත්ත්‍යාංගයන්ට පත්ව තිර ලක්ෂණයෙන් යුත් ශ්‍රද්ධෙන්‍ද්‍රියයම ජ්‍යෙෂ්ඨ වේ. පූර්වාංගම වේ. සෙසු ඉන්‍ද්‍රියයෝ ඒ හා

අනුගත වෙති. යම්සේ දෙවැන්නාගේ ගෘහයෙහිදී, අනෙක් සතරදෙන නිශ්ශබ්දව හිඳිත්ද, ගෙහිමියාම විධාන කෙරේද, එපරිද්දෙන් සම්‍යක් ප්‍රධානයන්ට පත්ව දැඩිව අල්ලාගැනීම් ලක්‍ෂණැති වීර්යෙන්‍ද්‍රියයම ජ්‍යෙෂ්ඨ වේ. පූර්වාංගම වේ. සෙසු ඉන්‍ද්‍රියයෝ ඒ හා අනුගත වෙති. යම්සේ තෙවැන්නාගේ ගෘහයෙහිදී අනෙක් සිව්දෙන නිශ්ශබ්දව හිඳිත්ද, ගෙහිමියාම විධාන කරයිද, මෙසේ සතිපට්ඨානයන්ට පත්ව එළැඹ සිටීම් ලක්‍ෂණ සතින්‍ද්‍රියම ජ්‍යෙෂ්ඨ වේද, පූර්වාංගම වේද, සෙසු ඉන්‍ද්‍රියයෝ ඒහා අනුගත වෙත්ද? යම්සේ සිව්වැන්නාගේ ගෘහයෙහිදී අනෙක් සිව්දෙන නිශ්ශබ්දව හිඳිත්ද? ගෙහිමියාම විධාන කෙරේද? එසේම ධ්‍යානයන්ට පත්ව නොවිසිරීම් ලක්‍ෂණ වූ සමාධින්‍ද්‍රියයම ජ්‍යෙෂ්ඨ වේ. පූර්වාංගම වේ. සෙසු ඉන්‍ද්‍රියයෝ ඒ හා අනුගත වෙති. සියල්ලන්ට පසුව රජුගේ ගෘහයට ගිය කල්හි වනාහි යම්සේ අනෙක් සතරදෙන නිශ්ශබ්දව හිඳිත්ද? රජම විධාන කෙරේද? එපරිද්දෙන් චතුරාර්ය සත්‍යයන්ට පත්ව දැනගැනීම් ලක්‍ෂණ වූ ප්‍රඥෙන්‍ද්‍රියයම ජ්‍යෙෂ්ඨ වෙයි. පූර්වාංගම වෙයි. සෙසු ඉන්‍ද්‍රියයෝ ඒ හා අනුගත වෙති.

සූත්‍රාන්තයෙහි, ප්‍රභේද, ගණන් විමසීම් පූර්වාංගමවම ප්‍රභේද ගණන් නිර්දේශයෙහි, **සප්පුරිස සංසෙවෙ** යනු සෝභන පුරුෂයන්ගේ මනා සෙවුමෙහි **අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන** යනු අධිමෝක්‍ෂ සංඛ්‍යාත සෙසු ඉන්‍ද්‍රියයන්හි අධිපති භාවාර්ථයෙන්, සෙසු ඉන්‍ද්‍රියයන්ගේ පූර්වාංගම අර්ථයෙනැයි අර්ථයි. **සද්ධම්ම සවණෙ** යනු සත්පුරුෂයන්ගේ ධර්මය සෝභන වූ ධර්මයනුයි සද්ධර්මයි. එම සද්ධර්මයාගේ ශ්‍රවණයෙහි, **යොනිසො මනසිකාරෙ** යනු උපායෙන් මෙනෙහි කිරීමෙහි, **ධම්මානුධම්ම පටිපත්තියා** යන මෙහි නවලොවුතුරු දහම් අනුව ගිය ධර්මය ධර්මානුධර්මයි. සීල, සමාධි, ප්‍රඥා සංඛ්‍යාත ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපැදීම ධර්මානුධර්ම ප්‍රතිපත්තියයි. සම්‍යක් ප්‍රධානාදීන්හිද එම ක්‍රමයයි.

චර්යා වාරයෙහිද මෙම ක්‍රමයෙන්ම අර්ථය දතයුතුය. හුදෙක් ප්‍රථම වාරය ඉන්‍ද්‍රියයන්ගේ උපදවන කාල වශයෙන් යූ.සේයි. චර්යාවාරය උපන්නවුන්ගේ ආසේවන කාල වශයෙන්, පරිපූර්ණත්වයට පත්වන කාල වශයෙන්ද යූ.සේයි. චර්යා ප්‍රකෘති උස්සන්නතාව වනාහි අර්ථ වශයෙන් එකකි.

දැන් චර්යා සම්බන්ධයෙන්ම, චාර, විහාර, නිර්දේශ වශයෙන් අනෙක් ක්‍රමයකින් ඉන්‍ද්‍රිය නියමය නිර්දේශ කරනු කැමැතියේ, **චාරොච**

විහාරොච ආදී වූ උදෙසීම උදෙසා එහි නිර්දේශය වදාළහ. එහි උද්දේසයෙහි පළමුව යම්සේ හැසිරෙන්නා වූ, වාසය කරන්නා වූ නැණවත් සබ්‍රම්සරුන් ගැඹුරුතන්හි ඒකාන්තයෙන් මේ ආයුෂ්මත් තෙමේ පැමිණියේය. පැමිණෙන්නේ යයි විශ්වාස කරන්නාහුය. එසේ ඉන්‍ද්‍රිය සම්පන්නහුගේ හැසිරීමද, විහරණයද, නැණැති සබ්‍රම්සරුන් විසින් අවබෝධ කරන ලද්දේ, ප්‍රතිවේධ කරන ලද්දේ වේයයි උද්දේශයෙහි සම්බන්ධය දතයුත්තේය.

උද්දේශ, නිද්දේශයන්හි චර්යාව චාරයමය. චාරය චර්යාව වනාහි අර්ථ වශයෙන් එකය. එහෙයින් චාරො යන පදයට නිර්දේශයෙහි චරියා යැයි යූ.සේයි. **ඉරියාපථ චරියා** යනු ඉරියව්වල හැසිරීම, පැවැත්ම යයි අර්ථයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **ආයතන චරියා** යනු ආයතනයන්හි සිහියෙන් මනාව විමසන ඥාණචර්යාවයි. **පතති** යනු එලයි. ඒවාට පැමිණෙත්නුයි පතති යැයි යූ.සේයි. සත්ත්වලෝකයාගේ ඉහාත්මයෙහි හා මරණින් මත්තෙහි අභිවෘද්ධි **ලොකත්‍ථ** නම් වේ. මේ විශේෂයයි.

දැන් ඒ චර්යාවන්හි භූමිය දක්වනුයේ **චතුසු ඉරියාපථෙසු** යනාදිය වදාළහ.

**සතිපට්ඨානෙසු** යනු ආරම්මණ සතිපට්ඨානයන්හි, සතිපට්ඨානයැයි කියනු ලබන කල්හි, සිහියෙන් අන්‍යයන් ව්‍යවහාර වශයෙන් අන්‍යයන් සේ කොට යූසේයි.

**අරියසච්චෙසු** යනු පූර්වභාග ලෞකික සත්‍ය ඥාණයෙන් වෙන් වෙන්ව සත්‍යය පරිග්‍රහ වශයෙන් යූසේයි. **අරියමග්ගෙසු සාමඤ්ඤ ඵලෙසු** යනු ව්‍යවහාර වශයෙන්ම යූසේයි. **පදෙසෙ** යනු ලෝකාර්ථ චර්යායෙහි එක් දේශයෙක්හි, අවශේෂ දැයක් නොමැතිව ලෝකාර්ථ චර්යාව බුදුවරුම කරති.

නැවත එම චර්යාවන්ම කාරක, පුද්ගල වශයෙන් දක්වනුයේ **පණිධි සමපන්නානං** ආදිය වදාළහ. එහි ප්‍රණිධි සම්පන්න නම් ඉරියව්හි ශාන්ත බැවින් මනා ඉරියව් පැවැත්මෙහි යුක්ත, සෙලවිය නොහැකි ඉරියව්වලින් යුත් භික්ෂුභාවයට සුදුසු ශාන්ත ඉරියව්වලින් යුක්ත, **ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරානං** යනු චක්ෂුරාදී ෂට් ඉන්‍ද්‍රියයන්හි, තම තමා අයත් විෂයයෙහි පැවැති එක් එක් ද්වාරය වශයෙන් රක්නා ලද ද්වාර ඔවුන්ටනුයි ගුත්ත

ද්වාරායි. ඒ රක්නා ලද ද්වාරයන්ගේ, ද්වාරං යනු මෙහි උපදනා ද්වාර වශයෙන් චක්ෂුරාදීහුමය. **අපපමාද විහාරීනං** යනු සීලාදීන්හි අප්‍රමාදීව වසනසුලු වූ, **අධිචිත්තමනුයුත්තානං** යනු සමාධියෙහි අනුයුක්තයනට, **බුද්ධි සමපන්නානං** යනු නාමරූප විභාගකිරීම් ආදීකොට ගොත්‍රභූ දක්වා එතෙක් පැවැති ඤාණයෙන් යුක්ත වූවන්ට, **සම්මා පටිපන්නානං** යනු සිව් මාර්ගක්ෂණයෙහි, **අධිගත ඵලානං** යනු සිව් ඵලක්ෂණයෙහි,

**අධිමුච්චනෙතා** යනු නිශ්චය කරනුයේ, **සද්ධාය චරති** යනු ශ්‍රද්ධා වශයෙන් පවතියි. **විජානනෙතා** යනු ඉන්‍ද්‍රිය සම්ප්‍රයුක්ත ජවන පූර්වාංගම, ආවර්ජන විඤ්ඤාණයෙන් අරමුණ දැනගනුයේ, **විඤ්ඤාණචරියාය** යනු ආවර්ජන විඤ්ඤාණ චර්යා වශයෙන්, **එවං පටිපන්නසස** යනු ජවනය සහිතව ඉන්‍ද්‍රිය චර්යායෙහි පිළිපන්නහුට, **කුසලා ධම්මා ආයාපෙන්ති** යනු සමථ විදර්ශනා වශයෙන් පැවැති කුසල්දම් අතිශයින් යැපෙත් - පවතිත් යනු අර්ථයි. **ආයතන චරියාය** යනු කුසල්දම්හි අතිශයින් ප්‍රයත්න චර්යායෙන් උත්සාහවත් චර්යායෙන්, පැවැත්වීම් චර්යායෙන් යයි යූ.සේයි. **විසේසමධිගච්ඡති** යනු විෂ්කම්භන, තදංග, සමුච්ඡේද පටිපපසසද්ධි වශයෙන් අවබෝධ කරයි. දර්ශන චර්යාදීහු කියන ලද අර්ථමය. සද්ධාය විහරති යන ආදීන්හි ශ්‍රද්ධාදියෙන් යුක්ත වූ ඉරියව් විහරණය දතයුතුය. **අනුබුද්ධො** යනු අනුමාන බුද්ධියෙන්, **පටිවිද්ධො** යනු ප්‍රත්‍යක්ෂ බුද්ධියෙන්, අධිමෝක්ෂාර්ථාදීන්හි, අනුමානයෙන් දන්නා ලද ප්‍රත්‍යක්ෂයෙන් දන්නා ලද දැහි චාරයද, විහාරයද අනුමානයෙන් දන්නා ලද්දේ වේ. ප්‍රත්‍යක්ෂයෙන් දන්නා ලද්දේ වෙයි. එහෙයින් අනුබෝධ, ප්‍රතිවේධයන්හිද නිශ්චය කිරීම් අර්ථාදීහු නිර්දිෂ්ටයහ. **එවං සද්ධාය චරන්තං** යන ආදීන්හි එවං යනු කියන ලද ආකාරය නිර්දේශ කරනුයේ යථා ශබ්දයෙහි අර්ථය නිර්දේශ කරයි. විඤ්ඤූති ආදීන්හිද, යථා ස්වභාවයෙන් දනිත්නුයි විඤ්ඤූයි, දැනගත් ස්වභාවය පැහැදිලි කරත්. ප්‍රකට කෙරෙත්නුයි **විභාවියි**. පර්වතයෙහි හෙනක් මෙන් කෙලෙස් මැඩලයි. හිංසනයට පත්කෙරේනුයි **මෙධායි**. වහා ග්‍රහණ, ධාරණ අර්ථයෙන්ද මෙධායි. ධාරණ ශක්තිය ඔවුන්ට ඇතියේනුයි **මෙධාවියි**. ඤාණ ස්වභාවයෙහි පවතිත්, යෙති. පවතිත්නුයි **පණ්ඩිතා**, බුද්ධි සම්පත්තියෙන් යුක්ත වූ හෙයින් **බුද්ධි සමපන්නායි**. බ්‍රහ්ම චර්යාව සමග උතුම් ප්‍රතිපදාවෙහි හැසිරෙත්නුයි **සබ්‍රහමචාරිනොයි**. අපලොකන කර්මාදි, සිව් වැදෑරුම් කර්ම එක්ව කිරීම් වශයෙන් **එකං කම්මංයි**. සිව් වැදෑරුම් ප්‍රාතිමෝක්ෂ උදෙසීමද එසේය. සමාන ශික්ෂා ඔවුන්ටනුයි සමසික්ඛායි. සම ශික්ෂාවන්ගේ ස්වභාවය **සමසික්ඛතායි**.

සමසික්ඛාතා යනුවෙන්ද කියවති. යම් කෙනෙකුන්ට එක් කර්මයක්, එක් උදෙසීමක් වේද, එය සමසික්ඛතායි. ඔවුහු සබ්‍රහ්මචාරීහුයැයි යූ.සේයි. **ඣානානි** යයි කිවයුතු කල්හි ඣානායි. ලිංග විපර්යාසය කරන ලදී. **විමොක්ඛා** තෙවදෑරුම් හෝ අටවැදෑරුම් විමොක්ෂ, **සමාධි** යනු සවිතර්ක සවිචාර අවිතර්ක විචාරමාත්‍ර, අවිතර්ක අවිචාර යන තෙවදෑරුම් සමාධීහුය. **සමාපත්තියො** යනු සුඤ්ඤත-අනිමිත්ත-අප්‍රණිහිත යන ත්‍රයයි. **අභිඤ්ඤායො** යනු ෂට් අභිඥාවෝය. එක් කොටසකි. භාගයකි. දෙවැන්නක් නැත්තේනුයි එකංසොයි. එක් කොටසකට අයත් අර්ථයෙහි කීම **එකංසවචනංයි.** මෙසේ සෙස්සෙහිද යෙදීම් කළයුත්තාහ. විශේෂයෙන් වනාහි සමව හාත්පස බැසගනී පවත්වයිනුයි සංසයයි මෙහි සැකයක් නැත්තේනුයි **නිසසංසයොයි.** එක් කරුණෙක්හිම නොකැමැති වී, අනෙක් කරුණෙහිද සැක කෙරේනුයි **කංඛායි.** මෙහි සැකයෙක් නැත්තේනුයි **නික්කංඛොයි.**

දෙවදෑරුම් භාවය දෙවජ්ඣංයි. මෙහි දෙවදෑරුම් භාවයක් නැත්තේනුයි **අද්වෙජ්ඣායි.** දෙයාකාරයකින් සෙලවේ. කම්පාවේනුයි දෙවළහකයි. මෙහි දෙයාකාරයක් නැත්තේනුයි **අද්වෙළහකොයි** නියෝගයෙන්, නියමයෙන් කීම **නියොග වචනයි.** නියොග වචනං යනුවෙන්ද කියවති. නිදොස්, අවිරුද්ධ, සසරින් නිදහස දෙන අර්ථයෙහි වචනය **අපණ්ණක වචනංයි. අවත්ථාපන වචනං** යනු සතිටුහන් වචනයි. ඒ සියල්ල විචිකිච්ඡාවෙහි අභාවයාගේ පර්යායනාමයෝය. ප්‍රිය අර්ථයෙහි යෙදෙන හෙයින්

වචනය ප්‍රිය වූයේමනුයි **පියවචනංයි** ගරුවචනංද එසේමය. ගෞරව සහිතව ගරුභාවයෙනැයි **සගාරවංයි.** ගරුකිරීම පටිස්සයොයි, අන්‍යයා ගරුකොට ආශ්‍රයකිරීම, කීකරු භාවයෙන් පිහිට ලබාගැනීමයයි අර්ථයි. කීකරුභාවයෙන් යුක්තව ශ්‍රවණය කිරීම පටිස්සවොයි. යටහත් පහත් පැවතුම් ස්වභාවයෙන් අන් වදන් ශ්‍රවණය යයි අර්ථයි. දෙයාකාරයෙන්ම අන්‍යයාගේ ජ්‍යෙෂ්ඨතාභාවයට එය නාමයකි. ගෞරව සහිතව පවතීනුයි සගාරවංයි. යටහත් පහත් පැවතුම් ස්වභාවයේ මනා ශ්‍රවණයෙන් යුක්තව හෝ පවතීනුයි **සප්පටිස්සයංයි, සප්පටිස්සවං** යැයි කිවයුතු කල්හි 'යකාවකාර' ලොප්කොට සප්පටිස්සංයයි යූ.සේයි. අධික වූ, විශිෂ්ට වූ වචනය **අධිවචනංයි.** ගෞරව සහිත වූයේද මනා ශ්‍රවණය සහිත වූයේද, **සගාරව සප්පටිස්සංයි.** ගෞරව සහිත මනා ශ්‍රවණයට විශේෂ නාමය

සගාරව සප්පතිස්සධිවචනංයි දෙඅයුරින්ම පර්යාය වචන විකල්පනයන්ගේ වශයෙන් නැවත එකයයි යූ.සේයි. **පතෙතාවා පාපුණිස්සතීවා** යනු ධ්‍යානාදීහුමය.

## තෘතීය සූත්‍රාන්ත නිර්දේශ වර්ණනාව නිමි.

නැවත පළමු සූත්‍රයම බහා, වෙනත් ආකාරයකින් ඉන්ද්‍රියයන් නිර්දේශ කරයි. එහි **කතිහාකාරෙහි කෙනට්ඨෙන දට්ඨබ්බානි** යන කවර ප්‍රමාණ ආකාරයන්ගෙන් දතයුත්තාහුද, කවර අර්ථයෙන් දතයුත්තාහුදැයි දතයුතු ආකාරයන්ද දතයුතු දෑද විමසයි. **ඡහි ආකාරෙහි කෙනට්ඨෙන දට්ඨබ්බානි** යනු ෂට් ආකාරයන්ගෙන් දතයුත්තාහ. ෂට් ආකාර සංඛ්‍යාත ඒම අර්ථයෙන් දතයුත්තාහ. **ආධිපතෙය්‍යට්ඨෙන** යනු අධිපති භාව අර්ථයෙන්, **ආදිවිසොධනට්ඨෙන** යනු කුසල ධර්මයන්ට මුල්වූ සීලයෙහි, විසෝධනාර්ථයෙන්, **අධිමත්තට්ඨෙන** යනු බලවත් අර්ථයෙන්, බලවත් භාවයෙහි අධික මාත්‍රාව, ප්‍රමාණය වන්නේනුයි අධිමත්තංයයි යූ.සේයි. **අධිට්ඨානට්ඨෙන** යනු පිහිටන අර්ථයෙන්, **පරියාදානට්ඨෙන** යනු ක්‍ෂය කිරීම් අර්ථයෙන්, **පතිට්ඨාපකට්ඨෙන** යනු පිහිටුවීම් අර්ථයෙන්,

අධිපතෙය්‍යාර්ථ නිර්දේශයෙහි, **අස්සද්ධියං පජහතො** යනාදිය එකිනෙක ඉන්ද්‍රියයාගේ ප්‍රතිපක්ෂතා දුරුලීම් වචනය එකෙණෙහිම තම තමාගේ ප්‍රතිපක්ෂ දුරුලීම් කෘත්‍ය සාධනයෙහි අධිපතිභාවය සිදුකිරීම සඳහා යූ.සේයි. සෙසු සිව් ඉන්ද්‍රියයන් ඒ හා සම්ප්‍රයුක්තවම යූ.සේයි. නානා ක්‍ෂණයන්හි හෝ එක් එක් ඉන්ද්‍රියය ප්‍රධානකොට එයට ප්‍රතිපක්ෂ වූ, ඒ ඒ ඉන්ද්‍රියය ජ්‍යෙෂ්ඨ කොට සෙස්ස ඒ හා අනුගතකොට යූ.සේයි. **කාමච්ඡන්දං පජහතො** යන ආදිය වනාහි එක් ක්‍ෂණයක් වශයෙන්ම යූ.සේයි.

ආදි විසොධනාර්ථ නිර්දේශයෙහි, **අස්සද්ධිය සංවරට්ඨෙන සීල විසුද්ධි** යනු අශ්‍රද්ධාවගේ වැළැක්වීම් අර්ථයෙන් විරති අර්ථයෙන් සීලයෙහි මල පිරිසිඳු කරන හෙයින් සීල විශුද්ධි නමැ. **සද්ධින්‍ද්‍රියස්ස ආදි විසොධනා** යනු ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ උපනිශ්‍රය වශයෙන් මුල්වූ සීලය මනාව පිරිසිඳු කිරීමයි. මෙම ක්‍රමයෙන්ම සෙසු කාමච්ඡන්දාදී සංවරණ මූලික ඉන්ද්‍රියය දතයුත්තාහ.

අධිමාත්‍රාර්ථ නිර්දේශයෙහි, **සද්ධින්‍ද්‍රියස්ස භාවනාය ඡන්‍දො උප්පජ්ජති** යනු ශ්‍රද්ධාවත් පුද්ගලයාට, ශ්‍රද්ධා ප්‍රතිසංයුක්ත ධර්මයක් අසා හෝ, ශ්‍රද්ධෙන්‍ද්‍රියය වැඩිදියුණු කිරීමෙහි ආස්වාදය දැක හෝ ශ්‍රද්ධෙන්‍ද්‍රියෙහි කුසල් වූ ධර්මච්ඡන්දය හටගනී. **පාමුජ්ජං උප්පජ්ජති** යනු ඡන්දය හටගත් බැවින් දුර්වල ප්‍රීතිය උපදී. **පීති උප්පජ්ජති** යනු ප්‍රමුදිත හෙයින් බලවත් ප්‍රීතිය උපදී. **පස්සද්ධි උප්පජ්ජති** යනු ප්‍රීතියෙන් පිණාගිය හෙයින් කාය චිත්ත සංසිඳීම් උපදී. **සුඛං උප්පජ්ජති** යනු කය හා සිත සන්සුන් හෙයින් චෛතසික සුවය උපදී. **ඔභාසො උප්පජ්ජති** සුවයෙන් ආර්ද්‍ර හෙයින් ඥාණාලෝකය උපදී. **සංවෙගො උප්පජ්ජති** යනු ඥාණාලෝකයෙන් දත් සංස්කාරාදීනව හෙයින් සංස්කාර පැවැත්මෙහි සංවේගය උපදී. **සංවෙජෙත්වා චිත්තං සමාදහති** යනු සංවේගය උපදවා, එම සංවේගයෙන්ම සිත තැන්පත් කරයි. **සාධුකං පග්ගණ්හාති** යනු මැලිබව හා නොසන්සුන්කම අත්හැර මනාව උත්සාහවත් කරයි. **සාධුකං අජ්ඣුපෙක්ඛති** යනු වීර්යය සමව පැවැති හෙයින් නැවත වීර්යය සමතාවයට ගෙනඒමෙහි උත්සාහ නොකරනුයේ තත්‍ර මධ්‍යස්ථපේක්ෂා වශයෙන් මනාව මධ්‍යස්ථ වේ නමැ. **උපෙක්ඛාවසෙන** යනු සමව උසුලන ලක්ෂණයෙන් තත්‍ර මධ්‍යස්ථපේක්ෂා වශයෙන් **නානත්ත කිලෙසෙහි** යනු විදර්ශනාවට ප්‍රතිපක්ෂ වූ නොයෙක් ස්වභාවයන්ගෙන් යුත් කෙලෙසුන් කෙරෙන්, **විමොක්ඛවසෙන** යනු භංගානුපස්සනාවෙහි පටන් නොයෙක් කෙලෙසුන්ගෙන් මිදීම් වශයෙන්, **විමුත්තත්තා** යනු නොයෙක් කෙලෙසුන්ගෙන් මිදීම් වශයෙන්, **තෙ ධම්මා** යනු ඡන්දාදී ධර්ම, **ඒකරසාහොන්ති** යනු විමුක්ති රසයෙන් එකාකාරී රස වේ. **භාවනා වසෙන** යනු එක් රස භාවනා වශයෙන්, **තතො පණීත තරෙ විවට්ටන්ති** යනු එම කරුණින් විදර්ශනාරම්මණයෙන් වඩා ප්‍රණීත නිර්වාණාරම්මණයෙහි විවට්ටානුපස්සනා සංඛ්‍යාත ගෝත්‍රභූ ඥාණයෙන් ඡන්දාදී ධර්ම නවතී. සංස්කාරාරම්මණයෙන් ඉවත්ව නිර්වාණාරම්මණයෙහි පවතීයයි අර්ථයි.

**විවට්ටනාවසෙන** යනු මෙසේ ගෝත්‍රභූ ක්ෂණයෙහි සංස්කාරාරම්මණයෙන් පරාම්මුඛ වීම් වශයෙන්, **විවට්ටිතත්තා තතො වොස්සජ්ජති** යනු මාර්ග යුත් පුඟුලා මාර්ගයාගේ උපදනා ක්ෂණයෙහිම කෙලෙසුන් කෙරෙන්ද, ඒ හා අනුව පවත්නා ස්කන්ධයන් කෙරෙන්ද යන දෙකින් නැගී සිටීම් වශයෙන්, පරාම්මුඛ වූ හෙයින්, එම කරුණින්ම කෙලෙසුන්ද ස්කන්ධයන්ද අත්හරියි. **වොස්සජ්ජිතත්තා තතො නිරුජ්ඣන්ති** යනු මාර්ගයෙහි උත්පාදක්ෂණයෙහිම කෙලෙසුන්ද, ස්කන්ධයන්ද, අත්හළ හෙයින්, එම කරුණින්ම කෙලෙස්ද, ස්කන්ධයෝද නූපදනා නිරෝධ

වශයෙන් නිරුද්ධ වෙති. **වොසසජ්ජිතත්තාති** යනු අපේක්ෂායෙහි පැවතීම් වචනය කරන ලදී.

කෙලෙස් නිරෝධය ඇතිකල්හි ස්කන්ධ නිරෝධයද යෙදෙන හෙයින්, ස්කන්ධ නිරෝධය යූ.සේයි. **නිරොධ වසෙන** යනු කියන ලද ආකාර ඇති නිරෝධයාගේ වශයෙන් එම මාර්ගයාගේම උත්පාද ක්‍ෂණයෙහි, දෙයාකාර වොස්සජනයන් දක්වනු කැමැතියේ, **නිරොධ වසෙන** **ද්වෙ වොසසගග** ආදිය වදාළහ. ද්වයම යට කියන ලද අර්ථමය. **අසසද්ධියසස පහාණාය ඡන්දො උපපජ්ජති** යන ආදීන්හිද මෙම ක්‍රමයෙන්ම අර්ථය දතයුතුය. වීර්යෙන්ද්‍රියාදි මූලික වාරයන්හිද එම ක්‍රමයමැයි. මෙම ක්‍රමයෙන්ම අධිෂ්ඨානාර්ථ නිර්දේශයද විස්තර වශයෙන් දතයුතුය. හුදෙක් මෙහි අධිෂ්ඨාන කෙරේ යනු විශේෂයයි. පිහිටයි යන අර්ථයි.

පරියාදානාර්ථ නිර්දේශයෙහි, පරියාදියති යනු ක්‍ෂය කරයි.

පතිට්ඨාපනාර්ථ නිර්දේශයෙහි, **සද්ධො සද්ධින්ද්‍රියං අධිමොක්ඛෙ පතිට්ඨාපෙති** යනු ශ්‍රද්ධා සම්පන්න පුද්ගල තෙමේ, සියලු සංස්කාර, අනිත්‍යය, දුක්ය, අනාත්මයැයි ස්ථිර ලෙස සිතා ගනුයේ, ශ්‍රද්ධෙන්ද්‍රිය අධිමෝක්ෂයෙහි පිහිටුවයි. මෙම පුද්ගල විශේෂයෙන් ඉන්ද්‍රිය භාවනා විශේෂය නිර්දේශිතය.

**සද්ධසස සද්ධින්ද්‍රියං අධිමොක්ඛෙ පතිට්ඨාපෙති** යනු එම ශ්‍රද්ධා සම්පන්න පුද්ගලයාගේ ශ්‍රද්ධෙන්ද්‍රිය එම ශ්‍රද්ධායෙහිම එසේ ස්ථිර ලෙස පිහිටුවනුයේ අධිමෝක්‍ෂයෙහි පිහිටුවයි. මෙයින් ඉන්ද්‍රිය භාවනා විශේෂයෙන් පුද්ගල විශේෂය නිර්දේශිතය.

මෙසේ සිත ඔසවා තබනුයේ, ප්‍රග්‍රහණයෙහි පිහිටුවයි. සිහිය අරමුණට එළඹවනුයේ, එළඹවීමෙහි පිහිටුවයි. සිත මනාව තැන්පත් කරනුයේ අවික්‍ෂෙපයෙහි පිහිටුවයි. අනිත්‍යය, දුක්ය, අනාත්මයැයි දක්නේ දර්ශනයෙහි පිහිටුවයි යයි සෙස්සෙහිද යෙදීම් දතයුත්තාහ.

**යොගාවචරො** යනු සමථ යෝගයෙහිද, විදර්ශනා යෝගයෙහිද හැසිරේනුයි යෝගාවචරොයි, අවචරති යනු පිවිස හැසිරෙයි යනුයි.

**චතුර්ථ සූත්‍රාන්ත නිර්දේශ වර්ණනාව නිමි.**

දැන් සමාධිය වඩන්නහුගේද, විදර්ශනාව වඩන්නහුගේද ඉන්ද්‍රිය එක්තැන් කිරීම දක්වනු කැමැත්තේ, පළමුව වැටහීම් කුසලතා ප්‍රභේදය නිර්දේශ කරන්ට, 'පුථුජ්ජනො සමාධිං භාවෙනෙතා' ආදිය වදාළහ. එහි, **පුථුජ්ජනො සමාධිං භාවෙනෙතා** යනු නිර්වේදභාගී සමාධිය වඩනුයේ ශෛක්‍ෂ්‍යයාට හා වීතරාගීහුට ලෝකෝත්තර වූද සමාධිය ලැබේ. **ආවජ්ජිතත්තා** යනු කසිණ ආදී නිමිති ආවර්ජනය කළ හෙයින්, කසිණ ආදී පරිකර්මකොට එහි උපදවන ලද නිමිත්ත බැවිනැයි යූ.සේයි.

**ආරම්මණූපට්ඨාන කුසලො** යනු එහි උපදවන ලද නිමිත්තටම එළඹ සිටීමෙහි දක්‍ෂ වෙයි. **සමථ නිමිත්තූපට්ඨාන කුසලො** ඉතා තදින් පටන්ගත් වීර්යතාවයන්හිදී සිත නොසන්සුන් කල්හි, පසසද්ධි, සමාධි, උපෙක්‍ෂා සම්බොධ්‍යංග වැඩීම් වශයෙන් සිත සන්සුන් කරවීම් නිමිත්තට එළඹ සිටීමෙහි දක්ෂ වේ. **පග්ගහ නිමිත්තූපට්ඨාන කුසලො** යනු ඉතා ලිහිල් වීර්යාදීන්ගෙන් සිත මැලිවූ කල්හි, ධම්මවිචය, ප්‍රීති, සම්බොධ්‍යංග වැඩීම් වශයෙන් සිත දැඩිසේ උත්සාහවත් කිරීම් වශයෙන් නිමිත්තට එළඹීමෙහි දක්ෂ වේ. **අවික්ඛෙපූපට්ඨාන කුසලො** යනු නොසන්සුන් නුවූ, මැළි නුවූ සිත හා සම්ප්‍රයුක්ත සමාධියට එළඹීමෙහි දක්ෂ වේ. **ඕභාසූපට්ඨාන කුසලො** යනු ප්‍රඥා ප්‍රයෝග මන්දතාවයෙන් ආස්වාද රහිත සිතෙහි, අෂ්ට සංවේග වස්තූන් ප්‍රත්‍යවේක්‍ෂණයෙන් සිත සංවේගයට පත්කොට ඤාණාලෝකයට එළඹීමෙහි දක්ෂ වේ. අෂ්ට සංවේග වස්තුහු නම්: ජාති, ජරා, ව්‍යාධි, මරණ යන සතරද, පස්වන අපාය දුකද, අතීත සංසාර වෘත්තමූලික දුකද, අනාගත සංසාර වෘත්ත මූලික දුකද, වත්මනැ අහර සෙවීම් මූලික දුක යන මේවායි. **සම්පහංසනූපට්ඨාන කුසලො** යනු සන්සුන් සුව නොලැබීමෙන් සිත ආස්වාද රහිත වූ කල්හි, බුද්ධ, ධර්ම, සංඝ ගුණ සිහිකිරීමෙන් සිත පහදවනුයේ, සතුටු කරවීමට එළඹීමෙහි දක්ෂ වේ. **උපෙක්ඛූ පට්ඨාන කුසලො** යනු නොසන්සුන් ආදී දොස් විරහිත සිතෙහි, නිග්‍රහ, ප්‍රග්‍රහ ආදීන්හි යෙදීම් නොකිරීමෙන් උපේක්‍ෂාවට එළඹීමෙහි දක්ෂ වේ.

**සෙක්ඛො** යනු ත්‍රිවිධ ශික්‍ෂාවන්හි හික්මෙයි නුයි සෙක්ඛොයි. **එකත්තූපට්ඨාන කුසලො** යනු සක්කාය දෘෂ්ටි ආදීන් ප්‍රහීණ හෙයින් නෛෂ්ක්‍රම්‍යාදීන්ගේ ඒකත්වයට එළඹීමේ දක්ෂ වේ. වීතරාගො යනු සර්වප්‍රකාරයෙන් ප්‍රහීණ වූ රාග හෙයින් ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ.

**ඤාණුපට්ඨාන කුසලො** යනු රහත් තෙමේ ධර්මයන්හි, පහවූ මෝහ හෙයින්, ඒ ඒ තන්හි නුමුළා ඤාණයට එළැඹීමෙහි දක්ෂ වේ. **විමුත්තුපට්ඨාන කුසලො** යනු අර්හත්ඵල විමුක්තියට එළැඹීමෙහි දක්ෂ වේ. විමුත්ති යනු සියලු කෙලෙසුන්ගෙන් මිදුණු හෙයින් අර්හත් ඵල විමුක්තිය අදහස් කරන ලදී.

විදර්ශනා භාවනාවෙහි එළඹ සිටීම් නොඑළඹ සිටීම්හි, **අනිච්චතො** ආදිය. **නිච්චතො** යනාදියද සීල කථායෙහි කියන ලද ආකාරයෙන්ම දතයුත්තාහ. පාඨ වශයෙන් වනාහි, රැස්කිරීමට නොඑළඹවීමෙහි කුසලතා වශයෙන්, විපරිණාමය එළඹීමෙහි කුසලතා වශයෙන්, අනිමිත්තයට එළඹීමෙහි කුසලතා වශයෙන් නිමිත්තට නොඑළඹීමෙහි කුසලතා වශයෙන්, අප්‍රණිහිතයට එළඹීමෙහි කුසලතා වශයෙන්, ප්‍රණිධියට නොඑළඹීමෙහි කුසලතා වශයෙන්, අභිනිවේසයට නොඑළඹීමෙහි කුසලතා වශයෙන් ඒවාහි ෂෂ්ඨී වචනයෙන් පද වෙන්කිරීම කළයුතුය. සෙස්සෙහි වනාහි පංචමී වචනයෙන් පාඨයි. **සුඤ්ඤතුපට්ඨාන කුසලො** යන මෙහි වනාහි ශූන්‍යතායෙන් එළඹීමෙහි කුසලතාවයයි හෝ - ශූන්‍යතාවට එළඹීමෙහි කුසලතාවයයි පද ඡේද කළයුතුය. නිර්වේද විරාග, නිරෝධ, පටිනිස්සග්ගානුපස්සනා, අධි ප්‍රඥා ධර්ම විදර්ශනා, යථාභූත ඤාණ දර්ශන, පටිසංඛානුපස්සනා, විවට්ටානුපස්සනා යන මෙම අට මහා විදර්ශනාව තමාගේ ස්වභාව විශේෂයෙන් විශේෂිතය. අරමුණු වශයෙන් නොවේ. මෙම අනිත්‍ය වශයෙන් එළඹීමෙහි කුසලතාව වේයයි ආදී වචන මෙන්, නිර්වේදයෙන් එළඹීමෙහි කුසලතාව වේයයි ආදි වචන නොගැළපේ. එහෙයින් මෙම අට නොයොදන ලදී.

ආදීනවානුපස්සනාව වනාහි, ශූන්‍යතාවෙහි එළඹීමෙහි දක්ෂ වේ. අභිනිවේසයෙහි එළඹීමෙහි දක්ෂ වේයයි මෙම යුගලක වචනයෙන්ම, අර්ථ වශයෙන්ද, ආදීනව වශයෙන්ද එළඹීමෙහි දක්ෂ වේ. ආලයාභිනිවේසයෙහි එළඹීමෙහි දක්ෂ වේයයි යොදන ලද්දේම වේයයි ස්වරූපයෙන් නොයොදන ලදී. මෙසේ පළමු අටද, මෙම ආදීනවානුපස්සනාවදැයි යන අටළොස් මහා විදර්ශනාවන්හි මෙම නවය නොයොදා, අනෙක් නවයම යොදන ලදැයි දතයුතුය.

**ඤාණුපට්ඨාන කුසලො** යනු ශෛක්‍ෂයා විදර්ශනෝප ක්ලේශයන්ගේ අභාවයෙන් විදර්ශනා භාවනාවෙහි ඤාණයට එළඹීමෙහි දක්ෂ වේ.

සමාධි නිකන්තිය යෙදෙන හෙයින් ඤාණයට එළඹීමෙහි දක්‍ෂයැයි නොකියන ලදී. **විසඤ්ඤොගුපට්ඨාන කුසලො** යන කාම යෝග විසංයෝගය, භවයෝග විසංයෝගය, දෘෂ්ටියෝග විසංයෝගය, අවිද්‍යා යෝග විසංයෝගයැයි සිව් අයුරෙකින් කියන ලද විසංයෝගයට එළඹීමෙහි දක්ෂ වේ. **සඤ්ඤොගානුපට්ඨාන කුසලො** යනු කාමයෝග, භව යෝග දෘෂ්ටි යෝග, අවිද්‍යා යෝග වශයෙන් සිව් අයුරින් කියන ලද සංයෝගයට නොඑළඹීමෙහි දක්ෂ වේ. **නිරොධුපට්ඨාන කුසලො** යනු 'නැවතද මහණෙනි, ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ සිත නිර්වාණ නිම්න වූයේ, නිර්වාණ ප්‍රවණතාවට පත්වූයේ නිර්වාණයට නැමුණේ, විවේකස්ථායී වූයේ, නෛෂ්ක්‍රම්‍යයෙහි විශේෂයෙන් ඇලුණේ සර්වප්‍රකාරයෙන් ආශ්‍රවයන් හටගන්නා ධර්මයන් විනාශ කරන ලද්දේ වේයයි කියන ලද, ක්ෂීණාශ්‍රව බල වශයෙන් නිර්වාණ නිම්න සිතැති හෙයින් ක්ෂීණාශ්‍රව තෙමේම නිරෝධ සංඛ්‍යාත නිර්වාණයට එළඹීමෙහි දක්ෂ වේ. **ආරම්මණූපට්ඨාන කුසල වසෙන** යනාදීන්හි, කුසලං යනු ඤාණයයි. ඤාණයද කුසලයැයි කියයි. දක්ෂ පුද්ගල යෝගයෙන් කුසලයි. පණ්ඩිත පුද්ගල යෝගයෙන් පණ්ඩිත ධර්මයයි වේද, එසේම කෞශල්‍යතා වශයෙනැයි අර්ථයි.

**චතුසට්ඨියා ආකාරෙහි** යනාදිය ඤාණ කථායෙහි කියන ලදුයේද, ඉන්ද්‍රිය කථා සම්බන්ධයෙන් මෙහි ගෙනවුත් යූ.සේයි. එය යට කියන ලද ආකාරයෙන්ම දතයුතුය.

නැවත සමන්ත චක්ෂු සම්බන්ධයෙන් ඉන්ද්‍රිය නියමය කියනු කැමැතියේ '**න තස්ස අදිට්ඨං මිධත්ථි කිඤ්චි**' යනාදිය වදාළහ. එහි **සමන්ත චක්ඛු** යනු සර්වඥතාඥානයයි, **පඤ්චින්ද්‍රියස්ස වසෙන** යනාදියෙන් පංචෙන්ද්‍රියයන්ගේ නොවෙන්වීම්තාව දක්වයි.

**සද්දහතො පග්ගණ්හාති** යනාදීන්ගෙන් එකිනෙක ඉන්ද්‍රියමූලික, පඤ්ච චතුෂ්කයන්හි පංච ඉන්ද්‍රියයන්ගේ නිම්න ප්‍රයෝග කාලයෙහි හෝ මාර්ගක්ෂණයෙහි හෝ ඒකරස භාවයද, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය භාවයද දක්වයි. **සද්දහිතත්තා පග්ගහිතං** යන ආදී එකිනෙක ඉන්ද්‍රියමූලික පඤ්ච චතුෂ්කයන්හි, පඤ්ච ඉන්ද්‍රියයන්ගේ උත්පත්ති කාලයෙහි හෝ ඵල කාලයෙහි හෝ ඒකරස භාවයද, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය භාවයද දක්වයි.

නැවත බුද්ධ චක්ෂු සම්බන්ධයෙන් ඉන්ද්‍රිය නියමය කියනු කැමැතියේ,

යං බුද්ධ චක්ඛු ආදිය වදාළහ. එහි බුද්ධ චක්ඛු යනු ඉන්‍ද්‍රිය පරොපරියත්ත ඤාණය හා ආසයානුසය ඤාණයයි. බුද්ධ ඤාණං යනු එම ඤාණ ද්වයයමය. සෙස්ස යට කියන ලද අර්ථමය.

## සද්ධර්මප්‍රකාසනී ප්‍රතිසම්භිදා මාර්ග අර්ථ කථායෙහි ඉන්‍ද්‍රිය කථා වර්ණනාව නිමි.

දැන් ඉන්‍ද්‍රිය කථාවට අනතුරුව කියන ලද, විමොක්‍ෂ කථායෙහි, පෙර නොවූ විරූ අර්ථ අනුවර්ණනාව පැමිණියේය. මෙම විමොක්‍ෂ කථාව, ඉන්‍ද්‍රිය භාවනාවෙහි යෙදුණහුට විමොක්‍ෂය හටගන්නා හෙයින්, ඉන්‍ද්‍රිය කථාවට අනතුරුව කියන ලදී. එයද කියන්නේ, භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි ශ්‍රවණය කරන ලද සූත්‍රාන්ත දේශනා පූර්වාංගම කොට වදාළේය. එහි සූත්‍රාන්තයෙහි, **සුඤ්ඤතො විමොක්ඛො** යන ආදීන්හි ශූන්‍යතාකාරයෙන් නිර්වාණය අරමුණුකොට, පැවැති ආර්ය මාර්ගය සුඤ්ඤත විමොක්‍ෂයයි. එය ශූන්‍යතා ධාතුවෙන් හටගත් හෙයින් ශූන්‍යතායි, කෙලෙසුන්ගෙන් මිදුණු හෙයින් විමොක්‍ෂයි, එම ක්‍රමයෙන්ම අනිමිත්තතා කාරයෙන් නිර්වාණය අරමුණු කොට පැවැත්තේ **අනිමිත්තොයි.** ආසාවන්හි නොපිහිටි ආකාරයෙන් නිර්වාණය අරමුණුකොට පැවැත්තේ අපපණිහිතොයි දතයුතුය.

එකෙක් වනාහි මුලදීම අනිත්‍යය වශයෙන් සංස්කාරයන් මෙනෙහි කරයි. අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීම් මාත්‍රයෙන්ම මාර්ගයෙහි නැගී සිටීම සිදුනොවේ. දුක් වශයෙන්ද, අනාත්ම වශයෙන්ද මෙනෙහි කළයුතුමය. එහෙයින් දුක් වශයෙන්ද, අනාත්ම වශයෙන්ද මෙනෙහි කරයි. මෙසේ පිළිපන්නා වූ ඔහුට අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන කාලයෙහි මග නැගුම වේ. මේ අනිත්‍ය වශයෙන් ඇතුළට වැදී, අනිත්‍ය වශයෙන් නැගිටියි නම්. ඉදින් මොහුට දුක් වශයෙන්, අනාත්ම වශයෙන් විමසා බලනකල්හි, මාර්ග වුට්ඨානය වේද, මෙතෙමේ අනිත්‍යය වශයෙන් ඇතුළට පිවිස අනාත්ම වශයෙන් නැගී සිටියි, නමැ. දුක් වශයෙන්, අනාත්ම වශයෙන් ඇතුළට පිවිස නැගී සිටීම්හිද, එම ක්‍රමයමැයි. මෙහිද යම් අනිත්‍ය වශයෙන් ඇතුළට පිවිසීමක් වේද, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් ඇතුළට පිවිසීමක් වේද, නැගී සිටුනා කල්හිද අනිත්‍යය නැගීසිටීම වේ. තිදෙනම අධිමෝක්‍ෂ බහුල වෙති. සද්ධෙන්ද්‍රිය ලබත්. අනිමිත්ත

විමෝක්ෂයෙන් මිදෙත්. ප්‍රථම මාර්ගක්ෂණයෙහි ශ්‍රද්ධානුසාරීහු වෙති. සප්ත ස්ථානයන්හි ශ්‍රද්ධා විමුක්ත වෙති.

ඉදින් වනාහි දුක් වශයෙන් නැගී සිටීම වේද, තිදෙනම සන්සිඳීම් බහුල වෙති. සමාධින්‍ද්‍රිය ලබත්. අප්‍රණිහිත විමෝක්ෂයෙන් මිදෙත්. හැමතැන කායසාක්ෂිහු වෙති. මෙහි යමෙකුට අරූපධ්‍යාන පාදක වේද, හෙතෙම අග්‍රඵලයෙහි දෙකොටසින් මිදුණේ වේ. එකල්හි ඔවුන්ට අනාත්ම වශයෙන් නැගී සිටීම වේ. තිදෙනම නුවණ බහුල වූවාහු වෙති. ප්‍රඥෙන්‍ද්‍රිය ලබත්. ශූන්‍යතා විමෝක්ෂයෙන් මිදෙත්. ප්‍රථම මාර්ග ක්ෂණයෙහි ධර්මානුසාරීහු වෙති. ෂට් ස්ථානයන්හි දෘෂ්ටිප්‍රාප්ත වූවාහු, අග්‍රඵලයෙහි ප්‍රඥාවිමුක්ත වූවාහු වෙති.

තවද මාර්ගය නම් කරුණු පංචකයකින් නම ලබයි. එහි රස සහිත භාවයෙන්, ප්‍රත්‍යනීකතා වශයෙන්, ස්ව ගුණයෙන්, අරමුණු වශයෙන්, ආගමන වශයෙන්, ඉදින් සංස්කාරෝපෙක්ෂාව අනිත්‍යය වශයෙන් සංස්කාරයන් විමසා බලා නැගිටියිද අනිමිත්ත විමෝක්ෂයෙන් මිදෙයි. ඉදින් දුක් වශයෙන් විමසා බලා නැගිටීද, අප්‍රණිහිත විමෝක්ෂයෙන් මිදෙයි. ඉදින් අනාත්ම වශයෙන් විමසා බලා නැගිටීද, ශූන්‍යතා විමෝක්ෂයෙන් මිදෙයි. මෙය රස සහිත භාවයෙන් නමැ. (ඵල දායකත්වයෙන්). අනිත්‍යානුපස්සනාවෙන් සංස්කාරයන්ගේ ඝන වෙන්කොට, නිත්‍ය නිමිත්ත-සැමදා පවත්නා ශාශ්වත නිමිති හැර පැමිණි හෙයින් අනිමිත්තයි.

දුක්ඛානුපස්සනාවෙන්, සුව සංඥාව හැර ප්‍රණිධි ප්‍රාර්ථනා වියලවා පැමිණි හෙයින් අප්‍රණිහිතයි, අනත්මානුපස්සනාවෙන් ආත්ම, සත්ත්ව පුද්ගල සංඥා හැර සංස්කාරයන් ශූන්‍යය වශයෙන් දිටි හෙයින් ශූන්‍යතායි මෙය ප්‍රත්‍යනීක වශයෙන් යන නාමය ලබයි.

රාගාදීන්ගෙන් ශූන්‍ය හෙයින් ශූන්‍යය. රූප නිමිති ආදී රාග නිමිති ආදීන්ගේම හෝ අභාවයෙන් අනිමිත්තයි. රාග ප්‍රණිධි ආදීන්ගේ අභාවයෙන් අප්‍රණිහිතයි. මෙය ස්වගුණ වශයෙන් නාමය නම් වන්නේය.

හෙතෙම යම් ශූන්‍ය, අනිමිත්ත, අප්‍රණිහිත, නිර්වාණය අරමුණු කෙරේනුයිද, ශූන්‍යත, අනිමිත්ත, අප්‍රණිහිතයැයි කියයි. මෙය අරමුණු වශයෙන් නාමය නම් වන්නේය.

ආගමන වශයෙන් වනාහි දෙවැදෑරුම්ය. විදර්ශනාගමනයද, මාර්ගාගමනයද වශයෙනි. එහි මාර්ගයෙහි විදර්ශනාගමනය ලබයි. ඵලයෙහි මාර්ගාගමනයයි, අනත්තමානුපස්සනාව වනාහි ශූන්‍යතා නමැ. ශූන්‍යතා විදර්ශනායෙහි මාර්ගය ශූන්‍යතායි, ශූන්‍යතා මාර්ගයෙහි ඵලය ශූන්‍යතායි. අනිත්‍යානුපස්සනාව අනිමිත්ත නමැ. අනිමිත්තානුපස්සනාවෙහි මාර්ගය අනිමිත්තයි, මෙම නාමය වනාහි අභිධර්ම ක්‍රමයෙන් ලැබේ. සූත්‍රාන්ත ක්‍රමයෙන් නොලැබේ. එහි වනාහි ගෝත්‍රභූ ඤාණය අනිමිත්ත නිර්වාණය අරමුණුකොට අනිමිත්ත නාමිකව, තෙමේ පැමිණියයුතු තන්හි, සිට මාර්ගයට නාමය දේයයි කියති. එකරුණින් මාර්ගය අනිමිත්තයයි යූ.සේයි. මාර්ගාගමනයෙන් ඵලය අනිමිත්තයයි යෙදේමය. දුක්ඛානුපස්සනාව සංස්කාරයන්හි ප්‍රණිධිය වියලවා පැමිණි හෙයින්, අප්‍රණිහිත නමැ. අප්‍රණිහිත විදර්ශනායෙහි මාර්ගය අප්‍රණිහිතයි, අප්‍රණිහිත මාර්ගයාගේ ඵලය අප්‍රණිහිත යයි මෙසේ විදර්ශනාව තමාගේ නාමය මාර්ගයට දෙයි. මාර්ගය ඵලයට යැයි මෙය ආගමන වශයෙන් නාමය නමැ. මෙසේ සංස්කාරෝපේක්‍ෂා විමෝක්‍ෂ විශේෂය නියම කරයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත ත්‍රිවිධ මහාවස්තුක විමෝක්‍ෂයන් උදෙසා, එය නිර්දේශ වශයෙන්ම අන්‍ය වූද, විමෝක්‍ෂයන් නිර්දේශ කරනු කැමැතියේ, **අපිච අට්ඨ සට්ඨී විමොක්ඛා** යනාදිය වදාළහ. එහි **අපි ච** යනු අන්‍ය ක්‍රමයක් දැක්වීමයි. කෙසේ ඒවා සැට අටක් වේද, ඒවා සැත්තෑපහක් නොවේද? සත්‍යයි. නියමාකාරයෙන් සැත්තෑපහක් යයි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත ත්‍රිවිධ විමෝක්‍ෂයන් හැර අන්‍ය විමෝක්‍ෂයන් නිර්දේශ කරන කල්හි, මේවාට එය අවහිරවන හෙයින් මෙම් ත්‍රයය නොගිණිය යුතුය. අධ්‍යාත්ම විමෝක්‍ෂාදී විමෝක්‍ෂද, සතරාකාර විස්තර වචනයෙන්ම ඇතුළත් හෙයින් නොගිණිය යුතුය. '**පණිහිතො විමොක්ඛො අපපණිහිතො විමොක්ඛො**' යන මෙහි අප්‍රණිහිත විමෝක්‍ෂය පළමුව උදෙසීමෙන් ඒකනාමක හෙයින් නොගිණිය යුතුය. මෙසේ මෙම සත ඉවත්කළ කල්හි, සෙසු අටසැට විමෝක්‍ෂ වේ. මෙසේ ඇතිකල්හි ශූන්‍යතා විමෝක්‍ෂාදී ත්‍රයය නැවත කවර හෙයින් උදෙසන ලදද යත්? උදෙසීමෙන් ඇතුළත්කොට ඒවාහිද නිර්දේශ කිරීම සඳහායි. ආධ්‍යාත්ම නැගී සිටීම් ආදි ත්‍රයය ප්‍රභේදයෙන් තොරව මූලරාශි වශයෙන් උදෙසන ලදී. ප්‍රණිහිත විමෝක්‍ෂ ප්‍රතිපක්ෂ වශයෙන් නැවත අප්‍රණිහිත විමොක්‍ෂය උදෙසන ලදැයි දතයුතුය.

සතර ධ්‍යානයෝ අධ්‍යාත්මයෙහි නීවරණාදියෙන් නැගී සිටුනා හෙයින් **අජ්ඣත්තවුට්ඨානොයි. අනුලොම්** වෙත්නුයි **අනුලොමායි;** අධ්‍යාත්ම වුට්ඨානයන්ගේ සන්සිඳීම් ඉවත්වීමෙන් **අජ්ඣත්තවුට්ඨාන පටිප්පස්සද්ධියි. රූපී** යනු අධ්‍යාත්ම කේශාදීන්හි උපදවන ලද රූප ධ්‍යානය රූපයි. එම රූපය මොහුට ඇත්තේනුයි රූපීයි. **රූපානි පස්සති** යනු පිටත නීල කසිණාදී රූපයන් ධ්‍යාන චක්ෂුසින් බලයි. මෙයින් අධ්‍යාත්ම බාහිර වස්තුක කසිණයන්හි ධ්‍යාන ප්‍රතිලාභය දක්වන ලදී. **අජ්ඣත්තං අරූප සඤ්ඤී** යනු අධ්‍යාත්ම රූපසංඥී නොවේ. තමාගේ කේශාදීන්හි නූපදවන ලද රූපාවචර ධ්‍යානයයි අර්ථයි. මෙයින් පිටත පරිකර්මකොට පිටතම ලබන ලද ධ්‍යානතාව දක්වන ලදී.

**සුභන්තෙව අධිමුත්තො** යනු ශුභයයි යනුවෙන්ම අරමුණෙහි ඇලුණේ. එහි කිසිසේත් අර්පණාව තුළ සුභයයි සිතාබැලීමක් නැත. යමෙක් වනාහි නොපිළිකුල් ආකාරයෙන් සත්ත්වාරම්මණය පතුරුවමින් වාසය කෙරේද, හෙතෙම ශුභයයි යනුවෙන්ම ඇලුණේ වේ. එහෙයින් මෙසේ උද්දෙසය කරන ලදී. අර්පණාවට පත් කෙණෙහිම විෂ්කම්භන විමුක්තිය යෙදෙන හෙයින්, **සමය විමොක්ඛොයි.** එයම ස්වකෘත්‍යය කිරීම් වශයෙන් අර්පණාප්‍රාප්ත සමයෙහිම නියුක්තයැයි සාමයිකොයි. සාමායිකොයි ද පාඨයි. කෝප කරන්ට බිඳින්ට සක්‍යතායෙන් කුප්පොයි. ලෝකය නොඉක්මවන හෙයින්, ලෝකයෙහි නියුතු වූයේනුයි ලොකිකොයි. ලොකියො යනුද පාඨයි. ලෝකය තරණය කරයි එතෙර වූයේනුයි **ලොකුත්තරොයි.** අරමුණු කිරීම් වශයෙන් හෝ සම්ප්‍රයෝග වශයෙන් හෝ මෙහි ආශ්‍රවයන් නැත්තේනුයි **අනාසවොයි** රූප සංඛ්‍යාත ආමිසය සහිත වූයේ **සාමිසොයි.** රූප අරූප ප්‍රහාණයෙන් නිරාමිසයෙන්ද අතිශය නිරාමිස වූයේ **නිරාමිසා නිරාමිසතරොයි, පණිහිතො** යනු තෘෂ්ණා වශයෙන් පිහිටුවන ලද්දේ, ප්‍රාර්ථනා කරන ලදුයේ, අරමුණු කිරීම් වශයෙන් සංයෝජනයන් සමග එකට සංයෝග හෙයින් සඤ්ඤුත්තොයි. **එකත්ත විමොක්ඛා** යනු කෙලෙසුන්ගෙන් උස්ව නොවැඩුණු හෙයින් එක් ස්වභාව වූ විමොක්ෂය, **සඤ්ඤා විමොක්ඛා** යනු විදර්ශනා ඥාණයම විපරීත සංඥාවන්ගෙන් නිදහස්වන හෙයින් සඤ්ඤා විමොක්ඛායි. එම විදර්ශනා ඥාණයම මුළාවීමෙන් නිදහස්වීම් වශයෙන් ඥාණයම විමොක්ෂයනුයි **ඥාණවිමොක්ඛායි සීතිසියා විමොක්ඛා** යනු විදර්ශනා ඥාණයම සිසිල් වන්නේ යැයි පැවැති විමොක්ෂය **සීතිසියා** විමොක්ෂයි. '**සීති සිතා විමොක්ඛායිද**' පාඨයි. සිසිල්භාවය (සන්සිඳීම) වඩනා ලද හෙයින් හටගත්

විමොක්ෂයැයිද එහි අර්ථ වර්ණනා කරති. **ඣාන විමොක්ඛො** යනු උපචාර අර්පණා භේද වූද, ලෞකික ලෝකෝත්තර භේද වූද, ධ්‍යානයම විමෝක්ෂයි. **අනුපාදා චිත්තසස විමොක්ඛො** යනු තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගෙන ග්‍රහණය නොකොට වන චිත්තයාගේ විමෝක්ෂයයි. සෙස්ස කියන ලද අයුරින්ම දතයුතුය.

**විමෝක්ෂ උද්දෙස වර්ණනාව නිමි.**

කතමො යනාදී, උදෙසීමෙහි, නිර්දේශයෙහි **ඉති පටිසංචික්ඛති** යනු මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරයි. **සුඤ්ඤමිදං** යනු මෙම ස්කන්ධ පංචකය ශූන්‍යයි, කුමකින් ශූන්‍යයද? ආත්ම ආත්මීය වශයෙන් එහි **අත්තෙනවා** යනු අඥාන ජනයා විසින් පරිකල්පිත ආත්ම අභාව හෙයින්ද ඉන් ආත්මයෙහිද ශූන්‍යතාවයි. **අත්තනියෙනවා** එසේ පරිකල්පිත ආත්මයෙහි තමා සතු කිසිදැයක අවිද්‍යමානත්වයෙන් ශූන්‍ය වශයෙන් සැලකීම, ආත්මයෙහි අභාවයෙන්ම ආත්මානුගත දැහි අභාවය තමාට අයත් නම් නිත්‍ය හෝ සුව හෝ වන්නේය. එම ද්වයයම නොමැත. ඉන් නිත්‍ය ප්‍රතිපක්ෂ වූ අනිත්‍යානුපස්සනාවෙන් සුව ප්‍රතිපක්ෂ දුක්ඛානුපස්සනාවද යු.සේයි. **සුඤ්ඤමිදං අත්තෙන වා** යනු අනාත්මානුපස්සනාවම යු.සේයි. **සො** යනු මෙසේ ත්‍රිවිධ අනුපස්සනාවන්ගෙන් විදර්ශනා වඩන එම භික්ෂුව, **අභිනිවෙසං න කරොති** යනු අනාත්මානුපස්සනා වශයෙන් සිත දියුණු කරන හෙයින් ආත්මාභිනිවේශය නොකරයි. **නිමිත්තං න කරොති** යනු අනිත්‍යානුපස්සනා වශයෙන් සිත දියුණු කරන හෙයින් නිත්‍ය නිමිත්ත නොකරයි. **පණිධිං න කරොති** යනු දුකඛානුපස්සනා වශයෙන් සිත දියුණු කරන හෙයින් ආත්මීය වශයෙන් ප්‍රණිධි නොකරයි, මෙම ත්‍රිවිධ විමොක්ෂ ඒ ආකාරයෙන් විදර්ශනාක්ෂණයෙහි තදංග වශයෙන්ද ලබත්. අවිශේෂයෙන් වනාහි මුළුමනින් නැසීම් වශයෙන් මාර්ගක්ෂණයෙහිම සිදුවේ.

සිව් දැහැන් අධ්‍යාත්ම නීවරණයන්ගෙන් නැගී සිටුනා හෙයින් **අජ්ඣත්ත වුට්ඨානො විමොක්ඛොයි,** සිව් අරූප සමවත් අරමුණුවලින් නැගී සිටුනා හෙයින් **බහිද්ධා වුට්ඨානො විමොක්ඛොයි,** අරමුණද වනාහි බාහිරායතනයන් මෙන්, මෙහි බහිද්ධා යයි යුසේයි. මෙම ද්වයය විෂ්කම්භන

විමොක්ෂයි. **දුභතො වුට්ඨානො** යනු සමුච්ඡේද විමෝක්ෂයයි. **නීවරණෙහි වුට්ඨාති** යන ආදීන්ගෙන් අධ්‍යාත්ම නැගිටීම ස්වරූප වශයෙන් යූ.සේයි.

**රූප සඤ්ඤාය** යනාදීන්හි කසිණාදී අරමුණු සමතික්‍රමණය ප්‍රකට හෙයින් එය නොකියා සූත්‍රාන්තයන්හි කියන ලද රූප සංඥාදීන්ගේ සමතික්‍රමණය යූ.සේයි.

සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාසා යනු සමාස පදයයි. සක්කාය දෘෂ්ටියෙන්, විචිකිච්ඡායෙන්, සීලව්‍රත පරාමාසයෙනැයි පද බෙදීමයි. මෙයම හෝ පාඨයි. **විතක්කොච** යනාදීන්ගෙන් ධ්‍යාන සමාපත්තීන්ගේ උපචාර භූමි යූ.සේයි. **අනිච්චානුපස්සනා** යනාදීන්ගෙන් සිව් මාර්ගයන්ගේ පූර්වභාග විදර්ශනාව යූ.සේයි. **පටිලාභොච** යනු පස්වැදෑරුම් වසී ප්‍රාප්තියෙන් ව්‍යාප්ත වූ, පැතිරුණු ලාභයනුයි පටිලාභොයි. වසීප්‍රාප්තියෙන් පසු සියලු ධ්‍යාන ප්‍රයෝගයන්ද සමාපත්ති ප්‍රයෝගයන්ද සන්සුන් වූයේ වේ. එහෙයින් පටිලාභො පටිප්පස්සද්ධි විමොක්ඛො යයි යූ.සේයි. විපාකය වනාහි ධ්‍යානයෙහිද, සමාපත්තියෙහිද සන්සිඳීම ඍජුවම වේ. සමහරු වනාහි උපචාර ප්‍රයෝගයෙහි සන්සුන් හෙයින් ධ්‍යානයෙහිද සමවතෙහිද ප්‍රතිලාභය වේ යයි කියති. එහෙයින් ධ්‍යාන, සමාපත්ති ප්‍රතිලාභය **පටිප්පස්සද්ධි විමොක්ඛොයි** කියති. **අජ්ඣත්තං** යනු තමා පිළිබඳ උසස් කෘත්‍යවත් භාවයෙන් පැවැති, **පච්චත්තං** යනු තමා පිළිබඳ පැවති ද්වයයෙන්ම තමා අයත් අධ්‍යාත්මයම දක්වයි. **නීල නිමිත්තං** යනු නිල්වූයේම **නීල සඤ්ඤං පටිලභති** යනු එම නිල් නිමිත්තෙහි නිල්යැයි සංඥාව ලබයි. **සුග්ගහිතං කරොති** යනු පරිකර්ම භූමියෙහි මනාව ගන්නා ලද්දක් කරයි. **සූපධාරිතං උපධාරෙති** යනු උපචාර භූමියෙහි මනාව සලකා බලා, තවදුරටත් විමසයි. **සවාවත්ථිතං අවත්ථාපෙති** යනු අර්පණා භූමියෙහි මනා නිශ්චයෙන් නිශ්චය කරයි, වවත්ථාපෙතියිද පාඨයි. අධ්‍යාත්මයෙහි නීල පරිකර්මය කරනුයේ, කෙස්හි, පිතෙහි, ඇසෙහි කලු ඉංගිරියාවෙහි හෝ කරයි, **බහිද්ධා නීලනිමිත්තෙත** යනු නිල් මල්, නිල් වස්තුන්, නීල ධාතුන්හි එක්තරා නිල් කසිණයෙක්හි, **චිත්තං උපසංහරති** යනු සිත පමුණුවයි. පීතාදීන්හිද එම ක්‍රමයමැයි. **ආසෙවති** යනු එම සංඥාවම මුල සිට සේවනය කරයි. **භාවෙති** යනු වඩයි. **බහුලීකරොති** යනු නැවත නැවත කරයි. **රූපං** යනු නිල් නිමිති රූපයයි. **රූපසඤ්ඤී** යනු එම රූපයෙහි සංඥාව රූප සංඥාවයි. එය මොහුට ඇත්තේනුයි රූප සංඥීයි. අධ්‍යාත්ම කහ වර්ණ නිමිති ආදීන්හි, කහ වර්ණ පිරියම්

කරනුයේ මේදයෙහි හෝ සිවියෙහි හෝ අක්ෂීන්හි කහ වර්ණ ස්ථානයන්හි කරයි.

රත් පැහැයෙහි පිරියම් කරනුයේ, මාංසයෙහි හෝ ලෙයෙහි හෝ දිවෙහි හෝ අත් තලයන්හි පාද තලයන්හි හෝ අක්ෂීන්හි රත්පැහැ තන්හි කරයි. ශ්වේත පිරියම් කරනුයේ, අස්ථීන්හි හෝ දතෙහි, නියෙහි, අක්ෂීන්හි ශ්වේත ස්ථානයෙහි කරයි. **අජ්ඣත්තං අරූපං** යනු අධ්‍යාත්ම රූප නිමිත්ත නැතැයි අර්ථයි.

**මෙත්තා සහගතෙන** යනු ප්‍රථම, ද්විතීය, තෘතීය ධ්‍යාන වශයෙන් මෛත්‍රියයෙන් යුක්ත වීමෙන්, **චෙතසා** යනු සිතින්, **එකං දිසං** යනු තනි එක් දිසායෙක ඇතුළත් සත්ත්වයින්ට පැතිරීම් වශයෙන් යූ.සේයි. **ඵරිත්වා** යනු ස්පර්ශකොට, අරමුණුකොට, විහරති යනු බ්‍රහ්ම විහාරානුගත ඉරියව් විහරණය පවත්වයි. එසේ එයට අනතුරු දෙවන, තෙවන, සිව්වන යයි අර්ථයි. **ඉති උද්ධං** යනු එම ක්‍රමයෙන්ම මතු දිසාවයැයි යූ.සේයි. **අධොතිරියං** යනු යට දිසාවද, සරස් දිසාවද, එපරිද්දෙන්මය. එහිද, අධො යනු යට භාගය, තිරියං යනු අනුදිසාය. මෙසේ අශ්වයන් ධාවන පිට්ටනියක අශ්වයෙකු මෙන් මෛත්‍රී සහගත සිත හසුරුවයි. නැවත නැවත හසුරුවයි. මෙතෙකින් එක් එක් දිසාව පරිග්‍රහණය කොට සීමා වශයෙන් මෛත්‍රිය පැතිරවීම දක්වන ලදී. **සබ්බධි** යනාදීන්හි වනාහි සීමා රහිතව පැතිරවීම දැක්වීම සඳහා යූ.සේයි. එහි **සබ්බධි** යනු හැමතන්හි, **සබ්බත්තතාය** යනු සියලු හීන, මධ්‍යම, උත්කෘෂ්ට, මිත්‍ර, සතුරු, මධ්‍යස්ථ ආදී ප්‍රභේදයන්හි ආත්ම සමතායෙන් යුතුව ක්‍රියා කිරීමයි. මේ අන් සත්ත්වයෙකියි විභාග නොකොට ආත්ම සමතායෙන් සලකයි යයි යූ.සේයි. නොහොත් **සබ්බත්තතාය** යනු සම්පූර්ණ චිත්තයාගේ ස්වභාවයෙන් මදක් හෝ පිටත වික්ෂෙප නොකරනුයේ යනුයි. **සබ්බාවන්තං** යනු හැම සතුන් ඇති, සියලු සත්ත්වයින්ගෙන් යුක්තයි යන අර්ථයි. 'සබ්බවන්තං'යිද පාඨයි. **ලොකං** යනු සත්ත්වලෝකයයි. **විපුලෙන** යනු මේ ආදී ක්‍රම දැක්වීමෙන් වනාහි මෙහි නැවත මෛත්‍රී සහගතව යැයි යූ.සේයි. යම් හෙයකින් වනාහි මෙහි ප්‍රමාණ වශයෙන් පැතිරීම් වශයෙන් නැවත තථා ශබ්දය හෝ ඉති ශබ්දය නො යූසේයි. එහෙයින් නැවත **මෙත්තා සහගතෙන චෙතසායි** යූසේයි. නිගමන වශයෙන් හෝ එය යූසේයි. **විපුලෙන** යනු මෙහි පැතිරීම් වශයෙන් මහත්බව දතයුතුය. භූමි වශයෙන් වනාහි එය මහද්ගතය. එය වනාහි කෙලෙස් විෂ්කම්භනයට සමත් හෙයින්ද, මහත් ඵලතායෙන්ද,

දීර්ඝ පැතිරීම් වශයෙන්ද, මහත් භාවයට ගිය හෙයින්ද, මහත් වූ උළාර, ඡන්‍ද, වීර්ය, චිත්ත ප්‍රඥාවන් හා ගියේනුයි පිළිපන්නේනුයි **මහග්ගතං** යි. ප්‍රගුණ වශයෙන් අප්‍රමාණ සත්ත්ව අරමුණු වශයෙන්ද, **අප්පමාණංයි.** ව්‍යාපාද නමැති සතුරන්ගේ ප්‍රහාණයෙන් **අවෙරංයි.** දොම්නස් ප්‍රහාණයෙන් **අබ්‍යාපජ්ඣංයි.** නිදුක් යයිද යූ.සේයි. **අප්පටික්කූලා හොන්ති** යනු භික්ෂුවගේ සිතට අප්‍රතිකූලව වැටහේ. සෙස්සෙහිද කියන ලද අයුරින්ම කරුණා, මුදිතා, උපේක්ෂා වශයෙන් යෙදිය යුතුය. කරුණාවෙහි සිත වෙහෙස කරන සතුරාගේ ප්‍රහාණයෙන් අවෛරයි. මුදිතාවෙහි නොඇල්ම නමැති සතුරාගේ ප්‍රහාණයෙන් වේ. **උපෙක්ඛා සහගතෙන** යනු චතුර්ථ ධ්‍යාන වශයෙන් උපේක්ෂාවෙන් යුක්ත වූයේ, රාගය නමැති සතුරාගේ ප්‍රහාණයෙන් අවෛරී වේ. ලෞකික දෑ හා සම්බන්ධ සොම්නස් ප්‍රහාණයෙන් අව්‍යාපාදයයි. සියලුම අකුසල් කෙලෙස් දාහ යෝගයෙන් ව්‍යාපාද සහිතවම වූයේය. මේ ඒවාහි විසේසයි.

**සබ්බසො** යනු සර්වාකාරයෙන් හෝ සියල්ලන්ගේ සේස රහිතව යැයි අර්ථයි. **රූපසඤ්ඤානං** යනු සංඥා ශීර්ෂයෙන් කියන ලද රූපාවචර ධ්‍යානයෝද, ඒ හා පැවැති ආරම්මණයෝද, 'රූපී රූපානි පස්සති' ආදීන්හි රූපාවචර ධ්‍යානයද රූපයයි යූ.සේයි. '**බහිද්ධා රූපානි පස්සති සුවණ්ණ දුබ්බණ්ණානි**' ආදීන්හි එහි අරමුණද ඇතුළත්ය. එහෙයින් මෙහි රූපයෙහි සංඥාව රූප සංඥායැයි මෙසේ සංඥා ශීර්ෂයෙන් කියන ලද රූපාවචර ධ්‍යානයට එය විශේෂ නාමයකි. රූපයෙහි සංඥාව වන්නේනුයි රූප සංඥායි. රූපය එයට නාමය යැයි යූ.සේයි.

මෙසේ පෘථුවි කසිණාදී භේද වූ තදාරම්මණයට එය විශේෂ නාමයකැයි දතයුතුය. **සමතික්කමා** යනු නොඇලීමෙන්, නිරෝධයෙන්, කුමක් කියන ලද්දේ වේද, එම කුසල, විපාක, ක්‍රියා වශයෙන් පසළොස් ආකාර ධ්‍යාන සංඛ්‍යාත රූප සංඥාවන්ගේ, එහිම පෘථුවි කසිණාදී වශයෙන් නව වැදෑරුම් අරමුණු සංඛ්‍යාත රූප සංඥාවන්ගේ, සර්වාකාරයෙන් ශේෂ රහිතව, නොඇල්මෙන්ද, නිරෝධයෙන්ද, විරාග හේතුවද, නිරෝධ හේතුවද දුරුකොට ආකාසානඤ්චායතනයට එළඹ වාසය කරයි. සර්වාකාරයෙන් නොඉක්මවන ලද රූප සංඥාවෙන් එයට එළඹ වාසය කරන්ට නොහැකිය. එම සමාපත්තීහු අරමුණු ඉක්මවීමෙන් පැමිණිය යුත්තාහ. ප්‍රථම ධ්‍යානාදීන් මෙන් එක් අරමුණෙක්හිම නොවේ. අරමුණෙහි නොඇලුණහුට සංඥා සමතික්‍රමණය නොවෙයි. එහෙයින් මෙය අරමුණු ඉක්මවීම් වශයෙන්යැයි අර්ථ වර්ණනා කරන ලදැයි දතයුත්තාහ.

**පටිඝසඤ්ඤානං අත්ථංගමා** යනු චක්ෂුරාදී වස්තූන්ගේද රූපාදී ආරම්මණයන්ගේද, හැපීමෙන්, උපන් සංඥාව පටිඝ සංඥායි. රූප සංඥාදීන්ට එය විශේෂ නාමයකි. එම කුසල විපාක පංචකයද, අකුසල විපාක පංචකයද යන සර්වප්‍රකාරයෙන් දසවැදෑරුම් දසවැදෑරුම් වූ, ප්‍රතිඝ සංඥාවන්ගේ, විනාශ කිරීමෙන් ප්‍රහාණයෙන්, නොහටගැන්මෙන්, නොපැවැත්ම කොටයයි යූ.සේයි. ඒකාන්තයෙන් එය ප්‍රථමධ්‍යානාදීන්ට සමවන්නහුටද නොමැත. එසමයෙහි පංචද්වාර වශයෙන් සිත නොපවතී. මෙසේ ඇතිකල්හිද, අන් තන්හි ප්‍රහීණ වූ, සුවදුක්හි, චතුර්ථ ධ්‍යානයෙහි මෙන්, සක්කාය දෘෂ්ටීන්ගේ තෙවන මාර්ගයෙහි මෙන්ද, මෙම ධ්‍යානයෙහි උත්සාහ ජනනය සඳහා මෙම ධ්‍යානයට ප්‍රශංසා වශයෙන් ඒවාට මෙහි කීම දතයුතුය. නොහොත් කිසිසේත් එය රූපාවචර ධ්‍යානයට සමවන්නහුට නොමැත. එකල්හි ප්‍රහීණ නුවූ හෙයින් නොමැත. රූප විරාගයෙන් රූපාවචර භාවනා නොපවතියි. ඒවාහි පැවැත්ම රූපයන්ට අයත්මය. මෙම භාවනාව රූප විරාගය සඳහා පවතී. එහෙයින් එය මෙහි ප්‍රහීණයැයි කියන්ට සුදුසුය. හුදෙක් කියන්ට පමණෙක් නොව, ඒකාන්තයෙන්ම මෙසේ දරන්ටද සුදුසුය. ඒවාහි මින් පෙර ප්‍රහීණ නොවූ හෙයින්ම ප්‍රථම ධ්‍යානයට සමවන්නහුට ශබ්දය කටුවකැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙහිද ප්‍රහීණ වූ හෙයින්ම අරූප සමාපත්තීන්ගේ කම්පා නොවන බවද ශාන්ත විමෝක්ෂතාවද යූ.සේයි.

**නානත්ත සඤ්ඤානං අමනසිකාරා** යනු නානාප්‍රකාර අරමුණුවල පවත්නා, සංඥාවන්ගේ, නානාප්‍රකාර සංඥාවන්ගේ එම රූප ශබ්දාදි භේද වූ, නානාප්‍රකාර නානා ස්වභාව අරමුණුවල පවතී. අෂ්ට කාමාවචර කුසල සංඥාවන්, දොළොස් අකුසල සංඥාවන්, එකොළොස් කාමාවචර කුසල විපාක සංඥා, අකුසල විපාක සංඥා ද්වයය, එකොළොස් කාමාවචර ක්‍රියා සංඥායයි මෙසේ සූසාළිස් සංඥා නානා ප්‍රකාරය, නානාස්වභාවයෙන් යුක්තය. ඔවුනොවුන් විසදෘශයහ. එහෙයින් නානාප්‍රකාර සංඥායි යූ.සේයි. එම නානාප්‍රකාර සංඥාවන්ගේ සර්වප්‍රකාරයෙන් මෙනෙහි නොකිරීමෙන් ආවර්ජන නොකිරීමෙනැයි සිත්ද නොඉපදවීමෙන්, යම් හෙයකින් ආවර්ජන නොකරයිද, චිත්තයන්ද නොඉපදවාද, මෙනෙහි නොකෙරේද, ප්‍රත්‍යවේක්ෂා නොකෙරේද, එහෙයිනැයි යූසේයි. යම්හෙයකින් මෙහි ප්‍රථම රූපසංඥා ප්‍රතිඝ සංඥාවද, මෙම ධ්‍යානයෙන් උපන් භවයෙහිද විද්‍යමාන නොවේද? එම භවයෙහි මෙම ධ්‍යානයට එළඹ වාසය කරන කල්හි කියනුම කවරේද? එහෙයින් ඒවාහි සමතික්‍රමණයෙන්, අස්තංගමනයෙනැයි දෙයාකාරයෙන්ම

අභාවයම යූ.සේයි. නානත්ව සංඥාවන්හි, අටවැදෑරුම් කුසල සංඥා, නව ක්‍රියා සංඥා, දස අකුසල සංඥා යන මෙම සත්විසි සංඥා මෙම ධ්‍යානයෙන් උපන් භවයෙහි විද්‍යමාන වේ. එහෙයින් ඒවාහි මෙනෙහි නොකිරීමෙනැයි දතයුතුය. එහිද මෙම ධ්‍යානයට එළැඹ වසනුයේ ඒවා මෙනෙහි නොකිරීමෙන්ම එළඹ වාසය කරයි. ඒවා මෙනෙහි කරනුයේ නොසමවන්නේ වේ. මෙහි සංක්ෂෙපයෙන් රූප සංඥාවන්ගේ සමතික්‍රමණය යනු මෙයින් සියලු රූපාවචර ධර්මයන්ගේ ප්‍රහාණය යූ.සේයි. **පටිඝසඤ්ඤානං අත්ථංගමා නානත්ත සඤ්ඤානං අමනසිකාරා** යනු මෙයින් සියලු කාමාවචර චිත්ත චෛතසිකයන්ගේ ප්‍රහාණයද, මෙනෙහි නොකිරීමද යූ.සේයි. **අනන්තො ආකාසො** යන මෙහි ප්‍රඥප්ති මාත්‍රයක් බැවින් මෙහි උත්පාදයෙහි අන්තයක් හෝ වසයෙහි අන්තයක් නොපැණේනුයි අනන්තයි. අන්තයක් නොමැති පැතිරීම් වශයෙන්ද අනන්තයි. එම යෝගියා එක් කොටසක් වශයෙන් නොපතුරුවයි. සමස්ත ආකාශය වශයෙන් පතුරුවයි. **ආකාසො** යනු කසිණය උගුලුවාලූ අහස් ප්‍රදේශයයි. ආකාසානඤ්චායතනාදීන් කියන ලද අර්ථමය. උපසම්පජ්ජ විහරති යනු එයට පත්ව, නිපදවා, එයට සුදුසු ඉරියව්වෙන් වසයි. එයම සමවැදිය යුතු හෙයින් සමාපත්තියි. **ආකාසානඤ්චායතනං සමතික්කම්ම** යනු පෙර කියන ලද ආකාරයෙන් ධ්‍යානයද, අරමුණද ආකාසානඤ්චා යතනයි. අරමුණද පෙර කියන ලද ආකාරයෙන්මය. ආකාසානඤ්චයද, එය ප්‍රථම අරූප ධ්‍යානයට අරමුණු හෙයින් දෙවියන්ගේ දේවායතනය මෙන් අධිෂ්ඨානාර්ථයෙන් ආයතන යනුයි ආකාසානඤ්චායතනයි. එසේම ආකාසානඤ්චය වූ එය එම ධ්‍යානයාගේ හටගන්නා හේතු බැවින්, 'කාම්බෝජය අශ්වයින්ගේ උපන් තැනයි' ආදීන්හි මෙන් හටගන්නා දේශය යන අර්ථයෙන් ආයතනය වූයේනුයි ආකාසානඤ්චායතනයි. මෙසේ එම ධ්‍යානයද අරමුණද යන ද්වයයම නොපැවැත්වීම් තත්වයට පත් කරලීමෙන්ද, මෙනෙහි නොකිරීමෙන්ද, ඉක්මවාම මෙම විඤ්ඤාණඤ්චායතනයට එළඹ වාසය කළයුතුය. එම ද්වයයම එකක් ලෙස සලකා 'ආකාසානඤ්චායතනය ඉක්මවා' යයි මෙසේ යූසේයි.

**අනන්තං විඤ්ඤාණං** යනු එම ආකාසය අනන්තයැයි පතුරුවා පැවති විඤ්ඤාණය, විඤ්ඤාණය අනන්තයැයි මෙනෙහි කරනුයේ යැයි යූ.සේයි. මෙනෙහි කිරීම් වශයෙන් හෝ අනන්තයි. හෙතෙම ඒ ආකාසාරම්මණ විඤ්ඤාණය ශේෂ රහිතව මෙනෙහි කරනුයේ අනන්තව මෙනෙහි කරයි. **විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම** යන මෙහිද පෙර

කියන ලද අයුරින්ම ධ්‍යානයද, අරමුණද විඤ්ඤාණඤ්චායතනයයි, අරමුණද පෙර කියන ලද ක්‍රමයෙන්ම විඤ්ඤාණංචය. ඒ දෙවන අරූප ධ්‍යානයට අරමුණු හෙයින් අධිෂ්ඨානාර්ථයෙන් ආයතන යනුයි විඤ්ඤාණඤ්චායතනයි. එසේම එම විඤ්ඤාණඤ්චය එම ධ්‍යානයටම හටගන්නා හේතු බැවින්, හටගන්නා දේශය යන අර්ථයෙන් ආයතන යනුයි විඤ්ඤාණඤ්චායතනයි. මෙසේ එම ධ්‍යානයද අරමුණද යන ද්වයයෙහිම නොපැවතීම් තත්වයට පත්කරලීමෙන්, මෙනෙහි නොකිරීමෙන් ඉක්මවාම මෙම ආකිඤ්චඤ්ඤායතනයට එළඹ වාසය කළයුතුය. එහෙයින් මෙම ද්වයයම එකක් සේ සලකා, 'විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා' යයි මෙසේ යූ.සේයි.

නත්ථි කිඤ්චි යනු නොමැත, නොමැත. හිස්ය, හිස්ය. විචිත්‍රය, විචිත්‍රයැයි මෙසේ මෙනෙහි කරනුයේයැයි යූසේයි. **ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම** යන මෙහිද පෙර කියන ලද ක්‍රමයෙන්ම ධ්‍යානයද අරමුණද ආකිඤ්චඤ්ඤායතනයි, අරමුණද වනාහි පෙර කියන ලද ආකාරයෙන්මය. ආකිඤ්චඤ්ඤයද, එය තෘතීය අරූප ධ්‍යානයට ආරම්මණ හෙයින් අධිෂ්ඨානාර්ථයෙන් ආයතන යනුයි ආකිඤ්චඤ්ඤායතනංයි. එසේම එය ආකිඤ්චඤ්ඤයද එම ධ්‍යානයාගේ හටගන්නා හේතු හෙයින්, හටගන්නා දේශාර්ථයෙන් ආයතන යනුයි ආකිඤ්චඤ්ඤායතනයයි. මෙසේ එම ධ්‍යානයද, අරමුණද යන ද්වයයම නොපවත්නා භාවයට පත්කිරීමෙන්ද, මෙනෙහි නොකිරීමෙන්ද, ඉක්මවා මෙම නේවසඤ්ඤා නාසඤ්ඤායතනයට එළඹ වාසය කළයුතුය. එහෙයින් මෙම ද්වයයම එකක් සේ සලකා 'ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා යයි මෙය යූසේයි.

සඤ්ඤාවේදයිත නිරෝධ කථාව යට කියන ලදමය. **රූපී රූපානි පස්සති** යන සත් විමෝක්ෂයන් විරුද්ධ ධර්මයන්ගෙන් මනාව නිදහස්වීම් අර්ථයෙන්, අරමුණෙහි ඇලීම් වශයෙන් පැවැත්මෙහි මනාව නිදහස්වන අර්ථයෙන්ද විමොක්ෂයි. සමවතට සමවන් කල්හි නිදහස් වූයේ වේ. නැගිටි කල්හි නොමිදුණේ වේයයි **සමය විමොක්ඛායි**. මුළුමනින් නැසීම් සංඛ්‍යාත නිදහස්වීම් වශයෙන් අත්‍යන්තයෙන් නිදහස් වූ හෙයින් ආර්යමාර්ග එයට ඇතුළත්ය. සන්සිඳීම් සංඛ්‍යාත නිදහස්වීම් වශයෙන්, අත්‍යන්තයෙන් නිදහස් වූ හෙයින් සෝවාන් ඵලාදීහුය. නිස්සරණ විමුක්ති වශයෙන් අත්‍යන්තයෙන් නිදහස් වූ හෙයින් නිර්වාණය **අසමය විමොක්ඛායි**. සාමයික අසාමයික විමොක්ෂයද එසේමය. **සාමයිකා**

**සාමයික විමොක්ඛො** ප්‍රමාදයට පැමිණ පිරිහේනුයි **කුපෙපොයි.** ලෝකය සඳහා පවතීනුයි **ලොකියොයි.** ආර්ය මාර්ගයෙන් ලෝකය තරණය කෙරෙත්නුයි **ලොකුතතරායි.** සෝවාන් ආදී මාර්ග ඵලයන් හා නිර්වාණයද ලෝකයෙන් එතෙර වූයේනුයි **ලොකුතතරායි.** ගිනිගත් යකඩ ගුලියක මැස්සන් මෙන්, තෙදින් බහුල, ලෝකෝත්තර ධර්මය, ආශ්‍රවයෝ නොඑල්බෙත්නුයි **අනාසවොයි. රූප පටිසඤ්ඤුතෙතා** යනු රූප ධ්‍යානයන්ය. **අරූප පටිසඤ්ඤුතෙතා** යනු අරූප සමාපත්තීහුය. තෘෂ්ණායෙන් එල්බුණේ **පණිහිතොයි.** නොඑල්බුණේ **අපපණිහිතොයි.** මාර්ග ඵලයන් ඒකාරම්මණ හෙයින්ද, එක් නිෂ්ඨාවක් හෙයින්ද, **එකනත විමොක්ඛොයි.** නිර්වාණය අද්විතීය හෙයින් **එකනත විමොක්ඛොයි** අරමුණු නානත්වයෙන්ද, විපාක නානත්වයෙන්ද **නානතත විමොක්ඛොයි සියා** යනු වන්නේය යනාර්ථයි. සියයක් වෙතියි එකක් වේයයි වන්නේය යන අර්ථයි. සියා යන මෙය නියම කිරීමේ වචනයයි. විමසීම් වචනය නොවේ. **වත්‍ථුවසෙන** යනු නිත්‍ය සංඥාදී දසවස්තු වශයෙන් දසයක් වේ. **පරියායෙන** යනු නිදහස්වන ක්‍රමයෙක් එකක් වේ. **සියාති කථඤ්ච සියාති** යනු යමක් හෝ වන්නේ යයි කරන ලද්දේද? එය කෙසේ වන්නේදැයි විචාරයි. **අනිච්චානුපසසන ඤාණං** යනු සමාද පදයෙකි. 'අනිච්චානුපසසනා ඤාණං'යිද පාඨයි. සෙස්සෙහිද එසේමය. **නිච්චතො සඤ්ඤාය** යනු නිත්‍ය වශයෙන් පැවැති සංඥාවෙන් නිත්‍යයයි පැවැති සංඥාවෙනැයි අර්ථයි.

සුව වශයෙන් ආත්ම වශයෙන්, නිමිති වශයෙන්, සංඥා වශයෙන් යන මෙහිද එම ක්‍රමයමැයි. **නිමිත්තතො** යනු නිත්‍ය නිමිත්ත වශයෙන්, **නන්දියා තණ්හාය** යනු තෘෂ්ණා වශයෙන් පැවැති සංඥාවෙන්, තෘෂ්ණා සම්ප්‍රයුක්ත සංඥායෙනැයි අර්ථයි. ඇලීම් වශයෙන්, හටගැනීම් වශයෙන්, දෘඪග්‍රහණ වශයෙන්, ප්‍රණිධි වශයෙන්, ඇලීම් වශයෙන්, සංඥා වශයෙන් යන මෙහිද එම ක්‍රමයමැයි. ක්ෂය, ව්‍යය, විපරිණාමානුපස්සනා යන ත්‍රිවිධ අනුපස්සනාවන්ගේද, බලවත් භාවයෙන්, බලවත් ප්‍රත්‍යය වූ භංගානුපස්සනාවගේ විශේෂත්වය වේ. භංග දර්ශනයෙන් අනිත්‍යානු පස්සනාව බලවත් වේ. අනිත්‍යානුපස්සනාව බලවත්ව හටගත් කල්හි, යමක් අනිත්‍යයද, එය දුකය, යමක් දුකද, එය අනාත්මයැයි, දුක්ඛ අනාත්ම අනුපස්සනාවෝ බලවත් වෙති. එහෙයින් අනිත්‍යානුපස්සනාදීන් කී කල්හි එම ත්‍රයයම කියන ලද්දේම වෙයි. ශූන්‍යතානුපස්සනාවෙන්, ආත්මාභිනිවේස සංඥාවෙන් මිදේයයි යන වචනයෙන්ම, හර වශයෙන්

ගන්නා, මුළාවීම් වශයෙන් ගන්නා ඇලීම් වශයෙන් ගන්නා, එකට බැඳීම් වශයෙන් ගන්නා අභිනිවේසයෙන්ද සංඥාවෙන් මිදේයයි කියන ලද්දම වේයයි අභිනිවේස අභාවයෙන්ම නුවණින් මෙනෙහි නොකිරීම් සංඛ්‍යාත සංඥාවෙන් මිදේයයි යූ.සේයි. එහෙයින් අධිප්‍රඥා ධර්ම විදර්ශනාදී පංච අනුපස්සනාද නොකියන ලදී. මෙසේ අටළොස් මහා විදර්ශනාවන්හි ඒ අට අනුපස්සනා නොකියා දස අනුපස්සනාවෝම යූ.සේයි. **අනිච්චානුපස්සනා යථාභූතං ඤාණං** යනු අනිත්‍යානුපස්සනාවම යථාභූත ඤාණයයි, දෙකම ප්‍රථමා වචනයි. යථාභූත ඤාණය යනු ඤාණාර්ථයයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **සම්මොහා අඤ්ඤාණා** යනු මුළාවීම් ස්වභාව වූ නොදැනීම. **මුච්චති** යනු විමෝක්ෂාර්ථයයි.

**අනිච්චානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං** යනු මෙහි සාසනයෙහිම ස්වභාව වශයෙන් උත්තමාර්ථයෙන් අනුත්තරංයි. අනුත්තරත්‍වයට ප්‍රත්‍යය හෙයින්ද අනුත්තරංයි. සිසිල් භාවයෙන්ම යුත් ඤාණය සීතිභාව ඤාණයයි, එය අනිත්‍යානුපස්සනා සංඛ්‍යාත අනුත්තර සිහිල් භාවයෙන් යුත් ඤාණයයි, 'මහණෙනි, කරුණු සයකින් යුක්ත භික්ෂුව අනුත්තර සීතිභාවය (නිවන) සාක්ෂාත් කරන්ට සුදුසු වන්නේය. මෙහි නිර්වාණය අනුත්තර සීතිභාවය නමැ. මෙහි වනාහි විදර්ශනාව අනුත්තර සීතිභාවයයි. **නිච්චතො සන්තාප පරිළාහ දරථා මුච්චති** යන මෙහිද නිච්චං යනු පවත්නා කෙලෙස්මය. මෙහිද අසවල් තැනද තැවීම් අර්ථයෙන් සන්තාපොයි. දැවීම් අර්ථයෙන් පරිළාහොයි. උෂ්ණාර්ථයෙන් දරථයයි කියති. **නෙක්ඛම්මං ඣායතීති ඣානං** යනාදීන් යට කියන ලද අර්ථමය. මෙහි නෛෂ්ක්‍රම්‍යාදී අට සමවත් නිර්වේද භාගීමය. **අනුපාදා චිත්තස්ස විමොක්ඛො** යනු මෙහි විදර්ශනාවමය. යම් ඒ චිත්තයාගේ අනුත්පාද විමෝක්ෂයක් වේද, සියලුම කථා ඒ සඳහාය. සියලුම සම්මන්ත්‍රණ ඒ සඳහායි. යන මෙහි වනාහි නිර්වාණය චිත්තයාගේ අනුත්පාද විමෝක්ෂයයි. **කතීහුපාදානෙහි** යනු කෙතෙක් උපාදානයන් කෙරෙන්, **කතමා එකුපාදානා** යනු කවර එක් උපාදානයකින්, **ඉදං එකුපාදානා** යනු මේ එක් උපාදානයෙන්, 'ඉදං යනු පූර්ව ඤාණාපේක්ෂාවෙන් හෝ, උපාදානයන්ගෙන් මිදෙන කල්හි මුලදී, සංස්කාරයන්ගේ උදයව්‍යය දැක දැක අනිත්‍යානුපස්සනාවෙන් විදර්ශනා කරයි. පසුව සංස්කාරයන්ගේ භංගයම දැක අනිමිත්තානුපස්සනාවෙන් විදර්ශනා කරයි. අනිමිත්තානු පස්සනාව අනිත්‍යානුපස්සනාවගේම විශේෂයකි. සංස්කාරයන්ගේ හටගැන්ම හා විනාශය දැකීමෙන්ද, භංගය දැකීමෙන්ද ආත්ම භාවය

ප්‍රකට වේ. එයින් දෘෂ්ටි උපාදානයාගේද ආත්මවාදූපාදානයාගේද ප්‍රහාණය වේ. දෘෂ්ටි ප්‍රහාණයෙන්ම, 'සීලයෙන් හා ව්‍රතයෙන් ආත්මය පිරිසිදු වේයයි යන දර්ශනයෙහි අභාවය වන හෙයින් සීල ව්‍රතොපාදානය ප්‍රහාණ වේ. අනාත්මානුපස්සනාවෙන් ඍජුවම ආත්ම අභාවය දකියි. ශූන්‍යතානු පස්සනාව අනාත්මානුපස්සනා විශේෂයක්මය. මෙම සිව් ඤාණ දෘෂ්ටි උපාදානාදී උපාදානයන්ගෙන් මිදෙත්. දුකඛානුපස්සනාදී මෙම සතරට තෘෂ්ණාව ඍජු විරුද්ධතා හෙයින්ද, අනිත්‍යානුපස්සනාදී ත්‍රයයට කාමූපදානයෙන් මිදීම නොයූසේයි. මුලදීම දුකඛානුපස්සනාවෙන් සංස්කාර දුක්යැයි බලන කල්හි, පසුව අප්‍රණිහිතානුපස්සනාවෙන්ද සංස්කාර දුක්යැයි බලන කල්හි සංස්කාරයන්ගේ බලාපොරොත්තු දුරුවෙයි. අප්‍රණිහිතානු පස්සනාව දුකඛානුපස්සනාවෙහිම විශේෂයකි. සංස්කාරයන්හි, නිර්වේදානුපස්සනාවෙන් නිර්වේදයට පත්වන්නහුට, විරාගානු පස්සනාවෙන්, නොඇලෙන්නහුට සංස්කාරයන්ගේ ප්‍රාර්ථනා ප්‍රහීණ වේ. එහෙයින් මෙම සිව් ඤාණ හෝ කාමූපාදානයෙන් මිදෙත්. යම්හෙයකින් නිරොධානුපස්සනාවෙන් කෙලෙස් නිරුද්ධ කරයිද, පටිනිසසගගානු පස්සනාවෙන් කෙලෙස් පරිත්‍යාග කෙරේද, එහෙයින් මෙම ද්වි ඤාණයෝ සිව් උපාදානයන්ගෙන් මිදෙත්නුයි මෙසේ ස්වභාව නානත්වයෙන්ද, ආකාර නානත්වයෙන්ද විමොක්ෂ හැටඅටක් නිර්දිෂ්ටය.

මුලදී, උදෙසන ලද ත්‍රිවිධ විමෝක්ෂයන්ගේ විමෝක්ෂ මුඛයන් ගෙනහැර දක්වා, විමෝක්ෂ මුඛ පූර්වාංගම ඉන්ද්‍රිය විශේෂයද, පුද්ගල විශේෂයද, දක්වනු කැමැත්තේ 'තීණි ඛො පනිමානි' ආදිය වදාළහ. එහි **විමොකඛ මුඛානි** යනු ත්‍රිවිධ විමෝක්ෂයන්ගේ මුඛයෙන් **ලොක නියයානාය සංවතතනති** යනු ත්‍රෛධාතුක ලෝකයෙන් නිර්යාණය, නික්මයාම සඳහා පවතිත්. **සබබ සංඛාරෙ පරිච්ඡේද පරිවටුමතො සමනුපසසනතා** යනු සංස්කාරයන්ගේ උදයව්‍යය වශයෙන්, වෙන්කිරීම් වශයෙන්, පරිවෘත්ත වශයෙන් මනාව නුවණින් බැලීම් ස්වභාවයෙන්, ලොක නියයානං හොති යනු පාඨශේෂයි. අනිත්‍යානුපස්සනාව වනාහි හටගැන්මට මත්තෙහි සංස්කාර නැතැයි පිරිසිඳ, ඒවාහි ස්වභාවය මනාව සොයනු ලබන්නාහු, විනාශයෙන් මත්තෙහි නොයති. මෙහිම අතුරුදන් වෙති. පරිවෘත්ත වශයෙන් අවසන් වශයෙන් නුවණින් මනාව විමසා බලයි. සියලු සංස්කාර හටගැන්මෙන් පූර්වාන්තය පිරිසිඳින ලදී. විනාශයෙන් අපරාන්තය පිරිසිඳින ලදී. **අනිමිතතායච ධාතුයා චිතත සමපකඛනදනතාය** යනු විදර්ශනා ක්ෂණයෙහිද නිර්වාණ ප්‍රවණතායෙන් අනිමිත්තාකාරයෙන්, වැටහෙන

හෙයින්, අනිමිත්ත සංඛ්‍යාත නිර්වාණ ධාතුවෙහි සිත පිවිසෙන හෙයින්ද, ලෝක නිර්යාණය වේ. මනො **සමුතෙත ජනතාය** යනු සිතෙහි සංවේගය ඇතිකරලීම සඳහා, දුකඛානුපස්සනාවෙන් සංස්කාරයන් පිළිබඳව සිත සංවේගයට පත්වේ. **අපපණිහිතායච ධාතුයා** යනු විදර්ශනා **ක්‍ෂණයෙහිද**, නිර්වාණ නිම්න හෙයින් අප්‍රණිහිතාකාරයෙන් වැටහෙන හෙයින්, අප්‍රණිහිත සංඛ්‍යාත නිර්වාණ ධාතුවෙහි, **සබබ ධමෙම** යනු නිර්වාණයාගේ විදර්ශනා නොඑළඹි කල්හිද, අනාත්ම ස්වභාවය යෙදෙන හෙයින් සියලු සංස්කාරයන්ගෙන් යැයි නොකියා සියලු ධර්මයන්ගෙන් යැයි යූසේයි.

**පරතො සමනුපසසනතාය** යනු ප්‍රත්‍යයන්ට අයත් හෙයින්ද, සිය වසඟයෙහි නොපවත්නා හෙයින්ද, යටහත්ව නොපවත්නා හෙයින්ද මම නොවෙමි. මාගේ නොවේයයි මෙසේ අනාත්ම වශයෙන් නුවණින් විමසා බලන ස්වභාවයෙන්, **සුඤ්ඤතායච ධාතුයා** යන, විදර්ශනා **ක්‍ෂණයෙහිද**, නිර්වාණ නිම්නතායෙන් ශුන්‍යතාකාරයෙන් වැටහෙන හෙයින්, ශූන්‍යතා සංඛ්‍යාත නිර්වාණ ධාතුයෙහි, මෙසේ මෙම තෙවචනයන්ගෙන්, අනිත්‍යය, දුඃඛය, අනාත්මය යන අනුපස්සනාවන්ගේ වශයෙන් යූ.සේයි. එහෙයින්ම ඉන් අනතුරුව '**අනිචචතො මනසිකරොති**' යන ආදිය යූ.සේයි. එහි **ඛයතො** යනු, ක්‍ෂය වන අර්ථයෙන්, **භයතො** යනු භය සහිත වශයෙන්, **සුඤ්ඤතො** යනු ආත්ම රහිතතායෙන්. **අධිමොකඛ බහුලං** යනු අනිත්‍යානුපස්සනා වශයෙන් ක්‍ෂණ භංග වශයෙන් සංස්කාරයෝ බිඳෙත්නුයි ශ්‍රද්ධාවෙන් පිළිපන්නහුට ප්‍රත්‍යවේක්‍ෂා කරන කල්හි, ක්‍ෂණ භංග දර්ශනයෙන් භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සත්‍යයක් වදාළ සේකැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැවැති ශ්‍රද්ධායෙහි ශ්‍රද්ධා බහුලතා සිතක් වේ. නොහොත් වර්තමාන සංස්කාර කොටස්හි, අනිත්‍යතාව දැක මෙසේ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න සියලු සංස්කාරයන් අනිත්‍යයැයි ස්ථිර ලෙස පිහිටන හෙයින් සිත අධිමෝක්‍ෂ බහුල වේ. **පසසදධි බහුලං** යනු දුක්ඛානුපස්සනාවෙන් සිතෙහි කැළඹීම් ඇති කරවන ප්‍රණිධියගේ අත්හැරීම වන හෙයින් සිතෙහි දාහයෙහි අභාවය වන හෙයින් සිත සන්සිඳීම් බහුල වේ. නොහොත් දුක්ඛානුපස්සනාවෙන් සංවේගය හටගන්නා හෙයින් නුවණින් ප්‍රධන් වීර්යය කරන හෙයින්, සංවේගප්‍රාප්තයාට වික්‍ෂෙප අභාවයෙන් සිත සන්සිඳීම් බහුල වේ. **වෙද බහුලං** යනු අනතමානු පස්සනාවෙන් (සස්නෙන්) බාහිර අය නුදුටු ගැඹුරු අනාත්ම ලක්‍ෂණ බලනුයේ ඥාණ බහුල සිතක් වේ. නොහොත් දෙවියන් සහිත ලෝකයා නුදුටු අනාත්ම ලක්‍ෂණය දිටියෙමියි සතුටු වූවහුට තුෂ්ටිබහුල වූ සිතක් වේ.

**අධිමොක්ඛ බහුලො සද්ධින්‍ද්‍රියං පටිලභති** යනු පූර්ව භාගයෙහි අධිමෝක්ෂ බහුලව පවත්වනු ලබන භාවනා පරිපූර්ණත්වයෙන් සද්ධින්‍ද්‍රිය ලබනුයේ නම් වේ. හෙතෙම එය ලබයි නමැ. **පසසද්ධි බහුලො සමාධින්‍ද්‍රියං පටිලභති** යනු පූර්වභාගයෙහි සන්සිඳීම් බහුල වූවහුගේ, සත්සුන් සිරුරු ඇත්තේ සුව විඳියි. සුවපත් වූවහුගේ සිත තැන්පත් වේ යන වචනයෙන්, සන්සිඳීම් ප්‍රත්‍යයෙන්, භාවනා පරිපූර්ණත්වයෙන් සමාධින්‍ද්‍රිය වේ. හෙතෙම එය ලබයි නමැ. **වෙදබහුලො පඤ්ඤින්‍ද්‍රියං පටිලභති** යනු පූර්වභාගය සතුට බහුලව පවත්වනු ලබනුයේ භාවනා පරිපූර්ණත්වයෙහි පඤ්ඤින්‍ද්‍රිය නම් වේ. හෙතෙම එය ලබයි නමැ.

**ආධිපතෙය්‍යං හොති** යනු ඡන්දාදීන් අධිපති වූ කල්හිද ස්වකෘත්‍ය නිෂ්පාදන වශයෙන් අධිපති වේ. ප්‍රධාන වේ. **භාවනාය** යනු සත්තමී වචනයි. මතුමත්තෙහි භාවනාව සඳහා **තදන්වයාහොනති** යිද, **තං අනුගාමිනී** එය අනුගමනය කරනුයේ, **තං අනුවත්තිනී** ඒ අනුව පවතිනුයේ වේ. **සහජාත පච්චයා හොනති** යනු උපදිනු ලබන්නා වූද, උපත සමග වන ස්වභාවයෙන් උපකාරක වේ. බැබළීමට ආලෝකය මෙනි. **අඤ්ඤමඤ්ඤ පච්චයා හොනති** යනු ඔවුනොවුන්ට ඉපැත්මට උපස්තම්භ වන ස්වභාවයෙන් උපකාරක වේ. ඔවුනොවුන්ට උපකාරක වන ත්‍රිදණ්ඩ මෙනි. **නිස්සය පච්චයා හොනති** යනු අධිෂ්ඨානාකාරයෙන්ද, නිශ්‍රයාකාරයෙන්ද, උපකාරක වේ. තරු විසිතුරු කර්මාන්තයන්හි පෘථුවි තලයක් මෙන්, **සමපයුතත පච්චයා හොනති** යනු ඒකවස්තුක, ඒකාරම්මණ, ඒකෝත්පාද, ඒකනිරෝධ සංඛ්‍යාත සම්ප්‍රයුක්ත භාවයෙන් උපකාරක වේ.

**පටිවෙධ කාලෙ** යනු මාර්ගක්ෂණයෙහි සත්‍ය ප්‍රතිවේධ කාලයෙහි, **පඤ්ඤින්‍ද්‍රියං ආධිපතෙය්‍යං හොති** යනු මාර්ගක්ෂණයෙහි නිර්වාණය අරමුණුකොට සත්‍යයද දර්ශන කෘත්‍යය කිරීම් වශයෙන්ද කෙලෙස් ප්‍රහාණ කෘත්‍යය කිරීම් වශයෙන්ද, පඤ්ඤින්‍ද්‍රියයම ජ්‍යෙෂ්ඨ වේ. **පටිවෙධාය** යනු සත්‍යය ප්‍රතිවෙධය සඳහා, **එකරසා** යනු විමුක්ති රසයෙන්, **දසසනටෙඨන** යනු සත්‍යය දර්ශනාර්ථයෙන්, **එවං පටිවිජඣනෙතාපි භාවෙති භාවෙනෙතා පටිවිජඣති** යනු මාර්ගක්ෂණයෙහි වරක්ම භාවනාවෙහිද ප්‍රතිවේධයෙහිද යථා ස්වභාවය දැක්වීම සඳහා යූ.සේයි. අනාත්මානු පස්සනාවෙන් විදර්ශනා ක්ෂණයෙහිද, ප්‍රඥෙන්ද්‍රියයාගේම අධිපතිත්වය ප්‍රතිවේධ කාලයෙහි යැයි අපි ශබ්දය යොදන ලදී.

**අනිච්චතො මනසිකරොතො කතමින්ද්‍රියං අධිමත්තං හොති** ආදී ඉන්ද්‍රිය විශේෂයෙන්, පුද්ගල විශේෂය දක්වන්ට යු.සේයි. එහි ශ්‍රද්ධෙන්ද්‍රිය, සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රියයන්ගේ අධිමාත්‍රතාව සංස්කාරෝපේක්ෂාවෙන් දතයුත්තාහ. **සද්ධා විමුත්තො** යන මෙහි අවිසේසයෙන් කියන ලද්දේ නමුත් මත්තෙහි විශේෂකොට කියන ලද හෙයින්, සෝවාන් මාර්ගය හැර සෙසු සත් තන්හි ශ්‍රද්ධා විමුක්තයයි යු.සේයි.

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමාත්‍රතායෙන් ශ්‍රද්ධා විමුක්ත නම් වේ. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමාත්‍රාභාවයෙන් හැමතැන ශ්‍රද්ධා විමුක්තයැයි නොයුසේයි. ස්‍රෝතාපත්ති මාර්ගක්ෂණයෙහි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමාත්‍රතාවය වේ. සෙසු සමාධින්ද්‍රිය, ප්‍රඥෙන්ද්‍රියයන්ගේ අධිමාත්‍රතාව ඇතිකල්හිද, ශ්‍රද්ධා විමුක්තම නම් වේයයි කියති. **කාය සක්ඛි හොති** යනු අටතන්හි කාය සාක්ෂි නම් වේ. **දිට්ඨිප්පත්තො හොති** යන්න ශ්‍රද්ධා විමුක්තයෙහි කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය.

**සද්දහන්තො විමුත්තොති සද්ධා විමුත්තො** යනු ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමාත්‍රතා හෙයින් සෝවාන් මාර්ග ක්ෂණයෙහි අදහනුයේ, සිව් ඵලක්ෂණයන්හි මිදුණේනුයි ශ්‍රද්ධා විමුක්තයයි යු.සේයි. මතු මාර්ගත්‍රය ක්ෂණයෙහි, ශ්‍රද්ධා විමුක්තතාව දැන් කියයි. ස්‍රෝතාපත්ති මාර්ගක්ෂණයෙහි ශ්‍රද්ධානුසාරිත්වය පසුව කියයි. **ඵුට්ඨත්තා සච්ඡිකතොති කාය සක්ඛි** යනු ශුෂ්ක විදර්ශකත්වය ඇතිකල්හි උපචාර ධ්‍යාන ස්පර්ශයාගේද, රූපාරූප ධ්‍යානලාභිත්වය ඇතිකල්හි, රූපාරූප ධ්‍යාන ස්පර්ශයාගේ ස්පර්ශ කළ හෙයින්, නිර්වාණය සාක්ෂාත් කරන ලද්දේනුයි කාය සාක්ෂි නමැ. කයින් කියන ලද ආකාර ඇති, ධ්‍යාන ස්පර්ශයෙහිද, නිර්වාණයෙහිද සාක්ෂියයි යු.සේයි. දිට්ඨප්පත්තො යනු දිටි හෙයින් පැමිණියේයැයි ස්‍රෝතාපත්ති මාර්ග ක්ෂණයෙහි ඒ හා යෙදුණු ප්‍රඥෙන්ද්‍රියයෙන් ප්‍රථමයෙන් නිර්වාණයාගේ දිටි හෙයින්, පසුව ස්‍රෝතාපත්ති ඵලාදී වශයෙන් නිර්වාණයට පැමිණියේනුයි දෘෂ්ටිප්‍රාප්තයි. ප්‍රඥෙන්ද්‍රිය සංඛ්‍යාත දෘෂ්ටියෙන් නිර්වාණයට පැමිණියේ යැයි යු.සේයි. ස්‍රෝතාපත්ති මාර්ගක්ෂණයෙහි ධර්මානුසාරිත්වය පසුව කියයි. **සද්දහන්තො විමුච්චතීති සද්ධා විමුත්තො** යනු ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමාත්‍රතා හෙයින්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් මාර්ග ක්ෂණයන්හි අදහනුයේ මිදේයයි ශ්‍රද්ධා විමුක්තයි, මෙහි මිදෙනු ලබනුයේද බලාපොරොත්තුයෙහි භූත (වීම්) වචන වශයෙන් විමුක්ත යැයි යුසේයි.

**ඣාන ඵසසං** යනු ධ්‍යාන ස්පර්ශය තෙවදෑරුම්ය. 'ඣාන ඵසසං' යනාදීන්ද, 'දුකඛා සංඛාරා' යනාදීන්ද, ප්‍රථමයෙන් කියන ලද ද්වයයම වෙසෙසා යූ.සේයි. **ඤාතං හොති** යනාදීන් යට කියන ලද අර්ථමය. මෙහිද ධ්‍යානලාභී පුද්ගලයා, සමාධීන්ද්‍රියයට අනුකූල දුක්ඛානුපස්සනා වෙන්ම නැගිට මාර්ග ඵලයන්ට පැමිණේයයි ආචාර්යවරුන්ගේ අදහසයි. **සියා** යනු වන්නාහුය යන අර්ථයි. වන්නාහුය සියා යන එය නියම කිරීම් වචනයයි. **තයො පුගගලා** යනු විදර්ශනා නියමයෙන්ද, ඉන්ද්‍රිය නියමයෙන්ද කියන ලද ත්‍රිපුද්ගලයෝ, **වතු වසෙන** යනු ත්‍රිවිධ අනුපස්සනාවන්හි එකිනෙක ඉන්ද්‍රිය වශයෙන්, **පරියායෙන** යනු එම ක්‍රමයෙන්ම, මෙම වාරයෙන් කුමක් දක්වන ලද්දේ වේද, යට එකිනෙක අනුපස්සනාවෙහි එකිනෙක ඉන්ද්‍රියයෙහි ආධිපත්‍යය බොහෝ වශයෙන්, කියන ලදුයේද, කිසිකලෙක්හි ත්‍රිවිධ අනුපස්සනාවන්හි එකිනෙකම ඉන්ද්‍රියයාගේ ආධිපත්‍යය වේයයි දක්වන ලද්දේ වේ. නොහොත් පූර්වභාග විදර්ශනා ක්ෂණයෙහි ත්‍රිවිධ අනුපස්සනාවන්ගේ යෙදීම වන හෙයින් ඒ පූර්වභාග විදර්ශාවන්හි ඒ ඒ ඉන්ද්‍රියයන්ගේ ආධිපත්‍යය අපේක්ෂාකොට මාර්ග ඵලක්ෂණයන්හි ශ්‍රද්ධා විමුක්ති ආදී නම් වේ. මෙසේ කියනු ලබන කල්හි යට වුට්ඨානගාමිනී විදර්ශනායෙහිද මත්තෙහිද කරන ලද ඉන්ද්‍රියාධිපති පුද්ගල නියමය මනාව කරන ලද්දේම, නිශ්චලම වේ.

අනන්තර වාරයෙහි **සියා** යනු **අඤ්ඤඤායෙව** යනු මෙසේ වන්නේ යයි අර්ථයි. මෙහි නියමය පෙර කියන ලද්දේමය. දැන් මාර්ගඵල වශයෙන් පුද්ගල විසේසය බෙදා දක්වන්ට, **අනිච්චතො මනසිකරොතො** -පෙ- **සොතාපතති මගගං පටිලභති** යනාදිය වදාළහ.

එහි ශ්‍රද්ධාව අනුව හැසිරේ. අනුව යයි. ශ්‍රද්ධායෙන් හෝ නිර්වාණය අනුව හැසිරේ. අනුව යේනුයි **සඳධානුසාරීයි.**

**සච්ඡිකතං** යනු ප්‍රත්‍යක්ෂ කරන ලදී. **අරහත්තං** යනු අර්හත් ඵලයයි. ප්‍රඥා සංඛ්‍යාත ධර්මය සිහිකරයි. එම ධර්මයෙන් හෝ නිර්වාණය සිහිකෙරේනුයි - ධම්මානුසාරියි.

නැවත වෙනත් ක්‍රමයන්ගෙන්, ඉන්ද්‍රියත්‍රය විශේෂයෙන් පුද්ගල විශේෂය වර්ණනා කරනු කැමැතියේ, 'යෙහි කෙචි' යනාදිය වදාළහ. එහි **භාවිතාවා** යනු අතීතයෙහි වැඩූහ හෝ, **භාවෙනති වා** යනු වර්තමානයෙහි,

**භාවිසසනතිවා** යනු අනාගතයෙහි **අධිගතාවා** යනු එක් එක් අන්තිකය ප්‍රථම ප්‍රථමයෙහි අර්ථ විවරණය සඳහා යූ.සේයි. **එසසිතාවා** යනු ඥාණ ස්පර්ශයෙන් ස්පර්ශ කළහ හෝ, **වසිපපතතා** යනු ඓශ්වර්යභාවයට පැමිණියාහු, **පාරමිපපතතා** යනු අවසානයට පැමිණියාහු, **වෙසාරජජපපතතා** යනු විසාරද භාවයට පැමිණියාහු, සියලු ශ්‍රද්ධා විමුක්තාදීහු යට කියන ලද ක්‍ෂණයන්හිමය. සතිපට්ඨානාදීහු මාර්ගක්‍ෂණයෙහිමය. අට්ඨ විමොකෙඛ යනු රූපී රූපානි පසසති ආදීන්හිය. ප්‍රතිසම්භිදා මාර්ග ප්‍රාප්තියෙහිමය. **තිසෙසා සිකඛා** යනු අධිසීල, අධිචිත්ත, අධිප්‍රඥා ශික්‍ෂාවෝ, මෙසේ හික්මෙන්නාහු මාර්ගප්‍රාප්ත වූවාහු දුක මනාව දනිත් ආදීන් මාර්ග ක්‍ෂණයෙහිමය.

**පරිඤඤා පටිවෙධං පටිවිජඣති** යනු විශේෂ දැනීම් ප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කරයි. විශේෂ දැනීමෙන් ප්‍රතිවේධ කළයුතුයයි හෝ පරිඤඤා පටිවෙධංයි. සෙස්සෙහිද මෙසේමය. සියලු ධර්මාදීන්හි වෙසෙසා **අභිඤඤා පටිවෙධාදයො** විශිෂ්ට ඥාණයෙන් දතයුතු ප්‍රතිවේධාදීහු යූ.සේයි. **සචඡිකිරියා පටිවෙධො** යනු මාර්ගක්‍ෂණයෙහිම නිර්වාණ ප්‍රත්‍යවේක්‍ෂණ ඥාණ සිද්ධි වශයෙන් දතයුතුය. මෙසේ මෙහි ආර්ය පුද්ගලයෝ පස්දෙනෙක් නිර්දේශිතය. උභතොභාග විමුත්ත හා පඤඤා විමුත්ත යන මෙම දෙදෙන අනිර්දිෂ්ටයහ. අන් තන්හි වනාහි දුක් වශයෙන් මෙනෙහි කරනුයේ සන්සිඳීම් බහුල සමාධින්‍ද්‍රිය ලබයි. හෙතෙම හැමතන්හි කාය සාක්‍ෂි නම් වේ. අරූප ධ්‍යානයට පැමිණ, මාර්ග ඵලයට පැමිණියේ උභතො භාග විමුත්ත නම් වේ. අනාත්ම වශයෙන් මෙනෙහි කරනුයේ ප්‍රීතිය බහුල වූයේ ප්‍රඥෙන්ද්‍රිය ලබයි. සෝ‍තාපත්ති මාර්ගක්‍ෂණයෙහි ධර්මානුසාරී වේ. ෂට් ස්ථානයන්හි දෘෂ්ටිප්‍රාප්ත වූයේ, ප්‍රඥා විමුක්ත වූයේ අග්‍ර ඵලයෙහි පිහිටියේ වේයයි යූ.සේයි. ඔවුහු මෙහි කාය සාක්‍ෂි දෘෂ්ටි ප්‍රාප්තයන් කෙරෙහිම සංගෘහිතය. අර්ථ වශයෙන් වනාහි අරූප ධ්‍යානයෙන්ද, ආර්ය මාර්ගයෙන්ද යන දෙකොටසින් මිදුණේනුයි උභතො භාග විමුක්තයි. මනාව දැනගනුයේ මිදුණේනුයි පඤඤා විමුත්තයි. මෙතෙකින් ඉන්ද්‍රිය පුද්ගල විශේෂතා නිර්දිෂ්ටයහ.

දැන් විමෝක්‍ෂ පූර්වාංගමවම, විමෝක්‍ෂ විශේෂයද පුද්ගල විශේෂයද දක්වනු කැමැතියේ, අනිච්චතො මනසිකරොතො ආදිය වදාළහ. එහි **දෙව විමොකඛා** යනු අප්‍රණිහිත හා ශූන්‍යතා විමෝක්‍ෂයෝ අනිත්‍යානු පස්සනාවගේ එළැඹීම් වශයෙන් අනිමිත්ත විමෝක්‍ෂයැයි ලද නම් ඇති

මාර්ගය, රාග, ද්වේෂ, මෝහ ප්‍රණිධීන්ගේ අභාවයෙන් ගුණ සහිතතායෙන්ද එම ප්‍රණිධීන්ගේම අභාවයෙන් අප්‍රණිහිත යැයි ලද නම් ඇති නිර්වාණය අරමුණු කෙරේයැයි අරමුණු වශයෙන්ද, අප්‍රණිහිත විමෝක්ෂ යැයි නාමයද ලබයි. එසේම රාග, ද්වේෂ, මෝහයන්ගෙන් ශූන්‍ය හෙයින් ගුණ සහිත තාවයෙන්ද රාගාදීන්ගෙන්ම ශූන්‍ය හෙයින් ශූන්‍යයැයි ලද නම් ඇති නිර්වාණය අරමුණු කෙරේයැයි අරමුණු වශයෙන්ද ශූන්‍යතා විමෝක්ෂයැයිද නාමය ලබයි. එහෙයින් එම ද්වි විමෝක්ෂයෝ අනිමිත්ත විමෝක්ෂය අනුව ගියාහු නම් වෙති. අනිමිත්ත මාර්ගයෙන් අනන්‍ය අෂ්ට මාර්ගාංගයන්ගේ එකිනෙක මාර්ගාංගයාගේ වශයෙන් සහජාතාදී ප්‍රත්‍යයද වෙතියි දතයුත්තාහ.

නැවත **දෙව විමොක්ඛා** යනු ශූන්‍යත අනිමිත්ත විමොක්ෂයෝ, දුක්ඛානුපස්සනාවගේ පැමිණීම් වශයෙන් වනාහි අප්‍රණිහිත විමෝක්ෂයැයි ලද නම් ඇති මාර්ගය, රූප නිමිති, රාග නිමිති, නිත්‍ය නිමිත්තාදීන්ගේ අභාවයෙන් එම නිමිතීන්ගේ අභාවයෙන්, අනිමිත්ත සංඛ්‍යාත නිර්වාණය අරමුණු කෙරේයයි අරමුණු වශයෙන්ද, අනිමිත්ත විමෝක්ෂයයි නාමයද ලබයි. සෙස්ස කියන ලද ක්‍රමයෙන්ම යෙදිය යුතුය.

නැවත **දෙව විමොක්ඛා** යනු අනිමිත්ත අප්‍රණිහිත විමෝක්ෂයන්, මෙහි යෙදීම කියන ලද ක්‍රමයමය. ප්‍රතිවේධ කාලයෙහි ඉන්ද්‍රියයන්ගේ කියන ලද ක්‍රමයෙන්ම යු.සේයි. මාර්ගක්ෂණය අත්හැර විදර්ශනා ක්ෂණයෙහි විමෝක්ෂයෙක් නම් නැත. පළමුව කියන ලද්දම මාර්ග විමෝක්ෂය **පටිවෙධකාලෙ** යයි වචනයෙන් වෙසෙසා දක්වන ලදී. **යොවායං පුගගලො සදධා විමුතෙතා** ආදී ද්වි වාරයන්ද, **අනිචචතො මනසිකරොනෙතා සොතාපතති මගගං පටිලභති** යන ආදී වාරයද සංක්ෂිප්ත කරන ලදී. විමෝක්ෂ වශයෙන් යොදා විස්තර වශයෙන්ද දතයුතුය. **යෙහි කෙචි නෙකඛමමං** යන ආදී වාරය කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. මෙපමණකින්, විමෝක්ෂ පුද්ගල විශේෂතා නිර්දිෂ්ටය.

නැවත විමෝක්ෂ මුඛයන්ද, විමෝක්ෂයද නොයෙක් අයුරින් නිර්දේශ කරනු කැමැතියේ, **අනිචචතො මනසිකරොතො** අදිය වදාළහ. එහි **යථාභූතං** යනු යථා ස්වභාවයෙන්, **ජානාති** යනු ඥාණයෙන් දනියි. **පසසති** යනු එම ඥාණයෙන්ම ඇසින් දුටුසේ දකියි. **තදනවයෙන** යනු එය අනුගමනයෙන්, එයට ප්‍රත්‍යක්ෂ වශයෙන් ඥාණයෙන් දක්නා ලද්දෙහි

අනුගමනයෙන් යයි අර්ථයි. **කංඛා පහීයති** යනු අනිත්‍යානුපස්සනාවෙන් නිත්‍ය අනිත්‍ය පිළිබඳ සැකයන්, අනෙක්වායින් අනෙක් සැකයන්, **නිමිත්තං** යනු සන්තති හා ඝන බෙදා වෙන්කිරීමෙන් නිත්‍ය සංඥාවෙහි ප්‍රහීණ හෙයින් අරමුණු වූ, සංස්කාර නිමිත්ත තත්වාකාරයෙන් දනියි. **තෙන වුච්චති සම්මා දස්සනං** යනු ඒ යථා ස්වභාව දැනීමෙන් යුත් එම ඥාණය සම්මා දස්සනංයයි යූ.සේයි. **පවත්තං** යනු දුක්ඛප්‍රාප්තාකාරයෙහි සුව සංඥාව උගුලුවා සුව සංඥාවගේ ප්‍රහාණයෙන් ප්‍රණිධි සංඛ්‍යාත තෘෂ්ණාවගේ ප්‍රහීණ හෙයින් සුව සම්මත වූද විපාක ප්‍රවෘත්තිය තත්වාකාරයෙන් දනියි. **නිමිත්තඤ්ච පවත්තඤ්ච** යනු නොයෙක් ධාතු මනසිකාර හටගැන්මෙන්, සමූහ-ඝන වෙන් කිරීමෙන් යන දෙයාකාරයෙන්ම ආත්ම සංඥාවගේ ප්‍රහීණ හෙයින් සුව සම්මත වූද විපාක ප්‍රවෘත්තිය තත්වාකාරයෙන් දනියි. **යඤ්ච යථාභූතං ඤාණං** යනු ආදී ත්‍රයය දැන් කීයේමය. අනෙකක් නොවේ. **භයතො උපට්ඨාති** නිත්‍ය, සුව, ආත්ම අභාව දර්ශනයෙන් පිළිවෙළින් ඒ ඒ දෑ භය වශයෙන් වැටහේ. **යඤ්ච භයතුපට්ඨානෙ ඤාණං** යන ආදියෙන් උදයව්‍යයානුපස්සනා ඥාණය, භංගානුපස්සනා ඥාණය, භයතුපට්ඨාන ඥාණය, ආදීනවානුපස්සනා ඥාණය, නිර්වේදානුපස්සනා ඥාණය, මුඤ්චිතුකම්‍යතා ඥාණය, පටිසංඛානුපස්සනා ඥාණය, සංස්කාරෝපේක්ෂා ඥාණය, අනුලෝම ඥාණයයි කියන ලද, ප්‍රතිපදා ඥාණ දර්ශන විශුද්ධි සංඛ්‍යාත, නව විදර්ශනා ඥාණයන්හි, භයතුපට්ඨාන සම්බන්ධයෙන් අවස්ථා භේදයෙන් බිඳුණාහු, එකස්ථානී ත්‍රිවිධ ඥාණයන් යූ.සේයි. සෙස්ස නොවේ.

නැවත ත්‍රිවිධ අනුපස්සනාවන්හි අන්තයෙහි සිටි අනන්තර, අනාත්මානුපස්සනාව සම්බන්ධයෙන් එය සමග ශූන්‍යතානුපස්සනායෙහි එක් අර්ථ භාවය දක්වන්ට, **යාච අනත්තානුපස්සනා යාච සුඤ්ඤතානුපස්සනා** යන ආදිය වදාළහ. මෙම ද්වි ඥාණයෝ අර්ථ වශයෙන් එකමය. අවස්ථා භේදයෙන් බිඳුණාහ. මේවා යම්සේද, එසේම අනිච්චානුපස්සනාවද, අනිමිත්තානුපස්සනාවද, අර්ථ වශයෙන් එකම ඥාණයයි. දුක්ඛානුපස්සනාවද, අප්‍රණිහිතානුපස්සනාවද, අර්ථ වශයෙන් එකම ඥාණයයි, හුදෙක් අවස්ථා භේදයෙන්ම බිඳුණාහ. අනාත්මානුපස්සනාවද, ශූන්‍යතානුපස්සනාවද, ඒකාර්ථතායෙහි කියන ලද හෙයින් එම ද්වි ඥාණයන්ගේ එක් ලක්ෂණතාව ඒකාර්ථතාව යූ.සේයි.

**නිමිත්තං පටිසංඛා ඤාණං උප්පජ්ජති** යනු සංස්කාර නිමිත්ත ස්ථිර නොවේ තාවකාලිකයැයි අනිත්‍ය ලක්ෂණ වශයෙන් දැන නුවණ උපදී. ඒකාන්තයෙන් පළමුව දැන පසුව ඤාණය නූපදී. ව්‍යවහාර වශයෙන් 'සිතද ධර්මයන්ද හේතුවෙන් මනො විඤ්ඤාණය උපදී' යනාදීන් මෙන් මෙසේ යූසේයි. ශබ්ද ශාස්ත්‍රඥයෝද 'සූර්යයා පැමිණ අඳුර පහව යයි' ආදීන්හි මෙන් සමාන කාලයෙහිද මෙම පදය කැමැති වෙති. ඒකත්වනයෙන් හෝ පළමු පදයද, දෙවන පදයද එකක් සේ සලකා මෙසේ යූ.සේයි. මෙම ක්‍රමයෙන් අනෙක් පද ද්වයයෙහිද අර්ථය දතයුතුය. මුඤ්චිතු කම්‍යතාදී ත්‍රිවිධ ඤාණයන්ගේ ඒකාර්ථතාව යට යූ.සේයි. **නිමිත්තා චිත්තං වුට්ඨාති** යනු සංස්කාර නිමිතීන්හි දොස් දැකීමෙන් එහි නොඇලෙන ස්වභාවයෙන් සංස්කාර නිමිත්තෙන් සිත නැගිටී නමැ. **අනිමිත්තෙ චිත්තං පක්ඛන්දති** යනු සංස්කාර නිමිත්තට ප්‍රතිපක්ෂ වූ, අනිමිත්ත සංඛ්‍යාත නිර්වාණයෙහි සිත පිවිසේ. සෙසු අනුපස්සනා ද්වයයෙහිද මෙම ක්‍රමයෙන් අර්ථය දතයුතුය. **නිරොධ නිබ්බාන ධාතුයා** යනු කියන ලද්දා වූම ප්‍රථම අනුපස්සනා ද්වයයද යූ.සේයි. නිරොධෙ යනුද පාඨයි.

**බහිද්ධා වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා** යනු නැගී සිටීම් සම්බන්ධයෙන් ගෝත්‍රභූ ඤාණය යූ.සේයි. **ගෝත්‍රභූ ධම්මා** යනු ගෝත්‍රභූ ඤාණයමය. අනෙක් අයුරින් ඒකාර්ථතාව නොයෙදේ. අසංඛතා ධම්මා අප්පච්චයා ධම්මා යන ආදීන්හි මෙන් හෝ සිව්මග වශයෙන් හෝ බහුවචන කරන ලදැයි දතයුතුය. විමොක්ෂ යයි මාර්ගයද, මාර්ගයද කෙලෙසුන් කෙරෙන්ද, තදනුවර්තක ස්කන්ධයන් කෙරෙන්ද යන දෙකින් නැගී සිටුනේ වේ. එහෙයින් ඒහා සම්බන්ධයෙන් **යා ච දුභතො වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා** ආදිය යූ.සේයි.

නැවත විමෝක්ෂයන්ගේ නානා ක්ෂණයන් ඒකක්ෂණ ක්‍රමයෙහි දක්වනු කැමැතියේ කතිහාකාරෙහි යනාදිය වදාළහ. එහි **ආධිපතෙය්‍යට්ඨෙන** යනු ජ්‍යෙෂ්ඨකත්වයෙන්, **අධිට්ඨනට්ඨෙන** ප්‍රතිෂ්ඨා ස්වභාවයෙන්, **අභිනීහාරට්ඨෙන** යනු විදර්ශනා ක්‍රමයෙන් එළැවීම් ස්වභාවයෙන්, **නිය්‍යාණට්ඨෙන** යනු නිර්වාණයට එළැඹීම් අර්ථයෙන්, **අනිච්චතො මනසිකරොති** යනු වුට්ඨානගාමිණී විදර්ශනා ක්ෂණයෙහිම, **අනිමිත්තො විමොක්ඛො** යනු මාර්ගක්ෂණයෙහිම සෙස්සෙහිද මෙම ක්‍රමයමැයි. **චිත්තං අධිට්ඨාති** යනු සිත අධිකකොට සිටියි. සිත පිහිටුවයි යන අදහසයි. **චිත්තං අභිනීහරති** යනු විදර්ශනා ක්‍රමයෙන් සිත එළවයි.

නිරොධං නිබ්බාණං නීයාති යනු නිරෝධ සංඛ්‍යාත නිර්වාණයට එළැඹේ යැයි මෙසේ ආකාර නානත්වයෙන් සිව් ආකාරයෙන් නානා ක්ෂණතාව දක්වන ලදී.

**එකක්ඛණතාය සමොධානට්ඨෙන** යනු එකට එකතුව රැස්වීම් අර්ථයෙන්, **අධිගමනට්ඨෙන** යනු විඳිනාර්ථයෙන්, **පටිලාභට්ඨෙන** යනු ප්‍රතිලාභාර්ථයෙන්, **පටිවෙධට්ඨෙන** යනු නුවණින් අවබෝධ කරන අර්ථයෙන්, **සච්ඡිකිරියට්ඨෙන** යනු ප්‍රත්‍යක්ෂ කරන අර්ථයෙන්, **ඵුසනට්ඨෙන** යනු ඥාණ ස්පර්ශයෙන් ස්පර්ශ කරන අර්ථයෙන් **අභිසමයට්ඨෙන** යනු අභිමුව එක්තැන්වීම් අර්ථයෙන්, මෙහි **සමොධානට්ඨෙන** යනු මූලපදයයි. සෙස්ස අධිගම පර්යාය වචනයි. එහෙයින් සියල්ලෙහිම එකට විසඳීම කරන ලදී. **නිමිත්තා මුච්චති** යනු නිමිත්තෙන් මිදේ. මෙයින් විමෝක්ෂාර්ථය යූ.සේයි. **යතො මුච්චති** යනු යම් නිමිත්තකින් මිදේ. **තත්‍ථ න පණිදහති** එම නිමිත්තෙහි අපේක්ෂාවක් නොකරයි. **යත්‍ථ න පණිදහති** යම් නිමිත්තක අපේක්ෂාවක් නොකරයිද, **තෙන සුඤ්ඤො** යනු එම නිමිත්තෙන් ශූන්‍ය වූයේ, **යෙන සුඤ්ඤො** යනු යම් නිමිත්තකින් ශූන්‍ය වූයේ, **තෙන නිමිත්තෙන අනිමිත්තො** යනු මෙයින් අනිමිත්තාර්ථය යූ.සේයි. **පණිධියා මුච්චති** යනු ප්‍රණිධියෙන් මිදේ. පණිධි මුච්චතියිද පාඨයි. පංචමී අර්ථයමය. මින් විමෝක්ෂාර්ථය යූ.සේයි. **යත්‍ථ න පණිදහති** යනු යම් දුක්ඛයෙක්හි ප්‍රාර්ථනා නොකෙරේද, **තෙන සුඤ්ඤො** එම දුකින් ශූන්‍ය වූයේ, **යෙන සුඤ්ඤො** යම් දුක් නිමිත්තකින් ශූන්‍ය වූයේ **යෙන නිමිත්තෙන** යනු යම් දුක් නිමිත්තකින්, **තත්‍ථ න පණිදහති** මෙයින් අප්‍රණිහිතාර්ථය යූ.සේයි. **අභිනිවෙසා මුච්චති** යනු මෙයින් විමෝක්ෂාර්ථය යූසේයි. **යෙන සුඤ්ඤො** යනු යම් අභිනිවේස නිමිත්තෙන් ශූන්‍ය. **යෙන නිමිත්තෙන** යනු යම් අභිනිවේස නිමිත්තෙන්, **යත්‍ථ න පණිදහති තෙන සුඤ්ඤො** යනු යම් අභිනිවේස නිමිත්තක ප්‍රාර්ථනා නොකෙරේද, ඒ අභිනිවේස නිමිත්තෙන් ශූන්‍යයි. මෙයින් ශූන්‍යතාර්ථය යූසේයි.

නැවත අෂ්ට විමෝක්ෂාදීන් නිර්දේශ කරනු කැමැතියේ 'අට්ඨ විමොක්ඛා' ආදිය වදාළහ. එහි **නිච්චතො අභිනිවෙසා** යනාදීන් සංඥා විමෝක්ෂයෙහි කියන ලද ක්‍රමයෙන් දතයුත්තාහ. **සබ්බාභි නිවෙසෙහි** යනු කියන ලද ආකාර අභිනිවේසයන්ගෙන් මෙසේ අභිනිවේස මිදීම් වශයෙන් ශූන්‍යත විමෝක්ෂ නම් විය. ඒවාම නිත්‍යාදි නිමිතිවලින් මිදීම් වශයෙන් අනිමිත්ත විමෝක්ෂයි. නිත්‍යය යන ප්‍රාර්ථනාවන්ගෙන් මිදීම් වශයෙන් අප්‍රණිහිත විමෝක්ෂයි. මෙහිද, **පණිධි මුච්චති** යන හැමතැන

පංචමී අර්ථය දතයුතුය. පණිධියා මුච්චති යයි හෝ පාඨයි. සබ්බ පණිධීහි මුච්චතී යනු මෙහි සාධකයි. මෙසේ ත්‍රිවිධ අනුපස්සනා තදංග විමෝක්ෂ හෙයින්ද සමුච්ඡේද විමෝක්ෂයට ප්‍රත්‍යය හෙයින්ද පර්යායෙන් විමෝක්ෂයයි යුසේයි. **තත්‍ථ ජාතා** යනු අනන්තරව විදර්ශනා විමෝක්ෂයන් ඇතිකල්හිද මෙම කථාවෙන් මාර්ග විමෝක්ෂාධිකාරත්‍වය හෙයින්, එම මාර්ග විමෝක්ෂයෙහි හටගත්තේ යයි යුසේයි. **අනවජ්ජ කුසලා** යනු රාගාදී දෝෂ විරහිත කුසල්, සිදීම් කොට යැයිද පාඨයි. **බොධිපක්ඛියා ධම්මා** යනු සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද, පඤ්චඉන්ද්‍රිය, පඤ්චබල, සප්ත බොධ්‍යංග, ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි කියන ලද සත්තිස් බෝධිපාක්ෂික ධර්ම, **ඉදං මුඛං** යනු මෙම කියන ලද ආකාර ඇති ධර්ම සමූහය අරමුණු කිරීම් වශයෙන් නිර්වාණ ප්‍රවේශය සඳහා වන ප්‍රවේශස්ථානය හෙයින් මුඛ නමැයි යු.සේයි. **තෙසං ධම්මානං** ඒ බෝධිපාක්ෂික ධර්මයන්ට, **ඉදං විමොක්ඛ මුඛං** යනු නිර්වාණය විෂ්කම්භන, තදංග, සමුච්ඡේද, පටිප්පසසද්ධි, නිසසරණ යන විමෝක්ෂයන්හි නිසසරණ විමෝක්ෂයමය. මහණෙනි, ප්‍රත්‍යයෙන් හටගත් හෝ හට නොගත් යම් ධර්ම සමූහයක් වේද, විරාගය එම ධර්මයන් අතර ශ්‍රේෂ්ඨයයි කියනු ලැබේ යයි යු සෙයින්, උත්තමාර්ථයෙන් මුඛයනුයි විමෝක්ෂ මුඛයි. විමෝක්ෂයද, මුඛයද එයමනුයි විමොක්ඛමුඛං යැයි කම්මාධාර සමාස වශයෙන් මෙම අර්ථයම යු.සේයි. විමොක්ඛංච යයි මෙහි ලිංග විපර්යාසය කරන ලදී. **තීණි අකුසලමූලානි** යනු ලෝභ, ද්වේෂ, මෝහයෝ, **තීණි දුච්චරිතානි** යනු කාය, වාග්, මනො දුශ්චරිත, **සබ්බෙපි අකුසලා ධම්මා** යනු අකුසලමූලයන් හා සම්ප්‍රයුක්ත වූද, දුශ්චරිතයන් හා සම්ප්‍රයුක්ත වූද, අසම්ප්‍රයුක්ත වූද, සේවනය කළයුතු වූද, දෝමනස්සාදීන් හැර සියලුම අකුසල ධර්ම, කුසලමූල සුචරිතයන් කියන ලද්දට ප්‍රතිපක්ෂ වශයෙන් දතයුත්තාහ. **සබ්බෙපි කුසලා ධම්මා** යනු කියන ලද ආකාරයෙන්ම සම්ප්‍රයුක්ත හා අසම්ප්‍රයුක්තද, විමෝක්ෂයට උපනිශ්‍රය වූ සියලුම කුසල්දම්, විවර්තකථා යට යු.සේයි. විමෝක්ෂ විවර්ත සම්බන්ධයෙන් වනාහි මෙහි සෙසු විවර්තද යුසේයි. **අසෙවනා** යනු මුලින් සේවනය, භාවනා යනු එහිම වර්ධනය යනු එහිම වසීප්‍රාප්තිය සඳහා නැවත නැවත කිරීම, මාර්ගයෙහි වනාහි එක් ක්ෂණයෙක්හිම කෘත්‍ය ඉටුකිරීම් වශයෙන් ආසේවනාදිය දතයුත්තාහ. **පටිලාභොවා විපාකොවා** යන ආදිය යට කියන ලද අර්ථමය.

**සද්ධර්මප්‍රකාශනී නම් වූ ප්‍රතිසම්භිදා මාර්ග අර්ථකථායෙහි විමෝක්ෂ කථා වර්ණනාව නිමි.**

දැන් එම විමෝක්ෂ හටගැන්මෙහි හේතු වූ, හේතු සම්පත්තිය දක්වන්නහු විසින් කියන ලද, ගති කථාවෙහි පෙර නුවූ අර්ථ අනුවර්ණනාවයි, ද්විහේතුක ප්‍රතිසන්ධිකයාටද නත්ථි ඣානං අපඤ්ඤස්ස යන වචනයෙන් ධ්‍යානයද නූපදී. විමෝක්ෂය ගැන කවර කථාද? එහි **ගති සම්පත්තියා** යනු නිරය, තිරිසන් යෝනිය, ප්‍රේත විෂය, මනුෂ්‍ය, දේව සංඛ්‍යාත පංච ගතීන්හි මනුෂ්‍ය දේව සංඛ්‍යාත ගති සම්පත්තියෙහි මෙයින්ම පළමු ත්‍රිවිධ විපත්ති ගති ප්‍රතික්ෂෙප කරයි. ගතියෙන් යුක්ත වූයේ ගති සම්පත්තියි. යහපත් ගතිය යැයි යු.සේයි. ගති යනු අවකාස සහිත ස්කන්ධයෝය. පඤ්ච ගතීන්හි ප්‍රේත විෂය ග්‍රහණයෙන්ම අසුර කායයද ගන්නා ලද්දේය. **දෙවා** යනු ෂට් කාමාවචර දේවතාවෝද, බ්‍රහ්මයෝද, දේව ග්‍රහණයෙන් අසුරයෝද සංගෘහිතයි. **ඤාණ සම්පයුත්තෙ** ඤාණ සම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධික්ෂණයෙහි, ක්ෂණයද ඤාණ සම්ප්‍රයුක්ත යෝගයෙන් එම ව්‍යවහාරයෙන්ම යු.සේයි. **කතිනං හෙතුනං** අලෝභ, අද්වේෂ, අමෝහ යන හේතූන්හි කවර හේතූන්ගේ, **උප්පත්ති** යනු ඉපදීම, හටගැන්ම යයි අර්ථයි.

ශුද්‍ර කුලයෙහි උපන්නාහු නමුත් ත්‍රිහේතුක වෙති. එහෙයින් ඔවුන් සඳහා ප්‍රථම විමැසීමයි. බොහෝසෙයින් මහ පිනැතියෝ ත්‍රිවිධ මහාසාල කුලයන්හි උපදිති. එහෙයින් ඒ ත්‍රිවිධ කුලයන්ගේ වශයෙන් ත්‍රිවිධ විමැසීම වේ. පාඨය සංක්ෂිප්තය. මහත් ශාලා ඔවුන්ටනුයි **මහාසාලායි.** මහත් සාරවූවාහු, මහත් සම්පත් ඇත්තාහු යයි අර්ථයි. නොහොත් මහත් හරයක් ඔවුන්ටනුයි **මහාසාරායි** කිවයුතු කල්හි රකාරසට ලකාරකොට මහාසාලායි යු.සේයි. ක්ෂත්‍රිය මහාසාල ක්ෂත්‍රියයන් කෙරෙහි හෝ මහාසාලායි. **ඛත්තිය මහාසාලායි** සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

යම් ක්ෂත්‍රියයකුගේ ගෘහයෙහි පශ්චිමාන්තයෙන් (අවමයෙන්) සියක් කෝටි ධනය නිධන්ගතව තිබේද? කහවණුද අමුණු විස්සක් දවසේ වියදමට හිස් කෙරේද, මේ **ඛත්තිය මහාසාල** නමැ. යම් බමුණෙකුගේ ගෘහයෙහි අවම වශයෙන් අසූකෝටියක් ධනය නිධන්ගතව තිබේද? කහවණු දස අමුණක් දවසේ වියදමට හිස්කෙරේද, මේ **බ්‍රාහමණ මහාසාල** නමැ. යම් ගෘහපතියෙකුගේ ගෘහයෙහි අවම වශයෙන් සතලිස් කෝටියක් ධනය නිධන්ගත වේද, කහවණු පස් අමුණක් දවසේ වියදමට හිස්කෙරේද, මේ **ගහපති මහාසාල** නමැ.

රූපාවචර, අරූපාවචර ඒකාන්ත ත්‍රිහේතුක හෙයින් ඤාණ

සම්ප්‍රයුක්තයැයි නොයූසේයි. මිනිසුන් කෙරෙහි ද්විහේතුක අහේතුකයන්ගේද ලැබීම් ස්වභාව හෙයින්ද, කාමාවචර දෙවියන් කෙරෙහි ද්විහේතුකයන්ගේ ලැබීම් ස්වභාව හෙයින්ද සෙස්සෙහි ඤාණ සම්ප්‍රයුක්ත යැයි යූ.සේයි. මෙහිද කාමාවචර දෙවිවරු පංචකාම ගුණ රතියෙන් ක්‍රීඩා කරති. ශරීර බැබළීමෙන් බැබළෙත්නුයි දෙවායි.

රූපාවචර බ්‍රහ්මයෝ ධ්‍යාන රතියෙන් ක්‍රීඩා කරති. ශරීර බැබළීමෙන් බැබළෙත්නුයි දෙවායි. අරූපාවචර බ්‍රහ්මයෝද ධ්‍යාන රතියෙන් ක්‍රීඩා කරති. ඤාණාලෝකයෙන්ද බබළත්නුයි දෙවායි, **කුසල කම්මස්ස ජවනක්ඛණෙ** යනු අතීත ජාතියෙහිදී මෙලොව ත්‍රිහේතුක ප්‍රතිසන්ධි ජනක ත්‍රිහේතුක කාමාවචර කුසල කර්මයෙහිද, ජවනවීථියෙහි නැවත නැවත ඉපදීම් වශයෙන් සත්වරක් ජවන ක්ෂණයෙහි පවත්නා කාලයෙහි යයි අර්ථයි. **තයො හෙතු කුසලා** යනු අලෝභ, අද්වේෂ, අමෝහ යන කුසල හේතූන් **තස්මිං ඛණෙ ජාතචෙතනාය** යනු ඒ කියන ලද ක්ෂණයෙහිම හටගත් කුසල චේතනායෙන්, **සහජාත පච්චයා හොන්ති** යනු උපදිනු ලබන්නාහු, උපදනා ස්වභාවයෙන් උපකාරක වෙති. **තෙන වුච්චති** යනු එම සහජාත ප්‍රත්‍යය භාවයෙන්ම යූ.සේයි. **කුසලමූල පච්චයාපි සංඛාරා** යනු එක් චිත්තක්ෂණික ප්‍රත්‍යයාකාර ක්‍රමයෙන් යූ.සේයි. සංඛාරායි බහුවචනයෙන් දක්වයි. එහි සංස්කාර ස්කන්ධ සංගෘහිත සියලු චෛතසික සංග්‍රහ කරන ලදැයි දතයුතුය. අපි ශබ්දයෙන් සංස්කාර ප්‍රත්‍යය වූ කුසල මූලයන් යැයි යූ.සේයි. **නිකන්තික්ඛණෙ** යනු තම විපාකය දෙන්ට එළැඹි කර්මයෙහි හෝ එසේ එළැඹි කර්මයෙන් එළැඹ සිටි කර්ම නිමිත්තෙහි හෝ ගති නිමිත්තෙහි හෝ උපන්නා වූ නිකන්ති ක්ෂණයෙහි, නිකන්ති යනු ආශා කිරීම, ප්‍රාර්ථනා කිරීම ආදියයි. මරණාසන්න වූවහුට මෝහයෙන් ආකුල සිතැති හෙයින් අවීචි ගිනිදැල්හිද ආශාව උපදී. සෙසු නිමිති කෙරෙහි කවර කථාද? **ද්වෙහෙතු** යනු ලෝභය හා මෝහය යන අකුසල හේතු, භව නිකන්තිය වනාහි ප්‍රතිසන්ධියට අනතුරුව පැවැති භවංග වීථියෙන් නැගිටි කෙණෙහිම, තම ස්කන්ධ සන්තානය ඇරැබ සියල්ලම උපදී. **තස්මිං ඛණෙ ජාත චෙතනාය** යනු අකුසල් චේතනාවෙන්, **පටිසන්ධික්ඛණෙ** යනු ඒ කර්මයෙන් ගත් ප්‍රතිසන්ධික්ෂණයෙහි, **තයොහෙතු** යනු අලෝභ, අද්වේෂ, අමෝහ යන අව්‍යාකෘත හේතු, **තස්මිං ඛණො ජාතචෙතනාය** යනු විපාක අව්‍යාකෘත චේතනාවෙන් **නාමරූප පච්චයාපි විඤ්ඤාණං** යන මෙහි එම ප්‍රතිසන්ධි ක්ෂණයෙහි ත්‍රිවිධ විපාක හේතුද, සෙසු චෛතසිකද, නාමයද හෘදය වස්තු රූපයද ඉන් නාමරූප

ප්‍රත්‍යයෙන්ද ප්‍රතිසන්ධි විඥානය පවතියි. **විඤ්ඤාණ පච්චයාපි නාමරූපං** යන මෙහිද නාමය කියන ලද ආකාරමය. රූපය වනාහි මෙහි සහේතුක මනුෂ්‍ය ප්‍රතිසන්ධිය පිළිබඳ අදහස් කළ හෙයින්, මව්කුසින් උපදිනවුන්ට, වස්තු දශකය, කාය දශකය, භාව දශක යැයි සමතිස් රූපයෝය. සංසේදජයන්ටද ඕපපාතිකයන්ටද, පරිපූර්ණායතන සහිත වූයේ, චක්ෂු දශකය, ශ්‍රොත දශකය, ඝ්‍රාණ දශකය, ජිව්හා දශකය යන සමසැත්තෑ රූපයෝය. ඒ කියන ලද ආකාරැති නාමරූප ප්‍රතිසන්ධි ක්ෂණයෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් පවතී. **පඤ්චක්ඛන්ධා** යන මෙහි ප්‍රතිසන්ධි සිතින් ප්‍රතිසන්ධික්ෂණයෙහි ලබන රූපයන් රූපස්කන්ධයයි. ඒ හා සමග හටගත් වේදනාව වේදනා ස්කන්ධයයි. සංඥාව සංඥා ස්කන්ධයයි. සෙසු චෛතසික සංස්කාරස්කන්ධයයි. ප්‍රතිසන්ධි සිත විඤ්ඤාණස්කන්ධයයි, **සහජාත පච්චයා හොනති** යනු සිව් අරූපී ස්කන්ධ ඔවුනොවුන්ට සහජාත ප්‍රත්‍යය වෙතියි රූපස්කන්ධයෙන් සතර මහාභූත ඔවුනොවුන්ට සහජාත ප්‍රත්‍යය වෙයි. අරූපස්කන්ධද, හෘදයරූපයද ඔවුනොවුන්ට සහජාත ප්‍රත්‍යය වෙයි. මහාභූතද, උපාදාය රූපයන්ට සහජාත ප්‍රත්‍යය වෙයි. **අඤ්ඤමඤ්ඤ පච්චයා හොනති** යනු ඔවුනොවුන් ඉපැත්මෙහි ආධාරවීම් වශයෙන් උපකාරක වෙතියි, සතර අරූපස්කන්ධ ඔවුනොවුන්ට ප්‍රත්‍යය වෙයි. සතර මහාභූත ඔවුනොවුන්ට ප්‍රත්‍යය වෙයි. **නිස්සය පච්චයා හොනති** යනු ස්ථිර ලෙස පිහිටනාකාරයෙන්ද, නිශ්‍රයාකාරයෙන්ද උපකාරක වෙයි. **චත්තාරො අරූපිනො ඛන්ධාච අඤ්ඤමඤ්ඤං නිස්සය පච්චයා හොනති** යනු සහජාතයෙහි දක්වන ලද අයුරින් විස්තර කළයුත්තාහ. **විප්පයුත්ත පච්චයා හොනති** යනු ඒකවස්තුකාදී භාවයන්ට නොපැමිණීමෙන් විප්‍රයුක්ත භාවයෙන් උපකාරක වෙයි. අරූප ස්කන්ධ ප්‍රතිසන්ධි රූපයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය වෙයි. හෘදයරූපය අරූප ස්කන්ධයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය වේ. **පඤ්චක්ඛන්ධා** යන මෙහි මෙසේ යථා ලාභ වශයෙන් යු.සේයි. **චත්තාරො මහාභූතා** යන මෙහි ත්‍රිවිධ ප්‍රත්‍යය පළමුව යුසේයි.

**තයො ජීවිත සංඛාරා** යනු ආයුෂ, උෂ්ණය, විඤ්ඤාණය යන ත්‍රයයයි, ආයු යනු රූප ජීවිතේන්ද්‍රියය හා අරූප ජීවිතේන්ද්‍රියයි. උස්මා යනු තේජෝ ධාතුයි. විඤ්ඤාණං යනු ප්‍රතිසන්ධි විඤ්ඤාණයයි. ඒවා මතුමත්තෙහි ජීවිත සංස්කාර රැස්කෙරේ. පවත්වානුයි ජීවිත සංස්කාරයි. **සහජාත පච්චයා හොනති** යනු අරූප ජීවිතේන්ද්‍රියයද, ප්‍රතිසන්ධි විඤ්ඤාණයද සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ටද, හෘදය රූපයටද අඤ්ඤමඤ්ඤනා සහජාත ප්‍රත්‍යය වෙති. තේජෝ ධාතුව ත්‍රිවිධ මහාභූතයන්ට අඤ්ඤමඤ්ඤ

සහජාත ප්‍රත්‍යය වේ. උපාදාරූප සහජාත ප්‍රත්‍යයමය. රූප ජීවිතේන්ද්‍රිය සහජාත රූපයන්ට (ඒ හා හටගත්) ක්‍රමයෙන් සහජාත ප්‍රත්‍යය වේයයි දතයුතුය. **අඤ්ඤමඤ්ඤ පච්චයා හොන්ති නිස්සය පච්චයා හොන්ති** යනු අරූප ජීවිතේන්ද්‍රිය ප්‍රතිසන්ධි විඤ්ඤාණය යන ද්වයය සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය වෙතියි, අඤ්ඤමඤ්ඤනිශ්‍රය ප්‍රත්‍යය වෙතියි කියන ලද ආකාරයෙන්ම යොදා දතයුතුය. **විප්පයුත්ත පච්චයා හොන්ති** යනු අරූප ජීවිතේන්ද්‍රියයද ප්‍රතිසන්ධි විඤ්ඤාණයද, ප්‍රතිසන්ධි රූපයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය වෙයි. රූප ජීවිතේන්ද්‍රියය වනාහි අඤ්ඤමඤ්ඤා, නිස්සය, විප්‍රයුක්ත ප්‍රත්‍යයත්‍රයයෙහි නොයෙදේ. එහෙයින් ත්‍රිවිධ ජීවිත සංස්කාරයැයි ලැබෙන ආකාර වශයෙන් යූසේයි නාමයද, රූපයද කියන ලද ක්‍රමයෙන්ම සිව් පච්චයත්‍රයයෙහි යෙදිය යුතුය. **චුද්දස ධම්මා** යනු පංචස්කන්ධ, සිව් මහාභූත, ත්‍රිවිධ ජීවිත සංස්කාර, නාමයද රූපයද යන මෙසේ ගණන් වශයෙන් තුදුස් ධර්ම, ඒවාහිද මත්තෙහි අන්‍යයන්හිද, සහජාත ආදී ප්‍රත්‍යය භාවයි කියන ලද ක්‍රමයමය. **සම්පයුත්ත පච්චයා හොන්ති** යනු නැවත ඒකවස්තුක, ඒකාරම්මණ, ඒකෝත්පාද ඒකනිරෝධ සංඛ්‍යාත සම්ප්‍රයුක්ත භාවයෙන් උපකාරක වෙයි. **පඤ්චින්ද්‍රියානි** යනු ශ්‍රද්ධෙන්ද්‍රියාදීහුය. **නාමඤ්ච** යනු මෙහි වේදනාදී ස්කන්ධත්‍රයය, **විඤ්ඤාණඤ්ච** යනු ප්‍රතිසන්ධි විඤ්ඤාණය, නැවත චුද්දස ධම්මා යනු සතර ස්කන්ධ, පඤ්චෙන්ද්‍රිය ත්‍රිවිධ හේතු, නාමය, විඤ්ඤාණයිද යන මෙසේ ගණන් වශයෙන් තුදුස් ධර්ම, **අට්ඨ වීසති ධම්මා** යනු පළමු තුදුසද මෙම තුදුසදැයි එකතුව විසිඅටකි. මෙහි රූපයටද පිවිසි හෙයින් සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ඉවත්කොට විප්‍රයුක්ත ප්‍රත්‍යය යූ.සේයි. මෙසේ ප්‍රතිසන්ධික්ෂණයෙහි විද්‍යමාන වූ, ඒ ඒ ප්‍රත්‍යයෙන් හටගත් ධර්මයාගේ ඒ ඒ ප්‍රත්‍ය භේදය ඉදිරිපත්කොට, ප්‍රථමයෙන් නිර්දිෂ්ට හේතු නිගමනය කොට දක්වනුයේ, **ඉමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා නත්ථි උප්පත්ති හොතියි** වදාළහ. කර්ම රැස්කරන ක්ෂණයෙහි ත්‍රිවිධ කුසල හේතුද නිකන්ති ක්ෂණයෙහි අකුසල හේතු ද්වයයද, ප්‍රතිසන්ධි ක්ෂණයෙහි ත්‍රිවිධ අව්‍යාකෘත හේතුදැයි මෙසේ හේතු අටෙකි. එහි ත්‍රිවිධ කුසල හේතුද, අකුසල හේතු ද්වයයද, මෙහි ප්‍රතිසන්ධි ක්ෂණයෙහි පැවැත්මෙහිදී උපනිශ්‍රය ප්‍රත්‍යය වෙයි. ත්‍රිවිධ අව්‍යාකෘත හේතු සුදුසු පරිදි, හේතු ප්‍රත්‍යය, සහජාත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති. සෙසු වාරයන්හිද එම ක්‍රමයමැයි.

අරූපාවචරයන්ගේ වනාහි, රූප අභාවයෙන් **නාමපච්චයාපි විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයාපි නාමංයි** යූ.සේයි. රූප මිශ්‍රිත තුදුසින්ද පිරිහිණ. එහි පිරිහුණු හෙයින් අටවිසි ධර්මයයි වාරයද නො ලබයි. දැන්

විමෝක්ෂයට ප්‍රත්‍යය වූ, ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ඉදිරිපත්කොට ඒ සම්බන්ධයෙන් ද්විහේතුක ප්‍රතිසන්ධි විශේෂය පෙන්වන් කැමැතියේ **ගති සමපතතියා ඤාණ විපපයුතෙත** ආදිය වදාළහ. **කුසල කමමසස ජවනකඛණෙ** යනු අතීත ජාතියෙහි මෙලොව ප්‍රතිසන්ධිජනක ද්විහේතුක කුසල කර්මයෙහි කියන ලද ක්‍රමයෙන්ම ජවනක්ෂණයෙහි, **දෙව හෙතූ** යනු ඤාණ විප්‍රයුක්ත හෙයින් අලෝභ, අද්වේෂ කුසල හේතු, අව්‍යාකෘත හේතු ද්වයයද අලෝභ, අද්වේෂමය. **චතතාරි ඉන්‍ද්‍රියානි** යනු ප්‍රඥෙන්‍ද්‍රිය වර්ජිත ශ්‍රද්ධෙන්‍ද්‍රියාදි සතරයි. **දවාදස ධමමා** යනු ප්‍රඥෙන්‍ද්‍රියගේද, අමෝහ හේතුවගේද අඩුවූ හෙයින් දොළොසෙක. එම ද්වයයෙහි අඩුවූ හෙයින් විසිහයකි. **ඡනනං හේතූනං** කුසල හේතු ද්වයයක්ද, අකුසල හේතු ද්වයයක්ද, විපාක හේතු ද්වයයක්දැයි මෙසේ ෂට් හේතුන්ගේ, මෙහි රූපාවචර, අරූපාවචර ඒකාන්ත ත්‍රිහේතුක හෙයින් නොගන්නා ලදී. සෙස්ස ප්‍රථම වාරයෙහි කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. මෙම වාරයෙහි ද්විහේතුක ප්‍රතිසන්ධියෙහිලා, ද්විහේතුක කර්මයම කියන ලද හෙයින් ත්‍රිහේතුක කර්මයෙන් ද්විහේතුක ප්‍රතිසන්ධිය නොවේයයි යූ.සේයි. එහෙයින් ධර්ම සංග්‍රාහාර්ථ කථායෙහි ත්‍රිපිටක මහා ධම්මරක්ඛිත ථේරවාදයෙහි, ත්‍රිහේතුක කර්මයෙන් වන ප්‍රතිසන්ධිය ත්‍රිහේතුකම වේ. ද්විහේතුක කර්මයෙන් ද්විහේතුක වේ. ත්‍රිහේතුක නොවේ යයි යූ.සේයි. එය මෙම පෙළට සම වේ. ත්‍රිපිටක චූලනාග තෙරුන්ගේද, මොරවැව වාසී මහාදත්ත තෙරුන්ගේද වාදයන්හි ත්‍රිහේතුක කර්මයෙන් වන ප්‍රතිසන්ධිය ත්‍රිහේතුකම වේ. ද්විහේතුක හෝ අහේතුක නොවේ. ද්විහේතුක කර්මයෙන් ද්විහේතුක වේ. අහේතුකද වේ. ත්‍රිහේතුක නොවේයයි යූ.සේයි. එය මෙම පෙළට විරුද්ධ සේ පෙනේ. මෙම කථාවෙන් හේතු අධිකාරත්වය කියැවෙන හෙයින් අහේතුක ප්‍රතිසන්ධි නොයූසේයි.

### ගති කථා වර්ණනා නිමි.

එම හේතු සම්පත්තියෙහි හේතුභූත කර්මය දක්වන්නහු විසින් කියන ලද කර්ම කථායෙහි පෙර නුවූ අර්ථ අනුවර්ණනාව මෙසේය. එහි **අහොසිකමමං අහොසි කමම විපාකො** යන ආදීන්හි අතීත භවයන්හි කළ කර්මයට අතීත භවයන්හිම එලදුන් විපාකය සලකා, අහෝසි කර්මය, අහෝසි කර්ම විපාකයැයි යූ.සේයි. එම අතීත කර්මයෙහිම දිට්ඨධම්ම වේදනීය, උපපජ්ජ වේදනීය ප්‍රත්‍යය ඌනතායෙන් අතීත භවයන්හිදී එල නුදුන් විපාකයද, අතීතයෙහිම පිරිනිවියහුගේ, දිට්ඨධම්ම වේදනීය, උපපජ්ජ

වේදනීය අපරාපරිය වෙදනීය කර්මයාගේ පල නුදුන් විපාකයද සලකා **අහොසි කම්මං නාහොසි කම්ම විපාකොයි** යූ.සේයි. ඉක්ම ගියා වූ කර්මයෙහිම පල නුදුන් විපාකයෙහි, වත්මන් භවයෙහි ප්‍රත්‍යය සම්පත්තියෙන් පලදෙනු ලබන විපාකය සලකා **අහොසි කම්මං අත්‍ථිකම්ම විපාකොයි** යූ.සේයි. ඉක්මගියා වූ කර්මයෙහිම ඉක්මගියා වූ විපාක කාලයාගේද, වත්මන් භවයෙහි පිරිනිවන්පාන්නහුගේද, පලනොදෙන්නා වූ විපාකය සලකා **අහොසි කම්මං නත්‍ථි කම්ම විපාකොති** යූ.සේයි. අතීත වූම කර්මයාගේ විපාක දීමේ ශක්තිය තිබියදී, පල නුදුන් විපාකයට, අනාගත භවයෙහි ප්‍රත්‍යය සම්පතින් විපාක දියයුතු තත්වයට පත් විපාක දියයුතු සේ සැලකෙන කර්මය **අහොසි කම්මං භවිස්සති කම්ම විපාකොයි** යූසේයි. අතීත කර්මයාගේ ඉක්මගිය විපාක කාලයද අනාගත භවයෙහි පිරිනිවන් පාන්නහුගේද, අවිපාක තත්වය සලකා **අහොසි කම්මං නාභවිස්සති කම්ම විපාකොයි** යූසේයි.

මෙසේ, අතීත කර්මය, අතීත, වර්තමාන, අනාගත, විපාක, අවිපාක වශයෙන් ෂට් ආකාරයකට දක්වන ලදී.

වත්මන් භවයෙහි කළ, දිට්ඨධම්ම වේදනීය කර්මයෙහි මෙලොවදීම පලදෙනු ලබන විපාකය සලකා, **අත්‍ථිකම්මං අත්‍ථිකම්ම විපාකොයි** යූ.සේයි. එම වත්මන් කර්මයාගේම ප්‍රත්‍යය ඌනතායේ මෙහි පලනොදෙනුයේ, මේ අත්බැව්හිම පිරිනිවෙන්නහුට මෙලොව පලනොදෙන විපාකය සලකා **අත්‍ථි කම්මං නත්‍ථි කම්ම විපාකොයි** යූ.සේයි. වර්තමාන වූම කර්මයාගේ උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීයද, අනාගත භවයෙහි පලදිය යුතු විපාකය සලකා **අත්‍ථි කම්මං භවිස්සති කම්මවිපාකොයි** යූසේයි. වර්තමාන වූම කර්මයාගේ උපපජ්ජවේදනීයතාවයාගේ ප්‍රත්‍යය ඌනතායෙන්, අනාගත භවයෙහි පලනොදීම් භාවයද, අනාගත භවයෙහි පිරිනිවන්පෑ යුතු තැනැත්තාගේ අපරාපරියවේදනීය භාවයාගේ පලනොදිය යුතු බවද සලකා **අත්‍ථිකම්මං න භවිස්සිති කම්ම විපාකොයි** යූ.සේයි. මෙසේ වර්තමාන කර්මය වර්තමාන, අනාගත, විපාක, අවිපාක වශයෙන් සිව් අයුරෙකින් දක්වන ලදී.

අනාගත භවයෙහි කළයුතු කර්මයෙහි අනාගත භවයෙහි පලදිය යුතු කර්මය සලකා, **භවිස්සති කම්මං භවිස්සති කම්ම විපාකොයි** යූ.සේයි. එහිම අනාගත කර්මයාගේ ප්‍රත්‍යය හීනතාවයෙන් පලනොදිය යුතු වූද, අනාගත භවයෙහි පිරිනිවන් පෑයුතු තැනැත්තහුගේද, පලනොදිය යුතු

විපාකයද සලකා, **භවිස්සති කම්මං න භවිස්සති කම්ම විපාකොයි** යුසේයි. මෙසේ අනාගත කර්මය අනාගත, විපාක අවිපාක වශයෙන් දෙයාකාරයෙන් දක්වන ලදී. ඒ සියල්ල එකතුකොට දොළොස් අයුරෙකින් කර්මය දක්වන ලදී.

මෙතැන් සිට කර්ම චතුෂ්ක ත්‍රයය ගෙනහැර කියති. ඒවා කී කල්හි මෙම අර්ථය වඩාත් ප්‍රකට වන්නේය. දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය, අහෝසි කර්ම වශයෙන් කර්මය සිව්ආකාර වේ. ඒවා අතර, එක් ජවන වීථියක, සත් සිත්හි කුසල හෝ අකුසල හෝ ප්‍රථම ජවන් චේතනාව දිට්ඨධම්ම වේදනීය කර්මය නමැ. එය මෙ අත්බැව්හිම විපාක දේ. එසේ නොහැකි වනුයේ අහෝසිකර්ම වේ. කර්මවිපාක නොවූයේය. කර්මවිපාක නොවන්නේය. මෙම ත්‍රිකයෙහි වශයෙන් අහෝසි කර්මය වේ. අර්ථසිද්ධිය ගෙනදෙන සත්වන ජවන චේතනාව උපපජ්ජ වේදනීය කර්මය නමැ. එය අනතුරු අත්බැව්හි විපාක දෙයි. එසේ නොහැකි වනුයේ කියන ලද ක්‍රමයෙන්ම අහෝසි කර්ම නම් වේ. දෙඅතර පස්වන ජවන චේතනාව අපරාපරිය වේදනීය කර්මය නමැ. එය අනාගතයෙහි යම්කලෙකැ අවකාශ ලබාද? එකලැ විපාක දේ. සංසර ප්‍රවෘත්තිය ඇතිකල්හි අහෝසි කර්ම නම් නොවන්නේය.

අන්‍ය වූද සිව් අයුරු කර්මයකැ. යග්ගරුක, යබ්බහුල, යදාසන්න, කටත්තාවා යන කර්මයි. එහි යම් කුසලයක් හෝ අකුසලයක් බරපතල හා බරපතල නොවූ කර්ම අතර, යම් බරපතල මාතෘ ඝාතකාදී කර්මයක් හෝ මහද්ගත කර්මයක් හෝ වේද, එයම පළමුව පලදේ. එසේම සුසීල්‍ය හා දුස්සීල්‍ය කර්ම අතරද, බහුල වශයෙන් හා බහුල නොවූ අයුරින් කරන ලද කර්මයන්හි යමක් බහුලව කෙරේද, එයම පළමුව පලදේ. යදාසන්න නම් මියෙන කල්හි සරන ලද හෝ කළ කමැ. යමක් වනාහි මරණාසන්නයෙහි සිහිකරන්ට හෝ කරන්ට හෝ හැකිවනුයේද එම කර්මයෙන්ම උපදී. මෙම ත්‍රයයෙන් මුක්ත නැවත නැවත ලද සෙවුමැතියේ කටත්තාවාපන කර්ම නම් වේ. ඒවාහි අභාවයෙන් ඒ ප්‍රතිසන්ධිය ආපසු අදී. ඉදිරියට නොයයි.

අන්‍ය වූද සිව් ආකාර කර්මයකි. ජනක, උපස්තම්භක, උපපීඩක, උපඝාතක යනුවෙනි. එහි ජනක නම් කුසල්ද අකුසල්ද වේ. ප්‍රතිසන්ධියෙහිද, ප්‍රවෘත්තියෙහි රූපාරූප විපාක (විපාක ස්කන්ධයන්) හටගන්වයි.

උපස්තම්භකය වනාහි විපාක හටගන්වන්ට නොහැකි වේ. අන් කර්මයකින් දුන් ප්‍රතිසන්ධියෙන් හටගත් විපාකයන්හි උපදනා සුවදුක්හිදී පිහිට වේ. දීර්ඝ කාලයක් පවත්වයි. උපපීඩකය අන් කර්මයකින් දුන් ප්‍රතිසන්ධියෙහි හටගත් විපාකයන්හි උපදනා සුවදුක් පීඩාකරයි. බාධා කරයි. දීර්ඝ කාලයක් පවතින්ට නොදෙයි. උපඝාතකය වනාහි කුසල් හෝ අකුසල් වූයේ අන්‍ය දුර්වල කර්මයක් නසා එහි විපාක වළකා තමාගේ විපාකයට අවකාශ ලබාගනී. මෙසේ කර්මයෙන් කළ අවකාශයෙහි එම විපාකය උපන්නේ නම් වේ.

මෙසේ දොළොස් කර්මයන්ගේ, කර්මාන්තරයද, විපාකාන්තරයද බුදුවරුන්ගේ කර්මවිපාක ඤාණයටම නියම ස්වභාවයෙන් ප්‍රකට වේ. ශ්‍රාවක අසාධාරණව, විදර්ශකයා විසින් කර්මාන්තරයද, විපාකාන්තරයද, එක් කොටසක් වශයෙන් දතයුතුය. එහෙයින් මේ මුඛ මාත්‍ර දර්ශනයෙන් පමණක් කර්ම විපාකය ප්‍රකාශිතය. මෙසේ අමිශ්‍ර කර්ම වශයෙන් ප්‍රථම වාරය පෙන්වා, එම කර්මයම දෙකට බෙදා, කුසල් අකුසල් ආදී යුගල වශයෙන් දස ක්‍රමයන්ගෙන් අනෙක් දසවාරයන් යූ.සේයි. එහි ආරෝග්‍යාර්ථයෙන් **කුසලංයි**. අනාරොග්‍යාර්ථයෙන් **අකුසලංයි** මෙම ද්විකය ජාති වශයෙන් යූ.සේයි. අකුසලයම රාග ආදී දෝස සංයෝගයෙන් **සාවජ්ජංයි**. කුසලය එම ස්වභාවයෙන් **අනවජ්ජංයි**. අකුසලය අපිරිසිදු හෙයින්ද, කෘෂ්ණාව හටගත් හෙයින්ද **කණ්හංයි**. කුසලය පිරිසිදු හෙයින්ද, යහපත්ව හටගත් හෙයින්ද, **සුක්කංයි**. කුසලය සුඛ වෘද්ධි මාත්‍ර හෙයින් **සුඛුද්‍රයංයි**. අකුසලය දුක් වෘද්ධි මාත්‍ර හෙයින් **දුක්ඛුද්‍රායංයි**. කුසලය සුව ඵල හෙයින් **සුඛවිපාකංයි**. අකුසලය දුක්ඵල හෙයින් **දුක්ඛ විපාකංයි**. මෙසේ මේවාහි වෙනස් ආකාරයන් දතයුතුය.

## කර්ම කථා වර්ණනාව නිමි.

එම කර්මයට ප්‍රත්‍යය වූ, විපර්යාසයන් දක්වමින් කියන ලද, සූත්‍රාන්ත පූර්වාංගම විපර්යාස කථායෙහි පෙරනුවූ අර්ථ අනුවර්ණනාවයි. සූත්‍රාන්තයෙහි **සඤ්ඤා විපල්ලාසාය** සංඥාවගේ විපර්යාසයට පත් ස්වභාවයයි විපරීත සංඥාව යයි අර්ථයි. සෙසු ද්වයෙහිම එම ක්‍රමයමැයි. චිත්ත කෘත්‍යයාගේ, දුර්වල ස්ථානයෙහි, දෘෂ්ටි විරහිත හෙයින් අකුසල සංඥාවගේ ස්වකෘත්‍යයෙහි බලවත් කාලයෙහි **සඤ්ඤා විපල්ලාසොයි**.

දෘෂ්ටි විරහිත වූයේම අකුසල චිත්තයාගේ ස්වකෘත්‍ය බලවත් කාලයෙහි **චිත්ත විපල්ලාසොයි.** දෘෂ්ටි සම්ප්‍රයුක්ත සිතෙහි **දිට්ඨි විපල්ලාසොයි.** එහෙයින් සංඥා විපර්යාසය සියල්ලට වඩා දුර්වලය. චිත්ත විපර්යාසය එයට වඩා බලවත්ය. සියල්ලට වඩා දෘෂ්ටි විපර්යාසය ඉතා බලවත්ය. සංඥාව, නුවණ හටනොගත් දරුවකුගේ කහවණු දැක්ම මෙනි. අරමුණෙහි එළැඹ සිටීම් මාත්‍ර ග්‍රහණය හෙයිනි. ලක්‍ෂණාවබෝධයට පමුණුවන හෙයින් චිත්තය ගැමි පුරුෂයකුගේ කහවණු දැක්ම මෙනි. ඇතුළට කිඳබැස, ස්පර්ශ කරන හෙයින් දෘෂ්ටිය ලෝකුරුවාගේ මහ අඬුවෙන් යකඩ ග්‍රහණය මෙනි. **අනිච්චෙ නිච්චන්ති සඤ්ඤා විපල්ලාසො** යනු අනිත්‍ය වස්තුවෙහි මෙය නිත්‍යයයි මෙසේ ග්‍රහණයකොට උපදනා සංඥාව සංඥා විපර්යාසයයි. මෙම ක්‍රමයෙන් සියලු පදයන්හි අර්ථ දතයුතුය. **න සඤ්ඤා විපල්ලාසො න චිත්ත විපල්ලාසො නදිට්ඨි විපල්ලාසො** යනු සිව් වස්තුන්හි දොළොස් විපර්යාස ග්‍රාහයන්ගේ අභාවයෙන් නිසියාකාර ග්‍රහණය යු.සේයි.

ගාථාවන්හි, **අනත්තනිච අත්තා** යනු ආත්ම නුවූවෙහි ආත්මයැයි මෙසේ සංඥාවෙන් යුක්තවූයේ යන අර්ථයි. **මිච්ඡාදිට්ඨිහතා** යනු හුදෙක් සංඥාවෙන් පමණක් යුක්ත වූයේ නොව සංඥාව මෙන් උපදිනු ලබන මිථ්‍යා දෘෂ්ටියගේද නැසීමෙන්, **ඛිත්ත චිත්තා** යනු සංඥා දෘෂ්ටීන් මෙන් උපදිනු ලබන, හැරදමන ලද, අත්හළ සිතින් යුක්ත වූවාහු, **විසඤ්ඤිනො** යනු එය දේශනා මාත්‍රයකි. විපරීත, සංඥා, චිත්ත, දෘෂ්ටීන්ගෙන් යන අර්ථයි. නොහොත් සංඥා පූර්වංගම හෙයින් දෘෂ්ටියෙහි ප්‍රථම සිව් පදයන්ගෙන් සංඥා විපර්යාසය යුසේයි. ඉන් මිච්ඡාදිට්ඨි හතා යනු දෘෂ්ටි විපර්යාසයයි. **ඛිත්ත චිත්තා** යනු චිත්ත විපර්යාසයයි. **විසඤ්ඤිනො** යනු ත්‍රිවිධ විපර්යාස ග්‍රාහයන්ගෙන් ප්‍රකෘති සංඥා විරහිත වූවාහු මෝහයට ගියහු, විසවේගයෙන් සිහිමුළා වූයේ විසඥභාවයට පැමිණවූ යන මෙහි වැනිය. **තෙ යොග යුත්තා මාරස්ස** යනු එම ජනතාව, සත්ත්වයෝ මාර යෝගයෙහි යෙදුණාහු නම් වෙති. **අයොගක්ඛෙමිනො** යනු චතුර් යෝගයන් නමැති උපද්‍රවයන්ගෙන් යුක්ත වූවාහු, ක්ෂේම නිර්වාණයට නොපැමිණියාහු, **සත්තා ගච්ඡන්ති සංසාරං** යනු එම පුද්ගලයෝම සසර සැරිසරති. කුමක් හෙයින්ද යත්, ඔවුහු ඉපැත්ම හා මරණ අනුව යන්නෝ වෙති. එහෙයින් සැරිසරත් යයි අර්ථයි. **බුද්ධා** යනු සිව්සස් අවබෝධ කළ සර්වඥවරු, කාලත්‍රය සාධාරණ වශයෙන් බහුවචනයෙන් දක්වයි. **ලොකස්මිං** යනු අවකාශ ලෝකයෙහි **පභංකරා** යනු ලෝකයට ප්‍රඥාලෝකය ඇති කරන්නා

වූ, **ඉමං ධම්මං පකාසෙන්ති** යනු විපර්යාස ප්‍රහාණ ධර්මය බබළවති. **දුක්ඛූපසමගාමිනං** යනු දුක් සංසිඳවන නිර්වාණයට යන්නා වූ **තෙ සං සුත්වාන** යනු එම බුදුවරුන්ගේ ධර්මය ශ්‍රවණය කොට, **සප්පඤ්ඤා** යනු භව්‍ය වූ, ප්‍රඥාවන්තයෝ, **සචිත්තං පච්ච ලද්ධුං** යනු විපර්යාස වර්ජිත සිය සිත ලැබ, පටි අලද්ධා යනු පදච්ඡේදයි. නොහොත් ලද්දාහ. පටිඅලද්ධුං යනු පදච්ඡේදයි. **අනිච්චතං දක්ඛුං** යනු අනිත්‍ය වශයෙන්ම දුටුවාහුය. **අනත්තනි අනත්තා** යනු ආත්මය අනාත්ම වශයෙන් දුටුවාහුය. නොහොත් අනාත්ම වස්තුවෙහි ආත්මයක් නැතැයි දුටුවාහුය. **සම්මාදිට්ඨි සමාදානා** යනු ගන්නා ලද සම්‍යක් දර්ශනයෙන් යුක්තවූවාහු, **සබ්බදුක්ඛං උපච්චගුං** යනු සියලු සංසාර වෘත්ත දුක ඉක්මවූවාහුය.

ප්‍රහීණ අප්‍රහීණ විමසුම්හි, **දිට්ඨිසම්පන්නස්ස** යනු සෝවාන් පුද්ගලයා හට, **දුක්ඛෙ සුඛන්ති සඤ්ඤා උප්පජ්ජති චිත්තං උප්පජ්ජති** යනු මෝහය නමැති කාලුෂ්‍යයාගේ (අඳුරු පටලය) ප්‍රහීණ නොවූ හෙයින් සංඥා මාත්‍රයක් හෝ චිත්ත මාත්‍රයක් හෝ උපදී. අනාගාමීහුටද උපදී. සෝවාන් වූවහු ගැන කවර කථාද? මෙම ද්වයය රහත්හුටම ප්‍රහීණය. **අසුභෙ සුභන්ති සඤ්ඤා උප්පජ්ජති චිත්තං උප්පජ්ජති** යනු සකෘදාගාමීහුටද උපදී. සෝවාන් වූවහු ගැන කවර කථාද? මෙම ද්වයය අනාගාමීහුට ප්‍රහීණයයි අටුවායෙහි යූ.සේයි. එහෙයින් මෙම ද්වයය සෝවාන් සකෘදාගාමීහු සඳහා යූ.සේයි. අනාගාමීහුට කාමරාගය ප්‍රහීණ හෙයින්, අසුභයෙහි සුභයයි සංඥා, චිත්ත විපර්යාසයන්ගේ ප්‍රහාණය යූ.සේයි. **ද්වීසු වත්ථූසු** යනාදී පදයන්ගෙන් ප්‍රහීණ ප්‍රහීණ දෑ නිගමනයකොට දක්වයි. එහි අනිත්‍යයෙහි නිත්‍යයැයිද, අනාත්මයෙහි ආත්මයැයිද යන මෙම ද්වි වස්තුන්හි ෂට් විපර්යාස ප්‍රහීණ වූවාහු වෙති. **ද්වීසු වත්ථූසු ඡ විපල්ලාසා පහීණා**, දුකෙහි සුවයයිද අසුභයෙහි සුභයැයිද මෙම ද්වි වස්තුන්හි දෘෂ්ටි විපර්යාස ද්වයය ප්‍රහීණයහ. **ද්වෙ දිට්ඨි විපල්ලාසා පහීණා** සමහර පොත්වල ද්වෙ, යන්න පළමුව ලියා ඇත. 'ඡා' යන්න පසුව ලියා ඇත. **චතූසුවත්ථූසු** යනු සතර එක්කොට යූ.සේයි. **අට්ඨ** යනු ද්වයෙක්හි සයක්ද, ද්වයෙක්හි ද්වයයක්දැයි අටකි. **චත්තාරො** යනු දුක්, අශුභ වස්තුන්හි එකිනෙකෙහි ද්වයය, ද්වයය බැගින් සංඥා චිත්ත විපර්යාසයෝනුයි සතරෙකි. සමහර පොත්වල 'ඡ ද්වීසු'යි කියන ලද ස්ථානයන්හිද මෙපරිද්දෙන්ම ලියන ලදී.

**විපර්යාස කථා නිමි.**

එම ත්‍රිවිධ විපර්යාසයන්ගේ ප්‍රහාණ කර ආර්යමාර්ගය, දක්වන්නාහු විසින් කියන ලද, මාර්ග කථායෙහි පෙර නුවූ අර්ථ වර්ණනාවයි. එහි මග්ගති කෙනට්ඨෙන මග්ගො යනු යමක් බුදුසස්නෙහි මාර්ගයයි කියයිද, එය කවරාර්ථයකින් මාර්ගය නම් වේදැයි අර්ථයි. **මිච්ඡාදිට්ඨියා පහාණාය** යනාදී දස පර්යායයන්හි ප්‍රථම, ප්‍රථමය ඒ ඒ මාර්ගාංගයට ඍජු විරුද්ධතා වශයෙන් යූ.සේයි. **මග්ගො චෙව හෙතු ච** යනු ඒ ඒ කෘත්‍යය කිරීම සඳහා ප්‍රතිපදාර්ථයෙන් මාර්ගය පමුණුවන අර්ථයෙන් හේතුයි. එයින් මාර්ගයාගේ ප්‍රතිපදාර්ථයද, පමුණුවන අර්ථයද යූ.සේයි. මේ මාර්ගයයි, මේ ප්‍රතිපදාව යැයි ආදීන්හි මෙන් ප්‍රතිපදාව මාර්ගයයි, මාර්ගයාගේ නිර්යාණාර්ථය ගතයුතුය යනාදීන්හි පමුණුවන හේතුවය. මෙසේ ද්වයය, ද්වයය වූ පදයන්ගෙන් 'මාර්ගය' යනු කවරාර්ථයෙන් මාර්ගයදැයි විමසීමෙහි විසඳුම කරන ලද්දේ වේ. **සහජාතානං ධම්මානං උපත්ථම්භනාය** යනු තමා සමග හටගත් අරූප ධර්මයන්ගේ සහජාත, අඤ්ඤමඤ්ඤ, නිශ්‍රය ප්‍රත්‍යයාදී භාවයෙන් උපකාර වීම සඳහායි. **කිලෙසානං පරියාදානාය** යනු ඒ ඒ මාර්ගයෙන් නැසිය යුතු කියන ලද දැයින් ශේෂ වූ කෙලෙසුන්ගේ ක්ෂය කිරීම සඳහායි. **පටිවෙධාදී විසොධනාය** යන මෙහි කුසල ධර්මයන්ගේ මුල කිමෙක්ද? සුපිරිසිදු සීලයද, දෘෂ්ටියෙහි ඍජුතාවද වේ යන වචනයෙන් සීලයද, දෘෂ්ටියද, සත්‍ය ප්‍රතිවේධයෙහි මුලයි. එම මුලද මාර්ග ක්ෂණයෙහි සුපිරිසිදු වේ. එහෙයින් ප්‍රතිවේධාදී පිරිසිදු කිරීම සඳහා යයි යූ.සේයි. **චිත්තස්ස අධිට්ඨානාය** යනු සම්ප්‍රයුක්ත චිත්තයාගේ තම කිස්හි පිහිටීම සඳහා, **චිත්තස්ස වොදානාය** යනු චිත්තයෙහි පිරිසිදුභාවය සඳහා **විසෙසාධිගමාය** යනු ලෞකික වශයෙන් විශේෂතා ප්‍රතිලාභය සඳහා, **උත්තරි පටිවෙධාය** යනු ලෞකිකයන්ගෙන් මත්තෙහි අවබෝධ කිරීම සඳහා **සච්චාභිසමයා** යනු චතුසසත්‍යයන්ගේ එක්වර අවබෝධ කිරීමෙන් කෘත්‍ය නිෂ්පත්ති වශයෙන් එක්වර ප්‍රතිවේධය සඳහා, **නිරොධෙ පතිට්ඨාපනාය** යනු චිත්තයාගේ හෝ පුද්ගලයාගේ නිර්වාණයෙහි පිහිටුවීම සඳහා, සකෘදාගාමි මාර්ගක්ෂණාදීන්හි, අට මාර්ගාංගයන් එකතුකොට, ඒ ඒ මාර්ගවධ්‍ය කෙලෙස් ප්‍රහාණය යූ.සේයි. මෙසේ කීමෙහි හේතුව යට යූ.සේයි. මතු මතු මාර්ගයෙන්ද මනාව, මූල විශෝධනයන්, මනාව චිත්තයාගේ පිරිසිදුබවට හේතු වේ. එහෙයින් එම පදයන්ද යූසේයි. **දස්සන මග්ගො** යනාදීන්ගෙන් අවසානය තෙක්, ඒ ධර්මයාගේ ලක්ෂණ වශයෙන් මාර්ගාර්ථය යූ.සේයි. ඒ සියලුම පදයන් අභිඤ්ඤෙය්‍ය නිර්දේශයෙහි කියන ලද අර්ථමය. මෙසෙ මෙහි පිළිවෙළින් ලෞකික ලෝකෝත්තර මාර්ගය නිර්දේශිතය. හේතු අර්ථයෙන් මාර්ගය

නිර්දේශිතය. නිෂ්පර්යාය මාර්ගය හෙයින් මෙයට මාර්ගයැයි නැවත නොයුසේයි. **ආධිපතෙය්‍යට්ඨෙන ඉන්‍ද්‍රියා** යනාදීන්ද ඉන්‍ද්‍රියාදීන්ගේ අර්ථ වශයෙනි. **සච්චානි** යනු මෙහි සත්‍ය ඤාණයෝය. එම සියලුම ධර්මයන් නිර්වාණයාගේ ප්‍රතිපදාර්ථයෙන් මාර්ගයයි. අන්තයෙහි කියන ලද, නිර්වාණය වනාහි, සසර දුකින් මැඩුණා වූ දුකින් නික්මීම අපේක්ෂා කරන්නා වූ සත්පුරුෂයන් විසින් සොයනු ලැබේ. ගවේෂණය කරනු ලැබේනුයි මාර්ගයයි යුසේයි.

## මාර්ගකථා වර්ණනා නිමි.

ඒ මාර්ගයාගේ මණ්ඩපෙය්‍යත්වය දක්වන්නහු විසින් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත වදන් කොටසක් පූර්වාංගම කොට, මණ්ඩපෙය්‍ය කථාවෙහි පෙර නුවූ අර්ථ අනුවර්ණනාවයි, එහි **මණ්ඩපෙය්‍ය** යනු නිසි ප්‍රමිතියෙන් යුත්, නිර්මල, මනා ප්‍රසන්න ගිතෙල්, ඉතා පිරිසිදු ගිතෙල් යයි කියනු ලැබේ. එසේම මනා ප්‍රසන්නාර්ථයෙන් මණ්ඩයි. පානය කළයුතු අර්ථයෙන් පෙය්‍යයි. යමක් පානයකොට, ඇතුල් වීථියෙහි, පතිත වූවාහු, විසඥී වූවාහු තම වස්ත්‍රාදීන්ටද, අස්වාමික වෙත්ද, එය ප්‍රසන්න වූයේද පානය නොකළ යුතුය. මාගේ මේ ශික්ෂාත්‍රය සංගෘහිත ශාසන බ්‍රහ්මචර්යය නිසි අංගයන්ගෙන් සම්පූර්ණ හෙයින්ද, නිර්මල හෙයින්ද, මනා ප්‍රසන්නතායෙන් යුත් හෙයින්ද, මණ්ඩයක් වූයේනුයිද, හිතසුව එළවන හෙයින් පෙය්‍යං වූයේනුයිද මණ්ඩපෙය්‍යයයි දක්වයි. මණ්ඩයද, පෙය්‍යද මෙහිනුයි මණ්ඩපෙය්‍යංයි. එය කිමෙක්ද, සාසන බ්‍රහ්මචර්යාවයි. කවර හෙයින් ශික්ෂාත්‍රය බ්‍රහ්මචර්ය නම් වේද, උතුම් අර්ථයෙන් නිර්වාණය බ්‍රහ්ම නමැ. ශික්ෂාත්‍රය නිර්වාණය සඳහා පවත්නා හෙයින් බ්‍රහ්ම අර්ථය සඳහා චර්යාවනුයි **බ්‍රහ්මචරියං** යැයි යුසේයි. ශාසන බ්‍රහ්මචර්යය යනුද එයමැයි. **සත්ථා සම්මුඛී භූතො** මෙහි මේ හේතු වචනයයි. යම්හෙයකින් වනාහි ශාස්තෲන් වහන්සේ හමුවූයේ වේද, එහෙයින් වීර්යය ප්‍රයෝගකොට එම මණ්ඩය බොවු. බාහිරව වනාහි බෙහෙත් මණ්ඩය, වෛද්‍යවරයාගේ නොහමුයෙහි, පානය කරනුයේ ප්‍රමාණය හෝ නැගීම හෝ පිටතයාම නොදනිමුයි සැක ඇතිවෙයි. වෛද්‍යවරයාගේ හමුයෙහි වනාහි වෛද්‍යවරයා දන්නේයයි සැකරහිතව පානය කරති. එපරිද්දෙන්ම අපටද ධර්මස්වාමි ශාස්තෲන් වහන්සේ හමුවූයේ යයි වීර්යයකොට පානය කරවූ යයි මණ්ඩ පානයෙහි මනාව යෙදේ. ඉහාත්ම හා මරණින් මත්තෙහි

වන උතුම් අර්ථයන්ගෙන් සුදුසු පරිදි අනුශාසනා කෙරේනුයි සත්ථායි. තවද සත්ථා, භගවා, සත්ථවාහ ආදී වූ නිර්දේශ ක්‍රමයන්ද මෙහි අර්ථ දතයුතුය. පෙනෙන මුහුණ වූයේනුයි සම්මුඛීභූතොයි.

මණ්ඩපෙය්‍ය නිර්දේශයෙහි, **තිධත්ත මණ්ඩො** යනු ත්‍රිවිධභාවය තිධත්තංයි. ත්‍රිවිධ භාවයෙන් මණ්ඩය තිධත්ත මණ්ඩොයි ත්‍රිවිධාකාරයෙන් මණ්ඩයැයි අර්ථයි. **සත්ථරි සම්මුඛී භූතෙ** යන මෙය සර්වාකාර පරිපූර්ණ මණ්ඩත්‍රය දැක්වීම සඳහා යුසේයි. ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හිද, එක් කොටසකින් මණ්ඩත්‍රයය පවතීමය. එහෙයින්ම මෙම නිර්දේශයෙහි, ශාස්තෘන් වහන්සේ හමුවීමෙහියි ප්‍රකාශ නොකොට **කතමො දේශනා මණ්ඩො** යන ආදිය යූ.සේයි. **දේශනා මණ්ඩො** යනු ධර්මදේශනාවම මණ්ඩයයි, **පටිග්ගහමණ්ඩො** යනු දේශනා ප්‍රතිග්‍රාහක මණ්ඩයයි. **බ්‍රහ්මචරිය මණ්ඩො** යනු දේශනා ප්‍රතිග්‍රාහක මණ්ඩයයි. **බ්‍රහ්මචරිය මණ්ඩො** යනු මාර්ග බ්‍රහ්මචර්යාවම මණ්ඩයයි. **ආචික්ඛනා** යනු දේශනා කළයුතු සත්‍යාදීන්ගේ මේවා නාමයෝ යැයි නම් වශයෙන් කීම, **දෙශනා** යනු දැක්වීම, **පඤ්ඤාපනා** යනු දැනුවත් කිරීම, ඤාණමුඛයෙහි තැබීම, ආසනය තබනුයේ අසුන පනවා යයි යූ.සේයි. **පට්ඨපනා** යනු පැනවීම, පැවැත්වීම යයි අර්ථයි. ඤාණ මුඛයෙහි තැබීම හෝ, **විවරණා** යනු විවෘත කිරීම, විවෘතකොට දැක්වීමයයි අර්ථයි. **විභජනා** යනු විභාග කිරීම, බෙදීම් වශයෙන් දැක්වීම යයි අර්ථයි. **උත්තානි කම්මං** යනු ප්‍රකට භාවකරණයයි. නොහොත්, **ආචික්ඛණා** යනු දේශනාදී ෂට්පදයන්ගේ මූලපදයයි. දේශනාදී ෂට් පදයන් එහි අර්ථ විවරණය සඳහා යූ.සේයි. එහි **දෙශනා** යනු උද්ඝටිතඤ්ඤයින්ගේ වශයෙන් ප්‍රථමයෙන් උදෙසීම් වශයෙන් දේශනායි, උද්ඝටිතඤ්ඤයෝ වනාහි සංක්ෂේපයෙන් හා ප්‍රථමයෙන් කියන ලද දෑ අවබෝධ කරති. **පඤ්ඤාපනා** යනු විපචිතඤ්ඤයින්ගේ වශයෙන් ඔවුන්ගේ සිත් තුටු කිරීමෙන්, තියුණු නුවණින්ද ප්‍රථමයෙන් සංක්ෂිප්තව දෙසූ දෑ විස්තර වශයෙන්, නිර්දේශ වශයෙන් දැක්වීම පඤ්ඤාපනායි. **පට්ඨපනා** යනු එම නිර්දිෂ්ට නිර්දේශයන්ගේ ප්‍රතිනිර්දේශ වශයෙන් විස්තර කිරීම් වශයෙන් පඤ්ඤාපනායි. **විවරණා** යනු නිර්දේශ කරන ලද්දෙහිද නැවත නැවත කීමෙන් විවරණ කිරීමයි, **විභජනා** යනු, නැවත නැවත කියන ලද්දෙහිද විභාග කිරීමෙන් බෙදීමයි. **උත්තානි කම්මං** යනු විවෘත කළ වචනයෙහි විස්තර කර කීමෙන් බෙදන ලද්දෙහිද නිදර්ශන වචනයෙන් පැහැදිලි කිරීමයි. මෙම දේශනාව නෙය්‍යයන්ගේද අවබෝධය සඳහා පවතී. **යෙවා පනඤ්ඤෙපි කෙචි** යනු පියංකර මාතාදී විනිපාතිකයෝ ගන්නා

ලදහ. **විඤ්ඤාතාරො** යනු ප්‍රතිවේධ වශයෙන් ලෝකෝත්තර ධර්මය අවබෝධ කරවන්නෝ, භික්ෂු ආදීහු ප්‍රතිවේධ වශයෙන් ධර්මදේශනය පිළිගනිත්තුයි ප්‍රතිග්‍රාහකයෝය. **අයමෙව** යනාදිය ප්‍රථම ඤාණ නිර්දේශයෙහි කියන ලද අර්ථමය. ආර්යමාර්ගය නිර්වාණය හා සංසන්දනය වන හෙයින් බ්‍රහ්මාර්ථය සඳහා චර්යාතුයි බ්‍රහ්මචර්ය යයි යුසේයි.

**අධිමොක්ඛමණ්ඩො** යනාදීන්හි එම මාර්ගක්ෂණයෙහි විද්‍යමාන වන්නා වූ, ඉන්ද්‍රිය, බල, බොධ්‍යංග, මාර්ගාංගයන් මණ්ඩපෙය්‍ය පිළිවෙළෙහි යොදා දක්වයි. එහි **අධිමොක්ඛ මණ්ඩො** අධිමෝක්ෂ සංඛ්‍යාත මණ්ඩයයි, **කසටො** යනු ප්‍රසාද විරහිත අධිමෝක්ෂ මණ්ඩයයි. **ඡඩ්ඩෙත්වා** යනු විනාශ කිරීම් වශයෙන් දුරුකොට, **සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛ මණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං** යනු ශ්‍රද්ධෙන්ද්‍රියයෙන් අධිමෝක්ෂ මණ්ඩයාගේ අනන්‍යත්වය ඇති කල්හිද, අනෙකක් මෙන් කොට ව්‍යවහාර වශයෙන් යුසේයි. යම්සේ වනාහි ලෝකයෙහි ඇඹරුම් ගල් (පෝය) ඇඹරුම් ගල් ශරීරයෙහි අනන්‍යත්වය ඇතිකල්හිද ඇඹරුම්ගලෙහි ශරීරයයි කියයි. යම්සේ පෙළෙහි 'ඵුසිතත්තං' යනාදීන්හි ස්වභාව වශයෙන් අනන්‍ය වූද ස්වභාවය අනෙකක් මෙන් යු.සේයි. අටුවායෙහි 'ස්පර්ශ කිරීම් ලක්ෂණය ස්පර්ශයයි' ආදීන්හි ස්වභාව වශයෙන් අනන්‍ය වූද ලක්ෂණය අන්‍යයක් මෙන් යු.සේයි. මෙයද එසේයයි දතයුතුය. **පිවති** යනු එයින් යුක්ත පුද්ගල තෙමේ යයි යු.සේයි. එයින් යුක්ත පුද්ගල තෙමේ එම මණ්ඩය පානය කරයි යයි සලකා එම පුද්ගලයා විසින් එම මණ්ඩය පානය කළයුතු හෙයින් මණ්ඩපෙය්‍ය නම් වේයයි යු.සේයි. මණ්ඩපෙය්‍යෝයි කිවයුතු කල්හි මණ්ඩපෙය්‍යං යයි ලිංග විපර්යාසය කරන ලදී. සෙසු වදන්හිද මෙම ක්‍රමයෙන් අර්ථ දතයුතුය.

**පරිළාහො** යනු පිනවීම් ලක්ෂණ ඇති ප්‍රීතියට විරුද්ධ කෙලෙස් සන්තාපයයි. **දුට්ඨුල්ලං** යනු සන්සිඳීමට ප්‍රතිපක්ෂ කෙලෙස් වශයෙන් දළ ස්වභාවය, සන්සුන් නුවූ ස්වභාවය, **අප්පටිසංඛා** යනු ප්‍රත්‍යවේක්ෂා ප්‍රතිපක්ෂ කෙලෙස් වශයෙන් විෂම පැවැත්ම,

නැවත අන් ක්‍රමයෙකින් මණ්ඩපෙය්‍ය ක්‍රමය නිර්දේශ කරනු කැමැතියේ **අත්ථි මණ්ඩො** ආදිය වදාළහ. එහි **තත්ථ** යනු එම ශ්‍රද්ධෙන්ද්‍රියයෙහි, **අත්ථරසො** යනාදීන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ ස්ථිර ලෙස පිහිටීමය යන අර්ථයි. ශ්‍රද්ධෙන්ද්‍රිය ධර්මයයි. එයම නොයෙක් කෙලෙසුන්ගෙන් මිදුණු හෙයින් විමුක්තියි, එම අර්ථයෙහි සමෘද්ධිය

අර්ථ රසයයි එම ධර්මයාගේ සමෘද්ධිය ධම්මරසොයි. එම විමුක්තියෙහි සමෘද්ධිය විමුත්තිරසොයි නොහොත් අර්ථ ප්‍රතිලාභ රතිය අර්ථ රසයයි. ධර්ම ප්‍රතිලාභ රතිය ධර්ම රසයයි. විමුක්ති ප්‍රතිලාභ රතිය විමුක්ති රතියයි. රති යනු එය හා සම්ප්‍රයුක්ත වූ හෝ එය අරමුණුකොට ඇති හෝ ප්‍රීතියයි. මෙම ක්‍රමයෙන් සෙසු පදයන්හිද අර්ථය දතයුතුය.

මෙම ක්‍රමයෙහි මණ්ඩයාගේ පෙය්‍ය මණ්ඩපෙය්‍යං යයි අර්ථය යු.සේයි. මෙසේ ඉන්ද්‍රියාදී බෝධිපාක්ෂික ධර්ම පිළිවෙළින් ඉන්ද්‍රිය බල, බොජ්ඣංග මාර්ගාංගයන්ගේ වශයෙන් මණ්ඩපෙය්‍යය ගෙනහැර දක්වා නැවත අන්තයෙහි පිහිටි බ්‍රහ්මචර්යා මණ්ඩය දක්වනුයේ මාර්ගයාගේ ප්‍රධානත්වය හෙයින්, මාර්ගය පූර්වාංගම කොට, උපිළිවෙළින් මාර්ගාංග, බොධ්‍යංග, බල, ඉන්ද්‍රියයන් දැක්වීය. **ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රිය මණ්ඩො** යනාදීහු සුදුසු පරිදි, ලෞකික ලෝකෝත්තර මණ්ඩයෝය. එය යට කියන ලද අයුරින් දතයුතුය. **තථට්ඨෙන සච්චා මණ්ඩො** යන මෙහි වනාහි දුක්ඛ සමුදයයන්ගේ මණ්ඩභාවය මහා හත්ථි පද සූත්‍රයෙහි මෙන් සත්‍ය ඥාණ සත්‍යයැයි යු.සේයි.

සද්ධර්මප්‍රකාශනී, ප්‍රතිසම්භිදා මාර්ග අර්ථ කථායෙහි
මණ්ඩපෙය්‍ය කථා වර්ණනාව නිමි.

මහා වර්ග වර්ණනාව නිමියේ ය.

දැන් මණ්ඩපෙය්‍ය ගුණයෙහිද, ආර්ය මාර්ගයෙහිද, එකට වෙළී පවත්නා ගුණ ගෙනහැර දක්වන්නාහු විසින් කියන ලද සූත්‍රාන්ත පූර්වංගම යුගනන්ධ කථායෙහි පෙර නුවූ අර්ථ අනුවර්ණනාවයි. දම්සෙනෙවි තෙමේ, ධර්මරජාණන් වහ්සේ ජීවමානව සිටියදීම ධර්මරාජයාණන් වහන්සේගේ පරිනිර්වාණ සංවත්සරයෙහිම පිරිනිවියේද, එහෙයින් ධර්මරාජයාණන් වහන්සේ ජීවමාන කල්හිම ධර්මභාණ්ඩාගාරිකයාණන් විසින්, දේශනා කරන ලද මෙම සූත්‍රාන්තය එතුමන් වහන්සේගේම හමුයෙහි ශ්‍රවණය කොට **එවං මෙසුතං** ආදිය කීවේයයි දතයුතුය. එහි **ආයසමා** යනු ප්‍රිය වචනයකි. ගරු වචනයකි. ගෞරව සහිත, සැලකිලි සහිත වචනයකි. **ආනන්දො** යනු ඒ තෙරුන්ගේ නාමයයි, හෙතෙම උපදිනු ලබන්නේම

කුලයෙහි ප්‍රීතිය සතුට බොහෝ සේ වර්ධනය විය. එහෙයින් මොහුට ආනන්ද යැයි නාමය කරන ලදැයි දතයුතුය. **කොසම්බියං** යනු එබඳු නම් සහිත නගරයෙහි, එම නගරයෙහි මල් පලතුරු සහිත වතු හා පොකුණු ආශ්‍රිත ඒ ඒ තන්හි කොහොඹ රුක් ඉතා බහුල විය. එහෙයින් එය කෝසම්බියයි යන සංඛ්‍යාවට ගියේය. කුසම්බ නමැති ඍෂිහුගේ ආශ්‍රමයට නුදුරින් නිමවන ලද හෙයිනැයි ඇතැම්හු කියති. **ඝොසිතාරාමෙ** යනු ඝෝසිත සිටුහු විසින් කරවන ලද අරම්හි, කොසඹෑ නුවර, ඝෝසිත සිටු කුක්කුට සිටු පාවාරික සිටුයයි සිටුවරු තිදෙනෙක් විසූහ. එම තිදෙනම ලොවැ බුදුරදහු උපනැයි අසා, ගැල් පන්සියය බැගින් දානෝපකරණයන් අසුරවා සැවැතට ගොස් දෙව්රම සමීපයෙහි කඳවුරු බැඳ, බුදුරදුන් වෙත ගොස් වැඳ, පිළිසඳර කොට හුන්නාහු, බුදුරදුන්ගේ ධර්ම දේශනාව ශ්‍රවණයකොට, සෝවාන් ඵලයෙහි පිහිටා, බුදුරදුන්ට ආරාධනා කොට, බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයාට අඩමසක් පමණ මහදන් දී බුදුන් පාමුල වැදහෙව, සියදනව් යාම සඳහා බුදුරදුන් ආරාධනා කොට 'ගෘහපතිවරුනි, තථාගතවරු ශූන්‍යාගාරයන්හි සිත් අලවතියි බුදුරදුන් වදාළ කල්හි, භාග්‍යවතුන් විසින් අපට ප්‍රතිඥා දෙන ලදැයි අතිශයින් සතුටට පත්ව දසබලධාරීන් වැඳ නික්මුණාහු අතරමග යොදුනක් යොදුනක් පාසා භාග්‍යවතුන් වහන්සේට විසීම සඳහා විහාර කරවනුයේ, පිළිවෙළින් කොසඹෑ නුවරට පැමිණ, තම තමන්ගේ ආරාමයන්හි මහත් ධන පරිත්‍යාගකොට භාග්‍යවතුන් වහන්සේට විහාරයන් කරවූහ. එහි ඝෝසිත සිටුහු විසින් කරවන ලද ආරාමය ඝෝසිතාරාම නම් විය. කුක්කුට සිටුහු විසින් කරවන ලද ආරාමය කුක්කුටාරාම නම් විය. පාවාරික සිටුහු විසින් අඹ වනයෙහි කරවන ලද ආරාමය පාවාරිකම්බවන නම් විය. ඒ සඳහා යූ.සේයි. 'ඝෝසිත සිටුහු විසින් කරවන ලද ආරාමයෙහි යැයි ආවුසො **භික්ඛවෙ** යන මෙහි භාග්‍යවත් බුදුවරු ශ්‍රාවකයින් ආමන්ත්‍රණය කරන්නාහු භික්ඛවෙ යයි ආමන්ත්‍රණය කරති. ශ්‍රාවකයෝ වනාහි බුදුවරු හා සමාන නොවෙමුයි ඇවැත්නි යයි ප්‍රථමයෙන් කියා, පසුව මහණෙනියි කියති.

බුදුවරුන් විසින් අමතනු ලැබූ භික්ෂු සංඝයා, භදන්තෙ යයි පිළිවදන් දේ. ශ්‍රාවකයින් විසින් අමතනු ලැබූ කල්හි ආවුසොයි පිළිවදන් දේ. **යොහි කොචි** අනියම් වචනයයි. එයින් එබඳු වූ සියලු භික්ෂූන්ගේ ග්‍රහණයයි, **මම සන්තිකෙ** යනු මාගේ සමීපයෙහි තමාගේ අර්හත්වයට පැමිණීම, නපුංසක භාවයෙහි සිද්ධ වචනයයි. අරහත්තං පත්තං යනු පදච්ඡේදයි. තමා විසින් පත් අර්හත්වයයි අර්ථයි. අර්හත්වයට පත් තමා යයි පාඨ ශේෂයි.

**චතූහි මග්ගෙහි** යනු මතු කියනු ලබන සිව් ප්‍රතිපදා මාර්ගයන්ගෙන්, ආර්ය මාර්ගයන්ගෙන් නොවේ. **චතූහි මග්ගෙහි** යයි වෙන්වද කියන ලද හෙයින් කිසි රහත් කෙනෙකුන්ට ප්‍රථම ආර්ය මාර්ගයෙහි ඕභාසාදී ධර්මයෙහි නොසන්සුන් භාවයන් විරෝධයට පැමිණවීම් පූර්වාංගම මාර්ගයයි. එක් අයෙකුට සමථ පූර්වංගම ආර්ය මාර්ගයාගේ වශයෙනි. එක් අයෙකුට විදර්ශනා පූර්වංගම මාර්ගය වශයෙනි. එක් අයෙකුට සමථ විදර්ශනා දෙකම එක්කොට (යුගනද්ධ) පූර්වංගම වශයෙනි. මෙසේ මේ චතුෂ්කයම ප්‍රතිපදා මාර්ග වේයයි දතයුතුය. **එතෙසංවා අඤ්ඤතරෙන** යනු එම සිව් ප්‍රතිපදා මාර්ගයන්ගෙන් එක් ප්‍රතිපදා මාර්ගයකින් හෝ, අර්හත්ව ප්‍රාප්තිය ප්‍රකාශ කෙරේයයි අර්ථයි. ශුෂ්ක විදර්ශක රහත් හට ධර්මෝද්ධච්ච පූර්වංගම මාර්ග වේ. ධර්මෝද්ධච්ච විරෝධයට පැමිණ හෝ නොපැමිණ හෝ සමථ පූර්වංගමාදී ත්‍රිවිධ ප්‍රතිපදා මාර්ගයන්ගේ එකිනෙකාගේ වශයෙන් පත් සිව්මග රහත් හට, අර්හත්ව ප්‍රාප්තිය අනෙක් එකිනෙක මාර්ගයන් පූර්වංගම වේ. එහෙයින් ඒවායින් එක්තරා එකකින්ය යන අර්ථයි. **සමථ පුබ්බංගමං විපස්සනං භාවෙති** යනු සමථ පූර්වංගම පෙර ගමන්කොට විදර්ශනා වඩයි. පළමුවෙන් සමාධිය උපදවා, පසුව විදර්ශනා වඩයි යයි අර්ථයි. **මග්ගො සඤ්ජායති** යන ආදීන්හි, එක් චිත්ත ක්ෂණික මාර්ගයාගේ ආසේවනාදීහු නම් නැත. ද්විතීය මාර්ගාදීන් උපදවනුයේ එම මාර්ගයම සේවනය කරයි. වඩයි. බහුල වශයෙන් කෙරේයයි යු.සේයි. **සංයොජනා පහීයනති අනුසයා බ්‍යනති හොනති** යනු අර්හත් මාර්ගය තෙක් ක්‍රමයෙන් සියලු සංයෝජන ප්‍රහීණ වෙයි සිත්හි පවත්නා අප්‍රකට කෙලෙස් අවසන් වෙයි. අනුසයා බ්‍යනති හොනති යනු නැවත නොඉපදීම් වශයෙන් විගතාන්ත වෙයි අර්ථයි.

**පුනචපරං** යනු නැවත අනෙක් කරුණෙකි. **විපස්සනා පුබ්බංගමං සමථං භාවෙති** යනු විදර්ශනා පූර්වාංගමව, පෙරගමන් කොට සමථය වඩයි. ප්‍රථමයෙන් විදර්ශනාව උපදවා පසුව සමාධිය වඩයි යන අර්ථයි.

**යුගනන්ධං භාවෙති** යනු යුගනද්ධ කොට වඩයි. මෙහි එම සිතින්ම සමවතට සමවැද, එම සිතෙන්ම සංස්කාරයන් සම්මර්ශනය කරන්ට නොහැකිය. මෙය වනාහි යම් පමණ සමවත් සමවදීද, එපමණ සංස්කාරයන් සම්මර්ශනය කරයි. යම්පමණ සංස්කාරයන් සම්මර්ශනය කෙරේද? එපමණ සමවදී. කෙසේද, ප්‍රථම ධ්‍යානයට සමවදී. ඉන් නැගිට සංස්කාරයන් සම්මර්ශනය කරයි. සංස්කාරයන් සම්මර්ශනය කොට තෘතීය ධ්‍යානයට

-පෙ- නේවසඤ්ඤානාසඤ්ඤායතන සමවතට සමවදී. ඉන් නැගිට සංස්කාරයන් සම්මර්ශනය කරයි. මෙසේ සමථ විදර්ශනාවන් යුගනද්ධව වඩයි නමැ.

**ධම්මුද්ධච්ච විග්ගහිතං මානසං හොති** යන මෙහි මන්දප්‍රාඥ විදර්ශකයින්ට උපක්ලේශ වස්තු හෙයින්, එම ආලෝක ආදී දස විදර්ශනොපක්ලේශයන්හි, කම්පාවීම් වශයෙන් නොසන්සුන්කම ධම්මුද්ධච්චයයි, ඒ ධර්මොද්ධච්චයෙන්, නොමනාව ගත් විරූපයෙන් ගත්, විරෝධයට පමුණුවන ලද මනස, සිත ආලෝකාදී ධර්මයෙහි වික්ෂෙප සංඛ්‍යාත උද්ධතභාවයෙන් විරෝධයට පමුණුවන ලද මනස වෙයි. එම ධර්මෝද්ධච්චයෙන් එයට හේතුවූ එයට මූලික වූ, තෘෂ්ණා මාන දෘෂ්ටි ඉපැත්මෙහි විරෝධයට පමුණුවන ලද මනස වෙයි. 'ධම්මුද්ධච්ච විග්ගහිත මානසං'යිද පාඨයි. **සො ආවුසො සමයො** යනු මෙයින් මාර්ගාමාර්ග තීරණයෙන් ඒ ධර්මෝද්ධච්චය වළක්වා නැවත විදර්ශනා වීථියට පිළිපන් කාලය පෙන්වයි. **යං තං චිත්තං** යම් වේලාවක එම විදර්ශනා වීථියට බැස පැවැති සිත. **අජ්ඣත්තමෙව සන්තිට්ඨති** යනු විදර්ශනා වීථියට පසුව බැස, එසමයෙහි ගොචරජ්ඣත්ත සංඛ්‍යාත අරමුණෙහි සිටී. පිහිටයි. **සන්නිසීදති** යනු එහිම පැවැතීම් වශයෙන් මනාව හිඳියි. **එකොදිහොති** එකඟ වේ. **සමාධියති** යනු මනාව පිහිටයි. මනාව සිටියේ වේ. මේ සූත්‍රාන්ත වර්ණනාවයි.

ඒ සූත්‍රාන්ත නිර්දේශ කථාවෙහි, **තත්ථ ජාතෙධම්මෙ** එම සමාධියෙහි හටගත් චිත්ත චෛතසික ධර්මයන්, **අනිච්චතො අනුපස්සනට්ඨෙන** යනාදියෙන් විදර්ශනාවෙහි භේද දක්වයි. **සම්මාදිට්ඨි මග්ගො** යනු සම්‍යග් දෘෂ්ටි සංඛ්‍යාත මාර්ගය අෂ්ට මාර්ගාංගයන්හි එකිනෙකද මාර්ගයයි යුසේයි.

**ආසෙවති** යනු ස්‍රෝතාපත්ති මාර්ග වශයෙන්, **භාවෙති** යනු සකෘදාගාමි මාර්ග ඉපදවීමෙන්, **බහුලීකරොති** යනු අනාගාමි, අර්හත් මාර්ග ඉපදවීමෙන්, මේවාහි ත්‍රිවිධ අවස්ථා භේදයක් ඇතිකල්හිද, ආවර්ජනාදීන්ගේ සාධාරණත්වය හෙයින් සමානවම විසඳීම කරන ලදී. ආලෝක සංඥා, පටිනිස්සග්ගානු පස්සනාවන්ගේ අන්තර පෙය්‍යාලයෙහි අවික්ෂෙපාදීන්ද, ධ්‍යාන සමාපත්ති, කසිණ, අනුස්සති, අශුභද, දීර්ඝ ආස්වාසාදියද, ආනන්තරික සමාධි ඤාණ නිර්දේශයෙහි නිර්දේශිත හෙයින්

සංක්ෂිප්ත කරන ලද්දේ වේ. එහිද, **අවික්ඛෙපවසෙන** යනු පූර්වභාග අවික්ෂෙප, අවික්ෂෙප වශයෙන් ගතයුතුය. **අනිච්චානුපස්සී අස්සාසවසෙන** ආදී වූ ශුද්ධ විදර්ශනා වශයෙන් කියන ලද චතුෂ්කයෙහි වනාහි තරුණ විදර්ශනා කාලයෙහි, විදර්ශනා සම්ප්‍රයුක්ත සමාධි පූර්වංගම බලවත් විදර්ශනාව දතයුත්තාහ. විදර්ශනා පූර්වංගම වාරයෙහි **පඨමං අනිච්චතො** යන ආදියෙන් අරමුණ නියම කොට යූ.සේයි.

**තත්‍ථ ජාතානං** යනු එම විදර්ශනායෙහි හටගත් චිත්ත චෛතසික ධර්ම, **වවස්සග්ගාරම්මණතතා** යන මෙහි වවස්සග්ගො යනු නිර්වාණයයි, නිර්වාණය වනාහි සංඛතයන් අත්හරින හෙයින්, පරිත්‍යාග කරන හෙයින් වොස්සග්ගයයි යූ.සේයි. විදර්ශනාවද, ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන්ද, නිර්වාණ නිම්නතායෙන්, අධ්‍යාශය වශයෙන්, නිර්වාණයෙහි පිහිටි හෙයින්, නිර්වාණයෙහි පිහිටියාහු, නිර්වාණාරම්මණ වූවාහුය. පිහිටීමද, එල්බේනුයි අරමුණ නම් වේ. නිර්වාණයෙහි පිහිටි අර්ථයෙනම නිර්වාණය අරමුණු වූවාහු වෙති. පෙළෙහි අන් තන්හිද 'පිහිටීම අරමුණ'යැයි කියති. දෙසූ පරිදි, ඇවැත්ති යම්සේ අවුරුදු තුන හතරක් කල්ගතවූ වියලි බෙන සහිත කොවුලක් වූ බටකැලයක් හෝ තෘණ කැලයක් හෝ වේද, නැගෙනහිර දිසාවෙන් ඇවිළගත් තණහුලක් ගත් පුරුෂයෙක් එළඹෙන්නේය. ගිනි ඇවිලීමෙහිලා දෝෂයක් මතුවන්නේද, ගින්නට ඉඩක් ලබන්නේද, යනාදියෙහි මෙනි. එහි හටගත් ධර්මයන් නිර්වාණය ද අරමුණුකොට ඇති හෙයින්, නිර්වාණයෙහි පිහිටන ස්වභාවයෙන් හේතු ආකාරයෙන් උපදවන ලද හෙයින්, යම් චිත්තයාගේ ඒකාග්‍රතා සංඛ්‍යාත, උපචාර අර්පණාභේද යම් අවික්ෂෙපයක් වේද, එය සමාධියයි, විදර්ශනාවෙන් පසුව උපදවන ලද නිර්වේදභාගි සමාධිය නිර්දිෂ්ට වේ. එහෙයින්ම **පඨමං විපස්සනා පච්ඡා සමථොයි** යූසේයි.

යුගනන්ධ නිර්දේශයෙහි, යට සූත්‍රාන්ත වර්ණනායෙහි කියන ලද, යුගනන්ධ ක්‍රමය ප්‍රථම නිර්දේශ ද්වයයෙන්ම ප්‍රකටය. මාර්ගක්ෂණයෙහි යුගනන්ධ ක්‍රමය අප්‍රකටය. එහෙයින් පූර්වභාගයෙහි අනේකාන්තික යුගනන්ධ භාවනාව නොකියා මාර්ගක්ෂණයෙහි ඒකාන්තයෙන් ලැබෙන යුගනන්ධ භාවනාවම දක්වනුයේ 'සොළසහි ආකාරෙහි' යන ආදිය වදාළහ. එහි **ආරම්මණට්ඨෙන** යන එල්ලීම් අර්ථයෙන්, අරමුණු වශයෙන් යැයි අර්ථයි. සෙස්සෙහිද මෙසේය. **ගොචරට්ඨෙන** යනු අරම්මණාර්ථය ඇතිකල්හිද, පිහිටවිය යුතු අර්ථයෙන්, **පහාණට්ඨෙන** යනු දුරුකිරීම්

අර්ථයෙන්, **පරිච්චාගට්ඨෙන** යන ප්‍රහාණය ඇතිකල්හිද නැවත නොගැනීමෙන් පරිත්‍යාගාර්ථයෙන්, **වුට්ඨානට්ඨෙන** යනු උඩට නැගීම් අර්ථයෙන්, **විවට්ටනට්ඨෙන** යනු උඩට නැගීම් ඇති කල්හිද, පුනරාවර්තන නොවන ආකාරයෙන් නැවතීම් අර්ථයෙන්, **සන්තට්ඨෙන** යනු නිවීම් අර්ථයෙන්, **පණීතට්ඨෙන** යනු නිවීම් ඇතිකල්හිද උතුම් අර්ථයෙන් නොතැවීම් අර්ථයෙන්, **විමුත්තට්ඨෙන** යනු බැඳීම්වලින් ඉවත්වූ අර්ථයෙන්, **අනාසවට්ඨෙන** යනු බන්ධනයන්ගෙන් මිදීම් ඇති කල්හිද, අරමුණුකොට පවත්නා ආශ්‍රව විරහිතාර්ථයෙන්, **තරණට්ඨෙන** යනු ගිලානොබැස, පාවීම් අර්ථයෙන්, ඉක්මවීම් අර්ථයෙන්, **අනිමිත්තට්ඨෙන** යනු සංස්කාර නිමිති විරහිතාර්ථයෙන්, **අප්පණිහිතට්ඨෙන** යනු තෘෂ්ණා ප්‍රාර්ථනා විරහිතාර්ථයෙන්, **සුඤ්ඤතට්ඨෙන** යනු තෘෂ්ණා වශයෙන් ඇතුළට වැදීම් විරහිතාර්ථයෙන්, **එකරසට්ඨෙන** යනු එක කෘත්‍යාර්ථයෙන්, **අනතිවත්තනට්ඨෙන** යනු ඔවුනොවුන් නොඉක්මවන අනර්ථයෙන්, **යුගනන්ධට්ඨෙන** යනු යුගලකාර්ථයෙන්, **උද්ධච්චං පජහතො අවිජ්ජං පජහතො** යනු යෝගියා හට එයට එයට ප්‍රතිපක්ෂතා ප්‍රහාණ වශයෙන් යූ.සේයි. මෙහි නිරොධො යනු නිර්වාණයමය.

**අඤ්ඤමඤ්ඤං නාති වත්තන්ති** යනු ඉදින් සමථය විදර්ශනාව ඉක්මවා යන්නේද, මැළිභාව පාක්ෂික හෙයින් සමථයෙහි සිත කුසීතතාව සඳහා පවතින්නේය. ඉදින් විදර්ශනාව සමථය ඉක්මවා යන්නේද? නොසන්සුන් පාක්ෂික හෙයින් විදර්ශනාවෙහි සිත නොසන්සුන් බව සඳහා පවතින්නේය. එහෙයින් සමථය විදර්ශනාව නොඉක්මවනුයේ කුසීතතායෙහි පතිතවීම් නොකරයි. විදර්ශනාව සමථය නොඉක්මවනුයේ නොසන්සුන්තායෙහි පතිතවීම් නොකරයි. සමථය සමව පවත්වනුයේ විදර්ශනාව නොසන්සුන් බවට වැටීමෙන් රකියි. විදර්ශනාව සමව පවත්වනුයේ සමථය කුසීතතාවයට වැටීමෙන් රකියි. මෙසේ මේ ද්වයය ඔවුනොවුන් නොඉක්මවන කෘත්‍යයෙන් ඒක කෘත්‍යයව සමව පවත්නාහු ඔවුනොවුන් නොඉක්මවන්නාහු අර්ථ සිද්ධකරන්නාහු වෙති. ඔවුන්ගේ මාර්ගක්ෂණයෙහි යුගනන්ධත්වය උට්ඨානගාමිණී විදර්ශනා ක්ෂණයෙහි යුගනන්ධත්වව වේ. ප්‍රහාණ පරිත්‍යාග, වුට්ඨාන විවට්ටන කරණයන්ගේ මාර්ග කෘත්‍යය වශයෙන් කියන ලද හෙයින්, සියලු මාර්ග කෘත්‍යයාගේ දර්ශනය සඳහා උද්ධච්ච සහගත කෙලෙස්ද, ස්කන්ධයෝද, අවිද්‍යා සහගත කෙලෙස්ද, ස්කන්ධයෝද නිර්දිෂ්ටයහ. සෙස්සන්ගේ එසේ නොකියන ලද හෙයින්, ප්‍රතිපක්ෂ ධර්ම මාත්‍රයක් දැක්වීම් වශයෙන් උද්ධච්චය හා අවිද්‍යාවම නිර්දිෂ්ටය.

විවට්ටතො යනු නොපෙරළෙන අයුරින් නවතන්නාහුට, **සමාධි කාමාසවා විමුත්තො හොති** යනු සමාධියට කාමච්ඡන්දය ප්‍රතිපක්ෂ හෙයින් යු.සේයි. **රාගවිරාගා** යනු රාගයෙහි විරාගය **සමතික්‍රමණය** මෙයට ඇත්තේනුයි රාගවිරාගයි. රාග විරාගයෙන් යනු පංචමී වචනයි, එසේම **අවිජ්ජා විරාගා චෙතො විමුත්ති** යනු මාර්ග සම්ප්‍රයුක්ත සමාධිය. **පඤ්ඤා විමුත්ති** යනු මාර්ග සම්ප්‍රයුකත ප්‍රඥාව. **තරතො** යනු තරණය කරන්නහුට, **සබ්බ පණිධීහි** රාග, ද්වේෂ, මෝහ ප්‍රණීධීන් ඇතුළු සියලු ප්‍රාර්ථනාවන්ගෙන්, මෙසේ තුදුස් ආකාරයෙන් විසඳ, ඒකරසාර්ථයද, නොඉක්මවන අර්ථයද නොවිසඳම, **ඉමෙහි සොළසහි ආකාරෙහි** ආදිය කීහ. කුමක් හෙයින්ද යත්? ඒ තුදුස් ආකාරයන්ගේ එකිනෙක අවසානයෙහි, එක්රස වෙයි. යුගනන්ධ වෙයි. ඔවුනොවුන් ඉක්මවයි. නිර්දේශිත හෙයින්, එම දෙයාකාරයෝම නිර්දේශ කරන ලද්දාහුම වෙති. එහෙයින් සොළසකිනැයි වදාළහ. යුගනන්ධාර්ථය වනාහි උදෙසීමෙහිදනො කියන ලද්දේමය.

ධර්මෝද්ධච්චවාරයෙහි, **අනිච්චතො මනසි කරොතො ඔභාසො උප්පජ්ජති** යනු උදයව්‍යයානු පස්සනාවෙහි සිටියහුට, ත්‍රිවිධ අනුපස්සනාවන්ගෙන් නැවත නැවත සංස්කාරයන් විදර්ශනා කරන කරන කල්හි නුවණ මේරීමට ගියකල්හි, තදංග වශයෙන් කෙලෙස් ප්‍රහාණයෙන්, පිරිසිදු සිතැත්තහුට, අනිත්‍ය වශයෙන් හෝ, දුක් වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ මෙනෙහි කරන කෙණෙහි, විදර්ශනා ඥාණානුභාවයෙන් ප්‍රකෘතියෙන්ම ආලෝකය උපදී. පළමුව අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන කල්හි ආලෝකය කියන ලදී. අදක්ෂ විදර්ශකයා එම ආලෝකය උපන් කල්හි, මට මෙයට පෙර මෙබඳු ආලෝකයක් නූපන් විරූය. ඒකාන්තයෙන් මාර්ගයට පැමිණියෙමි. ඵලයට පැමිණියෙමියි, නොමගම මාර්ගයැයිද ඵල නුවූයේම ඵලය යැයි ගනියි. නොමග මාර්ගයැයිද, නිඵලය ඵලයයැයිද ගන්නහුට විදර්ශනා වීථිය උදුරා දමනු ලැබුයේ වේ. හෙතෙම විදර්ශනා වීථිය අත්හැර, වික්ෂේපයට පැමිණියේ හෝ ආලෝකයම, තෘෂ්ණා, දෘෂ්ටි හැඟීම්වලින් හඟිනු ලබන්නේ හෝ හිඳී. මෙම ආලෝකය වනාහි ඇතැම් භික්ෂුවකට පර්යංකස්ථාන ප්‍රමාණයම බබළවනුයේ උපදී. ඇතමෙකුට ඇතුල්ගැබ, ඇතමෙකුට ගැබෙන් පිටද, ඇතමෙකුට සම්පූර්ණ විහරයද, ගව්වක්, අඩයොදුනක්, යොදුනක්, දෙයොදුනක් -පෙ- ඇතැමෙකුට පෘථුවිතලයෙහි සිට අකනිට්ඨා බඹලොව තෙක් ඒකාලෝක කරමින් පවතී. භාග්‍යවතුන් වහන්සේට වනාහි දසදහසක්

ලෝකධාතු බබළවමින් පහළවිය. මෙම ආලෝකය වනාහි සිව් අංගයන්ගෙන් සමන්විත ඝන අන්ධකාරයෙහි පවා ඒ ඒ ස්ථාන ආලෝක කරමින් උපදී.

**ඔභාසො ධම්මොති ඔභාසං ආවජ්ජති** යනු මෙම ආලෝකය, මාර්ග ධර්මයයිද ඵල ධර්මයයිද ඒ ඒ ආලෝකය මෙනෙහි කරයි. **තතො වික්ඛෙපො උද්ධච්චං** යනු එම ආලෝකය තුළින් එය මාර්ගඵල ධර්මයැයි ආවර්ජනා කිරීමෙන් යම් වික්‍ෂෙපයක් උපදීද, එය උද්ධච්ච නමැයි අර්ථයි.

**තෙන උද්ධච්චෙන විග්ගහිත මානසො** යනු එයින් මෙසේ උපදිනු ලබන උද්ධච්චයෙන් විරෝධයට පමුණුවන ලද සිතැතියේ, එම උද්ධච්චයෙන් හෝ එයට හේතුවූ එයට මූලික ක්ලේශෝත්පත්තියෙහි විරොධයට පමුණුවන ලද සිතැති, විදර්ශක තෙමේ විදර්ශනා වීථියට බැස, වික්‍ෂෙපයට හෝ එය මූලික ක්ලේශයන්හි හෝ සිටි හෙයින්, අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් එළැඹ සිටීම් තත්වාකාරයෙන් නොදනී. එහෙයින් 'ධම්මුද්ධච්ච විග්ගහිත මානසොයි' කියනු ලැබේ. මෙසේ යයි ශබ්දය යෙදිය යුතු වේ. **සො සමයො** යනු මෙසේ ආස්වාද වශයෙන් කිලිටි වූ සිතැති යෝගීහුටද ඉදින් විමසා බැලීම් උපදීද, හෙතෙම මෙසේ විශේෂයෙන් දැනගනී. විදර්ශනා නම් සංස්කාරාරම්මණය. මාර්ගඵල නිර්වාණාරම්මණය. මෙම චිත්තයෝද සංස්කාරාරම්මණයහ. එහෙයින් මෙම ආලෝකය මාර්ගය නොවේ. උදයව්‍යය නුවණින් මනාව බැලීමම නිර්වාණයෙහි ලෞකික මාර්ගය යැයි මාර්ගාමාර්ග වෙන්කොට එම වික්‍ෂෙපය දුරුකොට, උදයව්‍යයානුපස්සනාවෙහි පිහිටා සිට මනාව සංස්කාරයන්, අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි. මෙසේ මනාව පරීක්‍ෂා කරන්නහුට, යම්කලෙක සිත ගෝචරාධ්‍යාත්ම සංඛ්‍යාත ආරම්මණයෙහිම පිහිටා නම් මනාව හිඳීනම්, එකඟ වේනම් එබඳු සමයක් වේ. මෙසේ නොදක්නේ වනාහි මාර්ගයට ඵලයට පත්වූයෙමියි අධිමානික වේ.

**යං තං චිත්තං** යනු යම් ඒ විදර්ශනා සිත, **අජ්ඣත්තමෙවසණ්ඨව** යනු ගෝචරාධ්‍යාත්ම සංඛ්‍යාත අනිත්‍යානුපස්සනා අරමුණෙහි, **ඤාණං උප්පජ්ජති** යනු රූපාරූප ධර්මයන් තුලනය කරන, තීරණය කරන, එම යෝගාවචරයාටම මුදාහළ සක්දෙව්රදුන්ගේ වජ්‍රායුධය මෙන් නොනසන ලද වේග ඇතියේ, සියුම් ඉතා දක්ෂ පැහැදිලි විදර්ශනා ඥානය උපදී.

**පීති උප්පජ්ජති** යනු ඔහුට එසමයෙහි ඛුද්දිකා, ඛණිකා, ඔක්කන්තිකා, උබ්බෙගා ඵරණා යන මේ පස්වැදෑරුම් ප්‍රීතිය මුළු සිරුර පුරවමින් උපදී. **පස්සද්ධි උප්පජ්ජති** යනු ඔහුට එසමයෙහි කාය චිත්තයන්ගේ දාහය නොමැතියේමය. ගරුබව (දැඩිබව) නොමැත. කර්කශ බව නොමැත. අකර්මණ්‍යතාව නොමැත. ගිලන් බව නොමැත වක්බව නොමැත. එකල්හි වනාහි ඔහුගේ කාය චිත්තයෝ සංසුන් වූවාහු, සැහැල්ලු වූවාහු, මෘදු වූවාහු, කර්මණ්‍ය වූවාහු, ප්‍රගුණ වූවාහු, මනාව පිරිසිදු වූවාහු ඍජු වූවාහු වෙති. හෙතෙම මෙම සන්සිඳීම් ආදියෙන්, අනුගෘහිත කය හා සිතැතියේ, එසමයෙහි අමානුසි නම් ඇල්ම අනුභව කරයි. (සාමාන්‍ය මිනිසුන් විඳින සැපත ඉක්මවා ගිය)

**සුඤ්ඤාගාරං පවිට්ඨස්ස - සන්ත චිත්තස්ස භික්ඛුනො**
**අමානුසී රතී හොති - සම්මා ධම්මං විපස්සතො**

ශූන්‍යාගාරයට පිවිසි ශාන්ත සිතැති භික්ෂුවට, මනාව ධර්මය නුවණින් බලනකල්හි අමානුෂික ඇල්ම හටගනී.

**යතො යතො සම්මසති - ඛන්ධානං උදයබ්බයං**
**ලභතී පීති පාමොජ්ජං - අමතං තං විජානතං**

යම්කලෙකැ පටන් ස්කන්ධයන්ගේ උදයව්‍යය විමසා බලයිද? එය අමෘතයැයි දන්නා ලද්දුයේ එපමණ ප්‍රීති ප්‍රමෝද්‍යයක් ලබයි.

මෙසේ මොහුට මෙම අමානුෂික ඇල්ම සිදුකරන්නේ, ලහුතාදීන් සමග විදර්ශනා සම්ප්‍රයුක්ත කාය චිත්ත සන්සිඳීම උපදී. **සුඛං උප්පජ්ජති** යනු ඔහුට එකල්හි මුළුසිරුර පුරා ගලාබස්නා මෙන් විදර්ශනා සම්ප්‍රයුක්ත සුවය උපදී. **අධිමොක්ඛො උප්පජ්ජති** යනු ඔහුට එසමයෙහි චිත්ත චෛතසිකයන්ගේ අතිශය ප්‍රසාදය වූ, විදර්ශනා සම්ප්‍රයුක්ත ශ්‍රද්ධාව උපදී. **පග්ගහො උප්පජ්ජති** යනු ඔහුට එසමයෙහි ඉතා ලිහිල් නුවූ - ඉතා දැඩි නුවූ, මනාව එසැවූ, විදර්ශනා සම්ප්‍රයුක්ත වීර්යය උපදී. **උපට්ඨානං උප්පජ්ජති** යනු ඔහුට එකල්හි, මනාව එළැඹි, මනාව පිහිටි, සිටවූ, නොසෙල්විය හැකි පර්වතරාජයෙකු බඳු විදර්ශනා සම්ප්‍රයුක්ත සිහිය උපදී. හෙතෙම යම් යම් ස්ථානයක් ආවර්ජනය කෙරේද, එක්තැන් කරයිද, මෙනෙහි කෙරේද, ප්‍රත්‍යවේක්ෂා කෙරේද, ඒ ඒ ස්ථානය ඔහුට

බැසගෙන පැනවැදී, දිව්‍යචක්ෂුර් ලාභීහුට පරලොව මෙන් සිහිය එළැඹ සිටී. **උපෙක්ඛා** යනු විදර්ශනෝපේක්ෂාවද ආවර්ජනෝපේක්ෂාවද වේ. එකල්හි සියලු සංස්කාරයන්හි මධ්‍යස්ථ ස්වභාව වූ විදර්ශනෝපේක්ෂාවද, මනෝද්වාරයෙහි ආවර්ජනෝපේක්ෂාවද බලවත්ව උපදී. එය ඒ ඒ ස්ථාන ආවර්ජනය කරන්නහුට, මුදාහළ සක්දෙව් රදුන්ගේ වජ්‍රායුධය මෙන්ද, කොළ ගොටුවක බහාලූ රත්වූ යකඩ හුලක් මෙන්ද, දක්ෂව, තීක්ෂණව උසුලයි. මෙසේ විසුද්ධි මාර්ගයෙහි යූසේයි. 'විපසසනූපෙකඛා' යන මෙහි විදර්ශනා සම්ප්‍රයුක්ත තත්‍ර මධ්‍යස්ථුපේක්ෂාව යැයි ආචාර්යයෝ කියති.

විදර්ශනා ඤාණයන් ගනු ලබන කල්හි, **ඤාණං උපපජ්ජති** යයි විදර්ශනා ඤාණය ගණන් ගත් හෙයින්, පුනරුක්ති දෝෂය වේ. තෘතීය ධ්‍යාන වර්ණනාවෙහිද, සංස්කාරෝපේක්ෂා, විදර්ශනෝපේක්ෂාවන්හිද අර්ථ වශයෙන් ඒකීභාවය වේ. එම ප්‍රඥාවම කෘත්‍යය වශයෙන් දෙකඩ වූහයි යූ.සේයි. එහෙයින් විදර්ශනා සම්ප්‍රයුක්ත තත්‍ර මධ්‍යස්ථපේක්ෂාව කියනු ලබන කල්හි පුනරුක්ති දෝෂයද නොවේ. තෘතීය ධ්‍යාන වර්ණනාවෙහිද ගැළපේ. පඤ්ච ඉන්ද්‍රියයන්හි ඤාණය, අධිමෝක්ෂ, පග්‍රහ, උපට්ඨාන යැයි, ප්‍රඥෙන්ද්‍රිය, ශ්‍රද්ධෙන්ද්‍රිය, වීර්යෙන්ද්‍රිය, සතින්ද්‍රිය නිර්දිෂ්ටය. සමාධීන්ද්‍රිය අනිර්දිෂ්ටය. යුගනන්ධ වශයෙන් සමාධීන්ද්‍රිය නිර්දේශ කළයුතුමය. සමව පැවැති සමාධිය නැවැත එක්තැන් කිරීමෙහි උත්සාහ දුරුකිරීමෙන් උපේක්ෂා යයි යූසේයි.

**නිකනති උපපජජති** යනු මෙසේ ආලෝකාදියෙන් සැදුම්ලත් විදර්ශනාවට ඇලුම් කරනුයේ සියුම් සංසුන් ආකාර වූ තෘෂ්ණාව හටගනී. කෙලෙස්යයි පරිග්‍රහණය කරන්ටද නොහැකි වේ. ආලෝකයෙහි යම්සේද, ඒවාහි කිසියම් එකක් හටගත් කල්හි යෝගාවචරයා, ඒකාන්තයෙන් මා හට මින්පෙර මෙවන් ඤාණයක්, මෙබඳු ප්‍රීතියක්, සංසිඳීමක්, සුවයක්, සිතෙහි ස්ථිරත්වයක්, උත්සාහවත් වීමක්, එළඹ සිටීමක්, උපේක්ෂාවක්, තෘෂ්ණාවක නූපන් විරූය. ඒකාන්තයෙන් මාර්ගයට පැමිණියෙමි. ඵලයට පැමිණියෙමියි, නොමගම මාර්ගයැයිද, ඵලනුවූවක්ම ඵලයෙකැයි ගනියි. නොමග මගයැයිද, ඵල නුවූවක් ඵලයයැයි ගන්නහුට විදර්ශනා වීථිය නොමගට පිළිපන්නේ වේ. හෙතෙම තමාගේ මුල් කමටහන අත්හැර තෘෂ්ණාවම ආස්වාද කරනුයේ හිඳියි. මෙහිද ආලෝක ආදීහු කෙලෙසුන්ට හේතුහෙයින් උපක්ලේශයි යූසේයි. අකුසල් නොවේ.

තෘෂ්ණාව වනාහි උපක්ලේශයද, උපක්ලේශ වස්තුවද වේ. වස්තු වශයෙන්ද ඒවා දසයකි. ග්‍රහණ වශයෙන් තිහකි. කෙසේද, මට ආලෝකය උපනැයි ගන්නා කල්හි දෘෂ්ටි ග්‍රාහය වෙයි. සිත්කලු ආලෝකයක් උපනැයි ගන්නා කල්හි මාන ග්‍රාහය වෙයි. ආලෝකය අස්වාදනය කරන්නහුට තෘෂ්ණා ග්‍රාහයයි, මෙසේ ආලෝකයෙහි දෘෂ්ටි, මාන, තෘෂ්ණා වශයෙන් ග්‍රාහත්‍රයයකි. සෙසු ප්‍රීති ආදීන්හිද එසේය. මෙසේ ග්‍රාහ වශයෙන් සමතිස් උපක්ලේශ වෙයි. **දුක්ඛතො මනසිකරොතො අනත්තතො මනසිකරොතො** යන වාරයන්හිද මෙම ක්‍රමයෙන් අර්ථය දතයුතුය. එක් එක් අනුපස්සනා වශයෙන් වනාහි මෙහි එක් එක් විදර්ශනෝපක්ලේශෝත්පත්ති දතයුත්තාහ. තනි එකක් වශයෙන් නොවේ.

ත්‍රිවිධ අනුපස්සනාවන්හි මෙසේ භේද රහිත විදර්ශනා වශයෙන් උපක්ලේශයන් ඉදිරිපත්කොට නැවත භේද වශයෙන් ඉදිරිපත් කරනුයේ, **රූපං අනිච්චතො මනසි කරොතො** ආදිය වදාළහ. එහි **ජරා මරණං අනිච්චතො උපට්ඨානං** යනු ජරා මරණයාගේ අනිත්‍යය වශයෙන් වැටහීම පෙර කියන ලද සමතිස් උපක්ලේශයන්ගේ වශයෙන් අදක්‍ෂ, අව්‍යක්ත යෝගාවචරයා ආලෝකාදීන්හි විශේෂයෙන් කම්පාවෙයි. ආලෝකාදීන්හි එකින් එක එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයැයි මනාසේ දකියි. ඒ අර්ථය දක්වනුයේ **ඔභාසෙ චෙව ඤාණෙච** යන ගාථා ද්වයය වදාළහ.

එහි **විකම්පති** යනු ආලෝකාදී අරමුණුවල නොයෙක් කෙලෙස් වශයෙන් විවිධාකාරයෙන් කම්පා වේ. සැලේ. **යෙහි චිත්තං පවෙධති** යනු සන්සිඳීම් ආදී සුවයන්ගෙන් සිත, නොයෙක් කෙලෙස් වශයෙන් නානාප්‍රකාරයෙන් සැලේ. කම්පා වේ. **පස්සද්ධියා සුඛෙචෙව** යෝගාවචරයා විවිධාකාරයෙන් කම්පාවේයයි සම්බන්ධය දතයුතුය. **උපෙක්ඛා වජ්ජනාය චෙව** යනු උපේක්‍ෂා සංඛ්‍යාත ආවර්ජනයෙන්ද විශේෂයෙන් කම්පා වේ. ආවර්ජනෝපේක්‍ෂාවෙන්ද විශේෂයෙන් කම්පා වේයයි අර්ථයි. විශුද්ධි මාර්ගයෙහි වනාහි 'උපක්ඛා වජ්ජනායංච' යයි යූසේයි. **උපෙක්ඛා යච** යනු යට කියන ලද ආකාර ඇති, උපේක්‍ෂාවෙන්ද තෘෂ්ණාවෙන්ද විශේෂයෙන් කම්පා වේයයි අර්ථයි.

මෙහිද, දෙවදෑරුම් උපේක්‍ෂාවන්ගේ වශයෙන් නිර්දේශිත හෙයින්, යට උපේක්‍ෂාව හටගනීයයි දක්වන ලද තන්හි, දෙයාකාරයෙන් අර්ථය

යූ.සේයි. අනිත්‍යානුපස්සනාදීන්හිද, එකිනෙකම වූ ආවර්ජනෝපේක්ෂාවගේ යෙදෙන හෙයින්, එකිනෙකම වූ, අනුපස්සනාවෝ, අනිත්‍යය, අනිත්‍යය, දුක්ය, දුක්ය, අනාත්මය, අනාත්මයැයි නැවත නැවත වඩනු ලැබේ යයි යූසේයි. දක්ෂ, නුවණැති, ව්‍යක්ත, බුද්ධිමත් යෝගාවචර තෙමේ, ආලෝකාදිය හටගත් කල්හි මෙම ආලෝකය මට උපන්නේය, එබඳු වූ මෙම ආලෝකය වනාහි, අනිත්‍යය, ප්‍රත්‍යයෙන් හටගත්තේය. හේතුවකින් හටගත්තේය. ක්‍ෂය වන ස්වභාවයය, විනාශවන ස්වභාවයය, නොඇලිය යුතු ස්වභාවයකි. නිරුද්ධවන ස්වභාවයකැයි මෙසේ එය ප්‍රඥාවෙන් පිරිසිඳියි. මනාව පරීක්‍ෂා කරයි. තවද ඔහුට මෙබඳු සිතක් වේ. 'ඉදින් ආලෝකය ආත්මය වන්නේද? ආත්මයැයි ගන්ට වටනේය. මෙය ආත්මය නොවූයේම ආත්මයැයි ගන්නා ලද්දේය. එහෙයින් මෙය වශයෙහි නොපවත්නා අර්ථයෙන් ආත්මියැයි දක්නේ දෘෂ්ටිය උගුලුවාලයි. ඉදින් ආලෝකය නිත්‍ය වන්නේද? නිත්‍යයැයි ගන්ට සුදුසුය. මෙය අනිත්‍යය වූයේම නිත්‍යයැයි ගන්නා ලද්දේය. එහෙයින් මෙය පැවත අභාවයට යන අර්ථයෙන් අනිත්‍යයැයි දක්නේ මානය උගුලුවා ලයි. ඉදින් ආලෝකය සුවයෙක් වන්නේද? සුවයැයි ගන්ට වටනේය. මෙය දුක් ස්වභාව වූයේම සුවයැයි ගන්නා ලදී. එහෙයින් මෙය ඉපැත්ම විනාශය යනාදියෙන් මනා පීඩනයට පත්වන අර්ථයෙන් දුකකැයි දක්නේ තෘෂ්ණාව මඩිනු ලැබේ. ආලෝකය යම්සේද, සෙස්සෙහිද එසේමය. මෙසේ මනාව පරීක්‍ෂාකොට, ආලෝකය, එය මාගේ නොවේ. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙමියි මනාව දකියි. ඥාණය -පෙ- තෘෂ්ණාව එය මාගේ නොවේ. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි මනාව දකියි. මෙසේ මනාව දක්නේ ආලෝකාදීන්හි කම්පා නොවේ. නොසැලේ. එහෙයින් එම අර්ථය දක්වනුයේ **ඉමානි දසඨානානි** යන ගාථාව වදාළහ.

එහි **දස ඨානානි** යනු ආලෝකාදීහුය. **පඤ්ඤා යසස පරිචිතා** යනු යමක්හු විසින් උපක්ලේශයන්ගෙන් මුක්ත ප්‍රඥායෙන්, පුරුදුකරන ලද්දාහු නැවත නැවත ස්පර්ශ කරන ලද්දාහු, මනාව වඩන ලද්දාහුය. **ධම්මුද්ධච්ච කුසලො හොති** යනු ප්‍රඥායෙන් පුරුදු කරන ලද, දස ස්ථාන ඇති එම යෝගාවචරයා, පෙර කියන ලද ආකාර ඇති ධර්මෝද්ධච්චයෙහි නිසි ස්වභාව ප්‍රතිවේධයෙන් දක්ෂ වේ. **නච සමෙමාහං ගච්ඡති** යනු ධර්මෝද්ධච්චයෙහි දක්ෂතායෙන්ම තෘෂ්ණා, මාන, දෘෂ්ටි උගුළුවා දැමීම් වශයෙන් මුළාවට නොයේ.

පෙර කියන ලද ආකාරයම, වෙනත් ක්‍රමයකින් ප්‍රකටකොට දක්වනුයේ, **වික්ඛිපපති චෙව කිලිසසතිච** යනාදී ගාථාව වදාළහ. එහි මන්ද ප්‍රාඥ යෝගාවචර තෙමේ, ආලෝකාදීන්හි වික්ෂේපයද, සෙසු ක්ලේශෝත්පත්තියටද පැමිණේ. මධ්‍යම ප්‍රාඥ තෙමේ වික්ෂේපයටම පැමිණේ. සෙසු ක්ලේශෝත්පත්තියට නොපැමිණේ. හෙතෙම අධිමානික වේ. තීක්ෂණ ප්‍රාඥයා වික්ෂේපයට පැමිණද, එම අධිමානය දුරුලා විදර්ශනාව අරඹයි. අති තීක්ෂණ ප්‍රාඥ තෙමේ වික්ෂෙපයට නොපැමිණේ. සෙසු ක්ලේශෝත්පත්තියට නොපැමිණේ. **වික්ඛිපපති චෙව** යනු ඔවුනතර මන්ද ප්‍රාඥ තෙමේ ධර්මෝද්ධච්ච සංඛ්‍යාත වික්ෂෙපයටද පැමිණේ. **කිලිසසතිච** යනු තෘෂ්ණා, මාන, දෘෂ්ටි යන කෙලෙසුන්ගෙන් කෙලෙසෙනු ලැබේ. බාධා කෙරේයයි අර්ථයි. **චවති චිතත භාවනා** යනු ඒ මන්ද ප්‍රාඥයාට, විදර්ශනා චිත්ත භාවනාව කෙලෙසුන් කෙරෙහිම පිහිටා සිටින හෙයින් ප්‍රතිපක්ෂතා නසන ලද හෙයින් ච්‍යුත වේ. බිඳවැටේ යයි අර්ථයි.

**වික්ඛිපති න කිලිසසති** යනු මධ්‍යම ප්‍රාඥ තෙමේ වික්ෂේපයෙන් වික්ෂේපයට පත්වේ. කෙලෙසුන්ගෙන් කිලිටි නොවන්නේය. **භාවනා පරිහායති** යනු ඒ මධ්‍යම ප්‍රාඥයාට අධිමානික හෙයින්, විදර්ශනා ආරම්භ අභාවයෙන් විදර්ශනාවෙන් පිරිහෙයි. නොපවතී යයි අර්ථයි. **වික්ඛිපති න කිලිසසති** යනු තීක්ෂණ ප්‍රාඥ තෙමේද, වික්ෂේපයෙන් වික්ෂේපයට පත්වේ. කෙලෙසුන්ගෙන් කිලිටි නොවන්නේය. **භාවනා න පරිහායති** යනු එම තීක්ෂණ ප්‍රාඥයා හට වික්ෂේපය ඇතිකල්හිද, එම අධිමාන වික්ෂේපය අත්හැර විදර්ශනාරම්භය යෙදීමෙන්, විදර්ශනා භාවනාව නොපිරිහේ. පවතීයයි අර්ථයි. **නච වික්ඛිපතෙ චිතතං න කිලිසසති** යනු අති තීක්ෂණ ප්‍රාඥයාට සිත වික්ෂේපයෙන් වික්ෂේපයට පත් නොවේ. කෙලෙසුන්ගෙන් කිලිටි නොවේ. **න චවති චිතත භාවනා** යනු ඔහු විදර්ශනා චිත්ත භාවනාවෙන් ච්‍යුත නොවේ. වික්ෂේප ක්ලේශ අභාවයෙන් නිසිතැන සිටීයයි අර්ථයි. **ඉමෙහි චතුහි ඨානෙහි** යනාදීන්හි දැන් කියන ලද මෙම කරුණු සතරෙන්ද, හේතු වූ, කාරණා වූ, ඕභාසාදී දස ස්ථානයෙහි 'චිත්තයාගේ සංක්ෂේපයෙන්ද, වික්ෂේපයෙන්ද, විරෝධයට පමුණුවන ලද සිත, වික්ෂේප ක්ලේශෝත්පත්ති විරහිත සතරාකාරයන්හි දක්ෂ, මහා ප්‍රාඥ යෝගාවචර තෙමේ මන්ද ප්‍රාඥාදී ත්‍රිවිධ යෝගාවචරයින්ගේ මනස මෙසේ මෙසේ වෙයයි නා නා අයුරින් දනීයයි සම්බන්ධතා වශයෙන් අර්ථ වර්ණනා දතයුත්තාහ. **සංඛෙපො** යනු චිත්ත වික්ෂේපයාගේද, කෙලෙසුන්ගේ උත්පත්ති වශයෙන් චිත්තයාගේ මැළිබව දතයුතුය.

විකෙඛපො යනු වික්‍ෂේප වේ. කිලිටි නොවන්නේය යන දෙතන්හි කියන ලද වික්‍ෂේප වශයෙන් චිත්තයාගේ නොසන්සුන් බව දතයුතුය.

## යුගනන්ධ කථා වර්ණනා නිමි.

යුගනන්ධ ගුණය ආර්ය මාර්ගයාගේ වශයෙන්, සත්‍යාර්ථය, සත්‍යය ප්‍රතිවේධ විශේෂය, සත්‍ය ලක්‍ෂණ, විධානයද ගෙනහැර දක්වමින්, දේශිත සූත්‍රාන්ත පූර්වංගම සත්‍ය කථායෙහි පෙර නුවූ විරූ අර්ථ අනුවර්ණනාවයි, එහි සූත්‍රාන්තයෙහි, **තථානි** යනු යථා ස්වභාව වශයෙන් සත්‍යයෝ, යථා ස්වභාව වූම, ධර්ම සමූහය සත්‍යාර්ථයෙන් සත්‍යයෝයි. සත්‍යාර්ථය ප්‍රථම ඤාණ නිර්දේශ වර්ණනායෙහි යුසේයි. **අවිතථානි** යනු කියන ලද ස්වභාවයෙහි වෙනස් ස්වභාව විරහිත, සත්‍යයෝ අසත්‍යයෝ නම් නොවෙති. **අනඤ්ඤථානි** යනු අන්‍ය ස්වභාව විරහිත, අසත්‍යයෝ, සත්‍යයෝ නම් නොවෙති. **ඉදං දුකඛනති භිකඛවෙ තථමෙතං** යනු මහණෙනි, මෙය දුකයැයි යමක් ගැන කියයිද, එය යථා ස්වභාව හෙයින් සත්‍යය, දුක දුකෙක්මය, කියන ලද ස්වභාවයෙහි වෙනස් ආකාරයක් නොමැති හෙයින් අවිතථංයි. දුක දුකක් නොවන්නේ නොවේ. අන් ස්වභාව විරහිත හෙයින් අනඤ්ඤථංයි. දුක සමුදය ආදී ස්වභාවයකට පත් නොවේ. සමුදයාදීන්හිද එම ක්‍රමයමැයි. **තථටෙඨන** යනු නිසි ස්වභාවාර්ථයෙන්, පීළනාර්ථාදීහු ඤාණ කථායෙහි කියන ලද අර්ථමය. **එක පටිවෙධානී** යනු එක් මාර්ග ඤාණයෙන් වන ප්‍රතිවේධය, එක්තැන්ව වූ ප්‍රතිවේධය ඒවාටනුයි එකපටිවෙධානියි, **අනත්තටෙඨන** යනු සිව් සත්‍යයන්ගේ ආත්ම විරහිත හෙයින් අනාත්මාර්ථයෙන් එය විශුද්ධි මාර්ගයෙහි යුසේයි. 'පරමාර්ථ වශයෙන් සියලුම සත්‍යයෝ, වේද, කාරක, නිබබුත, ගමක අභාව හෙයින් ශූන්‍යයයි දතයුත්තාහ. එහෙයින් එය යුසේයි.

**දුකඛමෙවහි න කොචි දුකඛිතො - කාරකො න කිරියාව විජජති**
**අතථි නිබබුති න නිබබුතොපුමා - මගගමතථි ගමකො න විජජති**

දුකක්ම වේ. දුකට පත් කිසිවෙක් නොමැත. කරන්නෙක් නොමැත. ක්‍රියාවක් පමණක් විද්‍යමාන වේ. නිවීමක් ඇත. නිවුණු පුද්ගලයෙක් නොමැත. මාර්ගය ඇත. ගමන් කරන්නෙක් විද්‍යමාන නොවේ.

**ධුව සුභ සුඛත්ත සුඤ්ඤං - පුරිම ද්වය මත්ත සුඤ්ඤම මත පදං**
**ධුව සුභ අත්ත විරහිතො - මග්ගො ඉති සුඤ්ඤතා තෙසු'ති**

ප්‍රථම ද්වයය නිත්‍ය, ශුභ, සුව ආත්ම ශූන්‍යයි. අමෘතපදය වූ නිර්වාණය ආත්ම ශූන්‍යයි. මාර්ගය නිත්‍ය, සුව, ආත්ම විරහිතයි. මෙසේ ඒවාහි ශූන්‍යතාවයි.

**සච්චට්ඨෙන** යනු බොරු නොකියන අර්ථයෙන්, **පටිවෙධට්ඨෙන** යනු මාර්ග ක්ෂණයෙහි අවබෝධ කළයුතු අර්ථයෙන්, **එක සංගහිතාහීති** යනු සත්‍යාර්ථාදී වශයෙන් එකෙකී අර්ථයෙන් සංග්‍රහ කරන ලදහ. එකත්ව ග්‍රහණයට ගියාහුයයි අර්ථයි.

**යං එක සංගහිතං තං එකත්තං** යනු යම්හෙයකින් එකෙකී අර්ථයෙන් සංග්‍රහ කරන ලද්දේද, එහෙයින් එකත්වයයි අර්ථයි. සත්‍යයන් බොහෝ වූයේද, ඒකත්වය අපේක්ෂාකොට ඒකවචනය කරන ලදී. **එකත්තං එකෙන ඤාණෙන පටිවජ්ඣති** යනු චතුසත්‍යයන්ගේ පූර්වභාගයෙහි නානත්වය හා ඒකත්වය, ස්වාවස්ථිතව ව්‍යවස්ථාපනය කොට සිටියේ මාර්ගක්ෂණයෙහි එක් මාර්ග ඤාණයෙන් තථාර්ථාදිත්වය ඒකත්වයෙන් ප්‍රතිවේධ කරයි. කෙසේද? නිරෝධ සත්‍යයෙහි, සත්‍යාර්ථාදී වූ ඒකත්වය, අවබෝධ කළ කල්හි, සෙසු සත්‍යයන්ගේද, සත්‍යාර්ථාදී වූ, ඒකත්වය අවබෝධ කරන ලද්දේම වේ. යම්සේ පූර්වභාගයෙහි පංචස්කන්ධයන්ගේ නානත්වකත්වය, ස්වාවස්ථිතව, ව්‍යවස්ථාපනයකොට සිටියහුට මාර්ගයෙන් නැගී සිටුනා කල්හි අනිත්‍ය වශයෙන් හෝ දුක් වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ නැගී සිටිනහුට, එක් ස්කන්ධයෙක්හිද, අනිත්‍යාදී වශයෙන් දිටිකල්හි සෙසු ස්කන්ධයෝද, අනිත්‍යාදී වශයෙන් දුටුවාහුම වෙති. මෙයද එසේයයි දතයුතුය.

**දුක්ඛස්ස දුක්ඛට්ඨො තථට්ඨො** යනු දුක්ඛ සත්‍යයාගේ පීඩකිරීම් ආදී වූ සිව් වැදෑරුම් අර්ථය ස්වභාවාර්ථයෙන් සත්‍යාර්ථයි. සෙසු සත්‍යයන්හිද මෙම ක්‍රමයමැයි. ඒ සිව්වැදෑරුම් අර්ථයම, ආත්ම අභාවයෙන් **අනත්තට්ඨොයි** කියන ලද ස්වභාවයෙහි මුසා නොබණනා හෙයින් **සච්චට්ඨොයි** මාර්ග ක්ෂණයෙහි ප්‍රතිවේධ කළයුතු හෙයින් **පටිවෙධට්ඨොයි.**

**යං අනිච්චං** යනාදිය සමානතා ලක්ෂණ පූර්වංගම කොට දක්වන

ලදී. එහි **යං අනිච්චං තං දුක්ඛං, යංදුක්ඛං තං අනිච්චං** යනු දුක් හටගන්නා මාර්ගය ගන්නා ලදී. එම ත්‍රිවිධ සත්‍යයෝම අනිත්‍ය වූවාහුම, අනිත්‍ය හෙයින් දුක්වූවාහුද වෙති. **යං අනිච්චං ච දුක්ඛඤ්ච තං අනත්තාති** එම ත්‍රයයම ගන්නා ලද්දාහුය. **යං අනිච්චං ච දුක්ඛඤ්ච අනත්තාචාති** යනු ඒ ත්‍රයයෙන් සහ නිරෝධ සත්‍යයද සංගෘහිතය. සතරම අනාත්මයහ. **තං තථං** යනු එම සත්‍ය චතුෂ්කය සත්‍ය ස්වභාව වූයේ, **තං සච්චං** යනු එම සත්‍ය චතුෂ්කයම යථා ස්වභාවයෙහිලා මුසා නොබණන සුලුය.

**නවහාකාරෙහි** යන ආදීන්හි 'මහණෙනි, සියල්ල විශිෂ්ට ඥාණයෙන් දතයුතුය' යන වචනයෙන් විශේෂ දැනුම් අර්ථයෙන් දුක්ඛයාගේ විශේෂ දැනීම් අර්ථයෙහි, සමුදයාගේ ප්‍රහාණාර්ථයෙහි, මාර්ගයාගේ වැඩීම් අර්ථයෙහි, නිරෝධයාගේ සාක්‍ෂාත් කිරීම් අර්ථයෙහි, මෙහි චතුරාර්ය සත්‍යයන්හි ආවේණික ලක්‍ෂණයන් වූ, විශේෂ ඥාණයෙන් දැනීම යෙදෙන හෙයින් විශේෂ ඥාණයෙන් දැනීම් අර්ථයෙන් සිව්සස් දර්ශනයෙන ප්‍රහාණය යෙදෙන හෙයින් ප්‍රහාණාර්ථයෙන් සිව්සස් වැඩීම් යෙදෙන හෙයින් භාවනාර්ථයෙන්, සිව් සස්හි සාක්‍ෂාත් කිරීම් යෙදෙන හෙයින් සාක්‍ෂාත් කිරීම් අර්ථයෙන් නිර්දේශිත යැයි දතයුතුය. **නවහාකාරෙහි තථටෙඨන** යනාදීන්හි පළමුව කියන ලද ආකාරයෙන්ම යෙදීම් කළයුත්තාහ. **දවාදසහි ආකාරෙහි** යන ආදීන්හි සත්‍යාර්ථාදීහු ඥාණ කථායෙහි කියන ලද අර්ථයි. ඒවාහි නිර්දේශයෙහිද කියන ලද අයුරින්ම යෙදීම් දතයුතුය.

**සච්චානං කති ලක්ඛණානි** යනාදීන්හි මත්තෙහි කිවයුතු ෂට් ලක්‍ෂණයන් සංඛත අසංඛත වශයෙන් දෙකඩකොට **දෙව ලක්ඛණානියි** වදාළහ. එහි **සංඛත ලක්ඛණඤ්ච අසංඛත ලක්ඛණංච** යනු මහණෙනි, මේ සංඛතයාගේ සංඛත ලක්‍ෂණත්‍රයයකි. ඉපැත්ම පෙනේ. විනාශය පෙනේ. සිටියහුගේ (පැවති ද්‍රව්‍යයෙහි) විනාශය පෙනේ. මහණෙනි, මේ අසංඛතයාගේ අසංඛත ලක්‍ෂණ ත්‍රයයකි. ඉපැත්ම නොපෙනේ. විනාශය නොපෙනේ. සිටියහුගේ (පැවති ද්‍රව්‍යයෙහි) වෙනස් ආකාරය නොපෙනේ. මෙසේ කී කල්හි සංඛතයාගේ සංඛත යන ලක්‍ෂණයද, අසංඛතයාගේ අසංඛත යන ලක්‍ෂණයද වේ. සංඛතය ලක්‍ෂණය නොවේ. ලක්‍ෂණය සංඛතය නොවේ. සංඛතයෙන් තොරව ලක්‍ෂණය පනවන්ට (දක්වන්ට) නොහැකිය. ලක්‍ෂණයෙන් තොරව සංඛතයද නොහැකිය.

නැවත එම ලක්‍ෂණ ද්වයයම විස්තර වශයෙන් ඉදිරිපත් කරනුයේ, **ඡ ලක්ඛණානියි** වදාළහ. **සංඛතානං සච්චානං** යනු දුක්ඛ, සමුදය, මාර්ග යන සත්‍යයන්හි, ඒවා වනාහි ප්‍රත්‍යයන් හා එක්ව කළ හෙයින් සංඛතය. **උප්පාදො** යනු ඉපැත්මයි. **පඤ්ඤායති** යනු දැනගනු ලැබේ. **වයො** යනු භංගයයි. **ඨිතානං අඤ්ඤථත්තං** යනු ස්ථිති ප්‍රාප්තයින්ගේ වෙනස් ස්වභාවය වූ ජරාවයි. ත්‍රිවිධ සංඛත සත්‍යයන්ගේ හටගත් හෙයින් ඉපැත්ම, විනාශය, වෙනස් ස්වභාවයට පත්වීම යූසේයි. එම උත්පාද, ජරා, භංගයාගේද, අනිෂ්පන්න හෙයින් උත්පාද, ව්‍යය, වෙනස් ස්වභාවය නොකිවයුතුය. (නොයෙදේ) සංඛත නිශ්‍රිත හෙයින් උත්පාද, ව්‍යය, වෙනස් ස්වභාවය නොපෙනේ යයි නොකිව යුතුය. ප්‍රත්‍යයෙන් හටගත් දෑ වෙනසට පත්වන හෙයින් සංඛතයයි කිවයුතුය. දුක්ඛ, සමුදයයන්ගේ, උත්පාද, ජරා, භංග සත්‍යයන්ට ඇතුළත් වීය. මාර්ග සත්‍යයාගේ උත්පාද, ජරා, භංග සත්‍යයන්ට ඇතුළත් වී යි නො කියති. එහි සංඛතයන්ගේ, උත්පාද ක්‍ෂණයෙහි, සංඛතද, උත්පාද ලක්‍ෂණයද, කාල සංඛ්‍යාත එහි ක්‍ෂණයද පෙනේ. (ප්‍රකට වේ). ඉපැත්ම ඉක්මගිය කල්හි, සංඛතද, දිරීම් ලක්‍ෂණයද, කාල සංඛ්‍යාත එහි ක්‍ෂණයද පෙනේ. භංග ක්‍ෂණයෙහි සංඛතද, දිරීමද, භංග ලක්‍ෂණයද, කාල සංඛ්‍යාත එහි ක්‍ෂණයද පෙනේයයි ඛන්ධක වර්ග අටුවායෙහි යූ.සේයි. **අසංඛතස්ස සච්චස්ස** යනු නිරෝධ සත්‍යයාගේ, එය ප්‍රත්‍යයන් හා එකතුව නොකරන ලද හෙයින්, තෙමේම නිපන්නේනුයි අසංඛතංයි. **ඨිතස්ස** යනු නිත්‍ය වූ හෙයින් සිටියහුගේ ස්ථානගත නොවීම, නැවත එම ලක්‍ෂණ ද්වයයම විස්තර වශයෙන් දක්වනුයේ ද්වාදස ලක්ඛණානීයි වදාළහ.

**චතුන්නං සච්චානං කති කුසලා** යනාදීන්හි **අබ්‍යාකතං** යනු විපාක, ක්‍රියා, රූප, නිර්වාණ යන සිව් අව්‍යාකෘතයන්හි නිර්වාණාව්‍යාකෘතයයි. සතරම කුසල්, අකුසල් වශයෙන් ප්‍රකාශ නොකළ හෙයින් අව්‍යාකෘතයෝයි. **සියා කුසලං** යනු කාමාවචර, රූපාවචර, අරූපාවචර කුසලයන්ගේ වශයෙන් කුසලද වන්නේය. **සියා අකුසලං** යනු තෘෂ්ණාව හැර සෙසු අකුසල් වශයෙන්, **සියා අබ්‍යාකතං** යනු කාමාවචර රූපාවචර, අරූපාවචර විපාක, ක්‍රියාවන්ගේද, රූපයන්ගේද වශයෙන්, **සියා තීණි සච්චානි** ආදීන්හි **සංගහීතානි** යනු ගණනා ලදහු, **වත්ථුවසෙන** යනු අකුසල, කුසල, අව්‍යාකෘත, දුක්ඛ, සමුදය, නිරොධ, මාර්ග සංඛ්‍යාත වස්තු වශයෙන්, **යං දුක්ඛ සච්චං අකුසල** යනු තෘෂ්ණාව හැර සෙසු අකුසල්. **අකුසලට්ඨෙන ද්වෙ සච්චානි එක සච්චෙන සංගහීතානි** යනු මෙම දුක්ඛ, සමුදය යන ද්වි සත්‍යයෝ අකුසලාර්ථයෙන් එක් සත්‍යයෙකින් ගණනා ලදහ. අකුසල සත්‍යනම්

වේයයි අර්ථයි. **එකසච්චං ද්වීහි සච්චෙහි සංගහිතං** යනු එක් අකුසල සත්‍යයක්, දුක්ඛ සමුදය යන සත්‍යය දෙකෙකින් ගණනා ලදී. **යං දුක්ඛ සච්චං කුසලං** යනු ත්‍රෛභූමක කුසලයයි. මෙම දුක්ඛ, මාර්ග යන ද්වි සත්‍යයන් කුසලාර්ථයෙන් එක් සත්‍යයෙකින් ගණනා ලද්දේ කුසල සත්‍යය නම් වේ. එක් කුසල සත්‍යය දුක්ඛ, මාර්ග යන ද්වි සත්‍යයන්හි ගණනා ලදී. **යං දුක්ඛ සච්චං අබ්‍යාකතං** යනු ත්‍රෛභූමික විපාක ක්‍රියා හා රූපයද වේ. මෙම දුක්ඛ නිරෝධ යන ද්වි සත්‍යයෝ අව්‍යාකෘත්‍යාර්ථයෙන් එක් සත්‍යයෙකින් ගණනා ලදහ. එක් අව්‍යාකෘත සත්‍යයකි. දුක්ඛ, නිරෝධ යන ද්වි සත්‍යයන්හි ගණනා ලදී. **තීනි සච්චානි එක සච්චෙන සංගහීතානි** යනු සමුදය, මාර්ග, නිරොධ යන සත්‍යයෝ එක් අකුසල, කුසල, අව්‍යාකෘත ස්වභාව වූ දුක්ඛ සත්‍යයෙහි ගණනා ලදහ. **එකං සච්චං තීහි සච්චෙහි සංගහිතං** යනු එක් දුක්ඛ සත්‍යය වෙන්ව අකුසල, කුසල, අව්‍යාකෘත ස්වභාව වූ සමුදය, මාර්ග, නිරෝධ සත්‍යයකින් ගණනා ලදද වේ. සමහරු වනාහි දුක්ඛ, සමුදය, සත්‍ය අකුසලාර්ථයෙන් එක් සත්‍යයෙකින් ගණනා ලදැයිද දුක්ඛ, මාර්ග සත්‍යයන් කුසලාර්ථයෙන් මාර්ග සත්‍යයෙන් ගණනා ලදැයිද දර්ශනාර්ථයෙන් නොවේයයිද වේ. දුක්ඛ, නිරෝධ සත්‍යයන් අව්‍යාකෘතාර්ථයෙන් නිරෝධ සත්‍යයෙන් ගණනා ලදැයිද අසංඛතාර්ථයෙන් නොවේයයිද වර්ණනා කරති.

නැවත අන්‍ය සූත්‍රාන්තයක්හුගේ අර්ථ වශයෙන් සත්‍ය ප්‍රතිවේධය නිර්දේශ කරනු කැමැතියේ, **පුබ්බෙ මෙ භික්ඛවෙ** ආදිකොට ඇති සූත්‍රාන්තය ගෙනහැර දැක්වූ, එහි **පුබ්බෙ මෙ භික්ඛවෙ සම්බොධා** යනු මහණෙනි, මාගේ සම්බෝධියෙන් සර්වඥතා ඥානයෙන් පූර්වයෙහි, **අනභි සම්බුද්ධස්ස** සියලු ධර්මයන් ප්‍රතිවේධ නොකළ, **බොධිසත්තස්සෙව සතො** යනු බෝධි සත්ත්වයෙකු වූයේම, **එතදහොසි** යනු බෝධිපර්යංකයෙහි හුන්නා වූ මට මෙබඳු සිතිවිල්ලක් වූයේය. **අස්සාදො** යනු රසවිඳීනුයි ආස්වාදයි. **ආදීනවො** යනු දෝෂයයි. **නිස්සරණං** යනු ඉවත්වීමයි. **සුඛං** යනු සුවපත් වේනුයි සුඛංයි, යමෙකුට එය උපදීද ඔහු සුවපත් කෙරේයයි අර්ථයි. **සොමනස්සං** යනු ප්‍රීතිය හා සතුට යෙදීමෙන් සුන්දර වූ මනසක් වන්නේනුයි සුමනොයි, සුන්දර වූ මනසෙහි ස්වභාවය සොමනස්සංයි, සුවයම ප්‍රීති යෝගයෙන් විශේෂයෙන් දක්වයි. **අනිච්චං** යනු ස්ථිර නොවේ. **දුක්ඛං** යනු දුකට හේතු හෙයින්ද, සංස්කාරයන්ගේ දුක්ඛතාව බැවින්ද දුක්ය. **විපරිණාමධම්මං** යනු සිය වශයෙහි නොපැවැත, දිරීමෙන් විනාශයට යාම් වශයෙන් පෙරළීම් ස්වභාවකොට ඇත්තේය. එයින් අනාත්ම ස්වභාවය යූ.සේයි. **ඡන්දරාග**

විනයො යනු ඡන්ද සංඛ්‍යාත රාගයෙහි වැළැක්වීම වර්ණ රාගයෙහි නොවේ. **ඡන්දරාගප්පහානං** යනු එම ඡන්ද රාගයෙහිම දුරැලීමයි. **යාව කීවඤ්ච** ආදීන්හි මෙම පඤ්චවාපාදානස්කන්ධයන්ගේ යම්පමණ -පෙ- **යථාභූතං නාබ්භඤ්ඤාසිං** යනු අධික වූ ඤාණයෙන් ප්‍රතිවේධ නොකෙළෙම්ද එතෙක් **අනුත්තරං සම්මා සම්බොධිං** යනු අනුත්තර සර්වඥභාවය, **අභිසම්බුද්ධො** අවබෝධ කළ රහත්හු වෙමියි **නෙවාහං පටිඤ්ඤාසිං** පිළිණ නොමැ කළෙමියි සම්බන්ධතා වශයෙන් අර්ථයි. **කීවඤ්ච** යනු නිපාත මාත්‍රයයි. **යතො** යනු යම්හෙයකින් හෝ යම්කලෙකැ. **අථ** යනු අනතුරුව, **ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි** යනු දර්ශන කෘත්‍ය කරණයෙන් දර්ශන සංඛ්‍යාත ප්‍රත්‍යවේක්‍ෂා ඤාණයද මට උපනි. **අකුප්පා** යනු වෙනස් කරන්ට, සොලවන්ට නොහැකි වන්නේය. **විමුත්ති** යනු අර්හත ඵල විමුක්තියයි. එම ඵල ප්‍රත්‍යවේක්‍ෂණයෙන්, මාර්ග නිර්වාණ ප්‍රත්‍යවේක්‍ෂණද යූසේයි. **අය මන්තිමා ජාති** යනු මෙය අවසන් ස්කන්ධ ප්‍රවෘත්තියයි. **නත්ථිදානි පුනබ්භවො** යනු දැන් නැවැත ඉපැත්මක් නොමැත. ඉන් ප්‍රහීණ කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂණය යූ.සේයි. රහත්හට ඉතිරි කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂණ නොවේ.

සත්‍ය ප්‍රතිවේධ ඤාණ යෝජනා ක්‍රමයෙහිද, **අයං රූපස්ස අස්සාදොති පහාණ පටිවෙධො** යනු පූර්වභාගයෙහි තෘෂ්ණා සම්ප්‍රයුක්ත රූපයෙහි අස්වාද යැයි දැන, මාර්ගක්‍ෂණයෙහි සමුදය ප්‍රහාණ සංඛ්‍යාත සමුදය සත්‍ය ප්‍රතිවේධය, **සමුදය සච්චං** යනු සමුදය සත්‍ය ප්‍රතිවේධ ඤාණය, ආර්ය සත්‍යාර්ම්මණ ඤාණයද, 'යම්කිසි කුසල්දම් කෙණෙක් වෙත්ද, ඒ සියල්ල සිව් අරි සස්හි සංග්‍රහයට යෙත් යනාදීන්හි මෙන් සත්‍යයයි යූ.සේයි. **අයං රූපස්ස ආදීනවොති පරිඤ්ඤා පටිවෙධො** යනු පූර්වභාගයෙහි මේ රූපයෙහි ආදීනවයැයි දැන, මාර්ග ක්‍ෂණයෙහි, දුක විශේෂයෙන් දැනීම් සංඛ්‍යාත, දුක්ඛ සත්‍යය ප්‍රතිවේධයයි, **දුක්ඛ සච්චං** යනු දුක්ඛ සත්‍යය ප්‍රතිවේධ ඤාණයයි. **ඉදං රූපස්ස නිස්සරණන්ති සච්ඡිකිරියා පටිවෙධො** යනු පූර්වභාගයෙහි මේ රූපයෙහි නිදහස්වීම යැයි දැන, මාර්ගක්‍ෂණයෙහි, නිරෝධය සාක්‍ෂාත් කිරීම් සංඛ්‍යාත නිරෝධ සත්‍ය ප්‍රතිවේධයයි, **නිරොධ සච්චං** යනු නිරෝධ සත්‍යාරම්මණී වූ, නිරෝධ සත්‍ය ප්‍රතිවේධ ඤාණයයි. **යා ඉමෙසු තීසු ඨානෙසු** යනු මෙම කියන ලද ආකාර ඇති දුක්ඛ, සමුදය, නිරෝධ යන ත්‍රයයෙහි, ප්‍රතිවේධ වශයෙන් පැවැති යම් දෘෂ්ටියක් යම සංකල්පයක්දැයි යා **දිට්ඨි** යො **සංකප්පොයි** යෙදීමය. **භාවනා පටිවෙධො** යනු මේ මාර්ග භාවනා සංඛ්‍යාත මාර්ග සත්‍යය ප්‍රතිවේධයයි, **මග්ග සච්චං** යනු මාර්ග සත්‍ය ප්‍රතිවේධ ඤාණයයි.

නැවත වෙනත් ක්‍රමයකින්, සත්‍යයන්ද, සත්‍යප්‍රතිවේධයද, දක්වනුයේ, **සචචනති කතිහාකාරෙහි සචචං** යනාදිය වදාළහ. එහි සියලු සර්වඥ බෝසත්වරු, බෝධි පර්යංකයෙහි වැඩහුන්නාහු, ජරාමරණාදී වූ දුක්ඛ සත්‍යයට, ජාති ආදී වූ සමුදය කවරනම් හේතුවකින් හටගනිත්දැයි සොයති. එසේ සොයන්නාහු ජරා මරණාදී දුක්ඛ සත්‍යයට, ජාති ආදී වූ, සමුදය සත්‍යය ප්‍රත්‍යය වේයයි තීරණය කරන්නාහු පරිග්‍රහණය කරති. එහෙයින් එම සෙවීමද, එම පරිග්‍රහණයද සත්‍යයන්ගේ සෙවීම හෙයින්ද, පරිග්‍රහණය හෙයින්ද, සත්‍යයයි නිගමනය කොට **එසනටෙඨන පරිගගහටෙඨන** යයි යූසේයි. මෙම ක්‍රමය පසේබුදුවරුන්ටද ප්‍රත්‍යය පරිග්‍රහණයෙහි ලැබේමය. ශ්‍රාවකයින්ට වනාහි ශ්‍රවණය කිරීම් වශයෙන් ප්‍රත්‍යය පරිග්‍රහණය ලැබේ. **පටිවෙධටෙඨන** යනු පූර්වභාගයෙහි, එසේ සොයන ලද්දා වූ හා පරිගෘහිතයෝද, මාර්ගක්‍ෂණයෙහි එක් ප්‍රතිවේධාර්ථයෙන්, **කිනනිදානං** යන ආදීන්හි නිදානාදීන් සියලු කාරණයන්ට පර්යාය වචනයි. යම්හෙයකින් ඵලය ගෙනදේද එය හේතුවයි. එහෙයින් එය ගනිවු යයි අර්පණය කරවන්නාක් මෙනි. එහෙයින් නිදානයයි යූසේයි. යම්හෙයකින් ඵලය ඉන් උදාවේද? හටගනීද? ප්‍රභව වේද? එහෙයින් සමුදය ජාති ප්‍රභවයැයි යූසේයි. මේ වනාහි මෙහි අර්ථයි. එයට කුමක් නිදාන වූයේදැයි **කිනනිදානං**යි එයට කුමක් සමුදයදැයි **කිං සමුදයං** යි එයට කවර හටගැනීමක් දැයි **කිං ජාතිකං**යි. එයට කවර ප්‍රභවයක්දැයි **කිමපභවං**යි එය හටගැන්මට, කියන ලද අර්ථයෙන්, නිදානයද, සමුදයද, ජාතියද ප්‍රභවයද වේ. එහෙයින් ජාති නිදානයයි ආදිය වදාළහ. **ජරා මරණං** යනු දුක්ඛ සත්‍යයයි. **ජරා මරණ සමුදයං** යනු එයට ප්‍රත්‍යය වූයේ සමුදය සත්‍යයයි. **ජරා මරණ නිරොධං** යනු නිරොධ සත්‍යයයි. **ජරා මරණ නිරොධ ගාමිණි පටිපදං** යනු මාර්ග සත්‍යයයි. මෙම ක්‍රමයෙන්ම සියලු පදයන්හි අර්ථය දතයුතුය.

**නිරොධ පජානනා** යනු අරමුණු කිරීමෙන් නිරෝධයෙහි දැනීම, **ජාති සියා දුකඛසචචං සියා සමුදය සචචං** යනු භව ප්‍රත්‍යයෙන් පැහැදිලි වන අර්ථයෙන්, දුක්ඛ සත්‍යය ජරා මරණයට ප්‍රත්‍යාර්ථයෙන් සමුදය සත්‍යයයි, සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**අවිජජා සියා දුකඛ සචචං** යනු ආශ්‍රව සමුදයෙන් අවිද්‍යා සමුදය සමුදයාර්ථයෙනි.

සත්‍යකථා වර්ණනාව නිමි.

සත්‍ය ප්‍රතිවේධ සිදුකරන, බෝධ්‍යංග විශේෂය දක්වන්නහු විසින් දේශිත, සූත්‍රාන්ත පූර්වංගම බෝධ්‍යංග කථායෙහි පෙර නුවූ අර්ථ අනු වර්ණනාවයි. එහි සූත්‍රාන්තයෙහි **බොජ්ඣංගා** යනු බෝධියගේ හෝ බෝධියට අංගනුයි බොජ්ඣංග යයි යූසේයි. යම් මේ ධර්ම සාමාග්‍රියෙන්, ලෝකෝත්තර මාර්ගක්‍ෂණයෙහි උපදින මැළි හා නොසන්සුන් පිහිටීම්, කර්ම රැස්කිරීම්, කාමසුඛල්ලිකානුයෝග, ආත්මය වෙහෙසට පත්කරන යෝග, උච්ඡේද, ශාස්වත අභිනිවේසාදී නොයෙක් උපද්‍රවයන්ට ප්‍රතිපක්‍ෂ වූ, සති, ධම්මවිචය, වීර්ය, ප්‍රීති, පස්සද්ධි, උපේක්‍ෂා සංඛ්‍යාත ධර්ම සාමාග්‍රිය තුළින් ආර්යශ්‍රාවක තෙමේ අවබෝධ කෙරේනුයි සලකා බෝධියැයි යූ.සේයි. අවබෝධ කෙරේ කෙලෙස් චිත්ත පරම්පරා නිද්‍රාවෙන් නැගිටියි. චතුරාර්ය සත්‍යයන් ප්‍රතිවේධ කරයි. නිර්වාණයම හෝ සාක්‍ෂාත් කෙරේයයි යූ.සේයි. දෙසූ පරිදි 'සප්ත බොධ්‍යංගයන් වඩා අනුත්තර සම්‍යක් සම්බෝධිය මනාව අවබෝධ කළෙමි'. එහෙයින් ධර්ම සාමග්‍රී සංඛ්‍යාත බෝධියගේ අංගයෝනුයි බොජ්ඣංගායි. ධ්‍යානාංග, මාර්ගාංගාදීහු මෙනි. යමෙක් වනාහි මෙම කියන ලද, ආකාරයට අනුව එම ධර්ම සාමග්‍රියෙන් අවබෝධ කකරේනුයි සලකා ආර්යශ්‍රාවක තෙමේ 'බෝධි'යයි යූ.සේයි. එම බෝධියට අංගනුයි බොජ්ඣංගායි, සේනාංග-රථාංග ආදිය මෙනි. එහෙයින් අටුවාචාර්යයෝ කීහු, 'අවබෝධ කරන්නා වූ පුද්ගලයාගේ අංගයෝනුයි බොජ්ඣංගායි. සති සම්බොධ්‍යංගාදීන්ගේ අර්ථ අභිඥෙය්‍ය නිර්දේශයෙහි යූ.සේයි.

බොජ්ඣංගත්ථ නිර්දේශයෙහි, **බොධාය සංවත්තනති** යනු අවබෝධය පිණිස පවතිත්. කවරක්හුගේ අවබෝධය පිණිසද, මාර්ගඵල සහිත නිර්වාණයෙහි ප්‍රත්‍යවේක්‍ෂණය සඳහා කරන ලද, කෘත්‍යයාගේ අවබෝධය සඳහා, මාර්ගයෙන් හෝ කෙලෙස් නිද්‍රාවෙන් පිබිදීම සඳහා ඵලයෙන් ප්‍රබුද්ධ භාවය සඳහායි යූ.සේයි. බලවත් විදර්ශනාවගේද බොධ්‍යංග අවබෝධය සඳහා පවතිත්, එහෙයින් මේ විදර්ශනා, මාර්ග, ඵල, බොධ්‍යංගයන්ගේ සාධාරණාර්ථයයි. ස්ථානත්‍රයයෙහිම ඒ ඒ කරුණු අවබෝධයෘසඳහා නිර්වාණ ප්‍රතිවේධය සඳහා පවතිත්. එයින් බෝධියගේ අංගනුයි බොධ්‍යංග යයි යූ.සේයි. **බුජ්ඣනතීති බොජ්ඣංගා** යන ආදී පංච චතුෂ්කයන්හි කියන ලද බොධ්‍යංගයන්ගේ උත්පත්ති ස්ථානය අභිඥෙය්‍ය නිර්දේශ කෘත්‍ය කරණයෙහි සමර්ථතාව දැක්වීම සඳහා කර්තෘ නිර්දේශයයි.

**බුජ්ඣනට්ඨෙන** යනු ස්වකෘත්‍ය කරණයෙහි, සමර්ථතාව ඇති කල්හිද, කර්තෘගේ අභාවය දැක්වීම සඳහා භාව නිර්දේශයයි. **බොධෙනති** යනු බොධ්‍යංග භාවනාවෙහි අවබෝධ කරන්නා වූ යෝගීන්ට ප්‍රයෝජනවත් හෙයින් බොධ්‍යංගයන්ගේ හේතු කර්තෘ නිර්දේශයයි. **බොධනට්ඨෙනං** යනු පළමු කියන ලද ක්‍රමයෙන්ම ප්‍රයෝජක හේතු කර්තෘහුගේ භාව නිර්දේශයයි. ඒවායින්ද, බෝධියගේ අංගනුයි බොජ්ඣංගයයි යුසේයි.

**බොධිපක්ඛියට්ඨෙන** යනු අවබෝධ කිරීම් අර්ථයෙන්, බෝධයයි ලද නම් ඇති යෝගියාගේ පක්ෂයෙහි වූ හෙයින්, මෙය එම යෝගියාට උපකාරකත්ව නිර්දේශයයි. එයින් බෝධියගේ අංගනුයි බොජ්ඣංගයයි යු.සේයි. **බුදධිලභනට්ඨෙන** යනාදී ෂට්කයෙහි **බුදධිලභනට්ඨෙන** යනු යෝගාවචරයා විසින් බුද්ධියට පැමිණීම් අර්ථයෙන්, **රොපනට්ඨෙන** යනු සත්ත්වයින්ගේ ප්‍රතිෂ්ඨාපනාර්ථයෙන්, මෙම විදර්ශනා බොධ්‍යංග, පති, අභි, සං යන උපසර්ගත්‍රයයෙන් විශේෂණ කරන ලද්දාහු මාර්ග ඵල බොධ්‍යංගයයි කියති. සියලුම ධර්ම ව්‍යවහාරයෙන් නිර්දිෂ්ට බොධ්‍යංගයන්ගේ බෝධියෙහි අංගනුයි බොධ්‍යංගයැයි යුසේයි.

**මූලට්ඨෙන** යනාදියෙහි මූලික වූ දශකයෙහි, **මූලට්ඨෙන** යනු විදර්ශකාදීන්හි පළමු පළමු බොධ්‍යංග, පශ්චිම පශ්චිම බොධ්‍යංගයන්ටද, සහජාත ධර්මයන්ටද, ඔවුනොවුන්ටද මූලාර්ථයෙන්, **මූලචරියට්ඨෙන** යනු මුල්වැ චර්යා පැවැත්ම මූලචර්යායි. එම මූලචර්යාර්ථයෙන් මුල්වැ පවත්නා අර්ථයෙන් යැයි අර්ථයි. **මූලපරිග්ගහට්ඨෙන** යනු එම බොධ්‍යංගයෝම මූල සිට ඉපදවීම සඳහා අල්ලා ගනු ලබන හෙයින් පරිග්ගහායි. මුල් වූම පරිග්‍රහ-මූල පරිග්‍රහයි. එම මූල පරිග්‍රහාර්ථයෙන්, ඒවාම ඔවුනොවුන්ටද පරිවාර වශයෙන් **පරිවාරට්ඨෙනයි**. භාවනා පරිපූරාර්ථයෙන් **පරිපූරණට්ඨෙනයි**. නිෂ්ඨාවට පැමිණීම් වශයෙන්, පරිපාකාර්ථයෙන්, **පරිපාකට්ඨෙනයි**. එම මූලයෝම සවැදෑරුම් ප්‍රභේද වශයෙන් බිඳුණු හෙයින් ප්‍රතිසම්භිදාවනුයි මූල ප්‍රතිසම්භිදායි. එම මූල ප්‍රතිසම්භිදා අර්ථයෙන්, **මූලපටිසම්භිදට්ඨෙන;**

**මූල පටිසම්භිදාපාපනට්ඨෙන** යනු බොධ්‍යංග භාවනායෙහි අනුයුක්ත යෝගියාට එය මූලික ප්‍රතිසම්භිදාවට පැමිණවීම් අර්ථයෙන්, එම යෝගියාටම එම මූල ප්‍රතිසම්භිදාවෙහි (වසීභාවට්ඨෙන) වසී භාවාර්ථයෙන්. සෙසු මෙබඳු පුද්ගල ව්‍යවහාරයන්හි බොධියගේ අංගනුයි

බෝධ්‍යංගයයි යු.සේයි. **මූලපටිසම්භිදාය වසී භාවප්පත්තානම්පි** යනු මෙබඳු වූ නිෂ්ඨා වචනයන්හි ඵල බොධ්‍යංගයයි දතයුතුය. **වසභාවප්පත්තානංයිද** පාඨයි.

## මූල මූලක දශකය නිමි.

සෙසු හේතු මූලකාදී නව දශකයන්හි, මෙම ක්‍රමයෙන්ම සාධාරණ වචනයන්ගේ අර්ථය දතයුතුය. අසාධාරණයන්හි වනාහි, කියන ලද ආකාර වූම, බොධ්‍යංග කියන ලද ආකාර ධර්මයන්ගේ ඉපදවීම් කරන හෙයින් හේතු නම් වෙයි. උපස්තම්භක හෙයින් **පච්චයා** ප්‍රත්‍යය නමැ. එව්ාම තදංග, සමුච්ඡේද, පටිප්පසසද්ධි යන කෙලෙස් ප්‍රහාණයන්ගෙන් පිරිසිදු හෙයින් **විසුද්ධි** නමැ. දෝෂ විරහිත හෙයින් **අනවජ්ජා** නමැ. සියලුම කුසල්දම් නෛෂ්ක්‍රම්‍යයයි කීමෙන් **නෙක්ඛම්මං** නමැ. කෙලෙසුන්ගෙන් මිදුණු හෙයින් **විමුත්ති** නමැ. මාර්ගඵල බොධ්‍යංගයන්ට විෂය වූ ආශ්‍රවයන්ගෙන් විරහිත හෙයින් **අනාසවායි.** තෙවැදෑරුම් වූද බොධ්‍යංග කෙලෙසුන්ගෙන් ශූන්‍ය හෙයින්, තදංග විවේකාදී වශයෙන් විවෙකායි. විදර්ශනාමාර්ග බොධ්‍යංග පරිත්‍යාග වොසසග්ග හෙයින්ද, පක්ඛන්දන වොසසග්ග හෙයින් **වොසසග්ගායි. මූලට්ඨං බුජ්ඣන්ති** යනාදීහු එක් එක් පද වශයෙන් නිර්දිෂ්ටයහ. නව දශකයන් කියන ලද අයුරින්ම දතයුත්තාහ. **වසීභාවප්පත්තානං** යන පදය වනාහි වර්තමාන වචන අභාවයෙන් නොයොදන ලදී. පරිග්‍රහර්ථාදීහු අභිඤෙඤය්‍ය නිර්දේශයෙහි කියන ලද අර්ථමය.

තෙරහු තමන් විසින් දේශිත සූත්‍රාන්තය කෙටියෙන් දක්වා විස්තර වශයෙන් බොධ්‍යංග විධිය දක්වනු කැමැත්තාහු, **එකං සමයං** ආදී වූ නිදානය ප්‍රකාශකොට පළමුව සූත්‍රාන්තය කෙටියෙන් දැක්වූහ. මෙහි තමන් විසින් දේශිත සූත්‍රයක් හෙයින් **එවං මෙ සුතං** ආදිය නොයුසේයි. **ආයසමා සාරිපුත්තො** යන මෙහි වනාහි දෙශක දක්ෂභාවය සඳහා තෙමේ අනෙකා මෙන් කොට යුසේයි. මෙබඳු වචන ලෝකයෙහි ග්‍රන්ථයන්හි බොහෝ සේ යෙදේ. **පුබ්බණ්හසමයං** සියලු පූර්වාහ්න සමය, අත්‍යන්ත සංයෝගාර්ථයෙහි ද්විතියා වචනයි. සෙසු ද්වයයෙහිද එම ක්‍රමයමැයි. **සති සම්බොජ්ඣංගො ඉති** චෙ මෙ **හොති** යනු ස්මෘති සම්බොධ්‍යංග යැයි මෙසේත් මට සිත් වේ. **සුසමාරද්ධො මෙහොති** යනු මොනවට

පරිපූර්ණයැයි මෙසේත් මට සිත් වේ. තිට්ඨනතං යනු නිර්වාණා රම්මණයෙහි පැවතීම් වශයෙන් සිටිනුයේ, චවති යනු නිවන් අරමුණින් පහවැයේ. සෙසු බොධ්‍යංගයන්හිද එම ක්‍රමයමැයි.

**රාජ මහා මත්තසස** යනු රජෙකුට හෝ මහ ඇමැතියෙකු හට, ප්‍රමාණාතික්‍රාන්ත මහත් වූ භෝග සම්පත්තීන්ගෙන් යුක්ත වූයේ. **නානා රත්තානං** යනු නොයෙක් වර්ණවලින් වර්ණ කැවූ, පූරණාර්ථයෙහි ෂෂ්ඨී වචනයි, නොයෙක් සායම්වලින් යන අර්ථයි. **දුසසකරණ්ඩකො** යනු වස්ත්‍ර බහාලන පෙට්ටිය, **දුසසයුගං** යනු වස්ත්‍ර යුගලය, **පාරුපිතුං** යනු පොරෝනට, මෙම සූත්‍රාන්තයෙහි තෙරුන්ගේ ඵල බොජ්ඣංගය කියන ලදී. යම්කලෙකැ තෙරහු ස්මෘති සම්බොධ්‍යංගය ශීර්ෂකොට ඵල සමවතට සමවදිත්ද? එකල්හි අනෙක් ද්වයය ඒ අනුගත වූවාහු වෙති. මෙසේ ඵල සමවතෙහි තම පුරුදු කළ වසීභාවය පෙන්වන්නා වූ තෙරහු මෙම සූත්‍රාන්තය වදාළහ.

**කථං සති සම්බොජ්ඣංගො ඉති චෙ හොති** යනු බොධ්‍යංගයැයි ස්මෘති සම්බොධ්‍යංගය ශීර්ෂකොට ඵල සමවතට සමවදින්නහුට, අනෙක් බොධ්‍යංගයන් විද්‍යමාන කල්හි, මෙසේ ස්මෘති සම්බොධ්‍යංගය වේයැයි මෙසේ පැවැතියා වූ කෙසේ එම ස්මෘති සම්බොධ්‍යංගය වේදැයි අර්ථයි. **යාවතා නිරොධූපට්ඨාති** යනු යම්තාක් කලකින් නිරෝධය වැටහේද? යම්පමණ කලෙකින් අරමුණු කිරීම් වශයෙන් නිර්වාණය වැටහේදැයි අර්ථයි. **යාවතා අච්චි** යනු යම්තාක් ප්‍රමාණයකින් සිළුව වේද?

**කථං අප්පමාණො ඉති චෙ හොති** යනු බොධ්‍යංගයැයි අප්‍රමාණ නුවූයේද, ස්මෘති සම්බොධ්‍යංගය විද්‍යමාන කල්හි, මෙසේ මේය අප්‍රමාණ වේයැයි, මෙසෙ පැවැතියා වූ එම අප්‍රමාණ ස්මෘති සම්බොධ්‍යංගය කෙසේ වේදැයි අර්ථයි. **පමාණබන්ධා** යනු අනුසය සහගත කෙලෙස්ද, මැඩගෙන නැඟී සිටින කෙලෙස්ද පුනර්භවය ඇතිකරන සුලු යම් සංස්කාර කෙනෙක් වෙත්ද, ඒවා පමාණ බද්ධ නම් වෙති. රාගය ප්‍රමාණ කරණයි, ද්වේෂය ප්‍රමාණකරණයි. මෝහය ප්‍රමාණ කරණයි, යන වචනයෙන් රාගාදීහු යමෙකුට උපදිත්ද? මේ මෙතෙකැයි එහි ප්‍රමාණ කරන හෙයින් ප්‍රමාණ නමැ. එම ප්‍රමාණයෙහි බැඳුණහු මනාව බැඳුණාහු, අයත් වූයේනුයි ක්ලේශාදීහු ප්‍රමාණ බන්ධා නම් වෙති. **කිලෙසා** යනු අනුසය සහගත වූ, **පරියුට්ඨානානි** යනු සමුදාචාර ප්‍රාප්ත කෙලෙස්, **සංඛාරා පො නො**

භවිකා යනු නැවත නැවත ඉපැත්ම කරනුයේ පුනර්භවයි. පුනර්භවය ඇතිකරන ස්වභාවය ඔවුන්ටනුයි පොනබ්භවිකායි, පොනබ්භවිකයම පොනොභවිකායි, කුසල් අකුසල් කර්ම සංඛ්‍යාත සංස්කාරයි, **අප්පමාණො** යනු කියන ලද ආකාර ඇති ප්‍රමාණයෙහි අභාවයෙන් ප්‍රමාණ රහිත වූයේ, මාර්ග ඵලයන්ගේද, අප්‍රමාණ හෙයින් එහි විශේෂතා වශයෙන් දැක්වීමට අචලට්ඨෙන, අසංඛතට්ඨෙන යයි යූසේයි. භංග අභාවයෙන් අචලයි, ප්‍රත්‍යය අභාවයෙන් අසංඛතයි, යමක් වනාහි අචලද, අසංඛතද, එය අතිශයින් ප්‍රමාණ විරහිත වූයේ වේ.

**කථං සුසමාරද්ධො ඉති ච හොතීති බොජ්ඣංගො** යනු අනතුරුව කියන ලද ක්‍රමයෙන් යෙදිය යුතුය. **විසමා** යනු තෙමේද විෂම හෙයින්, විෂම ස්වභාවයට හේතුවන හෙයින්ද විසමායි. **සම ධම්මා** යනු ශාන්තාර්ථයෙන්, ප්‍රණීතාර්ථයෙන් සමවූ ධර්මය, ප්‍රමාණ අභාවයෙන් ශාන්ත වූයේ, 'මහණෙනි, යම් පමණ සංඛත හෝ අසංඛත ධර්ම කෙනෙක් වෙත්ද? එම ධර්මයන් අතර විරාගය අග්‍රයැයි කියනු ලැබේයයි යන කීමෙන් සියලු ධර්මයන් අතර උතුම් අර්ථයෙන් ප්‍රණීත වූයේ **පණීතොයි** එම සම ධර්මයන්හි කී කල්හි සුසමයෙහි අරඹන ලදුයේ **සුසමාරද්ධායි.**

**ආවජ්ජිතත්තා** යනු ඵල සමවතෙහි පැවැති කාලය සඳහා යූසේයි. අනුත්පාදාදී සංඛ්‍යාත නිර්වාණයෙහි, මනෝද්වාරා වර්ජනයෙහි උපන් හෙයිනැයි යූ.සේයි. **තිට්ඨති** යනු පවතියි. උත්පාදාදිය යට කියන ලද අර්ථමය. සෙසු බොධ්‍යංග මූලික වාරයන්හිද එම ක්‍රමයමැයි.

**බොධ්‍යංග කථා වර්ණනාව නිමි.**

බොධ්‍යංග කථානන්තරවැ, දේශිත, බොධ්‍යංගකථා සංකල්පයන්හි, සූත්‍රාන්ත පූර්වංගම මෛත්‍රී කථායෙහි පෙර නුවූ විරූ අර්ථ අනුවර්ණනාවයි. එහි සූත්‍රාන්තයෙහි **ආසෙවිතාය** යනු වඩනා ලද ආදරයෙන් සෙවුණා ලද, **භාවිතාය** යනු වඩනා ලද **බහුලීකතාය** යනු නැවත නැවත කරනා ලද, **යානිකතාය** යනු යුක්ත යානයක් මෙන් කළ (එන්ජින් පරීක්ෂාකොට, ටයර් හා ඔයිල්, බ්රේක් ආදිය නිසි අයුරින් පවත්නා) **වත්ථුකතාය** යනු ප්‍රතිෂ්ඨාර්ථයෙන් වස්තුවක් මෙන් කළ, **අනුට්ඨිතාය** යනු එළඹ සිටි කල්හි, **පරිචිතාය** යනු හාත්පසින් රැස්කළ,

**සුසමාරද්ධාය** යනු මොනොවට පටන්ගත් මොනොවට කළ, **ආනිසංසා** යනු අනුසස් (ගුණ) **පාටිකංඛා** බලාපොරොත්තු විය යුත්තාහ. කැමැති විය යුත්තාහ. **සුඛං සුපති** යනු සෙසු ජනතාව, පෙරළෙන්නාහු, ගොරවන්නාහු දුකසේ ශයනය කෙරෙත්ද? එසේ නොනිඳ සුවසේ නිදයි. නිද්‍රාවට අවතීර්ණ වනුයේ සමවතට සමවන්නාක් මෙන් වෙයි. **සුඛං පටිබුජ්ඣති** යනු අන්‍යයෝ කෙඳිරිගාන්නාහු, අත්පා දිගහැර ප්‍රාණවත් කරන්නාහු, පෙරළෙන්නාහු දුකසේ පිබිදෙති. එසේ නොපිබිද, විකසිත වන නෙළුම්මලක් මෙන්, වෙනස්වීම් රහිතව පිබිදේ. **නපාපකං සුපිනං පසසති** යනු සිහින දක්නේම යහපත් වූම චෛත්‍යය වන්දනා කරන්නාක් මෙන්, පූජාවක් කරන්නාක් මෙන්, ධර්මය අසන්නාක් මෙන් වූ සිහිනයක් දකියි. අන්‍යයෝ තමා සොරුන් විසින් වටකරන ලද්දාක් මෙන්ද, නපුරු සතුන්ගෙන් උවදුරට පත් වූවාක් මෙන්ද, ප්‍රපාතයට පතිත වන්නාක් මෙන් දකිත්. මෙසේ පාපී සිහින නොදකියි. **මනුසසානං පියො හොති** යනු ළයෙහි පැළැඳි මුතුහරක් මෙන්ද, හිස පළන් මල්දමක් මෙන්ද, මිනිසුනට ප්‍රියමනාප වේ. **අමනුසසානං පියොහොති** යනු යම්සේ මනුෂ්‍යයින්ටද අමනුෂ්‍යයින්ටද එසේම ප්‍රිය වේ. **දෙවතා රකඛනති** යනු මව්පියවරුන් සිය දරුවා මෙන් දේවතාවෝ රකිති. **නාසස අගගිවා විසංවා සත්‍ථංවා කමති** යනු මෛත්‍රී විහාරිහුගේ සිරුරෙහි ගිනි හෝ විස හෝ ආයුධ හෝ නොවැදගනී. නොපිවිසෙයි. ඔහුගෙ සිරුර කඩා කපා දැමීම්වලට බඳුන් නොවේ. **තුවටං චිතතං සමාධියති** යනු මෛත්‍රී විහාරිහුගේ සිත වහාම සමාධිගත වේ. එහි මන්දගාමී බවක් නොමැත. **මුඛවණෙණා විපපසීදති** යනු බන්ධනයෙන් මුක්ත, ඉදුණු තල්ගෙඩියක් මෙන්, ඔහුගේ මුහුණෙහි පැහැය සුපසන් වේ. **අසමමූළ්හො කාලං කරොති** යනු මෛත්‍රී විහාරීහුට මුළාසී මරණයක් නම් නොමැත. නොමුළාසීවැ නිද්‍රාවට බස්නාක් මෙන් කළුරිය කරයි. **උතතරිං අපපටි විජඣනෙතා** යනු මෛත්‍රී සමවතින් මතුයෙහි අර්හත්වය අවබෝධ කරන්ට, නොහැකි වනුයේ නම්, මෙයින් චුතව නිදා පිබිදියාක් මෙන්, **බ්‍රහම ලොකූපගො හොති** යනු බඹලොව උපදීයයි අර්ථයි.

මෛත්‍රී නිර්දේශයෙහි, **අනොධීසො ඵරණා** යනු සීමා මායිම් වශයෙන්, සීමාරහිත වූයේ අනොධියි. එම සීමා රහිත වශයෙන්, සීමා රහිතතායෙන් යයි අර්ථයි. ප්‍රදේශ රහිතතායෙන් ස්පර්ශ කිරීමයයි යූසේයි. **ඕධිසො** යනු ප්‍රදේශ වශයෙන් **දිසා ඵරණා** යනු දිසාවන්හි පැතිරීම්. **සබෙබ** යනු ප්‍රදේශ සේසරහිත ගැනීමයි. **සතතා** යන පදයෙහි අර්ථය

ඤාණ කථා මාතෘකා වර්ණනායෙහි යුසේයි. අධ්‍යාහාර ශබ්දයෙන් වීතරාගීන් කෙරෙහිද, මෙම ව්‍යවහාරය පවතී. උණ, බට පතුරුමුවා වූද, වටාපත් විශේෂයන්හි තල් නටු ව්‍යවහාරය මෙනි.

අවෙරා යනු වෛර රහිත වූවාහු, ස්වකීය සන්තානයෙහිද අනෙකා හේතුකොට අන්‍ය සන්තානයෙහිද වෛර අභාවය දක්වන ලදී. අබ්‍යාපජ්ඣා 'අබ්‍යාපජ්ඣ' ආදීන්හි වෛර අභාවයෙන් එය මූලිකකොට ඇති ව්‍යාපාද අභාවයයි, 'අනීඝා' යනු ව්‍යාපාද අභාවයෙන් එය මූලිකකොට ඇති දුකෙහි අභාවයෙන්, 'සුඛී අත්තානං පරිහරන්තු' යනු දුක් අභාවයෙන් සුවයෙන් ආත්මභාව පරිහරණය දක්වන ලදැයිද, මෙසේ මෙහි වචන සම්බන්ධය දතයුතුය. මේවාහිද 'අවෙරා හොන්තු' ආදී සිව් වචනයන්හි යමක් යමක් ප්‍රකට වේද, ඒ ඒ වශයෙන් මෛත්‍රියෙන් පතුරුවයි. 'පාණා' යන ප්‍රාණතායෙන් **පාණායි**. ආශ්වාස ප්‍රශ්වාසයන්ට අයත් පැවැත්මෙනැයි අර්ථයි. හටගත් හෙයින් **භූතායි**. මනාව හටගත්තාහුය. (උපන්නාහුයයි) අර්ථයි. නිරය පුං යයි යුසේයි. එහි ගිලිහෙති. යෙත්නුයි පුග්ගලායි. ශරීරය ආත්මභාවයයි යු.සේයි. ස්කන්ධ පංචකයම හෝ, එය දැඩිසේ ගෙන ප්‍රඥප්ති මාත්‍රය යෙදෙන හෙයින් එම ආත්ම භාවයට ඇතුළත් වූවාහු, වෙන්කළාහු, ඇතුළත් වූවාහුනුයි **අත්තභාව පරියාපන්නායි**. සත්ත්වයා යන වචනය යම්සේද, මෙසේ සෙසු වචනයන්ද, අධ්‍යාහාර වශයෙන්, ආරෝපණය කොට එම සියල්ලම සියලු සත්ත්වයින්ට පර්යාය වචනයෝ යැයි දතයුත්තාහ. පොදුවේ ගත්කල අනෙකුත් සියලු සත්ත්වයෝ සියලු ජීවිහු යනාදී සියලු සත්ත්ව පර්යාය වචන ඇත. ප්‍රකට වශයෙන් මෙම පංචකයම ගෙන පඤ්චාකාරයකින්, සීමාරහිතව පැතිරවීම මෛත්‍රී චෙතො විමුක්තිය යැයි යු.සේයි. යම් සත්ත්වයෝ, ප්‍රාණීහු ආදීන්ගේ හුදෙක් වචන මාත්‍ර වශයෙන්ම නොවේ. තවද අර්ථ වශයෙන්ද නානාප්‍රකාර බව කැමැති වන්නාහුය. ඒවාහි සීමාරහිතව මෛත්‍රී පැතිරවීම විරුද්ධ වේ. (නොගැළපේ) එහෙයින් එසේ අර්ථ නොගෙන මෙම පඤ්චාකාරයන්හි එක්තරා ආකාරයක් වශයෙන් සීමාරහිත මෛත්‍රිය පතුරුවයි.

සීමාකිරීම් සහිත පැතිරවීම්හි **ඉත්ථියො පුරිසා** යනු ලිංග වශයෙන් යුසේයි. **අරියා අනරියා** යනු ආර්ය, පෘථග්ජන වශයෙන්, **දෙවා මනුස්සා විනිපාතිකා** යනු උත්පත්ති වශයෙන් දිසා පැතිරවීම්හි, දිසා බෙදීමක් නොකොට සියලු දිසාවන්හි සියලු සත්ත්වයෝ ආදී ක්‍රමයෙන් පැතිරවීමෙන් සීමාරහිතව පැතිරවීම වේ. සියලු දිසාවන්හි සියලු ස්ත්‍රීහු යන ආදී

ක්‍රමයෙන් පැතිරවීමෙන්, සීමා සහිතව පැතිරවීමය. මෙම ත්‍රිවිධ වූ මෛත්‍රී පැතිරවීම අර්පණාප්‍රාප්ත චිත්තයාගේ වශයෙන් යු.සේයි. එහෙයින් ත්‍රිවිධ වාරයන්හි අර්පණාව ගතයුත්තාහ. සීමාරහිත පැතිරවීමෙහි 'සියලු සත්ත්වයෝ අවෛර වෙත්වායි' එකකි. ව්‍යාපාද රහිත වෙත්වායි එකකි. නිදුක් වූවාහු වෙත්වා යනු එකකි. සුවපත්ව ආත්මය පරිහරණය කෙරෙත්වා යනු එකකි. එම සතරම යහපත එළැවීම වශයෙන් යු.සේයි. මෛත්‍රිය හිතසුව එළැවීම් ලක්‍ෂණකොට ඇත්තේය. මෙසේ සත්ත්වයෝ ආදී පඤ්ච ආකාරයන්හි, සිව් අර්පණා වශයෙන් විසි අර්පණාවෝ වෙති. සීමාසහිත පැතිරවීම්හි 'සියලු ස්ත්‍රීහු' යන ආදී සත් ආකාරයන්හි සතර සතර බැගින් අටවිසි අර්පණාවෝ වෙති. දිසා පැතිරවීම්හි, සියලු පෙරදිග සත්ත්වයෝ යන ආදී ක්‍රමයෙන් එක් එක් දිසාවෙහි විස්ස විස්ස බැගින් ගෙන දෙසියයකි. 'සියලු පෙරදිග ස්ත්‍රීහු'යයි ආදී ක්‍රමයෙන් එක් එක් දිසාවෙහි විසිඅට විසිඅට බැගින් ගෙන, දෙසිය අසූවක්ද හාරසිය අසූවක්ද අර්පණාවෝ වෙති. මෙසේ මෙහි සඳහන් සියලුම පන්සිය විසිඅටක් අධිකකොට ඇති අර්පණාවෝ වෙති. යම්සේ මෛත්‍රියෙහි ත්‍රිවිධාකාරයෙන් පැතිරීම කියන ලදද? එසේම කරුණා, මුදිතා උපේක්‍ෂාවන්හි ද යුසේයි.

මෛත්‍රී චින්තාවන් එක්තැන් කරන ආකාරයද, ඉන්ද්‍රියයන්ගේ වැඩිදියුණු කිරීමද ගෙනහැර දක්වන්ට, 'හැම සතුන් පිළිබඳ පෙළීම දුරුකොට' ආදිය වදාළහ. එහි **පීළනං** යනු අභ්‍යන්තර වශයෙන් ශරීරය පීඩාවට පත්කිරීම, **උපඝාතං** යනු බාහිර වශයෙන් ශරීර හිංසා, **සන්තාපං** යනු යම් යම් ආකාර සිත් තැවුල්, **පරියාදානං** යනු ප්‍රකෘතියෙන් ජීවිතාදිය ක්‍ෂයවීම, **විහෙසං** යනු අන්‍යයා කෙරෙන් වන දිවි වෙහෙස, **වජ්ජෙත්වා** යනු පීඩාදීන්හි එකින් එක තමාගේ සිතින්ම හැරපියා, මෙම පීඩා ආදී පඤ්ච පදයන්, මෛත්‍රියගේ එක්තැන් කිරීමට ප්‍රතිපක්‍ෂ දුරුලීම් වශයෙන් යු.සේයි. **අපීළනාය** යන ආදීන් මෛත්‍රිය ගෙනහැර දැක්වීම් වශයෙනි. **අපීළනාය** යනු නොපෙළෙන ආකාරයෙන්, සියලු සත්ත්වයින් කෙරෙහි මෛත්‍රී කෙරේයයි සම්බන්ධයයි. සෙස්සෙහිද මෙසේමය. **මා වෙරිනො මා දුක්ඛිනො මා දුක්ඛිතත්තා** යන මෙම ත්‍රයය එක්තැන් කිරීමෙහි, ප්‍රතිපක්‍ෂතා, ප්‍රතික්‍ෂෙප වචනයෝය. මා වචනයාගේ නොවෙත්වායි අර්ථයි. **අවෙරිනො, සුඛිනො, සුඛිතත්තා** යන මෙම වචන මෛත්‍රිය එක්තැන් කරන වචනය.

**අබ්‍යාපජ්ඣා, අනීඝා** යන මෙම ද්වයය සුඛිනො යන වචනයෙන්

සංගෘහිතයැයි දතයුතුය. **සුඛිතත්තා** යනු එම සුවයෙහි නිතර පැවැත්ම දැක්වීමයි, 'සුඛිතත්තා' යනුද, 'සුඛී අත්තානං පරිහරන්තු' යනුද අර්ථ වශයෙන් එකකි. **අපීළනාය** යනාදීන්ගෙන් අබ්‍යාපජ්ඣ, අනීඝ යන වචනයන් සංගෘහිතයි, **අට්ඨහාකාරෙහි** යනු 'අපීළනාය' යන ආදී මෛත්‍රියය එක්තැන් කරන ආකාර පහද, 'අවෙරිනො හොන්තු' ආදී මෛත්‍රියය එක්තැන් කරන කරුණු ත්‍රයයද යන මෙම අෂ්ටාකාරයන්ගෙන්, **මෙත්තායති** යනු සිනිඳුවේ. **තං ධම්මං චෙතයති** එම හිතවත්භාවය එක්තැන් කිරීම ගැන සිතයි, එකමුතු කරයි. පවත්වයි යන අර්ථයි. **සබ්බ බ්‍යාපාද පරියුට්ඨානෙහි විමුච්චති** මෛත්‍රියයට ප්‍රතිපක්ෂ වූ, සියලු ව්‍යාපාද පැවැතීම් වලින් විෂ්කම්භන වශයෙන් මිදේ. මෛත්‍රියයද චෙතො විමුත්තියද යන එකම මෛත්‍රියය ත්‍රිවිධාකාරයෙන් වර්ණිතය. **අවෙරිනො ඛෙමිනො, සුඛිනො** යන මෙම තෙපදයන් පෙර කියන ලද ආකාරයන් සංක්‍ෂෙපයෙන් සංග්‍රහකොට යු.සේයි. **සද්ධාය, අධිමුච්චති** යනාදී ක්‍රමයෙන් කියන ලද පඤ්ච ඉන්ද්‍රියයෝ මෛත්‍රිය හා සම්ප්‍රයුක්ත වූවාහුමය.

ආසෙවනා යනාදීන්හි, ෂට් ද්වාරයන්හි ඒවා කරණකොට, මෛත්‍රිය සෙවුණේනුයි ආසෙවනායි. එසේ **භාවනා බහුලීකම්මං අලංකාරා** යනු සැරැසීමයි. **සවාලංකතා** යනු මනාව අලංකාර කරන ලද්දාහු සැරැසුණාහු. **පරික්ඛාරා** යනු රාශියයි. **සුපරික්ඛතා** යනු මනාව හටගත්තාහු, **පරිවාරා** යනු රක්ෂණාර්ථයෙන්.

නැවත ආසෙවනාදී අටවිසි පදයන් මෛත්‍රියෙහි ගුණ වර්ණනාව සඳහා යූසේයි. එහි **පාරිපූරී** යනු පරිපූර්ණ භාවයයි. **සහගතා** යනු මෛත්‍රිය සමග එකට යෙදුණාහු, එසේ **සහජාතාදයො පක්ඛන්දනා** යනු මෛත්‍රියට පිවිසීමයි. ඒවා කරණකොට මෛත්‍රියට පැනවදීනුයි හෝ පක්ඛන්දනායි, සංසීදනාදයො ද එසේය. **එතං සන්තන්ති එසසනා** යනු එම මෛත්‍රිය ශාන්තයැයි, ඒවාහි ස්පර්ශනය වේයයි එම මෛත්‍රී චිත්ත විමුක්තිය ශාන්තයැයි ස්පර්ශනයයි.

එතදග්ගං ආදීන්හි මෙන් නපුංසක ලිංගයි. **සවාධිට්ඨිතා** යනු මනාව පිහිටියාහු වෙති. **සුසමුග්ගතා** යනු මනාව එසවූ, **සුවිමුත්‍යා** යනු තම තමාගේ විරුද්ධතාවන්ගෙන් මනාව මිදුණාහු, **නිබ්බත්තෙන්ති** යනු මෛත්‍රී සම්ප්‍රයුක්තව මෛත්‍රියය උපදවති. **ජොතෙන්ති** යනු ප්‍රකට කෙරෙත්. **පකාසෙන්ති** යනු බබුළුවත්. ඉන්ද්‍රියවාරයෙහි කියන ලද ක්‍රමයෙන්ම

බලවාරයද දතයුතුය. බොධ්‍යංග මාර්ගාංග වාර පර්යායෙන් යුසේයි. ස්වභාව ලක්‍ෂණ වශයෙන් නොවේ. මාර්ගාංග වාරයෙහි සම්‍යක් වචන, කර්මාන්ත, ආජීවයන්, මෛත්‍රී අධි පූර්වභාග වශයෙන් යුසේයි. අර්පණා වශයෙන් නොවේ. ඒවා මෛත්‍රිය සමග නොවේ. **සබ්බෙසං පාණානං** යනාදීන්ගේ සෙසු වාරයන්ද, සත්වාරයෙහි කියන ලද ක්‍රමයෙන්ම අර්ථය දතයුතුය. මෛත්‍රී භාවනා විධානය විශුද්ධි මාර්ගයෙන් දතයුතුය.

## මෛත්‍රී කථා වර්ණනා නිමි.

දැන් මාර්ග ප්‍රයෝජන කෙළවර කොටැති, මෛත්‍රී කථාවට අනතුරුවැ දේශිත විරාග සංඛ්‍යාත මාර්ග පූර්වාංගම විරාග කථායෙහි පෙර නුවූ විරූ අර්ථ අනුවර්ණනාවයි. පළමුව **නිබ්බින්‍දං විරජ්ජති විරාගා විමුච්චති** යයි කියන ලද, ද්වි සූත්‍ර පදයන්ගේ අර්ථය නිර්දේශ කරනු කැමැත්තනු විසින් **විරාගො මග්ගො විමුත්ති ඵලං** යන උද්දේශය තබන ලදී. පළමුව වචනාර්ථය නිර්දේශ කරනු කැමැතියේ **කථං විරාගො මග්ගො** යන ආදිය වදාළහ. එහි **විරජ්ජති** යනු නොඇලුණේ වේ. සෙස්ස මාර්ග ඥාණ නිර්දේශයෙහි කියන ලද අර්ථමය. **විරාගො** යනු සම්‍යග් දෘෂ්ටිය නොඇලේ. එහෙයින් විරාග නමැයි අර්ථයි. එම විරාගය යම්හෙයකින් විරාගාරම්මණද, -පෙ- විරාගයෙහි පිහිටියේද, එහෙයින් විරාගයැයි මෙසේ විරාගාරම්මණයැයි ආදී පඤ්ච වචනයන්ගේ සම්බන්ධය දතයුතුය. එහි **විරාගාරම්මණො** යනු නිර්වාණාරම්මණ වූයේ, **විරාග ගොචරො** යනු නිර්වාණ විෂය වූයේ, ගොදුරුකොට ඇතියේ, **විරාගෙ සමුදාගතො** යනු නිවන් අරමුණෙහි උපන්නේය. **විරාගෙ ඨිතො** යනු නිවන්හි ප්‍රවෘත්ති වශයෙන් සිටියේය. **විරාගෙ පතිට්ඨිතො** යනු නොනවත්නා වශයෙන් නිවන්හි පිහිටියේය.

**නිබ්බාණඤ්ච විරාගො** යනු නිර්වාණයද විරාග හේතු හෙයින් විරාග නම් වේ. **නිබ්බාරම්මණතා ජාතා** යනු නිර්වාණාරම්මණයෙහි හටගත්, නිර්වාණාරම්මණ භාවයෙන් හෝ හටගත්, ඒ මාර්ග සම්ප්‍රයුක්ත සියලුම ස්පර්ශාදී ධර්ම නොඇලීම් අර්ථයෙන් විරාග නම් වේ. **විරාගා හොන්ති. සහජාතානි** යනු සම්‍යක් දෘෂ්ටිය සමග හටගත් සම්‍යග් සංකල්පාදී සප්ත මාර්ගාංග, **විරාගං ගච්ඡන්තීති විරාගො මග්ගොති** යනු විරාගය, නිර්වාණය අරමුණු කොට යේනුයි විරාගාරම්මණ හෙයින් විරාග නමැ.

සෙවීම් අර්ථයෙන් මාර්ග නම් වේයයි අර්ථයි. එක් එක් වූද මාර්ගාංගය මාර්ගයැයි නාමය ලබයි. මෙසේ එක් එක් අංගයෙහි මාර්ගත්වය කී කල්හි සම්‍යග් දෘෂ්ටියෙහිද මාර්ගත්වය යු.සේයි. එහෙයින්ම **එතෙන මග්ගෙන** යනු අට මාර්ගාංගයන් ගෙන යු.සේයි. **බුද්ධාච** යනු පසේබුදුවරුද සංගෘහිතයි. ඔවුහුද, 'මහණෙනි, මේ බුදුවරු දෙදෙනෙකි. තථාගත අර්හත් සම්‍යක් සම්බුදුරදහුද, ප්‍රත්‍යෙක සම්බුදුරදහුද යැයි කියන ලද හෙයින් බුදුවරුමය. **අගතං** යනු අනවරාග්‍ර සසරෙහි නොගිය විරූ, **දිසං** යනු සියලු ප්‍රතිපත්තියෙන් දිස්වේ. මනාව දර්ශනය වේ. ගලාබසීනුයිද දිසායි. සියලු බුදුවරුන් විසින් හෝ පරම සුවය යැයි පෙන්වනු ලැබේ. මනාව දක්වනු ලැබේ. දේශනා කරනු ලැබේනුයි දිසායි. (සියලු දුක් හෝ පෙනෙත්. අත්හරිත්. දොස් කියත්. එය කරණකොටගෙනනුයි දිසායි) එම දිසාව; **අට්ඨංගිකො මග්ගො** යයි කුමක් කියන ලද්දේ වේද, යම් ඒ අෂ්ටාංගික ධර්ම සමූහයක් වේද, එම අෂ්ටාංගික ධර්ම සමූහය කරණකොට නිවනට යෙත්නුයි ගමනාර්ථයෙන් මාර්ග නමැයි යුසේයි. **පුථුසමණ බ්‍රාහමණානං පරප්පවාදානං** යනු වෙන් වෙන්වූ ශ්‍රමණයින්ගේද, බ්‍රාහ්මණයින්ගේද, මෙයින් අන්‍ය ලබ්ධිකයින්ගේද, **අග්ගො** යනු එම සෙසු මාර්ගයන් අතර මෙය විශිෂ්ටය. **සෙට්ඨො** යනු සෙසු මාර්ගයන්ගෙන් අතිශයින් ප්‍රශංසනීයයි, **මොක්ඛො** යනු ඉදිරියෙහි යහපති, සෙසු මාර්ගයන්ගේ අබිමුවෙහි මෙයම යහපතියි අර්ථයි. **උත්තමො** යනු සෙසු මාර්ගයන්හි මෙන් අතිශයින් තරණය කළේ, **පවරො** යනු සෙසු මාර්ගයෙහිලා සලකා බලනවිට නානාප්‍රකාර මනා බෙදීම්වලින් යුක්තය.

**ඉති** යනු කාරණාර්ථයෙහි නිපාතයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් මාර්ගයන් අතර, අෂ්ටාංගික මාර්ගය ශ්‍රේෂ්ඨයයි වදාරන ලද්දේ යයි අදහසයි. භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී.

**මග්ගානට්ඨංගිකො සෙට්ඨො - සච්චානං චතුරො පදා**
**විරාගො සෙට්ඨො ධම්මානං - ද්විපදානඤ්ච චක්ඛුමා**

මාර්ගයන් අතර අෂ්ටාංගික මාර්ගයද, සත්‍යයන් අතර සිව් පදද, ශ්‍රේෂ්ඨය. ධර්මයන් අතර විරාග සංඛ්‍යාත නිර්වාණයද දෙපා ඇත්තවුන් අතර, බුදුන් වහන්සේද ශ්‍රේෂ්ඨය.

එය මෙහි පරවාද සිඳ, මාර්ගයන් අතර අෂ්ටාංගික මාර්ගය

ශ්‍රේෂ්ටයැයි යූ.සේයි. සෙසු වාරයන්හිද මෙම ක්‍රමයෙන්ද, යට කියන ලද ක්‍රමයෙන්ද අර්ථය දතයුතුය.

**දස්සන විරාගො** යන ආදීන්හි දර්ශන සංඛ්‍යාත විරාගය දර්ශන විරාගයයි. ඉන්ද්‍රියාර්ථයෙන් බලයෙහි විශිෂ්ටතාව හෙයින් මෙහි ඉන්ද්‍රිය වශයෙන් බලය ප්‍රථමයෙන් යූසේයි. **ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියානි** යනාදීන්හි අර්ථ පැහැදිලි කිරීම විරාගයාගේ වශයෙනි. **තථට්ඨෙන සච්චා** යනු සත්‍ය ඥාණය දතයුතුය. **සීල විසුද්ධි** යනු සම්‍යග් වාචා, කර්මාන්ත, ආජීවයෝය, **චිත්ත විසුද්ධි** යනු සම්‍යග් සමාධියයි. **දිට්ඨි විසුද්ධි** යනු සම්‍යග් දෘෂ්ටි හා සංකල්පයයි. **විමුත්තට්ඨෙන** යනු ඒ ඒ මාර්ගයන්ගෙන් නැසිය යුතු කෙලෙසුන්ගෙන් මිදීම් අර්ථයෙන්, **විජ්ජා** යනු සම්‍යග් දෘෂ්ටියයි. **විමුත්ති** යනු විනාශකිරීම් වශයෙන් මිදීමයි. **අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන මග්ගො** යනු මාර්ගඵල ප්‍රත්‍යවේක්ෂණ වනාහි සොයනු ලැබේනුයි, මෙම විරාග නිර්දේශයෙහි කියන ලද සියලු ධර්ම මාර්ග ක්ෂණයෙහිමය. විමුක්ති නිර්දේශයෙහි ඵලක්ෂණයෙහිය. එහෙයින් ඡන්ද, මනසිකාරද මාර්ගඵල සම්ප්‍රයුක්ත වූවාහු වෙති. විරාග නිර්දේශයෙහි කියන ලද ක්‍රමයෙන්ම විමුක්ති නිර්දේශයෙහිද අර්ථය දතයුතුය. මෙහි ඵලය වනාහි සන්සිඳීමෙන් විමුක්ත හෙයින් විමුක්තියි. නිර්වාණය නිස්සරණයෙන් විමුක්ත හෙයින් විමුක්තියි. '**සහජාතානි සත්තංගානි**' ආදී වචන මෙහි නොලැබේයයි නොයූසේයි. ස්වයං ඵල විමුක්ත හෙයින් **පරිච්චාගට්ඨෙන විමුත්තිය** මෙපමණෙක්ම යූ.සේයි. සෙස්ස කියන ලද අයුරුමය.

## විරාග කථා වර්ණනාව නිමි.

විරාග සංඛ්‍යාත මාර්ග වශයෙන් සිද්ධ ප්‍රතිසම්භිදා ප්‍රභේදය, දක්වන්නහු විසින් දේශිත, දම්සක් පැවතුම් සූත්‍රාන්ත පූර්වංගම ප්‍රතිසම්භිදා කථායෙහි, පෙර නුවූ විරූ අර්ථ අනුවර්ණනාවයි. සූත්‍රාන්තයෙහි **බාරාණසියං** යනු බාරාණසී නම් නදියකි. බාරාණසට නුදුරෙහි වූ නගරය බාරාණසියි. එම බරණැසෙහි, **ඉසිපතනෙ මිගදායෙ** යනු ඍෂීන්ගේ පහළට බැසීම් ඉහළට නැගීම් වශයෙන් මෙසේ ලද නාමයන් ඇති, සිවුපාවුන්ට අභයදානය දෙන ලද ස්ථානය හෙයින්ද, මිගදාය සංඛ්‍යාත ආරාමයෙහි, එතැන්හි වනාහි උපන් සර්වඥ ඍෂිවරු වැටෙති. දම්සක් පැවැත්වීම සඳහා හිඳගනිත් යන අර්ථයි. නන්දමූලක ගුහාවෙන්, සත්දිනක් ඇවෑමෙන්

නිරෝධ සමවතින් නැගිට, අනෝතත්ත විලෙන් කරන ලද, මුවදෙවීම් කිස ඇතියේ අහසින් අවුත් මෙහි පසේබුදු, ඍෂිවරු රැස්වීම් වශයෙන් බසිති. පොහොය කටයුතු සඳහාද, පොහොය නොවන කටයුතු සඳහාද රැස්වෙති. ගන්ධමාදන පර්වත බලා යන අයද එහිද බසිත් යයි (විවේක ගනිත්) මෙම ඍෂීන්ගේ බැසීම්, ඉහළට නැගීම් වශයෙන් එය ඉසිපතන යැයි යූසේයි. **ඉසිපදනං** යිද පාඨයි.

පඤ්චවග්ගියෙ යනු

**කොණ්ඩඤ්ඤො භද්දියො වප්පො මහානාමොච අස්සජි**
**එතෙ පඤ්ච මහා ථෙරා - පඤ්ච වග්ගාති වුච්චරෙ**

කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි යන එම මහ තෙරවරු පස්දෙන පඤ්චවග්ගිය යැයි කියනු ලැබෙත්. මෙසේ කියන ලද පඤ්ච භික්ෂූන්ගේ වර්ගය පඤ්ච වග්ගයි. එම පඤ්ච වර්ගයෙහි වූවාහු, එයට ඇතුළත් වූවාහුනුයි පඤ්ච වග්ගියායි, **භික්ඛූ ආමන්තෙසි** යනු දීපංකර දශබලධාරීන්ගේ පාමුලැ කරන ලද ප්‍රාර්ථනයෙහි පටන් පාරමී පුරනුයේ, පිළිවෙළින් බෝමැඩට පැමිණ, එහි නොපැරදුණු පර්යංකයෙහි හුන්නේ, මාරබල බිඳ, ප්‍රථම යාමයෙහි පෙර වුසූ කඳපිළිවෙළ සිහිකොට, මධ්‍යම යාමයෙහි දිවැස ශුද්ධකොට, පශ්චිමයාම අවසානයෙහි දසදහසක් ලෝදා නාද කරවමින්, කම්පා කරවමින්, සර්වඥතාඥානයට පත්ව, සත් සතියක් බෝමැඩ කල්යවා, මහබඹු විසින්, දම් දෙස්මට අයැදින ලදසේක් බුදුඇසින් ලොව බලා ලෝකානුග්‍රහයෙන්, බරණැසට ගොස්, පස්වග මහණුන් හඟවා දම්සක් පවත්වනු කැමැතිසේක් ඇමතූ සේක. **ද්වෙ මෙ භික්ඛවෙ අන්තා** යනු මහණෙනි, මෙම දෙකොටස්, මෙම වචනය ප්‍රකාශ කිරීමෙන් හටගත් එම ප්‍රකාශන ඝෝෂාව යටින් අවීචිය තෙක්ද මත්තෙහි භවාග්‍රය තෙක් විහිදී ලෝදා පතුරුවා සිටියේය. එම අවස්ථායෙහි අටළොස් කෝටියක් පමණ බ්‍රහ්මයෝ රැස්වූහ. පැසුළු දිගින් හිරු බැස යයි. පෙරදිගින් උතුරුසල (උත්‍රසල) නැකතින් යුත් පුන්සඳ උදාවේ. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රාන්තය අරඹන සේක් 'ද්වෙ මෙ භික්ඛවෙ අන්තා' යනාදිය වදාළහ. එහි **පබ්බජිතෙන** යනු ගිහි බන්ධන, වස්තුකාම සිඳ පැවිදි වූවහු විසින්, **න සෙවිතබ්බා** යනු පරිභෝග නොකළ යුතුය. විශේෂයෙන් පැවිද්දන්ගේම ප්‍රතිපත්තියෙහි ඇතුළත් හෙයින්, පැවිද්දා විසින් සේවනය නොකට යුත්තේයයි යූ.සේයි. **යොචායං කාමෙසු කාම**

**සුඛල්ලිකානු යොගො** යනු යම් ඒ වස්තු කාමයන්හිද කෙලෙස් කම් සුවයෙහිද, කෙලෙස් කම්සුව නිශ්‍රය වූ හෝ යම් ක්‍රියාවක යෙදීම, **හීනො** යනු ලාමක, **ගමෙමා** යනු ගම්වාසීන් සතු **පොථුජ්ජනිකො** යනු අන්ධබාල පෘථග්ජනයා විසින් පුරුදු කරන ලද, **අනරියො** යනු ආර්ය නුවූ, නොහොත් පිරිසිදු උතුම් ආර්යයන් සතු නොවූ, **අනත්‍ථසංහිතො** යනු වැඩදායක නුවූ, සුව එළවන කරුණු හා නිශ්‍රිත නොවූයේයයි අර්ථයි. **අත්තකිලමථානු යොගො** යනු තම සිරුර වෙහෙසට පත්කරවන, තමාට දුක ඇතිකරවීම යයි අර්ථයි. **දුක්ඛො** යනු තමා මරණයට පත්කරවන සුළු දුක් එළවන, කටු සහිත හේත්තුවන ලෑලිවල ශයනය කිරීම් ආදිය, තපස්වීන් විසින් උතුම් තපසයැයි ගත් හෙයින් ඔවුන්ගේ සිත් රැකීම සඳහා මෙහි හීනයැයි නොයුසේයි.

පැවිද්දන්ගේ ස්වභාවයක් හෙයින් 'ගමෙමායි' ගිහියන් හා අසාධාරණ හෙයින් 'පොථජජනික'යැයිද නොයුසේයි. එහි වනාහි ඇතැම් ප්‍රවෘජිතයෙක්මියි හැඟවූ ප්‍රතිඥා ඇති, ඉහාත්ම නිර්වාණවාදීන් විසින්, පින්වත, යම්කලෙකැ පටන් මෙම ආත්මය පංචකාම ගුණයන්ගෙන්, සමර්පිතව, යුක්තව සැපවිඳියිද? පින්වත, එපමණෙකින් මේ ආත්මය ඉහාත්ම නිර්වාණයට පැමිණියේ වේයයි, දෘෂ්ටි ගත් හෙයින් ඔවුන්ගේ සිත් රැකීම සඳහාද වත්මන් සුවය සඳහාද එම ධර්ම සමාදානයට දුකයැයි නොයුසේයි. කාමසුඛල්ලිකානුයෝගය වත්මනැ තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් කිලිටිභාවයට පත් සුව හෙයින් මත්තෙහි, දුක් විපාක හෙයින්ද ඒහා අනුයුක්ත වූවන්ගේ සිත් තෘෂ්ණා දෘෂ්ටි බන්ධනයෙන් බඳනා ලද හෙයින් නොසෙවිය යුතුය. ආත්ම කිලමථානුයෝගය වත්මනැ දෘෂ්ටීන් කිලිටිභාවයට පත්, දුක් හෙයින්ද මත්තෙහි, දුක් විපාක හෙයින්ද, ඒ හා යෙදුණවුන්ගේ සිත් දෘෂ්ටි බන්ධනයෙන් බඳනා ලද හෙයින්ද නොසෙවිය යුතුය. **එතෙ තෙ** එම ඒවා. **අනුපගමම** යනු නොඑළඹ **මජ්ඣිමා** යනු සකිලිටි සුවදුක් ආදීන්ගේ අභාවයෙන් මධ්‍යයෙහි වූයේනුයි මජ්ඣිමායි. එයම එය කරණකොට නිර්වාණය පිණිස පිළිපදීනුයි **පටිපදායි** අවබෝධ කරන ලද්දේනුයි **අභිසමබුද්ධායි**, **චක්ඛුකරණී** ආදීන්හි ප්‍රඥා චක්‍ෂුස හටගන්වයිනුයි චක්ඛුකරණීයි, **ඤාණ කරණී** යනු එයටම පර්යාය වචනයි. **උපසමාය** යනු කෙලෙස් සංසිඳවීම සඳහා, **අභිඤ්ඤාය** යනු චතුසසත්‍යයන්ගේ දැනගැනීම සඳහා, **සමෙබාධාය** යනු ඒවාහිම තත්වාකාරයෙන් අවබෝධ කිරීම සඳහා, **නිබ්බාණාය** යනු නිර්වාණය සාක්ෂාත් කිරීම සඳහා, නොහොත් දර්ශන මාර්ග ඤාණය හටගන්වයිනුයි

**චක්ඛුකරණීයි**, භාවනා මාර්ග ඥාණය හටගන්වයිනුයි **ඥාණකරණීයි.** සියලු කෙලෙසුන්ගේ සන්සිඳීම සඳහා **උපසමාය**, සියලු ධර්මයන්ගේ විශේෂ දැනුම සඳහා, අර්හත් ඵලය අවබෝධය සඳහා **සම්බොධාය** කෙලෙසුන්ගේද, ස්කන්ධයන්ගේද නිවීම සඳහා **නිබ්බාණාය**, සත්‍ය කථා අභිඤ්ඤෙය නිර්දේශයෙහි යු.සේයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, සත්‍යයන් ප්‍රකාශකොට, තමා කෙරෙහි කරන ලද බුහුමන් ඇති ඔවුන්ට, තම ප්‍රතිවේධ ක්‍රමය ශ්‍රවණය කොට, ප්‍රතිපත්තියෙහි බුහුමන් ආරෝපණයෙන් ප්‍රතිපත්ති සාධනයකොට, සත්‍ය ප්‍රතිවේධය දක්නේ, **ඉදං දුක්ඛං අරියසච්චන්ති මෙ භික්ඛවෙ** යනාදී ක්‍රමයෙන් තම ප්‍රතිවේධ ක්‍රමය දැක්වූ සේක. එහි **අනනුස්සුතෙසු** යනු නොඅසන ලද්දෙහි අනුන් අනුව ගොස් නොඅසන ලද්දේයයි අර්ථයි. චක්ඛු යනාදීන්ගේ අර්ථය මතුයෙහි ප්‍රකට වන්නේය. **ඉදං දුක්ඛං අරියසච්චං, ඉදං දුක්ඛ සමුදයං, ඉදං දුක්ඛ නිරොධං, ඉදං දුක්ඛ නිරොධගාමිණී පටිපදා** අරියසච්චං යනු සිව් සත්‍යයන්ගේ දර්ශනයයි. ප්‍රතිවේධය ශෛක්ෂ්‍ය භූමියෙහිය. **පරිඤ්ඤෙය්‍යං, පහාතබ්බං, සච්ඡිකාතබ්බං, භාවෙතබ්බං** යන සිව් සත්‍යයන්ගේ භාවනා ප්‍රතිවේධය ශෛක්ෂ්‍ය භූමියෙහිමය. **පරිඤ්ඤාතං, පහීණං, සච්ඡිකතං, භාවිතං** යන සිව් සත්‍යයන්ගේ ප්‍රත්‍යවේක්ෂණය අශෛක්ෂ්‍ය භූමියෙහිය.

**තිපරිවට්ටං** යනු සත්‍යඥාණ, කෘත්‍යඥාණ, කෘතඥාණ සංඛ්‍යාත තිපරිවෘත්තයන්ගේ වශයෙන් ත්‍රිවිධ පරිවෘත්තයක් ඇත්තේනුයි තිපරිවට්ටංයි. මෙහි වනාහි 'මේ දුකය, මේ දුක හටගැනීමය, මේ දුක් නිරෝධයයි, මේ දුක් නිරෝධයට පමුණුවන මාර්ගය වූ ප්‍රතිපදා ආර්ය සත්‍යයයි' යන මෙසේ සිව් සත්‍යයන්හි තත්වූ පරිදි ඥාණය සත්‍යඥාණ නමැ. ඒවාහිම, පරිඥෙය්‍ය, ප්‍රහාතව්‍ය, සාක්ෂාත් කළයුතු, වැඩිය යුතු යයි මෙසේ කළයුතු කෘත්‍යයන් දන්නා වූ ඥාණය කෘත්‍යඥාණ නමැ. පරිඥාත, ප්‍රහීණ, සාක්ෂාත් කළ, වඩන ලද යයි මෙසේ එම කෘත්‍යයාගේ කළ බව දන්නා නුවණ කෘත ඥාණ නමැ. **ද්වාදසාකාරං** යනු ඒවාහිම එක් එක් සත්‍යයෙහි ත්‍රිවිධ ආකාරයන් වශයෙන් ද්වාදසාකාර වන්නේ නුයි ද්වාදසාකාරංයි. **ඥාණ දස්සනං** යනු එම ත්‍රිපරිවෘත්ත ද්වාදසා කාරයන්ගේ වශයෙන් උපන් ඥාණ සංඛ්‍යාත දර්ශනයයි, **අත්තමනා** යනු සිය මනයි. සත්ත්වයින්ගේ වනාහි සුවකාමී හෙයින්, දුක් පිළිකුල් හෙයින් ප්‍රීතිය හා සොම්නසින් යුත් මනස සක්මන නමැ. ප්‍රීති සොම්නසින්, සිය

මනස ගත් මනස, ව්‍යාප්ත වූ මනස යැයි අර්ථයි. **අභිනන්දුං** යනු අභිමුඛව සතුටු වූහ. **වෙය්‍යාකරණෙ** යනු සූත්‍රාන්තයෙහි, ගාථා රහිත සූත්‍රාන්තය තනිව අර්ථය ප්‍රකාශ කරන හෙයින් වෙය්‍යාකරණ නමැ. **භඤ්ඤමානෙ** යනු කියනු ලබන කල්හි, සමීප වර්තමානයෙහි වර්තමාන වචනයෙන් කරන ලදී. කියන ලද කල්හි යැයි අර්ථයි. **විරජං** පහවූ රාගාදී රජස් ඇත්තේ, **විගතමලං** පහවූ රාගාදී මල ඇතියේ, රාගාදීහු වසාගෙන පැතිරෙන අර්ථයෙන් රජස් නමැ. දූෂිත කරන අර්ථයෙන් මල නමැ. **ධම්මචක්ඛුං** යනු කිසිතැනක ප්‍රථම මාර්ගඥානයද, කිසිතැනක මුල් මාර්ගත්‍රයයද කියිතැනක සිව්වන මාර්ග ඥානයද ගැනේ. මෙහි වනාහි ප්‍රථම මාර්ග ඥාණයමය. **යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං** යනු විදර්ශනා වශයෙන් මෙසේ පැවැතියහුට ධර්ම චක්‍ෂුසය පහළ වූයේ යයි අර්ථයි. **ධම්මචක්ක** යනු ප්‍රතිවේධ ඤාණයෙහිද දේශනා ඤාණයෙහිද වේ. බෝධිපර්යංකයෙහි වැඩහුන්නා වූ භාග්‍යවතුන් වහන්සේට සිව්සස්හි ද්වාදසාකාර ප්‍රතිවේධ ඤාණයද, ඉසිපතනයෙහි වැඩහුන්නා වූ භාග්‍යවතුන් වහන්සේට ද්වාදසාකාර වූම චතුසසත්‍ය දේශනායෙහි පැවැතියා වූ, දේශනා ඤාණයද ධර්මචක්‍රය නමැ. එම ද්වයයම දශබලධාරීන් වහන්සේට පැවැති ඤාණමය. එය මෙම දෙස්මෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මචක්‍රය පවත්වන ලද්දේ නමැ. ඒ මේ ධර්මචක්‍රය, අටළොස් කෙළක් බ්‍රහ්මයින් සමග අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරහු යම්තාක් වේලාවක් ගතවන තෙක් සෝවාන් ඵලයෙහි නොපිහිටාද, එතෙක් භාග්‍යවතුන් වහන්සේ ධර්මචක්‍රය පවත්වති නමැ. සෝවාන් ඵලයෙහි පිහිටි කල්හි පවත්වන ලද්දේ නමැ. එම කරුණ සඳහා 'පවත්තිතෙච භගවතා ධම්මචක්ක' යනාදිය යූ.සේයි. **භුම්මාදෙවා** යනු පෘථිවි තලය ආශ්‍රිතව සිටින දෙවිවරු, **සද්දමනුස්සාවෙසුං** යනු එක් පහරින්ම සාධුකාර දී, **එතං භගවතා** යනාදිය කියන්නාහු ශබ්ද අනුශ්‍රවණය කළහ. **අප්පවත්තියං** යනු මෙය එය මෙන් නොවේයයි ප්‍රතිලෝම වශයෙන් පවත්වන්ට නොහැකිවන්නේ, මෙහි රැස්වූ දෙවිබඹහු, දේශනාවසානයෙහි එක් පහරින්ම සාධුකාර දුන්හ. රැස්වීමට නොපැමිණි භුම්‍යස්ථ දේවතාවෝ ඔවුනොවුන්ගෙන් ශ්‍රවණයකොට සාධුකාර දුන්නාහයි දතයුතුය.

ඔවුනතර, පර්වත වෘක්‍ෂාදියෙහි උපන් භුම්‍යස්ථ දෙවිවරු ඔවුහු චාතුර්මහා රාජිකයට ඇතුළත් වූවාහු වෙත්යයි මෙහි වෙන්කොට යූ.සේයි. **චතුම්මහාරාජිකා** යනු ධෘතරාෂ්ඨ්‍ර, විරූඪ, විරූපාක්‍ෂ, වෛශ්‍රවණ සංඛ්‍යාත සිව්මහ දෙව්රජවරු ඔවුන්ට ඇතුළත් වූවාහුනුයි චාතුම්මහාරාජිකායි,

ඒවා මහමෙර මධ්‍යයෙහි වෙයි. ඔවුනතර පර්වතස්ථායීහුද, ආකාස ස්ථායීහුද ඇත. ඔවුන්ගේ පරපුර සක්වළ පච්චට පැමිණියාහු, ඛිඩ්ඩාපදොසික, මනොපදොසික, සීත වලාහක, උෂ්ණ වලාහක, චන්‍ද්‍ර-සූර්ය දිව්‍යපුත්‍රදැයි යන එම සියල්ලෝම චාතුර්මහාරාජික දේව ලෝකස්ථායීහුමය. තෙතිස් ජනකෙනෙක් එහි උපන්නාහුයි **තාවතිංසායි.** තවද තාවතිංසා යනු එම දෙවිවරුන්ගේ නාමයමයැයිද යූ.සේයි. ඔවුහුද පර්වතස්ථායී හා ආකාසස්ථායීහු සිටිති. ඔවුන්ගේ පරපුර සක්වල පච්චට පැමිණියාහ. යාමාදීන්ගේද එසේමය. එක් ලෝකයෙක්හිද දෙවිවරුන්ගේ පරපුර සක්වළ පච්චට නොපැමිණියාහු නම් නැත. දිව්‍ය සුවයට ගියාහු, ප්‍රයාණය කළාහු, පැමිණියාහුනුයි **යාමායි.** තුටුපහටු වේනුයි **තුසිතායි.** ප්‍රකෘතියෙන් පිළියෙළ කළ අරමුණට අතිරේකව සිත් අලවමින් ප්‍රීතිමත් වීමට කැමැති කල්හි කැමැති පරිද්දෙන් එම කාම වස්තූන් නිර්මාණයකොට සිත් අලවමින් වෙසෙත්නුයි **නිම්මාණරතියි.** සිතෙහි හැසිරීම දැන, අන්‍යයා විසින් නිර්මිත භෝගයන්හි වශයෙහි පවතිත්නුයි **පරනිම්මිත විසවත්තියි,** බ්‍රහ්ම කායයෙහි, බ්‍රහ්ම සමූහයෙහි නියුක්තනුයි **බ්‍රහමකායිකායි.** සියලුම පඤ්චවොකාර භව බ්‍රහ්මයෝ ඇතුළත්ය. **තෙන ඛණෙන** යන වචනය වෙසෙසා **තෙන මුහුතෙතන** යයි යූසේයි. මොහොතකැයි කියනු ලබන ක්‍ෂණයෙන් පරමාර්ථ ක්‍ෂණයෙන් යැයි යූ.සේයි. **යාව බ්‍රහමලොකා** යනු බඹලොව ඇතුළත්කොට, **සඳෙදා** යනු සාධුකාර ශබ්දියයි. **දසසහසසි** යනු දසදහසක් සක්වළ, **සංකම්පි** යනු උඩට නගින්නේ මනාව කම්පා විය. **සම්පකම්පි** යනු උඩට නගින්නේ, පහළට බසින්නේ අධිකව කම්පා විය. **සම්පවෙධි** යනු සිව්දිසාවට යන්නේ මනාව කම්පා විය. මහ බෝසතාණන් සම්බුදුබව සඳහා මව්කුසට බැසගන්නා කල්හිද මවුකුසින් නික්මෙන කල්හිද, මහපොළොව කම්පා විය. බුද්ධත්වයට පත්ව, ප්‍රතිවේධ ඥාණ තේජසින් දම්සක් පැවතුම් දේශනා ඥාණ තේජසින්, සාධුකාර දෙන්නාක් මෙන් පෘථුවිය දේවතානුභාවයෙන් කම්පා විය. ආයු සංස්කාර හරණයෙහිද මහ පිරිනිවනෙහිද, කාරුණ්‍යයෙන් කැළඹීම නොඉවසන්නාක් මෙන් පෘථුවි දේවතානුභාවයෙන් කම්පා විය. **අපපමාණො** යනු වෘද්ධියෙහි ප්‍රමාණයයි. **උළාරො** යන මෙහි 'මහත් වූ කෑ යුතු දෑ කති' ආදී තන්හි මිහිරියාව උළාරයයි යූසේයි. උදාර වූ වස්තු භෝගයන්හි සිත නොනැමේ යන ආදීන්හි ප්‍රණීතතාව උළාරයයි යූ.සේයි. 'පින්වත් වච්ඡායන තෙමේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ උදාර වූ ප්‍රශංසාවෙන් ප්‍රශංසා කරයි' ආදීන්හි ශ්‍රේෂ්ඨත්වය උළාරයයි යූ.සේයි. මෙහි වනාහි පැතිරුණු බව උළාරයයි යූසේයි. **ඔභාසො** යනු දේශනා

ඤාණානුභාවයෙන්ද, දේවතානුභාවයෙන්ද හටගත් ආලෝකයයි. **ලොකෙ** යනු දසදහසක් සක්වළයන්හිම, **අතික්කම්මදෙවානං දෙවානුභාවං** යනු මේ දෙවිවරුන්ගේ ආනුභාවයයි. ඇඳි වත් ආලෝකය දොළොස් යොදුනක් පැතිරේ. ශරීරාලංකාරයෙහිද විමානයෙහිද එසේමය. එම දේවානුභාවය ඉක්මවාමයැයි අර්ථයි. **උදානං** යනු සොම්නස් ඤාණමය ප්‍රීති වාක්‍යයයි. **උදානෙසි** යනු කීවේය. **අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො** යන මෙම උදානයෙහිද කථාකරන හඬ දසදහසක් ලෝදා පැතිර සිටියේය. අඤ්ඤා කොණ්ඩඤ්ඤ යනු බොහෝ සේ දත් කොණ්ඩඤ්ඤයයි අර්ථයි.

චක්ඛු ආදීන්ගේ නිර්දේශයෙහි **දස්සනට්ඨෙන** යන ආදීන්හි එකම ඤාණය කියන ලද ආකාර ඇති, අවබෝධ කළයුතු දැහි ඇසක් මෙන් වූයේ, දර්ශන කෘත්‍යය කිරීමෙන් චක්ඛුයි. ඤාණ කෘත්‍ය කරණයෙන් **ඤාණංයි**, නානාප්‍රකාරයෙන් දැනගැනීම් කෘත්‍යකරණයෙන් **පඤ්ඤායි**. සේසරහිත ප්‍රතිවේධකරණයෙන් **විජ්ජායි**. හැමකල්හි ආලෝක කරණ කෘත්‍ය වශයෙන් **ආලොකො** නමැයි අර්ථයි. **චක්ඛුධම්මො** යනාදීන්හිද එකම ඤාණය කෘත්‍යය නානාප්‍රකාර භාවයෙන් පස් අයුරෙකින් වර්ණිතය. **ආරම්මණා** යනු උපකාර වන අර්ථයෙන්, **ගොචරා** යනු ගොදුරු වන දෙය යන අර්ථයෙන්, **දස්සනට්ඨෙන** යනාදීන්හි ඤාණ කෘත්‍යය පස් අයුරෙකින් යු.සේයි.

මෙම ක්‍රමයෙන් ත්‍රිවිධ වාරයන්හි, එකිනෙකෙහි පහක් බැගින් කොට, පසළොස් ධර්ම, පසළොස් අර්ථ දෙපසළොස්හි තිස් නිරුක්තීන්හු, පසළොස් ධර්මයන්හි පසළොස් අර්ථයන්හි තිස් නිරුක්තීන්හි සැට ඤාණ දතයුත්තාහ. සෙසු ආර්ය සත්‍යයන්හිද එම ක්‍රමයමැයි.

චතුරාර්ය සත්‍යයෙහි එකිනෙක ආර්ය සත්‍යයෙහි පසළොසක් බැගින් වූ, ධර්මයන්ගේද, අර්ථයන්ගේද වශයෙන් සැට ධර්ම අර්ථ වෙයි. සැට ධර්මයන්හිද සැට අර්ථයන්හිද එකසිය විස්සක් නිරුක්තීහු වෙති. විස්සක් අධිකකොට ඇති සියයයි අර්ථයි. සැට ධර්මයන්හිද, සැට අර්ථයන්හිද, එක්සිය විස්සක් නිරුක්තීන්හිදැයි මෙසේ දෙසිය හතළිහක් ඤාණ වෙයි.

සතිපට්ඨාන සූත්‍රාන්ත පූර්වංගම වූද, ඍද්ධිපාද සූත්‍රාන්ත පූර්වංගම වූද, ප්‍රතිසම්භිද නිර්දේශයෙහි මෙම ක්‍රමයෙන්ම අර්ථයද, ගණන් කිරීමද දතයුත්තාහ.

සත්බෝසත් සූත්‍රාන්තයන්හි එකිනෙකෙහිම, සමුදයෙහි චක්ෂුරාදී පහක්ද නිරෝධයෙහි පහක්දැයි දසධර්මයි. සමුදයෙහි දර්ශනාර්ථාදීහු පහක්ද, නිරෝධයෙහි පහක්දැයි දස අර්ථයි. ඒවාහි වශයෙන් විසි නිරුක්තීහුය. සතළිස් ඤාණයෝය සත එකතුකොට කියන ලද ගණන පහසුවෙන් දතහැකිය.

මෙසේ සර්වඥතා ඥාන වශයෙන් කියන ලද, ප්‍රතිසම්භිදා නිර්දේශයෙහි එකිනෙක මූලිකව, ශූන්‍යතා වශයෙන් දක්නා ලදුයේ දන්නා ලදුයේ, සාක්ෂාත් කරනා ලදුයේ, ප්‍රඥාවෙන් ස්පර්ශ කරන ලද්දේනුයි මෙම පඤ්ච වචනයන්හි, චක්ෂුරාදී පංචකයෙහි එකිනෙක වශයෙන් දර්ශනාර්ථාදීහු පඤ්චකයදැයි වශයෙන් පඤ්ච පඤ්චකයන්ගේ වශයෙන් විසිපස් ධර්මයි. විසිපස් අර්ථයි. ඒ හා ද්විගුණ නිරුක්තීහුය. ඒ හා ද්විගුණ ඤාණයෝය. පහ එකතුකොට කියන ලද වාරයෙහිද, පස්වරක්, විසිපහ බැගින් පහක්කොට, එකසිය විසි පහක් ධර්මයෝ, එකසිය විසිපහක් අර්ථයෝ, ඒ හා ද්විගුණ නිරුක්තීහුය. ඒ හා ද්විගුණ ඤාණයෝය. අඩ්ඪතෙය්‍යානි යනු දෙසිය පණහකි. ස්කන්ධාදීන්හිද එම ක්‍රමයමැයි. මෙම ක්‍රමයෙන්ම සත්‍යවාර, ප්‍රතිසම්භිදා වාරයන්හි ධර්මාදී ගණනය දතයුත්තාහ.

බුද්ධ ධර්මවාරයෙහි දියඩ්ඪසතං යනු (විසිපහ බැගින් සයවාරයක්) එකසිය පණහකි. නිරුක්ති තුන්සියයකි. ඤාණ හයසියයකි. පටිසම්භිදාධිකරණෙ යනු ප්‍රතිසම්භිදා අධිකාරයෙහි, අඩ්ඪනවධම්මසතානි යනු ප්‍රථමයෙන් කියන ලද චතුසසත්‍යයන්හි සැටෙකි. සිව් සතිපට්ඨානයන්හි සැටෙකි. සිව් සම්‍යක්ප්‍රධානයන්හි සැටෙකි. සත් බෝසත් විස්තර දේශනාවන්හි සැත්තෑවකි. අභිඤ්ඤාර්ථාදී පඤ්චකයෙහි එක්සිය විසිපහකි. ස්කන්ධාදී පංචකයෙහි එක්සිය විසිපහකි. නැවත චතුරාර්ය සත්‍යයන්හි සියයකි. සිව් ප්‍රතිසම්භිදාවන්හි සියයකි. ෂට් බුද්ධ ධර්මයන්හි එක්සිය පණහකැයි මෙසේ අටසිය පණහක් ධර්ම වෙයි. මෙසේ අර්ථද එපමණම වෙයි. එපරිද්දෙන්ම ශ්‍රද්ධාදී ත්‍රිවිධ ස්ථානයන්හි එක්සිය විස්සක් නිරුත්තීහුය. සත් විස්තර දේශනාවන්හි එක්සිය හතළිහක් නිරුක්තීහුය. අභිඥාතාර්ථාදීන්හිද ස්කන්ධාර්ථාදීන්හිද නිරුක්ති දෙසිය පණහ බැගිනි. ආර්ය සත්‍යයන්හිද ප්‍රතිසම්භිදාදීන්හි නිරුක්ති දෙසියය බැගිනි. බුද්ධ ධර්මයන්හි නිරුක්ති තුන්සියයකි. මෙසේ නිරුක්ති එක්දහස් හත්සියයකි. සත්‍යයෝද එපරිදිමය. ත්‍රිවිධ ස්ථානයන්හි ඤාණ දෙසිය හතරක් බැගිනි.

සත් විස්තර දේශනාවන්හි දෙසිය අසූවක් අධික කොට ඇති ඤාණයෝය. අභිඤ්ඤාර්ථාදීන්හිද, ස්කන්ධාර්ථාදීන්හිද එක්සිය පහ බැගිනි. සත්‍යයන්හිද ප්‍රතිසම්භිදාදීන්හිද ඤාණ එක්සිය හතර බැගිනි. බුද්ධ ධර්මයන්හි ඤාණ එක්සිය සයකැයි, මේ ඤාණ තුන්දහස් හාරසියයකි.

## ප්‍රතිසම්භිදා කථා වර්ණනාව නිමි.

නැවත ධර්මචක්‍රප්‍රවර්තන සූත්‍රාන්තයම පූර්වංගම කොටැ, දේශිත ධර්මචක්‍ර කථායෙහි පෙර නුවූ විරූ අර්ථ අනුවර්ණනාවයි. එහි **දුක්ඛ වත්ථුකා** යනු එක්වර අවබෝධවීම් වශයෙන්, දුක වස්තුකොට ඇතියේ ඒවාටනුයි දුක්ඛ වත්ථුකායි. එම දුකම වෙසෙසා **සච්ච වත්ථුකා** යන ආදිය වදාළහ. එහි සත්‍යය අරමුණු වූයේ, උපකාර වූයේ ඒවාටනුයි **සච්චාරම්මණායි**. සත්‍යය ගොදුරුවූයේ, විෂය වූයේ ඒවාටනුයි **සච්චගොචරායි, සච්චසංගහිතා** යනු මාර්ග සත්‍යයෙන් සංගෘහිත වූවාහු, **සච්ච පරියාපන්නා** යනු මාර්ග සත්‍යයට අයත්වූවාහු, **සච්චෙ සමුදාගතා** යනු දුක දැනීමෙන් දුක්ඛ සත්‍යයෙහි උපන්නාහු එසේම එහි සිටියාහු, පිහිටියාහුයි **ඨිතා පතිට්ඨිතායි.**

'පවත්තිතෙච භගවතා ධම්මචක්කෙ' යයි කියන ලද ධර්මචක්‍රය නිර්දේශ කරනු කැමැතියේ **ධම්මචක්කං** යනාදිය වදාළහ. එහි ධර්මචක්‍රය ප්‍රතිවේධ ධර්මචක්‍රය, දේශනා ධර්මචක්‍රයයි දෙවැදෑරුම්ය. එහි ප්‍රතිවේධ ධර්මචක්‍රය බෝධි පර්යංකයෙහි, දේශනා ධර්මචක්‍රය ඉසිපතනයෙහිය. **ධම්මඤ්ච පවත්තෙති චක්කඤ්ච** යන්නෙන් ප්‍රතිවේධ ධර්මචක්‍රය යූසේයි. **චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්ච** යන්නෙන් දේශනා ධර්ම චක්‍රයයි.

කෙසේ නම් භාග්‍යවතුන් වහන්සේ බෝධි පර්යංකයෙහි වැඩහුන් සේක් මාර්ගක්ෂණයෙහි ඉන්ද්‍රිය, බල, බොධ්‍යංග, මාර්ගාංගාදී ප්‍රභේද වූ ධර්මය පවත්වාද? එම ධර්මයන්ම කෙලෙස් සතුරන් නැසීම සඳහා පවත්නා හෙයින් ප්‍රහරණ චක්‍රයක් මෙනැයි චක්‍රයි. භාග්‍යවතුන් වහන්සේ ධර්මචක්‍රය පවත්වනසේක්ම එම චක්‍රය පවත්වත් නමැ. එයින් ධර්මයම චක්‍ර යනු කර්මධාර සමාසභාවය යූසේයි. ඉසිපතනයෙහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා ක්ෂණයෙහි හික්මවිය යුතු පුද්ගල සන්තානයෙහි කෙලෙස් සතුරන් නැසීම සඳහා පවත්වන හෙයින් ප්‍රහරණ

චක්‍රයක් හා සමානව දේශනා චක්‍රයද පවත්වති, හික්මවිය යුතු පුද්ගල සන්තානයෙහි ඉන්ද්‍රියබල බොධ්‍යංග, මාර්ගාංගාදී ප්‍රභේද ධර්මචක්‍රයද පවත්වති. එයින් ධර්මයද, චක්‍රයද ධර්මචක්‍රයයි ද්වන්ධ සමාසතාව යූසේයි පවත්වන්නෙකු ඇතිකල්හි පැවැත්වීම නම් වේද? එහෙයින් හැමතැනම පවත්වති යයි යූසේයි. පවත්වන අර්ථයෙන් චක්‍රයයි යූසේයි. **ධම්මෙන පවත්තෙතී ධම්මචක්කං** යන ආදිය දේශනා ධර්මචක්‍රයම සඳහා යූසේයි.

එහි **ධම්මෙන පවත්තෙති** යනු යථා ස්වභාව හෙයින් ධර්මයෙන් පැවැත්වූ චක්‍රයනුයි ධම්මචක්කංයි යූසේයි.

**ධම්මචරියාය පවත්තෙති** යනු හික්මවිය යුතු පුද්ගල සන්තානයෙහි ධර්මය සඳහා පැවැත්වූ චක්‍රයනුයි ධම්ම චක්කං යයි යූසේයි. **ධම්මෙම ඨිතො** ආදීන්ගෙන් භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම සත්‍යතාව හෙයින්ද, ධර්මස්වාමී හෙයින්දැයි යූසේයි. දෙසූ පරිදි, 'ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ දන්නේ දනියි. දක්නේ දකියි. පැණැසින් නැණැසින්, දැහැමින් ශ්‍රේෂ්ඨත්වයෙන් යුක්ත වූවාහු, දෙසන්නාහු මනාව දෙසන්නාහු අර්ථය පැහැදිලි කරන්නාහු අමෘතය දෙන්නාහු ධර්මස්වාමී තථාගත වූ සේක. එම ධර්මයෙහි චක්‍රයනුයි ධර්මචක්‍රයයි යූසේයි. **ඨිතො** යනු විෂයීභාවයෙන් සිටියේ, **පතිට්ඨිතො** යනු අචලභාවයෙන් පිහිටියේ, **වසිප්පත්තො** යනු ඓශ්වර්යභාවයට පත්වූයේ, **පාරමිප්පත්තො** යනු කෙළවරට පැමිණියේ, **වෙසාරජ්ජප්පත්තො** යනු හික්මවිය යුතු සත්ත්වයින් අපේක්ෂාකොට කියන ලද වචනයන්ගෙන් ධර්මස්වාමිතාවයෙහිද, ධර්මාර්ථයෙහිද චක්‍රයයි යූසේයි. **ධම්මං සක්කරොනෙතා** යන ආදීන්ගෙන් ධර්මාර්ථය සඳහා චක්‍රයයි යූ.සේයි. යමෙක් ධර්මය සත්කාරාදී වශයෙන් පවත්වයිද, හෙතෙම ධර්මාර්ථය පවත්වයි නමැ. **ධම්මං සක්කරොනෙතා** යනු යම්සේ කරන ලද එම ධර්මය මනාව සත්කාර කරන ලද්දේ වේද, එපරිද්දෙන් එය කරනුයේ **ධම්මං ගරු කරෙනෙතා** යනු එහි ගෞරව ඉපිදවීමෙන් එයට ගරු කරනුයේ, ධම්මං මානෙනෙතා යනු ධර්මයට ප්‍රියභාවයද බුහුමන්ද කොට වාසය කරනුයේ, **ධම්මං පූජෙනෙතා** යනු එය සාක්‍ෂාත්‍යකොට දේශනා ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කරනුයේ, **ධම්මං අපචායමානො** යනු එම ධර්මයටම සත්කාර ගරුකාරයන්ගෙන් යටහත් පහත් පැවතුම් කරනුයේ, **ධම්මද්ධජො ධම්මකෙතු** යනු ධර්මය ධජයක් මෙන් පෙරටුකොට (කෙහෙලි) තුන්හුලස් කොඩියක් මෙන් ඔසවා පැවැත්මෙහි, ධර්මධජ ධර්මකේතුවක්ව වීයයි අර්ථයි. **ධම්මාධිපතෙය්‍යො** යනු ධර්මාධිපති

වශයෙන් පැමිණියා වූ භාවනා ධර්ම වශයෙන්ම සියලු ක්‍රියාවන්ගේ කිරීමෙන් ධර්මාධිපති වී, **තං බොපන ධමම චකකං අපපතිවතතියං** යනු කිසිවෙකු විසින් නැවැත්විය නොහැකිතායෙන් නොනැසිය හැකි ස්වභාවයෙනැයි යූසේයි. නොපැවැත්විය හැකියයි අර්ථයි, එහෙයින් එම ධර්මය, පවත්වන අර්ථයෙන් ධර්මචක්‍රයයි යූ.සේයි.

**සඳධිනද්‍රියං ධමෙමා,** තං ධමමං **පවතෙතති** යනු හික්මවිය යුතු අයගේ සන්තානයෙහි මාර්ග සම්ප්‍රයුක්ත ශ්‍රද්ධෙන්ද්‍රිය උත්පාදනයෙන් එම ශ්‍රද්ධෙන්ද්‍රිය ධර්මය පවත්වානුයි අර්ථයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**සචචා** යනු සත්‍ය ඥාණයෝය. විදර්ශනාවද, විද්‍යාවද මාර්ග ඥාණයමය. **අනුපපාදෙ ඤාණං** යනු අර්හත් ඵලයෙහි ඥාණයයි. එය හික්මවිය යුතු අයගේ සන්තානයෙහි පැවතේමය. නිර්වාණය ප්‍රතිවේධ කරනුයේ පැවැත්තේ නමැ. සමුදය වාරාදීන්හි, **සමුදය වතුථුකා, නිරොධ වතුථුකා,** මගග වතුථුකායි විශේෂ පදයෙන් සංක්‍ෂෙප කරන ලදී. මෙහිද, කියන ලද ආකාරය පළමු කියන ලද අයුරින්ම් දතයුතුය. සතිපටඨාන, ඍද්ධිපාද පූර්වාංගම වාරයන්ද මාර්ගක්‍ෂණ වශයෙන් යූ.සේයි. ඒවාද ඒ ඒ තන්හි විශේෂ පද මගින් සංක්‍ෂේප කරන ලදහ.

## ධර්ම කථා වර්ණනා නිමි.

දැන් ලෝකෝත්තර දම්වැටෙහි, ධර්මචක්‍ර කථායෙහි අනතුරුව දේශිත ලෝකෝත්තර කථායෙහි පෙර නුවූ විරූ අර්ථ අනුවර්ණනාවයි. එහි ලෝකෝත්තර පදයෙහි අර්ථය නිර්දේශ වාරයෙහි ප්‍රකට වන්නේය. **චතතාරො සතිපටඨානා** යන ආදීහු සත්තිස් බෝධිපාක්‍ෂික ධර්ම සුදුසු පරිදි මාර්ගඵල සම්ප්‍රයුක්තය. ඒවා අවබෝධ කිරීම් අර්ථයෙන් බෝධියැයි ලද නම් ඇති ආර්යයන්ගේ පක්‍ෂයෙහි වූ හෙයින් බෝධිපාක්‍ෂික නමැ. පක්‍ෂයෙහි වූ හෙයින් යනු උපකාර භාවයෙහි සිටි හෙයිනි. එම අරමුණුවල ඇතුල්ව, පැන වැදී එළඹ සිටින හෙයිනි. එම අරමුණුවල ඇතුල්ව, පැනවැදී එළඹ සිටින හෙයින් උපටඨානංයි සිහියම එළඹ සිටීම **සතිපටඨානංයි.** කාය, වේදනා, චිත්ත, ධර්මයන්හි වනාහි, අශුභ, දුක්, අනිත්‍ය, අනාත්ම ආකාර ග්‍රහණ වශයෙන් සුභ, සුව, නිත්‍ය, ආත්ම සංඥා ප්‍රහාණ කෘත්‍ය, සාධන වශයෙන්ද පැවැතීම් වශයෙන් සිව් ආකාර භේදයක් වේ. එහෙයින් **චතතාරො සතිපටඨානායි** යූසේයි.

එය කරණකොට බලවත් සේ උත්සාහ කෙරේනුයි පධානංයි. ශෝභන වූ බලවත් උත්සාහය **සම්මප්පධානංයි.** එය කරණකොට මනාව බලවත් උත්සාහ කෙරේනුයි **සම්මප්පධානංයි.** සෝභන වූ හෝ එය කෙලෙස් විරූප පැවැත්මෙන් විරහිත හෙයින් ප්‍රධාන වූයේද, හිතසුව නිපැයුම් අර්ථයෙන් ශ්‍රේෂ්ඨභාවය ගෙනදෙන හෙයින් ප්‍රධානභාවය හටගන්වන හෙයින්ද **සම්මප්පධානංයි.** වීර්යයට එය විශේෂ නාමයකි. මෙය උපන්නා වූද, නූපන්නා වූද අකුසලයන්ගේ ප්‍රහාණ නොඉපදීම් කෘත්‍යයද, නූපන්නා වූද උපන්නා වූද, කුසලයන්ගේ ඉපදීම් පැවැතීම් කෘත්‍යයන් සිදුකෙරේනුයි සිව්ආකාර වෙයි. එහෙයින් චත්තාරො සම්මප්පධානායි කියති. හටගැනීම් ක්‍රමයෙන් සමෘද්ධවීම් අර්ථයෙන් සත්ත්වයෝ එයින් සමෘද්ධ වෙති.

සමෘද්ධ වූවාහු, වෘද්ධියට පත්වූවාහු, උසස් බවට ගියාහු වෙත්යයි මෙම ක්‍රමයෙන්ද ඍද්ධියි. ඒහා සම්ප්‍රයුක්ත පූර්වංගමාර්ථයෙන් ඵලය වූ පූර්වභාග කාරණාර්ථයෙන් ඍද්ධියගේ පාදය (පිහිටීමට ආධාරකය) නුයි **ඉද්ධිපාදොයි.** එය ඡන්‍ද, වීර්යය, චිත්ත, වීමංසා වශයෙන් සිව්වැදෑරුම් වෙයි. එහෙයින් **චත්තාරො ඉද්ධිපාදායි** කියති.

අශ්‍රද්ධා, කුසීතභාව, ප්‍රමාද, වික්ෂෙප, මුළාවීම් ආදීන්ගේ මැඩපැවැත්වීම ඇතිකරන හෙයින්, අභිභවන සංඛ්‍යාත අධිපති අර්ථයෙන් **ඉන්‍ද්‍රියංයි.** අශ්‍රද්ධාදීන්ගෙන් නොමඩනා හෙයින් අකම්පාර්ථයෙන් බලංයි. එම ද්වයයම ශ්‍රද්ධා, වීර්යය, සති, සමාධි, ප්‍රඥා වශයෙන් පස්වැදෑරුම් වේ. එහෙයින් පඤ්චින්‍ද්‍රියානි පඤ්චබලානියි කියති.

අවබෝධ කරන සත්ත්වයාගේ කොටස් වන හෙයින් සති ආදී සත් ධර්ම **බොජ්ඣංගායි.** නික්මයාම් අර්ථයෙන් සම්‍යග් දෘෂ්ටි ආදී අට, මාර්ගාංග වෙයි. එහෙයින් කියති **සත්ත බොජ්ඣංගානි (අරියො) අට්ඨංගිකො මග්ගොයි.**

මෙම සත්තිස් බෝධිපාක්ෂික ධර්ම පූර්වභාගයෙහි ලෞකික විදර්ශනාව පවත්නා කල්හි, තුදුස් ආකාරයෙන් කය පරිග්‍රහණය කරන කල්හි කායානුපස්සනා සතිපට්ඨානයයි. නව අයුරෙකින් වේදනාව පරිග්‍රහණය කරන කල්හි වේදනානුපස්සනා සතිපට්ඨානයයි. සොළොස් අයුරෙකින් සිත පරිග්‍රහණය කරන කල්හි චිත්තානුපස්සනා සතිපට්ඨානයයි.

පස් අයුරෙකින් ධර්මයන් පරිග්‍රහණය කරන කල්හි ධර්මානුපස්සනා සතිපට්ඨානයයි. මෙසේ මෙ අත්බැව්හි නූපන්විරූ පරහට නිපන් අකුසලයක් දැක යම් අයුරෙකින් පිළිපන් ඔහුට එය උපනිද? එසේ නොපිළිපදින්නෙමි. මෙසේ මාහට එය නූපදින්නේයයි එහි නොඉපැත්ම සඳහා උත්සාහ කරන කල්හි ප්‍රථම සම්‍යග් ප්‍රධානය වේ. තමා කෙරෙහි හැසිරීමට පත් අකුසලයක් දැක එහි ප්‍රහාණය සඳහා උත්සාහ කරන කල්හි දෙවැන්නද, මෙ අත්බැව්හි නූපන් විරූ ධ්‍යානයක් හෝ විදර්ශනාවක් හෝ උපදවන්ට උත්සාහ කරනහුට තෙවැන්නද, නිපන් දෑ යම්සේ නොපිරිහේද, මෙසේ නැවත නැවත උපදවන්නහුට සිව්වන සම්‍යක් ප්‍රධානය වේ. කැමැත්ත ප්‍රධානකොට කුසල් උපදවන කල්හි ඡන්දිද්ධිපාදයි. වීර්යය, සිත, විමසීම ප්‍රධානකොට කුසල් උපදවන කල්හි වීමංසිද්ධිපාදයි. මිථ්‍යා වචනයෙන් වළක්නා කල්හි සම්මා වාචායි. මිථ්‍යා කර්මාන්තයෙන්, මිථ්‍යා ආජීවයෙන් වළක්නා කල්හි සම්‍යග් ආජීවයදැයි මෙසේ නොයෙක් සිත්හි ලැබෙත්. සිව් මාර්ගක්‍ෂණයන්හි වනාහි එක් සිතෙහි ලැබෙත්. ඵලක්‍ෂණයෙහි සිව් සම්‍යග් ප්‍රධානයන් හැර සෙසු තෙතිස ලැබේ. මෙසේ එක් සිතෙහි ලබන්නා වූ ඒවා එකම නිර්වාණාරම්මණ සිහිය, කායාදීන්හි ශුභ සංඥාදී ප්‍රහාණ කෘත්‍යය සිදුකිරීම් වශයෙන් සිව් සීවටන්හුයැයි යූ.සේයි. එක්ම වීර්යය, නූපන් හා උපනවුන්ගේ අනුත්පාදාදී කෘත්‍යයන් සිදුකිරීම් වශයෙන් සිව් සම්‍යක් ප්‍රධානයැයි යූ.සේයි. සෙස්සෙහි පරිහානියක් හෝ වර්ධනයක් නොමැත. තවද ඒවාහි

නව එක විධා එකො - දෙවධාථ චතු පඤ්චධා
අට්ඨධා නවධා චෙව - ඉති ඡද්ධා භවන්ති තෙ

නවයක් එක් අයුරෙකි. එකක් දෙ අයුරෙකි. එකක් සිවු අයුරෙකි. එකක් පස් අයුරෙකි. එකක් අට අයුරෙකි. එකක් නව අයුරෙකි. මෙසේ ඒවා සය අයුරෙකින් වේ.

'නවයක් එක් අයුරුය' යනු ඡන්ද, චිත්ත, ප්‍රීති, පස්සද්ධි, උපේක්‍ෂා, සංකල්ප, වාචා, කම්මන්ත, ආජීව යන මෙම නවය ඡන්ද සෘද්ධිපාදාදී වශයෙන් එක් අයුරුම වෙයි. අන් කොටස් භජනය නොකරයි. 'එකක් දෙඅයුරෙකින්' යනු ශ්‍රද්ධාව, ඉන්ද්‍රිය, බල වශයෙන් දෙඅයුරෙකින් සිටියේය. නැවත සිව්, පස් අයුරෙකින් යනු නැවත අන් එකක් සිව් අයුරෙකින්ද, අනෙකක් පස් අයුරෙකින්ද සිටියේයයි අර්ථයි. එහි එකක් වූ සමාධිය,

ඉන්ද්‍රිය, බල, බොධ්‍යංග, මාර්ගාංග වශයෙන් සිව් අයුරෙකින් සිටියේය. ප්‍රඥාව එම සතරෙහිද, ඍද්ධිපාද කොට්ඨාසයෙහිද වශයෙන් පස් ආකාරය. 'අට අයුරින් නව අයුරින්' යනු අනෙක් එකක් අට අයුරෙකින්ද එකක් නව අයුරෙකින්ද සිටියේ යයි අර්ථයි. සිව් සීවටන්, ඉන්ද්‍රිය, බල, බොධ්‍යංග, මාර්ගාංග වශයෙන් සිහිය අට අයුරෙකින් සිටියේය. සිව් සම්‍යක් ප්‍රධන්, ඍද්ධිපාද ඉන්ද්‍රිය, බල, බොධ්‍යංග, මාර්ගාංග වශයෙන් වීර්යය නවවැදෑරුම් වේ. මෙසේ,

**චුද්දසෙව අසම්භින්නා - හොන්ති තෙ බොධි පක්ඛියා**
**කොට්ඨාසතො සත්තවිධා - සත්ත තිංසප්ප භෙදතො**

එම බොධිපාක්ෂික ධර්ම මිශ්‍ර නොවූවාහු තුදුසෙක්ම වේ. කොටස් වශයෙන් සත්වැදෑරුම්ය. ප්‍රභේද වශයෙන් සත් තිසකි.

**සකිච්ච නිප්ඵාදනතො - සරූපෙනච වුත්තිතො**
**සබ්බෙව අරිය මග්ගස්ස - සම්භවෙ සම්භවන්ති තෙ**

ස්වකෘත්‍ය නිෂ්පාදනයෙන්ද, ස්වරූපයෙන්ද, පැවැත්මෙන්ද ඒ සියල්ලම ආර්යමාර්ග සම්භවයේදී හටගනී.

මෙසේ මාර්ගඵල සම්ප්‍රයුක්ත සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් ඉදිරිපත්කොට නැවත ඒවා මාර්ගඵලයන්හි හකුළුවා, චත්තාරොච අරියමග්ගා චත්තාරිච සාමඤ්ඤඵලානියි. ශ්‍රමණභාවය සාමඤ්ඤංයි. සිව් ආර්ය මාර්ගයන්ට එය නාමයකි. සිව් ආර්යමාර්ග සංඛ්‍යාත සාමඤ්ඤයන්ගේ ඵලයනුයි **සාමඤ්ඤ ඵලානියි.** නිර්වාණය වනාහි සියල්ලෙන් අසම්මිශ්‍රමය, මෙසේ විස්තර වශයෙන් සත්තිස් බෝධිපාක්ෂික ධර්ම, සිව්මග, සිව්ඵල, නිර්වාණයන්ගේ වශයෙන් සිව්සාළිස් ලෝකෝත්තර ධර්ම වේ. එයින් සංක්ෂේපයෙන් සිව්මග සිව්ඵල වශයෙන් නව ලොව්තුරු ධර්මයි. එයින්ද සංක්ෂේපයෙන්ද, මාර්ග, ඵල, නිර්වාණයන්ගේ වශයෙන් ලෝකෝත්තර ධර්මත්‍රයයක් යයි දතයුතුය. සතිපට්ඨානාදීන්ගේද, මාර්ගඵලයන්ගේද, ලෝකෝත්තරත්වය කී කල්හි ඒ හා සම්ප්‍රයුක්ත ස්පර්ශාදීන්ගේද, ලෝකෝත්තරත්වය යු.සේයි. ප්‍රධාන ධර්ම වශයෙන් සතිපට්ඨානාදීහුම යුසේයි. අභිධර්මයෙහිද, ලෝකෝත්තර ධර්ම නිර්දේශයෙහි මාර්ගඵල සම්ප්‍රයුක්ත ස්පර්ශාදීන්ගේ ලෝකෝත්තරත්වය යුසේයි.

**ලොකං තරනති** යනු ලෝකය ඉක්මවති. මෙහි සියලුම මෙවැනි වර්තමාන කාලවචන සිව් ආර්ය මාර්ග සඳහා යූ.සේයි. සෝවාන් මාර්ගය අපාලොව තරණය කරයි. සකෘදාගාමී මාර්ගය කාමාවචර ලෝකයෙහි එක් කොටසක් තරණය කරයි. අනාගාමී මාර්ගය කාමාවචර ලෝකය තරණය කරයි. අර්හත් මාර්ගය රූපාවචර අරූපාවචර ලෝකය තරණය කරයි. **ලොකා උතතරනති** යනු ලෝකයෙන් උඩට නැගේ. (මතුවේ). **ලොකතො** යිද **ලොකමහා** යිද පංචමී වචනයෙන් වෙසෙසා දක්වන ලදී. **ලොකං සමතිකකමනති** යනු පළමුව කියන ලද අර්ථයමය. එහි උපසර්ගාර්ථය අනපේක්ෂිතව යූ.සේයි. මෙහි උපසර්ගාර්ථය සහිතව යූසේයි. **ලොකං සමතිකකනතා** යනු කියන ලද ආකාර ලෝකය මනාව ඉක්මවූවාහු, මෙහි සියලුම මෙවැනි අතීත කාල වචන ඵල, නිර්වාණයන් සඳහා යූ.සේයි. සෝවාන් ඵලාදීහුද කියන ලද ආකාරැති ලෝකය ඉක්මවා සිටියහ. හැමකල්හි නිර්වාණය මුළු ලොව ඉක්මවා සිටියේය. ලොකෙන අතිරෙකා යනු ලෝකයෙන් අධික වූවාහු, මෙය සියලුම ලෝකොත්තර ධර්මයන් සඳහා යූ.සේයි. **නිගගචඡනති** යනු නික්මෙත්. **නිසසටා** යනු නික්මුණාහු, **ලොකෙ න තිටඨනති** යනාදී අටලොස් වචන සියලු ලෝකෝත්තරයන්හි යෙදේ. **න තිටඨනති** යනු ලෝකයෙහි ඇතුළත් නොවුණු හෙයිනැයි යූසේයි. **ලොකෙ න ලිමපති** යනු සන්තානයෙහි පැවැතියේද, එහි නොතැවරේ යයි අර්ථයි. නොකරන ලද ප්‍රතිවේධ ඇති සමහරුන්ගේ සිතින්, කළ ප්‍රතිවේධ ඇතියවුන්ට, අදක්‍ෂ, අසමත් සිතින් නොඇලේ යයි අර්ථයි. **අසංලිතතා අනුපලිතතා** යනු උපසර්ගයෙන් විශේෂිතව දක්වයි. **විපපමුතතා** යනු නොතැවරුණු භාවයම නොයෙක් අක්‍ෂරයන්ගෙන් වෙසෙසා දැක්වීය. යම්කිසිවෙක් වනාහි යම්තැනක, යමකින් හෝ නොතැවරුණාහුද, ඔවුහු එහි එයින් මිදුණාහි වෙති. **ලොකාවිපපමුතතා** ආදී ත්‍රයයි පංචමී විභක්ති වශයෙනි. **විසඤඤුතතා** යනු මිදුණහුට විශේෂණයකි. යම්කිසිවෙක් යම්තැනක, යමක් කරණකොට, යම්තැනක පටන් මිදුණාහුද, ඔවුහු එහි එයින් එතැන් පටන් විසංයුක්ත නම් වෙති. **ලොකා සුජඣනති** යනු ලෝකමල සෝදා ලෝකයෙන් පිරිසිදු වෙති. **විසුජඣනති** යනු එය උපසර්ගයෙන් විශේෂිතයි. **උටඨහනති** යු ලෝකයෙන් නැගී සිටියාහු වෙති. **විවටටනති** යනු නවතිත්. **නිසසජනති** යනු නොලැගෙත්. **නගයහනති** යනු නොගනිත්. **නබජඣනති** යනු නොපෙළත්. **සමුචඡිඥනති** යනු නොපැවැත්ම කරති. යම්සේ **ලොකං සමුචඡිනනතතා** යනු එසේම ලෝකයෙන් විශුද්ධ හෙයිනැයි ආදිය යූසේයි.

**පටිප්පස්සම්භෙන්ති** යනු නිරුද්ධ කරති. **අප්පථා** යන ආදී සතර සියලු ලෝකෝත්තරයන්හි යෙදේ. **අප්පථා** යනු නොමගයි. **අගති** යනු නොපිහිටයි. **අවිසයා** යනු අයත් නොවූවාහු, **අසාධාරණා** යනු අසමාන වූවාහු, **වමන්ති** යනු වමනය කරති. න පච්චා වමන්ති යනු කියන ලද්දට ප්‍රතිපක්ෂ වශයෙන් යූසේයි. වමනය කරන ලද්දක් නැවත අනුභව නොකෙරෙත් යන අර්ථයි. එයින් වමනය කරන ලද්දෙහි මනාව වමනය කරන ලද බව යූ.සේයි. අනතුරු ද්විකත්‍රයයෙහිද එම ක්‍රමයමැයි.

**විසීනෙන්ති** යනු විසුරුවත්. මුදත්. නොබඳිත්යයි අර්ථයි. න **උස්සීනෙන්ති** යනු නොවිසුරුවති. නොමුදති. 'විසිනෙන්ති න උස්සිනෙන්ති' යයි හ්‍රස්වකොට පාඨය වඩා සුන්දරය. **විධූපෙන්ති** යනු නිවති. න **සංධූපෙන්ති** යනු නොදල්වත්. **ලොකං සමතික්කම්ම අභිභුය්‍ය තිට්ඨන්ති** යනු සියලුම ලෝකෝත්තර ධර්මයෝ ලෝකය මනාව ඉක්මවා මැඩ පවත්වා සිටිත්නුයි ලොකුත්තරයි. මෙම සියලුම කියන ලද ආකාරයන්ගෙන් ලෝකෝත්තරයන්ගේ, ලෝකයෙන් එතෙරවීම් භාවය, අධික භාවය යූ.සේයි.

ලෝකෝත්තර කථා වර්ණනා නිමි.

ලෝකෝත්තර කථාවට අනතුරුව කියන ලද, ලෝකෝත්තර කථා ප්‍රවෘත්තියෙහි සූත්‍රාන්ත පූර්වංගම බලකථායෙහි පෙර නුවූ විරූ අර්ථ අනුවර්ණනාවයි. එහි පළමුයෙන් සූත්‍රාන්ත වශයෙන් පඤ්ච බලයන් ගෙනහැර දක්වා, එයින් අන්‍ය වූද බලයන් දක්වනු කැමැතියේ, **අට්ඨ සට්ඨී බලානි** ආදිය වදාළහ. සියල්ලම එයට ප්‍රතිපක්ෂයන්ගෙන් කම්පා නොවන අර්ථයෙන් බල නම් වේ. හිරිබලං යනාදීන්හි එය කරණකොට පාපය කෙරෙන් ලජ්ජා වේනුයි **හිරියි**. එය ලජ්ජාවට නාමයකි. පාපය කෙරෙන් එය කරණකොට බිය වේනුයි **ඔත්තප්පංයි**. එය පාපය කෙරෙන් තැතිගැන්මට නාමයකි. ලජ්ජාව ආධ්‍යාත්මිකව හටගනී. බිය බාහිරව හටගනියි. ලජ්ජාව ආත්මධිපතියි. බිය ලෝකාධිපතියි. හිරිය ලජ්ජා ස්වභාවයෙහි පිහිටියේය. ඔත්තප්පය බිය ස්වභාවයෙහි පිහිටියේය. තමා ගැන ගෞරව ස්වභාව ඇතියේ හිරියි. වරදෙහි බියජනක ස්වභාවය හා බියදක්නා සුලු ලක්‍ෂණය ඔත්තප්පයයි. එම ලජ්ජාවම, ලජ්ජා නොමැති ස්වභාවයෙන් කම්පා නොවේනුයි **හිරිබලංයි**. එම බියම, නොබියවීමෙන් කම්පා නොවේනුයි **ඔත්තප්පබලංයි**. නුවණින් සලකා නොබැලීමෙන්

කම්පා නොවේනුයි **පටිසංඛානබලංයි.** විමසා බැලීමේ ප්‍රඥාවට එය නාමයකි. වීර්ය ශීර්ෂයෙන් සප්ත බොධ්‍යංගයන් වඩන්නහුට උපන් බලය **භාවනා බලංයි.** එසේ පැවැති සිව් ස්කන්ධයන්ට එය නාමයකි.

පිරිසිදු සීලාදීන් **අනවජ්ජබලංයි.** සතර සංග්‍රහ වස්තූන් **සංගහබලංයි.** සංගහෙබලංයිද පාඨයි. දුක පිළිබඳ ඉවසීම **ඛනතිබලංයි.** දැහැමි කථායෙන් අන්‍යයා තෘප්තියට පත්කිරීම **පඤ්ඤත්තිබලංයි.** කියන ලද්දෙහි අර්ථාවබෝධයට පැමිණීම **නිජ්ඣත්තිබලංයි.** කුසලයන්හි බහුලභාවය **ඉසසරියබලංයි.** කුසලයන්හි කැමැති පරිදි පිහිටීම **අධිට්ඨානබලංයි.** හිරිබලාදීන්ගේ අර්ථය මාතෘකා පදයන්හි අක්ෂර වශයෙන් විශේෂයෙන් යෙදෙන ආකාරය ගෙන යුසේයි. **සමථබලං විපසසනා බලං** යනු බලවත් භාවයට පත් සමථ විදර්ශනාමය.

මාතෘකා නිර්දේශයෙහි, **අසසද්ධියෙ න කමපතීති සද්ධාබලං** යනු මුල් බලාර්ථය කියා එයම වෙනත් නව(9) ක්‍රමයන්ගෙන් වෙසෙසා දැක්වීය. යම් ධර්මයක් වනාහි කම්පා නොවූයේ බලප්‍රාප්ත වේද, එය සමග හටගත් දැයට රුකුල් දෙයි. තමාට ප්‍රතිපක්ෂ කෙලෙසුන් හාත්පසින් ක්ෂය කරයි. ප්‍රතිවේධයට මුල්වූ සීලයද, දෘෂ්ටියද පිරිසිදු කරයි. සිත අරමුණෙහි පිහිටුවයි. සිත ප්‍රභාස්වර කරනුයේ පිරිසිදු කරයි. වසඟයට පමුණුවනුයේ විශේෂයන් අවබෝධ කරවයි. ඉන් මතුයෙහි පමුණුවනුයේ, මත්තෙහි ප්‍රතිවේධ කරවයි. ක්‍රමයෙන් ආර්යමාර්ගයට පමුණුවා සිව්සස් අවබෝධ කරවයි. ඵල ප්‍රාප්තියෙන් නිරෝධයෙහි පිහිටුවයි. එහෙයින් නව(9) අයුරෙකින් බලාර්ථය වෙසෙසා දැක්වීය. වීර්ය බලාදී සතරෙහිද එම ක්‍රමයමැයි.

**කාමච්ඡන්දං හිරීයතී** යනු නෛෂ්ක්‍රම්‍යයුක්ත යෝගියා **නෙකඛම්මෙන** කාමච්ඡන්දය කෙරෙන් ලජ්ජා වේ. ඔත්තප්පයෙහිද එම ක්‍රමයමැයි. එම සියලු අකුසලයන්ගෙන් ලජ්ජාවීම බියවීම යුසේයි. බ්‍යාපාදං යනාදීන්ගේද මෙම ක්‍රමයෙන් අර්ථය දතයුතුය.

**පටිසංඛා** යනු මුළානොවීම් වශයෙන් ආදීනව වශයෙන් මනාව නුවණින් පිරික්සයි. **භාවෙති** යනු වඩයි. **වජ්ජං** යනු රාගාදී දෝෂයයි. **සංගණ්හාති** යනු බඳියි. **ඛමති** යනු එම යෝගීහට ඉවසයි. රිසි වේ. **පඤ්ඤාපෙති** යනු සතුටු කරයි. **නිජ්ඣාපෙති** යනු චින්තනය කරවයි.

(ශ්‍රැතාර්ථ විමර්ශන) **වසං වත්තෙති** යනු සිතෙහි බොහෝම, සිත තම වශයෙහි කොට පවත්වයි. **අධිට්ඨාති** යනු නියම කරයි. භාවනා බලාදී සියල්ලම නෛෂ්ක්‍රම්‍යාදීහුමය. මාතෘකා වර්ණනායෙහි අන් අයුරෙකින් යුසේයි. අර්ථය වනාහි ව්‍යඤ්ජන වශයෙන්ම ප්‍රකට හෙයින් මෙහි නොකියන ලදැයි දතයුතුය. සමථ බලයද, විදර්ශනා බලයද විස්තර වශයෙන් නිර්දේශකොට අවසානයෙහි **උද්ධච්ච සහගත කිලෙසෙච ඛන්ධෙච න කම්පති** යන ආදියද, **අවිජ්ජා සහගත කිලෙසෙච ඛන්ධෙච න කම්පතී** යනාදියද සමථබල, විදර්ශනා බලයන්ගේ ලක්‍ෂණ දැක්වීම සඳහායි යුසේයි.

ශෛක්‍ෂ්‍ය, අශෛක්‍ෂ්‍ය බලයන්හි, **සම්මාදිට්ඨිං සික්ඛතීති සෙඛබලං** යනු ශෛක්‍ෂ්‍ය පුද්ගලයා සම්‍යග් දෘෂ්ටියෙහි හික්මේනුයි ශෛක්‍ෂ්‍යයි. ඒ සම්‍යග් දෘෂ්ටිය එම ශෛක්‍ෂ්‍යයාගේ බලයනුයි ශෛක්‍ෂ්‍ය බලය යයි අර්ථයි. **තත්ථ සික්ඛිතත්තා අසෙඛ බලං** යනු, අශෛක්‍ෂ්‍ය පුද්ගලයා සම්‍යග් දෘෂ්ටියෙහි ශික්‍ෂිත බැවින් නොහික්මේනුයි අශෛක්‍ෂ්‍යයි. එම සම්‍යග් දෘෂ්ටියම එම අශෛක්‍ෂ්‍යයාගේ බලයනුයි අශෛක්‍ෂ්‍ය බලයයි. සම්‍යග් සංකල්පාදියෙහිද එම ක්‍රමයමැයි. **සම්මා ඤාණං** යනු ප්‍රත්‍යවේක්‍ෂා ඥාණයයි. එයද ලෞකික වනුයේ ශෛක්‍ෂ්‍යයාට පැවැති හෙයින් ශෛක්‍ෂ්‍ය බලයයි, අශෛක්‍ෂ්‍යයාට පැවැති හෙයින් අශෛක්‍ෂ්‍ය බලයැයි යුසේයි.

**සම්මා විමුත්ති** යනු මාර්ගාංග හැර සෙසු බල සම්ප්‍රයුක්ත ධර්මයි. සමහරු වනාහි ලෝකෝත්තර විමුක්තිය හැර සෙසු විමුක්තීහු සම්මා විමුත්ති යැයි කියති. එහි ශෛක්‍ෂ්‍ය, අශෛක්‍ෂ්‍ය බලත්වය කියන ලද ක්‍රමයමැයි. ක්‍ෂීණාශ්‍රව බලයන්හි සියලුම ඥාණ බලයන් **ඛීණාසවස්ස භික්ඛුනොයි** කරණාර්ථයෙහි ෂෂ්ඨී වචනයි. ක්‍ෂීණාශ්‍රව භික්‍ෂුව විසිනැයි අර්ථයි. **අනිච්චතො** යනු පැවැත, අභාවයට යන ආකාරයෙන් අනිත්‍ය වශයෙන්, **යථාභූතං** යනු යථා ස්වභාවයෙන් **පඤ්ඤාය** යනු විදර්ශනා සහිත මාර්ග ප්‍රඥායෙන්, **අනිච්චතො සුදිට්ඨා, දුක්ඛතො, අනත්තතො සුදිට්ඨා හොන්ති** යන එය මූලික හෙයිනි. **යං** යනු භාව නපුංසක වචනයි. යම් කරුණෙකින් යයි හෝ අර්ථයි. **ආගම්ම** යනු හේතුකොට, **පටිජානාති** යනු පිළිගනියි පිළිණ කෙරේ. **අංගාරකාසූපමා** යනු මහත් දැඩි උෂ්ණ අර්ථයෙන් අඟුරුවළට උපමා කරන ලද, **කාමා** යන, වස්තුකාම හා ක්ලේශ කාම, **විවෙක නින්නං** යනු එල සමවත් වශයෙන්, උපධි විවේක සංඛ්‍යාත නිර්වාණ නිම්න වූයේ, කාය, චිත්ත, උපධියයි විවේක ත්‍රයයකි. කාය විවේකය නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණවුන්ගේ ශාරීරික විවේකස්ථායී

භාවයයි. චිත්ත විවේකය අධිචිත්තයන්හි (ධ්‍යාන සමාධි) යෙදුණවුන්ගේ වශයෙනි. උපධි විවේකය ලෞකික දැයින් වෙන්වූ උපධි රහිත පුද්ගලයින්ගේ වශයෙනි. නිස්සරණ විවේක සංඛ්‍යාත නිර්වාණ නිම්න වූවන්ගේ වශයෙන් හෝ වේ. විෂ්කම්භන, තදංග, සමුච්ඡේද, පටිපපසසදධි, නිසසරණ යනුවෙන් විවේක පස් අයුරෙකින්ද වේ. **විවෙක නිනනං** යනු විවේකයට නැඹුරුවූයේ, **විවෙක පොණං** යනු විවේක ප්‍රවණ වූ, **විවෙකං පබභාරං** යනු විවේකයට බැහැවුම් ඇති, ද්වයයම ප්‍රථම වචනයට පර්යායයි. **විවෙකටඨං** යනු කෙලෙසුන්ගෙන් වර්ජිත වූයේ දුරුවූයේ, **නෙකඛමමාභිරතං** යනු නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණා වූ හෝ ප්‍රව්‍රජ්‍යායෙහි ඇලුණා වූ, **බ්‍යනතිභූතං** යනු විගතාන්ත වූයේ, එක් කොටසකින් හෝ නොඇලුණේ, මිදුණේ වෙන්වූයේ, සබබසො යනු සර්වප්‍රකාරයෙන්, **ආසවටඨානීයෙහි ධමෙමහි** යනු සම්ප්‍රයෝග වශයෙන් ආශ්‍රවයන්ට හේතු වූ, කෙලෙස් ධර්මයන්ගෙන් යයි අර්ථයි. නොහොත් **බ්‍යනතිභූතං** යනු පහවූ තෘෂ්ණාවෙන් යුක්තවූයේ, තෘෂ්ණා රහිත යැයි අර්ථයි. කොතැනින්ද, **සබබසො ආසවටඨානීයෙහි ධමෙමහි** යනු සියලු ත්‍රෛභූමික ධර්මයන්ගෙන් යන අර්ථයි. මෙහි දශ ක්ෂීණාශ්‍රව බලයන්ගෙන් යුක්ත රහත්හුගේ ලෞකික ලෝකෝත්තර මාර්ගය කියන ලදී. 'අනිචචතො සඞ්ඛ සංඛාරා' යනු දුක සම්පූර්ණයෙන් දැනීමේ බලයයි. 'අංගාරකාසූපමා කාමා' යනු දුක්ඛ සමුදයෙහි ප්‍රහාණ බලයයි. 'විවෙක නිනනං චිතතං හොති' නිරෝධය සාක්ෂාත් කිරීමේ බලයයි. 'චතතාරො සතිපටඨානා' ආදිය සත්වැදෑරුම් මාර්ග භාවනා බලය යැයිද කියති. දස ඍද්ධි බල ඍද්ධි කථායෙහි ප්‍රකට වන්නේය.

තථාගත බල නිර්දේශයෙහි, **තථාගත බලානි** යනු අන්‍යයන් හා අසාධාරණ තථාගතයන් වහන්සේගේම බලයෝය. යම්සේ හෝ පෙර බුදුවරුන්ගේ බල, පුණ්‍යබහුල සම්පත්තියෙන් පැමිණියාහු, එසේ පැමිණියා වූ බල යයිද අර්ථයි. එහි තථාගත බල දෙයාකාරය. කායබලය හා ඥාණබලය වශයෙනි. එහි කාය බලය ඇත්කුල අනුසාරයෙන් දතයුතුය. එය පෞරාණිකයන් විසින් කියන ලද්දේමය.

**කාලාවකඤච ගංගෙය්‍යං - පණඩරං තමබ පිංගලං**
**ගනධ මංගල හෙමඤච - උපොසථ ඡදදනති මෙ දසා'ති**

මේවා දස ඇත් කුලයෝය. එහි කාලාවකං යනු ප්‍රකෘති ඇත්කුලය දතයුතුය. පුරුෂයින් දස දෙනෙකුන්ගේ යම් කාය බලයක් වේද, එය එක්

කාලාවක හස්තියෙකුගේ බලයයි. කාලාවකයින් දසදෙනෙකුන්ගේ යම් බලයක් වේද, එය එක් ගංගෙය්‍ය හස්තියෙකුගේ බලයයි. ගංගෙය්‍ය හස්තීහු දස දෙනෙකුන්ගේ යම් බලයක් වේද, එය එක් පණ්ඩර හස්තියෙකුගේ බලයයි. පණ්ඩර හස්තීහු දස දෙනෙකුන්ගේ යම් බලයක් වේද, එය එක් තම්බ හස්තියෙකුගේ බලයයි. තම්බ හස්තීහු දස දෙනෙකුන්ගේ යම් බලයක් වේද එය එක් පිංගල හස්තියෙකුගේ බලයයි. පිංගල හස්තීහු දස දෙනෙකුන්ගේ යම් බලයක් වේද, එය එක් ගන්ධ හස්තියෙකුගේ බලයයි. ගන්ධ හස්තීහු දස දෙනෙකුන්ගේ යම් බලයක් වේද, එය එක් මංගල හස්තියෙකුගේ බලයයි. මංගල හස්තීහු දස දෙනෙකුන්ගේ යම් බලයක් වේද, එය එක් හේමවත හස්තියෙකුගේ බලයයි. හේමවත හස්තීහු දස දෙනෙකුන්ගේ යම් බලයක් වේද එය එක් උපෝසථ හස්තියෙකුගේ බලයයි. එක් උපෝසථ හස්තියෙකුගේ යම් බලයක් වේද එය එක් ඡද්දන්ත හස්තියෙකුගේ බලයයි. ඡද්දන්ත හස්තීහු දස දෙනෙකුන්ගේ යම් බලයක් වේද, එය එක් තථාගතයන් වහන්සේගේ බලයයි. මෙයම නාරායණ සංඝාත බලය යයි යූසේයි.

එය ප්‍රකෘති (සාමාන්‍ය) හස්තීන්ගේ ගණනින් හස්තීහු කෝටි ලක්‍ෂයකි. මිනිස් ගණනින් පුරුෂයින් දසදෙනෙකුන් එක්කොට ගත් කල එවැනි පුරුෂ (මිනිස්) බල කෝටි දහසක් වේ. මෙය තථාගතයන් වහන්සේගේ කාය බලයයි.

ඤාණ බලය වනාහි මෙහිද පෙළෙහි අන් තන්හිද සඳහන් අයුරුමය. දසබල ඤාණය මජ්ඣිම නිකායෙහි දැක්වේ. චතුර් වෛශාරද්‍ය ඤාණය අට පිරිස්හි අකම්ප්‍ය ඤාණය, සිව්යෝනි පිරිසිඳ දක්නා ඤාණය, පඤ්චගති පිරිසිඳ දක්නා ඤාණය සංයුක්ත නිකායාගත තෙසැත්තෑ ඤාණ, සත් සැත්තෑ ඤාණදැයි මෙසේ අන්‍ය වූ නොයෙක් ඤාණ දහස් ගණනකි. එය ඤාණ බලනමැ. මෙහිද ඤාණ බලයම අදහස් කරන ලදී. ඤාණය වනාහි අකම්ප්‍යාර්ථයෙන්ද, රැකුල් දෙන අර්ථයෙන්ද බලය යැයි යූසේයි.

ඨානඤ්ච ඨානතො යනු හේතුව හේතුව වශයෙන්, යම් හෙයකින් හේතුව වනාහි එහි ඵලයට පැමිණ සිටීද? එයට අයත් පැවතුම් ඇති හෙයින් හටගනීද? පවතීද? එහෙයින් හේතුවයැයි කියයි. එය භාග්‍යවතුන් වහන්සේ යම් යම් ධර්මයන්ගේ ඉපැත්ම සඳහා යම් යම් ධර්ම හේතුප්‍රත්‍යය වේද? ඒ ඒ දේ හේතුව නම් වේ. යම් යම් ධර්ම යම් යම් ධර්මයන්ගේ ඉපැත්ම සඳහා හේතුප්‍රත්‍යය නොවේද, ඒ ඒ කරුණ අහේතුව යැයි

දන්නේ හේතුවද, හේතු වශයෙන් අහේතුවද අහේතු වශයෙන් තත්වාකාරයෙන් දැනගනී. (දනී)

**යම්පි** යනු යම් ඤාණයකින්, **ඉදම්පි** යනු මෙම ඨානා ඨානඤාණය, තථාගතයන් වහන්සේගේ තථාගත බලය නම් වේයයි අර්ථයි. සෙසු පදයන්හිද මෙසේ යෙදීම දතයුත්තාහ.

**ආසභණ්ඨානං** යනු ශ්‍රේෂ්ඨ ස්ථානය, උතුම් ස්ථානය, ශ්‍රේෂ්ඨ වූ හෝ පූර්ව බුදුවරු, ඔවුන්ගේ ස්ථානයයි අර්ථයි. තවද ගවයින් සියයක ප්‍රධාන ගවයා වෘෂභයි. ගවයින් දහසක ප්‍රධාන ගවයා වසභයි. ගාල් සියයක ප්‍රධාන ගවයා හෝ වෘෂභයි. ගාල් දහසක ප්‍රධාන ගවයා වසභයි. සියලු ගවයින්ට ශ්‍රේෂ්ඨ, සියලු උවදුරු උසුලන, ශ්වේත වර්ණ, ප්‍රසාදාවහ මහබර උසුලන, හෙන හඬ සියයකින්ද, සන්ත්‍රාසයට පත් නොවනුයේ නිසභයි. එය මෙහි වෘෂභයයි අදහස් කරන ලදී. මෙයද එයට පර්යාය වචනයයි. මෙය වෘෂභයාට නුයි ආසභංයි. **ඨානං** යනු සිව් පාදයන්ගෙන් පෘථුවිය මැඩ නොසෙල්වී සිටීමයි. මෙය වනාහි ආසභයකු මෙනැයි ආසභං නම් වේ.

යම්සේ වනාහි නිසභ සංඛ්‍යාත වෘෂභයා වෘෂභ බලයේ යුක්ත වූයේ, සිව් පාදයන්ගෙන් පෘථුවිය මැඩ නොසෙල්වන සිටීමෙන් සිටියිද, එසේ තථාගතයන් වහන්සේද දස තථාගත බලයන්ගෙන් යුක්ත වූයේත් චතුර් වෛශාරද්‍ය පාදයන්ගෙන්, අටපිරිස නමැති පෘථුවිය මැඩ සදේවක ලෝකයෙහි කිසි සතුරෙකු පස මිතුරෙකු විසින් අකම්පා‍ය වූ සේක් නොසැලෙන සිටීමෙන් සිටිත්. මෙසේ සිටිනු ලබන්නා වූද, එතුමාණෝ ශ්‍රේෂ්ඨ ස්ථානය පිළිණ කෙරෙත්. එළැඹෙත්. අත්හැර නොදමත්. තමා කෙරෙහි ආරෝපණය කරත්. එහෙයින් **ආසභණ්ඨානං පටිජානාතියි** යූසේයි.

**පරිසාසු** යනු ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ, චාතුර්මහා රාජික, තාවතිංස, මාර, බ්‍රහ්ම වශයෙන් වන අටපිරිස්හි, **සීහනාදං නදති** යනු ශ්‍රේෂ්ඨ නාදය, අභීත නාදය නාදකරයි. සිංහනාදය හා සමවූ නාදය නාදකරයි. මෙම අර්ථය සීහනාද සූත්‍රයෙන් දැක්විය යුතුය. යම්සේ වනාහි සිංහයා ඉවසන හෙයින්ද, නසන හෙයින්ද සිංහයයි කියනු ලැබේ. මෙසේ තථාගතයන් වහන්සේ ලෝකධර්මයන් ඉවසන හෙයින්ද, පරප්‍රවාදයන් නසන හෙයින්ද සිංහයයි යූසේයි. මෙසේ කියන ලද

සිංහයාගේ නාදය සිංහනාදයයි. එහි යම්සේ සිංහයා සිංහ බලයෙන් යුක්ත වූයේ හැමතැන නිර්භය වූයේ, පහවූ ලොමුඩැහැ ගැනීම් ඇතියේ සිංහනාදය කරයි. මෙසේ තථාගත සීහරාජයාණෝද, තථාගත බලයන්ගෙන් යුක්ත වූයේ, අට පිරිස්හි නිර්භය වූයේ, පහවූ ලොමුඩැහැ ගැනීම් ඇතියේ 'මෙසේ රූප'යැයි ආදී ක්‍රමයෙන් නොයෙක් ආකාර දේශනා විලාසයන්ගෙන් යුක්ත වූයේ සිංහනාදය නාදකරයි. එහෙයින් **පරිසාසු සීහනාදං නදති. බ්‍රහ්ම චක්කං පවත්තෙතියි** යුසේයි. මෙහි බ්‍රහ්ම යනු ශ්‍රේෂ්ඨ උතුම්, අතිපරිශුද්ධ යන අර්ථයි.

මෙම චක්ක ශබ්දය වනාහි,

> **සම්පත්තියං ලක්ඛණෙච - රථංගෙ ඉරියාපථෙ**
> **දානෙ රතන ධම්මුර චක්කාදිසුච දිස්සති**
> **ධම්ම චක්කෙ ඉධ මතො - තම්පි ද්වෙධා විභාවයෙ**

මහණෙනි, යම් කරුණුවලින් යුක්ත වූ, දෙවි මිනිසුන්ට අදාලවන මෙම චක්‍ර සතරෙකි. යනාදීන්හි මෙය වස්තු සම්පතෙහි දිස්වේ. යට පාද තලයන්හි චක්‍ර හටගත්තාහු වෙති යන මෙහි ලක්ෂණයෙහිය. පා අනුව උසුලන චක්‍රය මෙනි. මෙහි රිය අංගයෙහි 'රෝද සතරෙකි. ද්වාර නවයකි' මෙහි ඉරියව්හි, 'දන්දෙව, අනුභව කරව, පමා නොවෙව කෝසලාධිපතිය චක්‍රය පවත්වව' යන මෙහි දානයෙහි, 'දිව්‍ය චක්‍ර රත්නය පහළවිය' මෙහි රත්න චක්‍රයෙහිය' 'මා විසින් පවත්වන ලද චක්‍රය' මෙහි ධර්ම චක්‍රයෙහිය, 'ආශාව නට පුරුෂයාගේ මස්තකයෙහි චක්‍රය කැරකේ.' මෙහි උර(ළය) චක්‍රයෙහිය. 'මුවහත කෙළවර කොටැති චක්‍රයෙන්' මෙහි ප්‍රහාර දීමේ චක්‍රයෙහි, 'අසනි චක්කං' යන මෙහි හෙණ මණ්ඩලයෙහි, මෙහි වනාහි මෙය ධර්මචක්‍රයෙහි දන්නා ලදී. එම ධර්ම චක්‍රය දෙවදෑරුම් වේ. ප්‍රතිවේධ ඤාණයද, දේශනා ඤාණයද වශයෙනි. එහි ප්‍රඥාවෙන් මනාව වඩනා ලදුයේ තමාගේ ආර්යඵල එළවනුයේ ප්‍රතිවේධ ඤාණයයි. කරුණාවෙන් මනාව වඩනා ලදුයේ, ශ්‍රාවකයින්ගේ ආර්යඵල එළවනුයේ දේශනා ඤාණයයි. එහි ප්‍රතිවේධ ඤාණය, උපදිනු ලබනුයේ, උපන්නේය යැයි දෙවදෑරුම්ය. එහි අභිනිෂ්ක්‍රමණයෙහි පටන් අර්හත් මාර්ගය තෙක් උපදිනු ලබන්නේ නම් වේ. ඵලක්ෂණයෙහි උපන්නේ නමැ. තුෂිත භවනයෙහි පටන්, බෝමැඩ අර්හත් මාර්ගය තෙක් උපදිනු ලබන්නේ නමැ. ඵලක්ෂණයෙහි උපන්නේ නමැ. දීපංකර දශබලධාරීන් වහන්සේගේ පටන් අර්හත් මාර්ගය තෙක් උපදිනු ලබන්නේ නමැ. ඵලක්ෂණයෙහි උපන්නේ

නමැ. දේශනා ඤාණයද පවත්වනු ලබන්නේ හා පැවැත්වියයි දෙයාකාරය. එය වනාහි අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන්ගේ අර්හත් මාර්ගය තෙක් පවත්වනු ලබන්නේ නමැ. ඵලක්ෂණයෙහි පැවැත්වූයේ නමැ.

එහි ප්‍රතිවේධ ඤාණය ලෝකෝත්තරය. දේශනා ඤාණය ලෞකිකය. එම ද්වයයම අනෙක් ඒවා හා අසධාරණය. බුදුවරුන්ගේම ඖරස ඤාණයෝය. එහෙයින් බ්‍රහ්මචක්‍රය පවත්වයි යයි යූ.සේයි. **කම්මසමාදානානං** යනු සමාදන්ව කරන ලද කුසලාකුසල කර්මයන්ගේ, කර්මයම හෝ කර්ම සමාදානංයි. **ඨානසො හෙතුසො** යනු ප්‍රත්‍යය වශයෙන්ද හේතු වශයෙන්ද, එහි උපදනා ස්ථානය, ඉපදීමට හේතුව-කාලය, ප්‍රයෝගය විපාකයට ප්‍රත්‍යයයි. කර්මය හේතුයි. **සබ්බත්‍ථ ගාමිනිං** යනු සියලු ගතිවලට හා අගතිවලට පමුණුවන්නා වූද **පටිපදං** යනු මාර්ගයයි. **යථාභූතං පජානාති** යනු බොහෝ මිනිස්සු එකම ප්‍රාණියෙකු ඝාතනය කරන කල්හි, මොහුගේ චේතනාව නිරයගාමී වන්නේය. මොහුගේ චේතනාව තිරිසන් යෝනිගාමියයි. මෙම ක්‍රමයෙන්, එක් කරුණෙක්හිද, කුසලා කුසල චේතනා සංඛ්‍යාත ප්‍රතිපත්තීන්ගේ වෙනසක් නොවන අයුරින් ස්වභාවානුකූලව දනිති. **අනෙකධාතු** යනු චක්‍ෂුධාතු, කාමධාතු ආදී ධාතූන්හි ඇතුළත් බොහෝධාතු, **නානාධාතු** යනු එම ධාතූන්ගේම විශේෂ ලක්‍ෂණතාවයෙන් නානාප්‍රකාර ධාතු, **ලොකං** යනු ස්කන්ධ, ආයතන ධාතු සංඛ්‍යාත ලෝකය, **යථාභූතං පජානාති** යනු ඒ ඒ ධාතූන්ගේ අවිපරීත ස්වභාවය අවබෝධ කරයි. **නානාධිමුත්තිකතං** යනු හීන, පණීතතාදී සංකල්පනයන්හි, නොයෙක් සංකල්පන ස්වභාවය, **පරසත්තානං** යනු ප්‍රධාන සත්ත්වයින්ගේ, **පර පුග්ගලානං** යනු එයින් අන්‍ය වූ හීන සත්ත්වයින්ගේ, එම පද ද්වයයම ඒකාර්ථමය. හික්මවිය යුතු පුද්ගලයින්ගේ වශයෙන් දෙයාකාරයෙන් යූසේයි. මෙහිද භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද අයුරින්ම යූසේයි. **ඉන්ද්‍රිය පරොපරියත්තං** යනු ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ පර භාවයද අපරභාවයද, වෘද්ධියද හානියදැයි අර්ථයි. **ඣාන විමොක්ඛ සමාධි සමාපත්තීනං** යනු ප්‍රථමාදී සිව් ධ්‍යානයන්ගේද, රූපී රූපානි පස්සති යනාදී අෂ්ට විමෝක්ෂයන්ගේද සවිතර්ක, සවිචාරාදී ත්‍රිවිධ සමාධීන්ගේද, ප්‍රථම ධ්‍යාන සමවත් ආදී නව අනුපූර්ව සමාපත්තීන්ගේද වශයෙනි. **සංකිලෙසං** පිරිහීම් ප්‍රවණතා සහිත ධර්මයයි. **වොදානං** යනු දියුණුවට පමුණුවන ධර්මයයි. **වුට්ඨානං** යනු යම් කාරණයකින් ධ්‍යානාදීන්ගෙන් නැගිටිත්ද, එම කරුණයි, එය වනාහි 'වොදානයද වුට්ඨානයයි. ඒ ඒ සමාධියෙන් නැගිටීමද වුට්ඨාන'යැයි මෙසේ කියන ලද ප්‍රගුණ ධ්‍යානයද, භවංගයද, ඵල

සමාපත්තීහුද වෙති. 'යට යට යනු ප්‍රගුණ ධ්‍යානය මතු මතු ධ්‍යානයන්ට ආසන්න කාරණය වේ.' එහෙයින් වොදානයද වුට්ඨානයැයි යූ.සේයි. භවංගයෙන් වනාහි සියලු ධ්‍යානයන්ගෙන් නැගිටීම වේ. නිරෝධ සමාපත්තියෙන් ඵල සමවතෙහි නැගිටීම වේ. ඒ සඳහා 'ඒ ඒ සමාධියෙන් නැගී සිටීමද වුට්ඨාන'යැයි යූ.සේයි. පූර්වේනිවාස, දිව්‍යචක්‍ෂු, ආශ්‍රවක්‍ෂයකර ඥාන යට ප්‍රකාශිතමය.

එහි **ආසවානං ඛයා** යනු අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙසුන්ගේ ක්‍ෂය කිරීමයි. **අනාසවං** යනු ආශ්‍රව විරහිත භාවයයි. **චෙතො විමුත්තිං පඤ්ඤා විමුත්තිං** යන මෙහි චෙතො යන වචනයෙන් අර්හත් ඵල සම්ප්‍රයුක්ත සමාධිය ගැනේ. පඤ්ඤා වචනයෙන් ඒ හා සම්ප්‍රයුක්ත ප්‍රඥාව යූ.සේයි. එහිද සමාධිය රාගයෙන් මිදුණ හෙයින් චෙතො විමුක්තියි. ප්‍රඥාව අවිද්‍යාවෙන් මිදුණු හෙයින් ප්‍රඥා විමුක්තියි දතයුත්තාහ. භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. මහණෙනි, යම් ආකාර වූ සමාධියෙක් වන්නේද? එය සමාධින්ද්‍රිය වන්නේය. මහණෙනි, යම් ප්‍රඥාවක් වන්නේද, එය ප්‍රඥෙන්ද්‍රිය වන්නේය. මහණෙනි, මෙසේ වනාහි රාග විරාගයෙන් චෙතො විමුක්තියද, අවිද්‍යා විරාගයෙන් ප්‍රඥා විමුක්තියද වේ. තවද මෙහි සමථබලය චෙතො විමුක්තියි. විදර්ශනා බලය ප්‍රඥා විමුක්තියි දතයුත්තාහ. දිට්ඨෙව ධම්මෙ යනු මෙ අත්බැව්හිම, **සයං අභිඤ්ඤා සච්ඡිකත්වා** යනු අධික ප්‍රඥායෙන් තෙමේම ප්‍රත්‍යක්‍ෂ කොට, වෙනත් හේතුවකින් දැනයයි අර්ථයි. උපසම්පජ්ජ යනු අවබෝධ කොට නිෂ්පාදනය කොට හෝ, මෙම දසබල ඤාණයන්ගේ විස්තරය අභිධර්මයෙහි යූසෙයින් දතයුතුය.

එහි පරවාදී කථාවක් වෙයි. දසබල ඤාණයයි වෙන්ව ඤාණයක් නැත. මෙය සර්වඥතා ඥානයෙහිම ප්‍රභේදයකි. එය එසේ නොදතයුතුය. දසබල ඤාණය අනෙකකි. සර්වඥතාඥානය අනෙකකි. දසබල ඤාණය තම තම කිසම දනියි. සර්වඥතා ඥානය එයද, ඉන් අවසේස දෑද දනියි. දසබල ඤාණයන්හි පළමුවැන්න කාරණා කාරණයන්ම දනියි. දෙවැන්න කර්මාන්තර විපාකාන්තරයන්ම දනියි. තෙවැන්න කර්ම පිරිසිඳ දැනීමමය. සිව්වැන්න ධාතු නානත්ව කාරණයමය. පස්වැන්න සත්ත්වයින්ගේ අදහස් හා අදහස් ස්වභාවයන්, සවැන්න ඉන්ද්‍රියයන්ගේ තීක්‍ෂණ මෘදු බවමය. සත්වැන්න ධ්‍යානාදීන් සමග ඒවාහි කිලිටිවීම් ආදියමය. අටවැන්න පෙර විසූ ස්කන්ධ සන්තතියමය. නවවැන්න සත්ත්වයින්ගේ චුති ප්‍රතිසන්ධියමය. දසවැන්න සත්‍යය පිරිසිඳීමමය. සර්වඥතාඥානය වනාහි ඒවායින්

දතයුත්තද, ඉන් මත්තෙහිද දනියි. ඒවාහි සියලු කෘත්‍යයන් නොකරයි. එය වනාහි ධ්‍යානයක්ව සමවදින්ට නොහැකි වේ. ඍද්ධියක්ව විකුර්වණ නොකරයි. මාර්ගය වී කෙලෙස් ක්‍ෂය කරන්ට නොහැකි වේ. තවද පරවාදියා මෙසේ එම දශබල ඥාණය වනාහි සවිතර්ක සවිචාරද? අවිතර්ක විචාර මාත්‍රද? අවිතර්ක අවිචාරද? කාමාවචරද? රූපාවචරද? අරූපාවචරද? ලෞකිකද? ලෝකෝත්තරද යනුවෙන් විචාළ යුතුය. දන්නා තැනැත්තේ පිළිවෙළින් සත් ඥාණ සවිතර්ක සවිචාරයයි කියයි. ඉන් මත්තෙහි ද්වයය අවිතර්ක අවිචාරයයි කියයි. ආශ්‍රවක්‍ෂයකර ඥානය විටෙක සවිතර්ක සවිචාර වන්නේය. විටෙක අවිතර්ක විචාර මාත්‍ර වන්නේය. විටෙක අවිතර්ක අවිචාර යයිද කියයි. එසේම පිළිවෙළින් ඥාණ සතක් කාමාවචරය. ඉන් මතුයෙහි ද්වයයක් රූපාවචරය. ඉන් අවසානයෙහි එකක් ලෝකෝත්තරයයි කියයි. සර්වඥතාඥානය වනාහි සවිතර්ක සවිචාරමය. කාමාවචරමය. ලෞකිකමයැයි කියයි.

මෙසේ මෙහි පෙර නොවූ විරූ අර්ථ අනුවර්ණනාව දැන, දැන් තථාගතයන් වහන්සේ, ප්‍රථමයෙන්ම ඨානාඨාන ඥාණයෙන් හික්මවිය යුතු සත්ත්වයින්ගේ ආශ්‍රවක්‍ෂය අධිගමයෙහිද, අවබෝධ නොකිරීමට කාරණා කාරණ වූ, ලෞකික සම්‍යග් දෘෂ්ටියෙහි පිහිටීම දක්නා හෙයින්ද, නියත මිථ්‍යා දෘෂ්ටියගේ පිහිටීමෙහි අභාවය දක්නා හෙයින්ද, ක්ලේශාවරණ අභාවය දකියි. ඉක්බිති කර්ම විපාක ඥාණයෙන් ඔවුන්ගේ ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය දක්නා හෙයින් විපාක ආවරණ අභාවය දකියි. සබ්බත්‍ථගාමිණී ප්‍රතිපදා ඥාණයෙන්, ආනන්තරික කර්ම අභාව දක්නා හෙයින් කර්මාවරණ අභාවය දකියි. මෙසේ අනාවරණ වූවන්ට සුදුසු ධර්මදේශනා සඳහා, අනෙකධාතු නානා ධාතු ඥාණයෙන්, ධාතු වෙනස දක්නා හෙයින් චර්යා විශේෂය දකියි. ඉක්බිති නානාධිමුත්තිකතා ඥාණයෙන්, උත්සාහ නොගෙනම අදහස් වශයෙන් ධර්මදේශනා සඳහා අදහස් බලයි. මෙසේ දක්නා ලද අධිමුක්ති ඇති පුද්ගලයින්ට, ශක්තියේ, බලයේ ප්‍රමාණයෙන් දම් දෙසන්ට, ශ්‍රද්ධාදීන්ගේ තීක්‍ෂණ මෘදුභාවය දක්නා හෙයින් ඉන්ද්‍රිය පරොපරියත්ත ඥාණයෙන්, ඉන්ද්‍රියයන්ගේ උසස් පහත් බව බලයි. මෙසේ විශේෂ ඥාණයෙන් දත් ඉන්ද්‍රිය උසස් පහත් භාවයෙන් යුත් ඔවුහු ඉදින් දුර පෙදෙසක වෙත්ද? ඉක්බිති ධ්‍යානාදී ඥාණයෙන්, ධ්‍යානාදීන්හි වශී වූ හෙයින්, ඍද්ධි විශේෂයෙන් වහා එළැඹේ. එළැඹ, ඔවුන්ට පූර්වෙ නිවාසානුස්මෘති ඥාණයෙන් පූර්වජාති පැහැදිලි කිරීමද, දිව්‍යචක්‍ෂු ඥාණානුභාවයෙන් පැමිණිය යුතු, චෙතොපරිය ඥාණයෙන් දැන් පවත්නා

චිත්ත විශේෂය දක්නේ, ආශ්‍රවක්‍ෂය ඤාණානුභාවයෙන් ආශ්‍රවක්‍ෂයට පමුණුවන්නා වූ, ප්‍රතිපදාවෙන්, පහවූ මුළා ඇති හෙයින් ආශ්‍රවක්‍ෂය සඳහා ධර්මය දේශනා කරයි. එහෙයින් මෙම අනුපිළිවෙළින් මෙම දස බලයන් දෙසන ලදැයි දතයුත්තාහ.

දැන් සියලු බලයන් ලක්‍ෂණ වශයෙන් නිර්දේශ කරනු කැමැත්තේ **කෙනට්ඨෙන සද්ධාබලං** යනාදී ක්‍රමයෙන් විමසීම් කොට, **අස්සද්ධියෙ අකම්පියට්ඨෙන** යනාදී ක්‍රමයෙන් විසඳුම කළේය. එහි **හිරීයති** යනාදිය පුද්ගලාධිෂ්ඨාන දේශනායි භාවනා බලාදීන්හි අධිෂ්ඨානබල කෙළවරකොට ඇති 'එහි' 'එයින්' 'එය' යයි නෛෂ්ක්‍රම්‍යයාදියම සඳහා කියනලදැයි දතයුතුය.

**තෙන චිත්තං එකග්ගං** යනු එම සමාධියෙන් සිත එකඟ වේයයි යුසේයි. **තත්ථජාතෙ** යනු එහි සමථයෙහි සම්ප්‍රයෝග වශයෙන් හටගත්, එහි හෝ විදර්ශනාරම්මණව හටගත්, **තත්ථ සික්ඛති** යනු එහි ශෛක්‍ෂ්‍ය බලයෙහි ශෛක්‍ෂ්‍යයා හික්මේනුයි ශෛක්‍ෂ්‍ය බලයයි අර්ථයි. **තත්ථ සික්ඛිතත්තා** යනු එහි අශෛක්‍ෂ්‍ය බලයෙහි අශෛක්‍ෂ්‍යයා හික්මුණු හෙයින් අශෛක්‍ෂ්‍ය බලයයි. **තෙන ආසවාඛීණා** යනු ඒ ලෞකික ලෝකෝත්තර ඤාණයෙන් ආශ්‍රවයන් ක්‍ෂය වූයේ යයි එම ඤාණය ක්‍ෂීණාශ්‍රව බලයයි. ලෞකික ඤාණයෙන්ද ආශ්‍රවයෝ ක්‍ෂීණ වූවාහු නමැ. විදර්ශනාවගේ නොමැති කල්හි ලෝකෝත්තර මාර්ග අභාව හෙයිනි. මෙසේ ක්‍ෂීණාශ්‍රවයාගේ බලයනුයි **ක්‍ෂීණාශ්‍රව බලංයි. තස්ස ඉජ්ඣතීති ඉද්ධිබලං** එම ඍද්ධිමත්හුට සමෘද්ධ වේනුයි ඍද්ධියම බලයයි. **අප්පමෙය්‍යට්ඨෙන** යනු යම් හෙයකින් ශ්‍රාවකයෝ කාරණාකාරණාදිය එක් කොටසක් දනිත්. සර්වප්‍රකාරයෙන් දැනගැනීම සඳහා 'තත්වාකාරයෙන් දනීයයි' යු.සේයි. කිසිසේත් ත්‍රිවිද්‍යාවන්හි තත්වාකාරයෙන් දනීයයි නොයුසේයි. අන් තන්හි වනාහි කියන ලද හෙයින් ඒවාහිද කියන ලදුයේම වේ. **අඤ්ඤත්ථ** යනු සෙසු සත් ඤාණ බලයන්හිද, අභිධර්මයෙහි දසබලයන්හිද වේ. ඉන්ද්‍රියපරොපරියත්ත ඤාණය වනාහි සර්වප්‍රකාරයෙන්ම ශ්‍රාවකයින් හා අසාධාරණමය. එහෙයින් දස බලද ශ්‍රාවකයින් හා අසාධාරණ වූයේමය. අධි මාත්‍රාර්ථයෙන්ද අසමාන තාවයෙන්ද අප්‍රමෙය්‍යමය. එහෙයින්ම අප්‍රමෙය්‍යාර්ථයෙන් තථාගත බලයැයි යුසේයි.

**බලකථා වර්ණනාව නිමි.**

දැන් ලෝකෝත්තර බලකථා කෙළවර කොටැති, බලකථායෙහි, අනතුරුව කියන ලද, ලෝකෝත්තර ශූන්‍යතා කෙළවරකොට ඇති, සූත්‍රාන්ත පූර්වංගම ශූන්‍යතා කථායෙහි පෙර නුවූ විරූ අර්ථ අනුවර්ණනාවයි. සූත්‍රාන්තයෙහි අථ යනු වචන ගැනීමේ නිපාතයි. එයින 'ආයසමා' ආදී වචනයෙහි ගැනීම කරන ලද්දේ වේ. ඛො යනු (පද) පූරණාර්ථයෙහි නිපාතයි. යෙන භගවා තෙනුපසංකමි යනු සතතමී අර්ථයෙහි කරණ වචනයි. එහෙයින් යම්තැනෙක්හි භාග්‍යවතුන් වහන්සේ වැඩසිටිත්ද එහි එළැඹියේ යැයි මෙසේ මෙහි අර්ථය දතයුතුය.

යම් කරුණෙකින් භාග්‍යවතුන් වහන්සේ දෙවිමිනිසුන් විසින් එළැඹිය යුතුද? එම කරුණෙන්ම එළැඹියේ යැයි මෙසේද මෙහි අර්ථය දැකිය යුතුය. කවර කරුණෙකින් භාග්‍යවතුන් වහන්සේ එළැඹිය යුතුද? නානාප්‍රකාර ගුණ විශෙෂයන් අධිගම අභිප්‍රායයෙන්, මිහිරිඵල පරිභෝග කිරීමේ අභිප්‍රායයෙන්, පක්ෂි සමූහයා විසින් සෙවුනා සැමදා පලගත් මහරුකක මෙනි. එකරුණින් එළැඹීයැයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. උපසංකමි යනු ගියේයැයි යූ.සේයි. **උපසංකමිත්වා** යනු එළැඹීමෙහි අවසානය දැක්වීමයි. නොහොත් මෙසේද ගියේ, එයින්ද ඉතා ආසන්න ස්ථානයට භාග්‍යවතුන් වහන්සේගේ, සමීපයයැයි කියන ලද ස්ථානයට ගොස් යයි යූ.සේයි. **අභිවාදෙත්වා** යනු පසඟ පිහිටුවීමෙන් වැඳ දැන් යම් අර්ථයකින් ලෝකයෙහි අග්‍ර පුද්ගලයාගේ උපස්ථානයට පැමිණියේද, එය විමසනු කැමැතියේ, දස නබ සමෝධානයෙන් සමුජ්වලිත අංජලිය සිරසෙහි පිහිටුවා එකමනතං නිසීදි. එකමනතං යනු භාව නපුංසක නිර්දේශයයි. 'විසම සඳහිරු කැරකෙමින් ගමන් කරයි' ආදීන්හි මෙනි. යම්සේ හිඳගත් තැනැත්තේ එකත්පස්ව හිඳගත්තේ වේද, එසේ හිඳීයයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. එය සතතමී අර්ථයෙහි හෝ ද්විතියා වචනයි. නිසීදි යනු හිඳීම කළේය. නුවණැති දෙව් මිනිස්සු ගරු කළයුතු අයෙකු වෙත එළඹ හිඳීමෙහි දක්ෂ බැවින් එකත්පස්ව හිඳිති. මෙම තෙරහුද ඔවුනතර එක්තරා අයෙකි. එහෙයින් එකත්පස්ව හුන්හ. කෙසේ හුන්නහු එකත්පස්ව හුන්නාහු වෙත්ද, ෂට් නිසද්‍ය දෝෂයන් දුරුකොට, ඒ කවරේද යත්? ඉතා දුර, ඉතා ළඟ, උඩුසුළඟෙහි, උස් ප්‍රදේශය, ඉතා අබිමුව, ඉතා පසු ප්‍රදේශය. ඉතා දුර හුන්නහු වනාහි ඉදින් කියනු කැමැත්තේ වේද, උස් හඬින් කිවයුතු වේ. ඉතා ආසන්නයෙහි හුන්නේ ගැටීම් කරයි. උඩුසුළඟෙහි හුන්නේ සිරුරු ගඳින් බාධා ඇතිකරයි. උස් පෙදෙස්හි හුන්නේ අගෞරවය ප්‍රකාශ කරයි. ඉතා අබිමුව හුන්නේ ඉදින් දක්නා

කැමැති වේද? ඇසින් ඇස ගටා දැකිය යුතු වේ. ඉතා පසුපසින් හුන්නේ, ඉදින් දක්නා කැමැතියේ වේද, ග්‍රීවය දිගුකොට දැකිය යුතු වේ. එහෙයින් මෙතෙමේද, එම නිසද්‍ය දෝෂයන් දුරුකොට හුන්නේය. එහෙයින් එකත්පස්හි හුන්නේ යයි යූ.සේයි. **එතදවොච** යනු එය කීවේය. **සුඤ්ඤො ලොකො සුඤ්ඤො ලොකොති භනෙත වුච්චති** යනු මෙ සස්නෙහි සසුන් පිළිවෙත්හි පිළිපන් ඒ ඒ භික්ෂූන් විසින් ලොව හිස්ය, ලොව හිස්යයි කියනු ලැබේ යයි අර්ථයි. මෙසේ කී කල්හි එබඳු සියලු වචන සංගෘහිත වෙයි. **කිත්තාවතා** යනු කොපමණ ප්‍රමාණයකින්ද, **නු** යනු සංශයාර්ථයෙහි නිපාතයි. **සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙනවා** යනු කරන්නා, විඳින්නා, ස්වයං වශීයැයි මෙසේ ලෝකයෙහි පවත්නා පරිකල්පිතයන්ගෙන් තමාද, ආත්ම අභාවයෙන්ම තමා සතු පරිෂ්කාරයන්ගෙන්ද, සියලුම චක්ෂුරාදි ලෞකික ධර්ම සමූහයෙන්ද ශූන්‍යයි. එයම පලුදුවන අර්ථයෙන් ලෝක නමැ. මෙහි ආත්මයක් නැත. මෙහි ආත්මනීයත්වයක්ද නැත. **තසමා සුඤ්ඤො ලොකො වුච්චති** යයි අර්ථයි. ලෝකෝත්තර ධර්මයද ආත්ම ආතමනීයත්වයෙන් ශූන්‍යමය. විමසීමට අනුරූප අයුරින් ලෞකික ධර්මයම යූ.සේයි. ශූන්‍යයයි ධර්මයක් නැතයයි කියන ලද්ද එසේම නොවේ. එම ධර්මයෙහි ආත්ම ආත්මනීය සාරයෙහි නොමැති බැව් යූ.සේයි. ලෝකයෙහි 'හිස්ගෙය, හිස් කළය' යැයි කී කල්හි ගෘහයෙහිද, කළයෙහිද අවිද්‍යමාන බැව් කියන ලද්දේ නොවේ. එම ගෘහයෙහිද, කළයෙහිද අන්දැයක නොමැති බැව් යූ.සේයි. භාග්‍යවතුන් වහන්සේ විසින්ද 'මෙසේ යමක් වනාහි එහි නොවේද? එහෙයින් එය ශූන්‍ය වශයෙන් නුවණින් මනාව බලයි. යමක් වනාහි එහි ඉතිරි වේද? එසේ පවත්නා මෙය තිබේයයි විශේෂයෙන් දැනගනී යයි මෙයම අර්ථයැයි යූසේයි. එසේම න්‍යාය ග්‍රන්ථයෙහිද ශබ්ද ග්‍රන්ථයෙහිද මෙයම අර්ථයි. මෙසේ මෙම සූත්‍රාන්තයෙහි අනාත්ම ලක්‍ෂණයම කියන ලදී.

සූත්‍රාන්ත නිර්දේශයෙහි **සුඤ්ඤ සුඤ්ඤං** යනාදී පස්විසි මාතෘක පද ශූන්‍යය හා සම්බන්ධයෙන් උදෙසා ඒවාහි නිර්දේශය කරන ලදී. එහි මාතෘකාවෙහි පළමුව ශූන්‍ය සංඛ්‍යාත ශූන්‍යය. අනෙක් උප පදයකින් වෙසෙසා නොදක්වන ලදැයි **සුඤ්ඤං** ශූන්‍යයි. අසවල් දැයයි අනිර්දිෂ්ට හෙයින් මෙහි ශූන්‍යතාවම අපේක්‍ෂාකොට නපුංසක වචනය යොදන ලදී. සෙස්සෙහිද එසේමය.

සංස්කාරයෝම සෙසු සංස්කාරයන්ගෙන් ශූන්‍යනුයි **සංඛාර**

**සුඤ්ඤඤ්ඤංයි.** ජරා භංග වශයෙන් විරූප වූ වෙනස්වීම විපරිණාමයි. එම විපරිණාමයෙන් ශූන්‍ය වූයේ **විපරිණාම සුඤ්ඤඤ්ඤංයි.** අග්‍රවූයේද එය ආත්ම ආත්මනීය භාවයන්ගෙන්ද, සියලු සංස්කරයන්ගෙන්ද ශූන්‍යනුයි **අග්ගසුඤ්ඤඤ්ඤංයි.** ලක්‍ෂණයම සෙසු ලක්‍ෂණයන්ගෙන් **වීකබමහන සුඤ්ඤඤ්ඤංයි. තදංග සුඤ්ඤඤ්ඤාදි** තදංග ශූන්‍යාදී සතරෙහිද එම ක්‍රමයමැයි. අධ්‍යාත්මය එය ආත්ම ආත්මනීයාදීන්ගෙන් ශූන්‍යනුයි **අජ්ඣතත සුඤ්ඤඤ්ඤංයි.** පිටතද එය ආත්ම, ආත්මීයතාවයන්ගෙන් ශූන්‍යනුයි **බහිද්ධා සුඤ්ඤඤ්ඤංයි.** එම ද්වයයම, ආත්ම ආත්මීයතාවන්ගෙන් ශූන්‍යනුයි **උභතො සුඤ්ඤඤ්ඤංයි.** සමාන කොටස් එයටනුයි සභාගංයි. සභාගයද එය ආත්ම ආත්මීයතාවයන්ගෙන් ශූන්‍යනුයි **සභාග සුඤ්ඤඤ්ඤංයි.** සමානතා ශූන්‍යයයිද අර්ථයි. විසභාගයද එය ආත්ම, ආත්මීයතාවන්ගෙන් ශූන්‍යනුයි **විසභාග සුඤ්ඤඤ්ඤංයි.** විසදෘශ ශූන්‍යයයි අර්ථයි. සමහර පොත්වල සභාග ශූන්‍යය, නිසසරණ ශූන්‍යයට අනතුරුව ලියන ලදී. නෛෂ්ක්‍රම්‍යාදීන් සෙවීම කාමච්ඡන්දාදියෙන් ශූන්‍යනුයි **එසනා සුඤ්ඤඤ්ඤංයි, පරිගගහ සුඤ්ඤඤ්ඤාදිසු** පරිග්‍රහ ශූන්‍යාදී සතරෙහිද එම ක්‍රමයමැයි. එක් අරමුණෑ පිහිටි හෙයින්, විවිධ අරමුණු වික්‍ෂෙප අභාව හෙයින්, එකත්වදයද වූ එය නානත්වයෙන් ශූන්‍යනුයි **එකතතසුඤ්ඤඤ්ඤංයි.** එයට විපරීත වශයෙන් නානත්වයද වූ එය ඒකත්වයෙන් ශූන්‍යනුයි **නානතත සුඤ්ඤඤ්ඤංයි.** නෛෂ්ක්‍රම්‍යාදී ක්‍ෂාන්තිය කාමච්ඡන්දාදියෙන් ශූන්‍යනුයි **ඛනති සුඤ්ඤඤ්ඤංයි. අධිට්ඨාන සුඤ්ඤඤ්ඤ පරියොගාහන සුඤ්ඤඤ්ඤව** මේවාහිද එම ක්‍රමයමැයි. පරියොගාහ සුඤ්ඤඤ්ඤංයිද පාඨයි. **සමපජානසස** යනු සම්‍යක් ඥානයෙන් යුක්තව, පිරිනිවෙන්නා වූ රහත්හුගේ, **පවතත පරියාදානං** යනු ප්‍රවෘත්තික්‍ෂය සංඛ්‍යාත අනුපාදා පරිනිර්වාණය සබබ සුඤ්ඤඤ්ඤතානං යනු හැම ශූන්‍යයන් අතරින්, පරමත්‍ථ සුඤ්ඤඤ්ඤං යනු සියලු සංස්කාර අභාවයෙන් ශ්‍රේෂ්ඨ අර්ථය වූ ශූන්‍යය.

මාතෘකා නිර්දේශයෙහි, **නිචෙචනවා** යනු භංගය ඉක්මවා පවත්නා කිසි නිත්‍ය දැයක අභාව හෙයින් (පැවතීමක් නොවන හෙයින්) නිත්‍යයෙන්ද ශූන්‍යයි. **ධුවෙන වා** යනු විද්‍යමාන කාලයෙහිද ප්‍රත්‍යයන්ට අයත් පැවැත්ම හෙයින් (ආහාරාදී ප්‍රත්‍යයන්ගෙන් පවත්නා හෙයින්) ස්ථිර කිසිදැයක අභාව හෙයින් ධ්‍රැවයෙන්ද ශූන්‍යයයි. **සසසතෙනවා** යනු හැමකල් නොසිඳී පවත්නා කිසිවක අභාව හෙයින් ශාශ්වතයෙන්ද ශූන්‍යයයි. **අවිපරිණාම ධමෙමන වා** භංග වශයෙන් නොවෙනස්වීම් ප්‍රාකෘතික කිසිවක අභාව හෙයින් ශාශ්වතයෙන්ද ශූන්‍යයි. සූත්‍රාන්තයෙහි ආත්ම ශූන්‍යතායෙන්ම කියන ලද්දා වූම, නිත්‍ය ශූන්‍යතාවයද, සුව ශූන්‍යතාවයද දක්වන්ට මෙහි

නිවෙචන වා යනාදියද කියන ලද්දේය. පීඩාකාරී තත්වයන්ගේ යෙදීමෙන්, අනිත්‍යයෙහිම දුක්ඛතාවද, නිත්‍ය ශූන්‍යතාව කියන ලද කල්හි සුව ශූන්‍යතාවද කියන ලද්දේම වේ. මෙහි රූපාදී සය විෂයෝය. චක්ඛු විඤ්ඤාණාදී සය විඤ්ඤාණයෝය. චක්ඛු ස්පර්ශාදී සය ස්පර්ශයෝය. චක්ඛු ස්පර්ශයෙන් හටගත් වේදනාදීහු, ෂට් වේදනාවෝ යයි සංක්ෂෙප කරන ලදැයි දතයුත්තාහ.

පුඤ්ඤාභිසංඛාරො යනු භාවනා ආදීන්හිදී තම කෘත්‍යය කරන්නා පිරිසිදු කරයි. ඔහුගේ අදහස පුරයි. පූජා ලැබිය යුතු භවයක් උපදවයිනුයි පුඤ්ඤං (පුණ්‍යයයි) අභිසංඛරොති යනු විපාක කටත්තා රූපයදැයි අභිසංඛාරයි. (කළමාත්‍ර) පුණ්‍යය රැස්කෙරේනුයි පුඤ්ඤාභිසංස්කාරයෑ. පුණ්‍ය ප්‍රතිපක්ෂ අපුණ්‍ය රැස්කෙරේනුයි **අපුඤ්ඤාභි සංඛාරොයි** කම්පිත නොවේනුයි අනෙඤ්ජංයි කම්පිත නොවන භවය රැස්කෙරේනුයි **ආනෙඤ්ජාභි සංඛාරොයි.** පුණ්‍යාභිසංස්කාරය දාන සීල භාවනාදි වශයෙන් පවත්නා අට කාමාවචර කුසල චේතනා, භාවනා වශයෙන් පවත්නා පඤ්ච රූපාවචර කුසල චේතනාදැයි යන තෙළෙස් චේතනාවෝ වෙති. අපුණ්‍යාභි සංස්කාරය ප්‍රාණඝාතාදී වශයෙන් පවත්නා දොළොස් අකුසල චේතනාවෝය. ආනෙඤ්ජාභි සංස්කාරය භාවනා වශයෙන්ම පවත්නා සිව් අරූපාවචර චේතනාද යන ත්‍රිවිධ සංස්කාරයෝ එකුන්තිස් චේතනාවෝ වෙති.

කාය සංඛාරො යනාදීන්හි ශරීරයෙන් හෝ පැවැති ශරීරයාගේ හෝ සංස්කාර නුයි කාය සංස්කාරයි. **වචී සංඛාර චිත්ත සංඛාරෙසු** වාග්, චිත්ත සංස්කාරයන්හිද එම ක්‍රමයමැයි. මෙම ත්‍රිකය කර්මයන් රැස්කරන ක්ෂණයෙහි පුණ්‍යාභිසංස්කාරාදීන්ගේ ද්වාර වශයෙන් පැවැත්ම දැක්වීම සඳහා යූ.සේයි. කායික හැඟවීම උපදවා, කායද්වාරයෙන් පැවැති අෂ්ට කාමාවචර කුසල චේතනාද, දොළොස් අකුසල චේතනාද, අභිඥා චේතනාවදැයි යන එක්විසි චේතනා කාය සංස්කාර නමැ. ඒවාම වාක් විඤ්ඤප්තිය උපදවා, වාක් ද්වාරයෙන් පැවැතියේ වචී සංස්කාර නමැ මනෝ ද්වාරයෙහි පැවැත්තා වූ සියලුම එකුන්තිස් චේතනාවෝ චිත්ත සංස්කාර නමැ.

**අතීතා සංඛාරා** යනාදීන්හි සියලුම ප්‍රත්‍යයෙන් හටගත් ධර්ම ස්වලක්ෂණයට පත්ව නිරුද්ධ වූවාහු අතීත සංස්කාරයෝය. ස්වලක්ෂණයට

නොපැමිණියාහු **අනාගතා සංඛාරායි.** ස්වලක්‍ෂණයට පැමිණියාහු **පච්චුප්පන්නා සංඛාරායි.** වෙනස්වීම් ශුන්‍යතායෙහි වර්තමානය පෙන්වා ඒ ඒ දැයෙහි වෙනස්වීම පහසුවෙන් කියන්ට හැකියයි ප්‍රථමයෙන් වත්මන් ධර්මය දක්වන ලදී. එහි **ජාත රූපං** යනු වත්මන් රූපයයි. **සභාවෙන සුඤ්ඤං** යන මෙහි තමාගේ වීම ස්වභාවයයි. තමාම හටගනී යන අර්ථයි. තමාගේ සිදුවීම ස්වභාවයයි. තමා විසින්ම කරනු ලබන ඉපදවීමයි යන අර්ථයි. ප්‍රත්‍යයන් අයත් පැවැත්ම හෙයින් ප්‍රත්‍යයෙන් තොරව තෙමේම වීම, තමා විසින්ම හෝ වීම එහි නැතැයි ස්වභාවයෙන් ශුන්‍යයි. ස්වකීය වූම ස්වභාවයෙන් තමාගේම හෝ ස්වභාවයෙන් ශුන්‍යයයි යු.සේයි.

නොහොත් ස්වකීය භාවය පෘථුවි ධාතු ආදී නොයෙක් රූපාරූප ධර්මයන්හි එක් එක් ධර්මය අනෙකක් ගැන සලකා බැලීමේදී ස්වකීය නමැ භාව යනු එය සවභාව පර්යාය වචනයකි. එක් ස්වභාවයකට අන්‍ය ස්වභාව සංඛ්‍යාත ස්වභාවයක් නැත. එහෙයින් ස්වකීයය අන්‍ය ස්වභාවයෙන් ශුන්‍යයි. ස්වකීයය අන්‍ය ස්වභාවයෙන් ශුන්‍යයයි අර්ථයි. එහෙයින් එක් ධර්මයක එක් ස්වභාවතාව යුසේයි.

නොහොත් **සභාවෙන සුඤ්ඤං** යනු ශුන්‍ය ස්වභාවයෙන්ම ශුන්‍යයි. කුමක් කියන ලද්දේ වේද? ශුන්‍ය ශුන්‍යතායෙන්ම ශුන්‍යයි. අනෙක් ආකාර ශුන්‍යතාවන්ගෙන් ශුන්‍යයයි නොයුසේයි. ඉදින් කිසිවෙක් ස්වකීය භාවය ස්වභාවයැයි ඒ ස්වභාවයෙන් ශුන්‍යයයි කියන්නාහුය. ඉන් කුමක් කියන ලද්දේද යත්? භාව යනු ස්වභාවයයි. එය අනෙකක් ගැන සලකා බැලීමෙහිදී සපදත්වයෙන් විශේෂිත කරන ලදුයේ ස්වභාව නමැ. කිසි ධර්මයක අවිද්‍යමානත්‍වයෙන් හටගත් රූපය ස්වභාවයෙන් ශුන්‍යයයි රූපයාගේ අවිද්‍යමානත්‍වය යු.සේයි. මෙසේ ඇතිකල්හි 'ජාත රූපං' යන වචනය හා විරුද්ධ වේ. උත්පාද රහිත හටගැනීමක් නම් නොවේ. ජාති, ජරා, මරණයෝද උත්පාද රහිතව හටගත්තාහු නම් නොවෙති. එහෙයින්ම මෙහි හටගත්තාහු හටගත් ස්වභාවයෙන ශුන්‍යයි ජාති, ජරා මරණ එම ස්වභාවයෙන් ශුන්‍යයයි මෙසේ නොඋදුරා භවයම අවසන්කොට නිර්දිෂ්ටයහ. ඉදින් උත්පාද රහිතයට විජාතයැයි යන වචනය යෙදෙන්නේද, එසේ නම් උත්පාද සහිතයට ජාති, ජාතං, ජරා මරණං යැයි කිවයුතු වන්නේය. එහෙයින් ස්වභාවයෙන් ශුන්‍යයට, අවිද්‍යමාන යැයි යන වචනය අවිද්‍යමාන වූ, උත්පාද රහිතයට ජාත යන වචනය විරුද්ධයි. අවිද්‍යමානයට ශුන්‍යයයි යන වචනය යට කියන ලද ලෝක වචනයෙන්ද, භාග්‍යවතුන්

වහන්සේගේ වචනයෙන්ද, න්‍යාය ග්‍රන්ථ, ශබ්ද ශාස්ත්‍ර ග්‍රන්ථ වචනයන් අනුවද විරුද්ධ වේ. නොයෙක් යුක්තීන් සමග ද විරුද්ධ වේ. එහෙයින් එම වචනය කසල මෙන් ඉවත දැමිය යුතුය. මහණෙනි, ලෝකයෙහි නැණැතියන් විසින් පිළිගනු ලැබූ යම් දැයක් තිබේද? මම ද එය තිබේයයි වදාරමි.

මහණෙනි, ලෝකයෙහි නැණැතියන් විසින් නොපිළිගත් යම් දැයක් තිබේද? මමද එය නොතිබේයයි වදාරමි. මහණෙනි, ලෝකයෙහි නැණැතියන් විසින් විද්‍යමානයයි පිළිගත් කෙබඳු වූ, යම් දැයක් මම තිබේයයි වදාරම්ද? මහණෙනි, රූපය අනිත්‍යය. දුක්ය. වෙනස්වන සුලුයයි ලෝකයෙහි නැණැතියන් විසින් පිළිගැනීමක් තිබේ. මමද එය තිබේයයි වදාරමි යනාදී, නොයෙක් බුදු වදන් ප්‍රමාණයන්ගෙන්ද නොයෙක් යුක්ති ධර්මයන්ගෙන්ද ස්වලක්ෂණයෙහි විද්‍යමාන වේමයැයි මෙහි නිශ්වයට යායුතුයි.

විගතං රූපං යනු හටගෙන භංගයට පත්ව නිරුද්ධ අතීත රූපයයි, විපරිණතඤ්චව සුඤ්ඤඤ්ච යනු ජරා භංග වශයෙන් විරූපයට වෙනසට පත්වූයේ, පවත්නා වූම වෙනස යෙදෙන හෙයින්, අතීත වෙනස්වීම් අභාවයට ගිය හෙයින් එම වෙනස්වීමෙන් ශූන්‍යයයි අර්ථයි. **ජාතා වෙදනා** යනාදියෙහිද එම ක්‍රමයයි. ජාති, ජරා, මරණ අනිෂ්පන්න හෙයින්, සිය බවෙන් නොලබන හෙයින්, ජාතාජාති ජාතං ජරා මරණං යනාදි ක්‍රම ද්වයය අත්හැර, භවාධික වූම ක්‍රමය කෙළවර කොට තබන ලදී.

අග්ගං යනු අග්‍රයෙහි වූයේ. **සෙට්ඨං** යනු අතිශයින් ප්‍රශංසා කටයුතු, **විසිට්ඨං** යනු අධික වූ, **විසෙට්ඨං** යනුද පාඨයි. ත්‍රිවිධාකාරයෙන්ම ප්‍රශස්ථ නිර්වාණ්‍ය යහපත් ප්‍රතිපදාවෙන් පිළිපැදිය යුතු හෙයින් **පදං** නමැ. **යදිදං** යනු යම් මේ දැන් කිවයුතු නිර්වාණය පෙන්වයි. යම්හෙයකින් නිර්වාණයට පැමිණ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමෙක් වේද? සියලු ස්කන්ධ, කෙලෙස්, අභිසංස්කාර, කාමගුණ සංඛ්‍යාත උපධීන්ගේ දුරැලීමෙක් වේද, තෘෂ්ණාවන්ගේ, ක්‍ෂය, විරාගය නිරෝධය වේද? එහෙයින් **සබ්බ සංඛාර සමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො** යයි යූසේයි. **නිබ්බාණං** යනු ස්වභාව ලක්‍ෂණයෙන් නිගමනය කරන ලදී.

ලක්‍ෂණයන්හි, මහණෙනි, මේ අඥානයාගේ අඥාන ලක්‍ෂණ ත්‍රයයකි. කවර ත්‍රයයෙක්ද යත්? මහණෙනි, මෙලොව අඥාන තෙමේ

නරක සිතිවිලි සිතනුයේ, නරක කථාවන් කථා කරනුයේ නරක ක්‍රියාකරන සුලු වූයේ වේ. මහණෙනි, මෙම ත්‍රයය අඥානයාගේ අඥාන ලක්‍ෂණයෝය. පණ්ඩිතයින් විසින් අඥානයාට අඥානයා යැයි සලකන හෙයින් ත්‍රිවිධ අඥාන ලක්‍ෂණයි. මහණෙනි, මේ ත්‍රයය පණ්ඩිතයාගේ පණ්ඩිත ලක්‍ෂණයි. කවර ත්‍රයයෙක්ද යත්? මහණෙනි, මෙලොව පණ්ඩිත තෙමේ යහපත් සිතිවිලි සිතන්නේ වේ. යහපත් කථා කථාකරන්නේ වේ. යහපත් ආකර වූ ක්‍රියාවන් කරන්නේ වේ. මහණෙනි, මේ ත්‍රයය පණ්ඩිතයාගේ පණ්ඩිත ලක්‍ෂණයෝයි යූසේයි. පණ්ඩිතයන් විසින් පණ්ඩිතයාට පණ්ඩිත යැයි සලකන හෙයින් ත්‍රිවිධ පණ්ඩිත ලක්‍ෂණයයි 'මහණෙනි, මේ සංඛතයාගේ සංඛත ලක්‍ෂණ ත්‍රයයකි. (හේතුවකින් හටගත්) කවර ත්‍රයයෙක්ද යත්? හටගැන්ම පෙනේ. විනාශය පෙනේ. සිටියහුගේ වෙනස්වීම් ආකාරය පෙනේයයි යූ.සේයි. හටගැන්මම සංඛතනුයිද, ස්වභාවයනුයිද සංඛත ලක්‍ෂණයි. මෙසේ අනෙක් ද්වයයෙහිද අර්ථය දතයුතුය. මෙයින් උත්පාද ක්‍ෂණයෙහි සෙසු ද්වයෙහිද, ස්ථිති ක්‍ෂණයෙහි සෙසු ද්වයෙහිද භංගක්‍ෂණයෙහි සෙසු ද්වයෙහිද අභාවය දක්වන ලදී. එය විපරිණාම ශූන්‍යතා හෙයින්, ජාති, ජරා, මරණයන් අත්හැර භව කෙළවරකොට ඇති න්‍යාය වචනයෙන්, උත්පාදාදීන්ගේ උත්පාදාදිය නොකියන කල්හි විරුද්ධ වේ. ලක්‍ෂණ ශ්‍රෝතසෙහි වටහෙයින් ශ්‍රෝතසෙහි පතිතකොට ලියන ලදැයි දතයුතුය.

යම්සේ අභිධර්මයෙහි අහේතුක විපාක මනෝධාතු, මනෝ විඥඥාණ ධාතූන්ගේ සංග්‍රහ වාරයෙහි ලබන්නා වූද, ධ්‍යානාංගය පඤ්ච විඥඥාණ ශ්‍රෝතසෙහි වැටී ගියේ යයි නොඋදුරන ලදැයි යූසේයි. මෙසේ මෙහිද ශ්‍රෝතසට වැටීම දතයුත්තාහ නොහොත් ජාති, ජරා, මරණ වත් සංස්කාරයන්ගේ හටගැනීම් ආදීහු, ජාති ජරා මරණ අනිත්‍ය වශයෙන් ආදීන්හි මෙන්ද, ඒවාහි ස්වභාවයන් මෙන්ද කොට යූසේයි.

**නෙකඛම්මෙන කාමච්ඡන්දො විකඛම්භිතො චෙව සුඤ්ඤාව** යනු කාමච්ඡන්දය නෛෂ්ක්‍රම්‍යයෙන් මැඩපවත්වන ලදුයේද, එහි නෛෂ්ක්‍රම්‍යය අභාව හෙයින්, එයින්ම විෂ්කම්භන සංඛ්‍යාත නෛෂ්ක්‍රම්‍යයෙන් ශූන්‍ය වූයේද වේ. මෙසේ සෙස්සෙහිද යෙදීම් කළයුත්තාහ.

මෙහි තදංග ප්‍රහාණ, සමුච්ඡේද ප්‍රහාණයන්හිද තදංග වශයෙන්ද, සමුච්ඡේද වශයෙන්ද ප්‍රහීණ වූයේ දුරුකරන ලදුයේම වේයයි මෙයින් දුරුකරන අර්ථයෙන් විෂ්කම්භනය යූ.සේයි.

**නෙක්ඛම්මෙන කාමච්ඡන්දො තදංග සුඤ්ඤො** යනු නෛෂ්ක්‍රම්‍යයෙන් ප්‍රහීණ කාමච්ඡන්දය, එම නෛෂ්ක්‍රම්‍ය සංඛ්‍යාත අංගයේ ශූන්‍යයි. නොහොත් යම්කිසි කාමච්ඡන්දයක් වේද? එහි නෛෂ්ක්‍රම්‍යයාගේ අභාව හෙයින් එම නෛෂ්ක්‍රම්‍ය අංගයෙන් ශූන්‍යයි. මෙසේ සෙස්සෙහිද යෙදීම් කළයුතුය. මෙහි ඒ ඒ අංගයාගේ ඒ ඒ තන්හි අභාව මාත්‍රයෙන්ම උපචාර, අර්පණා ධ්‍යාන වශයෙන්ද විදර්ශනා වශයෙන්ද තදංග ශූන්‍යතාව නිර්දිෂ්ටය. ප්‍රහාණය දක්වන වචනයෙහි අභාවයෙන් විවට්ටානුපස්සනාවම කෙළවරකොට විදර්ශනාව නිර්දිෂ්ටය. සතරමාර්ග අනිර්දිෂ්ටය.

**නෙක්ඛම්මෙන කාමච්ඡන්දො සමුච්ඡින්නො චෙව සුඤ්ඤො ච** යනාදීන්හි මෙහි විෂ්කම්භනයෙහි කියන ලද ක්‍රමයෙන්ම අර්ථය දතයුතුය. මෙහි තදංග විෂ්කම්භන වශයෙන් ප්‍රහීණ වූවාහුද හැසිරීම් අභාව හෙයින් විනාශ වූවාහු නම් වෙතියි මෙම ආකාරයෙන් විනාශ කිරීම යුක්තයි. ඒ ඒ නැසීමේ කෘත්‍ය සිදුකිරීම් වශයෙන් හෝ මාර්ග සම්ප්‍රයුක්ත නෛෂ්ක්‍රම්‍යාදී වශයෙන් කියන ලදැයි දතයුතුය. පටිප්පස්සද්ධි නිස්සරණ ශූන්‍යයන්හිද මෙහි කියන ලද ආකාරයෙන්ම අර්ථය දතයුතුය. මෙහි තදංග, විෂ්කම්භන, සමුච්ඡේද ප්‍රහාණයන්හි වනාහි සන්සිඳීම් මාත්‍රතාව, හැරපියන ලද මාත්‍රයද ගෙන යුක්තයි. එම පඤ්ච ශූන්‍යයන්හි නෛෂ්ක්‍රම්‍යාදීන්ම, විෂ්කම්භන, තදංග, සමුච්ඡේද, පටිප්පස්සද්ධි, නිස්සරණ නාමයෙන් යු.සේයි.

**අජ්ඣත්තං** යනු අධ්‍යාත්ම වූ, **බහිද්ධා** යනු පිටත වූ, **දුභතො සුඤ්ඤං** යනු දෙයාකාරයෙන් ශූන්‍යයයි. පච්චත්තාදීන්හිද 'තො' යයි වචනය වේමය. ෂට් ආධ්‍යාත්මිකායතනාදි භාවයෙන් **සභාගානියි. විසභාගනි විඤ්ඤාණකායා** යනාදීන්හි කාය වචනයෙන් විඤ්ඤාණාදීන්මම යුක්තයි. නෛෂ්ක්‍රම්‍යසනාවන්හිදී, නෛෂ්ක්‍රම්‍යාදීන්මම එය කැමැති වන්නා වූ නුවණැත්තන් විසින් සොයනු ලැබේනුයි එසනායි. නොහොත් පූර්වභාගයෙහි නෛෂ්ක්‍රම්‍යයාදීන්ගේ සෙවීමද, කාමච්ඡන්දාදීන්ගෙන් ශූන්‍යයි. කුමක් හෙයින් නෛෂ්ක්‍රම්‍යාදීන්ගෙන් යැයි කියන ලද්දේ වේද? පරිග්‍රාහාදීන්හි නෛෂ්ක්‍රම්‍යාදීහුම පූර්ව භාගයෙහි සොයන ලද්දාහු අපරභාගයෙහි අල්වාගනිත්තුයි **පරිග්ගහොයි.** පරිග්‍රහිතයන් සම්ප්‍රාප්ති වශයෙන් ලබත්තුයි **පටිලාභොයි.** ප්‍රතිලබ්ධයන් ඤාණ වශයෙන් ප්‍රතිවේධ කරන්නාහුයි **පටිවෙධොයි** යුක්තයි. ඒකත්ව ශූන්‍යතාවද, නානත්ව ශූන්‍යතාවද, එක්වරක් පමණක් විචාරා, ඒකත්ව ශූන්‍යතාව විසඳ, නානත්ව ශූන්‍යතාව නොවිසඳම වරක් නිගමන කරන ලදී. කවර හෙයින් එය නොවිසඳියේද

යත්? මෙහි කියන ලද ආකාරයෙන්ම යෙදීම දැනේයයි නොවිසඳන ලදැයි දතයුතුය. මෙහි මෙය වනාහි යෝජනායි. නෛෂ්ක්‍රම්‍යය ඒකත්වයයි. කාමච්ඡන්දය නානත්වයයි. නෛෂ්ක්‍රම්‍යය ඒකත්වයෙන් ශූන්‍යයි. මෙසේ සෙස්සෙහිද යෙදීම් දතයුත්තාහ.

ක්‍ෂාන්ති ආදීන්හි, නෛෂ්ක්‍රම්‍යාදීහුම, ඉවසන හෙයින් කැමැති වන හෙයින්ද, ඛනතියි. රුචිවූයේම පිවිස සිටුනා හෙයින් අධිට්ඨාන යැයිද, පිවිස සිටියවුන් කැමැති පරිද්දෙන් සෙවුනා හෙයින් **පරියොගාහනංයි** යූසේයි. **ඉධ සමපජානො** යනාදී, පරමාර්ථ ශූන්‍ය නිර්දේශය පරිනිර්වාණ ඥාන නිර්දේශයෙහි වර්ණනා කරන ලද්දේමය. මෙම සියලු ශූන්‍යයන්හි සංස්කාර ශූන්‍යය, විපරිණාම ශූන්‍යය, ලක්‍ෂණ ශූන්‍යයද, කියන ලද ධර්මයන්ගේ අන්‍යෝන්‍ය අසම්මිශ්‍රතා දැක්වීම සඳහායි. යම්තැනෙක්හි අකුසල පක්‍ෂයට අයත් වූ ධර්මයන්ගේ කුසල පාක්‍ෂික ධර්මයෙන් ශූන්‍යතාව යූ.සේයිද? ඉන් අදහස් කළේ අකුසලයෙහි ආදීනව දැක්වීමයි. යම්තැනෙක්හි කුසල පක්‍ෂයට අයත් වූ ධර්මයන්ගේ, අකුසල පාක්‍ෂික ධර්මයෙන් ශූන්‍යතාවය යූ.සේයිද? ඉන් අදහස් කළේ කුසලයෙහි ආනිසංස දැක්වීමයි. යම්තැනෙක්හි ආත්ම ආත්මනීයතාදීන්ගෙන් ශූන්‍යතාවය යූ.සේයිද? එය සියලු සංස්කාරයන්හි කලකිරීම් ඇතිකරලීම සඳහායි. අග්‍රශූන්‍යයද, පරමාර්ථ ශූන්‍යයද නිර්වාණයෙහි උනන්දුව ඇතිකරලීම සඳහා යූ.සේයි. ඒවා අතර අග්‍ර ශූන්‍යයද, පරමාර්ථ ශූන්‍යයද යන ද්වයය අර්ථ වශයෙන් එකක්මය. නිර්වාණය, අග්‍ර, පරමාර්ථ වශයෙන්ද, සඋපාදිසෙස, අනුපාදිශේෂ වශයෙන්ද දෙයාකාරකොට යූ.සේයි. එම ද්වයය ආත්මනීය ශූන්‍යතා වශයෙන්ද, සංස්කාර ශූන්‍යතා වශයෙන්ද සමානය. ශූන්‍ය ශූන්‍යය, අධ්‍යාත්ම ශූන්‍යය, බහිද්ධා ශූන්‍යය, දෙඅයුරින් ශූන්‍යය. සභාග ශූන්‍යය, විසභාග ශූන්‍යය යන මෙම ෂට් ශූන්‍යයෝ ශූන්‍ය ශූන්‍යම වෙත්. අධ්‍යාත්මිකාදී භේදයෙන් ෂට් අයුරෙකින් කියන ලද, එම ෂට් ආත්ම ආත්මනීයාදී ශූන්‍ය වශයෙන් සමානවූවාහු, සංස්කාර, විපරිණාම, ලක්‍ෂණ ශූන්‍යයන්, විෂ්කම්භන තදංග, සමුච්ඡේද, පටිප්පස්සද්ධි, නිස්සරණ ශූන්‍යයන්, එසනා පරිග්‍රහ, ප්‍රතිලාභ ප්‍රතිවේධ ශූන්‍යයන්, ඒකත්ව, නානත්ව ශූන්‍යයන් ක්‍ෂාන්ති, අධිෂ්ඨාන, පරියොගාහන ශූන්‍යයන්දැයි සතළොස් ශූන්‍යයන් තමා කෙරෙහි අවිද්‍යමාන වූ ඒ ඒ ධර්මයන්ගෙන් ශූන්‍ය හෙයින් අවිද්‍යමානයන්ගේ වශයෙන් වෙන් වෙන්ව යූ.සේයි. සංස්කාර, විපරිණාම, ලක්‍ෂණ ශූන්‍යයෝ වනාහි අනෙක් අනෙක් ශූන්‍යයන්ගෙන් අසම්මිශ්‍ර වශයෙන් සමාන වූවාහුය. විෂ්කම්භනාදී පංචකය කුසල පක්‍ෂයෙන් ශූන්‍ය

හෙයින් සමාන වූයේය. ඒසනාදි සතරද, ක්ෂාන්ති ආදී ත්‍රයයද අකුසල පක්ෂයෙන් ශූන්‍ය හෙයින් සමාන වූයේය. ඒකත්ව, නානත්ව ශූන්‍යයෝ ඔවුනොවුන්ට ප්‍රතිපක්ෂ වශයෙන් සමාන වූවාහුය.

සබ්බෙ ධම්මා සමාසෙන - තිධාද්වෙධා තථෙකථා
සුඤ්ඤතාති සුඤ්ඤත්ථ විදූ - වණ්ණයන්තිධ සාසනෙ

සියලු ධර්මයෝ කෙටියෙන් තෙවදෑරුම්, දෙවදෑරුම් එසේම එක් වැදෑරුම් ලෙසින් ශූන්‍යයයි මෙ සස්නෙහි ශූන්‍යාර්ථ දත් ප්‍රාඥයෝ වණති.

කෙසේද? පළමුව සියලු ලෞකික ධර්ම, ස්ථිර, ශුභ, සුව, ආත්ම විරහිත හෙයින් ස්ථිර, සුභ, සුව, ආත්මයන්ගෙන් ශූන්‍යයයි, මාර්ගඵල ධර්ම ස්ථිර, සුව, ආත්ම විරහිත හෙයින් ස්ථිර, සුව, ආත්මයන්ගෙන් ශූන්‍යයි. අනිත්‍යය හෙයින්ම සුවයෙන් ශූන්‍යයි. අනාශ්‍රව හෙයින් සුභයෙන් අශූන්‍යයයි. නිර්වාණ ධර්මය ආත්මයාගේම අභාව හෙයින් ආත්ම ශූන්‍යයි. සියලුම ලෞකික ලෝකෝත්තර සංඛත ධර්ම කිසි සත්ත්වයෙකුගේ අභාව හෙයින් සත්ත්ව ශූන්‍යයි. අසංඛත නිර්වාණ ධර්මය එම සියලු සංස්කාරයන්ගේ අභාව හෙයින් සංස්කාර ශූන්‍යයි. සියලුම සංඛත අසංඛත ධර්ම ආත්ම සංඛ්‍යාත වූ පුද්ගලයාගේ අභාව හෙයින් ආත්ම ශූන්‍යයි.

### සද්ධර්මප්‍රකාශනී, ප්‍රතිසම්භිදා මාර්ග අට්ඨකථායෙහි ශූන්‍යකථා වර්ණනාව නිමි.

## මධ්‍යම වර්ගයෙහි පෙර නුවූවිරූ අර්ථ වර්ණනාවයි.

දැන් විශේෂයෙන් ප්‍රඥාවට ආසන්න කාරණය වූ ශූන්‍ය කථාවට අනතුරුව දේශිත ප්‍රඥාකථායෙහි පෙර නුවූ විරූ අර්ථ අනුවර්ණනාවයි. එහි මුලදීම සත් අනුපස්සනාවන්හි එකිනෙක මූලික සත් ප්‍රඥා විචාරීම් පූර්වංගම කොට නිර්දිෂ්ටය. නැවත සත් අනුපස්සනා මූලික එකෝත්තර මූලික. ත්‍රිවිධ ප්‍රඥා විචාරීම් රහිතවම නිර්දිෂ්ටය. මෙසේ මුලින්ම දශ ප්‍රඥා පරිපූර්ණත්වය නිර්දිෂ්ටය. එහි **අනිච්චානුපස්සනා** යනු අනිත්‍යය දිටි සංස්කාරයන්හි 'යමක් අනිත්‍යයද එය දුකයැයි' දුක් වශයෙන්ද, 'යමක් දුක්ද එය අනාත්මයැයි'ද අනාත්ම වශයෙන්ද දුවයි. එහෙයින් එය **භාවිතා බහුලීකතා ජවන පඤ්ඤං පරිපූරෙති**. එය තම විෂයයන්හි දුවයිනුයි

ජවනයි. ජවනයද ප්‍රඥාවද එයම වූයේනුයි **ජවන පඤ්ඤායි. දුක්ඛානුපස්සනා** දුක්ඛානුපස්සනාව සමාධීන්ද්‍රිය නිශ්‍රිත හෙයින් බලවත්ව ප්‍රණිධිය පසාකරගෙන යයි පළයි. එහෙයින් **නිබ්බේධික පඤ්ඤං පරිපූරෙති.** එය විනිවිද යේනුයි නිබ්බේධිකායි. නිර්වේදයද ප්‍රඥාවද එයමනුයි **නිබ්බේධික පඤ්ඤායි.** අනත්තානුපස්සනා අනාත්මානුදර්ශනය ශූන්‍යතා දර්ශනයෙන් වෘද්ධිප්‍රාප්තියෙන් මහත්භාවයට පත්හෙයින් මහා ප්‍රඥාව පරිපූරණය කරයි. **මහාපඤ්ඤං පරිපූරෙති** එය අභිවෘද්ධිප්‍රාප්ත හෙයින්, මහත් වූයේද ප්‍රඥාව වූයේද එයමනුයි **මහා පඤ්ඤායි. නිබ්බිදානුපස්සනා.** ත්‍රිවිධ අනුපස්සනාවන්ගේම, ප්‍රථමයෙන් කරන ලද ආසේවනයෙන් බලප්‍රාප්ත වස්තු හෙයින් සියලු සංස්කාරයන්හි කළකිරීමට සමර්ථව තීක්ෂණ වේ. එහෙයින් **තික්ඛ පඤ්ඤං පරිපූරෙති. විරාගානුපස්සනාපි.** ත්‍රිවිධ අනුපස්සනාවන්ගේම, ප්‍රථමයෙන්ද, ආසෙවන බලප්‍රාප්ත වෘද්ධතර අවස්ථා හෙයින් සියලු සංස්කාරයන්ගේ නොඇල්මෙහි සමර්ථව මහත් වේ. එහෙයින් **විපුල පඤ්ඤං පරිපූරෙති නිරොධානුපස්සනාපි.** ත්‍රිවිධ අනුපස්සනාවන්ගේම ප්‍රථමයෙන්ද, ආසෙවන බලප්‍රාප්ත වෘද්ධතර අවස්ථා හෙයින් ව්‍යය ලක්‍ෂණ වශයෙන් සියලු සංස්කාරයන්ගේ නිරෝධ දර්ශනයෙහි සමර්ථව ගැඹුරු වේ. එහෙයින් **ගම්භීර පඤ්ඤං පරිපූරෙති.** නිරෝධය නොගැඹුරු ප්‍රාඥයින් විසින් නොලැබිය හැකි පිහිටීම හෙයින් ගැඹුරුයි. එම ගැඹුරෙහි නපතුලටම පත්හෙයින් ප්‍රඥාව ගම්භීරය. **පටිනිස්සග්ගානුපස්සනාපි** ත්‍රිවිධ අනුපස්සනාවන්ගේම, ප්‍රථමයෙන්ද ආසේවන බලප්‍රාප්තියෙන්, වෘද්ධතර අවස්ථා හෙයින්, ව්‍යය ලක්‍ෂණ වශයෙන් සියලු සංස්කාර අත්හැරීමට සමර්ථව නොළං වේ. බුද්ධිය වනාහි පර්යන්ත ප්‍රාන්ත වූයේ ෂට් ප්‍රඥාවන්ගෙන් දුරවේයයි අර්ථයි. එහෙයින් තෙමේ නොළං හෙයින් **අසාමන්ත පඤ්ඤං පරිපූරෙති.** එය යට යට ප්‍රඥාවන්ගෙන් දුර හෙයින්, නොළං වූ සමීප නොවූ ප්‍රඥාවනුයි අසාමන්ත ප්‍රඥායි. **පණ්ඩිච්චං පරිපූරෙනති** යනු පණ්ඩිතභාවය සම්පූර්ණ කරති. කියන ලද ආකාර සත්ප්‍රඥා පරිපූර්ණත්වයෙන් වඩා, පණ්ඩිත ස්වභාවයට පත්වූයේ මස්තකප්‍රාප්ත ව්‍යුත්ථානගාමිනී විදර්ශනා සංඛ්‍යාත, සංස්කාරෝපේක්‍ෂා අනුලෝම, ගෝත්‍රභූ ඤාණයන්ගෙන් පණ්ඩිත භාවයට පත්ව, පාණ්ඩිත්‍යයෙන් යුක්ත වූයේ වේ. එහෙයින් පාණ්ඩිත්‍යය සම්පූර්ණ කෙරෙත් යයි යූ.සේයි.

**අට්ඨපඤ්ඤා** යනු පාණ්ඩිත්‍ය සංඛ්‍යාත ප්‍රඥාවෙන් සහ සියලු අෂ්ට ප්‍රඥාවෝ, **පුථුපඤ්ඤං පරිපූරෙනති** යනු එම පාණ්ඩිත්‍යයෙන් යුක්තව ඒ

පණ්ඩිතයා ගෝත්‍රභූ ඥාණයට අනතුරුව නිර්වාණය අරමුණුකොට, ලෝකෝත්තර භාවප්‍රාප්තිය සඳහා ලෞකිකත්වයෙන් පැතිර සිටි හෙයින්, වෙන්වූ හෙයින්, පුථුපඤ්ඤා යැයි සංඛ්‍යාත මාර්ගඵල ප්‍රඥාවට පැමිණේ. එහෙයින් 'අට්ඨපඤ්ඤා පුථු පඤ්ඤං පරිපූරෙනති' යයි යුසේයි.

ඉමා නව පඤ්ඤා යනාදීන්හි, අවබෝධ කළ මාර්ගඵල සහිත එම ආර්ය පුද්ගලයාටම ක්‍රමයෙන් ප්‍රණීත ලෝකෝත්තර ධර්ම යෙදීමෙන්, ප්‍රණීත සිත් සතන් හෙයින්, ඉතා සතුටු ආකාරයෙන්ම, පවත්නා චිත්ත සන්තානයාගේ ඵලානන්තරව බැසගත් භවංගයෙන් නැගිටියහුගේ මාර්ග ප්‍රත්‍යවේක්ෂණය, ඉක්බිති භවංගයට බැස නැගිටියහුගේ ඵල ප්‍රත්‍යවේක්ෂණය යන ක්‍රමයෙන් ප්‍රහීණ කෙලෙස් ප්‍රත්‍යවේක්ෂණය ඉතිරි කෙලෙස් ප්‍රත්‍යවේක්ෂණය නිර්වාණ ප්‍රත්‍යවේක්ෂණය පවතී. එම ප්‍රත්‍යවේක්ෂණයන්හි මාර්ග ප්‍රත්‍යවේක්ෂණයද, ඵල ප්‍රත්‍යවේක්ෂණයද ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවයි. කෙසේද? යම්කිසි ප්‍රත්‍යයෙන් හටගත් දැයක් වේද එයද, නිර්වාණයද, භාෂිතාර්ථයද, විපාකයද, ක්‍රියාවද යන මෙම පඤ්ච ධර්ම අර්ථය යැයි අභිධර්ම පෙළ අනුව ගොස් ලියා ඇති එම අට්ඨකථායෙහි යු.සේයි. නිර්වාණයාගේද අර්ථතාවය හෙයින්, තදාරම්මණ මාර්ගඵල ඥාණය 'අත්ථෙසු ඤාණං අත්ථ පටිසම්භිදා' යන වචනයෙන් අර්ථ ප්‍රතිසම්භිදාව වේ. එම අර්ථ ප්‍රතිසම්භිදාව වූ, මාර්ගඵල ඥාණයාගේ ප්‍රත්‍යවේක්ෂා ඥාණය 'ඤාණෙසු ඤාණං පටිභාන පටිසම්භිදා' යන වචනයෙන් ප්‍රතිභාන ප්‍රතිසම්භිදාව වේ. එම ප්‍රත්‍යවේක්ෂා ප්‍රඥාව හාසාකාරයෙන් පවත්නා වූ චිත්ත සන්තානයාගේ වශයෙන් **හාසපඤ්ඤා** නමැ. එහෙයින් **නව පඤ්ඤා - හාසපඤ්ඤං පරිපූරෙනතිච - හාසපඤ්ඤා පටිභාන පටිසම්භිදායි** යුසේයි. සියලු ආකාර වූම ප්‍රඥාව ඒ ඒ අර්ථයෙහි ප්‍රකට කිරීම් සංඛ්‍යාත පැනවීම් අර්ථයෙන් ප්‍රඥායි. ඒ ඒ ප්‍රකාරයේ ධර්මයන් දනීනුයි ප්‍රඥායි.

**තසස** යනු ඒ කියන ලද ආකාර ඇති ආර්ය පුද්ගලයා විසින්, කරණාර්ථයෙහි ෂෂ්ඨී වචනයි. **අත්ථ වවත්ථාන තො** යනු කියන ලද ආකාර ඇති පස්වැදෑරුම් අර්ථයෙහි නිශ්චය කිරීම් වශයෙන්, එය ශ්‍රමණ කරණීය කථායෙහි කියන ලද්දේමය. හේතුඵලය, නිර්වාණය යන වචනාර්ථයි. නොහොත් මුහුකුරා ගිය ක්‍රියාවය යන අර්ථයෙහි පඤ්ච ප්‍රභේද ප්‍රථමාන්ත ප්‍රභේදගත ඥාණයයි.

**අධිගතා හොති** යනු ලබන ලද්දේ වේ. එයම ප්‍රතිලාභ සාක්ෂාත් **කිරීමෙන් සචඡිකතායි**. ප්‍රතිලාභ ස්පර්ශයෙන්ම **එසසිතා පඤ්ඤාය, ධම්ම**

**විවත්ථානතො** යනු යම්කිසි ඵල නිපදවන හේතුවක් වේද එයද, ආර්ය මාර්ගයද, භාසිතයද කුසලයද, අකුසලයද යන මෙම පඤ්ච ධර්ම ධර්මය යැයි අභිධර්ම පෙළ අනුසාරයෙන් කියන ලද පංච ධර්මයන්ගේ නිශ්චය කිරීම් වශයෙන්, එය ශ්‍රමණ කරණීය කථායෙහි හේතුව, ආර්ය මාර්ගය, වචනය, කුසලය, අකුසලය යන පස් ආකාර වූ ධර්ම ද්විතීයාන්ත ප්‍රභේදගත ඤාණයයි කියන ලද්දේය.

**නිරුත්ති වවත්ථාපනතො** යනු එම අර්ථ ධර්මයන්ට සුදුසු නිරුක්තීන්ගේ නිශ්චය කිරීම් වශයෙන්, **පටිභාන වවත්ථානතො** යනු ප්‍රතිභාන සංඛ්‍යාත ත්‍රිවිධ ප්‍රතිසම්භිදා ඤාණයන්ගේ නිශ්චය කිරීම් වශයෙන්, **තසසිමා** යනු එය නිගමන වචනයයි.

මෙසේ සර්ව සංග්‍රාහක වශයෙන් අනුපස්සනාවන්ගේ විශේෂතා දක්වා, දැන් වස්තුභේද වශයෙන් දක්වනුයේ **රූපෙ අනිච්චානු පසසනා** යනාදිය වදාළහ. එය යට කියන ලද අර්ථමය. නැවත රූපාදීන්හිම අතීත, අනාගත, වර්තමාන වශයෙන් ජවන ප්‍රඥාව දක්වනු කැමැතියේ, තනි රූපාදී වශයෙන්ද අතීත, අනාගත, වර්තමාන රූපාදි වශයෙන්ද, විමසීම්කොට විමසනු කැමැත්තෙන්ම විසඳුම කළේය. එහි තනි රූපාදී විසඳුම්හි පළමුව ප්‍රඥාවම නිර්දිෂ්ටය. අතීත, අනාගත, වර්තමාන මූලක ඒ සියලු විසඳුම්හි, අතීතාදී ජවන වශයෙන් ජවන ප්‍රඥායි නිර්දිෂ්ටය.

නැවත නොයෙක් සූත්‍රාන්ත පූර්වංගම ප්‍රඥා ප්‍රභේදය ගෙනහැර දක්වනු කැමැතියේ ප්‍රථමයෙන් සූත්‍රාන්තයන්ගෙන් ගෙනහැර දැක්වීය. එහි **සප්පුරිස සංසෙවො** යනු යට කියන ලද ආකාර ඇති සත්පුරුෂයන්ගේ ආශ්‍රයයි. **සදධමම සවණං** යනු එම සත්පුරුෂයින්ගේ සමීපයෙහි ශීලාදී ප්‍රතිපත්ති දක්වන සදහම් වචන ශ්‍රවණයයි. **යොනිසොමනසිකාරො** යනු අසන ලද ධර්මයන්ගේ අර්ථ විමසීම් වශයෙන් පිළිවෙළින් මෙනෙහි කිරීමයි. **ධමමානුධමම පටිපතති** යනු ලෝකෝත්තර ධර්ම අනුගත ශීලාදී ප්‍රතිපදා ධර්මයෙහි පිළිපැදීමයි.

පඤ්ඤාය පටිලාභාය, පඤ්ඤාවුද්ධියා, පඤ්ඤා වෙපුලලාය, පඤ්ඤා බාහුලලාය යන මෙම සතර ප්‍රඥා වශයෙන් භාව වචනයන්ද සෙසු දොළොස පුද්ගල වශයෙන් භාවවචන වේ. සූත්‍රාන්ත නිර්දේශයෙහි, **ඡනනං අභිඤ්ඤා ඤාණානං** යනු ඉද්ධිවිධ, දිව්‍යශ්‍රොත, චෙතොපරිය, පූර්වෙනිවාස, දිව්‍යචක්ෂු, ආශ්‍රවක්ෂයකර ඤාණය යන සයයි. **තෙ සතතතීනං**

ඤාණානං යනු ඤාණ කථායෙහි නිර්දිෂ්ට ශ්‍රාවක සාධාරණ ඤාණයන්ගේ, **සත්ත සත්තතීනං ඤාණානං** යන මෙහි 'මහණෙනි, තුඹලාට සත් සැත්තෑ ඤාණ වස්තූන් දේශනා කරන්නෙමි. එය ශ්‍රවණය කරවු. මෙනෙහි කරවු. දේශනා කරන්නෙමි. මහණෙනි, සත් සැත්තෑ ඤාණ වස්තූහු කවරහුද? ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ වේ යනු ඤාණයකි. ජාතිය (ඉපැත්ම) නොමැති කල්හි ජරාමරණ නැත යනු ඤාණයකි. අතීත වූද, සංසාර දීර්ඝ ගමන් මාර්ගයෙහිද ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ වූයේය යනු ඤාණයකි. ජාතිය නොමැති කල්හි ජරාමරණ නොවේ යනු ඤාණයකි. අනාගත සංසාර දීර්ඝ ගමන් මාර්ගයෙහිද ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වන්නේය යනු ඤාණයකි. යම් ආකාර වූ ධර්ම ස්ථිති ඤාණයක් වේද, එයද ක්ෂය ධර්මයකි. ව්‍යය ධර්මයකි. විරාග ධර්මයකි. නිරෝධ ධර්මයකි යනු ඤාණයකි. භව ප්‍රත්‍යයෙන් ඉපැත්ම වේ යනු ඤාණයකි. උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේ යනු ඤාණයකි. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වේ යනු ඤාණයකි. වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ යනු ඤාණයකි. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාව වේ යනු ඤාණයකි. ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ යනු ඤාණයකි. නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වේ යනු ඤාණයකි. විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වේ යනු ඤාණයකි. සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය වේ යනු ඤාණයකි. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වේ යනු ඤාණයකි. අවිද්‍යාව නොමැති කල්හි සංස්කාර නැත යනු ඤාණයකි. අතීත වූද සංසාර දීර්ඝ ගමන් මාර්ගයෙහිද අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වූයේය යනු ඤාණයකි. අවිද්‍යාව නොමැති කල්හි සංස්කාර නොමැත යනු ඤාණයකි. අනාගත සංසාර දීර්ඝ ගමන් මාර්ගයෙහිද අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වන්නේය යනු ඤාණයකි. අවිද්‍යාව නොමැතිකල්හි සංස්කාර නොවන්නේය යනු ඤාණයකි. යම් ධර්මස්ථිති ඤාණයක් වන්නේද එයද ක්ෂය ධර්මයකි. ව්‍යය ධර්මයකි. විරාග ධර්මයකි. නිරෝධ ධර්මයකි යනු ඤාණයකි. මහණෙනි, මේවා සත් සැත්තෑ ඤාණ වස්තු යැයි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේ විසින් නිදාන වර්ගයෙහි දේශිත සත් සැත්තෑ ඤාණ මෙසේය. ජරාමරණයෙහි ඤාණය, ජරා මරණ සමුදයෙහි ඤාණය, ජරාමරණ නිරෝධයෙහි ඤාණය, ජරා මරණ නිරෝධගාමිනී ප්‍රතිපදා ඤාණය යැයි, මෙම ක්‍රමයෙන් එකොළොස් අංගයන්හි සතර සතර බැගින් කොට කියන ලද, සිව්සාළිස් ඤාණ වස්තූහු මෙහි නොගන්නා ලදහ. දෙවැදෑරුම් ඤාණයෝම හිතසුවයට හේතුවූවෝනුයි ඤාණ වස්තූහුය. **ලාභො** යනාදීන්හි ලාභයම උපසර්ගයෙන් වෙසෙසා **පටිලාභොයි** වූසේයි. නැවත එහිම අර්ථ විවරණ වශයෙන්

**පත්ති සමපත්තියි** යූසේයි. **ඵුසනා** යනු අවබෝධ කිරීම් වශයෙන් ස්පර්ශ කිරීමයි. **සච්ඡිකිරියා** යනු ප්‍රතිලාභ වශයෙන් සාක්‍ෂාත් කිරීමයි. **උපසම්පදා** යනු නිෂ්පාදනයයි.

**සත්තන්නඤ්ච සෙක්ඛානං** යනු ත්‍රිවිධ ශික්‍ෂා හික්මෙත්නුයි ශෛක්‍ෂ්‍යයැයි දන්නා ලද ශ්‍රෝතාපත්ති මාර්ගස්ථාදී සත් ශෛක්‍ෂ්‍යයන්ගේ, **පුථුජ්ජන කල්‍යාණකස්සච** යනු නිර්වාණගාමී ප්‍රතිපදාවෙන් යුත් හෙයින් සුන්දරාර්ථයෙන් යහපත් පුද්ගලයෙකැයි හඟවන ලද පෘථග්ජනයාගේ, වැඩුණු, වැඩීම් එයටනුයි **වඩ්ඪිත වඩ්ඪනායි.** කියන ලද ආකාර ඇති අෂ්ට ප්‍රඥාවන්ගේ වශයෙන් විශේෂ වශයෙන් රහත්හුගේ ප්‍රඥා වශයෙන් ප්‍රඥාවගේ වැඩීමෙන් **පඤ්ඤා වුද්ධියා, පඤ්ඤා** වෙපුලලාය යනු එසේය.

**මහන්තෙ අත්ථෙ පරිගණ්හාති** යනාදීන්හි, ප්‍රතිසම්භිදාප්‍රාප්ත ආර්ය ශ්‍රාවක් තෙමේ අර්ථාදීහු අරමුණු කිරීමෙන් පිරිසිඳ ගනීනුයි සියලුම මහා ප්‍රඥාවෝ ආර්යශ්‍රාවකයින්ටමය. එම ප්‍රඥාවෙහි විෂයතා යට කියන ලද අර්ථමය.

**පුථුනානාඛන්ධෙසු** යනාදීන්හි නානා යන ශබ්දය පුථු ශබ්දයාගේ අර්ථය දෙන වචනයයි. **ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා** යනු ඒ එසේ කියන ලද ස්කන්ධාදීන්හි ඥානය පවත්වයි කොට, එම ඥානය පෘථු ප්‍රඥා නමැයි අර්ථයි. **නානා පටිච්ච සමුප්පාදෙසු** යනු ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන්ගේ වශයෙන් ප්‍රත්‍යය බහුත්වය යූ.සේයි. **නානා සුඤ්ඤත මනුපලබ්භෙසු** යනු ලැබීම උපලබ්ධයි. ග්‍රහණය යන අර්ථයි. නොලැබීම අනුපලබ්ධයි. අනුපලබ්ධයන්ගේ සංඛ්‍යාව බොහෝ බැවින් බහුවචනයෙන් දැක්වීය. පස්විසි අනුපලබ්ධයෝ, ශූන්‍යතා වශයෙන් හෝ නොයෙක් ශූන්‍යතාවන්හි ආත්ම ආත්මනීයාදීන්ගේ වශයෙන්, අනුපලබ්ධ වූවාහු නානා ශූන්‍යතානුපලබ්ධයහ. ඒවාහි, 'නානා සුඤ්ඤතානුපලබ්භෙසු'යි කිවයුතු කල්හි 'අදුක්ඛමසුඛා' ආදීන්හි මෙන් මකාරය පද සන්ධි වශයෙන් යූ.සේයි. මෙම පස්වැදෑරුම් ප්‍රඥාවෝ කල්‍යාණ පෘථග්ජනයින් හා සාධාරණය. නොයෙක් අර්ථාදීන්හි ප්‍රඥාව ආර්යයන්ගේමය. පෘථග්ජයින් හා අසාධාරණය. ධම්මෙ යනු ලෞකික ධර්මයෙහි, මෙයින් අවසන් ක්‍රමයෙන් ලෞකිකත්වයෙන් පෘථක්භූත වෙන්වූ ප්‍රඥාවනුයි පුථුපඤ්ඤා නමැයි යූ.සේයි.

විපුල පඤ්ඤා මහා ප්‍රඥා ක්‍රමයෙන් දතයුත්තාහ. කියන ලද ආකාර ඇති ධර්මයෙහි පිරිසිඳ ගන්නහුට ගුණ මහත්වය හෙයින්ද, එම ධර්මයන්ගේ පිරිසිඳ ගන්නා වූ ප්‍රඥාවගේ මහත්වය හෙයින්ද, එම ධර්මයන්ගේ පිරිසිඳ ගන්නා වූ ප්‍රඥාවගේ මහත්වය හෙයින්ද, එම ධර්මයන්ගේ ස්වයං මහත්වය හෙයින්ද, ධර්මයන්ගේ උසස් භාවය හෙයින්ද, ප්‍රඥාවෙහි විපුලතාවය දතයුත්තාහ.

ගම්භීර පඤ්ඤා යනු පෘථු ප්‍රඥා ක්‍රමයෙන් දතයුත්තාහ. එම ධර්මද, ඒවා අනුපලබ්ධ වූවාහු, එම ප්‍රඥාව ප්‍රකෘති ජනයා විසින් නොලැබිය යුතු පිහිටීම් හෙයින් ගැඹුරුය.

**යස්ස පුග්ගලස්ස** යනු ආර්ය පුද්ගලයා විසින්ම, **අඤ්ඤා කොචි** යනු පෘථග්ජන තෙමේ, **අභිසම්භවිතුං** යනු සම්ප්‍රාප්තවීමට **අනභිසම්භවනීයො** යනු සම්ප්‍රාප්ත වීමට නොහැකිවනුයේ, **අඤ්ඤෙහි** යනු පෘථග්ජනයන් විසින්ම, **අට්ඨමකස්ස** යනු අර්හත් ඵලස්ථයාගේ පටන් ගණනය කරනු ලබන කල්හි, අෂ්ටමය වූ ශ්‍රෝතාපත්ති මාර්ග ස්ථයාගේ, දූරෙ යනු දුරින් පිහිටි යන අර්ථයි. **විදූරෙ** යනු ඉතා දුරින් පිහිටි, **සුවිදූරෙ** යනු මැනවින් ඉතා දුරින් පිහිටි.

**න සන්තිකෙ** යනු සමීපයෙහි නොවේ. **න සාමන්තා** යනු සමීපභාගයෙහි නොවේ. වැළැක්වීම් සහිත වූ මෙම වචනද්වයය දූර භාවයෙහිම නියමයන්ය. **උපාදාය** යනු හේතුකොට, **සොතාපන්නස්ස** යනු ශ්‍රෝතාපත්ති ඵලස්ථයාගේ, එයින්ම ඒ ඒ මාර්ග ප්‍රඥාව ඒ ඒ ඵල ප්‍රඥාවෙන් දූරයයි යූසේයි. **පච්චෙක සම්බුද්ධො** යනු උපසර්ගයෙන් විශේෂිතයි. අනෙක් ද්වයය තනිවම ආයේය.

පසේ බුදුරදුන්ගේද, දෙවියන් සහිත ලෝකයාගේද ප්‍රඥාව තථාගතයන් වහන්සේගේ ප්‍රඥාව දූරයයි ආදිය කියා එම දූරාර්ථයම නොයෙක් ආකාරයෙන් දක්වනු කැමැතියේ 'පඤ්ඤා පභෙද කුසලො' යනාදිය වදාළහ.

එහි **පඤ්ඤාපභෙද කුසලො** යන තමාගේ අනන්ත කල්පනාවන්හි ඇතුළත් ප්‍රඥාප්‍රභේදයෙහි දක්ෂ වූයේ, **පභින්න ඤාණො** යනු අනන්ත ප්‍රභේද ප්‍රාප්ත ඤාණ සහිත වූයේ, එයින් ප්‍රඥා ප්‍රභේද කුසලතාව ඇතිකල්හිද,

එම ප්‍රඥාවන්ගේ අනන්ත භේදතාව දක්වයි. අධිගත පටිසම්භිදො යනු ලද අග්‍ර සිව්පිළිසිඹියා ඥාණයෙන් යුක්ත වූයේ, චතුවෙසාරජ්ජපපත්තො යනු සිව් විසාරද භාව සංඛ්‍යාත ඥාණයන්ට පැමිණියේ, දෙසූ පරිදි සම්‍යග් සම්බුද්ධයැයි ප්‍රතිඥා කරන ඔබ විසින් මෙනම් ධර්ම අවබෝධ නොකරන ලදැයි යන කරුණෙහිලා ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලෝකයෙහි කිසිවෙක් හෝ කරුණු සහිතව මට දොස් නගන්නේය යන එම කරුණ මහණෙනි මම නොදකින්නෙමි. මහණෙනි, මම එම කරුණ නොදක්නේ, ක්ෂේමප්‍රාප්තව, අභය ප්‍රාප්තව, වෛශාරද්‍යප්‍රාප්තව වාසය කරමි. ක්ෂීණාශ්‍රවයැයි ප්‍රතිඥා කරන ඔබ විසින් මෙම ආශ්‍රව ක්ෂය නොකරන ලදැයි- ඔබ විසින් යම්කිසි අන්තරායික ධර්මයක් කියන ලදද? ඒවා සෙවුනහුට අන්තරායකරභාවය සඳහා එය ප්‍රමාණවත් නොවන්නේ යයි යම්කිසි අර්ථයක් සඳහා ඔබ විසින් ධර්මයක් දේශිතද? ඒ අනුව ක්‍රියා කරන්නහුට මනාව දුක් ක්ෂය කිරීම සඳහා එය ගෙන නොයයි (බලනොපායි) එහි ඒකාන්තයෙන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලෝකයෙහි කිසිවෙක් හෝ කරුණු සහිතව මට දොස් නගන්නේය යන එම කරුණ මහණෙනි, මම නොදකින්නෙමි. මහණෙනි, මම එම කරුණ නොදක්නේ, ක්ෂේමප්‍රාප්තව, අභයප්‍රාප්තව, වෛශාරද්‍යප්‍රාප්තව වාසය කරමි. දසබලධාරී යනු ඒවාට දස බලයක්නුයි දසබලායි. දසබලයන්ගේ බලයෝ දසබලබලානියි. එම දසබල බලයන් දරානුයි දසබලධාරියි. දසබලඥාණ බලධාරියි අර්ථයි. එම ත්‍රිවිධ වචනයන්ගෙන් අනන්තප්‍රභේද වූ, අවබෝධ කළයුතු දැහි ප්‍රභේද මුඛ මාත්‍රයක් දැක්වීය. හෙතෙමේම ප්‍රඥා ප්‍රයෝග වශයෙන් ශුභ මංගල සම්මත අර්ථයෙන් පුරිසාසභොයි. සන්ත්‍රාස නොවීම් අර්ථයෙන් පුරිසසීහොයි. මහත් අර්ථයෙන් පුරිසනාගොයි. විශේෂ දැනීම් අර්ථයෙන් පුරිසාජඤ්ඤායි. ලෞකික කෘත්‍ය වීර්යය උසුලන අර්ථයෙන් පුරිසධොරයෙහායි.

නැවත තේජාදී වූ අනන්ත ඥාණයෙන් ලද, ගුණ විශේෂය දක්වනු කැමැතියේ එම තේජාදීන්ගේ අනන්ත ඥාණ මූලක බව දක්වනුයේ 'අනනත ඤාණො'යි වදාරා 'අනනත තෙජො' යනාදිය වදාළහ. එහි අනනත ඤාණො යනු ගණන් වශයෙන්ද, තේජස් වශයෙන්ද අන්තරහිත ඥාණයයි. අනනතතෙජො යනු හික්මවිය යුතු අයගේ සන්තානයෙහි, මෝහය නමැති අන්ධකාරය විනාශ කිරීමෙන් අනනතඥාණ තේජසින් යුක්ත වූයේ. අනනත යසො යනු ප්‍රඥා ගුණයන්ගෙන්ම ලෝකත්‍රයයෙහි

පැතිරුණු අනන්ත කීර්තිඝෝෂා සහිතවූයේ, **අඩ්ඪො** යනු ප්‍රඥා නමැති ධන සමෘද්ධියෙන් සමෘද්ධියට පත්වූයේ, **මහද්ධනො** යනු ප්‍රඥා ධන අභිවෘද්ධියෙහිද, තේජස් මහත්වයෙන් මහත් ප්‍රඥාධනය මොහුටනුයි මහද්ධනොයි. 'මහාධනො' යනුද පාඨයි. **ධනවා** යනු ප්‍රශංසා කටයුතු ප්‍රඥා ධනවත්හු, නිතර යෙදුණු ප්‍රඥා ධනවත්හු, අතිශයින් වූ ප්‍රඥා ධනවත්හු ධනවායි, එම ත්‍රිවිධ අර්ථයන්හි මෙම වචනය ශබ්ද ශාස්ත්‍රඥයෝ කැමති වෙති.

ප්‍රඥා ගුණයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ආත්ම සම්පත්ති සිද්ධිය දක්වා, නැවත ප්‍රඥා ගුණයෙන්ම ලෝක හිතාර්ථ සම්පත්ති සිද්ධිය දක්වනුයේ **නෙතායි** ආදිය වදාළහ. එහි හික්මවිය යුතු අය සංසාර සංඛ්‍යාත භය ස්ථානයෙන් නිර්වාණ සංඛ්‍යාත ක්ෂේම ස්ථානයට පමුණුවයිනුයි **නෙතායි**. එහි පමුණුවන කල්හි මෙසේ සංවර විනය, ප්‍රහාණ විනය වශයෙන් හික්මවියි යුතු අය හික්මවයිනුයි **විනෙතායි**. ධර්මදේශනා කල්හි මෙසේ සැක සිඳීමෙන් හික්මවයිනුයි **අනුනෙතායි**. සැක සිඳ පැනවිය යුතු අර්ථය පනවයිනුයි **පඤ්ඤාපෙතායි**. එසේ පනවන ලද අර්ථයන්ගේ නිශ්චය කිරීම් වශයෙන්, නිශ්චය කරවනුයේනුයි **නිජ්ඣාපෙතායි**.

එසේ නිශ්චය කරන ලද, අර්ථයට අදාළ ප්‍රතිපත්තීන්හි යෙදවීම් වශයෙන් දැක්වීම **පෙක්ඛෙතායි**. එසේ පිළිපන්නවුන් ප්‍රතිපත්ති ඵලයෙන් පහදවනුයේ, **පසාදෙතායි**. **සො හි භගවා** යන මෙහි හිකාරය අනතුරුව කියන ලද, අර්ථයෙහි හේතුව, දැක්වීමේ නිපාතයි. **අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා** යනු ලෝකයාගේ හිතසුව පිණිස ස්වසන්තානයෙහි නූපන්විරූ, ෂට් අසාධාරණ ඥාණයන්ට හේතුභූත වූ ආර්යමාර්ග බෝමුලදී උපදවනුයේ, **අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජානෙතා** යනු හික්මවිය යුතු පුද්ගල සන්තානයෙහි හටනොගත් විරූ ශ්‍රාවක පාරමී ඥාණ හේතුභූත වූ ආර්යමාර්ගයෙහි, දම්සක් පැවතුමෙහි පටන්, අදකල් දක්වා හික්මවිය යුතු පුද්ගල සන්තානයෙහි දනවනුයේ, ශ්‍රාවක හික්මවිය යුතු අයගේද, සන්තානයෙහි භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙන්ම ආර්ය මාර්ගයාගේ හටගැන්ම වන හෙයින් භාග්‍යවතුන් වහන්සේ දනවනුයේ නම් වේ. **අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා** යනු අෂ්ට ධර්මයෙන් යුත් බුදුබව සඳහා කරන ලද ප්‍රාර්ථනා ඇති බෝසත්වරුන්ගේ බුදුබව සඳහා විවරණ දී ප්‍රකාශ නොකරන ලද විරූ, පාරමිතා මාර්ගයෙහි, බුදුවන්නේ යයි විවරණ

මාත්‍රයෙන්ම හෝ බෝමුලදී ඉපදවිය යුතු ආර්යමාර්ගය ප්‍රකාශ කරනුයේ, මෙම ක්‍රමය ප්‍රත්‍යෙක බෝධිසත්ත්ව විවරණයෙහිද ලැබේමය. **මග්ගඤ්ඤූ** යනු ප්‍රත්‍යවේක්ෂණ වශයෙන් තමා විසින් උපදවන ලද මාර්ගය දතුයේ, **මග්ගවිදූ** යනු හික්මවිය යුතු පුද්ගල සන්තානයෙහි දැනැවිය යුතු මාර්ගය දන්නා සුලුවූයේ, **මග්ග කොවිදො** යනු බෝධිසත්ත්වයින්ට ප්‍රකාශ කළයුතු මාර්ගයෙහි විචක්‍ෂණයහ. නොහොත් සර්වඥ බෝධි ප්‍රතිපත්ති මාර්ගය දත්, ප්‍රත්‍යෙක බෝධි ප්‍රතිපත්ති මාර්ගයෙහි නුවණැති, ශ්‍රාවක බෝධි ප්‍රතිපත්ති මාර්ගයෙහි පණ්ඩිත වූයේ 'එම මාර්ගයෙන් කාමාදී ක්ලේශ පෙර තරණය කළහ. තරණය කරති. තරණය කරන්නාහුමය' යන වචනයෙන් සුදුසු පරිද්දෙන් අතීත, අනාගත, වර්තමාන, බුදු, පසේබුදු, ශ්‍රාවකයින්ගේ, මාර්ග වශයෙන්, ශූන්‍යත, අනිමිත්ත, අප්‍රණිහිත මාර්ග වශයෙන්ද, උද්ඝටිතඥ, විපචිතඥ, නෙය්‍ය පුද්ගලයින්ගේ මාර්ග වශයෙන්ද මෙහි ක්‍රමානුකූලව යෙදීම කරති. **මග්ගානුගාමීච පන** යනු භාග්‍යවතුන් වහන්සේ ගියමග අනුව ගමන් කරන්නේ වී, මෙහි 'ච' ශබ්දය හේත්වර්ථයෙහි නිපාතයි. එයින් භාග්‍යවතුන් වහන්සේගේ මාර්ග ඉපදවීම් ආදී ගුණ අවබෝධය සඳහා වූ හේතු යූ.සේයි. පන ශබ්ද කෘත්‍යාර්ථයෙහි නිපාතයි. එයින් භාග්‍යවතුන් වහන්සේ කළ මාර්ග කරුණ යූ.සේයි. **පච්ඡා සමන්නාගතා** යනු වර්තමාන ශ්‍රාවකයෝ ප්‍රථමයෙන් ගියා වූ භාග්‍යවතුන් වහන්සේ අනුව, පසුපස යෙමින් ශීලාදී ගුණයෙන් යුක්ත වූවාහු වෙසෙත්.

මෙසේ තෙරහු 'නූපන් මාර්ගය උපදවනුයේ' යන ආදීන්ගෙන් යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ සියලුම ශීලාදී ගුණයෝ අර්හත් මාර්ගයම ඇසිරිකොට පැමිණියාහුය. එහෙයින් අර්හත් මාර්ගයම ඇසිරිකොට ගුණකථනය කළේය. **ජානං ජානාති** යනු දතයුතු දෙය දනියි. සර්වඥතා ප්‍රඥායෙන් දතයුතු යම්කිසිවක් නම් ඇත්ද? ඒ සියල්ල පංච නෙය්‍ය පථයෙන් හටගත් ප්‍රඥාවෙන් දනියි යයි අර්ථයි. **පස්සං පස්සති** යනු දැකිය යුතු දේ දකියි. සියල්ල දක්නා ස්වභාව හෙයින් එම නෙය්‍ය පථයම ඇසින් දුටුවාක් මෙන් කරනුයේ පැණැසින් දකීයයි අර්ථයි. යම්සේ වනාහි ඇතැමෙක් වෙනස් ආකාරයෙන් ග්‍රහණය කරත්ද, දැනගනිත්ද නොදනිත් දක්නාහුද නොදකිත්. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවෙති. භාග්‍යවතුන් වහන්සේ වනාහි, යථා ස්වභාවයෙන් ග්‍රහණය කරන සේක් දන්නාහුමය. දක්නාහුමය.

දර්ශනයෙහි අධිපති අර්ථයෙන් **චක්ඛුභූතොයි.** දැනගත් ආදී අර්ථයෙන් **ඤාණභූතොයි.** වෙනස් නොවන ස්වභාවාර්ථයෙන් පර්යාප්ති ධර්මය පවත්වන හෙයින් හෘදයෙන් සිතා වචනයෙන් පිටකරන ධර්මමය කරුණුවලින් යුක්ත වූයේනුයි **ධම්මභූතොයි.** ශ්‍රේෂ්ඨාර්ථයෙන් **බ්‍රහ්මභූතොයි.** නොහොත් ඇස මෙන් වූයේනුයි **චක්ඛුභූතොයි.** ඤාණය මෙන් වූයේනුයි **ඤාණභූතොයි.** ධර්මය මෙන් වූයේනුයි **ධම්මභූතොයි.** බ්‍රහ්ම මෙන් වූයේනුයි බ්‍රහ්මභූතොයි. ඒ මෙම ධර්මය කීමෙන් පවත්වන හෙයින් හෝ වත්තායි.

නොයෙක් ආකාරයන්ගෙන් කියන හෙයින් හෝ පවත්වන හෙයින් පවත්තායි. අර්ථය පිටතට ගෙන, ගෙනයන හෙයින් **අත්ථස්ස නිනෙතායි.** නිර්වාණාධිගමය සඳහා, ප්‍රතිපත්ති දේශනා කරන හෙයින්ද, තිවන ප්‍රකට කිරීම සඳහා ධර්ම දේශනයෙන්, නිර්වාණාධිගමයට පමුණුවන හෙයින් **අමතස්සදාතායි,** ලෝකෝත්තර ධර්මය උපදවන ලද හෙයින්ද, හික්මවිය යුතු අයට සුදුසු අයුරින් සුවසේ ලෝකෝත්තර ධර්ම දානයෙහිද, ධර්මයෙහි ඓශ්වර්යත්වයට පත්වූයේනුයි **ධම්මස්සාමියි තථාගත** පදය යටකියන ලද අර්ථමය. දැන් **ජානං ජානාති** යනාදියෙන් කියන ලද ගුණය සර්වඥතායෙන් වෙසෙසා දක්වනු කැමැතියේ සර්වඥතාව සිදුකරනුයේ 'නත්ථි' යනාදිය වදාළහ.

මෙසේ වූ භාග්‍යවතුන් වහන්සේගේ, පාරමී පුණ්‍යබල ප්‍රභාවයෙන් නිපන් අර්හත් මාර්ග ඤාණයෙන් සියලු ධර්මයන්හි අනුසහිත මුළාව මනාව නැසූ හෙයින් **අසච්ඡිකතං** සාක්ෂාත් නොකරන ලද්දක් නම් නැත. නුමුළාවෙන් යුක්තව සියලු ධර්මයන් දත් හෙයින් මග නැණින් නොදක්නා ලද්දෙක් නම් නැත. **අඤ්ඤාතං** එසේම සියලු ධර්මයන් ඇසින් දක්නා මෙන් නැණැසින් දක්නා ලද හෙයින් නොදක්නා ලද්දෙක් නම් නැත. **අදිට්ඨං** නාම නත්ථි. නුවණින් පැමිණි හෙයින් නොදත් දැයක් නම් නැත. **අවිදිතං** නාම නත්ථි. නුමුළා සාක්ෂාත් කිරීමෙන් සාක්ෂාත් කළ හෙයින් සාක්ෂාත් නොකරන ලද්දක් නම් නැත. **අසච්ඡිකතං** නාම නත්ථි. නුමුළා ප්‍රඥාවෙන් ස්පර්ශ කරන ලද හෙයින් ප්‍රඥාවෙන් ස්පර්ශ නොකරන ලද්දක් නම් නැත. **අඵස්සිතං නාම නත්ථි පච්චුප්පන්නං** යනු වර්තමාන කාලය හෝ ධර්මය හෝ, **උපාදාය** යනු ගෙන, ඇතුළත් කොටයයි අර්ථයි. **උපාදාය** යන වචනයෙන්ම කාල විමුක්ත නිර්වාණයද ගන්නා ලද්දේම වේ. අතීතාදී වචනද නැත යනාදී වචනය සමගද සියල්ල යන

වචනය සමගද ගැලපේ. **සබ්බෙ ධම්මා** යනු සියලු සංඛත අසංඛත ධර්ම ඉතිරි නොකොට ගැනීම. **සබ්බාකාරෙන** යනු සියලු ධර්මයන්හි එකිනෙක ධර්මයාගේ වශයෙන්, අනිත්‍ය ආකාරාදී සියලු ආකාරයන් ඉතිරි නොකොට ගැනීමයි. **ඤාණාභි මුඛෙ** යනු නුවණ අබිමුවෙහි, **ආපාථං ආගච්ඡන්ති** යනු දැකීම් ආදියට යොමුවීම සඳහා එළැඹෙති. 'ජානිතබ්බං' යන පදය නෙය්‍ය යන පදයෙහි අර්ථ විවරණ සඳහා යූ.සේයි. අත්තත්ථොච යනාදීන්හි 'ච' ශබ්දය සමුච්චයාර්ථයෙහිය. **අත්තත්ථො** යනු තමාගේ අර්ථයයි. **පරත්ථො** යනු අන්‍ය ත්‍රිවිධ ලෝකයන්ගේ අර්ථයයි. **උභයත්ථො** යනු තමාගේද, අන්‍යයාගේද යන දෙදෙනාගේ අර්ථයයි. **දිට්ඨ ධම්මිකො** යනු ඉහාත්මයෙහි නියුක්ත, ඉහාත්මයෙහි ප්‍රයෝජන වූ අර්ථයයි. මරණින් මත්තෙහි නියුක්ත, මරණින් මතුයෙහි ප්‍රයෝජනවත් වනුයේ **සම්පරායිකොයි**. **උත්තානො** යනාදීන්හි ව්‍යවහාර වශයෙන් කිවයුතු සුවයෙහි පිහිටිහෙයින් නොගැඹුරුය. ව්‍යවහාරය ඉක්මවා කිවයුත්ත ශූන්‍යතා ප්‍රතිසංයුක්ත හෙයින්ද, දුකෙහි පිහිටි හෙයින්ද, **ගම්භීරොයි**. ලෝකෝත්තරය අත්‍යන්ත මුවහ ස්වභාව හෙයින් **ගුළ්හොයි**. අනිත්‍යාදී සනයන්ගෙන් වැසුණු හෙයින් **පටිච්ඡන්නොයි**. ස්වල්ප ව්‍යවහාරයෙන් කිවයුත්ත යථාර්ථය ලෙස නොගෙන අධ්‍යාශයාගේ වශයෙන් ගෙන යායුතු හෙයින් **නෙය්‍යොයි**. බොහෝ ව්‍යවහාරයෙන් කිවයුත්ත වචනමාත්‍රයෙන් අධ්‍යාශයාගේ ගෙනගිය හෙයින් **නීතොයි**. සුපිරිසිදු සීල, සමාධි විදර්ශනාර්ථය තදංග, විෂ්කම්භන වශයෙන් දෝෂ විරහිත හෙයින් **අනවජ්ජොයි**. කෙලෙස් නසන හෙයින් ආර්ය මාර්ගාර්ථය **නික්කිලෙසොයි**. කෙලෙස් සංසිඳුණු හෙයින් ආර්ය ඵලාර්ථය **වොදානොයි**. සංඛත අසංඛතයන්හි අග්‍ර ධර්මය හෙයින් නිර්වාණය **පරමත්ථොයි**. **පරිවත්තති** යනු බුද්ධ ඤාණයට විෂයභාව හෙයින් පිටත නුවූ හෙයින් බුද්ධ ඤාණය තුළ ව්‍යාප්තකොට හෝ හාත්පස වැළඳගෙන හෝ විශේෂයෙන් හෝ පවතී. **සබ්බං කාය කම්මං** යනාදීන්ගෙන් භාග්‍යවතුන් වහන්සේගේ ඤාණමයතාව දක්වයි. **ඤාණානුපරිවත්තති** යනු ඤාණය අනුව පෙරළේ. ඤාණ විරහිතව නොවේයයි අර්ථයි. **අප්පටිහතං** යන්නෙන් නිරාවරණතාව දක්වයි.

නැවත සර්වඥතාවය උපමාවකින් ඔප්පු කරනු කැමැතියේ **යාවතකං** ආදිය වදාළහ. එහි දතයුතුය යනු නෙය්‍යංයි. දතයුත්ත කෙළවර කොටැති, දතයුත්තෙහි අවසානය මොහුට ඇත්තේනුයි නෙය්‍ය පරියන්තිකංයි. අසර්වඥයින්ට වනාහි දතයුත්තෙහි අවසානය නැත්තේමය. ඤාණ පරියන්තිකයෙහිද එම ක්‍රමයමැයි. ප්‍රථම යමකයෙහි කියන ලද

අර්ථයම මෙම යමකයෙන් වෙසෙසා දක්වයි. තෘතීය යමකයෙන් ප්‍රතිෂේධ වශයෙන් නියමකොට දක්වයි. මෙහිද දතයුත්ත ඤාණයාගේ මාර්ගය හෙයින් නෙයාපථයි. **අඤ්ඤඤ මඤ්ඤඤ පරියන්තට්ඨායිනො** යනු දතයුත්තද ඤාණයද ක්ෂයකොට සිටීමෙන් ඔවුනොවුන්ගේ කෙළවරෙහි සිටිනසුලු වූයේ, **ආවජ්ජන පටිබද්ධා** යනු මනෝද්වාරාවර්ජන අයත් වූයේ, ආවර්ජන අනතුරුවම දනීයයි අර්ථයි. **ආකංඛන පටිබද්ධා** යනු කැමැත්තට අයත් වූවාහු, ආවර්ජනයට අනතුරුව ජවන ඤාණයෙන් දනීයයි අර්ථයි. අනෙක් දෙපදයන්, මේ දෙපදයන්ගේ පිළිවෙළින් අර්ථ ප්‍රකාශනය සඳහා යූ.සේයි. **බුද්ධො ආසයං ජනාති** යනු ආදිය ඤාණ කථායෙහි වර්ණිතය. මහා නිර්දේශයෙහි වනාහි 'භාග්‍යවතුන් වහන්සේ ආසය දනිති යයි ආයේය. එහි බුදුරදුන්ගේ යන්නට 'භාග්‍යවතුන් වහන්සේගේ' යයි ආ තන්හිද මෙහි සමහර තන්හිද 'බුදුරදුන්ගේ'යයි ආයේය. **අනන්තමසො** උපරිමාන්තයෙන්, **තිමිතිමංගලං** යන මෙහි තිමිනම් එක් මත්ස්‍ය ජාතියකි. තිමියන් ගිලින්ට සමත් යොදුන් පන්සියයක් විශාල සිරුරැති තිමි තිමංගල නම් එක් මත්ස්‍ය ජාතියක් වේ. මෙහි ජාති ග්‍රහණයෙන් ඒකවචන කරන ලදැයි දතයුතුය. **ගරුළං වෙනතෙය්‍යං** යන මෙහි ගුරුළා යනු ජාති වශයෙන් නාමයයි. වෙනතෙය්‍ය යනු ගෝත්‍ර වශයෙනි. **පදෙසෙ** යනු එක් දේශයක, **සාරිපුත්ත සමා** යනු සියලු බුදුවරුන්ගේ දම්සෙනෙවි තෙරුන් සලකා යූ.සේයි. සෙසු ශ්‍රාවකයෝ වනාහි දම්සෙනෙවි තෙරුන් හා සමාන වූවෝ නම් නොමැත. දෙසූ පරිදි, 'මහණෙනි, මාගේ ශ්‍රාවක මහාප්‍රාඥ භික්ෂූන් අතර යම් ඒ ශාරිපුත්‍ර කෙනෙක් වේද ඔහුම අග්‍රය. අටුවා කථායෙහිද, යූ.සේයි.

**ලොකනාථං ඨපෙත්වාන - යෙ චඤ්ඤෙ සන්ති පාණිනො**
**පඤ්ඤාය සාරිපුත්තස්ස - කලං නාග්ඝන්ති සොළසිං**

ලෝකනාථයන් වහන්සේ හැරුණවිට, යම් ඒ අන්‍ය ප්‍රාණීහු වෙත්ද, සැරියුත් තෙරුන්ගේ ප්‍රඥාව හා සැසඳීමේදී සොළොස් කලාවෙන් කලාවක්ද නොවටී. (එක් කොටසක් 16 ට බෙදා ඉන් කොටසක් 16 ට බෙදා වශයෙන් 16 වතාවක් බෙදීමෙන්) **ඵරිත්වා** යනු බුදු නැණ සියලු දෙව් මිනිසුන්ගේ ප්‍රඥාවට පැමිණ සිටින හෙයින් ඔවුන්ගේ ප්‍රඥාව පැතිර ව්‍යාප්තව සිටියි. **අති සංසිත්වා** යනු බුදු නැණ සියලු දෙව් මිනිසුන්ගේ ප්‍රඥාව ඉක්මවා, ඔවුන්ට විෂය නොවූද, සියලු දතයුතු දේ මැඩගෙන බිඳ සිටියි. මහා නිර්දේශයෙහි වනාහි මැඩපවත්වායිද පාඨයි. මර්දනයකොට

යන අර්ථයි. **යෙපිතෙ** යන ආදිය මෙසේ පතුරුවා, මැඩසිටීමෙහි ප්‍රත්‍යක්ෂ කාරණය දක්වයි. එහි **පණ්ඩිතා** යනු පාණ්ඩිත්‍යයෙන් යුක්ත වූවාහු, **නිපුණා** යනු මෘදු, සියුම් බුද්ධියෙන් යුක්ත වූවාහු, සියුම් අර්ථාන්තරයන්හි අවබෝධ කිරීමෙහි සමර්ථ වූවාහු, **කතපරප්පවාදා** යනු දත් පරවාදයන්ද, අන්‍යයින් සමග කළ වාදයන්හි පළපුරුද්ද ද, **වාලවෙධිරූපා** යනු අස්ලොම් දුනුවායන් සෙයින්, **වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි** යනු විදිනා අස්ලොම්විදුනා දුනුවායා වාලය (අස්ලොම) මෙන් සියුම් වූද, අන්‍යයාගේ දෘෂ්ටිගමනයන් තමාගේ ප්‍රඥා ගමනින් බිඳින්නාහු මෙන් හැසිරෙත් යයි අර්ථයි. නොහොත් 'අශුචිගත මූත්‍රගත'යයි ආදීන්හි මෙන් ප්‍රඥාවම ප්‍රඥාගතයෝය. දෘෂ්ටීහුම දෘෂ්ටිගතයෝය. **පඤ්හං අභිසංඛරිත්වා** යනු ද්විපද, ත්‍රිපද, චතුෂ්පද ප්‍රශ්න රචනාකොට, 'ගුළහානිච අත්ථජාතානි' යනු පාඨ සේසයි. එසේ ඔවුන්ගේ විනය දැක තමා සකස්කළ ප්‍රශ්නය විචාරාවායි මෙසේ භාග්‍යවතුන් වහන්සේ අදහස් කළ හෙයින් ප්‍රශ්න විචාරති. අන්‍යයන්ට වනාහි විමසීමෙන් අවකාශ නොදී භාග්‍යවතුන් වහන්සේ එළැඹෙනවුන්ට දම්දෙසති. දෙසූ පරිදි, අප මෙම ප්‍රශ්නය ශ්‍රමණ ගෞතමයන් කරා එළැඹ විමසන්නෙමු. ඉදින් ශ්‍රමණ ගෞතම තෙමේ මෙසේ විමසූයේ අපට මෙසේ ප්‍රකාශ කරන්නේද? මෙසේ අපි එම වාදය ඔහුට ආරෝපණය කරන්නෙමු. මා විසින් මෙසේ විමසන ලදුයේ මෙසේ ප්‍රකාශ කරන්නේය. මෙසේ අපි එම වාදය ඔහුට ආරෝපණය කරන්නෙමුයි ඔවුහු මෙසේ ප්‍රශ්න සකස් කරති. ඔවුහු ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි එළැඹෙත්. ඔවුහු ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දැහැමි කථායෙන් මනාසේ පෙන්වති. සමාදන් කරවති. උත්සාහවත් කරවති. සතුටු කරවති. ඔවුහු ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් දැහැමි කථායෙන් මනාව පෙන්වන ලද්දාහු, සමාදන් කරවන ලද්දාහු, උත්සාහවත් කරවන ලද්දාහු, සතුටු කරවන ලද්දාහු, ශ්‍රමණ ගෞතමයන් වහන්සේගෙන් ප්‍රශ්න නොවිචාරත්මය. කෙසේනම් වාදයක් ආරෝපණය කරන්නාහුද? ඒකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේම ශ්‍රාවක බවට පැමිණෙත්. කවර හෙයින් ප්‍රශ්න නොවිචාරත්ද යත්? භාග්‍යවතුන් වහන්සේ වනාහි පිරිස මැද ධර්මය දේශනා කරනසේක් පිරිසෙහි අදහස බලති. මෙම පණ්ඩිතවරු ගුය, රහස්‍ය ප්‍රශ්න බඳපටි හරකොට පැමිණියාහුයයි ඉක්බිති දකිති. හෙතෙම (භාග්‍යවත්හු) ඔවුන් විසින් නොවිචාරන ලද්දේම ප්‍රශ්න විචාරීමෙහි මෙතෙක් දොස්ය. විසඳීමෙහි මෙතෙක් දොස්ය. අර්ථයෙහි, පදයෙහි, අක්ෂරයෙහි මෙතෙක් දොස් වේයයි දක්වයි. මෙම ප්‍රශ්න විචාරනුයේ මෙසේ විචරන්නේය. විසඳන්නේ

මෙසේ විසඳන්නේ යයි මෙසේ බඳපටි හරකොට ගෙන එන ලද ප්‍රශ්න දැහැමි කථායෙහි අතරත බහා විනාශ කරයි. එම පණ්ඩිතවරු අපි මෙම ප්‍රශ්න නොවිචාළෙමු. එනිසා ඒකාන්තයෙන් අපි ශ්‍රේෂ්ඨ වෙමු. ඉදින් අපි විමසුයෙමු නම්, පිහිටක් නොමැති අය ලෙසින් සලකා ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අප ඉවත දමන්නෝ යයි සතුටු සිතැත්තෝ වෙති. තවද බුදුවරු දම් දෙසන්නාහු පිරිසට මෛත්‍රී පතුරුවති. මෛත්‍රියෙහි පැතිරවීමෙන් දශබලධාරීන් කරෙහි මහජනයාගේ සිත පහදියි. බුදුවරුනම් රූපයෙන් අග්‍රප්‍රාප්ත වෙති. දැකුම්කලු වූවාහු, මිහිරි ස්වර ඇත්තාහු, මෘදු දිවැති, මනා ස්පර්ශිත දන්තාවරණ ඇත්තාහු, අමෘතයෙන් හෘදය ඉසින්නාක් මෙන් ධර්මය දේශනා කරති. එහි මෛත්‍රී පැතිරවීමෙන් පහන් සිතැති ඔවුන්ට මෙබඳු දෙයාකාරයක් නොමැති හිස් නුවූ, නෛර්යාණික කථාවක් දෙසන භාග්‍යවතුන් වහන්සේ සමග විරුද්ධ ග්‍රාහ ගන්ට නොහැකි වන්නෙමුයි යනාදී වශයෙන් මෙවන් සිත් හටගනී.

**කථිතා විසජ්ජිතා** යනු මෙසේ නුඹලා විචාරවූ යයි නොවිචාළ ප්‍රශ්නයන්ගේ උච්චාරණයෙන් එම ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දාහුම වෙති. යම්සේ ඒවා විසඳිය යුතුද, එසේ විසඳන ලද්දාහුම වෙති. **නිද්දිට්ඨ කාරණා** යන මෙම කරුණෙන් හේතුයෙන්ම වේයයි, මෙසේ සහේතුකත්‍ව කොට විසඳීමෙන්, එම ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේ විසින් නිර්දිෂ්ට කරුණුම වේ. **උපක්ඛිත්තකාව තෙ භගවතො සම්පජ්ජන්ති** යනු එම ක්‍ෂත්‍රිය පණ්ඩිතාදීහු භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්න විසඳීමෙන්ම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි විසිරුණාහු, පාද විසිරුණු බවට පත්වෙති. ශ්‍රාවක බවට හෝ උපාසක බවට පැමිණෙතියි අර්ථයි. ශ්‍රාවක සම්පත්තියට හෝ උපාසක සම්පත්තියට පැමිණෙති යයි යූ.සේයි. **අථ** යනු අනන්තරාර්ථයෙහිය. ඔවුන්ගේ ශ්‍රාවක, උපාසක සම්පත්ති සමනන්තරවමයැයි අර්ථයි. **තත්‍ථ** යනු එම ස්ථානයෙහි හෝ එම ප්‍රාර්ථනයෙහි හෝ, **අතිරොචති** යනු අතිශයින් ජෝතිමත් වේ. බබළයි. **යදිදං පඤ්ඤාය** යනු යම් ආකාර වූ භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රඥාවක් වේද, එම ප්‍රඥාවෙන් භාග්‍යවතුන් වහන්සේ අතිශයින් බබළත් යන අර්ථයි. **ඉති** ශබ්දය කාරණාර්ථයෙහි. මෙම කාරණයෙන් **අග්ගා අසාමන්ත පඤ්ඤා** යනු අග්‍ර අන්‍යයන් විසින් පැමිණිය නොහැකි ප්‍රඥාව යැයි අර්ථයි.

**රාගං අභිභුය්‍යතීති භූරිපඤ්ඤා** යනු එය සාමග්‍රී ප්‍රඥාවෙන් තම වරද රාගය අභිභවනය කෙරේ. මැඩපවත්වයි. මර්දනය කෙරේනුයි භූරි

පඤ්ඤායි. භූරි යනු ස්පර්ශාර්ථය, ප්‍රකටාර්ථයයි. යමක් ස්පර්ශ කරන ලද්දේද, එය ප්‍රතිපක්ෂය මැඩපවත්වයි. ස්පර්ශ නොකරන ලද්ද එසේ නොවේ. එහෙයින් භූරි ප්‍රඥාවෙන් අභිභවනාර්ථය යූ.සේයි. **අභිභවිතා** යනු ඒ ඒ ඵල ප්‍රඥාව ඒ ඒ රාගය අභිභවනය කරන්නේනුයි, මර්දනය කරන්නේනුයි භූරි පඤ්ඤායි. අභිභවතායිද පාඨයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

රාගාදීන්හි වනාහි ඇලීම් ලක්ෂණය **රාගොයි.** දූෂ්‍යවීම් ලක්ෂණය **දොසොයි.** මුළාවීම් ලක්ෂණය **මොහොයි.** කිපීම් ලක්ෂණය **කොධොයි.** වෛර බැඳීම් ලක්ෂණය **උපනාහොයි.** පෙර කල ක්‍රෝධය, පසුකල උපනාහයයි. අන් ගුණ මැකීම් ලක්ෂණය **මක්ඛොයි.** තරඟකාරී ලක්ෂණය **පලාසොයි.** පර සම්පත් ක්ෂය කරන ලක්ෂණය **ඉස්සායි.** තම සම්පත් සඟවන ලක්ෂණය **මච්ඡරියංයි.** තමා කළ පාපයන් සැඟවීම් ලක්ෂණය **මායායි.** තමාගේ අවිද්‍යමාන ගුණ ප්‍රකාශ කිරීම් ලක්ෂණය **සාඨෙය්‍යංයි.** සිතෙහි ඉදිමුණු ස්වභාව ලක්ෂණය **ථම්භොයි.** කළ දෙයට වැඩියමක් කිරීම් ලක්ෂණය **සාරම්භොයි.** ඉහළ නැගීම් ලක්ෂණය **මානොයි.** වැඩිපුර ඉහළ නැගීම් ලක්ෂණය **අතිමානොයි.** මත්වූ ස්වභාව ලක්ෂණය **මදොයි.** පඤ්චකාම ගුණයන්හි සිත අත්හැරීම් ලක්ෂණය **පමාදොයි.**

**රාගො අරි, තං අරිං මද්දනී පඤ්ඤා** යන ආදීන්ගෙන් කුමක් යූසේයිද? රාගාදී ක්ලේශය චිත්ත සන්තානයෙහි වූ සතුරෙක්නුයි භූඅරියි. පද සන්ධි වශයෙන් අකාර ලෝපය කොට භූරියි යූසේයි. එම සතුරා මර්දනය කරන ප්‍රඥාව යැයි කිවයුතු කල්හි (භූරිසසමද්දනී පඤ්ඤා) මද්දන ශබ්දය ලොප්කොට 'භූරි පඤ්ඤායි' යූසේයි. එම සතුරා මර්දනය කරයිද, එම සතුරන්ගේ මර්දනය යැයි පදච්ඡේද කළයුතුය.

**පඨවිසමාය** යනු පැතිරුණු, මහත් අර්ථයෙන්ම පෘථුවිය හා සමවූ, **විත්ථතාය** යනු දතයුතු විෂයයෙහි පතළ භාවයෙන්, එක් කොටසක පමණක් පවත්නා දැනුමෙන් නොවේ. **විපුලාය** යනු විශාල වූ, මහා නිර්දේශයෙහි වනාහි විපුලාය විත්ථතාය යනුවෙන් ආයේය. **සමන්නාගතො** යනු එයින් යුක්ත පුද්ගල තෙමේ **ඉති** ශබ්දය කාරණාර්ථයි. මෙම කරුණෙන් පුද්ගලයා භූරි ප්‍රඥාවෙන් යුක්ත වූ හෙයින් ඔහුගේ ප්‍රඥාව භූරිප්‍රඥා (භූතාර්ථයෙහි සිත් අලවානුයි) නමැයි අර්ථයි. භූරි ප්‍රාඥයාගේ ප්‍රඥාව භූරිපඤ්ඤා ප්‍රඥාව යැයි කිවයුතු කල්හි එක් ප්‍රඥා ශබ්දයකගේ ලෝපය කොට භූරි පඤ්ඤායි යූ.සේයි. භූරිසම ප්‍රඥාවනුයි හෝ භූරි පඤ්ඤායි. **අපිච** යනු අන් ක්‍රමයක්

සඳහා යූ.සේයි. **පඤ්ඤාය මෙතං** යනු ප්‍රඥාවට එය, **අධිවචනං** යනු අධික වචනයයි. **භූරි** යනු භූතාර්ථයෙහි සිත් අලවානුයි භූරියි. **මෙධා** යනු පර්වතයෙහි වැදුණු හෙණක් මෙන් කෙලෙසුන් පීඩනයට පත්කරයි. හිංසාවට පත් කෙරේනුයි මෙධායි, වහා ග්‍රහණ ධාරණාර්ථයෙන් හෝ මෙධායි. **පරිණායිකා** යනු යමෙකුට එය හටගනීද? එම සත්ත්වයා යහපත් ප්‍රතිපත්තියෙහිද, සම්ප්‍රයුක්ත ධර්මයෙහිද යථා ස්වභාව ලක්ෂණ ප්‍රතිවේධයෙහි මනාව ගෙනයයි නුයි පරිණායිකායි. මේවායින්ම අන්‍ය වූද, ප්‍රඥා ආකාර වචන යූසේයි. **පඤ්ඤා බාහුල්ලං** යනු ප්‍රඥාව බහුල වන්නේනුයි පඤ්ඤා බහුලොයි. එහි ස්වභාවය පඤ්ඤා බාහුල්ලංයි. එයද බහුලව පවත්නා ප්‍රඥාවමය. ඉධෙකච්චො යන ආදීන්හි, කල්‍යාණ පෘථග්ජන පුද්ගලයා හෝ ආර්ය පුද්ගල තෙමේ, ප්‍රඥාගරුක වන්නේනුයි **පඤ්ඤා** ගරුකොයි. ප්‍රඥා චරිත පැවැත්ම වන්නේනුයි **පඤ්ඤා සයොයි**, ප්‍රඥාවගේ ඇලුණු බව **පඤ්ඤාධිමුත්තොයි**. ප්‍රඥාවම ධජයක් වැනි වූයේ වන්නේනුයි පඤ්ඤාධජොයි, ප්‍රඥාවම කේතුවක් වැනි වූයේ, වන්නේ නුයි පඤ්ඤාකෙතුයි. ප්‍රඥාවම අධිපති වූයේ **පඤ්ඤාධිපතෙය්‍යොයි**. ධර්ම ස්වභාව විමසීම් බහුලකොට වන්නේනුයි **විචයබහුලොයි**. නොයෙක් ආකරයන්ගෙන් ධර්මස්වභාව විමසීම් බහුලකොට වන්නේනුයි **පවිචය** බහුලොයි. ප්‍රඥායෙන් බැස ඒ ඒ ධර්මයෙහි වැටහීම, ප්‍රකට කිරීම ඔක්ඛායන යයි. එය බහුල වන්නේනුයි **ඔක්ඛායන බහුලොයි**. ප්‍රඥායෙන් ඒ ඒ ධර්මයෙහි මනාකොට දැක්ම සමෙපක්ඛායි. මනාව දැක්මෙහි මාර්ගය පැවැත්ම සමෙපක්ඛායනයයි. මනාව දැක්මෙහි මාර්ග ස්වභාව ප්‍රකෘතිය වන්නේනුයි **සමෙපක්ඛායන ධම්මොයි**. ඒ ඒ ධර්මය විභූතකොට, ප්‍රකටකොට වාසය කෙරේනුයි **විභූත විහාරීයි**. ප්‍රකට වූ විහරණය මොහුට ඇත්තේනුයි **විභූත විහාරීයි**.

ඒ ප්‍රඥා චරිතය ගරුකොට, බහුලකොට වන්නේනුයි තච්චරිතො තග්ගරුකො තබ්බහුලොයි, එම ප්‍රඥායෙහි නිම්න වූයේ, ප්‍රවණතාවයට පත්වූයේ නම්‍රතායෙන් යුක්ත වූයේ - ඇලුණේනුයි **තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තොයි** ඒ ප්‍රඥා තොමෝ අධිපති වූවෝ තදධිපතියි. එයින් පැමිණියේනුයි **තදධිපතෙය්‍යොයි**. පඤ්ඤාගරුකො යන ආදිය 'කාමය සෙවුණේම මෙම පුද්ගලයා කාමය ගරු කරයි යයි දනියි. යනාදීන්හි මෙන් පෙර ජාතියෙහි පටන් යූසේයි. තච්චරිතො යනාදිය මේ ජාතිය සඳහා යූසේයි.

සීඝ්‍ර ප්‍රඥාවද, ලහු ප්‍රඥාවද, හාස ප්‍රඥාවද, ජවන ප්‍රඥාවද, ලෞකික ලෝකෝත්තර මිශ්‍ර වූයේය. වහා සිදුවන අර්ථයෙන් **සීඝ පඤ්ඤායි.** සැහැල්ලු අර්ථයෙන් **ලහුපඤ්ඤායි.** සතුට බහුල අර්ථයෙන් **හාස පඤ්ඤායි.** විදර්ශනා අනුව ගිය සංස්කාරයන්හිද, විසංස්කාරයන්හිද ජවනාර්ථයෙන් **ජවන පඤ්ඤායි. සීඝසීඝං** යනු බොහෝ ශීලාදීන්ගේ සංග්‍රහය සඳහා දෙවරක් යූසේයි. **සීලානි** යනු චාරිත්‍ර වාරිත්‍ර වශයෙන් පනවන ලද ප්‍රාතිමෝක්ෂ සංවර ශීල, **ඉන්ද්‍රිය සංවරං** යනු චක්ෂුරාදී ෂට් ඉන්ද්‍රියයන්ට, රාග ප්‍රතිඝාදි ප්‍රවේශ නොකොට සිහි නමැති කවුළුවෙන් වළක්වා වැසීමයි. **භොජනෙ මත්තඤ්ඤුතං** යනු ප්‍රත්‍යයවේක්ෂිත පරිභෝග වශයෙන් බොදුන්හි පමණ දැනීම් ස්වභාවයයි. **ජාගරියානුයොගං** යනු දවසෙහි රැයෙහි ත්‍රිවිධ කොට්ඨාසයන් තුළ, ප්‍රථම, මධ්‍යම යන දෙකොටසෙහි නිදිවරයි. නොනිදයි. ශ්‍රමණ ධර්මයම (භාවනාවම) කරයිනුයි ජාගරොයි. ජාගරයෙහි ස්වභාවය හෝ කර්මය හෝ ජාගරියංයි. ජාගරියෙහි යෙදීම ජාගරියානුයොගයි. එම ජාගරියානුයෝගය. **සීලක්ඛන්ධං** යනු ශෛක්ෂ්‍ය හෝ අශෛක්ෂ්‍ය ශීලස්කන්ධය, මෙසේ අනෙක් ස්කන්ධයන්ද දතයුත්තාහ. **පඤ්ඤාක්ඛන්ධං** යනු මාර්ග ප්‍රඥාවද, ශෛක්ෂ්‍ය, අශෛක්ෂ්‍යයන්ගේ ලෞකික ප්‍රඥාවද වේ. **විමුත්තික්ඛන්ධං** යනු ඵල විමුක්තියයි. **විමුත්ති ඤාණ දස්සනක්ඛන්ධං** යනු ප්‍රත්‍යවේක්ෂණ ඤාණයයි, **හාසබහුලො** යනු මූලදපදයයි. **වෙදබහුලො** යනු එම ප්‍රීතිය හා සමග යෙදුණු සොම්නස් වේදනාව විඳීම් වශයෙන් විස්තර පදයයි. **තුට්ඨී බහුලො** යනු ඉතා බලවත් ප්‍රීතිය නුවූ, සතුටුවීම් ආකාර වශයෙන් පවත්නා සන්තුෂ්ටිය. **පාමුජ්ජබහුලො** යනු බලවත් ප්‍රීතියෙන් ප්‍රමුදිත භාව වශයෙන්.

**යං කිඤ්චි රූපං** යන ආදිය සම්මර්ශන ඤාණ නිර්දේශයෙහි කියන ලද අර්ථයමය. **තුලයිත්වා** යනු කලාප සම්මර්ශන වශයෙන් තුලනය කොට, **තීරයිත්වා** යනු උදයව්‍යය ඤාණ අනුපස්සනා වශයෙන්, **විභාවයිත්වා** යනු භංගානුපස්සනාදී වශයෙන් ප්‍රකටකොට, **විභූතං කත්වා** යනු සංස්කාරෝපේක්ෂා වශයෙන් ස්පර්ශකොට, තීක්ෂණ ප්‍රඥා ලෝකෝත්තරමය.

**උප්පන්නං** යනු සමථ විදර්ශනා වශයෙන්, විෂ්කම්භන තදංග වශයෙන් ප්‍රහීණ වූයේද, ආර්ය මාර්ගයෙන් මුළුමනින් නොනැසූ හෙයින් හටගන්නා ස්වභාවය නොඉක්මවූ හෙයින් අසමූහතුප්පන්නයැයි යූ.සේයි. එය මෙහි අදහස් කරන ලදී. **නාධිවාසෙති** යනු සිත් සතන්හි නංවා

වාසය නොකරයි. **පජහති** යනු මුළුමනින් නැසීම් වශයෙන් දුරුකෙරේ. **විනොදෙති** යනු ඉවත දමයි. **බ්‍යනති කරොති** යනු විගතාන්ත කරයි. **අනභාවං ගමෙති** යනු සම්පූර්ණ අභාවයට පමුණුවයි. විදර්ශනා අනුක්‍රමයෙන් ආර්ය මාර්ගයට පැමිණ සිඳදැමීම් වශයෙන්ම අභාවයට පමුණුවයි යන අර්ථයි. මෙහිද කාම ප්‍රතිසංයුක්ත විතර්කය **කාම විතක්කොයි**. 'මෙම සත්ත්වයෝ මැරෙත්වායි' අන්‍යයන්ගේ මරණ ප්‍රතිසංයුක්ත විතර්කය **බ්‍යාපාද විතක්කොයි**. 'මෙම සත්ත්වයෝ හිංසනයට පත් වෙත්වායි, අන්‍යයන්ගේ විහිංසා ප්‍රතිසංයුක්ත විතර්කය **විහිංසා විතක්කොයි**. **පාපකෙ** යනු ලාමකයෙහි, **අකුසලෙ ධම්මෙ** යනු අදක්‍ෂතායෙන් හටගත් ධර්මයන්හි,

**නිබ්බෙධික පඤ්ඤා** යනු කලකිරීම් බහුල පුද්ගලයාට උපන් මාර්ග ප්‍රඥාවමය. **උබ්බෙග බහුලො** යනු ඤාණ භය වශයෙන් භය බහුල වූයේ, **උත්‍රාස බහුලො** යනු බලවත් භය බහුල වූයේ, මෙය පළමු පදයෙහිම අර්ථ විවරණයයි. **උක්කණ්ඨන බහුලො** යනු සංස්කාරයන්ගෙන් මත්තෙහි විසංස්කාර අභිමුව හෙයින් උකටලී බව බහුල වූයේ, **අනභිරති බහුලො** යනු උකටලී භාව වශයෙන්ම ඇල්මෙහි අභාවය දක්වයි. දැන්ම එම අර්ථය දෙවදනෙකින් ප්‍රකට කළේය. එහි **බහිමුඛො** යනු සංස්කාරයෙන් පිටත වූ නිර්වාණාභිමුඛව, **න රමති** යනු සිත් නොඅලවයි. **අනබ්භිදධ පුබ්බං** යනු නොදත් කෙළවර ඇති සසර අන්තයට පමුණුවා නොවිදුනා ලද විරූ, **අපපදාලිත පුබ්බං** යනු එම අර්ථයම දෙන වචනයයි. අන්ත කරණයෙන්ම ප්‍රදාරණය නොකළ විරූ යන අර්ථයි. **ලොභක්ඛන්ධං** යනු ලෝභ රාශිය හෝ ලෝභ කොටස හෝ, **ඉමාහි සොළසහි පඤ්ඤාහි සමන්නාගතො** යනු උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් රහත්හුම යූ.සේයි. මත්තෙහි එක් ශෛක්‍ෂ්‍ය ප්‍රතිසම්භිදා ප්‍රාප්තයෙකැයි කියන ලද හෙයින් සෝවාන්, සකෘදාගාමි, අනාගාමීහුද ලැබෙත්මය. **ද්වෙ පුග්ගලා** යනාදීන්හි ප්‍රතිසම්භිදා ප්‍රාප්ත පුද්ගල විශේෂ පිළිවෙළ දක්වයි. එහි **පුබ්බයොගො** යනු අතීත ජාතීන්හි ප්‍රතිසම්භිදා ප්‍රාප්තියට හේතුවූ පුණ්‍ය ප්‍රයෝගයයි. **තෙන** යනු එම පූර්වයෝග කාරණයෙන්, සෙස්සෙහිද මෙසේමය.

**අතිරෙකො හොති** යනු අතිරික්ත වේ. අතිරේක යෝගයෙන් හෝ අතිරේක යැයි යූ.සේයි. **අධිකො හොති** යනු අග්‍ර වේ. **විසෙසො හොති** යනු විශිෂ්ට වේ. විශේෂ යෝගයෙන් හෝ විශේෂයි. **ඤාණං පභිජ්ජති** යනු ප්‍රතිසම්භිදා ඤාණ ප්‍රභේදයට පැමිණේ. **බහුස්සුතො** යනු බුද්ධ වචන

ශ්‍රවණ වශයෙනි. **දෙශනා බහුලො** යනු ධර්මදේශනා වශයෙනි. **ගරූපනිස්සිතො** යනු ප්‍රඥායෙන් අධික ගුරුවරයෙකු ඇසිරි කරන ලදුයේ, **විහාර බහුලො** යනු විදර්ශනා විහරණ බහුල වූයේ, ඵල සමවත් විහරණ බහුල වූයේ හෝ, **පච්චවෙක්ඛනා බහුලො** යනු විදර්ශනා විහරණ ඇතිකල්හි විදර්ශනා ප්‍රත්‍යවේක්ෂණ බහුල වූයේ, ඵල සමවත් විහරණ ඇතිකල්හි ඵල සමවත් බහුල වූයේ, **සෙඛ පටිසම්භිදප්පත්තො** යනු ශෛක්‍ෂයෙක්ව ප්‍රතිසම්භිදා ප්‍රාප්ත වූයේ, මෙසේ **අසෙඛ පටිසම්භිදප්පත්තො, සාවක පාරමිප්පත්තො** යන මෙහි අග්‍ර මහාප්‍රාඥ මහා ශ්‍රාවක සත්සැටක් ඥාණයන්ගේ පරතෙරට යාම පාරමීයි. ශ්‍රාවකයාගේ පාරමීය ශ්‍රාවක පාරමියි. එම ශ්‍රාවක පාරමීයට පැමිණියේනුයි සාවක පාරමිප්පත්තොයි, සාවක පාරමිතාප්පත්තොයි හෝ පාඨයි. ඒ සත්සැටක් ශ්‍රාවක ඥාණයන්ගේ, පාලකයා වූද, පූරකයා වූද ඒ මහා ශ්‍රාවක තෙමේ උතුම්ය. ඒ උතුම් පුද්ගලයාගේ මේ සත් සැට ප්‍රභේදගත ඥාණ ක්‍රියාව උත්තමයාගේ ස්වභාවය, ක්‍රියාවනුයි පාරමීයි. එම ශ්‍රාවකයාගේ පාරමීය ශ්‍රාවක පාරමීයි. එයට පැමිණියේනුයි ශ්‍රාවක පාරමීප්‍රාප්ත යනු **සාවක පාරමිප්පත්තො** යනු මහ මුගලන් තෙරුන් ආදී වූ යම්කිසි ශ්‍රාවකයෙකි. ශ්‍රාවක පාරමීප්‍රාප්ත ශ්‍රාවකයාගෙන් අතිරේක අන්‍ය ශ්‍රාවකයෙකුගේ අභාවයෙන් **එකො පච්චෙක සම්බුද්ධොයි** වදාළහ. නැවත **පඤ්ඤා පභෙද කුසලො** යන ආදීන්ගෙන් කියන ලද අර්ථයම නිගමනය කොට දැක්වීය. ඥාණ කථායෙහි බොහෝ සෙයින් නොයෙක් ඥාණ නිර්දිෂ්ටය. ප්‍රඥා කථායෙහි බොහෝසෙයින් එකම ප්‍රඥාව, නොයෙක් ආකාර වශයෙන් නොයෙක් ආකර කොට යූසේයි. මේ විශේෂයයි.

## ප්‍රඥා කථා වර්ණනා නිමි.

දැන් ප්‍රඥා කථාවට අනතුරුව ප්‍රඥානුභාව දක්වන්නහු විසින් දේශිත සෘද්ධි කථායෙහි පෙරනුවූ අර්ථ අනුවර්ණනාවයි. එහි විමසීම්හි **කා ඉද්ධි** යනු ස්වභාව විමසීමයි. **කති ඉද්ධියො** යනු ප්‍රභේද විමසීමයි. **කති භූමියො** යනු රාශි විමසීමයි. **කති පාදානි** යනු පිහිටීම විමසීමයි. **කති පදානි** යනු ආසන්න කරුණ විමසීමයි. **කති මූලානි** යනු මුල් කරුණ විමසීමයි. විසඳීම්හි **ඉජ්ඣනට්ඨෙන ඉද්ධි** යනු සමෘද්ධවීම් අර්ථයෙන්, ප්‍රතිලාභාර්ථයෙන් හෝ යන අර්ථයි. යමක් නිපදේද, ලබයිද, එය සමෘද්ධ වේයයි යූසේයි. දෙසූ පරිදි 'කැමැති දේ කැමැති වන්නහුට ඉදින් සමෘද්ධ

වේද, නෛෂ්ක්‍රම්‍යය සිද්ධවේනුයි ඉද්ධියි. බැහැර කෙරේනුයි ප්‍රාතිහාර්යයි ආදියයි. වෙනත් ක්‍රමයක් සමෘද්ධවීම් අර්ථයෙන් ඍද්ධියි. උපාය සම්පත්තියට එය විශේෂ නාමයකි. උපාය සම්පත්තිය වනාහි අදහස් කරන ලද ඵලය බිහිකරවන හෙයින් සමෘද්ධ වේ. දෙසූ පරිදි, මෙම චිත්ත ගෘහපති තෙමේ සිල්වත්ය. යහපත් ධර්මයන්ගෙන් යුක්තය. ඉදින් ප්‍රාර්ථනා කරන්නේද අනාගත කාලයෙහි සක්විති රජ වන්නේය. සිල්වතාට චිත්ත ප්‍රණිධි විශුද්ධ හෙයින් සමෘද්ධ වන්නේය. වෙනත් ක්‍රමයක් එයින් සත්ත්වයෝ සමෘද්ධ වෙත්නුයි ඍද්ධියි. සමෘද්ධ වූවාහු, අභිවෘද්ධියට පත්වූවාහු උසස් බවට පැමිණියාහු වෙත්යයි යුසේයි.

දශ ඍද්ධීන්හි අදිටන් වශයෙන් නිපන් හෙයින් **අධිට්ඨානා ඉද්ධියි,** ප්‍රකෘති වර්ණ අත්හැරීමෙන් වන වෙනස්වීම් වශයෙන් පවත්නා හෙයින් **විකුබ්බනා ඉද්ධියි.** ශරීරාභ්‍යන්තරයෙහි අන් මනොමය ශරීරයක්හුගේ හටගැනීම් වශයෙන් පවත්නා හෙයින් **මනොමයා ඉද්ධියි,** ඥාණයාගේ හටගැන්මෙන් පෙර හෝ පසුව හෝ එකෙණෙහි හෝ ඥාණානුභාවයෙන් නිපන් විශේෂය **ඤාණ විප්ඵාරා ඉද්ධියි.** සමාධියෙන් පෙර හෝ පසුව හෝ එකෙණෙහි හෝ සමථානුභාවයෙන් නිපන් විශේෂය **සමාධි විප්ඵාරා ඉද්ධියි.** සිත් වසඟ කළ ආර්යයන්ටම හටගන්නා හෙයින් **අරියා ඉද්ධියි.** කර්ම විපාක වශයෙන් හටගත් විශේෂය **කම්ම විපාකජා ඉද්ධියි.** පෙර කළ පිනැත්තහුට හටගත් විශේෂය **කම්මවිපාකජා ඉද්ධියි.** පෙර කළ පිනැත්තහුට හටගත් විශේෂය **පුඤ්ඤවතො ඉද්ධියි.** විද්‍යාවෙන් හටගත් විශේෂය **විජ්ජාමයා ඉද්ධියි.** ඒ ඒ සම්‍යක් ප්‍රයෝගයෙන් ඒ ඒ ධර්මයාගේ සමෘද්ධවීම **තත්‍ථ තත්‍ථ සම්මාපයොග පච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධියි. ඉද්ධියා චතසෙසා භූමියො** යයි විශේෂයක් නොකොට කියන ලද්දේ නමුත්, යථාලාභ වශයෙන්, අධිට්ඨාන, විකුර්වණ, මනොමය ඍද්ධීන්ම භූමීහුය. සෙස්සන්ගේ වශයෙන් නොවේය. **විවෙකජා භූමි** යනු විවේකයෙන් හෝ විවේකයෙහි හෝ හටගත්තාහු විවේකජ භූමියි **පීති සුඛ භූමි** යනු ප්‍රීති, සුව යුත් භූමියයි. **උපෙක්ඛා සුඛ භූමි** යනු තත්‍රමධ්‍ය සෝපේක්ෂාවෙන්ද, සුවයෙන්ද යුත් භූමියයි. අදුක්ඛමසුඛ භූමි යනු නොදුක්, නොසුව වේදනා යුත් භූමියයි. ඒවා අතර ප්‍රථම ද්විතීය ධ්‍යානයන්, ප්‍රීතිය පැතිරීමෙන්ද, ධ්‍යානත්‍රයයක් සුවය පැතිරීමෙන්ද චතුර්ථ ධ්‍යානයන් චිත්තයාගේ පැතිරවීම් වශයෙනි. මෙහිද ප්‍රථම ත්‍රිවිධ ධ්‍යානයන් ප්‍රීතිය පැතිරීමෙන්ද, සුවය පැතිරීමෙන්ද, සුව සංඥාවටද, ලහු සංඥාවටද බැස ලහු (සැහැල්ලු) මෘදු කර්මණ්‍යතාවයන් වී ඍද්ධියට පැමිණේ. මෙම ක්‍රමය ඍද්ධි ප්‍රතිලාභය

සඳහා පවත්නා හෙයින් සම්භාර භූමියයි දතයුත්තාහ. (හටගන්නා භූමි) චතුර්ථ ධ්‍යානය වනාහි ඍද්ධි ලාභය සඳහා ප්‍රකෘති භූමියමය. **ඉද්ධිලාභාය** යනු තම සන්තානයෙහි පහළවීම් වශයෙන් ඍද්ධීන්ගේ ලැබීම සඳහා, **ඉද්ධිපටිලාභාය** යනු පරිහානියට පත්වූ ඍද්ධීන්ගේ වීර්යාරම්භ කිරීම් වශයෙන් නැවත ලැබීම සඳහා, උපසර්ග වශයෙන් හෝ පදය වඩන ලදී. **ඉද්ධි විකුබ්බනතාය** යනු ඍද්ධියෙන් නොයෙක් ක්‍රියාකිරීම සඳහා, **ඉද්ධිවිසවිතාය** යනු නොයෙක් විශේෂතා ගලායයි. හටගන්වයි. පවත්වයිනුයි විසවියි. විවිධ වූ ශ්‍රවණය හෝ මොහුට ඇත්තේනුයි විසවියි. එහි ස්වභාවය විසවිතායි. එම විසවිතායෙන්, ඍද්ධියෙන් විවිධ විශේෂ පවත්වන ස්වභාවය යැයි අර්ථයි. **ඉද්ධි වසීභාවාය** යනු ඍද්ධියෙහි ස්වාමිත්වය සඳහා, **ඉද්ධි වෙසාරජ්ජාය** යනු ඍද්ධියෙහි විශාරද බව සඳහා (නිපුණතාවය සඳහා) ඍද්ධිපාද ඥාණ කථායෙහි කියන ලද අර්ථමය.

**ඡන්දං චෙ භික්ඛු නිස්සාය** යනු ඉදින් භික්ෂුව ඡන්දය නිශ්‍රයකොට ඡන්දය අධිපතිකොට, **ලභති සමාධිං** යනු සමාධිය ලබයි. නිපදවයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. එහි ඡන්ද, චිත්ත, වීර්ය, වීමංසා යන සිව් පදය ඒ හා සම්ප්‍රයුක්ත සිව සමාධි සිව්පදදැයි මෙසේ අෂ්ටපද වේ. ඍද්ධිය උපදවනු කැමැති ඡන්දය සමාධිය හා එක්ව නියුක්තවූයේම ඍද්ධි ප්‍රතිලාභය සඳහා පවතී. වීර්යාදීහුද එසේමය. එහෙයින් මෙම අට පද යූසේයි.

අභිඥා උපදවනු කැමැති යෝගියා විසින් කළයුතු යෝග විධි දක්වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් 'හෙතෙම මෙසේ සිත සමාහිත වූ පිරිසිදු වූ ඉතා පිරිසිදු වූ, කිළිටි රහිත, පහවූ උපක්ලේශයන් ඇති මෘදු වූ, කර්මණ්‍යව සිටි කම්පානොවන තත්වයට පත්කල්හි, යයි සිතෙහි කම්පා නොවීම යූසේයි. ඒ තෙරහු සොළොස් ආකාරයකින් දක්වන්නාහු සොළස මූලානි යනාදිය වදාළහ.

එහි **අනොනතං** යනු කුසීතබව වශයෙන්, පහත් බවක් නොමැතිවීම යයි අර්ථයි. **අනුන්නතං** යනු නොසන්සුන්කම් වශයෙන් ඉහළ නොනැගියේ, නොසන්සුන් නොවූයේ යන අර්ථයි. **අනභිනතං** යනු ලෝභ වශයෙන් නොඅල්ලා ගැනීම නොඇලීමයයි අර්ථයි. කාමූකත්වයට නැමුණේ අභිනතංයි. මෙය එසේ නොවේයයි යූසේයි. **රාගෙන** යනු සංස්කාර

වස්තුක ලෝභයෙන්, **අනපනතං** යනු ද්වේෂ වශයෙන් නොනැමුණු, නොගැටීම යයි අර්ථයි. නතං, නති යනු අර්ථ වශයෙන් එකකි. පහවූ නැමීම අපනතංයි. එය මෙබඳු නොවේයයි යූසේයි. **අනිස්සිතං** යනු අනාත්ම වශයෙන් දුටු හෙයින් දෘෂ්ටි වශයෙන් ආත්මයයි හෝ ආත්මනීය යැයි හෝ කිසිවක් නිශ්‍රිත නොවූයේ, **අප්පටිබද්ධං** යනු ප්‍රත්‍යුපකාර ආශා වශයෙන් ප්‍රතිබද්ධ නොවූයේ, **ඡන්දරාගෙන** යනු සත් වස්තුක ලෝභයෙන්, **විමුත්තං** යනු විෂ්කම්භන විමුක්ති වශයෙන් කාමරාගයෙන් මිදුණේ, නොහොත් පඤ්ච විමුක්ති වශයෙන් ඒ ඒ ප්‍රතිපක්ෂතාවන්ගෙන් මිදුණේ, මෙය පෘථග්ජන ශෛක්ෂ්‍ය අශෛක්ෂ්‍යයන්ටද අභිඥා උපදවන හෙයින්, නිරෝධ සමාපත්ති ඥාණයෙන් සොළොස් ඥාණ චර්යාවන්ගෙන් යැයි කියන ලද ක්‍රමයෙන් උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් යූසේයි. යථාලාභ වශයෙන් ගතයුතුය. **කාමරාගෙන** යනු මෛථුන රාගයෙන්, **විසඤ්ඤුත්තං** යනු විෂ්කම්භන වශයෙන් සෙසු කෙලෙසුන්ගෙන් වෙන්වූයේ, උත්කෘෂ්ට ක්‍රමයෙන් නැසීම් වශයෙන් වෙන්වූයේ, **කිලෙසෙ** යනු සෙසු කෙලෙසුන්, **විමරියාදි කතං** යනු විෂ්කම්භනය කරන ලද සීමා වශයෙන් පහවූ කෙලෙස් සීමා කරන ලදුයේ, ඒ ඒ මාර්ගයෙන් ප්‍රහාණය කළයුතු සීමා වශයෙන් හෝ පහවූ කෙලෙස් සීමා කරන ලදුයේ, **කිලෙස මරියාදෙ** යනු එයින් ප්‍රහීණ කෙලෙස් සීමාවෙන්, මෙහි ලිංග විපර්යාසය දතයුතුය. **එකත්තගතං** එක් අරමුණකට ගියා වූ, **නානත්ත කිලෙසෙහි** යනු නොයෙක් අරමුණුවල පවත්නා කෙලෙසුන්ගෙන්, මෙය අරමුණ අපේක්ෂාකොට යූසේයි. අනොනතං ආදිය වනාහි කෙලෙසුන්ම අපේක්ෂාකොට යූසේයි. **ඔභාසගතං** යනු ප්‍රඥාවෙහි ප්‍රකට පැවතීම් වශයෙන් ප්‍රඥාලෝකයට ගිය, අවිද්‍යාන්ධකාරයන්ගෙන් බලවත් අවිද්‍යාවෙන්. සිව්භූමීහු සොළොස් මූල ඍද්ධියෙහි පූර්වභාග වශයෙන් යූ.සේයි. සිව් සිව් පාද, අටපදයන්, පූර්වභාග වශයෙන්ද සම්ප්‍රයෝග වශයෙන්ද යූසේයි.

මෙසේ ඍද්ධියෙහි භූමි, පාද, පද, මූල වූ ධර්මයන් පෙන්වා, දැන් එම ඍද්ධීන් පෙන්වනුයේ **කතමා අධිට්ඨානා ඉද්ධි** යනාදිය වදාළහ. එහි උදෙසීම් පදයන්හි අර්ථ, ඍද්ධිවිධ ඥාණ නිර්දේශයෙහි යූ.සේයි. **ඉධ භික්ඛු** යනු මෙ සස්නෙහි භික්ෂුව, ඉන් සියලු ආකාර ඍද්ධිවිධ කාරකයාගේ අන්තන්හි අභාවය දක්වයි. මෙම දෙපදයන්ගේ නිර්දේශය කියන ලද අර්ථමය. එහෙයින්ම ඍද්ධියෙහි භූමි, පාද, පද මූල වූ ධර්මයන්ගෙන් යුක්ත වූයේ, විශුද්ධි මාර්ගයෙහි කියන ලද තුදුසක් හෝ පසළොසක් වූ ආකාරයන්ගෙන්, මනාව දමනය කරන ලද සිතැති බවද, ඡන්දාදී එකිනෙක

අධිපති සමවැදීම් වශයෙන් ආවර්ජනාදී වසීභාව වශයෙන්ද මෘදු කර්මණ්‍ය කළ සිතැති බවද යූ.සේයි. බලවත් පූර්වයෝග යුත්, පූර්වයෝග සම්පතින් අර්හත්ව ප්‍රතිලාභයෙන්ම ලද අභිඥාදී ගුණ යුත් භික්‍ෂුව භූමි ආදී ධර්මයන්ගෙන් යුක්ත වූයේ වේයැයි සලකා එයද යූසේයි.

**බහුකං ආවජ්ජති** යනු පෘථුවි කසිණාරම්මණ, අභිඥාපාදක චතුර්ථ ධ්‍යානයට සමවැද, නැගිට, ඉදින් සියයක් කැමැති වේද, සියයක් වෙමි. සියයක් වෙමියි පරිකර්ම කිරීම් වශයෙන් ආවර්ජනා කරයි. **ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති** යනු මෙසේ පරිකර්ම කොට අභිඥා ඥානයෙන් අධිෂ්ඨාන කරයි. මෙහි පරිකර්මකොට නැවත පාදකධ්‍යාන සමවැදීම යූ.සේයි. කිසිසේත් නොකියන ලදී. තවද අටුවායෙහි ආවර්ජනා කෙරේයයි පරිකර්ම වශයෙන්ම යූසේයි. ආවර්ජනය කොට ඤාණයෙන් අධිෂ්ඨාන කෙරේයයි අභිඥා ඥාන වශයෙන් යූසේයි. එහෙයින් බොහෝකොට ආවර්ජනා කෙරේ. ඉක්බිති එම පරිකර්ම චිත්තයන්ගේ අවසානයෙහි සමවදී. සමවතින් නැගිට නැවත බොහෝ දෙනෙක් වෙමියි ආවර්ජනා කොට ඉන් මත්තෙහි පවත්නා තුනක් හෝ සතරක් වූ පූර්වභාග චිත්තයන්ට අනතුරුව උපන් තීරණය කිරීම් වශයෙන් අධිෂ්ඨානයැයි ලද නාමයෙන් එක්ම අභිඥා ඥානයෙන් අධිෂ්ඨාන කෙරේයැයි මෙසේ මෙහි අර්ථ දතයුතුයැයි යූසෙයින් එපරිද්දෙන්ම දතයුතුයි.

'අනුභව කොට සයනය කෙරේ'යයි කී කල්හි ජලය පානය නොකොට, අත් සේදීම් ආදිය නොකොට, අනුභව කළ අනතුරුවම සයනය කෙරේයයි අර්ථය නොවේ. අන් කෘත්‍යයන්හි අතරක් ඇතිකල්හිම අනුභව කොට සයනය කෙරේයයි යූ.සේයි. මෙසේ මෙහිද දතයුතුය. පළමුව පාදකධ්‍යාන සමවැදීමද පෙළෙහි නොකියන ලද්දේමය. එම අධිෂ්ඨාන ඥානය සමගම සියයක් වේ. දහසෙහිද ලක්‍ෂයෙහිද එම ක්‍රමයමය. ඉදින් මෙසේ සිදු නොවේද? නැවත පිරියම්කොට, දෙවනුවද සමවැද, නැගිට අධිෂ්ඨාන කළයුතුය. සංයුත්තට්ඨ කථායෙහි එක්වරක් දෙවරක් සමවදින්ට සුදුසුයැයි යූසේයි. එහි පාදකධ්‍යාන සිත නිමිත්තාරම්මණය, පරිකර්ම සිත් සියක් අරමුණු හෝ දහසක් අරමුණු හෝ වෙයි. ඒවා වනාහි වර්ණ වශයෙනි. ප්‍රඥප්ති වශයෙන් නොවේ. අධිෂ්ඨාන සිතද එසේම සියක් අරමුණු හෝ දහසක් අරමුණු හෝ වෙයි. එය පෙර කියන ලද අර්පණා සිත මෙන් ගොත්‍රභුවට අනතුරුව රූපාවචර චතුර්ථධ්‍යානික එකක්ම උපදියි. **යථායසමා චූලපන්ථකො එකොපි හුත්වා**

බහුධා හොති යනු බොහෝ ආකාර භාවයාගේ කාය සාක්ෂි දැක්වීම සඳහා යූ.සේයි. මෙහි වර්තමාන කාල වචනය තෙරුන්ගේ එසේ කරන ස්වභාව හෙයින්, ඔහුගේ ජීවමාන කාලය ලෙසින් සලකා කරන ලදැයි දතයුතුය.

එකොපි හොති යන වාරයෙහිද එම ක්‍රමයමැයි. එහි මේ කථාවස්තුවයි. එම දෙසොහොවුරෝ මාර්ගයෙහි උපන්හෙයින් පන්ථක යන නාමය ලදහ. ඔවුනතර දෙටු සොහොවුරු මහාපන්ථක පැවිදිව පිළිසිඹියා සහිතව අර්හත්වයට පැමිණියේය. ඔහු අර්හත්වයට පත්ව චූලපන්ථක පැවිදි කරවා,

පදුමං යථා කොකනදං සුගන්ධං
පාතො සියා ඵුල්ලමවීත ගන්ධං
අංගීරසං පස්ස විරොචමානං
තපන්ත මාදිච්ච මිවන්ත ලික්ඛෙ

උදෑසන පිපුණු පහනොවූ සුවඳැති, රත් පියුම් පුෂ්පයක් යම්සේ සුවඳවත් වන්නේද? එබඳු වූ අහසෙහි බබළන සූර්යයා බඳු, බබළන්නා වූ අංගීරසයන් වහන්සේ බලව යන මෙම ගාථාව දුන්නේය.

හෙතෙම එය සිව්මසක් තුළ ප්‍රගුණ කරන්ට නොහැකිවිය. ඉක්බිති තෙරහු ඔහුට, නුඹ මෙසස්නෙහි පැවිදිව සිටීමට නුසුදුස්සෙකි. මින් 'නික්ම යව'යි කීයේය. එකල්හි තෙරහු භත්තුද්දෙසක වෙති. කෞමාර භෘත්‍ය ජීවක තෙමේ බොහෝ මල්, ගඳ, විලවුන් ගෙන තම අඹවනයට ගොස් ශාස්තෲන් වහන්සේ පූජාකොට, ධර්මශ්‍රවණය කොට, දශබලධාරීන් වහන්සේ නැමද, තෙරුන් කරා එළඹ, 'ස්වාමීනි, හෙට බුද්ධප්‍රමුඛ පන්සියයක් භික්ෂූන් රැගෙන අප නිවසෙහි භික්ෂාව ගනු මැනවැයි කීයේය. තෙරහුද, චූලපන්ථක හැර සෙස්සන්ගේ වශයෙන් ඉවසමියි කිවූහ. එය අසා චූලපන්ථක තෙමෙ, බොහෝසෙයින් දොම්නසට පත්වූයේය. දෙවන දින උදෑසනින්ම විහාරයෙන් නික්ම සස්නෙහි අපේක්ෂා සහිතව විහාර දොර කොටුයෙහි හඬමින් සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ හේතුසම්පත් දැක, ඔහු කරා එළැඹ කවර හෙයින් හඬන්නෙහිදැයි විචාළ සේක. හෙතෙම එම පුවත කීයේය. භාග්‍යවතුන් වහන්සේ හැදෑරීම් කරන්ට නොහැකිවනුයේ මාගේ ශාසනයෙහි අභව්‍යයෙක් නම් නොවේ.

පන්ථක සෝක නොකරවයි චක්‍ර ලක්‍ෂණ ඇති අත්ලෙන් ඔහුගේ හිස ස්පර්ශකොට, ඔහු අතින් අල්ලාගෙන, විහාරයට පිවිස, ගඳකිළි ඉදිරිපස හිඳුවා, සෘද්ධියෙන් මැවූ පිරිසිදු දිරූ රෙදිකඩක් 'මෙම දිරූ රෙදිකඩ 'රජොහරණං රජොහරණං' යනුවෙන් අතින් පරිමදිමින් හිඳුව පන්ථකයැයි කියා, ඔහුට දිරූ රෙදිකඩ දී, කල් දැන්වූ කල්හි භික්‍ෂු සංඝයා පිරිවරන ලදුයේ ජීවකයාගේ ගෙට ගොස් පනවන ලද අස්නෙහි වැඩහුන් සේක. එසේ පිරිමදින්නා වූ ඔහුගේ එම දිරුණු රෙදිකඩ කිළිටිව ක්‍රමයෙන් කලුවන් විය. හෙතෙම, මේ පිරිසිදු දිරුණු රෙදිකඩකි. මෙහි දොසෙක් නැත. මෙම දෝෂය ආත්මභාවය නිසායැයි හැඟීම් ලැබ, පඤ්චස්කන්ධයන්හි නුවණ බහා විදර්ශනා වැඩීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට ආලෝකයක් විහිදුවා ඉදිරිපස හිඳින්නාක් මෙන් දර්ශනය වනු ලබන ආකාරයක්ව මෙම ආලෝක ගාථා වදාළේය.

**රාගො රජො නච පන රෙණු වුච්චති**
**රාගස්සෙතං අධිවචනං රජොති**
**එතං රජං විප්පජහිත්වා භික්ඛවො**
**විහරන්ති තෙ විගත රජස්ස සාසනෙ**

රාගය කිලුටකි. දුහුවිල්ලක් යයි නොකියනු ලැබේ. රජස් යනු රාගයට විශේෂ නාමයකි. භික්‍ෂූහු එම කිලුට දුරුකොට, පහවූ කිලිටි ඇත්තහුගේ සස්නෙහි වෙසෙත්.

**දොසො -පෙ- සාසනෙ** ද්වේෂය සස්නෙහි
**මොහො -පෙ- සාසනෙ** මෝහය සස්නෙහි

**අධිචෙතසො අප්පමජ්ජතො**
**මුනිනො මොන පථෙසු සික්ඛතො**
**සොකා නභවන්ති තාදිනො**
**උපසන්තස්ස සදා සතීමතො ති**

මුනිවරයෙකු ගමන් කළයුතු මාර්ගයෙහි ගමන් කරමින් හික්මෙන්නා වූ, උසස් චිත්ත සමාධීන්හි අප්‍රමාද වන්නා වූ තාදි ගුණ යුත්, හැමකල්හි සිහියෙන් යුත් උපශාන්ත මුනීහුට සෝකයෝ හට නොගනිත්.

ගාථාවසානයෙහි තෙරහු ප්‍රතිසම්භිදා සහිතව අර්හත්වයට පැමිණියහ. හෙතෙම මනෝමය ධ්‍යානලාභියෙක් බවට පත්ව, එකෙක්ව බොහෝ වීමටත්, බොහෝව එකෙක් වීමටත් සමර්ථ වූයේය. අර්හත් මාර්ගාවබෝධය සමගම ත්‍රිපිටකාවබෝධයද, ෂට් අභිඥාද ලදහ. ජීවක තෙමේද දශබලධාරීන් වහන්සේට දක්ෂිණෝදකය එළැවීය. ශාස්තෲන් වහන්සේ පාත්‍රය අතින් වසා 'ස්වාමීනි, කවර හෙයින්දැයි විචාරන ලද සේක් 'ජීවක වෙහෙරෙහි එක් භික්ෂුවක් සිටීයයි වදාළ සේක. හෙතෙම යව, ආර්යයන් වහන්සේ කැටුව වහා එවයයි කියා පුරුෂයෙකු යැවීය. චුල්ලපන්ථක තෙරහු තම සහෝදරයාට තමා පැමිණි උසස් ඥාණය හඟවනු කැමැතියේ එම පුරුෂයාගේ පැමිණීමට කල්තබාම භික්ෂූන් දහසක් නිර්මිතකොට එක් අයෙකුගෙන් එක් අයෙක් අසමාන වන ලෙසද, එක් අයෙකුගේ සිවුරු මැසීම් ආදී සාසනික කටයුතු අනෙකාගෙන් අසමාන වන ලෙසද නිර්මිත කළහ. පුරුෂයා ගොස් වෙහෙරෙහි බොහෝ භික්ෂූන් දැක ආපසු අවුත්, ස්වාමීනි වෙහෙරෙහි භික්ෂූහු බොහෝය. කැඳවිය යුතු ආර්යයන් වහන්සේ නොදකිමියි ජීවකට කීය. ජීවක තෙමේ ශාස්තෲන් වහන්සේ විමසා ඔහුගේ නම කියාදී නැවත ඔහු යැවීය. ඔහු ගොස් ස්වාමීනි, චූලපන්ථක නම් කවරෙක්දැයි විචාළේය. මම චූලපන්ථක, මම චූලපන්ථකයැයි එක්වරම මුව සහසක් කීයේය. ඔහු නැවත ගොස් සියල්ලෝ චූලපන්ථකයහ. මම කැඳවිය යුතු අය නොදනිමියි කීයේය. ජීවක තෙමේ ප්‍රතිවේධ කළ සිව්සස් හෙයින් ඍද්ධිමත් භික්ෂුවකැයි න්‍යාය අනුව දැනගති. භාග්‍යවතුන් වහන්සේ යව, යමෙක් පළමුව දක්නෙහිද? ඔහු සිවුරු කොණින් ගෙන ශාස්තෲන් වහන්සේ නුඹ අමතන සේක යයි කියා ගෙන එවයි වදාළ සේක. හෙතෙම ගොස් එසේ කළේය. එකෙණෙහිම සියලු නිර්මිතයෝ අතුරුදන් වූහ. තෙරහු ඔහු පිටත්කර යවා, මුව දෝවනාදී සිරුරු කිස නිමවා පළමුව ගොස් පැනැවූ අස්නෙහි හුන්හ. එකෙණෙහි ශාස්තෲන් වහන්සේ දක්ෂිණෝදකය ගෙන, බත් කිස කොට, චුල්ලපන්ථක තෙරුන් ලවාම භුක්තානුමෝදනා ධර්මදේශනය කරවූහ. තෙරහු දීඝ, මජ්ඣිම නිකාය ප්‍රමාණ ධර්මකථාවක් කළහ.

අනෙක් භික්ෂූහු අධිෂ්ඨානයෙන් මනෝමය ශරීර නිර්මිතකොට තුනක් හෝ සතරක් නිර්මිත කෙරෙති. බොහෝ අය එක් සමානවූයේම, ඒකාකාර වූම ක්‍රියාවන් කරනවුන් කොට නිර්මිත කෙරෙති. චූලපන්ථක තෙරහු ඒකාවර්ජනයෙන්ම භික්ෂූන් දහසක් මැවූහ. දෙදෙනෙක් එක් සමාන නොකළහ. එක් ආකාර ක්‍රියා කරන අය ලෙසින්ද නොම කළහ. එහෙයින්

මනෝමය කාය නිර්මාණය කරන්නන් අතර අග්‍රයෙක් නම් වූයේය. අනෙක් බොහෝ අය නියම නොකොට නිර්මිත කළාහු ඍද්ධිමතා සමා නම වෙති. සිටීම් හිඳීම් ආදියෙහිද කථාකිරීම් තෘෂ්ණීභාවාදීන්හිද, ඍද්ධිමතා යම් යම් දේ කරයිද, ඒ ඒ දේම නිර්මිතයද කරයි. ඉදින් වනාහි නොයෙක් වර්ණ කරනු කැමැතියේ වේද, සමහරු ප්‍රථම වයසෙහි, සමහරු මධ්‍යම වයසෙහි, සමහරු පශ්චිම වයසෙහි, එසේම දික් කෙස්, අර්ධයක් මුඩුකළ, මුඩුකළ, මිශ්‍රකෙස්, අර්ධයක් රත් සිවුරු, පඬුවන් සිවුරු, දහම්පද කියන, ධර්මකථා කියන හඬ නගා කියන, ප්‍රශ්න විමසන, ප්‍රශ්න විසඳන, පඬු පොවන, පඬු තම්බන, සිවුරු මහන, සේදීම් ආදිය කරනවුන්, අන්‍ය වූ හෝ නොයෙක් ආකාරයන් කරනු කැමැතියේ වේද, ඔහු විසින් පාදක ධ්‍යානයෙන් නැගිට මෙතෙක් භික්ෂූහු ප්‍රථම වයසෙහි වෙත්වායි ආදී ක්‍රමයෙන් පරිකර්ම කොට නැවත සමවැද නැගිට අධිෂ්ඨාන කළයුතුය. අධිෂ්ඨාන සිත සමගම කැමැති කැමැති ආකාරම වෙයි. බහුධාපි හුත්වා එකොහොති ආදීන්හිද එම ක්‍රමයමැයි. මෙය විශේෂයයි. පකතියා බහුකො යනු නිර්මිත කාලාභ්‍යන්තරයෙහි නිර්මිත ප්‍රකෘතියෙන් බොහෝවැ, මේ භික්ෂුව විසින්ද මෙසේ බොහෝ භාවය නිර්මිතකොට නැවත එකෙක්ව සක්මන් කරන්නෙමි. සජ්ඣායනා කරන්නෙමි. ප්‍රශ්න විචාරන්නෙමියි සිතා, මෙම විහාරය අල්ප භික්ෂුකය. ඉදින් කිසිවෙක් පැමිණෙන්නාහුද? මෙතෙක් මේ එක් සමාන භික්ෂූහු කොයින්ද? ඒකාන්තයෙන් මෙය තෙරුන්ගේ ආනුභාවයයි මා හඳුනා ගන්නාහුයයි, අල්පේච්ඡතායෙන් හෝ අතරතුර එකෙක් වෙමියි කැමැති වන්නහු විසින් පාදක ධ්‍යානයට සමවැද, නැගිට එකෙක් වෙමියි පරිකර්මකොට නැවත සමවැද නැගිට එකෙක් වෙමියි අධිෂ්ඨාන කළයුතුය. අධිෂ්ඨාන සිත සමගම එකලා වේ. මෙසේ නොකරනුයේ, යම්සේ පිරිසිඳින ලද්දේද, එම පිරිසිඳින ලද කාලයාගේ වශයෙන් ස්වයං සිද්ධව එකලා වෙයි. 'ආවිභාවං' යන පදය බහා **කෙනචි අනාවටං හොති** යයි කියන ලද හෙයින්, කිසිවකින් ආවෘත නොවූයේ යන පදයෙන්ද ප්‍රකටභාව යන පදයෙන්ද, ප්‍රකට භාවාර්ථය යුසේයි. හොති යන පදයෙන් කරයි යයි පාඨශේෂය යු.සේයි. ප්‍රකටවීම වනාහි විවෘතභාවය කළ කල්හි වේ. **කෙනචි අනාවටං** යනු බිත්ති ආදී යම් කිසිවෙකින් අනාවෘත වූයේ - ආවරණ විරහිත වූයේ, **අපපටිච්ඡන්නං** යනු මතුයෙහි නොවසන ලදුයේ, එය ආවෘත හෙයින් **විවටංයි.** නොවැසුණු හෙයින් **පාකටංයි. තිරොභාවං** යනු දෙකක් අතර භාවය කරයි. නොවැසුණේම එම ආවරණයෙන් **පිහිතංයි.** ප්‍රතිච්ඡන්න වූයේ, එම වැසීමෙන්. යටිකුරු වූයේ වෙයි. **ආකාස කසිණ සමාපත්තියා** යනු

පරිච්ඡෙදාකාස කසිණයෙහි උපදවන ලද චතුර්ථධ්‍යාන සමවතෙහි, **ලාභී** යනු එම ලාභය ඔහුගේ ඇත්තේනුයි ලාභියි. **අපරික්ඛිතෙත** යනු කිසිවකින් හාත්පස ප්‍රාකාර ආදියෙන් වට නොකරන ලද පෙදෙසෙහි, මෙහි ආකාස කසිණයම කියන ලද හෙයින් එහි වඩන ලද්දා වූම ධ්‍යානය ආකාස කසිණයට ප්‍රත්‍යය වේ. අනෙකක් නොවේයයි දතයුතුය. මතු ආපො කසිණාදීන්හිද එය අරමුණුකොටම වූ ධ්‍යානය දතයුතුය. අනෙකක් නොවේ. පෘථුවිය ආවර්ජනා කෙරේද? දිය ආවර්ජනා කෙරේද? ආකාසය ආවර්ජනා කෙරේද? ප්‍රකෘති පෘථුවි, දිය ආකාසයන් ආවර්ජනය කෙරේ. **අනතලික්ඛෙ** යනු එම අහසට පෘථුවියෙහි සිට දුර ආකාසභාවය දක්වයි. චන්‍ද්‍ර සූර්ය පිරිමැදීමෙහි කසිණ නියමය නොකොට 'චිත්ත වශීප්‍රාප්ත ඍද්ධිමතා' යැයි අවිශේෂයෙන් කියන ලද හෙයින් මෙහි කසිණ සමාපත්ති නියමයක් නැතයයි දතයුතුය. **නිසින්නකොවා නිපන්නකොවා** යනු හුන්, වැදහොත්යයි මේවායින්ම අනෙක් ඉරියව් ද්වයයද යූ.සේයි. **හත්ථපාසෙ හොතු** යනු අත්පසැ වේවා, (සමීපයෙහි) 'හත්ථපසෙස හොතු' යනුද පාඨයි. මෙය එසේ කරනු කැමැත්තහුගේ වශයෙන් යූ.සේයි. මෙය වනාහි එහි ගොස්ද, අත දිගුකොටද (දීර්ඝභාවයට පත්කොට) ස්පර්ශ කරයි. **ආමසති** යනු මඳක් ස්පර්ශ කරයි. **පරාමසති** යනු දැඩිව ස්පර්ශ කරයි. **පරිමජ්ජති** යනු හාත්පසින් ස්පර්ශ කරයි. **රූපගතං** යනු අත්පසැ සිටි රූපයමය. **දූරෙපි සනතිකෙ අධිට්ඨාති** යනු පාදක ධ්‍යානයෙන් නැගිට දුර පිහිටි දෙව්ලොව හෝ බඹලොව සමීපයෙහි වේවායි ආවර්ජනා කරයි. ආවර්ජනය කොට, පරිකර්මකොට නැවත සමවැද, නැගිට සමීපයෙහි වේවායි ඥාණයෙන් අධිෂ්ඨාන කරයි. සමීපයෙහි වේ. සෙසු පදයන්හිද එම ක්‍රමයමැයි.

බඹලෝ යනු කැමැත්තහුට දුරස්ථය සමීප කිරීම කියා, බඹලෝ ගමනට අනුපකාර වූයේද, මෙම ඍද්ධියෙන් සමෘද්ධ වන විශේෂතා දක්වනුයේ, **සනතිකෙපි** යනාදිය වදාළහ. හුදෙක් ස්වල්ප කරණය, බොහෝ කරණයම නොවේ. මිහිරි නොවේ ආදීන්හිද යම් යම් දැයක් කැමැති වේද, එම සියල්ල ඍද්ධිමතාට සිද්ධ වේ. අනෙක් ක්‍රමයක්, **දූරෙපි සනතිකෙ අධිට්ඨාති** යනු දුර බඹලොව හෝ මිනිස්ලොව සමීපයෙහි අධිෂ්ඨාන කරයි. **සනතිකෙපි දූරෙ අධිට්ඨාති** යනු සමීපයෙහි වූ මිනිස්ලොව හෝ දුර බඹලොවැ අධිෂ්ඨාන කරයි. **බහුකම්පි ථොකං අධිට්ඨාති** යනු ඉදින් බ්‍රහ්මයෝ රැස්වූවාහු වෙත්ද? විශාල ආත්මභාව හෙයින් දර්ශන සීමාවද ශ්‍රවණ සීමාවද දුරුකෙරෙත්. දර්ශන සීමාවද ශ්‍රවණ සීමාවද එක්තැනක

හකුළුවා බොහෝවූයේද මඳ ලෙසින් අධිෂ්ඨාන කරයි. **ථොකම්පි බහුකනති අධිට්ඨාති** යනු ඉදින් මහ පිරිවරින් යනු කැමැතියේ වේද? හුදෙකලා හෙයින් මඳ වූ තෙමේ බොහෝ ලෙසින් අධිෂ්ඨාන කොට, මහපිරිවරින් යේයයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. මෙසේ ඇතිකල්හි සිව්වැදෑරුම් වූද එය බඹලෝ ගමනෙහි උපකාරී වේ. **දිබෙබන චකඛුනා තසස බ්‍රහමුනො රූපං පසසති** යනු මෙහි සිටියේ ආලෝකය වඩා, යම් බ්‍රහ්මයෙකුගේ රූපය දක්නා කැමැතියේ වේද දිව්‍ය චක්‍ෂුසින් එම බ්‍රහ්මයාගේ රූපය දකියි. මෙහිම සිටියේ දිව්‍ය ශ්‍රෝතධාතුයෙන් බ්‍රහ්මයාගේ කථාකරන ශබ්දය ශ්‍රවණය කරයි. චේතෝපරිය ඥාණයෙන් එම බ්‍රහ්මයාගේ සිත දනියි. **දිසසමානෙන** යනු ඇසින් පෙනෙන **කාය වසෙන චිතතං පරිණාමෙති** යනු රූපකායයාගේ වශයෙන් සිත වෙනස් කරයි. **රූප කායසස වසෙන පරිණාමෙති** යනු පාදකධ්‍යාන සිත ගෙන කයෙහි ආරෝපණය කරයි. සැහැල්ලු සංඥාව, ඉක්මනින් ක්‍රියා කළ නොහැකි ගමන කායානුගතික කරයි. කායගමන ඉක්මනින් ක්‍රියා කළ නොහැකිය. **අධිට්ඨාති** යනු ඊටම පර්යාය වචනයි. පිහිටුවයි යන අර්ථයි. **සුඛ සඤ්ඤඤ්ච ලහු සඤ්ඤඤ්ච ඔකකමිතවා** යනු පාදක ධ්‍යානාරම්මණ ඍද්ධි සිතින් එකට හටගත්, සුවසංඥාවටද, සැහැල්ලු සංඥාවටද, බැස, පිවිස, ස්පර්ශකොට, පැමිණ, සුව සංඥාව නම් උපේක්‍ෂා සම්ප්‍රයුක්ත සංඥාවයි. උපේක්‍ෂාව වනාහි ශාන්තයැයි, සුවයැයි යූ.සේයි. එම සංඥාවම නීවරණයන්ගෙන්ද, විතර්කාදී විරුද්ධතාවන්ගෙන්ද මිදුණු හෙයින් සැහැල්ලු සංඥාවයැයි දතයුත්තාහ. එයට බැසගත්තහුගේ මච්පියන් නිසා හටගත් ශරීරයද කපු පුළුන්පොදක් මෙන් සැහැල්ලු වේ. හෙතෙම මෙසේ වාතයෙහි දමන ලද කපුපුළුන් පොදක් මෙන් දක්නා ලැබෙන සිරුරින් බඹලොව යේ. මෙසේ යනුයේද, ඉදින් කැමැති වේද, පෘථුවි කසිණ වශයෙන් අහසෙහි මාර්ගයක් නිර්මිත කොට පියවර තබමින් පාගමනින් යේ. ඉදින් කැමැති වේද? අහසෙහි පෘථුවි කසිණ වශයෙන්ම, පියවරින් පියවර නෙළුම් මල බැගින් නිර්මිතකොට, නෙළුම් මලක් මලක් පාසා පියවර තබනුයේ පාගමනින් යේ. ඉදින් කැමැති වේද, වායො කසිණ වශයෙන් වාතය අධිෂ්ඨානකොට පුළුන් පොදක් මෙන් වායුවෙන් යේ. තවද ගමන් කරනු කැමැත්තම මෙහි ප්‍රමාණවත්ය. ගමන් කරනු කැමැත්තෙන් මෙසේ කළ චිත්තාධිෂ්ඨාන ඇතියේ අධිෂ්ඨාන වේගයෙන් විසිකළ එය දුනු වේගයෙන් විසිකළ හීයක් මේ දෘශ්‍යමානව යේ.

**චිතතවසෙන කායං පරිණාමෙති** යනු කරජකාය ගෙන පාදකධ්‍යාන

සිතෙහි නංවයි. සීඝ්‍ර ගමන් සහිත සිත අනුව යන ලෙස කරයි. සිතෙහි ගමන වනාහි සීඝ්‍ර වේ.

**සුඛ සඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච ඔක්කමිත්වා** යනු රූපකායාරම්මණ ඍද්ධි සිතෙන් හටගත් සුව සංඥාවද සැහැල්ලු සංඥාවද, සෙස්ස කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. මෙය වනාහි සිතේ ගමනම වේ. මෙසේ අදෘශ්‍යමාන සිරුරින් ගමන් කරන්නා වූ මෙතෙමේ, කිමෙක්ද, ඔහුගේ අධිෂ්ඨාන චිත්තයෙහි උත්පාදක්ෂණයෙහි යේද? නොහොත් ස්ථිති ක්ෂණයෙහි භංගක්ෂණයෙහිදැයි කී කල්හි ත්‍රිවිධ ක්ෂණයන්හි යේයයි තෙරහු කීහු. කිමෙක්ද හෙතෙම තෙමේ යේද? නිර්මිතය යවයිද? කැමැති පරිදි කරයි. මෙහි වනාහි මොහුගේ ස්වයං ගමනම ආයේය. **මනොමයං** යනු අධිෂ්ඨාන මනසින් නිර්මිත හෙයින් මනොමයංයි. **සබ්බංග පච්චංගං** යනු සියලු අංගප්‍රත්‍යංගයෙන් යුත්, **අහිනින්ද්‍රියං** මෙය චක්ෂු ශ්‍රෝතාදීන්ගේ පිහිටීම් වශයෙන් යු.සේයි. නිර්මිත රූපයෙහි වනාහි ප්‍රසාදය නම් නැත. 'ඉදින් ඒ ඍද්ධිමත්හු සක්මන් කෙරෙත්ද? නිර්මිතයද එහි සක්මන් කරයි යන ආදී සියල්ල ශ්‍රාවක නිර්මිතය සඳහා යු.සේයි. බුද්ධ නිර්මිතය වනාහි භාග්‍යවතුන් වහන්සේ යම් යම් දැයක් කරත්ද? එයද එය කරත්. භාග්‍යවතුන් වහන්සේගේ සිත වශයෙන් (අනුව) අන් දැයද කරති.

**ධූමායති පජ්ජලති** යනු තේජෝ කසිණ වශයෙනි. **ධම්මං භාසති** ආදි ත්‍රයය නියම නොකොට යූසේයි. **සන්තිට්ඨති** යනු එක්වැ සිටී. **සල්ලපති** යනු එක්වැ කථා කරයි. **සාකච්ඡං සමාපජ්ජති** යනු ඔවුනොවුන්ට උත්තර ප්‍රතිඋත්තරදීම් වශයෙන් කථාකරයි. මෙහිද යම් ආකාර වූ එම ඍද්ධිමත්හු, මෙහිම සිටියාහු දිවැසින් රූපය දකිති. දිව්‍යශ්‍රොත ධාතුයෙන් ශබ්දය ශ්‍රවණය කරයි. චේතෝපරිය ඤාණයෙන් සිත දැනගනී. යම් ආකාර වූ හෙතෙම මෙහිම සිටියේ එම බඹහු සමග සිටියි. කථාබහ කරයි. සාකච්ඡාවට පිවිසේ. යම් ආකාර වූ ඔහුගේ දුරින් යමක් වේද? සමීපයෙහි වේවායි අධිෂ්ඨාන කරයි යන ආදී වූ අධිෂ්ඨානයද යම් ආකාර වූ හෙතෙම දෘශ්‍යමාන වූ හෝ අදෘශ්‍යමාන වූ හෝ කයින් බඹලොව යේ. මෙතෙකින් කයින් වසයෙහි නොපවත්වයි. එම බඹහුගේ පෙරැටුයෙහි රූපය නිර්මිත කරයි යන ආදී ක්‍රමයෙන් කියන ලද නියමයන්ට පැමිණේ. මෙතෙකින් කයින් වශයෙහි පවත්වයි නමැ. සෙස්ස කයින් වශයෙහි පැවැත්වීමෙහි පූර්වභාග දැක්වීම සඳහා යූසේයි. මෙය අධිෂ්ඨාන ඍද්ධියයි.

විකුර්වණ ඍද්ධි නිර්දේශයෙහි සිඛී භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක නිදර්ශනය විකුර්වණ ඍද්ධියෙහි කාය සාක්ෂි පුද්ගල නිදර්ශය සඳහා යූසේයි. එයද දක්වනුයේ පළමුව බ්‍රහ්මලොකෙ ඨිතො සහස්සී ලොකධාතුං සරෙ විඤ්ඤාපෙසී යයි ඉතාමත් ආශ්චර්ය අද්භූත වූ, සහස්‍ර ලෝකධාතුන්හි ශබ්ද ශ්‍රවණ අධිෂ්ඨාන ඍද්ධිය දැක්වීය. දැන් එම වස්තුයෙහි මනාකොට දැක්වීම සඳහා මෙය යූසේයි. මෙම කල්පයෙන් තිස්එක්වන කල්පයෙහි, සිඛී භාග්‍යවතුන් වහන්සේ අනතුරු ජාතියෙන් තුසිත පුරයෙන් චුතව අරුණවතී නගරයෙහි අරුණවත රජුගේ ප්‍රභාවතී නම් මෙහෙසියගේ කුසෙහි ඉපිද, මුහුකුරාගිය නැණැතියාහු මහබිනික්මන් නික්ම බෝමැඩදී සර්වඥතාඥානය ප්‍රතිවේධකොට, පවත්වන ලද උතුම් දම්සක් ඇතිසේක් අරුණවතී නුවර ඇසිරිකොට වෙසෙන්නාහු එක් දිනක් උදෑසනම සිරුරු පිළිදැගුම් කොට මහබික් සඟන පිරිවරන ලදසේක් අරුණවතියෙහි පිඬු පිණිස පිවිසෙන්නෙමියි නික්ම, විහාර දොර කොටු සමීපයෙහි සිටිසේක් අභිභූ නම් අගසව් ඇමතූ සේක. භික්ෂුව අරුණවතියෙහි පිඬු පිණිස පිවිසෙන්ට කල්වේලා වැඩියි. එහෙයින් යම්තැනක එක්තරා බඹලොවක් වේද, එහි එළඹෙන්නෙමු. දෙසූ පරිදි 'මහණෙනි, ඉක්බිති සිඛී භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජ අභිභූ භික්ෂුව ආමන්ත්‍රණය කළේය. යමු, බ්‍රාහ්මණය, එක්තරා බඹලොව යම්තැනෙක්හිද එහි එළැඹෙන්නෙමු. මහණෙනි, එසේය ස්වාමීනියි අභිභූ භික්ෂුව සිඛී භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරදුන්ට පිළිවදන් දිනි. මහණෙනි, ඉක්බිති සිඛී භාග්‍යවතුන් වහන්සේද අභිභූ භික්ෂුවද එක්තරා බ්‍රහ්මලෝකයක් යම්තැනෙක්හිද එහි එළැඹුණහ. එහි මහබඹු සම්‍යක් සම්බුදුරදුන් දැක සිතුටු සිතැතියේ, පෙරගමන්කොට බ්‍රහ්මාසනය පනවා දුන්නේය. තෙරුන්ටද සුදුසු අසුනක් පැනවීය. භාග්‍යවතුන් වහන්සේ පැනවූ අස්නෙහි වැඩහුන් සේක. ථෙරහුද තමාට පැණැවූ අස්නෙහි වැඩහුන් සේක. මහබඹහුද දශබලධාරීන් වැඳ එකත්පස්හි හිඳගත්හ. එහෙයින් කීහ: මහණෙනි, එකල්හි සිඛී භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරදහු, අභිභූ භික්ෂුව ඇමතුහ. බ්‍රාහ්මණය, ඒ බ්‍රහ්මයාටද, බ්‍රහ්ම පිරිසටද, බ්‍රහ්ම පිරිසට අයත් පුද්ගලයන්ටද දැහැමි කථා වැටහේවා. (දම් දෙසාවා) මහණෙනි, එසේය ස්වාමීනියි අභිභූ භික්ෂුව සිඛී භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට පිළිවදන් දී, බ්‍රහ්මයාටද බ්‍රහ්ම පිරිසටද, බ්‍රහ්ම පිරිසට අයත් අනෙක් පුද්ගලයන්ටද දැහැමි කථාවක් වදාළේය. තෙරහු දැහැමි කථාව කරන කල්හි බඹගණ, බොහෝ කලෙකින් අප ශාස්තෲන් වහන්සේගේ බ්‍රහ්ම ලෝකාගමනය ලදිමු. මේ භික්ෂුව ශාස්තෲන් වහන්සේ අත්හැර දැහැමි කථාව ඇරැඹීයයි දොස් කීහු.

ශාස්තෘන් වහන්සේ ඔවුන්ගේ නොසතුටු සිත් ඇති බැව් දැන අභිභූ භික්ෂුවට මෙයි වදාළ සේක. බ්‍රාහ්මණය, බ්‍රහ්මයාද, බ්‍රහ්ම පිරිසද, බ්‍රහ්ම පිරිසට අයත් අනෙක් පුද්ගලයෝද දොස් කියති. එසේනම් බ්‍රාහමණය ඔබ වැඩිපුර සංවේගයට පත්කරව'යයි තෙරහු ශාස්තෘන් වහන්සේගේ වචනය පිළිගෙන නොයෙක් ආකාර ඍද්ධි විකුර්වණ කොට දහසක් ලෝදා, හඬින් අවබෝධ කරවනුයේ,

**ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධසාසනෙ**
**ධුනාථ මච්චුනො සෙනං - නලාගාරංව කුඤ්ජරො**

**යො ඉමස්මිං ධම්ම විනයෙ - අප්පමත්තො විහෙස්සති**
**පහාය ජාති සංසාරං - දුක්ඛස්සන්තං කරිස්සති**

යන මෙම ගාථා ද්වයය වදාළේය.

බුදු සස්නෙහි ප්‍රධන් වීර්යය අරඹවු. ගිහිගෙය හැර නික්මෙවු. ප්‍රතිපත්තීන්හි යෙදෙවු. ඇතෙකු බටලීයෙන් තැනූ ගෘහයක් විනාශ කරන්නාක් මෙන් ක්ලේශමාරයන් විනාශ කරවු.

යමෙක් මෙම ධර්මවිනය සංඛ්‍යාත සාසනයෙහි අප්‍රමාදව (ධ්‍යාන භාවනාවන්හි) වෙහෙසී ක්‍රියා කරන්නේද, ඔහු සසර ඉපැත්ම දුරුකොට දුක් කෙළවර කරන්නේය.

කුමක්කොට තෙරහු සහස්‍රී ලෝකධාතුව හඬින් අවබෝධ කරවූද? (හැඟවීද) නීල කසිණයට සමවැද නැගිට අභිඥා ඥානයෙන් දහසක් සක්වළ හැමතැන අඳුර පැතිරවූහ. ඉක්බිති මෙම අන්ධකාරය කුමක්දැයි සත්ත්වයින්ට සිතාබැලීම් උපන් කල්හි ආලෝක කසිණයට සමවැද නැගිට ආලෝකය දැක්වූහ. මෙම ආලෝකය කවරෙක්දැයි සොයනවුන්ට තමා දැක්වූහ. දහසක් සක්වළ දෙව් මිනිස්සු ඇඳිලිබැඳ තෙරුන්ම නමස්කාර කරමින් සිටියහ. තෙරහු, 'මහජනයා ධර්මය දෙසන්නා වූ මාගේ ශබ්දය අසාවා'යි මෙම ගාථා වදාළහ. සියලු රැස්වූ පිරිස මැද හිඳ ධර්මය දෙසන්නාක් මෙන් ශබ්දය ශ්‍රවණය කරවූහ. ඔවුන්ට අර්ථයද ප්‍රකට වූයේය. එම අවබෝධ කරවීම (හැඟවීම) සඳහා **සරෙන විඤ්ඤාපෙසි** යයි යූ.සේයි. ඔහු විසින් කරන ලද, නොයෙක් ආකාර ඍද්ධි විකුර්වණ සඳහා නැවත **සොදිසසමානෙනපි** යනාදිය යූසේයි. එහි **ධම්මංදෙසෙසි** යනු පළමු

කියන ලද ආකාර ඍද්ධි විකුර්වණ දක්වමින් ධර්මය දේශනා කළේය. ඉක්බිති කියන ලද ක්‍රමය පරිදි ගාථා ද්වයය වදාරනුයේ හඬින් අවබෝධ කරවූයේ යයි දතයුතුය. **දිසසමානෙනපි කායෙන** යන ආදීන්හිද ඉත්ථමභූත ලක්ෂණයෙහි කරණ වචනයයි. මෙසේ වූ ශරීරය වීයැයි අර්ථයි.

එම වස්තුව දක්වනුයේ, අනෙක් ඍද්ධිමතෙකුගේ විකුර්වණ ඍද්ධි කිරීමෙහි පිළිවෙළ දක්වනුයේ, **සො පකතිවණ්ණං විජහිත්වා** යනාදිය වදාළහ. එහි **සො** යනු යට කියන ලද, පිළිවෙළින් මෘදු කර්මණ්‍ය කළ සිතැති එම ඍද්ධිමත් භික්ෂුව, ඉදින් විකුර්වණ ඍද්ධිය කරනු කැමැතියේ වේද? තමාගේ ප්‍රකෘති වර්ණය, **පකතිවණ්ණං** ප්‍රකෘති සටහන **විජහිත්වා කුමාර(ක) වණ්ණං වා** අත්හැර කුමාර සටහන් හෝ දක්වයි. කෙසේද? පෘථුවි කසිණාරම්මණ අභිඥාපාදක චතුර්ථ ධ්‍යානයෙන් නැගිට 'මෙබඳු කුමාරයෙක් වෙමි'යි නිර්මිත කළයුතුය. කුමරකුගේ පෙනුම ආවර්ජනාකොට, කළ පරිකර්ම අවසානයෙහි නැවැත සමවැද නැගිට, 'මෙබඳු වූ නම් කුමාරයෙක් වෙමි'යි අභිඥා ඥානයෙන් අධිෂ්ඨාන කෙරේ. අධිෂ්ඨානය සමග කුමාරයෙක් වේ. විශුද්ධි මාර්ගයෙහි කසිණ නිර්දේශයෙහි පෘථුවි කසිණ වශයෙන් 'එකොපි හුත්වා බහුධාහොති' එකෙක්ව බොහෝ වෙයි. ප්‍රකට වූයේ -පෙ- මේ ආදිය (ඉටුවෙත්) සිදුවේ යයි යන වචනයෙන් මෙහි පෘථුවි කසිණාරම්මණ පාදකධ්‍යානය යෙදේ. එහිම අභිඥා නිර්දේශයෙහි විකුර්වණ ඍද්ධියෙහි පෘථුවි කසිණාදීන්හි එක්තරා අරමුණකින් නැගිට යැයි යූසේයි. එහිම, තමාගේ කුමාර සටහන් ආවර්ජනා කළයුතුයැයි යූසේයි. එය නාගාදි නිර්මාණයෙහි නොයෙදෙන්නාක් මෙනි. නාග සටහන් ආදී නිර්මාණයෙහිද එම ක්‍රමයමැයි. එහි **නාගවණ්ණං** යනු සර්ප සටහන්, **සුපණ්ණ වණ්ණං** යනු ගුරුළු සටහන්, **ඉන්ද වණ්ණං** යනු සක් සටහන්, **දෙව වණ්ණං** යනු සෙසු දෙව් සටහන්, සමුද්දවණ්ණං මෙය ආපො කසිණ වශයෙන් සමෘද්ධ වේ. **පතතිං** යනු පාබළද, **විවිධම්පි සෙනාබ්‍යූහං** යනු ඇත් ආදීන්ගේ වශයෙන් නොයෙක් ආකාර සෙන්මුළුදු, විශුද්ධි මාර්ගයෙහි වනාහි හස්තියෙකුද පෙන්වයි යනාදිය වනාහි මෙහි බාහිර හස්ති ආදීන්ගේ දර්ශන වශයෙන් යූ.සේයි. එහි හස්තියෙක් වෙමියි අධිෂ්ඨාන නොකොට, හස්තියෙක් වේවායි අධිෂ්ඨාන කළයුතුය. අශ්වාදීන්ගේද එම ක්‍රමයමැයි යූ.සේයි. පියවි පැහැ සටහන් හැරපියා යයි කියන ලද මුල්පදයෙන්ද, විකුර්වණ ඍද්ධිභාවයෙන්ද විරුද්ධ වේ. පෙළෙහි කියන ලද ක්‍රමයෙන් වනාහි ප්‍රකෘති පැහැ සටහන් අත්නොහැර, අධිෂ්ඨාන වශයෙන් අන්‍යයාට දර්ශනය අධිෂ්ඨාන ඍද්ධි නමැ. ප්‍රකෘති පැහැ සටහන්

අත්හැර අධිෂ්ඨාන වශයෙන් තමාගේ අන්‍යාකාරයෙන් දර්ශනය විකුර්වණ ඍද්ධි නමැ.

මනෝමය ඍද්ධි ඤාණ නිර්දේශයෙහි, **ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති** යනාදීන්හි ඍද්ධිමත් භික්‍ෂුව මනොමය ඍද්ධිය කරනු කැමැතියේ, ආකාස කසිණාරම්මණ පාදක ධ්‍යානයෙන් නැගිට, තමාගේ රූපකය ආවර්ජනාකොට කියන ලද ආකාරයෙන්ම බෙනයක් වේවායි අධිෂ්ඨාන කරයි. බෙනයක් වේ. ඉක්බිති එහි අභ්‍යන්තරයෙහි පෘථුවි කසිණ වශයෙන්, අන්‍ය කයක් ආවර්ජනාකොට පරිකර්මකොට කියන ලද ආකාරයෙන්ම අධිෂ්ඨාන කරයි. ඔහුගේ අභ්‍යන්තරයෙහි අන් කයෙක් වේ. හෙතෙම එය මුඛයෙන් උදුරා පිටත තබයි. එම කරුණ උපමාවකින් ප්‍රකාශ කරනුයේ **සෙය්‍යථාපි** ආදිය වදාළහ. එහි **මුඤ්ජම්හා** යනු මුඤ්ජ තෘණයෙන්, **ඊසිකං පවාහෙය්‍ය** යනු ගොබය උදුරා දමන්නේය. **කොසියා** යනු කොපුවෙන්, **කරණ්ඩා** යනු කරඬුයෙන් පුරාණ සර්ප සැවයෙන් යන අර්ථයි. එහිද **උද්ධරෙය්‍ය** යනු සිතින්ම මෙහි ඉදිරීම දතයුතුය. සර්පයෝ නම් ස්ව වර්ගයෙහි සිටියාහු ලීයක් අතර හෝ වෘක්‍ෂයක් අතර හෝ ආශ්‍රයකොට, සමෙන් ශරීරය අදිනා ප්‍රයෝග සංඛ්‍යාත ශක්තියෙන් සිරුර මනාසේ විකා කන්නාක් මෙන් පැරණි සම පිළිකුල් කරන්නාහු මෙම සිව් කරුණින් තුමූම සැව අත්හරිති. මෙහිද ගොබ ආදිය, මුඤ්ජ තණ ආදිය මෙන් සමාන වෙයි. එසේම මෙම මනොමය රූපය ඍද්ධිමතා හා සියලු ආකාරයන්ගෙන් සමාන වූයේම වේයයි දැක්වීම සඳහා මෙම උපමා යූ.සේයි. 'මනොමය කයින් ඍද්ධියෙන් එළැඹියේය යන මෙහි අභිඥා මනසින් කළ කය මනොමය කාය නමැ. එක්තරා මනොමය කයක් හටගත්තේය යන මෙහි ධ්‍යාන මනසින් උපන් කය ඒ මනසින් කළ හෙයින් මනොමය කාය නමැ. මෙහි වනාහි අභිඥා මනසින් උපදවන ලද කය, එම මනසින් කළ හෙයින් මනොමය කාය නමැ. මෙසේ ඇතිකල්හි අධිෂ්ඨාන ඍද්ධියෙන්ද, විකුර්වණ ඍද්ධියෙන්ද කළ මනොමය කය නම් වේද? වේමය. මෙහි වනාහි ඒවාහි වෙන් වෙන්ව විශේෂයෙන්, විශේෂිතකොට, අධිෂ්ඨාන ඍද්ධියද, විකුර්වණ ඍද්ධියද යුසෙයින් අභ්‍යන්තර වශයෙන් නිර්මාණයම මනොමය ඍද්ධි නමැ.

ඤාණ විප්ඵාර ඍද්ධි නිර්දේශයෙහි, ඤාණයෙහි පැතිරීම් වේගය මොහුට ඇත්තේනුයි **ඤාණ විප්ඵාරායි**. මෙහිද සප්ත අනුපස්සනා

වශයෙන්ම ඍද්ධිය ඉදිරිපත්කොට සෙස්ස අර්හත් මාර්ගය තෙක් සංක්‍ෂෙප කරන ලදැයි දතයුත්තාහ.

**ආයසමතො බකකුලසස ඤාණ විපඵාරා ඉදධි** යනාදීන්හි බක්කුල තෙර, කුල ද්වයයෙක්හි වැඩුණු හෙයින් මෙසේ ලද නම් ඇතියේ, පූර්ව බුදුවරුන් කෙරෙහි කරන ලද ප්‍රාර්ථනා ඇතියේ, පුණ්‍ය සම්පතින් යුත් තෙරය.

හෙතෙම වනාහි මහා සම්පත් අනුභව කරනුයේ දෙව් මිනිසුන් අතර සැරිසරනුයේ, අපගේ දශබලධාරීන් වහන්සේගේ ඉපැත්මට ප්‍රථමයෙන්ම කොසඹෑනුවර සිටු කුලයෙහි උපන්නේය. ඔහු උපන් වේලායෙහි යහපත උදෙසා මහපිරිවරින්, යමුනාවට ගෙනගොස් පිරිවර සහිත කිරිමව්වරු කිමිදීම්, මතුවීම් වශයෙන් ජලක්‍රීඩා කරවති. නහවති. එක් මහා මත්ස්‍යයෙක් මා විසින්, මොහු භක්‍ෂණය කළයුතුයැයි හඟිමින් මුව විවරකොට එළැඹියේය. කිරි මව දරුවා අත්හැර පළා ගියාය. මහා මත්ස්‍යයා ඔහු ගිල දැමීය. පින්වත් සත්ත්ව තෙමේ යහන්ගැබට පිවිස වැදහොත්තාක් මෙන් කිසි දුකකට නොපැමිණියේය. මත්ස්‍යයා ළදරුවාගේ පුණ්‍ය තේජසින්, රත්වූ කබලක් ගිලින ලද්දාක් මෙන් දැවෙනුයේ වේගයෙන්, තිස් යොදුනක් ගොස්, බරණැස්වැසි මත්ස්‍ය බන්‍ධකයෙකුගේ දැලට පිවිසියේය. මත්ස්‍යයා දරුවාගේ තේජසින් දැලෙන් ඉවත්කළ සැණින් මළේය. මත්ස්‍ය බන්‍ධකයෝ මත්ස්‍යයා සම්පූර්ණයෙන්ම කද තුළින් ගෙන දහසකට දෙමුයි නුවර සැරිසරන්නාහු අසූකෝටියක් ධනය ඇති අපුත්‍රක සිටුහුගේ දොරකඩට ගොස් සිටුභාර්යාවට එක් කහවණුවකට දුන්හ. ඕ එය තමාම පුවරුයෙහි තබා පිටතින් පලන්නී මත්ස්‍ය කුසෙහි රන්වන් ළදරුවෙකු දැක 'මත්ස්‍ය කුසින් මා විසින් පුතෙක් ලද්දේයයි' නදකොට ළදරුවා රැගෙන රජුගේ සමීපයට ගෙනවුත් ඒ කරුණ දැන්වූවාය. රජතෙමේ පින්වත් ළදරුවෙකි. ඔහු පෝෂණය කරවයි කීය.

අනෙක් සිටු කුලයද, එම පුවත අසා, එහි ගොස් අපගේ පුත්‍රයා යැයි ළදරුවා ගන්ට විවාද කළේය. දෙදෙනම රජකුලයට ගියහ. රජතෙමේ දෙදෙනාටම අපුත්‍රක කරන්ට නොහැක. දෙදෙනාටම උරුම වේවායි කීය. එතැන්පටන් කුලද්වයයම ලාභයෙන් යසසින් අග්‍රප්‍රාප්ත විය. එම දෙකුලෙහි වැඩුණු හෙයින් බක්කුල කුමාරයැයි නම් කළහ.

වැඩිවිය පත් ඔහුට නගර ද්වයයෙහිම ප්‍රාසාද ත්‍රයය බැගින් කරවා නාට්‍ය කණ්ඩායම් පිහිටවූහ. එක් නගරයක සිව්මස බැගින් වාසය කරයි. එහි එක් නගරයක සිව්මසක් වාසය කළහුට පහුරු නැව්හි මණ්ඩපයක් කරවා, එහි ඔහු නාට්‍ය කණ්ඩායම් සමග නංවා මහත් සැප අනුභව කරනුයේ, දෙමසකින් අනෙක් නාට්‍ය කණ්ඩයම මාර්ගයෙහි අඩක් ගෙනයත්. අනෙක් නගරවාසීහු නාට්‍ය කණ්ඩයම් දෙමසෙකින් මාර්ගයෙහි අඩක් පැමිණියේ වන්නේයයි එසේම පෙරගමන් කොට, දෙමසෙකින් තම නුවරට ගෙන එති. අනෙක් නළු කණ්ඩායම මධ්‍යයෙහි නැවැතී තම නුවරටම යෙත්. එහි සිව්මසක් වැස එම ක්‍රමයෙන්ම නැවත අනෙක් නුවරට යෙත්. මෙසේ සම්පත් අනුභව කරන්නා වූ ඔහුට අසූවස් සම්පූර්ණ විය. එසමයෙහි අප බෝසත් තෙමේ සර්වඥතාවයට පැමිණ පවත්වන ලද උතුම් දම්සක් ඇතියේ, අනුක්‍රමයෙන් චාරිකායෙහි සරනුයේ කොසඹෑ නුවරට වැඩියේය. බරණැසයයි මජ්ඣිම භාණකයෝ කියති. බක්කුල සිටුතෙමේද දශබලධාරීන් වහන්සේ වැඩම කළහයි අසා, බොහෝ සුවඳ මල් ගෙන ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් ධර්මකථා ශ්‍රවණයකොට ලද ශ්‍රද්ධා ඇතියේ පැවිදි විය. ඔහු සත්දිනක්ම පෘථග්ජනව සිට අටවන අරුණෝදයෙහි ප්‍රතිසම්භිදා සහිතව අර්හත්වයට පැමිණියේය. එකල්හි දෙනගරයන්හි ආශ්‍රයකොට පළපුරුදු මාගම්හු තම කුල ගෙවල්වලට අවුත් එහිම වසමින් සිවුරු කරවා යැවූහ. තෙරහු එක් අඩමසක් කොසඹෑ නුවරවාසීන් විසින් යැවුණු සිවුරු පරිභෝග කරති. එක් අඩමසක් බරණැස්වාසීන්ගෙන් යැයි එම ක්‍රමයෙන්ම දෙනගරයන්හි යම් යම් දැයක් උසස්ද? එය තෙරුන්ටම ගෙන එනු ලැබේ. පැවිදි වූවා වූද ඔහුගේ අසූ වර්ෂයෝ සුවයෙන්ම ගතවූවාහුය. දෙඅයුරින්ම වාසය තුළ මොහුට මොහොතක් ප්‍රමාණ වූද අල්පමාත්‍ර වූද ආබාධයක් නූපන් විරූය. හෙතෙම පැසුළු යම් කලැ, බක්කුල සූත්‍රාන්තය දේශනාකොට පිරිනිවන් පෑයේය. මෙසේ මත්ස්‍ය කුසෙහි නිරෝගීභාවය ආයුෂ්මත් බක්කුල පශ්චිම භවිකයාගේ, එම ආත්මභාවයෙන් ලැබිය යුතු අර්හත් ඤාණානුභාවයෙන් නිපන් හෙයින් ඤාණ විප්ඵාර ඍද්ධි නමැ. සුචරිත කර්ම ඵලප්‍රාප්ත, ප්‍රතිසම්භිදා ඤාණයෙහි ආනුභාවයෙනැයි කියති.

**සංකිච්චත්ථෙරොපි** සංකිච්ච තෙරහුද, පෙර කළ පිනැතියාහු, දම් සෙනෙවි සැරියුත් තෙරහුගේ, උපස්ථායක සැවැත්නුවර ධනාඪ්‍ය කුල දියණියකගේ කුස පිළිසිඳ ගත්හ. ඔහු කුසඔත් කල්හි ඕ එක් ව්‍යාධියකින් එකෙණෙහිම කළුරිය කළාය. ඇයගේ ශරීරය දවනු ලබන කල්හි ගැබ්මස

හැර සෙසුමස් දැවුණේය. ඉක්බිති ඇයගේ ගර්භමාංශය චිතකයෙන් බහා දෙතුන් තැනෙක්හි හුල්වලින් හිල්කළහ. හුල් කෙළවර දරුවාගේ ඇස් කොණ ස්පර්ශ කළේය. මෙසේ ගැබ්මස විද, අඟුරු රැසෙහි බහා, අඟුරු වලින්ම වසා ගියහ. ගැබ්මස දැවිණි. අඟුරු මතුයෙහි රන් ප්‍රතිමාවක් සමාන ළදරුවා, නෙළුම් මල අභ්‍යන්තරයෙහි වැදහොත්තාක් මෙන් වූයේය. පශ්චිමභවික සත්ත්වයාට මහමෙරින් මැඩගෙන යනු ලබන්නේද, අර්හත්වයට නොපැමිණ දිවික්ෂය වීමනම් නොමැත. දෙවන දින, චිතකය නිවන්නෙමුයි පැමිණි පුඟුලෝ, එසේ හොත් ළදරුවා දැක ආශ්චර්ය, අද්භූත සිත් හටගත්තාහුය. ළදරුවා ගෙන නුවරට ගොස් නිමිති කියන්නවුන් විචාළහ. නිමිති කියන්නෝ, ඉදින් මෙම ළදරුවා ගිහිගෙයි වාසය කරන්නේද? සත්වන කුල පරපුර තෙක් ඤාතීහු දුගී වන්නාහුය. ඉදින් පැවිදි වන්නේද, මහණුන් පන්සියයක් විසින් පිරිවරන ලදුයේ හැසිරෙන්නේ යයි කීහ. මිත්තණිය එම ළදරුවා (වැඩීය) පෝෂණය කළේය. ඤාතීහුද වැඩුණු කල්හි අපගේ උත්තමයාගේ සමීපයෙහි පැවිදි කරවන්නෙමුයි පෝෂණය කළහ. හෙතෙම සත් වස් කල්හි, නුඹ මව්කුසෙහි වසන කල්හි නුඹගේ මව කළුරිය කළාය. ඇයගේ සිරුර දවන කල්හිද නුඹ නොදැවිණියි ළමයින්ගේ කථාව අසා, මම වනාහි මෙබඳු වූ බියකින් මිදුණෙමි. මගේ ගෘහවාසයෙන් කවර ප්‍රයෝජනයෙක්ද? පැවිදිවන්නෙමියි ඤාතීන්ට සැල කළේය. ඔවුහු යහපත දරුව යැයි ඔහු දම්සෙනෙවි සැරියුත් තෙරුන්ගේ සමීපයට ගෙන ගොස්, ස්වාමීනි, මොහු පැවිදි කරනු මැනවැයි දුන්හ. තෙරහු තච පඤ්චක කර්මස්ථානය දී පැවිදි කරවූහ. හෙතෙම හිස මුඩුකරන ස්ථානයෙහිදීම ප්‍රතිසම්භිදා සහිතව අර්හත්වයට පැමිණියේය. පිරිපුන් වස් ඇතියේ, උපසම්පදාව ලැබ දසවස් වී පන්සියයක් භික්ෂු පිරිවර සහිතව හැසිරුණේය. මෙසේ කියන ලද ආකාරයෙන්ම දර සෑයෙහි නිරෝගභාවය, ආයුෂ්මත් සංකිච්ච තෙරුන්ගේ ඤාණ විප්ඵාරා ඍද්ධි නමැ.

**භූතපාලත්ථෙරොපි** භූතපාල තෙරහුද පූර්වහේතු සම්පන්නයෙකි. ඔහුගේ පියා රජගහනුවර දිළිඳු මිනිසෙකි. හෙතෙම එම දරුවා රැගෙන දර සඳහා ගැලෙන් කැලයට ගොස් (ගැලම ප්‍රමාණවත්) දර බරක්කොට සවස නුවර දොර සමීපයට පැමිණියේය. ඉක්බිති මොහුගේ ගොන් යුගලය ගැල අත්හැර නගරයට පිවිසුණහ. හෙතෙම ගැල්මුල පුත්‍රයා හිඳුවා ගොනුන්ගේ පිය සටහන් අනුව යනුයේ, නගරයටම පිවිසියේය. ඔහුගේ නුවරින් නොනික්මුණු කල්හිම දොර වැසිණි. දරුවා මුළුරැය ගැල

යට වැදහෙව නිද්‍රාවට බටුයේය. රජගහනුවර ප්‍රකෘතියෙන්ම අමනුෂ්‍ය බහුලය. මෙය වනාහි සුසානස්ථානයට සමීප ස්ථානයකි. කිසිම යක්ෂයෙකුට පශ්චිම භවික එම දරුවාට, උපද්‍රවයක් කරන්ට නොහැකි විය. හෙතෙම පසුකලෙක‍ැ පැවිදිවී අර්හත්වයට පත්ව භූතපාල තෙර නම් විය. මෙසේ තපුරු යක්ෂයින් හැසිරෙන්නා වූද ප්‍රදේශයෙහි කියන ලද ආකාරයෙන්ම නිරෝගීභාවය ආයුෂ්මත් භූතපාල තෙරුන්ගේ ඤාණවිප්ඵාර ඍද්ධි නමැ.

සමාධි විප්ඵාර ඍද්ධි නිර්දේශයෙහි, **ආයසමතො සාරිපුත්තසස සමාධි විපඵාරා ඉදධි** යන ආදීන්හි ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට, මහමුගලන් තෙරුන් සමග කපොත නම් ගිරිකඳුරෙහි වෙසෙන කල්හි, ආලෝකවත් රාත්‍රියෙහි අලුත ඉවත් කළ කෙස් සහිතව හුන් කල්හි, එක් දුෂ්ට යක්ෂයෙක්, සහාය යක්ෂයා විසින් වළකනු ලැබුයේද, හිසට පහරක් දුන්නේය. යමක ශබ්දය මේඝ ගර්ජනාවක් මෙන් වූයේද, මෙයද එවන් ආකාර විය. තෙරහු ඔහුගේ ප්‍රහරණ සමයෙහි සමවතට අර්පිතව හුන්නාහු වෙති. ඉක්බිති ඔහුට එම ප්‍රහාරයෙන් කිසි ආබාධයෙක් නොවීය. මේ එම ආයුෂ්මත්හුගේ සමාධි විප්ඵාර ඍද්ධියයි (පැතිරීම).

දෙසූ පරිදි, මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ, ලෙහෙනුන්ට අහර දෙන රජගහනුවර වේළුවනයෙහි වැඩ වාසය කරත්. එසමයෙහි වනාහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝද කපොත නමැති ගිරි ගුහායෙහි වාසය කරති. එසමයෙහි වනාහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආලෝකවත් රාත්‍රියෙහි, අලුත ඉවත්කළ කෙස්වලින් යුක්තව, අභ්‍යවකාශයෙහි එක්තරා සමාධියකට සමවැද වැඩහුන්නාහු වෙති. එසමයෙහි වනාහි මිත්‍ර දෙයක්ෂයෝ උතුරු දිසායෙන්, දකුණු දිසාවට කිසියම් කටයුත්තක් සඳහා යති. එම යක්ෂයෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් ආලෝකවත් රාත්‍රියෙහි, අලුත ඉවත් කළ කෙසින් යුක්තව අභ්‍යවකාශයෙහි හුන්නහු දුටහ. දැක එක් යක්ෂයෙක් අනෙක් යක්ෂයාට මෙසේ කීයේය. යහළුව, මෙම ශ්‍රමණයාගේ හිසෙහි පහරක් දෙන්ට මට (සිතේ) වැටැහේ. මෙසේ කී කල්හි එම යක්ෂයා අනෙක් යක්ෂයාට මෙය කීවේය. අනවශ්‍යයි යහලුව, ශ්‍රමණයාට පහර නොදෙව. යහළුව, එම ශ්‍රමණ තෙමේ මහත් ඍද්ධි ඇත්තෙකි. මහානුභාව සම්පන්නය. උදාරය. දෙවනුවද වනාහි -පෙ- තෙවනුවද වනාහි එම යක්ෂයා, අනෙක් යක්ෂයාට මෙසේ කීයේය. යහළුව, මෙම ශ්‍රමණයාගේ හිසෙහි පහරක් දෙන්ට මට

(සිතේ) වැටැහේ. තෙවනුවද එම යක්ෂයා අනෙක් යක්ෂයාට මෙය කීයේය. අනවශ්‍යයි යහළුව, ශ්‍රමණයාට පහර නොදෙව. එම ශ්‍රමණ තෙමේ මහත් ඍද්ධි ඇත්තෙකි. මහානුභාව සම්පන්නය. උදාරය. ඉක්බිති එම යක්ෂයා අනෙක් යක්ෂයා ගණන් නොගෙන ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ හිසෙහි පහර දුන්නේය. එය විශාල ප්‍රහාරයක් වූයේය. තවද එම ප්‍රහාරයෙන් සත්රියන්, දොළොස්රියන් ප්‍රමාණ වූ, ඇතෙකු වුව කිඳ බස්වන්නේය. මහත් පර්වත කූටයක් හෝ පළන්නේය. ඉක්බිති එම යක්ෂයා දැවෙමි දැවෙමියි එහිම මහ නිරය මැඩගෙන ගියේය. ආයුෂ්මත් මහ මුගලන් තෙරහු, එම යක්ෂයා විසින්, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට පහරදෙනු ලැබීම පිරිසිදු, මානුෂිකත්වය ඉක්ම ගිය දිව්‍ය චක්ෂුසින් දුටහ. ඉක්බිති ආයුෂ්මත් මහ මුගලන් තෙරහු, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ යම් තැනෙක්හිද, එතැන්හි එළැඹියහ. එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මෙය කීහ. ඇවැත්නි ශාරිපුත්‍රය, ඔබගේ ඉවසීම කෙසේද? ඇවැත්නි ඔබගේ යැපීම කෙසේද? ඇවැත්නි මට ඉවසිය හැකිය. ඇවැත්නි මට යැපිය හැකිය. තවද මාගේ හිස මඳක් දුක්වේදනා සහිතය. ඇවැත්නි ශාරිපුත්‍රය ආශ්චර්යයකි. ඇවැත්නි ශාරිපුත්‍රය පුදුමයෙකි. ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙමේ කෙතරම් ඍද්ධිමත්ද? කෙතරම් මහානුභාවද? ඇවැත්නි ශාරිපුත්‍රය, මෙහි ඔබට එක්තරා යක්ෂයෙක් හිසෙහි ප්‍රහාරයක් දුන්නේය. එය කෙතරම් මහා ප්‍රහාරයෙක් වීද? තවද එම ප්‍රහාරයෙන් සත්රියක් හෝ රියන් දොළසක් වූ ඇතෙකු හෝ කිඳබස්වන්නේය. මහත් පර්වත කූටයක් පළන්නේය. එසේද වුවත්, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙසේ කීහ. ඇවැත්නි මොග්ගල්ලානය, මට ඉවසිය හැකිය. ඇවැත්නි, මොග්ගල්ලානය, මට යැපිය හැකිය. තවද මාගේ හිස මඳක් දුක්වේදනා සහිතයයි, ඇවැත්නි මොග්ගල්ලානය ආශ්චර්යයකි. ඇවැත්නි මොග්ගල්ලානය පුදුමයෙකි. ආයුෂ්මත් මහ මුගලන් තෙරණුවෝ යම්තැනෙක්හි යක්ෂයෙකුද දකියි නම් කෙතරම් මහර්ධිකද? කෙතරම් මහානුභාවද? අපි වනාහි දැන් පාංශු පිශාචයෙකුද නොදකිමු. භාග්‍යවතුන් වහන්සේ, විශුද්ධ මනුෂ්‍යත්වය ඉක්මගියා වූ, දිව්‍ය ශ්‍රොත ධාතුයෙන්, එම දෙඋතුමන්ගේ මෙම කථා සල්ලාපය ශ්‍රවණය කළ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ එම කරුණ දැන එවේලෙහි මෙම ප්‍රීති වාක්‍යය වදාළ සේක.

**යස්ස සෙලූපමං චිත්තං - ඨිතං නානු කම්පති**
**විරත්තං රජනීයෙසු - කොපනීයෙ න කුප්පති**
**යස්සෙවං භාවිතං චිත්තං - කුතො තං දුක්ඛමෙස්සතීති**

යමෙකුගේ පර්වතයකට උපමා කළහැකි සිත ස්ථිරව පිහිටියේ කම්පනය නොවේද? ඇල්ම කළයුතු දැහි නොඇලේද? කෝපවිය යුතු දැහි කෝප නොවේද? යමෙකුගේ මෙසේ වඩනා ලද සිත, කෙසේනම් දුකට පමුණුවන්නේද? මෙහිද 'කුතො නං දුක්ඛමෙස්සති' කෙසේනම් දුකට පමුණුවන්නේද යන භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙන් එම ප්‍රහාරයෙන් කිසි ආබාධයක් නුවූයේය යන අට්ඨකථා වචනය ඉතාමත් සමවේ. එහෙයින් 'තවද මාගේ හිස මඳක් දුක් සහිත'යයි කියන ලද වචනයෙන් දුක්වේදනා නොවේ. හිසෙහි අකර්මණ්‍යභාවය සඳහා දුක යැයි යූ.සේයි. ලොවැ නිදුකින් පරිහරණය කරන්ට හැකිවීම සුව ස්වභාවයයි. දුකින් පරිහරණය කරන්ට හැකිවීම දුක් ස්වභාවයයි යූ.සේයි. එම අකර්මණ්‍යතාව සමවතින් නැගිටි සමය හෙයින් වූයේයයි දතයුතුය. සමවතට සමවන් සමයෙහි එයද නොවන්නේය. 'වත්මනැ පාංශු පිශාචයෙකුදු නොදක්නෙමුයි දක්නට අසමර්ථ හෙයින් නොයූසේයි. අභිඥාවන්හි උත්සාහය අභාවයෙන් යූසේයි තෙරහු වනාහි පශ්චිම ජනතාව පෘථග්ජන ඍද්ධියෙහි සාරවත් යන හැඟීම් නොවෙත්වායි පශ්චිම ජනතාවට අනුකම්පා කරනුයේ බොහෝසෙයින් ඍද්ධිය පාවිච්චි නොකරත්.

ථෙර ගාථායෙහිදඃ-

> **නෙව පුබ්බෙ නිවාසාය - නපි දිබ්බස්ස චක්ඛුනො**
> **චෙතො පරියාය ඉද්ධියා - චුතියා උපපත්තියා**
> **සොතධාතු විසුද්ධියා - පණිධි මෙ නවිජ්ජති**

ඍද්ධිවිධ, දිව්‍යශ්‍රොත, චෙතොපරිය, පූර්වෙනිවාසානුස්මෘති, චුතුපපාත, දිව්‍යචක්ෂු යනාදීන්හි මාගේ ප්‍රාර්ථනයක් නොමැත යයි. තෙරුන් විසින් තෙමේම අභිඥාවන්හි ප්‍රාර්ථනා අභාවය යූ.සේයි. තෙරහු වනාහි සත්සැටක් ශ්‍රාවක පාරමී ඥාණයන්හි පරිපූර්ණත්වයට පත්වූහ.

**සඤ්ජීවත්ථෙරං** සංජීව තෙර වනාහි කකුසඳ භාග්‍යවතුන් වහන්සේගේ සස්නෙහි දෙවන අගසව් වූයේ, නිරොධ සමවතට සමවන්නේ කළුරිය කළේයැයි සලකා, ගොපලු ආදීහු තෘණ, දර ආදිය එකතුකොට ගිනිලෑහ. තෙරුන්ගේ සිවුරෙහි අංශු මාත්‍රයක්වත් නොදැවිණි. මෙය මෙම ආයුෂ්මත්හුගේ අනුපූර්ව සමවත් වශයෙන් පැවැති සමථ

ආනුභාවයෙන් නිපන් හෙයින් සමාධි විප්ඵාර (පැතිරීම) ඍද්ධියයි. දෙසූ පරිදි, පාපිෂ්ඨය එසමයෙහි වනාහි, කකුසඳ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ ලොවැ උපන්නාහු වෙති. කකුසඳ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට විධුර-සංජීව නමැති අග්‍ර, සොඳුරු යුගලක් වූ, ශ්‍රාවක යුග්මයක් වූයේය. යම්තාක් වනාහි පාපිෂ්ඨය, මෙහි ආයුෂ්මත් විධුර හා යම් ඒ ධර්මදේශනායෙහි සම තත්වයට පත්වූ කිසි ශ්‍රාවකයෙක් කකුසඳ බුදුන්ට නොවීය. මෙම ක්‍රමයෙන් පාපිෂ්ටයා ආයුෂ්මත් විධුරට විධුරයැයිම ව්‍යවහාරය හටගති. පාපිෂ්ටය ආයුෂ්මත් සඤ්ජීව, අරණ්‍යයට ගියේද, රුක්මුලට ගියේද, ශූන්‍යාගාරයට ගියේද, කරදරයකින් තොරව සංඥාවේදයිත නිරෝධයට සමවදියි. මෙය පෙර වූවකි. පාපිෂ්ඨය, ආයුෂ්මත් සංජීව එක්තරා රුක්මුලෙකැ සංඥා වේදයිත නිරෝධයට සමවැදී හුන්නේ වේ. පාපිෂ්ඨය, ගොපල්ලෝ, දෙනුු රැකබලා ගන්නෝ, ගොවියෝ මගියෝ ආයුෂ්මත් සංජීව එක්තරා රුක්මුලෙකැ සංඥාවේදයිත නිරෝධයට සමවැද සිටින්නහු දුටහ. දැක ඔවුන්ට මෙබඳු සිතෙක් විය.

පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්වර්යයෙකි. පින්වත්නි, ඒකාන්තයෙන් පුදුමයෙකි. මෙම ශ්‍රමණ තෙමේ හුන්නේම කළුරිය කළේය. එහෙයින් ඔහු දවමු. ඉක්බිති පාපිෂ්ඨය, එම ගොපල්ලෝ, දෙනුන් රැකබලා ගන්නෝ, ගොවියෝ, මගියෝ, තෘණද, වියලි ලීදඬුද, ගොමද, එකතුකොට, ආයුෂ්මත් සංජීවගේ සිරුරෙහි රැස්කළේය. රැස්කොට ගිනි අවුළුවා ගියහ. ඉක්බිති පාපිෂ්ඨය, ආයුෂ්මත් සංජීව එම රාත්‍රියගේ ඇවෑමේ එම සමවතින් නැගිට, ගසා දමා, පෙරවරුයෙහි හැඳ පාසිවුරු ගෙන ගමෙහි පිඬු පිණිස පිවිසියේය. පාපිෂ්ඨය එම ගොපල්ලෝ දෙනුන් රැකබලා ගන්නෝ, ගොවියෝ, මගියෝ ආයුෂ්මත් සංජීව පිඬු පිණිස හැසිරෙන්නිහු දුටහ. දැක ඔවුන්ට මෙබඳු සිතක් විය. පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්වර්යයෙකි. පින්වත්නි ඒකාන්තයෙන් පුදුමයෙකි. මෙම ශ්‍රමණ තෙමේ හුන්නේම කළුරිය කළේය. ඒ මෙතෙමේ නැවත දිවි ලබන ලද්දේය. පාපිෂ්ඨය, මෙම ක්‍රමයෙන් ආයුෂ්මත් සංජීවට සංජීව යැයිම ව්‍යවහාරය හටගති.

**ඛාණුකොණ්ඩඤ්ඤ** තෙරහු ඛාණුකොණ්ඩඤ්ඤ තෙරහු ප්‍රකෘතියෙන්ම සමවත් බහුලය. හෙතෙම එක්තරා අරණ්‍ය රැයෙහි සමවතට සපැමිණ හුන්නේය. පන්සියයක් සොරහු භාණ්ඩ සොරකම්කොට යන්නාහු, දැන් අපගේ පියවර අනුව යන්නාහු නැතැයි විඩාහරිනු

කැමැත්තාහු භාණ්ඩ බහාතබන්නාහු මෙය කණුවෙක්යැයි හඟින්නාහු තෙරුන්ගේම මත්තෙහි සියලු භාණ්ඩ තැබූහ. විඩාහැර, යන ඔවුන්ගේ ප්‍රථමයෙන් තැබූ භාණ්ඩයෙහි, ග්‍රහණ කාලයෙහි පිරිසිඳි කාලයාගේ වශයෙන් තෙරහු සමාධියෙන් නැගිටියේය. ඔවුහු තෙරුන්ගේ චලන ආකාරය දැක බියවූවාහු කෑගැසූහ. තෙරහු උපාසකවරුනි, බිය නොවවු. මම භික්ෂුවක්මියි කීහ. ඔවුහු අවුත්, වැඳ තෙරුන් කෙරෙහි හටගත් ප්‍රසාදයෙන් පැවිදි වී පිළිසිඹියා සහිතව අර්හත්වයට පැමිණියහ. එතැන් පටන් තෙරහු ඛාණු කොණ්ඩඤ්ඤ තෙරයැයි නම වූයේය. මේ මෙහි භාණ්ඩ පන්සියයකින් වසාගෙන පැතිරසිටි එම ආයුෂ්මතුන්ට ආබාධ (පීඩා) අභාවය සමාධි විප්ඵාර ඍද්ධියි.

උතතරා උත්තරා උපාසිකාව වනාහි රජගහ නුවර මහා ධනවත් පුණ්ණ සිටුහුගේ දියණියයි. ළමා කල්හිම මව්පියවරුන් සමග සෝවාන් ඵලයට පැමිණියාය. ඕ වියපත් වූවා රජගහනුවර සිටුහුගේ මහත් ඇවිටිලි කිරීම් මත ඔහුගේ මිථ්‍යා දෘෂ්ටික පුත්‍රයාට දුන්නාය. ඕ බුද්ධ දර්ශනයට, ධර්ම ශ්‍රවණයට, බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයාට දන් දෙන්ට, නොලබන්නී විපතට පත්ව, එම නගරයෙහිම සිරිමා නම් ගණිකාව කැඳවා අවකාශ ලබාැනීම සඳහා පිය ගෘහයෙන් ගෙනඑන ලද, කහවණු පසළොස් දහසක් ඇයට දී, මෙම කහවණු ගෙන මෙම අඩමස සිටු පුත්‍රයාට සේවය කරවයි. ඇය ස්වාමියාට පමුණුවා තමා උපොසථාංග අධිෂ්ඨානකොට මෙම අඩමස බුද්ධ දර්ශනාදීන් ලබන්නෙමියි තුටු මනසින් පවාරණය (අවසානය) තෙක් බුද්ධප්‍රමුඛ බික් සඟන ආරාධනාකොට අඩමසක් දන් දුන්නාය. සවස් කාලයෙහි මුළුතැන්ගෙයි ඛාද්‍ය භොද්‍යාදීන් සංවිධාන කරයි. ඇයගේ ස්වාමියාද හෙට අවසන් දිනය යැයි සිරිමා සමග ජනේලය අසල සිට පිටත බලනුයේ, දහදියෙන් තෙත්ව අළුවලින් ගැවැසී, (වැගිරී) අඟුරු දැලිවලින් තැවැරී එසේ හැසිරෙන්නා වූ ඇය දැක තම සම්පත් අනුභව නොකොට, අඥාන තැනැත්තිය කුසල් නම් කරයි යයි සිනාසුණි. උත්තරාවද ඔහු බලා පරලොව සඳහා අඥානයා කුසල් නොකරයි යයි සිනාසුණි. සිරිමාව, දෙදෙනාගේම එම ක්‍රියාව දැක මම ගෘහ ස්වාමියි හඟිනු ලබන්නී, ඊර්ෂ්‍යා ප්‍රකෘතිව උත්තරාවට කිපී දුකක් උපදවන්නෙමියි ප්‍රාසාදයෙන් බිමට බසියි.

උත්තරාවද එය දැන කුඩා පුටුවක හිඳ, ඇයට මෛත්‍රී සිත පැතිරවීය. සිරිමා ප්‍රාසාදයෙන් බැස, මුළුතැන්ගෙට පිවිස, කැවුම් පිසින

විශාල හැන්ද පුරවා කකාරවන ලද ගිතෙල් ගෙන ඇයගේ හිසෙහි විසිරවූවාය. එය නෙළුම් කොළයක සීතල දිය දහරක් මෙන් ඉවතට පෙරළා දමා ගියේය. දාසීහු සිරිමාට අත්පාවලින් තළා බිම හෙළූහ. උත්තරාව මෛත්‍රී දැහැනින් නැගිට දාසීන් වළකාලීය. සිරිමා උත්තරා කමා කළාය. උත්තරාව හෙට ශාස්තෘන් වහන්සේ ඉදිරිපිටදී කමා කරවයි කියා, ඇය විසින් කායික වතාවත් යැදි හෙයින් ව්‍යඤ්ජන සැකසීම පැවරුවාය. ඕ එය සම්පාදනය කොට තමාගේ පිරිවර පන්සියයක් ගණිකාවන් සමග සංඝයා සහිත ශාස්තෘන් වහන්සේ වළඳවා, යෙහෙළිය සමාවනු මැනැවැයි කියා, දෙවන දිනැ එසේ පැමිණියා වූ ගණිකාවන් සමග ශාස්තෘන් වහන්සේගේ බත්කිස අවසන්හි ශාස්තෘන් වහන්සේ වැඳ භාග්‍යවතුන් වහන්ස, අපරාධයක් කළෙමි. උතතරාව මට කමා කරනු මැනැවැයි කීය. ශාස්තෘන් වහන්සේ උත්තරාව කමා කරවයි වදාළ කල්හි, භාග්‍යවතුන් වහන්ස කමා කරමියි කී කල්හි 'අක්‍රෝධයෙන් ක්‍රෝධය දිනයි' ආදී වූ ධර්මය දේශනා කළ සේක. උත්තරා ප්‍රථමයෙන්ම ස්වාමියාද මාමලා හා නැන්දලාද ශාස්තෘන් වහන්සේ සමීපයට පැමිණවූවාය. දේශනාවසානයෙහි එම තිදෙනද සියලුම ගණිකාවෝද සෝවාන් ඵලයෙහි පිහිටියහ. මෙසේ උත්තරා උපාසිකාවගේ කකාරවන ලද ගිතෙලින් පීඩා අභාවය සමාධි විපඵාර ඍද්ධියි.

සාමාවතී සාමාවතී උපාසිකාව නම් කොසඹෑ නුවර උදෙන රජුගේ අගමෙහෙසියයි. එම රජුට පන්සියයක් බැගින් වන පරිවාර ස්ත්‍රීහු සහිත අගමෙහෙසීහු තිදෙනෙක් වූහ. ඇලා අතර සාමාවතිය භද්දිය නුවර භද්දිය සිටුහුගේ දියණියයි. පියා කළුරිය කළ කල්හි පියාගේ යහළු කොසඹෑ නුවර ඝෝෂිත සිටුහුගේ ගෘහයෙහි පන්සියයක් ස්ත්‍රී පිරිවරව වැඩුණාය. රජු වියපත් ඇය දැක හටගත් ඇල්ම ඇත්තේ තම ගෘහයට ගෙන ගොස් අභිෂේක ස්ථාන දුන්නේය. චණ්ඩ ප්‍රද්‍යොත රජුගේ දියණිය වාසුල දත්තා නම් එක් මෙහෙසියකි. මාගන්දිය බමුණහුගේ දියණිය භාග්‍යවතුන් වහන්සේගේ පාද පරිචාරිකාව කොට පියා විසින් දෙනු ලබන්නේ,

දිස්වාන තණ්හං අරතිං රගඤ්ච
නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං
කිමෙවිදං මුත්ත කරීස පුණ්ණං
පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ ති

තෘෂ්ණා, රතී, රගා යන මරදෙව් දූවරුන් තිදෙන දක්නා ලදුවත් මෛථුනයෙහි කැමැත්තෙක් නොවීය. මුත්‍ර, අශුචි පිරුණු මෙය කිමෙක්ද? පාවලින්ද එය ස්පර්ශ කරන්ට නොකැමැත්තෙමියි

භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද ගාථාව අසා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ක්‍රෝධ බැන්දාය. ඇයගේ මව්පියවරු මාගන්දිය සූත්‍ර දේශනාවසානයෙහි අනාගාමි ඵලයට පත්ව පැවිදිව අර්හත්වයට පැමිණියහ. ඇයගේ කුඩාපිය තෙමේ මාගන්දිය කොසඹෑ නුවරට ගෙනගොස් රජුට දුන්නේය. ඕ රජුගේ එක් මෙහෙසියකි. ඉක්බිති, ඝෝෂිත සිටු, කුක්කුට සිටු, පාවාරික සිටු යන සිටුවරු තිදෙන ලොවැ තථාගතොත්පත්තිය අසා, දෙව්රමැ ශාස්තෘන් වහන්සේගේ සමීපයට ගොස් දහම් අසා, සෝවාන් ඵලයට පත්ව අඩමසක් බුද්ධප්‍රමුඛ භික්සඟනට මහදන් දී, කොසඹෑ ගමනට, ආයාචනා කොට කොසඹෑ නුවරට ගොස්, ඝෝෂිතාරාමය, කුකකුටාරාමය, පාවාරිකාරාමයැයි තිදෙන, ආරාමත්‍රයයක් කරවා, පිළිවෙළින් එහි වැඩමකළ ශාස්තෘන් වහන්සේ පිළිවෙළින් එක් එක් දිනයෙහි, එක් එක් වෙහෙරෙහි වාසය කරවා, එකිනෙකා සංඝයා සහිත භාග්‍යවතුන් වහන්සේට මහදන් දුන්හ. ඉක්බිති ඔවුන්ගේ උපස්ථායක සුමන නම් මල්කරු, සිටුහුගෙන් ඉල්ලා සංඝයා සහිත ශාස්තෘන් වහන්සේ අනුභව කරවන්ට තම ගෘහයෙහි හිඳවීය. එකෙණෙහි සාමාවතියගේ සේවිකා ඛුජ්ජුත්තරා නම් දාසිය කහවණු අටක් ගෙන ඔහුගේ ගෘහයට ගියාය. හෙතෙම සංඝයා සහිත ශාස්තෘන් වහන්සේට වැළඳවීමට සහාය වෙවයි කීය. ඕ එසේ කොට ශාස්තෘන් වහන්සේගේ බත්කිස අවසන්හි දම්දෙසුම අසා සෝවාන්ව, අන් දිනයන්හි කහවණු සතරක් තමා විසින් ගනු ලබන්නී, නුදුන් දේ ගන්ට නුසුදුසු හෙයින් කහවණු අටකින්ම මල් ගෙන සාමාවතියට එළැවූවාය. ඇය පුෂ්පයන්ගේ බොහෝභාවයට හේතු විචාරණ ලද්දී මුසා බණන්ට නුසුදුසු හෙයින් යථා ස්වභාවය කීවාය. අද කවර හෙයින් නොගන්නා ලද්දේ දැයි කියන ලද්දී සම්‍යග් සම්බුදුරදුන්ගේ ධර්මය ශ්‍රවණයකොට නිවන සාක්‍ෂාත් කරන ලදැයි කීවාය. උත්තරා මාතාවනි, එම ධර්මය අපටද කියවයි කීවාය. එසේනම් මා නහවා, පිරිසිදු වස්ත්‍ර යුග්මයක් දී උස් අසුනක හිඳුවා, සියල්ලෝ මිටි ආසනයන්හි හිඳිවූ යයි කීවාය. සියල්ලෝ එසේ කළහ. ශෛක්‍ෂ්‍ය ප්‍රතිසම්භිදාප්‍රාප්ත ඒ ආර්යශ්‍රාවිකා තොමෝ, එක් වස්ත්‍රයක් හැඳ, එකක් උතුරුසළුවක් කොට විජිනිපතක් ගෙන ඔවුන්ට ධර්මය දේශනා කළාය. සාමාවතියද පන්සියයක් ස්ත්‍රීහුද සෝවාන්ඵලයට පැමිණියහ. ඒ සියල්ලෝම ඛුජ්ජුත්තරාවට වැඳ,

මැණියෙනි, අද පටන් කුදුමහත් වැඩ නොකොට අපගේ මාතෘස්ථානයෙහිද, ආචාර්ය ස්ථානයෙහිද, සිට ශාස්තෘන් වහන්සේ විසින් දේශිත, දේශිත ධර්මය අසා අපට කියවයි කීහ. ඕ එසේ කරන්නී, පසුකල්හි ත්‍රිපිටකධරව, ශාස්තෘන් වහන්සේ විසින් බහුශ්‍රැත උපාසිකාවන් අතර අග්‍රස්ථානයෙහි තබන ලද්දේ අග්‍ර ස්ථානය ලැබුවාය. සාමාවතී ප්‍රධාන පිරිස, බුද්ධදර්ශනය ප්‍රිය කෙරෙති. දශබලධාරීන් වහන්සේ ඇතුල්වීථියට පිළිපන් කල්හි, ජනෙල් නොපොහොනා කල්හි බිත්තිය බිඳ ශාස්තෘන් වහන්සේ බලති. වැඳුම් පිදුම්ද කරති. මාගන්දිය එහි යන ලද්දී, එම සිදුරු දැක එහි කරුණු විමසන්නී, ශාස්තෘන් වහන්සේගේ පැමිණි බව දැන, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බද්ධ වෛරයෙන් ඇලාටද කිපී, මහරජතුමනි, සාමාවතී ප්‍රධාන පිරිස ඔබ හැර වෙනත් පිටත අය පිළිබඳව ප්‍රාර්ථනා ඇත. බිත්තිය බිඳ ශ්‍රමණ ගෞතමයන් බලති. කිහිප දිනකින්ම ඔබ මරන්නාහයි රජුට කීය. රජු සිදුරු දැක ඇයගේ වචනය නොඇදහීය. උඩින් දැල් ගැසූ වා කවුළු කරවීය. නැවත මාගන්දිය ඇලා කෙරෙහි රජු බිඳවනු කැමැත්තී සජීවි කුකුලන් අටදෙනෙකු ගෙන්වා, මහරජ ඔවුන් විමසීම සඳහා මෙම කුකුලන් මරා මා සඳහා පිසවයි යවනු මැනැවැයි කීවාය. රජ එසේ යැවීය. ඇලා ප්‍රාණඝාත නොකරමුයි කී කල්හි ඒ ශ්‍රමණ ගෞතමයන්ට පිස යවයි කීයේය. රජු විසින් එසේ යැවූ කල්හි, මාගන්දි මළ කුකුලන් අටදෙනෙකු එසේ කියා යැව්වාය. සාමාවතී පිස දශබලධාරීන් වහන්සේට යැව්වාය. මාගන්දියට එයිනිදු රජු කෝප කරවන්ට නොහැකි විය. රජ වනාහි තෙමෙහෙසින් වසන තන්හි සත්දිනක් වසයි. රජ තමාගේ ගමන ස්ථානයට හස්තිකාන්ත වීණාව රැගෙනයේ. මාගන්දිය රජු සාමාවතියගේ ප්‍රසාදයට යන කල්හි දළ බෙහෙතින් සෝදවා උණු පුරුකක බහවා එක් කෘෂ්ණ (නපුරු) සර්ප පැටියෙකු ගෙන්වා, වීණාව තුළ බහා මල් ගුලියකින් සිදුර වැසුවාය. ඇය රජු එහි ගියකල්හි ඔබිනොබ සරන්නාක් මෙන්ව වීණා සිදුරින් මල්ගුලිය ඉවත් කළාය. සර්පයා නික්ම ප්‍රශ්වාස කරනුයේ පෙණයකොට සයනය මත්තෙහි හොත්තේය. ඕ, චිඃ චිඃ සර්පයෙක් මරනුයි මහා ශබ්දයක් කළාය. රජ සර්පයා දැක කෝපයට පත්විය. සාමාවතී රජු කෝපයට පත් බව දැන, පන්සියයක් ස්ත්‍රීන්ට, අද නියම කළ මෛත්‍රී පැතිරවීමෙන් රජුන්ට මෛත්‍රියය පතුරුවවු යයි සංඥා දුන්නාය. තමාද එසේ කළේය. රජු දහසක් දෙනා උසුලන දුන්න රැගෙන දුනු දිය පොලා සාමාවතිය එක් තැනක සිටුවා, ඒ සියලු ස්ත්‍රීහු පිළිවෙළින් සිටුවා, විෂ පෙවූ ඊතලය ගෙන සන්නද්ධ වී දුන්න සම්පූර්ණකොට සිටියේය. ඊතලය ඉවත දමන්ට හෝ බිම තබන්ට හෝ නොහැකි වේ.

සිරුරින් දහදිය මිදේ. සිරුර කම්පනය වේ. මුවින් කෙළ වැටේ. ගතයුතු ග්‍රහණයක් නොදකියි. ඉක්බිති සාමාවතිය ඔහුට කිමෙක්ද මහරජ, ක්ලාන්ත වෙහිදැයි ඇසුවාය. එසේය දේවිය ක්ලාන්ත වෙමි. මට පිහිටවුව මැනැවැයි කීය. යහපති මහරජ හීය පෘථුවිය අබිමුව කරව. රජ එසේ කළේය. රජුගේ අතින් හීය මිදේවායි අධිෂ්ඨාන කළාය. එකෙණෙහි හීය මිදුණි. රජ එකෙණෙහිම දියෙහි කිමිද, තෙත් වස්ත්‍ර ඇතියේ තෙත් කෙස් ඇතියේ සාමාවතියගේ පා අබිමුව වැටී දේවිය මට කමා වනු මැනව.

**සම්මුය්හාමි පමුය්හාමි - සබ්බා මුය්හන්ති මෙ දිසා**
**සාමාවතී මං තායස්සු - ත්වංච මෙ සරණං භවාති (ආහ)**

මුළාවෙමි. අතිශයින්ම මුළාවෙමි. සියලු දිශාවෝ මට නොවැටහෙති. කළ කී දෑ නොදනිමි. පෘථුවිය මහා මේසයකි. අඳුරු කළාක් වැනිය. අදෘශ්‍යමාන බලවේගයකට මා හසුව ඇත. සාමාවතිය, මා රැක ගනුව. ඔබ මට පිහිට වනු මැනැවැයි කීය.
සාමාවතිය :-

**මා මං ත්වං සරණං ගච්ඡ - යමහං සරණං ගතා**
**සරණං ගච්ඡ තං බුද්ධං - ත්වංච මෙ සරණං භවා'ති**

ඔබ මා සරණ නොයව, මා යමෙකු සරණ ගියෙම්ද, ඒ බුදුරදුන් සරණ යව. ඔබ මට පිහිටවනු මැනැවැයි කීවාය. රජ, එසේ නම් ඔබද ශාස්තෘන් වහන්සේද සරණ යමි. ඔබට වරයක්ද දෙමියි කීය. ඕ මහරජ, වරය පසුව ගන්නෙමියි කීවාය. රජ බුදුරදුන් වෙත එළැඹ, සරණ ගොස් ආරාධනාකොට බුද්ධප්‍රමුඛ සංඝයාට සත්දිනක් මහදන් දී, සාමාවතිය වරය ගනුවයි කීය. යහපත මහරජ, මට මෙම වරය දෙනු මැනව. ශාස්තෘන් වහන්සේ භික්ෂූන් පන්සියයක් සමග මෙහි වඩින සේක්වා. ධර්මයද අසන්නෙමියි කීවාය. රජු ශාස්තෘන් වහන්සේ වැඳ, ස්වාමීනි, භික්ෂූන් පන්සියයක් සමග නිතර මෙහි වඩිනු මැනව. සාමාවතී ප්‍රමුඛ පිරිස ධර්ම අසන්නෙමුයි කියත්යයි කීහ. බුදුරජාණන් වහන්සේ මහරජ, බුදුවරු නම් එක් ස්ථානයකට නිතර යන්ට නොවටී. මහජනයාද බලාපොරොත්තු වේයයි වදාළහ. ස්වාමීනි, එසේනම් භික්ෂූන්ට අණකරනු මැනැවැයි කීය. බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන්ට අණ කළ සේක. තෙරහු භික්ෂූන් පන්සියයක් ගෙන නිතර රජ කුලයට යෙත්. එම දේවිය ප්‍රමුඛ ස්ත්‍රීහු තෙරුන් වළඳවා ධර්මය ශ්‍රවණය කළහ. බුදුරදහු,

සාමාවතිය මෛත්‍රී විහරී උපාසිකාවන් අතර අග්‍රස්ථානයෙහි තැබූහ. මෙසේ රජුගේ ඊතලය මුදන්ට නොපොහොනා භාවය සාමාවතී උපාසිකාවගේ සමාධි විප්ඵාරා ඍද්ධියි. මෙහිද නොසෙල්වෙන පැහැදීමෙන් හෝ විශ්වාස කරන ප්‍රසාදයෙන් හෝ රත්නත්‍රය සරණ යාමෙන් හෝ සෙවුණේනුයි, උපාසිකායි යු.සේයි.

ආර්ය ඍද්ධි නිර්දේශයෙහි, **අරියා ඉද්ධි** යනු සිත් වසඟ කළ ක්ෂීණාශ්‍රව ආර්යයන්ටම හටගන්නා හෙයින් ආර්ය ඍද්ධියැයි යු.සේයි. **ඉධ භිකඛු** යනු මෙ සස්නෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුව, **අනිට්ඨෙ වත්‍ථුසමිං** අරමුණු කිරීම් ස්වභාවයෙන් අමනාප වස්තුවෙක හෝ සත්වයින් හෝ සංස්කාර කෙරෙහි, **මෙත්තායවා එරති** යනු ඉදින් සත්ත්වයෙක් වේද, මෛත්‍රී භාවනාවෙන් පතුරුවයි. **ධාතුතොවා උපසංහරති** යනු ඉදින් සංස්කාරයන් වේද, ධාතු මාත්‍රයක් යැයි ධාතු මනසිකාරය එළවයි. සත්ත්වයින් කෙරෙහිද ධාතු වශයෙන් එක්තැන් කිරීමද යහපති. **අසුභාය වා එරති** යනු ඉදින් සත්ත්වයෙක් වේද, අශුභ භාවනා වශයෙන් පතුරුවයි. **අනිච්චතොවා උපසංහරති** යනු ඉදින් සංස්කාරයෙක් වේද අනිත්‍යයයි මෙනෙහි කිරීම එක්තැන් කරයි. **තදුභයං** යනු එම ද්වයය. **උපෙකඛකො** යනු ෂඩංගොපේක්ෂාවෙන් උපේක්ෂක වූයේ. **සතො** යනු සිහියෙහි මහත්භාවයට පත්හෙයින්, **සමපජානො** යනු ප්‍රඥාවෙන් යහපත් නුවණැති බවට පත්වූයේ, **චකඛුනාරූපං දිසවා** යනු හේතු වශයෙන් ලද, ව්‍යවහාරයෙන් රූප දැක්මට සමර්ථ වූ චක්ෂු විඥ්ඥාණයෙන්, පෞරාණිකයෝ වනාහි කීහු:- ඇස රූපය නොදකියි. අචිත්තක හෙයි. සිත රූපය නොදකියි. ඇස නොවන හෙයිනි, චක්ෂුද්වාර, රූපාරම්මණ ගැටීමෙන් වනාහි ප්‍රසාදවස්තුක සිතින් දකියි. මේ හා සමාන වූවාහු, දුන්නෙන් විදියි ආදීන්හි මෙන් පිරිවර දේ සහිත කථා නම් වේ. එහෙයින් චක්ෂු විඥ්ඥාණයෙන් රූපය දැකයයි මෙහි මේ අර්ථයයි. නොහොත් ඇස කාරණා වීමෙන් (හේතු වීමෙන්) රූපය දැකයයි අර්ථයි. **නෙව සුමනො හොති** යනු ලෞකික දෙය හා සම්බන්ධ සොම්නස ප්‍රතිෂෙක්‍ෂපය. ක්‍රියාවක් වූ සොම්නස් වේදනාවද නොවේ. **න දුම්මනො** යනු සියලු දොම්නස් ප්‍රතික්‍ෂෙපය. **උපෙකඛකො විහරති** යනු ඉෂ්ට අනිෂ්ට අරමුණු හමුවූ කල්හි, පිරිසිදු ප්‍රකෘති ස්වභාව අත් නොහරනාකාර වූ, ෂට් ද්වාරයන්හි පවත්නා හෙයින් ෂඩංගොපේක්ෂායැයි ලද නම් ඇති තත්‍ර මධ්‍යස්තෝපේක්ෂායෙන් උපේක්ෂකව වාසය කෙරේ. **සොතෙන සද්දං සුත්වා** යනාදියෙහිද එම ක්‍රමයමැයි.

කම්ම විපාකජ ඍද්ධි නිර්දේශයෙහි, **සබ්බෙසං පක්ඛීනං** සියලු පක්ෂි වර්ගයන්ට ධ්‍යානාභිඥාවන්ගෙන් තොරව අහසින් ගමන, එසේම **සබ්බෙසං** දෙවානං අහස්ගමන හා දර්ශනයන් **එකච්චානං මනුස්සානං** යනු ප්‍රථම කල්පික මනුෂ්‍යයින්ට, **එකච්චානං විනිපාතිකානං** යනු ප්‍රියංකරමාතා, පුනබ්බසුමාතා ඵුස්සමිත්තා, ධම්මගුත්තා යන මේ ආදී සුව ශරීරයෙන් විවසව පතිත වන හෙයින් විනිපාතිකයින්ගේද, අන්‍ය ප්‍රේතයින්ගේද, නාග ගුරුළු ආදීන්ගේද, අහස් ගමනාදිය කර්ම විපාකජ ඍද්ධියයි.

පුණ්‍යවන්තයාගේ ඍද්ධි නිර්දේශයෙහි **රාජා** යනු දැහැමින් අන්‍යයාගේ සිත් අලවන හෙයින් රාජායි. රත්න චක්‍රය පවත්වන හෙයින් **චක්කවත්තියි. වෙහාසං ගච්ඡති** යනු අත්‍යන්ත සංයොගාර්ථයෙහි ද්විතියා වචනයි. **චතුරංගිනියා** යනු ඇත්, අස්, රිය, පාබල සංඛ්‍යාත සිව් අංගයන්ගෙන් යුක්ත වීමයි. **සෙනා** යනු ඒවාහි සමූහ මාත්‍රයමය. **අන්තමසො** යනු යටත් පිරිසෙයින්, **අස්සබන්ධා** යනු අශ්වයින්ගේ ආරක්ෂකයෝ, **ගොපුරිසා** යනු ගවයින්ගේ ආරක්ෂකයෝ **උපාදාය** යනු අත්නොහැර, මෙසේ ඔවුන්ගේ අහස් ගමනද පින්වතාගේ ඍද්ධිය යැයි අර්ථයි.

**ජොතිකස්ස ගහපතිස්ස පුඤ්ඤවතො ඉද්ධි** යනු ජෝතික නම් පෙර පසේ බුදුවරුන් කෙරෙහි කරන ලද ප්‍රාර්ථනා ඇති රජගහනුවර සිටුවරයෙකි. ඔහු උපන් දිනයෙහි මුළු නුවර සියලු ආයුධ දිලිසුණේය. සියල්ලන්ගේ ශරීරයන්හි නැගි ආභරණයන්ද, දිලිසුණාක් මෙන් ආලෝකය මිදුනාහ. නුවර ඒකාලෝක විය. ඔහුගේ නාම ග්‍රහණ දිනයෙහි මුළු නුවර එක්වර ආලෝකවත් වූ හෙයින් 'ජෝතික' යයි නාමය කළහ. ඉක්බිති ඔහුට වියපත් කල්හි, ගෘහයක් තැනීම පිණිස භූමිතලය ශුද්ධකරනු ලබන කල්හි සක්දෙව් රජ අවුත් සූසැට අමුණු ප්‍රමාණ ස්ථානයෙහි පෘථුවිය බිඳ, සත්රුවන්මය සත්මහල් ප්‍රාසාදයක් හටගැන්විය. ප්‍රාසාදය වටකොට සත්රුවන්මය, දොරකොටු සතකින් යුත් සත්ප්‍රාකාරයින් හටගැන්වීය. ප්‍රාකාර කෙළවර සූසැටක් කප්රුක් හටගැන්වීය. ප්‍රසාදයෙහි සිව් කොන්හි යොදුනක් තෙගව්, දෙගව්, එක්ගව් ප්‍රමාණ වූ, සිව් නිධන් සට හටගැන්වීය. ප්‍රාසාදයෙහි සිව් කොන්වල, තරුණ තල්කඳක් ප්‍රමාණ සිව් ස්වර්ණමය උක් යෂ්ටීහු හටගත්හ. ඒවාහි මැණික්මය පත්‍රද, රන්මය පුරුක්ද වීය. සත් දොරකොටුවල එකිණෙකෙහි, එක්දහස, දෙදහස, තුන්දහස, හාරදහස, පන්දාහ, හයදාහ, හත්දාහ බැගින් වන පිරිවර යක්‍ෂයින් සහිත යක්‍ෂයෝ

සත්දෙනෙක් ආරක්‍ෂා සැලසූහ. බිම්සර මහරජ ප්‍රාසාදීන්ගේ හටගැන්ම අසා සිටු ඡත්‍රය පිටත්කර යැවීය. හෙතෙම ජෝතික සිටුයයි මුළු දඹදිවම ප්‍රකට වී, උතුරුකුරු දිවයිනෙන් දෙවිවරුන් විසින් ගෙනවුත් සිරියහන් ගබඩාවෙහි හිඳුවන ලද එක් සහල් නැළියක්ද, ගිනි ඉපදවිය හැකි ගල් තුනක්ද, රැගෙන පැමිණ බිරිඳ සමග, එම ප්‍රාසාදයෙහි මහත් සම්පත් අනුභව කරමින් විසීය. ඔවුන්ට ජීවිතාන්තය තෙක් එම එක් සහල් නැළියෙහි බත් ප්‍රමාණවත් විය. ඉදින් ඔවුහු ගැල්සියයක් සහලින් පුරවාලනු කැමැති වෙත්ද, එය සහල් නැළියක්වම සිටියි. (පවතියි) බත් පිසිනකල්හි, සහල් සැළියෙහි බත පැසුණු කෙණෙහිම ගින්න නිවෙයි. එම සංඥාවෙන් බත පැසුණු බැව් දනිති. ව්‍යඤ්ජනාදිය පිසින කල්හිද එම ක්‍රමයමැයි. මෙසේ ඔවුන්ගේ ගිනිගල්වලින් ආහාරය පිසියි. මැණික් ආලෝකයෙන් වෙසෙත්. ගින්නෙහි හෝ පහනෙහි ආලෝකය නොදත්හ. ජෝතික සිටුහුට මෙබඳු සම්පත් ඇතැයි මුළු දඹදිවැ ප්‍රකට වූයේය. මහජනයා යානවාහනවලින් ඔහු දැකීමට එති. ජෝතික සිටුහු පැමිණි පැමිණි අයට උතුරුකුරු සහලින් බත් දෙවයි, කප්රුක්වලින් වස්ත්‍රාභරණ ගනිත්වායි අණකරයි. ගව්වක් වූ නිධාන කළයෙහි කට විවරකරවා යැපෙන පමණ ගනිත්වායි අණ කරයි. සියලු දඹදිව වැසියෝ ධනය ගෙනයන කල්හි නිධාන කළයෙහි අඟලක් මාත්‍රවූද, ඌනතාවක් නොවූයේය. මෙය පින්වත්හුගේ ඍද්ධියයි.

**ජටිලස්ස ගහපතිස්ස පුඤ්ඤවතො ඉද්ධි** යනු ජටිල නම්, කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ ධාතු චෛත්‍යයෙහි කරන ලද ප්‍රාර්ථනා ඇති තක්සලාවෙහි සිටුහුය. ඔහුගේ මව බරණැස් සිටුහුගේ දුව මනා රූ ඇත්තී වූවාය. ඇය පසළොස්, සොළොස් වයස් කල්හි රැකවරණය සඳහා මතු මහල්තලයෙහි වාසය කරවූහ. ඇය එක්දිනක් ජනේලය විවෘතකොට, පිටත බලන්නී, අහසින් යන්නා වූ විද්‍යාධරයෙකු ඇය දැක හටගත් ඇල්ම ඇතියේ ජනේලයෙන් පිවිස ඇය සමග සංවාසය කළේය. ඕ ඉන් ගැබ් ගති. ඉක්බිති දාසිය එය දැක, දරුව මේ කුමක්දැයි කියා චෝවා, කිසිවෙකුට නොකියවයි කියන ලද්දී බියෙන් නිශ්ශබ්ද වූවාය. ඕද දසවන මස පුත්‍රයෙකු ප්‍රසූතකොට, අලුත් බඳුනක් ගෙන්වාගෙන එහි එම දරුවා හොවවා එම බඳුන වසා, මතුයෙහි මල්දම් තබා 'මෙය හිසෙන් ඔසවාගෙන ගොස් ගඟෙහි අත්හැර දමව'. මෙය කිමෙක්දැයි විචාරණ ලද්දී, මාගේ ආර්යාවගේ බිලිපූජා කර්මයක් යයි කියවයි අණ කළාය. ඕ එසේ කළාය. යට ගංගා මතුයෙහි ස්නානය කරමින් සිටි ස්ත්‍රීහු එම

භාජනය දියෙන් ගෙන එනු ලබනු දැක එක් තැනැත්තියක් තෙල බඳුන මාගේ යැයි කීවාය. එක් තැනැත්තියක තෙල බඳුනෙහි ඇතුළත යමක් වේද, එය මාගේ යැයි කියා බඳුන සම්ප්‍රාප්ත වූ කල එය රැගෙන ගොඩබිම තබා විවෘතකොට දරුවකු දැක එක් තැනැත්තියක් 'මාගේ භාජනයැයි' කී හෙයින් ළදරුවා 'මාගේම වේයැයි' කීවාය. ඇලා විවාද කරමින් නඩුමගට බැස, අමාත්‍ය මට්ටම්හි, විනිශ්චය නොහැකි කල්හි, රජු වෙත ගියහ. රජු ඔවුන්ගේ වචන අසා, නුඹ දරුවා ගනුව, නුඹ භාජනය ගනුවයි කීයේය. යම් තැනැත්තියක විසින් ළදරුවා ලබන ලදද, ඕ මහා කච්චායන තෙරුන්ගේ උපස්ථායිකාවක් වේ. ඕ ළදරුවා තෙරුන් සමීපයෙහි පැවිදි කරවන්නෙමුයි පෝෂණය කළාය. ඔහු උපන්දින ගැබ්මළ සෝදා ඉවත් නොකළ හෙයින් කෙස් ගෙතී සිටියේය. එහෙයින් ඔහුට ජටිලයැයිම නම කළහ. ඔහු පියවර තබා හැසිරෙන කල්හි තෙරහු එම ගෘහයට පිඬු පිණිස පිවිසියහ. උපාසිකාව තෙරුන් වැඩ හිඳුවා ආහාර දුන්නාය. තෙරහු ළදරුවා දැක, උපාසිකාව ඔබ විසින් ළදරුවකු ලද්දේදැයි විමසීය. එසේය ස්වාමීනි. මම මොහු ඔබතුමන්ගේ සමීපයෙහි පැවිදි කරවන්නෙම්යි පෝෂණය කළෙමියි කීවාය. තෙරහු යහපතැයි ඔහු රැගෙන යනුයේ, මොහුට ගිහි සම්පත් අනුභව කරන්ට පුණ්‍යකර්ම ඇත්දෝහෝයි බලනුයේ, මහ පිණැති සත්ත්වයෙකි. මහසැප අනුභව කරන්නේය. තවමත් ළමා වියෙහිය. ඔහුගේ නුවණද මේරීමට නොගියේයැයි සිතා, ඔහු කැටුව තක්සලාවෙහි එක් උපස්ථායකයෙකුගේ ගෙට ගියේය. හෙතෙම තෙරුන් වැඳ සිටියේ දරුවා දැක ස්වාමීනි දරුවකු ලදදැයි විමසීය. එසේය උපාසක, දරුවා පැවිදි වන්නේය. එතෙක් ඔබ සමීපයෙහි සිටීවායි කීය. හෙතෙම යහපති ස්වාමීනියි ඔහු පුත්‍රස්ථානයෙහි තබා පෝෂණය කළේය. ඔහුගේ නිවසෙහි දොළොස් වසක් තුළ එකතු වූ භාණ්ඩ ඉතා බහුල විය. හෙතෙම අන් ගමකට යනුයේ එම සියලුම භාණ්ඩ කඩයට ගෙනවුත් ඒ භාණ්ඩයෙහි මිල කියා, මේ මේ දැයට මෙතෙක් නම් ප්‍රමාණයක් ධනය ගෙන දෙන්නෙහියයි (දෙනුව) කියා ගියේය. එදින නගරාරක්ෂක දේවතාවෝ යටත් පිරිසෙයින් දිරාගිය මිරිස් කරලක් ප්‍රමාණවත් දැයකින්ද, අවශ්‍යතා ඇත්තවුන් එම කඩය අබිමුව කළහ. එම දොළොස් වසක් තුළ බහුල වූ භාණ්ඩ එක් දිනයකින්ම විකිණිනි. කෙළෙඹියා අවුත් කඩයෙහි කිසිවක් නොදැක, දරුව, ඔබ විසින් සියලු භාණ්ඩ විනාශ කරන ලද්දේදැයි විමසීය. පියාණෙනි, විනාශ නොකළෙමි. සියල්ල ඔබ විසින් කියන ලද ක්‍රමයෙන් විකුණන ලදී. මෙය අසවල් දැයෙහි මිලය. මෙය අසවල් දැයෙහි මිලයයි සියලු

මිල ඔබ විසින්ම පිහිටුවන ලදී. කෙළෙඹියා පැහැද අනර්ඝ පුරුෂයෙකි. යම්කිසි තැනක ජීවත්වන්ට දක්‍ෂයැයි, තම වියපත් දියණිය ඇයට දී, මොහුට ගෘහයක් කරවුයැයි පුරුෂයින් අණකෙට, ගෘහය නිමිකල්හි යවු නුඹලා තම ගෘහයෙහි වසවු යයි කීයේය. ඉක්බිති ඔහුගේ ගෘහයට පිවිසෙන කල්හි, එක් පාදයකින් එළිපත්තට පය තැබූ කෙණෙහිම ගෘහයෙහි පසුභාගයෙහි පෘථුවිය පිහිටි තන්හි අසූරියන් රන් පර්වතයක් පැන නැංගේය. රජු ජටිලයාගේ ගෙහි පොළොව බිඳී, රන් පර්වතයක් පැන නැංගේයයි අසා, ඔහුට සිටු ඡත්‍රය යැවීය. හෙතෙම ජටිල සිටු නම් වූයේය. මේ පුණ්‍යවන්තයාගේ සෘද්ධිය වන්නේ **මෙණ්ඩකසස සෙට්ඨිසස පුඤ්ඤවතො ඉද්ධි** යනු මෙණ්ඩකනම් විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කරන ලද ප්‍රාර්ථනා ඇති, මගධ රට භද්දිය නුවර සිටුහුය. ඔහුගේ ගෘහය පිටුපස අමුණු සතරක වපසරිය මෙන්, අට ගුණයක් ප්‍රමාණ බිම් පෙදෙසෙක ඇත්, අස්, වෘෂභ ප්‍රමාණ රන් බැළුවෝ පෘථුවිය බිඳ, පිටෙන් පිට හැපෙනු ලබන්නාහු පැන නැංගාහ. ඔවුන්ගේ මුඛයන්හි පඤ්චවර්ණ නූල් ගුලි බහාලන ලද්දේ වෙයි. ගිතෙල්, තලතෙල්, මී, උක්පැණි ආදියෙන් හෝ වස්ත්‍ර, හඳනා වස්ත්‍ර රන්රුවන් ආදීන්ගෙන්, අවශ්‍යතාවක් ඇතිකල්හි උන්ගේ මුවින් ගුලිය ඉවත් කරති. එක් බැටළුවකුගේ මුවින්, සමස්ත ජම්බුද්වීප වාසීන්ට ප්‍රමාණවත් ගිතෙල්, තලතෙල්, මී, උක්පැණි ආදියද, වස්ත්‍ර, හඳනා වස්ත්‍ර, රන්රුවන් නික්මේ. එතැන් පටන් මෙතෙමේ මෙණ්ඩක සිටුයයි ප්‍රකට විය. මේ පින්වත්හුගේ සෘද්ධිය වන්නේය.

**ඝොසිතසස ගහපතිසස පුඤ්ඤවතො ඉද්ධි** යනු පසේ බුදුවරයෙකු කෙරෙහි කරන ලද ප්‍රාර්ථනා ඇති, සාක්‍ය රටෙහි කොසඹෑ නුවර උපන් සිටුවරයා ඝෝසිත නම් වේ. හෙතෙම දෙව්ලොවින් චුතව කොසඹෑ නුවර නගර සෝභිනියගේ කුසෙහි උපනි. ඕ ඔහු ප්‍රසූත කළ දින කුල්ලෙහි නිදිකරවා කසලගොඩෙහි දැම්මවූවාය. දරුවා බලුකපුටන් පිරිවරා හුන්නේය. එක් පුරුෂයෙක් ඔහු දැක පුත්‍ර සංඥා ලැබ, මවිසින් පුත්‍රයෙකු ලදැයි ගෙට ගෙන ගියේය. මෙම සිද්ධියට අනතුරුව කොසඹෑ නුවර සිටුතුමා පුරෝහිත දැක, 'ආචර්යය, කිමෙක්ද අද ඔබ විසින් තිථි, කරණ නක්‍ෂත්‍ර ආදීහු බලන ලදදැයි විචාරා 'එසේය මහ සිටාණෙනියි කී කල්හි 'ජනපදයට කුමක් වන්නේදැයි විමසීය. මෙනුවර අද උපන් දරුවා ජ්‍යෙෂ්ඨ සිටු වන්නේ යයි කීය. එකල්හි සිටුහුගේ බිරිඳ ගැබ්බර වේ. එහෙයින් හෙතෙම වහා ගෙට කිසිවෙකු යැවීය. යව ඇය ප්‍රසූත කළේද නොකළේදැයි දැනගනුව. ප්‍රසූත නොකරන ලදැයි අසා ගෙට ගොස් කාලිනම්

මෙහෙකාරිය කැඳවා, දහසක් මසුරන් දී, යව, මෙනුවර විමසා බලා, අද උපන් දරුවා ගෙන එවයි කීය. ඕ විමසා බලන්නී එම ගෘහයට ගොස් එම දරුවා, එදින උපන් බැව් දැන මසුරන් දහසක් දී ගෙනවුත් සිටුහුට පෙන්වූවාය. සිටුතෙමේ ඉදින් මා හට දියණියක් උපදින්නේද, ඇය සමග ඔහු වස්වා සිටු තනතුරට ස්වාමිත්වය කරන්නෙමි. ඉදින් පුත්‍රයෙකු උපදින්නේද, ඔහු මරවන්නෙමියි සිතා ඔහු ගෙහි පෝෂණය කරවීය.

ඉක්බිති ඔහුගේ බිරිඳ කිහිපදිනක් ඇවෑමෙන් පුතෙකු ප්‍රසූත කළාය. සිටුතෙමේ, මොහු නොමැතිකල්හි මාගේ පුත්‍ර සිටුතනතුර ලබන්නේය. දැන්මම ඔහු මරන්ට වටනේයයි කාලිය අමතා, එම්බල කාලිය යව, ගාලෙන් ගවයින් නික්මෙන වේලායෙහි ගාල්දොර මැද මොහු හරස්ව හොවවව. දෙන්නු ඔහු මැඩ මරන්නාහ. ඔහුගේ මඩනා ලද නොමඩනා ලද බව දැන එවයි කීය. ඕ ගොස් ගොපල්ලා විසින් ගාල්දොර විවෘත කළ කෙණෙහිම ඔහු එසේ හෙවවූවාය. ගව ගණ ජ්‍යෙෂ්ඨ වෘෂභයා, අන් කල්හි සියල්ලන්ට පසුව නික්මයන්නේ නමුදු, එදින සියල්ලන්ට පළමු නික්ම දරුවා සිව්පාදයන් අතරත කොට සිටියේය. නොයෙක් සියගණන් ගවයෝ වෘෂභයාගේ දෙපස ගැටෙමින් නික්මුණහ. ගොපල්ලාද මෙම වෘෂභයා පෙර සියල්ලන්ට පසුව නික්මෙයි. අද වනාහි සියල්ලන්ට ප්‍රථම නික්මී දොරමැද නිශ්චලව සිටියේය. එය කිමෙක්දැයි සිතා, ගොස් උගේ යට හොත් දරුවා දැක පුත්‍රස්නේහය ලැබ, මවිසින් පුත්‍රයෙක් ලබන ලදැයි ගෙදර ගෙන ගියේය. කාලී ගොස් සිටුහු විසින් විචාරන ලද්දී, එකරුණ සැලකොට සිටියහ. යව, ඔහු නැවත මෙම මසු දහස දී රැගෙන එවයි කියන ලද්දී නැවත ගෙනවුත් දුන්නාය.

ඉක්බිති සිටුහු ඇයට දුව කාලිය, මෙනුවර පන්සියයක් ගැල් ඉතා අලුයම් කලැ නැගිටැ වෙළඳම් පිණිස යෙති. නුඹ මොහු ගෙනගොස් රථමගැ හොවව. ගොන්නු ඔහු මඩින්නාහ. රිය සක් හෝ ඔහු මඩී. ඔහුගේ පුවත්ද දැන එනු මැනැවැයි කීය. ඕ ගොස් දරුවා රියමගැ හෙවවූවාය. ගැල්දෙටු පෙරටුයෙන් විය. ඉක්බිති ඔහුගේ ගොන්නු එතැන් පැමිණ විය හළය. නැවත නැවත විය නංවා ඉදිරියට ගමන් කරවීමට යත්න කළේද පෙරට නොගියහ. මෙසේ ඔහුට ඔවුන් සමග උත්සාහ කරනුයේම අරුණ නැංගේය. හෙතෙම, ගොන්නු කිමෙක්නම් කළාහුදැයි මං බලනුයේ ළදරුවා දැක, ඒකාන්තයෙන් බැරෑරුම් කර්මයක් යැයි සිතා මවිසින් පුතෙකු ලදැයි තුටු සිතැතියේ, ඔහු තම නිවසට ගෙන ගියේය.

කාලිය ගොස් සිටුහු විසින් විමසන ලද්දී එපවත් කීවාය. නැවත සිටුහු දහසක් දී ඔහු රැගෙන එවයි කියන ලද්දී එසේ කළාය.

ඉක්බිති සිටුහු ඇයට, දැන් ඔහු අමු සොහොනට ගෙනගොස් පඳුරු අතරෙහි හොවව. එහි සුනඛාදීන් විසින් කන ලද්දේ හෝ අමනුෂ්‍යයින් විසින් පහරනු ලැබුයේ හෝ මැරෙන්නේය. ඔහුගේ මළ නොමළ බවද දැන එනු මැනැවැයි කීය. ඕ ඔහු එහි ගෙනගොස් හොවවා එකත්පස්හි සිටියාය. ඔහු කරා සුනඛාදීන්ට හෝ අමනුෂ්‍යයින්ට හෝ එළඹෙන්ට නොහැකිවිය. එකල්හි එක් එළුවන් බලන්නෙක් එළුවන් ගොදුරු පිණිස ගෙනයනුයේ, සොහොන් පසින් යේ. එක් එළු දෙනක් කොළ කමින් පඳුරු අතරට පිවිස ළදරුවා දැක, දණින් සිට ළදරුවාට කිරිතනය දුන්නාය. එළුපල්ලා විසින්, හෙ, හෙයි ශබ්ද කරන ලද්දීද, නොනික්මිණි. හෙතෙම කෝටුවෙන් එළුදෙනට පහරදී බැහැර කරන්නෙමියි පඳුරු අතරට පිවිසියේ දණින් සිට ළදරුවාට කිරිපොවන එළුදෙන දැක ළදරුවා කෙරෙහි පුත්‍ර ප්‍රේමය ලැබ මවිසින් පුතෙක් ලදිමියි රැගෙන ගියේය. කාලිය ගොස් සිටු විසින් විමසන ලද්දී එපවත් කීවාය. නැවත සිටුහු දහසක් දී ඔහු රැගෙන එවයි කියන ලද්දී එසේ කළාය.

ඉක්බිති සිටුහු දූව මොහු රැගෙන චොර ප්‍රපාත පර්වතයට නැග ප්‍රපාතයෙහි දමව. පර්වත කුසෙහි හැපෙනුයේ කැබලි කැබලිව බිමැ වැටෙන්නේය. මළ නොමළ බව දැන එනු මැනැවැයි කීයේය. ඕ ඔහු එසේ ගෙනගොස් පර්වත මුදුනෙහි සිට විසිකළාය. එම පර්වත කුස ඇසිරිකොට මහ උණපඳුරෙක් පර්වතයෙහි අනුසාරයෙන්ම වැඩිණි. එහි මතුයෙහි ඝනව හටගත් ඔළිඳ පඳුරක් පැතිරී තිබුණි. ළදරුවා වැටෙනුයේ පලසක් මත තැබුවාක් මෙන් ඒ මත වැටුණේය. එදිනම නළකාර ප්‍රධානියාගේ වේණුබලිය (උණ ලීවලට බදුගෙවීම) සිදුවන දිනයද විය. හෙතෙම සිය පුතු සමගින් ගොස් එම උණපඳුර සිඳින්ට ඇරඹීය. එහි සලිතය තුළින් ළදරුවා ශබ්ද කළේය. හෙතෙම ළදරුවෙකුගේ ශබ්දයක් මෙනැයි එක් පසෙකින් නැග ඔහු දැක මවිසින් පුතෙක් ලබන ලදැයි තුටු සිතැතියේ රැගෙන ගියේය. කාලි ගොස් සිටුහු විසින් විමසන ලදුයේ එපවත් කීය. නැවත සිටුහු දහසක් දී ඔහු රැගෙන එවයි කියන ලද්දී එසේ කළාය.

සිටුහු විසින් එක් එක් දැය කරන අතරවාරයේ දරුවා වැඩිණි. මහා ශබ්දයෙන් කථාකරන හෙයින් මොහුට ඝෝෂිත යැයිම නාමය

වූයේය. ඔහු සිටුහුගේ ඇසෙහි කටුවක් මෙන් වැටහිණ. සෘජුව බලන්ට හෝ අසමත් විය. ඉක්බිති ඔහු මරාදමන උපාය සිතනුයේ තම කුඹල්කරුගේ හමුවට ගොස් කවර කල්හි වළං පෝරණුව දල්වන්නේදැයි විචරා, හෙටයයි කී කල්හි එසේනම් මෙම දහස ගෙන මගේ එක් කාර්යයක් කරවයි කීය. ස්වාමීනි, කිමෙක්ද? මගේ එක් අවජාතක පුත්‍රයෙක් සිටී. ඔහු ඔබ සමීපයට එවන්නෙමි. ඉක්බිති ඔහු ගැබට (කාමරයට) ප්‍රවේශකරවා තියුණු වෑයකින් කැබැලි කැබැලිවලට කපා සැළියෙක බහා පෝරණුවෙහි පිසවයි කීය. නුඹට මෙම දහස අත්තිකාරමකි. ඉදිරි කාලයේදී නුඹට කළයුතු සියල්ල පසුව කරන්නෙමි. කුඹල්කරු යහපතැයි පිළිගත්තේය. සිටුහු දෙවන දින ඝෝෂිත කැඳවා ඊයේ මවිසින් කුඹල්කරුට එක් කාර්යයක් අණ කරන ලද්දේය. එනු දරුව, නුඹ ඔහු සමීපයට ගොස් මෙසේ කියව. මාගේ පියා විසින් ඊයේ අණකරන ලද ක්‍රියාව සම්පූර්ණ කරවයි පිටත් කළේය. හෙතෙම මැනැවැයි ගියේය. ඔහු එහි යන්නහු, සිටුහුගේ අනෙක් පුත්‍රයා ළමයින් සමග ගුඩුකෙළි, ක්‍රීඩා කරන්නේ ඝෝෂිත දැක කැඳවා, කොහි යන්නෙහිදැයි විමසන ලදුයේ, පියතුමාගේ හස්නක් ගෙන කුඹල්කරු සමීපයට යෙමියි කී කල්හි, මම එහි යන්නෙමි. මෙම ළමයි මට වඩා බොහෝ ඔට්ටු දිනූහ. එය මට නැවත දිනවා දෙවයි කීය. මම පියාට බියවෙමි. සොයුර බිය නොවෙව. මම එම හස්න ගෙනයන්නෙමි. බොහෝ ඔට්ටු මගෙන් දිනාගෙන ඇතිනිසා, මා එනතුරු ඒ සියල්ල දිනාගෙන තබන්නැයි සිටුපුතා කීයේය. ඝෝෂික වනාහි ගුඩු ක්‍රීඩායෙහි දක්‍ෂයෙකි. එහෙයින් ඔහු මෙසේ යොදවන ලදී.

හෙතෙමේද ඔහුට එසේ නම් ගොස් කුඹල්කරුට කියව. මාගේ පිය තෙමේ ඊයේ එක් කාර්යයක් අණ කරන ලද්දේද? එය සම්පූර්ණ කරවයි පිටත්කර හැරියේය. හෙතෙම ඔහුගේ සමීපයට ගොස් එසේ කීයේය. ඉක්බිති කුඹල්කරු සිටුහු විසින් කියන ලද අයුරින් ඔහු මරා පෝරණුවෙහි බහාලීය. ඝෝෂිතද දිවා කලැ, කෙළැ, සවස් කලැම ගෙට ගොස් දරුව කිම නොගියෙහිදැයි කී කලැ තමාගේ නොගිය හේතුවද, බාලයාගේ ගිය හේතුවද දැනුම් දිනි. සිටුහු අහෝ නැසුණෙමියි මහහඬින් ඝෝෂාකොට මුළු සිරුරෙහි ලෙය කකාරවන ලද කලක් මෙන්ව, පින්වත් කුඹලාණෙනි, නොනසව. නොනසවයි දෑත් බැඳ හඬනුයේ ඔහු වෙත ගියේය. කුඹල්කරු එසේ එන්නා වූ ඔහු දැක ස්වාමීනි, ශබ්ද නොකළ මැනවි. කාර්යය සම්පූර්ණයයි කීය. හෙතෙම මහ පර්වතයකින් ඇදහැලුණාක් මෙන් මහත් සොවින් මැඩුණේව අනල්ප දොම්නසක් වින්දේය.

මෙසේ ඇතිකල්හි, සිටුහුට ඔහු සැජුව බැලීමට පවා නොහැකි තත්වයක් උදාවිය. කෙසේනම් ඔහු මරන්නේදැයි සිතනුයේ, මාගේ ගම් සියයක ආදායම් පාලකගේ සමීපයට යවා මරවන්නෙමියි උපායක් සිහිපත් වී 'මොහු මාගේ අවජාත පුත්‍රයෙකි. මොහු මරා අශුචි වළෙහි දමව. එසේ කළ කල්හි මම මයිළනුවන්ට කළයුත්තක් දන්නෙමියි ඔහුට (තල්) කොළයක් ලියා දරුව සෝෂිත, අපගේ ගම්සියයක ආදායම් පාලකයෙක් සිටී. මෙම කොළය ගෙනගොස් ඔහුට දෙවයි කියා කොළය ඔහුගේ ඉණේ (දසරුව) බැන්දේය. ඔහු අකුරු ලිවීම කියවීම නොදනී. බාල කල පටන් ඔහු මැරවීමට උත්සාහ කළේද සිටුහුට ඔහු මරන්ට නොහැකි විය. අකුරු ශිල්පයක කෙසේනම් හික්මවන්නේද? හෙතෙම තම මරණ පත ඉණෙහි බැඳ (රෙදිවාටියෙහි) නික්මෙනුයේ පියාණෙනි, මට මාර්ගෝපකරණ නැතැයි කීය. මාර්ගෝපකරණවලින් කම් නැත. අතරමග අසවල් නම් ගමෙහි මාගේ යහළු සිටුවරයෙක් සිටී. ඔහුගේ ගෘහයෙහි උදෑසන අහර ගෙන ඉදිරියට යවයි කීය. හෙතෙම මැනැවැයි පියා වැඳ නික්මෙනුයේ, එගමට පැමිණ සිටුගෙය විමසා එහි ගොස් සිටු බිරිඳ දිටීය. කොහි සිට පැමිණියෙහිදැයි පුළුවුත්තේ ඇතුල් නුවරිනැයි කීය. කවරෙකුගේ පුතෙක්ද? මැණියනි, ඔබගේ යහළු සිටුහුගේය. නුඹ සෝෂිත නම් වෙහිද? එසේය මැණියනි. ඇයට දරුවා දුටු පමණින්ම පුත්‍ර ස්නේහය හටගති. එම සිටුවරයාට වනාහි, පසළොස්, සොළොස් හැවිරිදි පමණ වූ, මනා රුවැති ප්‍රසාදජනක එක් දියණියක් සිටියාය. ඇය රැක්මට එකම මෙහෙකාර දැස්සක් දී, සත්මහල් පහයක මතුමහලෙහි සිරියහන් ගබඩාවෙකැ වාසය කරවයි. එකෙණෙහි සිටු දියණිය එම දාසිය නුවර ඇතුළු වෙළඳපොළට යැවුවාය. එකල්හි සිටු බිරිඳ ඇය දැක කොහි යන්නීදැයි විචාරා, ආර්ය දියණියගේ යැවීමෙන්යැයි කී කල්හි දැන් මෙහි එව. ගමන නවතනු. මගේ පුත්‍රයාට පුටුවක් අතුරා (සූදානම්කොට) දිය ගෙනවුත්, පා දොවා, තෙල් ගල්වා සයනයක් අතුරා දෙව. පසුව ගමන කරන්නෙහි යයි කීය. ඕ එසේ කළාය. ඉක්බිති කාලය ගතකර පැමිණි ඇයට සිටුදියණිය දැඩිව තර්ජනය කළාය. ඉක්බිති ඇයට ඕ මෙසේ කීවාය. මට කෝප නොවුව මැනවි. සෝෂිත සිටුපුත් පැමිණියේය. ඔහුට මේ මේ දෑ කොට, එහි ගොස් පැමිණියේ වෙමියි කීවාය.

සිටු දියණියට සෝෂිත සිටුපුත්‍රයා යැයි නම ඇසීමෙන්ම, පෙර අත්බැව්හි එක්ව වාසය කිරීම් වශයෙන් හටගත් ප්‍රේමය සිවි ආදිය සිඳ ඇටමිදුළු හා ගැටී සිටියේය. ඉක්බිති මැණියෙනි, ඔහු කොහිදැයි විචාළාය.

සයනයෙහි හෙවියේ නිදයි යයි කීවාය. ඔහු හස්තයෙහි කිසිවක් ඇත්ද? ඉණෙහි හසුනපතක් ඇත. ඕ එය කුමක් වියහැකිදැයි ඔහු නිදනා කලැ, මව්පියවරුන් වෙනත් කරුණක් පිළිබඳ අවධානය යොමුකළ කල්හි ඔවුන්ට නොපෙනෙන ලෙසින් මහලින් බැස, ඔහු සමීපයට ගොස් එම පත ඉණෙන් මුදා රැගෙන තම ගැබට පිවිස දොර වසා, ජනේලය විවෘතකොට අක්ෂර ශාස්ත්‍රයෙහි දක්ෂ හෙයින් එම පත මුදා කියවා 'අනේ මේ බාලයා තම මරණ ලිපිය තමන්ගේ ඉණේ බැඳගෙන ඇවිදියි. ඉදින් මා විසින් මෙය නොදිටියේ වන්නේද? ඔහුගේ ජීවිතය නැතයයි එම පත පළා විනාශකොට, සිටුවරයා ලියන අයුරින් වෙනත් පත්‍රයක් ලීවාය. 'මේ මාගේ පුත්‍ර ඝෝෂිත නමැ. ගම් සියයෙන් අයබදු ගෙන්වා මොහුට ජනපද සිටුහුගේ දියණිය සමග විවාහ මංගල්‍යය සිදුකොට, තමන් වසන ගම මැද දෙමහල් ගෘහයක් තනා, ප්‍රාකාරවලින් වටකොට, ආරක්ෂක පුරුෂයන් යොදවා මනා ආරක්ෂාව කෙරේවා. මේ මේ දෙය මවිසින් කරන ලදැයි මට හස්නක් එවනු මැනවි. මෙසේ කළ කල්හි මම මයිලණුවන්ට කළයුතු සියල්ල දන්නෙමියි ලියා ලිපිය හකුළුවා ඔහුගේ ඉණෙහිම බැන්දේය. හෙතෙම දිවා කලැ නිදා, නැගිට අනුභවකොට පිටත්ව ගියේය. දෙවන දින උදෑසනම ඒ ගමට ගොස් ආදායම්පාලක ග්‍රාම කෘත්‍යයන් කරමින් සිටියදීම දිටීය. හෙතෙම ඔහු දැක, දරුව, කිමෙක්දැයි විමසා, මාගේ පියා විසින් තුඹට ලිඛිත පත්‍රයක් එවන ලදැයි කී කල්හි ලිපිය ගෙන කියවා සතුටු සිතැතියේ පින්වත්නි, මාගේ ස්වාමියාගේ මා කෙරෙහි ඇති ස්නේහය බලවු. දෙටු පුත්‍රයාගේ විවාහ මංගල්‍යය කරවයි මාගේ සමීපයට එවීය. වහා දර ආදිය ගෙන එවු යයි ගෘහපතියන්ට අණකොට ගම මැද කියන ලද ආකර ඇති ගෙයක් කරවා, ගම්සියයෙන් අයබදු ගෙන්වා, ජනපද සිටුහුගේ දියණිය කැඳවා ගෙනවුත් මංගල්‍යය නිමාකොට සිටුහු මවිසින් මේ මේ දේ කරන ලදැයි හස්නක් යැවීය.

සිටුහු එය අසා යමක් කරන්ට සිතයිද? එය නොකෙරෙයි. යමක් නොකරන්ට සිතයිද එයම කෙරෙයි යයි මහත් දොම්නසක් උපනි. පුත්‍ර ශෝකය සමග, එම ශෝකය එක්ව කුසෙහි දාහයක් හටගෙන එයින් අතීසාරය ඉපදවිය. සිටු දියණියද ඉදින් කිසිවෙක් සිටුහුගේ සමීපයෙහි සිට පැමිණේද? මට නොකියා පළමුව සිටු පුත්‍රයාට නොකියවයි අණ කළාය.

සිටුහුද දුෂ්ට පුත්‍රයා මාගේ වස්තු සම්පතට ස්වාමියෙකු නොකරන්නෙමියි සිතා එක් අයකැමියෙකුට මෙසේ කීයේය. මයිලණුවෙනි

මාගේ පුත්‍රයා දක්නා කැමැත්තෙමි. එක් හස්නක් ලියා, සේවකයෙකු යවා මපුතු කැඳවවයි කීය. හෙතෙම මැනැවැයි හස්නක් දී, එක් පුරුෂයෙකු යැවීය. සිටු දියණිය ඔහු පැමිණ දොරටුව අබියස සිටින බැව් අසා කැඳවා දරුව ඇයිදැයි ඇසුවාය. ආර්යාවනි, සිටුවරයා ගිලන් විය. පුතා දකිනු කැමැත්තේය. රෝගියා බලවත්ද දුබලද, ආර්යාවෙනි බලවත්ය. දැනට ආහර අනුභව කරයි යයි කීය. ඇය ඔහු පැමිණි බැව් සිටුපුතුට නොදන්වා, පැමිණි පුරුෂයාට නිවසක්, බහුබාහිරාදිය වෙනත් අමතර වියදම්ද දී, මා දන්වන තෙක් රැඳීසිටින ලෙස කීවාය. සිටුහු නැවතත් අයකැමි අමතා මයිලණුවෙනි, ඇයි මපුතු වෙත හස්නක් නොයැව්ණිදැයි ඇසීය. යැව්වෙමි. පණිවුඩකරු මෙතෙක් නොපැමිණියේ යැයි කීය.

එසේනම් වෙනකෙකු යවව. ඔහු වෙනත් අයෙකු යැවීය. සිටු දියණිය ප්‍රථමයෙන් පැමිණි පුද්ගලයා කෙරෙහි ක්‍රියා කළ අයුරින් ඔහු කෙරෙහිද ක්‍රියා කළාය. සිටුහුගේ රෝගය බලවත් විය. එක් භාජනයක් තබා, එය ඉවත් කරනවිට වෙනත් භාජනයක් තබන්ට සිදුවිය. මයිලණුවෙනි මපුතු වෙත වෙනත් අයෙකු නොයැව්ණිද? යැවීමි ස්වාමීනි, ගිය පුද්ගලයා නොපැමිණියේය. එසේනම් වෙනත් අයෙකු යවව. තෙවන වරටත් පුරුෂයෙකු යැවීය. තෙවනවර පැමිණියහුගෙන් විස්තර විමසුවාය. සිටුදේවිය ඔහු බලවත් සේ රෝගාතුරය. අහර නොගෙන ඇඳේ වැතිරී සිටියි. දැන් වේලාව සුදුසුයැයි සිතා, ඔබගේ පියතුමා ගිලන්ව ඇතැයි සෝෂිතට දැනුම් දිනි. අපි කුමක් කළයුතුදැයි විමසීය. ගම් සියයෙන් උපදනා අයබදු හා බඩුබාහිරාදිය රැගෙන ගොස් සිටුතුමා හමුවෙමුයි කීවා තෙවන වර පැමිණි පුරුෂයාත් සමග පිටත්වූහ. ඔබගේ පියා දුර්වලය. මෙම භාණ්ඩ රැගෙන ගැලෙන් යනවිට පමාවෙයි. ගැල හා ගැල්කරු නතර කරන්නැයි සෝෂිතට කියා එම බඩු සියල්ල ආපසු සිය නිවසට හරවා යැවීය. දැන් අපි එහි යමු. ඔබ පියතුමාගේ පාද පාර්ශ්වයෙන් සිටින්න. මා හිස පැත්තෙන් සිටින්නෙමියි කියා ගෘහයෙහි ඉදිරිපස-පිටුපස ආරක්ෂකයින්ට රැඳී සිටින ලෙස නියෝග කළාය. ගෘහ ප්‍රවිශ්ට සිටුපුත්‍රයා පියාගේ පාද පාර්ශ්වයෙන් සිටගති. ආයුත්තකයා සිටුහුගේ පා පිරිමදිමින් ඔබ පුතු පැමිණියේයයි කීය. පුතා දැන් කොතැන්හිද? ඔබේ දෙපා සමීපයෙහි මාගේ නිවසෙහි කෙතෙක් ධය ඇත්දැයි විමසීය. ස්වාමීනි කහවණු හතලිස් කෝටියකි. ග්‍රාම-ක්ෂේත්‍ර (කුඹුරු) දෙපා සිව්පා සත්තු - යාන වාහන මෙතෙක් ප්‍රමාණ තිබේ. මාගේ මෙපමණ වූ ධනය සෝෂිතට නොදෙන්නෙමියි කියනු කැමැතියේ දෙමියි කීය. එය ශ්‍රවණය

කළ සිටුදියණිය, මොහු නැවත කථා කළහොත් වෙනස් දෑ කීමට සිදුවිය හැකියයි සිතා ශෝකාතුර වූවාසේ, කෙස් කළඹ කඩාහෙළා, හඬා පියාණෙනි මේ මොනවා කථා කරනවාද? මොනවද මේ කියන්නේ අප විසින් නොඇසිය යුත්තක් අසන ලද්දේය. සිටුහුට යළි කථා කළ නොහැකි වන ආකාරයෙන් හිසෙන් ඔහුගේ පපුව මැදට ගසමින් බලවත් ශෝකය ප්‍රකට කරන අයුරක් දැක්වූවාය. සිටුහු ඒ මොහොතෙහිම මියැදුණාහ.

රජු පියා කළුරිය කළ කල්හි, පියා විසින් පරිභෝග කරන ලද, භෝගයන් දී හැම දෙයකින්ම සියයේ කොටස්වලින් යුත් වස්තුව සමග සිටු තනතුර දුන්නේය. සෝෂිත සිටුහු නම් වී, මහා සම්පත්තියක පිහිටියේ සිටු දියණියගේද, කාලියගේද වචනයෙන් මුලසිට සත් තන්හි තමාගේ මරණයෙන් මිදුණ බැව් දැන දිනපතා දහසක් වියදම්කොට දන් පිහිටවීය. මෙසේ මොහුගේ සිත් සතන් නිරෝග භාවය පින්වත්හුගේ ඍද්ධියයි. එහි ගහ යනු ගෘහය යූසේයි. ගෘහයෙහි අධිපති ගහපතියි මහාසාල කුලයෙහි අධිපතියාටද එය නාමයකි. සමහර පොත්වල සෝෂිත වස්තුවට අනතුරු මෙණ්ඩක වස්තුව ලියන ලදී.

පඤ්චන්නං මහා පුඤ්ඤානං පුඤ්ඤවතො ඉද්ධි යන මෙහි පුනාර්ථිය පඤ්ච මහ පිනැතියන්ගේ වශයෙන් දතයුත්තාහයි අර්ථයි. පස් මහ පිනැත්තෝ නම්, මෙණ්ඩක සිටු, ඔහුගේ බිරිඳ චන්ද්‍ර පද්මා, පුත් ධනඤ්ජය සිටු, ලේලිය සුමනාදේවී, පුණ්ණදාස යන අයය. මෙම පස්දෙන පසේබුදුන් කෙරෙහි කරන ලද ප්‍රාර්ථනා ඇත්තාහුය. ඔවුනතර මෙණ්ඩක සිටුහු කෝෂ්ඨාගාර හත්සිය පනහක්, ශුද්ධ කරවා, හිසෙහි සිට නහන ලදුයේ, දොරටුයෙහි හිඳ, උඩ බලයි. අහසින් රත්හැල් දහරා, පහත හෙළා සියලු කොටු පුරවයි. ඔහුගේ බිරිඳ, සහල් එක් නැළියක් පමණ ගෙන බත්පිසවා එක එලවළු පිසින භාජනයක, ව්‍යංජනයක් කරවා සියලු අලංකාරයන්ගෙන් සැරසෙන ලද්දී දොර කොටුයෙහි පනවන ලද අස්නෙහි හිඳ, බත්වලින් අවශ්‍යතා ඇති සියල්ලෝ එත්වායි සෝෂා කරවා කැඳවා රන් හැන්දක් ගෙන පැමිණි පැමිණියවුන්ට එළවන ලද බඳුන් පුරවා දෙන්නීය. මුළු දවස පුරා, දෙනු ලබන්නී, හැන්දෙන් වරක් ගත් ස්ථානයම පමණක් පෙනේ. ඔහුගේ පුත්‍රයා හිස සිට ස්නානය කළේ, මසුදහසක පසුම්බියක් ගෙන කහවණුවලින් අවශ්‍යතා ඇත්තෝ පැමිණෙත්වායි සෝෂා කරවා, පැමිණි පැමිණියවුන්ට බඳුන් පුරවා දෙයි. පසුම්බියෙහි කහවණු දහස වෙනසක් නොවී ඒ අයුරින්ම තිබේ. ඔහුගේ ලේලිය සියලු

අලංකාරයෙන් සැරසෙන ලද්දී, ද්‍රෝණ සතරෙක වී කුඩයක් රැගෙන අස්නෙහි හිඳින ලද්දී, බිත්තර වී අවශ්‍යතා ඇතියහු පැමිණෙත්වායි ඝෝෂා කරවා පැමිණි පැමිණියවුන්ට ගත් භාජන පූරවා දෙයි. කුඩය පුරවන ලද අයුරින්ම නොවෙනස්ව පවතී. ඔහුගේ දාසයා සියලු අලංකාරයන්ගෙන් සැරසුණේ රන් වියගසෙහි රන් යොත්වලින් ගොනුන් යොදා රන් කෙවිටක් ගෙන, ගොනුන්ට සුවඳ පසැඟිලි දී, අංවල රන් කොපු පළඳවා කෙතට ගොස් පදවයි. (දක්කයි) මෙතැනින් තුනකි. මෙතැනින් තුනකි. මැදින් එකක්දැයි සත්නගුල් පාරවල් පොළොව බිඳ ගෙන යයි.

දඹදිව් වාසීහු බත්, බීජ, රන් රුවන් ආදීන්හි කැමැති පරිද්දෙන් සිටු ගෘහයෙන්ම ගත්හ. අනුක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේ භද්දිය නුවරට, සම්ප්‍රාප්ත වූ කල්හි භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනායෙන් පස්මහ පිනැත්තෝද, ධනඤ්ජය සිටුහුගේ දියණිය විශාඛාවද සෝවාන් ඵලයට පැමිණියහ. මේ එම පස්මහ පිනැත්තවුන්ගේ පිනැත්තහුගේ ඍද්ධියයි. සංක්‍ෂෙපයෙන් වනාහි පුණ්‍ය සම්භාරයන් මේරීමට ගියකල්හි, සිද්ධවීම් විශේෂය පිනැත්තහුගේ ඍද්ධියයි.

විද්‍යාමය ඍද්ධි නිර්දේශයෙහි, ඉටුවීම් ආකාර, ග්‍රන්ථාදී විද්‍යාවක් හෝ උපචාර සිද්ධ, පණ්ඩිතයින් විසින් උපදවාගත් අන්‍ය වූ හෝ විද්‍යාවක් දරත්නුයි **විජ්ජා ධරායි. විජ්ජං පරිජපෙපත්වා** යනු සුදුසු පරිද්දෙන් විද්‍යාව මුඛයෙන් පිරිවහා, සෙස්ස කියන ලද අර්ථමය.

සම්‍යක් ප්‍රයෝග ඍද්ධි නිර්දේශයෙහි, සිද්ධවීම් ආකාර මාත්‍රය විමසා, අන් විශේෂයක අභාව හෙයින් 'කතමා'යි නොවිචාරා, ආකාර මාත්‍රයම විමසනුයේ 'කෙසේදැයි' විමසීම කරන ලදී. එසේම 'මෙසේ'යයි නිගමනය කරන ලදී. මෙහිද ප්‍රතිපත්ති සංඛ්‍යාත වූම සම්‍යක් ප්‍රයෝගයාගේ දැක්වීම් වශයෙන් පළමු පෙළ සමානවම පෙළෙහි සඳහන් විය. ඉක්බිති මෙය වනාහි ගැල් පෙළ ගැස්වීම් ආදිය කිරීම් වශයෙන් කිසිවක් සංවිධාන කිරීම, යම්කිසි වෛද්‍ය කර්මයක්, ත්‍රිවේදයන්ගේ උද්ග්‍රහණය, ත්‍රිපිටකයන්හි උද්ග්‍රහණය, යටත් පිරිසෙයින් සීසෑම්, වැපිරීම් ආදියද සැලකිල්ලට ගෙන, ඒ ඒ කාර්යයන් කොට, උපන් විශේෂතාව **තත්‍ථ තත්‍ථ සම්මා පයොග පච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධියි** සඳහන් විය.

ඍද්ධිකථා වර්ණනාව නිමි.

සද්ධිකථාවට අනතුරුව, උසස් සද්ධිය වූ අවබෝධය දක්වන්නහු විසින් දේශිත අවබෝධ කථාවෙහි පෙරනුවූ විරූ අර්ථ අනුවර්ණනාවයි. එහි **අභිසමයො** යනු සත්‍යයන්ගේ අබිමුවින් එක්වීමයි. ප්‍රතිවේධයයි යන අර්ථයි. අර්ථාවබෝධයැයි සමහරු කියති. **කෙන අභිසමෙති** යයි කුමක් යුසේයිද? 'මහණෙනි, මෙසේ ධර්මාභිසමය මහර්ධිය ආදීන්හි සූත්‍ර කොටස්හි යෙදේ. එම රසය අභිසමය යැයි යූ.සේයි. එම අවබෝධය පවත්නා කල්හි, අවබෝධ කළ පුද්ගලයා එම ධර්මයෙන් සත්‍යයන් අවබෝධ කරයි. අභිමුඛව හමුවෙයි. ප්‍රතිවේධ කරයි යයි යූසේයි. මේ චෝදකයාගේ විමැසීමයි. **චිතෙතන අභිසමෙති** යනු සිතින් තොරව අවබෝධයෙහි අභාව හෙයින් එසේ විසඳීමයි. **හඤචි** ආදිය චෝදනායි. හඤචි යනු ඉදින් යන අර්ථයි. **චිතෙතන** යයි කියන ලද හෙයින්, **තෙනහි අඤඤාණි අභිසමෙති** යයි කීය. **න අඤඤාණි අභිසමෙති** යනු සිත් මාත්‍රයෙන් අවබෝධ නොවන හෙයින් ප්‍රතික්ෂිප්තය. **ඤාණෙන අභිසමෙති** යනු ප්‍රතිඥාවයි. නැවත **හඤචි** යන ආදිය ඤාණයෙන් යැයි කියන ලද හෙයින් **අඤඤාණි** අචිත්තකයැයි චෝදනාවකි. **න අචිතතකො අභිසමෙති** යනු සිත් නැත්තහුට අවබෝධය නොවන හෙයින් ප්‍රතික්ෂිප්තය. **චිතෙතන** ච යනාදි ප්‍රතිඥාවයි. නැවත **හඤචි** ආදිය සර්ව ඥාන සාධාරණ වශයෙන් චෝදනායි. සෙසු චෝදනා, විසඳීම්ද එම ක්‍රමයමැයි.

**පරතොපන කමමසසකතා චිතෙතනච ඤාණෙ නච** යනු කර්මය ස්වකීය කොට ඇති සත්ත්වයෝයි මෙසේ කර්මය ස්වකීය කොට, පැවැති සිතින්ද ඤාණයෙන්ද, **සචචානු ලොමික චිතෙතනච ඤාණෙනච** යනු සත්‍යය ප්‍රතිවේධයට අනුකූල හෙයින් සත්‍යානුලොමික සංඛ්‍යාත විදර්ශනා සම්ප්‍රයුක්ත සිතින්ද, විදර්ශනා ඤාණයෙන්ද, **කථං** යනු යම්සේ අවබෝධය වේද, එසේ කියනු කැමැත්තෙන් විමසීමයි. **උපපාදාධිපතෙයයං** යනු යම්හෙයකින් චිතෙතාත්පාදය නොමැතිව චිත්ත චෛතසිකයන්ගේ උත්පාදය නැත්ද? සිත අරමුණු ගැනීම් ස්වභාවකොට ඇත. ඒ හා සමග උපදිනු ලබන චෛතසික කෙසේ අරමුණ නොගත් කල්හි උපදින්නාහුද අභිධර්මයෙහිද, චිතෙතාත්පාදයෙන්ම චෛතසික බෙදූහ. එහෙයින් මාර්ග ඤාණොත්පාදයෙහි අධිපති වූ සිතයයි අර්ථයි. **ඤාණසස** යනු මාර්ග ඤාණයට, **හෙතු පචචයොච** යනු ජනක හා උපස්තම්භක වශයෙන්, **තං සමපයුතතං** යනු ඒ ඤාණය හා සම්ප්‍රයුක්ත, **නිරොධ ගොචරං** යනු නිර්වාණාරම්මණ වූ, **දසසානාධිපතෙයයං** යනු සෙස්සන්ට දර්ශන කෘත්‍යයෙහිද, නිර්වාණ දර්ශනයෙහිද අධිපති වූ, **චිතතසස** යනු මාර්ග

සම්ප්‍රයුක්ත සිතට, **තං සමපයුතතං** යනු ඒ සිත හා සම්ප්‍රයුක්ත යම් හෙයකින් හටගත්තා වූද ක්‍රමයෙහි, හුදෙක් චිත්ත ඥාණයන්ගෙන්ම අවබෝධය නොවේ. තවද සියලුම මාර්ග සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයෝ සත්‍යාවබෝධ කෘත්‍ය සිදුකිරීම් වශයෙන් අභිසමය නම් වෙති. එහෙයින් එම ක්‍රමයද දක්වනු කැමැතියේ **කිං නු එකකකොයෙව අභිසමයොයි** විචාරා **නහීයි** එම වචනය ප්‍රතික්ෂෙප කොට **ලොකුතතර මගගකඛණෙයි** යනාදිය වදාළහ. **දසසනාභි සමයො** යනු දර්ශන ස්වභාව වූ අවබෝධය, සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

**සචචා** යනු සත්‍ය ඥාණයෝ, මාර්ග ඥාණයම නිර්වාණය නුවණින් බැලීම් අර්ථයෙන් විදර්ශනායි, **විමොකෙඛා** යනු මාර්ග විමෝක්ෂයයි. **විජජා** යනු මාර්ග ඥාණයමය. **විමුතති** යනු කෙලෙස් නැසීම් වශයෙන් වන විමුක්තියයි. නිර්වාණය අවබෝධ කෙරේනුයි **අභිසමයොයි**. සෙස්ස ඒවායින් අවබෝධ කෙරෙත්නුයි **අභිසමයොයි**.

නැවත මාර්ගඵල වශයෙන් අවබෝධය බිඳ දක්වන්ට **කිංනු** ආදිය වදාළහ. මෙහි යම්හෙයකින් වනාහි මුළුමනින් නැසීම් අර්ථයෙන් ක්ෂයයෙහි ඥාණය නොලබාද? එහෙයින් සන්සිඳීම් අර්ථයෙන් අනුපපාදෙ **ඤාණං** යයි යු.සේයි. සෙස්ස සුදුසු පරිද්දෙන් දතයුතුය.

දැන් යම්හෙයකින් කෙලෙස් ප්‍රහාණය ඇතිකල්හි අවබෝධය වේද, අවබෝධයෙහිද ඇතිකල්හි කෙලෙස් ප්‍රහාණය වේද? එහෙයින් චෝදනා පූර්වංගම කෙලෙස් ප්‍රහාණය දක්වනු කැමැතියේ 'යවායං' යනාදිය වදාළහ. එහි **යවායං** යනු යම් මේ මාර්ගස්ථ ආර්ය පුද්ගල තෙමේ, මෙහි වනාහි එවමාදිකා යන සිව් වචනයන් චෝදකයාගේ විමැසීමැයි. නැවැත **අතීතෙ කිලෙසෙ පජහති** යන මෙය චෝදනාවට අවකාශ දීම සඳහා විසඳුමයි. **ඛීණං** යනු විනාශවීම් වශයෙන් ක්ෂය වීමයි. **නිරුදධං** යනු චිත්ත පරම්පරා වශයෙන් නැවැත නැවැත නොඉපදීම් වශයෙන් නිරුද්ධ වූයේ, **විගතං** යනු වත්මන් ක්ෂණයෙන් පහවූයේ, **විගමෙති** යනු ඉවත් කරවයි. **අඣං ගතං** යනු අභාවයට ගියේ, **අඣංගමෙති** යනු අභාවයට පමුණුවයි. එහි දොස් පෙන්වා, **න අතීතෙ කිලෙසෙ පජහති** යයි ප්‍රතික්ෂිප්තය. අනාගත චෝදනායෙහි **අජාතං** යනු ඉපැත්මට නොපත්, **අනිබබතතං** යනු ස්වභාවයට නොපත්. **අනුපපනනං** යනු උපතෙහි පටන් මතුයෙහි නොපිළිපන්, **අපාතුභූතං** යනු වර්තමාන භාවයෙන් චිත්තයාගේ පහළ නොවීම, අතීත අනාගත කෙලෙසුන් දුරුකරන කල්හි දුරුකළයුතු දෑ

නොමැති හෙයින් උත්සාහය නිෂ්ඵල බවට පැමිණේයයි එම ද්වයයම ප්‍රතික්ෂිප්තය. **රත්තො රාගං පජහති** යයි වත්මනෙන් රාගයෙන් රත්වූයේ එම රාගයම දුරුකරයි. වත්මන් කෙලෙසුන්හිද එම ක්‍රමයමය.

ථාමගතො යනු ස්ථිර ස්වභාවයට ගියේ, **කණ්හ සුක්කා** යනු අකුසල් කුසල්දම්, **යුගනද්ධා සමමෙව වත්තන්ති** යනු එකට වෙළී සමව පවතිත්නුයි එම ස්වභාවයට පැමිණේයයි අර්ථයි. **සංකිලෙසිකා** යනු මෙසේ කිලිටි ස්වභාවයන්ගේ සම්ප්‍රයුක්ත භාවය ඇතිකල්හි, කිලිටි බවින් යුක්ත වූවාහු, **මග්ග භාවනා හොති** යනු මාර්ග භාවනාවට පැමිණේ යයි අර්ථයි. මෙසේ වත්මන් කෙලෙසුන් දුරුකරන උත්සාහය සමග, දුරු කළයුතු කෙලෙසුන්ගේ විද්‍යමානතායෙන් මාර්ග භාවනාවද කිලිටි වූයේ වෙයි. උත්සාහයද නිෂ්පල වූයේ වේ. වත්මන් කෙලෙසුන්ගේ චිත්ත විප්‍රයුක්ත තාවයක් නම් නොමැත. **නහි** යනු සිව් ආකාරයෙන් කියන ලද වචනයෙහි ප්‍රතික්ෂෙපයයි.

අත්ථි යනු සේයයි පිළිගැනීමයි. **යථා කථං විය** යනු, ඇත යන ස්වභාවයෙහි උදාහරණ දැක්වීම සඳහා විමසීමයි. යම්සේ ඇත්ද, එය කවරාකාරයකින් මෙන් ඇත්ද? කුමක් මෙන් ඇත්දැයි අර්ථයි. **සෙය්‍යථාපි** යනු යම්සේනම්, **තරුණ රුක්ඛො** යනු ඵල දරන (දෙන) බව දැක්වීම සඳහා තරුණ ග්‍රහණය කරන ලදී. **අජාතඵලො** යනු ඵලදායකත්වය ඇති කල්හිද, ඵලගැන්මට පෙර කාල ග්‍රහණයයි. **තමෙනං** යනු එම වෘක්ෂය, **එන** යනු නිපාත මාත්‍රයයි එය එයමයයි අර්ථයි. **මූලං ඡින්දෙය්‍ය** යනු මුලින් සිඳින්නේය. **අජාත ඵලා** යනු හටනොගත් ඵල **එවමෙවං** යනු එසේ එසේ, හටගැන්ම, පැවැත්ම, ලකුණ, රැස්කිරීම යන සතරින්ම වත්මන් ස්කන්ධ සන්තානයම යූ.සේයි. යම් ස්කන්ධ සන්තානයෙක්හි යම් යම් මාර්ග ඥාණයක් උපදීද? ඒ ඒ මාර්ග ඥාණයෙන් ප්‍රහාණය කළයුතු කෙලෙසුන්ට එම ස්කන්ධ සන්තානය අබීජ වේ. එයට අබීජ වූ හෙයින් ඒ හේතුයෙන් ඒ ඒ කෙලෙස් නූපන්නාහුම නූපදිති. **ආදීනවං දිස්වා** යනු අනිත්‍යාදී වශයෙන් ආදීනව දැක, **අනුප්පාදො** යනාදී සතරෙන් නිර්වාණයම යූ.සේයි. **චිත්තං පක්ඛන්දති** යනු මාර්ග සම්ප්‍රයුක්ත සිත ඇතුළට පැන වදියි. **හෙතු නිරොධා දුක්ඛ නිරොධො** යනු කෙලෙසුන්ට බීජයන් වූ චිත්ත පරම්පරාවෙහි අනුත්පාද නිරෝධයෙන් ආගත ස්කන්ධයන් වූ, දුකට හේතුභූත වූ කෙලෙසුන්ගේ අනුත්පාද නිරෝධය වේ. මෙසේ දුකට හේතුභූත වූ කෙලෙසුන්ගේ අනුත්පාද නිරෝධයෙන් දුක්ඛයාගේ

අනුත්පාද නිරෝධය වේ. මෙසේ කෙලෙස් ප්‍රහාණ සාධාරණය යෙදෙන හෙයින්ම **අෂ්ට මගග භාවනා** යනාදිය වදාළහ. අට්ඨකථායෙහි වනාහි 'එයින් කුමක් දක්වන ලද්දේ වේද?' භූමිලබධ කෙලෙසුන්ගේ ප්‍රහාණය දක්වන ලද්දේ වේ. කිමෙක්ද භූමි ලබධයෝ නම් අතීත අනාගතද නොහොත් වර්තමානද? භූමි ලබේධාත්පන්න නමැයි කියා, කියන ලද කෙලෙස් ප්‍රහාණයෙහි විස්තර කථාව, මාර්ග සත්‍යය නිර්දේශ වර්ණනායෙහි ශ්‍රැතමය ඤාණ කථාවෙහි කියන ලද ක්‍රමයෙන්ම දතයුත්තාහ. මෙහි වනාහි මාර්ග ඤාණයෙන් ප්‍රහාණය කළයුතු කෙලෙසුන්ම අදහස් කරන ලදී.

## අභිසමය කථා වර්ණනාව නිමි.

දැන් ප්‍රහාණ අවසානයෙහි, අභිසමය කථාවට අනතුරුව ප්‍රහාණාකාරය දක්වන්නහු විසින් දේශිත, සූත්‍රාන්ත පූර්වාංගම විවේක කථායෙහි පෙරනුවූ අර්ථ අනුවර්ණනාවයි. එහි සූත්‍රාන්තයෙහි **යෙ කෙචි** යනු සේස රහිතව හාත්පසින් ග්‍රහණයයි. **බලකරණීයා** යනු ඍජු බාහු බලයෙන් කළයුතු හෙයින්, කම්මනතා යනු දිවීම්, පැනීම්, සීසෑම්-වැපිරීම් ආදී ක්‍රියා, ශක්තිවන්තයින් විසින් කරනු ලැබෙත්. **සීලං නිසසාය** යනු සිව් පිරිසිදු සීලය නිශ්‍රයකොට, **භාවෙති** යනු බිඳුණු සිල්වත්හුට භාවනා අභාව හෙයින් මෙහි වනාහි ලෞකික ලෝකෝත්තර මාර්ග භාවනා අදහස් කරන ලදී. විවෙක නිසසිතං යනු තදංග, සමුච්ඡේද, නිසසරණ විවේක නිශ්‍රිත, **විවෙකො** යනු විවේකතාව, මෙම ආර්ය මාර්ග භාවනායෙහි අනුයුක්ත යෝගියා විදර්ශනා ක්‍ෂණයෙහි, කෘත්‍යය වශයෙන් තදංග විවේක නිශ්‍රිතව, අදහස් වශයෙන් නිසසරණ විවේක නිශ්‍රිතව, මාර්ග ක්‍ෂණයෙහි කෘත්‍යය වශයෙන් සමුච්ඡේද විවේක නිශ්‍රිත අරමුණු වශයෙන් නිසසරණ විවේක නිශ්‍රිතව වඩයි. විරාග නිශ්‍රිතාදීන්හිද එම ක්‍රමයමැයි. විවේකයම නොඇලීම් අර්ථයෙන් විරාගයයි. නිරෝධාර්ථයෙන් නිරෝධයයි. අත්හැරීම් අර්ථයෙන් වොසසගගයි. නොහොත් කෙලෙසුන්ගෙන් වෙන් වූ හෙයින් විවේකයි. කෙලෙසුන් කෙරෙන් නොඇලුණු හෙයින් විරාගයි. කෙලෙසුන්ගේද නිරුද්ධ කළ හෙයින් නිරෝධයි. කෙලෙසුන්ගේද පරිත්‍යාග කළ හෙයින් අත්හළ හෙයින් වොසසගගයි. වොසසගගය වනාහි දෙයාකාරය. පරිත්‍යාග වොසසගගය හා පැනවැදීම් වොසසගගය වශයෙනි. එහි පරිත්‍යාග වොස්සජ්ජනය යනු විදර්ශනා ක්‍ෂණයෙහි තදංග වශයෙන්ද

මාර්ග ක්‍ෂණයෙහි සමුච්ඡේද වශයෙන්ද කෙලෙස් ප්‍රහාණයයි. ප්‍රස්කන්දන වොස්සජනය යනු විදර්ශනා ක්‍ෂණයෙහි එහි නිම්නභාවයෙන් මාර්ග ක්‍ෂණයෙහි අරමුණු කිරීමෙන් නිර්වාය තුළට වැදීම එම ද්වයයම මෙම ලෞකික ලෝකෝත්තර මිශ්‍රිත අර්ථ වර්ණනා ක්‍රමයෙහි සුදුසුය. එසේම මෙය සම්‍යග් දෘෂ්ටි ආදීන්හි එක් එක් ධර්මයද, කියන ලද ආකාරයෙන් කෙලෙස්ද අත්හරියි.

**වොසසගග පරිණාමිං** යනු මෙම සියලු වචනයෙන්, වොසසගගාර්ථය නියමකොට දෙන ලදුයේ මුහුකුරා ගියේ මේරුයේ යයි යූ.සේයි. මෙම ආර්ය මාර්ග භාවනායෙහි අනුයුක්ත භික්‍ෂුව සම්‍යග් දෘෂ්ටි ආදීන්හි එක් එක් ධර්මය කෙලෙස් පරිත්‍යාග වොසසගගාර්ථයද, නිර්වාණයට පැනවැදීම් වොසසගගාර්ථයද මෝරවයි. යම්සේ මුහුකුරා ගියේද එසේ එය වඩයි.

**බීජගාම භූතගාමා** යන මෙහි මූලබීජ, ඛන්ධ බීජ, අගග බීජ, ඵල බීජ, බීජ බීජ යයි බීජය පස්වැදෑරුම්ය. බීජගාමනම් බීජ සමූහයයි අර්ථයි. එයම පිරිපුන් නිල් අංකුර පහළ වීමෙහි පටන් භූතගාම නමැ. සිදුවූ, හටගත්, හටගත් මූලය නිල් අංකුරයන්ගේ සමූහයයි අර්ථයි. නිල් අංකුර කාලයෙහි පටන් දේවතා පරිග්‍රහය වේයයි එම දේවතා සංඛ්‍යාත භූතයින්ගේ ග්‍රාමයනුයි භූතගාම යයි කියති. **වුද්ධිං** යනු අංකුර වශයෙන් වැඩීමයි. **විරූළහිං** යනු වෘක්‍ෂයන්හි කඳන් ආදී වශයෙනි. **වෙපුලලං** යනු කෘත්‍යයන් සම්පූර්ණත්වයට පත්වීම් වශයෙන් මහත් භාවයැයි අර්ථයි. 'විපුලතතං'යිද පාඨයි. තවද එම තෙපදයන් සීල, සමාධි, ප්‍රඥාවන්හිද යොදති.

සූත්‍රාන්ත නිර්දේශයෙහි, **සමමා දිට්ඨියා** යනු ෂෂ්ඨී වචනයි. ධ්‍යාන, විදර්ශනා, මාර්ග, ඵල, නිර්වාණයන්හි, ලෞකික විරති සම්ප්‍රයුක්ත සිතෙහිද, සුදුසු පරිද්දෙන් සම්ප්‍රයෝග වශයෙන්ද අරමුණු වශයෙන්ද, පවත්නා සම්‍යග් දෘෂ්ටියෙහි සමාන ලක්‍ෂණ වශයෙන් ඒකාකාර වූ සම්‍යග් දෘෂ්ටියෙහි, **විකඛමභන විවෙකො** යනු යටපත් කිරීම් වශයෙන් දුර කිරීම් වශයෙන් විවේකයයි කවරකගේද? නීවරණයන්ගේ. ඔහුට **පඨමජඣානං භාවයතො** යනාදිය යටපත් කිරීම් වශයෙන් ප්‍රථමධ්‍යානයම යූ.සේයි. එය කී කල්හි සෙසු ධ්‍යානයෝද කියන ලද්දාහුම වෙති. ධ්‍යානයන්හිද සම්‍යක් දෘෂ්ටිය විද්‍යමාන හෙයින් සම්‍යග් දෘෂ්ටියෙහි විවේකය නමැ. **තදංග විවෙකො** යනු ඒ ඒ විදර්ශනා ඥාණයෙන් වන විවේකයයි.

**දිට්ඨිගතානං** යනු දෘෂටි විවේකයාගේ දුෂ්කර හෙයින්ද, ප්‍රධාන හෙයින්ද දෘෂ්ටි විවේකයම යූ.සේයි. **නිබෙබධභාගියං සමාධිං** යනු විදර්ශනා

සම්ප්‍රයුක්ත සමාධියයි, **සමුච්ඡෙද විවෙකො** යනු කෙලෙසුන්ගේ විනාශකිරීම් වශයෙන් වන විවේකයයි. **ලොකුත්තරං ඛයාමි මග්ගං** යනු ක්‍ෂය සංඛ්‍යාත නිර්වාණයට පමුණුවන ලෝකෝත්තර මාර්ගයයි, **පටිප්පස්සද්ධි විවෙකො** යනු කෙලෙසුන්ගේ සංසිඳීමෙහිදී වන විවේකයයි. **නිස්සරණ විවෙකො** යනු සියලු සංඛතයන්ගෙන් නිදහස්වීම වූ සංස්කාර විවේකයයි. **ඡන්ද ජාතො හොති** යනු පූර්ව භාගයෙහි හටගත් ධර්මච්ඡන්දය වෙයි. **සද්ධාධිමුත්තො** යනු පූර්ව භාගයෙහිම ශ්‍රද්ධායෙහි ඇලුණේ වේ. **චිත්තඤ්චස්ස සවාධිට්ඨිතං** යනු පූර්වභාගයෙහි මෙම යෝගියාගේ සිතද මනාව අධිෂ්ඨාන කරන ලද්දුයේ මනාව පිහිටුවන ලද්දුයේ වේ. මෙසේ, ඡන්දය, ශ්‍රද්ධාව, සිත යන මෙම තෙදහම් පෙරකළ උපන් විවේකයන්ට උපනිශ්‍රය හෙයින් නිශ්‍රය නමැ. සමහරු වනාහි 'චිත්තඤ්චස්ස සමාධිට්ඨිතං' යැයි සමාධිය කියන ලදැයි කියති. විරාගාදීන්හිද එම ක්‍රමයමැයි. නිරොධ වාරයෙහි වනාහි නිරොධ ශබ්දයෙන් අන්‍ය සමාන වචනයක් දක්වන්නහු විසින් 'අමතං ධාතු'යි යූසේයි. සෙසු තන්හි 'නිරොධො නිබ්බාණං'යි දක්වයි. දෙඅයුරින්ම නිර්වාණයම දැක්වේ. ඡන්ද, ශ්‍රද්ධා, චිත්තයන්ම විවේකාදී සතරෙහි එකිනෙකෙහි ත්‍රයය, ත්‍රයය බැගින් කොට දොළොස් නිශ්‍රය වෙයි. සම්මා සංකප්ප, වායාම, සති, සමාධීන්හිද මෙම ක්‍රමයෙන් අර්ථ යෙදීම දතයුත්තාහ. සම්මා වාචා, කම්මන්ත, ආජීවයන්ගේ වනාහි ධ්‍යානක්‍ෂණයෙහිද, විදර්ශනා ක්‍ෂණයෙහිද අභාව හෙයින්, ධ්‍යාන විදර්ශනාවන්ට පූර්වභාග අපරභාග වශයෙන් පවත්නා විරතීහු, ධ්‍යාන විදර්ශනා සනනිශ්‍රිත කොට කියන ලදැයි දතයුතුය. නීවරණයන්ගේද දෘෂ්ටිගතයන්ගේද, විවේක, විරාග, නිරොධ, පටිනිස්සග්ගයෝ, එසේ පවත්නා විරතීන්ගේ විවේකාදීහු නමැයි දතයුතුය. අට්ඨක නිපාතයෙහි 'ඉක්බිති භික්‍ෂුව නුඹ මෙම සමාධිය සවිතර්ක සවිචාර වඩන්නෙහිය. අවිතර්ක විචාර මාත්‍රව වඩන්නෙහිය. අවිතර්ක, අවිචාරවද වඩන්නෙහිය. ප්‍රීති සහිතවද වඩන්නෙහිය. ප්‍රීති රහිතවද වඩන්නෙහිය. සති සහගතවද වඩන්නෙහිය. උපේක්‍ෂා සහගතවද වඩන්නෙහි යයි' මෛත්‍රී ආදීහුද, කායානුපස්සනාදීහුද, ස්වකීය අධ්‍යාත්ම මූලික සමාධි වශයෙන් චතුෂ්ක, පඤ්චකධ්‍යානිකාදීන් මෙන් යූසේයි. මෙසේ මෙහිද පූර්වභාග, අපරභාග වශයෙන් විරතීහු යූ.සේයි. අක්‍ෂර ඡායා මාත්‍රය ගෙන භාග්‍යවතුන් වහන්සේට අසත්‍ය දෙයින් දොස් නොනැගිය යුතුයි. බුදුවදන් ගැඹුරුයි. ගුරුන් ඇසිරිකොට අදහස් වශයෙන් ගතයුතුය. බොධ්‍යංග-බල, ඉන්ද්‍රිය වාරයන්හිද මෙම කමයෙන් අර්ථය දතයුතුය.

**විවෙක කථා වර්ණනා නිමි.**

විවේක කථාවට අනතුරුව, උතුම් විවේකය වූ, නිස්සරණ විවේක සංඛ්‍යාත නිර්වාණයෙ සාක්‍ෂාත් කිරීමෙහි උපායමාර්ග දැක්වීම සඳහා, එසේ සාක්‍ෂාත් කළ, නිරෝධයෙහි, ලෝහිත සුව සඳහා ක්‍රියාකිරීම දැක්වීම සඳහාද ඉන්‍ද්‍රිය කථායෙහි නිර්දිෂ්ට චර්යාකථා නැවැත කියන ලදී. එහි අර්ථ වර්ණනා ඉන්‍ද්‍රිය කථායෙහි කියන ලද්දේමය.

## චර්යා කථා වර්ණනාව නිමි.

ලෝකාර්ථ චර්යා කෙළවරකොට ඇති, චර්යා කථාවට අනතුරුව, ලෝකාර්ථ අනුශාසනා කෙළවරකොට ඇති, ප්‍රාතිහාර්ය විස්තර දක්වන්නහු විසින් දේශිත සූත්‍රාන්ත පූර්වංගම ප්‍රාතිහාර්ය කථායෙහි පෙර නුවූ අර්ථ අනුවර්ණනාවයි. එහි සූත්‍රාන්තයෙහි **පාටිහාරියානි** යනු එකිනෙකට විරුද්ධ ඉන්‍ද්‍රියයන්ගෙන් වෙන් වෙන්ව බැහැර කිරීම් වශයෙන් **ඉද්ධිපාටිහාරියං** යනු සිද්ධවීම් වශයෙන් ඍද්ධියි. විරුද්ධ දෑ එළැවීම් වශයෙන් ප්‍රාතිහාර්ය යයි. ඍද්ධියම ප්‍රාතිහාර්ය වූයේ ඍද්ධි ප්‍රාතිහාර්ය යයි. අනෙක්වාහි වනාහි පෙන්වීම් වශයෙන් **ආදෙසනංයි.** අනුසාසන වශයෙන් **අනුසාසනීයි.** සෙස්ස කියන ලද ක්‍රමයමැයි. **ඉධ** යනු මෙලොව. **එකච්චො** යනු එක් පුරුෂයෙක්, ඍද්ධි ප්‍රාතිහාර්ය නිර්දේශය යට කියන ලද අර්ථමය. **නිමිත්තෙන ආදිසති** යනු පැමිණි නිමිත්තෙන් හෝ ගිය නිමිත්තෙන් හෝ සිටි නිමිත්තෙන් හෝ කියයි. **එවම්පි තෙ මනො** යනු මෙසේද නුඹගේ මනස සොම්නසින් යුක්තවූයේ හෝ දොම්නසින් යුක්ත වූයේ හෝ කාම විතර්කාදියෙන් යුක්ත වූයේ හෝ වේ. අපි ශබ්දය සම්පිණ්ඩණාර්ථයෙහිය. **ඉත්ථම්පි තෙ මනො** යනු සොම්නස් ආදී වශයෙන් එක් එක් ආකාර වූද සිතෙහි නානාප්‍රකාර භාවය දැක්වීමයි.

**ඉතිපි තෙ චිත්තං** යනු නුඹගේ සිත මේ මේ ආකාරද වේ. මේ මේ අර්ථ සිතමින් පවතී යයි අර්ථයි. **බහුං චෙපි ආදිසති** යනු සිතින් අන්‍ය වූ හෝ මේ මේ දෑ වූයේය වේ. වන්නේ යයි බොහෝ දෑද කියයි. **තථෙව තං හොති නො අඤ්ඤථා** යනු ඒ සියල්ලම යම් යම් ආකාරයකින් කියන ලද්දේද, ඒ අයුරින්ම වේ. අන් අයුරෙකින් නොවේ. **න හෙව බො නිමිත්තෙන ආදිසති** යනු නිමිත්ත දනුයේද හුදෙක් නිමිත්තෙන්ම නොකියයි. අපිච යනු වෙනත් ක්‍රමයක දැක්වීමයි. **මනුස්සානං** යනු සිත දැනගන්නා වූ මනුෂ්‍යයින්ගේ, **අමනුස්සානං** යනු ශ්‍රවණය කරවන ලද්දා

වූ හෝ ශ්‍රවණය නොකරවන ලද්දා වූ හෝ යක්ෂ පිශාචාදීන්ගේ, **දෙවතානං** යනු චාතුර්මහා රාජිකාදීන්ගේ, **සද්දං සුත්වා** යනු අන්‍යයාගේ සිත දැන කියනවුන්ගේ ශබ්දය ශ්‍රවණය කොට, **පන** නැවත ආරම්භයෙහි, නිපාතයකි. **විතක්කයතො** යනු යම් ඒ දෙයක් විතර්ක කරන්නහුගේ, **විචාරයතො** යනු විතර්ක සම්ප්‍රයුක්ත වූම විචාරයෙන් විමසා බලන්නහුගේ, **විතක්ක විප්ඵාර සද්දං සුත්වා** යනු විතර්ක වෙග වශයෙන් උපන් විකාර දොඩවන්නවුන්ගේ නින්දට වට, මත්වූවන්ගේ නාදය අසා, යමක් කල්පනා කරන කල්හි එම ශබ්දය උපන්නේ වේද, එම ශබ්දයාගේ වශයෙන් 'ඔබගේ මනස මෙසේ'යයි ආදිය පෙන්වයි. **අවිතක්කං අවිචාරං සමාධිං** යනු විතර්ක විචර කැළැඹීම් විරහිත ශාන්ත චිත්තයාගේද දැනීමෙහි සමර්ථතාව දක්වන්නහු විසින් යූසේයි. සෙසු සිත් දැනගැනීම්හි වනාහි කිවයුත්තක්ම නැත. **චෙතසා චෙතො පරිච්ච පජානාති** යනු චෙතො පරියඤාණලාභියා, **භොතො** යනු භවත්හුගේ, **මනො සංඛාරා පණිහිතා** යනු චිත්ත සංස්කාර තබන ලද්දාහු, **අමුකං නාම විතක්කං විතක්කයිස්සති** යනු කුශලාදි සිතිවිල්ලක් සිතන්නේය. පවත්වන්නේ යයි දනියි. දන්නේද පැමිණීමෙන් දනියි. පූර්වභාගයෙන් දනියි. සමවත තුළ සිත බලා දනියි. පැමිණීමෙන් දනියිනම්, කසිණ පරිකර්ම කාලයෙහිම යම් ආකාරයකින් කසිණ භාවනාව අරඹන ලදද? ප්‍රථමධ්‍යානය හෝ ද්විතිය ධ්‍යානය හෝ අට සමවත් හෝ උපදවන්නේ යයි දනියි. පූර්වභාගයෙන් දනියි නම්, ප්‍රථම විදර්ශනාවගේ ආරම්භයෙහිදීම දනියි. යම් ආකාරයකින් එම විදර්ශනාව අරඹන ලදුයේ, සෝවාන් මාර්ගය හෝ උපදවන්නේය. -පෙ- අර්හත් මාර්ගය හෝ උපදවන්නේ යයි දනියි. සමවත තුළ සිත බලා දනියි නම්, යම් ආකාරයකින් මොහුගේ මනෝ සංස්කාර තබන ලද්දාහුද, මෙනම් චිත්තයට අනතුරුව මෙනම් විතර්කය විතර්කනය කරන්නේය. මෙයින් නැගිටි ඔහුට පිරිහීමට නැඹුරු වූ හෝ සමාධිය වන්නේය. අඩුවැඩි නොවී පවත්නා ස්වභාවයට පත් සමාධිය වන්නේය. විශේෂාධිගමයන් ලබාදෙන සමාධිය හෝ වන්නේය. තියුණු අවබෝධයට අයත් හෝ සමාධිය වන්නේය. අභිඥාවන් හෝ උපදවන්නේ යයි දනියි. **බහුඤ්චෙපි ආදිසති** යනු චෙතොපරිය ඤාණයට චිත්ත චෛතසිකයන්ම අරමුණු කරන හෙයින්, සරාගාදි සොළොස් ප්‍රභේදයෙන්ම බොහෝකොටද කියයි. අනෙකක් වශයෙන් නොවේයයි දතයුතුය. **තථෙවෙතං හොති** යනු මෙය ඒකාන්තයෙන්ම එසේම වේ. චෙතොපරිය ඤාණ වශයෙන් දන්නා ලද්දේ වේ. අන්‍යාකාරයෙන් සිදුවීමක් නම් නැත. **එවං විතක්කෙථ** යනු මෙසේ නෛෂ්ක්‍රම්‍ය විතර්කාදීහු පවත්වමින් සිතාබලවු. **මා එවං**

**විතකකයිතථ** යනු මෙසේ කාම විතර්කාදීන් පවත්වමින් සිතාබැලීම් නොකරවු. **එවං මනසිකරොථ** යනු මෙසේ අනිත්‍ය සංඥාවන්ද, දුක්ඛ සංඥාදීන් අතරත වූ එක්තරා එකක් මෙනෙහි කරවු. **මා එවං මනසි කරිතථ** යනු මෙසේ නිත්‍යයයි ආදී ක්‍රමයෙන් මෙනෙහි නොකරවු. **ඉදං පජහථ** යනු පඤ්චකාම ගුණයන්හි ඇලීම් ආදිය දුරුකරවු. **ඉදං උපසමපජ්ජ විහරථ** යනු මෙම සිව්මග ඵල ප්‍රභේද වූ ලෝකෝත්තර ධර්මයටම පැමිණ එම ගුණ නිපදවා වාසය කරවු.

ඍද්ධි ප්‍රාතිහාර්යයෙහි වෙනත් ආකාරයක් විශේෂයෙන් දක්වනුයේ, නෙකඛමමං ඉජඣතීති ඉද්ධි යනාදිය වදාළහ. එහි **කාමචඡන්දං පටිහරති** යනු තමාට ප්‍රතිපක්ෂ වූ, කාමච්ඡන්දය ප්‍රතිබලව ඉවත්කරයි. දුරුකෙරේනුයි එයම නෛෂ්ක්‍රම්‍ය ප්‍රාතිහාර්ය නමැයි අර්ථයි. **යෙ තෙ නෙකඛමෙමන සමනනාගතා** යනු මෙසේ කාමච්ඡන්දය ප්‍රතිබලව දුරුකරන ඒ ඒ නෛෂ්ක්‍රම්‍යයෙන් යම් පුද්ගලයෝ ප්‍රතිලාභ වශයේ යුක්ත වූවාහු, **විසුදධ චිතතා** යනු කාමච්ඡන්ද අභාවයෙන් පිරිසිදු සිතැති, **අනාවිල සංකපපා** කාම සංකල්පයෙන් නොකළඹන ලද නෛෂ්ක්‍රම්‍ය සංකල්ප, **ඉති ආදෙසනා පාටිහාරියං** යනු පරසිත් දැනීමෙහි දක්ෂතායෙන් හෝ අන් අයුරෙකින් හෝ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් හෝ බුද්ධ ශ්‍රාවකයින් විසින් හෝ මෙසේ අනුන්ගේ සිත් දැන ප්‍රකාශ කිරීම ආදෙසන ප්‍රාතිහාර්ය යයි අර්ථයි. නොහොත් මෙසේ කීම ආදෙසන ප්‍රාතිහාර්ය යයි ආදෙසන ශබ්දය පාඨශේෂකොට යෙදිය යුතුය. **එවං ආසෙවිතබබං** යනු මේ මේ ආකාරයෙන් මුලසිට සේවනය කළයුතුය. සෙසු ත්‍රයයෙහිද එම ක්‍රමයමැයි. **තදනුධමමතා සති උපටඨාපෙතබබා** යනු එම නෛෂ්ක්‍රම්‍යයට අනුකූල වූ සිහිය බොහෝ සේ තැබිය යුතුය. **ඉති අනුසාසනී පාටිහාරියං** යනු මෙහි ආදේසනා ප්‍රාතිහාර්ය යෝජනාවෙහි මෙන් යෙදීම කළයුතුය. අව්‍යාපාදාදීන්හිද එම ක්‍රමයමැයි. පාඨය වනාහි ධ්‍යානාදීන් හකුළුවා අර්හත් මාර්ගයම පෙන්වා ලියා ඇත. එහි සිව් මාර්ගයන්හිද මෙසේ සේවනය කළයුතුයැයි ආදිය එක් චිත්තක්ෂණික හෙයින් මාර්ගයෙහි පූර්වභාග වශයෙන් කියන ලදැයි දතයුතුය.

සර්වාස්තිවාදී ආචාර්යවරු වනාහි, එක් එක් මාර්ගය සොළොස් ක්ෂණිකයැයි කියති. ඒ අනුව පවත්නා සිහියෙහි එළඹීම වනාහි පූර්ව භාගයෙහි යෙදේමය. නැවත **නෙකඛමමං ඉජඣතීති ඉද්ධි** යනාදීන් 'ඉද්ධිපාටිහාරියං' යන පදයට කර්මාධාර සමාසභාවය දැක්වීම සඳහා යුසේයි. සූත්‍රාන්තයෙහි කියන ලද, ත්‍රිවිධ ඍද්ධි ප්‍රාතිහාර්යයාගේම

සමාසාර්ථය කී කල්හි, සෙසු ද්වයයටම කියන ලද්දේම වේයයි මෙම ක්‍රමයෙහි, මූලය වූ, ඍද්ධි ප්‍රාතිහාර්යයෙහිම සමාසාර්ථය කියන ලදැයි දතයුතුය.

## ප්‍රාතිහාර්ය කථා වර්ණනා නිමි.

ප්‍රාතිහාර්ය කථානන්තරවැ, ප්‍රාතිහාර්යයට මුල් වූ ඍද්ධි ප්‍රාතිහාර්ය සංගෘහිත සමසීසී භාවයෙහි, ඍද්ධි ප්‍රාතිහාර්ය බව දැක්වීම සඳහා, ඤාණ කථායෙහි නිර්දිෂ්ට වූදි සමසීසීකථා ඍද්ධි ප්‍රාතිහාර්ය සම්බන්ධයෙන් නැවත දේශිතය. එහි අර්ථ වර්ණනා එහි කියන ලද්දේමය.

## සමසීසී කථා වර්ණනා නිමි.

සමසීසී කථානන්තරවැ, තමා විසින් කියන ලද, ඍද්ධි ප්‍රාතිහාර්ය සාධක සත් අනුපස්සනා විශේෂයන් දක්වන්නහු විසින් දේශිත සූත්‍රාන්ත පූර්වංගම සීවටන් කථායෙහි පෙරනුවූ අර්ථ අනුවර්ණනාවයි. එහි සූත්‍රාන්තයෙහි **චත්තාරො** යනු ගණන් පිරිසිඳීමයි. ඉන් අඩුවැඩි නොවන සීවටන් පිරිසිඳීම පෙන්වයි. **ඉමෙ** යනු නිර්දේශ කළයුත්ත දැක්වීමයි. **භික්ඛවෙ** යනු ධර්ම ප්‍රතිග්‍රාහක පුද්ගලයින් ඇමතීමයි. **සතිපට්ඨානා** යනු සීවටන් ත්‍රයයකි. සිහිය ගෝචර වූයේද වේ. ත්‍රිවිධාකාරයෙන් පිළිපන් ශ්‍රාවකයින් කෙරෙහි ශාස්තෘහුගේ ප්‍රතිසානුනය ඉක්මවූ හෙයින්ද, සිහියද වේ. 'මහණෙනි, සිව් සීවටන්හුගේ හටගැන්මද, අස්තංගමයද දෙසන්නෙමි' ආදීන්හි සිහිය ගොදුරුකොට ඇතියේ සතිපට්ඨානයැයි යූ.සේයි. එහි අර්ථය, එහි පිහිටානුයි පට්ඨානයි. කවරක් පිහිටාද? සිහියයි. සිහියෙහි පිහිටීම සතිපට්ඨානයයි. ශාස්තෘන් වහන්සේගේ අනුශාසනා ලබන්ට යම් සමූහයක් සුදුසුකම් ලබාද? එබඳු සුදුසුකම් ලබන්ට හැකියාව ඇතියෝ සතර සතිපට්ඨාන වඩන ආර්ය පුද්ගලයෝය. මෙහි තෙඅයුරින් පිළිපන් ශ්‍රාවකයින් කෙරෙහි ශාස්තෘන් වහන්සේගේ ප්‍රතිසානුනය ඉක්මවූ හෙයින් සතිපට්ඨානයැයි යූසේයි. එහි අර්ථය පිහිටවිය යුතු හෙයින් පට්ඨානංයි. පැවැත්විය යුතුයැයි අර්ථයි. කවරකින් පිහිටවිය යුතුද, සිහියෙන්. සිහියෙහි පිහිටුවීම සතිපට්ඨානයයි. සිව් සීවටන් වඩනා ලදුයේ බහුල වශයෙන් කරන ලදුයේ, සප්ත බොධ්‍යංග සම්පූර්ණ කෙරේ යනාදීන්හි වනාහි

සිහියම සතිපට්ඨානයැයි යූ.සේයි. එහි අර්ථය පිහිටානුයි පට්ඨානංයි. එළඹ සිටී. බැස පැන වැදී පවතී යයි අර්ථයි. සිහියම පිහිටීම සතිපට්ඨානංයි. නොහොත් සිහිකිරීම් අර්ථයෙන් සතියි. එළඹ සිටීම් අර්ථයෙන් උපට්ඨානංයි. මෙසේ සිහිය එය එළඹ සිටීමනුයි සතිපට්ඨානංයි. මෙහි මෙය අදහස් කරන ලදී. මෙසේ සතිපට්ඨානයෝයි කුමක් හෙයින් බහුවචන කරන ලදුයේද? සිහියෙහි බොහෝ භාවය හෙයිනි. අරමුණු භේදයෙන්ද ඒ සතීහු බොහෝ වෙති.

කතමෙ චත්තාරො යනු කියනු කැමැත්තෙන් විමසීමයි. ඉධ යනු මෙසස්නෙහි, භික්ඛු යනු සසර බිය බලානුයි භික්ෂුයි. මෙහි සෙසු පදයන්හි අර්ථ වර්ණනාව ශ්‍රැතමය ඤාණ කථායෙහි, මාර්ග සත්‍ය නිර්දේශ වර්ණනායෙහි යූ.සේයි. කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් අඩුවැඩි නොවූ සතිපට්ඨාන සතරක්ම දේශනා කළසේක්ද යත්, හික්මවිය යුතු අයගේ හිතසුව සඳහායි. තෘෂ්ණා චරිත, දෘෂ්ටි චරිත, සමථයානික, විදර්ශනා යානිකයන් කෙරෙහි, මන්‍ද, තීක්ෂණ වශයෙන් දෙඅයුරෙකින් පැවැති කල්හි, මන්‍ද තෘෂ්ණා චරිතයාට දළ කායානුපස්සනා සතිපට්ඨාන විශුද්ධි මාර්ගයයි. තීක්ෂණ චරිතයාට සියුම් වේදනානුපස්සනා සතිපට්ඨානයයි. මන්‍දප්‍රාඥ දෘෂ්ටි චරිතයාටද, ඉතා ප්‍රභේදගත නුවූ, චිත්තානුපසසනා සතිපට්ඨානය විශුද්ධි මාර්ගයයි. තීක්ෂණ චරිතයාට ඉතා ප්‍රභේදගත ධර්මානුපස්සනා සතිපට්ඨානයයි. සමථයානික මන්‍දප්‍රාඥයාට, අපහසුවකින් තොරව අවබෝධ කළ යුතු නිමිත්ත සහිත ප්‍රථම සතිපට්ඨානය විශුද්ධි මාර්ගයයි. තීක්ෂණ ප්‍රාඥයාට දළ අරමුණෙහි නොපිහිටන හෙයින් දෙවැන්නද, මන්ද ප්‍රාඥ විදර්ශනායානිකයා හටද, අතිප්‍රභේද ගත නුවූ අරමුණු සහිත තෙවැන්නද, තීක්ෂණ ප්‍රාඥයාට ඉතා ප්‍රභේද ගත අරමුණු සහිත සිව්වැන්නද, විශුද්ධි මාර්ගයයි මෙසේ අඩුවැඩි නුවූ සතරෙක්ම දේශිතය.

සුභ, සුව, නිත්‍ය, ආත්ම විපර්යාස ප්‍රහාණය සඳහා හෝ වේ. කය වනාහි අශුභයි. සත්ත්වයෝ එහි ශුභයයි විපර්යාස ග්‍රහණයෙන් විපර්යාසයට පත්වූවාහු වෙති. ඔවුන්ට එහි අශුභභාවය දැකීමෙන් එම විපර්යාසයෙහි ප්‍රහාණය සඳහා ප්‍රථම සතිපට්ඨානය යූ.සේයි. සැපය, නිත්‍යය, ආත්මයැයි ගත් වේදනාවන්හි වේදනාව දුක්ය. සිත අනිත්‍යයි ධර්ම අනාත්මය. සත්ත්වයෝ ඒවාහිද සුව, නිත්‍ය, ආත්ම විපර්යාස ග්‍රහණයෙන් විපර්යාසයට පත්වූවාහු වෙති. ඔවුන්ට එහි දුක් ආදි භාවය

දැකීමෙන් එම විපර්යාසයන්ගේ ප්‍රහාණය සඳහා සෙසු ත්‍රයය යූ.සේයි. මෙසේ ශුභ, සුව, නිත්‍ය, ආත්ම විපර්යාස ප්‍රහාණය සඳහා හෝ සතරෙක්ම යූ.සේයි. හුදෙක් විපර්යාස ප්‍රහාණය සඳහාම නොවේ. සිව් ඕඝ, යෝග, ආශ්‍රව, ග්‍රන්ථ, උපාදාන, අගති ප්‍රහාණය සඳහාද, සිව්ආකාර ආහාර පරිඥාව සඳහාද සතරෙක්ම යූසේයි.

සූත්‍රාන්ත නිර්දේශයෙහි, **පඨවි කායං** යනු මෙම රූප කයෙහි පෘථුවි ධාතුවයි. මුළු සිරුරෙහි පෘථුවි ධාතුන්ගේ බොහෝ බැවින් සියලු පෘථුවි ධාතුව සංග්‍රහය සඳහා සමූහාර්ථයෙන් කාය ග්‍රහණය කරන ලදී. **ආපො** කායාදීන්හිද එම ක්‍රමයමැයි. **කෙසකායාදීනමපි** කේශ කායාදීන්ගේ බොහෝ බැවින් කේශකායාදී ග්‍රහණය කරන ලදී. **වක්කාදීනි** වකුගඩු ආදිය පිරිසිඳින ලද හෙයින් කාය ග්‍රහණයට නුසුදුසු වෙත්නුයි ඒවාහි ග්‍රහණය නොකරන ලදැයි දතයුතුය.

**සුඛං වෙදනං** යනාදීන්හි **සුඛං වෙදනං** යනු කායික හෝ චෛතසික සුව වේදනාව, එසේම **දුක්ඛං වෙදනං, අදුක්ඛමසුඛං වෙදනං** යනු චෛතසික වූම උපෙක්ෂා වේදනාවයි. **සාමිසං සුඛ වෙදනං** යනු ෂට් ලෞකික දේ සම්බන්ධ සොම්නස් වේදනාව, **නිරාමිසං සුඛං වෙදනං** යනු ෂට් නෛෂ්ක්‍රම්‍ය සම්බන්ධ සොම්නස් වේදනාව, **සාමිසං දුක්ඛං වෙදනං** යනු ෂට් ලෞකික දේ සම්බන්ධ දොම්නස් වේදනාව, **නිරාමිසං දුක්ඛං වෙදනං** යනු ෂට් නෛෂ්ක්‍රම්‍ය සම්බන්ධ දොම්නස් වේදනාව, **සාමිසං අදුක්ඛම සුඛං වෙදනං** යනු ෂට් ලෞකික දේ සම්බන්ධ උපේක්ෂා වේදනාව.

**නිරාමිසං අදුක්ඛමසුඛං වෙදනං** යනු ෂට් නෛෂ්ක්‍රම්‍ය සම්බන්ධ උපේක්ෂා වේදනාව, **සරාගං චිත්තං** යනාදිය ඥාණ කථායෙහි කියන ලද අර්ථමය. **අවසෙසෙ ධම්මෙ** යනු එම කාය වේදනා චිත්තයන්ගෙන් අවශේෂ ත්‍රෛභූමික ධර්මයන්හි, හැමතන්හිම **තෙන ඤාණෙන** යනු එම සත්වැදෑරුම් අනුපස්සනා ඥාණයෙන්, මෙහි වනාහි යම්ආකාර අතරින් පතර නොකියන ලද අර්ථ වෙත්ද, ඒවා යට ඒ ඒ තන්හි කියන ලද අර්ථමය.

**සතිපට්ඨාන කථා වර්ණනා නිමි.**

විදර්ශනා ප්‍රතිසංයුක්ත, සතිපට්ඨාන කථාවට, අනතුරුව විදර්ශනා ප්‍රභේද, දක්වන්නහු විසින් දේශිත සූත්‍රාන්ත පූර්වංගම විදර්ශනා කථායෙහි පෙර නුවූ අර්ථ වර්ණනාවයි. එහි සූත්‍රාන්තයෙහි **සො** යනු සර්වනාම හෙයින් යමෙක හෝ ඔහු හෝ සියල්ලෝම හෝ සංගෘහිත වෙත්. **වත** යනු ඒකාංශාර්ථයෙහි නිපාතයි. **කඤ්චි සංඛාරං** යනු ස්වල්ප මාත්‍රවූද සංස්කාරයක් **අනුලොමිකාය ඛනතියා** යනු මෙහි විදර්ශනා ඤාණයම ලෝකොත්තර මාර්ගයට අනුලොම් වේනුයි අනුලෝමිකංයි. එයම කැමැත්ත අපේක්ෂාකොට, අනුලෝමික සියලු සංස්කාර එයට අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් කැමැති වෙති. රුචිවෙතියි නුයි ඛනතියි. එය මෘදු, මධ්‍යම, තීක්ෂණ වශයෙන් තෙවදෑරුම්ය. කලාප සම්මර්ශනය මුල්කොට උදයව්‍යය ඤාණ කෙළවරකොට ඇතියේ මෘදුකානුලෝමික ක්ෂාන්තියි. භංගානුපස්සනාව මුල්කොට ඇති සංස්කාරෝපේක්ෂා ඤාණය කෙළවරකොට ඇතියේ මධ්‍යමානුලෝමික ක්ෂාන්තියි. අනුලෝම ඤාණය තීක්ෂණ අනුලෝමික ක්ෂාන්තියි. **සමන්නාගතො** යනු යුක්ත වූයේ, **නෙතං ඨානං විජ්ජති** යනු එම හේතුව, එම කරුණ විද්‍යමාන නොවේ. **සම්මත්තනියාමං** යනු මෙහි මා හට හිතසුව එළවන්නේ වන්නේ යයි මෙසේ ආශිර්වාද කරනුයේ එසේම හටගන්නා හෙයින්, අශුභාදීන්හි අශුභයැයි ආදී අවිපරීත පැවැත්ම යෙදෙන හෙයින්ද යහපත් ස්වභාවයනුයි සම්මත්තොයි. අනන්තර ඵලදානය සඳහා, අර්හත්වෝත්පත්තියට නියමිත පිළිවෙළ වූ හෙයින් නියාමයි. නිශ්චයයි අර්ථයි. නිවැරදි ස්වභාවයද, නියමිත පිළිවෙළද එයමනුයි සම්මත්ත නියාමයි. ඒ කවරක්ද, ලෝකෝත්තර මාර්ගයයි. විශේෂයෙන් වනාහි සෝවාන් මාර්ගයයි. එහෙයින් මාර්ග නියමයෙන් නියම හෙයින් නියතයි.

**කතිහාකාරෙහි** යන ආදී වූ විමසීම් පූර්වංගම සූත්‍රාන්ත නිර්දේශයෙහි **පඤ්චක්ඛන්ධෙ අනිච්චතො** ආදීන්හි නාමරූපද නාමරූපයෙහි ප්‍රත්‍යයන්ද, පරිග්‍රහණය කොට, කලාප සම්මර්ශන වශයෙන්, ආරබ්ධ විදර්ශක යෝගාවචරයා පඤ්ච ස්කන්ධයන්හි එක් එක් ස්කන්ධය, අනිත්‍යය අවසන්කොට ඇති ස්වභාවයෙන්ද, ආදි අන්තවත් භාවයෙන්ද, අනිත්‍යය වශයෙන් බලයි. උත්පාද ව්‍යය ප්‍රතිපීළනතායෙන්ද දුකට වස්තු හෙයින්ද **දුක්ඛතො** ප්‍රත්‍යයන්ගෙන් යැපිය යුතු හෙයින්ද, රෝග මූලතායෙන්ද **රොගතො** දුක්ඛතාව නමැති හුල වැදීමට යෝග්‍ය හෙයින්ද, කෙලෙස් නමැති අපවිත්‍ර දෑ වැගිරෙන හෙයින්ද, උත්පාද ජරා භංගයන්ගෙන්ද ඉදිමුණු, මේරුණු, බිඳුණු ස්වභාව හෙයින්ද, ගෙඩි පීඩා හටගන්නා හෙයින්ද,

ඇතුළත විදින හෙයින්ද, ඉවත් කරලීම දුෂ්කර හෙයින්ද සලලතො; ගර්හා කරන ස්වභාවයෙන්ද, අවැඩ එළවන ස්වභාවයෙන් දුකට වස්තු ස්වභාවයෙන්ද **අඝතොයි.** අඓශ්වර්‍යභාව ජනනය කරන හෙයින්ද, රෝගාබාධයන්ට ආසන්න කාරණය හෙයින්ද **ආබාධතොයි;** ස්වවශයෙහි නොපවත්නා හෙයින්ද, යටහත්ව නොපවත්නා හෙයින්ද **පරතොයි;** ව්‍යාධි ජරා මරණයන්ගෙන් බිඳවැටෙන හෙයින් **පලොකතොයි;** නොයෙක් ව්‍යසනයන් ගෙන එන හෙයින් **ඊතිතොයි;** නොදත් මහත් අනර්ථයන් එළවන හෙයින්ද සියලු උපද්‍රවයන්ට හේතුවන හෙයින්ද **උපද්‍දවතොයි;** සියලු බියට ආකර හෙයින්ද, දුක් සංසිඳවීම් සංඛ්‍යාත උතුම් ආශ්වාසයට ප්‍රතිපක්ෂ වූ හෙයින්ද **භයතොයි;** නොයෙක් අනර්ථයන්ගෙන් අනුබද්ධ හෙයින්ද, දෝසයන් එළඹ සිටින හෙයින්ද, විපතක් මෙන්, නොඉවසීමට සුදුසු හෙයින් **උපසග්ගතො;** ව්‍යාධි ජරා මරණයන්ගෙන්ද, ලාභාදී ලෝක ධර්මයන්ගෙන්ද, බොහෝසෙයින් සැලෙන හෙයින් **චලතො;** උපක්‍රමයෙන්ද, ස්වභාවයෙන්ද ලෙහෙසියෙන් බිඳීයන සුලු හෙයින් **පභංගුතොයි;** සියලු අර්ථයන්ගේ වැටීම වන හෙයින්ද, ස්ථිරභාවයාගේ අභාව හෙයින්ද **අද්ධුවතොයි;** ආරක්ෂාවක් නොමැති හෙයින්ද, ක්‍ෂෙමතාවයක් නොලැබිය හැකි හෙයින්ද, **අතාණතො** ඇලීමට නුසුදුසු හෙයින්ද, ඇලුණවුන්ටද, ආරක්‍ෂක කෘත්‍යයක් නොකැරේනුයි **අලෙණතො;** නිශ්‍රිතයින්ට බිය හා සාරකත්ව අභාව හෙයින්ද **අසරණතොයි;** කල්පිතය පරිදි, ස්ථිර ශුභ, සුව, ආත්ම ස්වභාවයන්ගෙන් හිස් හෙයින් **රිත්තතො;** හිස් හෙයින්ම **තුච්ඡතො;** ස්වල්ප හෙයින් හෝ, ස්වල්පයද ලෙව්හි හිස්යයි යූ.සේයි. ස්වාමි, නිවාසී, වේදක, කාරක පාලක විරහිත හෙයින් **සුඤ්ඤතො;** තෙමේද අස්වාමික භාවාදියෙන් යුක්ත හෙයින් **අනත්තතො;** ප්‍රවෘත්ති දුක්ඛතායෙන්ද, දුක්ඛයාගේ ආදීනවතායෙන්ද **ආදීනවතො;** නොහොත් දරිද්‍රතාවන්ට හමයි. යේ පවත්වයිනුයි **ආදීනවො;** දිළිඳු මිනිසාට එය විශේෂ නාමයකි. ස්කන්ධයෝද දිළින්දෝමයැයිද, දිළින්දන් හා සමාන හෙයින්ද ආදීනව වශයෙන්, ජරාවෙන්ද මරණයෙන්ද යන දෙඅයුරෙකින් වෙනස්වන හෙයින් **විපරිණාමධම්මතො;** දුර්වලතායෙන් පෙණපිඬක් මෙන්ද, සුව බිඳ දමන හෙයින්ද **අසාරකතො;** දුකට හේතු බැවින් **අඝමූලතො;** මිතුරු වෙසින් එන සතුරෙකු මෙන් විශ්වාසය නසන හෙයින් **වධකතො;** පහවූ භවතායෙන්ද විභවය හටගන්වන හෙයින්ද **විභවතො;** ආශ්‍රවයන්ට ආසන්න කාරණ බැවින් **සාසවතො;** හේතුප්‍රත්‍යයන්ගෙන් මනාව සංස්කරණය කරන ලද හෙයින් **සංඛතතො;** මෘත්‍යුමාර, ක්ලේශමාරයින්ට ආහාරවන හෙයින් **මාරාමිසතො;** ජාති, ජරා, ව්‍යාධි, මරණ ස්වභාව හෙයින් **ජාති**

ජරා ව්‍යාධි මරණ ධම්මතො; සොක, පරිදෙව උපායාසයන්ට හේතුවන හෙයින් **සොක පරිදෙව උපායාස ධම්මතො;** තෘෂ්ණා, දෘෂ්ටි, දුශ්චරිත සංකිලේසයන්ට විෂය ස්වභාව හෙයින් **සංකිලෙසික ධම්මතො;** වශයෙන් බලයි. මේ හැමතන්හිම බලයි යන වචනය අන්තයට ගතයුතුය. **පංචක්ඛන්ධෙ** යයි සමූහ වශයෙන් කියන ලදුයේද, එක් එක් ස්කන්ධ වශයෙන් අර්ථ වර්ණනාව කලාප සම්මර්ශන ඥාණ නිර්දේශයෙහි වෙන් වෙන් දක්වන ලද හෙයින් අවසානයෙහිද වෙන් වෙන්ව ස්කන්ධයන්ගේ වශයෙන් අනුපස්සනාවන්ගේ ගණන් ගත් හෙයින් සමූහයෙහි පැවති වචනයන්ගේද කොටස්හිද පැවැත්ම ලැබීම් වශයෙන් කරන ලදැයි දතයුතුය. වෙන් වෙන්ව පැවැති සම්මිශ්‍රණයන් එකට හකුළුවා වචන වශයෙන් හෝ පංචස්කන්ධ යැයි යූසේයි. එක පහරින් පංචස්කන්ධයන් එකක් වශයෙන් සම්මර්ශනය ගැළපේමය. **පඤ්චන්නං ඛන්ධානං නිරොධො නිච්චං නිබ්බාණන්ති පස්සන්තො** යන ආදීනව ඥාණ නිර්දේශයෙහි කියන ලද ක්‍රමයෙන් විදර්ශනා කාලයෙහි සන්තිපද ඥාණ වශයෙන් නිර්වාණය නිත්‍යයැයි දක්නේ, **සම්මත්ත නියාමං ඔක්කමති** යනු මාර්ග ක්‍ෂණයට බසියි. ඵල ක්‍ෂණයෙහි වනාහි බැසගත්තේ නම් වේ. සියලු නියාමයන්ට බස්නා ක්‍රමයන්හි එම ක්‍රමයමැයි.

අරොග්‍යං යනු නිරෝග වූයේ, **විසල්ලං** යනු හුල් රහිත වූයේ, ඒ හා සමානයන්හි එම ක්‍රමයමැයි. **අනාබාධං** යනු ආබාධ විරහිත ආබාධයන්ට ප්‍රතිපක්‍ෂ වූයේ හෝ ඒ හා සමානයන්හි එම ක්‍රමයමැයි. **අපරපච්චං** යනු අන්‍ය ප්‍රත්‍යය විරහිත, උපසග්ගතො යන්නද, අනුපසග්ගං යන්නද සමහරු සංයෝග කොට කියවති. **පරමසුඤ්ඤං** යනු සියලු සංස්කාරයන්ගෙන් ශූන්‍ය හෙයින්ද, උතුම් හෙයින්ද පරම ශූන්‍යයි. **පරමත්ථං** යනු සංඛත අසංඛතයන්ගේ අග්‍ර වූ හෙයින් උතුම් අර්ථයයි. ලිංග විපර්යාස වශයෙන් නපුංසක වචනයයි. නිර්වාණයාගේ ශූන්‍යතාව හෙයින්ද අනාත්මතාව හෙයින්ද, මෙම ද්වයයෙහි ප්‍රතිලෝම ක්‍රමය නොයූසේයි. **අනාසවං** යනු ආශ්‍රව විරහිත, **නිරාමිසං** යනු ආමිස විරහිත, **අජාතං** යනු උපත් විරහිත හෙයින් නූපන්, අමතං යනු භංග අභාවයෙන් මරණ විරහිත, මරණයද නපුංසක භාව වචන වශයෙන් මතං යයි යූසේයි.

මෙසේ මේ පිළිවෙළින් කියන ලද ආකාර භේදභින්න වූ සමසතළිස් අනුපස්සනාවන්හි ස්වභාව සංග්‍රහ වශයෙන් ත්‍රිවිධ අනුපස්සනාවන්හි එකට සංග්‍රහ කරනුයේ අනිච්චතොති අනිච්චානුපස්සනා යන ආදිය වදාළහ.

ඒවාහි සුදුසු අයුරින් අනිත්‍ය, දුක්ඛ, අනාත්මයන්හි යෙදීම් කළයුත්තාහ. අවසන්හි වනාහි ඒවා වෙන් වෙන්ව ගණන් වශයෙන් දක්වන ලදී. ගණනයන්හිද ගණන් පිළිවෙළ වශයෙන් ප්‍රථමයෙන් අනත්මානුපස්සනාව ගණිතය. එහි **පඤ්ච වීසති** යනු මත්තෙහි හිස් ලෙසින් නිෂ්ඵල ලෙසින් ශූන්‍යතා වශයෙන් අනාත්ම වශයෙන්දැයි එක් එක් ස්කන්ධයෙහි ස්කන්ධ පහ බැගින් කොට පඤ්ච ස්කන්ධයන්හි පස්විසි අනත්මානුපස්සනායි. **පඤ්ඤාසා** යනු අනිත්‍ය වශයෙන්, විනාශවන ස්වභාව වශයෙන් කම්පාවීම් වශයෙන්, බිඳෙනසුලු වශයෙන් සැමදා නොපවත්නා ලෙසින්, වෙනස්වීම් ස්වභාවයෙන්, අසාර වශයෙන්, විනාශ වීම් වශයෙන්, ප්‍රත්‍යයෙන් හටගත් ලෙසින්, මරණ ස්වභාව වශයෙන් එක් එක් ස්කන්ධයෙහි දහය බැගින් කොට පංචස්කන්ධයන්හි අනිත්‍යානුපස්සනා පණහකි. **සතං පඤ්ච වීසති චෙව** යනු සෙසු දුක් වශයෙන් රෝග වශයෙන් ආදී එක් එක් ස්කන්ධයෙහි විසිපහ බැගින් කොට, පංච ස්කන්ධයන්හි එකසිය විසිපහක් අනුපස්සනාවෝ වෙති. **යානි දුක්ඛෙ පවුච්චරෙ** යනු යම් අනුපස්සනාවෝ වෙත්ද, ඒවා දුක්ඛමය පංචස්කන්ධයෙහි ගණන් වශයෙන් කියති. ඒවා එක්සිය විසිපහක්මයැයි සම්බන්ධය දතයුතුය. යානි යන මෙහි ලිංග විපර්යාසය දතයුතුය.

විදර්ශනා කථා වර්ණනාව නිමි.

දැන් මහතෙරහු, විදර්ශනා කථානන්තරව, සියලු ප්‍රතිසම්භිදා මාර්ගයෙහි නිර්දිෂ්ට, සමථ විදර්ශනා මාර්ග නිර්වාණ ධර්මයන් ආකර නානත්ව වශයෙන් නොයෙක් ක්‍රමයන්ගෙන් පසසනු කැමැතියාහු **නිච්ඡාතො** ආදී එකුන්විසි මාතෘකා පදයන් උදෙසා එහි නිර්දේශ වශයෙන් මාතෘකා කථාවක් නම් කීහ. එහි මේ පෙර නුවූ අර්ථ අනුවර්ණනාවයි. පළමුව මාතෘකාවෙහි **නිච්ඡාතො** යනු නොමැලවුණේ, සියලු කෙලෙස්හු පීඩා යෝගයෙන් මැලවුණාහු වෙති. රාගයද නිරතුරු පැවැතියේ සිරුර දවයි. අනෙක් කෙලෙසුන් ගැන කියනුම කවරේද? මහණෙනි, රාගාග්නිය, ද්වේෂාග්නිය, මෝහාග්නිය යැයි මේ අග්නි තුනෙකි. කෙලෙසුන්ට ප්‍රධාන වූ කෙලෙස් ත්‍රයයක්ම ය්‍ූ.සේයි. ඒහා සම්ප්‍රයුක්ත පුද්ගලයෝද දවත්මය. මෙසේ හටගත් කෙලෙසුන්ගේ අභාවයෙන් නිච්ඡාතොයි. එය කවරෙක්ද, විමෝක්ෂ සම්බන්ධයෙන් විමෝක්ෂයැයි දතයුතුය. **මිද්ධෙනුයි මොක්ඛායි** මනාව මිද්ධෙනුයි විමෝක්ෂයැයි අර්ථයි. මේ එක් මාතෘකා පදයකි. **විජ්ජා**

විමුත්ති යනු විද්‍යාවම විමුක්තියි. මේ එක් මාතෘකා පදයකි. **ඣාන විමොක්ඛො** යනු ධ්‍යාන යම විමෝක්ෂයි. මේ එක් මාතෘකා පදයෙකි. සෙස්ස එකිනෙකවමය. මෙසේ එකුන්විසි මාතෘකා පදයෝය. **නෙක්ඛම්මෙන කාමච්ඡන්දතො නිච්ඡාතො** යනු නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය පහව ගිය හෙයින්, කාමච්ඡන්දයෙන් නිකෙලෙස් වූ යෝගියා ඉන් ලද, නෛෂ්ක්‍රම්‍යයද, නොමැලවුණු, නිකෙලෙස් විමෝක්ෂයෙයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. **නෙක්ඛම්මෙන කාමච්ඡන්දතො මුච්චතීති විමොක්ඛො** යනු නෛෂ්ක්‍රම්‍යය තුළින් යෝගියා කාමච්ඡන්දයෙන් මිදේනුයි එම නෛෂ්ක්‍රම්‍යය විමෝක්ෂයැයි අර්ථයි. සෙස්සෙහිද එසේමය. **විජ්ජතීති විජ්ජා** යනු ස්වභාවයෙන් විද්‍යමාන වේ. තිබේ. ලබයිනුයි විද්‍යා නමැයි අර්ථයි. නොහොත් ස්වභාව තත්වය දැනගැනීම සඳහා පිළිපන් යෝගීන් විසින් ස්වභාවය විඳිනු ලැබේ. දැනගනු ලැබේනුයි විද්‍යා නමැයි අර්ථයි. නොහොත්, විශේෂ ස්වභාව ලැබීම සඳහා පිළිපන් යෝගීන් විසින් විඳිනු ලැබේ. ලබානුයි විද්‍යා නමැයි අර්ථයි. නොහොත් තමා විසින් විඳිය යුතු භූමිය විඳියි. ලබයිනුයි විද්‍යා නමැයි අර්ථයි. තමා විසින් විඳිය යුතු ස්ථානය විඳියි ලබයි නුයි විද්‍යා නමැයි අර්ථයි. ස්වභාව දර්ශන හේතු හෙයින් යථා ස්වභාවය ප්‍රකට කෙරේනුයි විද්‍යා නමැ. **විජ්ජන්තො මුච්චති** මුච්චන්තො විජ්ජති යනු කියන ලද ආකාර ධර්මය කියන ලද අර්ථයෙන් විද්‍යමාන වූයේ කියන ලද අයුරින් මිදේ. කියන ලද අයුරින් මිදෙනුයේ කියන ලද අර්ථයෙන් විද්‍යමාන වේනුයි විද්‍යා විමුක්ති නමැයි අර්ථයි. කාමච්ඡන්දං සංවරට්ඨෙන යනු කාමච්ඡන්දය වැළැකීම් අර්ථයෙන් එම නෛෂ්ක්‍රම්‍යය සීල, විශුද්ධි නමැ. එයම අවික්ෂෙප හේතු හෙයින් අවික්ෂෙපාර්ථයෙන් චිත්ත විශුද්ධියි. දර්ශන හේතු හෙයින් දර්ශනාර්ථයෙන් දෘෂ්ටි විශුද්ධියි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. පටිප්පස්සම්භෙති යනු යෝගාවචර තෙමේ නෛෂ්ක්‍රම්‍යයාදියෙන් කාමච්ඡන්දාදිය සංසිඳවානුයි නෛෂ්ක්‍රම්‍යාදි ධර්මය පස්සද්ධි නමැ. **පහීනත්තා** යනු ඒ ඒ ප්‍රහාණයෙන් ප්‍රහීණ හෙයින් **ඤාතට්ඨෙන ඤාණං** යනු ධ්‍යාන ප්‍රත්‍යවේක්ෂණ වශයෙන්, විදර්ශනා වශයෙන් මාර්ග ප්‍රත්‍යවේක්ෂණ වශයෙන්, ඤාතාර්ථයෙන් නෛෂ්ක්‍රම්‍යාදිය ඤාණය නමැයි අර්ථයි. **දිට්ඨත්තා දස්සනං** යන මෙහිද එම ක්‍රමයමැයි. **විසුජ්ඣති** යනු යෝගියා නෛෂ්ක්‍රම්‍යාදියෙන් පිරිසිදු වීමයි. නෛෂ්ක්‍රම්‍ය නිර්දේශයෙහි නෛෂ්ක්‍රම්‍යය අලෝභ හෙයින් කාම රාගයෙන් බැහැරවූයේනුයි **නිස්සරණං** ඉන් නික්මුණේ නුයි **නෙක්ඛම්මංයි, රූපානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මංයි** කියනු ලබන කල්හි, ආරූප්‍ය

විශේෂයෙහි නොපෙනෙන හෙයින් විශේෂයෙහි දැක්වීම සඳහා අන්තන්හි කියන ලද පාඨ ක්‍රමයෙන්ම යම් මේ 'ආරුප්පං' යයි යූ.සේයි. එම ආරුප්‍යයද රූපයෙන් නික්මුණු හෙයින් නෙකඛමම නමැයි ප්‍රාර්ථනා වශයෙන්ම යූ.සේයි. **භූතං** යනු හටගැන්ම හා එක්ව යෙදීම දැක්වීමයි. **සංඛතං** යනු ප්‍රත්‍යය බල විශේෂ දැක්වීමයි. **පටිචච සමුපපනනං** යනු ප්‍රත්‍යය එක්වීමෙහිදී, ප්‍රත්‍යයන්ගේ උත්සාහවත් නොවීම දැක්වීමයි. **නිරොධො තසස නෙකඛමමං** යනු නිර්වාණය එම සංඛතයෙන් නික්මුණු හෙයින් එම සංඛතයාගේ නික්මීම නමැ. ආරුප්‍යයාගේද නිරෝධයාගේද ග්‍රහණය අන් පාඨයන්හි කියන ලද ක්‍රමයෙන්ම කරන ලදී. කාමච්ඡන්දයාගේ නික්මීම නෛෂ්ක්‍රම්‍යයයි කියනු ලබන කල්හි පුනරුක්ති දෝෂය වේ. නෙකඛමම වචනයෙන්ම එයට නෛෂ්ක්‍රම්‍යය සිදුවේයයි එය නොකියා සෙසු නෛෂ්ක්‍රම්‍යම යූසේයි. එය සෘජුය.

නිස්සරණ නිර්දේශයෙහිද මෙම ක්‍රමයෙන්ම අර්ථය දතයුතුය. මෙහි වනාහි නිස්සරණීය ධාතුහු සෘජුව නෛෂ්ක්‍රම්‍යයැයි යූසේයි.

**පවිවෙකො** යනු අතිශයින් විවේක භාවයට පත් වීමයි. නෛෂ්ක්‍රම්‍යයාදියමය. **වොසසජජති** යනු නෛෂ්ක්‍රම්‍යාදීහු වොස්සග්ගයෙහි නෛෂ්ක්‍රම්‍ය පවත්වන්නා වූ යෝගියා නෛෂ්ක්‍රම්‍යයෙන් හැසිරේයයි යූ.සේයි. එම නෛෂ්ක්‍රම්‍යය වනාහි චර්යාවයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි.

ධ්‍යාන විමෝක්ෂයෙහි කිවයුත්ත විමෝක්ෂ කථායෙහි යූසේයි. හුදෙක් එහි 'ජානාතීති ඣානා විමොකෙඛා' යැයි යූ.සේයි. මෙහි වනාහි 'ඣායතී' යැයි පුද්ගාධිෂ්ඨාන දේශනාවම කරන ලද්දේය. මෙය විශේෂයයි.

භාවනාධිෂ්ඨාන ජීවිත නිර්දේශයෙහිද, පුද්ගලාධිෂ්ඨාන දේශනාව කරන ලද්දේය. ධර්ම වශයෙන් වනාහි භාවනාව නම් නෛෂ්ක්‍රම්‍යාදීහුමය. **අධිටඨානං** නම් නෛෂ්ක්‍රම්‍යාදී වශයෙන් පිහිටුවන ලද සිතමය. **ජීවිතං** නම් නෛෂ්ක්‍රම්‍යාදී වශයෙන් පිහිටුවන ලද සිතෙහි සම්‍යග් ආජීවය නමැ. මිථ්‍යාජීවයෙන් වැළැක්ම දැහැමින් සෙමෙන් ප්‍රත්‍යය සෙවීමේ උත්සාහයයි. එහි **සමං ජීවති** යනු සම ජීවිතයෙන් ජීවත් වේ. භාව නපුංසක වචනය හෝ වේ. සම පැවැත්මෙන් ජීවත් වේයයි යූ.සේයි. **නො විසමං** යනු සම පැවැත්මෙන් ජීවත් වේයයි කියන කියන ලද්දා වූම

අර්ථයෙහි වැළැක්ම වශයෙන් අවධාරණය කරන ලදී. **සම්මා ජීවති** යනු ස්වභාව විශුද්ධියෙන් විශුද්ධ වූ ජීවිතයෙන් ජීවත් වේ. **නොකිලිට්ඨං** එහිම නියම කිරීමයි. **යඤ්ඤදෙවා** යනාදීන්ගෙන් ඤාණ සම්පත්තියෙහි කියන ලද ආකාර ත්‍රිවිධ අනුසස් දක්වයි. එහි **යඤ්ඤදෙවා** යනු යම් යම දැයක්ම **ඛත්තිය පරිසං** යනු ක්‍ෂත්‍රියයන්ගේ රැස්වීම,

යම් අය හාත්පස ගිලාබසිත්ද, මෙහි නොකරන ලද බුද්ධිමත්හුයි පිරිසයැයි යූ.සේයි. අනෙක් ත්‍රයයෙහිද එම ක්‍රමයමැයි. ක්‍ෂත්‍රියයාදීන්ගේම පැමිණීමේ සම්පත්තියෙන්ද, ඤාණ සම්පත්තියෙන්ද යුක්ත වූ හෙයින් එම සතරෙහිම ග්‍රහණයයි. ශුද්ධ පිරිස වශයෙන් නොවේ. **විසාරදො** යනු ධෛර්ය සම්පන්න පහවූ ඇල්මෙන් යුත්, නිර්භය වූයේ යන අර්ථයි. **අමංකු භූතො** යනු නොහැකිලුණේ තෙද විරහිත නොවූයේ, **තං කිසස හෙතු** යනු එම විශාරදත්‍වය කවර හේතුවකින් කවර කරුණෙකින් වේදැයි යන අර්ථයි. දැන් **තථාහි** යනු එම හේතු වචනයයි. යම් හෙයකින් මෙසේ ත්‍රිසම්පදාවන්ගෙන් යුක්ත වූයේද, එහෙයින් විසාරද වේයැයි විසාරද බැව්හි හේතු පෙන්වා නිම කළේය.

සද්ධර්මප්‍රකාශනී නම් ප්‍රතිසම්භිදා මාර්ග අර්ථකථාවෙහි
මාතෘකා කථා වර්ණනාව නිමි.
චූලවර්ගයෙහි පෙර නුවූ අර්ථ අනුවර්ණනාව නිමි.
මෙතෙකින් ත්‍රිවර්ග සංගෘහිත සමතිස් කථා ප්‍රතිමණ්ඩිත

## ප්‍රතිසම්භිදා මාර්ගයෙහි අර්ථ වර්ණනාව නිමි.

**මහාවග්ගො මජ්ඣිමොච - චූලවග්ගොච නාමතො**
**තයො වග්ගා ඉධ වුත්තා - පමාණ පටිපාටියා**

මහා, මධ්‍යම, චූලයැයි නම් වශයෙන් මෙහි පිළිවෙළින් වර්ග ත්‍රයයෙක් යු.සේයි.

**වග්ගෙ වග්ගෙ දස දස - කථා යා තා උදීරිතා**
**උද්දාන කථා වණ්ණනා - ඉමා තාසං යථාක්කමං**

වර්ගයක් පාසා කියන ලද, යම් ඒ දහයක් බැගින් වූ කථාවෝ වේද? මෙ එම කථාවන්හි පිළිවෙළින් දක්වන ඇමුණුමය. (පටුනය)

**ඤාණං දිට්ඨී ආනපානං - ඉන්ද්‍රියං විමොක්ඛ පඤ්චමං**
**ගති කම්මං විපල්ලාසො - මග්ගො මණ්ඩාති තෙ දස**

ඤාණ, දෘෂ්ටි, ආනාපාන, ඉන්ද්‍රිය, පස්වන විමෝක්ෂයද, ගති, කර්ම, විපර්යාස, මාර්ග, මණ්ඩයැයි මහා වර්ගයෙහි දහයකි.

**යුගනන්ධ සච්ච බොජ්ඣංගා - මෙත්තා විරාග පඤ්චමා**
**පටිසම්භිදා ධම්ම චක්කං - ලොකුත්තර බල සුඤ්ඤතා**

යුගනන්ධ, සත්‍ය, බොධ්‍යංග, මෛත්‍රී, පස්වන විරාගයද, ප්‍රතිසම්භිදා, ධර්මචක්‍ර, ලෝකෝත්තර, බල ශූන්‍යතා යැයි මධ්‍යම වර්ගයෙහි දහයකි.

**පඤ්ඤා ඉද්ධි අභිසමයො - විවෙකො චරිය පඤ්චමො**
**පාටිහීරං සමසීසී - සති විපස්සන මාතිකා**

ප්‍රඥා, ඍද්ධි, අභිසමය, පස්වන විරාගයද ප්‍රාතිහාර්යය, සමසීසි, සතිපට්ඨාන, විදර්ශනා මාතෘකා වශයෙන් දහයකි.

**යො සො සුගත සුතානං - අධිපති භූතෙන භූතහිත රතිනා**
**ථෙරෙන ථිර ගුණවතා - වුත්තො පටිසම්භිදා මග්ගො**

බුදුපුත්නට අධිපති වූ, ජනහිත සුවයෙහි ඇලුණු, ස්ථිර ගුණයෙහි පිහිටි තෙරුන් විසින් යම් ඒ ප්‍රතිසම්භිදා මාර්ගයක් කියන ලද්දේද?

**තස්සත්ථ වණ්ණනා යා පුබ්බට්ඨ කථානයං තථා යුත්තං**
**නිස්සාය මයාරද්ධා - නිට්ඨාන මුපාගතා එසා**

මවිසින් අරඹන ලද එහි අර්ථ වර්ණනාව යම් පූර්ව අර්ථ කථා ක්‍රමයක් වේද? එයද එසේම යෝග්‍යතාවයද, ඇසිරිකොට අවසානයට එළැඹියේය.

**යං තං උත්තරමන්තී - මන්ති ගුණ යුතෙනාව සද්ධාය**
**කාරයි මහා විහාරෙ - පරිවෙණ මනෙක සාධු ගුණං**

නොයෙක් යහපත් ගුණ යුත්, මන්ත්‍රී ගුණ යුත් යම් ඒ උත්තර මන්ත්‍රීවරයෙක් ශ්‍රද්ධායෙන් මහා විහාරයෙහි, පිරිවෙන් ශාලාවක් කරවන ලද්දේද?

**ථෙරෙනෙත්ථ නිවසතා - සමාපිතායං මහාභිධානෙන**
**තතියෙ වස්සෙ චුතිතො - මොග්ගල්ලානස්සභූපතිනො**

එම ශාලාවෙහි වසන තෙරුන් විසින් මහා යන විශේෂ නාමයෙන් යුත්, මුගලන් රජුගේ ච්‍යුතියෙන් තෙවන වර්ෂයෙහි මෙය සමාප්ත කරන ලදී.

**සමයං අනුලොමෙන්තී - ථෙරානං ථෙරවාද දීපානං**
**නිට්ඨං ගතා යථායං - අට්ඨකථා ලොක හිත ජනනී**

ථෙරවාද ප්‍රදීපායමාන තෙරවරුන්ගේ සමයට අනුලෝම වන සේ මෙන්ම, ලෝවැස්සාගේ යහපත යම්සේ හටගනිත්ද? එසේ මෙම අට්ඨකථාව නිමාවට ගියේය.

**ධම්මං අනුලොමෙන්තා - අත්තහිතං පරහිතඤ්ච සාධෙන්තා**
**නිට්ඨං ගච්ඡන්තු තථා මනොරථ සබ්බ සත්තානං**

ධර්මයට අනුලෝමව, ආත්මාර්ථ පරාර්ථ ඉටු කෙරෙමින් එසේම, සියලු සත්ත්වයින්ගේ අදහස් සම්පූර්ණ වෙත්වා.

**සද්ධම්මපකාසනියා අට්ඨකථායෙත්ථ ගණිත කුසලෙහි**
**ගණිතා තු භාණවාරා - විඤ්ඤෙය්‍යා අට්ඨ පඤ්ඤාස**

ගණිතයෙහි දක්‍ෂයින් විසින් මෙම සද්ධර්ම ප්‍රකාශනී අටුවායෙහි බණවර පණස් අටක් ගණන් කරන ලදැයි දතයුතුය.

**ආනුට්ඨුභෙන අසසා - ඡන්‍දො බන්‍ධෙන ගණියමානාතු**
**චුද්දස සහසස සංඛා - ගාථායො පඤ්චච සතානි**

මෙහි අනුෂ්ටුෂ් ඡන්‍දස් බන්‍ධනයෙන් ගණිනු ලබන කල්හි දාහතර දහස් පන්සියයක් ප්‍රමාණ ගාථා වේ.

**සාසන චිරට්ඨිතත්‍ථං - ලොකහිතත්‍ථඤ්ච සාදරෙන මයා**
**පුඤ්ඤං ඉමං රචයිතා - යම්පත්ත මනප්පකං විපුලං**

ශාසනයෙහි චිරස්ථිතිය හා ලෝවැස්සාගේ යහපත උදෙසාද, සාදරයෙන් මවිසින් මෙය රචනා කිරීමෙන් අනල්ප වූ මහත් පිනකට සම්ප්‍රාප්ත වීද,

**පුඤ්ඤෙන තෙන ලොකො - සද්ධම්ම රසායනං දසබලසස**
**උපභුඤ්ජිත්වා විමලං පප්පොතු - සුඛං සුඛෙන චාති**

එම පුණ්‍ය මහිමයෙන්, ලෝවැස්සා, දශබලධාරීන් වහන්සේගේ සද්ධර්ම රසායනය පරිභෝගකොට, සැනසිලිදායකව නිර්මල නිවන් සැපතට පැමිණේවා.

## සද්ධර්ම ප්‍රකාශනී නම් ප්‍රතිසම්භිදා මාර්ග ප්‍රකරණයෙහි අටුවා කථාව නිමි.

# සූචිය

අ

අකලලතො 232
අතීතංස ඤාණය 349
අඳුන් දිවිය 42
අධිමාත්‍රතාවය 547
අනුත්පාද නිරෝධය 697
අනභිනතං 655
අනුව්‍යංජන 15
අනුසුව වසයෙන්, 500
අනුනය සංයෝජනය 421
අනුතද්වයාදිය 197
අනුත්පාද නිරෝධය 655
අනුසසතානුතතරිය 72
අනුපසසනා 23
අනතානනතවාදය 432
අනුසය 377
අපරාමට්ඨ 200
අප්‍රහීණාකාරය 377
අබිනන්දනයන් 199
අභය සංඥාව 285
අභිනීහාර කුසල 233
අභාණ කතායෙන් 377
අමරා විකෙඛප 374-432
අමු සොහොණ 362
අරණ විභංග 40
අරණ විහාර 303
අසිතංගම වාරය 516
අසංවරය 15

ආ

ආජීව සංවරය 16
ආත්මනීය භාවය 627
ආත්මීය තාවය 627
ආදිකර්මික භික්ෂුව 348
ආභසසර 113
ආයතන පඤ්චකය 241
ආයූහනා 260
ආරූප්‍යය 711
ආවර්ජනා 348
ආස්වාද සංඥාව 426
ආශ්‍රව 38

ඇ

ඇටසැකිල්ල 236
ඇඹරුම් ගල් 567
ඇලීම් සංඥාව 426

උ

උත්පාදස්ථිතිය 239
උදයව්‍යය දර්ශනය 252
උද්ධුමාතක 235
උපායාස 261

එ

එක්විසි එලඤාණය 502
ඒකාර්ථතාව 551
ඒකෝදිභාව 183

ඔ

ඕභාසාදී ධර්ම 570

ක

කරජකාය 328
කරඬුව 428
කසිණ 87
කාමාවචර 288
කැඩපත්මඬලක් 351
කැළඹිලි ගතිය 18
කැලෑ කුකුළෙක් 25
කුම්භිල ග්‍රාහී 394
කෙහෙලි 608
ක්ෂාන්ති සංවරය 15

ගණ සංගම්කාරාමතාව 462

චාගානුස්සති 230
ජරා මරණ 242
ජරාව 151
ජාති 140

ඨිතකප්ප 39

තදංග සමුච්ඡේද නිරෝධය 501
තදනුවර්තන 551
තලගොයා 193
තුන්හුලස් 608

ද

දරථ 542
දශබලනුත්තරිය 70
දශබල ඤාණ 622
දස ඤාණ 262
දිට්ඨිගත 123
දිසාභිමුඛ 362
දෙවජ්ඣං 523
දෙවළහක 523
දෙසැත්තෑ අනුපස්සනා 502
දේවතානුස්සති 230
දේශනා ධර්මචක්‍රය 607

ධම්මානුස්සති 230
ධර්ම චක්‍රය 620
ධර්මච්ඡන්දය 500
ධර්ම ස්වාමී 608
ධර්මානුසාරිත්වය 546
ධර්මෞද්ධච්ච 570
ධ්‍යානාංග 233

න

නන්දෝපනන්ද දමනය 306
නානාබද්ධ අවිකෝපන 308
නිකන්තිය 138
නිජ්ජරානි 77
නිරයගාමී 363
නිර්වේද අනුලෝම 502
නිර්වේද ඤාණය 502
නිරෝධ සමාපත්තිය 307
නිස්සරණ නිර්දේශ 516
නෙය්‍ය පරියත්තික 647

ප

පටිනිස්සග්ග 501

පදට්ඨාන 14
පරවාදී 622
පරාමමුඛ 26
පරිභෝජන සංවරය 15
පරියේසන 119
පස් අභිනන්දිතයන් 199
පස් පනස් සමාධි 236
පස් වැදෑරුම් ප්‍රීතිය 576
පහාන විනය 426
පාටිහීර 58
පාරිචරියානුත්තරිය 73
පීඩා කිරීම් 195
පුථුජ්ජන 264
පුලවක 236
පංචගති 554
ප්‍රතිවේද ධර්මත්‍රය 607
ප්‍රතීත්‍ය සමුත්පාදය 246
ප්‍රාතිමෝක්‍ෂ 15

බ

බදාලතා 353
බිම්මල් 353
බීජගාම 697
බුද්ධක්‍ෂේත්‍රය 356
බුද්ධානුස්සති 230
බ්‍රහ්ම චක්‍රය 621

භයතුපට්ඨාන 502
භව්‍යා භව්‍ය 380
භාණක 377
භූතගාම 697

ම

මණ්ඩය 565
මන්ද ප්‍රාඥ විදර්ශකයින් 571
මණ්ඩපෙය්‍ය 565-568
මාර්ගාවරණ 427
මහාසාල කුල 554
මාතෘරාජ 260

ය

යෝග තේජස 175
යෝගාවචර 175
යෝගානුභාව 155

ර

රතන චක්‍රය 292
රතු කටු කරඬු 382
රාජ හංසයා 23
රූප විරාග 500

ල

ලාභානුත්තරිය 71
ලෝකව්‍යූහ 351
ලෝහිහි 236

ව

වසී භාවය 42
වසී භාවනා පඤ්ඤා නන42
වාස භාවය 377
විගතාන්ත 576

විකඛායිත 235
විකඛිත්තක 235
විච්ඡිද්දක 235
විචිකිච්ඡා 279
විනිපාතික 112
විනිපාත 363
විනිශ්චය ස්ථානය 26
විනාශත්‍රය 350
විනීලක 235
විපරිනාමධම්ම 283
විදර්ශනා බල 616
විපුබ්බක 235
විලාපනග්ග දුක 149
විසභාගයන් 198
විසංයෝග 529
විශාඛය 199
විරාග ධර්ම 251
වීර්ය සංවර 15
වුට්ඨාන ගාමිනී 193
වුට්ඨාන ගාමිනී විදර්ශනාව 501
වෙහප්ඵල 113
වෘත්ත පාදක 44

ස

සඤ්ඤාගස්තිථිය 236
සත්තාවාස 25
සත් විඤ්ඤාණස්ථිති 111
සදරේඛා 192
සන්සිදීම 195
සත්තනිද්දසවත්ථු 74
සප්තධාතු 149
සප්තමහ විල් 22
සබ්‍රම්සර 61
සමසීසී 42-83, 312
සමාධානය 18
සමවායවාදීන්ගේ 197
සම්මසන ඤාණ 251

සංඛත 62
සංඝපටිමානන 308
සංඝානුස්සති 230
සංවර විනය 425

සිවිරාසි 242
සිව්වැදෑරුම් පූර්ව කෘත්‍ය 308
සීල මූලාධාරයෙන් 228
සීලානුස්සති 230

සුද්ධාවාසික 111

සෝතාපත්ති අංග 519
සෝවැති 186
ස්පර්ශ කිරීමේ 26
ස්වර්ගා චරණ 427
ශික්ෂානුත්තරිය 72
ශ්‍රවණානුත්තරිය 71
ශ්‍රද්ධානුසාරීත්වය 546

හ

හටගැනීම 195
හතවිකඛිත්තක 236
හික්මීම 16
හේතුස්ථිතිය 236



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝෝෂාචාර්යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපැල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.com

ISBN 978-955-1604-44-4